# විසුද්ධිමාර්ගය

## (සිංහල පරිවර්තනය)

### පළමුවන කොටස

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අවසරය පිට
දෙවැනිවරට මුද්‍රණය කරන ලදී.

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 4

# විසුද්ධිමාර්ගය

## (සිංහල පරිවර්තනය)

### පළමුවන කොටස

සිංහල පරිවර්තනය

**ආචාර්ය හේමචන්ද්‍ර දිසානායක**

## ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ
## අට්ඨකථා පරිවර්තන කටයුතු පිළිබඳ කොමිටිය

මහාචාර්ය ඇම්. බී. ආරියපාල (සභාපති)

මහාචාර්ය එන්. ඒ. ජයවික්‍රම

මහාචාර්ය වයි. කරුණාදාස

ආචාර්ය කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය

රාජකීය පණ්ඩිත ආචාර්ය පී. එස්. බී. සේනානායක

ආචාර්ය ඇස්. පී. සමරසිංහ (ලේකම්)

ආචාර්ය කේ. ඩී. පරණවිතාන (භාණ්ඩාගාරික)

මහාචාර්ය කපිල අභයවංස

ආචාර්ය ඒ. අධිකාරි

## පෙරවදන (පළමු මුද්‍රණය)

ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය මගින් ආරම්භකොට ඇති පාලි අට්ඨකථා සිංහලට නැඟීමේ ව්‍යාපෘතියෙහි තවත් පියවරක් ලෙස විශුද්ධිමාර්ගයෙහි සිංහල අනුවාදය ප්‍රකාශයට පත්කරන්නට ලැබීම සතුටට කරුණකි. විශුද්ධිමාර්ගය ත්‍රිපිටක ධර්මය ථෙරවාද සම්ප්‍රදයට අනුව විවරණය කරන විශ්වසනීය කෘතියක් ලෙස බෞද්ධ ලෝකයාගේ ඉමහත් ගෞරවයට පාත්‍රවූ ග්‍රන්ථයකි. අනුබුදු මහමිහිඳු හිමියන් විසින් සිංහල භාෂාවෙන් තබවනලද හෙළ අටුවාවලට අනුගතව අටුකථාචාර්ය බුද්ධඝෝෂපාදයන් විසින් මුළු ත්‍රිපිටකධර්මය අලළා රචනාකොට ඇති මෙය සුවිශේෂ කෘතියක් ලෙස සලකනුලැබේ. සෙසු අට්ඨකථා ත්‍රිපිටකයෙහි එක් එක් කොටසක් වෙනවෙනම ගෙන කරනලද කෘතීන් නමුදු විශුද්ධිමාර්ගය පිටකතුනටම පොදුවූ අට්ඨකථාවකි. බුද්ධධර්මයෙහි මූලික ඉගැන්වීම් සියල්ලක්ම අඩුවක් නැතිව මෙහි විස්තර කොට ඇත. එහෙයින්ම මෙය ත්‍රිපිටකධර්මය පිළිබඳ විශ්වකෝෂයෙකැයි කිවහැකිය.

මෙතරම් වැදගත් ග්‍රන්ථයක්වූ විශුද්ධිමාර්ගය පරිශීලනය කිරීමට පාලිභාෂාප්‍රවීණත්වයක් නැති සිංහල පාඨකයාට තිබුණ පහසුකම් මෙතෙක් සීමාසහිත විය. මෙම ග්‍රන්ථය සම්පූර්ණයෙන් ඉංග්‍රීසි ආදී බටහිර භාෂාවලට පරිවර්තනය කොට ඇතත්, සියවස් අටකට පමණ පෙර දෙවන පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා විසින් කරනලදැයි සලකනුලබන විශුද්ධිමාර්ග මහා සන්නය හැර, සම්පූර්ණ ග්‍රන්ථයේ සිංහල අනුවාදයක් මෙතෙක් නොවීය. විශුද්ධිමාර්ග මහාසන්නයෙහි බස නූතන පාඨකයාට සුගම නොවේ. එහෙයින් විසිවන සියවස මුලදී ලක්මිණිපහන් කර්තෘ එම්. ධර්මරත්න පඬිතුමා විසින් එය සංස්කරණය කොට භාවාර්ථ සන්නයක්ද සහිතව පසළොස් වන පරිච්ඡේදය දක්වා කොටස් වශයෙන් පළකරවන ලදි. මෙයද භාෂාවේ ඇති ගාම්භීර්‍යයද, ඉතා විස්තර සහිත වර්ණනාක්‍රමයද හේතුකොටගෙන සාමාන්‍ය පාඨකයාට එතරම් ප්‍රයෝජනවත් නොවියහැකිය. මාතර ශ්‍රී ධර්මවංශ පඬිහිමිපාණන් විසින් කරනලද අනුවාදයක්ද ඇතත් එයද සංක්ෂිප්ත ප්‍රකාශනයකි. කරුණු මෙසේ හෙයින් විශුද්ධිමාර්ගයෙහි සම්පූර්ණ පරිවර්තනයක් නැතිවීමේ අඩුපාඩුව මඳවශයෙන් හෝ මෙයින් පිරිමැසෙතැයි විශ්වාස කරමු.

විශුද්ධිමග්ග නම් පාලිග්‍රන්ථය මුද්‍රිත පිටු පන්සිය හතළිස් සතරකින් යුත් විශාල ග්‍රන්ථයකි. මෙම සිංහල අනුවාදයෙහි පිටුගණන හත්සියයක් පමණ වනුඇත. පරිච්ඡේද විසිතුනකින් යුත් මෙහි (මුල් පරිච්ඡේද එකොළසවූ) ප්‍රථම භාගය මෙයින් ප්‍රකාශයට පත්කරමු. ඉතිරි (පරිච්ඡේද දෙළස) ද්විතීය භාගය වශයෙන් සූචියද සහිතව, නුදුරු අනාගතයේදීම ප්‍රකාශයට පත්කිරීමට කටයුතු සම්පාදනය වෙමින් පවතිනබවද සඳහන් කරමු.

**ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ**
**පාලි අට්ඨකථා පරිවර්තන කටයුතු පිළිබඳ කොමිටිය**

# ප්‍රස්තාවනාව (පළමු මුද්‍රණය)

**ආචාර්ය හේමචන්ද්‍ර දිසානායක**

පාලි අට්ඨකථාවන් අතුරෙන් විසුද්ධිමග්ගය සුවිශේෂ කෘතියකි. සෙසු පාලි අට්ඨකථාවන් මෙන් ත්‍රිපිටකධර්මයෙහි එක් එක් කොටසක් වෙනවෙනම ගෙන කරනලද්දක් නොව එය මුළුමහත් සූත්‍රපිටකයම අලළා කරනලද පරිපූර්ණවූද විස්තීර්ණවූද නිබන්ධයකි. පුද්ගලයෙකුගේ ආධ්‍යාත්මික සංවර්ධනය පිණිස අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගය ලෙස බුදුදහමෙහි ඉගැන්වෙන සීල, සමාධි, පඤ්ඤ යන ත්‍රිවිධ ශික්ෂාව විස්තර කරමින් පරිච්ඡේද විසිතුනකින් කරනලද විසුද්ධිමග්ග සැබවින්ම විස්මය දනවන කෘතියකි. කරුණු සනාථකරනු පිණිස ඒ ඒ තැන උපුටා දක්වනලද උද්ධෘතපාඨ සංඛ්‍යාව ගැන සලකනකල එය ත්‍රිපිටකධර්මය පිළිබඳ විශ්වකෝෂයකැයි කිවහැකිය. විසුද්ධිමගග පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගැනීමට එහි පසුතලය, එනම්, බුදුසමයේ ව්‍යාප්තිය හා විකාශය පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් අවශ්‍යවෙතැයි හඟිමු. එහෙයින් ඒ පිළිබඳ කෙටි සමාලෝචනයක් කිරීම යෝග්‍ය වේ.

**පාලි අට්ඨකථායුගයට පෙර බුදුදහම**

බුදුන්වහන්සේ ධරමානව වැඩසිටි කාලයේ සිට පාලි අට්ඨකථායුගය තෙක් ඉකුත්වූ සියවස් දහයක් පමණ කාලය, බුදුසමයේ වර්ධනය සිදුවූ ආකාරය අනුව, තරමක් අසමාන කොටස් දෙකකට බෙදියහැකිය. පළමුවැන්න ක්‍රි.පූ. පස්වන සියවසේ සිට ක්‍රි. පූ. තුන්වැනි සියවස අවසානය දක්වාවූ කාලපරිච්ඡේදයයි. දෙවැන්න ක්‍රි. පූ. දෙවන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂයෙන් පස්වන සියවස දක්වාවූ කාලපරිච්ඡේදයයි.

පළමුවන දෙවන තුන්වන සංගායනා සියල්ලම පවත්වනලදුයේ පළමුවන කාලපරිච්ඡේදය තුළදීය. බුද්ධපරිනිර්වාණයෙන් සියවසක් ඉකුත්වත්ම එතෙක් එක් පිරිසක්ව සිටි ශ්‍රාවකසංඝයා වේසාලී නුවර පවත්වනලද දෙවන සංගායනාවස්ථාවේදී දෙකඩව ගියහ. බුදුදහම කාලානුරූපවූ හෝ දේශානුරූපවූ කවර ආකාරවූද වෙනසකට භාජනවීම ස්ථවිර භික්ෂූන්හට රුචි නොවීය. මෙම පිරිස 'ථෙරිය' යන නමින්ද, විරුද්ධමත දරූ පිරිස 'මහාසාංඝික' යන නමින්ද ප්‍රකටවූහ.

## මුල් බුදුදහම

බුදුන්වහන්සේ විසින් පන්සාළිස්වසක් තරම්වූ කාලයක් තුළ ඒ ඒ තැන්වලදී, ඒ ඒ අවස්ථාවලදී, ඒ ඒ කරුණු නිමිතිකොටගෙන, ඒ ඒ පුද්ගලයන්ට හෝ පිරිස්වලට දේශනා කරනලද ධර්මය හා පනවනලද විනය ශික්ෂාපද මුල් බුදුදහමේ ප්‍රධාන අංගයෝ වූහ. තවද මහාශ්‍රාවකයන් අතර ඇතිවූ ධර්මසාකච්ඡා ආදියද, සම්‍යග්දෘෂ්ටික දෙව්බඹුන්, මිනිසුන් හා බුදුන්වහන්සේ හා අතර ඇතිවූ සංවාදදියද ආහච්චභාසිතබවට පත්ව මුල් බුදුදහම තුළ අන්තර්ගතව ඇත. මේ ආකාරයෙන් ක්‍රමයෙන් වැඩීගිය ධර්මස්කන්ධය නැතිවී යානොදී රැකගනු පිණිස කිසියම් ක්‍රමානුකූල ක්‍රියාමාර්ගයක් අවශ්‍ය විය. බුදුන්වහන්සේ ජීවමානව වැඩවිසූ සමයෙහිදීම එබඳු සංවිධානාත්මක වැඩ පිළිවෙළක් පැවතිබවට සාධක ඇත. ආනන්ද තෙරණුවන් ධර්මභාණ්ඩාගාරික තනතුරටත්, උපාලි තෙරණුවන් විනයධරයන්ගේ අගතනතුරටත්, සැරියුත් තෙරණුවන් ධර්මසේනාපති තනතුරටත් පත්කරනුලැබීම මෙම වැඩපිළිවෙළ ක්‍රියාවට නැඟීමේ එක්පියවරක් සේ පෙනේ. ඒ ඒ දහම් කොටස් වාචෝද්ගත කොටගෙන, ඇතැම්විට ලේඛනගත කොටගෙන[1] පවත්වාගැනීමේ කාර්යයෙහි යෙදීසිටි භික්ෂූන් ගැන අසන්නට ලැබේ. මෙම ශාසනික කාර්යය 'ග්‍රන්ථධුර' යනුවෙන් හඳුන්වා ඇත. තවද ධර්ම, විනය යන කොටස් දෙක වෙනවෙනම හදළ භික්ෂුපිරිස් ගැනද අසන්නට ලැබේ. කෝසම්බික භික්ෂූන් අතර ඇතිවූ විවාදවලට හේතුවූයේ ධර්මධරයන්ගේ ආචාර්ය තෙරුන් අතින් සුලු විනය ශික්ෂාපදයක් කඩවීම විනයධරයන්ගේ විවේචනයට ලක්වීමයි. තවද මෙවන් ක්‍රියාමාර්ගයක් පැවතිබව අංගුත්තරනිකායෙහි ධම්මවිහාරී සූත්‍රයෙහි එන සඳහනකින්ද පැහැදිලි වේ.[2] ධර්මය හදරන, සජ්ඣායන කරන, තර්කනය කරන, දේශනා කරන භික්ෂූන් හා ආධ්‍යාත්මික වර්ධනය සඳහා ධර්මයට අනුව වීර්යවඩන භික්ෂූන් ගැන එහි සඳහන් වේ. පළමු පිරිස් හතරින් ග්‍රන්ථධුරයද, අවසනට සඳහන් පිරිසෙන් විදර්ශනාධුරයද හැඟවේ. මෙහිම සඳහන් 'නවඞ්ගසත්ථුසාසන' යනුවෙන් කරනුලබන සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන බෙදීම, දේශනා පාඨයන්ගේ බාහිර ස්වරූපය දක්වීම සඳහා යොදගත් ක්‍රමයක්

---

1. වාචෝද්ගත කිරීම වඩා ප්‍රචලිතව පැවති ක්‍රමය වූවද, මෙවකට ලේඛනශිල්පයද පැවති බව බෞද්ධසාහිත්‍යයෙහි එන කතාපුවත්වලින් හෙළිවේ. බන්ධුල මල්ලිකා, සෝණක සිටු ආදීන්ගේ කතාපුවත් දක්විය හැකිය.

2. අං. නි. පඤ්චක නිපාත

සේ පෙනේ. ධම්මපදයෙහි එන සඳහනකින්ද ධර්මය හදරන, පිරිවහන, එනම්: ග්‍රන්ථධුරයෙහි යෙදුණු භික්ෂූන් ගැන පැවසේ.[3]

පළමුවන ධර්මසංගායනාවෙහිදී මෙම ක්‍රියාමාර්ගය තවදුරටත් ඉදිරියට පමුණුවනලදබව සිතියහැකිය. මෙහිදී සංවාදයට පාත්‍රවූ විෂයපථය 'ධම්ම' හා 'විනය' යනුවෙන් කොටස් දෙකකින් හඳුන්වා ඇත.[4] මෙහිදී අභිධර්මපිටකය ගැන අසන්නට නොලැබීම කුහුල් දනවනසුලුය. එය ගැන පළමුවරට අසන්නට ලැබෙනුයේ තුන්වන .සංගායනාවේදීය. පළමුවන සංගායනාවේදී නිදානකථා සහිතව බුද්ධධර්මය කොටස් දෙකක් කොට සංග්‍රහකරනලදබව පෙනේ. මෙසේ සංග්‍රහකරනලද බුද්ධධර්මය පවත්වාගැනීමේ වැඩපිළිවෙළක්ද යොදනලදී. මෙම කොටස් දෙක නැවත අනුකොටස්වලට බෙද එක් එක් කොටස තම තමන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවන් මගින් පවත්වාගැනීම ඒ ඒ මහාස්ථවිරයන්වහන්සේලාට පවරනලදී. ධර්ම, විනය යන කොටස් දෙක සංවිධානය කොට මෙසේ පවත්වාගැනීමේ වගකීම් භාරය පැවරුණේ පිළිවෙළින් ආනන්ද තෙරණුවන් හා උපාලි තෙරණුවන් වෙතය. දෙවන සංගායනාව වන තෙක් මේ වැඩපිළිවෙළ ක්‍රියාවට නැඟුණුබව පැවසේ. මහාශ්‍රාවකයන් විසින් සංග්‍රහකොට පවත්වාගෙන ආ මෙම ධර්මය 'ථේරියවාද' යනුවෙන් ප්‍රකටවිය.[5]

එතැන්පටන් ශතවර්ෂයක් ඉකුත්වන තෙක් ශ්‍රාවකසංඝයා ථේරිය යන නමින් එක්ම පිරිසක් වූහයි පැවසේ. එහෙත් කල්යත්යත් මෙම සඟපිරිස අතරෙහි මතභේද පහළවන්නට විය. පළමුවන සංගායනාවේදී සංග්‍රහකොට සම්මත කරගන්නාලද බුද්ධවචනය විශේෂයෙන් විනය ශික්ෂාපද වෙනස්වීම්වලට භාජනවන්නට විය. කාලානුරූපව, දේශානුරූපව විනය ශික්ෂාපද මඳ වශයෙන් වෙනස් කරගැනීම වරදක් සේ නොදුටු භික්ෂුපිරිසක් වූහ. වේසාලී නුවර වජ්ජිපුත්තක භික්ෂූහු පෙරමුණ ගනිමින් මෙම මතය එළිපිටම ප්‍රකාශ කළහ. කල් යාමේදී මෙම පිරිස සංඛ්‍යාවෙන්ද වැඩිවූහ. දෙවන සංගායනාව පැවැත්වීමට හේතුවූයේ මෙම වජ්ජිපුත්තක භික්ෂූන් විසින් උපදවනලද 'දසවත්ථු' යනුවෙන් හැඳින්වෙන විනය ප්‍රශ්නයකි. මෙම සංගායනාවේදී දසවත්ථුව විනය විරෝධීයයි නිග්‍රහකොට ප්‍රතික්ෂේප කරනලදි. ථේරිය භික්ෂූන්ගේ මෙම විසඳීම නොපිළිගත් වැඩි

---

3. බහුම්පි චෙ සහිතං භාසමානො න තක්කරො හොති නරො පමත්තො
ගොපො'ව ගාවො ගණයං පරෙසං න භාගවා සාමඤ්ඤස්ස හොති.
ධ. ප. යමකවග්ග

4. හන්ද මයං ආවුසො ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායාම; චුල්ලවග්ගපාළි

5. මහාවංස V, 1

පිරිස බිඳීගොස් වෙනත් ස්ථානයක සංගායනාවක් පැවැත්වූබවද පැවසේ. බිඳීගිය පිරිස එතැන් පටන් 'මහාසාංඝික' යන නමින් ප්‍රකටවූහ.

දෙවන සංගායනාවෙන් පැහැදිලිව පෙනෙන කරුණක් නම් උපාලි තෙරණුවන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් පැවත ආ විනයධර තෙරවරුන් බුදුන්වහන්සේ විසින් පනවනලද කුඩු මහත් ශික්ෂාපද මදවශයෙන් හෝ වෙනස්කිරීම වරදක් සේ දුටුබවයි. එහෙත් ථේරියපරම්පරාවටම අයත් ධර්මධර භික්ෂූන්,එම පිළිවෙතම අනුගමනය කළහයි කිව හැකිද? මෙයට කෙළින්ම පිළිතුරක් නොදියහැකි වනුයේ එම සංගායනාවෙහි ප්‍රස්තුතයවූයේ විනය පිළිබඳ කරුණු මිස ධර්මය පිළිබඳ කරුණු නොවන හෙයිනි. බුදුන්වහන්සේ විසින් දේශිත ධර්මය ව්‍යංජන පද අර්ථ වශයෙන් කිසි වෙනසකට භාජන නොකොට නිර්මලව පවත්වා ගැනීම ථේරියපරම්පරාවේ ප්‍රතිපත්තියවූබව සාමාන්‍ය පිළිගැනීමයි. එහෙත් එය එසේම නොවූබවත්, අන්‍යනිකායිකයන් පමණක්නොව ථේරිය නිකායිකයන් පවා බුද්ධවචනයට නවඅරුත්, නවසංකල්ප, නවසම්ප්‍රදායයන් ඉදිරිපත් කිරීමෙන් නොවැලකුණබව විද්වතුන් විසින් පෙන්වාදී ඇත.[6] බුදුන්වහන්සේගේ ඉගැන්වීම්වල මූලික පදනමට හානියක් නොවන සේ එසේ කිරීම වරදක් නොමැතැයි ඔවුන් සැලකුබව පෙනේ. අංගුත්තරනිකායයෙහි එන නෙය්‍යාර්ථ නීතාර්ථ යන සූත්‍රවර්ග දෙක පිළිබඳ අදහසද, දීඝනිකායයෙහි එන චතුර්විධ ඥනයන් පිළිබඳ අදහසද යන ආදිය මෙයට අවසර සපයා ඇතිබවද පෙන්වාදී ඇත.[7]

දෙවන සංගායනාවත් තෙවන සංගායනාවත් අතර කාලය තුළ, ඇතැම්විට එයටත් පෙර සිට, අට්ඨකථාවන්හි පමණක් නොව පෙළෙහිද, එකතු කිරීම්, වෙනස් කිරීම්, නව අර්ථකථන ආදී වශයෙන් ක්‍රමානුකූල වර්ධනයක් සිදුවූ සේ පෙනේ. සූත්‍රයන්හි ඇතුළත් මූලික ඉගැන්වීම් විකාශයට පත්වෙමින් මෙම වර්ධනය සිදුවූබවද පෙනේ. මෙසේ පළමුවන සංගායනාවේදී ධම්ම, විනය යන කොටස් දෙකට සීමාවූ බුද්ධවචනය තෙවන සංගායනාවේදී විනය, සූත්‍ර, අභිධර්මයයි පිටක තුනක් ලෙසින් සංග්‍රහකරනලදි. මෙයින් පැහැදිලිවනුයේ අභිධර්මපිටකය මුලදී 'ධම්ම' යයි හඳුන්වනු ලැබූ සූත්‍රාගත ඉගැන්වීම් අනුවම විකාශයට පත්වූ නව සංකල්ප සමුදයක්බවයි. අභිධර්ම පිටකයට අයත් කථාවත්ථුප්පකරණය බුදුන්වහන්සේගේ දේශනානය

6. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පර්යේෂණ ඒකකය: බුදුසමයේ ලාංකේය වර්ධනය පිටු 3 සිට බලන්න.

7. එම, 20 වන පිටුව.

පාදක කොටගෙන මොග්ගලීපුත්ත තිස්ස තෙරණුවන් විසින් රචනාකොට ඉදිරිපත් කරනලදැයි අත්ථසාලිනී නිදානයෙහි පැහැදිලිව ප්‍රකාශකොට ඇත.[8] කථාවත්ථුප්පකරණයෙහි අපේක්ෂිතාර්ථය වනුයේ පරමතඛණ්ඩනය හා ස්වමතස්ථාපනයබව පෙනේ. මහාසාංඝිකයන් හා ථේරිය නිකායිකයන් හා අතර පමණක් නොව ථේරියනිකායිකයන් අතර පවා අභ්‍යන්තර මතවාද පැවතිබවද මෙයින් හෙළිවේ. තෙවන සංගායනාවට සහභාගීවූ භික්ෂුපිරිස තෝරාගන්නාලද්දේ සියුම් පරීක්ෂණයක් මගිනි. දහසක් පමණවූ මෙම පිරිස ථේරිය නිකායිකයන් අතුරෙන්ද තෝරාගනුලැබූ විභජ්ජවාදීහු වූහ.[9]

**තෙවන සංගායනාවෙන් පසු යුගය**

අශෝක අධිරාජයාගෙන් පසු මෞර්ය අධිරාජ්‍යය වැඩිකල් නොයාදීම බිඳීගියේය. උත්තරභාරතයෙහි මෙන්ම දක්ෂිණභාරතයෙහිද රාජ්‍යපාලනබලය බ්‍රාහ්මණ වංශිකයන් විසින් අයත් කරගන්නාලදි. මෞර්ය අධිරාජ්‍යයේ නටබුන් මත මෙසේ පැනනැගුණ බ්‍රාහ්මණික රාජ්‍ය තුනකි, මගධ ප්‍රදේශයෙහි ශුංගවංශය, ඉහළගංගා නදීනිම්නය ඇතුළු බටහිර ප්‍රදේශයෙහි කාණ්වවංශය හා දක්ෂිණාපථයෙහි සාතවාහන වංශයයි. මේ වකවාණුවේදීම දකුණුඉන්දීය ද්‍රවිඩනායකයින් සත්දෙනෙකු ලක්දිව ආක්‍රමණය කිරීම හා ඔවුන්ගේ සහයෝගය ඇතිව තීය නම් බ්‍රාහ්මණයෙකු රාජ්‍යයට පත්ව තුදුස්වසක් රජරට පාලනය කිරීම[10] කුහුල් දනවන සිද්ධියකි. මෙය පෙර නොවූවිරූ අසාමාන්‍ය සිදුවීමකි. බ්‍රාහ්මණික ධර්මශාස්ත්‍රයන්හි දක්වෙන වර්ණාශ්‍රමධර්මයට අනුව රාජ්‍යපාලන කටයුතු ක්ෂත්‍රියයනට මිස බ්‍රාහ්මණයනට අයත්නොවේ. මේ සියල්ලෙන්ම පෙනීයනුයේ අශෝක අධිරාජයාගෙන් පසු මුළුමහත් භාරතදේශය පුරා බ්‍රාහ්මණයන්ගේ නැගීමක් සිදුවූබවත්, ක්ෂත්‍රියයන් ලවා පාලනකටයුතු කරවනු වෙනුවට රාජ්‍යබලය කෙළින්ම සියතට ගත්බවත්, බ්‍රාහ්මණයන්ගේ මේ ප්‍රතික්‍රියාව ලක්දිව කෙරෙහිද බලපා ඇතිබවත්ය. අශෝක අධිරාජයා භික්ෂූන්හට පමණක් නොව සමාජයෙහි ප්‍රබල පිරිසක්වූ බ්‍රාහ්මණයන්ටද එකසේ සංග්‍රහ කළබවත්, හරසර දක්වූබවත් ප්‍රකටය[11]. එහෙත් මෞර්ය පාලනය යටතේ තමනට අත්වූ

8. එම 20 වන පිටුව

9. එම 4 වන පිටුව; මහාවංස V, 269-272 ගාථා

10. University of Ceylon; History of Ceylon, pp. 166-167 බලන්න.

11. 'බම්හණසමණානං දනං සම්පටිපති', අශෝක ලිපි.

දෙයට වඩා නැතිවූ දෙය අධිකතරයයි යන හැඟීමක් බ්‍රාහ්මණ සමාජය තුළ වැඩියාම නිසා මේ ප්‍රතික්‍රියාව සිදුවීයයි සිතියහැකිය.

රාජ්‍යබලය බ්‍රාහ්මණයන් අතට පත්වීමත් සමගම බ්‍රාහ්මණික සංස්කෘතියෙහි පුනරුදයක්ද ඇතිවිය. අශ්වමේධ ආදී පැරණි යඥවිධි හා යාගහෝම ගැන සාහිත්‍යයෙහි මෙන් සෙල්ලිපිවලද බහුලව සඳහන්වේ. බුදුසමයට මෞර්‍ය්‍යපාලනයතෙක් ලැබීතිබුණ රාජ්‍යඅනුග්‍රහය නැතිවූවා පමණක්නොව භාරතයතුළ එහි පැවැත්මපවා අවිනිශ්චිත ස්වභාවයකට පත්විය. පොදු සමාජය තුළ කුලුපගබවක් හෝ ජනප්‍රිය බවක් ඇති කරගැනීම විනයවිරෝධී ලෙස සැලකූ ථේරවාදීහු මෙහිදී අසරණබවට පත්වූහ. වනගතවීම නැතහොත් පිටුසර පෙදෙස්වලට පසුබැසීම, එසේත් නැතහොත් බ්‍රාහ්මණබලය උත්සන්න නොවූ පෙදෙස්වලට පලායාම හැර ගතහැකි අන්මඟක් ඔවුනට නොවීය. ථේරවාදී බුදුදහම උත්තරභාරතයෙන් අතුරුදහන් නොවූ බවට දක්විය හැකි එක් සාධකයක් නම් මිලින්දපඤ්හ නම් ග්‍රන්ථයෙහි එන මිලින්ද - නාගසේන සංවාද පිළිබඳ පුවතයි. මිලින්ද රජු ක්‍රි. පූ. පළමුවන සියවස මුල්භාගයේදී වයඹදිග ඉන්දියාවේ (පංජාබ් ප්‍රදේශයේ) සාගලපුර (සියල්කොට්) සිට රාජ්‍යය කළ මිනැන්ඩර් නම් ඉන්දු-ග්‍රීක රජු ලෙස හඳුනාගෙන ඇත.[12] ථේරවාදීන්ගේ ඉරණම මෙසේවූවද, දෙවන සංගායනාවේදී බිඳීගිය මහාසාංඝිකයන්ගෙන් පැවතෙන්නෝද, තෙවන සංගායනාවේදී බිඳීගිය පිරිස්ද බුදුසමය රැකගැනීමට පෙරමුණගත්හ. පොදු සමාජය තුළ ජනප්‍රියව සිටි ඔවුහු බ්‍රාහ්මණික ආගමෙහි ඇතැම් අංගයන් බුදුසමය තුළ ආරෝපණයකොටගත්හ. වෛදික ආගමෙහි බහුදේවවාදය බැහැර නොකළ ඔවුහු වෛදික දේවචරිත වෙනුවට බෝධිසත්ත්වචරිත නිර්මාණය කළහ. බුදුන්වහන්සේ දෙවියෙකු නොව දෙවියන්ගේ දෙවියකු (දේවාතිදේව) කොටගත්හ.[13] මහායාන බුදුසමයේ ආදිකර්තෘකයන්වූ මොවුන්ගේ අප්‍රතිහත පරිශ්‍රමයන් හේතුකොටගෙන භාරතභූමියෙන් නැත්තටම නැතිවීමේ තර්ජනයට මුහුණ පාතුබූ බුදුදහම ජනප්‍රිය ආගමක්බවට පත්වෙමින්, පසුව කණිෂ්ක අධිරාජයාගේ අනුග්‍රහය ලැබ උත්තර භාරතයෙහි පමණක් නොව මධ්‍යම ආසියාකරය දෙසටද, එතැනින් ඈත පෙරදිග දෙසටද පැතිරෙන්නට විය.

බ්‍රාහ්මණික ආචාර්යවරයන් හා බෞද්ධ ආචාර්යවරයන් අතර පැවති මතගැටුම් උත්සන්න වූයේද මේ යුගයේදීය. සාංඛ්‍ය, යොග ආදි

12. Majumdar, Raychaudhuri and Datta : An Advancced Hiotory of India, p.142

13. Majumdar, Raychaudhuri and Datta: An Advanced History of India p. 140

ෂඩ් දර්ශනයන් මෙන්ම බෞද්ධ දර්ශනයද අද පවත්නා තත්වයට වැඩිදියුණුවූයේ මේ මතගැටුම් හේතුකොටගෙනය. බෞද්ධයන් වෙනුවෙන් පෙරමුණ ගත් අශ්වඝෝෂ, කුමාරජීව, නාගාර්ජුන, අසංග, වසුබන්ධු ආදී ආචාර්යවරයන්ගේ නම් අමරණීයත්වයට පත්වූයේද මේ හේතුවෙනි.

**දක්ෂිණ භාරතයේ ථේරවාදය**

උතුර හා සසඳනකල දකුණ මේ කාලයතුළ ථේරවාදයට වඩා හිතකර ප්‍රදේශයක් විය. උතුරෙන් මුළුමනින්ම අතුරුදන්වූ සේ පෙනෙන එය දකුණෙහි යම් ප්‍රමාණයෙක සාර්ථකත්වයෙන් පාලි අට්ඨකථායුගයට පසුවද දිගුකලක් පැවතිබව පෙනේ. කෘෂ්ණානදියෙන් දකුණු ප්‍රදේශයෙහි පැවති ථේරවාද මධ්‍යස්ථාන සැලකියයුතු සංඛ්‍යාවක් ගැන අසන්නටලැබේ. කාංචීපුර (කොන්ජිවරම්), උරගපුර (උරයියූර්), මයූරරූපපට්ටන, (මයිලපූර්), බදරතිත්ථ (කඩල්-ඌර්), භූතමංගලම් (බුදල්-ඌර්), මෝරණ්ඩ ඛෙටක (කොතනෙමාලිපුර-ගුණ්ඩල්පල්ලි), නාගපට්ටන, කාවීරපට්ටන, ධාන්‍යකටත යන ආදියයි.[14]

සාතවාහනයන්ගේ අනුප්‍රාප්තික රාජවංශිකයන් වැඩිදෙනා ශෛව හෝ වෛෂ්ණව භක්තිකයන්වූ නමුදු අතරින්පතර කෙනෙක් බුදුසමයට නැඹුරුබවක් දක්වූහ. හින්දු භක්තික රාජවංශවලට අයත් රජදරුවන් අතර පවා කලාතුරෙකින් හෝ බෞද්ධයන්වූබව ඇතැම් ආදිපල්ලව වංශික රජුන් 'බුද්ධවර්මන්,' 'බුද්ධාංකුර' වැනි නම් හෝ විරුද දැරීමෙන් පැහැදිලි වේ.[15] හින්දු භක්තික පාලකයන් පවා සිය අණසක පැවති පෙදෙස්වල පිහිටි බෞද්ධ විහාරාරාම කෙරෙහි සතුරු ආකල්පයක් දැරූබවට සාක්ෂ්‍ය නැත.

ක්‍රිස්තු වර්ෂයෙන් තුන්වන සියවස මැදභාගයේදී සාතවාහන රාජ්‍යය බිඳවැටීමෙන් පසු නැඟී ආ දක්ෂිණාත්‍ය රාජවංශයන් අතර 'කලභ්‍ර' නම් වංශයක් ගැන අසන්නට ලැබේ. පල්ලව, පාණ්ඩ්‍ය, චාලුක්‍ය වංශවලට අයත් රජදරුවන්ගේ සෙල්ලිපි සන්නස් ආදියෙහි කලභ්‍රයන් හා සමග ඇතිවූ ගැටුම් ගැන සඳහන් වේ.[16] ඔවුන්ගේ බලප්‍රදේශයවූයේ කාවේරී

---

14. University of Ceylon: History of Ceylon, Vol. 1, pp.389-391; Bhikkhu Nanamali; Path of Purification, Introdaction, p. xvi; උත්තර (විනය) විනිච්ඡය, සමාප්ති ගාථා, පපඤ්චසූදනී හා මනෝරථපූරණී මධුරත්ථවිලාසිනී සමාප්තිපාඨ, විසුද්ධිමග්ග සමාප්ති පාඨය. තවද බ. Bulletin of the Madras Govt. Museum. New Series vol. vii art. T. N. Ramachandra pp.1 ff.

15. University of Ceylon: History of Ceylon, Vol. 1. p. 275

16. එම. pp. 276-277

නදී නිම්නයයි. මේ පුරාණ චෝළරාජ්‍යයට අයත් ප්‍රදේශයයි. සංගම් යුගයෙන් පසු නවවන සියවසේදී ආදිත්‍යචෝළ රජු පල්ලවයන් අබිබවා බලයට පත්වනතුරු චෝළයන්ගේ නිහඬබවක් දක්නට ඇත. මෙයින් හැඟීයනුයේ මේ සියවස් කීපයතුළ ඔවුන් බෙලහීනව සිටිබවයි. මේ කාලපරිච්ඡේදය තුළ පාරම්පරික චෝළරාජ්‍යයේ බලය කලභ්‍රයන් සතුව පැවතිබව මේ අනුව නිගමනය කළහැකිය.[17] කලභ්‍රයුගය කලියුගයක් ලෙසත් රාජන්තරයක් ලෙසත් දකුණෙහි හින්දුරාජ්‍යයන් විසින් සලකනලදබවද පෙනේ. ඔවුන් පරාජයකොට බලයෙන් පහකිරීමේ ගෞරවයට පල්ලව, පාණ්ඩ්‍ය, චාලුක්‍ය යන තුන් පක්‍ෂයම හිමිකම් කියති.[18] දකුණෙහි හින්දුරාජ්‍යයන් කලභ්‍රයන් කෙරෙහි දැක්වූ මේ ආකල්පයට හේතුවූයේ ඔවුන් බෞද්ධයන් වීමයයි අනුමාන කළහැකිය. ඔවුන් බෞද්ධයන්වූ බවට අට්ඨකථාචාර්ය බුද්ධදත්ත ස්වාමිපාදයෝද දෙස් දෙති. තමන් විනයවිනිච්ඡය නම් කෘතිය රචනාකළේ කලභ්‍රවංශික අච්චුතවික්කන්ත නම් රජු විසින් කාවේරී නදීතීරයෙහි ඉදිකරවනලද රමණීය විහාරයෙක වසමින් එම රජුගේ අනුග්‍රහය ලබමින්බව එම ග්‍රන්ථයෙහි සමාප්ති ගාථාවල සඳහන් වේ.[19] මේ කරුණු අනුව උතුරෙන් අතුරුදන්වූ ථේරවාද බුදුදහමට දකුණ සරුබිමක්වූයේ බොහෝ සෙයින් කලභ්‍රවංශික පාලකයන්ගෙන් ලැබුණ අනුග්‍රහය හා රැකවරණය හේතුකොටගෙනයයි සිතියහැකිය.

ප්‍රාග් අට්ඨකථා යුගයේ අවසන් සියවස් කිහිපය තුළ මහායානිකයන් මෙන්ම ථේරවාදීන්ද නිකාය කිහිපයකට බෙදීගොස් බුදුදහම නන් අයුරින් විවරණය කළබව පෙනේ. එහෙයින් මුල් බුදු සමය කුමක්දැයි තෝරා-බේරාගැනීම අතිශයින් දුෂ්කර කාර්යයක් වන්නට ඇත. ථේරවාදීන් අතර පවා ආචාර්යපරම්පරා අනුව බෙදීම් තිබුණබව පෙනේ. එහෙත් ථේරවාදීන් වැඩිදෙනෙක් මහාවිහාරය ස්වකීය මධ්‍යස්ථානය ලෙස පිළිගත්හ. එයට හේතුවූයේ මහින්ද තෙරණුවන් විසින් හෙළබසින් තබවනලද අට්ඨකථා ශුද්ධ බුද්ධභාසිතය පිළිබිඹු කරන විවරණ ග්‍රන්ථයන් ලෙස ඔවුන් විසින් අදහනු ලැබීමයි. මහාවිහාරය මධ්‍යස්ථානය ලෙස පිළිගත් ථේරවාදී සහපරපුර 'තම්බපණ්ණිය' යන අභිධානයෙන් හඳුන්වනලද සේ පෙනේ. විනයවිනිච්ඡය රචනාකළ

17. එම. pp. 283

18. එම. pp. 276-283

19. අච්චුතච්චුතවික්කන්තෙ කලබ්භකුලනන්දනෙ
මහිං සමනුසාසන්තෙ ආරද්ධො ච සමාපිතො.
උත්තරවිනිච්ඡය සමාප්ති ගාථා.

බුද්ධදත්තාචාර්යයන් මෙම අභිධානයෙන් තමන් හඳුන්වා ගැනීම මෙම අනුමානයට රුකුල් දෙයි[20] බුද්ධඝෝෂාචාර්යයෝද විසුද්ධිමග්ග සමාප්තිපාඨයෙහි තමන් මහාවිහාරවංශිකයෙකුබව ඉඳුරා පවසති. වෙනත් ආචාර්යපරම්පරාවනට අයත් ථේරවාදී පිරිසක් දකුණු දඹදිව වුසූහ. ගෝඨාභය රජුදවස නිග්‍රහකොට රටින් පිටුවහල් කරනුලැබූ වෛතුල්‍යවාද ගත් සඟුන් සැට නමකට රැකවරණ සැලසූ ආරාමයක් එහි තිබීමෙන්ද ඒබව තහවුරු වේ. මහසෙන් රජුදවස මහාවිහාරය වැනසීමට මුල්වූ සංඝමිත්‍ර භික්ෂුව පැමිණියේද මේ ආරාමයෙනි. තම්බපණ්ණිය පරපුරට අයත් භික්ෂූන් මහාවිහාරය හා සමගද, ප්‍රතිපක්ෂ පරපුරකට අයත් භික්ෂූන් අභයගිරි ජේතවන විහාරයන් හා සමගද සබඳකම් පැවැත්වූබව මේ අනුව නිගමනය කළහැකිය.

## විශුද්ධිමග්ගයෙහි භාෂාතත්වය හා රචනා ක්‍රමය

විසුද්ධිමග්ගය අතිශයින් ව්‍යක්තවූද නිරවද්‍යවූද පාලිභාෂාවෙන් රචනාකොට ඇත. ව්‍යාකරණ දෝෂයක් පදසටනාවෙහි ලිහිල්බවක්, ක්‍රියාකාරක සම්බන්ධයෙහි නොගැලපීමක්, අදහස් පැවසීමෙහි අවියත්බවක් දක්නට නැතිතරම්ය. බුද්ධඝෝෂපාදයන් ලක්දිවට එන්නට ප්‍රථම ඤාණෝදය නම් ග්‍රන්ථයක්ද, අත්ථසාලිනී නම් ධම්මසඞ්ගනී අට්ඨකථාවද කළබව පැවසේ. පළමුවැන්න අභාවයටගොස් ඇතිසේය. දෙවැන්න දනට විද්‍යමාන එනම් ග්‍රන්ථයමද? නැතහොත් අනිකක්ද? මේ ගැන විමසීමක් මෙහි මතු දක්වේ. ඒ කෙසේ වෙතත් පාලිභාෂාරචනයෙහි මනා පරිචයක් හා නිපුණත්වයක් ඇතිවම බුද්ධඝෝෂපාදයන් මෙහි පැමිණිබව ඉඳුරාම නිගමනය කළහැකිය.

පාලිභාෂාව හා එහි වර්ධනය පිළිබඳ කරුණු විමසාබැලීම මෙහිලා අනුචිත නොවියහැකිය:

## පාලි යනු කිනම් භාෂාවක්ද?

බුද්ධඝෝෂපාදයන් ඇතුළු පාලි අට්ඨකථාකරණයෙහි පුරෝගාමීවූ ආචාර්යවරයන් 'පාළි' (පාලි නොවේ) යන වචනය යොදගෙන ඇත්තේ අට්ඨකථාවන්ගෙන් වෙන්කොට ත්‍රිපිටකධර්මය හැඳින්වීමේ පාරිභාෂික වචනයක් ලෙසිනි. 'පාළියඤ්ච අට්ඨකථායං ච' (පෙළෙහිද අටුවාහිද) යනුවෙන් ඒබව පැහැදිලිවේ. අපගේ සමාලෝචනයට පාත්‍රවූ සියවස්

20. ඉති තම්බපණ්ණියෙන..... බුද්ධදත්තෙන...., විනයවිනිච්ඡය සමාප්තිපාඨය.

දසයක් තරම් කාලපරිච්ඡේදය තුළ උත්තරභාරතයෙහි ප්‍රචලිතව පැවති මහාරාෂ්ට්‍රී, සෞරසේනී, මාගධී, අර්ධමාගධී, පෛශාචී යනුවෙන් ප්‍රධාන ප්‍රාකෘතභාෂාවන් පහක් හා ඊට අදල අපභ්‍රංසයන් ගැන අසන්නට ලැබේ. අට්ඨකථාචාර්යවරයන් ඇතුළු පුරාණාචාර්යවරයන් පාළිය (පෙළ) හැඳින්වීම පිණිස යොදගත් 'තන්තිභාසා', 'මාගධිකනිරුත්ති', 'මාගධිකවොහාර', 'පාවචන' ආදී අභිධාන කීපයක් ඇත. 'තන්තිභාසා' යනු පාළියෙහි (පෙළෙහි) භාෂාව යන අරුත දෙයි. 'මාගධිකවොහාර', 'මාගධිකනිරුත්ති' යනුවෙන් අදහස්වූයේ කුමක්ද? 'මාගධී' යනුවෙන් හැඳින්වෙන මධ්‍යතන ප්‍රාකෘත භාෂාවද? ඉහත සඳහන් ප්‍රාකෘත භාෂා අතුරෙන් සෙසු භාෂාවලට වඩා, මාගධී භාෂාව හා පාලිභාෂාව අතර විශේෂ නෑහුරුකම්ද විරලය, එහෙත් නැත්තේම නොවේ. 'වනපපගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ' යන මෙහි එ-කාරාන්ත කොට යෙදූ ප්‍රථමා විභක්ති ඒකවචන රූපද 'යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ' යන මෙහි 'ආසෙ' (වෛදික - ආසඃ) යන ප්‍රථමා බහුවචන ප්‍රත්‍යයද මාගධී හෝ අර්ධමාගධී සබඳකම් නොදක්වනුයේ නොවේ. එහෙත් පාලිභාෂාව 'මාගධී' යන නමින් හඳුනාගැනීමට එය ප්‍රමාණවත් සාධකයක් නොවේ. මාගධීභාෂාවට වඩා පෛශාචී භාෂාවට පාලිභාෂාවේ ඇති සබඳකම් අධිකතරබව ස්ටෙන් කොනොව්, ජෝර්ජ් ග්‍රියර්සන් වැනි අපරදිග විද්වත්හු පෙන්වාදෙති.[21]

'මාගධී' යනුවෙන් අදහස් වනුයේ එනම් මධ්‍යතන ප්‍රාකෘත භාෂාව නොව 'මගධ රාජ්‍යයෙහි නිර්මාපිත භාෂාවයයි ගතහොත් මේ ගැටලුව බොහෝ දුරට විසදෙතැයි හැඟේ. තෙවන සංගායනා කාලය වනවිට බුද්ධකාලයෙහි එතරම් විශාල ප්‍රදේශයක්ව නොපැවති මගධරාජ්‍යය අතිවිශාල මෞර්ය අධිරාජ්‍යයබවට පත්වී තිබිණි. එවකට බුදුසමය පැතිරී තිබුණේද මෙම මෞර්ය රාජ්‍යයට අයත් පෙදෙස්වලය. පළමුවන, දෙවන, තුන්වන සංගායනා පවත්වනලදුයේද එම රාජ්‍යයතුළ පිහිටි රාජගහ, වේසාලී, පාටලීපුත්‍ර යන නගර ආශ්‍රය කොටගෙන මගධ රජවරුන්ගේම අනුග්‍රහයෙනි. පසුව බුදුසමය හා සමග මෙම 'මාගධී නිරුක්තිය'ද පිටත ප්‍රදේශවලට පිවිසෙන්නටවූවිට හැඳින්වීම පිණිස 'මාගධී' යන නම ව්‍යවහාරවූසේ පෙනේ. 'මාගධිකනිරුත්ති' 'මාගධිකවෝහාර' යන නම් ප්‍රචලිතවූයේ බුද්ධඝෝෂ, බුද්ධදත්ත, ධම්මපාල

---

21. ශ්‍රී ලංකා ප්‍රාචීනභාෂෝපකාර සමාගමේ ශාස්ත්‍රීය සඟරාව, 1981 27 වන පිටුව, පොල්වත්තේ ශ්‍රී බුද්ධදත්ත නාහිමි: පාලිසාහිත්‍යය, 15 වන පිටුව.

යන අට්ඨකථාචාර්යවරයන්ගේ මාර්ගයෙනි. මෙම අට්ඨකථාචාර්යයන් තිදෙනාම ද්‍රවිඩභාෂා කථාකරන දඹදිව දකුණු ප්‍රදේශවල වැසියන්වීම විශේෂයෙන් සැලකිය යුතුය. ඔවුන් තම භාෂාවෙන් මෙම භාෂාව වෙන්කොට හැඳින්වීමට 'මාගධී' යන නම යොදගත් සේ පෙනේ. (පාලි යනු 'පාළි' යන්නෙහි සංස්කෘත රූපයයි. පෙළෙන් වෙන්කොට භාෂාව වෙසෙසා දක්වීමට එය යෙදේ). ඒ නිසා 'පාලි' යනු 'පාළි' යන්නෙහිම විකෘතියක් බව පැහැදිලිය. මුල් අට්ඨකථාවලට පසුව ව්‍යවහාරයට පත් 'පාලි' යන නාමය ලාංකික ආචාර්යයන් විසින් ඇතිකරගත් එකක් සේ සැලකිය හැකිය.

## මූලභාෂා සංකල්පය

මාගධී (පාලි) භාෂාව 'මූලභාෂා' යනුවෙන්ද හඳුන්වා ඇත.[22] මෙසේ හැඳින්වීමට ඇති හේතුයුක්ති කවරේද? මුළුමහත් භාරතදේශය පුරා පැතිරිඇති භාෂා වැඩි කොටසක් ප්‍රධාන ගණ දෙකකට බෙදිය හැකිය. දකුණු කෙළවරෙහි ව්‍යවහාර වන දෙමළ, මලයාලම්, කර්ණාට හෙවත් කණ්ණාරා ආන්ධ්‍ර හෙවත් තෙළිඟු යන හතර ද්‍රාවිඩ ගණයට අයත් වේ. මහාරාෂ්ට්‍ර, මධ්‍යප්‍රදේශ, ඕරිස්සා ප්‍රාන්ත ඇතුළු උතුරු පෙදෙස්වල පැතිරිඇති භාෂා සියල්ලම ඉන්දු ආර්ය ගණයට වැටේ. ඉන්දු-ආර්ය භාෂා සියල්ලම එකම මූලයකින්, එනම් ක්‍රි. පූ. 2500 දී පමණ ඉන්දියාවට සංක්‍රමණය වූහයි සැලකෙන ආර්යයන් කථාකළ භාෂාවෙන් පැවත එයි. ඉන්දු-ආර්ය භාෂා හා යුරෝපය පුරා පැතිර ඇති භාෂා අතර ඇති සබඳකම්ද වාග්විද්‍යාඥයන් විසින් පෙන්වා දී ඇත. මෙම ඉන්දු-යුරෝපීය භාෂා පවුලට අයත් දැනට විද්‍යමාන පැරණිතම සාහිත්‍යය ඍග්වේදයයි. ඍග්වේදය රචනා කොටඇත්තේ ආර්යයන් ඉන්දියාවට සංක්‍රමණයවූ කාලයේදීමය. ඇතැම් කොටස් එයටත් වඩා පැරණි කාලයකට අයත් වියහැකිය. සියලුම ඉන්දු-ආර්ය භාෂාවල මූලය මෙකී වෛදික භාෂාවයි. පාලිභාෂාව හා වෛදිකභාෂාව අතර ඇති නෑහුරුකම්ද බොහෝය. ඇතැම්විට පාලිභාෂාව හා වෛදිකභාෂාව අතර ඇති සබඳකම් සංස්කෘත භාෂාව හා එම (වෛදික) භාෂාව අතර ඇති සබඳකම්වලට වඩා ඈතට යයි. වෛදික භාෂාවෙහි දක්නට ලැබෙන, එහෙත් සංස්කෘත භාෂාවෙන් ගිලිහී ගිය, ත්වාන, -තුන ආදී පූර්වක්‍රියා ප්‍රත්‍යයන්ද, -තවෙ, -තායෙ ආදී තු- ප්‍රත්‍යයාන්තයන්ද පාලිභාෂාවෙහි ඉතිරිවී තිබීම නිදසුනෙකි. මෙසේ පුරාණතම ඉන්දු-ආර්ය භාෂාවට ඇති කිට්ටු නෑහුරුකම්

---

22. එම: 'සභාවනිරුත්තියා මාගධිකාය සබ්බසත්තානං මූලභාසාය'

අනුව සලකන කල (වෛදික > -පාලි) මාගධී හෙවත් පාලි භාෂාව 'මූලභාෂා'යයි හැඳින්වීම යෝග්‍ය වියහැකිය.

තවද පස්වන ක්‍රි. සියවස වනවිට බ්‍රාහ්මණික ආගම් දර්ශනාදිය ඇතුළු ආර්යසංස්කෘතිය දකුණට පැතිරීම සම්පූර්ණවී තිබිණි. පසු කලක වේදය විවරණය කරමින් භාෂ්‍යයන් කළාහුද සායන, මාධව, විද්‍යාරණ්‍ය ආදී දක්ෂිණාත්‍ය ආචාර්යවරයෝය. සංස්කෘත භාෂාව මහායානිකයන්ගේ මෙන්ම ඔවුන්ගේද සංස්කෘතික භාෂාව විය. ථේරවාද බුදුසමයද දකුණු ප්‍රදේශවල මුල් බැසගෙන පැවතිබව ඉහත සඳහන් විය. ඔවුන්ගේ සංස්කෘතික භාෂාව මාගධී (පාලි) භාෂාව විය. මේ හේතුවෙන් දකුණෙහි ද්‍රවිඩ භාෂාවලට (සිංහල භාෂාවට මෙන්ම) සංස්කෘත පාලි භාෂාවල වචන අති විශාල සංඛ්‍යාවක් තත්සම තත්භව වශයෙන් වැදගෙන ඇත. මෙය කෙතරම් බහුල ලෙස සිදුවී ඇත්දැයි කිවහොත් ඇතැම් භාෂාවල ද්‍රවිඩ ස්වරූපය බොහෝ දුරට මැකී ගොස් ඇත. (උදා: මලයාලම්). අට්ඨකථාචාර්යයන් මාගධිය මූලභාෂායයි සලකා ඇත්තේ සිංහල උගතුන් පාලි සංස්කෘත භාෂා මාතෘභාෂායයි ව්‍යවහාර කරන අර්ථයෙන්යයිද අනුමාන කළහැකිය. මේ කාලය වනවිට හින්දු දහම ඇතුළු බ්‍රාහ්මණික සංස්කෘතිය මෙන්ම ථේරවාද බුදු දහමත් පිළිබඳ ගුරුත්වකේන්ද්‍රය දකුණට සංක්‍රමණය වී පැවති හෙයින් සංස්කෘත භාෂාව මෙන්ම පාලි භාෂාවද දක්ෂිණාත්‍යයන්ගේ නොමද ගෞරවයට පාත්‍රවී තිබිණි. හින්දු භක්තිකයන් සංස්කෘත භාෂාව දෛවීභාෂා හෙවත් දෙවියන්ගේ භාෂාව ලෙස සැලකූ අතර, ථේරවාදී බෞද්ධයෝ මාගධී (පාලි) භාෂාව මූලභාෂායයිද, ආදිකල්පිකයන්, බ්‍රහ්මයන්, උපන් කෙණෙහි ළදරුවන් හා බුදුවරයන් වහරන භාෂාවයයි පැවසූහ.[23]

### පාලිභාෂාව කෘත්‍රිම භාෂාවක්ද?

'අනුජානාමි භික්ඛවෙ සකාය නිරුත්තියා බුද්ධවචනං පරියාපුණිතුං' යන පාඨයෙහි 'සකාය නිරුත්තියා' යන්නෙන් අදහස් වනුයේ කුමක්ද? බුදුන්වහන්සේගේ සියබසද? නැතහොත් ශ්‍රාවකයන්ගේ මව්බසද? අට්ඨකථාචාර්යවරයෝ 'සකා නිරුත්ති' යන්නට 'මාගධිකවොහාරො'යි අර්ථ දක්වති. ඔවුන් මෙයින් අදහස් කළේ බුදුන්වහන්සේගේ මව්බස වියයුතුය. එහෙත් බුදුන්වහන්සේගේ මව්බස කුමක්වුවද එය මාගධිය

23. 'සා මාගධී මූලභාසා නරායාණාදිකප්පිකා
බ්‍රහ්මානො ච'ස්සුතාලාපා සම්බුද්ධා චාපි භාසරෙ',

මහාරූපසිද්ධි, සඤ්ඤ.

නොවිය හැකිවබව හේතුයුක්ති සහිතව දක්වන පොල්වත්තේ සිරි බුද්ධදත්ත නාහිමියෝ අට්ඨකථාචාර්යවරයන්ගේ විවරණය ඉතා නිවැරදිවම පිළිකෙව් කරති.[24] 'සකා නිරුත්ති' යනුවෙන් අදහස් වනුයේ පරියාපනය (පරිආප්තුං, පරියාපුණිතුං) කරන්නාගේ, ශ්‍රාවකයාගේ බසබව පැහැදිලිය.

නන්දෙසින් පැමිණ සසුන්ගතවූ භික්ෂූහු තමතමන්ගේ මව්බසින් බුද්ධවචනය උගෙන පෙළ වනපොත් කොටගෙන මුඛපරම්පරාවෙන් පවත්වාගෙන ආහ. මේ හේතුකොටගෙන කල්යාමේදී නොයෙක් ගැටලු පැනනගින්නට ඇත. මෙය වලක්වාගැනීම පිණිස කවර හෝ එක් භාෂාවකින් ආහච්චභාසිත බුද්ධවචනය පවත්වාගතයුතු විය. මේ සඳහා යොදගතනුලබන භාෂාවද කථාව්‍යවහාරයෙහි පවත්නා භාෂාවක් නොවීම යෝග්‍යතර වේ. පොදුජන ව්‍යවහාරයෙහි පවත්නා කවර භාෂාවක්වුවද අක්ෂර - පද - වාක් - ප්‍රයෝගවශයෙන්ද අර්ථප්‍රයෝගවශයෙන්ද විවිධ විකෘතීනට භාජනවීම ස්වභාවසිද්ධ වේ. එහෙයින් මාගධික වෝහාර, තන්ති භාෂා, පාලි ආදී නම්වලින් හැඳින්වෙන මෙම භාෂාව කිසියම් ප්‍රාකෘත භාෂාවක් ඇතැම්විට භාෂා කිහිපයක් පදනම් කොටගෙන සකස් කරගන්නාලද ශාස්ත්‍රීය භාෂාවක් සේ පෙනේ. මෙසේ ආහච්චභාසිත බුද්ධවචනය සකස් කරගත් කෘත්‍රිම භාෂාවකට නැඟීම තෙවන සංගායනාව කල, නැතහොත් එයට තුදුරු කාලයකදී වුසු, ශාසනභාරධාරී මහතෙරවරුන් විසින් එම බුද්ධවචනය නොවෙනස්ව පවත්වා ගැනීමේ අටියෙන්ම කරනලදබව සැලකියහැකිය.

මෙවන් ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙළඹීම ආකස්මිකව සිදුවූ දෙයක්ද නොවේ. මේ කාලය වනවිට මෙවැනිම ක්‍රියාමාර්ගයෙක සාර්ථක ප්‍රතිඵල පිළිබඳ අත්දකීම් උත්තරභාරතීයයන් සතුව පැවතිණි. කෘත්‍රිමභාෂාවක් පිළිබඳ සංකල්පය බෞද්ධයනට පමණක් ආවේණිකවූ දෙයක් නොවේ. සංස්කෘත භාෂාවද, නමින්ම හැඟීයන සේ, කෘත්‍රිම භාෂාවක් විය. ක්‍රි. පූ. සිවුවන සියවස තරම් ඈත යුගයෙකදී (කථාව්‍යවහාරයෙන් තොර) සාහිත්‍යමය භාෂාවක් බවට පත්ව තුබූ එය ක්‍රි. පූ. දෙවන සියවසේදී පමණ පාණිනී, පතඤ්ජලී, චන්‍ද්‍රගෝමින් ආදී ශබ්දශාස්ත්‍රඥයන් විසින් ව්‍යාකරණග්‍රන්ථයන් මගින් තවදුරටත්

---

24. පාලිසාහිත්‍යය, 1 වන පරි., 9-15 වන පිටු

ක්‍රමානුකූලව සකස්කොට ස්ථාවර බවට පත්කරන ලදි.[25] මේ හේතුකොටගෙන සංස්කෘත භාෂාව හුදෙක් කාව්‍යමය භාෂාවක් වශයෙන්ම නොපැවත ශාස්ත්‍රීය භාෂාවක් ලෙසද ස්ථාපිත විය. භාරත දේශයෙහි උපන් සියලුම ශිල්ප-ශාස්ත්‍ර-විද්‍යා-ආගම්-දර්ශන ආදිය පිළිබඳ කෘති මෙම භාෂාවට නඟා සුරක්ෂිතකොට ඇත. කණිෂ්ක අධිරාජයාගේ කාලයේදී, එනම්: ක්‍රි. පූ. දෙවන සියවස මැද භාගයේදී මහායාන බුදු දහමේ මාධ්‍යයද සංස්කෘතභාෂාව විය.

## පාලිභාෂාවේ වර්ධනය

ඉහත කී ආකාරයෙන් සකස්කරගන්නාලද භාෂාවට නඟන ලදුයේ පාළිය (පෙළ) පමණෙකි. අට්ඨකථා පෙරපරිදිම දේශීය භාෂාවලින්ම පැවතියේය. 'සීහළට්ඨකථා'. 'අන්ධට්ඨකථා' ආදී ව්‍යවහාරයන්ගෙන් ඒ බව පැහැදිලි වේ. සිවුවන පස්වන ක්‍රිස්තු සියවස් වනවිට ථෙරවාදී බුදුදහම ඉන්දියාවේ දකුණු ප්‍රදේශවලද, ශ්‍රී ලංකාවතුළද, අවට අග්නිදිග ආසියාතික රටවලද ව්‍යාප්තව පැවතියේය. මේ රටවල් අතර සබඳකම් පවත්වා ගැනීම පිණිස පොදු භාෂාමාධ්‍යයක් අවශ්‍යවිය. මෙය සඳහා ඉතා යෝග්‍යවූයේ 'මාගධීනිරුත්ති,' 'තන්තිභාසා', 'පාලි' ආදී නම්වලින් හැඳින්වුණ භාෂාවයි. එතෙක් ප්‍රවචන සාහිත්‍යයට පමණක් සීමාවී පැවති එය මෙකී අවශ්‍යතාව සඳහා යොදගැනීමට නම් එය තවදුරටත් වර්ධනය කරගතයුතුවිය. එහෙයින් එවකට ප්‍රචලිතව පැවති ප්‍රාකෘතභාෂාවන්ගෙන්ද, එවකට මහායානිකයන් ස්වකීය මාධ්‍යය කොටගෙන තුබූ සංස්කෘත භාෂාවෙන්ද ඇදගත් වචන රාශියක් 'මාගධික නිරුත්තියට' අවිරුද්ධ වනසේ තත්සම තත්භව වශයෙන් යොදගැනීමෙන් මෙම අවශ්‍යතාව සපුරාගත්බව පෙනේ. පාලි අට්ඨකථායුගයට පෙර රචනා කරනලදැයි සැලකෙන ග්‍රන්ථයක්වන නෙත්තිප්පකරණය එවකට

---

25. මෙහිදී 19 වන සියවස අගභාගයේදී පුරාතන හා නූතන යුරෝපීය භාෂාවන්ද ඉන්දු-ආර්යභාෂාවන්ද එකිනෙක සංසන්දනය කරමින් ආදිකල්පික ඉන්දු-යුරෝපීය භාෂාව ප්‍රතිනිර්මාණය කිරීමට යුරෝපීය වාග්විද්‍යාඥයන් විසින් දරනලද පරිශ්‍රමය පිළිබඳ චමත්කාරජනක පුවත සිහියට නැගේ. මෙම කෘත්‍රිම ඉන්දු-යුරෝපීය භාෂාව ආර්ය භාෂා කථාකරන ජාතීන් අතර පොදු ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් පිළිගැන්වීමට ඔවුන් දැරූ උත්සාහය පළමුවන ලෝක යුද්ධයට ප්‍රථම යුරෝපයේ පැවති අන්තර් ජාතික නොසන්සුන්කම නිසා අසාර්ථක විය. පළමුවන ලෝකයුද්ධයෙන් පසුව පිහිටුවනුලැබූ ජාතීන්ගේ සංගමයට (League of Nations) නැවත මෙම යෝජනාව ඉදිරිපත්කරනලදුව සාකච්ඡාවට භාජන කළයුතු යෝජනාවක් වශයෙන් එහි න්‍යායපත්‍රයට ඇතුළත්ව එම සංගමය අභාවයට යනතෙක්ම තිබුණබව කියනුලැබේ.

ජනවහරින් බැහැරවෙමින් පැවතුණ පාලියෙහි ගැටලු තැන් පැහැදිලි කිරීමේ අරමුණින් කරනලදසේ සැලකේ.[26] අක්ඛර, පද, ව්‍යඤ්ජන, නිරුත්ති ආදී වශයෙන් රචනාකොට ඇති මෙම ග්‍රන්ථය 'පාලි' භාෂාව ඉහතකී අවශ්‍යතාව සඳහා හැඩගස්වාගැනීමට උපදෙස් සපයන කෘතියක් වශයෙන්ද සැලකිය හැකිය. කෙසේ හෝ වේවා පාලි අට්ඨකථායුගය වනවිට මෙම භාෂාව ලෞකිකවූද ලෝකෝත්තරවූද විවිධ අදහස් ප්‍රකාශකිරීමේ හැකියාව ඇති, වාංමාලාවෙන් පොහොසත්, සුබනම්‍ය ලිඛිතභාෂාවක්බවට පත්ව තිබුණබව පෙනේ.

මෙහිදී මෙම භාෂාව හැදීවැඩී දියුණුව ගියේ කොහිදීද යන ප්‍රශ්නය පැනනඟියි. අපරට බොහෝ විද්වත්හු පාලිභාෂාව අනුරාධපුර මහාවිහාරය මුල්-කොටගෙන වැඩීගියබව විශ්වාස කරති. ඇතැමෙක් එය මහාවිහාරික භික්ෂූන්ගේ නිර්මාණයකැයි පැවසීමට තරම් සාහසික වූහ. අට්ඨකථායුගයෙන් පසු ප්‍රකරණයුගය පිළිබඳවනම් මෙම මතය නිවැරදිවිය හැකිය. එහෙත් අපගේ විමසීමට පාත්‍රවී ඇති ප්‍රාග්-අට්ඨකථායුගය පිළිබඳව මෙය නිවැරදි නොවේ. මේ යුගය වනවිට එය මහාවිහාරය මතු නොව දකුණු දඹදිව ථේරවාදී මධ්‍යස්ථානයන්ද, ඇතැම් විට බුරුම, සියම් ආදී සෙසු ථෙරවාදී රටවල්ද අතර අන්‍යොන්‍ය සම්බන්ධතා පවත්වාගැනීමේ මාධ්‍යය බවට පත්වී තිබුණබව පෙනේ. බුද්ධඝෝෂහිමියන් මෙන්ම පාලි අට්ඨකථාවිෂයයෙහි පුරෝගාමීන් වන බුද්ධදත්තපාදයන්ද, බදරතිත්ථවාසී ධම්මපාල ආචාර්‍යයන්ද, මහාවිහාරය සතුව තුබූ හෙළඅටුවා වටහාගැනීමට තරම් භාෂාඥනයක් ලබාගැනීමෙහි සැලකියයුතු තරම් කාලයක් නිරත වන්නට ඇත. එහෙත් පාලිභාෂාව පිළිබඳව මහාවිහාරයෙන් ලබාගතයුතු දෙයක් ඔවුනට තිබුණසෙයක් නොපෙනේ. බුද්ධඝෝෂහිමියන්ගේ විසුද්ධිමග්ගයෙහිද, බුද්ධදත්තපාදයන්ගේ අනුෂ්ටුභ් ගාථා පන්දහස් තිහකින් සමන්විත[27] විනයවිනිච්ඡය නම් මහාග්‍රන්ථයෙහිද දක්නට ඇති පරිසමාප්ත භාෂාවිලාශයත් ව්‍යක්ත රචනාශෛලියත් අනුව මෙම නිගමනයට බැසගතහැකිය. අනෙක් අතින් ප්‍රාග් අට්ඨකථායුගයට අයත් ලාංකික ආචාර්යවරයන්ගේයයි දක්වියහැකි කෘති මොනවාද? දීපවංසයත් චීනපරිවර්තනයක් ශේෂ කොට තබා අතුරුදන්වී ඇති විමුත්තිමග්ගයත් පමණි. බුද්ධදත්තපාදයන්ගේ විනයවිනිච්ඡය භාසමග සසඳනවිට දීපවංසයෙහි ඇති දිළිඳුබව ප්‍රකටව

---

26. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය: බුදුසමයේ ලාංකෙය වර්ධනය 5-7 වන පිටු

27. උත්තර (විනය) විනිච්ඡය සමාප්ති ගාථා

පෙනේ. එපමණක් නොව ප්‍රථම පාලිව්‍යාකරණග්‍රන්ථය වන කච්චායන නම් කෘතියෙහි කතුවරයාද, පසුකලෙක ඒ අනුවම යමින් කළ වඩා සවිස්තර කෘතියක් වන මහාරූපසිද්ධි නම් කෘතිය කළ බුද්ධප්පිය නම් ආචාර්යවරයන්ද දඹදිව් වැස්සෝම වූහ. මේ අනුව ප්‍රාග්අට්ඨකථායුගයෙහිදී පාලිභාෂා පෝෂණය සිදුවූයේ ප්‍රධානවශයෙන් දකුණු දඹදිව ථේරවාදී මධ්‍යස්ථානවලදීබව නිගමනය කළහැකිය.

තවද පාලිභාෂාව මහාවිහාරයට පමණක් විශේෂවූ උරුමයකියි යන විශ්වාසයද නිවැරදි නොවේ. පසුකලක කෙසේ වෙතත් ප්‍රස්තුත කාලපරිච්ඡේදය තුළ එය මහාවිහාරයෙහි ඒකාධිකාරයක් නොවීය. ඉහත සඳහන් විමුත්තිමග්ග අභයගිරිවිහාරයට අයත් කෘතියක් බව මෙහි මතු දැක්වෙන කරුණුවලින් පැහැදිලි වේ. පාලිභාෂා සාහිත්‍යය අනෙක් විහාර දෙක විසින්ද හදරනලදබවත් එහි පෝෂණය සඳහා එම විහාර දෙකින්ද යම් පමණෙක සේවාවක් ඉටුවන්නට ඇතිබවත් සද්ධම්මෝපායන නම් පාශ්චාත්‍ය කෘතියෙන්ද හෙළිවේ.

**බුද්ධඝෝෂාචාර්ය හිමියෝ**

පාලි අට්ඨකථාචාර්යවරයන් අතුරෙන් ප්‍රමුඛස්ථානයෙහි සිටින බුද්ධඝෝෂපාදයන් පිළිබඳ පෞද්ගලික තොරතුරු අසන්නට ඇත්තේ ඉතා මඳවශයෙනි. මහාවංස 37 වන පරිච්ඡේදයෙහි 215-247 වන ගාථා හා බුරුම කතුවරයකුගේයයි සැලකෙන **'බුද්ධඝෝසුප්පත්ති'** නම් කෘතියද මේ පිළිබඳව ඇති සවිස්තර වාර්තා දෙකක්වුවද ඒවායෙහි දැක්වෙන තොරතුරුවල නිරවද්‍යතාව ගැන සැකයක් මතුවේ. මෙම වාර්තාවල දැක්වෙන ඇතැම් කරුණු බුද්ධඝෝෂපාදයන්ම ස්වකීය කෘතිවල පවසන දෙය හා නොසැසඳෙන හෙයිනි. මෙම වාර්තා දෙකෙහිම මුලින්ම සඳහන් බුද්ධඝෝෂපාදයන්ගේ ජන්මභූමිය ගැන පැවසෙන දෙය නිදසුනක් ලෙස දැක්වියහැකිය, එනම්: ඔවුන්ගේ උපත මහබෝමැඩ අසල ගමෙක සිදුවූබවය. මේ වාර්තා දෙකෙහි සඳහන් කරුණු වෙනත් මූලාශ්‍රයවලින් ලැබෙන සාක්ෂ්‍ය හා සමග සැසඳෙතොත් මිස එලෙසින්ම පිළිගැනීම යෝග්‍ය නොවනබව මෙයින් පෙනේ. එහෙයින් බුද්ධඝෝෂපාදයන්ම තමන් ගැන පවසන කරුණු විමසා බැලීම සුදුසුය. විසුද්ධිමග්ග සමාප්ති පාඨයෙහි තමන් ගැන පෞද්ගලික තොරතුරු ස්වල්පයක් ඔහු හෙළි කරති. **'බුද්ධඝොසො'ති ගරූහි ගහිතනාමධෙය්‍යෙන ථෙරෙන මොරණ්ඩ ඛෙටකවත්ථබ්බෙන'** යන මෙහි **'මොරණ්ඩඛෙටකවත්ථබ්බෙන** යන්නෙන් අදහස්වනුයේ මෝරණ්ඩඛෙටක නම් ගමෙහි[28] විසියයුත්තෙකු, වැසියෙකු

වනබවයි. (වස් + තබ්බ, වත්ථබ්බ) යනුවෙන් මෙය සිද්ධයි [29] 'වත්ථබ්බ' යනුවෙන් අදහස්කළේ ඉදිරියට විසියයුතු ස්ථානයක් නොවියහැකිය. එවැන්නක් සඳහන් කිරීමේ වැදගත්කමක් නැත. එහෙයින් තමන් උපන්ගම අදහස්කළ සේ ගැනීම වඩා යෝග්‍යවේ. **'බුද්ධඝොසො'ති ගරූහි ගහිතනාමධෙය්‍යෙන'** යනුවෙන් බුද්ධඝෝෂ යන නම ගුරුන්ගෙන් ලැබුණබව ඔවුහු පවසති. කෙනෙකු සසුන්ගත වීමේදී ගිහිනම වෙනුවට ශාසනික අභිධානයක් ලැබීමේ සම්ප්‍රදය අද මෙන්ම එදද පැවතිබවත් ඇතැම් විට එයටත් වඩා ඈතක සිට පැවතෙන්නක්බවත් මෙයින් පෙනේ. තවද පැවිද්දෙකු සමානනම් ඇති අන්‍යයන්ගෙන් වෙසෙසනු පිණිස නම හා සමග උපන්ගම යෙදීමද චිරාගත සම්ප්‍රදයයෙකි. බුද්ධදත්තපාදයන්ද උත්තර (විනය) විනිච්ඡය සමාප්ති පාඨයෙහි **'උරගපුරෙන බුද්ධදත්තෙන'** යනුවෙන් තමන් හඳුන්වාගැනීමෙන් මෙය වඩාත් පැහැදිලිවේ. මේ කරුණු අනුව බුද්ධඝෝෂපාදයන් උතුරු දඹදිව ගයාවෙහි නොව දකුණු දඹදිව උපන් කෙනෙකුබව නිගමනය කළහැකිය.

එම පාඨයෙහිම, **'සකසමය-සමයන්තර-ගහනජ්ඣොගාහන-සමත්ථෙන'** යනුවෙන් තමන් ස්වසමය සමයාන්තරයන් මැනවින් හදළ කෙනෙකුබවත්, **'තිපිටක-පරියත්තිභෙදෙ සාට්ඨකථෙ සත්ථුසාසනෙ අප්පටිහතඤාණප්පභාවෙන'** යනුවෙන් අට්ඨකථා සහිත ත්‍රිපිටක ධර්මයෙහි විශාරදඥානයෙන් යුක්තවූවෙකුබවත්', **'මහාවිහාරවාසීනං වංසාලඞ්කාරභූතෙන** යනුවෙන් මහාවිහාරවංශයට අලංකාරයක්වූබවත් පවසති. තමන් ගැනම පවසන මේ විශේෂණයන් අතිශයෝක්තීන් ලෙස නොගතහැකිබව සෙසු කෘතීන් පසෙක තබා විසුද්ධිමග්ගයෙන්ම තහවුරු කළහැකිය. බුද්ධඝෝෂපාදයන් පාලිභාෂාසාහිත්‍ය විෂයයෙහි මනා පටුත්වයක් ඇත්තෙකුබව ඔවුන්ගේ සෙසු කෘතීන්ගෙන්ද ඔප්පුවේ. උන්වහන්සේ සංස්කෘත භාෂාවෙහිද විශාරදයෙකුබව බුද්ධඝෝසුප්පත්තියෙහි එන සඳහනකින් පැවසේ. මේ අනුව බුද්ධඝෝෂපාදයන් ලක්දිවට එන්නට ප්‍රථම ත්‍රිපිටක බුද්ධධර්මය, පාලි, සංස්කෘත, සිංහල ආදී භාෂාවන්ද මනාව දත සිටිබව පැහැදිලිය. මහායාන දර්ශනයද, සාංඛ්‍ය-වේදන්තාදී හින්දු දර්ශනයන්ද දත සිටින්නට ඇත. ඔවුන් මේ දැනුම්සම්භාරය දකුණුදඹදිව ථේරවාදී මධ්‍යස්ථානයන්හිදී හෝ නාගර්ජුනීකොණ්ඩ,

---

28. මෝරණ්ඩඛෙටක නම් ගම හඳුනාගැනීම පිණිස විද්වතුන් විසින් දරන ලද උත්සාහයන් පිළිබඳව: Bhikkhu Nanamali:Path of Purification, Introduction, f. n. 8 බලන්න. අධොලිපි 14ද බලන්න.

29. වස් + තු = වත්ථු වස් + ත්‍ර = වත්ථ, සාස් + තු = සත්ථු ආදිය සසඳන්න.

අමරාවතී වැනි මහායාන මධ්‍යස්ථානයන්හිදී හෝ ලබාගන්නට ඇත. වැඩි ශක්‍යතාව ඇත්තේ දකුණු දඹදිව දෙසටවුවද මහාවංසය මෙන්ම බුද්ධඝෝෂුප්පත්තියද ඔවුන් ගයාවට සම්බන්ධ කොට ඇතිහෙයින් උතුරු දඹදිව මුළුමනින්ම බැහැර නොකළහැකිය.

මහාවංසයෙහි මෙන්ම බුද්ධඝෝෂුප්පත්තියෙහිද දක්වෙනුයේ විසුද්ධිමග්ගය ඉතා කෙටිකලකින් කරනලදබවයි. එහෙත් ලිවීමේ තාක්ෂණක්‍රම හා මුද්‍රණශිල්පය මෙතරම් දියුණුවී ඇති මේ යුගයේපවා දනට විද්‍යමාන විසුද්ධිමග්ගය වැනි ග්‍රන්ථයක් ලියා ප්‍රකාශයට පත්කිරීමට කොපමණ කලක් ගතවේද? එහෙයින් එය ප්‍රථමයෙන් ලියන්නට ඇත්තේ ඉතා සංක්ෂිප්ත සාරාංශයක් වශයෙන් බවත්, එහි සැලැස්ම හා සැකිල්ල මහාවිහාර සංඝසභාව විසින් අනුමත කරනු ලැබීමෙන් පසු, ත්‍රිපිටක උද්ධෘත පාඨයන්ද, මහාඅට්ඨකථා, මහාපච්චරී, කුරුන්දිය යන හෙළ අටුවාවල ඇතුළත් කරුණුද ඇදගනිමින් අතිවිස්තරාත්මක ග්‍රන්ථයක්ලෙස පසුව සංස්කරණය කරන්නට ඇතිබවත් විශ්වාස කළහැකිය. බුද්ධඝෝෂාචාර්යයන් විසින් මහාවිහාරයෙහිදී කරනලද ප්‍රථම කෘතිය විසුද්ධිමග්ගයබවට සැකයක් නැත. එහෙයින් ඔවුන් විසින් පසුව කරනලද පාලිඅට්ඨකථාවන්හි විසුද්ධිමග්ගාගතකරුණු ගැන සඳහන්කිරීමත්, පාඨකයා එම කරුණුවෙතට යොමුකරවීමත් අරුමයක් නොවේ. බුද්ධඝෝෂපාදයන්ගේමයයි නිසැක ලෙස හඳුනාගතහැකි කෘතීන්හි එකිනෙකට කළ සඳහන් හා යොමුකිරීම් සුලබය. මේ හේතුවෙන් එම කෘතීන් කරනලද අනුපිළිවෙළ තීරණය නොකළහැකිය.[30] මෙයින් පෙනීයනුයේ බුද්ධඝෝෂපාදයන් ස්වකෘතීන් නැවත සකස්කළබවයි. අත්ථසාලිනිය ලක්දිවට එන්නට ප්‍රථම කළබව පැවසේ. එහෙත් එහිද පසුව කළ අට්ඨකථාවෙතට යොමුකිරීම් දක්නටඇත.

## විමුත්තිමග්ග හා විසුද්ධිමග්ග

පාලි අට්ඨකථායුගයට පෙරාතුව කරනලදයි සලකනුලබන විමුත්තිමග්ග නම් කෘතියක් ගැන ඉහත සඳහන්විය. අභාවයට ගොස් ඇති මෙම කෘතිය ගැන යමක් දනගතහැකි වනුයේ සවන ක්‍රි. ව. සියවසේදී පමණ කරනලද චීන පරිවර්තනයක් මගිනි. මෙහි සැලැස්ම සීල, සමාධි, පඤ්ඤා, විසුද්ධි යනුවෙන් කොටස් හතරෙකින් යුක්තවූබව

30. E. W. Adikarm : Early History of Buddhism in Ceylon, Chapter I, p. 4 කාල නිර්ණය සඳහා තවද බ. Jayawickrama: Inception of Discipline & Vinayanidana පි. xxiv. සිට.

පෙනේ. අවසන් කොටස අත්හළවිට විසුද්ධිමග්ගයෙහි සැලැස්මද මෙය වේ. විසුද්ධිමග්ගයෙහි සැලැස්මතුළ අංගයක්වශයෙන් මෙය යොදගෙන නැතත්, **සීලවිසුද්ධි චිත්තවිසුද්ධි** යන දෙක මුල් පරිච්ඡේදයන් මගින්ද, **දිට්ඨිවිසුද්ධි, කංඛාවිතරණවිසුද්ධි, මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි, පටිපදාඤාණදස්සනවිසුද්ධි, ඤාණදස්සනවිසුද්ධි** යන පස, අටළොස්වනපරිච්ඡේදයේ පටන් දෙවිසිවන පරිච්ඡේදය තෙක් පරිච්ඡේද පසින්ද විස්තර කොට ඇත. තවද කුතුල් දනවන කරුණක් වනුයේ 'විසුද්ධි' යන පදයම මුලට යොදගෙන බුද්ධඝෝෂපාදයන් ස්වකීය කෘතිය නම්කොට ඇතිබවයි. ග්‍රන්‍ථ දෙකෙහි නම්වලද, සැලැස්මෙහිද, අන්තර්ගත විෂය අනුවද සමානත්වය ආකස්මිකව සිදුවූවක්ද? බුද්ධඝෝෂපාදයන් විමුත්තිමග්ගය ගැන කිසිවිටෙක නමින් සඳහන් නොකරතත් එය ගැන දනසිටිබවට සැකයක් නැත.

විසුද්ධිමග්ගයෙහි කම්මට්ඨානගහනනිද්දෙස නම් තෙවන පරිච්ඡේදයෙහි රාගචරිතාදී චරිතස්වභාවයන් විග්‍රහකරන බුද්ධඝෝෂපාදයෝ අන්‍යාචාර්ය මතයක් (**එකච්චෙ වදන්ති**) විවේචනය කරමින් එය පිළිකෙව්කරති. පසු කලක විසුද්ධිමග්ගයට 'පරමත්‍ථමඤ්ජුසා' යන නමින් ටීකාවක් කරන ධම්මපාලාචාර්යයෝ මෙය විමුත්තිමග්ගයෙහි එන මතයක් බව පවසති. එම මතයද විමුත්තිමග්ග-චීන පරිවර්තනයෙහි දක්නට ඇත. එපමණක් නොව විසුද්ධිමග්ගයෙහි ප්‍රතික්ෂේප කොට ඇති අනෙක් ඇතැම් මතද එම චීන පරිවර්තනයෙහි දකියහැකිය. ධම්මපාලාචාර්යයෝ මේවාද අභයගිරි පාර්ශ්වයේ මතයන් බව පවසති[31]. මේ අනුව විසුද්ධිමග්ගයෙහි ප්‍රතික්ෂේප කොටඇති මතිමතාන්තර විමුත්තිමග්ගයෙහි එන ඒවාබවත්, විමුත්තිමග්ගය කළ උපතිස්ස නම් ආචාර්යවරයා අභයගිරි පාර්ශ්වයට අයත් කෙනෙකු බවත් නිගමනය කළහැකිය. තවද විසුද්ධිමග්ගය කිරීමේ එක් අභිමතාර්ත්‍ථයක් වන්නට ඇත්තේ විමුත්තිමග්ගයෙහි ප්‍රකාශිත මත ඛණ්ඩනයකිරීම වියහැකිය.

**විසුද්ධිමග්ගයෙහි සැලැස්ම හා රචනා ක්‍රමය**

විසුද්ධිමග්ග සැලසුම් කොට ඇත්තේ සීල, සමාධි, පඤ්ඤා යන ශික්ෂාත්‍රය පාදක කොටගෙනය. විමුත්තිමග්ගයෙහි විශේෂකොට දක්වා ඇති 'විසුද්ධිය' සීල, සමාධි, පඤ්ඤා යන තුනෙන් ලබාගතයුතු ඵලයක් මිස ඉන් බැහැරවූවක් නොවනබව මහාවිහාරික මතයවූයේ පෙනේ. පළමුවන දෙවන පරිච්ඡේද දෙක සීලයටද, තෙවන පරිච්ඡේදයෙහි පටන්

31. Bhikkhu Nanamoli : Path of Purification, Introduction p. xxvii.

තෙළෙස්වන පරිච්ඡේදයතෙක් පරිච්ඡේද එකොළොස සමාධියටද තුදුස්වන පරිච්ඡේදයෙහි පටන් තෙවිසිවන පරිච්ඡේදයතෙක් ඉතිරි දසය පඤ්ඤාවටද ඇතුළත්වනසේ විස්තරකොටඇත. එය මෙසේ දක්වියහැකිය:

| | | |
|---|---|---|
| **I සීල** | 1. සීලනිද්දේස | විෂය පථය: සතර සංවරශීලය |
| | 2. ධුතඞ්ගනිද්දේස | තෙළෙස් ධුතංග |
| **II සමාධි** | 3. කම්මට්ඨානගහණ | විෂය පථය: යෝගාවචරයා නිද්දේස විසින් කළයුතු ප්‍රාථමික කාර්ය-රාගාදී චරිත ලක්ෂණ - පළිබෝධ නිවාරණය ආදිය. |
| | 4. පඨවිකසිණනිද්දේස | කසිණය පිළියෙළ කරගන්නා ආකාරය-භාවනාරම්භය පිළිබඳ උපදෙස් - උග්ගහ-පටිභාග නිමිති- උපචාර-අර්පණා ධ්‍යාන ආදිය. |
| | 5. සේසකසිණනිද්දේස | ආපෝ කසිණයෙහි පටන් පරිච්ඡින්නාකාස කසිණය තෙක් ඉතිරි කසිණ නවය. |
| | 6. අසුභකම්මට්ඨාන නිද්දේස | උද්ධුමාතකාදී දස අසුභය. යෝගාවචරයා විසින් විශේෂයෙන් පිළිපැදිය යුතු කරුණු පිළිබඳ උපදෙස්. |
| | 7. අනුස්සතිනිද්දේස | දේවතානුස්සතියතෙක් ප්‍රථම අනුස්සති සය. |
| | 8. අනුස්සති-කම්මට්ඨාන නිද්දේස | මරණානුස්සතිය පටන් උපසමානුස්සතියතෙක් ඉතිරි අනුස්සති සතර. |

| | | |
|---|---|---|
| | 9. බ්‍රහ්මවිහාර-නිද්දේස | මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර බඹවිහරණ වඩන ආකාරය පිළිබඳ උපදෙස් |
| | 10. ආරුප්ප-නිද්දේස | ආකාසානඤ්චායතනාදී අරූපභාවනා සතර |
| | 11. සමාධි-නිද්දේස | ආහාරෙ පටික්කූලසඤ්ඤා හා චතුධාතු වවත්ථානය යන දෙක |
| | 12. ඉද්ධිවිධ-නිද්දේස | සමාධිභාවනාවෙන් ලැබියහැකි ආනිසංස විශේෂ; පඤ්ච අභිඤ්ඤා අතුරෙන් පළමුවන ඉද්ධිවිධඤාණය |
| | 13. අභිඤ්ඤා-නිද්දේස | දිබ්බසෝතාදී ඉතිරි අභිඤ්ඤා සතර |
| **III. පඤ්ඤා** | 14. ඛන්ධ-නිද්දේස | රූපාදී ස්කන්ධපංචකය |
| | 15. ආයතන-ධාතු-නිද්දේස | චක්ඛු ආදී ආයතන දොළොස හා චක්ඛු ආදී ධාතු අටළොස පිළිබඳව අභිධර්ම නයින් කැරෙන විස්තරය |
| | 16. ඉන්ද්‍රිය-සච්ච-නිද්දේස | චක්ඛුන්ද්‍රියාදී ඉන්ද්‍රිය විසිදෙක හා චතුරාර්යසත්‍යයන් පිළිබඳ වර්ණනය |
| | 17. පඤ්ඤාභූමි-නිද්දේස | පටිච්ච සමුප්පාද විස්තරය |
| | 18. දිට්ඨිවිසුද්ධි-නිද්දේස | දිට්ඨි-විසුද්ධිය පිළිබඳව අභිධර්ම නයින් කරනුලබන විස්තරය |
| | 19. කංඛාවිතරණවිසුද්ධි-නිද්දේස | නාමරූප ධර්මයන් පිළිබඳව අභිධර්මනයින් කරනුලබන විග්‍රහය |

| | |
|---|---|
| 20. මග්ගාමග්ගඤාණ දස්සනවිසුද්ධි-නිද්දේස | මග්ග-අමග්ග-ඤාණ දස්සනය පිළිබඳව අභිධර්ම නයින් කරනුලබන විනිශ්චය |
| 21. පටිපද-ඤාණ-දස්සන විසුද්ධි-නිද්දේස | භංගානුපස්සනා ආදී ඤාණ අට හා සච්චානුලෝමික ඤාණය පිළිබඳව අභිධර්ම නයින් කරනුලබන විස්තරය |
| 22. ඤාණ-දස්සන-විසුද්ධි නිද්දේස | චතුර්විධ මාර්ගඥානය පිළිබඳව අභිධර්ම නයින් කරනුලබන විස්තරය |
| 23. පඤ්ඤාභාවනානිසංස නිද්දේස | විදර්ශනා භාවනානිසංසයන් පිළිබඳව අභිධර්ම නයින් කරනුලබන වර්ණනය, නානාකිලේසවිද්ධංසනාදි ආනිසංස සතර |

මෙහි පරිච්ඡේද නම්කොට ඇති ආකාරයෙහි තරමක ලිහිල්බවක් නොහොත් අපිළිවෙළක් දක්නටඇත. හත්වන අටවන පරිච්ඡේද දෙක පිළිවෙළින් අනුස්සති, අනුස්සති කම්මට්ඨාන යනුවෙන් නම්කොටඇත. එකොළොස්වන පරිච්ඡේදය සමාධිනිද්දේසයයි නම්කොට ඇතිනමුදු එහි අන්තර්ගතව ඇත්තේ සතළිස් කර්මස්ථානයන් අතුරෙන් අවසන් දෙක පමණි. පංච අභිඥානයන් අතුරෙන් ඉද්ධිවිධ ඤාණය ඉද්ධිවිධනිද්දේස නම් දෙළොස්වන පරිච්ඡේදයෙන් විස්තරකොට ඉතිරි සතර විස්තර කැරෙන තෙළෙස්වන පරිච්ඡේදය අභිඤ්ඤානිද්දේසයයි නම්කොටඇත. පරිච්ඡේද බෙදනලද හා නම්කරනලද ආකාරය පාඨකයාට තරමක අවුලක් වියහැකිය.

එක්එක් කරුණක් පිළිබඳව දැනගතයුතු සියලුම දෙය සවිස්තරව දක්වමින් විවරණය කරන ආකාරය සාමාන්‍ය පාඨකයා මඳක් වෙහෙසට පත්කරවිය හැකිය. ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨානාදී වශයෙන්ද, එක් එක් කරුණක් කීවැදෑරුම් වේදැයි දක්වනු පිණිස ඒකක, ද්වික, ත්‍රික ආදීවශයෙන් කිසිවක් අඩු නොකොට දැක්වීමට දරනලද පරිශ්‍රමය සැබවින්ම විස්මය දනවනසුලුය. උදහරණයක් ගතහොත්: ශීලය විස්තර කිරීමේදී **‘කිං සීලං? කෙනට්ඨේන සීලං? කානස්ස ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨානානි? කිමානිසංසං සීලං? කතිවිධං සීලං?’** යන

ආදීවශයෙන් ප්‍රශ්නාස්වරූපයෙන් ඉදිරිපත් කරනුලබන මාතෘකාපාඨ පිළිබඳ සියලු කරුණු විදහා දක්වේ. **'කතිවිධං සීලං?'** යන්න විසඳමින් ශීලය එක්වැදෑරුම් වනසැටි එක් ආකාරයෙකින්ද, දෙවැදෑරුම් වනසැටි හත් ආකාරයෙකින්ද, තෙවැදෑරුම් වනසැටි පස් ආකාරයෙකින්ද, සිවුවැදෑරුම් වනසැටි සිවු ආකාරයෙකින්ද, පස් වැදෑරුම් වනසැටි දෙආකාරයෙකින්ද වර්ණනා කොට ඇත. සමාධි, පඤ්ඤ ආදියද මෙසේය. කරුණු සනාථ කිරීම බොහෝවිට ත්‍රිපිටකපාඨයෙකින්ම, නැතහොත් අට්ඨකථා පාඨයෙකින් කිරීමට ඉමහත් පරිශ්‍රමයක් දරාඇත. මෙසේ උපුටා දක්වනලද උද්ධෘතපාඨ සංඛ්‍යාව ඇතැම් විට සියගණන ඉක්මවනු ඇත. මුළු ග්‍රන්ථයෙහිම ස්වමතය ගෙනහැර දක්වෙනුයේ දෙතුන්වරක් පමණි. එයද අටුවා මගින් හෝ පුරාණාචාර්ය මතයෙකින් විසඳුමක් නොලැබෙන විටය. විසුද්ධිමග්ගය ස්වාධීන කෘතියක් නොවේ. එය කිරීමට නිමිතිවූ අරමුණුවල හා එහි අපේක්ෂිතාර්ථයන්ගේ ස්වභාවය අනුව ස්වාධීන මතවලට තිබුණ ඉඩකඩ සීමාසහිතය.

විසුද්ධිමග්ගය මුළුමහත් ත්‍රිපිටකසාහිත්‍යයෙහි සාරය ඇතුළත් සංග්‍රහයෙකැයි කිවයුතුය, අඩුවක් කිවනොහැකි තරම් පරිපූර්ණය, මනා අවධානයෙකින් කරන ලද්දෙකි. එය එද පටන් අද දක්වා ථෙරවාද බුද්දහම පිළිබඳව ප්‍රමාණත්වයෙහිලා ගැනෙන විශ්වසනීය විවරණයක් ලෙස බෞද්ධලෝකයාගේ ගෞරවයට පාත්‍රවීඇත. විසුද්ධිමග්ගය ගැන අදහස් දක්වන රිස් ඩේවිඩ්ස් මැතිණිය එයතුළ 'හැම දෙයක් ගැනම යම් දෙයක්'[32] ඇතුළත්වඇතැයි පවසයි. ඉහත සඳහන් වර්ණනාක්‍රමය අනුව සලකනවිට 'යම්දෙයක් ගැන හැම දෙයක්ම' යන කොටසද එකතු කළයුතුයයි හැඟේ.

32. "Something on everything", E. W. Adikaram: Early History of Buddhism in Ceylon, p. 4. Afterword to Visuddhimagga, P.T.S. Edition, p. 763.

# පටුන


| | කථා වස්තු | පිටු අංක |
|---|---|---|
| | නිදනාදි කථා | 1 |
| 1 | සීල නිද්දෙස | 8 |
| 2 | ධුතංග නිද්දෙස | 65 |
| 3 | කම්මට්ඨානගහන නිද්දෙස | 93 |
| 4 | පඨවිකසිණ නිද්දෙස | 128 |
| 5 | සෙසකසිණ නිද්දෙස | 183 |
| 6 | අසුභකම්මට්ඨාන නිද්දෙස | 191 |
| 7 | ඡ-අනුස්සති නිද්දෙස | 210 |
| 8 | අනුස්සතිකම්මට්ඨාන නිද්දෙස | 248 |
| 9 | බ්‍රහ්මවිහාර නිද්දෙස | 320 |
| 10 | ආරුප්ප නිද්දෙස | 358 |
| 11 | සමාධි නිද්දෙස | 376 |

# විසුද්ධි මාර්ගය

**භාග්‍යවත් වූ අර්හත් වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා!**

## නිදානාදිකථා

'සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටං'[1]

සිල්හි පිහිටා සිත - පැනද, වඩන පැනැතියේ
තවසර නිපුණ යතිවර - තෙමේ මෙගැට ලිහාලයි.

මෙය මෙසේ කියන ලදුයේමැයි; කවුරුන් විසින් මෙය වදරන ලදුයේද, යත්, සැවැත් නුවර වැඩ වසන භාග්‍යවතුන්වහන්සේ වෙත රාත්‍රිභාගයෙහි එළඹ එක්තරා දේවපුත්‍රයෙක් තමාගේ සැකයක් දුරු කරගනු පිණිස,

'අන්තො ජටා බහි ජටා ජටාය ජටිතා පජා
තං තං ගොතම පුච්ඡාමි කො ඉමං විජටයෙ ජටං' [2]

ඇතුළු ගැට පිට ගැට - ලෝසතැ'න ගැටෙනි වෙළී
අසමි හිමි ගොයුමාණෙනි - කවුරු මෙගැට ලිහාද'යි

යන මේ ප්‍රශ්නය ඇසීය. එහි අරුත් සැකෙවින් මෙසේයි: **ජටා** යනු, අකුලක් වැනි තෘෂ්ණාව හැඟවීම සඳහා වූ අධිවචනයෙකි; එම තෘෂ්ණාව රූපාදී අරමුණු කෙරෙහි යටිකුරු උඩුකුරු වශයෙන් යළි යළිදු ඉපැදීමේ හේතුවෙන්, එකිනෙක පැටලීමේ අරුතින්, හුණ පඳුරු ආදියෙහි අතුපතර එකිනෙක හෙවී පැටලී සැදුණු දලක්, නොහොත් අකුලක් වැනිවූ හෙයින් එනම් වේ. ඒ මේ තෘෂ්ණාවවූ කලී තමන් සතුවූ හා අනුන් සතුවූ පරිභෝග වස්තූන් කෙරෙහිද, තමන්ගේ හා අනුන්ගේ ආත්මභාවයන් කෙරෙහිද, අභ්‍යන්තර හා බාහිර ආයතනයන් කෙරෙහිද, උපදනා හෙයින් **අන්තො ජටා බහි ජටා'** යි කියනුලැබේ. මෙසේ උපදනා එවන් ගැටයෙන් ලෝකසත්වයා වෙළී පැටලී ඇත. යම්සේ හුණ ආදිය

(1) සං. නි. දෙවතා සංයුත්ත - S i 13

(2) සං. නි. දෙවතා සංයුත්ත - S i 13

හුණ අකුලින් වෙළී පැටලී ඇත්ද, එසේම එම තෘෂ්ණා නමැති අකුලින් මේ සියලු සත්වකාය සංඛ්‍යාත ලෝකප්‍රජාව වෙළී පැටලී ගැටගැසී ඇතැ'යි යන අර්ථයි. යම් හෙයකින් මෙසේ පැටලී ඇත්ද, **තං තං ගොතම පුච්ඡාමි** යනු, එහෙයින් ඔබ වහන්සේගෙන් විමසමි, **ගොතම** යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ නම්ගොත් වශයෙන් ඇමතූ තියායි; **සො ඉමං විජටයෙ ජටං** යනු, මෙසේ මේ ත්‍රිවිධ ලෝකධාතුව වෙළාගෙන පවත්නා ගැට කවරෙක් ලිහාද, ලිහාලීමට කවරෙක් සමත් වේදැ'යි විචාළ තියායි. මෙසේ විචාරණ ලදසේක්, සියලු ධර්මයන් කෙරෙහි නොපැකිලෙන ඥානචාර ඇති, දේවාතිදේව, බ්‍රහ්මාතිබ්‍රහ්ම චතුර්වෛශාරද්‍යවිශාරද, දශබලධාරී, අනාවරණඥානසම්පන්න, සමන්තචක්ඛුවූ භාග්‍යවතුන්වහන්සේ එම අර්ථය විසඳමින්,

'සීලෙ පතිට්ඨාය -පෙ- සො ඉමං විජටයෙ ජටං' යන මේ ගාථාව වදාළ සේක.

ඉමිස්සාදනි ගාථාය කථිතාය මහෙසිනා
වණ්ණයන්තො යථාභූතං අත්ථං සීලාදිභෙදනං

සුදුල්ලභං ලභිත්වාන පබ්බජ්ජං ජිනසාසනෙ
සීලාදිසඞ්ගහං ඛෙමං උජුං මග්ගං විසුද්ධියා

යථාභූතං අජානන්තා සුද්ධිකාමාපි යෙ ඉධ
විසුද්ධිං නාධිගච්ඡන්ති වායමන්තාපි යොගිනො

තෙසං පාමොජ්ජකරණං සුවිසුද්ධවිනිච්ඡයං
දෙසනානය නිස්සිතං

විසුද්ධිමග්ගං භාසිස්සං තං මෙ සක්කච්ච භාසතො
විසුද්ධිකාමා සබ්බෙපි නිසාමයථ සාධවො'ති

මහාමුනීන්ද්‍රයන්වහන්සේ විසින් දේශනා කරනලද මේ ගාථාවෙහි ශීලාදි විස්තර ඇතුළත් අර්ථය මෙතැන් සිට තත්වූ පරිද්දෙන් වර්ණනා කෙරෙමින්, අතිශය දුර්ලභවූ බුද්ධශාසනයෙහි පැවිදිබව ලැබපවා ශීලාදී වශයෙන් සංග්‍රහ කරනලද, ක්ෂේමවූ ඍජුවූ විශුද්ධි මාර්ගය,

තත්වූ පරිද්දෙන් නොදත් ඇතැම් යෝගීකෙනෙක් මේ ශාසනයෙහි, පිරිසිදු බව පතමින් වීර්ය වඩන්නාහුද විශුද්ධියට නොපැමිණෙත්,

ඔවුන්හට ප්‍රමෝද්ජනකවන ආකාරයට ඉතා පිරිසුදු ලෙස විනිශ්චය කොට, මහාවිහාරවාසීන්ගේ දේශනාක්‍රමය ඇසුරු කරමින්,

විශුද්ධිමාර්ගය පවසන්නෙමි. මවිසින් එසේ කියනුලබන එම විශුද්ධිමාර්ගය, විශුද්ධිකාමී සියලු සජ්ජනයෙනි, මනාකොට ශ්‍රවණය කරවු.

එහි **විසුද්ධි** යනු, සියලු කෙලෙස්මල විරහිතවූ, අත්‍යන්තයෙන් පරිශුද්ධවූ නිර්වාණය'යි දතයුතුය. එවන් විශුද්ධියට මගවූ හෙයින් '**විසුද්ධිමග්ග**' නම්. **මග්ගො** යනු, අධිගමයට උපායයයි කියනුලැබේ. එම විශුද්ධිමාර්ගය කියන්නෙමි'යි යන අර්ථයයි.

ඒ මේ විශුද්ධිමාර්ගය තෙමේ කිසි තැනෙක්හි විදර්ශනා මාත්‍ර වශයෙන් දේශිතයි. යම්සේ වදළෝද:

'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති යද පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා'(1)

සියලු සංස්කාරධර්මයෝ අනිත්‍යයහ'යි යම්කලෙක ප්‍රඥාවෙන් දකියිද, එවිට සසරදුක් කෙරෙහි කලකිරෙයි, මෙය විශුද්ධියට මාර්ගයයි.

කිසි තැනෙක්හි ධ්‍යානප්‍රඥා වශයෙන් දේශිතයි, යම්සේ වදළෝද:

'යම්හි ඣානඤ්ච පඤ්ඤා ච ස වෙ නිබ්බාණසන්තිකෙ'(2)

යම් කෙනෙකු, වෙත ධ්‍යානයද, ප්‍රඥාවද ඇත හොත්, ඔහු නිර්වාණය අසලමය.

කිසි තැනෙක්හි කර්මාදිවශයෙන් දේශිතයි. යම්සේ වදළෝද:

'කම්මං විජ්ජා ච ධම්මො ච සීලං ජීවිතමුත්තමං
එතෙන මච්චා සුජ්ඣන්ති න ගොත්තෙන ධනෙන වා'(3)

කර්මය, විද්‍යාය, ධර්මය, ශීලය, උතුම් දිවිමහය යන මෙයින් මනුෂ්‍යයෝ පිරිසුදු වෙති, ගෝත්‍රයෙන් හෝ ධනයෙන් එසේ නොවෙති.

---

(1) සං. නි. දේවතා සංයුත්ත - Dh 277

(2) ධ. ප. භික්ඛු වග්ග - Dh 372

(3) ම. නි. අනාථපිණ්ඩිකසුත්ත, සං. නි. දෙවතා සංයුත්ත - M iii 262

කිසි තැනෙක්හි ශීලාදිවශයෙන් දේශිතයි. යම්සේ වදළෝද:

'සබ්බදා සීලසම්පන්නො පඤ්ඤවා සුසමාහිතො
ආරද්ධවිරියො පහිතත්තො ඔඝං තරති දුත්තරං'(1)

සියලු කල්හි ශීලසම්පන්න වේද, ප්‍රඥා ඇත්තේද, සන්සුන් සිත් ඇත්තේද, අරඹනලද වීර්ය ඇත්තේද, පධන්වියසි වඩා ඇත්තේද හේතෙමේ දුකසේ තරණය කළයුතු ඔඝය තරණය කරයි.

කිසි තැනෙක්හි සතිපට්ඨානාදි වශයෙන් දේශිතයි. යම්සේ වදළෝද:

'එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා-පෙ-නිබ්බාණස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා'(2)

'මහණෙනි, යම් මේ සතර සතිපට්ඨානයෙක් වේද, එය වූකලී සත්වයාගේ විශුද්ධිය පිණිස-පෙ-නිවන් අවබෝධ කිරීම පිණිස ඇති ඒකායන මාර්ගයයි.'

සම්‍යක්ප්‍රධානාදී විෂයෙහිද, මේ ක්‍රමයමැයි. මෙම ප්‍රශ්නය විසඳීමෙහිදී වනාහි ශීලාදී වශයෙන් දේශිතයි.

එහි අර්ථවර්ණනය සැකෙවින් මෙසේයි: **සීලෙ පතිට්ඨාය** යනු, සිල්හි පිහිටා, සිල් මැනවින් පුරන්නේම සිල්හි පිහිටියේයයි කියනු ලැබේ, එහෙයින් සිල් පිරීම් වශයෙන් සිල්හි පිහිටා'යි යනු මෙහි අර්ථයි. **නරො** යනු, සත්ව තෙමේයි, **සපඤ්ඤො** යනු, කර්මය හේතුකොට උපන් ත්‍රිහේතුක ප්‍රතිසන්ධි ප්‍රඥාවෙන් ප්‍රඥා ඇත්තේයි, **චිත්තං පඤ්ඤඤ්ච භාවයං** යනු, සමාධි හා විදර්ශනා වඩන්නේයි; මෙහි වනාහි 'චිත්ත' යනුවෙන් සමාධියද, 'පඤ්ඤා' යනුවෙන් විදර්ශනාවද, දක්වන ලදි. **ආතාපී** යනු, වීර්ය ඇත්තේයි. වීර්යය වනාහි කෙලෙසුන් තවන දවන අරුතින් 'ආතාප'යයි කියනුලැබේ. එය ඇතැයි යන අරුතින් 'ආතාපී' නම්. **නිපකො** යනු, නිපකභාවය ප්‍රඥායයි කියනු ලැබේ. එම ප්‍රඥාවෙන් සමන්විත වූයේ'යි යන අර්ථයි. මෙම පදයෙන් වනාහි ව්‍යාවහාරික ප්‍රඥාව දක්වයි. මෙම පැන විසඳීමෙහිදී වනාහි ප්‍රඥාව තුන් වරක් එයි, එහි පළමුවැන්න සහජ ප්‍රඥාවයි. දෙවැන්න විදර්ශනා ප්‍රඥාවයි. තෙවැන්න

---

(1) සං. නි. දේවතා සංයුත්ත - S i 53

(2) දී. නි. සතිපට්ඨාන සු. - D ii 290

සියලු කටයුතු හසුරුවන ව්‍යාවහාරික ප්‍රඥවයි. සසරබිය දකිති'යි 'භික්ඛු' නම්. **සො ඉමං විජටයෙ ජටං** යනු, මෙම ශීලයෙන්ද, 'චිත්ත' යන ශීර්ෂයෙන් දක්වනලද මෙම සමාධියෙන්ද, මෙම ත්‍රිවිධ ප්‍රඥවෙන්ද, මෙම ආතාපී ගුණයෙන්දැයි යන කරුණු සයකින් සමන්විත භික්ෂු තෙමේයි; යම්සේ වනාහි පුරුෂයෙක් තෙමේ පොළෝ මත සිට ඉතා තියුණු සැතක් ඔසවා මහත්වූ හුණ පඳුරක් සිඳ අවුල්හැර හෙලන්නේද, එසේම ශීලයෙහි පිහිටා සමාධි නමැති හණගලෙහි මුවහත් තබනලද විදර්ශනා ප්‍රඥ නමැති සැත වීර්ය බලයෙන් මෙහෙයවනලද ව්‍යාවහාරික ප්‍රඥ නමැති අතින් ඔසවා ස්වසන්තානයෙහි පවත්නා තෘෂ්ණා නමැති ඒ අකුල මුළුමනින්ම ලිහා ලන්නේයි, සිඳ ලන්නේයි, මුලුසුන් කරන්නේයි; හේ තෙමේ වනාහි මාර්ගක්ෂණයෙහි ඒ තෘෂ්ණාජටාව ලිහාලන්නේය; ඵලක්ෂණයෙහි ලිහාලූ ජටා ඇත්තේ දෙවියන් සහිත ලෝකයාට අග්‍රදක්ෂිණාර්හ බවට පත් වන්නේය. එහෙයින් වදළහ භාග්‍යවතුන් වහන්සේ:-

'සීලෙ පතිට්ඨාය නරො-පෙ- විජටයෙ ජටං'

එහි යම් ප්‍රඥවක් හේතුකොට ගෙන 'සපඤ්ඤො'යි කියන ලද්දේද, එය පිළිබඳව කළයුතු කාර්යයක් නොමැත. පෙර කම්පල අනුභසින්ම එය සිද්ධය; **ආතාපී නිපකො** යන මෙහි ඉහත විස්තර කරනලද වීර්ය වශයෙන්ද, සතතයෙන් පුරුදු කළ ප්‍රඥ වශයෙන්ද, සියලු කාර්යයෙහි සම්පජානකාරීව (කරන දෙය ගැන දැනුමෙන් යුතුව කරන) ශීලයෙහි පිහිටා, චිත්ත, පඤ්ඤ වශයෙන් විස්තර කරනලද ශමථ විදර්ශනාවන් වැඩිය යුතුය. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ ශීල, සමාධි, ප්‍රඥ වශයෙන් මෙම විශුද්ධිමාර්ගය දක්වති. මෙතෙකින් වනාහි ශික්ෂාත්‍රයද, ත්‍රිවිධකල්‍යාණ ශාසනයද, ත්‍රිවිද්‍යාදිය ඉපැදවීම පිළිබඳ උපනිශ්‍රයද, අන්තද්වයයෙන් තොර මධ්‍යම ප්‍රතිපද සේවනයද, අපායාදිය ඉක්මවන උපායද, තුන් ආකාරයෙන් කෙලෙසුන් ප්‍රහාණය කිරීමද, ක්ලේශව්‍යතික්‍රමාදීන් පිළිබඳ ප්‍රතිපක්ෂයද, සංක්ලේශත්‍රය විශෝධනයද, ශ්‍රෝතාපන්නතාදිය පිළිබඳ හේතුවද, ප්‍රකාශ කරනලද්දේ වේ. කෙසේද යත්, මෙහි සීල යනුවෙන් අධිශීල ශික්ෂාවද සමාධි යනුවෙන් අධිචිත්ත ශික්ෂාවද, පඤ්ඤ යනුවෙන් අධිප්‍රඥ ශික්ෂාවද, ප්‍රකාශ කරනලද්දේ වේ. සීල යනුවෙන් ශාසනයෙහි ආදිකල්‍යාණතාව පවසනලද්දේ වේ. 'කුශල ධර්මයන්ගේ ආරම්භය කුමක්ද? ඉ-පිරිසුදු ශීලයයි'(1) ආදී වචනයෙන් ද, 'සියලු පව්කම්

---

(1) කො චාදි කුසලානං ධම්මානං සීලඤ්ච සුවිසුද්ධං - සං. නි. මහාවග්ග - S v 143

නොකිරීම'[1] ආදී වචනයෙන්ද, ශීලය ශාසනයෙහි මුලයයි පැවසේ. එය කල්‍යාණයෙක්ද වේ. විපිළිසරින් මිදීම ආදී ශුභඵල ගෙනදෙන හෙයිනි; සමාධි යනුවෙන් මධ්‍යකල්‍යාණතාව ප්‍රකාශ කරනලද්දේ වේ. 'කුසල් වෙත ලභාවීම'[2] ආදී වචනයෙන් සමාධිය ශාසනය පිළිබඳ මධ්‍යයයි පැවසේ. එයද කල්‍යාණයෙකි. සෘද්ධිවිධාදී ගුණයන් ගෙනදෙන හෙයිනි. පඤ්ඤා යනුවෙන් පර්යවසාන කල්‍යාණතාව ප්‍රකාශ කරනලද්දේ වේ. 'තම සිත පිරිසුදු කර ගැනීමය යනු, මේ බුදුවරයන්ගේ ශාසනයයි'[3] යන වචනයෙන්ද, ප්‍රඥාව උසස්තම වන හෙයින්ද, එම ප්‍රඥාව ශාසනය පිළිබඳ පර්යවසානයයි. එයද කල්‍යාණයෙකි. ඉෂ්ටානිෂ්ට (කැමති නොකැමති) විෂයයන් පිළිබඳ යථාස්වභාවය එලවන හෙයිනි.

'සෙලො යථා එකඝනො වාතෙන න සමීරති
එවං නින්දාපසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා'[4]

යම්සේ තනි ගන ගල් කුළක් සුළඟින් නොසෙලවේද, එසේම පණ්ඩිතයෝ තුමූ නින්දා ප්‍රශංසා දෙක්හි නොසැසලෙතියි කියනලදි.

එසේම සීල යනුවෙන් ත්‍රිවිද්‍යාභාවය පිළිබඳ උපනිශ්‍රය පවසන ලද්දේ වේ. ශීල සම්පත්තිය හේතුකොට ත්‍රිවිද්‍යාවනට පැමිණේ. එයින් ඔබ්බට නොයෙයි. සමාධි යනුවෙන් ෂඩභිඥලාභය පිළිබඳ උපනිශ්‍රය පවසනලද්දේ වේ. සමාධි සම්පත්තිය හේතුකොට ෂඩභිඥවනට පැමිණේ. එයින් ඔබ්බට නොයෙයි. පඤ්ඤා යනුවෙන් පටිසම්භිද ප්‍රභේදයන් පිළිබඳ උපනිශ්‍රය පවසනලද්දේ වේ. ප්‍රඥාසම්පත්තිය හේතුකොටගෙනම සිව්පිළිසිඹියාවනට පැමිණේ. අන් හෙයකින් නොවේ. තවද සීල යනුවෙන් කාමසුඛල්ලිකානුයෝග සංඛ්‍යාත (කාම සුවය සෙවීම) අන්තයද, සමාධි යනුවෙන් අත්තකිලමථානුයෝග සංඛ්‍යාත අන්තයද දුරු කිරීම පවසනලද්දේ වේ. පඤ්ඤා යනුවෙන් මධ්‍යමප්‍රතිපද සේවනය පවසන ලද්දේ වේ. එසේම සීල යනුවෙන් අපායසමතික්‍රම උපායද, සමාධි යනුවෙන් කාමධාතුසමතික්‍රම උපායද, පඤ්ඤා යනුවෙන් සකලභවසමතික්‍රම උපායද පවසනලද්දේ වේ. තවද ශීලයෙන් තදංගප්‍රහාණ වශයෙන්ද, සමාධියෙන් විෂ්කම්භනප්‍රහාණ වශයෙන්ද, ප්‍රඥාවෙන් සමුච්ඡේදප්‍රහාණ වශයෙන්ද, කෙලෙසුන් ප්‍රහීණකිරීම පවසනලද්දේ වේ; තවද, ශීලයෙන් කෙලෙසුන්ගේ පැළඹීම පිළිබඳ ප්‍රතිපක්ෂයද, සමාධියෙන් (මැඩලනලද

---

(1) (2) (3) දී. නි. මහාපදාන සු, ධ. ප. බුද්ධ වග්ග - සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා, සචිත්තපරියොදපනං එතං බුද්ධාන සාසනං - Dh 185

(4) සං. නි. සගාථවග්ග, ධ. ප. පණ්ඩිත වග්ග - Dh 81

කෙලෙසුන්) යලි නැගිටීම පිළිබඳ ප්‍රතිපක්ෂයද, ප්‍රඥවෙන් අනුශය පිළිබඳ ප්‍රතිපක්ෂයද, පවසනලද්දේ වේ. තවද, ශීලයෙන් දුශ්චරිත සංක්ලේශ විශෝධනයද, සමාධියෙන් තෘෂ්ණා සංක්ලේශ විශෝධනයද, ප්‍රඥවෙන් දෘෂ්ටි සංක්ලේශ විශෝධනයද, පවසනලද්දේ වේ. තවද ශීලයෙන් ශ්‍රෝතාපන්න සකෘදගාමී භාවයන්හිද, සමාධියෙන් අනාගාමී භාවයෙහිද, ප්‍රඥවෙන් අර්හත් භාවයෙහිද හේතු පවසන ලද්දේ වේ. ශ්‍රෝතාපන්නවූයේ වනාහි ශීලපරිපූරණය කරන්නේයයි කියනලදී. සකෘදගාමී වූයේද එසේය, අනාගාමීවූයේ සමාධි පරිපූරණය කරන්නේයයිද, අර්හත්වූයේ වනාහි ප්‍රඥ පරිපූරණය කරන්නේයයිද කියනලදී. මෙසේ මෙතෙකින් ශික්ෂාත්‍රයයද, ත්‍රිවිධකල්‍යාණ ශාසනයද, ත්‍රෛවිද්‍යතාදිය පිළිබඳ උපනිශ්‍රයද, අන්තද්වයවර්ජනය හා මධ්‍යමප්‍රතිපද සේවනයද, අපායාදීන් පිළිබඳ සමතික්‍රම උපායයන්ද, කෙලෙසුන් ප්‍රහීණකිරීම පිළිබඳ තුන් ආකාරයද, ව්‍යතික්‍රමාදීන්ගේ ප්‍රතිපක්ෂයද, සංක්ලේශත්‍රය විශෝධනයද, ශ්‍රෝතාපන්නාදි භාවයන් පිළිබඳ හේතුන්දයි යන මේ නව ආකාරයද, සෙසු මෙවන් ගුණත්‍රිකයෝද ප්‍රකාශ කරනලද්දහු වෙති.

**නිදානාදි කථා සමාප්තයි.**

# 1. ශීල නිර්දේශය

මෙසේ නොයෙක් ගුණ සංග්‍රහ කෙරෙමින් ශීල සමාධි ප්‍රඥා වශයෙන් පවසනලදුයේ නමුදු මේ විශුද්ධිමාර්ගය ඉතා සැකෙවින් දේශනා කරනලද්දේම වේ. එහෙයින් මෙය සියල්ලනටම උපකාර පිණිස නොසැහෙතැ'යි හඟිමින් විස්තරකොට දක්වනු පිණිස, පළමුකොට ශීලය අරබයා මේ ප්‍රශ්නකිරීම වේ.

ශීලය නම් කිමෙක්ද? කවර අරුතෙකින් ශීල නම් වේද? එහි ලක්ෂණ, රස (හෙවත් කෘත්‍ය), පච්චුපට්ඨාන (එළඹීම), පදට්ඨාන (ආසන්න කාරණය) යන මොහු කවරහුද? ශීලය කවර අනුසස් ඇත්තේද? මෙම ශීලය කෙතෙක් ආකාර ඇත්තේද? එහි මලිනවීම කවරේද? පිරිසුදුවීම කවරේද? එහි විසඳුම මෙසේයි:

**ශීල යනු කිමෙක්ද** යත්, ප්‍රාණඝාතාදියෙන් වැලකෙන්නහුගේ හෝ චේවා, වත්පිළිවෙත් පුරන්නහුගේ හෝ චේවා, චේතනාදී ස්වභාවය ශීල නම්. කියනලද මැයි පටිසම්භිදාවෙහි: 'ශීලය නම් කිම? චේතනාව ශීලයයි, චෛතසිකය ශීලයයි, සංවරය ශීලයයි, අව්‍යතික්‍රමය (කඩ නොකිරීම) ශීලයයි.'(1) එහි **චේතනා ශීලය** නම්: ප්‍රාණඝාතාදියෙන් වලකින්නහුගේ හෝ වත්පිළිවෙත් පුරන්නහුගේ හෝ චේතනාවයි. **චෛතසික ශීලය** නම්: ප්‍රාණඝාතාදියෙන් වලකින්නහුගේ විරතියයි, යළිදු, චේතනාශීලය නම්: ප්‍රාණඝාතාදිය හැරපියන්නහුගේ සප්ත (කුශල) කර්මපථ චේතනායි, චෛතසික ශීලය නම්, 'අභිද්‍යාව හැරපියා අභිද්‍යාවෙන් මිදුණු සිතින් යුක්තව වාසය කරයි'(2) ආදි නයින් කියන ලද අනභිද්‍යා, අව්‍යාපාද සම්‍යග්දෘෂ්ටි ධර්මයයි. **සංවර ශීලය** නම්: මෙහි පස්ආකාරයෙකින් වන සංවරය දතයුතුය: ප්‍රාතිමෝක්ෂ සංවරය, සති සංවරය, ඥාන සංවරය, ඛන්ති සංවරය, විරිය සංවරය යන මොහුය. එහි, 'මේ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් උපේත වූයේ, සමුපේත වූයේ'(3)යි යන ආදිය ප්‍රාතිමෝක්ෂ සංවරයයි. 'චක්ෂුරින්ද්‍රියය රකියි, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි'(4) යන මේ සතිසංවරයයි.

---

(1) 'කිං සීලන්ති: චේතනාසීලං චෙතසිකං සීලං සංවරො සීලං අවීතික්කමො සීලං' පටිසම්භිදාමග්ග, ඤාණකථා -Ps 144

(2) 'අභිජ්ඣං පහාය විගතාභිජ්ඣේන චෙතසා විහරති...' දී. නි. සාමඤ්ඤඵල සු. -Di 71

(3) 'ඉමිනා පාතිමොක්ඛසංවරෙන උපෙතො හොති සමුපෙතො' අභිධ. ඤාණවිභඞ්ග - Vbh 246

(4) 'රක්ඛති' දී. නි. සාමඤ්ඤඵලසු Di 71; ම.නි. සබ්බාසවසු - Mi 10

'යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා) සති තෙසං නිවාරණං සොතානං සංවරං බෲමි පඤ්ඤායෙතෙ පිථීයරේ'ති[1]

'ලොව යම්තාක් ශ්‍රෝතස්හු (ප්‍රවාහයෝ) වෙත් නම්,' (අජිත'යයි භාග්‍යවතුන් වහන්සේ කීහ.) 'සිහිය එම ශ්‍රෝතසුන්ගේ වැළැක්වීමයි, ශ්‍රෝතස්හුගේ සංවරයයි කියමි, ප්‍රඥාවෙන් මේ ශ්‍රෝතස්හු වැසීයෙති.' මේ ඥානසංවරයයි. ප්‍රත්‍යය පරිභෝගයද මෙහිම එක්ව සම්බන්ධ වේ. යම් මේ සංවරයක් ශීතය හා උෂ්ණය ඉවසන්නේ වේද'[2] ආදි නයින් දක්වන ලද්දේද, මෙය ඛන්තිසංවර නම්. යම් මේ සංවරයක් 'උපන් කාමවිතර්කයන් හෝ නො ඉවසාද'[3] යන ආදි නයින් දක්වනලද්දේ ද මෙය විරියසංවර නම්. ආජීවපාරිසුද්ධියද මෙහිම එක්ව සම්බන්ධ වේ. මෙසේ පස්වැදෑරුම් සංවරයද, පවට බිය ඇති කුලපුත්‍රයන්ගේ අවස්ථානුරූප වැළැක්මක් වේනම් එයද, යන මේ සියල්ලම සංවරශීලයයි දතයුතුය. අව්‍යතික්‍රම ශීලය යනු සමාදන්වූ ශීලය කායික වශයෙන් හෝ වාචසික වශයෙන් කඩ නොකිරීමයි. මේ වනාහි ශීලය නම් කිමෙක්දැයි යන ප්‍රශ්නයට විසඳුමයි.

සෙසු ප්‍රශ්නයන් අතර, **කවර අරුතෙකින් ශීල නම් වේද යත්:** ශීලන (එකලස්වීම) යන අර්ථයෙන් ශීල නම් වේ. මෙම ශීලනය නම් **කිමෙක්ද?** කායකර්මාදියෙහි එකලස් බවයි. දුශීලතා වශයෙන් නොවිසුරුණු බවයි යන අර්ථයි, නොහොත් කුශල ධර්මයන්ගේ පැළඹීමට ප්‍රතිෂ්ඨා වශයෙන් ආධාරවන බවයි. මෙහිලා මෙම දෙඅරුත ශබ්දශාස්ත්‍රඥයෝ අනුදනිති. අන් කෙනෙක් වනාහි 'සිරස' යන අරුතද 'ශීතල' යන අරුතද යන මේ ආදි නයින්ද මෙහි අරුත් විවරණය කෙරෙති.

අනතුරුව **මෙහි ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨානයෝ කවරහුද** යන මෙහි,

සීලනං ලක්ඛණං තස්ස භින්නස්සාපි අනෙකධා
සනිදස්සනත්තං රූපස්ස යථා භින්නස්ස' නෙකධා

නොයෙක් ආකාරයෙන් බෙදී ගියාවූ රූපයෙහි දැකියහැකිබව පොදු ලක්ෂණය වන්නාසේ (චේතනාදි වශයෙන්) නොයෙක් ආකාරයෙන් බෙදීගියේ නමුදු එම ශීලයෙහි ලක්ෂණය එකලස්බවයි.

---

(1) සුත්තනිපාත අජිතමාණවපුච්ඡා- Sn, 1035

(2) 'ඛමො හොති සීතස්ස උණ්හස්ස' ම.නි. සබ්බාසව සූ - Mi 10

(3) 'උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති' ම. නි. සබ්බාසව සූ -Mi 11

යම්සේ වනාහි නීලපීතාදිවශයෙන්, නන් ලෙසින් බෙදී ඇතත් දැකියහැකි බව රූපායතනයෙහි ලක්ෂණය වේද, නීලාදී භේදයෙන් බෙදී ගියද දැකිය හැකි බව නොඉක්මවන හෙයිනි. එසේම චේතනාදී භේදයෙන් නන් ලෙසින් බෙදී ඇති ශීලයද කායකර්මාදීන්ගේ එකලස් බවින්ද කුශලධර්මයනට ප්‍රතිෂ්ඨාවන හෙයින්ද, යම් මේ ශීලනයක් කියන ලද්දේද, එයම එහි ලක්ෂණය වේ. චේතනාදී භේදයෙන් බෙදී සිටියද එකලස්වීමේ හා ප්‍රතිෂ්ඨාවීමේ ස්වභාවය නොඉක්මවන හෙයිනි. මෙබඳු ලක්ෂණ ඇති ශීලයෙහි වනාහි,

දුස්සීල්‍ය විද්ධංසනතා අනවජ්ජගුණො තථා
කිච්චසම්පත්ති අත්‍ථෙන රසො නාම පවුච්චති

දුසිල් නැති කරනබවද, එසේම නිරවද්‍ය ගුණයද යන දෙක (පිළිවෙළින්) කෘත්‍යය, සම්පත්තිය යන දෙඅරුතින් (ශීලය පිළිබඳ) රසයයි කියනුලැබේ.

එහෙයින් මෙම ශීලය වනාහි කෘත්‍යය යන අරුත් ඇති රසය අනුව දුසිල් වැනසීම රසකොට ඇත්තේය; සම්පත්තිය යන අරුත් ඇති රසය අනුව නිවරද බව රසකොට ඇත්තේයයි දතයුතුයි. මෙහි ලක්ෂණාදියෙහි වනාහි කෘත්‍යයම නැතහොත්, සම්පත රස වෙතැයි කියනුලැබේ.

සොචෙය්‍ය පච්චුපට්ඨානං තයිදං තස්ස විඤ්ඤූහි
ඔත්තප්පඤ්ච හිරිඤ්චෙව පදට්ඨානන්ති වණ්ණිතං

නොකිලිටිබව එහි පච්චුපට්ඨානය හෙවත් නිතර එළඹසිටින ගුණයයිද, හිරිඔතප් යන දෙක පදට්ඨානය හෙවත් පදනමයයිද නුවණැත්තන් වර්ණනා කොටඇත.

එම ශීලය වෙත නිරන්තරයෙන් එළඹ සිටිනුයේ 'කායික (අකුසල් වලින්) නොකිලිටිබවය. වාචසික (අකුසල්වලින්) නොකිලිටිබවය. මානසික (අකුසල්වලින්) නොකිලිටිබවය'(1) යි මෙසේ කියනලද නොකිලිටිබව නිරන්තරයෙන් එය හා සමග එළඹ සිටිති'යි ගැවසෙති'යි යන අර්ථයයි. හිරිඔතප් දෙක එම ශීලයට පදනමයයිද දනුමැතියන් විසින් වර්ණනාකොට ඇත, ආසන්න කාරණයයි යන අර්ථයයි. හිරිඔතප් ඇති කල්හි සිල් උපදිතැයිද, පවතිතැයිද, එය නැති කල්හි නොඋපදිතැයිද, නොපවතිතැයිද, යනු අර්ථයයි. මේ ආකාරයෙන් ශීලය පිළිබඳ ලක්ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨානයන් දතයුතුය.

(1) 'කායසොචෙය්‍යං-පෙ-මනොසොචෙය්‍යං' අං. නි. තිකනි - Ai 271

**සීලයෙහි අනුසස් කවරේද යත්:** විපිළිසර (පසුතැවිලි) නොවීම ආදී නොයෙක් ගුණයන්ගේ ප්‍රතිලාභය එහි ආනිසංස වේ. කියන ලදමැයි: 'ආනන්ද, කුශලයෝ වනාහි අවිපිළිසර ප්‍රයෝජන කොට ඇත්තාහුය, ශීලයෝ අවිපිළිසර අනුසස් කොට ඇත්තාහුයි.'(1)

අනෙකක්ද කියනලදි: 'ගෘහපතියනි, සිල්වතකුගේ සිල්සම්පතෙහි අනුසස් පසෙකි, ඒ කවරේද? ගෘහපතියනි, මේ ලෝකයෙහි ශීලසම්පන්නවූ සිල්වත් පුද්ගලයා තමාගේ අප්‍රමාදබව හේතුකොට මහත් භෝගසම්භාරයක් ලබයිද, මෙය සිල්වත්හුගේ ශීලසම්පත්තියෙහි පළමුවන අනුසසයි. තවද ගෘහපතියනි, ශීලසම්පන්නවූ සිල්වත්හුගේ කල්‍යාණවූ කීර්තිරාවයෙක් පැනනඟියි. මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියෙහි දෙවන අනුසසයි. තවද ගෘහපතියනි, ශීලසම්පන්නවූ සිල්වත් තෙමේ යම් යම් පිරිසක් වෙත එළඹේද, ක්‍ෂත්‍රිය පිරිසක් වේවයි, බ්‍රාහ්මණ පිරිසක් වේවයි, ගෘහපති පිරිසක් වේවයි, ශ්‍රමණ පිරිසක් වේවයි, නොපැකිල විශාරද ලීලාවෙන් එළඹෙයි. මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියෙහි තෙවන අනුසසයි. තවද ගෘහපතියෙනි, ශීලසම්පන්නවූ සිල්වත් තෙමේ නුමුළාව කලුරිය කරයි, මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියෙහි සිවුවන අනුසසයි. තවද ගෘහපතියෙනි, ශීලසම්පන්නවූ සිල්වත්තෙමේ දිවි තොරවීමෙන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලෝකයෙහි උපදියි. මේ සිල්වත්හුගේ ශීලසම්පත්තියෙහි පස්වන අනුසසයි.'

තවද, 'මහණෙනි, ඉදින් භික්‍ෂු තෙමේ සබ්‍රම්සරුන් අතර ප්‍රිය වන්නෙමි, මනාප වන්නෙමි, ගරු සම්මානයට සුදුස්සෙක් වන්නෙමි'යි අපේක්‍ෂා කරන්නේ නම්, ශීලය පරිපූරණය කරන්නෙක්ම වන්නේය.'(3) යන මේ ආදි නයින් ප්‍රිය මනාපතාදීවූ නිර්වාණය කෙළවරකොට ඇති නොයෙක් ශීලානිශංසයෝ කියනලද්දහුය. මෙසේ ශීලය අවිපිළිසර ආදී නොයෙක් ගුණයන් ආනිසංසකොට ඇත්තේය. යළිදු:

සාසනෙ කුලපුත්තානං පතිට්ඨා නත්ථි යං විනා
ආනිසංසපරිච්ඡෙදං තස්ස සීලස්ස කො වදෙ

න ගඞ්ගා යමුනා චාපි සරභූ වා සරස්සතී,
නින්නගා වා'චි රවතී මහී චාපි මහා නදී

(1) 'අවිප්පටිසාරත්ථානි ඛො ආනන්ද-පෙ-අවිප්පටිසාරානිසංසානි' සං.නි.මහාවග්ග

(2) 'පඤ්චිමේ ගහපතයො ආනිසංසා-පෙ-සීලවතො සීලසම්පදාය' දී.නි. මහාපරිනිබ්බාණ සු. - D ii 86 අං.නි. පඤ්චක නිපාත

(3) 'ආකඞ්ඛෙය්‍ය ඛො භික්ඛවෙ... පරිපූරකාරී' ම.නි. ආකඞ්ඛෙය්‍ය සු - M i 33

සක්කුණන්ති විසොධෙතුං තං මලං ඉධ පාණිනං
විසොධයති සත්තානං යං වෙ සීලජලං මලං

න තං සජලදා වාතා න චාපි හරිචන්දනං
නෙව හාරා න මණයො න චන්දකිරණඞ්කුරා

සමයන්තීධ සත්තානං පරිළාහං සුරක්ඛිතං
යං සමෙති ඉදමරියං සීලං අච්චන්තසීතලං

සීලගන්ධසමො ගන්ධො කුතො නාම භවිස්සති
සො සමං අනුවාතෙ ච පටිවාතෙ ච වායති
සග්ගාරොහණසොපානං අඤ්ඤං සීලසමං කුතො,

ද්වාරං වා පන නිබ්බාණනගරස්ස පවෙසනෙ
සොභන්තෙවං න රාජානො මුත්තාමණිවිභූසිතා

යථා සොභන්ති යතිනො සීලභූසනභූසිතා,
අත්තානුවාදදිභයං විද්ධංසයති සබ්බසො,

ජනෙති කිත්තිං හාසඤ්ච සීලං සීලවතං සදා
ගුණානං මූලභූතස්ස දොසානං බලඝාතිනො
ඉති සීලස්ස විඤ්ඤෙය්‍යං ආනිසංසකථාමුඛං'.

ශාසනයෙහි කුලපුත්‍රයන්හට යම් ශීලයක් හැර අන් පිහිටෙක් නැද්ද එම ශීලයෙහි ආනිසංසයන් පිරිසිඳ පැවසීමට කවරෙක් සමත්වේද?

ගංගා, යමුනා, සරභූ, සරස්වතී, අචිරවතී, මහී යන ගලායන මහාගංගාවෝ

මෙලොව සත්වයන් අපිරිසුදු කරන කෙලෙස්මල සෝද හැරීමට නොසමත් වෙති, එහෙත් ශීල නමැති ජලය ඒකාන්තයෙන් සත්වයන්ගේ කෙලෙස්මල සෝද පිරිසුදු කරයි.

සීකර සහිත සුලහය, රන්වන් සඳුන්ය, මුතුහරය, මැණික් වෙසෙස්ය, සඳකිරණය යන මෙතෙක් දෑ අතුරෙන් කිසිවක්,

ලෝකසත්වයාගේ කෙලශපරිදහය ශමනයකරනු නොසමත් වේ, එහෙත් මනාව රක්නාලද අත්‍යන්තශීතලවූ මේ උතුම්වූ ශීලය එම පරිදහය ශමනය කරයි,

සිල්සුවඳ හා සමාන සුවදෙක් කොතැනින් හෝ වන්නේද? එම සිල්සුවඳ යටිසුළඟට මෙන්ම උඩුසුළඟටද, එකසේ හමයි.

දෙව්ලොවට නැඟීමට ශීලය හා සම කළහැකි අන් හිණෙක් කොයින්ද? මොක්පුරට පිවිසීමට එම ශීලය හා සම කළහැකි අන් දෙරෙක් කොයින්ද?

සිල් නමැති අබරණින් සැදුණ යතිවරයෝ යම්සේ හොබිත්ද, මුතුමිණියෙන් සැරසුණ රජදරුවෝද, එසේ නොහොබිත්.

අත්තානුවාද, (තමා තුළින්ම එන අපවාද) ආදී භය සර්වප්‍රකාරයෙන් නැතිකරයි, සිල්වතුන්හට එම ශීලය සැම කල්හිම කීර්තියද සන්තුෂ්ටියද දනවයි.

ගුණයනට මුල්වන, දෝෂයන්ගේ බලය නසාලන, ශීලයෙහි අනුසස් පිළිබඳ විස්තරය මෙසේ දතයුතුය.

**ඉක්බිති, මේ ශීලය කී ආකාරවේදැයි** යමක් කියන ලද්දේද, එහි විසඳුම මෙසේය: පළමුකොට මේ සියලු ආකාර ඇති ශීලය තෙමේ එකලස් කිරීමේ ලක්‍ෂණයෙන් එක්ම ආකාර වේ. චාරිත්‍ර වාරිත්‍ර වශයෙන් දෙආකාර වේ. එසේම ආභිසමාචාරික, ආදිබ්‍රහ්මචරියක වශයෙන්ද, විරති, අවිරති වශයෙන්ද, නිස්සිත අනිස්සිත වශයෙන්ද, කාලපරියන්ත, ආපාණකෝටික වශයෙන්ද, සපරියන්ත, අපරියන්ත වශයෙන්ද, ලෞකිකලොකෝත්තර වශයෙන්ද (එකක් පාසා) දෙආකාර වේ. හීන, මධ්‍යම, ප්‍රණීත වශයෙන් තුන් ආකාර වේ. එසේම අත්තාධිපතෙය්‍ය, ලෝකාධිපතෙය්‍ය, ධම්මාධිපතෙය්‍ය වශයෙන්ද, පරාමට්ඨ, අපරාමට්ඨ, පටිප්පස්සද්ධි වශයෙන්ද, විසුද්ධ, අවිසුද්ධ, වේමතික වශයෙන්ද, සේඛ, අසේඛ, නෙවසේඛාසේඛ වශයෙන්ද, තුන්ආකාර වේ. හානභාගීය, ඨිතිභාගිය, විසෙසභාගීය, නිබ්බේධභාගීය වශයෙන් සිවුආකාර වේ. එසේම භික්ඛු, භික්ඛුණී, අනුපසම්පන්න, ගහට්ඨ වශයෙන්ද, පකති, ආචාර, ධම්මතා, පුබ්බහේතුක වශයෙන්ද, පාතිමොක්ඛසංවර ඉන්ද්‍රියසංවර, ආජීවපාරිසුද්ධි, පච්චයසන්නිස්සිත වශයෙන්ද, සිවු ආකාර වේ. පරියන්ත පාරිසුද්ධි සීල ආදී වශයෙන් පස්ආකාර වේ. කියනලද මැයි පටිසම්භිද වෙහි: 'පරියන්ත පාරිසුද්ධි සීලය, අපරියන්ත පාරිශුද්ධි ශීලය පරිපුණ්ණ පාරිසුද්ධි සීලය, අපරාමට්ඨ පාරිසුද්ධි සීලය, පටිප්පස්සද්ධි පාරිසුද්ධසීලයයි ශීලය පස්ආකාර වේ.'(1) එසේම පහාණ, වේරමණී, චේතනා, සංවර, අවීතික්කම වශයෙන්ද පස්ආකාර වේ.

එහි එක්වැදෑරුම් කොටසෙහි අර්ථය යට කී පරිදිම දතයුතුය. දෙවැදෑරුම් කොටසෙහි: භාග්‍යවතුන් වහන්සේ විසින් මේ මේ දෑ කළ

---

(1) 'පඤ්චසීලානි... පටිප්පස්සද්ධිපාරිසුද්ධිසීලං' පටිසම්භිද, ඤාණකථා - Ps 142

යුතුය'යි පනවනලද සිකපද පිරීම වාරිත්‍රයි; 'මේ මේ දෑ නොකළයුතුය'යි පිළිකෙව් කරන ලද්දක් නොකිරීම වාරිත්‍රයි. එහි වචනාර්ත්‍ථය මෙසේයි: ඒ ශීලයෙහි හැසිරෙති'යි, එය පුරන්නකු වශයෙන් පවතිති'යි චාරිත්‍ර නම්. වලක්වනලද දෙයින් වැලකෙති'යි, එයින් රැකෙති'යි වාරිත්‍ර නම්. එහි චාරිත්‍රය ශ්‍රද්ධා, වීර්ය යන දෙකින් සිද්ධ වේ, වාරිත්‍රය ශ්‍රද්ධා සති යන දෙකින් සිද්ධ වේ. මෙසේ චාරිත්‍ර වාරිත්‍ර වශයෙන් දෙආකාරවේ. දෙවන ද්විකයෙහි, අභිසමාචාර නම් උතුම් සමාචාරයයි, අභිසමාචාරයම (තදර්ත්‍ථ වශයෙන්) ආභිසමාචාරික නම් වේ. අභිසමාචාරය උදෙසා පනවන ලදහ'යි හෝ ආභිසමාචාරික නම් වේ. ආජීවට්ඨමක ශීලය හැර සෙසු ශීලයනට මේ අධිවචනයි. මාර්ගබ්‍රහ්මචර්යාවට මුල් වූහ'යි ආදිබ්‍රහ්මචර්යක නම්. මෙය ආජීවට්ඨමක ශීලයට අධිවචනයි. එය වනාහි ආරම්භයෙහිදීම පිරිසුදු කළයුතු හෙයින් (විශුද්ධි) මාර්ගයට මුල් වූයේය. එහෙයින් කීහ: ඔහුගේ වනාහි කායකර්ම, වාක්කර්ම, ආජීව යන මේවා මුලදීම සුපිරිසුදු වූයේ වේ.(1) නොහොත් යම් ශික්‍ෂාපදයක් ඛුද්දානුඛුද්දකයයි කියන ලද නම් මෙය ආභිසමාචාරික ශීලයයි. සෙසු ශික්‍ෂාපද ආදිබ්‍රහ්මචර්යක ශීලයයි. නැතහොත්, උභතොවිභඞ්ගයට අන්තර්ගත වූයේ ආදිබ්‍රහ්මචර්යකයි, ඛන්‍ධකවත්හි අන්තර්ගතවූයේ ආභිසමාචාරිකයි. එම ආභිසමාචාරිකය සමෘද්ධවීමෙන් ආදිබ්‍රහ්මචර්යකය සමෘද්ධවේ. එහෙයින්ම කීහ: මහණෙනි, ඒ භික්‍ෂුතෙමේ වනාහි ආභිසමාචාරික ධර්මය පරිපූරණය නොකොට ආදිබ්‍රහ්මචර්යක ධර්මය පරිපූරණය කරන්නේය යනු කිසිවිටෙකත් සිදුනොවේ.(2) මෙසේ ආභිසමාචාරික ආදිබ්‍රහ්මචර්යක වශයෙන් දෙආකාර වේ. තෙවන ද්විකයෙහි හුදෙක් ප්‍රාණඝාතාදියෙන් වැලකීමම විරති ශීලයයි; සෙසු චේතනාදිය අවිරති ශීලයයි. මෙසේ විරති, අවිරති වශයෙන් දෙආකාර වේ. සිවුවන ද්විකයෙහි: නිස්සය යනු තණ්හානිස්සය, දිට්ඨිනිස්සයයි දෙකෙකි. එහි යම් ශීලයක්, 'මම් මේ ශීලය හේතුකොටගෙන දෙවියෙක් හෝ වන්නෙමි, නැතහොත් දෙවියන් හා සමාන අන් කෙනෙක් හෝ වන්නෙමි'(3)යි මෙසේ භව සම්පත් අපේක්‍ෂා කරමින් පවත්වනලද්දේ නම් මේ තණ්හානිස්සිතයි. ශීලය හේතුකොටගෙන ශුද්ධිය වන්නේයයි මෙසේ

---

(1) 'පුබ්බෙව ඛො පනස්ස කායකම්මං වචීකම්මං ආජීවො සුපරිසුද්ධො හොති' අං. නි. පඤ්චකනිපා හා M iii 289

(2) 'සො වත භික්ඛවෙ, භික්ඛු ආභිසමාචාරිකධම්මං අපරිපූරෙත්වා අදිබ්‍රහ්මචරියකං ධම්මං පරිපූරෙස්සතී ති නෙ'තං ඨානං විජ්ජති - අංගුත් නි. පඤ්චක- නිපාත - A iii 14ff

(3) 'ඉමිනාහං සීලෙන දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා' - අං. නි. සත්තක නිපා -M i 102

ශුද්ධිදෘෂ්ටියෙන් යම් ශීලයක් පවත්වනලද්දේ නම් මේ දිට්ඨිනිස්සිතයි. යම් ලෝකෝත්තර ශීලයක් වේනම් එයද, එම ලෝකෝත්තර ශීලය කරා මෙහෙයවන යම් ලෞකික ශීලයක් වේනම් එයද අනිස්සිතයි. මෙසේ නිස්සිත, අනිස්සිත වශයෙන් දෙආකාර වේ. පස්වන ද්විකයෙහි කාල සීමාවක් කොට සමාදන්වූ ශීලය කාලපර්යන්තයි. දිවිහිමිකොට සමාදන්ව එසේම පවත්වනලද ශීලය ආපාණකෝටිකයි. මෙසේ කාලපරියන්ත ආපාණකෝටික වශයෙන් දෙආකාර වේ. සවන ද්විකයෙහි: ලාභ, යසස්, ඥාති, අංග, ජීවිත ආදී වශයෙන් දක්නාලද සීමා ඇති ශීලය සපරියන්ත නම්. එබඳු සීමා නැති ශීලය අපරියන්ත නම්. කියනලදමැයි පටිසම්භිදායෙහි: 'සපරියන්ත ශීලය නම් කිමෙක්ද? ලාභය සීමාකොටගත් ශීලයක් ඇත, යසස සීමා කොටගත් ශීලයක් ඇත. ඥාතීන් සීමාකොටගත් ශීලයක් ඇත, ශරීරාවයව සීමාකොටගත් ශීලයක් ඇත, ජීවිතය සීමා කොටගත් ශීලයක් ඇත. ලාභය සීමාකොටගත් ශීලය කිමෙක්ද? මේ ශාසනයෙහි කිසිවෙක් ලාභය හේතුකොට ලාභය නිමිති කොට, ලාභය පිණිස යම්සේ සමාදන්වූ ශික්ෂාපදය ඉක්මවත් නම් එම ශීලය ලාභ පර්යන්ත වේ'(1) මේ ක්‍රමයෙන්ම සෙසු කරුණුද විස්තර කළයුතුය. අපරියන්ත ශීලය විසඳීමේදීද කියනලදමැයි: 'ලාභ පර්යන්ත නොවන ශීලය කිමෙක්ද? මේ ශාසනයෙහි කිසිවෙක් ලාභය හේතුකොට, ලාභය නිමිතිකොට, ලාභය පිණිස තමන් සමාදන්වූ ශික්ෂාපදය කඩ කිරීමට සිතිවිලිමාත්‍රයක් හෝ නොඋපදවත් නම්, ඔහු කිමෙකැයි එය කඩ කෙරෙත් ද? මෙවන් ඒ ශීලය ලාභපරියන්ත නොවේ'(2) මෙම ක්‍රමයෙන් සෙස්සද විස්තර කළ යුතුය. මෙසේ පරියන්ත, අපරියන්ත වශයෙන් දෙආකාර වේ. සත්වන ද්විකයෙහි: ආශ්‍රවයන්ගෙන් නොමුත් සියලු ආකාර ඇති ශීලය ලෞකික වේ. ආශ්‍රව රහිත ශීලය ලෝකෝත්තර වේ. එහි ලෞකික ශීලය විශේෂ භව සම්පත් ගෙන දෙන්නේ වේ. එය භවය කෙළවර කරනු පිණිස මෙහෙයවන රුකුලක්ද වේ. යම්සේ කියන ලද්දේ දැ: විනය සංවරය සඳහාය, සංවරය අවිපිළිසර සඳහාය, අවිපිළිසර ප්‍රමෝදය සඳහාය, ප්‍රමෝදය ප්‍රීතිය සඳහාය, ප්‍රීතිය පස්සද්ධිය සඳහාය, පස්සද්ධිය සුවය සඳහාය, සුවය සමාධිය සඳහාය, සමාධිය තත්වාවබොධය සඳහාය, තත්වාවබොධය (සසර) කලකිරීම සඳහාය, කලකිරීම විරාගය සඳහාය, විරාගය විමුක්තිය සඳහාය, විමුක්තිය විමුක්තිඥානදර්ශනය සඳහාය, විමුක්තිඥානදර්ශනය උපාදාන රහිත පරිනිර්වාණය සඳහාය, යම් මේ

(1) 'කතමං තං සීලං සපරියන්තං? අත්ථි සීලං ලාභපරියන්තං... ඉධෙකච්චො...ඉදං තං සීලං ලාභපරියන්තං' -පටිසම්භිදා, ඤාණකථා -Ps 143

(2) 'කතමං තං සීලං නලාභපරියන්තං? ඉධෙකච්චො... ඉදං තං සීලං න ලාභපරියන්තං' - පටිසම්භිදා, ඤාණකථා -Ps 144

උපාදන රහිත චිත්තවිමෝක්ෂයක් වේනම්, කථාවෙහි ඵලය එයයි, මන්ත්‍රණයෙහි ඵලය එයයි, ළඟ හිඳ සාකච්ඡා කිරීමෙහි (උපනිසා) ඵලය එයයි. ඇහුම්කන්දීමෙහි ඵලය එයයි.'(1) ලොකෝත්තර ශීලය භවයෙන් මිදීම සිද්ධකරන්නේ වේ, එය ප්‍රත්‍යවෙක්ෂණ ඥනයට ආධාරකයක්ද වේ. මෙසේ ලෞකික-ලෝකෝත්තර වශයෙන් දෙආකාරවේ.

ත්‍රිකයන් අතුරෙන්, පළමුවන ත්‍රිකයෙහි: හීනවූ ඡන්දයෙන්, සිතින්, වීර්යයෙන් හෝ විමසීමෙන් පවත්වනලද ශීලය හීන නම්, මධ්‍යමවූ ඡන්දාදියෙන් පවත්වනලද ශීලය මධ්‍යම නම්. ප්‍රණීතවූ ඡන්දදියෙන් පවත්වන ලද ශීලය ප්‍රණීත නම්. නොහොත් යසස් කාමයෙන් සමාදන්වූ ශීලය හීන නම්, පින්පල කැමැතිව සමාදන්වූ ශීලය මධ්‍යම නම්, ආර්යභාවය පිණිස මෙය කළයුතුයයි සලකා සමාදන්වූ ශීලය ප්‍රණීත නම්. නොහොත්, මම ශීල සම්පන්න වෙමි, මේ අන් භික්ෂූහු පාපස්වභාව ඇති දුශ්ශීලයෝ ය'යි මෙසේ අත්තුක්කංසන (තමා උසස් කොට සැලකීම) පරවම්භන (අනුන් හෙලා දැකීම) ආදියෙන් කිලිටිවූ ශීලය හීන නම්, මෙසේ නොකිලිටිවූ ලෞකික ශීලය මධ්‍යම නම්, ලෝකෝත්තර ශීලය ප්‍රණීත නම්. නොහොත්, තෘෂ්ණා වශයෙන් භවභෝග පිණිස පවත්වනලද ශීලය හීන නම්, ස්වකීය විමෝක්ෂය පිණිස පවත්වනලද ශීලය මධ්‍යම නම්. සියලු සත්‍වයන්ගේ විමෝක්ෂය පිණිස පවත්වනලද ශීලය ප්‍රණීත නම්. මෙසේ හීන, මධ්‍යම, ප්‍රණීත වශයෙන් තුන්ආකාර වේ. දෙවන ත්‍රිකයෙහි: තමාට නොසුදුසු දෙය අත්හරිනු රිසියෙන් ආත්මගෞරවය හේතුකොට, තමා කෙරෙහි ගෞරවයෙන් පවත්වනලද ශීලය අත්තාධිපතෙය්‍ය නම් වේ. ලෝකාපවාදය වලකනු පිණිස ලෝකගෞරවයෙන් පවත්වනලද ශීලය ලෝකාධිපතෙය්‍ය නම්වේ. ධර්මමහත්‍වය පුදනු රිසියෙන් ධර්මගෞරවය හේතුකොට ධර්මය කෙරෙහි ගෞරවයෙන් පවත්වනලද ශීලය ධම්මාධිපතෙය්‍ය නම් වේ. මෙසේ අත්තාධිපතෙය්‍ය ආදි වශයෙන් තුන් ආකාර වේ. තෙවන ත්‍රිකයෙහි: යම් ශීලයක් (යට) ද්විකයන්හි නිස්සිතයයි දක්වන ලද්දේද, එය තෘෂ්ණාදෘෂ්ටීන්ගෙන් පරාමර්ශවූ හෙයින් පරාමට්ඨ නම් වේ. කල්‍යාණගුණයෙන් හෙබි පෘථග්ජනයන් ආර්යමාර්ගය කරා මෙහෙයවන, ශෛක්ෂ්‍යයන්ගේ මාර්ගය හා සමග යෙදෙන ශීලය අපරාමට්ඨ නම් වේ, ශෛක්ෂ්‍ය අශෛක්ෂ්‍ය යන දෙපක්ෂයෙහිම ඵලය හා සමග යෙදෙන ශීලය පටිප්පස්සද්ධ නම් වේ. මෙසේ පරාමට්ඨ ආදී වශයෙන් තුන් ආකාරවේ. සිවුවන ත්‍රිකයෙහි: යම් ශීලයක් ඇවැත්වලට නොපැමිණ පුරනලද්දේද, පැමිණ හෝ පිළියම් කරනලද්දේද, එය විශුද්ධ නම් වේ, ඇවැත්වලට

---

(c) 'විනයො සංවරත්ථාය, සංවරො අවිප්පටිසාරත්ථාය... එතදත්ථා කථා, එතදත්ථා මන්තනා... යදිදං අනුපාද චිත්තස්ස විමොක්ඛො' විනය පරිවාර, චූලසඞ්ගාම -Vin V 164

පැමිණ පිළියම් නොකරනලද ශීලය අවිශුද්ධ නම්වේ, ඇවැතට හේතුවූ කරුණ පිළිබඳව හෝ, ඇවැත පිළිබඳව හෝ, ශික්ෂාපදය ඉක්මවීම පිළිබඳව හෝ විමති ඇත්තහුගේ ශීලය වෙමතික නම්වේ. මෙහිලා යෝගාවචරයා විසින් අවිශුද්ධවූ ශීලය පිරිසුදු කරගතයුතුය. වෙමතිකයෙහිලා, විමති සහිත කරුණ ඉක්ම යනු නොදී විමතිය දුරු කොටගතයුතුය. මෙයින් ඔහුට පහසුවක්ම වන්නේය. මෙසේ විශුද්ධාදී වශයෙන් තුන් ආකාර වේ. පස්වන ත්‍රිකයෙහි: ආර්යමාර්ග සතරින්ද, සාමඤ්ඤඵල තුනින්ද යුක්තවූ ශීලය සෙඛ නම් වේ, අර්හත් ඵලයෙන් යුක්තවූයේ අසෙඛ නම් වේ, සෙසු ශීලය සෙඛ හෝ අසෙඛ නොවන ශීලය වේ. මෙසේ සෙඛාදීවශයෙන් තුන්ආකාර වේ. පටිසම්භිදයෙහි වනාහි යම් හෙයකින් ලෝකයෙහි ඒ ඒ සත්ත්වයන්ගේ ස්වභාවයද ශීලයයි. කියනු ලබන හෙයින්, යම් ස්වභාවයක් හේතුකොට මේ තෙමේ සුඛශීලයෙකි, මේ තෙමේ දුඃඛශීලයෙකි, මේ තෙමේ කලහ ශීලයෙකි, මේ තෙමේ මණ්ඩනශීලයෙකි'යි බෙණෙන හෙයින්, එම් අර්ථයෙන්, 'කුශල ශීලය, අකුශල ශීලය, අව්‍යාකෘත ශීලයයි තුනෙකි'(1). මෙසේ කුශලාදී වශයෙන් තුන් ආකාරවේයයි කියනලදි. එහි අකුශල ශීලය මෙම අර්ථයෙහි අභිප්‍රේතවූ ශීලයෙහි ලක්ෂණයන් අතර ඇති කිසිවක් හා සමග නොගැලපෙති'යි හඟිමින් මෙහි ගෙනහැර නොදක්වනලදි. එහෙයින් කියනලද නයින්ම මෙහි තුන්ආකාරබව දතයුතුය.

චතුෂ්කයන් අතුරෙන් ප්‍රථම චතුෂ්කයෙහි:
යො'ධ සෙවති දුස්සීලෙ සීලවන්තෙ න සෙවති,
වත්ථුවීතික්කමෙ දෙසං න පස්සති අවිද්දසු
මිච්ඡාසඞ්කප්පබහුලො ඉන්ද්‍රියානි න රක්ඛති,
එවරූපස්ස වෙ සීලං ජායතෙ හානභාගියං
යො පන'ත්තමනො හොති සීලසම්පත්තියා ඉධ,
කම්මට්ඨානානුයොගම්හි න උප්පාදෙති මානසං
තුට්ඨස්ස සීලමත්තෙන අඝටන්තස්ස උත්තරිං,
තස්ස තං ඨිතිභාගීයං සීලං භවති භික්ඛුනො
සම්පන්නසීලො ඝටති සමාධත්ථාය යො පන,
විසෙසභාගියං සීලං හොති එතස්ස භික්ඛුනො
අතුට්ඨො සීලමත්තෙන නිබ්බිදං යො'නුයුඤ්ජති,
හොති නිබ්බෙධභාගීයං සීලමෙතස්ස භික්ඛුනො ති.

මේ ශාසනයෙහි යමෙක් දුසිලුන් සේවනය කෙරේද, සිල්වතුන් සේවනය නොකෙරේද, අඥනවූ හේ තෙමේ (ශික්ෂාපද) වස්තූන් ඉක්මවීමෙහි දොස් නොදකී.

---

(1) "තීණි සීලානි කුසලසීලං, අකුසලසීලං අබ්‍යාකතසීලං" පටිසම්භිද - ඤාණකථා -Ps 144

මිථ්‍යා සංකල්පනා බහුල කොට ඇති, ඉන්ද්‍රියයන් නොරකින මෙවැන්නහුගේ ශීලය ඒකාන්තයෙන් හානභාගීය වේ.

මේ ශාසනයෙහි යමෙක් වනාහි තමාගේ ශීලසම්පත්තියෙන් තෘප්තියට පත්ව කර්මස්ථානානුයෝගයෙහි සිත් නො උපදවාද,

ශීලමාත්‍රයෙන් තෘප්තව උතුරුම්තිස්දම්, උදෙසා වීර්ය නොකරන එවන් භික්ෂූහුගේ ඒ ශීලය ඨිතිභාගීය වේ.

ශීලසම්පන්නවූ යමෙක් වනාහි සමාධිය පිණිස වීර්ය කෙරේද, මෙවන් භික්ෂූහුගේ ශීලය විසෙසභාගීය වේ.

ශීලමාත්‍රයෙන් අතෘප්තවූ යමෙක් තෙමේ විරාගය වෙත සිත යොදවාද මෙවන් භික්ෂූහුගේ ශීලය නිබ්බෙධභාගීය වේ.

මෙසේ හානභාගීය ආදී වශයෙන් සිවුආකාර වේ. දෙවන චතුෂ්කයෙහි: භික්ෂූන් අරබයා පනවනලද, භික්ෂුණීන් උදෙසා පනවන ලද ශික්ෂාපදයන් කෙරෙන් විශේෂ කොට ඔවුන් (භික්ෂූන්) විසින්ම රැකියයුතු ශික්ෂාපද, භික්ෂුශීලයයි, භික්ෂුණීන් අරබයා පනවනලද, භික්ෂූන් උදෙසා පනවනලද ශික්ෂාපදයන් කෙරෙන් විශේෂකොට ඔවුන් (භික්ෂුණීන්) විසින්ම රැකියයුතු ශික්ෂාපද, භික්ෂුණීශීලයයි. සාමණේර සාමණේරීන් විසින් රැකියයුතු, දශශීලය අනුපසම්පන්නශීලයයි. උවසු උවැසියන් විසින් නිරන්තරයෙන් රැකියයුතු සිකපද පසද, උත්සාහ ඇතොත් රැකියහැකි සිකපද දසයද, උපොසථාංග වශයෙන් රැකියහැකි සිකපද අටද යන මේ ගෘහස්තශීලයයි, මෙසේ භික්ඛුසීලාදි වශයෙන් සිවුආකාර වේ. තුන්වන චතුෂ්කයෙහි: උතුරුකුරු දිවයින් වැසි මනුෂ්‍යයන් විසින් ස්වභාව වශයෙන්ම රැකෙන ශීලය ප්‍රකෘතිශීලයයි, ඒ ඒ කුල පරම්පරාවන්, ඒ ඒ දේශයන්, ඒ ඒ ලබ්ධිකයන් විසින් තමතමනට ආවේණික සීමාවනට අනුව පවත්වාගෙන ආ චාරිත්‍රවිධි ආචාරශීලයයි, 'ආනන්දය, බොධිසත්ව කෙනකු මව් කුස පිළිසිඳගත් තැන් පටන් එම බොධිසත්වමාතාවට පුරුෂයන් කෙරෙහි කාමගුණයෙන් යුතු සිතක් පහළ නොවීම ධර්මතාවෙකි'(1) යනුවෙන් කියනලද බෝධිසත්වමාතාවගේ ශීලය ධර්මතා ශීලයයි, මහාකාශ්‍යපාදී ශුද්ධසත්වයනටද, බෝධිසත්වයනටද, ඒ ඒ ජාතියෙහි සහජයෙන් පිහිටන ශීලය පූර්වහේතුක ශීලයයි, මෙසේ ප්‍රකෘතිශීලාදී වශයෙන් සිවුආකාර වේ. සිවුවන චතුෂ්කයෙහි: මේ ශාසනයෙහි භික්ෂුතෙමේ ප්‍රාතිමොක්ෂසංවරශීලයෙන් සංවෘතවූයේ, ආචාර ගොචරසම්පන්නවූයේ ස්වල්පමාත්‍රවූද වරදෙහි බිය දක්නාසුලුවූයේ ශික්ෂාපදයන් සමාදන්ව

(1) 'ධම්මතා එසා ආනන්ද, යද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, න බොධිසත්තමාතු පුරිසෙසු මානසං උප්පජ්ජති කාමගුණූපසංහිතං' දී. නි. මහාපදාන සු.

හික්මෙමින් වාසය කරයි'[1] යනුවෙන් මෙසේ භාග්‍යවතුන්වහන්සේ විසින් යමක් වදරන ලද්දේද, මෙම ශීලය ප්‍රාතිමොක්ෂසංවරශීලයයි, 'ඒ භික්ෂු තෙමේ ඇසින් රූපයක් දක නිමිති වශයෙන් ග්‍රහණය නොකරයි, විසිතුරුලකුණු වශයෙන් ග්‍රහණය නොකරයි. යම් ග්‍රහණයක් හේතුකොටගෙන අසංවෘතවූ චක්ෂුරින්ද්‍රිය ඇතිව වාසය කරන්නහු කරා අභිද්‍යා දෞර්මනස්‍ය ආදී පවිටු අකුශල ධර්මයෝ ගලා එත්ද, එයින් වැලකීම පිණිස පිළිපදියි, චක්ෂුරින්ද්‍රිය රැකගනියි, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කණින් ශබ්දයක් අසා, - පෙ - නාසයෙන් ගඳක් ආඝ්‍රාණය කොට දිවෙන් රසයක් විඳ, - පෙ - කයින් පහසක් විඳ, - පෙ - මනසින් ඥෙය්‍ය ධර්මයක් දැන, නිමිති වශයෙන් ග්‍රහණය නොකරයි විසිතුරු ලකුණු වශයෙන් ග්‍රහණය නොකරයි - පේ - මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ'[2] යනුවෙන් යමක් වදරනලද්දේද, මෙය ඉන්ද්‍රියසංවරශීලයයි. ජීවිකාව පිළිබඳව පනවන ලද ශික්ෂාපද සය ඉක්මවීම් වශයෙන්ද, ලාභ හේතුවෙන් වංචනික ක්‍රියාවල යෙදීම, වාටුබස් බිණීම, ඉඟියෙන් පැවසීම, අනුන් ගුණ මැකීම, පැහැරගනු රිසිවීම, යන මේ පාප ස්වභාවයන්ගේ වශයෙන්ද, පවත්වනුලබන මිථ්‍යාජීවයෙන් වැලකීම ආජීවපාරිශුද්ධි ශීලයයි, 'නුවණින් මෙනෙහි කොට සිවුරු පරිභොග කරයි, හුදෙක් ශීතය වැලකීම පිණිස'[3] ආදී වශයෙන් කියනලද ප්‍රත්‍යවේක්ෂාවෙන් පිරිසිදුව සිවුපසය පරිභොග කිරීම ප්‍රත්‍යයසන්නිශ්‍රිත-ශීලයයි.

එම සිවුවන චතුෂ්කයෙහි මුල පටන් අනු පිළිවෙළින් පදවර්ණනාව හා සමග විනිශ්චය විභාගය මෙසේයි: **ඉධ** යනු, මේ ශාසනයෙහි, **භික්ඛු** යනු, සසරබිය දක්නා හෙයින්, නොහොත්, කැබැලිකළ වස්ත්‍රාදිය දරන බැවින්, එනමින් ව්‍යවහාරයට පත්වූ ප්‍රාතිමෝක්ෂසංවරයෙන් සංවෘතවූ, ශ්‍රද්ධාවෙන් පැවිදිබවට පත් කුලපුත් තෙමේ, **පාතිමොක්ඛසංවර සංවුතො** යන මෙහි **පාතිමොක්ඛ** යනු, ශික්ෂාපද ශීලයයි, එය වනාහි යමෙක් එය රක්නේද, ආරක්ෂා කරනුයේද, ඔහු අපාය ආදී දුකින් ගලවයි, මුදවයි, එහෙයින් 'පාතිමොක්ඛ' යයි කියනුලැබේ. මනාකොට ඇවිරීම සංවරයයි,

---

(1) 'ඉධ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණු - මත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු' - අභි - ඣාන වි - Vbh 244

(2) 'සො චක්ඛුනා රූපං දිස්වා... මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති' එම - M i 180

(3) 'පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවති යාවදෙව සීතස්ස පටිඝාතාය-ම.නි. සබ්බාසව සු.'-M i 10

මෙය කායිකවූද, වාචසිකවූද සීමා නොඉක්මවීම හඟවන නමෙකි, පාතිමොක්ඛයම සංවර වෙති'යි පාතිමොක්ඛසංවර නම්, එම පාතිමොක්ඛ සංවරයෙන් සංවෘතවූයේ 'පාතිමොක්ඛසංවුත' නම්, එයින් යුක්ත වූයේ, සමන්විතවූයේයි යන අර්ථයි. **විහරති** යනු, ඉරියව්වල යෙදෙයි. **ආචාරගොචරසම්පන්නො'**(1) යන ආදියෙහි අර්ථය පෙළෙහි ආ නයින්ම දත යුතුය, කියනලද මැයි: **'ආචාරගොචර සම්පන්නො'**(2) යනු, ආචාරයෙක් ඇත, අනාචාරයෙක්ද ඇත, එහි අනාචාර යනු කිමෙක්ද? කායික ව්‍යතික්‍රමණය, වාචසික ව්‍යතික්‍රමණය, කායික, වාචසික ව්‍යතික්‍රමණය යන මේ අනාචාරයයි කියනුලැබේ. සියලු ආකාර දුසිල්බව අනාචාරයයි. මේ සස්නෙහි යම් කිසිවෙක් හුණ දීමෙන් හෝ පලාකොළ දීමෙන් හෝ, මල් දීමෙන් හෝ ගෙඩි දීමෙන් හෝ, නහනසුණු දීමෙන් හෝ, දැහැටිදඬු දීමෙන් හෝ රැවටිලි බස් තෙපලීමෙන් හෝ, සැබෑ නොසැබෑ මුසු බස් වැහැරීමෙන් හෝ දරුවන් නැළවීමෙන් හෝ, පණිවුඩ පනත් ගෙනයාමෙන් හෝ බුදුන් විසින් පිළිකෙව් කරනලද අන් කිසි සදෙස් ක්‍රියාවෙකින් හෝ ජීවිකාව කෙරෙත්ද, මේ අනාචාරයයි කියනුලැබේ. එහි ආචාර යනු කිමෙක්ද? කායික අව්‍යතික්‍රමණය, වාචසික අව්‍යතික්‍රමණය, කායික, වාචසික අව්‍යතික්‍රමණය, යන මේ ආචාරයයි කියනුලැබේ. සියලු ආකාර ශීලසංවරය ආචාරයයි. මේ සස්නෙහි යම් කිසිවෙක් හුණ දීමෙන් හෝ, පලාකොළ දීමෙන් හෝ, මල් දීමෙන් හෝ, ගෙඩි දීමෙන් හෝ, නහනසුණු දීමෙන් හෝ, දැහැටිදඬු දීමෙන් හෝ, රැවටිලිබස් දෙඩීමෙන් හෝ, සැබෑ නොසැබෑ මුසු බස් වැහැරීමෙන් හෝ, දරුවන් නැළවීමෙන් හෝ, පණිවුඩපනත් ගෙනයාමෙන් හෝ, බුදුන් විසින් පිළිකෙව් කරනලද අන් කිසි සදෙස් ක්‍රියාවෙකින් හෝ ජීවිකාව නොකෙරෙත්ද, මේ ආචාරයයි කියනු ලැබේ.

ගොචරො යනුː ගෝචරයෙක් ඇත, අගෝචරයෙක්ද ඇත. එහි අගෝචර යනු කිමෙක්ද? මේ සස්නෙහි යම් කිසිවෙක් ගණිකාවන්ගේ හෝ, සැමියන් මළ කතුන්ගේ හෝ, අවිවාහක වියපත් කතුන්ගේ හෝ, නපුංසකයන්ගේ හෝ මෙහෙණින්ගේ හෝ, මත්පැන්හල්වල හෝ ඇසුරට පත්වේද, රජුන් සමඟ හෝ රජමහඇමතියන් සමග හෝ තීර්ථකයන් සමඟ හෝ, තීර්ථකශ්‍රාවකයන් සමඟ හෝ නොසුදුසු ඇසුරට පත්ව හැසිරෙත්ද, සැදැහැ නැති, නොපහන්, භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාදීන්හට දියපොදක් නොදෙන, ආක්‍රෝශපරිභව බෙණෙන, අවැඩ කැමති, අහිත කැමති, අපහසු කැමැති, අවිමුක්ති කැමති කුලයන් සේවනය කෙරෙත්ද, ඇසුරු කෙරෙත්ද, නිරතුරු එළඹ සිටීම කෙරෙත්ද, මේ අගෝචරයයි කියනු ලැබේ. එහි ගෝචර යනු කිමෙක්ද? මේ සස්නෙහි

යම් කිසිවෙක් ගණිකාවන්ගේ හෝ සැමියන් මළ කතුන්ගේ හෝ, අවිවාහකව වියපත් කතුන්ගේ හෝ නපුංසකයන්ගේ හෝ, මෙහෙණින්ගේ හෝ, මත්පැන්හල්වල හෝ ඇසුරට පත් නොවෙත්ද, රජුන් සමග හෝ- පෙ-තීර්ථකශ්‍රාවකයන් සමග හෝ නොසුදුසු ඇසුරෙන් ඉවත්ව හැසිරෙත්ද, සැදැහැති පහන්සිත් ඇති උතුරායන ලිඳක් මෙන් සනහන, කසාවතින් බැබලෙන, භික්ෂූන් යන එන ගමනින් සැලෙන පවන් ඇති, භික්ෂු, භික්ෂුණී උපාසක උපාසිකාවන්හට වැඩ කැමති, - පෙ- විමුක්ති කැමති කුලයන් සේවනය කෙරෙත්ද, ඇසුරු කෙරෙත්ද, නිරතුරු එළඹ සිටීම කෙරෙත්ද මේ ගෝචරයයි කියනුලැබේ. මෙසේ මෙවන් ආචාරයෙන්, මෙවන් ගෝචරයෙන් උපේතවූයේ, සමුපේතවූයේ, උපගතවූයේ, සමුපගතවූයේ, යුක්තවූයේ සංයුක්තවූයේ සමන්විතවූයේද, එහෙයින් ආචාරගෝචරසම්පන්නයයි කියනුලැබේ.'[1]

තවද, මෙහි ආචාරගෝචරයන් මෙම නයින්ද දතයුතුය: අනාචාරය කායික වාචසික වශයෙන් දෙආකාර වේ. එහි කායික අනාචාරය නම් කිමෙක්ද? මේ සස්නෙහි යම්කිසිවෙක් සංඝයා මැදට ගිය කල්හිද, බුහුමන් නැතිව වැඩිමහලු භික්ෂූන් හා ගැටෙමින් සිටිත් නම්, හිඳිත් නම්, ඉදිරියෙන්ද සිටිත් නම් හිඳිත් නම්, උසසුන්වල හිඳිත්නම්, හිස පටන් පොරවාගෙන හිඳිත් නම්, සිටුවාගෙන බෙණෙත් නම්, අත් දිගු කරමින් බෙණෙත් නම්, වැඩිමහලු භික්ෂූන් පාවහන් නැතිව සක්මන් කරද්දී පාවහන් සහිතව සක්මන් කරත් නම්, පහළ මලුවෙක්හි සක්මන් කරද්දී ඉහළ මලුවෙක්හි සක්මන් කරත්නම්, බිම සක්මන් කරද්දී මලුවෙහි සක්මන් කරත්නම්, වැඩිමහලු භික්ෂූන් ළඟ වැද සිටිත් නම් හිඳිත් නම්, නවක භික්ෂූන් අසුන්වලින් වලක්වත් නම්, ගිනිහල්ගෙහිද වැඩිමහලු භික්ෂූන් නොවිමසා දර බහාලත් නම්, දෙර වසත් නම්, පැන් තොටෙහිද වැඩිමහලු භික්ෂූන් හා ගැටෙමින් බසිත් නම්, පෙරටුව බසිත් නම්, ගැටෙමින් නහත් නම්, පෙරටුව නහත් නම්, ගැටෙමින් ගොඩ නගිත් නම්, පෙරටුව ගොඩ නගිත් නම්, ගමට පිවිසෙමින්ද, වැඩිමහලු භික්ෂූන් හා ගැටෙමින් යෙත් නම්, පෙරටුව යෙත් නම්, මහලු භික්ෂූන් පසුකොට පෙරටුපෙරටුව යෙත් නම්, ගෙවල කුල ස්ත්‍රීන් කුල කුමරියන් හිඳින මුවහවුණු ඇසුරුණු යහන් ගබඩාවලට සත් නොකොට පිවිසෙත් නම්, ළදරුවන් හිස පිරිමදිත් නම්, මේ කායික අනාචාරයයි කියනු ලැබේ. එහි වාචසික අනාචාරය නම් කිමෙක්ද? මේ සස්නෙහි යම් කිසිවෙක් සඟ මැදට ගියවිටද, බුහුමන් රහිතව වැඩිමහලු භික්ෂූන් නොවිමසා දහම් දෙසත්නම්, පැන විසඳත් නම්, ප්‍රාතිමෝක්ෂය

---

(1) Vibh 246f

උදෙසත් නම්, පිටුවා ගෙන බෙණෙත් නම්, අත් දිගු කෙරෙමින් බෙණෙත් නම්, ගමට පිවිසි කල්හිද, ස්ත්‍රියක හෝ කුමරියක අමතා, මෙනම් ඇත්තිය, මෙගොත් ඇත්තිය, කුමක් තිබේද? කැඳ තිබේද? බත් තිබේද? කැයුතු කිසිවක් ඇත්ද? කුමක් කත්තමෝ ද? කුමක් බොත්තමෝද? කුමක් බුදිත්තමෝද? කුමක් දෙත්තහුද? යනුවෙන් දෙඩවත් නම් මේ වාචයික අනාචාරයයි කියනුලැබේ.

මෙයට ප්‍රතිපක්‍ෂ වශයෙන් ආචාරය දතයුතුය. තවද ගරුසරු සහිත, හරසර සහිත, හිරිඔතප් ඇති, මනාකොට හැඳගත්, මනාකොට පොරවාගත් හික්‍ෂුතෙමේ ප්‍රසාද දනවන යාමෙන් ඊමෙන්, ඉදිරිපස දෙපස බැලීමෙන්, අඟපසඟ හැකිලීමෙන් දිගහැරීමෙන් යුතුව, පහතට නැඹුරු ඇස් ඇතිව යහපත් ඉරියව්වෙන් යුතුව, දුරැකි ඉඳුරන් ඇතිව බොජුනෙහි පමණ දන, ජාගරියානුයෝගීව, සිහි බුද්ධියෙන් යුතුව, අපිස්සතොස් ගුණයෙන් යුතුව, ඇරඹි වීර්ය ඇතිව, ආභිසමාචාරික ශීලය මනාව පිළිපදිමින්, ගුරුන් කෙරෙහි බුහුමන් ඇතිව, හැසිරේද,'(1) මේ ආචාරයයි කියනුලැබේ. මෙසේ පළමුකොට ආචාරය දතයුතුය.

ගෝචරය වනාහි තුන්ආකාරවේ: උපනිස්සයගෝචරය, ආරක්ඛගොචරය, උපනිබන්ධගොචරය යනුවෙනි. එහි උපනිස්සයගෝචරය යනු කිමෙක්ද? (අල්පේච්ඡකථාදීවූ) දශකථාවස්තු ගුණයෙන් සමන්විතවූ කල්‍යාණමිත්‍රයාය, යමකු ඇසුරු කරමින් පෙර නොඇසූවිරු දහම් අසාද, ඇසූවිරු දහම් පැහැදිලි කරගනීද, සැක දුරු කරගනීද, දෘෂ්ටිය සෘජු කරගනීද, සිත පහදවාගනීද, යමකු අනුව හික්මෙමින් ශ්‍රද්ධාවෙන් වැඩේද, ශීලයෙන් වැඩේද, ඇසුපිරුබවින් වැඩේද, ත්‍යාගගුණයෙන්, ප්‍රඥවෙන් වැඩේද මේ උපනිස්සය ගොචරයයි. ආරක්ඛගොචර යනු කිමෙක්ද? මේ සස්නෙහි භික්‍ෂු තෙමේ ගමට පිවිසියේ වීදියට පිළිපන්නේ පහතට නැඹුරු ඇස් ඇතිව, යුගදඬු පමණ බලමින් සංවර ඇතිව යෙයිද, ඇතුන් නොබලමින්, අසුන්, රිය පාබල සෙන් නොබලමින් ස්ත්‍රීන් නොබලමින්, උඩ නොබලමින් යට නොබලමින් දිසා අනුදිසා නොබලමින් යෙයිද, මේ ආරක්ඛගොචරයයි. උපනිබන්ධගොචරය යනු කිමෙක්ද? සිත පිහිටුවා තැබියයුතු සතරසතිපට්ඨානයයි. වදරන ලදමැයි භාග්‍යවතුන්වහන්සේ විසින්: 'මහණෙනි, භික්‍ෂුව සතු ගෝචරය, ස්වකීය පිය උරුමයවූ විෂය කිමෙක්ද? යම් මේ සතර සතිපට්ඨානයක් වේද, එය මැයි'(2) මෙය

(a) Nd 1 228 f.

(b) 'කො ච භික්ඛවෙ භික්ඛුනො ගොචරො, සකො පෙත්තිකො විසයො යදිදං චත්තාරො සතිපට්ඨානා. සං. නි. මහාවග්ග-S v 148

උපනිබන්ධ ගොචරයයි කියනුලැබේ. මෙසේ මෙම ආචාරයෙන්ද මෙම ගෝචරයෙන්ද උපේතවූයේද-පෙ-සමන්විතවූයේද එහෙයින් ආචාර ගෝචර සම්පන්නයයි කියනුලැබේ.

**'අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී'** (ස්වල්පමාත්‍රවූද වරදෙහි බිය දක්නේ) යනු, නොදැනුවත්ව සිදුවූ සේඛිය ශික්ෂාපදයක් කඩවීම, කිසියම් අකුසල් සිතක් පහළවීම වැනි සුලු වරදෙහි පවා බිය දක්නාසුලු වූයේ"යි. **'සමාදය සික්ඛති සික්ඛාපදෙසු'** (ශික්ෂාපද සමාදන්ව ඒ අනුව හික්මේ) යනු, ශික්ෂාපද අතුරෙන් යම් කිසිවක් පිළිපැදියයුතු වේනම්, ඒ සියල්ල සමාදන්ව ඒ අනුව හික්මෙයි. මෙහිද 'පාතිමොක්ඛ සංවරසංවුතො' (ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවෘතවූයේ) යන මෙයින්ද පුද්ගලාරෝපණයෙන් කළ දේශනයෙන් ප්‍රාතිමෝක්ෂසංවර ශීලය දක්වනලද්දේය. 'ආචාරගොචරසම්පන්නො' යන ආදී සියල්ල වනාහි නිසි ලෙස පිළිපන්නහුට එම ශීලය සමෘද්ධ වනබව දක්වනු පිණිස කියන ලද්'යි දතයුතුය.

**මේ ප්‍රාතිමෝක්ෂාසංවරශීලයයි.**

අනතුරුව **'සො චක්ඛුනා රූපං දිස්වා'** යන ආදී නයින් යමක් දක්වන ලද්දේද, ඒ ඉන්ද්‍රියසංවරශීලයයි. එහි **සො** යනු, ප්‍රාතිමොක්ෂසංවරශීලයෙහි පිහිටි ඒ භික්‍ෂු තෙමේයි. **'චක්ඛුනා රූපං දිස්වා'** යනු කාරණා වශයෙන් 'චක්ඛු'යයි ව්‍යවහාරයට පත් රූප දර්ශනයට සමත්' චක්ඛුවිඤ්ඤාණයෙන' රූපයන්' දැක, පුරාණාචාර්යවරයෝ වනාහි මෙසේ කීහු: ඇස රූප නොදකියි, අචේතනිකවූ හෙයිනි, සිතද නොදකියි, ඇසක් නොවන හෙයිනි, ද්වාරය ආරම්මණය යන දෙක්හි ගැටීමක්' ඇතිවිට චක්ඛුප්පසාදවත්‍ථුකවූ සිතින් දැකීම සිදුවේ. මෙබඳුවූ මෙය වනාහි, 'දුන්නෙන් විදියි' යන ආදියෙහි මෙන් ගම්‍යාර්ථවත් කියමනෙකි. එහෙයින් චක්ඛුවිඤ්ඤාණයෙන් රූපයක් දැකැ'යි යන මෙයම මෙහි අර්ථයි. **න නිමිත්තග්ගාහී** යනු, ස්ත්‍රී පුරුෂ ආදි වශයෙන් හෝ ශුභ අශුභ ආදී වශයෙන් හෝ කෙලෙස් ඉපැදීමට වස්තුභූතවූ නිමිති නොගනියි, දුටු පමණින්ම නවතියි. **නානුබ්‍යඤ්ජනග්ගාහී** යනු, කෙලෙසුනට ලකුණු වනහෙයින්, ප්‍රකටබව ඇතිකරවන හෙයින් අනුබ්‍යඤ්ජනයයි ව්‍යවහාරයට පත් අත් පා මඳසිනා මහසිනා බිණීම් බැලීම් ආදී නොයෙක් ආකාරයන් සිතට නොගනියි, එහි ඇති යථාස්වරූපයම ගනියි. සෑගිරි වැසි මහතිස් තෙරුන් මෙනි. තෙරුන්

සැගිරියෙහි සිට පිඩු පිණිස අනුරාධපුරය දෙසට එද්දී, එක්තරා කුලගෙයක ලෙහෙළිය සිය සැමියා සමග කලහ කොට, මනාව හැදපැළඳ දෙවඟනක මෙන් සැරසී, වේලාසනින්ම අනුරාධපුරයෙන් නික්ම සිය නෑයන්ගේ ගෙට යන්නී අතරමඟදී තෙරුන් දැක කැළඹුණ සිතින් හඬනගා සිනාසුණාය. තෙරණුවෝ 'මේ කිමෙක්ද'යි බලන්නාහු ඇයගේ දත් ඇට කෙරෙහි අශුභ සංඥා ලැබ රහත්බවට පැමිණියාහ. එහෙයින් කියනලදි,

'තස්සා දන්තට්ඨිකං දිස්වා පුබ්බසඤ්ඤං අනුස්සරි,
තත්ථෙව සො ඨිතො ථෙරො අරහත්තමපාපුණි.'

ඇයගේ දත් ඇට දැක පෙර හුරුපුරුදු අශුභ සංඥාව සිහිපත් කළහ. ඒ තෙරණුවෝ එහි සිටිවනම රහත්බවට පැමිණියාහ.

ඇයගේ සැමියාද ඇය ගිය මග අනුව යෙමින් තෙරුන් දැක, 'ස්වාමීනි, කිසි යම් ස්ත්‍රියක යනු දුටුවද'යි විමසීය. තෙරණුවෝ ඔහුට මෙසේ කීහ:

'නාභිජානාමි ඉත්ථී වා පුරිසො වා ඉතො ගතො,
අපි ච අට්ඨිසංඝාටො ගච්ඡතෙස මහාපථෙ'

ස්ත්‍රියක්ද පුරුෂයෙක්දැයි නොදනිමි, එහෙත් මෙතැනින් ගිය තෙල ඇට ගොඩ (තවමත්) මහමග යයි.

**යත්වාධිකරණමෙනං** යන ආදියෙහි, යම් කරුණක් නිසා චක්ඛුරින්ද්‍රියඅසංවරයක් හේතුකොට, සිහි නමැති පියන්පතින් නොවැසූ චක්ඛුරින්ද්‍රිය ඇතිව, නොපියනලද චක්ඛුද්වාර ඇතිව හැසිරෙන පුද්ගලයා වෙත අභිධ්‍යාදීවූ මේ ක්ලේශධර්මයෝ ගලා එත්ද, වැල නොකැඩී එත්ද, **තස්ස සංවරාය පටිපජ්ජති** යනු, ඒ චක්ඛුරින්ද්‍රිය සිහි නමැති පියන් පතින් වසනු පිණිස පිළිපදියි, මෙසේ පිළිපදින්නුයේම චක්ඛුරින්ද්‍රිය රකියි, චක්ඛුරින්ද්‍රිය විෂයෙහි සංවරයට පැමිණේයයිද කියනුලැබේ. එහිලා චක්ඛුරින්ද්‍රිය පිළිබඳව කිසිදු සංවරයෙක් හෝ අසංවරයෙක් නැත, චක්ඛුඃප්‍රසාදය නිසා සිහිය හෝ සිහිමුළාව හෝ සිදු නොවේ. එසේ වතුදු, රූපාරම්මණයක් චක්ඛුඃපථයට පැමිණිවිට භවාංගචිත්තය දෙවරක් ඉපිද නිරුද්ධවූ පසු කිරියමනොධාතුව ආවර්ජන කෘත්‍යය සිදුකෙරෙමින් ඉපිද නිරුද්ධ වේ, ඉක්බිති චක්ඛුර්විඥානය දර්ශනකෘත්‍යයද, විපාකමනෝධාතුව ප්‍රතිග්‍රහණකෘත්‍යයද, අනතුරුව විපාකඅහේතුක මනෝවිඤ්ඤාණධාතුව සන්තීරණකෘත්‍යයද, ඉන් ඉක්බිතිව කිරියඅහේතුක මනෝවිඤ්ඤාණධාතුව

ව්‍යවස්ථාපනකෘත්‍යයද සපුරාලමින් ඉපිද නිරුද්ධවී යයි. අනතුරුව ජවනචිත්තය දිවෙයි. එහිද භවාංග අවස්ථාවෙහිදී හෝ, ආවර්ජනාදී අන් අවස්ථාවෙක්හිදී හෝ සංවරයෙක් හෝ අසංවරයෙක් සිදු නොවේ. ජවනක්‍ෂණයෙහිදී වනාහි, ඉදින් දුසිල්බවක් හෝ සිහිමුළාබවක් හෝ අනවබෝධයක් හෝ අසහනයක් හෝ, අලසබවක් හෝ ඉපැදුණහොත් අසංවරය ඇතිවේ. මෙසේවූ කල්හි වනාහි ඒ තෙමේ චක්‍ෂුරින්ද්‍රිය විෂයෙහි අසංවෘතයෙකැ'යි කියනු ලැබේ. කවර හෙයින්ද යත්, එසේවූ කල චක්‍ෂුර්ද්වාරයද, භවාංගයද, ආවර්ජනාදී වීථිචිත්තයන්ද නොරක්නාලද හෙයිනි. කුමක් මෙන්දයත්, නගරයෙක සතර වාසල් නොවසනලද කල්හි, එහි ඇතුළත ගේදෙර, කොටු ගබඩා ආදිය කෙතරම් රක්නා ලද්දේවුවද, නගරය තුළ පිහිටි සියලු බඩු නොරක්නා ලද්දේමැයි, නගරද්වාරයෙන් පිවිස සොරුන්ට තමන් කැමති දෙයක් කළ හැකිය. එසේම ජවන අවස්ථාවෙහි දුසිල්බව ආදිය උපන් කල්හි, එහි අසංවරබව ඇති කල්හි ද්වාරයද, භවාංගයද, ආවර්ජනාදී වීථිචිත්තයෝද නොරක්නා ලද්දාහු වෙති. එහි (ජවනාවස්ථාවෙහි) ශීලාදිය උපන් කල්හි, ද්වාරයද, භවාංගයද, ආවර්ජනාදී වීථිචිත්තයෝද, රක්නාලද්දාහු වෙති. කුමක් මෙන්දයත්, නගරයක වාසල් මනාසේ රක්නාලද කල්හි එහි ඇතුළත පිහිටි ගේදෙර නොරක්නා ලද්දේවුවද, නගරයතුළ පිහිටි සියලු දෙය සුරක්‍ෂිතවූයේ සුගෝපිතවූයේද වේ. නගරද්වාරයන් වසනලද කල්හි සොරුන් පිවිසීමෙක් නැත. එමෙන්ම ජවනාවස්ථායෙහි ශීලාදිය උපන් කල, ද්වාරයද, භවාංගයද, ආවර්ජනාදී වීථි චිත්තයෝද රක්නාලද්දාහු වෙති, එහෙයින් ජවනක්‍ෂණයෙහි උපදිනුයේම චක්‍ෂුරින්ද්‍රියසංවරයයි කියනුලැබේ. **'කණින් ශබ්දයක් අසා'** යි යන ආදි තන්හිද මෙසේමැයි. රූපාදියෙහි කෙලෙස් අනුව ගිය නිමිති ගැනීම් ආදිය වැලැක්වීම ලක්‍ෂණකොට ඇති මෙය ඉන්ද්‍රියසංවරශීලයයි මෙසේ සැකෙවින් දතයුතුය.

**මේ ඉන්ද්‍රියසංවර ශීලයයි.**

ඉක්බිති ඉන්ද්‍රියසංවරශීලයට පසුව දක්වනලද ආජීවපාරිශුද්ධි-ශීලයෙහිඃ ආජීවය හේතුකොට පනවනලද ශික්‍ෂාපද සයෙහි යනු, "ජීවිකා හේතුවෙන්, ජීවිකාව නිසා ලාමක අදහස් ඇතිව, තෘෂ්ණාවට වසඟව, තමා කෙරෙහි අවිද්‍යමානවූ, නොවූවිරූ, උතුරුමිනිස්දම් ඇතැයි ප්‍රකාශ කෙරේද, ඔහුට පාරාජිකාපත්තිය වන්නේය, ජීවිකා හේතුවෙන්, ජීවිකාව නිසා, සංචරණ භාවයට (ස්ත්‍රී පුරුෂයන් අතර පණිවුඩ ගෙනයන්නකු බවට) පත්වේද, ඔහුට සංඝාදිසේස ආපත්තිය වන්නේය. ජීවිකා හේතුවෙන්,

ජීවිකාව නිසා, 'ඔබගේ විහාරයෙහි වෙසෙන භික්‍ෂුතෙමේ රහත් කෙනෙකි'යි එම වාක්‍යයෙහි අර්ථය දන්නකුට පවසාද, ඔහුට ථුල්ලච්චය නම් ආපත්තිය වන්නේය. ජීවිකා හේතුවෙන්, ජීවිකාව නිසා, මහණෙක් තෙමේ නොගිලන්ව ප්‍රණීත භෝජනයක් තමා පිණිස ඉල්වාගෙන පරිභෝග කෙරේද, ඔහුට පාචිත්තිය නම් ආපත්තිය වන්නේය. ජීවිකා හේතුවෙන්, ජීවිකාව නිසා මෙහෙණියක් තොමෝ නොගිලන්ව ප්‍රණීත භෝජනයක් තමා පිණිස ඉල්වාගෙන පරිභෝග කරයිද ඇයට පාටිදෙසනිය නම් ආපත්තිය වන්නේය, ජීවිකා හේතුවෙන්, ජීවිකාව නිසා, නොගිලන්ව සූපයක් හෝ බත් තමා පිණිස ඉල්වාගෙන පරිභෝග කෙරේද (ඒ මෙහෙණියට) දුක්කටාපත්තිය වන්නේය'[1] යි මෙසේ පනවන ලද ශික්‍ෂාපද සයෙහිය.

**'කුහනා'** යන ආදියෙහි පෙළ මෙසේය: එහි කුහනා යනු කිමෙක්ද? ලාභ සත්කාර කීර්ති විෂයෙහි ගිජු වූ, ලාමක අදහස් ඇති, ආශාවෙන් මඩනා ලද්දහු විසින් කුහක ලෙස සිවුපසය පිළිකෙව් කිරීම් වශයෙන් හෝ ළංවී කියන රවටිලිබස් වශයෙන් හෝ යම් ඉරියවු නොපැවැත්වීමක් හෝ පැවැත්වීමක්, තබන ආකාරයක්, සකසා තැබීමක්, බැම හැකිලීමක්, හකුලුවන ආකාරයක්, හකුලුවන බවක් විස්මය දනවීමක්, විස්මය පැවැත්වීමක්, කුහක බවක් වේනම් මේ කුහනායයි කියනුලැබේ. එහි **ලපනා** යනු කිමෙක්ද? ලාභසත්කාර කීර්ති විෂයෙහි ගිජුවූ, ලාමක අදහස් ඇති, ආශාවෙන් මඩනාලද්දහු විසින් අනුන්හට යම් පළමුව බිණීමක්, පසුව බිණීමක්, මිහිරිකොට බිණීමක්, උසස්කොට බිණීමක්, සැම අතින්ම උසස් කොට බිණීමක්, නැවත නැවත බැඳගැනීමක්, සැම අතින්ම බැඳ ගැනීමක්, උසස්කොට හැඟවීමක්, සැම අතින්ම උසස්කොට හැඟවීමක්, පිය තෙපුල් බිණීමක්, ඉච්චාබස් බිණීමක් සැබෑ නොසැබෑ මුඳුබස් බිණීමක්, දරුවන් නැළවීම් වැනි ක්‍රියාවක් වේනම්, මේ ලපනායයි කියනුලැබේ. එහි **නෙමිත්තිකතා** යනු කිමෙක්ද? ලාභසත්කාර කීර්ති ප්‍රශංසා විෂයෙහි ගිජුවූ, ලාමක අදහස් ඇති තෘෂ්ණාවෙන් මඩනා ලද්දහු විසින් අනුන්හට ඉඟිකොට යම් නිමිති බස් බිණීමක්, ඉඟි කිරීමක්, අවභාසයක් (එළියක්), අවභාස ඇතිවන ක්‍රියාවක්, අදහස ආශ්‍රයෙන් ඇවටිලි බස් කීමක්, කරුණා වටා වචන කීමක් වේනම් මේ නෙමිත්තිකතා යයි කියනු ලැබේ. එහි **නිප්පේසිකතා** යනු කිමෙක්ද? ලාභ සත්කාර කීර්ති විෂයයෙහි ගිජුවූ, ලාමක අදහස් ඇති, තෘෂ්ණායෙන්

(1) 'ආජීවහෙතු ආජීවකාරණා පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං.... අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති දුක්කටස්ස' විනය පරිවාර. Vin V 146

මඩනා ලද්දහු විසින් මෙරමාහට යම් ආක්‍රෝශ කිරීමක්, නින්‍දා කිරීමක්, ගැරහීමක්, උසස් කොට බිණීමක්, සැම අතින්ම උසස්කොට තැබීමක්, සිනා ගැන්වීමක්, සැම අතින්ම සිනා ගැන්වීමක්, ගුණ ගැයීමක්, සැම අතින්ම ගුණ ගැයීමක්, නුගුණ පැතිරවීමක්, ළඟ නැති විට නුගුණ කීමක් වේ නම් මේ නිප්පේසිකතා යයි කියනු ලැබේ. එහි **ලාභෙන ලාභං නිජිගිංසනතා** යනු කිමෙක්ද? ලාභ සත්කාර කීර්ති විෂයෙහි ගිජුවූ, ලාමක අදහස් ඇති, තෘෂ්ණායෙන් මඩනාලද්දේ මෙතැනින් ලත් ආමිෂය එතැනට ගෙනගොස් දෙයි, එතැනින් ලත් ආමිෂය මෙතැනට ගෙනවුත් දෙයි, මෙබඳුවූ ආමිෂය සෙවීමක්, ගවේෂණයක් නැවත නැවත සෙවීමක් වේනම් මේ 'ලාභෙන ලාභං නිජිගිංසනතා (ලාභයෙන් ලාභ සෙවීම)'(1) යයි කියනුලැබේ.'

මෙම පෙළෙහි අරුත් වනාහි මෙසේදත යුතුය. පළමුකොට කුහනා නිද්දේසයෙහි පටන් පිළිවෙළින් **ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස** යනු, ලාභයද සත්කාරයද, කීර්තිඝෝෂයද කෙරෙහි ගිජුවූවහුගේ, පතන්නහුගේයි යන අර්ථයි. **පාපිච්ඡස්ස** යනු, තමා කෙරෙහි නැති ගුණ පහළ කරනු කැමැත්තහුගේ, **ඉච්ඡාපකතස්ස** යනු, තෘෂ්ණායෙන් මඩනාලද්දහුගේයි, ආජීවෝපද්‍රවයට පත්වූවහුගේයි යන අර්ථයි. මෙතැන් පටන්, යම් හෙයකින් සිවුපස පිළිකෙව කිරීම් ළංව සිට කරුණ වටා තෙපලීම්, ඉරියව් මඟින් ඇඟවීම් වශයෙන් මහානිද්දෙසයෙහි ත්‍රිවිධවූ කුහන වස්තුවෙක් ආයේද, එහෙයින් මෙම ත්‍රිවිධවූ කුහන වස්තුව දක්වනු පිණිස **'පච්චයපටිසෙධන සංඛාතෙන වා'** යන මේ ආදිය ආරබ්ධයි. එහි චීවරාදියෙන් නිමන්ත්‍රණය කරනලදකල්හි පිළිගනු රිසිය ඇතිව පවා, ලාමක අදහස් හේතුකොටගෙන පිළිකෙව් කිරීමෙන්, එම දයක ගෘහපතියන් තමා කෙරෙහි පිහිටි දැඩි ශ්‍රද්ධා ඇත්තවුන්බව දැන, නැවත ඔවුන් 'විස්මයෙකි! ආර්යයන් වහන්සේ අල්පේච්ඡයහ, කිසිවක් පිළිගනු නොරිසියහ, සුලුයමක් හෝ පිළිගන්නාහුනම් අපට මහත් ලාභයෙක් වන්නේය'යි නොයෙක් උපායෙන් ප්‍රණීතවූ චීවරාදිය එළවන කල්හි, හුදෙක් ඔවුනට අනුග්‍රහ කිරීමේ කැමැත්තම අඟවා පිළිගැනීමෙන් එතැන් පටන් ගැල්බරින් පවා එළවීමට හේතුවනසේ විස්මයපත් කරවීම ප්‍රත්‍යය ප්‍රතිශේධන සංඛ්‍යාත කුහන වස්තුවයයි දතයුතුය.

මහානිද්දේසයෙහි කියනලදුයේමැයි: 'ප්‍රත්‍යයප්‍රතිසේධන සංඛ්‍යාත කුහන වස්තුව නම් කවරේදයත්, මෙහි දයක ගෘහපතියෝ චීවර-පිණ්ඩපාත-සේනාසන, ගිලානපච්චය, භෙසජ්ජපරික්ඛාරයෙන් භික්ෂුවකට

(1) විභංග -Vbh 352 f.

නිමන්ත්‍රණය කෙරෙති, ඒ භික්ෂුතෙමේ ලාමක අදහස් ඇතිව, ආශාවෙන් මඩනාලදුව චීවරාදී පරිෂ්කාරයන් ලබනු කැමැතිව පවා වැඩිවැඩියෙන් ලබන රිසියෙන් චීවර-පෙ-පරිෂ්කාරයන් ප්‍රතික්ෂේප කරයි, හේ මෙසේ පවසයි, 'ශ්‍රමණයකුට මහඟු සිවුරෙකින් පල කිම? ඉදින් ශ්‍රමණ තෙමේ සොහොන් බිමින් හෝ කසල ගොඩින් හෝ සල්පිල් දෙරින් හෝ රෙදි කැබැලි අවුලාගෙන සඟළසිවුරුකොට දරන්නේනම් එයම සුදුසු වන්නේය, ශ්‍රමණයකුට මහඟු පිණ්ඩපාතයෙන් කම් කිම? ඉදින් ශ්‍රමණ තෙමේ ගෙපිළිවෙළින් පිඬුසිඟා ගොස් ලබන පිණ්ඩපාත ආහාරයෙන් ජීවිකාව කෙරේ නම් එයම සුදුසු වන්නේය, ශ්‍රමණයකුට මහඟු සේනාසනයෙන් කම් කිම? ඉදින් ශ්‍රමණතෙමේ රුක්මුල්හි වසන්නෙක් හෝ අභ්‍යවකාශයෙහි වසන්නෙක් වන්නේනම් එයම සුදුසු වන්නේය, ශ්‍රමණයකුට මහඟු ගිලන්පස, බෙහෙත් පිරිකරින් කම් කිම? ඉදින් ශ්‍රමණතෙමේ ගෝමූත්‍රයෙන් හෝ අරළු කැබැල්ලෙකින් බෙහෙත් කරන්නේනම් එයම සුදුසු වන්නේය. හේ එතන් පටන් දළ සිවුරු දරයි, කටුසර බොජුන් වළඳයි, දළ සෙනසුන් පරිභෝග කරයි, දළ ගිලන්පස, බෙහෙත් පිරිකර ගනියි. ගෘහස්ථ දයක ජනයා ඔහු මෙසේ හැඳිනගනිති: මේ ශ්‍රමණතෙමේ අපිස් ගුණයෙන් යුක්තය, සතොස් ගුණයෙන් යුක්තය, විවේකයෙහි ඇලුණේය, කුලයා කෙරෙහි ගණයා කෙරෙහි නොඇලුණේය, ඇරඹිවිර්‍ය ඇත්තේය, ධුතංගගුණ පවසන්නේයයි වැඩිවැඩියෙන් සිවුරු-පෙ-බෙහෙත් පිරිකරින් පවරති. ඒ ශ්‍රමණතෙමේ මෙසේ කියයි: 'කරුණු තුනක් එක් වීමෙන් සැදැහැවත් කුලපුත්තෙමේ බොහෝ පින් රැස් කරයි, දීමට සුදුසු දනවස්තු-පෙ-දක්ෂිණාව ලැබීමට සුදුසු ප්‍රතිග්‍රාහකයන් හමුවීමෙන් සැදැහැවත් කුලපුත් තෙමේ - පෙ-පින් රැස්කරයි, ඔබට මෙකී ශ්‍රද්ධාව ඇත, දීමට සුදුසු දන වස්තුද ඇත, මමද සුදුසු ප්‍රතිග්‍රාහකයෙක් වෙමි, ඉදින් මම් නොපිළිගන්නෙම් නම් ඔබ පිනට අහිමි වන්නාහුය, මට නම් මෙයින් පලෙක් නැත, එතෙකුදු වුවත් ඔබ කෙරෙහි අනුකම්පායෙන්ම පිළිගන්නෙමි'යි එතන් පටන් බොහෝ සිවුරුද, පිළිගන්නේය, බොහෝ පිණ්ඩපාතයද පිළිගන්නේය,-පෙ-බෙහෙත් පිරිකරද පිළිගන්නේය. මේ ආකාරවූ යම් බැම හැකිළීමක්, මුහුණ හැකිලවීමක්, විස්මය දනවීමක්, විස්මය පැවැත්වීමක්, විස්මයට පත්කරවීමේ ස්වභාවයක් වේනම්, මෙය සිවුපස පිළිකෙවිකිරීම් සංඛ්‍යාත කොහොන් වතයයි කියනුලැබේ.'[1]

ලාමක අපේක්ෂා ඇත්තහුගේම වනාහි උතුරුමිනිස්දම් අවබෝධකොට ඇතැ'යි හැඟවෙන වචනයෙන් ඒ ඒ ආකාරයෙන් විස්මය

(a) මහානිද්දෙස - Nd2 224f.

පත්කරවීම සාමන්තජප්පන සංඛ්‍යාත කොහොන්වතයයි දතයුතුය. යම්සේ කියනලදද: 'සාමන්තංජප්පන සංඛ්‍යාත කුහන වස්තුව නම් කවරේද? මේ ශාසනයෙහි ලාමක අපේක්ෂා ඇති, තෘෂ්ණාවට වසඟවූ කිසිවෙක් ගරුබුහුමන් ලැබීමේ අභිලාෂයෙන්, 'ජනයා මෙසේ මා වෙත ගරු බුහුමන් කරන්නාහුය'යි ආර්යධර්මය හා සම්බන්ධකොට වචන භාවිත කෙරෙයි, 'යමෙක් මෙවන් සිවුරු දරාතම් ඒ ශ්‍රමණ තෙමේ මහේශාඛ්‍යයයි කියයි, යමෙක් මෙවන් පාත්‍රයක්-පෙ-ලොහොතලියක්-පෙ-ඩබරාවක්-පෙ-පෙරහනක්-යතුරුමුද්දුවක්-පෙ-කාබහනක්-පෙ-වහන්සහලක් දරාතම් ඒ ශ්‍රමණ තෙමේ මහේශාඛ්‍යයයි කියයි. යමකුට මෙවන් උපාධ්‍යාය කෙනෙක්-පෙ-ආචාර්ය කෙනෙක්-පෙ-එක්ම උපාධ්‍යායයන් ඇත්තෙක් -පෙ-එක්ම ආචාර්යයන් ඇත්තෙක්-පෙ-මිත්‍රයෝ-පෙ-දුටුමතින් මිතුරුවූවෝ-පෙ-බැතිමත් මිතුරෝ-පෙ-සහායකයෝ වෙත්නම් ඒ ශ්‍රමණතෙමේ මහේශාඛ්‍යයයි කියයි. යමෙක් මෙවන් විහාරයෙක්හි වෙසේනම් ඒ ශ්‍රමණ තෙමේ මහේශාඛ්‍යයයි කියයි. යමෙක් මෙවන් අඩ්ඪයෝග (දිගටි සෙවෙනි ඇති) පහයෙක්හි-පෙ-සිවුරැස් ගෙයෙක්හි-පෙ-සඳලු සහිත ගෙයෙක්හි-පෙ-ගුහායෙක්හි-පෙ-ලෙණෙක්හි-පෙ-කුටියෙක්හි-පෙ-කුළුගෙයෙක්හි-පෙ-උස් ගෙයෙක්හි-පෙ-මාලකයෙක්හි-පෙ-දීර්ඝ ශාලාවෙක්හි-පෙ-උවටැන් හලෙක්හි-පෙ-මණ්ඩපයෙක්හි-පෙ-රුක් මුලෙක්හි වෙසේ නම් ඒ ශ්‍රමණතෙමේ මහේශාඛ්‍යයයි කියයි. නැතහොත් හැඟීම් බරින් බොහෝසෙයින් හැකිලෙමින්, බොහෝසෙයින් බැම හකුලුවමින්, බොහෝසෙයින් විස්මයට පත්වෙමින් බොහෝසෙයින් දෙඩමලුවෙමින්, ප්‍රශංසාවචන කියමින්, 'මේ ශ්‍රමණතෙමේ විහාරසමාපත්ති ලාභියෙකැ'යි තමන් උදෙසාම, එවැනි ගැඹුරු, සැඟවුණු, වැසුණු, ලොවුතුරු, නිවන්මඟ පිළිබඳ කථා බෙණෙයි. මෙබඳුවූ යම් බැම හැකිලවීමක්, බැම හැකිලවීමේ ආකාරයක් විස්මය දනවීමක්, විස්මය පත්කරවීමක්, විස්මය පත්කරවන ආකාරයක් වේනම් එය සාමන්තජප්පන සංඛ්‍යාත කුහන වස්තුවයයි කියනුලැබේ.'(1)

ලාමක අපේක්ෂා ඇත්තහුගේම වනාහි ගරුබුහුමන් ලැබීමේ අභිලාෂයෙන් කරනලද ඉරියව්වූ මඟින් විස්මය පත්කරවීම ඉරියව්වූ සබඳකොට ඇති කොහොන්වතයයි දතයුතුයි යම්සේ කියනලදද: 'ඉරියාපථ සංඛ්‍යාත කුහනවස්තු නම් කවරේද යත්, මේ ශාසනයෙහි ලාමක අපේක්ෂා ඇති තෘෂ්ණාවෙන් මඩනාලද කිසිවෙක් ගරුබුහුමන් ලැබීමේ අභිලාෂයෙන්, 'මෙසේවූ කල ජනයා ගරු බුහුමන් කෙරෙති'යි ගමන් පිහිටුවති, සිටීම්

---

(1) මහානිද්දෙස - Ndl 226 f.

පිහිටුවති, හිඳීම් පිහිටුවති, හෙවීම් පිහිටුවති, මනාකොට පිහිටුවාගෙන ගමන් කරති, මනාකොට පිහිටුවාගෙන සිටිති, මනාකොට පිහිටුවාගෙන හිඳිති, මනාකොට පිහිටුවාගෙන හොවිති, අභිමුඛයෙහි ධ්‍යාන ලාභියකු මෙන් හැසිරෙති, මෙබඳුවූ යම් ඉරියව්වු පිහිටුවීමක්, තැබීමක්, මනාකොට තැබීමක්, බැම හැකිලවීමක්, බැම හකුලුවන ආකාරයක්, විස්මයට පත්වීමක්, විස්මය පත්කරවීමක්, විස්මය පත්කරවන ආකාරයක් වේනම්, මෙය ඉරියාපථසංඛ්‍යාත කුහනවස්තුයයි කියනුලැබේ.'[1]

එහි **පච්චයපටිසෙධනසංඛාතෙන** යනු, සිවුපස පිළිකෙව් කිරීමයයි කියනලද කොහොන් වතිනි. **සාමන්තජප්පිතෙන** යනු, (කාරණයට) ළංව සිට බිණීමෙනි. **ඉරියාපථස්ස වා** යනු, සිවු ඉරියව්වු පිළිබඳ, **ආඨපනා** යනු, පළමු කොට පිහිටුවීමයි, ආදරයෙන් පිහිටුවීම හෝ වේ. **ඨපනා** යනු පිහිටුවන ආකාරයයි, **සණ්ඨපනා** යනු, මනාකොට පිහිටුවීමයි- පැහැදීම ඇතිවනසේ සැදීමයයි කීයේයි. **භාකුටිතා** යනු, වීර්ය වැඩීමෙන් මිරිකුණුබව දක්වෙන සේ බැම හැකිලීමයි. මුහුණ හැකිලවීමයයි කීයේයි. බැම හැකිලවීම ස්වභාවකොට ඇත්තේනුයි භාකුටික නම්. භාකුටික ස්වභාවය භාකුටිය නම්. **කුහනා** යනු, විස්මයට පත්වීමයි, විස්මය පැවැත්වීම **කුහායන** නම්. විස්මාපිත ස්වභාවය **කුහිතත්ත** නම්.

ලපනා නිද්දේස කිරීමෙහි: **ආලපනා** යනු, විහාරයට පැමිණි ජනයා දැක, 'පින්වත්හු කුමක් පිණිස ආහුද? භික්ෂූන් නිමන්ත්‍රණය කිරීම පිණිසද? එසේනම් යනු මැනවි, මම් පසුව එම්'යි පළමුකොටම කීමයි. නැතහොත්, තමා ඉදිරිපත් කරමින් 'මම් තිස්ස නම් වෙමි. රජතෙමේ මා කෙරෙහි ප්‍රසන්නය, අසුවල් අසුවල් රජඇමැතිවරු මා කෙරෙහි ප්‍රසන්නයහයි මෙසේ තමා උදෙසා කීම ආලපනා නම්. **ලපනා** යනු, පිළිවිසින ලදුව මෙකී අයුරු පැවසීමයි. **සල්ලපනා** යනු, සැම අතින්ම උසස්කොට බිණීමයි. **සමුත්තාභනා** යනු, 'උපාසකවරුනි, පෙර මෙවන් කාලයෙහි අගසස් දන් දෙන්නහුය, දැන් කවරහෙයින් නොදෙන්නහුද'යි මේ ආකාරයෙන්, 'ස්වාමීනි, දෙන්නමෝය, එයට අවසරයක් නොලබම්හ'යි යන ආදිය කියනතුරු යලි යලිදු අල්වා බැඳීමයි, වෙළීමයයි කී නියායි. නැතහොත්, උක් ගෙනයන්නකු දැක, උපාසකය, කොයින් ගෙන අවුද'යි පිළිවිසියි, 'ස්වාමීනි, උක්කෙතෙනි,' 'කිම එහි උක් මිහිරිද?', 'ස්වාමීනි කා බලා දතයුතුය', 'උපාසකය, උක්දෙව'යි කියනු භික්ෂුවකට නොසුදුසුය.' මේ ආදී වශයෙන් ගැලවී යනු කැමැත්තකු පවා යලියලිදු අල්වා බැඳීමේ

---

(1) මහානිද්දෙස - Ndl 225 f.

කථා **උන්නහනා** නම්. සෑම අතින්ම යලියලි බැඳීමයි. **සමුන්නහනා උක්කාචනා** යනු, අසුවල් ගෙහි ඇත්තෝ මා මෙසේ මෙසේ දන්නාහුය, එහි දෙනුමනා දෙයක් වෙතොත් මටම දෙති'යි මෙසේ ඔසවා තැබීම උක්කාවනා නම්, අතිශයෝක්තියෙන් කීමයයි පැවසූ සේයි. මෙහිලා තෙලකන්‍දරිකාවගේ වත සඳහන් කළයුතුය. සෑම අතින්ම යලියලිදු ඉහළින් තබා වර්ණනා කිරීම **සමුක්කාවනා** නම්. **අනුප්පියභාණිතා** යනු, සත්‍යයට හෝ ධර්මයට අනුකූලදැයි නොවිමසා යලියලිදු ප්‍රිය වචනම කථා කිරීමයි. **චාටුකම්‍යතා** යනු, යටත් පහත් පැවතුම් ඇතිබවයි, තමා පහළින් පහළින් තබා හැසිරීමයි, **මුග්ගසූපා‍යතා** යනු, මුඟු ඇට සූපයක් වැනිබවයි, යම්සේ මුං පිසනුලබන කල සමහර ඇට නොපැසී තිබියදී සෙසු ඇට පැසේද, එසේ කිසියම් පුද්ගලයකුගේ වචන අතුරෙන් සුලුප්‍රමාණයක් සත්‍යද සෙස්ස අසත්‍යද වේනම්, මෙබඳු පුද්ගලයා මුග්ගසූප්පයයි කියනු ලැබේ. එවැන්නහුගේ ස්වභාවය මුග්ගසූප්‍යතා නම්. **පාරිභටටතා** යනු, දරුවන් වැඩීම කරනබවයි, යම් කිසිවෙක් කිරිමවක මෙන් ප්‍රත්‍යය දයකයන්ගේ දරුවන් ඇකයෙන් හෝ කරින් දරත්නම්, ඔවුන්ගේ ඒ ක්‍රියාව පාරිභට්ට නම්. පාරිභට්ටභාවය පාරිභට්ටතා නම්.

නෛමිත්තිකතා නිද්දේසයෙහි: **නිමිත්තං** යනු, අන්‍යයන් තුළ, ප්‍රත්‍යයදනය පිළිබඳ හැඟීම දනවනු පිණිස කයින් හෝ වචනයෙන් කරනුලබන යම් කිසි ක්‍රියාවෙකි. **නිමිත්තකම්මං** යනු, කැවිලි වෙසෙසක් ගෙන යන්නකු දැක, 'කිමෙක්ද? කැවිලි ලැබුණේද?' ආදි වශයෙන් කරනුලබන කථා නිමිත්තකම්ම නම්. **ඕභාසො** යනු, ප්‍රත්‍යය පිළිබඳව කරනුලබන කථායි. **ඕභාසකම්මං** යනු, වස්සන් රක්නවුන් දැක, 'කිමෙක්ද? මේ කිරිදෙනුන්ගේ වස්සෝද? නැතහොත් මෝරු, දෙනුන්ගේ වස්සෝද'යි විචාරා 'ස්වාමීනි කිරිදෙනුන්ගේ වස්සෝය'යි කීකල්හි, 'කිරිදෙනුන්ගේ වස්සන් විය නොහැකිය, ඉදින් කිරි දෙනුන්ගේ වස්සන් වෙතොත් භික්‍ෂූන්ටද කිරි ලැබියයුතුය' මේ ආදි වශයෙන් එම ගොපලු දරුවන් ලවා මාපියන්හට දනගන්නට සලස්වා කිරි දෙන්නට පෙළඹවීම ආදිය ඕභාසකරණ නම්. **සාමන්තජප්පා** යනු, ඉච්ඡිත වස්තූන් පිළිබඳව සමීපකොට බිණීමයි. මෙහිලා කුලූපග භික්‍ෂුවගේ කථා වස්තුව සඳහන් කළයුතුය. කුලූපග භික්‍ෂු තෙමේ වනාහි වළඳනු කැමතිව ගෙයකට පිවිස හුන්නේය. ඒ දැක දෙනු නොරිසි ගෘහිණී තොමෝ සහල් නැතැ'යි කියමින් සහල් සෙවීමට යන ලෙසක් පා අසල ගෙයකට ගියාය. භික්‍ෂු තෙමේ ඇතුළු ගෙයට වැද, පිරික්සනුයේ කවුළු කොන්හි උක්ගසක්ද, බඳුනෙක ලූ සකුරුද, පැසෙක්හි බහා තුබූ ලුණුමස් පලුවක්ද, සැලෙක්හි තුබූ සහල්ද, කළයක

බහාලූ ගිතෙල්ද දක නික්ම පෙරළා අවුත් හුන් තැනම හුන්නේය. ගෘහිණී තොමෝද සහල් නොලදිමියි කියමින් පෙරළා පැමිණියාය. භික්ෂු තෙමේ, 'උපාසිකාවෙනි, අද භික්ෂාව නොලැබෙනබවට පෙරමහදීම නිමිති දිටිමි'යි කීය. 'ස්වාමීනි, කවර නිමිත්තෙක්දැයි' විචාළ කල්හි, 'කවුළු කොන්හි ඇති උක්දඬුව වැනි සර්පයකු දිටිමි, උහුට ගසමි'යි බලන විට බඳුනෙහි ඇති සකුරු කැට වැනි කැට කැබැලිතිද, පැසෙහි තබා ඇති ලුණුමස් පෙති සෙයින් පහර ලත් සර්පයාගේ පෙණයද, සැළෙහි බහා ඇති සහල් සෙයින් කැබැලිති ඩැහැගනු රිසි සර්පයාගේ දත්ද, ඉක්බිති කළයෙහි තබා ඇති ගිතෙල් සෙයින් කුපිතවූ සර්පයාගේ මුවින් නික්මුණු විෂ මුසු කෙළද දිටිමි'යි කීය. ඕ තොමෝ 'මේ මුඩු මහණ රැවටිය නොහැකැ'යි උක්දඬු දී බත්පිස ගිතෙල්, සකුරු, මස් හා සමඟ දුන්නීය. මෙසේ රිසි දෙයට ළංකොට බිණීම සාමන්තජප්පන මැ'යි දතයුතුයි. **පරිකථා** යනු, තමා රුචිකරන දෙය ලැබෙන ආකාරයට පෙරළ පෙරළා බිණීමයි.

නිස්පේසිකතා නිද්දේස කිරීමෙහි: **අක්කොසනා** යනු, දශ ආක්‍රෝශ වස්තුවෙන් බැණවැදීමයි. **වම්භනා** යනු, නිඳු කොට බිණීමයි. **ගරහනා** යනු, 'සැදැහැ නැත්තෙහිය, ප්‍රසාද නැත්තෙහිය,' ආදි වශයෙන් ගැරහීමයි. **උක්ඛෙපනා** යනු, 'මේ දෙය මෙහි නොකියව'යි වදන් කියා නෙරපීමයි, සැම අතින්ම සාක්ෂ්‍ය සහිතකොට, හේතු සහිතකොට නෙරපීම **සමුක්ඛෙපනා** නම්. නොහොත්, නොදෙන්නහු දක 'ඔහෝ දනපතිය' යන ආකාරයෙන් උපහාස කිරීම උක්ඛෙපනායි, 'මහාදනපතිය'යි මෙසේ මහත්සේ උපහාස කිරීම සමුක්ඛෙපනායි. **ඛිපනා** යනු, 'බිජුවට කන මොහුගේ ජීවිතයෙන් පල කිමැ'යි මෙසේ දැඩිලෙස උපහාස කිරීමයි. **සඞ්ඛිපනා** යනු, 'මොහු නොදෙන්නෙකැ'යි කවර හෙයින් කියවුද? නිතරම සැමටම 'නැත' යන වචනය දෙන්නේයයි මෙසේ අතිශයින් උපහාස කිරීමයි. **පාපනා** යනු, නොදෙන්නකුබවට, නැතහොත් නුගුණ ඇත්තකු බවට පත්කිරීමයි. සැම අතින්ම එසේ පැමිණවීම සම්පාපනායි. **අවණ්ණහාරිතා** යනු, මෙසේ නුගුණ කියනුවට බියෙන් හෝ දෙන්නේයයි ගෙන්ගෙට, ගමින්ගමට, ජනපදයෙන් ජනපදයට නුගුණ ගෙනයාමයි. **පරපිට්ඨිමංසිකතා** යනු, අභිමුඛයෙහි මිහිරි බස් කියා අනභිමුඛයෙහි නුගුණ කීමයි. මේ වනාහි අභිමුඛයෙහිදී බලන්නට පවා නොහැකිව අනභිමුඛයන්ගේ පිට මස් කෑම හා සමාන වේ, එහෙයින් පරපිට්ඨිමංසිකතායි කියනලදි. **අයං වුච්චති නිප්පෙසිකතා** යනු, මෙය වනාහි උණ පතුරෙන් කළ පිස්නාවක් සිරුරෙහි ගල්වනලද අභරාවක් පිසිනාසේ මෙරමා ගුණ පිසලන්නේ වේද, සුවඳ ජාතියක් සුනුකොට

සුවඳ සොයන්නාසේ මෙරමා ගුණ සුණුකොට ලාභ සොයන්නේ වේද, එහෙයින් නිප්පේසිකතායයි කියනුලැබේ යන අර්ථයි.

ලාභෙන ලාභං නිජිගිංසනතා නිද්දේස කිරීමෙහි: **නිජිගිංසනතා** යනු, සොයා යාමයි. **ඉතො ලද්ධං** යනු, මෙහෙයින් ලද දෙයයි, **අමුත්‍ර** යනු අර ගෙහි, **එට්ඨී** යනු පැතීමයි, **ගවෙට්ඨී** යනු, සොයා යාමයි, **පරියෙට්ඨී** යනු, නැවත නැවත සොයා යාමයි. මුලපටන් ලදලද දෑ ඒ ඒ ගෙහි කුලදරුවනට දී අවසන කිරිකැඳ ලැබ ගිය භික්ෂුවගේ වත මෙහිලා සඳහන් කළ යුතුය. 'එසනා' යන ආදිය 'එට්ඨී' යන ආදියට පර්යාය වචනයි. එහෙයින් 'එට්ඨී' යනු එසනා වශයෙන්ද, 'ගවෙට්ඨී' යනු 'ගවෙසනා' වශයෙන් ද, 'පරියෙට්ඨී' යනු 'පරියෙසනා' වශයෙන්ද, මෙහි යෙදීම දත යුතුයි. මේ කුහනා යන ආදියෙහි අරුති. දැන් **එවමාදීනඤ්ච පාපධම්මානං** යනු, මෙහිලා ආදි ශබ්දයෙන්, යම්සේ ඇතැම් පින්වත් මහණ බමුණු කෙනෙක් සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳ අංගලක්ෂණ විද්‍යාය, නිමිත්ත ශාස්ත්‍රය, උල්කාපාත විද්‍යාය, ස්වප්න විද්‍යාය, ලක්ෂණ විද්‍යාය, මූෂිකච්ඡින්න විද්‍යාය, අග්නි හෝමය, දර්වී හෝමය, යන මේ ආදී තිරශ්චීන විද්‍යායයි දක්වනලද මෙවන් මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරෙත්ද'යි ආදි වශයෙන් බ්‍රහ්මජාල සූත්‍රයෙහි කියනලද නොයෙක් පාපස්වභාවයන්ගේ ග්‍රහණය දතයුතුය. මෙසේ යම් මේ ආජීව හේතුවෙන් පනවනලද සිකපද සය ඉක්මවීම් වශයෙන්ද, කුහනා, ලපනා, නෙමිත්තකතා, නිප්පෙසිකතා, ලාභෙන ලාභං නිජිගිංසනතා යන මේ ආදී පාපස්වභාවයන්ගේ වශයෙන්ද පවත්වනලද මිථ්‍යා ආජීවයෙක් වේද, ඒ සකලාකාර මිථ්‍යාආජීවයෙන් වෙන්වීම මේ ආජීවපාරිසුද්ධිසීලයයි. මේ එහි වචනාර්ථයයි: මෙයට පැමිණ ජීවත්වෙත්නුයි 'ආජීව' නම්. ඒ කවරේද? ප්‍රත්‍යය සොයා යෑමේ ව්‍යායාමයයි. 'පාරිසුද්ධි' යනු පිරිසුදුබවයි, ආජීවයෙහි පිරිසුදුබව ආජීවපාරිසුද්ධි නමි.

**ආජීවපාරිසුද්ධිසීලය නිමි.**

ඉතික්බිතිව යම් මේ ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලයක් කියනලදුයේද, එහි **පටිසංඛා යොනිසො** යනු, සදුපාය මාර්ගයෙන් දත නුවණින් පිරික්සා, ප්‍රත්‍යවේක්ෂා කොට'යි යන අර්ථයි. මෙහි වනාහි, සීතස්ස පටිඝාතාය (ශීතය නසනු පිණිස) ආදි නයින් කියනලද ප්‍රත්‍යවෙක්ෂණයම 'යොනිසො පටිසඞ්ඛාය' යනුවෙන් දතයුතුයි. එහි, **චීවරං** යනු, අඳනය ආදීවූ කිසිදු වස්ත්‍ර විශේෂයෙකි. **පටිසෙවති** යනු, පරිභෝජනය කරයි, හදියි, නොහොත් පොරවයි. **යාවදෙව** යනු, ප්‍රයෝජන සීමාව පිරිසිඳ

දක්වන වචනයි. යෝගාවචරයාහට චීවර පරිභෝගයෙහි ඇති ප්‍රයෝජනය මෙපමණෙක් මැයි එනම්: ශීතය නැසීම පිණිස ආදියයි, මෙයට වැඩියෙන් ප්‍රයෝජනයෙක් නැති. **සීතස්ස** යනු, සිරුර තුළ දෙස් කිපීම් වශයෙන් හෝ බාහිරවූ ඍතුවිපර්යාසාදි වශයෙන් හෝ උපන් යම්කිසි ශීත ගුණයක්, **පටිඝාතාය** යනු, නැසීම පිණිස, ශරීරයෙහි ආබාධයක් නො-උපදනා සේ එම ශීතය දුරුකිරීම පිණිසයි. ශරීරය ශීතයෙන් පෙළෙනවිට විසිරුණු සිත් ඇතිවන හෙයින් නුවණින් යුක්තව වීර්යකරනු නොහැකි වේ, එහෙයින් ශීතය නැසීම පිණිස සිවුරු පරිභෝග කළයුතුයයි භාග්‍යවතුන්වහන්සේ අනුදන වදළහ. සියලු තන්හි මේ නය මැයි. මෙහි **උණ්හස්ස** යනු, හුදෙක් ගින්නෙන් උපදින තාපයයි, එම තාපය වනාහි ලැව්ගිනි ආදියෙන් උපදිති'යි දතයුතුය. **'ඩංස-මකස-වාතා'තපසිරිංසප සම්ඵස්සානං'** යන මෙහි වනාහි, **ඩංස** යනු, ඩැහැ ලේ බොන මැස්සෝයි, අද මැස්සෝයයිද කියනුලැබේ. **මකස** යනු, මදුරුවෝය, **වාත** යනු, දූවිලි සහිත, දූවිලිරහිත ආදි භේද ඇති වාතයයි, **ආතප** යනු ඉර අව්වයි. **සිරිංසප** යනු, ඇදෙමින් යන දික්සිරුරු ඇති සර්ප ආදීහුයි. ඔවුන්ගේ ස්පර්ශය නම් ඩැසීමෙන් හෝ වෙර තැවරීමෙන් දෙ-ආකාරයෙකින් සිදුවන ස්පර්ශයයි. සිවුරු හැඳ පොරවා හුන්නහුට සර්පස්පර්ශයෙන් පීඩා නොවේ. එහෙයින් එබඳු තන්හිදී ඒ ඒ ගැහැට දුරු කරනු පිණිස සිවුරු පරිභෝග කරනු ලැබේ. **යාවදෙව** යනු, නැවතත් නියත ප්‍රයෝජන සීමාව පිරිසිඳ දක්වනු පිණිසයි. ලජ්ජාව දනවන අඟපසඟ මුවහ කිරීම නියත ප්‍රයෝජනයයි, සෙසු ප්‍රයෝජනයෝ කවර කවර විටෙක හෝ වෙති. එහි **හිරිකොපීන** යනු ඒ ඒ සම්බාධස්ථානයි. යම් යම් අඟපසඟක් විවෘත කැරෙනවිට ලජ්ජාව හටගනීද, නැතහොත් එය නැසේද, ඒ ඒ අඟපසඟ ලජ්ජාව කුප්වන හෙයින් හිරිකොපීනයයි කියනු ලැබේ, එම හිරිකොපීනය වසා තබනු පිණිසැ'යි හිරිකොපීන පටිච්ඡාදනත්ථං'යයි කීහු. **හිරිකොපීනං පටිච්ඡාදනත්ථං** යනුද පාඨයි.

**පිණ්ඩපාතං** යනු, කිසියම් ආහාරයෙකි, යම්කිසි ආහාරයක් භික්ෂාචර්යාවෙහිදී භික්ෂු කෙනෙකුගේ පාත්‍රයෙහි බහාලන ලදුයේ පිණ්ඩපාතයයි කියනු ලැබේ. පිඩු වශයෙන් එකතුවූයේ පිණ්ඩපාතයි. ඒ ඒ තැනින් ලද භික්ෂාවන්ගේ සන්නිපාතයැ'යි සමූහයැ'යි කී සේයි. **නෙව දවාය** යනු, ගැමිදරුවන් සෙයින් කෙළි පිණිස නොවේ, ක්‍රීඩාවට නිමිත්තක් නොවේයයි කීසේයි. **න මදය** යනු, මුෂ්ටිමල්ලවාදීනට සෙයින් මද පිණිස නොවේ, බලය නිසා උපදනා මදයට හෝ පෞරුෂය නිසා හටගන්නා මදයට නිමිති නොවේයයි කී නියායි. **න මණ්ඩනාය** යනු, අන්තඃපුර ස්ත්‍රීනට හෝ ගණිකා ස්ත්‍රීනට මෙන් සැරසිලි පිණිස නොවේ,

අංගප්‍රත්‍යංග පෝෂණයට නිමිති නොවේයයි කීයේයි. **න විභූසනාය** යනු, නට-නර්තකාදීනට සෙයින් අලංකාර පිණිස නොවේ, පහන් සිරුරු පැහැයට නිමිති නොවේයයි කීයේයි. මෙහි වනාහි 'නෙව දවාය' යන මෙය මෝහයට උපනිශ්‍රය නසනු පිණිස කියනලදි. 'න මදය' යනු, ද්වේෂයට උපනිශ්‍රය නසනු පිණිසද 'න මණ්ඩනාය, න විභූසනාය' යන මෙය රාගයට උපනිශ්‍රය නසනු පිණිසද කියනලදි. 'නෙව දවාය න මදය' යන මෙය තමා පිළිබඳ සංයෝජනයන්ගේ උපත ප්‍රතිෂේධ කරනු පිණිසද, 'න මණ්ඩනාය න විභූසනාය' යන මෙය අනුන් පිළිබඳ වූ සංයෝජනයන්ගේ උපත ප්‍රතිෂේධ කරනු පිණිසද කියනලදි. මේ සතරින්ම අනුපාය ප්‍රතිපත්තියෙහිද, කාමසුඛල්ලිකානුයෝගයෙහිද ප්‍රහාණය කියනලද'යි දතයුතුය. **යාවදෙව** යනු, පළමු කියනලද අර්ථයෙහි මැයි. **ඉමස්ස කායස්ස** යනු, චතුර් මහාභූතයන්ගෙන් උපන් මේ රූපකායයෙහි, **ඨිතියා** යනු, බැඳී පවතිනු පිණිස, **යාපනාය** යනු, දිවිපැවැත්ම පිණිස, නොසිඳීම පිණිස, බෝකල් සිටිනු පිණිස හෝ වේ. දිරාපත් ගෙයක හිමිකරුවකු ගෙයට මුක්කු ලන සෙයින්ද, ගැල්කරුවකු අක්ෂයෙහි ලිහිසිතෙල් යොදන සෙයින්ද, කයෙහි පැවැත්ම පිණිසද, යැපීම පිණිසද, පිණ්ඩපාතය පරිභෝග කරයි. කෙළි පිණිස, මද පිණිස, සැරසීම පිණිස, අලංකරණය පිණිස පරිභෝග නොකරයි. තවද **ඨිති** යන මෙය ජීවිතේන්ද්‍රියයට පර්යාය වචනයෙකි, එහෙයින් 'ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය' යනු මෙතෙකින් මේ කයෙහි ජීවිතේන්ද්‍රියය පවත්වා ගැනීම පිණිසැ'යි කියන ලදුයේයයි දත යුතුය. **විහිංසූපරතියා** යනු. විහිංසා නම් සාගිනියි, රෝගාබාධ ඇති කරන හෙයිනි. එම විහිංසා ආබාධය සන්සිඳුවනු පිණිස පිණ්ඩපාතය පරිභෝග කරයි, වණයෙක්හි බෙහෙත් ගල්වන සෙයින්ද, උෂ්ණ ශීතාදිය ඇති කල එයට ප්‍රතිකාර සලස්වන සෙයින්ද, පිණ්ඩපාතය පරිභෝග කරයි. **බ්‍රහ්මචරියානුග්ගහාය** යනු, සියලු ශාසන බ්‍රහ්මචර්යාවටද, මාර්ග බ්‍රහ්මචර්යාවටද, අනුග්‍රහ පිණිස, මේ තෙමේ පිණ්ඩපාත පරිභෝග හේතුවෙන් කායබලය ලැබ ශික්ෂාත්‍රයයෙහි යෙදීම් වශයෙන් සසර කතර තරණය කරනු පිණිස පිළිපන්නේ බ්‍රහ්මචර්යාවට අනුග්‍රහ පිණිස පිණ්ඩපාතය පරිභෝග කරයි. කාන්තාර තරණය කරනු කැමැති දෙ-මහල්ලන් (අතර මගදී මළ) පුතුගේ මාංශය මෙන්ද, ගඟෙකින් එතෙර යනු කැමැත්තන් පසුරක් මෙන්ද, මුහුදින් එතෙර යනු කැමැත්තන් නැවක් මෙන්ද (සසර කතර තරණය කරනු කැමැත්තෝ පිණ්ඩපාතය උපයෝග කර ගනිති.) **ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි** යනු, මෙසේ මේ පිණ්ඩපාත පරිභෝගය හේතුකොටගෙන පැරණි සාගිනි වේදනාව නසමි. පමණ

නොදන ආහාර වැළඳීම හේතුකොට සිදුවන ආහාරහත්ථකය, අලංසාටකය, තත්ථවට්ටකය, කාකමාසකය, භුත්තවමිතකය යන මේ ලක්ෂණ ඇති බමුණන් අතුරෙන් කිසිවකු මෙන් නව වේදනාවක් හෝ නො-උපදවමි'යි සිතා (පිණ්ඩපාත පරිභෝග) කරයි. බෙහෙතක් වළඳන රෝගියකු සෙයිනි; නොහොත්, අහිතකර ලෙස පමණ නොදන ආහාර පරිභෝගකිරීම නිසා පූර්ව කර්ම හේතුවෙන් උපදනා හෙයින් යම් වේදනාවක් වර්තමානයෙහි පුරාණ වේදනායයි කියනු ලැබේද, හිතකර ලෙස පමණ දන වැළඳීමෙන් එම පුරාණ වේදනාවට හේතුව නසමින් එම පුරාණ වේදනාවද නසමි. වර්තමානයෙහි කරනලද අනුචිත පරිභෝග කර්මය හේතුකොට මතුවට උපදනා හෙයින් යම් වේදනාවක් නව වේදනායයි කියනු ලැබේද, උචිත පරිභෝග වශයෙන් එම නව වේදනාවට මුල නො-උපදවන හෙයින් එම නව වේදනාවද නො-උපදවමි'යි යන මේ ආකාරයෙන්ද මෙහි අර්ථය දතයුතුය. මෙතෙකින් යුක්ත පරිභොගසංග්‍රහයද, අත්තකිලමථානුයෝග ප්‍රහාණයද, ධාර්මිකසුඛ අපරිත්‍යාගයද දක්වනලද්දැ'යි දතයුතුය. **යාත්‍රා ච මෙ භවිස්සති** යනු, හිතකර පරිමිත පරිභෝගය හේතුකොට, ජීවිතේන්ද්‍රිය නසනසුලුවූ හෝ ඉරියවු බිඳිනසුලුවූ උවදුරු නොවන හෙයින් බෝකල් පැවැත්ම හෙවත් ප්‍රත්‍යය හේතුකොට පවත්නා මාගේ මේ ශරීරය පිළිබඳ ජීවිතයාත්‍රාව සිදුවන්නේයයි සිතා, යැපියහැකි රෝගයෙකින් පෙළෙන්නෙකු යෝග්‍යවූ බෙහෙත් පරිභෝග කරන්නා සේ පිණ්ඩපාතය පරිභෝග කරයි. **අනවජ්ජතා ච ඵාසුවිහාරො ච** යනු, අයුතු සෙවීමය, අයුතු පිළිගැනීමය අයුතු වැළඳීමය යන මෙයින් වැලකීමෙන් අනවද්‍යතාව වන්නේය, පමණ දන වැළඳීමෙන් පහසු විහරණය වන්නේය. යෝග්‍ය නොවනසේ පමණ ඉක්මවා වැළඳීමෙන් ඇතිවන අරති හෙවත් භාවනායෙහි නොඇලීමය, තන්දී හෙවත් නිදිමතය, විජම්භිකා හෙවත් ඇඟමැලි බවය, විඤ්ඤුගරහ හෙවත් නුවණැත්තවුන් විසින් ගරහනු ලැබීමය යන මේ දෝෂයන් නොවීමෙන් හෝ අනවද්‍යතාව වන්නේය. යෝග්‍ය වනසේ පමණ නො-ඉක්මවා අහර වැළඳීමෙන් කය බල ලැබීම හේතුකොටගෙන හෝ පහසු විහරණය වන්නේය. කුස පිරෙන තෙක් අහර වැළඳීමෙන් වැලකීම හේතුකොටගෙන හෝ සයනය කිරීමෙන් ලැබෙන සුවය, සැප පහසු ලෙස වැතිරීමෙන් ලැබෙන සුවය, නිද්‍රාවෙන් ලැබෙන සුවය, යන මෙයින් වැලකීම හේතුකොටගෙන හෝ නිරවද්‍යතාව වන්නේය, පිඩු සතරක් පහක් පමණ අඩුවෙන් වැළඳීම හේතුකොට සිවු ඉරියවු පැවැත්වීමට පහසුබව ඇතිවන හෙයින් මාගේ පහසු විහරණය වන්නේයයි සිතා පිණ්ඩපාතය පරිභෝග කරයි. කියනලද මැයි:

චත්තාරෝ පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ
අලං ඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනො[1]

පිඩු සතරක් පහක් නොවළඳ (ඉඩ තබා) පැන් බොන්නේය, පධන්වියෑි ලත් බවුන් වැඩූ භික්ෂුවකට පහසු විහරණය පිණිස මෙය ප්‍රමාණවත්ය.

මෙතෙකින් වනාහි පිණ්ඩපාතයෙහි ප්‍රයෝජනමාත්‍රයද, එය පිළිබඳ මධ්‍යම ප්‍රතිපදවද දක්වනලද්දැ'යි දතයුතුය.

**සෙනාසනං** යනු, හෝනා හිඳිනා තැනයි. යම් තැනෙක හොවීද, විහාරයක් හෝ වේවා, අඩ්ඪයොග නම් (ගුරුළු පියාපත් ලෙසින් දෙපසට විහිදුණු සෙවෙනි සහිත) ගෘහයක් හෝ වේවා, එය 'සෙන' (සයන) නම්. යම් තැනෙක හිඳීද, හිඳගනීද, එය 'ආසන' නම්. එක්ව ගෙන 'සෙනාසන'යයි කියනුලැබේ. **උතුපරිස්සයවිනොදනං පටිසල්ලානාරාමත්ථං** යනු, පීඩනාර්ත්ථයෙන් 'උතු' යනුම 'උතුපරිස්සය'යි කියනුලැබේ. එම ඍතුපීඩාවන් දුරලීම පිණිසද, කමටහන් අරමුණෙහි සිත රඳවා ගැනීමට අවශ්‍ය එකලාබව පිණිසද, සේනාසන පරිභෝගයෙන් දුරුකළයුතු ශරීරාබාධයන් මෙන්ම චිත්ත වික්ෂේපයද, දනවන අහිතකර ඍතුපීඩාවන් දුරලීම පිණිසද, හුදකලාබවින් ලැබෙන විවේකසුවය පිණිසද'යි කී නියාය. 'සීතස්ස පටිඝාතාය' යන ආදියෙන් එතැතින්ම ඍතුපීඩාවන් දුරුකිරීම කියනලද්දේ වේ. යම්සේ වනාහි ලජ්ජා උපදවන තැන් වැසීම සිවුරු හැඳීමෙහි පෙරවීමෙහි නියත ප්‍රයෝජනය වෙතැ'යිද, සෙසු ප්‍රයෝජනයන් යම්කිසි විටෙක පමණක් වෙතැයිද කියනලද්දේවේද, එසේම මෙහිදීද නියත ප්‍රයෝජනයවූ ඍතුපීඩාවන් දුරලීම අරමුණුකොට මෙය කියනලද්දැ'යි දතයුතුය, නොහොත් 'උතු' යනු කියනලද ආකාර ඇති ඍතුහු මැයි, 'පරිස්සය යනු ප්‍රකට උවදුරුය, සැඟවුණු උවදුරුයයි දෙආකාර වේ. එහි ප්‍රකට උවදුරු නම් සිංහ ව්‍යාඝ්‍ර ආදීහුය, සැඟවුණු උවදුරු නම් රාග, ද්වේෂ ආදියයි. රැකවරණ නොමැතිබව හේතුකොට හෝ අහිතකර රූපදර්ශනාදිය හේතුකොට හෝ සිදුවන මේ උවදුරු යම් තැනෙක ආපද නොකෙරේද, එය සේනාසනයයි මෙසේ දන ප්‍රත්‍යවේක්ෂා කොට පරිභෝග කරන භික්ෂුතෙමේ නුවණින් මෙනෙහිකොට සේනාසන-පෙ-ඍතුපීඩාවන් දුරුකරනු පිණිස පරිභෝග කෙරේය'යි දතයුතුය.

**ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරං** යනු, මෙහි රෝගයට විරුද්ධව යෙති'යි යන අරුතින් පච්චය නම්; ප්‍රතිපක්ෂ ගමනිනැ'යි යන අර්ත්ථයි.

(1) ථෙරගාථා, සාරිපුත්තථෙර - Thl 983

පථ්‍යවූ කිසියම් දෙයක් හැඳින්වීම පිණිස මේ පර්යාය වචනයෙකි. (හිසගේ) වෙදහුගේ කාර්යය, නොහොත් වෙදහු විසින් අනුදත් හෙයින් හෝ භේසජ්ජ නම්. ගිලානපච්චයම භේසජ්ජ වේනුයි ගිලානපච්චය භේසජ්ජ නම්. ගිලනහුට පථ්‍යවූ යම්කිසි ප්‍රතිකාර විධියෙකැ'යි, එනම්: තෙල් මී පැණි ආදියයි කීසේයි. **පරික්ඛාරො** යනු, 'නගර පරික්ඛාර සතෙකින් මනාකොට රැකවරණ කරනලද්දේ වේ'[1] යන ආදියෙහි පිරිවර පවසයි. 'ශීල නමැති පරික්ඛාර ඇති, ධ්‍යාන නමැති අක්ෂ ඇති, වීර්ය නමැති සක් ඇති, ආර්යමාර්ග නමැති රථය'[2] යන මෙහි අලංකාර විශේෂ පවසයි. 'යම් මේ ජීවිත පරික්ඛාරයක් පැවිද්දකු විසින් එලවිය යුත්තේවේද'[3] යන ආදියෙහි පරිභෝග භාණ්ඩ පවසයි. මෙහි වනාහි පරිභෝග භාණ්ඩ යන අරුතද, පරිවාර භාණ්ඩ යන අරුතද යෝග්‍ය වේ. එම ගිලානපච්චය භේසජ්ජය ජීවිතයට පරිවාරයෙක් වේ, ජීවිතය නසන ආබාධ හටගැනීමට ඉඩ නොදී රක්නා හෙයින්, සම්භාරයෙක්ද වේ යම්සේ ජීවිතය බෝකල් පවතීද, එසේ ජීවිතයට කාරණ වනහෙයිනි. එහෙයින් පරික්ඛාරයයි කියනුලැබේ. මෙසේ ගිලානපච්චය-හෙසජ්ජද එම පරික්ඛාරද එම වේනුයි 'ගිලානපච්චය හෙසජ්ජපරික්ඛාර' නම්. එම ගිලානපච්චය භේසජ්ජපරික්ඛාරයයි. ගිලනහුට පථ්‍යවූ, වෙදහු විසින් අනුමත යම්කිසි තෙල්, මී පැණි ආදී ජීවිත පරිෂ්කාරයයි කීසේයි. **උප්පන්නානං** යනු, උපන්, හටගත්, නිපන්, **වෙය්‍යාබාධිකානං** යන මෙහි 'ව්‍යාබාධ' නම් ධාතුන්ගේ කැළඹීමයි. කුෂ්ට ගණ්ඩ පිළිකා ආදිය එය හේතුකොට හටගනී. ව්‍යාබාධ හේතුකොට හටගත් හෙයින් වෙය්‍යාබාධික නම්. **වේදනානං** යනු, දුඃඛවේදනා හෙවත් අකුසලවිපාක-වේදනා යන එම වෙය්‍යාබාධික වේදනාවන් ගේ, **අබ්‍යාපජ්ජපරමතාය** යනු, නිදුක් වනු පිණිසයි. ඒ සියලු දුක් වේදනා පහවන තෙක් යන අර්ථයි. මෙසේ නුවණින් මෙනෙහි කොට ප්‍රත්‍යය පරිභෝග කිරීම ලක්ෂණකොට ඇති මේ ප්‍රත්‍යය සංනිශ්‍රිත ශීලය සැකෙවින් දතයුතුයි. මෙහි වචනාර්ථය වනාහි, යම් හෙයකින් චීවරාදිය හේතුකොට, ඒවා නිසා, ඒවා පරිභෝග කෙරෙමින් ප්‍රාණීහු හැසිරෙත්ද, යෙත්ද, පවතිත්ද, එහෙයින් 'පච්චය'යි කියනුලැබේ. එම ප්‍රත්‍යයයන් ඇසුරුකොට ඇත්තේනුයි ප්‍රත්‍යය සන්නිශ්‍රිත (පච්චය සන්නිස්සිත) නම්.

**ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලය නිමි**

---

(1) සත්තහි නගරපරික්ඛාරෙහි සුපරික්ඛිත්තං හොති. අ.නි. සත්තක නි - A iv 106

(2) රථො සීලපරික්ඛාරො ඣානක්ඛො චක්කවීරියො. සං.නි. මහාවග්ග - S v 6

(3) යෙ චිමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා ම.නි. වත්ථුපම සු. - M i 107

## ඉක්බිති ප්‍රකීර්ණක කථායි

මෙසේ මේ සිවු වැදෑරුම් ශීලයෙහි:- ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය ශ්‍රද්ධාව කරණකොටගෙන සැපයීය යුතුය; එය වනාහි ශ්‍රද්ධාවෙන් සාද ගතයුතුය, ශික්ෂාපද පැනවීම ශ්‍රාවක විෂය ඉක්මවා සිටි හෙයින් එම ශික්ෂාපද පැනවීම (සඳහා අවසර පතමින් සැරියුත්තෙරුන් විසින් කරනලද ආයාචනය) වචනයෙන්ම ප්‍රතික්ෂෙප කිරීමද මෙහි නිදර්ශනයි. එහෙයින් යෝග්‍යවූ පරිදි පනවනලද නිරවශේෂ ශික්ෂාපදය ශ්‍රද්ධාවෙන් සමාදන්ව ජීවිතය ගැන පවා අපේක්ෂා රහිතව මනාසේ සම්පාදනය කළයුතුය. කියනලදමැයි:

කිකීව අණ්ඩං චමරීව වාලධිං
පියං ව පුත්තං නයනං ව එකකං
තථෙව සීලං අනුරක්ඛමානකා
සුපෙසලා හොථ සද සගාරවා[1]

කිරළා තම බිජුවට මෙන්ද, සෙමරියක් තම වලිගය මෙන්ද, (මවක්) තම ප්‍රිය පුත්‍රයා මෙන්ද, (කණකු) තම තනිඇස මෙන්ද, ශීලය ගරුසරු ඇතිව ආරක්‍ෂා කෙරෙමින් සියලු කල්හි ශික්‍ෂාකාමීවව්. අනෙකක්ද වදරනලදි. 'මෙසේම මහරජ, ශ්‍රාවකයන් උදෙසා යම් ශික්‍ෂාපදයක් මවිසින් පනවන ලද්දේද, මාගේ ශ්‍රාවකයෝ ජීවිතය හේතුකොටගෙන පවා එය නොඉක්මවති'[2]. මේ කාරණයෙහිලා සොරුන් විසින් වනයෙහි බැඳදමනලද තෙරුන්ගේ කථාවස්තූන් දතයුතුය. මහාවත්තනි නම් වනයෙහි සොරු එක් තෙරනමක් කළුවැල්වලින් බැඳ හොවා තැබූහ. තෙරණුවෝ හෙවූ සැටියෙන්ම සත් දිනක් විදර්ශනා වඩා, අනාගාමී ඵලයට පත්ව එහිම කාලක්‍රියා කොට බ්‍රහ්මලෝකයෙහි උපන්හ. අනෙක්, තෙරණු කෙනෙකු තාම්‍රපර්ණී දිවයිනෙහිදී කිඳිවැල්වලින් බැඳ හොවාපූහ. තෙරණුවෝ ලැව්ගිනි ඇවිල එද්දී වැල නොසිඳම විදර්ශනා වඩා ජීවිතය නිරුද්ධවන්නා සමගම ක්ලේශප්‍රහාණයද කරමින් පිරිනිවන් පෑහ. දීඝභාණක අභය තෙරණුවෝ භික්‍ෂූන් පන්සිය නමක් සමඟ වඩින්නාහු තෙරුන්ගේ සිරුර දැක ආදහන කරවා එහි සෑයක් කරවූහ. එහෙයින් අනෙක් සැදැහැවත් කුලපුත් තෙමේද:

පාතිමොක්ඛං විසොධෙන්තො අපෙපව ජීවිතං ජහෙ,
පඤ්ඤත්තං ලොකනාථෙන න භින්දෙ සීලසංවරං.

(1) අපදානපාළි
(2) සං. නි. කොසල සං.

ප්‍රාතිමෝක්ෂය පිරිසුදුව තබාගෙන ජීවිතපරිත්‍යාගයවුවද යෙහෙකි. ලෝකනාථයන්වහන්සේ විසින් පනවනලද ශීලසංවරය නොබිඳින්නේය.

යම්සේ ප්‍රාතිමෝක්ෂසංවරය ශ්‍රද්ධාවෙන් සම්පාදනය කළයුතු වේද, එසේම ඉන්ද්‍රියසංවරය සිහියෙන් සම්පාදනය කළයුතු වේ. සිහිය හේතුකොට සාදගතයුතුය. සිහියෙන් ඉවාගන්නාලද ඉන්ද්‍රියයන් අභිධ්‍යා ආදී පාපධර්මයනට ලුහුබැඳියහැකි නොවන හෙයිනි. එහෙයින්, 'මහණෙනි රත්වූ ඇවිල දිලියෙන ගිනිසහිත නාරාසනයෙකින් චක්ෂුරින්ද්‍රිය පළහනුලැබීම මැනවි, චක්ෂුරින්ද්‍රියයෙන් දකියයුතු රූපයන් කෙරෙහි නැවත නැවත බැලීම් වශයෙන් සුබනිමිති ගැනීම නොමැනවි'[1]යි ආදී නයින් දෙසනලද ආදිත්තපරියාය දේශනාව මැනවින් සිහිකොට රූපාදී අරමුණු විෂයෙහි චක්ෂුර්ද්වාරාදියෙහි පවත්නා විඥ්ඥාණය අභිධ්‍යාදීන් විසින් ලුහුබැඳියහැකි නිමිති ආදිය ගැනීම නොමුළාවූ සිහියෙන් වලක්වමින් මේ ඉන්ද්‍රියසංවරය මැනවින් සම්පාදනය කළයුතුය. මේ ඉන්ද්‍රියසංවරය මෙසේ සම්පාදිත නොවූ කල්හි ප්‍රාතිමෝක්ෂශීලයද කල් පවත්නේ නොවේ. දිගුකල් සිටිනුයේ නොවේ. මනාසේ සකස් නොකළ වැට සහිත ගොයමක් මෙනි. මේ ප්‍රාතිමෝක්ෂසංවරශීලය කෙලෙස් සොරුන් විසින් වනසනු ලැබේ, නොවැසූ දොරටු සහිත ගමක් ගම්පහරන්නවුන් විසින් වනසනු ලබන්නාක් මෙනි. රාගය තෙමේ මොහුගේ සිතද විනිවිද යයි, වැස්ස මනාසේ සෙවෙනි නොකළ ගෙයක් විනිවිද යන්නාක් මෙනි. කියනලද මැයි:

රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු ඵස්සෙසු ච රක්ඛ ඉන්ද්‍රියං,
එතෙ හි ද්වාරා විවටා අරක්ඛිතා
හනන්ති ගාමං ව පරස්ස හාරිනො[2]

යථාගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති,
එවං අභාවිතං චිත්තං රාගො සමතිවිජ්ඣති[3]

රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන මොවුන් විෂයෙහි ඉන්ද්‍රියයන් රකුව, නොරක්නාලද, විවෘතවූ ද්වාරයන් කරණකොට මොවුහු (රූප ශබ්දදිය), සොරුන් ගමක් පහරන්නාක් මෙන්, පහරති (කොල්ල කති).

යම්සේ වැස්ස මනාව සෙවිලි නොකළ ගෙයක් විනිවිද යන්නේද එසේම රාගය (භාවනාදියෙන්) නොවඩනාලද සිත විනිවිද යන්නේය.

(1) සං. නි. සළායතනවග්ග - S iv 168
(2) සං. නි. සළායතනවග්ග - S iv 168
(3) ධම්මපද යමකවග්ග - Dh 13

මේ ඉන්ද්‍රියසංවර ශීලය සම්පාදිතවූ කල්හි ප්‍රාතිමෝක්ෂ ශීලයද කල් පවත්නේ වේ, දිගුකල් පිහිටනුයේද වේ, මනාසේ සකස්කළ වැට සහිත ගොයමක් මෙනි. මේ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයද කෙලෙස් සොරුන් විසින් වැනසිය නොහැකි වේමය. වසනලද දෙරටු සහිත ගමක් සොරුන් විසින් වනසනු නොහැකි වන්නාක් මෙනි. රාගය මොහුගේ සිතද විනිවිද නොයයි, වැස්ස මනාසේ සෙවිලි කළ ගෙයක් විනිවිද නොයන්නාක් මෙනි. කියනලද මැයි:

රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු ඵස්සෙසු ච රක්ඛ ඉන්ද්‍රියං
එතෙ හි ද්වාරා පිහිතා සුසංවුතා
න හන්ති ගාමං ව පරස්ස හාරිනො[(1)]

යථාගාරං සුච්ඡන්නං වුට්ඨී න සමතිවිජ්ඣති
එවං සුභාවිතං චිත්තං රාගො න සමතිවිජ්ඣති[(2)]

රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන මොවුන් විෂයෙහි ඉන්ද්‍රියයන් රකුව, මනාසේ රක්නාලද, වසනලද ද්වාරයන් කරණකොට මොවුහු, සොරුන් ගමක් පහරනු නොහැකි වන්නාක් මෙන්, පහරනු නොහැකි වෙති.

යම්සේ වැස්ස මනාකොට සෙවිලි කරනලද ගෙයක් විනිවිද නොයන්නේද, එසේම රාගය තෙමේ මනාසේ වඩනාලද සිත විනිවිද නොයන්නේය.

මේ වනාහි අතිශය උත්කෘෂ්ට දේශනායි.

මේ සිත වනාහි යුහුව පෙරළෙනසුලුය. එහෙයින් රාගයක් උපනහොත් එය අසුබ මෙනෙහි කිරීමෙන් දුර හැර ඉන්ද්‍රිය සංවරය සම්පාදනය කළයුතුය. පැවිදිව නොබෝකල්වූ වංගීස තෙරුන් මෙනි. අලුත පැවිදිවූ වංගීස තෙරුන් පිඩු පිණිස හැසිරෙද්දී එක් ස්ත්‍රියක් දැක රාගය උපනි. ඉක්බිති ආනන්ද තෙරුන් අමතා මෙසේ කීහ:-

කාමරාගෙන ඩය්හාමි චිත්තං මෙ පරිඩය්හති
සාධු නිබ්බාපනං බ්‍රෑහි අනුකම්පාය ගොතමාති[(3)]

(1) සං. නි. සළායතනවග්ග
(2) ධම්මපද යමකවග්ග - Dh 14
(3) සං. නි. වංගීස සං. - S i 188

ගෞතමයන්වහන්ස, මම කාමරාගයෙන් දවෙමි. මාගේ සිත පැළහේ. මා කෙරෙහි අනුකම්පාවෙන් එය නිවන සැටි කියනු මැනවි.

තෙරණුවෝ මෙසේ කීහ:

සඤ්ඤාය විපරියෙසා චිත්තං තෙ පරිඩය්හති,
නිමිත්තං පරිවජ්ජේහි සුභං රාගූපසංහිතං
අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං

සඞ්ඛාරෙ පරතො පස්ස දුක්ඛතො නො ච අත්තතො
නිබ්බාපෙහි මහාරාගං මා ඩය්හිත්ථො පුනප්පුනං ති[1]

සංඥාව වරදවා ගත් හෙයින් ඔබගේ සිත පැළහේ. රාගය හා සමඟ බැඳුණු සුබනිමිත්ත වළකාලනු.

අසුභ සංඥාවෙහි සිත වඩනු. එකඟ කරනු. මොනවට සන්සුන්ද කරනු. සංස්කාරයන් තමා සතු නොවන්නන් ලෙසින්ද දුක් වශයෙන්ද අනාත්ම වශයෙන්ද දකිනු. මේ මහාරාගය නිවනු, නැවත නැවතත් නොම දවෙනු.

තෙරණුවෝ රාගය දුරු කොටම පිඩු සිඟා වැඩියහ. තවද ඉන්ද්‍රියසංවරය පුරන පැවිද්ද විසින් කුරණ්ඩක මහලෙන් වැසි චිත්තගුත්ත තෙරුන් මෙන්ද චෝරක මහවෙහෙර වැසි මහාමිත්ත තෙරුන් මෙන්ද වියයුතුය. කුරණ්ඩක ලෙණෙහි වනාහි සත්බුදුවරයන්ගේ අභිනිෂ්ක්‍රමණය විදහාපාන මනරම් සිතුවම් විය. බොහෝ භික්ෂූහු සේනාසනචාරිකාවෙහි හැසිරෙන්නාහු සිතුවම් දක, 'ස්වාමීනි, සිතුවම් මනහරය'යි කීහ. තෙරණුවෝ, 'ඇවැත්නි, සැට වසකට වැඩි කලක් ලෙණෙහි වසන්නෙමි සිතුවමක් ඇති බව හෝ නොදනිමි, අද ඇස් ඇත්තවුන් නිසා දන ගතිමි'යි කීහ. මෙසා දිගු කලක් ලෙණෙහි වසන තෙරුන් විසින් ඇස් ඇර ලෙණ දෙස නොබලනලදවිරූය. ලෙන් දෙර අබියස මහ නා රුකක් විය. තෙරුන් විසින් උඩට ඇස් යොමා එයද නොබලනලද විරූය. වසරක් පාසා එහි බිම වැගුරුණු රේණු දකම එය පිපීගියබව දනගනිති. රජ තෙමේ තෙරුන්ගේ ගුණ සම්පත්තිය අසා වඳිනු කැමැතිව තුන් වරක් කැඳවා යවාද, තෙරුන් නොඑන කල 'යම්තාක් තෙරුන්වහන්සේ නොඑන සේක්ද ඒ තාක් දරුවෝ කිරි නොලබත්වා'යි එගම ළදරුවන් ඇති ස්ත්‍රීන්ගේ පියොවුරු බඳවා හස් තබවා පීය. තෙරණුවෝ දරුවන්

(1) සං. නි. වංගීස සං. - S i 188

කෙරෙහි අනුකම්පාවෙන් මාගමට වැඩියහ. රජතෙමේ එපවත් අසා, 'යවු දරුවෙනි, තෙරුන්වහන්සේ කැඳවාගෙන එවු, සිල් ගනු කැමැත්තෙමු'යි අන්තඃපුරයට ගෙන්වා වැඳ, දන් වළඳවා, 'ස්වාමීනි, අද අවසර නැත, හෙට සිල් ගන්නෙමු'යි තෙරුන්ගේ පාත්‍රය ගෙන මඳක් පසු ගමන් ගොස් බිසොව හා වැඳ නැවතියේය. තෙරුන්වහන්සේ රජු හෝ වේවයි බිසොව හෝ වේවයි, වඳින කල, 'මහරජ සුවපත් වේවා'යි කියති. මෙසේ සත් දිනක් ඉකුත්ව ගියේය. භික්ෂූහු මෙසේ කීහ, 'කිමෙක්ද ස්වාමීනි, ඔබවහන්සේ රජු වඳින කලද, බිසොව වඳින කලද, 'මහරජ, සුවපත් වේව'යි කියන සේකැ'යි පැවසූහ. තෙරණුවෝ, 'ඇවැත්නි, මම් රජුදැයි හෝ බිසොවදැ'යි හෝ විපරම් නොකෙරෙමි'යි පවසා, සත් දිනක් ඉකුත්ව ගිය කල්හි, 'තෙරුන්හට මෙහි විසීම අපහසුය'යි රජු විසින් මුදවාහළ කල්හි කුරණ්ඩක මහලෙණට ගොස් රාත්‍රිභාගයෙහි සක්මන් මලුවට නැඟියාහ. එහි නාරුකට අධිගෘහීත දෙවියා දඬුවැට පහනක් ගෙන සිටියේය. ඉක්බිති, උන්වහන්සේට කමටහන් ඉතා පිරිසුදු ලෙස වැටහිණි. තෙරණුවෝ, 'කිමෙක්ද අද මාගේ කමටහන් ඉතා පැහැදිලියයි සතුටුව, මැදයම ඉකුත්වත්ම මුළු පර්වතය සාධුනාදයෙන් උන්නාද කරවමින් රහත්බවට පැමිණියහ. එහෙයින්, වැඩකැමැති සෙසු කුලපුත්‍රයකු වුවද,

මක්කටො'ව අරඤ්ඤම්හි වනෙ භන්තමිගො විය
බාලො විය ච උත්‍රසොතා න භවෙ ලොලලොචනො
අධො ඛිපෙය්‍ය චක්ඛූනි යුගමත්තදසො සියා
වනමක්කටලොලස්ස න චිත්තස්ස වසං වජෙ ති.

වනයෙහි වෙසෙන වඳුරකු මෙන් හෝ වනයෙහි මුළාවූ මුවකු මෙන් තැතිගත් ළදරුවකු මෙන් හෝ චංචල ඇස් ඇත්තකු නොවියයුතුය.

ඇස් පහතට යොමාගතයුතුය. වියදඬු පමණ බැලියයුතුය. වනවඳුරෙකු මෙන් චංචලවූ සිතෙහි වසහයට නොයායුතුය.

මහාමිත්ත තෙරුන්ගේද මෑණියන්හට විසගඩු රෝගයෙක් උපනි. ඇයගේ දියණියෝද මෙහෙණවරෙහි පැවිදිව වෙසෙති. ඕතොමෝ 'ආර්යාවෙනි, බෑණන් වෙත යනු මැනවි, ගොස් මට අසනීපබව දන්වා බෙහෙතක් සපයාගෙන එනු මැනවැ'යි මෙහෙණියන්හට කීවාය. මෙහෙණියෝද ගොස් එපවත් දැන්වූහ. තෙරණුවෝ, 'මම බොහෝ මුල් ආදිය රැස්කොට බෙහෙත් පිසන්නට නොදනිමි. එතෙකුදුවුවත් ඔබට

බෙහෙතක් කියන්නෙමි, යම් හෙයකින් මා පැවිදිවූ තැන් පටන් මවිසින් ලොභ සහගත සිතින්, ඉන්ද්‍රිය සංවරය බිඳ කෙලෙසුන් ඉපැදවීමට හේතුවන විෂම රූපයක් නොබලනලදවිරූද, මේ සත්‍ය වචනයෙන් මාගේ මෑණියන්හට සුවවේවා! යනු මැනව. මේබව කියා උපාසිකාවගේ ශරීරය පිරිමදිනු මැනවැ'යි කීහ. තෙරණියෝද ගොස් මෙපවත් දන්වා එසේ කළහ. එකෙණෙහිම උපාසිකාවගේ විසගඩුව පෙණපිඩක්මෙන් දියවී අතුරුදන් විය. ඕ තොමෝ නැඟී සිට, 'ඉදින් සම්මා සම්බුදුන්වහන්සේ ජීවමාන වූසේක් නම්, මා පුත් තෙරුන් වැනි භික්ෂුකෙනෙකුගේ හිස දලක් වැනි විසිතුරු අතින් කවර හෙයින් නොපිරිමදින සේක්ද'යි ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කළාය. එහෙයින්,

කුලපුත්තමානී අඤ්ඤාපි පබ්බජිත්වාන සාසනෙ
මිත්තත්ථෙරෝ'ව තිට්ඨෙය්‍ය වරෙ ඉන්ද්‍රියසංවරෙ

කුලපුත්හැඟීමෙන් ශාසනයෙහි පැවිදිවූ අන් පැවිද්දකුවුවද, මිත්ත තෙරුන්මෙන් සිටියයුතුය. ඉන්ද්‍රිය සංවරයෙහි හැසිරියයුතුය.

යම්සේ ඉන්ද්‍රියසංවරය සිහියෙන් සම්පාදනය කළයුතුවේද, එසේම ආජීවපාරිශුද්ධි ශීලය වීර්යයෙන් සම්පාදනය කළයුතුය, එය වනාහි වීර්යය හේතුකොට සාධනය කරනු ලැබේ. මනාකොට ඇරඹි වීර්ය ඇත්තහුට මිථ්‍යාජීවප්‍රහාණය සිදුවන හෙයිනි. එහෙයින් උචිත නොවූ ප්‍රත්‍යයාන්වේෂණය (සිවුපසය ඉපයීම) හැරපියා වීර්යයෙන් පිණ්ඩපාතචර්යා ආදියෙන් උචිත ලෙස ප්‍රත්‍යයාන්වේෂණය සම්පාදනය කළයුතුය. පිරිසුදු ලෙස උපයාගත් සිවුපසය සෙවුමින් අපිරිසුදු ලෙස උපදවනුලබන ප්‍රත්‍යයන් ආශීර්විෂයන් මෙන් දුරුකරමින් මේ ප්‍රත්‍යයාන්වේෂණය සම්පාදනය කළයුතුය. එහි ධුතාංග සමාදන් නොවූවහුට නම්, සංඝයා කෙරෙන්ද, (සෞත්‍රාන්තික ආදී) ගණයා කෙරෙන්ද, ධර්මදේශනා ආදී ගුණයෙහි පහන් ගිහි ජනයාගෙන්ද උපන් සිවුපසය පිරිසුදු ඉපැදවීම නම්. පිණ්ඩපාතචර්යා ආදියෙන් ලද සිවුපසය ඉතාපිරිසුදු ඉපැදවීම වේ. ධුතාංග සමාදන් වූවහුට පිණ්ඩපාතචර්යාවෙන්ද, ධුතාංග ගුණයෙහි පහන් ජනයාගෙන්ද, ධුතාංග නියමයට අනුකූලව උපන් ප්‍රත්‍යය පිරිසුදු ඉපැදවීම නම්. කිසියම් ව්‍යාධියක් ශමනය කරනු පිණිස, ගෝමූත්‍රයෙන් පැසවනලද අරළුද චතුමධුරද ලැබුණ විටෙක, සෙසු සබ්‍රම්සරහුද චතුමධුරය පරිභෝග කරන්නාහුයයි සලකා අරළු කැබැල්ල පමණක් පරිභෝග කරන්නහුට ධුතාංග සමාදනය යෝග්‍ය වේ. (මෙවන් ස්වභාව ඇති) මේ තෙමේ ආර්යයන්ගේ වංශයට අයත් උතුම් භික්ෂුකෙනෙකු'යි කියනුලැබේ.

යම් මේ චීවරාදී ප්‍රත්‍යයෝ වෙත්ද, ඔවුනතුරෙන් චීවරය, පිණ්ඩපාතය යන දෙක පිළිබඳව නිමිත්තය, ඕභාසය, පරිකථාය, විඤ්ඤත්තිය යන සතර, ආජීවය පිරිසිදුකරන භික්ෂු කෙනකුට යෝග්‍ය නොවේ. සේනාසන විෂයෙහි වනාහි, ධුතාංග සමාදන් නොවූවකුට නම්, නිමිත්තය, ඕභාසය, පරිකථාය යන තුන නොසුදුසු නොවේ. එහි නිමිත්ත නම්: සේනාසනයක් ඉදි කිරීම පිණිස බිම සකස් කරන විට, 'ස්වාමීනි, කුමක් කරයිද? කවරෙක් කරවාද'යි ගිහියන් විමසනකල 'කිසිවෙක් නැතැ'යි පිළිතුරු දීමයි. නැතහොත් වෙනත් මෙබඳු ඉඟියකින් පිළිතුරු දීමයි. ඕභාස නම්: 'උපාසකවරුනි, තෙපි කොහි වෙසෙවුද?', 'ස්වාමීනි, පහයෙක්හිය,' 'උපාසකවරුනි, භික්ෂූන්හට පහයක් නොවටීදැ?'යි යන මෙවැනි වචනයි. නැතහොත්, මෙබඳු වෙනත් හැඟවීමක් කිරීමයි. පරිකථා නම්: 'භික්ෂු සංඝයාහට සේනාසනය ගැහැට සහිතය'යි කීමයි. නැතහොත්, වෙනත් මෙබඳු ඇඟවීමක් කිරීමයි. බෙහෙත් පසයෙහිදී මේ සියල්ල (සතර)ම යෝග්‍ය වේ. එසේ උපන් බෙහෙත් පසය රෝගය සුවවූ පසු පරිභෝග කිරීම සුදුසුද, නොසුදුසුද'යි යන මේ කාරණයෙහිලා විනයධර භික්ෂූහු, භාග්‍යවතුන්වහන්සේ විසින් අවසර දීඇති හෙයින් වළඳනු වටී'යයි කියති, සෞත්‍රාන්තික භික්ෂූහු වනාහි, කිසිදු ඇවැතක් සිදුනොවෙතත්, 'ආජීවය පලුදුවන හෙයින් නොවටීමය'යි කියති.

යම් භික්ෂු කෙනෙක් වනාහි භාග්‍යවතුන්වහන්සේ විසින් අනුදත් තන්හි පවා නිමිත්තය, ඕභාසය, පරිකථාය, විඤ්ඤත්තිය යන මේවා නොකෙරෙමින් අල්පේච්ඡතාදී ගුණයන් නිසාම මරණය එළඹි කල්හි පවා ඔභාසාදිය හේතුකොට උපන් සිවුපසය හැර වැළඳීම කෙරෙත්ද, මේ භික්ෂු තෙමේ පරමසල්ලේඛවූ පැවැතුම් ඇත්තෙකැ'යි කියනුලැබේ, සැරියුත් තෙරණුවන් මෙනි. ඒ ආයුෂ්මතුන්වහන්සේ වනාහි එක් සමයෙක්හි පවිවේකය (පලසමවත්) වඩනසේක් මහමුගලන් තෙරුන් හා සමඟ එක්තරා වනයෙක්හි වාසය කරනසේක. ඉක්බිති, එක් දවසක් උදරවාතාබාධයක් හටගෙන අධික දුක් වේදනා දෙන්නට විය. මුගලන් තෙරණුවෝ සවස් කාලයෙහි උන්වහන්සේ වෙත එළඹ වැදහොත් තෙරුන් දක, එපවත් අසා, 'ඇවැත්නි, පෙර ඔබවහන්සේට මෙබඳු ආබාධයක් හටගත් කල කුමක් කොට සුව වීද'යි විචාළහ. සැරියුත්තෙරණුවෝ 'ඇවැත්නි, ගිහිකල මාගේ මෑණියෝ ගිතෙල් මීපැණි උක්සකුරු ආදිය යොද දිය නොමුසු කිරිබත් දුන්හ, එයින් සුවවීය'යි කීහ. ඒ ආයුෂ්මතුන් වහන්සේද, 'එසේ වේවා, ඇවැත්නි, ඉදින් මාගේ හෝ ඔබගේ හෝ පිනක් ඇත්නම්, හෙට ලැබේවි'යි කීහ. ඔවුන් දෙදෙනාවහන්සේගේ මේ කථාසල්ලාපය සක්මන්මලු කෙළවර ගසක් අධිගෘහීත දේවතා කෙනෙක්

අසා සිට, හෙට ආර්යයන්වහන්සේට කිරිබත් ලබා දෙමි'යි එකෙණෙහිම ආර්යයන්වහන්සේගේ දයක ගෙයකට ගොස් වැඩිමහල් දරුවාගේ සිරුරට ආවිෂ්ටව පීඩා ඉපදවීය. ඉක්බිති ඔහුට ප්‍රතිකාර සඳහා රැස්වූ නෑයන්හට, 'හෙට තෙරුන්වහන්සේට මෙවන් කිරිබතක් පිළියෙළකොට දෙවූ, එවිට ඔහු මුදවා ලමි'යි කීහ. ඔවුහු 'ඔබ නොකීවද අපි තෙරුන් වහන්සේට නිරතුරු දන් දෙන්නමෝ'ය'යි පවසා පසුදින එවන් කිරිබතක් පිළියෙළ කළාහුය. මහමුගලන් තෙරණුවෝ උදසනින්ම අවුත්, 'ඇවැත්නි, මා පිඬුසිඟා එන තෙක් මෙහිම සිටිනු මැනවැ'යි පවසා ගමට පිවිසියහ. ඒ මිනිස්සු පෙර ගමන් ගොස් තෙරුන්ගේ පාත්‍රය රැගෙන කියනලද ආකාර ඇති කිරිබතින් පාත්‍රය පුරවා පිළිගැන්වූහ. තෙරණුවෝ යනු කැමැතිබව දක්වූහ. 'ස්වාමීනි, ඔබවහන්සේ වළඳනු මැනවි, වෙනත් එකක් දෙන්නමෝ'ය'යි තෙරුන් වළඳවා යළි පාත්‍රය පුරවා දුන්හ. තෙරණුවෝ සෙනසුනට ගොස්, 'ඇවැත්නි, සැරියුත් තෙරණුවනි, වළඳනු මැනවැ'යි පාත්‍රය එළවූහ. සැරියුත් තෙරණුවෝද එය දැක ඉතා සතුටුව, පායාසය කෙසේ නම් උපන්නේදැයි සිතන්නාහු එය ලැබීමට හේතුවූ කරුණ දැක, 'ඇවැත්නි, මුගලන් තෙරණුවනි, ඉවත ලනු මැනවි, මෙය පරිභෝගයට යෝග්‍ය නොවන පිණ්ඩපාතයෙකැ'යි කීහ. ඒ ආයුෂ්මත්හුද, 'මා වැන්නකු ගෙනවුත් දුන් පිණ්ඩපාතය පවා නොවළඳිති'යි සිතිවිලි පමණකුදු නො-උපදවා එක් වචනයෙන්ම පාත්‍රය මුවවිටින් ගෙන පසෙක හළාපූහ. පායාසය බිමට වැටෙත්ම තෙරුන්ගේ ආබාධය පහවී ගියේය, එතැන් සිට සාලිස්වසක් යනතෙක් යළි නො-උපනි. ඉක්බිති මහමුගලන් තෙරුන් අමතා, 'ඇවැත්නි, වාග් විඥප්තියෙන් (වචනයෙන් දැන්වීමෙන්) උපන් පායාසය අතුනු නික්ම බිම ඇවිදිතත් වළඳන්නට යොග්‍ය නොවේය"යි පැවසූහ. මේ උදනයද ප්‍රකාශ කළහ:-

වචීවිඤ්ඤත්තිවිප්ඵාරා උප්පන්නං මධුපායසං
සචෙ භුත්තො භවෙය්‍යාහං සාජීවො ගරහිතො මම[1]

යදිපි මෙ අන්තගුණං නික්ඛමිත්වා බහි චරෙ
නෙව භින්දෙය්‍යමාජීවං චජමානො'පි ජීවිතං[2]

ආරාධෙමි සකං චිත්තං විවජ්ජෙමි අනෙසනං
අහං හි බුද්ධපතිකුට්ඨං න කාහාමි අනෙසනන්ති.

(1) උදනපාළි
(2) මිලින්දපඤ්හා - Mil 370

වාග් විඥප්ති (වචනයෙන් හැඟවීම්) වශයෙන් උපයා ගන්නා ලද මීමුසු කිරිබත් වැළඳුව හොත් මාගේ ආජීවය ගැරහියයුතු බවට පත්වේ.

මාගේ අතුනුබහන් නිකුත්ව පිටත හැසිරෙතත්, දිවි තොරවී යතත්, ආජීවය කඩ නොකරමි.

මාගේ සිත සනස්වා ගනිමි. සිවුපස සෙවීම අත්හරිමි. බුදුන් විසින් පිළිකෙව් කරනලද ප්‍රත්‍යය සෙවීම මම් කිසිසේත් නොකරමි.

චීවරගුම්බ නම් ස්ථානයෙහි විසූ අම්බඛාදක මහාතිස්ස නම් තෙරුන්ගේ වතද මෙහිදී සඳහන් කළ යුතුය. මෙසේ සෑම අතින්ම

'අනෙසනාය චිත්තම්පි අජනෙත්වා විචක්ඛණො,
ආජීවං පරිසොධෙය්‍ය සද්ධා පබ්බජිතො යතී'ති

සැදැහැයෙන් පැවිදිවූ නුවණැති භික්ෂුතෙමේ ප්‍රත්‍යයන් සෙවීමෙහි සිතකුදු නො-උපදවා ආජීවය පිරිසුදු කර ගන්නේය.

මේ ආකාරයෙන් ආජීවපාරිශුද්ධිය වීර්යයෙන් සම්පාදනය කළයුතු වේනම්, එසේම ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය ප්‍රඥවෙන් සම්පාදනය කළයුතු වේ. එය වනාහි ප්‍රඥවෙන් සාදගත යුතුය. ප්‍රඥවන්තයා ප්‍රත්‍යයන් පිළිබඳ දෙස් හෝ අනුසස් දකිනු සමත්වන හෙයිනි. එහෙයින් ප්‍රත්‍යයන් කෙරෙහි ගිජුබව හැර දැහැමෙන් සෙමෙන් උපන් ප්‍රත්‍යය විෂයෙහි, කියනලද නයින් නුවණින් මෙනෙහි කොට පරිභෝග කිරීමෙන් එය සම්පාදනය කළයුතුය. එහි ප්‍රත්‍යවේක්ෂණය (නුවණින් මෙනෙහි කිරීම) ප්‍රත්‍යයන්ගේ ප්‍රතිලාභ කාලයෙහිද, පරිභෝග කාලයෙහිද'යි දෙ-ආකාර වේ. ප්‍රතිලාභ කාලයෙහි වනාහි ධාතු වශයෙන් හෝ ප්‍රතිකූල වශයෙන් හෝ ප්‍රත්‍යවේක්ෂා කොට තබනලද සිවුරු ආදිය පසුව පරිභෝග කරන්නහුගේ එම පරිභෝගය නිරවද්‍යවේ. පරිභෝග කාලයෙහිද, එසේම ප්‍රත්‍යවේක්ෂා කළ යුතුවේ. පරිභෝගකාල ප්‍රත්‍යවේක්ෂණය පිළිබඳව සනිටුහන් කරන විනිශ්චය මෙසේය:- පරිභෝගයෝ වනාහි, ථෙය්‍ය පරිභෝගය, ඉණපරිභෝගය දයජ්ජපරිභෝගය, සාමිපරිභෝගයයි, සතර ආකාර වෙති. එහි සඟ මැද හිඳ වළඳන දුශ්ශීලයාගේ පරිභෝගය ථෙය්‍යපරිභෝග නම්. සිල්වත්හුගේ වුවද, ප්‍රත්‍යවේක්ෂා නොකොට කරන පරිභෝගය ඉණපරිභෝග නම්.

එහෙයින් සිවුරු පොරවන වාරයක් වාරයක් පාසා, පිණ්ඩපාතය පිඩක් පිඩක් පාසා ප්‍රත්‍යවේක්ෂා කළ යුතුය. එසේ නොහැකි වුවහොත් පෙරවරු, පස්වරු, පෙරයම්, මැදයම්, අළුයම් කාලයන්හිදී කළයුතුය. ඉදින් ප්‍රත්‍යවේක්ෂා නොකොට සිටියදී අරුණු නැංගහොත් ඉණපරිභෝගස්ථානයෙහිම සිටියේ වේ. සේනාසනයද පරිභෝග කරන වාරයක් වාරයක් පාසා ප්‍රත්‍යවේක්ෂා කළයුතුය. බෙහෙත් පිළිගැනීමෙහිද, පරිභෝග කිරීමෙහිද සිහියෙන් ප්‍රත්‍යවේක්ෂාකිරීම යෝග්‍ය වේ, එසේවුවද, පිළිගැනීමෙහිදී සිහිකොට නමුදු පරිභෝග කිරීමෙහිදී නොකළහොත් ඇවැත් සිදුවේ. පිළිගැනීමේදී සිහි නොකොටවුවද පරිභෝග කිරීමෙහිදී සිහිකළහොත් ඇවැත් නොවේ ශුද්ධිය (පිරිසුදුබව) වනාහි, දේශනාශුද්ධිය, සංවරශුද්ධිය, පරියෙට්ඨිශුද්ධිය, ප්‍රත්‍යවේක්ෂණශුද්ධියයි සිවු ආකාර වේ. එහි දේශනාශුද්ධි නම් ප්‍රාතිමෝක්ෂසංවරශීලයයි, එය වනාහි දේශනා නයින් පිරිසුදුවන හෙයින් දේශනාශුද්ධියයි කියනුලැබේ. සංවරශුද්ධි නම් ඉන්ද්‍රියසංවරශීලයයි. එය වනාහි යළි මෙසේ නොකරන්නෙමියි සිතින් ඉටාගත් සංවරයෙන්ම පිරිසුදුවන හෙයින් සංවරශුද්ධියයි කියනුලැබේ. පරියෙට්ඨිශුද්ධිනම් ආජීවපාරිශුද්ධිශීලයයි. එය වනාහි අයුතු සෙවීම අත්හැර දැහැමෙන් සෙමෙන් සිවුපසය උපදවන්නහුගේ සෙවීම පිරිසුදුවන හෙයින් පරියෙට්ඨිශුද්ධියයි කියනුලැබේ. ප්‍රත්‍යවේක්ෂණශුද්ධි නම් ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලයයි. එය වනාහි කියනලද නයින් ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් පිරිසුදුවන හෙයින් ප්‍රත්‍යවේක්ෂණශුද්ධියයි කියනුලැබේ. එහෙයින් පිළිගැනීමෙහිදී සිහිනොකොට නමුදු පරිභෝග කිරීමෙහිදී සිහි කරන්නහුට ඇවැත් නොවේය'යි කියනලදී. ශෛක්ෂ්‍යයන් (සෝවාන් මඟ සිටියහු ආදි කොට ඇති වෛනෙය්‍ය ජනයන්) සත්දෙනාගේ ප්‍රත්‍යයපරිභෝගය දායජ්ජ පරිභෝග නම්. ඔවුහු වනාහි භාග්‍යවතුන්වහන්සේගේ පුත්‍රයෝනම් වෙති. එහෙයින් පියසන්තකවූ ප්‍රත්‍යයන් ප්‍රවේණි උරුමයෙන් ලැබ පරිභෝග කරන්නෝනම් වෙති. කිමෙක්ද? ඔවුහු භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රත්‍යයන් පරිභෝග කෙරෙත්ද? නැතහොත් ගිහියන්ගේ ප්‍රත්‍යයන් පරිභෝග කෙරෙත්ද? ගිහියන් විසින් දෙනුලබන නමුදු භාග්‍යවතුන්වහන්සේ විසින් අනුදන්නාලද හෙයින් ප්‍රත්‍යයෝ භාග්‍යවතුන්වහන්සේ සතු වෙති. එහෙයින් භාග්‍යවතුන්වහන්සේගේ ප්‍රත්‍යයන් පරිභෝග කරන්නාහුයයි දතයුතුය. මෙහිලා ධම්මදයාද සූත්‍රයද, සාධක වේ. රහතුන්ගේ පරිභෝගය සාමිපරිභෝග නම්. ඔවුහු වනාහි තෘෂ්ණාදසත්වය ඉක්මවා සිටිහෙයින් ස්වාමිත්වය ඇතිව පරිභෝග කෙරෙති. මෙකී පරිභෝගයන් අතුරෙන් දායජ්ජපරිභෝගයද, සාමිපරිභෝගයද සියල්ලනටම යෝග්‍ය වේ. ඉණපරිභෝගය සුදුසු නොවේ. ථෙය්‍යපරිභෝගය ගැන කවර කථාද? සිල්වතුන්ගේ යම් මේ ප්‍රත්‍යවේක්ෂා සහිත පරිභෝගයක් ඇත්ද, එය

ඉණපරිභෝගයට ප්‍රතිපක්ෂ වන හෙයින් ආණන්‍ය (ණය නැති) පරිභෝගනම් හෝ වේ. නැතහොත් එය දයජ්ජපරිභෝගය තුළම සංග්‍රහයට යෙයි (එහිම ඇතුළත්වෙයි). සිල්වත්හු ශික්ෂාවෙන් සමන්විතවන හෙයින්ම ශෛක්ෂ්‍ය වෙතැ'යි කියනුලැබේ. මෙකී පරිභෝගයන් අතුරෙන් සාමිපරිභෝගය ශ්‍රේෂ්ඨවන හෙයින් එය පතන භික්ෂුව විසින් කියනලද ආකාර ඇති ප්‍රත්‍යවේක්ෂණයෙන් ප්‍රත්‍යවේක්ෂාකොට පරිභෝගකරමින් ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීලය පිරියයුතුය. මෙසේ කරනුයේ වනාහි කළයුතු කාර්යය ඉටුකරනුයේ නම් වේ. කියනලද මැයි:

පිණ්ඩං විහාරං සයනාසනඤ්ච
ආපඤ්ච සඞ්ඝාටි-රජූපවාහනං
සුත්වාන ධම්මං සුගතෙන දෙසිතං
සඞ්ඛාය සෙවෙ වරපඤ්ඤසාවකො

තස්මා හි පිණ්ඩෙ සයනාසනෙ ච
ආපෙ ච සඞ්ඝාටි-රජූපවාහනෙ
එතෙසු ධම්මෙසු අනූපලිත්තො
භික්ඛු යථා පොක්ඛරෙ වාරිබින්දු[1]

කාලෙන ලද්ධා පරතො අනුග්ගහා
ඛජ්ජෙසු භොජ්ජෙසු ච සායනෙසු
මත්තං ස ජඤ්ඤා සතතං උපට්ඨිතො
වණස්ස ආලෙපනරූහනෙ යථා

කන්තාරෙ පුත්තමංසං'ව අක්ඛස්ස'බ්භඤ්ජනං යථා
එවං ආහරි ආහාරං යාපනත්ථාය' මුච්ඡිතො ති

උතුම් ප්‍රඥා ඇති ශ්‍රාවක තෙමේ බුදුන් විසින් දෙසනලද ධර්මය අසා නුවණින් මෙනෙහි කොට පිණ්ඩපාතය, සේනාසනය, යහන්ය, අසුන්ය, සිවුරුය, බොන පැන්ය, නහන සෝදන පැන්ය යන මෙතෙක් ද සේවනය කරන්නේය.

එහෙයින් පිණ්ඩපාතය, සේනාසනය, යහන්ය, අසුන්ය, බොන පැන්ය, නහන සෝදන පැන්ය, සිවුරුය යන මේ ද්‍රව්‍යයන් කෙරෙහි නෙළුම් පතෙහි දියබිඳු නොඇලෙන සෙයින් නො-ඇලුණ භික්ෂුතෙමේ,

(1) සුත්තනිපාත-ධම්මිකසුත්ත. Sn 390f.

සුදුසු කාලයෙහි අනුන්ගේ අනුග්‍රහයෙන් ලැබුණු කැයුතු, බිදියයුතු, ලෙවියයුතු අහරෙහි, වණයක් බෙහෙත් ගල්වා සුවකරන සෙයින්, නිතර එළඹසිටි සිහියෙන් යුතුව, පමණ දන වළඳන්නේය.

කාන්තාරය තරණය කිරීමෙහිදී (මළ) පුතුගේ මාංශය වළඳන සෙයින්ද, රථ-අක්ෂයෙහි ලිහිසි තෙල් යොදන සෙයින්ද, ජීවිතය පවත්වාගැනීම පිණිස, නොමුළාව ආහාර වළඳන්නේය.

මේ ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලය සම්පූර්ණ කිරිමෙහිලා භාගිණෙය්‍ය සංඝරක්ඛිත සාමරණේරයන්ගේ කථාවස්තුව කිවයුතුය. ඔහු මැනවින් ප්‍රත්‍යවේක්ෂා කොටම පරිභෝග කළහ. යම්සේ කියනලදදඃ-

උපජ්ඣායො මං භුඤ්ජමානං සාලිකූරං සුනිබ්බුතං
මා හෙව ත්වං සාමණෙර ජිව්හං ඣාපෙසි අසඤ්ඤතො

උපජ්ඣායස්ස වචො සුත්වා සංවෙගමලභිං තද,
එකාසනෙ නිසීදිත්වා අරහත්තං අපාපුණිං

සො'හං පරිපුණ්ණසඞ්කප්පො චන්දෙ පණ්ණරසො යථා
සබ්බාසවපරික්ඛීණො නත්ථිදානි පුනබ්භවො'ති[1]

ඉතා ශීතලවූ හැල්'බතක්' බුදිනවිට මාගෙ' උපාධ්‍යායයන්වහන්සේ මාහට, 'සාමණේරය, නොමෙනෙහි කොට වළඳ දිව පුළුස්සා නොගනුව'යි කීහ.

උපාධ්‍යායයන් වහන්සේගේ වදන් අසා එවිට මම සංවේග උපදවා ගතිමි, එ-අසුන්හි හුන්වනම හිඳ රහත් බවට පැමිණියෙමි.

එසේ වූ මම පුන් පොහෝ සඳමෙන් පිරිපුන් සිත් ඇත්තෙමි සියලු කෙලෙසුන් නැසුවෙමි, දන් මට නැවත ඉපදීමෙක් නැත.

තස්මා අඤ්ඤොපි දුක්ඛස්ස පත්ථයනෙතා පරික්ඛයං
යොනිසො පච්චවෙක්ඛිත්වා පටිසෙවෙථ පච්චයෙ ති

මෙසේ ප්‍රාතිමෝක්ෂසංවරශීලාදි වශයෙන් ශීලය සිවු ආකාර වේ.

**චතුපාරිසුද්ධිසීල-පකිණ්ණක-කථා නිමි.**

---

(1) අපදන පාළි

(ශීලය කී වැදෑරුම් වේදැයි විස්තර කෙරෙමින් යට කියනලද) පස්වැදෑරුම් කොටසෙහි, පළමුවන පංචකයෙහි, අනුපසම්පන්නශීලාදී වශයෙන් අර්ථය දතයුතුය. කියනලදමැයි පටිසම්භිදවෙහි:- 'පරියන්තපාරිසුද්ධිසීලය නම් කිමෙක්ද? මෙතෙකැ'යි නියමිත සංඛ්‍යාවක් ශික්‍ෂාපද ඇති අනුපසම්පන්නයන්ගේ ශීලයයි, මේ පරියන්ත පාරිසුද්ධිසීලයයි. අපරියන්ත පාරිසුද්ධිසීලය නම් කිමෙක්ද? මෙතෙකැ'යි අනියමිත සංඛ්‍යාවක් ශික්‍ෂාපද ඇති උපසම්පන්නයන්ගේ ශීලයයි. මේ අපරියන්ත පාරිසුද්ධි සීලයයි. පරිපූර්ණ පාරිසුද්ධිසීලය නම් කිමෙක්ද? කුශලධර්මයෙහි නියුතු, ශෛක්‍ෂ්‍යපර්යන්ත ධර්මයන් පුරන, කය හෝ ජීවිතය පිළිබඳ අපේක්‍ෂා නැති, ජීවිතපරිත්‍යාගයෙන් යුත් පෘථග්ජන කල්‍යාණයන්ගේ ශීලයයි. මේ පරිපූර්ණ පාරිසුද්ධිසීලයයි. අපරාමට්ඨ පාරිසුද්ධිසීලය නම් කිමෙක්ද? ශෛක්‍ෂයාන් සත්දෙනාගේ ශීලයයි, මේ අපරාමට්ඨ පාරිසුද්ධිසීලයයි. පටිප්පස්සද්ධි පාරිසුද්ධසීලය නම් කිමෙක්ද? තථාගත ශ්‍රාවක ක්‍ෂීණාශ්‍රවයන්ගේද, ප්‍රත්‍යෙක බුද්ධයන්ගේද, අර්හත් සම්‍යක් සම්බුද්ධතථාගතයන්ගේද ශීලයයි, මේ පටිප්පස්සද්ධි පාරිසුද්ධිසීලයයි.'(1) එහි අනුපසම්පන්නයන්ගේ ශීලය සංඛ්‍යා වශයෙන් පරියන්ත සහිත වනහෙයින් පරියන්ත පාරිසුද්ධියයි දතයුතුය. උපසම්පන්නයන්ගේ,

නව කොටිසහස්සානි අසීති සතකොටියො
පඤ්ඤාසා සතසහස්සානි ඡත්තිංසා ච පුනාපරෙ

එතෙ සංවරවිනයා සම්බුද්ධෙන පකාසිතා,
පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා සික්ඛා විනයසංවරෙති

නව දහස් කෝටියක්ද, සිය කෝටි අසූවක්ද? පණස් ලක්‍ෂයක්ද, නැවත තවත් සතිසක්ද,

යන මේ සංවර විනය ශික්‍ෂාපද සම්බුද්ධයන්වහන්සේ විසින් ප්‍රකාශ කරනලදුව විනය පිටකයෙහි පෙයාාල ස්වරූපයෙන් දක්වනලදී.

මෙසේ ගණන් වශයෙන් පර්යන්ත සහිත වුවද, නිරවශේෂ වශයෙන් සමාදන් වියයුතු බවද, ලාභ, යශස්, ඥාති, අංග, ජීවිත වශයෙන් නොදැකිය හැකි සීමා ඇති බවද සලකා අපරියන්ත පාරිසුද්ධි සීලයයි දතයුතුය. චීවරගුම්බවාසී අම්බඛාදක මහාතිස්ස තෙරුන්ගේ ශීලය මෙනි. ඒ එසේමයි, ඒ ආයුෂ්මත්තෙමේ,

(1) පටිසම්භිදාමග්ග - Pat i 42f

ධනං චජෙ යො පන අඞ්ගහෙතු
අඞ්ගං චජෙ ජීවිතං රක්ඛමානො,
අඞ්ගං ධනං ජීවිතං චා පි සබ්බං
චජෙ නරො ධම්මමනුස්සරන්තො ති

යමෙක් තෙමේ අවයව උදෙසා ධනය හැර දමන්නේද, ජීවිතය රකිමින් අවයවද හැර දමන්නේද, ධර්මය සිහිකරන මනුෂ්‍යයා අවයවද ධනයද ජීවිතයද යන සියල්ල හැර දමන්නේය.

යන මේ සත්පුරුෂානුස්මෘතිය නොහරිමින් ජීවිතය ගැන ශංකා ඇති කල්හි පවා ශික්ෂාපද නො-ඉක්මවා එම අපරියන්ත පාරිසුද්ධිසීලය හේතුකොටගෙන උපාසකයාගේ කරපිට හුන්නේම රහත්බවට පැමිණියේය. යම්සේ කියනලදද:

න පිතා න පි තෙ මාතා න ඤාති නපි බන්ධවො
කරොතෙතාදිසං කිච්චං සීලවන්තස්ස කාරණා

සංවෙගං ජනයිත්වාන සම්මසිත්වාන යොනිසො
තස්ස පිට්ඨිගතො සන්තො අරහත්තං අපාපුණීති

පියාද නොවේ, මව්ද නොවේ, නෑයෙක් හෝ බන්ධුවරයෝ නොවෙත්. මෙවන් කිසක් කරනුයේ ඔබගේ සිල්වත්කම සලකාගෙනමයි.

මෙසේ සංවේග දනවා නුවණින් විමසා බලා ඒ උපාසකයාගේ කරපිට හුන්නේම රහත්බවට පැමිණියේය.

පෘථග්ජනකල්‍යාණයන්ගේ ශීලය උපසම්පදවෙහි සිට මොනවට පිරිසුදු කරනලද දැරහමිණක් මෙන්ද, මොනවට පිරියම් කළ ස්වර්ණයක් මෙන්ද, අතිශයින් නිර්මලවන හෙයින් සිතිවිලි ඉපදවීම් පමණවූ හෝ මලයෙන් තොරවූයේ රහත්බවට පදනම් වේ, එහෙයින් පරිපූර්ණපාරිසුද්ධියයි කියනුලැබේ. මහාසංඝරක්ඛිතය, භාගිනෙය්‍ය සංඝරක්ඛිතය යන දෙදෙනාවහන්සේගේ ශීලය මෙනි. මහාසංඝරක්ඛිත තෙරුන් සැට වයස් ඉක්මවා මරණමඤ්චකයෙහි වැදහොත් කල්හි භික්ෂුසංඝයා ලෝකෝත්තර අධිගමයක් ඇත්දැයි විචාළහ. තෙරණුවෝ 'මට ලෝකෝත්තර අධිගමයෙක් නැතැ'යි පැවසූහ. එවිට උන්වහන්සේට උපස්ථාන කරන තරුණ භික්ෂු කෙනෙක්, 'ස්වාමීනි, ඔබවහන්සේ පිරිනිවියහ'යි හාත්පස දෙළොස් යොද්නෙක මිනිස්සු රැස්වූහ. ඔබවහන්සේ

පෘථග්ජනයෙකු ලෙස අපවත් වුවහොත් මහත් විපිළිසරයෙක් වන්නේය'යි කීය. 'ඇවැත්නි, මම් මෙතේ බුදුන් දක්නෙමැ'යි විදර්ශනා නොපිහිටුවීමි, එසේ නම් මා හිඳුවාතබා ඉඩ දෙනුයැ'යි කීහ. ඒ භික්ෂු තෙමේද තෙරුන් නහා හිඳුවා පිටතට නික්මිණි. තෙරණුවෝ ඒ භික්ෂුව පිටතට යන්නා හා සමඟම රහත්බවට පත්ව අසුරෙකින් ඒ භික්ෂුවට සන් කළහ. සංඝයා රැස්වී 'ස්වාමීනි, මෙවැනි මරණාසන්න අවස්ථාවෙක්හිදී පවා ලොවුතුරු දහම් ඉපැදවීමෙන් දුෂ්කර කාර්යයක් කළහුය'යි කීහ. 'ඇවැත්නි, මෙය දුෂ්කර නොවේ, වැලිදු මම ඔබට දුෂ්කර කාර්යයක් ප්‍රකාශ කරමි, ඇවැත්නි, මා පැවිදිවූ තැන් පටන් නොසිහියෙන්, නුනුවණින් කළ කාර්යයක් නම් නොසමරමි'යි කීහ. උන්වහන්සේගේ බෑණනුවෝද පණස්වස් කාලයෙහි මෙසේම රහත්බවට පැමිණියහ.

අප්පස්සුතොපි චෙ හොති සීලෙසු අසමාහිතො
උභයෙන නං ගරහන්ති සීලතො ච සුතෙන ච

අප්පස්සුතොපි චෙ හොති සීලෙසු සුසමාහිතො
සීලතො නං පසංසන්ති නාස්ස සම්පජ්ජතෙ සුතං

බහුස්සුතොපි චෙ හොති සීලෙසු අසමාහිතො
සීලතො නං ගරහන්ති නාස්ස සම්පජ්ජතෙ සුතං

බහුස්සුතොපි චෙ හොති සීලෙසු සුසමාහිතො
උභයෙන නං පසංසන්ති සීලතො ච සුතෙන ච

බහුස්සුතං ධම්මධරං සප්පඤ්ඤං බුද්ධසාවකං
නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති
දෙවාපි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතො ති[(1)]

යමෙක් අල්පශ්‍රැත වේද, ශීලයෙහි නොපිහිටියේ වේද, ඔහුට ශීලයෙන්ද බහුශ්‍රැතභාවයෙන්ද යන දෙකින්ම ගර්හා කෙරෙති.

යමෙක් අල්පශ්‍රැතවේද, ශීලයෙහි මනාව පිහිටියේවේද, ඔහුට ශීලයෙන් ප්‍රශංසා කෙරෙති, ඔහුගේ බහුශ්‍රැතභාවය නොපිරේ.

යමෙක් බහුශ්‍රැත වේද, ශීලයෙහි නොපිහිටියේ වේද, ඔහුට ශීලයෙන් ගර්හා කෙරෙති, බහුශ්‍රැතභාවය ද නොපිරේ. (නිෂ්ඵලය)

---

(1) අ. නි. Aii 7f.

යමෙක් බහුශ්‍රැත වේද, ශීලයෙහි මනාව පිහිටියේ වේද, ඔහුට ශීලයෙන්ද, බහුශ්‍රැතභාවයෙන්ද, යන දෙකින්ම ප්‍රශංසා කෙරෙති.

බහුශ්‍රැතවූ ධර්මධරවූ ප්‍රඥසම්පන්නවූ (එහෙයින්ම) දඹරන් කාසියක් මෙන් නිර්මලවූ ඔහුට කවරෙක් නිඳා කරනු හැකිවේද? දෙවියෝද ඔහුට ප්‍රශංසා කෙරෙති, බ්‍රහ්මයා විසින්ද පසස්නා ලද්දේය.

ශෛක්ෂ්‍යයන්ගේ ශීලය වනාහි දෘෂ්ටිවශයෙන් අපරාමෘෂ්ටවන (නොකිලිටි) හෙයින් අපරාමට්ඨපාරිසුද්ධියයි දතයුතුය. කුටුම්බියපුත්තතිස්ස තෙරුන්ගේ ශීලය මෙනි. ඒ ආයුෂ්මත්තෙමේ එවැනිවූ ශීලය නිසා රහත්බැව්හි පිහිටනු කැමතිව සතුරන්හට මෙසේ කීහ.

උභො පාදනි භින්දිත්වා සංයමෙස්සාමි වො අහං
අට්ටියාමි හරායාමි සරාගමරණං අහං

එවාහං චින්තයිත්වාන සම්මසිත්වාන යොනිසො
සම්පත්තෙ අරුණුග්ගමහි අරහත්තමපාපුණිං ති[1]

දෙපා බිඳදමා මා මඳකට හැරදමන ලෙස මම ඔබගෙන් ඉල්ලමි. සරාගියකු ලෙසින් මරණයට පත්වීම මම පිළිකුල් කරමි, එයට ලජ්ජාවෙමි.

මෙසේ සිතා මම නුවණින් විමසා අරුණුනැඟෙන වේලෙහි රහත්පලයට පැමිණියෙමි.

තවද එක්තරා මහතෙරණුකෙනෙක් ඉතා ගිලන්ව සියතින් අහර වැළඳීමට පවා නොහැකිව තමන්ගේම මළ මූ මත වැතිර ඒ මේ අත පෙරළෙමින් සිටියහ. ඒ දක එක්තරා තරුණ භික්ෂුකෙනෙක්, 'අහෝ! ජීවිත සංස්කාරයෝ දුක්සහිතයහමැ'යි කීහ. මහ තෙරණුවෝ, 'ඇවැත්නි, දැන් මිය යන්නෙම් සග සැපත් ලබන්නෙමි, මෙහි සැකයෙක් නැත, මේ ශීලය සිඳ දමා ලබන සැපත නම් මහණදම් පිළිකෙව්කොට ලබන ගිහිබව හා සමානය'යි කියා, 'ශීලය සමගම මැරෙන්නෙමි'යි එසේම වැදහෙව, එම රෝගය ගැනම මෙනෙහිකරමින් රහත්බවට පැමිණ භික්ෂුසංඝයාහට මේ ගාථාවන්ගෙන් ඒබව ප්‍රකාශකළහ.

---

(1) පපංචසූදනී - MA i 233

පුට්ඨස්ස මෙ අඤ්ඤතරෙන බ්‍යාධිනා
රොගෙන බාළ්හං දුක්ඛිතස්ස රුප්පතො
පරිසුස්සති ඛිප්පමිදං කලෙබරං
පුප්ඵං යථා පංසුනි ආතපෙ කතං

අජඤ්ඤං ජඤ්ඤසඞ්ඛාතං අසුචිං සුචිසම්මතං
නානාකුණපපරිපූරං ජඤ්ඤරූපං අපස්සතො

ධිරත්ථු'මං ආතුරං පූතිකායං
දුග්ගන්ධියං අසුචිං ව්‍යාධිධම්මං
යත්ථප්පමත්තා අධිමුච්ඡිතා පජා
හාපෙන්ති මග්ගං සුගතූපපත්තියා ති[(1)]

කිසියම් රෝගයක් වැළඳීමෙන් දැඩිසේ දුකටපත්ව පෙළෙන මාගේ මේ ශරීරය අව්වෙන් රත්වූ පස්මත හෙලූ මලක්මෙන් වහා වියලී යන්නේය.

මනෝඥයයි ගනුලබන මුත් අමනෝඥවූ පිරිසුදුයයි ගනුලබන මුත් අපිරිසුදුවූ නොයෙක් කුණපයෙන් පිරුණු, (ඇතිතතු) නොදක්නාහට රම්‍ය රූපයක්වූ,

ආතුරවූ, දුර්ගන්ධවූ, අපිරිසුදුවූ, ව්‍යාධිය ස්වභාවකොට ඇති මේ කුණුකයට නිඳු වේවා! මේ කය පිළිබඳව පමාවූ (මෝහයෙන්) මුසපත් ජනයා සුගතියෙහි ඉපැදීමේ මාර්ගයෙන් පිරිහෙත්.

රහතුන් ආදීන්ගේ ශීලය වනාහි සියලු කෙලෙස්විඩා සන්සිඳීම් හේතුවෙන් පිරිසුදුවූ හෙයින් පටිප්පස්සද්ධි පාරිශුද්ධියයි දතයුතුය. මෙසේ පරියන්තපාරිශුද්ධි ආදී වශයෙන් පස් ආකාරවේ.

දෙවන පංචකයෙහි පාණාතිපාතාදීන්ගේ ප්‍රහාණ ආදී වශයෙන් අර්ථය දත යුතුය. කියනලද මැයි පටිසම්භිදවෙහි:

ශීලය පස් ආකාරවේ. ප්‍රාණඝාතය (කුශලචිත්තයෙන්) ප්‍රහීණ කිරීම ශීලයයි, එයින් වෙන්වීම ශීලයයි, එයට ප්‍රතිපක්ෂ චේතනාව ශීලයයි, එයින් වැලකීම ශීලයයි, එම ශික්ෂාපදය නොඉක්මවීම ශීලයයි. අදත්තාදනය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය, පිශුණංවචනය, පරුෂවචනය,

(1) ජාතකපාළි - Ja ii 437

සම්ඵප්පලාපය, අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහීණ කිරීම ශීලයයි, නෙක්ඛම්ම චිත්තොත්පාදයෙන් කාමච්ඡන්දය, මෛත්‍රීචිත්තයෙන් ව්‍යාපාදය, ආලෝකසංඥාවෙන් ථීනමිද්ධය, අවික්ෂේපයෙන් උද්ධච්චය, ධර්මව්‍යවස්ථානයෙන් විචිකිච්ඡාව, ඥානයෙන් අවිද්‍යාව, ප්‍රමෝදයෙන් අරතිය, ප්‍රථමධ්‍යානයෙන් නීවරණය, ද්විතීයධ්‍යානයෙන් විතක්ක-විචාරය, තෘතීයධ්‍යානයෙන් ප්‍රීතිය, චතුර්ථධ්‍යානයෙන් සුඛදුඃඛය, ආකාශානඤ්චායතන සමාපත්තියෙන් රූපසංඥාව, ප්‍රතිඝසංඥාව හා නානත්වසංඥාව විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙන්, ආකාසානඤ්චා- යතනසංඥාව, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතන සංඥාව, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන- සංඥාව, අනිච්චානුපස්සනාවෙන් නිච්චසංඥාව, දුක්ඛානුපස්සනාවෙන් සුඛසංඥාව, අනත්තානුපස්සනාවෙන් අත්තසංඥාව, නිබ්බිදානුපස්සනාවෙන් නන්දිරාගය, විරාගානුපස්සනාවෙන් රාගය, නිරෝධානුපස්සනාවෙන් සමුදය, පටිනිස්සග්ගානුපස්සනාවෙන් ආදානය, ඛයානුපස්සනාවෙන් ඝන සංඥාව, වයානුපස්සනාවෙන් ආයූහනය, විපරිණාමානුපස්සනාවෙන් ධ්‍රැවසංඥාව, අනිමිත්තානුපස්සනාවෙන් නිමිත්තය, අප්පණිහිතානු- පස්සනාවෙන් පණිධිය, සුඤ්ඤතානුපස්සනාවෙන් අභිනිවෙසය, අධිපඤ්ඤාධම්මවිපස්සනාවෙන් සාරාදනාභිනිවෙසය, යථාභූතඤාණ- දස්සනයෙන් සම්මොහාභිනිවෙසය, ආදීනවානුපස්සනාවෙන්, ආලයාභිනිවෙසය, පටිසංඛානුපස්සනාවෙන් අප්පටිසංඛාව, විවට්ටානු- පස්සනාවෙන් සංයොගාභිනිවෙසය, සොතාපත්ති මාර්ගයෙන් දෘෂ්ටිය හා එක්ව සිටි ක්ලේශයන්, සකෘදගාමි මාර්ගයෙන් ඖළාරික ක්ලේශයන්, අනාගාමී මාර්ගයෙන් අනුසහගත ක්ලේශයන්, අර්හත් මාර්ගයෙන් සියලු ක්ලේශධර්මයන් ප්‍රහීණ කිරීම ශීලයයි. විරමණය, චෙතනාව, සංවරය, අව්‍යතික්‍රමණය ශීලයයි. මේ ආකාරවූ ශීලය සිතෙහි අවිපිළිසර පිණිස පවතී. ප්‍රමෝදය පිණිස පවතී, ප්‍රීතිය පිණිස පවතී, සන්සිඳීම පිණිස පවතී. සොම්නස පිණිස පවතී. ඇසුරු කිරීම පිණිස පවතී. භාවනා පිණිස පවතී. නැවත නැවත වඩනු පිණිස පවතී, (සතින්ද්‍රියාදී) පරිවාර පිණිස පවතී. පිරිපුන්බව පිණිස පවතී. ඒකාන්ත නිර්වේදය පිණිස, නිරෝධය පිණිස, උපශමය පිණිස අභිඤ්ඤාව පිණිස, සම්බොධය පිණිස, නිර්වාණය පිණිස පවතී.[1]

මෙහි වනාහි **පහාණං** යනු කියනලද ප්‍රකාර ඇති පාණාතිපාතාදිය නොඉපැදවීම පමණකි, ඒ හැර අන්කිසි ස්වභාවයක් නැත. යම් හෙයකින්

(1) පටිසම්භිද ඤාණකථා - Ps.i.46-47.

ඒ ඒ අකුශලයන්ගේ ප්‍රහාණය ප්‍රතිපක්‍ෂ කුශල ධර්මයනට ප්‍රතිෂ්ඨාවීමේ අර්ත්‍ථයෙන් පාදකවේද, සිත් සසලවීම් නොකරන හෙයින් සමාධානයවේද, එහෙයින් යටකියනලද උපධාරණ-සමාධාන-සංඛ්‍යාතවූ ශීලනාර්ත්‍ථයෙන් ශීලයයි කියනලදි. (වෙරමණී) ආදී අතික් සතර ඒ ඒ ස්වභාවයෙන් වෙන්වීම් වශයෙන්ද, ඒ ඒ ස්වභාවයෙන් වැලකීම් වශයෙන්ද (වෙරමණී, සංවරය යන) දෙකින්ම සංයෝගවූ චෙතනා වශයෙන්ද, ඒ ඒ ස්වභාවය ව්‍යතික්‍රමණය නොකිරීම් වශයෙන්ද සිත පිළිබඳ පැවැත්මේ සත්‍යස්වභාවය සඳහා කියනලදි. ඒ (වෙරමණී ආදිය) පිළිබඳ ශීලාර්ථය යට පවසනලද්දේම වේ. මෙසේ පහාණසීල ආදි වශයෙන් පස් ආකාරවේ.

මෙතෙකින්, ශීලය යනු කිමෙක්ද? කවර අර්ත්‍ථයෙන් ශීල නම් වේද? එහි ලක්‍ෂණ, රස, පච්චුපට්ඨාන පදට්ඨානයෝ කවරහුද? ශීලය කවර අනුසස් ඇත්තේද? මේ ශීලය කී ආකාර වේදැයි යනුවෙන් යට දක්වනලදි. මේ ප්‍රශ්නයන්ගේ විසදීම සමාප්තයි.

එහි (ශීලයෙහි) කිලිට්වීම යනු කිමෙක්ද? පිරිසුදුවීම කිමෙක්ද'යි යමක් කියන ලද්දේද, ඒ පිළිබඳ විස්තර පවසමු. ඛණ්ඩාදිභාවය ශීලය පිළිබඳ කිලිටිබවයි. අඛණ්ඩාදිභාවය පිරිසුදුබවයි. ඒ ඛණ්ඩාදිභාවය ලාභ කීර්ති ආදී භේද, ඇති හේතු වශයෙන්ද, සත් වැදෑරුම් මෙවුන්දම් සෙවීම් වශයෙන්ද, සංග්‍රහකොට ඇත. ඒ එසේමැයිඃ සත්වැදෑරුම් ඇවැත් සමූහයන් විෂයෙහි, ආදියෙහි වේවයි, අන්තයෙහි වේවයි, යමකුගේ ශික්‍ෂාපදයක් බිඳුණේ නම් ඔහුගේ ශීලය කොන් ඉරුණු සළුවක් මෙන් වනහෙයින් 'ඛණ්ඩ' නම්වේ, යමකුගේ ශික්‍ෂාපදය මැදදී බිඳුණේ නම්, ඔහුගේ ශීලය මැදින් ඉරුණු සළුවක් මෙන් වනහෙයින් ජිද්ද නම්වේ, යමකුගේ ශික්‍ෂාපද දෙකතුනක් පිළිවෙළින් බිඳුණේ නම්, පිටෙහි හෝ බඩවතෙහි හෝ තැනින් තැන මතුවී පෙනෙන නොසම පැහැ ඇති, කළු රතු ආදී කිසියම් ශරීරවර්ණයක් සහිත දෙනකමෙන් වනහෙයින් සබල නම්වේ. යමෙකුගේ ශික්‍ෂාපද අතරින්පතර කඩවූයේනම්, ඔහුගේ ශීලය අතරින් පතර නොසම පැහැ ඇති තිත් සහිත දෙනකමෙන් වන හෙයින් කම්මාස නම්වේ. මේ ආකාරයෙන් ලාභාදී හේතු භේදයෙන් ඛණ්ඩ ආදී ස්වභාවයවේ.

මෙසේ සත්වැදෑරුම් මෛථුන සංයෝග වශයෙන්ද ඛණ්ඩ ආදී භාවය වේ. වදාරනලදුයේමැයි භාග්‍යවතුන්වහන්සේ විසින් බ්‍රාහ්මණය, මේ ලෝකයෙහි කිසියම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ බ්‍රහ්මචාරියෙකු ලෙස පිළිනකරමින්', මාගමක හා සමග

මෛථුනසංසර්ගයට නොඑළඹෙනුයේ නමුදු, මාගමක විසින් කරනුලබන ඇඟ ඉලීම්, පිරිමැදීම්, නැහැවීම්, හැඹීම් (සම්බාහනය) ඉවසා නම්, විඳී නම්, රිසි වේනම්, එයින් සතුටට පත්වේනම්, මෙය බ්‍රහ්මචර්යය පිළිබඳ කඩ (ඛණ්ඩ) වීමද, සිදුරු (ඡිද්ද) වීමද, විසම (සබල) වීමද, ලප සහිත (කම්මාස) වීමද වේ. බ්‍රාහ්මණය, මේ තෙමේ අපිරිසුදු බ්‍රහ්මචර්යයෙහි හැසිරේයයි කියනුලැබේ. මෛථුනසංයෝගයෙන් සංයුක්තවූයේ ජාතියෙන්, ජරාවෙන්, මරණයෙන් නොමිදේ, දුකින් නොමිදේයයි කියමි, තවද බ්‍රාහ්මණය මේ ලෝකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ-පෙ-පිළින කරමින් මාගමක හා සමග මෛථුන සංසර්ගයට නොඑළඹෙනුයේ නමුදු, මාගමක විසින් කරනුලබන ඉලීම්, පිරිමැදීම්-පෙ-නොම ඉවසනුයේ නමුදු මාගමක හා සමඟ මහත්සේ සිනාසේනම්, ක්‍රීඩා කෙරේනම් ක්‍රීඩා කරවානම් හේ තෙමේ එය ඉවසා නම්, -පෙ-දුකින් නොමිදේයයි කියමි. තවද බ්‍රාහ්මණය. මේ ලෝකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ-පෙ-මාගමක හා සමඟ මෛථුන සංසර්ගයට නො-එළඹෙනුයේ නමුදු, මාගමක විසින් කරනු ලබන -පෙ-නොඉවසෙනුයේ නමුදු මාගමක හා සමඟ මහත්සේ සිනා නොම සෙනුයේ නමුදු,-පෙ-මාගමකගේ ඇස තමාගේ ඇසින් දකීනම්, බලානම්, හේ තෙමේ එය ඉවසානම්-පෙ-දුකින් නොමිදේයයි කියමි, තවද බ්‍රාහ්මණය, මේ ලෝකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ-පෙ-මාගමක හා සමග-පෙ-මාගමක විසින් කරනුලබන-පෙ-මාගමකගේ-පෙ-නොබලනුයේ නමුදු, බිත්තියකට එපිටින් හෝ පවුරකට එපිටින් හෝ සිට සිනාසෙන හෝ බණන හෝ ගයන හෝ හඬන හෝ මාගමකගේ කටහඬ අසා නම්,-පෙ-හේ තෙමේ එය ඉවසා නම්-පෙ-දුකින් නොමිදේයයි කියමි, තවද බ්‍රාහ්මණය, මේ ලෝකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ-පෙ-මාගමක සමග-පෙ-මාගමක විසින්-පෙ-මාගමක සමඟ-පෙ-මාගමකගේ-පෙ-හඬන හෝ-පෙ-නොම අසනුයේ නමුදු, මාගමක හා සමග පෙර (ගිහිකල) කරනලද සිනාසීම්, බිණීම්, ක්‍රීඩාකිරීම්, සිහිකෙරේනම්, හේතෙමේ එය ඉවසානම්, -පෙ-දුකින් නොමිදේයයි කියමි. තවද බ්‍රාහ්මණය, මේ ලෝකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මාගමක සමග-පෙ-මාගමක විසින්-පෙ-මාගමක හා සමග-පෙර කරනලද-පෙ-නොම සමරනුයේ නමුදු, ගෘහපතියෙකු හෝ ගෘහපතිපුත්‍රයෙකු හෝ පංචකාමගුණයෙන් යුක්තවූවහු, සමන්විතවූවහු, පිරිවරනු ලබන්නහු දක හේ තෙමේ එය ඉවසානම්-පෙ-දුකින් නොමිදේයයි කියමි, තවද බ්‍රාහ්මණය, මේ ලෝකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ-පෙ-මාගමක හා සමග-පෙ-මාගමක විසින්-පෙ-ගෘහපතියෙකු හෝ ගෘහපතිපුත්‍රයෙකු හෝ-

පෙ-පිරිවරනු ලබන්නහු දක-පෙ-නොම ඉවසෙනුයේ නමුදු, කිසියම් දේවනිකාජයක් පතමින්, 'මම මේ ශීලය හෝ ව්‍රතය හෝ තපස හෝ බ්‍රහ්මචර්ය හෝ හේතුකොටගෙන දෙවියෙකු හෝ දෙවියෙකු වැනි කෙනෙකු හෝ වන්නෙමි'යි බ්‍රහ්මචර්යයෙහි හැසිරේනම්, හේතෙමේ එය කැමති වේනම්, එයින් තුෂ්ටියට පත්වේනම්, මෙයද බ්‍රාහ්මණය, බ්‍රහ්මචර්ය පිළිබඳව 'ඛණ්ඩ'ද, 'ඡිද්ද'ද, 'සබල'ද, 'කම්මාස'ද වේ.'(1) මෙසේ ලාභාදිය හේතුකොට ඇති භේද වශයෙන්ද, සත් වැදෑරුම් මෛථුනසංයෝග වශයෙන්ද ශීලය පිළිබඳ 'ඛණ්ඩ' ආදී ස්වභාවය සංග්‍රහ කරනලද්'යි දතයුතුය.

අඛණ්ඩාදී ස්වභාවය වනාහි ශික්ෂාපදයන් නොබිඳීම් වශයෙන්ද, බිඳීගිය නමුදු පිළියම් කළහැකි ශික්ෂාපදයනට පිළියම්කිරීම් වශයෙන්ද, සත්වැදෑරුම් මෛථුනසංයෝගය නොසිදුවීම් වශයෙන්ද ක්‍රෝධය, වෛරය, ගුණමකුබව, කුහුකේවුකම, ඊර්ෂ්‍යාව, මසුරුබව, වංචනිකබව, කපටිබව, මුරණ්ඩුබව, එකටඑකකිරීම, මානය, අතිමානය. මදය, පිනට මැලිබව ආදී පාපචේතනා නොඉපැදවීම් වශයෙන්ද, සංග්‍රහ කරනලදි. යම් ශීලයක් ලාභ ආදිය පිණිසද නොබිඳුණේ නම්, ප්‍රමාද දෝෂයෙකින් බිඳුණු හෝ ශීලයට පිළියම් කරනලද්දේ නම්, මෛථුන සංයෝගයෙන් හෝ ක්‍රෝධ වෛර ආදී පාපචේතනාවන්ගෙන් හෝ නොපැරුණේ නම්, මේ ශීලය සැම අතින්ම අඛණ්ඩයයි, අච්ඡිද්දයයි, අසබලයයි අකම්මාසයයි කියනුලැබේ. ඒ ශීලය ක්ලේශයන්ගේ දසත්වයෙන් මිදුණ හෙයින් 'භුජිස්ස' නම්වේ. නුවණැත්තවුන් විසින් පසස්නාලද හෙයින් 'විඤ්ඤුප්පසත්ථ' නම්වේ, තෘෂ්ණා දෘෂ්ටි යන මෙයින් නොබැඳුණ හෙයින් 'අපරාමට්ඨ' නම්වේ. උපචාර සමාධිය හෝ අප්පණා සමාධිය පවත්වති'යි සමාධිසංවත්තනික නම්ද වේ. එහෙයින් ඒ ශීලයෙහි අඛණ්ඩ ආදී ස්වභාවය 'වොදන' (පිරිසුදුබව)යයි දතයුතුය. එම වොදනය දෙආකාරයකින් සම්පාදනය කරනුලැබේ. ශීලවිපත්තියෙහි ආදීනව දකීමෙන්ද, ශීලසම්පත්තියෙහි ආනිසංස දකීමෙන්දයි යනුවෙනි. එහි, 'මහණෙනි, දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි ආදීනව පසෙකි'යි(2) යන මේ ආදී සූත්‍ර නයින්ද, ශීල විපත්තියෙහි ආදීනව දතයුතුය. තවද දුශ්ශීල පුද්ගලතෙමේ එම දුශ්ශීලභාවය හේතුකොට දෙවියනටද මිනිසුනටද අප්‍රියවේ. සබ්‍රම්සරුන්හට අනුශාසනය කිරීමට නොසුදුස්සෙක්වේ, දුශ්ශීලයන් ගැරහීමෙහිදී දුකට පත්වේ. සිල්වතුන් පැසසීමේදී විපිළිසරයට පත්වේ, එම දුශ්ශීලභාවය හේතුකොට හණපිළියක් සෙයින් දුර්වර්ණවේ, යම් කෙනෙක් ඔහුගේ දෘෂ්ටිය අනුව ගියාහු නම්, ඔවුනටද බොහෝ කලක්

(1) අඞ්ගුත්තර නි. සත්තක නි.
(2) අඞ්ගුත්තර නි. පඤ්චක නි.

අවාදුක් ගෙනදෙවන හෙයින් දුක හා බැදුණේවේ, යම් කෙනෙකුගේ දනවස්තූන් පිළිගනී නම් ඔවුනට මහත්ඵල ගෙනනොදෙන හෙයින් මද ඇගයුම් ඇත්තේවේ, වසර බොහෝ ගණනක්වූ වැසිකිලිවළක් සෙයින් පිරිසුදු කළ නොහැක්කේවේ, සොහොන් පෙනෙල්ලක් සෙයින් (ගිහිපැවිදි) දෙපසින්ම බැහැරියෙක්වේ. ගවරැළක් පසුපස යන කොටළුවෙකු සෙයින් භික්ෂුවක් ලෙස පෙනීසිටින භික්ෂු ප්‍රතිරූපකයෙක්මවේ, සියල්ලන්ම සතුරුවූවෙකු සෙයින් නිරතුරු තැති ගත්තෙක්වේ, මළසිරුරක් සෙයින් ඇසුරු කරනු නොසුදුස්සෙක්වේ, බ්‍රාහ්මණයන්හට සොහොන් ගින්නක් සෙයින් සබ්‍රම්සරුන් විසින් පුදනුලැබීමට නොසුදුස්සෙක්වේ, රූපදර්ශනයෙහි අන්ධයෙකු සෙයින් විශේෂාධිගමයට නොසුදුස්සෙක්වේ, රාජ්‍යවිෂයෙහි සැඩොල්දරුවෙකු සෙයින් සද්ධර්මවිෂයෙහි අපේක්ෂා නැත්තෙක්වෙයි, සැප ඇත්තෙක්මි'යි හඟිනුයේ නමුදු අග්ගික්ඛන්ධ පරියායෙහි කියනලද දුක් අනුභව කරන්නෙකු වන හෙයින් දුක්ඛිතයෙක්මවේ, පස්කම්සැප වැළඳීමෙහිද, වැඳුම්පිදුම් ලැබීමේ සුවයෙහිද, ගිජුවූ සිත් ඇති දුශ්ශීලයන්හට ඒ හේතුවෙන් සිහිකිරීම් පමණෙකින් වුවද, හෘදයසන්තාපය උපදවා හුණු ලේ වමනයකරවනු සමත් ඉතා කටුක දුක් ගෙනහැර දක්වමින්, සියලු ආකාරයෙන් කර්මවිපාකයන් ප්‍රත්‍යක්ෂ කරවූ භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදළහ: 'මහණෙනි, ඇවිල ගිනිගෙන දිලිසෙන ගිනිදැල් සහිත තෙල මහගිනිකඳ තෙපි දක්නහුද?' 'එසේය ස්වාමීනි, දක්නමෝය'. 'මහණෙනි, එය කුමකැයි හඟිවුද? ඇවිල ගිනිගෙන දිළිසෙන ගිනි සහිත තෙල මහගිනිකඳ වැළඳගෙන හිඳීම හෝ වැදහෙවීමද, නැතහොත් මුදු මොලොක් සිවුමැලි අත්පා ඇති ක්ෂත්‍රිය කන්‍යාවක හෝ බ්‍රාහ්මණ කන්‍යාවක හෝ ගෘහපති කන්‍යාවක හෝ වැළඳගෙන හිඳීම හෝ වැදහෙවීමදැයි යන මෙදෙකිකින් කුමක් වඩා හොඳද?' 'ස්වාමීනි,-පෙ-ක්ෂත්‍රිය කන්‍යාවක හෝ-පෙ-ගෘහපති කන්‍යාවක හෝ වැළඳගෙන හිඳීම හෝ වැදහෙවීමය යන මෙයම වඩා හොඳය, ස්වාමීනි,-පෙ-මහ ගිනි කඳ වැළඳගෙන හිඳීම හෝ වැද හෙවීමය යන මෙය දුකකි,' 'මහණෙනි, තොපට හඟවමි, මහණෙනි තොපට දන්වමි, පාපී ස්වභාව ඇති අපිරිසුදු කායවාක් කර්ම ඇති, සැක කටයුතු පැවතුම් ඇති, සැඟවුණු ක්‍රියා ඇති, ශ්‍රමණයෙක්මියි පෙනීසිටින නමුදු අශ්‍රමණයකුවූ, බ්‍රහ්මචාරියෙකු ලෙස පෙනීසිටින නමුදු අබ්‍රහ්මචාරියෙකුවූ, ඇතුළත කුණුවූ, වැගිරෙන කෙලෙස්මල ඇති, කසලගොඩක් වැනිවූ දුශ්ශීලයාහට තෙල මහ ගිනිකඳ-පෙ-වැළඳගෙන හිඳීම හෝ වැදහෙවීමය යන මෙයම වඩා හොඳය, කවර හෙයින්දයත්, මහණෙනි, ඒ හේතුවෙන් මරණයට හෝ මරණය හා සමාන දුකකට හෝ පැමිණේ, ඒ හේතුවෙන් කය බිඳවැටීමෙන්, මරණින් මතු, අපායෙහි, දුගතියෙහි, විනිපාතයෙහි,

නිරයෙහි නොඋපදියි, මහණෙනි, කසලගොඩක් වැනිවූ-පෙ-ඒ දුශ්ශීල තෙමේ ක්‍ෂත්‍රිය කන්‍යාවක හෝ-පෙ-වැළඳගෙන හිඳීම හෝ වැදහෙවීම හෝ කෙරේද, මහණෙනි, එය වනාහි ඒ දුශ්ශීලයාහට බොහෝ කාලයක් අහිත පිණිස, දුක් පිණිස, හේතු වන්නේය, කය බිඳීමෙන් මරණින් මතු, අපායෙහි, දුගතියෙහි, විනිපාතයෙහි, නිරයෙහි උපදී'[1]

මෙසේ ගිනිකඳක් උපමා කොට ස්ත්‍රීන් පිළිබඳවූ පංචකාමගුණපරිභෝගය හේතුකොට ඇතිවන දුක් ගෙනහැර දක්වා මෙම නියායෙන්ම: 'මහණෙනි, එය කුමකැයි හඟිවුද? බලවත් පුරුෂයෙක් තෙමේ යමෙකු දළලොම් රැහැණෙකින් කෙණ්ඩා දෙක වෙලා පෙළයිද, එවිට ඒ රැහැණ සිවිය සිඳියි, සිවිය සිඳගෙන සම සිඳියි, සම සිඳගෙන මස් සිඳියි. මස් සිඳගෙන නහර සිඳියි, නහර සිඳගෙන ඇට සිඳියි, ඇට සිඳගෙන ඇටමිදුලු තුළට වැද සිටියි, එසේ කරනු ලැබීමද, ක්‍ෂත්‍රිය මහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණ මහාසාරයන්ගේ හෝ ගෘහපති මහාසාරයන්ගේ හෝ වැඳුම්පිදුම් ඉවසීමදැයි යන මෙදෙකින් කුමක් වඩා හොඳද'යිද,[2] 'මහණෙනි, එය කුමකැයි හඟිවුද? බලවත් පුරුෂයෙක් තෙමේ තෙල්ගලෙහි මුවහත් තබනලද තියුණු සැතෙකින් ළමැද පහරනුයේද, ක්‍ෂත්‍රිය මහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණ මහාසාරයන්ගේ හෝ ගෘහපති මහාසාරයන්ගේ හෝ ඇඳිලි බැඳීම ඉවසනුයේදැ'යි යන මේ දෙකින් කුමක් වඩා හොඳද'යිද,[3] 'මහණෙනි, එය කුමකැයි හඟිවුද? බලවත් පුරුෂයෙක්තෙමේ ඇවිලි ගිනිගෙන දිලියෙන ගිනිසහිත රත්වූ ලොහො කුමහය බහා ලනුයේද, ඒ තෙමේ පෙණ නැහෙමින් පැසෙනුයේ, වරෙක උඩ එනුයේ වරෙක යට යනුයේ වරෙක හරහට යනුයේද, ක්‍ෂත්‍රිය-පෙ-මහාසාරයන් සැදැහැයෙන් දුන් විහාරය පරිභෝග කරනුයේදැයි යන මෙදෙකින් කුමක් වඩා හොඳද'[4]යිද, යන මේ ලොම්රැහැන්, තියුණු සැත්, යපට, ලොහොගුලි ලොහො යහන්, ලොහොපුටු, ලොහොකුඹුය යන උපමාවන්ගෙන් වැඳුම්, ඇඳිලි බැඳීම්, සිවුරු පිණ්ඩපාත, ඇඳපුටු විහාර පරිභෝගයෙන් ඇතිවන දුක් ගෙනහැර දක්වූහ. එහෙයින්

අග්ගික්ඛන්ධාලිංගන-දුක්ඛාතිදුක්ඛකටුකඵලං,
අවිජහතො කාමසුඛං සුඛං කුතො භින්නසීලස්ස.
අභිවාදනසාදියනෙ කිං නාම සුඛං විපන්නසීලස්ස
දළ්හවාළරජ්ජුසංඝන-දුක්ඛාතිදුක්ඛභාගිස්ස
සද්ධානමඤ්ජලිකම්මසාදියනෙ කිං සුඛං අසීලස්ස

(1) අඞ්ගුත්තර නි. සත්තක නි. Aiv 128f.
(2) එම. Aiv 129
(3) එම. Aiv 130
(4) එම. Aiv 133f.

සත්තිප්පහාරදුක්ඛාධිමත්තදුක්ඛස්ස යං හෙතු
චීවරපරිභොගසුඛං කිං නාම අසඤ්ඤතස්ස,
යෙන චිරං අනුභවිතබ්බා නිරයෙ ජලිත-අයොපට්ටසම්ඵස්සා
මධුරොපි පිණ්ඩපාතො හළාහලවිසූපමො අසීලස්ස
ආදිත්තා ගිළිතබ්බා අයොගුළා යෙන චිරරත්තං
සුඛසම්මතොපි දුක්ඛො අසීලිනො මඤ්චපීඨපරිභොගො
යං බාධිස්සන්ති චිරං ජලිත-අයොමඤ්ච පීඨානි
දුස්සීලස්ස විහාරෙ සද්ධාදෙය්‍යම්පි කා නිවාසරති,
ජලිතෙසු නිවසිතබ්බං යෙන අයොකුම්භිමජ්ඣෙසු
සඞ්කස්සරසමාචාරො කසම්බුජාතො අවස්සුතො පාපො
අන්තොපූතීති ච යං නින්දන්තො ආහ ලොකගරු
ධිජ්ජීවිතං අධඤ්ඤස්ස තස්ස සමණාන වෙසධාරිස්ස
අස්සමණස්ස උපහතං ඛතමත්තානං වහන්තස්ස
ගූථං විය කුණපං විය මණ්ඩනකාමා විවජ්ජයන්තීධ
යං නාම සීලවන්තො සන්තො කිං ජීවිතං තස්ස
සබ්බභයෙහි අමුත්තො මුත්තො සබ්බෙහි අධිගමසුඛෙහි
සුපිහිතසග්ගද්වාරො අපායමග්ගං සමාරූළ්හො
කරුණාය වත්ථුභූතො කාරුණිකජනස්ස නාම කො අඤ්ඤො
දුස්සීලසමො දුස්සීලතාය ඉති බහුවිධාපි දොසාති

ගිනි කඳක් වැළඳගත් විට හටගන්නා දුකට වැඩි දුකක් ගෙනදෙන කටුක පල ඇති කම්සැපත නොහරනා බිඳුණු සිල් ඇත්තාහට සැපතක් කොයින්ද?

වැඳුම් පිදුම් ඉවසීමෙහිදී දුශ්ශීලයාහට කවර නම් සැපතක්ද? දළලොම් රැහැනෙකින් පෙළීමේදී වන දුකට වැඩි දුකකට බඳුන් වන්නේද, එහෙයිනි.

සැදැහැතියන්ගේ ඇදිලි බැඳීම් ඉවසීමේදී දුශ්ශීලයාහට කවර සැපයක්ද? යම් ඇදිලිබැඳීමක් සැත් පහරකින් ලැබෙන දුකට වැඩි දුකකට හේතුවන්නේද, එහෙයිනි.

නොදැමුණු පුද්ගලයාගේ සිවුරු පරිභෝගයෙහි කවරනම් සුවයෙක්ද? එම සිවුරු පරිභෝගය හේතුකොටගෙන නිරයෙහි බොහෝ කලක් ගිනිගෙන දිලිසෙන යපටෙහි පහස අනුභව කළයුතුවන හෙයිනි.

මිහිරිවූද පිණ්ඩපාතය දුශ්ශීලයාහට හළාහළ විෂක් හා සමානය, එම පිණ්ඩපාතය හේතුකොටගෙන බොහෝ කලක් ඇවිලෙන යගුළි ගිලියයුතු වන හෙයිනි.

දුශ්ශීලයාගේ ඇඳ පුටු පරිභෝගය සැපතකැයි සම්මතවූයේ නමුදු දුකකි. ගිනිගෙන දිලිසෙන යමුවා ඇඳපුටු බොහෝ කලක් ඔහු පෙළන හෙයිනි.

දුශ්ශීලයාහට ශ්‍රද්ධාවෙන් දෙනු ලබන විහාරයෙහි වාසයකිරීමේ කවර සුවයෙක්ද? යම් විහාරයක් හේතුකොටගෙන ගිනිගෙන දිලිසෙන ය-කුඹු මැද විසියයුතුවන හෙයිනි.

යම් පුද්ගලයකු ගරහමින් (ඔහට) ලෝකගුරුවූ භාග්‍යවතුන්වහන්සේ සැකකටයුතු පැවතුම් ඇත්තෙකැයිද, කසල ගොඩකැයිද, වැගිරෙන කෙලෙස් ඇත්තෙකැයිද, පව්ටෙකැයිද, ඇතුළත කුණුවූවෙකැයිද පැවසූහු නම්,

පිනෙන් පිරිහුණ, ශ්‍රමණ වේශධාරී, අශ්‍රමණවූ, චරිතය නසාගත්, උපුටා දමනලද ආත්මයක් දරන ඔහුගේ ජීවිතයට නින්ද වේවා.

මේ ලෝකයෙහි විලොවුන් ආදියෙන් සැරසී සිටීමට කැමති ජනයා අහිතු හෝ මළකුණු හෙළ දුරින් දුරුකරන්නා සේ සිල්වත් සත්පුරුෂ ජනයා යම් පුද්ගලයෙකු දුරු කෙරෙත්ද, ඔහුගේ ජීවිතයෙහි ඵලය කුමක්ද?

සියලු බියෙන් නොමිදුණ, සියලු අධිගම සුවයෙන් ගිලිහුණ, සගදෙර වසාගත් අවාමගට බැසගත්,

දුශ්ශීලයා තරම් අන් කවරෙක්නම් කාරුණික ජනයාගේ කරුණාවට බඳුන් වියයුතුවේද? මෙසේ දුසිල් බවෙහි දෙස් බොහෝය.

මේ ආදී වශයෙන් මෙනෙහි කිරීමෙන් ශීලවිපත්තියෙහි ආදීනව දැකීමද කියනලද ආකාරයට ප්‍රතිපක්‍ෂ ආකාරයෙන් ශීලසම්පත්තියෙහි ආනිශංස දැකීමද වෙතැයි දතයුතුය. තවද:

තස්ස පාසාදිකං හොති පත්තචීවරධාරණං
පබ්බජ්ජා සඵලා තස්ස යස්ස සීලං සුනිම්මලං

අත්තානුවාදදිභයං සුද්ධසීලස්ස භික්ඛුනො
අන්ධකාරං විය රවිං හදයං නාවගාහති,
සීලසම්පත්තියා භික්ඛු සොභමානො තපොවනෙ
පභාසම්පත්තියා චන්දො ගගනෙ විය සොභති
කායගන්ධොපි පාමොජ්ජං සීලවන්තස්ස භික්ඛුනො
කරොති අපි දෙවානං සීලගන්ධෙ කථා’ව කා
සබ්බෙසං ගන්ධජාතානං සම්පත්තිං අභිභුය්‍යති
අවිඝාතී දසදිසා සීලගන්ධො පවායති.
අප්පකාපි කතා කාරා සීලවන්තෙ මහප්ඵලා
හොන්තීති සීලවා හොති පූජාසක්කාරභාජනං
සීලවන්තං න බාධෙන්ති ආසවා දිට්ඨධම්මිකා
සම්පරායිකදුක්ඛානං මූලං ඛණති සීලවා
යා මනුසෙස්සු සම්පත්ති යා ච දෙවෙසු සම්පද
න සා සම්පන්නසීලස්ස ඉච්ඡතො හොති දුල්ලභා
අච්චන්තසන්තා පන යා අයං නිබ්බාණසම්පද
මනො සම්පන්නසීලස්ස තමෙව අනුධාවති
සබ්බ සම්පත්තිමූලම්හි සීලම්හි ඉති පණ්ඩිතො
අනෙකාකාරවොකාරං ආනිසංසං විභාවයෙ’ති

මේ ආකාරයෙන් විභාවනා කරන්නහුට වනාහි ශීලවිපත්තිය ගැන කලකිරීමෙන් ශීලසම්පත්තිය වෙත නැඹුරුවූ මනසක් ඇතිවේ එහෙයින් මෙසේ කියනලද ශීල විපත්තිය පිළිබඳවූ මේ ආදීනවයන්ද ශීලසම්පත්තිය පිළිබඳවූ මේ ආනිසංශයන්ද දැක සියලු ආදර සැලකිලි සහිතව ශීලය පිරිසුදු කරගත යුතුය. මෙතෙකින් ‘සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො’ යන ආදී මෙම ගාථාවෙහි ශීල සමාධි ප්‍රඥා යන මාතෘකා අනුව දේශනා කරනලද විශුද්ධිමාර්ගයෙහි ශීලය පළමුකොට දක්වන ලද්දේය.

**සාධුජන ප්‍රමෝදය පිණිස කරන ලද**
**විශුද්ධිමාර්ගයෙහි ශීලනිර්දේශ නම්වූ**
**ප්‍රථම පරිච්ඡේදය මෙතෙකින් නිමියේය.**

# 2. ධුතාංග නිර්දේශය

ඉක්බිති අපිස්බව, සතොස්බව ආදී යම් ගුණයන් කරණකොට කියනලද ප්‍රකාර ඇති ශීලයෙහි පිරිසුදුබව ඇති වේනම්, එම ගුණයන්ගේ සම්පාදනය පිණිස, සිල් සමාදන්වූ යෝගාවචරයා විසින් ධුතාංගසමාදනය කළයුතුවේ. මෙසේ අපිස්බව, සතොස්බව, කෙලෙස් තුනීවීම, කෙලෙසුන්ගෙන් දුරුවීම, කෙලෙසුන්ගෙන් වෙන්වීම, වීර්යාරම්භය, සුභරතාව (පහසුවෙන් පෝෂණය කළහැකිබව) ආදී ගුණ නමැති ජලයෙන් සෝදහළ මල ඇති යෝගාවචරයාගේ ශීලයද සුපිරිසුදු වන්නේය; ව්‍රතයෝද සම්පාදිත වන්නාහුය. මෙසේ නිරවද්‍යවූ ශීලව්‍රත ගුණයෙන් පිරිසුදුවූ සමාචාර ඇතිව, පළමුකොට පිහිටියයුතු (චීවරසන්තුට්ඨී, පිණ්ඩපාත සන්තුට්ඨී, සේනාසනසන්තුට්ඨී යන) ආර්යවංශ ගුණයන්හි පිහිටා භාවනාවෙහි නියැලීම නම් සිවුවෙනි ආර්යවංශ ගුණය පිළිබඳ අධිගමයට සුදුස්සෙක් වන්නේය. එහෙයින් ධුතාංගකථා ආරම්භ කරමු: භාග්‍යවතුන්වහන්සේ විසින් ලෞකික ආමිෂයන් අත්හළ, කය හෝ ජීවිතය පිළිබඳ අපේක්ෂා රහිත, අනුලෝම ප්‍රතිපදාවම පුරනු කැමති, කුලපුතුන්හට ධුතාංගයන් තෙළෙසක් අනුමත කොට ඇත. එනම්: පංසුකූලිකාංගය, තේචීවරිකාංගය, පිණ්ඩපාතිකාංගය, සපදානචාරිකාංගය, ඒකාසනිකාංගය, පත්තපිණ්ඩිකාංගය, ඛලුපච්ඡාභත්තිකාංගය, අරඤ්ඤිකාංගය, රුක්ඛමූලිකාංගය, අබ්භොකාසිකාංගය, සොසානිකාංගය, යථාසන්ථතිකාංගය, නෙසජ්ජිකාංගයයි යන මේවායි. එහි,

අත්ථතො ලක්ඛණාදීහි සමාදානවිධානතො
පභෙදතො භෙදතො ච තස්ස තස්සානිසංසතො

කුසලත්තිකතො චෙව ධුතාදීනං විභාගතො
සමාසව්‍යාසතො චාපි විඤ්ඤාතබ්බො විනිච්ඡයො

වචනාර්ථ වශයෙන්ද, ලක්ෂණාදීන්ගේ වශයෙන්ද, සමාදන් වන ආකාර වශයෙන්ද, පිළිපදනා විධිවශයෙන්ද, ප්‍රභේදවිභාග වශයෙන්ද, භේදය සිදුවන ආකාර වශයෙන්ද, ඒ ඒ ධුතාංගය පිළිබඳ ආනිසංස වශයෙන්ද, කුශලාදී ත්‍රික වශයෙන්ද, ධුතාදිය පිළිබඳ විභාග වශයෙන්ද සමස්ත වශයෙන් හා ප්‍රත්‍යෙක (වෙන්වෙන්) වශයෙන්ද මෙහි විනිශ්චය දතයුතුය.

එහි පළමුකොට වචනාර්ථ වශයෙන් විනිශ්චය මෙසේය: වීදි, සොහොන් බිම්, කසලගොඩ ආදී කිසි තැනක පස්වලින් උඩට මතුවී

වැටිලෙසින් සිටි හෙයින් පංසුකුල නම්; නොහොත්, පස්මෙන් අවමන්කළයුතු බවට යෙතියි පංසුකුල නම්; මෙලෙසින් ලද අරුත් ඇති පංසුකුලය දැරීමද පංසුකුල නම්; පංසුකුලය දැරීම මොහුගේ ස්වභාවය වෙති'යි පංසුකුලික නම්; පංසුකුලිකයාගේ අංගය **පංසුකුලිකංගයයි.** අංග යනුවෙන් පැවසෙනුයේ කාරණයයි, එහෙයින් යම් අංගයක් සමාදන්වීමෙන් පංසුකුලික නම් වේද, එම අංගයට මේ අධිවචනයයි දතයුතුය. මේ නයින්ම සඟලසිවුරය, පොරෝනා සිවුරය, අඳනකඩය යන තුන්සිවුරු පමණක් දැරීම මොහුගේ ස්වභාවය වෙතියි තෙචීවරිකයාගේ අංගය **තෙචීවරිකංගයයි.**

භික්ෂායයි කියනු ලබන අහර පිඩුවල පාතය හෙවත් රැස්වීම පිණ්ඩපාත නම්, අනුන් විසින් දෙනලද අහරපිඩු පාත්‍රය තුළ එකතුවීම'යි කී තියායි. එම පිණ්ඩපාත භෝජනය එකතු කෙරෙති'යි, ගෙයක් ගෙයක් පාසා යමින් සොයති'යි පිණ්ඩපාතික නම්, පිඩු පිණිස හැසිරීම මොහුගේ ස්වභාවය වෙති'යි හෝ 'පිණ්ඩපාතී' නම්. පතිතුං යනු හැසිරෙනු පිණිසයි. 'පිණ්ඩපාතී' යනුම 'පිණ්ඩපාතික' නම් වේ, පිණ්ඩපාතිකයාගේ අංගය **පිණ්ඩපාතිකංගයයි.**

'දන' යනු සිඳීමයයි කියනු ලැබේ, දනයෙන් ඉවත්වූයේ අපදනයි, අපදන සහිතවූයේ සපදනයි- සිඳීමක් නැතිව, අතරක් නැතිව ගෙපිළිවෙළිනියි කී නියායි, සපදනයෙහි හැසිරීම මොහුගේ ස්වභාවය වෙති'යි සපදනචාරී නම්, සපදනචාරී යනුම සපදනචාරිකයි, ඔහුගේ අංගය **සපදනචාරිකංග** නම්.

එක් අස්නෙක හිඳ බිදීම එකාසන නම්, එය මොහුගේ ස්වභාවය වෙතියි, ඒකාසනික නම්, ඔහුගේ අංගය **ඒකාසනිකංග** නම්, දෙවන බඳුනක් පිළිකෙව්කරන හෙයින් හුදෙක් එක්ම පාත්‍රයක ඇති පිඩු පත්තපිණ්ඩ නම්, පාත්‍රයෙන් පිඩු ගැනීම පත්තපිණ්ඩයයි නම් කොට, පත්තපිණ්ඩය ඔහුගේ ස්වභාවය වෙති'යි පත්තපිණ්ඩික නම් ඔහුගේ අංගය **පත්තපිණ්ඩිකංග** නම්, ඛලු යනු ප්‍රතිශෙධනාර්ථයෙහි නිපාතයකි. අහරකිස නිමවීමෙන් පසු ලද අහර පච්ඡාභත්ත නම්, පච්ඡාභත්තය වැළඳීම පච්ඡාභත්තභෝජන නම්. එම පච්ඡාභත්තභෝජනය පච්ඡාභත්තයයි ගෙන පච්ඡාභත්තය මොහුගේ ස්වභාවය වෙති'යි පච්ඡාභත්තික නම් පච්ඡාභත්තික නොවනුයේ ඛලුපච්ඡාභත්තික නම්; සමාදන්වීමෙන් ප්‍රතික්ෂිප්ත අතිරේක භෝජනයට මේ නමකි. අටුවාවෙහි වනාහි 'ඛලු' යනු එක්තරා පක්ෂියෙකි, උහු මුවින් ගත් ඵලයක් ගිලිහුණහොත් යළි අනෙකක් නොගනියි. මොහු එවැන්නෙකි'යි ඛලුපච්ඡාභත්තික නම්, ඔහුගේ අංගය **ඛලුපච්ඡාභත්තිකංග** නම් වේ.

අරණ්‍යයෙහි විසීම මොහුගේ ස්වභාවය වෙති'යි ආරඤ්ඤික නම්, ඔහුගේ අංගය **ආරඤ්ඤිකංග** නම්. රුක්මුල්හි විසීම රුක්ඛමූල නම්, එය මොහුගේ ස්වභාවය වෙති'යි රුක්ඛමූලික නම්, රුක්ඛමූලිකයාගේ අංගය **රුක්ඛමූලිකංග** නම්. අබ්භොකාසික, සොසානික අංගයන් පිළිබඳවද මෙම නයයි.

යම් සෙනසුනක් පමුණුවන ලද්දේද එය 'යථාසන්ථත' නම්, මෙය ඔබට පැවරේය'යි පළමුකොට පමුණුවනලද සෙනසුනට මේ අධිවචනයි, එම යථාසන්ථත සෙනසුනෙහි විසීම මොහුගේ ස්වභාවය වෙති'යි යථාසන්ථතික නම්, ඔහුගේ අංගය **යථාසන්ථතිකංග** නම්.

වැද හෙවීම (වැතිරීම) පිළිකෙව් කොට හිඳීම් පමණෙකින් විහරණය කිරීම මොහුගේ ස්වභාවය වෙති'යි නේසජ්ජික නම්, ඔහුගේ අංගය **නෙසජ්ජිකංග** නම්. මේ සියලු ධූතංග ඒ ඒ ධූතංගය සමාදන්වීම් වශයෙන් කෙලෙස් සොල්වාලන හෙයින් 'ධුත'යි යන නම් ඇති, භික්ෂුවගේ අංග වෙති'යි, කෙලෙස් සොල්වාලන හෙයින්, 'ධුත'යි යන ව්‍යවහාරයට පත් ඥානය මොහුට අංගවීයයි හෝ ධූතංග නම්වේ. නැතහොත්, ප්‍රතිපක්‍ෂවූ ක්ලේශයන් කම්පා කරවන හෙයින් 'ධුත' නම්දවේ. ශීලාදී ප්‍රතිපත්තියට අංගවෙති'යි, ධූතංග නම්දවේ. මෙසේ පළමුකොට වචනාර්ථ වශයෙන් මෙහි විනිශ්චය දතයුතුය.

**ලක්ඛණාදීහි** යනු, මේ සියලු ධූතංගයෝ සමාදන චේතනාව ලක්‍ෂණකොට ඇත්තාහුය. කියන ලදමැයි, "යමෙක් සමාදන් වේද, හේ පුද්ගලයෙකි, යමක් කරණකොට සමාදන් වේද, මේ චිත්ත චෛතසික ධර්මයෝය, යම් සමාදන චේතනාවක් වේද එය ධූතංගයි, යමක් පිළිකෙව් කෙරේද, එය වස්තුයි'[1] සියලු ධූතංගයෝ තෘෂ්ණාවිධ්වංසනය රස හෙවත් කෘත්‍ය කොට ඇත්තාහුය. තෘෂ්ණාරහිතබව ආසන්න ඵලය කොට ඇත්තාහුය. අල්පේච්ඡතාදී ආර්යධර්මයන් ආසන්න කාරණය කොට ඇත්තාහුය. මේ ආකාරයෙන් ලක්‍ෂණාදී වශයෙන් මෙහි විනිශ්චය දතයුතුය.

**සමාදාන විධානතො** යන ආදී පසෙහි වනාහි: සියලු ධූතංගයන් භාග්‍යවතුන්වහන්සේ ජීවමාන කල්හි උන්වහන්සේ වෙතම සමාදන් විය යුතුය, පිරිනිවි කල්හි මහාශ්‍රාවක කෙනෙකු සමීපයෙහිද, එවන් කෙනෙකු නැති කල්හි, රහත් කෙනෙකු අනාගාමී කෙනෙකු, සකෘදගාමී කෙනෙකු, සෝතාපන්න කෙනෙකු, ත්‍රිපිටකධරයකු, ද්විපිටකධරයකු, ඒකපිටකධරයකු, ඒක සංගීතිධරයකු, ඒකාගමධරයකු, අට්ඨකථාචාර්යවරයකු, එවන් කෙනෙකුද

(1) මහා අට්ඨකථා

නැති කල්හි, ධූතංගධරයකු එවන් කෙනෙකුද නැති කල්හි, සැමළුව හැමද, දණ නමා හිඳගෙන, සම්මාසම්බුදුන් අභිමුඛයෙහි කියන විලාශයෙන් සමාදන් වියයුතුය. තවද තමා විසින්ම සමාදන්වනුද වටී. මෙහිලා සඳගිරි වැසි දෙබෑතෙරුන් අතුරෙන් දෙටුබෑතෙරුන්ගේ ධූතංග අල්පේච්ඡතාව පිළිබඳ වත කිවයුතුය. මේ සියලු ධූතංගයනට සාධාරණ කථාය.

ඉක්බිති එක් එක් ධූතංගය පිළිබඳ සමාදන-විධාන-ප්‍රභේද-භේද-ආනිසංසයන් විස්තර කරම්හ. පළමුකොට පංසුකුලිකංගයයි: ගහපතිදානචීවරං පටික්ඛපාමි, පංසුකුලිකඩගං සමාදියාමි (ගෘහස්ථ-දායකයන් විසින් දෙනු ලබන සිවුරු පිළිකෙව් කරමි, පංසුකුලිකංගය සමාදන් වෙමි) යන මේ පාඨ දෙකින් එකකින් සමාදන් වියයුතුය. මෙහි පළමුකොට දක්වන ලද්දේ මෙය සමාදන්වන ආකාරයයි. මෙසේ මේ ධූතංගය සමාදන් වූවහු විසින් සොහොනෙහි හළ පිළීය, අවන්දෙර ඉවත දැමූ පිළීය, වීදියෙහි හළ පිළීය, කසලගොඩෙහි දැමූ පිළීය, වැදූ ගෙයින් ඉවත දැමූ පිළීය, ආතුරයන් නහවා ඉවත දැමූ පිළීය, නහන තොටෙහි හළ පිළීය, සොහොනට ගියවුන් පෙරළා අවුත් නහා ඉවත දැමූ පිළීය, ගින්නෙන් දැවුණු පිළීය, ගවයන් කෑ පිළීය, වේයන් කෑ පිළීය, මීයන් කෑ පිළීය, කොණකින් ඉරුණු පිළීය, වාටියෙන් ඉරුණු පිළීය, නැව්වල කොඩි පිණිස ගෙනා පිළීය, බිලියම් පිණිස තුඹස් වටා එතූ පිළීය, පැවිද්දන් පොරවා ඉවත දැමූ පිළීය, අභිෂේකයෙහිදී ඉවත දැමූ පිළීය, ඒහිභික්ෂුභාවයෙන් ලත් පිළීය, මහමග දැමූ පිළීය, සුළඟට ගසා ආ පිළීය, දෙවියන් දුන් පිළීය, මුහුදු රළපහරට ගසා ආ පිළීය, යන මෙතෙක් දෑ අතුරෙන් එක්තරා රෙදිකඩක් ගෙන, කැබලිවලට කපා දිරාපත් තැන් ඇතොත් වෙන් කොට, සවි ඇති කොටස් ගෙන, සෝද සිවුරු කොට දායකයන් දුන් පැරණි සිවුරු ඉවත තබා පරිභෝග කළ යුතුය. එහි **සොසානික** නම් සොහොනෙහි හළ පිළීය, **පාපණික** නම් අවන්දෙර වැටුණු පිළීය, **රථියචොළ** නම් පින් කැමැත්තවුන් විසින් කවුළු දෙරින් වීදියට හෙළු පිළීය, **සඞ්කාරචොළ** නම් කසල ගොඩට දැමූ පිළීය, **සොත්ථිය** නම් ගබ්මල පිස ඉවත දැමූ පිළීය. තිස්ස නම් ඇමතියාගේ මව් තොමෝ සියයක් අගනා වස්ත්‍රයෙකින් ගබ්මල පිස දමවා පංසුකුලිකයෝ ගන්නාහුයයි කාළවේලි මාර්ගයෙහි ඉවත දමවා ලීය. භික්ෂූහු දිරාපත් තැන් පිළිසකර පිණිස එය ගනිති. **නහානචොළ** නම් යකැදුරන් විසින් ආතුරයන් හිස පටන් නහවනු ලැබීමෙන් පසු කාලකණ්ණි වස්ත්‍රයයි හැරදමා ගිය පිළීය, **තිත්ථචොළ** නම් නහනතොටෙහි හැරදමා ගිය පිළීය, **ගතපච්චාගත** නම් මිනිසුන් සොහොන්බිමට ගොස් පෙරළා අවුත් නහා හැරදැමූ පිළීය. **අග්ගිදඩ්ඪ** නම් ගින්නෙන් ද ගොස් මිනිසුන්

ඉවත දැමූ වස්ත්‍රයි, **ගොඛායිත** යන ආදිය පැහැදිලිය, එවන් පිළිද මිනිස්සු ඉවත දමති. **ධජාහට** නම්, නැව් නගින්නෝ කොඩියක් බැඳ දමා නගිති, එය ඔවුනට පෙනෙන මානය ඉකුත්වූ පසු ගතු වටී, එසේම යුදබිමෙහි බැඳි ධ්වජයක් දෙසෙනහම බැහැර ගිය කල ගතු වටී, **ථූපචීවර** නම් තුඹස් වටා ඔතා බිලියම් කළ පිළිය. **සමණචීවර** නම් භික්ෂූන් සතු සිවුරුය, **ආභිසෙකික** නම් රජුන් අභිෂේක කළ ස්ථානයෙහි හැර දැමූ වස්ත්‍රයි, **ඉද්ධිමය** නම් ඒහිභික්ෂුභාවයෙන් ලද සිවුරුයි, **පන්ථික** නම් හිමියන් විසින් සිහි මඳව අතරමග හලා ගිය වස්ත්‍රයි, එය මඳ කලක් රකිමින් සිට ගතු වටී, **වාතාහත** නම් සුළඟට ගසා ගොස් ඈත වැටුණු පිළිය, හිමියන් දක්නට නැතොත් එය ගතු වටී, **දෙවදත්තිය** නම් අනුරුද්ධ තෙරුන්හට මෙන් දෙවියන් දුන් වස්ත්‍රයි, **සාමුද්දිය** නම් මුහුදු රළට ගසා අවුත් ගොඩටවන් පිළිය. 'සඞ්ඝස්ස දෙම'යි කියා දෙනලද වස්ත්‍ර හෝ චීවර භික්ෂාවෙහි හැසිරීමෙන් ලද වස්ත්‍ර හෝ පාංසුකූල නොවේ. භික්ෂූන් විසින් දෙනලද්දේ වුවද, යම් චීවරයක් වස් අවසන්හි පවරා දෙනලද්දේ නම් හෝ සෙනසුනෙහි භික්ෂූන් උදෙසා දෙනලද්දේ නම් හෝ එය පංසුකූල නොවේ. (සඞ්ඝස්ස දෙම යයි) නොපවරා දෙනලද්දේම පංසුකූල වේ. එහිද යම් සිවුරක් දයකයන් විසින් භික්ෂුවකගේ පාමුල තබා එම භික්ෂුව විසින් පංසුකූලික භික්ෂුවකගේ අත්හි තබා දෙනලද්දේ නම් එය 'එකතොසුද්ධික' (එක් පසෙකින් පිරිසුදු) නම්, යම් සිවුරක් භික්ෂුවකගේ අත්හි තබා දෙනලදුව, එම භික්ෂුව විසින් (පංසුකූලික භික්ෂුවකගේ) පාමුල තබනලද්දේ නම් එයද 'එකතොසුද්ධික' නම්, යම් සිවුරක් භික්ෂුවකගේ පාමුල තබන ලදුව එම භික්ෂුව විසින් එසේම පාමුල තබා දෙනලද්දේ නම් එය 'උභතොසුද්ධික' (දෙපසින්ම පිරිසුදු) නම්, යම් සිවුරක් අත්හි තබා දෙනලදුව අත්හිම තබනලද්දේ නම් එය 'අනුක්කට්ඨ (උත්කෘෂ්ට නොවූ) චීවර'නම් වේ. මෙසේ මේ පංසුකූල ප්‍රභේදයන් දැන පංසුකූලිකයා විසින් සිවුරු පරිභෝගය කළ යුතුය යන මේ මෙහි පිළිපදනා විධියි.

මේ වනාහි එහි ප්‍රභේදයි. පංසුකූලිකයෝ උත්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුයයි තිදෙනෙකි. එහි සොහොන් පිළීම ගන්නේ උත්කෘෂ්ට නම්, පැවිද්දෝ ගන්නාහුයයි තබනලද සිවුරු ගන්නේ මධ්‍යම නම්, පාමුල තබා දෙනලද සිවුරු ගන්නේ මෘදු නම් වේ. ඔවුනතුරෙන් කවරෙකු හෝ ගෘහස්ථයන් විසින් දෙනලද සිවුරු සිය කැමැත්තෙන් ඉවසුව හොත් එකෙණෙහි ධුතංගය බිඳේ. මේ මෙහි භේදයයි. **'පංසුකූලචීවරං නිස්සාය පබ්බජ්ජා'**[1] (පාංශුකූලචීවරය නිසා පැවිදිබව පවත්නේය) යයි කී හෙයින් නිශ්‍රයට අනුරූපවූ පිළිවෙත් ඇති බවය. පළමුවන අරියවංස ප්‍රතිපදවෙහි

---

(1) විනය මහාවග්ග, පබ්බජ්ජාඛන්ධක. Vin 1.58

පිහිටීමය, රැකීමෙහි ආයාසයක් නොමැති බවය, පරාධීනවෘත්ති රහිතබවය, සොරබිය නැතිබවය, පරිභෝග තෘෂ්ණා රහිතබවය, පැවිද්දනට සුදුසු පිරිකර ඇතිබවය, භාග්‍යවතුන් වහන්සේ විසින් **'අප්පානි චෙව සුලභානි තානි ච අනවජ්ජානි'**[1] (අගයෙන් අඩුවූද සුලබවූද එය නිරවද්‍යද වේ) යයි වර්ණනා කරනලද ප්‍රත්‍යයක් වීමය, ප්‍රසාද දනවනසුලු බවය, අල්පේච්ඡතාදියෙහි පල දැරීමක් වනබවය, මනා පිළිවෙත් වැඩෙන බවය, මෙම දෘෂ්ටිය අනුව යැම පිණිස පශ්චිම ජනතාව පෙළඹෙන බවය යන මේ එහි ආනිසංස වේ.

මාරසෙනවිඝාතාය පංසුකූලධරො යති.
සන්නද්ධකවචො යුද්ධෙ ඛත්තියො විය සොභති

පහාය කාසිකාදීනි වරවත්ථානි ධාරිතං
යං ලොකගරුනා කො තං පංසුකූලං න ධාරයෙ.

තස්මා හි අත්තනො භික්ඛු පටිඤ්ඤං සමනුස්සරං
යොගාචාරානුකූලම්හි පංසුකූලෙ රතො සියා

මරසෙන් වැනසීමෙහිලා පාංශුකූලධර භික්ෂු තෙමේ යුද්ධයෙහි සන්නාහසන්නද්ධ ක්ෂත්‍රියයකු සෙයින් හොබනේය.

කසී සළු ආදී අගනා පිළී හැරපියා යම් වස්ත්‍රයක් ලෝකගුරු වූ බුදුන් විසින් දරන ලද්දේද, එම පාංශුකූල වස්ත්‍රය කවරෙක් නම් නොදරන්නේද?

එහෙයින් භික්ෂු තෙමේ ස්වකීය ප්‍රතිඥාව සිහි කෙරෙමින් යෝගාවචරභාවයට අනුරූපවූ පාංශුකූල චීවරයෙහි ඇලුණෙක් වන්නේය.

මේ වනාහි පංසුකූලිකංගයෙහි සමාදන-විධාන-ප්‍රභේද-භේද-ආනිසංසයන් පිළිබඳ වර්ණනායි. ඉක්බිති,

## තෙචීවරිකංගයයි.

'චතුත්ථකචීවරං පටික්ඛිපාමි, තෙචීවරිකඞ්ගං සමාදියාමි" (සිවුවන සිවුරක් පිළිකෙව් කරමි, තෙචීවරිකංගය සමාදන් වෙමි) යන මේ පාඨ දෙකින් එක් පාඨයෙකින් එය දමාදන්වේ. එම තෙචීවරිකයා (තුන්සිවුරු පමණක් දරන්නා) විසින් සිවුරු පිණිස රෙදි කඩක් ලැබ අපහසු කමෙකින් සිවුරු මසා ගැනීමට යම්තාක් නොහැකිවේද, නොහොත්

(1) අං. නි. චතුක්ක නිපාත. Vii 26.

සිවුරු කරන්නට දත් කෙනෙකු යම්තාක් නොලැබේද, නැතහොත් ඉඳිකටු ආදී යම් කිසිවක් සපයාගැනීමට යම්තාක් නොහැකිවේද, එතාක් එම වස්ත්‍රය තමා ළඟ තබාගත හැකිය. එසේ තබාගැනීමෙහි දෙසෙක් නැත. පඬු ගැන්වූ තැන් සිට එසේ ළඟ තබාගැනීම නොවටී, ධූතංගචොරයෙකු බවට පත්වේ. මේ මෙහි පිළිපදනා විධියි. ප්‍රභේද වශයෙන් වනාහි මොහුද ත්‍රිවිධවේ. එහි උත්කෘෂ්ටයා විසින් පඬුගන්වන අවස්ථාවෙහිදී පළමුකොට අඳනය හෝ පොරෝනය හෝ පඬුගන්වා හැඳ අනික පඬු ගැන්විය යුතුය. එය පෙරවාගෙන සඟළසිවුර පඬුගැන්විය යුතුය. සඟළසිවුර හැඳීම නොවටී. මේ ඔහු විසින් ග්‍රාමාන්ත සේනාසනයෙහිදී පිළිපැදියයුතු වත්ය. ආරණ්‍යකයා විසින් වනාහි දෙකම එක් විට සෝද පඬු ගැන්වීම වටී. කිසිවකු දුටහොත් සිවුර ඇද සිරුරමත රුවා ගැනීමට හැකිවන අයුරු අසල් තැනෙක හිඳගත යුතුය. මධ්‍යමයා විසින් වනාහි: රජනශාලාවෙහි රජනචීවර නම් සිවුරක් තිබේ, එය හැඳ හෝ පෙරවගෙන රජනය කිරීම සුදුසුය. මෘදුකයාහට සභාය භික්‍ෂූන්ගේ සිවුරු හැඳ හෝ පෙරවගෙන පඬුගැන්වීම සුදුසුය. ඇතිරිලි පිණිස එහි තබා ඇති සිවුරක් වුවද ඔහුට සුදුසුය, එහෙත් එය දිගටම පරිහරණය කිරීම සුදුසු නොවේ. සභාග භික්‍ෂූන්ගේ සිවුරුද අතරින් පතර පරිභෝග කිරීම සුදුසුය. ධූතංග තෙචීවරිකයාහට වනාහි සිවුවැන්නක් ලෙස අංසකඩක් සුදුසු වේ; එයද පළලින් වියතක්ද දිගින් දෙවියතක්ද වූයේ යෝග්‍යය. මේ තිදෙනාගේම ධූතංගය සිවුවැනි සිවුරක් ඉවසූ කෙණෙහිම බිඳේ. මෙහි අනුසස් මෙසේය: තෙචීවරික භික්‍ෂු තෙමේ කයින් පරිහරණය කරනු ලබන සිවුරෙන් සන්තුෂ්ටවූ කෙනෙකි, එහෙයින් එය රැගෙන ඔහුට පක්‍ෂියකු මෙන් යාහැකි බවය, මඳකිස ඇති බවය, වස්ත්‍ර රැස් කිරීමෙන් වැලකුණ බවය, සැහැල්ලු පැවතුම් ඇති බවය, අතිරේක සිවුරු කෙරෙහි ලොල් බවින් වැලකුණ බවය, කැපවූ වස්ත්‍රයෙහි පවා පිරිමැසුම් ඇති බවය, කෙලෙස් සිඳින පැවතුම් ඇතිබවය, අල්පෙච්ඡතා ගුණයන් පල දරන බවය යන මේ ආදිය සම්පූර්ණ වේ.

අතිරෙකවත්ථතණ්හං පහාය සන්නිධිවිවජ්ජිතො ධීරො
සන්තොසසුඛරසඤ්ඤූ තිචීවරධරො භවති යොගී.

තස්මා සපත්තචරණො පක්ඛීව සචීවරොව යොගිවරො
සුඛමනුවිචරිතුකාමො චීවරනියමෙ රතිං කයිරා

ත්‍රිචීවරධර යෝගාවචර තෙමේ අතිරේක වස්ත්‍ර කෙරෙහි තෘෂ්ණාව හැරපියා රැස්කිරීමෙන් වැලකුණේ, නුවණැත්තේ සතොස්සුවයෙහි රස හඳුනන්නේ වේ.

එහෙයින් සිය පියාපතින් හැසිරෙන පක්ෂියකු සෙයින් තුන්සිවුරු සහිත වූයේම උතුම් යෝගාවචරතෙමේ සුවසේ හැසිරෙනු රිසිවූයේ, සිවුරු පිරිමැස්මෙහි ඇලුම් කරන්නේය.

මේ තෙචීවරිකාංගයෙහි සමාදන-විධාන-ප්‍රභේද-භේද-ආනිසංසයන් පිළිබඳ වර්ණනායි.

## පිණ්ඩපාතිකාංගයද,

'අතිරෙක ලාභං පටික්ඛිපාමි, පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමි' (අමතර ලැබීම් පිළිකෙව් කරමි, පිණ්ඩපාතිකංගය සමාදන් වෙමි)'. යන මේ පාඨ දෙකින් එක්තරා පාඨයෙකින් සමාදනයවේ. එම පිණ්ඩපාතිකයා විසින් සංඝයා වෙනුවෙන් දෙන බතය, භික්ෂූන් කිහිප දෙනකුන් උදෙසා දෙන බතය, ආරාධනාකොට දෙන බතය, සලාක බතය, පක්ෂයකට වරක් දෙන බතය, පොහොයට දෙන බතය, පැළවියට දෙන බතය, ආගන්තුකයනට දෙන බතය, ගමන් යන්නවුනට දෙන බතය, ගිලනුනට දෙන බතය, ගිලානොපස්ථානයකයනට දෙන බතය, විහාරයෙක්හි වෙසෙන භික්ෂූන් උදෙසා දෙන බතය, නිත්‍ය වශයෙන් දෙන බතය, ගම් කිහිපයක් විසින් වාරයෙන් වාරයට දෙන බතය, යන මේ තුදුස් බත නොඉවසිය යුතුය. ඉදින් සංඝයාහට දෙන බත පිළිගනු මැනවැ'යි නොකියා, අපගේ ගෙහි සංඝයා භික්ෂාව ගනිති, ඔබවහන්සේද භික්ෂාව ගනු මැනවැ'යි කියා දෙනු ලබන බත පිළිගනු වටී. සංඝයා කෙරෙන් කාලනියමයක් නැතිව එදිනෙද ලැබෙන ලහබතද, විහාරයතුළ පිස දෙනු ලබන බතද පිළිගනු වටීමය. මේ මෙහි පිළිපදනා විධියි. ප්‍රභේද වශයෙන් මෙයද ත්‍රිවිධ වේ. එහි උත්කෘෂ්ට තෙමේ ඉදිරියෙන්ද පසුපසින්ද එළවනු ලබන භික්ෂාව පිළිගනී. පැමිණි දෙරකඩ සිටද පාත්‍රය ගන්නවුනට දේ. බොජුන්හලට ගෙනවුත් දෙන භික්ෂාවද පිළිගනී. එදිනෙද පිඩුසිඟා නොගොස් විහාරයට එළවනලද භික්ෂාව නොපිළිගනී. මධ්‍යම තෙමේ එදිනෙද එළවනු ලබන භික්ෂාව පිළිගනී, එහෙත් හෙට දවස සඳහා නොඉවසයි. මෘදුක තෙමේ හෙට දවස පිණිසද අනිද්ද දවස පිණිසද භික්ෂාව ඉවසයි. (පසුව කී) දෙදෙනාම අපරායත්ත (නිදහස්) දිවිපෙවෙතෙහි සුවය නොලබති, උත්කෘෂ්ට තෙමේම එය ලබයි. එක්තරා ගමෙක අරියවංස දේශනාව පැවැත්වේ, උත්කෘෂ්ට තෙමේ අනෙක් දෙදෙනාට, 'ඇවැත්නි, දහම් ඇසීමට යන්නමෝදැ'යි කීය. ඔවුනතුරෙන් එක් කෙනෙක්, 'ස්වාමීනි, එක්තරා කෙනකුන් විසින් (විහාරයෙහි) රඳවනු ලද්දෙමි'යි කීය, අනෙකා ස්වාමීනි, මවිසින් හෙට දවස පිණිස එක්තරා කෙනකුගේ

භික්ෂාව ඉවසන ලදි'යි කීය. මෙසේ ඒ දෙදෙනාම (ධර්මලාභයෙන්) පිරිහුන්හ. අනෙක් භික්ෂු තෙමේ උදසනක්සේ පිඩු පිණිස හැසිර ඉක්බිති එහි ගොස් දහම්රස විඳියේය. මේ (උත්කෘෂ්ට, මධ්‍යම, මෘදුක යන) තිදෙනා විසින්ම සංඝභත්ත ආදී අතිරේක භික්ෂා ලාභයක් ඉවසනලද කෙණෙහිම ධුතංගය බිඳේ. මේ මෙහි භේදයයි. මෙහි ආනිසංස මෙසේය:

'පිණ්ඩපාත භෝජනය නිසා පැවිදිබව පවත්නේය[1]'යි කී හෙයින් නිස්සයට අනුරූපවූ පිළිවෙත් ඇති බවය, දෙවන අරියවංස ප්‍රතිපදවෙහි පිහිටි බවය, අපරායත්ත යැපීම් ඇති බවය, 'අගයෙන් අඩුවූද සුලබවූද එය නිරවද්‍යද වේ'යයි[2] භාග්‍යවතුන්වහන්සේ විසින් මොනවට පසස්නා ලද ප්‍රත්‍යයක් වනබවය, කුසීතබව මැඩලන බවය, පිරිසුදු ජීවිකා ඇති බවය, සේඛියා පිළිවෙත් පිරෙන බවය, පරපෝෂණරහිත බවය, පරහට අනුග්‍රහ කරන බවය, මානය පහ කෙරෙන බවය, රසතෘෂ්ණාව වැලකෙන බවය, ගණභොජන, පරම්පරභොජන පිළිබඳ චාරිත්‍ර ශික්ෂාපදවලින් ඇවැත් සිදුවීමක් නැතිබවය, අල්පෙච්ඡතාදී ගුණයනට අනුරූපවූ පැවතුම් ඇති බවය, යහපත් පිළිවෙත් වැඩෙන බවය, මතු පරම්පරාවන් කෙරෙහි අනුකම්පා කිරීමය යන මේය.

පිණ්ඩියාලොපසන්තුට්ඨො අපරායත්තජීවිකො
පහීණාහාරලොලුප්පො හොති චාතුද්දිසො යති.

විනොදයති කොසජ්ජං ආජීව'ස්ස විසුජ්ඣති
තස්මාහි නාතිමඤ්ඤෙය්‍ය භික්ඛාචරියං සුමෙධසො

පිඩු සිඟා ලත් අහරින් තෘප්තවූ භික්ෂු තෙමේ අනුන් පිහිට නොකළ යැපීම් ඇත්තේ, පහවූ ආහාරතෘෂ්ණා ඇත්තේ, සිවුදිශාවටම යෝග්‍ය යතිවරයෙක් වන්නේය.

කුසීතබව දුරුකරන්නේය, ඔහුගේ ආජීවය පිරිසුදු වන්නේය, එහෙයින් යහපත් ප්‍රඥ ඇත්තේ භික්ෂාචර්යාව සුළුකොට නොතකන්නේය. මෙබඳු වූ,

පිණ්ඩපාතිකස්ස භික්ඛුනො අත්තභරස්ස අනඤ්ඤපොසිනො
දෙවා පිහයන්ති තාදිනො නො චෙ ලාභසිලොකනිස්සිතො[3]

තමා විසින්ම යැපෙන, අනුන් විසින් පෝෂණය කරනු නොලබන, එවන් ගුණ ඇති භික්ෂුවට, ඉදින් ලාභ කීර්ති කෙරෙහි නොරැඳී

(1) විනය මහාවග්ග Vin I 58
(2) අං. නි. චතුක්ක නි. Aii 26
(3) උදනපාළි Ud 31

ඇත්නම්, එබඳු තාදී ගුණයෙන් යුතු ඔහු කෙරෙහි දෙවියෝ ආශා ඇති කෙරෙති.

මේ පිණ්ඩපාතිකංගය පිළිබඳ සමාදන-විධාන-ප්‍රභේද-භේද-ආනිසංසයන් පිළිබඳ වර්ණනායි.

## සපදනචාරිකංගයද

'ලොලුප්පචාරං පටික්ඛිපාමි, සපදානචාරිකඞ්ගං සමාදියාමි (ලොල්බවින් ගෙපිළිවෙළ හැර හැසිරීම පිළිකෙව් කරමි, සපදනචාරිකංගය සමාදන් වෙමි) යන මේ පාඨයන් අතුරෙන් එක් පාඨයෙකින් සමාදනය සිදුවේ. එම සපදනචාරිකයා විසින් ගම්දෙරදී උවදුරු නැතිබව නිශ්චය කළයුතුය. යම් වීදියෙක හෝ ගමෙක හෝ උවදුරක් ඇතොත් එය හැර වෙන'තෙක හැසිරීම යෝග්‍ය වේ. යම් ගෙදොරකදී හෝ වීදියෙකදී හෝ ගමෙකදී හෝ කිසිවක් නොලැබෙතොත් නොගමෙකැ'යි හැඟ හැර යායුතුය. යම් ගමෙක කිසිවක් හෝ ලැබේනම් එය හැරයනු නොවටී. මේ සපදනචාරික භික්ෂුව විසින් වේලාසනින් ගමට පිවිසිය යුතුය. මෙසේ වූකල්හි අපහසු තැන් හැර අන් තැනෙක යා හැකිවේ. ඉදින් විහාරයට ගෙනවුත් දන් දෙන හෝ අතරමගදී හමුවන හෝ මිනිසුන් පාත්‍රය ගෙන පිණ්ඩපාතය දෙතහොත් පිළිගනු වටී. මග බැස යන මොහු විසින් පිඩු පිණිස හැසිරෙන වේලෙහි පිවිසි ගම නොඉක්මවා හැසිරිය යුතුය. එහිදී නොලැබෙතොත් හෝ, මදක් ලැබ හෝ ගම් පිළිවෙළින්ම හැසිරිය යුතුය. මේ මෙහි පිළිපදනා විධියි. ප්‍රභේද වශයෙන් වනාහි මොහුද ත්‍රිවිධ වේ. ඔවුනතුරෙන් උත්කෘෂ්ට තෙමේ පෙරටු කොටගෙන ආ භික්ෂාවද, පසුව ගෙනා භික්ෂාවද, බොජුන්හලට ගෙනවුත් දෙන භික්ෂාවද නොපිළිගනියි. පැමිණි දෙරකඩදී පාත්‍රය හරියි. මේ ධූතංගයෙහි මහකසුප් තෙරුන් හා සම වූවෙක් නම් නැත. ඔවුන් විසින්ද පාත්‍රය හැරි තැනක් පෙනේ. මධ්‍යම තෙමේ පෙරටුව හෝ පසුව ගෙනා භික්ෂාවද, බොජුන්හලට ගෙනා භික්ෂාවද පිළිගනියි, පැමිණි දෙරකඩදීද පාත්‍රය හරියි. එහෙත් භික්ෂාව ගෙනඑනු බලා නොහිඳියි. මෙහිදී හේ තෙමේ උත්කෘෂ්ට පිණ්ඩපාතිකයාහට අනුලොම්වේ. මෘදුක තෙමේ එදවස පමණක් හිඳ බලාපොරොත්තුවේ. මේ තිදෙනාගේම ධූතංගය ගෙපිළිවෙළ සිඳීම සිදුවූ කෙණෙහි බිඳේ. මේ මෙහි භේදයයි. මෙහි ආනිසංස මෙසේය:

කුලයනට නිරතුරුවම අමුත්තකු වීම, (කිසිතැනෙක නොඇලෙන හෙයින්) සඳට උපමා කළ හැකි වීමය, කුලයන් කෙරෙහි (ආශාවෙන් යුතුව) ඇලෙන බව දුරුවීමය, සැමට එකසේ අනුකම්පා ඇතිබවය,

කුලයන් කෙරෙහි බැඳීමෙන් වන ආදීනවයෙන් මිදුණබවය, ඇරියුම් නොඉවසනබවය, ගෙනවුත් දෙන භික්ෂාවෙන් ප්‍රයෝජනයක් නැතිබවය, අල්පේච්ඡතාදියට අනුලෝම් යැපීම් ඇතිබවය යන මේය.

චන්දූපමො නිච්චනවො කුලෙසු අමච්ඡරී සබ්බසමානුකම්පො
කුලූපගාදීනවවිප්පමුත්තො හොතීධ භික්ඛු සපදානචාරී.
ලොලුප්පචාරඤ්ච පහාය තස්මා ඔක්ඛිත්තචක්ඛු යුගමත්තදස්සී
ආකඞ්ඛමානො භුවි සෙරිචාරං චරෙය්‍ය ධීරො සපදානචාරං

මේ සස්නෙහි සපදනචාරී භික්ෂු තෙමේ කිසි තැනෙක්හි හෝ (ආශාවෙන් යුතුව) නොඇලීමෙන් චන්ද්‍රයා වැනි වූයේ, සැම කල්හිම අලුතින් ආ අමුත්තෙක් වූයේ, කුලයන් කෙරෙහි මසුරුබවින් තොර වූයේ, සැමටම එකසේ අනුකම්පා ඇත්තේ, කුලයන් කෙරෙහි ඇලීමේ ආදීනවයෙන් මිදුණෙක් වන්නේය.

එහෙයින් නුවණැත්තේ ලොල්බවින් පිළිවෙළ සිඳ හැසිරීමෙන් වෙන්ව, මේ ලෝකයෙහි ස්වාධීනවිහරණයෙහි රිසිවූයේ, පහතට නැඹුරු ඇස් ඇතිව, වියදඬු පමණ බලමින් ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙන්නේය.

මේ සපදනචාරිකංගයෙහි සමාදන-විධාන-ප්‍රභේද-භේද ආනිසංසයන් පිළිබඳ වර්ණනායි.

## ඒකාසනිකංගයද,

'නානාසනභොජනං පටික්ඛිපාමි, එකාසනිකඞ්ගං සමාදියාමි' (නොයෙක් වර හිඳ අනුභවකිරීම පිළිකෙව් කරමි, ඒකාසනිකංගය සමාදන් වෙමි) යන මේ පාඨ දෙකින් එකකින් සමාදනය සිදුවේ. එම ඒකාසනික භික්ෂුව විසින් ආසන ශාලාවෙහි හිඳගන්නාවිට ථෙරාසනයෙහි නොහිඳ, මේ අසුන මට ලැබෙන්නේයයි සලකා යෝග්‍යවූ අසුනෙක හිඳගතයුතුය. ඉදින් ඔහුගේ අහරකිස නොනිමී තිබියදී ආචාර්යවරයා හෝ උපාධ්‍යායවරයා පැමිණියහොත්, නැගිට වත් පිළිපදිනු වටී. ත්‍රිපිටකධර චූලාභය තෙරණුවෝ "අසුන හෝ භෝජනය හෝ රකින්නේය, එහෙයින් අඩහල බොජුන් ඇති මේ තෙමේ වත් පිළිපදීවා, බොජුන් නොබුදීවා"යි කීහ. මේ මෙහි පිළිපදනා විධියි. ප්‍රභේද වශයෙන් වනාහි මෙයද ත්‍රිවිධ වේ. එහි උත්කෘෂ්ටයා මදවූ හෝ බොහෝවූ හෝ යම් බොජුනකට අත තැබුවේ නම් එය හැර අන්කිසිවක් නොපිළිගන්නේය, ඉදින් මිනිසුන්

'තෙරුන් කිසිවක් නොවැළඳූහ'යි ගිතෙල් ආදිය ගෙන එතොත් බෙහෙත් වශයෙන් පිළිගනු වටී, අහර වශයෙන් නොවටී. මධ්‍යමයා යම්තාක් පාත්‍රයෙහි බත් ඉතිරිව තිබේනම්, ඒතාක් එයට සෑහෙන තරම් සූප ආදී අන්අහරක් පිළිගන්නේය. මේ තෙමේ 'භෝජනපරියන්තික' නම්වේ. මෘදුක තෙමේ යම්තාක් හිඳ වැළඳූ අසුනෙන් නොනැගිටියේද ඒතාක් වැළඳීම කරන්නේය. මේ තෙමේ 'උදකපරියන්තික' නම්වේ. පාත්‍රය ධෝවනය කරන තෙක් අනුභව කරන හෙයිනි, නැතහොත් 'ආසනපරියන්තික' නම්වේ. යම්තාක් අසුනෙන් නොනැගිටියේද ඒතාක් අනුභවකරන හෙයිනි. මේ තිදෙනාගේම ධුතංගය නැවත හිඳ වැලඳූ කෙණෙහි බිඳේ, මේ මෙහි බිඳීමයි. මෙහි ආනිසංස මෙසේය: නිරෝගබවය, මඳපීඩා ඇතිබවය, සැහැල්ලු ඉරියවු ඇතිබවය, සිරුරු බලඇති බවය, පහසු විහරණ ඇතිබවය, ඉතිරි නොවූ ප්‍රත්‍යය ඇති හෙයින් ඇවැත් සිදුවීමට ඇති ඉඩ මඳබවය, රසතෘෂ්ණා දුරුවීමය, අල්පේච්ඡතාදී ගුණයනට අනුලොම්වූ යැපීම් ඇති බවය යනමේය.

> ඵකාසනභොජනෙ රතං න යතිං භොජනපච්චයා රුජා
> විසහන්ති රසෙ අලොලුපො පරිහාපෙති න කම්මමත්තනො
>
> ඉති ඵාසුවිහාරකාරණෙ සුචිසල්ලෙඛරතූපසෙවිතෙ
> ජනයෙථ විසුද්ධමානසො රතිමෙකාසනභොජනෙ යති.
>
> ඒකාසන භෝජනයෙහි ඇලුණ යතිවරයා ආහාර හේතුවෙන් ඇතිවන රෝගයෙන් නොපෙළේ, රසයෙහි ගිජු නොවූයේ ස්වකීය කාර්යයෙන් නොපිරිහෙයි.
>
> මෙසේ සුඛවිහරණයට හේතුවූ, පිරිසිදු සල්ලේඛගුණයෙහි ඇලුණවුන් විසින් සෙවුනාලද, ඒකාසනභෝජනයෙහි පිරිසුදු සිත්ඇති යති තෙමේ ඇලුම් කරන්නේය.

මේ ඒකාසනිකංගයෙහි සමාදන-විධාන-ප්‍රභේද-භේද-ආනිසංසයන් පිළිබඳ වර්ණනායි.

## පත්තපිණ්ඩිකංගයද.

"දුතියකභාජනං පටික්ඛිපාමි, පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමි (දෙවන බඳුනක් පිළිකෙව් කරමි, පත්තපිණ්ඩිකංගය සමාදන් වෙමි.) යන මේ පාඨ දෙකින් එකකින් සමාදනය සිදුවේ. එම පත්තපිණ්ඩිකයා විසින් වනාහි හුළුකැන් (කැඳ) බොනවිට භාජනයෙක තබා අවුළුපත් ලදහොත්

අවුළුපත් හෝ පළමුකොට බිදිය යුතුය, හුළුකැන් හෝ පළමුකොට පිය යුතුය, ඉදින් එම අවුළුපත් හුළුකැන්හි ලූවහොත් පිලීමඩුන් සහිත අවුළු ආදිය ලූ විට හුළුකැන් පිළිකුල් වේ. පිළිකුල් නොවන සේ කොට අනුභව කරනු වටී. එහෙයින් එබඳුවූ අවුළුපත් ගැන සලකා මෙසේ කියනලදි, 'මී සකුරු ආදී යම් කිසිවක් පිළිකුල් නොවේනම් එය හුළුකැන්හි ලිය යුතුය, පිළිගන්නාවිටද සුදුසු පමණට පිළිගත යුතුය. අතින් ගෙන කැයුතු අමුරිකිලි පවා එසේ නොකොට පාත්‍රයෙහිම බැහිය යුතුය. දෙවන බඳුනක් පිළිකෙව් කරනලද හෙයින් කොළපතක් තරම් වූද අන් බඳුනක් පරිභෝග කරනු නොවටී' යනුවෙති. මේ මෙහි පිළිපදනා විධියි. ප්‍රභේද වශයෙන් වනාහි මොහුද ත්‍රිවිධ වේ. එහි උත්කෘෂ්ටයා විසින් උක්දඩු සැපීමේදී හැර, රොඩු පවා ඉවතදැමීම නොවටී. බත්පිඩු, මත්ස්‍යමාංස, කැවුම් ආදිය පවා අතින් කඩා කෑම නොවටී, මධ්‍යමයා විසින් එක් අතෙකින් කඩා කෑම වටී, මේ තෙමේ හත්ථයෝගී'නම්. මෘදුක තෙමේ 'පත්තයෝගී' නම්, ඔහු විසින් පාත්‍රය තුළ බැහිය හැකි සියලුම ද අතින් හෝ දතින් කඩා කෑම වටී. මේ තිදෙනාගේම ධුතංගය දෙවන බඳුනක් ඉවසූ කෙණෙහිම බිඳේ. මේ මෙහි භේදයයි. ආනිසංස මෙසේයි: නොයෙක් රසයන් කෙරෙහි ඇති තෘෂ්ණාව දුරුවීමය, ආහාරයෙහි ගිජුබව දුරලීමය, ආහාරයෙහි ප්‍රයෝජනය පමණක් දන්නාබවය, තලි තැටි ආදී බඳුන් පරිහරණයෙන් ඇතිවන ගැහැට නැති බවය, නොවිසුරුණු බොජුන් ඇතිබවය, අල්පේච්ඡතාදී ගුණයනට අනුලෝම පැවතුම් ඇතිබවය යන මේය.

නානාභාජනවික්ඛෙපං - හිත්වා ඔක්ඛිත්තලොචනො
ඛණන්තෙවිය මූලානි රසතණ්හාය සුබ්බතො

සරූපං විය සන්තුට්ඨිං ධාරයන්තො සුමානසො
පරිභුඤ්ජෙය්‍ය ආහාරං කො අඤ්ඤො පත්තපිණ්ඩිකා

නොයෙක් බඳුන් පරිහරණයෙහි ඇති ගැහැට දුර හැර පහතට නැඹුරු ඇස් ඇතිව රසතෘෂ්ණාවෙහි මුල් උදුරන සෙයින් මනාව්‍රත ඇතිව,

මූර්තිමත් සන්තුෂ්ටිය දරමින් මෙන් සොඳුරු සිත් ඇතිව ආහාර අනුභව කරනුයේ පත්තපිණ්ඩිකයා හැර අන් කවරෙක්ද?

මේ පත්තපිංඩිකංගයෙහි සමාදන-විධාන-ප්‍රභේද-භේද ආනිසංසයන් පිළිබඳ වරණනායි.

## ඛලුපච්ඡාභත්තිකංගයද,

අතිරිත්තභොජනං පටික්ඛිපාමි, ඛලුපච්ඡාභත්තිකඞ්ගං සමාදියාමි (අමතර බොජුන් පිළිකෙව් කරමි. ඛලුපච්ඡාභත්තිකංගය සමාදන් වෙමි) යන මේ දෙපාඨයෙන් එක්පාඨයෙකින් සමාදන්විය හැකිය. ඒ ඛලුපච්ඡාභත්තිකයා විසින් වනාහි බොජුන් පවරාගැනීමෙන් පසු නැවත කැප කරවාගෙන වැළඳීම නොකළයුතුය. මේ මෙහි පිළිපදනා විධියි. ප්‍රභේද වශයෙන් වනාහි මෙයද, තුන්ආකාරවේ. එහි උත්කෘෂ්ට තෙමේ පළමු පිඩෙහි පවාරණයක් නැති හෙයින්, එය වළඳමින් සිටියදී වෙනත් අහරක් පිළිකෙව් කළහොත් පවාරණය සිදුවන හෙයින් පළමුවන පිඩ වළඳ ඉක්බිති (පළමුව කැප කරවාගත් අහරෙහි වුවද) දෙවන පිඩ අනුභව නොකරයි. මධ්‍යම තෙමේ මෙසේම වෙනත් අහරක් පිළිකෙව් කෙරෙමින් නමුදු පළමුව පවරාගත් බොජුනෙහි දෙවන පිඩ අනුභව කරයි. මෘදුක තෙමේ අසුනෙන් නොනැගිට සිටිතාක් පිඩු අනුභව කරයි. බොජුන් පවාරණය කිරීමෙන් පසු වෙනත් අහරක් කැපකරවාගෙන වැළඳූ කෙණෙහි මේ තිදෙනාගේම ධූතංගය බිඳේ. මේ මෙහි භේදයයි. ආනිසංස මෙසේය: අමතර බොජුන් වැළඳීමේදී සිදුවියහැකි ඇවැත් දුරුවීමය, කෑදරකමින් දුරුවීමය, පසුව කැප කරවාගෙන වළඳනු පිණිස ළඟතබාගත් ආමිෂයක් නැතිබවය, යළි අහර සෙවීමක් නැති බවය, අල්පේච්ඡතාදී ගුණයනට අනුකූල පැවතුම් ඇති බවය යන මේය.

පරියෙසනාය ඛෙදං න යාති න කරොති සන්නිධිං ධීරො
ඔදරිකත්තං පජහති ඛලුපච්ඡාභත්තිකො යොගී.

තස්මා සුගතපසත්ථං සන්තොසගුණාදිවුද්ධිසඤ්ජනනං
දොසෙ විධුනිතුකාමො භජෙය්‍ය යොගී ධුතඞ්ගමිදං

බුද්ධිමත් වූ ඛලුපච්ඡාභත්තික යෝගී තෙමේ (නැවත) ආහාර සෙවීමේ ආයාසයට නොපැමිණේ, අහර රැස්කොට ළඟ තබා ගැනීමද නොකරයි, අහරෙහි ගිජුකම් අත්හරියි.

එහෙයින් බුදුන් විසින් පසස්නාලද සතොස්ගුණාදියෙහි වැඩීම ඇතිකරවන මේ ධූතංගය කෙලෙස් දෙෂයන් පලවාහරිනු කැමැති යෝගී තෙමේ භජනය කරන්නේය.

මේ ඛලුපච්ඡාභත්තිකංගයෙහි සමාදන-විධාන-ප්‍රභේද-භේද-ආනිසංසයන් පිළිබඳ වර්ණනායි.

## ආරඤ්ඤිකාංගයද,

'ගාමන්තසෙනාසනං පටික්ඛිපාමි, අරඤ්ඤිකඞ්ගං සමාදියාමි (ග්‍රාම සේනාසන පිළිකෙව් කරමි, ආරඤ්ඤිකාංගය සමාදන් වෙමි යන මේ දෙපදයෙන් එකෙකින් සමාදානය සිදුවේ. එම ආරණ්‍යකයා විසින් ග්‍රාමාන්ත සේනාසනය හැර ආරණ්‍යයෙහි අරුණ නැංවිය යුතුය. උපචාරය සමග ගෙන ගමම ග්‍රාමාන්ත සේනාසන නමි. ගම නම්, එක්ගෙයක් හෝ බොහෝ ගෙවල් ඇති වැටපවුරුවලින් අවුරනලද හෝ නොලද, මිනිසුන් ඇති හෝ නැති යටත් පිරිසෙයින් සිවුමසකට වැඩි කලක් තවලමක් හෝ වාසයකළ කිසියම් ස්ථානයෙකි. ග්‍රාමෝපචාර නම්, ඉදින් ඇවුරුණු ගමෙක, අනුරාධපුරයෙහි මෙන් දෙරටු එලිපතු දෙකක් වේනම්, ඇතුල් එලිපත සිට සාමාන්‍ය බල ඇති මිනිසකු ගැසූ කැටක් වැටෙන තැන්ය. යම්සේ තරුණ ජනයා තම ශක්තිය දක්වමින් අත දිගහැර ගල්කැට විසිකරත්ද, මෙසේ විසිකළ කැටක් වැටෙන තැනින් ඇතුළතයයි විනයධරයෝද, කපුටන් වැලකීමට ගසනලද කැටක් වැටෙන තැන්යයි සෞත්‍රාන්තිකයෝද එහි ලක්‍ෂණ කියති. නොඇවුරුණු ගමෙක නම්, අන්තිම කෙළවර පිහිටි ගෙහි දෙරකඩ සිටි ස්ත්‍රියක් බඳුනෙකින් ඉවත ලන දිය වැටෙන තැන ගෘහෝපචාර නම්වේ. එතැන් සිට යට කී නයින් එක් ලෙඩ්ඩුපාතයක් (කැටක් වැටෙන දුර) ගමයි. දෙවන ලෙඩ්ඩුපාතය ග්‍රාමෝපචාරයයි. අරණ්‍යය වනාහි විනය නයින් 'ග්‍රාමයද, ග්‍රාමෝපචාරයද හැර මේ සියල්ල ආරණ්‍යය'[(1)]යි කියනලදී. අභිධර්ම නයින්, 'එලිපත සිට පිටතට නික්මුණු තැන් පටන් සියල්ල ආරණ්‍යය[(2)]'යි කියනලදි. මෙහි සෞත්‍රාන්තික නයින් 'ආරණ්‍ය සේනාසන නම් අවම වශයෙන් දුනු පන්සියයක් දුර වේ'[(3)] යන මේ ලක්‍ෂණයි. අවුරනලද ගමෙක නම් එලිපතෙහි සිටද, නොඇවුරුණු ගමෙක නම් ප්‍රථම ලෙඩ්ඩුපාතයෙහි සිටද විහාර ප්‍රාකාරය දක්වා මැන එය නිශ්චය කරගතයුතුය. ඉදින් විහාරයද නොඇවුරන ලදනම්, එහි පළමුවැනි සෙනස්න හෝ බත්හල හෝ, නිතර රැස්වන තැන හෝ, බෝධිවෘක්‍ෂය හෝ, චෛත්‍යය හෝ, සියල්ලට පෙරටුව පිහිටි සෙනස්නෙහි සිට යමක් දුරින්ම පිහිටියේද එය හිමි කොට මැනීම කළයුතුයයි විනය අටුවාවන්හි[(4)] කියනලදි. මැදුම්සඟි අටුවායෙහි[(4)] වනාහි විහාරයටද ග්‍රාමඋපචාරයට මෙන්ම ගෙන ලෙඩ්ඩුපාතයන් දෙක අතර දුර මිනිය යුතුයයි කියනලදි. මේ මෙහි ප්‍රමාණයි. ඉදින් අසල ගමක් ඇත්නම්, විහාරයෙහි සිටිනවුන්හට

---

(1) විනය, පාරාජිකපාළි. Vin. iii 46
(2) අභිධම්ම, ඣාන විභඞ්ග Vibh 251
(3) විනය, පාචිත්තියපාළි Vin iv 183
(4) හෙලටුවා

මිනිසුන්ගේ කටහඬ ඇසේනම්, පර්වත, නදී ආදිය නිසා කෙළින්ම යා නොහැකිනම්, එහි යාහැකි ස්වාභාවික මාර්ගයක් ඇත්නම් එයද, ඉදින් නැවෙන් යායුතු නම් එම මාර්ගයෙන් පන්සියයක් දුනු ගත යුතුය. යම් කිසිවකු වනාහි අසල්ගමට අවශ්‍ය මෙකී අංග (කෘත්‍රිමව) ඇති කරනු පිණිස ඒ ඒ තැන ඇති මංපෙත් වැසුවහොත් මේ තෙමේ ධුතංගචෝරයෙක් වේ. ඉදින් ආරණ්‍යක භික්ෂූහුගේ උපාධ්‍යායයන් හෝ ආචාර්යයන් ගිලන් වුවහොත්, වනයෙහි සප්පාය නොලැබෙතොත් ග්‍රාමාන්ත සේනාසනයට ගෙන අවුත් උපස්ථාන කළයුතුය. වේලාසනින් නික්ම ගොස් නියමිත අංග සහිත ස්ථානයෙහිදී අරුණු නැංවිය යුතුය. ඉදින් අරුණු නැගෙන අවස්ථාවෙහිදී ඔවුන්ගේ ආබාධය උත්සන්නවේනම් ඔවුන් කළයුතු කාර්යයම කළයුතුය. එහිදී ධුතංගය පිරිසුදු කරන්නකු නොවිය යුතුය. මේ මෙහි පිළිපදනා විධිය. ප්‍රභේද වශයෙන් වනාහි මෙයද තුන් වැදෑරුම් වේ. එහි උත්කෘෂ්ටයා විසින් සියලු කල්හිම අරණ්‍යයෙහි අරුණු නැංවිය යුතුය. මධ්‍යමයාට වස් සාරමස ග්‍රාමාන්තයෙහි විසීමට අවසර ඇත. මෘදුක තෙමේ හේමන්ත කාලයෙහි විසීමටද අවසර ලබයි. මේ තිදෙනාටම නියමිත කාලයතුළ අරණ්‍යයෙන් අවුත් ග්‍රාමාන්තයෙහි සිට දහම් අසන විටෙක අරුණු නැංගද ධුතංගය නොබිඳේ. දහම් අසා පෙරළා (අරණ්‍යයට) යන්නවුනටද අතරමඟදී අරුණු නැගියද නොබිඳේ. ඉදින් ධර්මකථිකයා නැගීසිටි පසුද මඳ වේලාවක් වැදහෙව යන්නෙමු'යි නිදනවිට අරුණු නැංගහොත් හෝ, සිය කැමැත්තෙන් ග්‍රාමාන්තයෙහි (සිටියදී) අරුණු නැගෙන්නට දුනහොත් හෝ ධුතංගය බිඳේ. මේ මෙහි භේදයයි. ආනිසංස මෙසේය: ආරණ්‍යක භික්ෂු තෙමේ අරණ්‍යසංඥාව මෙනෙහිකරනුයේ නොලද සමාධි ලැබීමටද ලද සමාධි රැකීමටද, සමත් වේ. ශාස්තෘන් වහන්සේද ඔහු කෙරෙහි සතුටු වෙති, කියන ලදුයේ මැයි: 'එහෙයින් මම අරණ්‍ය විහරණය හේතුකොට නාගිත භික්ෂුවහට සතුට වෙමි(1)'. ප්‍රාන්ත සේනාසනයෙහි සිටිනවිට ඔහුගේ සිත අසප්පාය රූපාදිය හේතුකොට වික්ෂේපයට නොපැමිණෙයි, පහවූ තැතිගැනීම් ඇත්තේ වෙයි, ජීවිතාශාව හරියි, විවේකසුවරසය විඳියි, පංසුකූලිකභාවය ආදී අංගයනටද, සුදුස්සෙක්වේ.

පවිවිත්තො අසංසට්ඨො පන්තසෙනාසනෙ රතො
ආරාධයන්තො නාථස්ස වනවාසෙන මානසං

එකො අරඤ්ඤෙ නිවසං යං සුඛං ලභතෙ යති
රසං තස්ස න වින්දන්ති අපි දෙවා ස-ඉන්දකා,

(1) සං. නි. සගාථවග්ග. අ. නි. ද බලන්න. A iii 343.

පංසුකූලංච එසො'ව කවචං විය ධාරයං
අරඤ්ඤසංගාමගතො අවසෙසධුතායුධො

සමත්ථො න චිරසෙසව ජෙතුං මාරං සවාහිනිං
තස්මා අරඤ්ඤවාසම්හි රතිං කයිරාථ පණ්ඩිතො

ප්‍රාන්තසේනාසනයෙහි ඇලුණු යෝගී තෙමේ විවේකසුව ඇත්තේ, කිසිවක් කෙරෙහි ඇලීම් නැත්තේ, වනවාසය හේතුකොටගෙන ශාස්තෲන්වහන්සේගේ සිත තොස්වාලනුයේ

ආරණ්‍යයෙහි හුදකලාව වාසය කෙරෙමින් යම්සුවයක් ලබාද, ඒ සුවයෙහි රසය ඉන්ද්‍රයා පෙරටුකොට ඇති දෙවියෝද නොවිදිති.

මේ තෙමේම පංශුකූලය සන්නාහයක් මෙන් දරමින් සෙසු ධුතංගයන් ආයුධ ලෙස ගෙන අරණ්‍යසංග්‍රාමයට ගියේ

සේනා සහිත මාරයා ජයගැනීමට නොබෝ කලෙකින්ම සමත් වන්නේය. එහෙයින් නුවණැත්තේ අරණ්‍යවාසයෙහි ඇලුම් කරන්නේය.

මේ ආරණ්‍යකාංගයෙහි සමාදන-විධාන-ප්‍රභේද-භේද-ආනිසංසයන් පිළිබඳ වර්ණනායි.

## රුක්ඛමූලිකාංගයද,

'ඡන්නං පටික්ඛිපාමි, රුක්ඛමූලිකඞ්ගං සමාදියාමි (සෙවිලි කළ ආවාසය පිළිකෙව් කරමි, රුක්ඛමූලිකඞ්ගය සමාදන් වෙමි) යන මේ පාඨ දෙකින් එකෙකින් සමාදනය සිදුවේ. ඒ රුක්ඛමූලිකයා විසින් දේශසීමාවෙක්හිවූ රුක්ය, ජනයා වැඳුම්පිදුම්කරන රුක්ය, ලහටු ගන්නා රුක්ය, පලගන්නා රුක්ය, වවුලන් වසන රුක්ය, සිදුරු සහිත රුක්ය, විහාරමධ්‍යයෙහිවූ රුක්ය, යන මේවා හැර ප්‍රත්‍යන්තයෙහි පිහිටි රුකක් තෝරාගත යුතුය. මේ මෙහි පිළිපදනා විධියි. ප්‍රභේද වශයෙන් වනාහි මොහුද ත්‍රිවිධ වේ. එහි උත්කෘෂ්ටයා රිසි පරිදි රුකක් තෝරාගත් පසු එය හෙළිපෙහෙළිකොට සකස්කරවාගැනීමට නොලබයි, පයින් කොළ රොඩු ඉවත්කොට විසිය යුතුය. මධ්‍යමයා පැමිණි කෙනකු ලවාම එතැන හෙළිපෙහෙළිකරවා ගැනීමට සුදුසු වේ, මෘදුකයා විසින් විහාරයෙහි වසන සාමණේරයන් කැඳවා පිරිසුදු කරවා, බිම සමකරවා ප්‍රාකාරයකින්

වටකරවා දෙරක් යොදවාගෙන විසිය යුතුය. පූජා උත්සව දිනයන්හි රුක්ඛමූලිකයා විසින් එහි නොහිඳ මුවහවූ වෙන ස්ථානයෙක්හි හිඳියයුතුය. මේ තිදෙනාගේම ධූතාංගය සෙවිලිකළ ගෙයක වාසයකළ කෙණෙහිම බිඳේ. සෙවිලිකළ ගෙයක්තුළ දැන දැන අරුණු නැංවූ කෙණෙහියයි අංගුත්තරභාණකයෝ කියති. මේ මෙහි භේදයයි. ආනිසංස මෙසේය: 'රුක්ඛමූල සේනාසනය නිසා පැවිදිබව පවතී'(1)යයි කී හෙයින් නිස්සයට අනුරූපවූ ප්‍රතිපත්ති ඇතිබවය, 'අගයෙන් අඩුවූද, සුලබවූද ඒවා නිරවද්‍ය වේ'(2)යයි භාග්‍යවතුන්වහන්සේ විසින් පසස්නාලද ප්‍රත්‍යය වීමය, නිරන්තරයෙන් ගස්කොලන් වෙනස්වන අයුරු දැකීමෙන් අනිත්‍ය සංඥව උපදින බවය, සේනාසන කෙරෙහි මසුරුකම (ගිජුබව) හා නවකම්හි ඇලීමක් නැතිබවය, අල්පේච්ඡතාදී ගුණයන් හා සමග සැසඳෙන පැවතුම් ඇති බවය යන මේය.

වණ්ණිතො බුද්ධසෙට්ඨෙන නිස්සයොති'ච භාසිතො
නිවාසො පවිවිත්තස්ස රුක්ඛමූලසමො කුතො,

ආවාසමච්ඡෙරහරෙ දෙවතාපරිපාලිතෙ
පවිවිත්තෙ වසන්තො හි රුක්ඛමූලම්හි සුබ්බතො,

අභිරත්තානි නීලානි පණ්ඩූනි පතිතානි ච
පස්සන්තො තරුපණ්ණානි නිච්චසඤ්ඤං පනූදති.

තස්මා හි බුද්ධදායජ්ජං භාවනාභිරතාලයං
විවිත්තං නාතිමඤ්ඤෙය්‍ය රුක්ඛමූලං විචක්ඛණො.

බුදුවරයන් විසින් වර්ණනා කරනලද නිශ්‍රයයි කියනලද රුක්ඛමූලය හා සමානවූ නිවෙස්නක් විවේකී ජනයාහට වෙන කොයින්ද?

ආවාස කෙරෙහි මසුරු (ගිජු) බව දුරුකරන, දෙවියන් විසින් ආරක්‍ෂා කරනලද, විවේකීවූ රුක්මුල්හි වසනුයේ, මනාව්‍රත ඇත්තේ,

ඉතා රතුවූද, නිල්වන්වූද, පඬුවන්වූද, බිම වැටුණාවූද තුරුපත් දකිනුයේ නිත්‍යසංඥව අත් හරියි.

(1) විනය, මහාවග්ග, මහාඛ. Ain i 58

(2) අං. නි. චතුක්ක නි. Aii 26

එහෙයින් තුවණැත්තේ බුදුන්ගෙන් දයාදකොට ලැබුණු භාවනානුයෝගීන්හට නිවෙස්වූ විවේකීවූ රුක්ඛමූලය සුලුකොට නොතකන්නේය.

මේ රුක්ඛමූලිකාංගයෙහි සමාදන-විධාන-ප්‍රභේද-භේද-ආනිසංසයන් පිළිබඳ වර්ණනායි.

## අබ්භොකාසිකාංගයද,

'ඡන්නඤ්ච රුක්ඛමූලඤ්ච පටික්ඛිපාමි, අබ්භොකාසිකඞ්ගං සමාදියාමි (සෙවිලිකළ ගෙයද, රුක්මූලද පිළිකෙව් කරමි, අබ්භොකාසිකාංගය සමාදන් වෙමි) යන මේ දෙපාඨයෙන් එක් පාඨයෙකින් සමාදන්වීම සිදුවේ. එම අබ්භොකාසිකයා විසින් වනාහි දහම් ඇසීම පිණිස හෝ පොහෝ කිරීම පිණිස හෝ උපෝසථාගාරයට පිවිසීම වටනේය. එසේ පිවිසි කල වැසි වසී නම් වසිද්දී නොනික්ම වැසි නැවතුණු පසු යායුතුය, බොජුන්හලට හෝ ගිනිහලට පිවිස වත්පිළිවෙත් කිරීමට හෝ, බොජුන්හලෙහි වැඩිමහලු භික්ෂූන් බතින් පිළිවිසීමට හෝ, දහම් කියවාදෙන්නහු විසින් හෝ කියවාගන්නහු විසින් සෙවිලිකළ ගෙයක් තුළට පිවිසීම වටී. පිටත නොපිළිවෙළට තබනලද ඇඳ පුටු ආදියක් ඇතුළත තැබවීම පිණිස ගෙයක් තුළට පිවිසීමටද වටී. ඉදින් මග බැස යනවිට වැඩිමහලු භික්ෂූන්ගේ පිරිකර ගන්නාලද නම්, වැසිවසිනවිට අතරමග පිහිටි ශාලාවකට පිවිසීම වටී. ඉදින් කිසිවක් ගෙන නැත්නම්, ශාලාවෙහි සිටිමි'යි යුහුගමනින් නොයායුතුය, පියවිගමනින් ගොස් පිවිස වැසි නවතින තෙක් සිට යායුතුය. මේ මෙහි පිළිපදනා විධියි. රුක්ඛමූලිකයාහටද මෙම නයයි. ප්‍රභේද වශයෙන් වනාහි මොහුද ත්‍රිවිධ වේ. එහි උත්කෘෂ්ටයා විසින් ගසක් හෝ පර්වතයක් හෝ ගෙයක් ඇසුරුකොට විසීම නොවටී. අභ්‍යවකාශයෙහිම සිවුරු කුටියක් තනාගෙන විසියයුතුය. මධ්‍යමයා විසින් ගසක්, පර්වතයක් හෝ ගෙයක් ඇසුරුකොට ඇතුළට නොපිවිස වසනු යෝග්‍යවේ. මෘදුකයාහට දියහිමි නොසුන් (කටාර නොකෙටූ) ගල්ලෙන්ද, කොළ අතු යෙදූ මඩුද, තලපගැසූ රෙදි (ඉටිරෙදි)ද, කෙත් රක්නවුන් විසින් හැරදමනලද පැල්පත්ද යොද ගැනීම යෝග්‍යවේ. මේ තිදෙනාගේම ධුතාංගය, වාසය පිණිස සෙවිලිකළ ගෙයකට හෝ රුක්මූලකට පිවිසි කෙණෙහිම බිඳේ. දන දන එවන් තැනෙක අරුණු නැංවූ පමණෙකින්යි අංගුත්තරභාණකයෝ කියති. මේ මෙහි භේදයයි. මෙහි ආනිසංස මෙසේය: ආවාස පළිබොධ නැති බවය, ථිනමිද්ධනීවරණ පහවන බවය, 'භික්ෂූහු ඇලුම් නැතිව හැසිරෙන නිවෙස්

නැති මුවන් මෙන් විහරණය කෙරෙති'යි යන මේ ප්‍රශංසා වචනයට යෝග්‍යවන බවය, ඇලුම් රහිත බවය, සිවුදිගට සාධාරණ බවය, අල්පේච්ඡතාදී ගුණයනට අනුලෝමවූ පැවතුම් ඇති බවය යන මෙයි.

අනගාරිකභාවස්ස අනුරූපෙ අදුල්ලභෙ
තාරාමණිවිතානම්හි චන්දදීපප්පභාසිතෙ

අබ්භොකාසෙ වසං භික්ඛු මිගභූතෙන චෙතසා
ථිනමිද්ධං විනොදෙත්වා භාවනාරාමතං සිතො

පවිවේකරසස්සාදං න චිරස්සෙව වින්දති
යස්මා තස්මා හි සප්පඤ්ඤො අබ්භොකාසෙ රතො සියා

අනගාරිකභාවයට යෝග්‍යවූ, දුර්ලභ නොවූ, තරු නමැති මිණියෙන් යුත් වියන් ඇති, සඳ නමැති පහනින් ආලෝකවත්වූ,

අභ්‍යවකාශයෙහි සිතින් මුවකු බවටපත්ව වසන භික්ෂුතෙමේ ථිනමිද්ධය පහකොට භාවනායෝගයෙහි යෙදුණේ,

යම් හෙයකින් නොබෝකලකින්ම විශිෂ්ට විවේකරසාස්වාදය විඳින්නේද, එහෙයින් නුවණැත්තේ අභ්‍යවකාශයෙහි ඇලුනෙක් වන්නේය.

මේ අබ්භොකාසිකංගයෙහි සමාදන-විධාන-ප්‍රභේද-භේද-ආනිශංසයන් පිළිබඳ වර්ණනායි.

## සොසානිකංගයද.

න සුසානං පටික්ඛිපාමි, සොසානිකඞ්ගං සමාදියාමි (සොහොන් නොවන තන්හි විසීම පිළිකෙව් කරමි, සොසානිකංගය සමාදන්වෙමි) යන මේ දෙපාඨයෙන් එකෙකින් සමාදන්වීම සිදුවේ. ඒ සෝසානිකයා විසින්, මිනිසුන් ගමක් පිහිටුවා 'මේ සොහොනය'යි වෙන්කළ පමණින් එය සොහොනැයි ගෙන නොවිසිය යුතුය. මළ සිරුරක් දවා නැතිනම් එය සොහොනක් නම් නොවේ. දවනලද තැන් පටන්, ඉදින් දොළොස් හවුරුද්දක් හැරදමන ලදුයේ නමුදු එය සොහොනක්ම වේ. එහි වෙසෙන්නහු විසින් සක්මන්මලු මණ්ඩප ආදිය තනවා, ඇඳ පුටු ආදිය පනවා, කැම් බීම් එළවාගෙන දහම් දෙසමින් නොවිසිය යුතුය. මේ වනාහි ගරුකවූ ධුතංගයකි. එහෙයින් උපන් උවදුරු නසනු පිණිස ගණදෙටු තෙරුන්හට

හෝ රජු විසින් පත්කොට ඇති නිලධාරීන්හට දන්වා ප්‍රමාදයෙන් තොරව විසිය යුතුය. සක්මන් කරමින් ඔබ මොබ යනවිට අඩනෙතින් සොහොන බලබලා සක්මන් කළයුතුය. සොහොනට යන කල්හිද මහමග බැස නොගොස් අප්‍රකට අතුරු මඟෙකින් යායුතුය. දහවල්හි මං සලකුණු නිශ්චය කළයුතුය, මෙසේ රැයෙහිදී එම සලකුණු ඔහුට බිය උපදවන්නේ නොවේ. මෙසේ රැයෙහිදී අමනුෂ්‍යයන් හඬ හඬා ඇවිදිනත් ඔවුනට කිසිවකින් නොගැසිය යුතුය. එක් දිනයකුදු සොහොනට නොගොස් සිටිනු නොවටනේය. මැදියම සොහොනෙහි ගෙවා අළුයම පෙරළා යනු වටීයයි අංගුත්තරභාණකයෝ කියති. අමනුෂ්‍යයනට ප්‍රියවූ තල, පිටි, උඳුබත්, මත්ස්‍යමාංස, කිරි, තෙල්, සකුරු ආදී කැවිලි පෙවිලි නොගතයුතුය, කුල ගෙවලට නොපිවිසිය යුතුය, යන මේ මෙහි පිළිපදනා විධියි. ප්‍රභේද වශයෙන් මොහුද ත්‍රිවිධ වේ. එහි උත්කෘෂ්ටයා විසින් නිරතුරු දැවීම්, නිරතුරු මළ සිරුරු දැමීම්, නිරතුරු හැඬීම් වැලපීම් ඇති තැනෙකම විසිය යුතුය. මධ්‍යමයාහට මේ තුනෙන් එකක් හෝ ඇති තැනක් සුදුසු වේ. මෘදුකයාහට කියනලද නයින් සොහොන් ලකුණු පමණක් ඇති තැනක් වුවද සෑහේ. මේ තිදෙනාගේම ධුතංගය නොසොහොන් තැනෙක විසීමෙන් බිඳේ. සොහොනට නොගොස් සිටි දවස්හියයි අංගුත්තර භාණකයෝ කියති. මේ මෙහි භේදයයි. ආනිසංස වනාහි මෙසේයි: මරණය පිළිබඳ සිහිය ලැබෙන බවය, අප්‍රමාද විහරණ ඇතිබවය, අශුභ නිමිති පිළිබඳ අවබෝධය ලැබෙන බවය, කාමරාගය පහවීමය, නිරතුරුව කයෙහි ස්වභාවය දක්නට ලැබීමය, සංවේග බහුල බවය, ආරෝග්‍යමද ආදිය පහවන බවය, බිය බියකරු දෙය ඉවසියහැකි බවය, අන්‍යයන්ගේ ගෞරව සම්මානයට භාජනවන බවය, අල්පේච්ඡතාදියට අනුරූප පැවතුම් ඇති බවය යන මේයි.

සොසානිකඤ්හි මරණානුසතිප්පභාවා
නිද්දගතම්පි න ඵුසන්ති පමාදදෝසා
සම්පස්සතො ච කුණපානි බහූනි තස්ස
කාමානුරාගවසගම්පි න හොති චිත්තං.

සංවෙගමෙති විපුලං න මදං උපෙති
සම්මා අථො නිබ්බුතිමෙසමානො
සොසානිකඞ්ගමිති නෙකගුණාවහත්තා
නිබ්බාණනින්නහදයෙන නිසෙවිතබ්බන්ති.

නිද්‍රාගතවුවත් ඒ සෝසානිකයාහට ප්‍රමාද දෝෂයෝ සිඩ නොවෙති. බොහෝ මළ සිරුරු දක්නා ඔහුගේ සිත කාමරාගයෙහි වසඟයට නොයන්නේය.

(සෝසානික තෙමේ) නොමඳ සංවේගයට පත් වනුයේ (මාන) මදයට නොපැමිණෙන්නේය, තවද මැනවින් නිවන් සොයමින් (සම්‍යග්ව්‍යායාමයෙහි) යෙදෙන්නේය, මෙසේ නොයෙක් ගුණ ගෙනදෙන හෙයින් නිවණට නැඹුරු හදවත් ඇත්තහු විසින් සෝසානිකාංගය වෙසෙසින් සේවනය කටයුතුය.

මේ සෝසානිකාංගයෙහි සමාදන-විධාන-ප්‍රභේද-භේද-ආනිසංසයන් පිළිබඳ වර්ණනායි.

## යථාසන්ථිකාංගයද

සේනාසනලොලුප්පං පටික්ඛිපාමි, යථාසන්ථිකඞ්ගං සමාදියාමි (සෙනසුන් කෙරෙහි ලොල් බව පිළිකෙව් කරමි, යථාසන්ථිකාංගය සමාදන් වෙමි) යන මේ දෙපාඨයෙන් එකකින් සමාදන්වීම සිද්ධවේ. එම යථාසන්ථිකයා විසින් තමාහට යම් සෙනසුනක් 'මෙය ඔබට පැවරේය'යි පමුණුවන ලදනම් එයින්ම තෘප්ත වියයුතුය. අනෙකකු නොනැගිටවිය යුතුය. මේ මෙහි පිළිපදනා විධියි. ප්‍රභේද වශයෙන් වනාහි මොහුද ත්‍රිවිධ වේ. එහි උත්කෘෂ්ට තෙමේ තමාහට පැමිණි සේනාසනය දුරද? ඉතා ළඟද? අමනුෂ්‍ය සර්ප ආදීන්ගෙන් උපද්‍රව ඇත්ද? උණුසුම්ද? සිහිල්දැ'යි විමසන්නට නොහැකිවේ, මධ්‍යම තෙමේ විමසන්නට හැකිවේ, එහෙත් ගොස් බලන්නට නොහැකිවේ. මෘදුක තෙමේ තමාට නොරිසි නම් අනෙකක් ගන්නට හැකිවේ. මේ තිදෙනාගේම ධුතාංගය සෙනසුන් කෙරෙහි ලොල්බවක් උපන් කෙණෙහිම බිඳේ. මේ මෙහි භේදයයි. ආනිසංස මෙසේයි: 'යමක් ලැබිණි නම්, එයින් සතුටු වියයුතුය' යන අවවාදය පිළිපදනා බවය, සබ්‍රම්සරුන් කෙරෙහි හිත කැමතිබවය, හීනය ප්‍රණීතය යන විකල්පය අත් හැරීමය, වාදවිවාදයෙන් වැලකීමය, අතිච්ඡතාවට දොර වැසීමය, අල්පේච්ඡතාදියට අනුකූල පැවතුම් ඇතිබවය යන මේයි.

යං ලද්ධං තෙන සන්තුට්ඨො යථාසන්ථිකො යති
නිබ්බිකප්පො සුඛං සෙති තිණසන්ථරකෙසු පි.

න සො රජ්ජති සෙට්ඨම්හි හීනං ලද්ධා න කුප්පති
සබ්‍රහ්මචාරීනවකෙ හිතෙන අනුකම්පති.

තස්මාරියසතාචිණ්ණං මුනිපුංගවවණ්ණිතං
අනුයුඤ්ජෙථ මෙධාවී යථාසන්ථතරාමතං.

යථා සන්ථතික භික්ෂු තෙමේ ලදදෙයින් සතුටුවූයේ විකල්ප පිළිබඳ අපේක්ෂා රහිත වූයේ තණඇතිරිවල පවා සුවසේ හෝනේය. හේ තෙමේ ප්‍රණීත දෙය කෙරෙහි නොඇලේ, හීනවූ යමක් ලැබ නොකිපේ, නවක සබ්‍රම්සරුන් කෙරෙහි හිතවත්ව අනුකම්පා කරයි.

එහෙයින් නුවණැත්තේ සියගණන් ආර්යයන් විසින් පුරුදු කරනලද, මුනි (පුංගවවූ) උතුමන් විසින් වර්ණනා කරනලද යථාසන්ථතිකංගයෙහි යෙදෙන්නේය.

මේ යථාසන්ථතිකංගයෙහි සමාදන-විධාන-ප්‍රභේද-භේද-ආනිසංසයන් පිළිබඳ වර්ණනායි.

## නෙසජ්ජිකංගයද

"සෙය්‍යං පටික්ඛිපාමි, නෙසජ්ජිකඞ්ගං සමාදියාමි (වැතිරීමේ ඉරියව්ව පිළිකෙව් කරමි. නේසජ්ජිකංගය සමාදන්වෙමි) යන මේ දෙපාඨයෙන් එකෙකින් සමාදන්වීම සිදුවේ. ඒ නේසජ්ජික යතිවරයා විසින් රාත්‍රියෙහි තුන් යමින් එක් යමක් නැගිට සක්මන් කළයුතුය. ඉරියව් අතුරින් වැදහෙවීම පමණක් නොවටී. මේ මෙහි පිළිපදනා විධියි. ප්‍රභේද වශයෙන් වනාහි මොහුද, ත්‍රිවිධවේ. එහි උත්කෘෂ්ටයාහට පිටිඇඳි සහිත අසුන් හෝ, පිළියෙන් කළ අකවටු (දෙදණ හා ඉහටිය වටා ඔතා ගෙන හිඳීම) හෝ ආයොගපට්ට නම් එල්ලී හිඳිනු සඳහා යොදගනු ලබන පටි හෝ යෝග්‍ය නොවේ. මධ්‍යමයාහට මේ තුනෙන් එකක් පමණක් යෝග්‍යවේ. මෘදුකයාහට වනාහි පිටිඇඳි ද, පිළියෙන් කළ අකවටුද, එල්ලී හිඳින පටිද, මෙට්ටද පසහිත් යුත් පුටුද, සතහිත් යුත් පුටුද යෝග්‍ය වේ. පසහපුටු නම් පිටිඇන්දක් සහිත පාසතරක් ඇති පුටුය. සතහපුටු නම් පිටි ඇන්දක් හා දැල ඇඳි සහිත පුටුය. එම සතහපුටුව පීඨාභය තෙරුන් උදෙසා කළාහුය. තෙරණුවෝ අනාගාමීව පිරිනිවියහ. වැද හෙවීම කළ පමණින් මේ තිදෙනාගේම ධුතංගය බිඳේ. මේ මෙහි භේදයයි. ආනිසංස මෙසේය: 'වැදහෙවීමේ සුවය, ඇලයෙන් ඇලයට වැද හෙවීමේ සුවය, නිදි සුවය, යන මෙහි යෙදී වාසය කරයි.'[1] යනුවෙන්

(1) ම. නි. චෙතොඛිලසුත්ත Mi 102.

කියනලද සිත් බැම් නසන බවය, සියලු කමටහන්වලට අනුකූල වනබවය, පහන් දනවන ඉරියව් ඇතිබවය, වීර්යාරම්භයට අනුකූල වනබවය, සම්‍යක්ප්‍රතිපත්ති වැඩෙනබවය යන මේයි.

ආභුජිත්වාන පලලඞ්කං පණිධාය උජුං තනුං
නිසීදන්තො විකම්පෙති මාරස්ස හදයං යති

සෙය්‍යසුඛං මිද්ධසුඛං හිත්වා ආරද්ධවීරියො
නිසජ්ජාභිරතො භික්ඛු සොභයන්තො තපොවනං

නිරාමිසං පීතිසුඛං යස්මා සමධිගච්ඡති
තස්මා සමනුයුඤ්ජෙය්‍ය ධීරො නෙසජ්ජිකං වතන්ති.

සිරුර සෘජුව පිහිටුවාගෙන බද්ධපර්යංකයෙන් හිඳින භික්ෂුතෙමේ මාරයාගේ හෘදය දෙදරවයි.

ඇරඹි වීර්ය ඇති භික්ෂු තෙමේ වැද හෙවීමේ සුවය, නිදි සුවය හැර නේසජ්ජිකංගයෙහි තියැලියේ තපෝවනය හොබවනුයේ,

යම් හෙයකින් නිරාමිස ප්‍රීතිසුඛයට පැමිණෙන්නේද, එහෙයින් නුවණැත්තේ නේසජ්ජික ව්‍රතයෙහි යෙදෙන්නේය.

මේ නේසජ්ජිකඞ්ගයෙහි සමාදන-විධාන-ප්‍රභේද, භේද-ආනිසංසයන් පිළිබඳ වර්ණනායි.

ඉක්බිති,

කුසලත්තිකතො චෙව ධුතාදීනං විභාගතො
සමාසව්‍යාසතො චාපි විඤ්ඤාතබ්බො විනිච්ඡයො.

කුශල, අකුශල, අව්‍යාකෘත යන ත්‍රිකය වශයෙන්ද, ධුත, ධුතවාද ආදී විභාග වශයෙන්ද, සමස්ත වශයෙන් හා විග්‍රහ වශයෙන්ද මෙහි විනිශ්චයය දතයුතුය යන

මේ ගාථාවෙහි දක්වන ලද ආකාරයෙන් විස්තරවර්ණනාව වන්නේය. එහි **කුසලත්තිකතො** යනු, සියලුම ධුතංගයෝ ශෛක්‍ෂ්‍ය, පෘථග්ජන, ක්‍ෂීණාශ්‍රව වශයෙන් කුශලද, අව්‍යාකෘතද වන්නේය. අකුශල ධුතංගයෙක් නැත. යමෙක් වනාහි 'පාපිච්ඡො ඉච්ඡාපකතො ආරඤ්ඤිකො හොති' (පවිටු අදහස් ඇත්තේ තෘෂ්ණාවෙන් මඩනා ලද්දේ ආරණ්‍යක

වේද)[1] යන ආදිය කියනලද හෙයින් අකුශල ධුතංගයෙක්ද ඇතැ'යි කියන්නේ නම්, ඔහුට මෙසේ කිවයුතුය. 'අකුසල් සිතින් අරණ්‍යයෙහි නොවෙසෙතැ'යි නොකියමු, යමකුට අරණ්‍යය වාසස්ථානය වේනම් හේ ආරණ්‍යකයෙකි, ඔහු පවිටු අදහස් ඇත්තකු හෝ අල්පේච්ඡයකු විය හැකිය, මොහු වනාහි ඒ ඒ ධුතංගය සමාදන්වීමෙන් සොල්වාලූ කෙලෙස් ඇති හෙයින් ධුත නම්වූ භික්ෂුවගේ අංගයෝය, කෙලෙස් සොල්වාලන හෙයින් 'ධුත' යන වහර ලැබූ ඥාණය මොවුනට අංග වෙති'යි හෝ ධුතංගනම් වෙති, නැතහොත් ධුතවූවෝද, ප්‍රතිපක්ෂවූ කෙලෙස් සොල්වාලන හෙයින් ප්‍රතිපත්තියට අංග වූවෝද මොවුහු වෙති'යි ධුතංගයයි කියන ලද්දහ. අකුසල හේතුවෙන් කිසිවෙක් 'ධුත' නම් නොවේ. යමකුට මේ අකුශල අංගයෝ වෙත්ද, හේ තෙමේ අකුශලවූ කිසිවක් ධුනනය නොකරයි. ධුනනය (සොල්වාලීම) අංගයයි ගෙන එම අකුශල අංගයෝ ධුතංගයයි කියනු නොලබති, අකුශලය චීවර ලෝභාදිය ධුනනය නොකරයි, ප්‍රතිපත්තියට අංගද නොවේ, එහෙයින් අකුශලධුතංගයෙක් නැතැයි යන මෙය මනාකොට කියන ලද්දෙකි. යම් (අභයගිරිවැසි) කෙනෙකුන්හට කුශලත්‍රික විනිර්මුක්ත ධුතංගයෙක් වේද, ඔවුනට අර්ථ වශයෙන් ධුතංගයෙක් නැත්මය. අවිද්‍යමානවූයේ කවරක් සොල්වා හරිති'යි ධුතංග නම් වන්නේද? ධුතගුණයන් සමාදන්ව පවතීය යන වචන විරෝධයද ඔවුන් වෙත පැමිණේ. එහෙයින් ඒ (අභයගිරික) මතය නොපිළිගත යුතුය. කුශලත්‍රික වශයෙන් කැරෙන වර්ණනාව මෙතෙකි.

**ධුතාදීනං විභාගතො** යනු, 'ධුත' නම් වනුයේ කවරෙක්දැයි දතයුතුය, ධුතවාද යනු කිමෙක්දැයි දතයුතුය. ධුතධර්මයන් හඳුනාගත යුතුය. ධුතංගසේවනය කවරකුට සප්පායවේදැ'යි දතයුතුය. එහි **ධුත** යනු, කෙලෙස් සොල්වා හළ පුද්ගලයා හෝ කෙලෙස් සොල්වා හරින ධර්මය හෝ වේ. **ධුතවාද** යන මෙහි වනාහි, ධුතවාදී නොවන ධුතයෙක් ඇත, ධුත නොවන ධුතවාදියෙක් ඇත, ධුතද නොවූ ධුතාවාදීද නොවූවෙක් ඇත, ධුතද වන ධුතවාදීදවන කෙනෙක්ද ඇත. එහි යමෙක් තෙමේ ධුතංග බලයෙන් තමාගේ කෙලෙස් සොල්වා හළේද, බක්කුල තෙරුන් මෙන් ධුතංගයන් පිළිබඳව අනුන්හට අවවාද නොකෙරේද, අනුශාසනා නොකෙරේද, මොහු ධුතවාදී නොවන ධුතයෙකි. කියනලද මැයි, 'මේ ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ 'ධුත' වෙති, ධුතවාදී නොවෙති.' යමෙක් වනාහි ධුතංගයෙන් තමාගේ කෙලෙස් සොල්වා නොහළේද, උපනන්ද තෙරුන් මෙන් හුදෙක් ධුතංගයන් ගැන අනුනට අවවාද අනුශාසනා

(1) අං. නි. පඤ්චක නි. A iii 219

කෙරේද මොහු ධූත නොවන ධූතවාදියෙකි. කියන ලද මැයි: මේ ආයුෂ්මත් උපනන්ද තෙරණුවෝ ධූත නොවෙති, ධූතවාදී වෙති.' යමෙක් වනාහි ලාලුදයී තෙරුන් මෙන් දෙකින්ම තොර වූයේද හේ තෙමේ ධූත නොවන්නකු මෙන්ම ධූතවාදීද නොවන්නෙකි. කියන ලදමැයි: 'මේ ආයුෂ්මත් ලාලුදයී තෙරණුවෝ ධූතද නොවෙති, දූතවාදීද නොවෙති.' යමෙක් වනාහි ධම්මසේනාපති සැරියුත් තෙරුන් මෙන් දෙකින්ම යුතුවූයේද, මේ තෙමේ ධූතද ධූතවාදීද වූවෙකි. කියනලද මැයි: 'මේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ධූතද වෙති, ධූතවාදීද වෙති.'

**ධූතධම්මා වෙදිතබ්බා** යනු, අල්පේච්ඡතාව, සන්තුෂ්ටතාව සල්ලේඛතාව (කෙලෙස් මැඩීමෙහි යෙදුණු බව), පවිවෙකතා (විවේකී බව) ඉදමට්ඨිතා (මෙයම ප්‍රයෝජනකොට ඇතිබව) යන මේ ධූතංග චේතනාවට පරිවාරවූ ධර්මයෝ 'අප්පිච්ඡං යෙව නිස්සාය'(1) යන ආදිය කී හෙයින් ධූතධම්ම නම් වෙති. එහි අල්පේච්ඡතාව හා සන්තුෂ්ටතාව ආලෝභයෙහි ඇතුළත් වේ, සල්ලේඛතාව හා පවිවෙකතාව අලෝභ අමෝහ යන ධර්ම දෙකෙහිම ඇතුළත් වේ. ඉදමට්ඨිතා යනු ඥානයමැයි. එහි අලෝභයෙන් ප්‍රතිපක්ෂ වස්තූන් කෙරෙහි ලෝභයද, අමෝහයෙන් එම වස්තූන් කෙරෙහිම වූ ආදිනවයන් මුවහ කරන මෝහයද දුරන් කරයි. අලෝභයෙන්ම අනුඥාත වස්තූන් පරිහරණය කිරීම් වශයෙන් පවත්නා කාමසුඛානුයෝගයද, අමෝහයෙන් ධූතංග විෂයෙහි අතිසල්ලේඛ වශයෙන් පවත්නා අත්තකිලමථානුයෝගයද දුරන් කරයි. එහෙයින් මේ ධර්මයෝ ධූතධම්මයයි දතයුතුය.

**ධූතඞ්ගානි වෙදිතබ්බානි** යනු, තෙළෙස් ධූතංගයෝ-පංසුකූලිකංගය -පෙ-නෙසජ්ජිකංගයයි යන තෙළෙස් ධූතංගයෝ දතයුත්තාහ. ඒ ධූතංගයෝ අර්ථව වශයෙන්ද ලක්ෂණාදිවශයෙන්ද කියන ලද්දහුමය. **කස්ස ධූතඞ්ගසේවනා සප්පායා?** යනු, කවරකුහට ධූතංගසේවනය ශුභඵලදයක වේදයි යතහොත්, රාගචරිතයාට හා මෝහචරිතයාහටයි. කවර හෙයින්දයත්, ධූතංග සේවනය වනාහි දුක් සහිත ප්‍රතිපදවක් මෙන්ම කෙලෙස් මඩින විහරණයක්ද වේ, දුක්සහිත ප්‍රතිපදවක් වනහෙයින් රාගය සන්සිදේ. කෙලෙස් මැඩීමේ උපායක් වනහෙයින් එහි අප්‍රමාද වූවහුගේ මෝහය පහවීයයි. මෙහි ආරඤ්ඤිකංග, රුක්ඛමූලිකංග යන දෙක සේවනය කිරීම දොසචරිතයාහට ශුභඵලදයක වේ. එහි වනාහි ගැටීමෙකින් තොරව වාසය කරන ඔහුගේ ද්වේෂය සන්සිදේ. මේ ධූතාදීන් පිළිබඳ විභාග වශයෙන් කරනලද විස්තරයයි.

(1) අං. නි. පඤ්චක නි. A iii 219.

**සමාසව්‍යාසතො** යනු, මේ ධුතංගයෝ සමස්ත වශයෙන් මූලික අංග තුනක්ද, අමිශ්‍ර අංග පසක්දැයි අටක් වේ. එහි සපදානචාරිකංග, ඒකාසනිකංග, අබ්භොකාසිකංග යන මේ තුන මූලිකාංගයෝ වෙති, සපදානචාරිකංගය රක්නේ පිණ්ඩපාතිකාංගයද රක්නේ වේ, ඒකාසනිකංගය රක්නහුට පත්තපිණ්ඩිකංග, ඛලුපච්ඡාභත්තිකංග යන දෙකද පහසුවෙන් රැකියහැකි වේ, අබ්භොකාසිකංගය රක්නහුට රුක්ඛමූලිකංග, යථාසන්‍ථතිකංග යන දෙකෙහි අමුතුවෙන් රැකියයුතු කිමෙක් නම් ඇත්ද? මෙසේ මේ තුන ශීර්ෂාංග (හෙවත් මූලිකාංග) නම් වේ. ආරඤ්ඤිකංග, පංසුකූලිකංග, තෙචීවරිකංග, නෙසජ්ජිකංග, සොසානිකංග යන මේ අමිශ්‍ර අංගයන්ද සමග අටක්ම වේ. යළිදු දෙකක් සිවුරු පිළිබඳ වේ, පසක් පිණ්ඩපාතය පිළිබඳ වේ, පසක් සේනාසන පිළිබඳ වේ. එකක් වීර්යය පිළිබඳ වේ. මෙසේ සතරක් වේ. එහි නෙසජ්ජිකංගය වීර්යය හා සමග යෙදේ. ඉතිරිය පැහැදිලි වේමැයි. යළි සියල්ලම නිශ්‍රය වශයෙන් ප්‍රත්‍යයනිශ්‍රිතවූ දෙළොසක්ද වීර්යය සන්නිශ්‍රිතවූ එකක්දැයි දෙආකාර වේ. සේවනය කළයුතු ධුතංගය, නොකළයුතු ධුතංගයයිද දෙආකාරවේ. යමකුට ධුතංගයක් සේවනය කරනවිට කමටහන් වැඩේනම්, ඔහු විසින් එය සේවනය කළයුතුය, යමකුට එය පිරිහේනම් ඔහු විසින් එය සේවනය නොකළයුතු වන්නේය, යමකුට වනාහි සේවනය කරනවිටද නොකරන විටද වැඩේනම්, නොපිරිහේනම්, ඔහු විසින්ද පශ්චිමජනතාව කෙරෙහි අනුකම්පාවෙන් සේවනය කළයුතු වන්නේය, යමකුට සේවනය කරන විටද, නොකරන විටද කමටහන් නොවැඩේ නම්, ඔහු විසින්ද මතු වාසනා පිණිස සේවනය කළයුතු වන්නේමය. මෙසේ සෙවිය යුතුද නොසෙවියයුතුදැයි දෙ-ආකාර වන නමුදු චේතනා වශයෙන් එක්ආකාර වන්නේය. ධුතංගසමාදාන චේතනාව එකක්ම වෙති'යි 'යා චෙතනා තං ධුතඞගනති වදන්ති' (යම් චේතනාවක් වෙතොත් එයම ධුතංගයයි කියති)යි අටුවායෙහිද කියන ලදි.

ප්‍රත්‍යෙක වශයෙන් වනාහි භික්ෂූන් උදෙසා තෙළෙසක්ද, භික්ෂුණීන් උදෙසා අටක්ද, සාමණේරයන් උදෙසා දෙළොසක්ද, පුහුණුවන සාමණේරීන් උදෙසා සතක්ද, උපාසක උපාසිකාවන් උදෙසා දෙකක්දැයි දෙසාළිසක් වේ. ඉදින් අබ්භොකාසයෙක්හි ආරඤ්ඤිකංගයෙන් යුක්තවූ සුසානයක්ද ඇත්නම්, එක්ම භික්ෂු කෙනකුට එක් වරම සියලු ධුතංගයන් දැරියහැකි වේ. භික්ෂුණීන්හට වනාහි ආරඤ්ඤිකංගයද, ඛලුපච්ඡාභත්තිකංගයද යන දෙක ශික්ෂාපදයෙන්ම පිළිකෙව් කරනලදි. අබ්භොකාසිකංග, රුක්ඛමූලිකංග, සෝසානිකංග යන තුන දැරීම අපහසු වන්නේය. භික්ෂුණීන් විසින් දෙවැන්නියක් නොමැතිව වසනු නොවටනේය. මෙවන් තැනෙක

සමාන සිතුම්පැතුම් ඇති දෙවැන්නියක් ලැබීම උගහටය, ඉදින් ලබන්නී නමුදු සංසට්ඨවිහාරතායෙන් නොමිදෙන්නීය, එසේ වූකල යමක් පිණිස ධූතංගසේවනය කරනු ලැබේද එම අර්ථය ඇයට නොසැපයෙන්නේය, මෙසේ පරිහරණය කළ නොහැකිවන හෙයින් පසක් අඩුකොට භික්ෂුණීන් උදෙසා අටක්ම වෙතැයි දතයුතුය. මෙසේ කියනලද ධූතංගයන් අතුරෙන් තෙචීවරිකංගය හැර ඉතිරි දෙළොස සාමණේරයන් උදෙසාද, සතක් පුහුණුවන සාමණේරීන් උදෙසාද වන්නේයයි දතයුතුය. උවසුඋවැසියන් උදෙසා ඒකාසනික, පත්තපිණ්ඩික යන මේ අංග දෙක සුදුසුවන හෙයින්ද පුරනු හැකිවන හෙයින්ද ඒ දෙක පමණක් වේ. මෙසේ ප්‍රත්‍යෙක වශයෙන් දෙසාළිසක් වන්නේය. මේ සමාසව්‍යාස වර්ණනායි.

මෙතෙකින් "සිලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො" යන ආදී මේ ගාථාවෙහි ශීල සමාධි ප්‍රඥ මුඛයෙන් දේශනා කරන ලද විශුද්ධිමාර්ගයෙහි අල්පේච්ඡතා සන්තුෂ්ටතාදී ගුණයන් හේතුකොටගෙන යට කියනලද ශීලයෙහි පිරිසුදුබව වේද, එම ගුණයන්ගේ සම්පාදනය පිණිස සමාදන් වියයුතු ධූතංගයන් පිළිබඳ කථාව කියන ලද්දේ වේ.

**සත්පුරුෂයන්ගේ ප්‍රමෝදය පිණිස කරන ලද**
**විශුද්ධිමාර්ගයෙහි ධූතංගනිද්දේස නම්**
**දෙවන පරිච්ඡේදය සමාප්තයි.**

# 3. කම්මට්ඨානගහන නිද්දේසය

ඉක්බිති යම් හෙයකින් මෙසේ ධුතංගපරිහරණයෙන් සම්පාදිතවූ අල්පේච්ඡතාදී ගුණයෙන් පිරිසිදු කරනලද මේ ශීලයෙහි පිහිටියහු විසින්, "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං" යන වචනයෙන් චිත්ත ශීර්ෂයෙන් නිර්දිෂ්ට සමාධිය වැඩියයුතු වේද, එයද ඉතා සැකෙවින් දෙසනලද බැවින් දැනගැනීම පවා සුකර නොවේ, වැඩීම ගැන කියනු කිම? එහෙයින්, එය පිළිබඳ විස්තරයද, වැඩීමේ ක්‍රමයද, දක්වනු පිණිස මේ ප්‍රශ්න කිරීම වේ.

සමාධි යනු කිමෙක්ද? කවර අරුතෙකින් සමාධි නම් වේද? එහි ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨානයෝ කවරහුද? සමාධිය කී ආකාර වේද, එහි කිලුටුවීම කවරේද? පිරිසුදු වීම කවරේද? කෙසේ වැඩියයුතු වේද? සමාධි භාවනාවෙහි ආනිශංස කවරරේද?

මේ එහි විසඳීමයි: සමාධි යනු කිමෙක්ද'යි යනහොත්: සමාධිය බොහෝ ආකාර ඇත්තේ වේ, නොයෙක් ආකාර ඇත්තේය, ඒ සියල්ල පැහැදිලි කරනු වස් විසඳීම ආරම්භ කළහොත් එය අභිප්‍රේතාර්ථය සාධනය නොකරයි. එමතුද නොව, වික්ෂේපය පිණිස පවත්නේය. එහෙයින් මෙහි අභිප්‍රේතයම සලකා කුසල් සිතෙහි එකඟබව සමාධියයි පවසමු. කවර අරුතෙකින් සමාධියයි කියනු ලැබේදයත්, සමාධානාර්ථයෙන් සමාධි නම්වේ, මේ සමාධාන නම් කිමෙක්දයත්, එක් අරමුණෙක්හි චිත්ත චෛතසිකයන් සමසේද මනාසේද පිහිටුවීමැයි, තැබීමැයි කියනලදි. එහෙයින් යම් ධර්මයෙක අනුභසින් චිත්ත චෛතසිකයෝ එක් ආරමුණෙක්හි සමසේ මනාසේ නොවිසිර, නිරවුල්ව සිටිත්ද මෙය සමාධානයයි දතයුතුය. එහි ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨානයෝ කවරහුද? මෙහි වනාහි සමාධිය නොවිසිර සිටීම ලක්ෂණකොට ඇත්තේය. විසිරීම නැතිකරන බව රස හෙවත් කෘත්‍ය කොට ඇත්තේය. නොසැලීම මෙහි වැටහීම නොහොත් ආසන්න කාරණය කොට ඇත්තේය. 'සුඛිනො චිත්තං සමාධියති'[(1)]යි කී හෙයින් සුවය මෙහි පදට්ඨාන (පදනම)යි.

සමාධිය කී ආකාර වන්නේද? නොවිසිරීම් ලක්ෂණයෙන් එක්ම ආකාරවේ. උපචාර අර්පණා වශයෙන් දෙ-ආකාර වේ, එසේම ලෞකික ලෝකෝත්තර වශයෙන්ද, පීති සහිත, පීති රහිත වශයෙන්ද, සුඛසහගත උපේක්ෂාසහගත වශයෙන්ද, දෙආකාර වේ. හීන, මධ්‍යම, ප්‍රණීත වශයෙන්

---

(1) දී. නි. සාමඤ්ඤඵල සුත්ත. D i 73

තුන් ආකාර වේ. එසේම සවිතක්ක සවිචාරාදි වශයෙන්ද, පීතිසහගතාදී වශයෙන්ද, පරිත්ත, මහග්ගත, අප්පමාණ වශයෙන්ද තුන් ආකාර වේ. දුක්ඛපටිපද, දන්ධාභිඤ්ඤාදී වශයෙන්ද, පරිත්ත, පරිත්තාරම්මණාදී වශයෙන්ද, චතුඣ්ඣානාංග වශයෙන්ද, හානභාගියාදී වශයෙන්ද, කාමාවචරාදී වශයෙන්ද, අධිපති වශයෙන්ද, සිවු ආකාර වේ. පඤ්චකනය අනුව පංචඣ්ඣානාංග වශයෙන් පස් ආකාර වේ.

එහි එක් ආකාරවූ කොටස පැහැදිලි අරුත් ඇත්තේම වේ. දෙආකාර කොටසෙහි: අනුස්සති සයද, මරණසති උපසමානුස්සති, ආහාරෙ පටික්කූල සඤ්ඤා, චතුධාතුවවත්ථාන යන මේ කර්මස්ථානයන්ගේ වශයෙන් ලබනලද චිත්තයෙහි ඒකාග්‍රතාව, අර්පණා සමාධියට පෙරාතුව ඇතිවන සමාධිය, උපචාර සමාධියයි. 'පඨමස්ස ඣානස්ස පරිකම්මං පඨමස්ස ඣානස්ස අනන්තරපච්චයෙන පච්චයො'(1) (ප්‍රථමධ්‍යානය පිළිබඳ පරිකර්මය ප්‍රථමධ්‍යානයට අනන්තරප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යයවේ) යන ආදී වචනයෙන් පරිකර්මයට අනතුරුව යම් ඒකාග්‍රතාවක් වේනම්, එය අර්පණා සමාධියයි. මෙසේ උපචාර, අර්පණා වශයෙන් දෙආකාර වේ. දෙවන ද්විකයෙහි කාම, රූප, අරූප යන භූමිත්‍රය විෂයෙහි කුශල චිත්තෛකාග්‍රතාව ලෞකික සමාධියයි, ආර්යමාර්ගය පිළිබඳ ඒකාග්‍රතාව ලෝකෝත්තර සමාධියයි. මෙසේ ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙආකාර වේ. තුන්වන ද්විකයෙහි: චතුෂ්කනයෙහි (ධ්‍යාන සතරක් වශයෙන් ඇති නයෙහි) ප්‍රථම ද්විතීය ධ්‍යාන දෙකෙහිද, පංචකනයෙහි (ධ්‍යාන පසක් ලෙස ගැනෙන ක්‍රමයෙහි) ප්‍රථම ද්විතීය තෘතීය යන ධ්‍යාන තුනෙහිද ඇති වන ඒකාග්‍රතාව සප්පීතික (පීති සහිත) සමාධියයි, ඉතිරි ධ්‍යාන විෂයෙහි වන ඒකාග්‍රතාව නිප්පීතික (පීති රහිත) සමාධියයි. උපචාර සමාධිය වනාහි සප්පීතිකද නිප්පීතිකද වන්නේය. මෙසේ සප්පීතික, නිප්පීතික වශයෙන් දෙ-ආකාර වේ. සිවුවන ද්විකයෙහි: චතුෂ්කනයෙහි ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යාන තුනෙහිද, පංචකනයෙහි ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ යන ධ්‍යාන සතරෙහිද, වන ඒකාග්‍රතාව සුඛසහගත සමාධියයි. (චතුෂ්කනයෙහි චතුර්ථධ්‍යානය හා පංචකනයෙහි පංචමධ්‍යානයද යන) මේ ඉතිරි ධ්‍යානයෙහි වන ඒකාග්‍රතාව උපේක්ෂාසහගත සමාධියයි. උපචාර සමාධිය වනාහි සුඛ සහගතද උපේක්ෂා සහගතද වන්නේය. මෙසේ සුඛසහගතය උපේක්ෂාසහගතය යනුවෙන් දෙආකාර වේ.

ත්‍රිකයන් අතුරෙන් ප්‍රථම ත්‍රිකයෙහි, ලබා නොබෝකල්වූයේ හීන නම්, බෝකල් නොවඩනා ලදුයේ මධ්‍යම නම්, මැනවින් වඩනා ලදුයේ,

(1) දී. නි. සාමඤ්ඤඵල සුත්ත. D i 73

වසීභාවයට පත්වූයේ ප්‍රණීත නමි; මෙසේ හීන, මධ්‍යම, ප්‍රණීත වශයෙන් ත්‍රිවිධ වේ. දෙවන ත්‍රිකයෙහි ප්‍රථමධ්‍යාන සමාධිය උපචාර සමාධියත් සමග ගෙන සවිතක්ක-සවිචාර නම් වේ, පංචකනයෙහි ද්විතීය ධ්‍යාන සමාධිය අවිතක්ක-විචාර මාත්‍ර වේ, යමෙක් වනාහි විතර්ක මාත්‍රයෙහිම ආදීනව දැක විචාරයෙහි ආදීනව නොදැක, හුදෙක් විතර්කප්‍රහාණයම අපේක්ෂා කරමින් ප්‍රථමධ්‍යානය ඉක්මවයිද, හේ තෙමේ අවිතර්ක විචාරමාත්‍රවූ සමාධිය ලබයි, මෙය ඒ සඳහා කියන ලදි. චතුෂ්කනයෙහි වනාහි ද්විතීයාදී වූද, පංචකනයෙහි තෘතීයාදීවූද ධ්‍යානත්‍රයෙහි වන ඒකාග්‍රතාව අවිතක්ක අවිචාර නම්වේ. මෙසේ සවිතක්ක-සවිචාරාදී (සවිතක්ක-සවිචාර, අවිතක්ක-සවිචාර, අවිතක්ක-අවිචාර– වශයෙන් ත්‍රිවිධ වේ. තුන්වන ත්‍රිකයෙහි, චතුෂ්කනයෙහි මුල පටන් ධ්‍යාන දෙකෙකද, පංචකනයෙහි තුනෙකද වන ඒකාග්‍රතාව පීති සහගත සමාධියයි, එහිම (පිළිවෙළින්) තෘතීය හෝ චතුර්ථ ධ්‍යානයෙහි වන ඒකාග්‍රතාව සුඛසහගත සමාධියයි, එහිම (පිළිවෙළින්) අවසන්හි වන (චතුර්ථ හෝ පංචම) ධ්‍යානයෙහි වන ඒකාග්‍රතාව උපේක්ෂා සහගත සමාධියයි, උපචාර සමාධිය පීති සුඛ සහගත හෝ උපෙක්ඛා සහගත හෝ වේ. මෙසේ පීති සහගතාදී (පීති-සහගත, සුඛ-සහගත, උපෙක්ඛා සහගත) වශයෙන් තුන් ආකාරවේ. සිවුවන ත්‍රිකයෙහි උපචාර භූමියෙහි වන ඒකාග්‍රතාව පරිත්ත සමාධියයි, රූපාවචර අරූපාවචර කුශල විෂයෙහි වන ඒකාග්‍රතාව මහග්ගත සමාධියයි, ආර්යමාර්ග පිළිබඳ ඒකාග්‍රතාව අප්පමාණ සමාධියයි. මෙසේ පරිත්ත, මහග්ගත, අප්පමාණ වශයෙන් තුන් ආකාර වේ.

චතුෂ්කයන් අතුරෙන් ප්‍රථම චතුෂ්කයෙහි දුඃඛප්‍රතිපද හා අවිශද ප්‍රඥා සහිත සමාධියෙක් ඇත, දුඃඛ ප්‍රතිපද හා තීක්ෂණ ප්‍රඥා සහිත සමාධියෙක්ද ඇත, සුඛප්‍රතිපද හා අවිශදප්‍රඥා සහිත සමාධියෙක්ද ඇත. සුඛප්‍රතිපද හා තීක්ෂණප්‍රඥා සහිත සමාධියෙක්ද ඇත. එහි පළමුවර පිවිසීමෙහි පටන් ඒ ඒ ධ්‍යානයෙහි යම්තාක් උපචාරය උපදියිද ඒතාක් පවත්නා සමාධිභාවනාව **පටිපදයයි** කියනුලැබේ. උපචාරයෙහි පටන් යම්තාක් අර්පණාව වේද ඒතාක් පවත්නා ප්‍රඥාව **අභිඤ්ඤයයි** කියනු ලැබේ. එහි ප්‍රතිපදව ඇතැමකුට දුක්සහිත වේ. නීවරණ ආදී ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ පරිචය හා ග්‍රහණය හේතුකොටගෙන ආයාසකරවේ. ඇතැමකුට එසේ නොවීමෙන් සුඛසහිත වේ. අභිඥාවද ඇතැමකුට අවිශද (දන්ධ) වේ, මඳවූ ශීඝ්‍ර නොවූ පැවතුම් ඇත්තේ වේ. ඇතැමකුට ක්ෂණිකවූ අමන්දවූ ශීඝ්‍රවූ පැවතුම් ඇත්තේ වේ. එහිලා සප්පාය අසප්පායයන්ද, පලිබෝධ නාශනාදී පූර්ව කෘත්‍යයන්ද, අර්පණා කුශලතාවන්ද මතු

විස්තර කරන්නමු. ඔවුන් අතුරෙන් යමෙක් අසප්පායයන් සේවනය කරන්නේද ඔහුට දුඃඛප්‍රතිපදද අවිශදප්‍රඥද වන්නේය, සප්පායයන් සෙවුනාහට සුඛප්‍රතිපදද විශදප්‍රඥද වන්නේය. යමෙක් වනාහි පූර්වභාගයෙහි අසප්පායයන් සේවනය කොට අපරභාගයෙහි සප්පායයන් සේවනය කරන්නේද, පූර්වභාගයෙහි සප්පායයන් සේවනය කොට අපරභාගයෙහි අසප්පායයන් සේවනය කරන්නේද, ඔහුට මිශ්‍රඵල වන්නේ යයි දතයුතුය. එසේම පලිබොධනාශනාදී පූර්වකෘත්‍යයන් නොසපයා භාවනාවෙහි යෙදෙන්නහුට දුඃඛප්‍රතිපද වේ, එහි විපර්යය හේතුකොටගෙන සුඛප්‍රතිපද වේ. අර්පණා කුශලතාවන් නොසපයන්නහුට අවිශද අභිඥ වේ, සපයන්නහුට ශීඝ්‍ර අභිඥ වේ, තවද තෘෂ්ණා අවිද්‍යා වශයෙන්ද සමථ විපස්සනාධිකාර වශයෙන්ද මෙම ප්‍රතිපද අභිඥවන් පිළිබඳ ප්‍රභේදය දතයුතුයඃ

තෘෂ්ණාවෙන් මඩනාලද්දහුට දුඃඛ ප්‍රතිපද වේ, නොමඩනා ලද්දහුට සුඛප්‍රතිපද වේ, අවිද්‍යාවෙන් මඩනා ලද්දහුට අවිශද අභිඥ වේ, නොමඩනා ලද්දහුට ශීඝ්‍ර අභිඥ වේ. යමෙක් සමථ භාවනාවෙහි පෙර (අත්බැව්හි කළ) පුරුදු නැත්තේ වේද, ඔහුට දුඃඛ ප්‍රතිපද වේ, පෙරපුරුදු ඇත්තහුට සුඛප්‍රතිපද වේ, යමෙක් වනාහි විදර්ශනා විෂයෙහි පෙර පුරුදු නැත්තේ වේද, ඔහුට අවිශද අභිඥ වේ, පෙරපුරුදු ඇත්තහුට ශීඝ්‍ර අභිඥ වේ. ක්ලේශ`හා ඉන්ද්‍රිය වශයෙන්ද මෙම ප්‍රතිපද අභිඥවන් පිළිබඳ ප්‍රභේදය දතයුතුය. තීව්‍ර ක්ලේශ හා මෘදු ඉන්ද්‍රිය ඇත්තහුට දුඃඛ ප්‍රතිපදද අවිශද අභිඥද වේ. තීක්ෂ්ණ ඉන්ද්‍රිය ඇත්තහුට ශීඝ්‍ර අභිඥ වේ, මන්‍ද ක්ලේශ හා මෘදු ඉන්ද්‍රිය ඇත්තහුට සුඛප්‍රතිපදද අවිශද අභිඥද වේ, තීක්ෂ්ණ ඉන්ද්‍රිය ඇත්තහුට ශීඝ්‍ර අභිඥ වේ. මෙසේ මෙම ප්‍රතිපද අභිඥවන් විෂයෙහි යම් පුද්ගලයෙක් තෙමේ දුඃඛප්‍රතිපදවෙන් හා අවිශද අභිඥවෙන් සමාධියට පැමිණේද ඔහුගේ එම සමාධිය දුඃඛ ප්‍රතිපද හා අවිශදඅභිඥ සහිතයයි කියනුලැබේ. සෙසු තුන් තන්හිද මෙම ක්‍රමය වේ. මෙසේ දුක්ඛපටිපද දන්ධාභිඤ්ඤ ආදී වශයෙන් චතුර්විධ වේ.

දෙවන චතුෂ්කයෙහිඃ නොවැඩුණු, නොවඩනලද අරමුණු ඇති සමාධියෙක් ඇත, නොවැඩුණු පමණ කළනොහැකි අරමුණු ඇති සමාධියෙක් ඇත. පමණ කළනොහැකි නොවඩනා ලද අරමුණු ඇති සමාධියෙක් ඇත. පමණ කළනොහැකි අරමුණුද ඇති සමාධියෙක් ඇත. එහි යම් සමාධියක් ප්‍රගුණ නොකරනලද්දේද, මතුධ්‍යානයට හේතුවීමටද නොහැක්කේද, මේ නොවැඩුණු (පරිත්ත) ධ්‍යානයයි, යම් ධ්‍යානයක් නොවඩනාලද අරමුණෙහි පවතී නම්, මේ පරිත්තාරම්මණ හෙවත්

නොවඩනාලද අරමුණු ඇති ධ්‍යානයයි, යම් ධ්‍යානයක් ප්‍රගුණ කරනලදුයේ මනාව වැඩුණේ මතු ධ්‍යානයට හේතුවියහැක්කේද මේ අප්පමාණ හෙවත් මනාව වැඩුණු ධ්‍යානයයි, යම් ධ්‍යානයක් වඩනාලද අරමුණෙහි පවතී නම්, මේ අප්පමාණාරම්මණ හෙවත් මනාසේ වඩනාලද අරමුණු සහිත සමාධියයි. මෙකී ලක්‍ෂණ මුසුවීම හේතුකොටගෙන වොමිස්සක නය හෙයත් මිශ්‍රවීමේ ක්‍රමය (න්‍යායය) දතයුතුය. මෙසේ පරිත්ත, පරිත්තාරම්මණ ආදී වශයෙන් චතුර්විධ වේ.

තුන්වන චතුෂ්කයෙහි: විදුරුවාහළ නීවරණ සහිතවූ විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා වශයෙන් අංග පසෙකින් යුත් ප්‍රථමධ්‍යානයද, ඉක්බිති මුළුනුපුටා දැමූ විතක්කවිචාර සහිතවූ අංග තුනෙකින් යුත් ද්විතීයධ්‍යානයද, ඉක්බිති පිති රහිතවූ අංග දෙකෙකින් යුත් තෘතීය ධ්‍යානයද, ඉක්බිති සුඛවෙදනා ප්‍රහීණකළ, උපෙක්ඛාවෙදනා සහිතවූ අංග දෙකෙකින් යුත් චතුර්ථ ධ්‍යානයද වේ. මෙසේ මේ ධ්‍යාන සතරෙහි අංගවූ සමාධි සතරෙක් වේ, මෙසේ චතුර්ධ්‍යාන වශයෙන් චතුර්විධ වේ.

සිවුවන චතුෂ්කයෙහි: හානභාගීය (පිරිහීමට නැඹුරු), සමාධියෙක් ඇත, ඨිතිභාගිය (නොවැඩී සිටි) සමාධියෙක් ඇත, විසෙසභාගීය විශේෂ අධිගමයන් පිණිස යන) සමාධියෙක් ඇත, නිබ්බෙධභාගීය (නිර්වේදයට නැඹුරු) සමාධියෙක්ද ඇත. එහි ප්‍රතිපක්‍ෂ ධර්මයන්ගේ පැළඹීමෙන් හානභාගීතාව වේ, අනුරූපවූ ස්මෘතිය පිහිටුවීම් වශයෙන් ඨිතිභාගිතාවද, මතු විශේෂාධිගම වශයෙන් විසෙසභාගිතාවද, ආදීනවදර්ශන සහිත සංඥා මනස්කාරයන්ගේ පැළඹීම් වශයෙන් නිබ්බෙධභාගිතාවද වෙතැ'යි දතයුතුය. යම්සේ කියන ලද්දේද: 'ප්‍රථමධ්‍යාන ලාභියා කෙරෙහි කාමරාග සහගත සඤ්ඤමනසිකාරයෝ පැළඹෙත් නම්, හානභාගීනී ප්‍රඥාවද, අනුරූප ස්මෘතිය පිහිටා නම් ඨිතිභාගිනී ප්‍රඥාවද අවිතර්ක සහගත සඤ්ඤ මනසිකාරයෝ පැළඹෙත් නම් විසේසභාගිනී ප්‍රඥාවද, නිර්වේද සහගත සඤ්ඤ මනසිකාරයෝ පැළඹෙත් නම් විරාගසහිතවූ නිබ්බෙධභාගිනී ප්‍රඥාවද වෙතැ'යි[1] ඒ ප්‍රඥාව හා සම්ප්‍රයුක්තවූ සමාධියද චතුර්විධ වේ. මෙසේ හානභාගීය ආදී වශයෙන් චතුර්විධ වේ.

පස්වන චතුෂ්කයෙහි කාමවචර සමාධිය, රූපාවචර සමාධිය, අරූපාවචර සමාධිය, අපරියාපන්න සමාධියයි මෙසේ සමාධි සතරෙක් වේ. එහි උපචාර එකග්ගතා සියල්ලම කාමාවචර සමාධි වේ, ඉතිරිතුන රූපාවචරාදී කුශලචිත්තයන් පිළිබඳ ඒකාග්‍රතාවයි. මෙසේ කාමාවචරාදී වශයෙන් චතුර්විධවේ.

(1) අභි. ඉධිපාද විභඞ්ග. Vbh 330

සවන චතුෂ්කයෙහි: 'ඉදින් භික්ෂු තෙමේ ඡන්දය අධිපතිකොට සමාධියක්, චිත්තෛකාග්‍රතාවක් ලබන්නේද, මෙය ඡන්දසමාධියයි කියනු ලැබේ-පෙ-වීර්යය අධිපති කොට-පෙ-චිත්තය අධිපතිකොට-පෙ-වීමංසය අධිපති කොට සමාධියක් ලබන්නේද, චිත්තෛකාග්‍රතාවක් ලබන්නේද, මෙය වීමංසාසමාධියයි කියනු ලැබේ[1]යයි මෙසේ අධිපතිවශයෙන් චතුර්විධ වේ.

පංචකයෙහි චතුෂ්ක භේදයෙහි (ධ්‍යාන සතරක් ලෙස ගන්නා ක්‍රමයෙහි) ද්විතීය ධ්‍යානයයි යමක් කියන ලද්දේද, එය විතර්කය පමණක් ඉක්මවීමෙන් ද්විතීය ධ්‍යානයද, විතර්ක විචාර දෙක ඉක්මවීමෙන් තෘතීයධ්‍යානයදැයි මෙසේ දෙකක් කොට බෙදීමෙන් පංචධ්‍යානයන් දතයුතුය. එම ධ්‍යානයනට අංගවූ සමාධි පසෙකැයි මෙසේ පංච ධ්‍යානයන්ගේ අංගවශයෙන් පස්වැදෑරුම් බව දතයුතුය.

**කො චස්ස සංකිලෙසො, කිං වොදානං** (එහි කිළිටුවීම නම් කිම? පිරිසුදුවීම නම් කිම?) යන මෙහි වනාහි විසඳීම විභංගයෙහි කියන ලදුයේමැයි: 'එහි කිලිටිවීම නම් හානභාගී ධර්මයයි, පිරිසුදුවීම නම් විසේසභාගී ධර්මයයි.[2] කියනලදී. එහි ප්‍රථමධ්‍යානලාභියා කෙරෙහි කාමසහගත සංඥ මනස්කාරයෝ පැළඹෙත් නම්, ඒ හානභාගී ප්‍රඥයයි[3] යන මේ ආකාරයෙන් හානභාගී ස්වභාවය දතයුතුය. අවිතක්ක සහගත සංඥ මනස්කාරයෝ පැළඹෙත් නම්, විශේෂභාගී ප්‍රඥයයි[4] යන මේ ආකාරයෙන් විසෙසභාගී ස්වභාවය දතයුතුය.

**කථං භාවෙතබ්බා** (කෙසේ වැඩිය යුතුදැයි) යන මෙහි ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙආකාර වේ යන ආදියෙහි ආර්යමාර්ග සම්ප්‍රයුක්තවූ යම් මේ සමාධියක් පළමු කියන ලද්දේද, එය වැඩීමේ ක්‍රමය ප්‍රඥභාවනාක්‍රමයෙහිම සංගෘහීත වේ, ප්‍රඥව වැඩීමෙන්ම එය වඩනාලද්දේ වේ, එහෙයින් එය සඳහා මෙසේ වැඩිය යුතුයයි කිසිවක් වෙන්කොට නොකියමු. යම් මේ ලෞකික සමාධියක් වේද, එය යට කියනලද සෙයින් ශීලය පිරිසුදු කොටගෙන සුපිරිසුදු ශීලයෙහි පිහිටා දශපලිබෝධයන් අතුරෙන් යම් පලිබෝධයක් ඇතොත්, එය පසිඳගෙන කමටහන් දෙන කල්‍යාණමිත්‍රයකු කරා එළඹ සතළිස් කමටහන් අතුරෙන් තමාගේ චරිතයට අනුකූලවූ යම්කිසි කමටහනක් ගෙන, සමාධි භාවනාවට

(1) අභි. විභඞ්ග. Vbh 216ff.
(2) අභි. විභඞ්ග. Vbh 343
(3) අභි. විභඞ්ග. Vbh 330
(4) එම

නොසුදුසු විහාරය අත්හැර සුදුසු විහාරයෙක්හි වෙසෙමින්, සුලු පලිබෝධ කිසිවක් ඇතොත් එයද සිඳලා සියලු භාවනාවිධි නොපිරිහෙළා වැඩියයුතුය යනු මෙහි සංක්ෂිප්ත අර්ථයි. විශේෂ විස්තරාර්ථ මෙසේය: දශ පලිබෝධයන් අතුරෙන් යම් පලිබොධයක් ඇතොත් එය පසිඳ ගෙනැ'යි යමක් පළමු කියන ලද්දේද, මෙහි,

ආවාසො ච කුලං ලාභො ගණො කම්මඤ්ච පඤ්චමං
අද්ධානං ඤාති ආබාධො ගන්ථො ඉද්ධීති තෙ දස

අවාසයද, කුලයද, (ප්‍රත්‍යය) ලාභයද, (සූත්තන්තික ආදී) ගණයද, පස්වැනිවූ නවකම්ද, (දුෂ්කර) ගමන් මාර්ගයද, (ආචාර්ය උපාධ්‍යාය ආදී) ඥතීහුද, රෝගාබාධද, (පර්යාප්ති ආදී) ග්‍රන්ථද, (ලෞකික) ඍද්ධියද යන මේ දශය පලිබොධ නම් වේ.

එහි ආවාස පලිබොධ නම් ආවාසයමැයි, කුල ආදියෙහිද මෙම න්‍යායයි. එහි ආවාස යනු, එක් කුටියක් හෝ, එක් පිරිවෙණක් හෝ මුළු සංඝාරාමයම හෝ ආවාසයයි කියනු ලැබේ. ඒ මේ ආවාසය සියල්ලනටම පලිබොධ නොවේ. යමෙක් වනාහි මේ ආවාසයෙහි නවකම් ආදිය කෙරෙහි උත්සුකබවට පත් වේනම්, බොහෝ භාණ්ඩයන් රැස් කරන්නේ හෝ වේනම්, යම් කරුණක් හේතුකොට අපේක්‍ෂා ඇත්තේ, එය වෙත නැඹුරු සිත් ඇත්තේ වේනම්, එවැන්නහුටම පලිබොධ වේ, අන් කෙනකුට නොවේ. එහිලා මේ කථාවස්තුවෙකි: කුලපුත්‍රහු දෙදෙනෙක් අනුරාධපුරයෙන් නික්ම ථූපාරාමයෙහි පැවිදිවූහ. ඔවුනතුරෙන් එක් කෙනෙක් මාතෘකා දෙකක් ප්‍රගුණ කොට උපසපන් පස්වස් ඇතිව පවාරණ කොට පාචීනඛණ්ඩරාජියට ගියේය, අනෙක් භික්‍ෂු තෙමේ එහිම වාසය කළේය. පාචීනඛණ්ඩරාජියට ගිය භික්‍ෂු තෙමේ එහි බොහෝ කලක් වැස ස්ථවිර කෙනකු බවට පත්ව මෙසේ සිතීය. මෙතන විවේක විහරණයට සරුප්වේ, එහෙයින් සහායකයාහටද ඒ බව දන්වමි. මෙසේ සිතා එතැනින් නික්ම පිළිවෙළින් ථූපාරාමයට සැපත් විය. සමවයස්කවූ යහළු භික්‍ෂු තෙමේද පිවිසෙන විටම දක පෙරගමන් ගොස් පාසිවුරු පිළිගෙන වත්පිළිවෙත් කළේය. ආගන්තුක භික්‍ෂු තෙමේ සෙනසුනට පිවිස මෙසේ සිතීය: 'දැන් මාගේ යහළු තෙමේ ගිතෙල් හෝ පැණි හෝ පානයක් හෝ එවන්නේය, මේ තෙමේ මේ නගරයෙහි බොහෝ කලක් වාසය කළේය'. හේ තෙමේ රාත්‍රියෙහි කිසිවක් නොලැබ පහන්වූ කල, 'දැන් උපස්ථායකයන් විසින් එවනලද හුළුකැඳ හා අවුලුපත් එවන්නේය'යි සිතීය. එයද නොදක, 'එවන්නට කෙනකු නැතුවා විය යුතුය, පිවිසි විට

දෙන්නාහුයයි සිතා උදෑසනින්ම සහායක භික්ෂුව හා සමග ගමට පිවිසියේය. ඔවුහු දෙදෙනා එක් වීදියෙක හැසිර සරළුවක් (හැන්දක්) පමණ හුළුකැඳ ලැබ ආසනශාලාවෙහි හිඳ වැළඳූහ. ඉක්බිති ආගන්තුක ස්ථවිර තෙමේ 'තිබඳව දෙන හුළුකැඳක් නැතැයි සිතමි, දැන් බත් වේලාවෙහි මිනිස්සු ප්‍රණීත ලෙස බත් දෙන්නාහුය'යි සිතීය. ඉක්බිති බත් වේලාවෙහිද පිඬු පිණිස හැසිර ලද දෙයක්ම වළඳ, 'කිමෙක්ද ස්වාමීනි, හැමදම මෙසේ යැපෙන්නහුදැ'යි ඇසීය. 'එසේය ඇවැත්නි'යි කීය. 'ස්වාමීනි, පාචීනඛණ්ඩරාජිය පහසුය එහි යම්හයි කීය. ස්ථවිර තෙමේ දකුණු දෙරටුවෙන් නගරයෙන් නික්ම කුඹල්ගමට යන මහට පිවිසියේය. අනෙක් ස්ථවිර තෙමේ, 'කිමෙක්ද, ස්වාමීනි, මේ මහට පිළිපන්නහුදැයි කීය. 'ඇවැත්නි, ඔබ පාචීනඛණ්ඩරාජියෙහි වරුණ කීවා නොවේද?' 'කිමෙක්ද ස්වාමීනි, මෙපමණ කල් වාසය කළ තැන ඔබවහන්සේට (ගෙනයායුතු) අතිරේක පිරිකර කිසිවක් නැද්ද? එසේය ඇවැත්නි, ඇඳ හා පුටුව සහ සතුය, එය සකස්කොට තබා ඇත. අන් කිසිවක් නැත.' 'ස්වාමීනි, මාගේ වනාහි සැරයටියද, තෙල්නලයද, වහන්පසුම්බියද එහියයි කීය. 'ඇවැත්නි, ඔබ එක් දිනක් වැස මෙතෙක් ද තබා ආවහුදැයි කීය. 'එසේය ස්වාමීනියි කියා, හේ (ආගන්තුක ස්ථවිර) තෙමේ පහන් සිත් ඇතිව, තෙරුන් වැඳ, 'ස්වාමීනි, ඔබවහන්සේ වැන්නවුනට සියලු තන්හිම අරණ්‍යවාසය වේ. ථූපාරාමය සිවු බුදුවරයන්ගේම ධාතූන් නිදහන්කළ තැනෙකි, ලෝහප්‍රාසාදයෙහි සප්පායවූ ධර්මශ්‍රවණය ඇත, මහසෑය දැකීමද, ස්ථවිර භික්ෂූන් දැකීමද ලැබේ, බුද්ධකාලය මෙන් පවතී, ඔබ වහන්සේ මෙතන්හිම වසනු මැනවැයි දෙවන දවස්හි පාසිවුරු ගෙන තනිවම ගියේය. මෙවැන්නහුට ආවාසය පලිබෝධ නොවේ.

**කුලං** යනු, ඥති කුලය හෝ උපස්ථායක කුලයයි. උපස්ථායක කුලයද, (ඔවුන්) සුවපත්වූ කල සුවපත් වෙමි'යි යන ආදී නයින් ඇලී වාසය කරන ඇතැමකුට පලිබොධ වේ. හේ තෙමේ කුලවැසියන් හා සමග මිස ධර්මශ්‍රවණය පිණිස ආසන්න විහාරයකට පවා තනිවම නොයයි. ඇතැමකුට මාපියෝ පවා පලිබොධ නොවෙති. කෝරණ්ඩක විහාරවාසී තෙරුන්ගේ බෑනණු තරුණ භික්ෂුවට මෙනි. හේ තෙමේ වනාහි උගෙණීම පිණිස රුහුණු දනව්වට ගියේය. තෙරුන්ගේ බුහුනණි උපාසිකා තොමෝ සැමදම ඔහු ගැන තෙරුන්ගෙන් විමසන්නීය. තෙරණුවෝ එක් දවසක් දහර භික්ෂුව කැඳවාගෙන එන්නෙමි'යි රුහුණ බලා පිටත් වූහ. තරුණ භික්ෂු තෙමේද මවිසින් මෙහි බොහෝ කලක් වාසය කරනලදි, දැන් උපාධ්‍යායයන් වහන්සේ දැක, (මෑණි) උපාසිකාවගේ තොරතුරුද දැන එන්නෙමි'යි රුහුණෙන් නික්මුණේය. දෙදෙනා මහවැලි

ගංතෙරදී ඔවුනොවුන් හමුවූහ. ඒ (තරුණ භික්ෂු) තෙමේ එක්තරා රුක්මුලෙක්හිදී තෙරුන්හට වත් පිළිවෙත් කොට, කොහි යන්නහුද?යි පිළිවිසින ලදුයේ එම කරුණ දැන්වීය. තෙරණුවෝ, ඔබ කළ සේ මැනවි, උපාසිකා තොමෝද සැමදම ඔබ ගැන විමසයි, මමද මේ සඳහාම ආයෙමි, ඔබ යනු මැනවි, මම මෙහිම වස් වසන්නෙමියි තරුණ භික්ෂුව යැවූහ. හේ තෙමේ වස් එළඹෙන දවස්හිම එම විහාරයට පැමිණියේය. තම පියා විසින් කරවනලද සෙනසුනම ඔහුට ලැබිණි, ඉක්බිති පසුදින ඒ භික්ෂුවගේ පිය තෙමේ විහාරයට පැමිණ, ස්වාමීනි, අපගේ සෙනසුන ලැබුණේ කවරකුටදැයි පිළිවිස, ආගන්තුක තරුණ භික්ෂු නමකටැයි අසා ඔහු වෙත එළඹ වැඳ, ස්වාමීනි, අපගේ සෙනසුනෙහි වස් එළඹියහු විසින් පිළිපැදිය යුතු වතෙක් ඇතැයි කීය. කිමෙක්ද උපාසකය?යි පිළිවිසියේය. මේ තුන්මාසය අපගේම ගෙහි භික්ෂාව පිළිගෙන, පවාරණය කොට යන කල අපට දැන්විය යුතුයයි කීය. භික්ෂු තෙමේ තුෂ්ණීම්භාවයෙන් ඉවසීය. උපාසක තෙමේද ගෙදර ගොස් අපගේ ආවාසයෙහි එක්තරා ආගන්තුක හිමි නමක් වස් එළඹියේය, මනාව උපස්ථාන කළයුතුයයි කීය. උපාසිකා තොමෝද මැනවැයි පිළිගෙන ප්‍රණීත ලෙස කෑයුතු බිදියයුතු දෑ පිළියෙළ කළාය. තරුණ භික්ෂු තෙමේද බත් වේලෙහි ඥාති ගෘහයට ගියේය. කිසිවකුට හඳුනාගත නොහැකි විය. ඒ භික්ෂු තෙමේ වස් තුන් මාසයම එහි භික්ෂාව වළඳ වස් හමාර කොට මම් යන්නෙමියි අවසර පැතීය. ඉක්බිති ඒ භික්ෂුවගේ ඥාතීහු ස්වාමීනි, හෙට වඩිනු මැනවයි කියා පසු දින ගෙහිම වළඳවා තෙල්නල පුරවා දී, සකුරු කැටයක්ද නවරියන් සළුවක්ද දී දැන් වඩිනු මැනවැයි සමුගත්හ. හේ තෙමේ අනුමෝදනාකොට රුහුණ බලා ගියේය. උපාධ්‍යාය තෙරණුවෝද පවාරණකොට පෙරළා එන්නාහු පෙර මුනගැසුණ තැනදීම හමුවූහ. භික්ෂු තෙමේ එක්තරා රුක් මුලෙකදී තෙරුන්හට වත්පිළිවෙත් කළේය. ඉක්බිති තෙරණුවෝ කිමෙක්ද දරුව, ඔබගේ මව් උපාසිකාව දක්නාලදදැයි විමසූහ. ඒ භික්ෂු තෙමේ, එසේය ස්වාමීනියි, කියා ඒ සියලු පවත් දන්වා ඒ (ඔවුන් දුන්) තෙල් තෙරුන්ගේ පා ගල්වා සකුරු පානයක් කොට වළඳවා ඒ වස්ත්‍රයද තෙරුන්හටම දී තෙරුන් වැඳ, ස්වාමීනි, මට රුහුණම සප්පායයයි කියා ගියේය. තෙරණුවෝද විහාරයට අවුත් පසු දින කොරණ්ඩක නම් ගමට පිවිසියහ. උපාසිකා තොමෝද, මාගේ බෑ තෙරණුවෝ මා පුත් භික්ෂුවද කැඳවාගෙන දැන් එති, දැන් එතියි සැමදා මඟ බලමින් සිටියි. ඕ තොමෝ තෙරුන් තනිවම එනු දැක, මා පුත් භික්ෂු නම මිය ගොසින් දෝයි හඟිමි, එහෙයින් තෙරණුවෝ තනිවම එතියි තෙරුන්ගේ පාමුල වැතිර වැලපෙමින් හැඬුවාය. තෙරණුවෝ ඒකාන්තයෙන් දහර භික්ෂු නම අල්පෙච්ඡතාව

හේතුකොට තමා නොහඳුන්වාම ගියේවනැයි ඇය අස්වසා සියලු පවත් දන්වා පාත්‍ර පසුම්බියෙන් ඒ සළුව ගෙන දැක්වූහ. උපාසිකා තොමෝ සිත පහදවාගෙන පුතු ගිය දෙසට හැරී උරයෙන් වැතිර නමස්කාර කෙරෙමින්, ඒකාන්තයෙන් මාපුතු වැනි භික්ෂුවක් කායසාක්ෂිකොට භාග්‍යවතුන් වහන්සේ රථවිනීතසූත්‍ර පටිපදාවද, නාලකසූත්‍ර පටිපදාවද, තුවටකසූත්‍ර පටිපදාවද, සිවුපසයෙහි සතොස්ව භාවනාවෙහි ඇලීම ගැන පැවසෙන මහා අරියවංස පටිපදාවද දෙසූ සේකැ'යි හඟිමි, වැදූ මවගේ ගෙහි තුන් මසක් වළඳමින්ම මම පුත් වෙමි, ඔබ මාගේ මෑණියෝයයි නොකියයි, අහෝ ආශ්චර්යවත් මනුෂ්‍යයෙකැ'යි කීවාය. මෙවන් කෙනෙකුට මාපියෝ පවා පලිබෝධ නොවෙති, සෙසු උපස්ථායක කුලයක් කැලම (පලිබෝධ) නොවේ.

**ලාභො** යනු සිවුපසයයි, ඒ සිවුපසය කෙසේ පලිබෝධ වේද? පින් ඇති භික්ෂුවට ගිය ගිය තැන ජනයා බොහෝ පිරිකර සහිතව ප්‍රත්‍යය පුදති, භික්ෂු තෙමේ ඔවුනට අනුමෝදනා කරනුයේ, දහම් දෙසනුයේ මහණදම් පිරීමට අවකාශ නොලබයි. හිරු නැඟි වේලෙහි පටන් පෙරයම තෙක් මිනිසුන්ගේ සංසර්ගය නොසිඳී පවතී. යළි ඉතා උදසනින්ම ප්‍රත්‍යය බහුල පිණ්ඩපාතයෙහි ලොල් වූවාහු අවුත්, ස්වාමීනි, අසුවල් උපාසක තෙමේ, අසුවල් උපාසිකා තොමෝ, ඇමති තෙමේ, අසුවල් ඇමැති දූ තොමෝ ඔබවහන්සේ දකිනු රිසියහයි කියති, ඒ භික්ෂු තෙමේ ඇවැත්නි, පාසිවුරු ගනිවුයයි ගමනට සැරසීගෙනම සිටියි, නිතර ව්‍යාපෘතවම සිටියි. මෙසේ ඒ භික්ෂුවට ප්‍රත්‍යයයෝ පලිබෝධ වෙති. එහෙයින් ගණයාගෙන් වෙන්ව, යම් තැනෙක තමා නොහඳුනත්ද එවන් තැනෙක හුදකලාව හැසිරිය යුතුය. මෙසේ එම පලිබෝධය නැසේ.

**ගණො** (ගණයා) යනු, සුත්තන්තික ගණය හෝ ආභිධම්මික ගණයයි, යමෙක් එම ගණයකට උද්දේසය (පෙළ කියා දීම) හෝ පරිපුච්ඡාව (අරුත් කියා දීම) දෙනුයේ මහණදම් පිරීමට අවකාශ නොබන්නේ නම්, ඔහුට ගණය පලිබෝධ වේ. එහෙයින් මතු දැක්වෙන සේ එම පලිබෝධය නැසිය යුතුය: ඉදින් ඒ ගණයට අයත් භික්ෂූන් විසින් වැඩි කොටස උගන්නාලදුවම කොටසක් ඉතිරිව ඇත්නම්, එය නිමවා අරණට පිවිසිය යුතුය. ඉදින්ම කොටසක් උගන්නාලදුව වැඩි කොටස ඉතිරිව ඇත්නම්, යොදුනෙකින් බැහැර නොගොස්, යොදුනෙකින් ඇතුළත මානයෙහි වෙනත් ගණවාචකයකු කරා ගොස්, ආයුෂ්මත්හු උද්දේසාදියෙන් මොවුනට සංග්‍රහ කරත්වායි කිව යුතුය. මෙසේත් නොලබන්නේ නම්, ඇවැත්නි, මවිසින් කළයුතු කිසියම් කාර්යයෙක්

ඇත, ඔබ පහසු තැනකට යෙත්වායි ගණය හැරපියා ස්වකීය කාර්යය කළයුතුය.

**කම්මං** (කර්මාන්තය) යනු, නවකම්මය, එය කරන්නහු විසින් වඩුවන් ආදී ශිල්පීන් විසින් ලද නොලද දෑ දතයුතුය, කළ නොකළ දෑ කෙරෙහි උත්සුක වියයුතුය, මෙසේ හැම අතින්ම පලිබෝධ වේ. එයද මෙකියන ආකාරයෙන් පසිඳලිය යුතුය. ඉදින් මදක් ඉතිරිව ඇත්නම් නිමකළ යුතුය, ඉදින් බොහෝ ඉතිරිව ඇත්නම්, ඉදින් සඟසතු නවකර්මාන්තයක් නම්, සංඝයාහට හෝ වගකීම් උසුලන භික්ෂූන්හට හෝ පවරා දියයුතුය. ඉදින් තමාසතු වූවක් නම්, තමා ගැන වගකීම් දරන්නවුනට භාර කළයුතුය. එවැන්නකු නොලැබෙතොත්, සංඝයාහට පරිත්‍යාග කොට යායුතුය.

**අද්ධානං** යනු, මඟ බැස යන ගමන්ය, කිසි තැනෙක්හි කිසිවකුට පැවිද්දෙහි අපේක්ෂා හෝ වේනම්, කිසියම් ප්‍රත්‍යයක් ලැබියයුතු හෝ වේනම්, එය නොලැබ ඉවසනු නොහැකි වේනම්, අරණට වැද මහණදම් පුරන්නහුට පවා ගමන්රිසිය මැඩලනු පහසු නොවේ, එහෙයින් ගොස් එම කිස නිමකොටම මහණදම්හි උත්සුක වියයුතුය.

**ඤාති** යනු, විහාරයෙහි නම්, ආචාර්ය, උපාධ්‍යාය, සද්ධිවිහාරික, අන්තේවාසික, සමානුපජ්ඣායක, සමානාචරියක යන මොහුද, ගෙහි නම් මව්, පිය, සොහොවුරු ආදීහුද වෙති. ඔවුන් ගිලන්ව ඇත්නම් මොහුට පලිබෝධයෙකි. එහෙයින් උපස්ථානකොට ප්‍රකෘති තත්වයට පැමිණවීමෙන් එම පලිබෝධය පසිඳලිය යුතුය. ඔවුනතුරෙන් උපාධ්‍යායයන් ගිලන්ව ගොස්, මද කලෙකින් නොනැගිටිතොත්, දිවි ඇති තාක් වුවද පිළිදැගියයුතුය. එසේම පැවිදිකළ ආචාර්යවරයාද, උපසම්පද දුන් ආචාර්යවරයාද, සද්ධිවිහාරිකයෝද, උපසම්පද කරවනලද, පැවිදි කරවන ලද අන්තේවාසිකයෝද, සමාන උපාධ්‍යායකයෝද පිළිදැගිය යුත්තාහුය. නිස්සය දුන්, උද්දේසය දුන් ආචාර්යවරයෝද, නිස්සය ලබන, උද්දේසය ලබන අන්තේවාසිකයෝද, සමානාචාර්යකයෝද, යම්තාක් නිස්සය උද්දේසයන් නොසිඳී පවත්නේද ඒ තාක් පිළිදැගිය යුත්තාහුය. හැකියාව ඇතොත් එයට වැඩි කලක් වුවද පිළිදැගිය යුත්තාහුමය. මාපියන් කෙරෙහි උපාධ්‍යායයන් කෙරෙහි මෙන් පිළිපැදිය යුතුය. ඉදින් ඔවුන් රජවී සිටිත් මුත්, පුතුන්ගෙන්ම උවටැන් අපේක්ෂා කෙරෙත්හොත් උවටැන් කළයුතුම වේ. තවද ඔවුන්හට බෙහෙත් නැතහොත්, තමා සතු බෙහෙත් දියයුතුය, තමාසතු බෙහෙත් නැතොත්, භික්ෂාචර්යාවෙන් සොයා හෝ දියයුතුමය. සොහොවුරු සොහොයුරියන්හට වනාහි ඔවුන් සතු බෙහෙත්ම යොද

දියයුතුය. ඔවුන් සතු බෙහෙත් නැතොත් තමා සතු බෙහෙත් තාවකාලික වශයෙන් දී පසුව ලැබෙතොත් ගතයුතුය, නොලැබෙතොත් නොඉල්වියයුතුය. සොහොයුරියගේ නොනෑ සැමියාහට බෙහෙත් කරන්නටද දෙන්නටද නොවටනේය, සැමියාහට දෙවයි සොහොයුරියට දියයුතුය. සෝවුරු බිරියටද මෙම නයයි. ඔවුන්ගේ දරුවන් වනාහි තමාගේද නෑයන්ම වන හෙයින් ඔවුනට බෙහෙත් කරන්නටද දෙන්නටද වටී.

**ආබාධො** යනු, කිසියම් රෝගයෙකි, එය තමාට බාධා කරන හෙයින් පලිබෝධයෙකි. එහෙයින් බෙහෙත් කිරීමෙන් පසිඳලිය යුතුය. ඉදින් කිහිප දවසක් බෙහෙත් කොටද නොසන්සිදෙතොත්, මම තොපගේ දසයෙක් නොවෙමි, බැළයෙක් හෝ නොවෙමි, තොපම පෝෂණය කෙරෙමින් අනාදිමත් සංසාරවට්ටයෙහි දුකට පැමිණියේ වෙමියි ආත්මභාවයට නිග්‍රහකොට මහණදම් පිරියයුතුය.

**ගන්‍ථො** යනු, පර්යාප්ති පරිහරණයයි. එය සජ්ඣායනාදියෙන් නිතර ව්‍යාපෘත වූවහුට පලිබෝධයෙකි. එසේ නොවූවහුට පලිබෝධ නොවේ. එහිලා මේ කථාවස්තුහු වෙති: මජ්ඣිමභාණක දෙව තෙරණුවෝ මලයවාසී දෙව තෙරුන් වෙත ගොස් කමටහන් ඉල්වූහ. තෙරණුවෝ ඇවැත්නි, පර්යාප්ති විෂයෙහි කෙබඳු වන්නහුදැයි විචාළහ. ස්වාමීනි, මැදුම්සඟිය ප්‍රගුණයයි කීහ. ඇවැත්නි, මේ මැදුම්සඟිය නම් දුකසේ පරිහරණය කළයුත්තෙකි, මූලපණ්ණාසකය සජ්ඣායන කරන්නහුට මජ්ඣිමපණ්ණාසකයද, මජ්ඣිමපණ්ණාසකය සජ්ඣායන කරන්නහුට උපරිපණ්ණාසකයද එකිනෙක පැටලේ, ඔබට කමටහන් කොයින්දැයි කීහ. ස්වාමීනි, ඔබවහන්සේ වෙතින් කමටහන් ලබා ගැනීමෙන් පසු නැවත එය නොබලන්නෙමියි කියා කමටහන් ගෙන එකුන්විසි හවුරුද්දක් සජ්ඣායනා නොකොට සිට විසිවන හවුරුද්දෙහිදී රහත් බවට පැමිණ, සජ්ඣායන පිණිස ආ භික්‍ෂූන්හට, ඇවැත්නි, මවිසින් පර්යාප්තිය නොබලන්නට පටන්ගෙන විසිහවුරුද්දෙකි, එතෙකුදු වූවත් එය මට පුරුදුය, මෙතැනින් අරඹවූයයි කියා මූල පටන් අවසන තෙක් එක් අකුරෙක පවා සැකයක් නොවීය. කරලියගිරි වැසි නාග තෙරණුවෝද අටළොස් වසරක් පර්යාප්තිය හැර සිට භික්‍ෂූන්හට ධාතුකථා ප්‍රකරණය දෙසූහ. ග්‍රාමවාසී භික්‍ෂූන් හා සමග එය සංගායනය කරන එම භික්‍ෂූන්හට උපිළිවෙළින් ආ එකද ප්‍රශ්නයෙක් නොවීය. මහාවිහාරයෙහිද ත්‍රිපිටකධර චූලාභය නම් තෙරණුවෝ අටුවා නොඉගෙනම, පංචනිකාය හදළ භික්‍ෂූන්හට ත්‍රිපිටකය විවරණ කරන්නෙමැයි රන්බෙරය ගැස්වූහ. භික්‍ෂුසංඝයා, කවර නම් ආචාර්යවරයකුගේ ඉගැන්වීමද? තමාගේ ආචාර්යවරයාගේ ඉගැන්වීම කියත්වා. නැතහොත් කියන්නට නොදෙම්හයි

කීහ. ඔවුන්ගේ උපාධ්‍යායයෝද තමන්ට උපස්ථාන පිණිස ආ අභය තෙරුන්ගෙන් මෙසේ විචාළහ: ඇවැත්නි, බෙර හඬුරුවා ලූවහුද? එසේය ස්වාමීනි, කුමක් පිණිසද? ස්වාමීනි, පර්යාප්තිවිවරණය කරන්නෙමියි කීහ. ඇවැත්නි, ආචාර්යවරයෝ මේ පදය කෙසේ විවරණ කෙරෙත්ද? ස්වාමීනි, මෙසේ කියතියි පැවසූහ. තෙරණුවෝ හුංකාරයෙන් එය ප්‍රතික්ෂේප කළහ. යළි අනෙක් අනෙක් ආකාරයෙකින් මෙසේ කියතියි තුන් වරක් පැවසූහ. තෙරණුවෝ හුංකාරයෙන් සියල්ල ප්‍රතික්ෂේප කොට, ඇවැත්නි, ඔබ විසින් පළමුවෙන් කියන ලද්දම අට්ඨකථාආචාර්යයන් දක්වන මාර්ගයයි. ආචාර්යවරයකුගෙන් නොඋගත් හෙයින් අට්ඨකථාචාර්යයෝ මෙසේ කියතියි නොසැලී සිටිනු නොහැකිවූවහුය. ගොසින් ආචාර්යවරයකු අතින් අරුත් අසාගනු මැනවැයි කීහ. ස්වාමීනි, කොහි යම්දැයි කීහ. මහවැලි ගඟින් එතෙර රුහුණු දනව්වෙහි තලදරුපවු වෙහෙර සකල පර්යාප්තිධර ධම්මරක්ඛිත නම් තෙරණු කෙනෙක් වෙති, ඔවුන් වෙත යනුයැයි කීහ. ස්වාමීනි, යහපතැයි කියා තෙරුන් වැඳ, භික්ෂූන් පන්සියයක් හා සමග තෙරුන් වෙත ගොස් වැඳ හුන්හ. තෙරණුවෝ කවර හෙයින් ආවහුදැයි විචාළහ. ස්වාමීනි, දහම් අසනු පිණිසයයි කීහ. ඇවැත්නි, දීඝ මජ්ඣිම දෙනිකායන්හි කලින් කල මා විචාරති, සෙසු දහම් කොටස් මවිසින් තිස් හවුරුද්දෙකින් පමණ නොබලන ලදි, එහෙත් ඔබ රාත්‍රිභාගයෙහි මා ඉදිරිපිටට විවරණ කරනුය, මම් දිවා කාලයෙහි කියා දෙමියි පැවසූහ. ඔහු (චූලාභය තෙරණුවෝ)ද එසේ කළහ. ගම්වැසි ජනයා පරිවෙණද්වාරයෙහි මහාමණ්ඩපයක් තනා දිනපතා දහම් ඇසීමට එන්නාහ. තෙරණුවෝ රාත්‍රිකාලයෙහි විවරණය කරනලද්ද දිවාකාලයෙහි කියා දෙමින් පිළිවෙළින් දේශනාව නිමකොට, අභය තෙරුන් සමීපයෙහි පත්කඩෙහි හිඳ, ඇවැත්නි, මාහට කමටහන් කියනුයයි පැවැසූහ. ස්වාමීනි, කුමක් කියන්නහුද? මා ඔබවහන්සේ වෙතින්ම ඇසූවිරූ නොවේද? ඔබ වහන්සේ නොදත් කුමක් මම් කියන්නෙම්දැයි පැවසූහ. ඉක්බිති තෙරණුවෝ ඇවැත්නි, මේ අධිගම මාර්ගය නම් අනිකක්මයයි කීහ. චූලාභය තෙරණුවෝ වනාහි එවකට සෝවාන්වී සිටියහ. ඉක්බිති චූලාභය තෙරණුවෝ ඒ ධම්මරක්ඛිත තෙරුන්හට කමටහන් දී පෙරළා (අනුරාධපුරයට) අවුත් ලෝවාමහපායෙහි දහම් විවරණ කරන්නාහු (ධම්මරක්ඛිත තෙරුන්) පිරිනිවියහයි අසා, ඇවැත්නි, පාසිවුරු ගෙන එවූයයි සිවුරු පොරවාගෙන, ඇවැත්නි, අපගේ ආචාර්යවරයන් වහන්සේගේ රහත්මග සුදුසුමය, අපගේ ආචාර්යයන් වහන්සේ ඍජුයයි දැනගතයුතු කෙනෙකි, උන්වහන්සේ තමන්ගේ ධර්මාන්තේවාසිකයන් ළඟ පත්කඩෙහි හිඳ, මට කමටහන් කියනුයයි පැවසූහ, ඇවැත්නි, තෙරුන්වහන්සේගේ රහත්මඟ සුදුසුමයයි කීහ. මෙවැන්නවුන්හට ග්‍රන්ථධුරය පලිබෝධ නොවේ.

**ඉද්ධි** යනු, පෘථග්ජනයන්ගේ ඍද්ධියයි. එම ඍද්ධිය වනාහි උඩුබැලිව නිදන වියෙහි සිටින දරුවකු සෙයින්ද, ළපටි ගොයමක් සෙයින්ද දුකසේ පරිහරණය කළයුතු වන්නේය, සුළු අතපසු වීමෙකින් පවා බිඳෙනසුලුය, එය වනාහි විදර්ශනාවට පලිබෝධයෙක් වේ, සමාධියට එසේ නොවේ, සමාධියට පැමිණ ලබාගතයුතු හෙයිනි, එහෙයින් විදර්ශනා කැමැත්තවුන් විසින් ඍද්ධිපලිබෝධය පසිඳලිය යුතුය. අන්‍යයන් (සමාධි කැමැත්තවුන්) විසින් සෙසු පලිබෝධයන් පසිඳලිය යුතුය. මේ පලිබෝධකථා වර්ණනායි.

**කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා** (කමටහන් දෙන කල්‍යාණ මිත්‍රයකු වෙත එළඹ) යනු මෙහි වනාහි කමටහන් දෙ-ආකාරවේ. සබ්බත්ථක හෙවත් සියලු තන්හි යුතු කර්මස්ථාන හා පාරිහාරිය හෙවත් තමාගේ චරිතයට අනුව පරිහරණය කළයුතු කර්මස්ථානයි. සියලු තන්හි යුතු කමටහන් නම්: භික්ෂුසංඝාදීන් කෙරෙහි මෛත්‍රී වැඩීමද, මරණානුස්මෘතියද යන මේවායි, ඇතැමෙක් අශුභසතියයිද කියති. කමටහන් ගන්නා භික්ෂුව විසින් පළමුකොටම සීමාව ඇතුළත වෙසෙන භික්ෂුසංඝයා කෙරෙහි, සුවපත් වෙත්වා, වෛර නැත්තෝ වෙත්වායි මෙත් වැඩිය යුතුය. ඉක්බිති සීමාව ඇතුළත දේවතාවන් කෙරෙහි, ඉක්බිති ගොදුරු ගම්හි ප්‍රභූජනයා කෙරෙහි, ඉක්බිති එහි පොදු මහජනයා පටන් සියලු සත්වයා කෙරෙහි වැඩියයුතු වේ. ඒ භික්ෂු තෙමේ වනාහි භික්ෂුසංඝයා කෙරෙහි මෙත් වැඩීමෙන් සමගවසන්නවුන් තුළ මුදුසිත් ඇතිකරවයි, ඒ හේතුවෙන් ඔවුහු සුඛසහවාස (සැපවත් සහවාස) ඇත්තෝ වෙති. සීමාස්ථ දේවතාවන් කෙරෙහි මෙත් වැඩීමෙන් මුදු මොලොක් බවට පත් සිත්ඇති දේවතාවන් විසින් දැහැමි රැක්මෙන් මනාව පිහිටුවනලද ආරක්ෂා ඇත්තේ වේ. ගොදුරු ගම්හි ප්‍රභූජනයා කෙරෙහි මෙත් වැඩීමෙන් මුදු මොලොක් බවට පත් සිත්ඇති ප්‍රභූන් විසින් දැහැමි රැක්මෙන් මනාව රක්නාලද පිරිකර ඇත්තේ වේ. එහි පොදු මහජනයා කෙරෙහි මෙත් වැඩීමෙන් පැහැදුණු සිත්ඇති ඔවුන් විසින් නින්ද නොකරනලදුව හැසිරේ. සියලු සත්වයන් කෙරෙහි මෙත් වැඩීමෙන් සියලුතන්හි නොවලක්වනලද හැසිරීම් ඇත්තේ වේ. මරණානුස්මෘතිය හේතුකොටගෙන, අවශ්‍යයෙන්ම මා මරණයට පත්වියයුතුයයි සිතන්නේ ප්‍රත්‍යාන්වේෂණය හැර, මතු මත්තේ වැඩෙන සංවේග ඇත්තේ පසු නොබස්නා සිත් ඇත්තේ වේ. අසුබ හැඟීම පුරුදුකළ සිත් ඇත්තහුට වනාහි දිව්‍යමයවූ අරමුණු පවා ලෝභ වශයෙන් සිත නොපාරයි. මෙසේ බොහෝ උපකාර ඇති හෙයින් සියලු තන්හි සෙවියයුතුය, කැමැති වියයුතුයයි. අභිප්‍රේතවූ යෝගාවචර කර්මයට පදස්ථානයයි යන අරුතින් කර්මස්ථානයයි කියනු

ලැබේ. සතළිස් කර්මස්ථානයන් අතුරෙන් යමක් යමකුගේ චරිතයට අනුකූලවේනම්, එය ඔහු විසින් නිතොරව පරිහරණ කළයුතුවන හෙයින් මතුමත්තෙහි භාවනා කිරීමට පදස්ථානවන හෙයින් පාරිහාරිය කර්මස්ථානයයි කියනුලැබේ. මෙසේ මේ ද්විවිධ කර්මස්ථානයන් යමෙක් දෙන්නේනම්, හේ තෙමේ කර්මස්ථානදායක නම් වේ. එවැනි කර්මස්ථාන දායකයායි.

**කල්‍යාණමිත්තං** යනු,

පියො ගරු භාවනීයො වත්තා ච වචනක්ඛමො
ගම්භීරඤ්ච කථං කත්තා නොචට්ඨානෙ නියොජයෙ[1]

ප්‍රියය, ගරුත්වයෙන් යුක්තය, සම්භාවනා කටයුතුය, කීමෙහි බිණීමෙහි දක්‍ෂය, වචන පිනවනසුලුය. ධර්මසංයුක්ත ගැඹුරු කථා ඇත්තේය. නොතැන්හි නොයොදවන්නේය.

මේ ආදී ගුණයෙන් සමන්විතවූ, ඒකාන්තයෙන් හිත කැමතිවූ, වෘද්ධිපක්‍ෂයෙහි සිටි කල්‍යාණමිත්‍රයායි, 'ආනන්දය, කල්‍යාණමිත්‍ර වූ මා වෙත පැමිණ ඉපදීම ස්වභාවකොට ඇති සත්වයෝ ඉපදීමෙන් මිදෙති.'[2]

මේ ආදී වචනයෙන් සම්මාසම්බුදුන් වහන්සේම සියලු ලක්‍ෂණයෙන් හෙබි කල්‍යාණමිත්‍රයෙකි. එහෙයින් බුදුන් දිවමන් කල ඔවුන්ගෙන්ම ලබාගත් කමටහන් මනාකොට ගන්නාලද්දේවේ. ඔවුන් පිරිනිවි කල, අසූ මහසව්වන්ගෙන් යම් කෙනෙක් දිවමන් වෙත්නම් ඔවුන් වෙතින් ලබාගැනීම වටනේය. ඔවුන්ද දිවමන් නොවූ කල්හි යම් කර්මස්ථානයක් ගනු කැමැත්තේද, එම කර්මස්ථානයම වැඩීම් වශයෙන් චතුර්ත්ථ පංචමධ්‍යානයන් උපදවා එම ධ්‍යානය පාදකකොට විදර්ශනා වඩා රහත්ඵලයට පත් ක්‍ෂීණාශ්‍රව කෙනකු වෙතින් ගතයුතුය. කිමෙක්ද? ක්‍ෂීණාශ්‍රවයෙක් තෙමේ මම් ක්‍ෂීණාශ්‍රවයෙක්මියි තමා හඳුන්වා ගන්නේද? මෙහි කිවයුත්තක් ඇත්ද? භාවනා කරන්නකු බව දතහොත් (තමා ක්‍ෂීණාශ්‍රවයකු බව) ප්‍රකාශ කරන්නේමය. අස්සගුත්ත තෙරණුවෝ මේ භික්‍ෂුව විසින් කමටහන් අරඹන ලද්දේය, මේ තෙමේ කාර්යය කරන්නෙකියි දැන, අහස්හි පත්කඩ එලා එහි පලක් බැඳ හිඳ කමටහන් නොකීවාහුද? එහෙයින් ක්‍ෂීණාශ්‍රව කෙනකුම ලබතොත් යෙහෙකි, ඉදින් නොලබතොත්, අනාගාමී, සකෘදගාමී ශ්‍රෝතාපත්තිලාභී, ධ්‍යානලාභී පෘථග්ජන, ත්‍රිපිටකධර, ද්විපිටකධර, එකපිටකධර යන මොවුන් අතුරෙන් පළමු

(1) අං. නි. සත්තක නි. Aiv 32
(2) සං. නි. සගාථවග්ග. Si 88

කියන ලද්දහු සමීපයෙන් ලබාගතයුතුය. එකපිටකධරයකුද නැතිවිට, යමකු විසින් එක් සඟියක් හෝ අටුවා සහිතව ප්‍රගුණ කරන ලද්දේනම්, තෙමේද, ලජ්ජී වේනම්, ඔහු වෙතින් (කමටහන්) ලබාගත යුතුය. පර්යාප්තිධරවූ. වංශානුරක්ෂකවූ, ආචාර්යවාදය රක්නාවූ මෙබඳුවූ ආචාර්ය තෙමේ ආචාර්ය මතයෙහි පිහිටියේම වේ, තමාගේ මතයෙහි සිටියේ එසේ නොවේ. එහෙයින්ම පුරාතන තෙරවරයෝ (ථේරවාදීහු) ලජ්ජී රක්ඛිස්සති, ලජ්ජී රක්ඛිස්සති" (ලජ්ජී තෙමේ රකියි, ලජ්ජී තෙමේ රකියි) යයි කීහු. පෙර කී ක්ෂීණාශ්‍රවාදීහුද මෙහිලා තමා විසින් අවබෝධ කළ මාර්ගයම කියන්නාහුය, බහුශ්‍රැත තෙමේ වනාහි ඒ ඒ ආචාර්යවරයන් වෙත එළඹ, උග්ගහ, පරිපුච්ඡා වශයෙන් දහම් අරුත් විවරණ පිරිසුදුකර ගන්නාලද හෙයින් ඒ ඒ තැන සූත්‍රයද, කාරණයද සැලකිල්ලට ගෙන කමටහනට යෝග්‍ය සප්පාය අසප්පාය යොදා ගහන තන්හි යන මහ ඇතකු සෙයින් කමටහන් විධි නමැති මහමඟ දක්වමින් කමටහන් කියති. එහෙයින් කමටහන් දෙන කල්‍යාණමිත්‍රයකු වෙත එළඹ ඔහුට වත්පිළිවෙත් කොට කමටහන් ගතයුතුය. ඉදින් ඔහු (කමටහන් දෙන්නා) එකම විහාරයෙහි ලැබෙතොත් මැනවි, නොලැබෙතොත්, ඔහු යම් තැනෙක වෙසේනම් එහි යායුතුය, එසේ යනවිට, සෝද තෙල් ගැල්වූ පා සහිතව වහන්නැඟී, කුඩය ගෙන, තෙල්නල, මීපැණි ආදිය ගෙන්වාගෙන අත වැසියන් පිරිවරාගෙන නොයායුතුය. ගමිකවත් පුරා තමාගේ පාසිවුරු තමාම ගෙන, අතරමඟ යම් විහාරයකට පිවිසේනම් ඒ ඒ සියලු තන්හිදීම වත්පිළිවෙත් කරමින්, සැහැල්ලු පිරිකර ඇතිව, පරම සල්ලේඛ පැවතුම් ඇතිව යායුතුය. එම විහාරයට පිවිසෙනවිට අතරමඟදීම දැහැටිදඬු කැප කරවාගෙන පිවිසිය යුතුය. මොහොතක් විවේක ගෙන පා දෙවීම් තෙල් ගැල්වීම් ආදිය කොට, ආචාර්යයන් වෙත යෙමියි අන් පිරිවෙණකට නොවැදිය යුතුය. කවර හෙයින්දයත්, ඉදින් එහි මේ ආචාර්යයන්හට නොපහන් භික්ෂූහු වෙත්නම්, ඔවුහු ආ කරුණු විමසා ආචාර්යයන්ගේ නුගුණ පවසා, ඔවුන් වෙත ආයෙහි නම් නටුයේ වෙහියි විපිළිසර උපදවන්නාහුය, එයින්ම ආපසු යන්නට සිදුවේ, එහෙයින් ආචාර්යයන් වෙසෙන තැන් විමසා කෙළින්ම එහි යායුතුය. ඉදින් ආචාර්යයන් තමනට වඩා අඩුවයස් වෙතොත් පාසිවුරු ආදිය පිළිගැනීම නොඉවසිය යුතුය. ඉදින් වැඩිවයස් වෙතොත් ගොස් ආචාර්යයන් වැඳ සිටිය යුතුය. ඇවැත්නි, පාසිවුරු බහාතබනුයයි කී විට බහා තැබිය යුතුය. පැන් බොනුයයි කීවිට රිසි ඇතොත් පියයුතුය, පා දෙවනුයයි කීවිට පළමුව නොදෙවියයුතුය. ඉදින් ආචාර්යයන් විසින් ගෙනෙනලද දිය ඇතොත්, එය යෝග්‍ය නොවේ. ඇවැත්නි, දෙවනුය, මවිසින් ගෙනෙනලද දිය නොවේ, අන්‍යයන් විසින් ගෙනෙන ලද්දේයයි කීවිට, ආචාර්යයන්හට

නොපෙනෙන ලෙස ඇවුරුණු තැනකදී හෝ අභ්‍යවකාශ විහාරයෙක් නම්, එක් පසෙක හිඳ පාදෙවිය යුතුය. ඉදින් ආචාර්යයෝ තෙල්නල ගෙනඑත් නම්, නැගිට දෙඅතින්ම මනාසේ පිළිගතයුතුය. ඉදින් නොගතහොත්, මේ භික්ෂු තෙමේ මෙතන් සිටම සමග පරිභෝග කිරීම කඩන්නේයයි ආචාර්යයන්තුළ විමතියක් හටගන්නේය. තෙල්නල ගෙන පළමුව පා නොගල්වන්නේය, ඉදින් එය ආචාර්යයන් සිරුර ගල්වන තෙලක් නම් යෝග්‍ය නොවේ. එහෙයින් පළමුකොට හිස ගල්වා ඉක්බිති උරහිස් ආදියෙහි ගැල්විය යුතුය. ඇවැත්නි, මෙය සියලු අවයවයන්හි ගැල්විය යුතු තෙලකියි පාවල ගල්වනුයයි කීවිට පාවල ගල්වා, මේ තෙල්නල තබමි ස්වාමීනියි කියා ආචාර්යයන් ගන්නාවිට යලි පෙරලා දියයුතුය. ආ දවස්ම ස්වාමීනි මට කමටහන් කියනු මැනවැයි නොකිව යුතුය. දෙවන දවස් පටන්, ඉදින් ආචාර්යයන්හට නිත්‍ය උපස්ථායකු වෙතොත්, ඔහුගෙන් ඉල්වාගෙන වත්පිළිවෙත් කළයුතුය, ඉදින් ඉල්වාද නොදෙතොත් අවසරයක් ලත් විටෙකම කළයුතුය. එසේ වත් කරන්නහු විසින් කුඩා මධ්‍යම මහත් දැහැටි දඬු තුනක් එළවිය යුතුය, ශීත වූද රත්වූද මුවදෝන ජලයද, නහන ජලයද පිළියෙළ කළ යුතුය. එයින් යමක් ආචාර්යයන් තුන් දවසක් පරිභෝග කළහොත්, එවන් දේම නිරතුරු එළවිය යුතුය. නියමයක් නැතිව කවර හෝ දියක් පරිභෝග කරන්නහුට ලදදෙයක් එළවිය යුතුය. බොහෝකොට කියනු කිම? මහණෙනි, අන්තේවාසිකයා විසින් ආචාර්යයන් කෙරෙහි මනාසේ පැවතිය යුතුය. එහිලා මනා පැවතුම් මෙසේය: වේලාසනින් නැගිට පාවහන් මුදවා තබා තනිපට සිවුර ඒකාංශ කොටගෙනම දැහැටි පිළිගැන්විය යුතුය. මුවදෝනා ජලය එළවියයුතුය, අසුන් පැනවිය යුතුය, ඉදින් හුළුකැඳ ඇතොත් බඳුන් දොවා හුළුකැඳ පිළිගැන්විය යුතුය[1] යන ආදී වශයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් ඛන්ධකයෙහි යමක් මනාකොට දක්වන ලද්දේද වත් පනවන ලද්දේද, ඒ සියල්ල කළයුතුය. එසේ වත් සැපයීමෙන් ගුරුන් සිත් ගෙන සවස් කාලයෙහි යන්නැයි මුදු හළ විට වැඳ යායුතුය. යම් දවසෙක කුමක් සඳහා ආයෙහිදැයි පිළිවිසිත්ද, එවිට ආ කරුණ කිව යුතුය. ඉදින් නොවිමසාම වත් ඉවසතහොත් දස දිනක් හෝ අඩමසක් ඉක්ම ගියකල, එක් දිනෙක යන්නැයි සත් කළ විට පවා නොගොස් අවසරගෙන ආ කරුණ දැන්විය යුතුය, නොකල්හි හෝ ගොස් කුමක් නිසා ආයෙහිදැයි විචාළ කල දැන්විය යුතුය. ඉදින් ඔවුන් උදැසනින්ම එන්නැයි කිවහොත් උදැසනින්ම යායුතුය. ඉදින් එම වේලෙහි පිත් රෝගයක් නිසා හෝ කුසදැවිල්ල වේනම්, නැතහොත් කුසගිනි මද

(1) මහාවග්ග, පාරිවාසික ඛන්ධක. Vin i 61

බැවින් අහර නොදිරා තිබේනම්, අන්කිසි රෝගයෙකින් හෝ පෙළේ නම්, ඒ බව ඇති තතු සැලකොට තමාට පහසු වේලාවක් දන්වා ඒ වේලාවෙහි එළඹියයුතුය, අසප්පාය වේලාවෙහි කියනලද කමටහන් මෙනෙහිකිරීම පවා නොහැකිවේ. කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා (කමටහන් දෙන කල්‍යාණමිත්‍රයකු වෙත එළඹ) යන මෙහි විස්තර කථාවයි.

ඉක්බිති. **අත්තනො චරියානුකූලං** (තමාගේ චරිතයට අනුකූලවූ) යන මෙහි, **චරියා** නම් රාගචරියා, දෙසචරියා, මොහචරියා, සද්ධාචරියා, බුද්ධිචරියා, විතක්කචරියායයි මෙසේ චර්යා සයෙකි. ඇතැමෙක් වනාහි, රාගාදී තුන එකින් එක මුසුවීමෙන් හා තුනම මෙසේ එක්වීමෙන් (රාග-ද්වේෂ, රාග-මෝහ, ද්වේෂ-මොහ, රාග-ද්වේෂ-මෝහ) යනුවෙන් සතරක්ද එසේම ශ්‍රද්ධාදී ඉතිරි තුන එකින් එක හා තුනම සමසේ මුසු වීමෙන් (ශ්‍රද්ධා-බුද්ධි, ශ්‍රද්ධා-විතර්ක, බුද්ධි-විතර්ක, බුද්ධා-බුද්ධි-විතර්ක) යනුවෙන් සතරක්දැයි තවත් අටක් හා සමග තුදුසක් කැමැති වෙති. මේ ආකාරයෙන් ප්‍රභේදයන් කියතොත් රාගාදිය හා ශ්‍රද්ධාදිය සමග මුසු කොටද බොහෝ චර්යාවෝ වෙති, එහෙයින් සංක්ෂේප වශයෙන් චර්යාවෝ සයක්ම වෙති'යි දතයුතුය. චර්යා, ප්‍රකෘති, උත්සන්නතා යන මේ වචන තුනම අරුත් වශයෙන් සමාන වේ. එම මූලචර්යාවන්ගේ වශයෙන් රාගචරිතයාය, ද්වේෂ චරිතයාය, මොහචරිතයාය, ශ්‍රද්ධාචරිතයාය, බුද්ධිචරිතයාය, විතර්කචරිතයායයි පුද්ගලයෝ සදෙනෙක්ම වෙති. එහි යම් හෙයකින් රාගචරිතයාහට කුසල් සිත් පවත්නා කල ශ්‍රද්ධාව බලවත් වේනම්, ඒ රාගයට ආසන්න ගුණ ඇති හෙයිනි. යම් හෙයකින් අකුශල පක්‍ෂයෙහි රාගය සිනිදු ගුණ ඇත්තේ වේද, රළු ස්වභාවයෙන් තොරවූයේ වේද, කුශලපක්‍ෂයෙහි ශ්‍රද්ධාවද එසේය. යම්සේ රාගය වස්තුකාමයන් සොයන්නේ වේද, එසේම ශ්‍රද්ධාව ශීලාදී ගුණයන් සොයන්නේ වේ. යම්සේ රාගය අහිත දෙය නොහරනේ වේද, එසේම ශ්‍රද්ධාව හිත දෙය නොහරනේ වේ, එහෙයින් රාගචරිතයා හා ශ්‍රද්ධාචරිතයා අනුකූලස්වභාව ඇත්තාහු වෙති. යම් හෙයකින් ද්වේෂ චරිතයාහට කුසල් සිත් පවත්නා කල ප්‍රඥව බලවත් වේද, ඒ ද්වේෂයට ආසන්න ගුණ ඇති හෙයිනි. යම්සේ වනාහි අකුශල පක්‍ෂයෙහි ද්වේෂය ඇලුම් නැතියේ අරමුණෙහි නොඇලේද, කුශල පක්‍ෂයෙහි ප්‍රඥවද එසේය. යම්සේ ද්වේෂය නැති දෙස් පවා සොයන්නේ වේද, එස්ම ප්‍රඥව ඇති දෙස් සොයන්නේ වේ. යම්සේ ද්වේෂය සත්වයන් නොරුස්නා ආකාරයෙන් පවතීද, එසේම ප්‍රඥව සංස්කාරයන් නොරුස්නා ආකාරයෙන් පවතී. එහෙයින් ද්වේෂ චරිතයාහට බුද්ධිචරිතයා අනුකූල ස්වභාව ඇත්තේ වේ. යම් හෙයකින්

මොහචරිතයාහට නූපන් කුසල් දහම් ඉපැදවීම පිණිස යත්න කරනවිට බොහෝසෙයින් අන්තරායකර විතර්කයෝ පහළ වෙත්ද, ඒ මොහ චරිතයාහට ආසන්න ලක්‍ෂණ ඇති හෙයිති. යම්සේ වනාහි මෝහය අවුල් සහගත ස්වභාව ඇති හෙයින් එක් අරමුණෙක නොසිටිනේ වේද, එසේම විතර්කය නානාආකාර විතර්කයන් හේතුකොට අරමුණෙහි නොසිටිනේය. යම්සේ මෝහය අරමුණෙහි ගැඹුරට බැස නොසිටින හෙයින් චංචල වූයේද එසේම විතර්කය ලුහු කල්පනා ඇති හෙයින් චංචලවේ. එහෙයින් මෝහචරිතයා විතර්ක චරිතයාහට අනුකූල ස්වභාව ඇත්තේවේ. ඇතැමෙක් තෘෂ්ණා මාන, දෘෂ්ටි වශයෙන් තවද චර්යාවන් තුනක් දක්වති. එහි තෘෂ්ණා නම් රාගය මැයි. මානයද රාගය හා සමග යෙදුණේ වේ, එහෙයින් ඒ දෙක රාගචරිතය ඉක්ම නොපවතී. දෘෂ්ටිය මෝහය නිදානකොට ඇතිහෙයින් දෘෂ්ටිචරිතය මෝහචරිතය තුළම වැටේ.

ඒ මේ චර්යාවෝ කුමක් නිදානකොට ඇත්තාහුද? මේ පුද්ගලයා රාගචරිතයෙකි, මේ පුද්ගලයා ද්වේෂාදී වශයෙන් එක්තරා චරිතයක් ඇත්තෙකි, කවර චරිතයක් ඇති පුද්ගලයාට කුමක් සප්පාය වේදැයි කෙසේ දතයුතුද? එහි වනාහි රාගාදී ප්‍රථම චර්යා තුන පෙර අත්බව්හි පුරුදු කරනලද දෙය නිදානකොට ඇත්තේයයිද, පෘථිවි ආදී ධාතුන් හෝ ශ්ලේෂ්මාදී දෝෂයන් මුල්කොට ඇත්තේයයිද ඇතැමෙක් පවසති. පෙර අත්බව්හි හිතකර ක්‍රියාවල හා යහපත් ක්‍රියාවල යෙදීම බහුලවූයේ හෝ දෙව්ලොවින් චුතව මෙහි උපන්නේ රාගචරිත ඇත්තෙක් වේ, පෙර අත්බව්හි කැපීම් කෙටීම් වධ බන්ධන වෛරකිරීම් බහුලවූයේ හෝ නිරයෙන්ද නාගයෝනියෙන්ද චුතව මෙහි උපන්නේ ද්වේෂ චරිත ඇත්තෙක් වේ, පෙර අත්බව්හි මද්‍යපානයෙහි බහුල වහයෙන් යෙදුණේ හෝ ඉගෙනීම් අරුත් ඇසීම් නොකළේ හෝ තිරිසන් යෝනියෙන් චුතව මෙහි උපන්නේ මොහචරිත ඇත්තේ වේ. මෙසේ පෙර පුරුද්ද නිදානකොට ඇත්තේයයි කියති. පෘථිවි ආපෝ යන උභයධාතූන් උත්සන්න වීමෙන් මොහචරිත ඇත්තේ වේ. සෙසු ධාතූන් දෙදෙනාගේ උත්සන්න වීමෙන් ද්වේෂ චරිත ඇත්තේ වේ, සියලු ධාතූන් සමවීමෙන් රාගචරිත ඇත්තේ වේ. තුන් දෙස් අතුරෙන් සෙම අධික වූයේ රාගචරිත ඇත්තේ වේ, වාතය අධිකවූයේ මොහචරිත ඇත්තේ වේ, නැතහොත්, සෙම් අධිකවූයේ මොහ චරිත ඇත්තේ වේ, වාතය අධික වූයේ රාගචරිත ඇත්තේ වේ, මෙසේ ධාතූන් හා දෙෂයන් නිදානකොට ඇත්තේයයි කියත්.

එහි යම් හෙයකින් පෙර අත්බව්හි හිතකර ක්‍රියා යහපත් ක්‍රියා බහුල ඇත්තාවූද, දෙව්ලොවින් චුතව මෙහි උපන්නාවූද සියලු දෙනා

රාගචරිත ඇත්තෝ නොවෙති. ද්වේෂ හෝ මොහචරිත ඇත්තෝයයි දක්වනලද සියල්ලෝම එසේ ද්වේෂ හෝ මොහචරිත ඇත්තෝ නොවෙති. එසේම ධාතුන්ගේද කියනලද ආකාරයෙන් උත්සන්න වීමේ ඒකාන්ත නියමයෙක් නැත්තේය, දොෂ නියමයෙහිද රාග මෝහ යන දෙක පමණක් කියන ලද්දේ වේ. (ද්වේෂය ගැන සඳහනෙක් නැත) එයද පරස්පර විරෝධී වේමය. ශ්‍රද්ධාදීන් අතුරෙන් එකද චරිතයක් පිළිබඳ නිදන නොකියන ලදි. එහෙයින් මේ සියල්ල නොපිරික්සා කියනලද වචනයි.

මේ වනාහි මෙහිලා අර්ථකථාචාර්යයන්ගේ මතයනට අනුව කැරෙන විනිශ්චයයි: උත්සන්නතා විස්තරයෙහි කියනලද මැයි: මේ සත්වයෝ පෙර අත්බව්හි හේතු නියායෙන් ලෝභය උත්සන්නකොට ඇත්තාහුද, ද්වේෂය උත්සන්නකොට ඇත්තාහුද, මොහය උත්සන්නකොට ඇත්තාහුද, අලොභය උත්සන්නකොට ඇත්තාහුද, අද්වේෂය උත්සන්නකොට ඇත්තාහුද, අමොහය උත්සන්නකොට ඇත්තාහුද වෙති. යමකුට වනාහි කර්මය සිදු කරන අවස්ථාවෙහි ලොභය බලවත්ව අලොභය දුබලවේද, අද්වේෂය හෝ අමොහය බලවත්ව ද්වේෂය හා මොහය දුබලවේද, ඔහුගේ දුබලවූ අලොභය ලොභය අබිබවා යනු නොහැකිවේ. බලවත්වූ අද්වේෂය හා අමොහය ද්වේෂය හා මොහය අබිබවා යාමට හැකිවේ. එහෙයින් හේ තෙමේ එම කර්මය විසින් දෙනලද ප්‍රතිසන්ධි වශයෙන් උපන්නේ, ලොභීද රළු නොවූ ස්වභාව ඇත්තේද නොකිපෙනසුලු වූයේද, විදුරුමිණි හා සමාන තියුණු ප්‍රඥ ඇත්තේද වේ. යමකුට වනාහි කර්මය ආයූහනය කරන අවස්ථාවෙහි ලොභ, ද්වේෂ යන දෙක බලවත්ව අලොභ, අද්වේෂ යන දෙක දුබල වේද, අමොහය බලවත්ව මෝහය දුබල වේද, හේ තෙමේ පළමු කී නයින්ම ලොභී වූයේද, කිපෙනසුලු වූයේද විදුරුමිණි මෙන් තියුණු ප්‍රඥ ඇත්තේවේ, දත්තාභය තෙරුන් මෙනි. යමකුට කර්මය ආයූහනය කරන අවස්ථාවෙහි ලොභ, අද්වේෂ මොහ යන තුන බලවත්ව අනෙක් තුන දුබල වූයේද, හේ තෙමේ යටකී නියායෙන්ම ලොභීවූයේද, අඥනවූයේද, මෘදු ස්වභාව ඇත්තේද නොකිපෙනසුලු වූයේද වේ. එසේම යමකුට කර්මය ආයූහනය කරන අවස්ථාවෙහි ලොභ ද්වේෂ මොහ යන තුනම බලවත්ව අලොභාදී අනෙක් තුන දුබල වූයේද, හේ තෙමේ යටකී නයින්ම ලෝභී වූයේද කිපෙනසුලු වූයේද අඥන වූයේද වේ. යමකුට වනාහි කර්මය ආයූහනය කරන අවස්ථාවෙහි අලෝභ ද්වේෂ මොහ යන තුන බලවත්ව අනෙක් තුන දුබල වූයේද, හේ තෙමේ පළමු නයින්ම අලෝභී වූයේ මඳ කෙලෙස් ඇත්තේ, දිව්‍යාරම්මණයක් දක වුවද නිශ්චල වූයේ කිපෙනසුලු වූයේද මඳ නුවණ ඇත්තේද වේ. යමකුට කර්මය

ආයූහනය කරන අවස්ථාවෙහි අලොභ අද්වේෂ මොහ යන තුන බලවත්ව අනෙක් තුන දුබල වේද, හේ තෙමේ පළමු නියායෙන්ම අලෝභී වූයේද, නොකිපෙනසුලු වූයේද, මෘදු ස්වභාව ඇත්තේද, මඳ නුවණ ඇත්තේද වේ. එසේම යමකුට කර්මය ආයූහනය කරන අස්ථාවෙහි අලොභ ද්වෙෂ අමොහ යන තුන බලවත්ව අනෙක් තුන දුබල වේද, හේ තෙමේ පළමු නයින්ම අලොභී වූයේද, ප්‍රඥ ඇත්තේද, කිපෙනසුලු වූයේද වේ. එසේම යමකුට කර්මය ආයූහනය කරන අවස්ථාවෙහි අලොභාදි තුනම බලවත්ව ලොභාදි තුන දුබල වූයේද, හේ තෙමේ පළමු නියායෙන්ම මහාසංඝරක්ඛිත තෙරුන් මෙන් අලෝභී වූයේද, නොකිපෙනසුලු වූයේද, ප්‍රඥ ඇත්තේද වේ.

මෙහි යමෙක් (ලුද්ධ) ලෝභී යයි කියන ලද්දේද මේ රාගචරිතයාය, (දුට්ඨ, දන්ධ) කිපෙනසුලුය, අඥනයයි කියනලද්දහු පිළිවෙළින් ද්වේෂචරිතයා ද මෝහචරිතයාද වෙති, ප්‍රඥ ඇත්තේ බුද්ධිචරිතයාය, (අලුද්ධ, අදුට්ඨ) අලෝභීය අද්වේෂීයයි කියන ලද්දහු ප්‍රසන්න ස්වභාව ඇති හෙයින් ශ්‍රද්ධාචරිතයෝය. නොහොත් අමෝහය පිරිවරකොට ඇති කර්මයෙන් උපන්නේ බුද්ධිචරිතයාය. මෙසේ බලවත්වූ ශ්‍රද්ධාව පිරිවරකොට ඇති කර්මයෙන් උපන්නේ ශ්‍රද්ධාචරිතයාය, කාමවිතර්කාදිය පිරිවරකොට ඇති කර්මයෙන් උපන්නේ විතර්කචරිතයාය. ලෝභාදී මිශ්‍ර කර්මයෙන් උපන්නේ මිශ්‍ර චරිත ඇත්තේ වේ. මෙසේ ලෝභාදිය අතුරෙන් එකක් එකක් පිරිවරකොට ඇති ප්‍රතිසන්ධිජනක කර්මය චර්යාවනට නිදනවෙතියි දතයුතුය.

**කථඤ්ච ජානිතබ්බං අයං පුග්ගලො රාගචරිතො**'ති (මේ පුද්ගලයා රාගචරිතයෙක්දැයි කෙසේ දතයුත්තේද) යන ආදී යමක් කියන ලද්දේද ඒ පිළිබඳ ක්‍රමය මෙසේය:

ඉරියාපථතො කිච්චා භොජනා දස්සනාදිතො
ධම්මප්පවත්තිතො චෙව චරියා සො විභාවයෙ'ති

ඉරියව්වලින්ද, කෘත්‍යයන්ගෙන්ද, භෝජන විලාශයෙන්ද, දර්ශනාදියෙන්ද, ගතිපැවතුම් වලින්ද චර්යාවන් පළ කරන්නේය.

එහි **ඉරියාපථතො** යනු, රාගචරිතයා ප්‍රකෘති ගමනින් යන්නේ තැන්පත් ලෙස ගමන් කරයි, සෙමින් පා තබයි, සමසේ පා තබයි, සමසේ ඔසවයි. මොහුගේ පියවරද විලුඹ හා පාඅග ගැඹුරුව, මැදින් උඩට නැඹුරුව පිහිටයි. ද්වේෂචරිතයා පාඅගින් බිම හාරමින් මෙන්

යයි, වේගයෙන් පාතබයි, වේගයෙන් ඔසවයි, මොහුගේ පියවර පසුපසට අදින ලද්දක් මෙන් පිහිටයි. මෝහචරිතයා හාත්පසින් කැළඹුණු විලාශයෙන් යයි, තැතිගත්තකු මෙන් පා තබයි, තැතිගත්තකු මෙන් ඔසවයි, මොහුගේ පියවර විලුඹින් ගිලී ඉදිරියට අදින ලද්දක් මෙන් පිහිටයි. කියන ලද මැයි මාගන්දිය සූත්‍රාරම්භයෙහි:

රත්තස්ස හි උක්කුටිකං පදං භවෙ
දුට්ඨස්ස හොති අනුකඩ්ඪිතං පදං
මූළ්හස්ස හොති සහසානුපීළිතං
විවත්තච්ඡදස්සිදමීදිසං පදං.[1]

රාගචරිතයාගේ පියවර විලුඹින් හා පාඅගින් ගැඹුරුව මැදින් උඩට නැඹුරුව පිහිටන්නේය. ද්වේෂචරිතයාගේ පියවර පසු පසට අදින ලද්දක් මෙන් පිහිටන්නේය. මෝහචරිතයාගේ පියවර විලුඹින් ගිලී ඉදිරියට අදින ලද්දක් මෙන් පිහිටන්නේය, මෙබඳු වූ මේ (දක්නට ලැබෙන) පියවර කෙලෙස්පටල විවෘතකොට හළ කෙනකුගේම වේ. තවත් කරුණක් නම් රාගචරිතයාගේ සිටීමද ප්‍රසාදජනක වේ. පියකරු වේ, ද්වේෂචරිතයාගේ සිටීම රළු විලාශයෙන් වේ. මෝහචරිතයාගේ සිටීම කැළඹුණු විලාශයෙන් වේ. හිඳීමද මෙම නයයි, රාගචරිතතෙමේ නොඉක්මන්ව, සෙමෙන් යහන පිළියෙළ කොට, සෙමින් වැතිර, අඟ පසඟ එක්තැන් කොටගෙන ප්‍රසාදජනක ආකාරයෙන් නිදයි, නැගිටුවනුලබන්නේ යුහුව නැගිට සැකයෙන් මෙන් සෙමින් පිළිතුරු දෙයි, ද්වේෂචරිත ඇත්තේ යුහුයුහුව එහෙන් මෙහෙන් යහන පනවාගෙන විසුරුණු අඟපසඟ ඇතිව, මුහුන හකුලුවාගෙන නිදයි, නැගිටුවනුලබන්නේ වහා නැගිට කෝපයෙන් මෙන් පිළිතුරු දෙයි, මොහචරිත ඇත්තේ නොපිළිවෙළින් යහන පනවා විසුරුණු කයින්, බොහෝවිට මුනින් අතට හැරී නිදයි, නැගිටුවනුලබන්නේද හුංකාර කෙරෙමින් ලැසිව නැගිටියි, ශ්‍රද්ධාචරිතාදීහු වනාහි රාගචරිතාදීන්හට සභාගවන හෙයින් ඒ ඒ ආකාර ඉරියවු ඇත්තෝ වෙති'යි මෙසේ ඉරියවු වශයෙන් චර්යාවන් අවබෝධ කරගන්නේය.

**කිච්චා** යනු, හැමදීම් ආදී කෘත්‍යයන්හි, රාගචරිතයා මනාකොට හිදල් ගෙන නොඉක්මන්ව වැලි නොවිසුරුවමින් තිකමල් ඇතිරියක් අතුරන විලසින් පිරිසුදුව සමසේ හමදියි. ද්වේෂචරිතයා දැඩිව හිදල් ගෙන යුහුයුහුව දෙපසින් වැලි කඳු නංවමින් අම්හිරි හඬ නංවා නොසමව

(1) පරමත්ථජෝතිකා. මාගන්දිය සු. වණ්ණනා, P; ii 544 = Dhp i 201

හමදියි, මෝහචරිතයා ලිහිල්ව හිදල්ගෙන ඔබ මොබ පෙරළමින් අවුල් කෙරෙමින් තැනින් තැනින් කැලිකසල ඉතිරිකරමින් නොසමසේ හමදියි. සිවුරු සේදීම, පඩු පෙවීම ආදීවූ සියලු කෘත්‍යයන්හිදීද හැමදීමෙහිදී මෙනි. දක්‍ෂ ලෙස පියකරු ලෙස සමසේ සකස්කොට කාර්යයන් කරනුයේ රාගචරිතයාය, දැඩි ලෙස රළු ලෙස විෂම ආකාරයෙන් කාර්යයන් කරනුයේ ද්වේෂචරිතයාය, නොපුහුණු ලෙස අවුල් කොට නොසම ලෙස නොපිරිසිඳ කාර්යයන් කරනුයේ මෝහචරිතයාය. රාගචරිතයාගේ සිවුරු පෙරවීමද ඉතා තදද නොවේ. ඉතා ලිහිල්ද නොවේ, පියකරු වේ. පිරිමඩුලුසහිත වේ, ද්වේෂචරිතයාගේ සිවුරු පෙරවීම ඉතා තද වේ, පිරිමඩුලු රහිත වේ, මෝහචරිතයාගේ සිවුරු පෙරවීම ලිහිල් වේ, හාත්පසින් අවුල් වේ. ශ්‍රද්ධාචරිතාදීහු, ඔවුනොවුන් සභාගවන අයුරු, රාගචරිතාදීන්ගේ අනුසාරයෙන්ම දතයුත්තාහුය. මෙසේ කෘත්‍ය වශයෙන් චර්යාවන් පළකරන්නේය.

**භෝජනා** යනු, රාග චරිතයා සිනිඳු මිහිරි බොජුන් කැමතිවේ, බුදින විටද නොමහත් වටකුර පිඩු වශයෙන් රස විඳිමින් නොඉක්මන්ව බුදියි, කිසියම් ප්‍රණීත දෙයක් ලැබ සොම්නසට පැමිණෙයි. ද්වේෂචරිතයා කටුසර ඇඹුල් රස බොජුන් කැමැත්තේ වේ, බුදිනවිටද මුව පුරවා පිඩු කරමින් රසය ගැන නොසලකා යුහුයුහුව බුදියි. කිසියම් අමිහිරි දෙයක් ලැබ දෙම්නසට පැමිණෙයි, මෝහචරිතයා අනියත රුචි ඇත්තේ වේ, බුදිනවිට නොවට කුඩා පිඩු වශයෙන් බඳුනෙහි විසුරුවමින් මුව පිසලමින් විසුරුණු සිතින්, ඒ ඒ දෙය ගැන විතර්ක කරමින් බුදියි. ශ්‍රද්ධාචරිතාදීහුද රාගචරිතාදීන්හට සභාගවන හෙයින් ඔවුන්ගේම අනුසාරයෙන් දතයුත්තාහුය. මෙසේ භෝජන වශයෙන් චර්යාවන් පළ කරන්නේය.

**දස්සනාදිතො** යනු, රාගචරිතයා මඳවූද සිත්කලු රූපයක් දැක විස්මයපත් විලාශයෙන් බොහෝ වේලා බලමින් සිටියි, සුලුවූද ගුණයෙහි ඇලේ, ඇති දෙස් පවා නොසලකයි. පෙරළා යන්නේද නොයනු කැමැත්තෙන් මෙන් නැවත දකින අපේක්‍ෂා ඇතිව යයි. ද්වේෂචරිතයා සුලුවූද නොමනා දෙයක් දැක ඛේදයට පත්වූවකු මෙන් වැඩි වේලාවක් නොබලා හරියි, සුලුවූද දෙස්හි ගැටේ, ඇති ගුණ පවා නොපිළිගනියි, පෙරළා යන්නේද මිදෙනු කැමැත්තෙකුමෙන් නැවත දැකීමේ අපේක්‍ෂා නැතිවම යයි. මෝහ චරිතයා කිසියම් රූපයක් දැක අනුන් අදහස් මත රැඳෙයි, අනිකකු නින්ද කරනු අසා නින්ද කෙරෙයි. ප්‍රශංසා කරනු අසා ප්‍රශංසා කරයි. තෙමේ වනාහි අනුවණ ආකාරයෙන් උපේක්‍ෂා ඇත්තේම වේ. ශබ්ද ශ්‍රවණාදිය පිළිබඳවද මෙම නයයි. ශ්‍රද්ධාචරිතාදීහු රාගචරිතාදීන්

හා සභාගවන හෙයින් එම අනුසාරයෙන්ම දතයුත්තාහුය. මෙසේ රූප දර්ශනාදියෙන්ද චර්යාවන් පළකරන්නේය.

**ධම්මප්පවත්තිතො චෙව** (ගති පැවතුම් වශයෙන්ද) යනු, රාගචරිතයා කෙරෙහි **මායා** හෙවත් ඇති දෙස් වසන්කරන බවය, **සාඨෙය්‍ය** හෙවත් නැති ගුණ පළකරනබවය, උඩඟුබවය, පාපිච්ඡතාය, මහිච්ඡතාය, අසන්තුට්ඨිතාය, අහිරිකතා හෙවත් අලජ්ජීභාවය, ලොල්බවය, යන මේ ආදී ස්වභාවයෝ බහුලව පවත්නාහුය. ද්වේෂචරිතයා කෙරෙහි ක්‍රෝධය, වෛරය, ගුණමකුබවය, දරදඬුබවය, ඊර්ෂ්‍යාය, මසුරුබවය, යන මේ ආදී ස්වභාවයෝ බහුල වෙති. මෝහචරිතයා කෙරෙහි වනාහි, උදාසීනබවය, සිතෙහි මැලිබවය, නොසන්සුන්බවය, විපිළිසරය, විචිකිච්ඡාය ආධානගාහී (වැරදි දෙය දැඩිව ගැනීම ඇති) බවය, වැරදි ග්‍රහණයෙන් මුදවනු නොහැකිබවය, යන මේ ආදී ස්වභාවයෝ බහුල වෙති. ශ්‍රද්ධාචරිතයා කෙරෙහි ලාභාපේක්ෂාවෙන් තොර ත්‍යාගවත්බවය, ආර්යයන් දක්නා කැමැතිබවය, දහම් අසනු රිසිබවය, ප්‍රමෝද බහුලබවය, කුලාදීන් කෙරෙහි නොඇලුණ බවය, ඇති දෙස් වසන් නොකරනබවය, පැහැදියයුතු තැන පැහැදීමය යන මේ ආදී ස්වභාවයෝ බහුල වෙති. බුද්ධිචරිතයා කෙරෙහි සුවචබවය, කල්‍යාණමිත්‍රබවය, බොජුනෙහි පමණ දන්නාබවය, සිහිනුවණ ඇතිබවය, අප්‍රමාදීබවය, සංවේග කටයුතු තන්හි සංවේග වනබවය, සංවේගයට පත්ව නුවණින් වීර්ය වඩනබවය, යනමේ ආදී ස්වභාවයෝ බහුලව පවත්නාහ. විතර්කචරිතයා කෙරෙහි දෙඩමලුබවය, ගණයා කෙරෙහි ඇලුණුබවය, කුසල්දහම් කෙරෙහි නොඇලෙනබවය, තැන්පත් නොවූ සිත් ඇතිබවය, රාත්‍රිභාගයෙහි නොයෙක් දේ ගැන විතර්ක සිතිවිලි ඇතිබවය, දිවාභාගයෙහි එම විතර්කයන් ක්‍රියාත්මක කරනබවය, අරමුණින් අරමුණට සිත දිවෙනබවය, යන මේ ආදී ස්වභාවයෝ බහුලව පවත්නාහුය. මෙසේ ගතිපැවතුම් වශයෙන් චර්යාවන් පළ කරන්නේය.

යම් හෙයකින් වනාහි මෙම චර්යාවිභාවනවිධිය සියලු ආකාරයෙන් පෙළෙහි හෝ අටුවායෙහි හෝ නොආයේද, හුදෙක් ආචාර්යමතානුසාරයෙන් කියනලද්දේ වේද, එහෙයින් සාර වශයෙන් ගතයුතු නොවේ. රාගචරිතයා පිළිබඳව කියනලද ඉරියව් ආදිය අප්‍රමාදවිහරණ ඇති ද්වේෂචරිතාදීහුද කරනු සමත් වෙති. මුසුවූ චරිත ඇති එක්ම පුද්ගලයකුට භින්නලක්ෂණ සහිත ඉරියව් ආදිය නොයෙදේ. අටුවායෙහි යම් මේ චර්යාවිභාවන විධානයක් කියනලද්දේද එයම සාර වශයෙන් ගතයුතුවේ. කියනලද මැයි: පරසිත් දන්නා නුවණලද

ආචාර්යතෙමේ චර්යාවන් දැන කමටහනත් කියන්නේය. අන්‍යයන් විසින් අතවැසියා පිළිවිසියයුතු වන්නේය. එහෙයින් පරචිත්තවිජානනඥනයෙන් හෝ (කමටහන් ඉල්ලන) එම පුද්ගලයා පිළිවිස හෝ මේ පුද්ගලයා රාගචරිත ඇත්තෙකි, මේ ද්වේෂාදී කිසියම් චරිතයක් ඇත්තෙකි'යි දතයුතු වේ.

**කිංචරිතස්ස පුග්ගලස්ස කිං සප්පායං**ති යනු කවර චරිත ඇත්තහුට කුමක් සප්පාය වේද? යන මෙහි වනාහි පළමුකොට රාගචරිත ඇත්තහුට, පිරිසුදු නොකරනලද වේදිකා ඇති තනිමහල් ගේය, පිරියම් නොකළ ගිරිගුහාය, තෘණයෙන් කළ කුටිය, පර්ණශාලා හෙවත් කොළඅතු සෙවෙනිකළ ගේය, යන මේ ආදිය අතුරෙන් කිසියම් සෙනස්නක් පථ්‍ය වේ. එයද දූවිල්ලෙන් වැසුණු, වවුලන් ගැවසුණ, ගරාවැටුණු, ඉතා උස් හෝ ඉතා මිටි, රළු ගෙබිම් සහිත වල්සතුන්ගෙන් වන බිය නිසා ශංකා දනවනසුලු, අපිරිසුදු විෂම මං ඇති සෙනස්නක් වීම සුදුසු වේ. යම් සෙනස්නෙක ඇති ඇඳපුටු මකුණන් වසා ඇත්නම්, විරූපව දුර්වර්ණව ගියේනම්, බලන්නකුට පිළිකුල් දනවනසුලුවූයේනම්, එබඳු සෙනස්න රාගචරිතයාහට සප්පාය වේ. හඳනා පොරෝනාද තුවා (වාටි) ඉරී ගොස් දල් පුවක් (ආස්සදයක්) මෙන් එතැනින් මෙතැනින් එල්බෙන නූල්කැබැලි ඇත්තේනම්, හණපිළියක් සෙයින් රළුපහස් ඇත්තේනම්, කිලිටිවූයේනම්, බරවූයේනම්, දුකසේ පරිහරණය කළයුතු වේනම්, එවන් හඳනා පොරෝනා සප්පාය වේ. පාත්‍රයද දුර්වර්ණවූවක්නම්, මැටියෙන් කරනලද්දක්නම්, නැතහොත්, ඇණ ගැට සහිතවූ, හිස් කබලක් මෙන් පිළිකුල් උපදවන, බර යකඩ පාත්‍රයක් නම් යෝග්‍ය වේ, පිඬු පිණිස හැසිරෙන මාර්ගයද මනරම් නොවූ, අසල ගමක් නැති වළගොඩලි සහිත මාර්ගයක් සුදුසු වේ. පිඬු පිණිස හැසිරෙන ගමද නුදුටුවන් ලෙස හැසිරෙන මිනිසුන් ඇති, එකද ගෙයකින් කිසි භික්ෂාවක් නොලැබ නික්මෙන විට, එනු මැනවි ස්වාමීනි'යි ආසනශාලාවට ඇරලා, කැඳ බත් පිළිගන්වා යන්නාහු, දෙනක් ගාලට ඇරලා යන්නවුන් මෙන් (හරසර නැතිව) යෙත්නම්, එවන් ගමක් යෝග්‍ය වේ. දන් වළඳවන මිනිස්සුද දසයෝ වෙත්වයි, කම්කරුවෝ වෙත්වයි, දුර්වර්ණවූවාහු, දැකීමට අප්‍රියවූවාහු, කිලිටි ඇඳුම් ඇත්තාහු දුර්ගන්ධවූවාහු පිළිකුල් උපදවන්නාහු, නොසැලකිල්ලෙන් කැඳබත් ආදිය දමා ගසන්නවුන් මෙන් වළඳවත්ද, එබඳුවූවෝ සප්පාය වෙති. කැඳ බත් කැවිලි ආදියද රළුවූ දුර්වර්ණවූ අමු, කුරහන්, තිවුඩු සහල් ආදියෙන් කළ, සූප සඳහා පිළුණු මොහොරු, කාඩි, මේරූ පලා ආදිය සහිතවූ, හුදෙක් කුස පිරෙන පමණවූ යම් කිසිවක් යෝග්‍ය වේ. මොහුට ඉරියවු වශයෙන්, සිටීම හෝ සක්මන්කිරීම

යෝග්‍ය වේ. අරමුණු වශයෙන්, නීල ආදී වර්ණ කසිණයන් අතුරෙන් කිසියම් දුබුල් වර්ණයක් පථ්‍ය වේ. මේ රාගචරිතයාහට සප්පායයි.

ද්වේෂචරිතයාහට ඉතා උස්නොවූ ඉතා මිටිද නොවූ ඡායෝදක සම්පන්නවූ, මනා කඩවසමින් යුතු බිත්ති, ටැම්, පියගැටපෙළ සහිත මොනවට නිමාකළ මල්කම් ලියකම් ඇති, නොයෙක් සිත්තමින් බබලන, සමවූ සිනිඳු මුදු ගෙබිම් ඇති, බඹවිමනක් සෙයින් මල්දම් විසිතුරු පැහැයෙන් යුත් වස්ත්‍රයෙන් කළ වියනින් සමලංකෘතවූ, මනාකොට පනවනලද පිරිසුදු මනරම් ඇතිරිලි සහිත ඇඳ පුටු ඇති, තන්හි තන්හි සුවඳ ගන්වනු පිණිස තබනලද මල් හා වත්සුණු සුවඳින් සුවඳවත්වූ දර්ශන මාත්‍රයෙන්ම ප්‍රීතිප්‍රමෝදය දනවන, මෙවන්වූ සෙනස්නෙක් සප්පාය වේ. එම සෙනස්නට පිවිසෙන පාරද සියලු උවදුරුවලින් මිදුණු, පිරිසුදුවූ, සමතලාවූ, අලංකාරයෙන් පිළියෙළ කරන ලද්දක්ම යෝග්‍යවේ. සෙනසුන් පිරිකරද: කෘමීන් මකුණන්, සපුන් හා මීයන්ගේ ඇසුර වලකාලනු පිණිස බොහෝ නොවන ලෙසින්-එක් ඇඳක් හා පුටුවක්ම යෝග්‍ය වේ. මොහුගේ හඳනා පොරෝනාද, චීන දේශයෙහි පට, සෝමාර (සුමේර්) දේශයෙහි පට, කෝසෙය්‍ය (කසීසළු), සිනිඳු කපුපිළී, සිනිඳු කොමුපිළි ආදිය අතුරෙන් ප්‍රණීතවූ යම්කිසි වස්ත්‍රජාතියෙකින් තනිපට හෝ දෙපටකොට තනනලද, සැහැල්ලුවූ, ශ්‍රමණසාරූප්‍ය වනසේ සුපිරිසුදු රත් පැහැ ගන්වන ලද්දක් සප්පාය වේ. පාත්‍රයද, දියබුබුලක් මෙන් කඩවසම් ඇති, මැණිකක් මෙන් සුමටවූ, නිර්මලවූ, ශ්‍රමණසාරූප්‍ය ලෙසින් සුපිරිසුදු පැහැ ඇති යකඩින් කරන ලද්දක් යෝග්‍ය වේ. පිඬු පිණිස හැසිරෙන මහද, උවදුරු රහිතවූ, මනාපවූ, ඉතා දුර හෝ ඉතා අසල් නොවූවක්ම පථ්‍ය වේ. පිඬු පිණිස පිවිසෙන ගමද, මිනිස්සු “දැන් දැන් ආර්යයන් වහන්සේ වඩිති’යි දිය ඉස හමදනාලද පෙදෙසක අසුන් පනවා, පෙර ගමන් ගොස් පාත්‍රය ගෙන ගෙට වඩම්වා, පනවනලද අසුන්හි වඩා හිඳුවා මනාකොට සියතින්ම වළඳවත්නම් සප්පාය වේ. වළඳවන ජනයාද, මනා රූ ඇත්තාහු, ප්‍රසාද දනවනසුලු වූවාහු, නහා විලවුන් ගත්තාහු, ගඳදුම්මලින් සුවඳවත් වූවාහු, නොයෙක් විසිතුරු පිවිතුරු මනරම් ඇඳුමින් පැළඳුමින් සැරසුණාහු මනාකොට කටයුතු කෙරෙත් නම්, එවන් ජනයා සප්පාය වෙති. කැඳබත් කැවිලි ආදියද, පැහැයෙන් ගඳින් රසින් යුක්ත වූයේ, පෝෂ්‍යජනක වූයේ මනරම් වූයේ, සෑම අතින්ම ප්‍රණීත වූයේ, කැමති තාක් සුදුසු වේ. ඉරියවු වශයෙන්ද, ඔහුට වැදහෙවීම හෝ හිඳීම සප්පාය වේ. අරමුණු වශයෙන්ද, නීලාදී වර්ණකසිණ අතුරෙන් සුපිරිසුදු පැහැ ඇති යම්කිසි වර්ණයක් සුදුසු වේ. මේ ද්වේෂචරිතයාහට සප්පායයි.

මෝහචරිතයාහට යම් සේනාසනයෙක්හි හුන් කල දිශාවෝ විවෘතව දිස්වෙත් නම්, එලෙසින් දිශාවනට අභිමුඛවූ මුවහ නොවූ සේනාසනය යෝග්‍ය වේ. ඉරියවු වශයෙන්, සක්මන් කිරීම යෝග්‍ය වේ. මොහුට සවල්පවූ, කුඩා කුල්ලක් හෝ මලාවක් (කොරහක්) තරම්වූ සුලු අරමුණක් නොසැහේ, මුවහවූ තන්හි සිත බොහෝ සෙයින් මුළාවට පත්වේ, එහෙයින් විශාලවූ මහත්වූ කසිණයක් යෝග්‍ය වේ. සෙසු කරුණු ද්වේෂචරිතයාහට කී නියායි, මේ මෝහචරිතයාහට සප්පායයි.

ශ්‍රද්ධාචරිතයාහට ද්වේෂචරිතයා පිළිබඳව කියනලද සියලුම විධානයෝ සප්පාය වෙති. අරමුණු වශයෙන් මොහුට බුද්ධානුස්සති ආදී අනුස්සති කර්මස්ථාන සයද යෝග්‍ය වේ. බුද්ධිචරිතයාහට සේනාසන ආදියෙහි මේ අසප්පායයි දක්වියයුතු කිසිවක් නැත. විතර්කචරිතයාහට යම් සේනාසනයෙක්හි හුන් විට අරම්, උයන්, පොකුණු ආදියෙන් රමණීයවූ ගම් නියම්ගම් ජනපද පිළිවෙළද, නිල්පැහැති ගිරිකුළුද දිස්වේ නම්, විවෘතව දිශාවනට අභිමුඛවූ එවන් සෙනසුනක් යෝග්‍ය නොවේ. එය වනාහි විතර්ක ධාවනයටම හේතුවේ. එහෙයින් හත්ථිකුච්ඡිපබ්භාර, මහින්දගුහා ආදී වන ගහණයෙන් මුවහවූ ගැඹුරු ගිරිගුහා සේනාසනයෙක්හි විසීම සුදුසුය. මොහුට විශාලවූ අරමුණුද නොවටී එවැන්නක් විතර්කධාවනයට හේතුවේ, කුඩා අරමුණු වටී. සෙසු කරුණු රාගචරිතයා පිළිබඳව කී නියායි. මේ විතර්ක චරිතයාහට සප්පායයි. **මේ අත්තනො චරියානුකූලං** (තමාගේ චරිතයට අනුකූලවන) යයි මෙහි දක්වුණු ප්‍රභේද-විධාන-විභාවන-සප්පාය යන මේ කරුණු පිළිබඳ විස්තරයයි.

චරියානුකූල කර්මස්ථානය සියලු ආකාරයෙන් තවමත් ප්‍රකාශ කරනලද්දේ නොවේ. එය වනාහි අනතුරුව කියනු ලබන මාතෘකාපද විස්තරයෙහි තෙමේම ප්‍රකට වන්නේය. එහෙයින්, **චත්තාළීසාය කම්මට්ඨානෙසු අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වා** (සතළිස් කර්මස්ථාන අතුරෙන් එක්තරා කර්මස්ථානයක් ගෙන)යි යන මෙහි, සංඛ්‍යා නිර්දේශ වශයෙන්ද, උපචාරාවහ අර්පණාවහ ධ්‍යානප්‍රභේද වශයෙන්ද, සමතික්‍රමණ වශයෙන්ද, වැඩියයුතු නොවැඩියයුතු වශයෙන්ද, අරමුණු වශයෙන්ද, කාමාවචරාදී භූමි වශයෙන්ද, ග්‍රහණ ආකාර වශයෙන්ද, ප්‍රත්‍යයභාව වශයෙන්ද, චරිතානුකූල වශයෙන්දැයි යන මේ දශආකාරයෙන් පළමුකොට කර්මස්ථාන විනිශ්චය දතයුතුය. එහි **සංඛ්‍යා නිර්දේශ වශයෙන්** යනු, සතළිස් කර්මස්ථානයන් අතුරෙහි'යි කියන ලදී, එම කර්මස්ථාන සතළිස මෙසේය: කසිණභාවනා දශයෙකි, අසුභභාවනා දශයෙකි, අනුස්සතිභාවනා

දශයෙකි, බ්‍රහ්මවිහාරභාවනා සතරෙකි, ආරුප්පභාවනා සතරෙකි, සඤ්ඤාභාවනා එකෙකි, වවත්ථානභාවනා එකෙකි. එහි පඨවී කසිණය, ආපෝ කසිණය, තේජෝ කසිණය, වායෝ කසිණය, නීල කසිණය, පීත කසිණය, ලෝහිත කසිණය, අවදාත කසිණය, ආලෝක කසිණය, පරිච්ඡින්නාකාස කසිණය යන මොහු දසකසිණයෝයි. උද්ධුමාතකය, විනීලකය, විපුබ්බකය, විච්ඡිද්දකය, වික්ඛායිතකය, වික්ඛිත්තකය, හතවික්ඛිත්තකය, ලෝහිතකය, පුලවකය, අට්ඨිකය යන මොහු දස අසුභයෝයි. බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය, සීලානුස්සතිය, චාගානුස්සතිය, දේවතානුස්සතිය, මරණානුස්සතිය, කායගතා සතිය, ආනාපාන සතිය, උපසමානුස්සතිය යන මොහු දස අනුස්සතීහුය. මෙත්තාය, කරුණාය, මුදිතාය, උපෙක්ඛාය යන මොහු සතර බ්‍රහ්මවිහාරයෝය. ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන මොහු සතර ආරුප්ප වෙති. ආහාරයෙහි පටික්කූලසඤ්ඤා යන මේ ඒක සඤ්ඤායි. චතුධාතුවවත්ථානය යන මේ ඒක වවත්ථානයි. මෙසේ සංඛ්‍යා වශයෙන් විනිශ්චය දතයුතුය.

**උපචාරාවහ, අප්පණාවහ වශයෙන්** යනු, කායගතාසති, ආනාපානසති යන මේ දෙක හැර ඉතිරි අනුස්සති අටද, ආහාරයෙහි පටික්කූලසඤ්ඤාව හා චතුධාතුවවත්ථාන යන මේ කර්මස්ථාන දශය උපචාර ධ්‍යාන එළවන්නේය. සෙසු කර්මස්ථාන තිහ අර්පණාධ්‍යාන එළවන්නේයයි මෙසේ උපචාරාවහ අප්පණාවහ වශයෙන් විනිශ්චය දතයුතුය. **ධ්‍යානප්‍රභේද වශයෙන්** යනු, අර්පණාධ්‍යානයන් එළවන කර්මස්ථානයන් අතුරෙන් ආනාපානසතිය හා කසිණභාවනා දශය (යන මේ එකොළස) සතර රූපාවචර ධ්‍යානයන් එළවන්නේ වේ, කායගතාසතිය හා දස අසුභය (යන මේ එකොළොස) ප්‍රථම ධ්‍යානය එළවන්නේ වේ, පළමු බ්‍රහ්මවිහාර තුන පළමු ධ්‍යාන තුන එළවන්නේ වේ, සිවුවන බ්‍රහ්මවිහාරයද, ආරූප්‍යභාවනා සතරද (යන මේ පස) සතරවන ධ්‍යානය එළවන්නේ වේ, මෙසේ ධ්‍යානප්‍රභේද වශයෙන් විනිශ්චය දතයුතුය.

**සමතික්කම** වශයෙන් යනු සමතික්කමය ධ්‍යානාංගයන්ගේ ඉක්මීමද ආරම්මණයන්ගේ ඉක්මීමදැයි ද්විවිධ වේ. එහි සියලු ත්‍රික-චතුෂ්කධ්‍යානික කර්මස්ථානයන් විෂයෙහි අංගසමතික්කම හෙවත් ධ්‍යානාංගයන් පිළිබඳ ඉක්මීම සිදුවේ. විතක්ක විචාර ආදීවූ ධ්‍යානාංගයන් ඉක්මවීමෙන්ම එම අරමුණෙහිම සිට ද්විතීයාදී (ඉහළ) ධ්‍යානයනට පැමිණියයුතු හෙයිනි.

සිවුවන බ්‍රහ්මවිහාරයෙහිද එසේය, එය වනාහි මෙත්තා ආදී අරමුණෙහිම සෝමනස්සය ඉක්මවීමෙන් පැමිණියයුතු වනහෙයිනි. ආරුප්ප සතරෙහි වනාහි ආරම්මණ අතික්කම හෙවත් අරමුණු ඉක්මවීම සිදුවේ. පළමු කසිණ නවය අතුරෙන් එකක් ඉක්මවීමෙන් ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණිය යුතුය, ආකාසානඤ්චායතනාදීන් ඉක්මවා විඤ්ඤාණඤ්චායතනාදියට පැමිණිය යුතුය, සෙසු කර්මස්ථානයන් විෂයෙහි සමතික්ක්‍රමයෙක් නැතැ'යි මේ සමතික්කම වශයෙන් මෙහි විනිශ්චයයි.

**වඩ්ඪනාවඩ්ඪන** (හෙවත් වැඩීම් නොවැඩීම්) වශයෙන් යනු, මේ සතළිස් කර්මස්ථානයන් අතුරෙන් හුදෙක් දස කසිණයෝම වැඩියයුත්තාහු වෙති, යම්තාක් අවකාශය කසිණයෙන් පතුරුවනු ලැබේද, ඒතාක් අවකාශය ඇතුළත දිවකණින් ශබ්දයන් ඇසීමට, දිව ඇසින් රූපයන් බැලීමට, තම සිතින් පරසිත් දැනීමට සමත් වෙයි. කායගතාසති හා අසුභ කර්මස්ථානයෝ නොවැඩියයුත්තාහු වෙති, කවර හෙයින්දයත්, අවකාශ වශයෙන් පිරිසුන් (සීමිත) හෙයින් හා ආනිසංසයක් නැති හෙයිනි, අවකාශ වශයෙන් මේ කර්මස්ථානයන්ගේ පිරිසුන්බව භාවනානයෙහිදී මතු ප්‍රකාශ වන්නේය. එම කර්මස්ථානයන් වැඩීම කළවිට කුණප රාශියෙක්ම වැඩේ, කිසි ආනිසංසයෙක්ද, නැත. (නොවැඩුවද කාමරාගය යටපත්වන හෙයිනි). කියන ලදමැයි සෝපාකපඤ්හ විවරණයෙහි විභූතා භගවා රූපසඤ්ඤා අවිභූතා අට්ඨිකසඤ්ඤා[1] (භාග්‍යවතුන් වහන්ස, රූපසඤ්ඤාව (වඩනාලද හෙයින්) ප්‍රකටය, අට්ඨිකසඤ්ඤාව (නොවඩනා ලද හෙයින්) අප්‍රකටය, එහි වනාහි නිමිති වැඩීම් වශයෙන් රූපසඤ්ඤාව විභූතයයි කියනලදි. අට්ඨිකසඤ්ඤාව නොවඩනාලද හෙයින් අවිභූත යයි කියන ලදී. "මේ මුළු පොළෝතලය අට්ඨික සඤ්ඤාවෙන් පැතිරවීමි[2]යි යමක් කියන ලද්දේ නම්, ඒ ලැබුවහුගේම වැටහීම් ආකාරයෙන් කියන ලද්දෙකි. යම්සේ වනාහි ධර්මාශෝක රජු සමයෙහි කෝකිලපක්ෂියෙක් තෙමේ හාත්පස දර්පණ භිත්තීන් තුළ තමාගේ ප්‍රතිබිම්බය දැක, සියලු අතින්ම කොවුලන් ඇතැයි යන හැඟීම් ඇතිව මිහිරි හඬින් හැඩලීද, එසේ තෙරණුවෝද අට්ඨිකසඤ්ඤා ලදහෙයින් සියලු දෙසින් එළඹ සිටි නිමිති දැක මුළු පොළෝතලය ඇටවලින් පිරී ගියහ'යි සිතූහ. එසේ වෙතොත්, අසුභධ්‍යානයන් පිළිබඳව යම් අප්පමාණාරම්මණතාවක් (අපමණවූ අරමුණු ඇති බවක්) කියන ලද්දේ නම්, එය විරෝධ නොවන්නේද? එයද විරෝධ නොවේ, කිසිවෙක් වනාහි මහත්වූ උද්ධුමාතකයෙක්හි හෝ අට්ඨිකයෙක්හි නිමිති ගනිති,

(1) සං. නි. මහාවග්ග
(2) ථෙරගා. Th 1 18

කිසිවෙක් සුලු අරමුණෙක්හි නිමිති ගනිති, මෙසේ කිසිවකුහට සුලු අරමුණු සහිත ධ්‍යාන වේ. කිසිවකුහට පමණකළ නොහැකි අරමුණු සහිත ධ්‍යාන වේ. නැතහොත්, යමෙක් වැඩීමේ ආදීනව නොදක අරමුණු වඩාද, ඔහු සඳහා අප්පමාණාරම්මණයයි මෙසේ කියනලදි. ආනිසංස රහිතවූ හෙයින් නොවැඩියයුතුය'යි කියනලදි. (කායගතාසති, දසඅසුභ යන) මේ කර්මස්ථානයන් සේම (දස කසිණ හැර) සෙසු කර්මස්ථානයෝද නොවැඩියයුත්තාහුය. කවර හෙයින්දයත්, සෙසු කර්මස්ථානයන් අතුරෙන් ආනාපානනිමිති වඩන්නහුට වාත රාශියෙක්ම වැඩේ, අවකාශ වශයෙන්ද පිරිසුන් (සීමා සහිත) වේ, මෙසේ ආදීනව සහිත හෙයින්ද පිරිසුන් අවකාශ ඇති හෙයින්ද නොවැඩිය යුතුය. බ්‍රහ්මවිහාරයෝ සත්‍වයන් අරමුණු කොට ඇත්තාහ, ඔවුන් පිළිබඳ නිමිති වඩන්නහුට සත්‍වරාශියෙක්ම වැඩෙන්නේය, එයින් ඇතිවන වැඩෙක් නැත, එහෙයින් එයද නොවැඩිය යුතුය. මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්‍වා[1] (මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා) යන මේ ආදී වශයෙන් යමක් කියනලද්දේ නම්, එය පරිග්‍රහ (මුළුමනින් ගැනීම) උදෙසා කියනලද්දේ වේ. එක් ආවාසයක්, ආවාස දෙකක්, ආදි වශයෙන් අනුක්‍රමයෙන් එක් දිශාවෙක්හි වෙසෙන සත්‍වයන් පූර්ණ වශයෙන් ගෙන (මෙත්) පැතිරවීම අරබයා 'එක් දිශාවෙක්හි පතුරුවා'යි කියන ලද්දේය, නිමිති වැඩීම අරබයා කියනලද්දේ නොවේ. යමෙක් වඩන්නේද, මෙහි ප්‍රතිභාගනිමිත්තක් නැත. මෙහිලා පරිත්තාරම්මණ ඇති බව හෝ අප්පමාණාරම්මණ ඇතිබව පරිග්‍රහ (මුළුමනින් ගැනීම) වශයෙන්ම දතයුතුවේ. ආරුප්පාරම්මණ විෂයෙහිද: ආකාශය කසිණය ඉගිලවූ තැනම වනහෙයින් නොවැඩිය යුතුය, එය වනාහි කසිණාපගම වශයෙන්ම මෙනෙහි කළයුතුය, එයින් මතු වඩන්නහුට කිසිවක් නොවැඩේ. විඥ්ඤාණය ස්වභාවධර්ම වනහෙයින් නොවැඩිය යුතුය, ස්වභාවධර්මය වැඩීම නොහැකියේමය. විඥ්ඤාණාපගමය විඥ්ඤාණයෙහි අභාවය වනහෙයින් නොවැඩිය යුතුය. නෙවසඤ්ඤානාසඤ්ඤාරම්මණය ස්වභාවධර්මයම වනහෙයින් නොවැඩිය යුතුය. සෙසු කර්මස්ථානයෝ (දසකසිණ හැර) නිමිති රහිත වනහෙයින් නොවැඩිය යුත්තාහ. පටිභාගනිමිත්ත වනාහි වැඩියයුතු වන්නේමය. බුද්ධානුස්මෘති ආදියට පටිභාග නිමිති අරමුණු නොවේ, එහෙයින් එයද, නොවැඩියයුතුය. මේ වඩ්ඪනාවඩ්ඪන වශයෙන් මෙහි විනිශ්චයයි.

**ආරම්මණ වශයෙන්** යනු, මේ සතළිස් කර්මස්ථානයන් අතුරෙන් දසකසිණය, දසඅසුභය, ආනාපානසතිය, කායගතාසතිය යන මේ දෙවිස්ස ප්‍රතිභාගනිමිති සහිත අරමුණුය, ඉතිරි අටළොස ප්‍රතිභාග නිමිති රහිත

(1) දී. නි. තෙවිජ්ජ සු. - D i 250

වත්තේය. එසේම දස අනුස්සතීන් අතුරෙන් ආනාපානසතිය, කායගතාසතිය යන මේ දෙක හැර ඉතිරි අටද, ආහාර විෂයෙහි පටික්කූලසඤ්ඤය, චතුධාතුවවත්ථානය, විඤ්ඤණඤ්චායතනය, නෙවසඤ්ඤනාසඤ්ඤයතනය යන මේ දොළස ස්වභාව ධර්මයට අයත් (ස්වකීය භාවයෙන්ම පවත්නා) අරමුණුය, දස කසිණ, දස අසුභ, ආනාපානසති, කායගතාසති යන මේ දෙවිස්ස නිමිති සහිත අරමුණුය, ඉතිරි සය (එම දෙකොටසටම අයත්යයි) කිව නොහැකි (න වත්තබ්බ) අරමුණුය. තවද විපුබ්බකය, ලොහිතකය, පුළවකය, ආනාපානසතිය, ආපො කසිණය, තෙජො කසිණය, වායො කසිණය, ආලොක කසිණ විෂයෙහි සූර්යාදීන් පිළිබඳ අවභාසමණ්ඩලය යන මොවුන් පිළිබඳ අරමුණු අට චලිත හෙවත් සැලෙන අරමුණුය. එසේ වනුයේද (ප්‍රතිභාග නිමිත්තයට) පූර්ව අවස්ථාවෙහිදීය; ප්‍රතිභාග නිමිත්ත වනාහි සන්නිසින්න (නිශ්චල) වූයේමය. ඉතිරි දෙතිස අචලිත (නොසැලෙන) අරමුණුය. මේ අරමුණු වශයෙන් මෙහි විනිශ්චයයි. **භූමිවශයෙන්** යනුඃ මෙහිද දස අසුභය කායගතාසතිය, ආහාරයෙහි පටික්කූලසඤ්ඤය, යන මේ දොළස කාමාවචර දේවලෝකයන්හි නොපවතී, ඒ දොළසද ආනාපානසතියදැයි යන මේ තෙළෙස (රූපාවචර) බ්‍රහ්ම ලෝකයන්හි නොපවතී, අරූප තලයෙහි වනාහි චතුරාරූප්‍යයන් හැර අන් කිසිවක් නොපවතී, මිනිස්ලොව සියල්ලම පවතී. මේ භූමි වශයෙන් මෙහි විනිශ්චයයි.

**ගහණතො** (ගන්නා ආකාර වශයෙන්) යනු, මෙහි දිට්ඨ-ඵුට්ඨ-සුත (දැකීම්, ස්පර්ශ කිරීම්, ඇසීම්) වශයෙන් මෙහි විනිශ්චය දතයුතුය. එහි වායෝ කසිණය හැර ඉතිරි කසිණ නවයද, දස අසුභයදැයි යන මේ එකුන්විස්ස දිට්ඨග්ගහණ (දැකීම්) වශයෙන් ගතයුතුය, ආරම්භයෙහිදී ඇසින් බලා නිමිති ගතයුතුය යන අර්ථයි. කායගතාසතියෙහි තචපංචකය දැකීම් වශයෙන් ගතයුතුය, සෙස්ස සුතග්ගහණ (ඇසීම්) වශයෙන් ගතයුතුයයි මෙසේ එහි අරමුණු දැකීම් හා ඇසීම් වශයෙන් ගතයුතුය. ආනාපානසතිය ඵුට්ඨග්ගහණ (ස්පර්ශ කිරීම්) වශයෙන්ද වායොකසිණය දැකීමෙන් හා පහසින්ද ඉතිරි අටළොස ඇසීම් වශයෙන්ද ගතයුතුය. උපේක්ෂා බ්‍රහ්මවිහාරයද ආරුප්ප සතරද යන මේ පස ආධුනිකයා විසින් (පිළිවෙළින් පළමු බ්‍රහ්මවිහාර තුන නොවැඩුවනු විසින්ද, කසිණභාවනා මගින් සිවුවන රූපාවචරධ්‍යානය නොලැබුවනු විසින්ද) නොගතයුතුය, ඉතිරි පන්තිස් කර්මස්ථානයන් (ආධුනිකයා විසින්) ගැනීම සුදුසුවේ. මේ ග්‍රහණ වශයෙන් මෙහි විනිශ්චයයි.

**ප්‍රත්‍යය වශයෙන්** යනු, මේ කර්මස්ථානයන් අතුරෙන් ආකාශකසිණය හැර ඉතිරි කසිණ නවය ආරුප්පයනට ප්‍රත්‍යය වේ.

කසිණ දසයම අභිඥාවනට ප්‍රත්‍යය වේ. පළමු බ්‍රහ්මවිහාර තුන සිවුවන බ්‍රහ්මවිහාරයට ප්‍රත්‍යය වේ. පහළින් පහළින් සිටි ආරූප්‍යය ඉහළින් ඉහළින් සිටි ආරූප්‍යයට ප්‍රත්‍යය වේ. නෙවසඤ්ඤායතනය නිරොධසමාපත්තියට ප්‍රත්‍යය වේ. සියල්ලම සුඛවිහාර ඇත්තේය, විදර්ශනා හා භවසම්පත්තිය පිණිස ප්‍රත්‍යය වේ. මේ ප්‍රත්‍යය වශයෙන් මෙහි විනිශ්චයයි.

**චර්යානුකූලවශයෙන්** යනු, චර්යාවනට අනුකූල වීම් වශයෙන්ද මෙහි විනිශ්චය දතයුතුය, ඒ මෙසේයි: මෙහි පළමුකොට රාගචරිතයාහට දස අසුභය, කායගතාසතිය, යන මේ එකොළොස් කර්මස්ථානය අනුකූල වේ, ද්වේෂචරිතයාහට බ්‍රහ්මවිහාර සතරද, වර්ණකසිණ සතරද, යන මේ අට අනුකූලවේ, මෝහචරිතයාහටද විතක්කචරිතයාහටද එක්ම ආනාපානසති කර්මස්ථානය අනුකූලවේ, ශ්‍රද්ධාචරිතයාහට පළමු අනුස්සති සය අනුකූලවේ. බුද්ධිචරිතයාහට මරණානුස්මෘතිය, උපශමානුස්මෘතිය, චතුධාතුවවත්ථානය, ආහාරයෙහි පටික්කූල සඤ්ඤය, යන මේ සතර අනුකූල වේ, ඉතිරි කසිණද සතර ආරුප්පයද, සියලුම චරියයනට අනුකූලවේ. කසිණ විෂයෙහිදී කිසියම් කසිණයක් සුළුකොට යොදගැනීම විතර්කචරිතයාහටද මහත්කොට යොදගැනීම මෝහචරිතයාහටද අනුකූලවේ. මෙසේ මෙහි චරියානුකූල වශයෙන් විනිශ්චය දතයුතුය. මේ සියල්ල ඒකාන්ත විපක්ෂ (එක එල්ලේම විරුද්ධ) වශයෙන්ද, අතිසප්පාය වශයෙන්ද කියන ලද්දේය. රාගාදීන් යටපත් නොකරන හෝ ශ්‍රද්ධාදීනට උපකාරී නොවන කුශලභාවනාවෙක් නම් නැත. කියනලදමැයි මේඝිය සූත්‍රයෙහි: ධර්මයන් සතරක් මතුමත්තෙහි වැඩිය යුතුය. රාගය ප්‍රහීණ කිරීම පිණිස අසුභයන් වැඩිය යුතුය, ව්‍යාපාදය ප්‍රහීණ කිරීම පිණිස මෛත්‍රිය වැඩියයුතුය, විතර්කය නැසීම පිණිස ආනාපානසතිය වැඩිය යුතුය. අස්මිමානය උදුරාලීම පිණිස අනිච්චසඤ්ඤාව වැඩිය යුතුය[(1)] රාහුලසූත්‍රයෙහිද, රාහුලය, මෛත්‍රීභාවනාව වඩනුය[(2)] යන ආදී නයින් එක් කෙනකුටම කර්මස්ථාන සතක් කියනලදි. එහෙයින් වචන මාත්‍රයෙහි ප්‍රපංච නොකොට සියළු තන්හි අර්ථය සෙවියයුතුය.

**කම්මට්ඨානං ගහෙත්වා** (කමටහන් ගෙන)යි යන මෙහි කර්මස්ථානයන් පිළිබඳ කථා විනිශ්චය මෙසේයි. **ගහෙත්වා** (ගෙන) යි යන මේ පදයෙහි අර්ථපරිදීපනය මෙසේයි: යෝගාවචරයා විසින්

(1) අ. නි. නවම නි. - A iv 358
(2) ම. නි. මහාරාහුලොවාද සු. - M i 424

කමටහන් දෙන කල්‍යාණමිත්‍රයකු වෙත එළඹ, යනුවෙන් මෙහි කියනලද නයින්ම, කියනලද ආකාර ඇති කල්‍යාණමිත්‍රයකු වෙත එළඹ, භාග්‍යවතුන් වහන්සේට හෝ ආචාර්යයන්හට හෝ තමා පාවාදී පවිත්‍රචේතනාවෙන් හා ස්ථිර අධිෂ්ඨානයෙන් යුක්තව කමටහන් ඉල්විය යුතුය. එහි, "භාග්‍යවතුන් වහන්ස, මේ මාගේ ආත්මභාවය ඔබ වහන්සේ වෙත පුද කරමි"යි මෙසේ භාග්‍යවත් බුදුන්වහන්සේහට තමා පාවා දියයුතුය. මෙසේ පාවා නොදී ප්‍රාන්ත සේනාසනයන්හි වෙසෙනුයේ බියකරු අරමුණු හමුවූවිට තහවුරු ලෙයින් සිටගත නොහැකිව ග්‍රාමාන්තයට බැස ගිහිජනයා හා සමග බැඳී, අයුතු අන්වේෂණයට හෝ වැටී අනයව්‍යසනයට පත් වන්නේය. පවරා දෙනලද ආත්මභාව ඇතිකල්හි වනාහි බියකරු අරමුණු හමුවූ කල්හිදු බියක් නො-උපදී. 'නුවණැත්ත, ඔබවිසින් පළමුදිනයෙහිම තෙමේ බුදුන්වහන්සේහට පුදන ලද්දේ නොවේද?'යි මෙනෙහිකරන ඔහුට සොම්නසෙක්ම උපදී. යම්සේ කිසියම් පුරුෂයකුහට උතුම් කසීසළුවෙක් ඇත්තේද, එය මීයන් විසින් හෝ කාවන් විසින් හෝ කාදමනලද කල්හි දෙම්නසෙක් උපදී, ඉදින් එම සළුවම සිවුරු නැති භික්ෂුවකට දෙන්නේද, එවිට එම භික්ෂුව විසින් (සිවුරු සැදීම පිණිස) එය කඩ කඩ කොට කපනු ලබන දුටුවිට සොම්නසෙක්ම උපදී. මෙයද මෙබඳුයයි දතයුතුය. ආචාර්යයන්හට පාවා දෙන්නහු විසින්ද, 'ස්වාමීනි, මේ මාගේ ආත්මභාවය ඔබ වහන්සේට පුද කරමි'යි කිව යුතුය. මෙසේ පවරා නොදෙනලද ආත්මභාව ඇත්තේ වනාහි නොහික්මවියහැකි, අකීකරු, අවවාද නොපිළිපදින පුද්ගලයෙක් හෝ වන්නේය, කැමැති තැනෙක යන්නෙක් වන්නේය, ආචාර්යයන් නොවිමසාම යම් තැනෙක යනු-කැමැතිනම් එහි යන්නේය. ආචාර්යවරයා එවැන්නකු ආමිෂයෙන් හෝ ධර්මයෙන් හෝ සංග්‍රහ නොකරයි, ගැඹුරු අරුත් ඇති ධර්මයන් නොඋගන්වයි. මේ දෙආකාර සංග්‍රහයන් නොලබන හේ තෙමේ ශාසනයෙහි පිහිටක් නොලබයි. හේ තෙමේ නොබෝ කලෙකින්ම දුසිල්බවට හෝ ගිහියකු බවට පැමිණෙන්නේය. පාවා දෙනලද ආත්මභාව ඇත්තේ වනාහි නොහික්මවිය හැක්කෙක් හෝ කැමැති අතෙක යන්නෙක් හෝ නොවේ. ආචාර්යවරයාට කීකරු, අවනත පැවතුම් ඇත්තෙක් වේ. හේ තෙමේ ආචාර්යවරයාගෙන් යටකී දෙආකාර සංග්‍රහයන් ලබනුයේ ශාසනයෙහි (ශීලයෙන්) අභිවෘද්ධියට, (සමාධියෙන්) තිරබවට, ප්‍රඥයෙන් විපුලබවට පැමිණේ. චූලපිණ්ඩපාතික තෙරුන්ගේ අතවැසියන් මෙනි. තෙරුන් වෙතට භික්ෂූහු තිදෙනෙක් ආවාහුය, ඔවුනතුරෙන් පළමු වැන්නා ස්වාමීනි, මම ඔබවහන්සේට හිත පිණිසයයි කිවහොත් මිනිසුන් (බඹ) සියයක් තරම් ගැඹුරැති ප්‍රපාතයකට වුවද පතිනු කැමැත්තෙමියි කීය, දෙවැන්නා, ස්වාමීනි ඔබ වහන්සේට හිතසුව පිණිසය'යි කිවහොත්

මාගේ මේ ශරීරය විලුඹ පටන් ගල්තලාවෙක උලා සම්පූර්ණයෙන්ම ගෙවා ලීමට වුව උත්සුක වන්නෙමි"යි කීය, තෙවැන්නා ඔබවහන්සේට වැඩ පිණිසැ'යි කිවහොත් හුස්ම හිරකරගෙන මියයන්නට වුව උත්සුක වන්නෙමි"යි කීය. තෙරණුවෝ මේ භික්ෂූහු ඒකාන්තයෙන් භව්‍යයෝමය'යි කමටහන් කීහ. ඒ තිදෙනා වහන්සේම උන්වහන්සේගේ අවවාදයෙහි පිහිටා රහත්බවට පැමිණියහ. තමා පවරා දීමෙහි ආනිසංස මෙසේය, එහෙයින් 'භාග්‍යවතුන් වහන්සේට හෝ ආචාර්යවරයාහට තමා පවරාදී' යැයි කියන ලදි.

**සම්පන්නජ්ඣාසයෙන සම්පන්නාධිමුත්තිනා ච හුත්වා** (පිවිතුරු අදහස් ඇතිව අපේක්ෂිත අරමුණ කෙරෙහි අධිෂ්ඨාන ඇතිව) යි යන මෙහි, එම යෝගාවචරයා විසින් අලෝභාදී වශයෙන් ස-ආකාරයෙකින් පවිත්‍රචේතනා ඇත්තකු වියයුතුය, මෙසේ පිවිතුරු අදහස් ඇත්තේම තුන්තරා බෝධියෙන් එක්තරා බෝධියකට පැමිණේ. කියන ලදමැයි, "අදහස් සයෙක් බෝධිසත්වයන්ගේ බෝධිඥානය මුහුකිරීම පිණිස පවත්නේය, ලෝභයෙහි දෙස් දක්නා බෝධිසත්වයෝ අලෝභ අධ්‍යාශය ඇත්තාහුය, ද්වේෂයෙහි දෙස් දක්නා බෝධිසත්වයෝ අද්වේෂ අධ්‍යාශය ඇත්තාහුය, මෝහයෙහි දෙස් දක්නා බෝධිසත්වයෝ අමෝහ අධ්‍යාශය ඇත්තාහුය, ගිහිගෙහි විසීමෙහි දෙස් දක්නා බෝධිසත්වයෝ නෛෂ්ක්‍රම්‍ය අධ්‍යාශය ඇත්තාහුය, ගණයා හා සමග ගැටෙමින් විසීමෙහි දෙස් දක්නා බෝධිසත්වයෝ පවිවේක අධ්‍යාශය ඇත්තාහුය, සියලු සංසාරගතියෙහි දෙස් දක්නා බෝධිසත්වයෝ නිඃසරණ අධ්‍යාශය ඇත්තාහුය." අතීත අනාගත ප්‍රත්‍යුත්පන්නවූ යම්කිසි ශ්‍රෝතාපන්න, සකෘදගාමී අනාගාමී අරහත් ප්‍රත්‍යෙකබුද්ධ සම්මාසම්බුද්ධ කෙනෙක් ඇත්නම් ඒ හැම දෙනම මේ ෂඩාකාරයෙන්ම තම තමන් විසින් පත්වියයුතු විශේෂයනට පත්වූවාහු වෙති. එහෙයින් මෙකී ෂඩාකාරයෙන් පිවිතුරු අදහස් ඇත්තන් වියයුතුය. එම අභිමතාර්ථය වෙතටම නැඹුරු අදිටන් ඇත්තන් විය යුතුය. සමාධිය වෙතට නැඹුරු අදිටන් ඇති සමාධිය කෙරෙහි ගරුසරු ඇති කෙනකු වියයුතුය, නිර්වාණය පිළිබඳ අදිටන් ඇති, නිර්වාණය කෙරෙහි ගරුසරු ඇති, නිර්වාණය වෙත නැඹුරුවූවකු වියයුතුය යන අර්ථයි.

මෙසේ පිවිතුරු අදහසින් හා අදිටනින් යුතුව කමටහන් ඉල්වා සිටින යෝගාවචරයාගේ සිත් හසර පරසිත් දන්නා නුවණ ලබාඇති ආචාර්යවරයා විසින් බලා චර්යාව දතයුතුය, එම නුවණ ලබා නැති ආචාර්යවරයකු විසින්, කවර චරිත ඇත්තෙක් වෙහිද? කවර ස්වභාවයෙක්

ඔබට උත්සන්නව පවතීද? කවර නම් කමටහනක් මෙනෙහි කරනවිට ඔබට පහදුවේද? කවර නම් කමටහනක් වෙත ඔබගේ සිත නැඹුරු වේදැ?යි මේ ආදී නයින් පිළිවිස (චර්යාව) දතයුතුය. මෙසේ දැනගෙන ඔහුගේ චරිතයට අනුකූලවූ කමටහනක් කිවයුතුය. එසේ කියනවිට තුන් ආකාරයෙකින් කිව යුතුය, පියවි වශයෙන් උගත් කමටහනෙක් නම් එක් වාරයක් හෝ දෙවාරයක් (නිසජ්ජා) හදරවා·දියයුතුය, තමා වෙතම වෙසෙන්නකුට නම් ආ ආ කෙණෙහි කිවයුතුය, උගෙන අන් තැනකට යනු කැමැත්තකුට නම් ඉතා සංක්ෂේප නොකොට, ඉතා විස්තරද නොකොට කිවයුතුය. එහි පඨවිකසිණය කියන විටෙක, පළමුකොට කසිණ දෙස් සතරද, කසිණය තනාගන්නා සැටිද, තනාගත් කසිණ විෂයෙහි භාවනා කරන සැටිද, දෙ-ආකාර නිමිතිද, දෙ-ආකාර සමාධියද, සත්වැදැරුම් සප්පායාසප්පායද, දස-ආකාර අර්පණාකුශල භාවයද, වීර්යසමත්වයද, අර්පණාවිධානයදැයි යන මේ නව ආකාරය කිවයුතුය. සෙසු කමටහන් විෂයෙහිද ඒ ඒ කමටහනට අනුරූපවූ පරිදි කිවයුතුය. ඒ සියල්ල කර්මස්ථාන-භාවනා-විධානයෙහිදී මතු ප්‍රකාශ වන්නේය. මෙසේ කමටහන් කියනු ලබනවිට යෝගාවචරයා විසින් නිමිති ගෙන කන්දී ඇසියයුතුය. **නිමිති ගෙනැ**'යි යනු, 'මේ පහළින්ම ඇති පදයයි, මේ ඉහළින්ම ඇති පදයයි, මේ මෙහි අර්ථයයි, මේ අභිප්‍රායයි, මේ උපමායි, යනුවෙන් මෙසේ ඒ ඒ ආකාරය සිතට ගෙනැ'යි යන අර්ථයි. මෙසේ නිමිති ගෙන මනාකොට අසන්නහු විසින් කමටහන් මැනවින් ගන්නාලද්දේ වේ. ඉක්බිති ඔහුට ඒ හේතුකොටගෙන විශේෂාධිගමය සිද්ධ වේ, එසේ නොකරන්නහුට සිද්ධ නොවේ. මේ 'ගහෙත්වා' යන පදයෙහි අර්ථවිභාවනයයි.

මෙතෙකින් **කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා අත්තනො චරියානුකූලං චත්තාළීසාය කම්මට්ඨානෙසු අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වා** යන මේ පදයෝ සියලු ආකාරයෙන් විස්තර කරන ලද්දාහුය.

**සාධුජන ප්‍රමෝදය පිණිස කරනලද විශුද්ධිමාර්ගයෙහි**
**සමාධිභාවනාධිකාරයට අයත් කම්මට්ඨානගහණනිද්දේස නම්වූ**
**තෙවෙනි පරිච්ඡේදය නිමියේය.**

# 4. පඨවිකසිණ නිර්දේශය

ඉක්බිති **සමාධිභාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහරන්තෙන** (සමාධිභාවනාවට යෝග්‍ය නොවූ විහාරය හැර යෝග්‍යවූ විහාරයෙක්හි වෙසෙන්නහු විසින්) යයි යමක් කියනලද්දේද, මෙහි වනාහි ආචාර්යයන් සමග එක් විහාරයෙක්හි වෙසෙන යමකුහට එම විහාරය පහසුනම්, ඔහු විසින් එහිම කමටහන් පිරිසුදු කෙරෙමින් විසියයුතුය. ඉදින් එහි පහසු නැත්නම්, ගව්වකින් හෝ අඩයොදුනෙකින් හෝ යොදුනක් පමණ ඔබ්බෙන් හෝ සප්පායවූ යම් අනෙක් විහාරයක් ඇත්නම්, එහි විසියයුතුය. මෙසේ වූකල්හි කමටහන්හි කිසියම් හෝ තැනෙක සැකයක් හෝ මතක නොවීමක් වුවහොත්, වේලාසනින්ම විහාරයෙහි වත්පිළිවෙත් අවසන්කොට අතරමඟදී පිඩු පිණිස හැසිර බත්කිස අවසන් කළ කෙණෙහිම ආචාර්යයන් වසන තැනට ගොස් එදින ආචාර්යයන් සමීපයෙහි කමටහන් පිරිසුදු කොටගෙන, දෙවන දවස්හි ආචාර්යයන් වැඳ නික්ම අතරමඟදී පිඩු පිණිස හැසිර විඩා නැතිවම තමා වසන තැනට ආහැකිවේ. යමෙක් වනාහි යොදුනක් පමණ තන්හි හෝ පහසු තැනක් නොලබන්නේ නම්, ඔහු විසින් කමටහන්හි සියලු ගැටලු තැන් පැහැදිලි කොටගෙන ඉතා නිරවුල් ලෙස කමටහන් සිහි තබාගෙන දුරබැහැරකට හෝ ගොස් සමාධිභාවනාවට අනුරූප නොවූ විහාරය හැර අනුරූපවූ විහාරයෙක්හි විසියයුතුය. එහි අනුරූප නොවූ විහාරය නම් අටළොස් දෙස් අතුරෙන් එක්තරා හෝ දෙසෙකින් යුත් විහාරයයි. එම අටළොස් දෙස් නම්: මහත් බවය, අලුත් බවය, දිරාපත් බවය, මඟ අසලවූ බවය, පැන් පොකුණු සහිත බවය, පලා ඇති බවය, මල් ඇති බවය, පලතුරු ඇති බවය, පැතියයුතු බවය, නගරාශ්‍රිතවූ බවය, දව ඇති තැන් අසල්වූ බවය, කෙත් අසල්වූ බවය, විෂම ක්‍රියාකලාපය ඇති තැනැත්තන් ඇති බවය, පටුන් ආශ්‍රිත බවය, පිටුසර වූ බවය, රාජ්‍ය සීමා අසල් වූ බවය, සප්පාය නොවූ බවය, කලණමිතුරන් නොලබන බවය යන මේය. මේ අටළොස් දෙස් අතුරෙන් එක් දෙසෙකින් හෝ යුතුවූයේ අනනුරූප නම්වේ. එවන් තැනෙක නොවිසිය යුතුය, කවර හෙයින්දයත්, මහත්වූ විහාරයෙහි නොයෙක් අදහස් ඇති බොහෝ දෙනා රැස්වෙති; ඔවුහු එකිනෙකා අතර ඇති විරුදුකම් නිසා වත්පිළිවෙත් නොකෙරෙති, බෝමලු ආදි නොහමදනා ලදුවම තිබේ. බොන පැන් නහන පැන් නොඑළවන ලද්දේම වේ, එහි මේ යෝගී තෙමේ 'ගොදුරුගම්හි පිඩු පිණිස හැසිරෙමි'යි පාසිවුරු ගෙන නික්මෙනවිට වත්-පිළිවෙත් නොකරනලද බව හෝ හිස්වූ පැන් බඳුන් හෝ දක්නේද, එවිට මොහු විසින් වත්-පිළිවෙත් කළයුතු වන්නේය, පැන් එළවියයුතු

වන්නේය. එසේ නොකළහොත් වත් බිඳීමෙන් දුකුළා ඇවැතට පැමිණෙන්නේය, කළහොත් කල් ඉකුත් වන්නේය, ඉතා දහවල් ගමට පිවිසියේ භික්ෂා නිමවී කිසිවක් නොලබන්නේය, විවේක පිණිස ගිය කල්හිද සාමණේර තරුණ භික්ෂූන්ගේ උස්හඬින්ද, සංඝකර්මයෙන්ද වික්ෂේපයට පැමිණේ, යම් තැනෙක සියලු වත්-පිළිවෙත් කරන ලද්දේ වේනම්, සෙසු ගැහැටද නැත්නම්, මහත් වූවද එබඳු විහාරයෙක විසීම සුදුසුය. අලුත් විහාරයෙක්හි බොහෝ නවකම් ඇත්තේ වේ, ඒවා නොකරන්නහුට බැණ වදිති, යම් විහාරයෙක්හි වනාහි භික්ෂූහු, ආයුෂ්මත්හු සුවසේ මහණදම් පුරත්වා! අපි නවකම් කරන්නමෝය"යි කියන්නාහුද, එවන් විහාරයෙක්හි විසීම සුදුසුය. දිරාපත් විහාරයෙහි වනාහි පිළිදගුම් කළයුතු බොහෝ දේ ඇත, යටත් පිරිසෙයින් තමාගේ සෙනසුන නොපිළිදගින්නහුට අවඥ කෙරෙති, පිළිදගින්නහුගේ කමටහන් පිරිහේ. මග අසලවූ, මහවත් අසල්වූ විහාරයෙක්හි රෑදවල් ආගන්තුකයෝ රැස්වන්නාහ. නොකල්හි ආවුන්හට තමාගේ සෙනසුන දී රුක්මුලෙක හෝ ගල්තලාවෙක විසිය යුතුවේ. දෙවන දවස්හිද මෙසේ වෙතොත් කමටහනට අවසර නොලැබේ. යම් තැනෙක්හි වනාහි ආගන්තුකයන් නිසා සිදුවන මෙබඳු සම්බාධ නැතොත් එතන්හි විසීම සුදුසුය. යම් විහාරයෙක්හි 'කෙමි' යන නමින් හැඳින්වෙන ගල් පොකුණු ඇත්නම්, එහි පැන් පිණිස මහජනයා රැස්වෙති, රජගෙදර හා සමඟ කුලුපගවූ නගරවැසි මහතෙරවරුන්ගේ අතවැස්සෝ සිවුරු පඬු ගැන්වීම පිණිස පැමිණෙති, බඳුන්, දර, පඬුඹරු ආදිය ගැන විමසන ඔවුන්හට අසුවල් අසුවල් තැනයයි පෙන්විය යුතුය, මෙසේ මුළු කාලයම නිරතුරු යෙදෙන්නට සිදුවේ. යම් විහාරයෙක නොයෙක් ප්‍රකාර ඇති පලාවෙසෙස් ඇත්නම්, එහි කමටහන් ගෙන දිවාවිහාරයෙහි හුන් කල්හි පවා යෝගාවචරයාගේ සමීපයෙහි ගී ගයමින් පලා නෙළන ස්ත්‍රීහු යෝග්‍ය නොවන ශබ්ද පවත්වමින් කමටහනට අන්තරාය කෙරෙති. යම් විහාරයෙක්හි නොයෙක් ප්‍රකාර ඇති සුපිපි මල්ගස් ඇත්නම්, එහිද එවැනිමවූ උවදුරු ඇත. යම් විහාරයෙක්හි අඹ දඹ පනා ආදී පලතුරු ඇත්නම්, පල කැමැත්තෝ පැමිණ ඉල්වති, නොදෙන විට කිපෙති, බලාත්කාරයෙන් හෝ ගනිති. සවස් කාලයෙහි විහාරමධ්‍යයෙහි හමදින විට ඔවුන් දැක 'උපාසකවරුනි, කවර හෙයකින් මෙසේ කරවුද'යි කීකල්හි රිසි සේ ආක්‍රෝශ කෙරෙති. ඒ භික්ෂුව විහාරයෙන් නෙරපීමට පවා උත්සාහ කෙරෙති. ලෝවැස්සන් විසින් සම්භාවිතවූ දක්ඛිණගිරි, හත්ථිකුච්ඡි, චේතියගිරි, සිතුල්පවු වැනි බොහෝ දෙනා වන්දනා පිණිස පැමිණෙන විහාරයෙක වසන්නහු කරා, මේ රහත් කෙනෙකි'යි සම්භාවනා කොට වඳිනු කැමැති ජනයා සැම දෙසින් රැස් වෙති, එයින් ඔහුට අපහසු වේ. යමකුට එම විහාරය

සප්පාය වේනම්, ඔහු විසින් දහවල්හි අන් තැනෙක ගොස් රෑකල එහි විසියයුතුය. නුවර අසලවූ විහාරයෙක්හි විෂමවූ අරමුණු හමුවට එයි, කළදැස්සෝ කළ ගටමින් යෙති, ඉවත්ව මහ ඉඩ නොදෙති, ප්‍රභූ ජනයාද විහාරමධ්‍යයෙහි තිර වටකොට හිඳිති. දැව ආශ්‍රිත විහාරයෙක්හි වනාහි යම් තැනෙක්හි දර හෝ දැවබඩු පිණිස ගනුලබන ගස් ඇත්නම්, එහි දැව ගෙනයන්නෝ යටකී පලා, මල් නෙළන්නවුන් සේම ගැහැට කෙරෙත්. විහාරයෙහි ගස් ඇත්නම්, කපා ගෙවල් ඉදි කරන්නමු"යි අවුත් කපති, ඉදින් සවස් කාලයෙහි පධානඝරයෙන් නික්ම විහාරමධ්‍යයෙහි සක්මන් කරනවිට ඔවුන් දැක, "උපාසකවරුනි, කවර හෙයින් මෙසේ කරවූදැ"යි කිවහොත් රිසි පරිදි ආක්‍රෝශ කෙරෙති. විහාරයෙන් නෙරපීමට හෝ උත්සාහ කෙරෙතී. යම් විහාරයක් කෙත් අසල වූයේද, හාත්පසින් කෙත්වලින් වටවූයේද, එහි විහාර මධ්‍යයෙහිම ජනයා කලවිටි තනා ගොයම් මඩිති, ඉදිරිපස මිදුලෙහි වී දමා වියලවති, තවද බොහෝ අපහසු ඇතිකරවයි. තවද, එබඳු විහාරයෙක මහා සඞ්ඝපරිභෝග ඇත්නම්, එහි ආරාම සේවකයන්ගේ පවුල්වලට අයත් ගවයන් බඳිති, දියමුර වලක්වති, මිනිස්සු (මැලවීගිය) වීකරල් කඩා ගෙනවුත් 'බලනු මැනවි, ඔබ වහන්සේගේ සේවක ජනයාගේ ක්‍රියාය'යි සංඝයාහට දක්වති. ඒ මේ කරුණු නිසා රාජරාජමහාමාත්‍යයන්ගේ ගෙදෙරට යායුතුවේ, මෙයද කෙත් අසල වූ ආරාම විෂයෙහි ඇතුළත් වේ. විසම (නොගැලපෙන) පුද්ගලයන් ඇති බවය යනු, යම් විහාරයෙක්හි ඔවුනොවුන් නොරුස්සන, ඔවුනොවුනට පසමිතුරු භික්ෂූහු වෙසෙත්ද, ඔවුන් කලහ කරනවිට, 'ස්වාමීනි, මෙසේ නොකරනු මැනවැ'යි වලක්වන ලද්දාහු 'මේ පංසුකූලිකයා ආ ද පටන් නටුවෝ වම්හ'යි කියන්නාහුය. යම් විහාරයක් මුහුදු ගංගා පටුන් හෝ ගොඩපටුන් හෝ නුදුරු තන්හි පිහිටියේ නම්, එහි නැව්වලින්ද, සාත්තු (තවලම්) වලින්ද ආ ජනයා, 'ඉඩක් දෙනු මැනවි, පැන් දෙනු මැනවි, ලුණු දෙනු මැනවැ'යි ගහට කෙරෙමින් අපහසු ඇති කරති. පිටිසර පෙදෙස්හි පිහිටි විහාරයෙහි වනාහි ජනයා බුද්ධාදීන් කෙරෙහි නොපහන් වූවෝය. රාජ්‍යසීමා අසල් තැන රජුන්ගෙන් බිය ඇතිවේ. එබඳු පෙදෙස්, එක් රජෙක් මා වසහයෙහි නොපවත්නේයයි පහරියි, අන් රජෙක් මා වසහයෙහි නොපවත්නේයයි පහරියි, එහිදී මේ භික්ෂු තෙමේ වරෙක මේ රජුගේ විජිතයෙහිද වරෙක ඒ රජුගේ විජිතයෙහිද හැසිරේ. එසේ වූවිට 'මොහු චරපුරුෂයෙකැ'යි ගන්නාලදුව නොයෙක් ව්‍යසනයට පත්වේ. **අසප්පාය බවය** යනු, විෂමවූ රූපාදි අරමුණු ගැවසීමෙන් හෝ අමනුෂ්‍යයන් විසින් අරක්ගන්නාලද හෙයින් හෝ අසප්පාය වූබවයි. ඒ පිළිබඳ කතා පුවතක් මෙසේය: එක්තරා තෙරණු කෙනෙක් වනයෙක්හි වාසය කරන්නාහුය, ඉක්බිති එක් යකිනියක්

තොමෝ පන්සල් දෙර සිට ගීයක් ගැයූ, තෙරණුවෝ නික්ම දොරකඩ සිටියහ. ඕ තොමෝ ගොස් සක්මන් හිස සිට ගැයූ. තෙරණුවෝ සක්මන් හිසට ගියහ, ඕ තොමෝ මිනිසුන් සියයක් (පමණ ගැඹුරු) වූ ප්‍රපාතයෙක්හි සිට ගැයූ, තෙරණුවෝ පෙරළා පැමිණියහ. එවිට ඕ තොමෝ වේගයෙන් (අවුත් ඔහු) අල්වාගෙන, 'හිමියනි, මවිසින් ඔබ වැන්නවුන් කනලදුයේ එකකු දෙන්නකු නොවේයයි කීවාය. කලණමිතුරන් නොලැබෙන බවය යනු, යම් තැනෙක ආචාර්යයන් හෝ ආචාර්යයන් හා සමවූ හෝ කලණමිතුරකු නොලදහැකිවේද, එතන්හි ඒ කලණමිතුරන් නොලැබීමේ මහාදෝෂය වේතැයි යන මේ අටළොස් දෙස් අතුරෙන් එකෙකින් යුතුවූයේ අනනුරූපැ'යි දත යුතුය.

කියනලදමැයි අටුවායෙහි:

මහාවාසං නවාවාසං ජරාවාසඤ්ච පන්ථනිං
සොණ්ඩිං පණ්ණඤ්ච පුප්ඵඤ්ච ඵලං පත්ථිතමෙව ච

නගරං දරුනා ඛෙත්තං විසභාගෙන පට්ටනං
පච්චන්තසීමාසප්පායං යත්ථ මිත්තො න ලබ්භති

අට්ඨාරසෙතානි ඨානානි ඉති විඤ්ඤාය පණ්ඩිතො
ආරකා පරිවජ්ජෙය්‍ය මග්ගං පටිභයං යථා ති.

මහත්වූ විහාරය, නවවිහාරය, දිරාපත් විහාරය, මහමං අසල වූ විහාරය, පැන්කෙම් ඇති විහාරය, පලාපත් ඇති විහාරය, මල් ඇති විහාරය, පලතුරු ඇති විහාරය, වඳනා කරුවන් නිතර ගැවසෙන විහාරය,

නගරාසන්න විහාරය, දව දඩු ඇති විහාරය, කෙත් අසල වූ විහාරය, නොගැලපෙන ජනයා ඇති විහාරය, පටුන් ගම්හි පිහිටි විහාරය, පිටුසර පෙදෙස්හි පිහිටි විහාරය, රාජ්‍යසීමා අසල පිහිටි විහාරය, අසප්පායවූ විහාරය, කල්‍යාණ මිත්‍රයකු නොලදහැකි විහාරයැයි යන,

මේ අටළොස් තැන් මෙසේ දන පණ්ඩිත තෙමේ, උවදුරු සහිත මාර්ගයක් මෙන් දුරින්ම දුරු කරන්නේය.

යම් විහාරයෙක් වනාහි ගොදුරු ගමින් ඉතා දුර නොවූ බවය, ඉතා අසල්ද නොවූ බවය, ආදී අංග පසෙකින් යුක්ත වූයේද, මේ අනුරූප නම්. කියනලදමැයි භාග්‍යවතුන් වහන්සේ විසින්, "මහණෙනි,

සෙනස්නෙක් කෙසේ අංග පසෙකින් සමන්විත වේද? මහණෙනි, මෙහි සෙනස්න ඉතා දුර හෝ ඉතා ළං හෝ නොවේනම්, යාම් ඊම් පහසුකම් ඇත්තේනම්, දහවල ජනයා නොගැවසෙත් නම්, මඳවූ ශබ්ද නිර්ඝෝෂ ඇත්තේනම්, මැසි-මදුරු-අවු-සුළං-සපුන් යන මේ ආදියෙන් වන උවදුරු අඩුවේ නම්, එහි වෙසෙන්නහුට චීවර-පිණ්ඩපාත-සෙනාසන-ගිලාන ප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයෝ මඳ ආයාසයෙකින් උපදිත් නම්, එම සෙනස්නෙහි බහුශ්‍රැත, ආගමධර, ධර්මධර, විනයධර, මාතිකාධර ස්ථවිර භික්‍ෂූහු වෙසෙත් නම්, ඔවුහු කලින් කල රැස්වී, ස්වාමීනි, මෙය මෙය කෙසේද? මෙහි අරුත් කවරේද?යි පිළිවිසිත් නම්, අර්ථ විචාරත් නම්, එසේ පිළිවිසින්නහුට ඒ ආයුෂ්මත්හු විවෘත නොවූ දෙය විවරණ කෙරෙත් නම්, අප්‍රකට දෙය ප්‍රකට කෙරෙත් නම්, අනේකවිධවූ ශංසය උපදනා ධර්මයන් විෂයෙහි ශංසය දුරු කෙරෙත් නම්, මහණෙනි, මෙසේ වනාහි සෙනස්නෙක් අංග පසින් සමන්විත වේ.(1) මේ 'සමාධි භාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහරන්තෙන' (සමාධි භාවනා පිණිස යෝග්‍ය නොවූ විහාරය හැර යෝග්‍යවූ විහාරයෙක්හි වෙසෙන්නහු විසින්) යන මෙහි විස්තර කථායි.

**ඛුද්දකපලිබොධුපච්ඡෙදං කත්වා** (සුලු පලිබෝධ සිඳලීම කොට) යනු, මෙසේ යෝග්‍යවූ විහාරයෙක වාසය කරන්නහු විසින්- ඔහුට යම් ඒ සුලු පලිබෝධයක් හෝ ඇත්නම් එයද සිඳලිය යුතුය, එනම්, දික්ව වැඩුණු කෙස්, නිය, ලොම් කපා දැමියයුතුය, දිරාපත් සිවුරු මැහුම් හෝ ගෙත්තම් කළ යුතුය, කිලිටි සිවුරු සෝද පඬු පොවාගත යුතුය, පාත්‍රා මල බැඳී ඇත්නම්, පාත්‍රය පිසිය යුතුය, ඇඳ පුටු ආදිය පිරිසුදු කරගත යුතුය. මේ ඛුද්දකපලිබොධුපච්ඡෙදං කත්වා (සුලු පලිබෝධයන් ඉවත් කොට) යන මෙහි විස්තර කථායි.

ඉක්බිති, **සබ්බං භාවනාවිධානං අපරිහාපෙන්තෙන භාවෙතබ්බො** (සියලු භාවනා විධි නොපිරිහෙලා භාවනා වැඩිය යුතුය) යනු: මෙහි මේ පඨවි කසිණය ආදිකොට ඇති සියලු කර්මස්ථානයන් පිළිබඳ විස්තර කථා දක්වේ. මෙසේ සුලු පලිබෝධයන් විසඳගත් භික්‍ෂුව විසින් පිඩු පිණිස හැසිරීමෙන් පෙරළා අවුත් බත්කිස නිමවීමෙන් පසු ඇතිවන බත්මත සන්සිඳවාගෙන, විවේක ස්ථානයෙක සුවසේ හිඳ, සකසනලද හෝ ස්වාභාවිකවූ හෝ පෘථිවිය කෙරෙහි නිමිති ගතයුතුය. කියනලද මැයි (අටුවාවෙහි): පඨවි කසිණය ගන්නා යෝගී තෙමේ සකසනලද හෝ ස්වාභාවිකවූ අන්ත සහිතවූ අන්ත රහිතනොවූ, කෙළවර සහිතවූ

(1) අ. නි. පඤ්චක සං. නි., සගාරවග්ග - A v 15f.

කෙළවර රහිතනොවූ, වටකුරුවූ නොවටකුරුනොවූ, සීමා සහිතවූ සීමා රහිත නොවූ, කුඩා කුල්ලක් පමණවූ හෝ මලාවක් පමණවූ පෘථිවී මණ්ඩලයෙහි නිමිති ගනියි. හේ තෙමේ එම නිමිති මනාලෙස ගැනීම කරයි, මනාලෙස උපධාරණය කරයි, මනාලෙස ව්‍යවස්ථාපනය කරයි, හේ තෙමේ එය මනාලෙස ගෙන, මනාලෙස උපධාරණය කොට, මනාලෙස ව්‍යවස්ථාපනය කොට, එහි අනුසස් දක්නේ මහඟුලෙස සලකා, ගරුසරු උපදවා, සොම්නස් දනවා, 'ඒකාන්තයෙන් මේ පිළිවෙත හේතුකොටගෙන ජරාමරණයෙන් මිදෙම්වා'යි එම අරමුණෙහි සිත බැඳ තබයි. හේ තෙමේ කාමයන් කෙරෙන් මිදී, අකුසලයන් කෙරෙන් මිදී ප්‍රථමධ්‍යානයට සමවැද වාසය කරයි[(1)]. එහිදී යමකු විසින් පූර්වභවයෙහිදී, බුදු සස්නෙක්හි හෝ ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හෝ පඨවිකසිණ විෂයෙහි ධ්‍යාන චතුෂ්කය, නැතහොත් පංචකය උපදවනලදවිරූ නම්, එවන් උපනිශ්‍රය සම්පන්න පිනැත්තහුට අකෘත්‍රිමවූද, සීසානලද තන්හි හෝ, කලවිටි මඩුල්ලෙහි හෝ නිමිති උපදනේය. මල්ලක තෙරුන්හට මෙනි. ඒ ආයුෂ්මතුන්හට වනාහි සීසානලද තැනක් දකිනවිට එම තැන් පමණවූ නිමිති උපදනේය, ඒ තෙරණුවෝ එය වඩා පංචකධ්‍යානයන් උපදවා ධ්‍යානය පාදකකොට විදර්ශනා පිහිටුවා රහත්බවට පැමිණියහ. යමෙක් වනාහි, මෙසේ පෙර පුරුදුකළ අධිකාර නැත්තේ නම්, ඔහු විසින් ආචාර්යයන් වෙතින් උගත් කර්මස්ථානවිධි නොවරදවා, සතර කසිණදෙස් දුරුකොට කසිණය තනාගත යුතුය. නිල්වන්, කසාවන්, රත්වන්, සුදුවන් මැටි මුසුවීමෙන් පඨවිකසිණ දෙස් සතරෙක් උපදී. එහෙයින් නිල්වන් ආදී මැටි නොගෙන ගංගාප්‍රවාහයෙහි මැටි හා සමාන අරුණුවන් මැටියෙන් කසිණය තනාගත යුතුය. එයද විහාරමධ්‍යයෙහි සාමණේරාදීන් සැරිසරන තන්හි නොතැනියයුතුය, විහාර භූමියෙහි කෙළවර මුවහවූ තැනෙක පිටතට නෙරා සිටි ගල්කුලක් යට හෝ කොළ මඩුවෙක හෝ ජංගම (තැනින් තැනට ගෙනයාහැකි) ලෙසින් හෝ ස්ථාවර (එම ස්ථානයෙහිම තිරව පවතින) ලෙසින් හෝ කසිණය තනාගත යුතුය. එහි ජංගම කසිණය දඬු සතරෙක රෙදිකඩක් හෝ සම්කඩක් බැඳ ඊ මත්තෙහි තණ මුල් බොරලු වැලි ඉවත්කොට මැනවින් හනාගත් මැටියෙන්, කියනලද තරමින් වටකුරු හැඩයට ආලේප කොට තනාගත යුතුය, එය පිරියම් කරනවිට බිම තබා බැලිය යුතුය. ස්ථාවර කසිණය බිම කණු සිටුවා වැලින් බැඳ පියුම් කෙමියක හැඩයට තනාගත යුතුය. ඉදින් අරුණුවන් මැටි නොසෑහේ නම් ඇතුළත වෙනත් මැටිටෙකින් සාද මතුපිට මනාසේ පිරිසුදු කරගත් අරුණුවන් මැටියෙන් එක් වියත් සතරඟුලක් විතරින් වටකුරු කොට

---

(1) පටිසම්භිද - ඣානකථා

තතාගත යුතුය, මෙකී පමණම සලකා කුඩා කුල්ලක් හෝ මලාවක් පමණයැයි යට කියනලදි. සාන්තකෙ නො අනන්තකෙ' යන ආදිය වනාහි එහි සීමාව දක්වනු පිණිස කියනලදි.

එහෙයින් මෙසේ කියනලද පමණ හිමි කොට - දඬු පෙණය (තැළීමට යොදගනු ලබන උපකරණයක්) විෂම වර්ණ ඇතිකරන හෙයින් එය නොගෙන ගල් පෙණයකින් තළා බෙර ඇසක් මෙන් මට්ටම් කොට, එම ස්ථානය හැමැද, නහාගෙන අවුත් කසිණ මඬුල්ලෙන් රියන් දෙකහමාරක් ඇතුළත පනවනලද එක් වියත් සතරඟුල් පමණ පා ඇති මනාකොට අතුළ පුටුවෙක හිඳගතයුතුය. එයට වඩා දුරින් හුන්නහුට කසිණය නොවැටහේ, එයට වඩා ළඟින් හුන්නහුට කසිණ දෙස් දිස්වේ. එයට වඩා උසින් හුන්විට ගෙල නමා බැලියයුතුවේ. එයට වඩා මිටි අස්නෙක හුන්විට දණ රිදෙන්නට ගනී, එහෙයින් කියන ලද නයින්ම හිඳ, කාමයෝ අල්ප ආස්වාද ඇත්තාහුය.(1) ආදී නයින් කාමයෙහි ආදීනව මෙනෙහිකොට කාමයන් කෙරෙන් දුරුවූ, සියලු දුක් කෙළවර කිරීමෙහි උපායවූ, නෛෂ්ක්‍රම්‍යයෙහි උපන් අභිලාෂ ඇතිව, බුදුන්-දහම්-සඟුන් ගුණ සිහිකරමින්, ප්‍රීති ප්‍රමෝදය උපදවාගෙන, "මේ වනාහි සියලු බුදු පසේබුදු අරියසව්වන් විසින් පිළිපන් ඒ නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදවයි" යනුවෙන් ප්‍රතිපත්ති විෂයෙහි උපන් ගෞරව ඇතිව, 'ඒකාන්තයෙන් මේ ප්‍රතිපදව හේතුකොටගෙන ප්‍රවිවේක සුඛ රසය අනුභව කරන්නෙක් වන්නෙමි'යි උත්සාහ උපදවා, සෙමෙන් ඇස් දල්වා නිමිති ගනිමින් භාවනා කළ යුතුය. පමණට වඩා ඇස් දල්වන කල ඇස් පෙළෙන්නට ගනී, කසිණ මණ්ඩලයද පමණට වඩා ප්‍රකාශවේ, එයින් ඔහුට නිමිති නො-උපදියි, ඉතා මදව ඇස් දල්වන්නහුට මණ්ඩලය ප්‍රකට නොවේ, සිතද කිඳෙන්නට ගනී, මෙසේද නිමිති නො-උපදී. එහෙයින් කැටපතෙක මුහුණු පිළිබිඹුව බලන්නකු මෙන් සෙමෙන් දල්වා නිමිතිගෙන භාවනා කටයුතුය. හුදෙක් වර්ණය සිතට නොගතයුතුය. හුදෙක් තදබව ආදි ලකුණුද මෙනෙහි නොකටයුතුය, එහෙත් වර්ණය අත් නොහැර පෘථිවියට නිශ්‍රයවූ වර්ණය ලෙස ගෙන (වර්ණ ලක්ෂණ දෙක වෙන් වෙන්ව නොගෙන) අධික වශයෙන් පෘථිවිය පිළිබඳ ප්‍රඥප්ති ධර්මයෙහි සිත පිහිටුවා මෙනෙහි කළ යුතුය, **පඨවි, මහී, මෙදිනී, භූමි, වසුධා, වසුන්ධරා** යන ආදී පෘථිවීපර්යාය නාමයන් අතුරෙන් යමක් රිසිවේනම්, යමක් තමාගේ සංඥවට අනුකූල වේනම්, එය උච්චාරණය කළ යුතුය. එතෙකුදු වුවත් **පඨවි** යන මේ නාමයම ප්‍රකට වේ, එහෙයින් "පඨවි පඨවි"

---

(1) ම. නි. අලගද්දූපම සූ - M i 130

යත්නුවෙන් ප්‍රකට නාමයම ගෙන භාවනාකිරීම යුතුවේ. විටෙක ඇස් දල්වාද, විටෙක ඇස් පියාගෙනද ආවර්ජන කළයුතුය, යම්තාක් උග්ගහ-නිමිත්ත නො-ඉපැද තිබේ නම්, ඒතාක් සියක් වර හෝ දහසක් වර හෝ එයටත් වැඩි වරක් හෝ මේ නයින්ම භාවනා කටයුතුය. මෙසේ භාවනා කරන ඔහුට යම් කලෙක ඇස් පියාගෙන ආවර්ජන කරනවිටද ඇස් ඇර සිටිනවිට මෙන් නිමිත්ත හමුබවට එතොත් එකල උග්ගහ-නිමිත්ත උපන්නේ නම් වේ, එය උපන් කල පටන් එතන්හිම හිදියයුතු නොවේ, තමා වෙසෙන තැනට පිවිස එහි හිඳගෙන භාවනා කළ හැකිය. පා දෙවීම සඳහා කල් ගතවීම වලකනු පිණිස මොහු විසින් තනිපටවහන්ද, සැරයටියක්ද පරිභෝග කිරීම සුදුසු වේ. ඉක්බිති ඔහුගේ තරුණ සමාධිය කිසියම් හෝ අසප්පාය කාරණයක් හේතුකොටගෙන නටහොත්, එවිට පාවහන් නැඟ සැරයටිය ගෙන එතැනට ගොස් නිමිති ගෙන පෙරළා අවුත් සුවසේ හිඳගෙන භාවනා කළයුතුය, යළි යළි ආවර්ජන කළ යුතුය, තර්කයෙන් විතර්කයෙන් නතු කරගත යුතුය. මෙසේ කරනවිට ඕහට අනුක්‍රමයෙන් නීවරණයෝ යටපත් වෙති, ක්ලේශයෝ සන්සිදෙති, උපචාර සමාධියෙන් සමාධිගත වේ. පටිභාග-නිමිත්ත උපදී. එහි පළමු කී උග්ගහ-නිමිත්ත හා මෙකී පටිභාග-නිමිත්ත හා අතර ඇති විශේෂය මෙසේයි: උග්ගහනිමිත්තයෙහිදී කසිණ දෙස් පෙනේ, පටිභාග-නිමිත්තය වූකලි කොපුවෙන් ගත් කැටපත්තලයක් සෙයින්ද, මොනවට පිරිසුදුකළ සක් තැල්ලක් සෙයින්ද, වළා අතරින් නිකුත් සඳමඩලක් සෙයින්ද, මේකුළක් ඉදිරියෙහි කොකුන් පෙළක් සෙයින්ද, උග්ගහ-නිමිත්ත පලාගෙන නිකුත් වූවක් මෙන්, එයට වඩා සිය ගුණයෙන්, දහස් ගුණයෙන් පිරිසුදුව වැටහේ, එමතුද නොවේ, එයට පැහැයෙක් නැත, හැඩයෙක් නැත, එසේ ඇතොත් ඇසින්ද දකගතහැකි වන්නේය, ඕළාරික වන්නේය, සම්මර්ශනයට යෝග්‍ය වන්නේය, ත්‍රිලක්ෂණයට ගොදුරු වන්නේය, එය වූකලි එබඳු වූවක් නොවේ, හුදෙක් සමාධි ලාභියාටම වැටහෙන ආකාර මාත්‍රයෙකි, භාවනා සංඥවෙන් උපන්නෙකි. එය උපන් තැන් පටන් නීවරණයෝ යටපත් කරන ලද්දහුම වෙති, ක්ලේශයෝ සන්සිදියාහුම වෙති, සිත උපචාර සමාධියෙන් සමාහිත වූයේම වේ.

සමාධිය වනාහි උපචාර සමාධියද අර්පණා සමාධියදැයි ද්විවිධ වේ. උපචාර භූමියෙහි හෝ පටිලාභ භූමියෙහි හෝ යන මේ දෙ-ආකාරයෙන් සිත සමාධිගත වේ, එහි උපචාරභූමියෙහිදී නීවරණ ප්‍රහාණයෙන්ද පටිලාභභූමියෙහිදී ධ්‍යානාංගයන් පහළවීමෙන්ද සිත සමාධිගත වේ. මේ සමාධි දෙක අතර ඇති වෙනස මේය: උපචාරයෙහිදී

අංගයෝ බලවත් නොවෙති, අංගයන් බලවත් නොවන හෙයින්, බාල දරුවකු නැගිටුවා තබනවිට නැවත නැවතත් වැටෙන්නාසේ උපචාරය උපන්කල විටෙකදී සිත නිමිති අරමුණුකොට ගනියි, විටෙකදී භවාංගයට බසියි. අර්පණා සමාධියෙහිදී වනාහි ධ්‍යානාංගයෝ බලවත් වෙති, එම අංගයන් බලවත්වන හෙයින් බලවත් පුරුෂයෙක් තෙමේ අස්නෙන් නැගිට දවසක්ම වුවත් සිටිනුයේ යම්සේද, එසේම අර්පණා සමාධිය උපන්කල සිත එක් වරක් භවංග වාරය සිඳීමෙන් මුළු රැයම, මුළු දහවලම සිටී, කුසල් ජවන් පිළිවෙළ වශයෙන්ම පවත්නේය. එහි, යම්කලෙක උපචාර-සමාධිය හා සමග පටිභාග-නිමිත්ත උපන්නේ නම්-එය ඉපැදවීම නම් ඉතා දුෂ්කරය- එහෙයින් එම පර්යංකයෙන්ම එම නිමිත්ත වඩා අර්පණාවට පැමිණෙනු සමත් වේනම් යෙහෙකි, ඉදින් සමත් නොවේනම්, එවිට මොහු විසින් අප්‍රමාදව එම පටිභාගනිමිත්ත සක්විති ගබක් සෙයින් රැකගත යුතුය. එසේවූ කල්හි,

> නිමිත්තං රක්ඛතො ලද්ධ-පරිහානි න විජ්ජති
> ආරක්ඛම්හි අසන්තම්හි ලද්ධං ලද්ධං විනස්සති

ප්‍රතිභාගනිමිත්ත රක්නහු විසින් ලද සමාධියෙහි පිරිහීමෙක් නොවේ, ආරක්ෂාවක් නොමැති කල්හි ලද ලද ධ්‍යානය නස්නේය.

එහි, ප්‍රතිභාගනිමිත්ත රක්නා විධි මෙසේයඃ-

> ආවාසො ගොචරො භස්සං පුග්ගලො භොජනං උතු
> ඉරියාපථො'ති සත්තෙතෙ අසප්පායෙ විවජ්ජයෙ

> සප්පායෙ සත්ත සෙවෙථ එවං හි පටිපජ්ජතො
> න චිරෙනෙව කාලෙන හොති කස්සචි අප්පනා

ආවාසය, ගෝචරය, කථාය, පුද්ගලය, භෝජනය, ඍතුය, ඉරියව්ව යන මේ සත පිළිබඳ අසප්පාය වූවත් දුරු කරන්නේය.

මේ සත, සප්පාය වූවත්ම සේවනය කරන්නේය, මෙසේ පිළිපදනා විට කිසිවකුට නොබෝ කලෙකින්ම අර්පණා සමාධිය උපදී.

එහිදී, යම් ආවාසයෙක්හි වසනවිට මොහුට නො-උපන් නිමිත්ත නො-උපදීනම්, උපන් නිමිත්ත හෝ නැසේනම්, නො-එළඹි සිහිය නොඑළඹේනම්, අසමාහිත සිත සමාහිත නොවේනම්, මේ ආවාසය

අසප්පාය වේ. එහෙයින් යම් විහාරයෙක්හි බොහෝ ආවාස ඇත්නම්, එහි එක් එක් ආවාසයෙහි දින තුනක් බැගින් වැස යම් තැනෙකදී සිත එකඟ වේනම්, එහි විසිය යුතුය. ආවාසසප්පාය හේතුවෙන් තම්බපණ්ණි දිවයිනෙහි චූලාභය නම් ලෙණෙහි පන්සියයක් භික්ෂූහු එහිදීම කමටහන් ගෙන රහත් බවට පැමිණියාහුය. සෝවාන් ආදී පලයනට පත්වූද, අන් තැනෙකදී ආර්යභූමියට පිවිස එහිදී රහත් පලයට පත්වූද ජනයාගේ ගණනෙක් නැත. සිතුල්පවු විහාරාදී අන් තන්හිද මෙසේය.

**ගොචරගාම**- ගොදුරුගම වනාහි: යම් ගොදුරුගමක් සෙනස්නෙන් කෝස එකහමාරක් (දුනු තුන්දහසක්) ඇතුළත, උතුරෙන් හෝ දකුණෙන්, නුදුරු තන්හි වෙතොත්, සුලභ භික්ෂා ඇතොත් එය සප්පාය වේ, නොඑසේ වෙතොත් අසප්පාය වේ. **භස්ස** කතා කරන දෙය යනු: දෙතිස් තිරිසන් කථාවට අයත්වූයේ අසප්පාය වේ, එය නිමිති අතුරුදහන්වීම පිණිස පවතී, දශකථාවස්තු නිශ්‍රිත වූයේ සප්පාය වේ, එය වුවද පමණ දැන බිණිය යුතුය. **පුග්ගලො** (පුද්ගලයා)ද, තිරිසන් කථා නොකියන්නේද, ශීලාදී ගුණයෙන් යුතුවූයේද, යම් පුද්ගලයකු නිසා අසමාහිත සිත සමාහිත වේද, සමාහිතවූ සිත ස්ථිර වේද, මෙබඳුවූ පුද්ගලයා සප්පාය වේ, තිරිසන් කථා කියන, කය පුෂ්ටිමත් කොට දැඩි කිරීමෙහි නියැලි පුද්ගලයා අසප්පාය වේ. හේ වනාහි මඩවතුරක් පිවිතුරු ජලය කිලිටි කරන්නා සේ යෝගාවචරයා කිලිටි කරන්නේමය, එබඳු පුද්ගලයකු හා ඇසුරට පැමිණීමෙන් කෝට නම් පව්වෙහි වැසි තරුණ භික්ෂුවගේ මෙන් සමාපත්තිය පවා නැසේ, නිමිති නස්නා බව කිවයුතු නොවේ. **භොජනං** (භෝජනය) වනාහි: කිසිවකුට පැණි රසද කිසිවකුට ඇඹුල් රසද සප්පාය වේ. **උතු** (සෘතු භේදය හෙවත් කාලගුණයද) කිසිවකුට ශීතද කිසිවකුට උෂ්ණයද සප්පාය වේ. එහෙයින් යම් බොජුනක් හෝ යම් කාලගුණයක් හෝ සෙවුනාහට පහසු වේනම්, අසමාහිතවූ සිත සමාහිත වේනම්, සමාහිත සිත හෝ ස්ථිර වේනම්, එම භෝජනයද එම කාලගුණයද සප්පාය වේ, එසේ නොවන භෝජනයද කාලගුණයද අසප්පාය වේ. **ඉරියාපථෙසු** (ඉරියවු අතුරෙන්) ද: කිසිවකුට සක්මන් කිරීම සප්පාය වේ, කිසිවකුට වැද හෙවීම, සිටීම හෝ හිඳීම යන මෙයින් එකක් සප්පාය වේ. එහෙයින් ආවාස විෂයෙහිදී මෙන් ඉරියවුද තුන්දිනක් පිරික්සා, යම් ඉරියව්වෙක්හි අසමාහිත සිත සමාහිත වේනම්, සමාහිතවූ සිත හෝ ස්ථිර වේනම්, එය සප්පායැයිද අනෙක අසප්පායැයිද දතයුතුය. මෙසේ සත් වැදෑරුම් අසප්පායයන් දුරුකොට සප්පායයන් සේවනය කළයුතුය. මෙසේ පිළිපන්නහුගේ (පටිභාග) නිමිත්ත බහුල වශයෙන් සෙවුනා කිසිවකුහට නොබෝ කලෙකින්ම අර්පණා සමාධිය උපදී.

යමකුට වනාහි මෙසේ පිළිපදින විට පවා අර්පණා නො-උපදී නම්, ඔහු විසින් දශවිධ අර්පණා කුශලතාවත් සම්පාදනය කළයුතුය. ඒ පිළිබඳ ක්‍රමය මෙසේයි:- දශ ආකාරයෙකින් අර්පණා කුශලතාව අපේක්ෂා කටයුතුය. අභ්‍යන්තර බාහිර වස්තූන් පවිත්‍ර කරගැනීමෙන්, (ශ්‍රද්ධාදී) ඉන්ද්‍රියයන් සමබවට පත් කිරීමෙන්, (කසිණ ආදී) නිමිති කෙරෙහි කුශලතාවෙන්, සිත නඟා සිටුවිය යුතු තන්හි නඟා සිටුවීමෙන්, සිත ඔබා තැබියයුතු කල්හි ඔබා තැබීමෙන්, සිත පිනවිය යුතු තන්හි පිනවීමෙන්, සිත උපේක්ෂා කටයුතු තන්හි උපේක්ෂා කිරීමෙන්, අසමාහිත පුද්ගලයන් දුරු කිරීමෙන්, සමාහිත පුද්ගලයන් ඇසුරු කිරීමෙන් හා සමාධිය කෙරෙහි අභිලාෂ ඇති කරගැනීමෙනි.

එහි **වත්ථුවිසදකිරියා** (වස්තූන් පවිත්‍ර කිරීම) නම්, අභ්‍යන්තර බාහිර වස්තූන් පවිත්‍ර කිරීමයි. යම් කලෙක ඒ යෝගාවචරයාගේ කෙස්, නිය, ලොම් දික්ව වැඩී ගියේනම්, සිරුර දහදියෙන් කිලිටිව ගියේ නම්, එකල ඒ අභ්‍යන්තර වස්තූන් අපවිත්‍ර වූයේය, අපිරිසුදු වූයේය. යම් කලෙක වනාහි සිවුරු දිරාපත්වූයේ, කිලිටිවූයේ, දුගඳවත් වූයේ නම්, සෙනස්න කසලින් ගැවසියේ නම්, එකල එම බාහිර වස්තූන් අපවිත්‍රව ගියේය, අපිරිසුදු වූයේය, අභ්‍යන්තර බාහිර වස්තූන් අපිරිසුදුවූ කල්හි උපදින චිත්ත චෛතසිකයන් කෙරෙහිවූ ඥානයද අපිරිසුදු වන්නේය, අපිරිසුදුවූ පහන් කබල්, වැටි, තෙල් නිසා උපන් පහන් සිළුවෙහි ආලෝකය මෙන් අපිරිසුදුවූ ඥානයෙන් සංස්කාරයන් සම්මර්ශනය කරන්නහුට සංස්කාරයෝ අප්‍රකාශ වන්නාහ, කමටහන්හි යෙදුණහුගේ කමටහනද වැඩීමට, බලවත් බවට, විපුල බවට නොයන්නේය. අභ්‍යන්තර බාහිර වස්තූන් පිරිසුදුවූ කල්හි උපදනා චිත්ත-චෛතසිකයන් කෙරෙහිවූ ඥානයද පිරිසුදු වන්නේය, පිරිසුදුවූ පහන් කබල්, වැටි, තෙල් නිසා උපන් පහන් සිළුවෙහි ආලෝකය මෙන් පිරිසුදුවූ ඥානයෙන් සංස්කාරයන් සම්මර්ශනය කරන්නහුට එම සංස්කාරයෝද ප්‍රකට වන්නාහ, කමටහන්හි යෙදුණහුගේ කමටහනද වැඩීමට, බලවත්බවට, විපුලබවට යන්නේය,

**ඉන්ද්‍රියසමත්තපටිපාදනං** (ඉන්ද්‍රියයන් සමබවට පත්කිරීම) නම්: ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ සමබව ඇතිකර ගැනීමයි. ඉදින් යෝගාවචරයාගේ සද්ධින්ද්‍රිය බලවත් වේනම්, සෙසු ඉන්ද්‍රියයෝ දුබල වෙත්නම්, ඒ හේතුවෙන් විරියින්ද්‍රිය සිත ඔසවා තැබීමේ කාර්යයද, සතින්ද්‍රිය වැටහීමේ කාර්යයද, සමාධින්ද්‍රිය එකඟ කිරීමේ කාර්යයද, පඤ්ඤින්ද්‍රිය යථාස්වභාවය දැකීමේ කාර්යයද ඉටුකරනු නොහැකි වන්නේය, එහෙයින් සද්ධින්ද්‍රිය ධර්මස්වභාවය ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් හෝ, යම් ආකාරයෙකින් මෙනෙහි කරනවිට ඒ

සද්ධින්ද්‍රිය බලවත් වේනම්, එම ආකාරයෙන් මෙනෙහි නොකිරීමෙන් හෝ හෙළා තැබිය යුතුය. මෙහිලා වක්කලී තෙරුන්ගේ කතාපුවත නිදර්ශනයි. ඉදින් විරියින්ද්‍රිය බලවත් වුවහොත් සද්ධින්ද්‍රිය අධිෂ්ඨානමය කාර්යයද, සෙසු ඉන්ද්‍රියයෝ තම තමන්ගේ කාර්ය විශේෂයන්ද ඉටුකරනු නොහැකි වන්නාහුය. එහෙයින් ඒ විරියින්ද්‍රිය පස්සද්ධි (ලිහිල්) භාවනාවෙන් අඩු කළ යුතුය. එහිලා සෝණ තෙරුන්ගේ කතාපුවත දක්විය යුතුය. මෙසේ සෙසු ඉන්ද්‍රියයන් පිළිබඳවද එක් ඉන්ද්‍රියයක් උත්සන්න වීමෙන් අනෙක් අනෙක් ඉන්ද්‍රියයන් තම තමන්ගේ කාර්යය ඉටුකිරීමට නොපොහොසත් වනබව දතයුතුය. මෙහිලා විශේෂයෙන් ශ්‍රද්ධා ප්‍රඥ යන දෙක්හිද සමාධි, වීර්ය යන දෙක්හිද සමබරබව අවධාරණය කෙරෙති, බලවත් ශ්‍රද්ධා ඇත්තේ නොදන පහදිනසුලු වූයේ මඳ නුවණ ඇත්තේ නොතන්හි පහදියි, බලවත් ප්‍රඥ ඇත්තේ මඳ සැදැහැ ඇත්තේ, කෙරාටික බවට නැඹුරු වේ, බෙහෙතින් හටගත් රෝගයක් මෙන් පිළියම්කළ නොහැක්කේ වේ. (ශ්‍රද්ධා ප්‍රඥ යන) දෙක සමබර වීමෙන් සුදුසු තන්හිම පහදනේ වේ. බලවත් සමාධි ඇත්තේ මඳ වීර්ය ඇත්තේය, සමාධිය කුසීතබවට නැඹුරුවන හෙයින් කුසීතබව විසින් මඩිනු ලබන්නේය. බලවත් වීර්ය ඇත්තේ දුර්වල සමාධි ඇත්තේය, වීර්යය උද්ධච්චයට (අසහනයට) නැඹුරුවන හෙයින් උද්ධච්චය විසින් මඩිනු ලබන්නේය. සමාධිය වීර්යය හා සමග සමව යෙදුණවිට කුසීතබවට නොවැටෙන්නේය, වීර්යය සමාධිය හා සමග සමව යෙදුණවිට උද්ධච්චයට නොවැටෙන්නේය, එහෙයින් (සමාධි වීර්ය යන) දෙක සම කළයුතුය. මේ දෙක සම වීමෙන් අර්පණා උපදනේය. තවද සමාධි වඩන්නහුට බලවත්වූද ශ්‍රද්ධාව වටනේය, මෙසේ ඇදහිලි ඇත්තේ, භක්ති ඇත්තේ, අර්පණාවට පැමිණෙන්නේය. සමාධි ප්‍රඥ යන දෙක්හි වනාහි, සමාධි වඩන්නහුට බලවත් ඒකාග්‍රතාව වටනේය, මෙසේ හේ තෙමේ අර්පණාවට පැමිණේ, විපස්සනා වඩන්නහුට බලවත් ප්‍රඥව වටනේය, මෙසේ හේ තෙමේ ලක්‍ෂණ ප්‍රතිවෙධයට පැමිණේ. සමාධි ප්‍රඥ යන දෙක්හි සමබවින්ද අර්පණා වන්නේමය.

**සතිය** (සිහිය) වනාහි සියලු තන්හි බලවත්වීම වටනේය, සති හෙවත් සිහිය වනාහි සිත උද්ධච්ච පක්‍ෂයට මෙහෙයවන ශ්‍රද්ධා වීර්ය ප්‍රඥ යන මොවුන්ගේ වශයෙන් උද්ධච්චයට වැටීමෙන්ද, කුසීත පක්‍ෂයට මෙහෙයවන සමාධිය නිසා කුසීතබවට වැටීමෙන්ද වලක්වයි. එහෙයින් ඒ සතිය සියලු සූපයන්හි ලවණ ධූපනයක් (ලුණු තෙම්පරාදුවක්) මෙන්ද, සියලු රාජකෘත්‍යයෙහි සියලු කටයුතු භාර ඇමතියකු සෙයින්ද, සියලු තන්හි කැමැතිවිය යුතුය. එහෙයින් කීහ: සිහිය වනාහි භාග්‍යවතුන්

වහන්සේ විසින් සියලු තන්හි කැමැතිවිය යුත්තේයයි වදරන ලද්දේය, කවර හෙයින්ද? (කුසල්) සිත වනාහි සිහිය පිළිසරණකොට ඇත්තේය. සිහිය වනාහි ආරක්‍ෂාව වැටහීම් කොට ඇත්තේය, සිහියෙන් තොරව සිත නැංවීම හෝ හෙළීම සිදු නොවේ.(1)

**නිමිත්තකොසල්ල** (හෙවත් නිමිති කෙරෙහි කුශලතා) නම්, පඨවිකසිණ ආදීවූ සිත එකඟ කිරීම පිළිබඳ නිමිති කෙරෙහි නො- ඉපැදවුණු නිමිති ඉපැදවීමෙහිද, ඉපැදවුණු නිමිති වැඩීමෙහිද කුශලතාව හා භාවනාවෙන් ලද නිමිති රැකගැනීමේ කුශලතාවයි. ඒ රැකීමේ කුශලතාව මෙම නිමිති කුශලතාවෙහිලා අභිප්‍රේතයි. යම් කලෙක සිත නංවා තැබිය යුතුවේනම්, එකල සිත නංවා තබයි, කෙසේදයත්, යම් කලෙක මෙම යෝගාවචරයාගේ සිත ඉතා ලිහිල් වීර්ය ඇතිබව ආදිය හේතුකොටගෙන ලීන බවට යේ නම්, එකල පස්සද්ධි ආදී බොජ්ඣංග තුන නොවඩා ධම්මවිචය ආදී බොජ්ඣංග තුන වඩයි. කියන ලදමැයි භාග්‍යවතුන් වහන්සේ විසින්: 'මහණෙනි යම්සේ පුරුෂයෙක් තෙමේ මදගින්නක් මොලවනු කැමැතිවන්නේ තෙත් තණ පරඬල් බහාලන්නේ නම්, තෙත් ගොම බහාලන්නේ නම්, තෙත් දර බහාලන්නේ නම්, දියමුසු පවන් ගසන්නේ නම්, පස්ද ඉසින්නේ නම්, මහණෙනි, ඒ පුරුෂයා එම මදගින්න මෙලවීමට හැකි වන්නේද?' 'ස්වාමීනි නොහැකි වන්නේමය. මහණෙනි, එසේම යම්විටෙක සිත හැකිළී ගියේනම්, එවිට පස්සද්ධි- සම්බොජ්ඣංගය වැඩීමට නොකල්‍ය, සමාධි-පෙ-නොකල්‍ය, උපෙක්ඛා- පෙ-නොකල්‍ය, එයට හේතු කවරේද? මහණෙනි, සිත හැකිළී ගියේනම්, ඒ හැකිළී ගිය සිත මේ (පස්සද්ධි ආදී) බොජ්ඣංග ධර්මයන්ගෙන් නඟා සිටුවිය නොහැකිය, මහණෙනි, යම්විටෙක සිත හැකිළී ගියේනම් එවිට ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩීමට කල්‍ය,විරිය-පෙ-කල්‍ය, පීති සම්බොජ්ඣංගය වැඩීමට කල්‍ය, එයට හේතු කවරේද? මහණෙනි, සිත හැකිළී ගියේනම්, ඒ හැකිළී ගිය සිත මේ (ධම්මවිචය ආදීකොට ඇති) බොජ්ඣංග ධර්මයන් මගින් පහසුවෙන් නඟා තැබිය හැකිය, මහණෙනි, යම්සේ පුරුෂයෙක් තෙමේ මද ගින්නක් මොලවනු කැමැතිව වියලි තණ පරඬල් බහාලන්නේ නම්, වියලි ගොම, වියලි දර බහා ලන්නේ නම්, කටින් සුලන්ද පිඹින්නේ නම්, පස්ද නොඉසින්නේ නම්, මහණෙනි, ඒ පුරුෂ තෙමේ එම ගින්න මොලවනු හැකි වන්නේද? එසේය ස්වාමීනි,(2)

මෙහිද තමතමන්ගේ ආහාර වශයෙන් ධම්මවිචය සම්බොජ් ඣංගාදිය වැඩීම දතයුතුය. කියනලද මැයි, මහණෙනි,

(1) මහා අට්ඨකථා පාඨයෙකි.
(2) සං. නි. මහාවග්ග, බො. සං - S v 112 f.

කුශලාකුශලධර්මයෙෝ ඇත්තාහ, සාවද්‍ය අනවද්‍ය ධර්මයෝ ඇත්තාහ. හීන ප්‍රණීත ධර්මයෝ ඇත්තාහ. කෘෂ්ණ ශුක්ල ධර්මයෝ ඇත්තාහ, එහිලා නුවණින් මෙනෙහි කිරීම බහුලව වේනම්, මෙය නූපන් ධම්මවිචය සම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස, උපන් ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩීම පිණිස ආහාර වේ, එම ධම්මවිචය සම්බොජ්ඣංගය විපුල බවට යාම පිණිස, වැඩීම පිණිස, සම්පූර්ණවීම පිණිස පවත්නේය.[1] එහිලා සාමඤ්ඤලක්ඛණ ප්‍රතිවේධ වශයෙන් කුශලාදී විෂයන්හි පවත්නා මනසිකාරය යොනිසොමනිසිකාර නම්. එසේම, මහණෙනි, ආරම්භකධාතු හෙවත් ඇරඹී නොබෝ කල් ගිය වීර්යයෙක් ඇත, නික්කමධාතු හෙවත් කුසීතබවින් නිකුත්වූ හෙයින් ඊටවඩා බලවත්වූද, පරක්කමධාතු හෙවත් වඩාත් බලවත්වූද වීර්යයෙක් ඇත, එහිලා නුවණින් මෙනෙහි කිරීම බහුල වශයෙන් වේනම්, එය නූපන් විරියසම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස, උපන් විරියසම්බොජ්ඣංගය බෝවීම පිණිස ආහාර වේ, විපුලබවට යාම පිණිස, වැඩීම පිණිස, සම්පූර්ණවීම පිණිස පවත්නේය. එසේම, මහහණෙනි, පීතිසම්බොජ්ඣංගය පිහිටන ධර්මයෝ ඇත්තාහ, එහිලා නුවණින් මෙනෙහි කිරීම බහුල වශයෙන් වේනම්, එය නූපන් පීතිසම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස, උපන් පීතිසම්බොජ්ඣංගය බෝවීම පිණිස ආහාරවේ. විපුල බවට යාම පිණිස, වැඩීම පිණිස, සම්පූර්ණ වීම පිණිස පවත්නේය.[2] එහි ස්වභාව ලක්‍ෂණ, සාමාන්‍ය ලක්‍ෂණ අවබෝධ කිරීම් වශයෙන් පැවති මනස්කාරය කුශලාදිය කෙරෙහි නුවණින් මෙනෙහි කිරීම නම් වේ. ආරම්භවීර්යාදිය ඉපැදවීම් වශයෙන් පවත්නා මනස්කාරය ආරම්භධාතු ආදිය කෙරෙහි යොනිසෝමනසිකාරය හෙවත් නුවණින් මෙනෙහි කිරීම නම් වේ. එහි ආරම්භධාතු යනු ප්‍රථම වීර්යයයි කියනු ලැබේ. නික්කමධාතු යනු කුසීතබවින් නික්මුණු හෙයින් එයට වඩා බලවත් වීර්යයයි. පරක්කමධාතු යනු, මතු මත්තෙහිත් පවත්නා හෙයින් එයටත් වඩා බලවත් වීර්යයයි. පීතිසම්බොජ්ඣංගය පිහිටන ධර්මයෝ (පීති සම්බොජ්ඣංගට්ඨානියා ධම්මා) යනු, ප්‍රීතියටම අධිවචනයෙකි. එය උපදවන මනස්කාරයද යොනිසො මනසිකාර නම්.

තවද ධර්මයෝ සත් දෙනෙක් ධම්මවිචයසම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස පවත්නාහුය. විචාරණපුලු බවය, (අභ්‍යන්තර බාහිර) වස්තුන් පිරිසුදු කරන බවය, (ශ්‍රද්ධාදී) ඉන්ද්‍රියයන් සමබවට පැමිණවීමය, නුවණමද පුද්ගලයන්ගෙන් දුරුවූ බවය, ප්‍රඥවත් පුද්ගලයන් සේවනය කිරීමය, ගැඹුරුවූ ඥානචර්යාවන් ප්‍රත්‍යවෙක්‍ෂා කරන බවය, එම ඥානචර්යාවන්

(1) සං. නි. මහාවග්ග, බො. සං -Sv 104
(2) එම

වෙත නැඹුරුවූ බවය යන මොහුය. ධර්මයෝ එකොළොස් දෙනෙක් විරියසම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස පවත්නාහුය. අපායාදී භය ප්‍රත්‍යවෙක්‍ෂා කරන බවය, වීර්යයට අයත් ලෞකික ලෝකෝත්තර විශේෂාධිගමයන්ගේ ආනිසංසයන් දක්නාසුලු බවය, බුදු පසේබුදු මහසව්වන් විසින් ගන්නාලද මාර්ගය මා විසිනුදු ගතයුතුය, ඒ අනුව යාම කුසීතව කළ නොහැකියයි මෙසේ ගමන් මඟ ප්‍රත්‍යවෙක්‍ෂා කරන බවය, දායකයනට මහත්ඵලභාවය ගෙනදෙන හෙයින් පිණ්ඩපාතයෙන් පුදනු ලබන බවය, 'මාගේ ශාස්තෘන් වහන්සේ වීර්යාරම්භයෙහි ගුණ කියන කෙනෙකි, උන්වහන්සේ වනාහි නොඉක්මවියහැකි ශාසන ඇත්තාහුය, අපට බොහෝ උපකාර ඇති කෙනෙකි, ප්‍රතිපත්ති පූජාවෙන් (පුදනු ලබන්නාහුම) පිදීමෙන්ම පුදනු ලබන්නාහු නම් වෙති, අන් ලෙසෙකින් (පුදනු ලබන්නාහු) නොවෙති'යි මෙසේ ශාස්තෘන් වහන්සේගේ ගුණමහත්වය ප්‍රත්‍යවෙක්‍ෂා කරන බවය, 'සද්ධර්ම සංඛ්‍යාතවූ මහාදායාදය මවිසින් ලබාගත යුතුය, එය කුසීතව ලබාගත නොහැකිය'යි මෙසේ දායාදමහත්වය ප්‍රත්‍යවෙක්‍ෂා කරන බවය, ආලෝකසංඥව මෙනෙහි කිරීමෙන්, ඉරියවු වෙනස් කිරීමෙන් හා අභ්‍යවකාශ සේවනාදියෙන් ථීනමිද්ධ විනොදනය කරන බවය, කුසීත පුද්ගලයන් දුරුකරන බවය, ආරබ්ධවීර්ය ඇත්තවුන් සේවනය කරන බවය, සම්‍යක් ප්‍රධානයන් ප්‍රත්‍යවෙක්‍ෂා කරන බවය, එම විරියසම්බොජ්ඣංගය වෙතට නැඹුරුවූ බවය යන මොහුය.

ධර්මයෝ එකොළොස් දෙනෙක් පීතිසම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස පවත්නාහුය: බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, උපසමානුස්සති යන මේ සතද, රළු පරුෂ පුද්ගලයන් දුරු කරන බවය, තෙරුවන් කෙරෙහි සෙනෙහැති සෞම්‍ය පුද්ගලයන් ඇසුරු කරන බවය, ප්‍රසාදය දනවන සූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්‍ෂා කරන බවය, එම පීතිසම්බොජ්ඣංගය වෙත නැඹුරුවූ බවය යන මේ සතරද යන මොහුය. මෙසේ මේ ආකාරයෙන් මේ ධර්මයන් උපදවනුයේ ධම්මවිචය ආදී බොජ්ඣංගයන් වඩන්නේ වේ. මෙසේ යම් කලෙක සිත නඟාසිටුවියයුතු වේනම් එකල නඟා සිටුවන්නේය, යම් කලෙක සිත ඔබාතැබියයුතු වේනම් ඔබා තබන්නේය, කෙසේද? යම් කලෙක අතිශයින් හුවා තබනලද වීර්ය ඇති බැවින් සිත නොසන්සුන් වේනම්, එකල ධම්මවිචය සම්බොජ්ඣංගාදී බොජ්ඣංග තුන නොවඩා පස්සද්ධි ආදී බොජ්ඣංගයන් වඩන්නේය. කියන ලදමැයි භාග්‍යවතුන් වහන්සේ විසින්: මහණෙනි, යම්සේ පුරුෂයෙක් තෙමේ මහ ගිනිකඳක් නිවනු කැමැත්තේ වේද, හේ තෙමේ එහි වියළි තණ පරඬල්

බහාලන්නේද-පෙ-පස් නො-ඉසින්නේද, මහණෙනි, ඒ පුරුෂයා ඒ මහ ගිනිකඳ නිවා ලන්නට සමත් වන්නේද? ස්වාමීනී, නොවන්නේ මැයි. මහණෙනි, එසේම යම් කලෙක කැළඹී ගිය සිත් ඇත්තේ නම්, එකල ධම්මවිචයසම්බොජ්ඣංගය වැඩීමට කල් නොවේ. විරියසම්බොජ්ඣංගය වැඩීමට කල් නොවේ, පීතිසම්බොජ්ඣංගය වැඩීමට කල් නොවේ. එයට හේතු කවරේද? මහණෙනි සිත අතිශයයෙන් හුවා තබනලද්දේ වේ, මේ ධර්මයන්ගෙන් එය සන්සිඳුවිය නොහැකි වන්නේය, මහණෙනි, යම් කලෙක හුවනලද සිත් ඇත්තේ නම්, එකල පස්සද්ධිසම්බොජ්ඣංගය වැඩීමට කල්ය, සමාධිසම්බොජ්ඣංගය-පෙ-උපෙක්ඛාසම්බොජ්ඣංගය වැඩීමට කල්ය. එයට හේතු කවරේද? මහණෙනි සිත ඉතා හුවනලද්දේ නම් එය මේ ධර්මයන්ගෙන් පහසුවෙන් සන්සිඳුවිය හැකි වන්නේය. මහණෙනි, යම්සේ පුරුෂයෙක් තෙමේ මහ ගිනිකඳක් නිවනු කැමැත්තේ වේද, හේ තෙමේ එහි තෙත්වූ තණපරඬැල්ද, තෙත්වූ-පෙ-පස්ද ඉසින්නේය, මහණෙනි, ඒ පුරුෂයා එම ගිනිකඳ නිවනු සමත් වන්නේද? එසේය ස්වාමීනි.[(1)]

මෙහිද තම තමන්ගේ ආහාර වශයෙන් පස්සද්ධි ආදී බොජ්ඣංගයන් වැඩීම දතයුතුය. වදරන ලද්දේ මැයි භාග්‍යවතුන් වහන්සේ විසින්: මහණෙනි, කායපස්සද්ධියෙක් ඇත, චිත්තපස්සද්ධියෙක්ද ඇත, එහි බොහෝසේ නුවණින් මෙනෙහි කිරීමෙක් ඇත්ද, එය නූපන් පස්සද්ධිසම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස, උපන් පස්සද්ධිසම්බොජ්ඣංගය බොහෝවීම පිණිස, එහි විපුලබව පිණිස, වැඩීයාම පිණිස, පිරිපුන්බව පිණිස පවත්නේය. එසේම මහණෙනි, සමාධිනිමිත්තෙක් ඇත, ඒකාග්‍රතා නිමිත්තෙක්ද ඇත, එහිලා බොහෝසෙයින් නුවණින් මෙනෙහි කිරීමෙක් වේද, මෙය නූපන් සමාධිසම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස, උපන් සමාධිසම්බොජ්ඣංගය බොහෝවීම පිණිස, එහි විපුලබව පිණිස, පිරිපුන්බව පිණිස පවත්නේය. එසේම මහණෙනි, උපෙක්ඛාසම්බොජ්ඣංගයට පාදකවූ ධර්මයෙක් ඇත, එහි බොහෝසෙයින් මෙනෙහි කිරීමෙක් වේද, මෙය නූපන් උපෙක්ඛාසම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස, උපන් උපෙක්ඛාසම්බොජ්ඣංගය බොහෝවීම පිණිස, එහි විපුලබව පිණිස, වැඩීම පිණිස, පිරිපුන්බව පිණිස පවත්නේය.'[(2)] එහිලා යම්සේ මේ යෝගාවචරයාහට පස්සද්ධි ආදිය උපන්විරුද, ඒ ඒ ආකාරය සලකා ඒ පස්සද්ධි ආදිය පිළිබඳ ඉපැදවීම් වශයෙන් පවත්වනලද මනස්කාරයම මෙහි තුන් පෙදෙහිම යොනිසොමනසිකාර නම්වේ.

(1) සං. නි. මහාවග්ග, බො. සං - S v 114
(2) එම - S v 104f.

**සමථනිමිත්ත** යනු සමථයටම අධිවචනයෙකි, අවික්ෂෙපාර්ථයෙන් **අව්‍යග්ගනිමිත්ත** යනුද එයටම අධිවචනයි. තවද ධර්මයෝ සත් දෙනෙක් පස්සද්ධිසම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස පවත්නාහුය, ප්‍රණීත ආහාර සේවනය කරනබවය, සුඛදයක ඍතුගුණයන් සේවනය කරනබවය, සුඛදයක ඉරියවු සේවනය කරනබවය, මධ්‍යස්ථවූ කායවාක්මනස් ප්‍රයොග ඇතිබවය, කිපෙනසුලු පුද්ගලයන් දුරුකරන බවය, සන්සුන් කය ඇති පුද්ගලයන් ඇසුරුකරන බවය, පස්සද්ධිසම්බොජ්ඣංගය වෙත නැඹුරුවූ බවය යන මොහුය.

ධර්මයෝ එකොළොස් දෙනෙක් සමාධිසම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස පවත්නාහුය (අභ්‍යන්තර බාහිර) වස්තූන්ගේ පිරිසුදු බවය, කසිණ ආදී නිමිති කෙරෙහි දක්‍ෂ බවය, (සමාධි, වීර්ය) යන ඉන්ද්‍රියයන් සමව පවත්වාගන්නා බවය, සුදුසු කල්හි සිත බහා තබන බවය, සුදුසු කල්හි සිත හුවා තබන බවය, (භාවනා විෂයෙහි) ආස්වාද රහිතවූ සිත ශ්‍රද්ධා සංවෙග වශයෙන් පුබුදුකරන බවය, සමව පවත්නා සිත උපෙක්‍ෂා කරන බවය, අසමාහිත පුද්ගලයන් දුරුකරන බවය, සමාහිත පුද්ගලයන් ඇසුරුකරන බවය, ධ්‍යාන විමොක්‍ෂයන් ගැන ප්‍රත්‍යවෙක්‍ෂාකරන බවය, සමාධිසම්බොජ්ඣංගය වෙත නැඹුරුවූ බවය යන මොහුය. ධර්මයෝ පස් දෙනෙක් උපෙක්ඛාසම්බොජ්ඣංගය ඉපැදවීම පිණිස පවත්නාහුය. සත්වයන් කෙරෙහි මැදහත් බවය, සංස්කාරයන් කෙරෙහි මැදහත් බවය, සත්වයන් හා සංස්කාරයන් කෙරෙහි මමත්වය කරන පුද්ගලයන් දුරුකරන බවය, සත්වයන් හා සංස්කාරයන් කෙරෙහි මැදහත් පුද්ගලයන් ඇසුරුකරන බවය, උපෙක්ඛාසම්බොජ්ඣංගය වෙත නැඹුරුවූ බවය යන මොහුය. මෙසේ කියනලද ආකාරයෙන් මේ ධර්මයන් උපදවන්නේ පස්සද්ධිසම්බොජ්ඣංගාදිය වඩන්නේ වේ. මෙසේ යම් කලෙක සිත බහා තැබියයුතු වේනම්, එකල සිත බහා තබයි, යම් කලෙක සිත පුබුදු කළයුතු වේනම්, එකල සිත පුබුදුවාලයි, කෙසේදයත්, යම් කලෙක මේ යෝගියාගේ ප්‍රඥාප්‍රයොගය මඳවීමෙන් හෝ ඒකාග්‍රතාසුඛය නොලදබැවින් හෝ සිත භාවනා විෂයෙහි ආස්වාද රහිත වේනම් එකල එය අෂ්ට සංවෙගවස්තූන් මෙනෙහි කිරීමෙන් සංවෙගවත් කරවන්නේය. අෂ්ට සංවෙගවස්තු නම්, ජාති, ජරා, ව්‍යාධි, මරණ යන සතරද, පස්වන අපාය දුකද, අතීතයෙහිවූ සංසාරමූලක දුක්ද, අනාගතයෙහි වන සංසාරමූලක දුකද, වර්තමානයෙහි ආහාර සෙවීමේ දුකද යන මේය. බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් ගුණ සිහි කිරීමෙන්ද සිත්හි ප්‍රසාදය උපදියි. මෙසේ යම් කලෙක සිත සොම්නස් කළයුතුවේනම් එකල සිත සොම්නස් කරවයි. යම් කලෙක සිත උපේක්‍ෂා කළයුතු වේනම්, එකල එය උපේක්‍ෂා කරවයි, කෙසේදයත්,

මේ ආකාරයෙන් පිළිපදනා ඔහුගේ සිත යම් කලෙක නොහැකුලුණේ, නොකැළඹුණේ, නිරාස්වාද නොවූයේ, අරමුණෙහි සමව පවත්නේ, සමථ මාර්ගයට පිළිපන්නේ වේනම්, එකල එය හුවා තැබීම, බහා තැබීම, පුබුදු කරවීම ආදී ව්‍යාපාරයකට නොඑළඹෙන්නේය. සමව පවතින අශ්වයන් කෙරෙහි රථාචාර්යයකු සෙයිනි. මෙසේ යම් කලෙක සිත උපේක්ෂා කරවියයුතු වේනම්, එකල සිත උපේක්ෂා කරවයි.

**අසමාහිතපුග්ගලපරිවජ්ජනතා** (අසමාහිත පුද්ගලයන් දුරු කිරීම) යනු, නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදවට නොනැගුණුවිරු, නොයෙක් කර්තව්‍යයන්හි නියැලුණු, විසුරුණු සිත්ඇති පුද්ගලයන් දුරින්ම දුරු කිරීමයි. සමාහිත පුද්ගලයන් සේවනය කිරීමය යනු නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදවට පිළිපන් සමාධිලාභී පුද්ගලයන් වෙත කලින් කල එළඹීමයි.

**තදධිමුත්තතා** යනු, සමාධිය වෙත නැමුරුවූ බවයි, සමාධියම ගුරුකොට පවත්නා බවයි, සමාධිය වෙත නැමෙන බවයි, සමාධිය වෙත ඇදෙන බවයි, සමාධිය වෙතට බරවූ බවයි යන අර්ථයි. මෙසේ මේ දශවිධවූ අර්පණා කෞශල්‍යය සම්පාදනය කටයුතුය.

එවං හි සම්පාදයතො අප්පණාකොසල්ලං ඉමං
පටිලද්ධෙ නිමිත්තස්මිං අප්පණා සම්පවත්තති

එවම්පි පටිපන්නස්ස සචෙ සා නප්පවත්තති
තථාපි න ජහෙ යොගං වායමෙථෙව පණ්ඩිතො

හිත්වා හි සම්මාවායාමං විසෙසං නාම මානවො
අධිගච්ඡෙ පරිත්තම්පි ඨානමෙතං න විජ්ජති

චිත්තප්පවත්තිආකාරං තස්මා සලක්ඛයං බුධො
සමතං විරියස්සෙව යොජයෙථ පුනප්පුනං

ඊසකම්පි ලයං යන්තං පග්ගණ්හෙථෙව මානසං
අච්චාරද්ධං නිසෙධෙත්වා සමමෙව පවත්තයෙ

රෙණුම්හි උප්පලදලෙ සුත්තෙ නාවාය නාළියා
යථා මධුකරාදීනං පවත්ති සම්පවණ්ණිතා

ලීන-උද්ධතභාවෙහි මොචයිත්වාන සබ්බසො
එවං නිමිත්තාභිමුඛං මානසං පටිපාදයෙ ති.

මෙසේ මේ අර්පණා කෞශල්‍යය සම්පාදනය කරන යෝගියාහට ලදනිමිත්තෙහි අර්පණාව මනාකොට පවත්නේය.

ඉදින් මෙසේ පිළිපන්නහුටද අර්පණාව නොපවත්නේ නම්, එසේවුවද පණ්ඩිතතෙමේ භාවනායෝගය නොහරින්නේය, තව තවත් උත්සාහ කරන්නේමය.

සම්‍යග් ව්‍යායාමය අත්හැර සත්වයෙක් තෙමේ මඳවූ හෝ විශේෂාධිගමයකට පැමිණේය යන මේ කාරණය විද්‍යමාන නොවේමැයි.

එහෙයින් පණ්ඩිත තෙමේ සිත පවත්නා ආකාරය පිළිබඳව සැලකිලිමත් වූයේ නැවත නැවතත් වීර්ය සමතාවම යොදවන්නේය.

මඳ වශයෙන් හෝ කුසීත බවට යන සිත හුවා තබන්නේය, අතිශය වීර්යය වලක්වා එය සමකොට පවත්වන්නේය,

මල් රොන්හිද, මහනෙල් පතෙහිද, මකුළුහුයෙහිද, නැවෙහිද, තෙල් නළෙහිද, ක්‍රමයෙන් මීමැසි ආදීන්ගේ පැවැත්ම යම්සේ (අටුවාවෙහි උපමා වශයෙන්) වර්ණනා කරන ලද්දේද.

එසේ ලීන උද්ධත භාවයන් කෙරෙන් සැම ලෙසින්ම සිත මුදවා (පටිභාග) නිමිත්තට අභිමුඛව මෙහෙයවන්නේය.

එහි අර්ථප්‍රතිරූපණය මෙසේය, යම්සේ අතිදක්ෂවූ මී මැස්සෙක් අසුවල් ගසෙහි මල් පිපී ගියේයයි දැන ඉතා වේගයෙන් පියා සලමින් එය වෙත යන්නේ එම ගස ඉක්මවා ගොස් පෙරළා එන්නේ රොන් අවසන් පසු පැමිණේ, අදක්ෂවූ අනෙකෙක් මඳ ජවයෙන් පියා සලනුයේ රොන් අවසන්වූ පසු එය වෙත පැමිණේ, දක්ෂවූ (අතිදක්ෂ හෝ අදක්ෂ නොවූ) අනෙකෙක් වනාහි සම වේගයෙන් පියා සලනුයේ මල් රැසක් වෙත සුවසේ හැසිරෙමින් කැමැතිතාක් රොන් ගෙන මීරස විඳින්නේ වේද, තවද යම්සේ පැන් තලියෙහි මහනෙල් පත් බහා ශල්‍ය කර්ම උගන්නා ශල්‍ය වෛද්‍ය ශිෂ්‍යයන් අතුරෙන් එකෙක් අතිදක්ෂ වූයේ වේගයෙන් සැත් හෙලමින් මහනෙල්පත දෙකඩකොට සිඳලයි, නැතහොත් දියෙහි ගිල්වා ලයි, අදක්ෂවූ අනෙකෙක් සිඳීයාදෝ දියෙහි ගිලේ දෝහෝයි බියෙන් සැත තබන්නට පවා නොසමත් වේ. දක්ෂවූ (අතිදක්ෂ හෝ අදක්ෂ නොවූ) අනෙකෙක් තෙමේ සමකොට යෙදීමෙන් එහි සැත් පහර දක්වා පිරිසිදුව හුරුපුරුදුකළ ශිල්ප ඇත්තේ සුදුසු තන්හි සැත් කම්

කොට ලාභ ලබන්නේද, තවද යම්සේ, "යමෙක් තෙමේ සිවුබඹයක් තරම් මකුළු හුයක් ගෙන එන්නේ නම්, හේ තෙමේ සාරදහසක් ලබන්නේය"යි රජු විසින් ප්‍රකාශ කරනලද කල්හි අතිදක්ෂවූ එක් පුරුෂයෙක් යුහුව මකුළු හූ එකතු කරනුයේ තැනින් තැන සිඳ ලන්නේමය, අදක්ෂවූ අනෙකෙක් සිඳීයාදෝයි බියෙන් අත තබන්නට පවා නොසමත් වෙයි, දක්ෂ වූයේ (අතිදක්ෂ හෝ අදක්ෂ නොවූයේ) වනාහි කොණක පටන් සමකොට යෙදීමෙන් දඬුවෙක ඔතාගත් මකුළු හූ ගෙනවුත් තෑගි ලබන්නේ වේද, තවද යම්සේ අතිදක්ෂවූ නියමුවා තදසුළඟෙහි රුවල් පුරා අදිමින් නැව විදේශයන්හි ගෙන යන්නේය. අදක්ෂවූ අනෙකෙක් මඳ සුළඟෙහි පවා රුවල් නොබහා එතැනම රඳවන්නේය, දක්ෂවූ (අතිදක්ෂ හෝ අදක්ෂ නොවූ) නියමු තෙමේ මඳ සුළඟ ඇති කල්හි රුවල් පුරා අදිමින් තද සුළඟ ඇති කල්හි අඩ රුවල් කරමින් නිරුපද්‍රැතව අභිමත ස්ථානයට නැව ගෙනයන්නේ වේද, තවද යම්සේ ආචාර්යයන් විසින් 'යමෙක් තෙල් නොවිසුරුවා නළ පුරවන්නේ නම් හේ තෑගි ලබන්නේය'යි ශිෂ්‍යයනට කී කල්හි, අතිදක්ෂවූ එකෙක් ලාභයෙහි ගිජුව යුහුව පුරවන්නේ තෙල් විසුරුවයි, අදක්ෂවූ අනෙකෙක් තෙල් විසිරෙති'යි බියෙන් නළ පුරවන්නට පවා නොහැකි වෙයි, දක්ෂවූ (අතිදක්ෂ හෝ අදක්ෂ නොවූ)අනෙකෙක් තෙමේ සමව යෙදීමෙන් නළ පුරවා තෑගි ලබන්නේ වේද, එසේම එක් භික්ෂු කෙනෙක් ප්‍රතිභාග නිමිත්ත උපන් කල ශීඝ්‍රයෙන් අර්පණාවට යෙමි'යි බලවත්සේ වීර්ය වඩති. අධිකව වඩනාලද වීර්ය ඇති හෙයින් ඔවුන්ගේ සිත නොසන්සුන් බවට හැරෙයි, අර්පණාවට පැමිණිය නොහැකි වෙයි. කෙනෙක් අධිකව වඩනාලද වීර්යයෙහි දොස් දැක, දැන්ම මට අර්පණාවෙන් කම් කිමැ'යි වීර්යය පිරිහෙවති, ඔහුගේ සිත ඉතා හැකුලුණු වීර්ය ඇති හෙයින් කුසීත බැව්හි වැටෙයි, අර්පණාවට පැමිණිය නොහැකි වෙයි. යම් කෙනෙක් වනාහි මඳ වශයෙන් හෝ හැකිලුණු සිත කුසීත බවින්ද, උද්ධතවූ සිත නොසන්සුන් බවින්ද ·මුදවා සමව යෙදීමෙන් (ප්‍රතිභාග) නිමිත්තට අභිමුඛව පවත්වන්නාහුද ඔහු අර්පණාවට පැමිණෙති, එබන්දකු විය යුතුය. මෙම අර්ථය පිණිස "රේණුම්හි උප්පලදලෙ" හා ('ලීන-උද්ධතභාවෙහි' යන ආදී) මෙය කියන ලදි.

රේණුම්හි උප්පලදලෙ සුත්තෙ නාවාය නාළියං
යථා මධුකරාදීනං පවත්ති සම්පවණ්ණිතා
ලීන-උද්ධතභාවෙහි මොචයිත්වාන සබ්බසො
එවං නිමිත්තාභිමුඛං මානසං පටිපාදයෙ ති

මෙසේ නිමිත්තට අභිමුඛකොට සිත පිළිපදවන මේ යෝගාවචරයාහට දැන් අර්පණාව සමෘද්ධ වන්නේය. කෙසේදයත්, "පඨවී,

පඨවී" යන ආදී වශයෙන් එළඹ සිටි එම පඨවීකසිණය අරමුණුකොට භවංගචිත්තය සිඳගෙන මනොද්වාරාවජ්ජන සිත උපදින්නේය, ඉක්බිති එම අරමුණෙහිම ජවන් සිත් සතරෙක් හෝ පසෙක් දිවෙයි. එම ජවන් සිත් අතුරෙන් අවසන්හි උපදින සිත රූපාවචර වේ, සෙසු සිත් කාමාවචර වේ, පියවි කාමාවචර සිත්වලට වඩා රූපාවචර සිත ඉතා බලවත් වේ. විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා සහිත වේ. අර්පණාවට පිරියම් වන හෙයින් පිරියම්සිත් යයිද කියනු ලැබේ. තවද යම්සේ ගම් ආදියට ආසන්න පෙදෙස ගාමොපචාරයයි නගරොපචාරයයි කියනු ලැබේද එසේම අර්පණාවට ආසන්නවූ හෙයින්, සමීපයෙහි හැසිරෙන හෙයින් උපචාරයයිද කියනු ලැබේ. මේ සිත් අතුරෙන් (තුන්වන ජවන් සිත) පෙරටු පිරියම් සිතටද මතුයෙහි අර්පණාවටද අනුලොමවන හෙයින් අනුලෝමයයි වහරනු ලැබේ. මෙම ජවන් සිත් අතුරෙන් අන්තිමවූ යම් සිතක් වේද, එය පරිත්ත (හෙවත් කාමාවචර) ගොත්‍රය මැඩලන හෙයින්ද, මහත්ගත (හෙවත් රූපාවචර) සිත් වඩවන හෙයින්ද ගොත්‍රභූයයි කියනු ලැබේ.

මෙහි අවිශේෂයෙන් කියනලද දෙය ගැනීම් වශයෙන්ද, මෙහි පළමුවන ජවන් සිත පරිකර්ම නම්, දෙවැන්න උපචාර නම්, තෙවැන්න අනුලෝම නම්, සිවුවැන්න ගොත්‍රභූ නම්. නැතහොත් පළමුවැන්න උපචාර නම්, දෙවැන්න අනුලෝම නම්, තෙවැන්න ගොත්‍රභූ නම්, සිවුවැන්න හෝ පස්වැන්න අර්පණා වේ. එයද ඛිප්පාභිඤ්ඤ, දන්ධාභිඤ්ඤ (වහා අවබෝධකරන, පමාවී අවබෝධ කරන) වශයෙන් වේ. එම (පස්වන) ජවනයෙන් පසු සවන සත්වන ජවනයෝ දිවෙති, ඉක්බිති භවාංගවාරය වේ. ආභිධම්මික ගෝදත්ත තෙරණුවෝ වනාහි "පළමු පළමු කුශල ධර්මයෝ පසු පසු කුශලධර්මයනට ආසේවනප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති[(1)]යි යන මේ සූත්‍රය කියා, ආසෙවනප්‍රත්‍යය වශයෙන් පසු පසු ධර්මයෝ බලවත් වෙති, එහෙයින් සවන සත්වන ජවන් සිත් තුළද අර්පණා සිද්ධ වෙති'යි කීහ. එය තෙරුන්ගේ මතිමාත්‍රයෙකැයි පවසා අට්ඨකථාවන්හි ප්‍රතික්ෂිප්තයි. සිවුවන පස්වන ජවනයන්හිදීම අර්පණා වේ, ඉන් මතු ජවනචිත්තයෝ පතිත (හෙවත් වැටුණාහු) නම් වෙති, භවංගයට ආසන්න බැවිනියි කියනලදි. එය මෙසේ විචාරණය කොට කියනලද හෙයින් පිළිකෙව් කළ නොහැකිය. යම්සේ වනාහි පුරුෂයෙක් තෙමේ බිදුණු ඉවුරකට අභිමුඛව දුවනුයේ නවතිනු කැමැතියේ වුවද කෙළවර පය තබා නවතිනු නොහැකිව ප්‍රපාතයටම වැටේද, එසේම සවන හෝ සත්වන ජවනයන්හිදී අර්පණා ලැබිය නොහැකිවේ, භවංගයට ආසන්නවූ හෙයිනි. එහෙයින් සිවුවන පස්වන ජවනයන්හිදීම අර්පණා

(1) අභි. පට්ඨාන - Path 5

වෙතැ'යි දතයුතුය. එම අර්පණාවද, එක් චිත්තක්ෂණයෙක්හිදීම සිද්ධ වන්නේය. සත් තැනෙක්හිදී චිත්තක්ෂණයන්ගේ සාමාන්‍ය කාලසීමාවෙක් නැත: පළමුවන අර්පණාවෙහි, ලෞකික අභිඥාවන් කෙරෙහි, සතර මග පිළිබඳ විෂයෙහි, සතර ඵල පිළිබඳ විෂයෙහි, රූපාරූප භවයන් පිළිබඳ භවාංග ධ්‍යානයෙහි, නිරෝධ සමාපත්තියට හේතුවූ නෙවසඤ්ඤ නාසඤ්ඤායතනයෙහි, නිරෝධ සමාපත්තියෙන් නැඟෙන්නහුගේ ඵල සමාපත්තියෙහිය යන මේ සත් තැනෙහිය. මෙහි මාර්ගයනට අනතුරුව එන ඵලය චිත්තක්ෂණ තුනකට වඩා නොවේ. නිරොධසමාපත්තියට හේතුවූ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය චිත්තක්ෂණ දෙකකට වඩා නොවේ. රූපාරූපභවයන් කෙරෙහිවූ චිත්තක්ෂණයන්ගේ පරිමාණයෙක් නැත. සෙසුතන්හි එක්ම සිතක් වන්නේය. මෙසේ අර්පණාව එකචිත්තක්ෂණිකම වේ. ඉක්බිති භවාංගපාතය වන්නේය. ඉක්බිති භවාංගය සිඳගෙන ධ්‍යානය ප්‍රත්‍යවෙක්ෂා කරනු පිණිස මනොද්වාරාවර්ජනය වන්නේය. ඉක්බිති ධ්‍යානප්‍රත්‍යවෙක්ෂණය වන්නේය. මෙතෙකින් වනාහි මේ යෝගී තෙමේ කාමයන්ගෙන් තොරව, අකුශලකර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවෙකයෙන් උපන් ප්‍රීති සුඛයෙන් යුත් ප්‍රථමධ්‍යානයට පැමිණ විහරණය කරන්නේය"(1) මෙසේ මොහු විසින් (කාමච්ඡන්දාදී) පංච අංගයෙන් විනිර්මුක්තවූ (විතර්කාදී) පංච අංගයෙන් සමන්විතවූ, ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තවූ, දශ ලක්ෂණ සම්පන්නවූ පඨවිකසිණයෙන් නැඟුණ ප්‍රථමධ්‍යානය අවබෝධ කරන ලද්දේ වේ.

එහි **විවිච්චෙව කාමෙහි** (කාමයන්ගෙන් තොරව) යනු, කාමයන්ගෙන් වෙන්ව, දුරුව, බැහැරව යන අර්ථයි. මෙහි යම් මේ **එව** පදයෙක් (විවිච්ච+එව) ඇද්ද, එය අවධාරණාර්ථයෙහියයි දතයුතුය. යම්හෙයකින් එය නිශ්චයාර්ථ ඇත්තේ වේද, එහෙයින් ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙන සමයෙහි අවිද්‍යමානවූද කාමයන් ඒ ප්‍රථම ධ්‍යානයට ප්‍රතිපක්ෂ වනබවද, කාමයන් අත්හැරීමෙන්ම එම ධ්‍යානාධිගමය සිදුවන බවද හඟවයි. කෙසේදයත්, විවිච්චෙව කාමෙහි යනුවෙන් මෙසේ අවධාරණය කරනු ලබන කල්හි, "ඒකාන්තයෙන් මේ ධ්‍යානයට කාමයෝ ප්‍රතිපක්ෂ වන්නාහ, කාමයන් විද්‍යමාන කල්හි මෙය නොපවත්නේය." අන්ධකාරය ඇති තැන ප්‍රදීපාලෝකයක් නොපවත්නා සේය. එම කාමයන් අත් හැරීමෙන්ම මෙහි අධිගමය සිදුවේ; මෙතෙර හැර යාමෙන්ම එතෙරවීම සිදුවන්නා සේය. එහෙයින් නිශ්චය කෙරෙති'යි යන මෙය පැහැදිලිය. එහිලා චෝදනාවෙක් (පැනයෙක්) වන්නේය. කවර හෙයින් මේ "එව"

---

(1) දී. නි. බ්‍රහ්මජාල සූ. ආදි - D i 37etc.

යතු පසු පදයෙහි නොකියා පෙරපදයෙහිම කියන ලද්දේද? කිම අකුශල ධර්මයන්ගෙන් දුරු නොවී වුවද ධ්‍යානයට පැමිණ වාසය කරන්නේද? මෙය මෙසේ නොගතයුතුය, පහවීම් වශයෙන් මෙය පෙරපදයෙහි කියනලදි. කාමභවසමතික්‍රමණ වශයෙන්ද කාමරාගයට සෘජුවම ප්‍රතිපක්ෂවීම් වශයෙන්ද මේ ධ්‍යානය කාමයන්ගේ නිස්සාරණය (පහවීම) සිද්ධ කරයි. කියනලද මැයි, යම් මේ නෛෂ්ක්‍රම්‍යයෙක් (ධ්‍යානයෙක්) ඇද්ද, එය කාමයන්ගේ නිස්සාරණය (පහවීම)යි(1) පසු පදයෙහිද මෙය යෙදේමය. ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණො(2) මහණෙනි, මේ (සෝවාන්වූ) ශ්‍රමණ තෙමේද මේ ශාසනයෙහිම වේ, මේ දෙවන (සකෘදගාමී) ශ්‍රමණ තෙමේද මේ ශාසනයෙහිම වේ. යන මේ පාඨයෙහි "එව" යන්න දෙවන පදයෙහිද ආධ්‍යාහාරකොට කියනු ලබන්නා සේය. මෙසේ කිවයුතුය, මෙයින් අන්‍යවූද නීවරණ සංඛ්‍යාත අකුශල ධර්මයන් කෙරෙන් දුරු නොවී ධ්‍යානයට පැමිණ විහරණය කළ නොහැකිය, එහෙයින් කාමයන් කෙරෙන් දුරුවම, අකුශල කර්මයන් කෙරෙන්ද දුරුවම (විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි) යයි මේ දෙපදයෙහිම "එව" යන්න යෙදෙතැයි දතයුතුය. දෙපදයෙහිම හුදෙක් "විවිච්ච" යන මේ පොදු වචනයෙන්ම තදංගවිවෙකාදියද, චිත්තවිවෙකාදියදැයි යන සියලුම විවේකයෝ සංග්‍රහයට යෙති. එසේවුවද, කායවිවේකය, චිත්තවිවේකය, වික්ඛම්භනවිවේකයැයි යන මේ තුනම මෙහිලා දතයුතුය.

**කාමෙහි** යන මේ පදයෙන් වනාහි "කතමෙ වත්ථුකාමා: මනාපියා රූපා"(3) (වස්තුකාමයෝ කවරහුද? ප්‍රිය මනාපවූ රූපයෝය) යන ආදී වශයෙන් නිද්දේසයෙහි වස්තු කාමයෝ කියන ලද්දහුද, තවද එම නිද්දේසයෙහි හා විභංගයෙහිද "ඡන්දො කාමො-රාගො කාමො-ඡන්දරාගො කාමොසඞ්කප්පො කාමො-රාගො කාමො-සඞ්කප්පරාගො කාමො, ඉමෙ වුච්චන්ති කාමා"(4) (ඡන්දය කාමයයි, රාගය කාමයයි-ඡන්දරාගය කාමයයි සංකප්පය කාමයයි- රාගය කාමයයි- සංකප්පරාගය කාමයයි, මොහු කාමයෝයයි කියනු ලබත්) යනුවෙන් ක්ලේශකාමයෝ කියන ලද්දහුද, ඒ සියලුම කාමයෝ මෙහි සංගෘහීත වෙතැයි දතයුතුය. මෙසේවූ කල්හි විවිච්චෙව කාමෙහි යනුවෙන් වස්තු කාමයන් කෙරෙන්ද දුරුවීයයි යන අර්ථය යෝග්‍යවේ. එයින් කායවිවේකය කියනලද්දේ වේ. "විවිච්ච අකුසලෙහි ධම්මෙහි" යන මෙයින් ක්ලේශ කාමයන් කෙරෙන්, නැතහොත්,

(1) දී. නි. දසුත්තර සු - D iii 275
(2) ම. නි. සීහනාද සු - M i 63
(3) මහානිද්දෙස - Nd i 1
(4) එම - Nd i 2; Vbh 256

සියලු අකුශල ධර්මයන් කෙරෙන් වෙන්ව'යි යන අර්ථය යෝග්‍යවේ. එයින් චිත්ත විවේකය කියන ලද්දේ වේ. මෙහි පළමුවැන්නෙන් වස්තුකාමයන් කෙරෙන් වෙන්වීමැයි කී හෙයින්ම කාමසුඛ පරිත්‍යාගයද, දෙවැන්නෙන් ක්ලේශ කාමයන් කෙරෙන් වෙන්වීමැයි කී හෙයින් නෛෂ්ක්‍රම්‍යසුඛපරිග්‍රහයද ප්‍රකාශකරනලද්දේ වේ. මෙසේ වස්තුකාම ක්ලේශකාම විවේකයයි කී හෙයින්ම, මේ දෙකින් පළමුවැන්නෙන් ක්ලේශයනට උත්පත්තිස්ථානවූ වස්තූන්ගේ ප්‍රහාණයද, දෙවැන්නෙන් එම ක්ලේශයන්ගේ ප්‍රහාණයද, නැවත පළමුවැන්නෙන් ලොල්බවට හේතුන් අත් හැරීමද දෙවැන්නෙන් අවිද්‍යාවට හේතුන් අත්හැරීමද, යලිදු පළමුවැන්නෙන් කාමගුණයනට හේතුන් දුරු කිරීම් වශයෙන් ප්‍රයෝග ශුද්ධියද, දෙවැන්නෙන් අධ්‍යාශ විශොධනයද ප්‍රකාශ කරනලදැයි දතයුතුය. මේ ක්‍රමය වූකලී 'කාමෙහි' යයි මෙහි කියනලද කාමයන් අතුරෙන් වස්තුකාම පක්ෂයෙහි වේ. ක්ලේශකාම පක්ෂයෙහි වනාහි, ඡන්දයයිද රාගයයිද යන මේ ආදී නයින් නොයෙක් ප්‍රභේද ඇති කාමච්ඡන්දයම 'කාම' යනුවෙන් අභිප්‍රේත වේ. ඒ කාමය අකුශලයට අයත්වූයේ නමුදු "තත්ථ කතමො කාමච්ඡන්දො කාමො[1] (එහි කාමච්ඡන්ද කාමය කවරේද?) ආදී නයින් විභංගයෙහි ධ්‍යානයට ප්‍රතිපක්ෂවන හෙයින් වෙන්කොට කියන ලද්දේය, ක්ලේශකාම වූහෙයින් හෝ පෙර පදයෙන් කියන ලද්දේය, අකුශලයනට ඇතුළත්වන හෙයින් දෙවන පදයෙහි කියන ලද්දේය. එහි නොයෙක් ප්‍රභේද ඇති හෙයින් "කාමතො"යි නොකියා "කාමෙහි" යයි කියන ලද්දේය. අනෙක් ක්ලේශ ධර්මයන්ගේද අකුසල බව ඇති කල්හි, "තත්ථ කතමෙ අකුසලා ධම්මා, කාමච්ඡන්දො"[2] (එහි අකුශල ධර්මයෝ කවරහුද? කාමච්ඡන්දය) යන ආදී නයින් විභංගයෙහි මතු ධ්‍යානාංගයනට ප්‍රතිපක්ෂ ප්‍රතිවිරුද්ධ බව දක්වන හෙයින් නීවරණයෝම කියන ලද්දහුය. නීවරණයෝ වනාහි ධ්‍යානාංගයනට ප්‍රතිපක්ෂයෝයි. එම නීවරණයනට ධ්‍යානාංගයෝම ප්‍රතිපක්ෂයෝය, විනාශකයෝය, විඝාතකයෝයයි කියන ලද්දේ වේ. ඒ එසේමැයි. "සමාධිය කාමච්ඡන්දයටද, පීතිය ව්‍යාපාදයටද, විතක්කය ථීනමිද්ධයටද, සුඛය උද්ධච්චකුක්කුච්චයටද, විචාරය විචිකිච්ඡාවටද ප්‍රතිපක්ෂ වෙති'යි පේටකයෙහි කියන ලද්දේය. මෙසේ මෙහි විවිච්චෙව කාමෙහි යන මෙයින්' කාමච්ඡන්දයාගේ' වික්ඛම්භනවිවෙකය කියනලද්දේ වේ. විවිච්ච අකුසලෙහි ධම්මෙහි යන මෙයින් නීවරණ පසෙහිම වික්ඛම්භනවිවෙකය කියනලද්දේ වේ. විශේෂකොට නොගන්නාලද අර්ථයන් ගතහොත්, පළමු පදයෙන්

---

(1) මහානිද්දෙස Vbh 256

(2) Vbh 256

කාමච්ඡන්දයාගේද, දෙවන පදයෙන් සෙසු නීවරණයන්ගේද, වික්ඛම්භනවිවේකය කියනලද්දේ වේ. තවද, පළමු පදයෙන් අකුසල් මුල් තුනෙන් පංචකාමගුණ විශේෂයනට විෂයවූ ලෝභයෙහිද, දෙවන පදයෙන් ආඝාතවස්තු විශේෂයනට විෂයවූ ද්වේෂ මෝහ යන දෙකෙහිද, වික්ඛම්භනවිවේකය කියනලද්දේ වේ. ඔඝාදී ධර්මයන් අතුරෙන්ද, පළමු පදයෙන් කාමෞඝ, කාමයොග, කාමාසව, කාමූපාදාන, අභිජ්ඣා, කායගන්ථ, කාමරාගසංයොජන යන මොවුන්ගේ වික්ඛම්භනවිවේකය කියනලද්දේ වේ. දෙවන පදයෙන් සෙසු ඔඝ, යොග, ආසව, උපාදාන, ගන්ථ, සංයොජනයන්ගේ වික්ඛම්භනවිවේකය කියනලද්දේ වේ. පළමු පදයෙන් තෘෂ්ණාවෙහි හා එය හා සමග බැඳුණු ක්ලෙශයන්ගේද, දෙවන පදයෙන් අවිද්‍යාවෙන් හා එය හා සමග බැඳුණු ක්ලෙශයන්ගේද, වික්ඛම්භනවිවේකය කියනලද්දේ වේ. යලිදු, පළමු පදයෙන් ලෝභ සම්ප්‍රයුක්ත චිත්තොත්පාද අටෙහිද, දෙවන පදයෙන් සෙසු අකුශල චිත්තොත්පාද සතරෙහිද වික්ඛම්භනවිවේකය කියනලද්දේයයි දතයුතුය. මේ වනාහි විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි" යන මෙහි අර්ථ ප්‍රකාශනයයි.

මෙතෙකින් ප්‍රථමධ්‍යානය පිළිබඳ ප්‍රහාණාංගයන් දක්වා ඉක්බිති සම්ප්‍රයොගාංගයන් දක්වනු පිණිස **සවිතක්කං සවිචාරං** යන ආදිය කියන ලදි. එහි "විතක්ක" යනු විතර්කනයයි, අරමුණ වෙත සිත එළවීමැයි කී නියායි. ඒ මේ විතර්කය අරමුණ කෙරෙහි සිත යොමුකිරීම ලක්‍ෂණකොට ඇත්තේය, අරමුණෙහි සිත රැදවීම, වෙසෙසින් රැදවීම රස හෙවත් කෘත්‍යකොට ඇත්තේය. ඒ එසේමැයි, එසේ රැදවීම් හේතුවෙන් යෝගාවචර තෙමේ අරමුණ විතර්කයෙන් පැහැරීම, විශේෂයෙන් පැහැරීම කෙරේය'යි කියනු ලැබේ. අරමුණෙහි සිත එළවීම වැටහීම්කොට ඇත්තේය. විචාර යනු, හැසිරීමයි, අනුව හැසිරීමැයි කී නියායි, ඒ විචාරය අරමුණ පිරිමදින ස්වභාව ඇත්තේය, එහි සහජාත ධර්මයන් අනුව යෙදීම රස හෙවත් කෘත්‍යකොට ඇත්තේය, අරමුණ කෙරෙහි සිත නොකඩවා පැවැත්වීම වැටහීම් කොට ඇත්තේය. එම විතක්ක විචාර යන දෙක අතුරෙන් කිසි විටෙක එකිනෙකින් වියෝ නොවන පැවැත්ම ඇති කල්හි පවා වඩා ප්‍රකට හෙයින්ද, ඝණ්ඨාවෙහි රාවය මෙන් පළමුකොට පිහිටන හෙයින්ද, පළමුවෙන් සිත අරමුණට නඟනුයේ විතක්කයයි. වඩා සූක්ෂ්ම වනහෙයින්ද, අනුව හැසිරෙන ස්වභාව ඇතිහෙයින්ද, ඝණ්ඨාවෙහි ප්‍රතිරාවය සෙයින් අනුව පවත්නේ විචාරයයි. ප්‍රථම උත්පත්ති කාලයෙහි ඔබමොබ සැලෙමින් බොහෝකොට පැතිරීම් ඇත්තේ විතක්කයයි, අහසට නැගෙනු කැමැති පක්‍ෂියකුගේ පියාපත් සැලීම

මෙන්ද, ගඳ අනුව ගිය සිත් ඇති ඛඹරාගේ පියුමට අභිමුඛව සැළීම මෙන්ද සත්සුන් පැවතුම් ඇතියේ බොහෝ නොවන සැලීම් ඇතියේ විචාරයයි. අහසට නැඟුණ පක්ෂියකුගේ පියාපත් විහිදීම මෙන්ද, පියුමට අභිමුඛව වැටුණ බඹරකුගේ එම පියුමට උඩින් පරිභ්‍රමණය මෙන්ද වේ. දුකනිපාතට්ඨකථාවෙහි වනාහි 'අහස්හි යන මහා පක්ෂියකුගේ දෙපියාපතින් වාතය ගන්වා පියාපත් තැන්පත්කොට යාම මෙන් අරමුණෙහි සිත පිහිටුවීම් වශයෙන් පැවැතියේ විතක්කයයි, එම විතක්කය ඒකාග්‍ර වීමෙන් අර්පණා බවට පත්වේ. වාතය ගැනීම පිණිස පියාපත් සලන පක්ෂියාගේ ගමන මෙන් පිරිමැදීම් ස්වභාවයෙන් පැවැතියේ විචාරයයි, එම විචාරය අරමුණ (අනුමශීනය කෙරෙතියි) පිරිමදිනේය'යි කියනලදි. එම මහාසකුණදෘෂ්ටාන්තය විතක්කය අනුව බැඳී පවත්නා කල්හි යෙදේ. විතක්ක විචාර යන දෙකෙහි මේ වෙනස ප්‍රථම ද්විතීය ධ්‍යානයන්හිදී ප්‍රකට වේ.

තවද, මල බැඳුණ ලොහොබඳුනක් එක් අතෙකින් තදින් අල්වාගෙන සුණුතෙල් සහිත ලොම් පුඹුලුවෙකින් පිරිමදින්නකුගේ දැඩිව ගත් අත මෙන් වූයේ විතක්කයයි, පිරිමදින අත මෙන් වූයේ විචාරයයි, එසේම දඬු පහරින් සක බමවා බඳුනක් තනන කුම්භකාරයකුගේ මැටිපිඩ පෙළාගත් අත මෙන් වූයේ විතක්කයයි, ඔබ මොබ හසුරුවනු ලබන අත මෙන් වූයේ විචාරයයි, එසේම වෘත්ත රේඛාවක් අඳින්නහුගේ මැද ඔබාගෙන සිටින කටුව මෙන් එක් තැන රුවනු ලබන ස්වභාවය විතක්කයයි, පිටත පරිභ්‍රමණයවන කටුව මෙන් පිරිමදින ස්වභාවය විචාරයයි. මෙසේ මෙම විතක්කයෙන්ද මෙම විචාරයෙන්ද යුතුව, පුෂ්පයෙන්ද ඵලයෙන්ද යුතුවූ රුකක් මෙන් පවතිතැ'යි මෙම ධ්‍යානය 'සවිතක්ක සවිචාර'යයි කියනු ලැබේ. විභංගයෙහි වනාහි ඉමිනාච විතක්කෙන ඉමිනා ච විචාරෙන උපෙතො සමූපෙතො[1] (මේ විතක්කයෙන්ද මේ විචාරයෙන්ද උපේතවූයේ සමූපේතවූයේ) යන ආදී නයින් පුද්ගල වශයෙන් ගෙන දේශනා කරනලදි. එහිද අර්ත්‍ථය මෙසේම දතයුතුය.

**විවෙකජං** යන මෙහි විවේක යනු වෙන්වීමයි, නීවරණයන් කෙරෙන් මිදීමය යන අර්ත්‍ථයි, පහවෙති'යි හෝ විවේක නම්, නීවරණයන්ගෙන් මිදුණු ධ්‍යානසම්ප්‍රයුක්ත ධර්මරාශියැ'යි යන අර්ත්‍ථයි. ඒ විවේකයෙන් නොහොත් ඒ විවේකය තුළ උපන්න'යි 'විවේකජ' නම් වේ. **පීතිසුඛං** යනු, පිනවති'යි 'පීති' නම්, එම පීතිය අරමුණ පිය කරන ස්වභාව

(1) විභංග - Vbh 257

ඇත්තේයි, කය හා සිත පිනවීම කෘත්‍යකොට ඇත්තේයි, එම පීතිය ඛුද්දිකා පීති, ඛණිකා පීති, ඔක්කන්තිකා පීති, උබ්බෙගා පීති, ඵරණා පීතියයි පංචවිධ වේ, එහි ඛුද්දිකා පීතිය ශරීරයෙහි රෝමහර්ෂ මාත්‍රයක්ම කරවනු සමත්වේ, ඛණිකා පීතිය කෙණෙහි කෙණෙහි විදුලිය වැටීම හා සමාන වේ, ඔක්කන්තිකා පීතිය මුහුදු වෙරළ හැපෙන රළ මෙන් සිරුර ඔකඳ කරවමින් බිඳීයයි, උබ්බෙගපීතිය බලවත් වේ, සිරුර ඔදවත් කොට අහස්හි උල්පවනු හැකිතරම් වේ. ඒ එසේමැයි, පුණ්ණවල්ලිකවාසී මහාතිස්ස නම් තෙරණුවෝ පුන් පොහෝ දිනෙක සවස් වේලෙහි සෑමලුවට ගොස් සඳ එළිය දැක, මහසෑය දෙසට හැරී, මෙවේලෙහි ඒකාන්තයෙන් සිවු පිරිස් මහසෑය වඳනාහුය'යි ප්‍රකෘතියෙන් දක්නාලද අරමුණු වශයෙන් බුදුන් අරමුණු කොටගත් උබ්බෙග පීතිය උපදවා සුණුබදමයෙන් කළ බිමෙහි ගැසූ විසිතුරු පන්දුවක් මෙන් අහසට පැන නැඟී මහසෑ මලුවෙහිම පිහිටියාහුය. එසේම ගිරිභඬු මහවෙහෙර අබියස වත්තකාලක නම් ගම එක් කුලදුවක් තොමෝ බලවත්වූ බුද්ධාලම්බන උබ්බෙගපීතියෙන් අහසට නැංගාය. ඇයගේ මාපියෝ දහම් ඇසීම පිණිස සවස් වේලෙහි විහාරයට යන්නාහු, දරුව, ඔබ ගැබ්බරවූ හෙයින් නොකල්හි හැසිරෙනු නොහැකිය, අපි ඔබටද පින් පිණිස දහම් අසම්හ'යි කියා ගියහ. ඕ තොමෝ යනු කැමැති වුවද ඔවුන්ගේ වචනය පිළිකෙව් කරනු නොහැකිව ගෙහි නැවතී, ගෙමිදුලෙහි සිට සඳ එළියෙන් ගිරිභඬු වෙහෙර අහස්සෑ-මලුව බලන්නී සෑයෙහි පහන් පූජා දුටුවාය, මල් ගඳ ආදිය ගෙන සෑය පුද පැදකුණු කරන සිවු පිරිස්ද දුටුවාය, භික්ෂූන්ගේ ගණ සජ්ඣායන ශබ්දයද ශ්‍රවණය කළාය, එවිට ඇයට මෙවන් සිතෙක් පහළ විය, "යම් කේනෙක් විහාරයට ගොස් මෙවන් සෑමලුවෙහි හැසිරෙන්නට, මෙවන් මිහිරි දහම් කතා අසන්නට ලබන්නාහුද, ඔහු ඒකාන්තයෙන්ම භාග්‍යවන්තයෝය"යනුයි.මුතු රැසක් වැනි සෑය දකින ඇයට උබ්බෙගපීතිය උපනි. ඕ තොමෝ අහස්හි ඉපිල මාපියනට පළමුව අහසින් සෑ-මලුවට බැස, සෑය වැඳ දහම් අසමින් සිටියාය, ඉක්බිති මාපියෝ අවුත්, "දරුව, ඔබ කවර මඟෙකින් ආවාහුද"යි පිළිවුසූහ. ඕ තොමෝ, "අහසින් ආමි, අන් මඟෙකින් නො-ආමි'යි කීවාය. "දරුව, රහත්හු නම් අහසින් යෙති, ඔබ කෙසේ ආහුද?'යි කීකල, "මා සඳ එළියෙන් සෑය දෙස බලමින් සිටිනවිට බලවත් බුද්ධාලම්බන ප්‍රීති උපන, එවිට මා සිටින බවක් හෝ හිඳුනා බවක් හෝ නොදත්තෙමි, ගන්නාලද නිමිත්තෙන්ම අහස්හි ඉපිල සෑ-මලුවෙහි පිහිටියෙමි'යි කීවාය. මෙසේ උබ්බෙගපීතිය අහස්හි ඉල්පවීමට තරම් බලවත් වේ.

ඵරණපීතිය උපන්කල මුළු සිරුර සුළං පිඹ පිරූ විතක් (වස්තියක්) සෙයින්ද, මහාජලප්‍රවාහයකින් හැරීගිය (?) පර්වත කුක්ෂියක් සෙයින්ද, සියලු පසින් ස්පර්ශ කරනලද්දේ වේ. ඒ මේ පංචවිධවූ ප්‍රීතිය ගැබ්ගනිමින්, මුහුකුරා යමින් කායපස්සද්ධි, චිත්තපස්සද්ධි යන ද්විවිධවූ පස්සද්ධිය සපුරාලයි, පස්සද්ධිය ගැබ් ගනිමින් මුහුකුරමින් කායිකවූද චෛතසික වූද යන ද්විවිධ සුඛය සපුරාලයි. සුඛය ගැබ් ගනිමින්, මුහුකුරමින් ක්‍ෂණිකසමාධිය, උපචාරසමාධිය හා අර්පණාසමාධියැ'යි යන මේ ත්‍රිවිධ සමාධිය සපුරා ලයි. ඒ පංචවිධ ප්‍රීතීන් අතුරෙන් අර්පණා සමාධියට මුල්ව වැඩෙමින් සමාධිය හා සමග සම්ප්‍රයෝගයට ගිය මේ ඵරණපීතිය මෙම අර්ථයෙහි අභිප්‍රේතවූ ප්‍රීතියයි.

අනෙකක් නම්, සුඛය වනාහි, මනාසේ දැරීම සුඛ(සුව) නම්, කාය චිත්ත ආබාධයන් මනාසේ කාදමතියි, උපුටා දමති'යි හෝ සුඛ නම්. එම සුඛය ප්‍රියජනක (මධුර) ස්වභාවය ලක්‍ෂණ කොට ඇත්තේය, තමා හා සමග සම්ප්‍රයුක්තවූ ධර්මයන් වැඩීම කෘත්‍ය කොට ඇත්තේය. එම සම්ප්‍රයුක්ත ධර්මයනට උපකාරී වීම ඵල කොට ඇත්තේය. කිසි තැනෙක්හි එම පීති සුඛ යන දෙක නොවෙන්ව ඇතිකල්හිද, ඉෂ්ටාලම්බනප්‍රතිලාභ වශයෙන් උපදනා තුෂ්ටිය පීති නම්. ප්‍රතිලබ්ධ ආලම්බනරසානුභවය සුඛ නම්. යම් තැනෙක ප්‍රීතිය ඇත්තේද, එතැන සුඛයද ඇත, යම් තැනෙක සුඛය ඇත්තේද, එතැන නියත වශයෙන් ප්‍රීතිය ඇත්තේ නොවේ. සංස්කාරස්කන්ධයෙහි සංගෘහීත වූයේ ප්‍රීතියයි. වේදනාස්කන්ධයෙහි සංගෘහීතවූයේ සුඛයයි. ප්‍රීතිය කාන්තාරයෙක්හි පීඩාවට පත්වූවකුහට වනයක් හෝ ජලයක් පිළිබඳව අසන්නට හෝ දකින්නට ලැබීම වැනිය. සුඛය වනසෙවණට වදින්නට හා ජල පරිභෝගය කරන්නට ලැබීම වැනිය. ඒ ඒ අවස්ථාවෙහි (ප්‍රීතිය හෝ සුඛය) බලවත්වීම් වශයෙන් මෙසේ කියන ලද්දේයයි දතයුතුය. මෙසේ මෙම පීතියද මෙම සුඛයද මේ ධ්‍යානයට, නැතහොත්, මේ ධ්‍යානයෙහි ඇත්තේයයි මේ (ප්‍රථම) ධ්‍යානය පීති සුඛ සහිතයයි කියනලදි. නොහොත්, පීතියද සුඛයද 'පීතිසුඛ' නම්, 'ධම්මවිනය' ආදියෙහි මෙනි. විවේකයෙන් උපන් පීතිසුඛය මෙම ධ්‍යානයට, නැතහොත්, මෙම ධ්‍යානයෙහි ඇත්තේය'යි හෝ, මෙසේද විවේකයෙන් උපන් පීතිසුඛ ඇත්තේය'යි කියනු ලැබේ. යම්සේ වනාහි ධ්‍යානය විවේකයෙන් උපන්නේද, එසේම මෙහි පීතිසුඛයද විවේකයෙන් උපන්නේම වේ, එම පීතිසුඛයද මේ ධ්‍යානයට ඇත, එහෙයින් විවේකජං පීතිසුඛංයයි එක් පදයෙන්ම කියනු යෙදේ. විභංගයෙහි වනාහි, ඉදං සුඛං ඉමාය පීතියා සහගතං[1] (මේ සුඛය මේ පීතිය හා සහගතය)යි ආදී නයින් කියනලදි. එහිද අර්ථය මෙසේම දතයුතුය.

(1) විභංග Vbh 257

**පඨමං ඣානං** (ප්‍රථම ධ්‍යානය) යන මෙය මතු ප්‍රකාශ වන්නේය. **උපසම්පජ්ජ** යනු, ප්‍රථම ධ්‍යානය ලැබීම, ප්‍රතිලාභය, පැමිණීම, සම්ප්‍රාප්තිය, දැකීම, ප්‍රත්‍යක්ෂ කිරීම "උපසම්පද"යි කියනු ලැබේ. එහිද මෙපරිද්දෙන්ම අර්ථය දතයුතුය. **විහරති** යනු, ධ්‍යානයට අනුරූපවූ ඉරියවු විහරණයෙන්, මෙසේ කියනලද ප්‍රකාර ඇති ධ්‍යානයෙන් සමන්විතව ආත්මභාවය පැවැත්වීම, ප්‍රවෘත්තවීම, පාලනය, යැපීම, ජීවත්වීම, හැසිරීම, විහරණය නිපදවයි, කියන ලද මැයි විභංගයෙහි, "විහරතී'ති ඉරියති, වත්තති, පාලෙති, යපෙති, යාපෙති, චරති, විහරති, තෙන වුච්චති විහරතීති[1] (විහරති යනු, ඉරියවු කෙරේයි, පවතියි, රකියි, යැපෙයි, ජීවත්වෙයි, හැසිරෙයි, විහරණය කෙරෙයි, එහෙයින් විහරති'යි කියනු ලැබේ.)

**පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගතං** (අංග පසෙකින් හීනවූ අංග පසෙකින් සමන්විතවූ) යනු, එහි කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථීනමිද්ධය, උද්ධච්ච-කුක්කුච්චය, විචිකිච්ඡාය යන මේ නීවරණ පස ප්‍රහීණ කිරීම් වශයෙන් පඤ්චඞ්ගවිප්පහීනතාව දතයුතුය, මොවුන් පහනොවූ කල ධ්‍යානය නො-උපදියි, එහෙයින් මේ පස පහාණ අංගයයි කියනු ලැබේ. කෙසේවතුදු ධ්‍යානක්ෂණයෙහි අන්‍යවූ අකුශලධර්මයෝද පහවෙති, එසේ නමුදු මේ නීවරණයෝම විශේෂයෙන් ධ්‍යානයට අන්තරායකර වෙති. කාමච්ඡන්දය හේතුකොටගෙන නොයෙක් අරමුණු මහින් පොළඹවනලද සිත එකාග්‍රතාව එළවන කසිණ ආදී අරමුණෙහි සමාහිත නොවේ, නොහොත් කාමච්ඡන්දයෙන් මඩනාලද සිත කාමධාතුප්‍රහාණය පිණිසවූ ප්‍රතිපදවට නොපිවිසේ. ව්‍යාපාදය හේතුකොටගෙනද, අරමුණෙහි ගැටෙමින් නිරතුරුව නොපවතී, ථීනමිද්ධයෙන් මඩනාලද සිත අකර්මණ්‍ය වේ, උද්ධච්ච-කුක්කුච්චයෙන් මඩනාලද සිත නොසන්සුන්වම ඔබමොබ භ්‍රමණය වේ, විචිකිච්ඡාවෙන් පහරනලද සිත ධ්‍යානාධිගමය සිද්ධකරන පිළිවෙතට නොනැඟේ. මෙසේ විශේෂයෙන් ධ්‍යානයට අන්තරායකරවූ හෙයින් මෙම නීවරණයෝම ප්‍රහාණ අංගයයි කියන ලද්දහුය.

යම් හෙයකින් වනාහි විතක්කය අරමුණට සිත යොමුකරවයිද, විචාරය අරමුණෙහි සිත හසුරුවයිද, එම විතක්ක විචාර යන දෙකින් වික්ෂේප නොවනසේ සකසනලද සිතෙහි මනාකොට යෙදීමෙන් උපන් පීතිය පිනවීමද, සුඛය වර්ධනයද ඇතිකරවයි. ඉක්බිති සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන් සහිතවූ එම සිත අරමුණට යොමුකිරීම, පිනවීම, වර්ධනය, යන මෙයින් අනුගෘහීතවූ එකාග්‍රතාව විසින් එකත්වාලම්බනයෙහි සමකොට මනාකොට පිහිටුවනු ලැබේ. එහෙයින් විතක්කය, විචාරය, පීතිය, සුඛය,

(1) විභංග Vbh 252

එකග්ගතාය යන මේ අංග පසෙහි ඉපැදීම් වශයෙන් පඤ්චාඞ්ගසමන්විතතාව දතයුතුය. මෙම අංග පස උපන්කල ධ්‍යානය උපන්නේ වේ, එහෙයින් මේ පස සමන්වාගත අංගයයි කියනු ලැබේ. එහෙයින්ම (මෙම අංග පස මිස) මේ අංග පසින් සමන්විතවූ ධ්‍යාන නම් අනෙක් යමක් ඇතැ'යි නොගතයුතුය. යම්සේ වනාහි චතුරඞ්ගිනී සෙනාය, පඤ්චාඞ්ගිකතූර්යය,අෂ්ටාඞ්ගික මාර්ගයයි අඞ්ගමාත්‍ර වශයෙන්ම වහරනු ලැබේද, එසේම මෙයද අඞ්ගමාත්‍ර වශයෙන් පඤ්චාඞ්ගිකයයි හෝ පඤ්චඞ්ගසමන්නාගතයයි කියනු ලැබෙතැ'යි දතයුතුය. මේ පඤ්චාඞ්ගයෝ උපචාරක්ෂණයෙහිද කිසියම් පමණෙකින් පවත්නාහුය, උපචාර විෂයෙහිදී ප්‍රකෘති චිත්තයට වඩා බලවත්ද වන්නාහුය. මෙහිදී වනාහි විතක්කය එයටත් වඩා බලවත්ව ප්‍රකටවූ ආකාරයෙන් අරමුණෙහි සිත නංවමින් උපදනේය, විචාරය අරමුණ අතිශයෙන් පිරිමදිමින් උපදනේය, පීති සුඛ යන දෙක සර්වාංග සහිත ශරීරය තුළ පැතිරෙමින් උපදනේය. එහෙයින් කීහ, මේ සකලාංගසහිත ශරීරය තුළ, විවේකයෙන් උපන් පීති සුඛ යන දෙකින් නොපතළ කිසිවක් නැත.'[1] චිත්තෙකාග්‍රතාවද සුමුගුවෙක යටි පියන තුළ උඩු පියන වැදගන්නා සෙයින් අරමුණ මනාකොට ස්පර්ශ කෙරෙමින් උපදනේය. මෙම විතක්ක ආදීන් අතුරෙන් මෙම එකග්ගතාව අනෙක් අංගයන්ගෙන් ඇති විශේෂයයි. එහි චිත්තෙකග්ගතාව කියිසේත් "සවිතක්කං සවිචාරං" යන ආදී මේ පාඨයෙහි නොදක්වනලද්දේ වීනමුදු එසේ වුවත් විභංගයෙහි "ඣානන්ති විතක්කො විචාරො පීති සුඛං චිත්තෙකග්ගතා"[2] (ධ්‍යාන යනු විතක්කය, විචාරය, පීතිය, සුඛය, චිත්තෙකග්ගතාය යන මොහුය)යි මෙසේ කියනලද හෙයින් එය අංගයක් වන්නේය. යම් අභිප්‍රායයෙකින් ශාස්තෲන්වහන්සේ විසින් උද්දේස කරන ලද්දේද, එම අභිප්‍රායම උන්වහන්සේ විසින් විභංගයෙහි ප්‍රකාශ කරන ලද්දේය.

**තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නං** යනු, මෙහි ආදි, මධ්‍ය පර්යවසාන වශයෙන් ත්‍රිවිධකල්‍යාණතාව වේ. ආදි මධ්‍යපර්යවසාන-යන්ගේම ලක්ෂණ වශයෙන් දශලක්ෂණසම්පන්නතාව දතයුතුය. එම කල්‍යාණ ලක්ෂණ විභාවනයෙහි පෙළ මෙසේය: ප්‍රථමධ්‍යානයෙහි ප්‍රතිපත්ති විශුද්ධිය ආදියයි, උපෙක්ෂාවර්ධනය මධ්‍යයයි, සම්ප්‍රහර්ෂණය (අතිශයින් තෘප්තභාවය) අවසානයයි. ප්‍රථමධ්‍යානය පිළිබඳ ප්‍රතිපත්තිවිශුද්ධිය ආදියයි. ආදියෙහි ලක්ෂණ කෙතෙක්ද? ආදියෙහි ලක්ෂණ තුනෙකි. ඒ

---

(1) දී. නි. සාමඤ්ඤඵල සූ. -D i 73; ම. නි. කායගතාසති සූ. "නාස්ස කිංචි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති."

(2) Vbh 237

ධ්‍යානයට අන්තරායකරවූ යමක් ඇද්ද එම අන්තරායකර ක්ලේශයන් කෙරෙන් මිදී සිත පිරිසුදු වෙයි, පිරිසුදුවූ හෙයින් මධ්‍යම සමථ නිමිත්තට පිළිපදියි (පැමිණෙයි), පිළිපන් හෙයින් එම නිමිත්ත තුළ සිත වැද ගනියි, අන්තරායකර ධර්මයන්ගෙන් සිත මිදීමෙන් පිරිසුදු වෙතැ'යි යන යමක් ඇත්ද, පිරිසුදුවූ හෙයින් සිත මධ්‍යම සමථනිමිත්ත කරා පැමිණෙතැ'යි යන යමක් ඇද්ද, පිළිපන් හෙයින් එහි සිත වැදගනිතැ'යි යන යමක් ඇද්ද'යි, යන මේ ප්‍රථමධ්‍යානයෙහි පටිපද විසුද්ධිය ආදියයි. ආදියෙහි මෙකී ලක්‍ෂණ තුන විද්‍යමාන වේ. එහෙයින් ප්‍රථමධ්‍යානය ආදි කල්‍යාණද ලක්‍ෂණසම්පන්නද වෙතැ'යි කියනු ලැබේ. "ප්‍රථම ධ්‍යානයෙහි උපෙක්‍ෂා වර්ධනය මධ්‍යයයි. මධ්‍යයෙහි ලක්‍ෂණ කෙතෙක්ද? මධ්‍යයෙහි ලක්‍ෂණ තුනෙකි, පිරිසුදුවූ සිත පිළිබඳව උපෙක්‍ෂා කෙරේ, සමථයට වැදගැනීම පිළිබඳවද උපෙක්‍ෂා කෙරේ, එකහබවට එළඹීම පිළිබඳවද උපෙක්‍ෂා කෙරේ. පිරිසුදුවූ සිත ගැන උපෙක්‍ෂා කෙරෙතැ'යි යන යමක් ඇත්ද, සමථයට පිවිසීම පිළිබඳව උපෙක්‍ෂා කෙරෙතැ'යි යන යමක් ඇත්ද, එකහබවට එළඹීම ගැන උපෙක්‍ෂා කෙරෙතැ'යි යන යමක් ඇද්ද, ප්‍රථමධ්‍යානයෙහි මේ උපෙක්‍ෂාවර්ධනය මධ්‍යයට අයත්වේ, මධ්‍යයෙහි මෙකී ලක්‍ෂණ තුන විද්‍යමාන වේ. එහෙයින් ප්‍රථමධ්‍යානය මධ්‍යයෙහි කල්‍යාණද, ත්‍රිලක්‍ෂණ සම්පන්නද වෙතැ'යි කියනු ලැබේ. ප්‍රථමධ්‍යානය පිළිබඳ සම්ප්‍රහර්ෂණය පර්යවසානයයි, පර්යවසානයෙහි ලක්‍ෂණ කෙතෙක්ද? පර්යවසානයෙහි ලක්‍ෂණ සතරෙකි, එහි උපන් (සමාධි ප්‍රඥ යන) ධර්මයන්ගේ ඉක්මවීමක් නොමැති හෙයින් සම්ප්‍රහර්ෂණය වේ, (ශ්‍රද්ධාදී) ඉන්ද්‍රියයන් (විමුක්තිරසයෙන්) ඒකරස වන හෙයින් සම්ප්‍රහර්ෂණය වේ, මෙකී අනති වර්තන (නොඉක්මවීම)ය, ඒකරසය යන දෙකට අනුරූපවූ වීර්යය ගෙනදෙන හෙයින් සම්ප්‍රහර්ෂණය වේ. නැවත නැවත ආසේවනය කිරීමේ අර්ථයෙන් සම්ප්‍රහර්ෂණය වේ. ප්‍රථමධ්‍යානයෙහි සම්ප්‍රහර්ෂණය පර්යවසානයයි, එම පර්යවසානයෙහි මෙකී ලක්‍ෂණ සතර විද්‍යමාන වේ. එහෙයින් ප්‍රථමධ්‍යානය පර්යවසානකල්‍යාණද, යථොක්ත ලක්‍ෂණ සතරින්ද යුක්ත වෙතැ'යි කියනු ලැබේ"[(1)]

එහි **පටිපදවිසුද්ධි** (ප්‍රතිපත්ති විශුද්ධි) නම් ආවර්ජන පරිකර්ම සහිතවූ උපචාරයයි. **උපෙක්ඛානුබ්‍රෑහනා** (උපේක්‍ෂා වර්ධනය) නම් අර්පණායි. **සම්පහංසන** (සම්ප්‍රහර්ෂණ) නම් ප්‍රත්‍යවෙක්‍ෂණයයි යනුවෙන් ඇතැමෙක් (අභයගිරිවාසීහු) විස්තර කෙරෙති. යම් හෙයකින් වනාහි ඒකාග්‍රතාවට පැමිණි සිත පටිපදවිසුද්ධියට පිළිපන්නේ, උපෙක්‍ෂාවෙන් වැඩුණේ, නුවණින්ද විශෝධිත වූයේයයි[(2)] පෙළෙහි කියන ලද්දේද,

(1) පටිසම්භිදාමග්ග -Ps i 167f.
(2) එම

එහෙයින් අර්පණාව ඇතුළතම ආගමන හේතුවෙන් පටිපදවිසුද්ධිය වන්නේය, එහි (මධ්‍යස්ථතා සංඛ්‍යාත) උපෙක්ෂාකෘත්‍ය වශයෙන් උපෙක්ඛානුබෲහණය (උපෙක්ෂා වර්ධනය) වන්නේය, ධර්මයන් එකිනෙක නොඉක්මවීම ස්වභාවය සිද්ධ කරන හෙයින් පරියොදපන (පිරිසුදු කරන) ඥානයෙහි කෘත්‍යනිෂ්පත්ති වශයෙන් සම්ප්‍රහර්ෂණය වෙතැ'යි දතයුතුය. කෙසේද යත්, යම් අර්පණා වාරයෙක්හි අර්පණා උපදීද, එවිට නීවරණ සංඛ්‍යාතවූ ධ්‍යානයට හානිකරවූ යම් ක්ලේශ සමූහයක් වේද, එම ක්ලේශයන් කෙරෙන් සිත පිරිසුදුබවට යන්නේය. එසේ පිරිසුදුවූ හෙයින් ආවරණ විරහිතබවට පත්ව මධ්‍යම සමථ නිමිත්තට පිළිපදනේය, මධ්‍යම සමථනිමිත්ත නම් සමව පවත්වනලද අර්පණා සමාධියමැයි. අනතුරුව එන පූර්ව චිත්තය (ගෝත්‍රභූචිත්තය) එකසන්තතිපරිණාම නයින් (එක්ම චිත්ත පරම්පරාවෙහි වෙනස්වීම් වශයෙන්) එම අර්පණා සමාධි බවට එළඹෙන්නේ මධ්‍යම සමථ නිමිත්තට පිළිපන්නේ නම් වේ. මෙසේ පිළිපන් හෙයින් අර්පණා සමාධියට පැමිණියේ නම් වේ. මෙසේ (අර්පණාචිත්තයට) පූර්වවූ (ගෝත්‍රභූ) චිත්තයෙහි විද්‍යමාන ආකාරයෙන් නිපදවන්නාවූ, පටිපද විසුද්ධිය ප්‍රථමධ්‍යානය උපන් කෙණෙහිම පැමිණිසේ දතයුතුය.

මෙසේ පිරිසුදු බවට පත් සිත යළි පිරිසුදු කිරීම අවශ්‍ය නොවන හෙයින් පිරිසුදු කිරීමේ ව්‍යාපාරයක් නොකරන්නේ, එම විශුද්ධවූ සිත පිළිබඳව උපෙක්ෂා (මැදහත්) වන්නේ නම් වේ. ශමථභාවයට පත්වීමෙන් ශමථයට පිළිපන් සිත පිළිබඳව යළි සමාධාන ව්‍යාපාරයක් නොකරන්නේ ශමථයට පිළිපන් සිත පිළිබඳව උපෙක්ෂා වන්නේ නම් වේ. ශමථයට පිළිපන් බැවින්ම ක්ලෙශයන් හා බැඳීමක් නැති බැවින් හුදකලාව පිහිටි සිත යළි එකඟ බවට පත් කිරීමේ ව්‍යාපාරයක් නොකරන්නේ එකත්වයෙහි පිහිටුවීම පිළිබඳව උපෙක්ෂා වන්නේ නම් වේ. මෙසේ එහිලා මැදහත්වීමේ කෘත්‍ය වශයෙන් උපෙක්ෂා වර්ධනය දතයුතුය. මෙසේ උපේක්ෂාවර්ධනයවූ ඒ සමාධිචිත්තයෙහි උපන් සමාධිය ප්‍රඥය යන එකිනෙක බැඳුණු යම් මේ ධර්ම කෙනෙක් එකිනෙකා නොඉක්මවා සමව පවත්වන ලද්දහුද, තවද ශ්‍රද්ධාදී යම් ඉන්ද්‍රිය කෙනෙක් නොයෙක් කෙලෙසුන්ගෙන් මිදුණු හෙයින්, හුදෙක් විමුක්ති රසයෙන් යුතුව පවත්වන ලද්දහුද, යම්සේ මේ යෝගී තෙමේ ඒ අනතිවත්තන (එකිනෙක නො-ඉක්මවන) එකරසභාවයට අනුරූපව එම ධ්‍යානය පිණිස වීර්යය පවත්වන්නේද, මෙම ධ්‍යානචිත්තයෙහි එම චිත්තක්ෂණයෙහි පවත්වනලද යම් ආසෙවනයක් වන්නේද, (එකිනෙක නො-ඉක්මවීම් ආදී) ඒ සියලු ආකාරයෝ, යම් හෙයකින් සංකිලෙස (අපිරිසුදුවීම) හා වොදනයන් (පිරිසුදුවීම) කෙරෙහි

ඒ ඒ ආදීනවයන්ද ආනිසංසයන්ද ව්‍යවහාර ඥනයෙන් දක ඒ ඒ ලෙසින් සම්ප්‍රහර්ෂිත වනබැවින්, පිරිසුදු කරනලද බැවින්, නිපදවන ලද්දහුය, එහෙයින් ධර්මයන් එකිනෙක නො-ඉක්මවීම් ස්වභාවය සිද්ධකරන හෙයින් පරියොදපන (පිරිසුදු කරන) ඥනයෙහි කෘත්‍යනිෂ්පත්ති වශයෙන් සම්ප්‍රහර්ෂණය වෙතැ'යි කියනලදි.

එහි යම් හෙයකින් උපේක්‍ෂා වශයෙන් ඥනය ප්‍රකට වේද, කියන ලදමැයි: එසේ (භාවනා වශයෙන්) ගන්නාලද සිත මනාකොට සමාධිවීර්ය යන දෙකෙහි උපේක්‍ෂා වශයෙන් මැදහත් වේ. ප්‍රඥ වශයෙන් පඤ්ඤින්ද්‍රියය අතිමාත්‍ර වේ, උපෙක්‍ෂා වහයෙන් නානාස්වභාව ඇති ක්ලෙශයන්ගෙන් (අර්පණා) සිත විමොක්‍ෂවශයෙන් මිදේ, ප්‍රඥ වශයෙන් පඤ්ඤින්ද්‍රියය අතිමාත්‍ර වේ, ක්ලෙශයන් කෙරෙන් විමුක්තවූ හෙයින් (ශ්‍රද්ධාදී) ඒ ධර්මයෝ එක්ම කෘත්‍ය ඇත්තාහු වෙති, ඒකකෘත්‍ය වූහෙයින් භාවනා වෙති;[1] එහෙයින් ඥනකෘත්‍ය වූ සම්ප්‍රහර්ෂණය පර්යවසානයයි කියනලදි.

ඉක්බිති **පඨමජ්ඣානං අධිගතං හොති පඨවිකසිණං** (පඨවි කසිණය නිමිතිකොට උපන් ප්‍රථමධ්‍යානයට පැමිණියේ වෙයි) යන මෙහි, ගිණීමේ අනුපිළිවෙළින් ප්‍රථම නම්, පළමුකොට උපන්නේයයිද ප්‍රථම නම්. අරමුණු නිරීක්‍ෂණය කරන හෙයින්ද, ප්‍රතිපක්‍ෂ (නීවරණ) යන් දවන හෙයින්ද ධ්‍යාන නම්. (එකදෙශයක් අරමුණු කොට) මුළු පෘථිවීමණ්ඩලය ගැනෙන හෙයින් පඨවිකසිණයයි කියනු ලැබේ. එය නිසා ලබනලද නිමිත්තද පඨවිකසිණ නම්, එම නිමිත්ත අනුව ලබනලද ධ්‍යානයද පඨවිකසිණයයි හැඳින්වේ. එහි මෙම අර්ථයෙන් පඨවිකසිණධ්‍යානයයි දතයුතුය. එය සඳහා, 'පඨමජ්ඣානං අධිගතං හොති පඨවිකසිණං'යයි කියනලදි. මෙසේ මේ ධ්‍යානය ලද කල්හි ඒ යෝගාවචරයා විසින් වාලවෙධියකු විසින් මෙන්ද අරක්කැමියකු ලෙසින් මෙන්ද, ආකාරයන් සැලකිය යුතුය. යම්සේ අතිදක්‍ෂවූ දුනුවායෙක් අස්ලොමක් විදීමට ප්‍රයත්න කරනුයේ යම් විටෙක එම අස්ලොම විදීද, එවිට මෙසේ සිටි මා විසින් මෙසේ දුනු දණ්ඩද, මෙසේ දුනුදියද, මෙසේ හීයද ගෙන ලෝමය විදිනලද්'යි තමාවිසින් තබනලද පාදයෙහිද, දුනුදණ්ඩෙහිද, දුනුදියෙහිද, හීයෙහිද ආකාරය සලකන්නේ එතැන් පටන් එම ආකාරයන් එලෙසින්ම සම්පාදනය කරමින් නොවරද්ද අස්ලොම් දෙපලු කොට විදින්නේද, මෙසේම යෝගාවචරයා විසින්ද, මෙනම් ආහාරයක් වළඳ, මෙවැනි පුද්ගලයකුගේ ඇසුරෙහි සිට, මෙවන් සෙනස්නෙක, මෙනම් ඉරියව්වෙන්, මෙනම් වේලාවෙක, මෙය ලබනලද්'යි

---

(1) පටිසම්භිදාමග්ග - Ps ii 25

යනුවෙන් මෙම භෝජන සප්පාය ආදී ආකාරයන් සැලකිය යුතුය. මෙසේ හේ තෙමේ එම ධ්‍යානය නට කල්හි වුවද එම ආකාරයන් සැලකීමෙන් යලි උපදවන්නටද, නොපුහුණු ධ්‍යානය පුහුණු කරමින් යලි යලිදු අර්පණා ලබන්නටද සමත් වන්නේය. (තවද) යම්සේ දක්‍ෂවූ අරක්කැමියෙක් ස්වාමියා වළඳවමින් යම් යම් දෙයක් වළඳන්නේ නම්, ඒ ඒ දෙය සලකා එතැන් පටන් එවැනි දෙයක්ම එළවමින් ප්‍රසාද ලබන්නේ වේද, එසේම මේ යෝගාවචර තෙමේද අධිගතකාලයෙහි භෝජන ආදී ආකාරයන් සලකාගෙන මෙකී ආකාරයන් සම්පාදනය කරමින් යලි යලිදු අර්පණා ලබන්නේ වේ. එහෙයින් යෝගාවචරයා විසින් වාලවෙධී ධනුර්ධරයකු සෙයින්ද, අරක්කැමියකු සෙයින්ද ආකාරයන් සැලකිය යුතුය. කියන ලදමැයි භාග්‍යවතුන් වහන්සේ විසින්:- “මහණෙනි, යම්සේ පණ්ඩිතවූ, ව්‍යක්තවූ, දක්‍ෂවූ, අරක්කැමියෙක් රජුන්හට හෝ රජමහඇමතියන්හට හෝ උසස්තම ඇඹුල් රසින්ද, උසස්තම තිත්තරසින්ද, උසස්තම කුළුරසින්ද, උසස්තම මිහිරි රසින්ද, කටුසරවූ හා නොවූ රසින්ද, ලුණු සහිතවූ හා නොවූ රසින්ද යන මේ නොයෙක් ආකාර ඇති නොයෙක් අගරස ඇති සූපයන්ගෙන් උපස්ථාන කරන්නේ වේද, මහණෙනි, එම පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්‍ෂවූ අරක්කැමි තෙමේ තම ස්වාමියාගේ නිමිති උගනියි. අද මාගේ ස්වාමියාට මේ සූපය රිසි වෙයි, මෙයට මනාප වෙයි, මෙය වැඩිපුර ගනියි, මෙය වර්ණනා කරයි, ඇඹුල් අගරස සූපය හෝ අද මාගේ ස්වාමියාහට රුචිවෙයි. ඇඹුල් අගරසයට මනාපවෙයි, ඇඹුල් අගරසය වැඩිපුර ගනියි, ඇඹුල්අගරසය වර්ණනා කරයි-පෙ-ලුණුසහිත නොවූ සූපය හෝ වර්ණනා කරයි, යන ආදී වශයෙන් දන ගනියි. මහණෙනි, ඒ පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්‍ෂවූ අරක්කැමි තෙමේ වස්ත්‍ර ලබන්නෙක්ද වේ, වැටුප් ලබන්නෙක්ද වේ, ප්‍රසාද ලබන්නෙක්ද වේ, එයට හේතු කිම? ඒ එසේමැයි, මහණෙනි පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්‍ෂවූ, ඒ අරක්කැමි තෙමේ ස්වකීය ස්වාමියාගේ රුචිය උගනියි, මහණෙනි, එසේම මේ ශාසනයෙහි පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්‍ෂවූ භික්‍ෂු තෙමේ කාය විෂයෙහි කය අනුව බලමින්-පෙ-වේදනා විෂයෙහි-පෙ-චිත්ත විෂයෙහි-පෙ-ධම්ම විෂයෙහි ධම්මයන් අනුව බලමින්, කෙලෙස් තවමින්, ඥානයෙන් යුක්තව, මනා සිහියෙන් යුක්තව, ලෝකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍යයන් දුරුකොට විහරණය කරයි. ධර්මයන් විෂයෙහි ධර්මයන් අනුව බලමින් වෙසෙන ඔහුගේ සිත සමාහිත වෙයි, උපක්ලෙශයෝ ප්‍රහීණ වෙති. ඒ භික්‍ෂු තෙමේ ඒ සමාධි නිමිත්ත උගනියි, මහණෙනි, පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්‍ෂවූ ඒ භික්‍ෂු තෙමේ මෙලොව (දෘෂ්ටධර්ම) සුඛවිහරණයද ලබන්නෙක් වේ, සතිසම්පජඤ්ඤයද ලබන්නෙක් වේ, එයට හේතු කිම? ඒ එසේමැයි, මහණෙනි පණ්ඩිතවූ

ව්‍යක්තවූ දක්‍ෂවූ ඒ භික්‍ෂු තෙමේ ස්වකීය චිත්තස්වභාවයෙහි නිමිත්ත උගනියි"(1)

නිමිත්තග්‍රහණයෙන්ද යලි එම ආකාරයන් සම්පාදනය කරන මේ යෝගාවචරයාහට හුදෙක් අර්පණාමාත්‍රයම සිද්ධවනු මිස එහි චිරස්ථිතිය සිද්ධ නොවේ. චිරස්ථිතිය වනාහි සමාධියට උපද්‍රවකර නීවරණ ධර්මයන් මනාකොට පිරිසුදු කිරීමෙන්ම සිද්ධවේ. යම් ශ්‍රමණයෙක් තෙමේ කාමයන්ගේ ආදීනව ප්‍රත්‍යවෙක්‍ෂණා ආදියෙන් කාමච්ඡන්දය මනාකොට යටපත් නොකොට, කායපස්සද්ධි වශයෙන් කායපීඩාව මනාකොට නොසන්සිඳුවා, ආරම්භධාතු මනසිකාරාදි වශයෙන් (පටන්ගැනීමේ වීර්යය මෙනෙහි කිරීම් වශයෙන්) ථිනමිද්ධය මනාකොට දුරු නොකොට, සමථනිමිත්ත මෙනෙහිකිරීම් ආදී වශයෙන් උද්ධච්ච-කුක්කුච්චය මනාකොට නොනසා, අන්‍යවූද සමාධියට උපද්‍රවකර ස්වභාවයන් මනාකොට ශෝධනය නොකොට ධ්‍යානයට සමවදීද, හේ තෙමේ අපිරිසුදු බිලකට පිවිසි බඹරකු මෙන්ද පිරිසුදු නොකළ උයනකට පිවිසි රජකු මෙන්ද වහා ධ්‍යානයෙන් නික්මේ. යමෙක් වනාහි සමාධියට අන්තරායකර නීවරණ ධර්මයන් මැනවින් පිරිසුදුකොට ධ්‍යානයට සමවදීද, හේ තෙමේ මොනවට පිරිසුදුකළ බිලකට පිවිසි බඹරකු සෙයින්ද, මොනවට පිරිසුදු කළ උයනකට පිවිසි රජකු සෙයින්ද, මුළු දහවලම සමවත තුළම රැදේ. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ,

> කාමෙසු ඡන්දං පටිඝං විනොදයෙ
> උද්ධච්චමිද්ධං විචිකිච්ඡපඤ්චමං
> විවෙකපාමොජ්ජකරෙන චෙතසා
> රාජාව සුද්ධන්තගතො තහිං රමෙ

කාමච්ඡන්දයද, ව්‍යාපාදයද, උද්ධච්චකුක්කුච්චයද, ථිනමිද්ධයද, පස්වැනිවූ විචිකිච්ඡාවද දුරුකරන්නේය. විවේකයෙන් උපන් ප්‍රමෝදය ඇති කරන සිතින් යුක්තව පිරිසුදු සීමා ඇති උයනකට ගිය රජකු මෙන් එම අර්පණාධ්‍යානයෙහි ඇලෙන්නේය.

එහෙයින් ධ්‍යානයෙහි චිරස්ථිතිය පතන යෝගාවචරයා විසින් උපද්‍රවකර නීවරණධර්මයන් විනෝදනය කොට ධ්‍යානයට සමවැදිය යුතුය, සමාධිභාවනාමහත්වය පිණිස (උපචාර හෝ අර්පණා වශයෙන්) ලද පටිභාගනිමිත්ත වැඩියයුතුය. ඒ පටිභාගනිමිත්ත වඩනා බිම් දෙකෙකි: උපචාර හෝ අර්පණා හෝ වශයෙනි. උපචාරයට පැමිණීමෙන් පසු

(1) සං. නි. මහාවග්ග සති. සං. - S v 151f

පවා එය වඩනු වටී. අර්පණාවට පැමිණීමෙන් පසුද වඩනු වටී. එහෙත් වැඩීම කළ යුත්තේ අවශ්‍යයෙන්ම බිම් දෙකින් එකකදීය. එහෙයින් (උපචාර හෝ අර්පණා වශයෙන්) ලද පරිදි පටිභාගනිමිත්ත වැඩිය යුතුයයි කියනලදි. එය වඩනා ක්‍රමය මෙසේයි:- යෝගාවචරයා විසින් එම නිමිත්ත (මැටි) බඳුනක් වඩවන නියායෙන් හෝ පූවක් වඩවන නියායෙන් හෝ බත් වඩවන නියායෙන් හෝ වැලක් වඩවන නියායෙන් හෝ පිළීවඩන නියායෙන් හෝ (පිරිසිඳීමක් නැතිව) නොවඩා, යම්සේ ගොවියෙක් සීසෑයුතු බිම්සීමාව නඟුලින් කලින් පිරිසිඳ එම සීමාව ඇතුළත සීසාද යම්සේ සීමා බඳින භික්ෂූහු පළමුකොට නිමිති සලකා පසුව සීමා බඳිත්ද, එසේම (උපචාර හෝ අර්පණා වශයෙන්) ලදපරිදි එම නිමිත්ත අනුක්‍රමයෙන් එක් අඟුල්, දෑඟුල් තෙඅඟුල්, සිවු අඟුල් පමණ තැන් සිතින් පිරිසිඳිමින් පරිච්ඡේද (කොටස්) වශයෙන් ගෙන වැඩියයුතුය, නොපිරිසිඳ නොවැඩියයුතුය. ඉක්බිත්තෙන් වියතක් පමණය, රියනක් පමණය, ඉදිරිපස ගෙමිදුලය, පිරිවෙණය, විහාරය යන මේවායෙහි සීමා වශයෙන්ද, ඉක්බිති, ගමය, නියම්ගමය, දනව්වය, රාජ්‍යය, සමුද්‍රය යන මේආදී සීමා වශයෙන්ද පිරිසිඳිමින් වඩන්නහු විසින් සක්වළ හෝ එයටත් වැඩි පමණින් පිරිසිඳ වැඩියයුතුය. යම්සේ හංසපෝතකයෝ පියාපත් හටගත් තැන් පටන් මඳ මඳ පෙදෙසක් පියාඹමින් පුහුණුවී අනුක්‍රමයෙන් සඳහිරු වෙතට පවා යෙත්ද, එසේම භික්ෂු තෙමේ කියන ලද ක්‍රමයෙන් නිමිති පිරිසිඳ වඩමින් සක්වළ හෝ එයටත් වැඩියෙන් වඩන්නේය. ඉක්බිති ඔහුට එම නිමිති වැඩූ වැඩූ තන්හි පෘථිවියෙහි ගොඩය, වළය, ගංනිම්නය, පර්වත විෂමය යන මේවා හුල් සියයක් ගසා අදිනලද ගෙරිසමක් සෙයින් සමව දිස්වන්නේය. එම නිමිත්තෙහි ප්‍රථමධ්‍යානයට පැමිණි නවකයා විසින් සමවැදීම බොහෝ සෙයින් කළයුතුය, ප්‍රත්‍යවෙක්ෂණය බොහෝ සෙයින් නොකළ යුතුය. ප්‍රත්‍යවෙක්ෂා බහුල වූවහුට වනාහි ධ්‍යානාංගයෝ ඔළාරිකව දුර්වලව වැටහෙති. ඉක්බිති ඔහුට මෙසේ වැටහීමේ හේතුවෙන් එම ධ්‍යානාංගයෝ මතු ධ්‍යානයට නැඟෙනු පිණිස ප්‍රත්‍යය බවට පැමිණෙති. හේ තෙමේ ප්‍රගුණ නොවූ ධ්‍යානයෙහි උත්සාහ කරනුයේ ප්‍රථමධ්‍යානයෙන්ද පිරිහෙයි, ද්විතීය ධ්‍යානයට පැමිණෙනු නොහැකි වේ. එහෙයින් වදාළහ භාග්‍යවතුන් වහන්සේ, "මහණෙනි, යම්සේ සාමාන්‍ය පර්වතයෙක්හි හැසිරෙන නොපුහුණුවූ, අවියත්වූ ගොදුරුබිම් නොහඳුනන්නාවූ, විෂම පර්වතයෙක්හි හැසිරෙන්නට නොදත් යම් ගව දෙනකට, 'නොගියවිරූ දෙසකට යන්නෙම් නම්, නොකෑවිරූ තණ බුදින්නෙම් නම්. නොපූවිරූ පැන් බොන්නෙම් නම්, යෙහෙකැ'යි යන මෙවන් අදහසෙක් වේද, ඒ දෙන් තොමෝ ඉදිරි

පා මනාසේ නොපිහිටුවා පසු පා ඔසවන්නී පෙර නොගියවිරූ දෙසකට හෝ නොයන්නීය, නොකෑවිරූ තණ හෝ නොකන්නීය, නොපූවිරූ පැන් හෝ නොබොන්නීය, යම් පෙදෙසක සිටින ඇයට 'නොගියවිරූ - පෙ-බොන්නෙම් නම් යෙහෙකැ'යි යන අදහස පහළ විණි නම් එම පෙදෙසටද පහසුවෙන් යලි පෙරළා එන්නටද නොහැකි වන්නීය, එයට හේතු කිම? ඒ එසේමැයි මහණෙනි, සාමාන්‍ය පර්වතයෙක්හි හැසිරෙන්නට නොදත්, අවියත්, ගොදුරුබිම් නොහඳුනන ඒ ගවදෙන් තොමෝ විෂම පර්වතයෙක්හි හැසිරෙන්නටද නොහැකි වන්නීය. එසේම මහණෙනි, මේ ශාසනයෙහි යම්කිසි මහණෙක් තෙමේ මඳ නුවණ ඇත්තේ, අවියත්වූයේ, විෂයසීමා පිළිබඳ දැනුමෙන් තොරවූයේ කාමයන්ගෙන් දුරුවී-පෙ-ප්‍රථමධ්‍යානයට පැමිණ වසන්නටද නොහැකිවේ, හේ තෙමේ එම නිමිත්ත බොහෝකොට සේවනය නොකරන්නේය, නොවඩන්නේය, බොහෝකොට පුරුදු නොකරන්නේය. නොවඩන්නේය, මනාකොට නොඉටන්නේය. ඔහුට විතක්කවිචාර ව්‍යපගමනයෙන්-පෙ-ද්විතීයධ්‍යානයට පැමිණ වසන්නෙම් නම් යෙහෙකැ'යි යන මෙවන් සිතක් පහළ වන්නේය, හේ තෙමේ විතක්කවිචාර ව්‍යපගමනයෙන්-පෙ-ද්විතීයධ්‍යානයට පැමිණ වසන්නට නොහැකිවේ. ඔහුට කාමයන්ගෙන් තොරව-පෙ-ප්‍රථමධ්‍යානයට පැමිණ වසන්නට නොහැකිවේ. මහණෙනි, මෙම ශ්‍රමණයා, දෙපසින්ම නටුයේ, දෙපසින්ම පිරිහුණේයයි කියනුලැබේ. මහණෙනි, සාමාන්‍ය පර්වතයෙක වෙසෙන මඳ දැනුම් ඇති, අවියත්, ගොදුරුබිම් ගැන නොදත්, ඒ ගවදෙන විෂම පර්වතයෙහි හැසිරෙන්නට නොහැකිවනු මෙනි.(1) එහෙයින් මේ යෝගාවචරයා විසින් පළමුකොට එම ප්‍රථමධ්‍යානය පස් ආකාරයෙකින් බොහෝ කලක් ප්‍රගුණ කළයුතුය. එය පිළිබඳ මෙකී පඤ්චවිධ ප්‍රාගුණ්‍යය නම්: ආවජ්ජනවසී, සමාපජ්ජනවසී, අධිට්ඨානවසී, වුට්ඨානවසී, පච්චවෙක්ඛණවසී, යන මේ පස් ආකාරයයි. ප්‍රථමධ්‍යානය රිසි තැනෙක, රිසිවිටෙක, රිසිතාක් කල් ආවර්ජනය කෙරෙතියි, ආවර්ජනයෙහි ලැසි බවෙක් නැතැ'යි ආවර්ජනවසී නම්, ප්‍රථමධ්‍යානය රිසිතැනෙක-පෙ-සමවදිති'යි සමවැදීමෙහි ලැසි බවෙක් නැතැ'යි සමාපජ්ජනවසී නම්.(2) මෙනයින්ම සෙසු වසීන්ද විස්තර කළයුතුය.

මෙහි අරුත් පැවසීම මෙසේයි: ප්‍රථමධ්‍යානයෙන් නැගී පළමුකොට විතක්කය ආවජ්ජන කරන්නහුට භවංගසිත සිඳගෙන උපන් ආවර්ජනයට අනතුරුව විතක්කයම අරමුණු කොටගත් ජවන් සිත් සතරෙක් හෝ

(1) අං.නි. නවක නි. මහාවග්ග - A iv 418f.

(2) පටිසම්භිද - Ps i 100

පසෙක් දිවේ, ඉක්බිති භවංග සිත් දෙකක් දිවේ, ඉක්බිති එම දෙවන භවංග සිතට අනතුරුව විචාරය අරමුණු කොටගත් ආවර්ජනය කියනලද නයින්ම වේ. මෙසේ පංච ධ්‍යානාංගයන් කෙරෙහි නිරතුරුව සිත මෙහෙයවන්නට යම් කලෙක සමත් වේනම්, එකල මේ යෝගාවචරයාට ආවජ්ජනවසිය සිද්ධවූයේ වේ. මස්තකප්‍රාප්තවූ මේ ආවජ්ජන-වසිය භාග්‍යවතුන් වහන්සේට යමකප්‍රාතිහාර්යයෙහිදී ලැබේ, අන්‍යයන්හටද මෙවැනි අවස්ථාවන්හිදී ලැබේ. මෙකී භාග්‍යවතුන් වහන්සේගේ ආවජ් ජනවසියට වඩා අතිශීඝ්‍ර ආවජ්ජනවසියක් නම් නැත. ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන තෙරුන්ගේ නන්දෝපනන්ද නාගරාජ දමනයෙහිදී මෙන් ශීඝ්‍රයෙන් සමවැදීමට සමත්බව සමාපජ්ජනවසී නම්.

අසුරුසණක් පමණවූ දස අසුරුසණක් පමණවූ හෝ කල් සිටුවන්නට සමත්බව අධිට්ඨාන-වසී නම්. එසේම සැහැල්ලු ලෙසින් නැගෙන්නට සමත්බව වුට්ඨාන-වසී නම්. එම අධිට්ඨාන-වසී වුට්ඨාන-වසී යන දෙක දක්වීමට බුද්ධරක්ඛිත තෙරුන්ගේ කතාපුවත කියනු වටී. ඒ ආයුෂ්මත්හු වනාහි උපසම්පදවෙන් අටවස් වූවාහු ථෙරම්බත්ථලයෙහි මහාරෝහණගුත්ත තෙරුන්හට ගිලානෝපස්ථාන පිණිස ආ තිස්දහසක් පමණවූ සෘද්ධිමතුන් මැද හුන්නාහු, තෙරුන්හට හුළුකැඳ පිළිගන්වමින් උපස්ථාන කරන නාරජු ගනිමි'යි අහසට පැන නගින ගුරුළුරජු දක එකෙණෙහි පර්වතයක් මවා, නාරජු අතින් ගෙන එතුළට පිවිසවූහ. ගුරුළුරජ තෙමේ පර්වතයට පහරදී පලා ගියේය. මහ තෙරණුවෝම, ඇවැත්නි, රක්ඛිත තෙරුන් නොසිටින්නට අපි සියල්ලෝම ගැරහිය යුත්තෝ වම්හ'යි කීහ. පච්චවෙක්ඛණ-වසිය වනාහි ආවජ්ජන-වසීයෙහිම කියනලදි. එහි ආවජ්ජන-වසියට අනතුරුව දිවෙන ජවනයෝ පච්චවෙක්ඛණජවනයෝ මැයි.

මේ පංචවිධ වසීන් කෙරෙහි බොහෝකල් පුරුදුවූවහු විසින් ප්‍රගුණ කරනලද ප්‍රථමධ්‍යානයෙන් නැඟී, "මේ සමාපත්ති තොමෝ නීවරණ නමැති සතුරන්ගෙන් නුදුරුව සිටියාය, විතක්ක විචාරයන් ඖළාරිකවූ හෙයින් දුර්වලවූ ධ්‍යානාංග ඇත්තීද වේ'යයි එහි දෙස් දක ද්විතීයධ්‍යානය ශාන්ත වශයෙන් මෙනෙහිකොට ප්‍රථමධ්‍යානය කෙරෙහිවූ රිසිය මැඩගෙන ද්විතීයධ්‍යානාධිගමය පිණිස භාවනායොග කටයුතුය. ඉක්බිති යම් කලෙක ප්‍රථමධ්‍යානයෙන් නැඟී සිහි ඇතිව, නුවණැතිව, ධ්‍යානාංගයන් ප්‍රත්‍යවෙක්ෂා කරන ඒ යොගාවචරයාහට විතක්ක, විචාර යන දෙක ඖළාරික ලෙසින් වැටහේද, පීති, සුඛ යන දෙකද චිත්තෙකග්ගතාවද ශාන්ත ලෙසින් වැටහේද, එකල එම ඖළාරිකවූ

ධ්‍යානාංගයන් ප්‍රහීණ කරනු පිණිසද, ශාන්තවූ ධ්‍යානාංගයන් ලබනු පිණිසද එම නිමිත්තම "පඨවී පඨවී" යනුවෙන් නැවතත් මෙනෙහි කරන ඒ යෝගාවචරයාහට දැන් ද්විතීය ධ්‍යානය උපදනේයයි භවංගසිත සිඳගෙන එම පඨවිකසිණයම අරමුණුකොට මනොද්වාරාවර්ජනය උපදී. ඉක්බිති එම අරමුණෙහිම ජවන් සතරෙක් හෝ පසෙක් දිවේ, ඒ ජවන් අතුරෙන් අවසානයෙහිවූ ජවනය රූපාවචර ද්විතීයධ්‍යානයට අයත්වේ, සෙසු ජවන්හු යට කියනලද පරිදි කාමාවචර වේ. මෙපමණෙකින් මේ යොගාවචර තෙමේ "විතක්ක විචාරයන් සන්සිඳීම හේතුකොටගෙන අධ්‍යාත්මය මැනවින් ප්‍රසාද කරවන චිත්ත සමාධි සංඛ්‍යාතවූ, විතක්ක රහිතවූ, විචාර රහිතවූ, සමාධියෙන් උපන් පීතිසුඛ සහිතවූ ද්විතීයධ්‍යානයට පැමිණ විහරණය කරන්නේය"(1)යි කියනලදි. මෙසේ මේ යොගාවචරයා විසින් අංග දෙකකින් හීනවූ අංග තුනෙකින් සමන්විතවූ ත්‍රිවිධ කල්‍යාණ සහිතවූ දශ ලක්ෂණයෙන් යුක්තවූ ද්විතීයධ්‍යාන සහිතවූ පඨවිකසිණය අවබෝධ කරනලද්දේ වේ.

එහි **විතක්කවිචාරානං වූපසමා** යනු: විතක්ක, විචාර යන මේ දෙක සන්සිඳුවීමෙනි, ඉක්මවීමෙනි. ද්විතීයධ්‍යානය ලද කෙණෙහි පටන් මේ දෙක පහළ නොවන බැවිනියි කීසේයි. එම ද්විතීයධ්‍යානයෙහිදී ප්‍රථමධ්‍යාන ස්වභාවයෝ කිසිසේත් විද්‍යමාන නොවෙති, ප්‍රථමධ්‍යානයෙහි ස්පර්ශ ආදිය එකෙකි, මෙම ද්විතීයධ්‍යානයෙහි අනෙකෙකි. ඖළාරික ඖළාරික (ඒ ඒ) අංගය ඉක්මවීමෙන් ප්‍රථමධ්‍යානයෙන් මතු ද්විතීයධ්‍යානාදීන්ගේ අධිගමය සිද්ධ වෙතැ'යි දක්වනු පිණිස **විතක්කවිචාරානං වූපසමා'යි** කියනලදැයි දතයුතුය. **අජ්ඣත්තං** යනු, මෙහි ස්වකීය සන්තානය අභිප්‍රේතයි. විභංගයෙහි වනාහි **අජ්ඣත්තං පච්චත්තං** (අජ්ඣත්තං යනු සන්තානයයි) යන මෙපමණක්ම කියනලදි.(2) යම් හෙයකින් ස්වසන්තානය අභිප්‍රේත වේද, එහෙයින්, ස්වසන්තානයෙහි උපන්, ස්වසන්තානයෙහි හටගත් යනු මෙහි අර්ථයයි. **සම්පසාදනං** යනු: ශ්‍රද්ධාව සම්පසාදනයයි කියනු ලැබේ. සම්පසාදනය හා සමග යෙදීමෙන් ධ්‍යානයද සම්පසාදන නම් වේ. නීලවර්ණය හා සමග යෙදීමෙන් වස්ත්‍රයද නීල නම් වන සේය. යම් හෙයකින් එම ධ්‍යානය සම්පසාදනයෙන් සමන්විතවන හෙයින්ද, විතක්ක විචාරයන්ගේ පැළඹීම සන්හුන් හෙයින්ද සිත ප්‍රසාදයට යන්නේද එහෙයින්ද, සම්පසාදනයයි කියනු ලැබේ. මෙම අර්ථ විකල්පයෙහි 'සම්පසාදනං චෙතසො' (සිතෙහි පහන් බව) යි මෙසේ පද යෙදීම දතයුතුය. පළමු කී අර්ථවිකල්පයෙහි වනාහි චෙතසො

(1) අභිධම්ම විභංග - Vbh 258
(2) Vbh 258

යන මෙය එකොදිභාවං යනු හා සමග යෙදියයුතුය. එහි අර්ථ යෝජනාව මෙසේය: අසහායව නැඟෙති'යි 'එකොදි' නම්, විතක්ක විචාරයන් අධ්‍යාරූඪ නොවූහෙයින් අග්‍රව, ශ්‍රේෂ්ඨව නැගෙති'යි යන අර්ථයි. ශ්‍රේෂ්ඨ වූයේද ලෝකයෙහි 'එක' යනුවෙන් වහරනු ලැබේ. විතක්ක, විචාර යන දෙකින් තොරවූයේ හෝ අසහායයයි, 'එක'යයි කියනු වටී, නැතහොත්, (ස්පර්ශාදී) සම්ප්‍රයුක්ත ධර්මයන් උද කරවති'යි උදී නම්, සිටුවාලයි යන අර්ථයි, ශ්‍රේෂ්ඨාර්ථයෙන් 'එක' වනුයේද එම උදී වනුයේද එමැයි එකොදී නම්. මේ සමාධියට අධිවචනයෙකි. මෙසේ මේ 'එකොදි'ය වවනුයේ'යි, වඩනුයේ'යි මෙම ද්විතීයධ්‍යානය 'එකොදිභාව' නම්. යම් හෙයකින් මෙම එකොදිභාවය සිත පිළිබඳ වූවක් මිස සත්වයකු, ජීවියකු පිළිබඳ වූවක් නොවේද, එහෙයින් මෙය 'චෙතසො එකොදිභාවං' යයි කියනලදි.

මෙම ශ්‍රද්ධාව ප්‍රථමධ්‍යානයෙහිද ඇත්තේ නොවේද? ඒකොදී නම් මෙම සමාධියද, එහි ඇත්තේ නොවේද? එසේ නම් කවර හෙයින් මේ ද්විතීයධ්‍යානයම 'සම්පසාදන' නම්ද 'චෙතසො එකොදිභාව' නම්ද වෙති'යි කියන ලද්දේද? (මෙහි පරිහාර) කියනුලැබේ: මේ ප්‍රථමධ්‍යානය වූකලි විතක්කවිචාරයන්ගේ පැළඹීම හේතුකොටගෙන කුදුමහත් රළින් කැළඹි ජලයක් මෙන් සුපහන්වූයේ නොවේ, එහෙයින් ශ්‍රද්ධාව පැවතුණද 'සම්පසාදන'යයි නොකියන ලදි, සුපහන් නොවූ හෙයින්ම මේ ප්‍රථමධ්‍යානසමාධිය මනාව ප්‍රකට නොවේ, එහෙයින් එකොදිභාව යයිද නොකියන ලදි. මේ ද්විතීයධ්‍යානයෙහි වනාහි විතක්ක-විචාර පලිබෝධයෙන් තොරව ලදඅවකාශ ඇති ශ්‍රද්ධාව බලවත් වේ. බලවත් ශ්‍රද්ධාවෙහි සහාය ලැබීමෙන්ම සමාධියද ප්‍රකට වේ. එහෙයින් මෙම ද්විතීයධ්‍යානයම මෙසේ (සම්පසාදන නම්ද, එකොදිභාව නම්ද) වෙති'යි කියනලදයි දතයුතුය. විභංගයෙහි වනාහි, සම්පසාදනන්ති යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදෙ; චෙතසො එකොදිභාවන්ති යා චිත්තස්ස ඨිති-පෙ-සම්මා සමාධි'(1) සම්පසාදන යනු, යම් ශ්‍රද්ධාවක්, ඇදහීමක්, විශ්වාස බවක්, මනාපැහැදීමක් ඇද්ද, එයයි. 'එකොදිභාව' යනු, සිත පිළිබඳ මනා පිහිටීමෙක් ඇද්ද-පෙ-සම්‍යක් සමාධියෙක් ඇද්ද, එයයි) යනුවෙන් මෙපමණක් කියනලදි. මෙසේ මෙහි දක්වනලද අර්ථයෝජන හා සමග ගෙන මෙම අර්ථවර්ණනාව යම්සේ විරෝධ නොවේද, නිසැකයෙන්ම සැසඳේද, සමාන වේද එසේයයි දතයුතුය.

(1) Vbh 258

**අවිතක්කං අවිචාරං** යනු, භාවනා නයින් ප්‍රහීණ කරනලද හෙයින් මේ ද්විතීයධ්‍යානයෙහි, නොහොත් මේ ධ්‍යානයට, විතක්කය නැතැයි අවිතක්ක නම්වේ, මෙනයින්ම අවිචාර නම්ද වේ. විභංගයෙහිද කියනලදි: "ඉති අයඤ්ච විතක්කො අයඤ්ච විචාරො සන්තා හොන්ති, සමිතා, වූපසන්තා, අත්ථඞ්ගතා, අබ්භත්ථඞ්ගතා, අප්පිතා, ව්‍යප්පිතා, සොසිතා විසොසිතා, ව්‍යන්තීකතා, තෙන වුච්චති අවිතක්කං අවිචාරන්ති"[1] (මෙසේ මේ විතක්කයද මේ විචාරයද සන්සුන් වූයේ, සන්සිඳුවන ලද්දේ, ශමනය කරන ලද්දේ, අස්තයට ගියේ, වෙසෙසින් අස්තයට ගියේ, බහා තබන ලද්දේ, වෙසෙසින් බහා තබන ලද්දේ, වියලවන ලද්දේ, වෙසෙසින් වියලවන ලද්දේ, අවසන් කරන ලද්දේද වේ, එහෙයින් අවිතක්කයයිද අවිචාරයයිද කියනු ලැබේ) යනුවෙනි.

මෙහිලා "විතක්කවිචාරානං වූපසමා" යන මෙයින් මෙම අර්ථය සිද්ධ නොවන්නේද? එසේනම් කවරහෙයින් "අවිතක්කං අවිචාරං"යයි නැවත කියන ලද්දේදැ?යි (චෝදනාවෙක් වේ. එයට පරිහාර) කියනු ලැබේ: ඒ එසේමය, මේ අර්ථය සිද්ධ වන්නේමය, එනමුදු විතක්කවිචාරානං වූපසමා" යන මෙය එම අර්ථය ප්‍රකට කරන්නේ නොවේ, ඒ ඒ ඖළාරික අංගය ඉක්මවීමෙන් ප්‍රථමධ්‍යානයෙන් මතු ද්විතීයධ්‍යානාදීන්ගේ අධිගමය වේයයි දක්වනු පිණිස විතක්ක විචාරයන් සන්සිඳුවීමෙන්යයි මෙසේ කියනලද'යි යට නොපැවසුමුද? තවද, විතක්කවිචාරයන්ගේ ව්‍යුපශමන හේතුවෙන් මිස කෙලෙස් කිලුට සන්සිඳුවීමෙන් මෙකී සම්පසාදනය සිද්ධ නොවේ. විතක්ක විචාරයන්ගේ ව්‍යුපශමනයෙන්ම මිස උපචාරධ්‍යානය මෙන් හුදෙක් නීවරණප්‍රහාණයෙන් හෝ, ප්‍රථම ධ්‍යානය මෙන් ධ්‍යානාංගයන් පහළවීමෙන් හෝ මේ ඒකොදිභාවය සිද්ධ නොවේ. මෙසේ 'විතක්ක විචාරානං වූපසමා' යනු, සම්පසාදන, එකොදිභාව යන මොවුන්ගේ හේතු දක්වනු පිණිස යෙදූ වචනයි. එසේම විතක්ක විචාරයන්ගේ ව්‍යුපශමන හේතුවෙන්ම මේ ද්විතීයධ්‍යානය 'අවිතක්ක' නම්ද 'අවිචාර' නම්ද වේ, තෘතීය චතුර්ථ ධ්‍යානයන් මෙන්ද, චක්ඛුවිඤ්ඤාණාදිය මෙන්ද (විතක්ක විචාරයන්ගේ) අභාව හේතුවෙන් (නැති හෙයින්) නොවේ. මෙසේ විතක්කවිචාරානං වූපසමා" යනු, අවිතක්ක අවිචාර භාවයට හේතු දක්වනු පිණිස මිස එම විතක්ක විචාරයන්ගේ අභාවය (නැති බව) දක්වනු පිණිස නොවේ. "අවිතක්කං අවිචාරං" යන මේම විතක්කවිචාරයන්ගේ අභාවමාත්‍රය දක්වනු පිණිස යෙදූ වචනයි, එහෙයින්, පළමු කී වචන පැවසීමෙන් පසුවද නැවත "අවිතක්කං අවිචාරං"යයි කිව යුතුම වේ.

---

(1) Vbh 258

**සමාධිජං** යනු, ප්‍රථමධ්‍යාන සමාධියෙන් හෝ සම්ප්‍රයුක්ත (ද්විතීයධ්‍යාන) සමාධියෙන් හෝ උපන්නේ'යි යන අර්ථයයි. එහි ප්‍රථමධ්‍යානයද සම්ප්‍රයුක්ත සමාධියෙන් උපන්නේ නමුදු මේ (ද්විතීයධ්‍යාන) සමාධියම "සමාධි"යයි කියනු යෝග්‍යවේ. විතක්ක විචාරයන්ගේ පැළඹීම් නොමැති වීමෙන් අතිශය නිශ්චලවූ හෙයින් හා අතිශය ප්‍රසන්නද වූ හෙයිනි. එහෙයින් මේ ද්විතීය ධ්‍යානයෙහි ගුණ පවසනු පිණිස මෙයම 'සමාධිජ'යයි කියනලදි. **පීතිසුඛං** යන මෙය කියනලද නයින්ම වේ.

**දුතියං** යනු ගණන් අනුපිළිවෙළින් දෙවැන්නයි, දෙවනුව උපන්හ'යි හෝ දුතිය නම්, දෙවනුව සමවදනේයයිද දුතිය නම්. **ද්වඞ්ගවිප්පහීණං තිවඞ්ගසමන්නාගතං** යයි යමක් කියන ලද්දේද, එහි විතක්ක-විචාරයන්ගේ ප්‍රහාණ වශයෙන් ද්වංගවිප්‍රහීණතාව දතයුතුයි. ප්‍රථමධ්‍යානයෙහිදී නීවරණයන් පහවී යනුයේ උපචාරක්ෂණයෙහිදීය, මෙම (ද්විතීය) ධ්‍යානයෙහිදී විතක්කවිචාරයන් පහවනුයේ එසේ නොවේ. මෙම ද්විතීයධ්‍යානය විතක්කවිචාරයන්ගෙන් තොරව උපදිනුයේ අර්පණාක්ෂණයෙහිදීය. එහෙයින්, ඒ (විතක්ක, විචාර යන) දෙක මේ ද්විතීය ධ්‍යානයෙහි ප්‍රහාණාංගයයි කියනු ලැබේ. පීති, සුඛ, චිත්තේකග්ගතා යන මේ තුනෙහි උත්පත්ති වශයෙන් තිවංගසමන්නාගතතාව දතයුතුය. එහෙයින් විභංගයෙහි, "ධ්‍යාන යනු සම්පසාදනයයි, පීතියයි, සුඛයයි, චිත්තේකග්ගතාවයි"(1) යනුවෙන් කියනලදි. සපරිවාර ධ්‍යානය දක්වනු පිණිස එය පර්යාය වශයෙන් කියනලදි. නිෂ්පර්යාය වශයෙන් සම්ප්‍රසාදය හැර, ධ්‍යානයෙහි විශේෂ ලක්ෂණ බවට අංගයන්ගේ වශයෙන් මේ ද්විතීයධ්‍යානය අංගත්‍රයයෙන් යුක්ත වූයේම වේ. යම්සේ කියන ලදද: "කතමං තස්මිං සමයෙ තිවඞ්ගිකං ඣානං හොති, පීතිසුඛං චිත්තෙකග්ගතා"(2) (එසමයෙහි ධ්‍යානය කවර නම් අංගත්‍රයයෙන් යුක්ත වේද? පීති, සුඛ ඒකග්ගතා යන අංගත්‍රයයෙනි). සෙස්ස ප්‍රථම ධ්‍යානයෙහි කියනලද නයමැයි.

මෙසේ එම ද්විතීය ධ්‍යානය අවබෝධ කළ පසුද යට කියනලද නයින්ම පංචාකාරයෙන් චිණ්ණවසී භාවයට පත්ව ප්‍රගුණකළ ද්විතීය ධ්‍යානයෙන් නැඟී, "මේ සමාපත්තිය විතක්ක-විචාර නැමති ප්‍රතිපක්ෂයන්ගෙන් නුදුරුව සිටියේයිද, පීති යනු සිතෙහි ඉල්පීමයි, එහෙයින් එය ඖළාරිකයයි(3) කියනු ලැබේ යනුවෙන් පවසනලද පීතිය ඖළාරික

(1) Vbh 258

(2) එම

(3) එම

වන බැවින් එය දුර්වල අංග ඇත්තේයයිද, මෙසේ එම ද්විතීයධ්‍යානයෙහි දෙස් දක, තෘතීයධ්‍යානය ශාන්ත වශයෙන් මෙනෙහිකොට ද්විතීයධ්‍යානයෙහි රිසිය මැඩලා තෘතීයධ්‍යානාධිගමය පිණිස භාවනානුයෝගය කටයුතුය.

ඉක්බිති යම් කලෙක ද්විතීයධ්‍යානයෙන් නැඟී සිහි ඇතිව, මනානුවණින් යුක්තව, ධ්‍යානාංගයන් ප්‍රත්‍යවෙක්‍ෂා කරණ මේ යෝගාවචරයාහට පීතිය ඖළාරික වශයෙන් වැටහේද, සුඛයද එකග්ගතාවද ශාන්ත ලෙසින් වැටහේද, එකල එම ඖළාරික අංගය ප්‍රහීණ කරනු පිණිසද, ශාන්ත අංගයන් ලබනු පිණිසද, එම නිමිත්තම "පඨවි පඨවි" යනුවෙන් නැවත නැවතත් මෙනෙහි කරනවිට, දැන් තෘතීය ධ්‍යානය උපදනේය'යි භවංගය සිඳගෙන එම පඨවිකසිණයම අරමුණුකොට මනොද්වාරාවර්ජනය උපදී. ඉක්බිති එම අරමුණෙහිම ජවන් සතරක් හෝ පහක් දිවෙයි, එම ජවන් අතුරෙන් අවසන් ජවනය රූපාවචර තෘතීයධ්‍යානය වේ, සෙසු ජවන් යට කියනලද නයින්ම කාමාවචර වේ. මෙතෙකින් වනාහි මේ යෝගාවචර තෙමේ "පීතිය කෙරෙහි නොඇලීමෙන්, උපෙක්‍ෂක වූයේම විහරණය කරයි, සිහි ඇත්තේ මනානුවණින් යුතුවූයේ සුඛය කයින් විඳියි, යම් ඒ ධ්‍යානයක් ඇත්තේ උපෙක්‍ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සුඛවිහරණ ඇත්තේයයි ආර්යයෝ පවසත් නම්, එම තෘතීයධ්‍යානයට සමවැද විහරණය කෙරේය"(1)යි මෙසේ මේ යෝගාවචරයා විසින් එක් අංගයෙකින් අඩුවූ අංග දෙකෙකින් සමන්විතවූ ත්‍රිවිධ කල්‍යාණ සහිතවූ දශ ලක්‍ෂණයෙන් යුක්තවූ පඨවිකසිණය අරමුණු කොට උපන් තෘතීයධ්‍යානය අවබෝධ කරන ලද්දේ වේ.

එහි **පීතියා ච විරාගා** යනු, මෙහි 'විරාග' නම් කියනලද ආකාර ඇති පීතිය පිළිබඳව කලකිරීමයි, නොහොත් එය ඉක්මවීමයි. පීතියා, විරාගා යන මේ පද දෙක අතර ඇති ච-කාරය සම්පිණ්ඩනාර්ථයෙහි වේ. එය 'වූපසමා' යනු හෝ 'විතක්කවිචාරානං වූපසමා' යනු සම්පිණ්ඩනය කෙරේ. එහි යම් කලෙක 'වූපසමා' යන්න පමණක් සම්පිණ්ඩනය කෙරේ නම්, එකල 'පීතියා විරාගා ච' යන්නට අමතරව 'වූපසමා ච' යනුවෙන්ද පද යෝජනා කටයුතුය. මෙම යෝජනාවෙහි 'විරාග' යනු ජුගුප්සා (කලකිරීම්) අර්ථ ඇත්තේ වේ, එහෙයින් පීතිය ගැන කලකිරීමෙනැ'යි, එය සන්සිඳුවීමෙනැ'යි යන මේ අර්ථය දතයුතුය. යම් කලෙක වනාහි 'විතක්කවිචාරානං වූපසමා' යන්න සම්පිණ්ඩනය කෙරේනම්, එකල 'පීතියා ච විරාගා' යන්නට අමතරව 'විතක්කවිචාරානං

(1) දී. නි. බ්‍රහ්මජාල සූ - D i 37

වූපසමා'යයි මෙසේ පදයෝජනා කටයුතුය. මෙම යෝජනාවෙහි 'විරාග' යනු සමතික්‍රමණාර්ථය ඇත්තේ වේ. එහෙයින් පීතිය ඉක්මවීමෙන්ද විතක්කවිචාරයන් සංසිඳුවීමෙන්දැයි යන මේ අර්ථය දතයුතුය. ඒකාන්තයෙන්ම මේ විතක්කවිචාරයෝ ද්විතීයධ්‍යානයෙහිදීම සන්සිඳුවන ලද්දාහුය, මේ තෘතීයධ්‍යානයට මාර්ගය දක්වනු පිණිසද, එහි ගුණ පවසනු පිණිසද මෙසේ කියනලදි. විතක්කවිචාරයන්ගේද ව්‍යූපශමනයෙහැ'යි කී කල මෙය ප්‍රකාශවේ. ඒකාන්තයෙන් විතක්ක විචාරයන් සන්සිඳුවීම මේ තෘතීයධ්‍යානයට මාර්ගය වේ. යම්සේ (ප්‍රථම ආර්යමාර්ගයෙන් මිස) තෘතීය ආර්යමාර්ගයෙන් ප්‍රහීණ නොකරනලද සක්කායදිට්ඨි ආදී පංච ඔරම්භාගීය සංයෝජනයන් ප්‍රහීණ කිරීමෙනැ'යි මෙසේ ප්‍රහාණය ගැන කීම එම තෘතීය ආර්යමාර්ගය පිණිස උත්සුකවූවන්ගේ උත්සාහජනනය සිදුවන ගුණ පැවසීමෙක් වේද, එසේම (ද්විතීය ධ්‍යානයෙහිදී මිස) මෙම තෘතීයධ්‍යානයෙහිදී සන්සිඳුවනු නොලද විතක්කවිචාරයන්ගේ සන්සිඳුවීම ගැන කීම ගුණ පැවසීමෙක් වේ. එහෙයින් පීතිය ඉක්මවීමෙන්ද, විතක්කවිචාරයන් සන්සිඳුවීමෙන්දැ'යි යන මේ අර්ථය කියනලදි.

**උපෙක්ඛකො ච විහරති** යනු, මෙහි, සුදුසු පරිදි (උපපත්ති වශයෙන්) බලති'යි උපෙක්ඛා නම්, සමසේ බලති'යි, අපක්ෂපාතීව බලති'යි යන අර්ථයි. ව්‍යක්තවූ මහත්වූ එම උපෙක්ෂා ගුණයෙන් සමන්විතවූ හෙයින් තෘතීයධ්‍යානයෙන් සමන්විතවූයේ 'උපෙක්ඛක'යයි කියනුලැබේ. උපෙක්ෂාව වනාහි දශආකාර වේ: ඡළංගඋපෙක්ඛාය, බ්‍රහ්මවිහාරඋපෙක්ඛාය, බොජ්ඣංගඋපෙක්ඛාය, විරියඋපෙක්ඛාය, සංඛාරඋපෙක්ඛාය, වෙදනාඋපෙක්ඛාය, විපස්සනාඋපෙක්ඛාය, තත්‍රමජ්ඣත්තුපෙක්ඛාය, ඣානඋපෙක්ඛාය, පාරිසුද්ධිඋපෙක්ඛාය යන මේ දශ ආකාර උපෙක්ඛායි. එහි, "මේ ශාසනයෙහි ක්ෂීණාශ්‍රව භික්ෂු තෙමේ ඇසින් රූපයක් දැක සොම්නස් නොවෙයි, දොම්නස්ද නොවෙයි, සිහි ඇතිව මනා නුවණින් යුතුව, උපෙක්ෂකවද විහරණය කෙරේ[(1)]" යනුවෙන් යම් උපෙක්ෂාවක් මෙසේ දක්වන ලද්දේද, ක්ෂීණාශ්‍රවයාගේ ෂඩ්ද්වාරයෙහි ඉෂ්ටානිෂ්ට ෂඩාලම්බනයන් සම්මුඛවීමෙහිදී පිරිසුදු පියවිබව නොහරනා ආකාරයෙන් සිටි මේ උපෙක්ෂාව ඡළංගුපෙක්ඛා නම් වේ. යම් උපෙක්ෂාවක්, "උපෙක්ෂා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා විහරණය කෙරේ[(2)]" යනුවෙන් මෙසේ දක්වන ලද්දේද, සත්වයන් කෙරෙහි මධ්‍යස්ථ ස්වභාවයෙන් වූ මේ උපේක්ෂාව බ්‍රහ්මවිහාරඋපෙක්ඛා නම් වේ. යම් උපේක්ෂාවක්, "විවෙක නිශ්‍රිතවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයි[(3)]" යනුවෙන් මෙසේ දක්වන

(1) දී. නි. සංගීති සු - D iii 250
(2) එම - D iii 251
(3) අං. නි. එකකනි. - cf. M i 11

ලද්දේද, සහජාත ධර්මයන් කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන් පවත්නා මේ උපේක්‍ෂාව බොජ්ඣංගුපෙක්ඛා නම් වේ. යම් උපේක්‍ෂාවක්, "කලින් කල උපේක්‍ෂා නිමිත්ත මෙනෙහි කරයි[1]" යනුවෙන් මෙසේ දක්වන ලද්දේද, ඉතා දැඩි ලෙසින් හෝ ඉතා ලිහිල් ලෙසින් නො-ඇරඹි වීර්යය පවසන ලද්දේද, මේ උපෙක්‍ෂාව විරියඋපෙක්ඛා නම් වේ. යම් උපේක්‍ෂාවක්, "සංස්කාර උපෙක්‍ෂා කීයක් සමාධි වශයෙන් උපදීද? සංස්කාරෝපෙක්‍ෂා කීයක් විදර්ශනා වශයෙන් උපදීද? සංස්කාරෝපෙක්‍ෂා අටක් සමාධි වශයෙන් උපදී, සංස්කාරෝපෙක්‍ෂා දහයක් විදර්ශනා වශයෙන් උපදී[2]" යනුවෙන් මෙසේ දක්වන ලද්දේද, නීවරණාදිය පරීක්‍ෂාකොට සනිටුහන් ගැනීමෙහිදී මධ්‍යස්ථවූ මේ උපෙක්‍ෂාව සංඛාරුපෙක්ඛා නම්වේ. යම් උපේක්‍ෂාවක් වනාහි, "යම් කලෙක උපෙක්‍ෂා සහගතවූ කාමාවචර කුශල චිත්තයක් උපන්නේ වේද[3]" යනුවෙන් මෙසේ දක්වන ලද්දේද, අදුඃඛවූ අසුඛවූද, සංඥ ඇති මේ උපෙක්‍ෂාව වේදනාඋපෙක්ඛා නම් වේ. යම් උපෙක්‍ෂාවක්, "යමක් (යම් ස්කන්ධපංචකයක්) පවත්නේ වේද, යමක් පැවතියේ වේද, එය අත්හරිනුයේ උපෙක්‍ෂාව ලබන්නේය[4]" යනුවෙන් මෙසේ දක්වන ලද්දේද, රැස් කිරීමෙහිලා මධ්‍යස්ථවූ මේ උපේක්‍ෂාව විපස්සනාඋපෙක්ඛා නම් වේ. යම් උපේක්‍ෂාවක් වනාහි ජනුදීවූ යම්බඳු ස්වරූපයක ධර්මයන් කෙරෙහි ආයේද, සහජාත ධර්මයන් සමව ඉසිලීමට කාරණවූ මෙම උපෙක්‍ෂාව තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නම් වේ. යම් උපේක්‍ෂාවක්, "උපෙක්ඛකො ච විහරති"[5] (උපේක්‍ෂාවෙන් යුක්තව විහරණය කෙරේ) යනුවෙන් මෙසේ ආයේද, අග්‍රවූ ධ්‍යානසුඛ විෂයෙහි පවා අපක්‍ෂපාතබව දනවන එම උපෙක්‍ෂාව ඣානුපෙක්ඛා නම් වේ. යම් උපේක්‍ෂාවක් වනාහි, "උපෙක්ඛා සති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං"[6] (උපෙක්ඛා සතිපාරිසුද්ධි සහිත චතුර්ථ ධ්‍යානය) යනුවෙන් මෙසේ දක්වන ලද්දේද, සියලු නීවරණ නමැති ප්‍රතිපක්‍ෂයන්ගෙන් පිරිසුදුවූ, එම ප්‍රතිපක්‍ෂයන් සන්සිඳුවීමෙහිදී පවා ව්‍යාපාරරහිතවූ මෙම උපෙක්‍ෂාව පාරිසුද්ධිඋපෙක්ඛා නම් වේ.

එහි ඡළංගුපෙක්ඛාවද, බ්‍රහ්මවිහාර-උපෙක්ඛාවද, බොජ්ඣංගුපෙක්ඛාවද, තත්‍රමජ්ඣත්තුපෙක්ඛාවද, ඣානුපෙක්ඛාවද, පාරිසුද්ධිඋපෙක්ඛාවද අර්ථවශයෙන් සමානවූ තත්‍රමජ්ඣත්තුපෙක්ඛාවම වේ. ඒ ඒ

(1) සං. නි. මහාවග්ග - cf. A i 257
(2) පටිසම්භිද - Ps i 64
(3) අභි. ධම්මසංගනී - Dhs 29
(4) සං. නි. මහාවග්ග
(5) අභි. විභංග - Vbh 45
(6) අභි. විභංග - Vbh 245

අවස්ථාභේදය අනුව උපෙක්ඛාව පිළිබඳ මේ භේදය වේ. එක්ම පුද්ගලයකු පිළිබඳව වුවද, ළදරු, තරුණ, වැඩිහිටි, සෙන්පති, රජ ආදි වශයෙන් විවිධ අවස්ථාවන් පිළිබඳ භේදය වැනිය. එහෙයින් යම් තැනෙක ඡළංගුපෙක්ඛාව ඇත්තේද, එතැන බොජ්ඣංගුපෙක්ඛා ආදිය නොවේ, යම් තැනෙක වනාහි බොජ්ඣංගුපෙක්ඛාව ඇත්තේද, එතැන ඡළංගුපෙක්ඛාදිය නොවේයයි දතයුතුය. යම්සේ අර්ථ වශයෙන් මොවුන්ගේ සමාන බවක් ඇත්ද, එසේම සංඛාරුපෙක්ඛා විපස්සනා-උපෙක්ඛා යන දෙකෙහිද අර්ථ වශයෙන් සමාන බවෙක් ඇත. ප්‍රඥාවම කෘත්‍ය වශයෙන් දෙආකාරයෙන් බෙදුණේ වේ. යම්සේ වනාහි සවස්කල ගෙට පිවිසි සර්පයකු, අජපද (එළුකකුලක් මෙන් නැමුණ) දණ්ඩක් ගෙන සොයන පුරුෂයකු, වී (ථුස-දහය්‍යා) කොටුවෙහි හොත් සර්පයා දැක, සර්පයෙක් දෝ නැද්දෝ'යි පිරික්සනවිට සෝවැති (ස්වස්තික ලකුණු) තුන දැක විමති රහිතව, සර්පයෙක්දෝ නැත්දෝ'යි (තවදුරටත්) සෙවීමෙහි නිරපේක්ෂ වේද, එසේම ඇරඹි විදර්ශනා ඇත්තහුගේ විදර්ශනාඥානයෙන් තිලකුණු දුටු කල්හි සංස්කාරයන්ගේ අනිත්‍යස්වභාව ආදිය සෙවීමෙහි නිරපෙක්ෂකතාව ඔහු තුළ උපදී. මේ විපස්සනා උපෙක්ඛායි. යම්සේ වනාහි අජපද දණ්ඩෙන් ඒ සර්පයා දැඩිලෙස ගෙන, (ඉක්බිති) 'කෙසේ නම් මේ සර්පයා පීඩාවට පත් නොකොට, සර්පයා ලවා දෂ්ට කරවා නොගෙන මුදා හරිම්දෝ'යි මුදාහරින ආකාරයම සොයන ඒ පුරුෂයාහට සර්පයා අල්වා තබාගැනීමෙහිලා උපෙක්ෂකතාව උපදීද, එසේම තිලකුණු දක්නාලද හෙයින් භවත්‍රයය ඇවිල ගියාක් මෙන් දක්නහුට සංස්කාරයන් ගැනීමෙහිලා මැදහත් බවක් වන්නේද එය සංඛාරුපෙක්ඛායි. මෙසේ විපස්සනා-උපෙක්ඛාව සිද්ධවූ කල්හි සංඛාරුපෙක්ඛාවද සිද්ධවූයේම වේ. මේ ප්‍රඥාව වනාහි සෙවීම් ගැනීම් යන දෙක්හි මධ්‍යස්ථතා සංඛ්‍යාතවූ කෘත්‍යයෙන් දෙවැදෑරුම්ව බිඳුණේ වේ. විරියුපෙක්ඛාව හා වේදනා-උපෙක්ඛාව එකිනෙකින්ද, සෙසු උපෙක්ඛාවන්ගෙන්ද අර්ථවශයෙන් බෙදුණේම වේ.

මෙසේ මේ උපෙක්ඛාවන් අතුරෙන් මෙහිලා ඣානුපෙක්ඛාව අභිප්‍රෙත වේ. එම උපෙක්ඛාව මැදහත්බව ලක්ෂණකොට ඇත්තේය, මෙනෙහි නොකිරීම කෘත්‍යකොට ඇත්තේය, ව්‍යාපාර රහිත බව වැටහීම්කොට ඇත්තේය, පීතිවිරාගය ආසන්න කාරණකොට ඇත්තේය. මෙහිලා කිවයුත්තෙකි: අර්ථවශයෙන් මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛාවම නොවේද? එය ප්‍රථම ද්විතීයධ්‍යානයන්හිද ඇත, එහෙයින් එම ප්‍රථම ද්විතීයධ්‍යානයන්හිද "උපෙක්ඛකො ච විහරති' (උපේක්ෂාවෙන් යුක්තව වෙසේ) යයි මෙසේ මෙය කිවයුතු වන්නේය. කවර හෙයින් නොකියන

ලද්දේද යත්, ප්‍රකට නොවූ කෘත්‍ය ඇති හෙයිනි. එහි වනාහි එම තත්‍රමජ්ඣත්තුපෙක්ඛාවෙහි කෘත්‍යය ප්‍රකට නොවේ, විතක්කාදියෙන් යටපත්වූ හෙයිනි. මෙම තෘතීයධ්‍යානයෙහිදී වනාහි විතක්ක, විචාර, පීති යන මෙයින් නොමඩනාලද හෙයින් නහාගත් හිස් ඇත්තකු සෙයින් ප්‍රකටවූ කෘත්‍ය ඇත්තේ වේ. එහෙයින් (උපෙක්ඛකො ච විහරති'යි) කියන ලදි. "උපෙක්ඛකො ච විහරති'යන මෙහි සියලු ආකාරයෙන් කළ අර්ථවර්ණනාව සමාප්තයි.

ඉක්බිති **සතො ච සම්පජානො** යන මෙහි සිහි කෙරෙති'යි 'සත' නම්, මනාකොට දනිති'යි සම්පජාන නම්. සිහියද මනාදැනීමද, පුද්ගල වශයෙන් ගෙන මෙසේ කියනලදි. එහි සති (සිහි)ය සිහිකිරීම ලක්ෂණකොට ඇත්තේය, සිහිවිකල නොවීම කෘත්‍යකොට ඇත්තේය, කෙලෙසුන්ගෙන් ආරක්ෂාවීම වැටහීම්කොට ඇත්තේය, සම්පජඤ්ඤය (මනාසේ දැනීම) නොමුළාබව ලක්ෂණකොට ඇත්තේය, විනිශ්චය කිරීම කෘත්‍යකොට ඇත්තේය, විමංසනය වැටහීම්කොට ඇත්තේය, මේ සිහි නුවණ දෙක ප්‍රථම ද්විතීය යන පළමු ධ්‍යානයන්හිද ඇත, සිහිමුළාවූවහුට, නුවණ නැත්තහුට උපචාර මාත්‍රයෙකුදු සිද්ධ නොවේ, අර්පණාව කැලම සිද්ධ නොවේ. ඒ පූර්ව ධ්‍යානයන් ඖළාරිකවන හෙයින් භූමියෙහි පුරුෂයකුගේ ගමන මෙන් සිතෙහි ගමන සුව වේ, එම ධ්‍යානයන්හිදී සතිසම්පඤ්ඤයන්ගේ කෘත්‍යය ව්‍යක්ත නොවේ. ඖළාරිකාංගයන්ගේ ප්‍රහාණයෙන් මේ (තුන්වන) ධ්‍යානය සියුම් වන හෙයින්, පුරුෂයකුගේ කරකැති (දැළිපිහි) මුවහතෙහි ගමන මෙන් සතිසම්පජඤ්ඤ දෙකෙහි කෘත්‍යයෙන් යුක්තවූ සිතෙහි ගමන කැමැති විය යුතුයයි මෙහිම කී නියායි. යලි කිමෙක්ද යත්, යම්සේ දෙන වෙත ගෙනෙනලද වස්සෙක් දෙනගෙන් ඉවත් කරනලද්දේ, නොරක්නා ලදහොත්, නැවත දෙන කරා එළඹෙන්නේද, එසේම මේ තෘතීයධ්‍යාන සුඛය පීතිය කෙරෙන් වෙන් කරන ලදුයේ සතිසම්පජඤ්ඤයෙන් නොරක්නා ලදහොත් නැවත පීතිය කරා එළඹෙන්නේය, පීතිසම්පයුත්ත (ද්විතීය ධ්‍යානය)ම වන්නේය. සුඛයෙහිද සත්වයෝ ඇලෙති, මේ (තෘතීයධ්‍යාන) සුඛයද ඉතා මිහිරි වන්නේය, එයට වැඩි තරම්වූ සුඛයක් නොමැති හෙයිනි. සතිසම්පජඤ්ඤබලයෙන්ම මිස අන් ලෙසකින් මේ (තෘතීයධ්‍යාන) සුඛයෙහි නො-ඇලීම නොම වන්නේය. මේ අරුත් වෙසෙසද දක්වනු පිණිස මෙය (සිහිනුවණ යන දෙක) මෙහිම කියනලදැ'යි දතයුතුය.

ඉක්බිති, **සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති** (කයින් සුවයද විඳිනේය) යන මෙහි: තෘතීයධ්‍යානයෙන් සමන්විත පුද්ගලයාට කිසිසේත් සුව

විඳීමේ මනස්කාරයෙක් නැත. එතෙකුදු වුවත්, යම්හෙයකින් ඔහුගේ නාමකාය සම්ප්‍රයුක්ත සුවයෙක් වේද, නොහොත් නාමකාය හා සමග බැඳුණු යම් ඒ සුවයෙක් වේද, යම්හෙයකින් එයින් හටගත් ඉතා ප්‍රණීතවූ රූපයෙකින් ඒ ධ්‍යානලාභියාගේ රූපකාය ස්පර්ශ කරන ලද්දේද, එම රූපයෙන් ස්පර්ශ කරනලද හෙයින් ධ්‍යානයෙන් නැගි කල්හිද කායික සුවය විඳිනේය, එහෙයින් එම අර්ථය දක්වමින් "සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති'යි කීය.

ඉක්බිති **යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරී** (යම් ඒ ධ්‍යානලාභියකු පිළිබඳව "උපේක්ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සුඛවිහරණ ඇත්තේයයි ආර්යයෝ කියත්ද) යන මෙහි යම් ධ්‍යානයක් හේතුකොට, යම් ධ්‍යානයක් අරබයා බුද්ධාදී ආර්යයෝ ඒ තෘතීයධ්‍යානයෙන් යුත් පුද්ගලයා පිළිබඳව ප්‍රශංසා මුඛයෙන් පවසත්ද, දෙසත්ද, පනවත්ද, පිහිටුවත්ද, විවරණ කෙරෙත්ද, විභාග කෙරෙත්ද, ප්‍රකට කෙරෙත්ද[1] යනු, ප්‍රශංසා කෙරෙතියි අභිප්‍රායයි. කෙසේද යත්, **උපෙක්ඛකො සතිමා සුඛවිහාරී** (උපෙක්ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සුඛවිහරණ ඇත්තේය) යනුවෙනි. ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසේය'යි මෙහි යෝජනා දතයුතුය. කවර හෙයින් ඒ ආර්යයෝ තෘතීයධ්‍යානලාභී පුද්ගලයකු මෙසේ පසසත්ද? එසේ ප්‍රශංසා ලැබීමට සුදුසුවන හෙයිනි. මේ තෘතීයධ්‍යානලාභී තෙමේ වනාහි යම් හෙයකින් ඉතා මිහිරි සුව ඇති, සුවයෙහි පරම කෙළවරට ගිය එම තෘතීයධ්‍යානයෙහි උපෙක්ෂා ඇත්තේ වේද, සුවයයි යන හැඟීමෙන් එය වෙත නොඇදේද, යම් හෙයකින් පීතිය නොඋපදීද, එසේ එළඹසිටි සිහි ඇත්තේය. තවද යම් හෙයකින් ආර්යයනට රුචිවූ ආර්යජනයා විසින් සෙවුනා ලද්දේමවූ, නොකිලිටිවූ සුඛය නාමකායෙන් අනුභව කෙරේද, එහෙයින් ප්‍රශංසාවට සුදුසු වේ. මෙසේ ප්‍රශංසාවට යෝග්‍යවන හෙයින් ඒ ආර්යයෝ ප්‍රශංසාවට හේතුවූ ගුණ ප්‍රකාශ කෙරෙමින් එම තෘතීයධ්‍යානලාභී පුද්ගලයා, උපෙක්ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සුඛවිහරණ ඇත්තේය'යි මෙසේ ප්‍රකාශ කෙරෙති'යි දතයුතුය. **තතියං** යනු ගණන් අනුපිළිවෙළින් තෙවැන්නයි, තෙවනුව සමවදිති'යි හෝ 'තතිය' නම්.

**එකඞ්ගවිප්පහීනං දුවඞ්ගසමන්නාගතං** (එක් අංගයෙකින් තොර වූයේය, අංගදෙකෙකින් සමන්විත වූයේය)යි යම් වචනයක් කියන ලද්දේද, එහි, පීති අංගය ප්‍රහීණ කිරීම් වශයෙන් ඒකංග විප්පහීණතාව දත්යුතුය. මේ පීතිය වනාහි ද්විතීයධ්‍යාන විෂයෙහිදී විතක්කවිචාර යන අංගයන්

(1) අභි. විභංග - Vbh 259

පහවන්නා සේම මෙහි අර්පණාක්‍ෂණයෙහිදීම පහවේ. එහෙයින් ඒ පීති-අංගය මේ තෘතීයධ්‍යාන විෂයෙහිදී ප්‍රහාණාංගයයි කියනුලැබේ. සුඛ, එකාග්‍රතා යන මේ අංග දෙක පමණක් උපදනා හෙයින් ද්‍රුවංගසමන්නාගතතාව දතයුතුය. එහෙයින් විභංගප්‍රකරණයෙහි, ඣානන්ති උපෙක්ඛා සතිසම්පජඤ්ඤං සුඛං චිත්තස්සෙකග්ගතා[1] (ධ්‍යාන යනු උපෙක්ඛා, සති, සම්පජඤ්ඤ, සුඛ, චිත්තෙකග්ගතා යන මෙයයි යමක් කියනලද්දේද, ඒ පිරිවර සහිත ධ්‍යානය දක්වනු පිණිස පර්යාය වශයෙන් කියන ලද්දේය. උපෙක්ඛා, සති, සම්පජඤ්ඤ යන මොවුන් හැර නිෂ්පර්යාය වශයෙන් නීවරණයනට ප්‍රතිපක්‍ෂවූ උපනිධ්‍යානලක්‍ෂණයට (ධ්‍යානය පිළිබඳ අරමුණු මෙනෙහි කිරීමේ ස්වභාවයට) පැමිණි (විතක්ක ආදී) අංගයන්ගේ වශයෙන් මෙය ද්වංග වූයේම වේ. කියන ලදමැයි: කතමං තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති? සුඛං චිත්තස්සෙකග්ගතා[2] (එසමයෙහි කවර නම් ධ්‍යානයෙක් කවර නම් අංගද්වයෙකින් යුක්තවේද? සුඛය, චිත්තෙකග්ගතාය යන මේ අංගද්වය)යි. සෙස්ස ප්‍රථමධ්‍යාන විවරණයෙහි කී නයමයි.

මෙසේ ඒ තෘතීයධ්‍යානය අවබෝධ කළ කල්හිද යට කී නයින්ම පස් ආකාරයෙකින් විෂණවසීභාවයට පැමිණ ප්‍රගුණවූ එම ධ්‍යානයෙන් නැඟී, මේ සමාපත්තිය පීති නම් ප්‍රතිපක්‍ෂ ධර්මයට ආසන්නවූ, "යම්සේ එහි සුඛයයි යන මනස්කාරය වේද, එහෙයින් මෙය ඖළාරිකය'යි කියනු ලැබේය'යි[3] මෙසේ දක්වනලද සුඛය ඖළාරිකවන හෙයින් මෙය දුර්වල අංග ඇත්තේයයි එම තෘතීයධ්‍යානයෙහි දෙස් දක, චතුර්ථ ධ්‍යානය ශාන්ත වශයෙන් මෙනෙහිකොට තෘතීය ධ්‍යානයෙහි රුචිය ඉක්මවා චතුර්ථධ්‍යානය අවබෝධ කරනු පිණිස භාවනානුයෝගය කටයුතුය.

ඉක්බිති යම් කලෙක තෘතීයධ්‍යානයෙන් නැඟී සිහි ඇතිව, සම්‍යග්ඥනයෙන් යුක්තව ධ්‍යානාංගයන් මෙනෙහි කරන යෝගාවචරයාහට චෛතසිකසෞමනස්ස සංඛ්‍යාතවූ සුඛය ඖළාරික වශයෙන් වැටහේද, උපෙක්ඛාවේදනාවද චිත්තෙකග්ගතාවද ශාන්ත වශයෙන් වැටහේද, එකල ඖළාරික අංගය ප්‍රහීණ කිරීම පිණිසද, ශාන්ත අංගය ලබා ගැනීම පිණිසද එම නිමිත්තම "පඨවි, පඨවි" යනුවෙන් නැවත නැවතත් මෙනෙහි කරන යෝගාවචරයාහට 'දැන් චතුර්ථධ්‍යානය උපදිති'යි භවාංගය සිඳගෙන, එම පඨවිකසිණයම අරමුණු කොටගත් මනොද්වාරාවර්ජනය උපදී. ඉක්බිති එම අරමුණෙහිම ජවන් සිත් සතරක් හෝ පහක් උපදී. ඒ

(1) Vbh 260
(2) අභි. විභංග - Vbh 264
(3) දී. නි. බ්‍රහ්මජාල සු. - D i 37

ජවන් සිත් අතුරෙන් අවසන් එක රූපාවචරචතුර්ථධ්‍යානයට අයත් වේ, සෙසු ජවන් සිත් (තුන හෝ හතර) කියනලද නයින්ම කාමාවචර වේ. මේ වනාහි මෙහි වෙනසෙකි: යම් හෙයකින් සුඛවේදනාව ආසෙවනප්‍රත්‍යය වශයෙන් උපෙක්ඛාවේදනාවට ප්‍රත්‍යය නොවන්නේද, චතුර්ථධ්‍යානයෙහිදී උපෙක්ඛාවේදනාව ඉපැදිය යුතුද වන්නේද, එහෙයින් ඒ ජවන්හු උපෙක්ඛාවේදනාවෙන් යුක්ත වෙති, උපෙක්ඛාවෙන් යුක්තවූ හෙයින්ම මෙහිදී පීතිඅංගයද පිරිහේ යතුයි. මෙතෙකින් මේ යෝගාවචර තෙමේ (කායික) සුඛය හා (කායික) දුඃඛය, දුරුවීමෙන්ද, ඉන් පෙරාතුවම සොමනස්සය දෝමනස්සය යන දෙක ඉකුත්වූ හෙයින්ද, දුක් නොවූ සැපද නොවූ උපෙක්ඛා සතියෙන් පිරිසුදුවූ චතුර්ථධ්‍යානය උපදවා වාසය කෙරේ[1]. මෙසේ මේ යෝගාවචරයා විසින් එක් අංගයෙකින් වියුක්තවූ අංගද්වයෙකින් (උපෙක්ඛාය, එකග්ගතාය යන දෙකින්) යුක්තවූ ත්‍රිවිධ කල්‍යාණයෙන් හා දශලක්‍ෂණයෙන් සමන්විතවූ පඨවිකසිණ චතුර්ථධ්‍යානය ලබනලද්දේ වේ.

එහි, **සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා** (සුඛය ද දුඃඛයද පහවීමෙන්) යනු, කායික සුඛයද, කායික දුඃඛයද පහවීමෙනි. පුබ්බෙව යනු චතුර්ථධ්‍යානය ලබන මොහොතෙහි නොව ඉන් පෙරාතුවමයි. **සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා** (සොම්නස් දොම්නස් දෙක ඉකුත් වීමෙන්) යනු, චෛතසික සුඛය චෛතසික දුඃඛය යන මේ දෙක පෙරාතුවම ඉවත්වීමෙනි'යි, පහවීමෙනි'යි කී නියායි. කවර කලෙක ඒ සොමනස්ස දෝ'මනස්'සයන්'ගෙ' ප්‍රහාණය වේද? චතුර්ධ්‍යානයන්'ගෙ' උපචාරක්‍ෂණයෙහිදීය. සෝමනස්සය වනාහි චතුර්ථධ්‍යානය පිළිබඳ උපචාරක්‍ෂණයෙහිදීම ප්‍රහීණ වේ. දුඃඛ, දෝමනස්ස, සුඛ, සෝමනස්ස යන මොවුහු පිළිවෙළින් ප්‍රථම, ද්විතීය, තෘතීය ධ්‍යානයන්ගේ උපචාරක්‍ෂණයෙහිදී ප්‍රහීණ වෙති. ප්‍රහාණක්‍රමයෙන් නොකියනලද, ඉන්ද්‍රිය විභංගයෙහි[2] කියනලද පරිදි ඉන්ද්‍රියයන්ගේ උද්දෙස ක්‍රමයෙන් මෙහිද කියනලද මේ සුඛ, දුඃඛ, සොමනස්ස, දෝමනස්සයන්ගේ ප්‍රහාණය මෙසේ දතයුතුය. ඉදින් මේ සුඛදුඃඛාදී ඉන්ද්‍රියය්න් ඒ ඒ ධ්‍යානය පිළිබඳ උපචාරක්‍ෂණයෙහිදීම ප්‍රහීණ වෙතොත්, කවර හෙයින් "උපන්නාවූ දුඃඛෙන්ද්‍රිය කොතැන්හිදී නිරවශේෂයෙන් නිරුද්ධවේද? මහණෙනි මේ ශාසනයෙහි භික්‍ෂු තෙමේ කාමයන් කෙරෙන් තොරව-පෙ-ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරේද, උපන්නාවූ දුඃඛෙන්ද්‍රිය මෙතන්හිදී නිරවශේෂයෙන් නිරුද්ධ වේ, උපන්නාවූ දෝමනස්සේන්ද්‍රිය-පෙ-සුඛෙන්ද්‍රිය-පෙ-

(1) අභි. ඣාන විභංග - Vbh 245

(2) Vbh 122

සෝමනස්සේන්ද්‍රිය නිරවශේෂයෙන් නිරුද්ධ වේද? මහණෙනි මේ ශාසනයෙහි භික්ෂු තෙමේ සුඛයද ප්‍රහීණ කිරීමෙන්-පෙ-චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙරේද, උපන්නාවූ සොමනස්සේන්ද්‍රිය මෙතන්හිදී නිරුද්ධවේ"[1]යයි මෙසේ ධ්‍යානයන්හිදීම නිරෝධය සිද්ධ වෙතැ'යි කියනලද්දේද? (ධ්‍යානයන්හිදී) අතිශය නිරෝධය සිද්ධවන හෙයිනි. ඒ දුඃඛාදී ඉන්ද්‍රියයන්ගේ අතිශය නිරෝධය ප්‍රථමධ්‍යානාදියෙහිදීම සිදුවේ, හුදු නිරෝධය නොවේ, උපචාරක්ෂණයෙහිදී සිදුවනුයේ හුදු නිරෝධයයි, අතිශය නිරෝධය නොවේ. ඒ එසේමැයි, නානාවර්ජන සහිත ප්‍රථමධ්‍යානොපචාරයෙහිදී මැසිමදුරු ආදීන්ගේ පීඩාවෙන් හෝ විෂම ආසන ආදියෙන් ඇතිවන ගැහැටින් හෝ නිරුද්ධවූද දුඃඛෙන්ද්‍රියයාගේ උපත සිදුවන්නේය, එහෙත් අර්පණාව ඇතුළතදී එසේ නොවන්නේමය, නොහොත් උපචාරයෙහිදී නිරුද්ධවූ දුඃඛෙන්ද්‍රියය මනාකොට නිරුද්ධවූයේ නොවේ, ප්‍රතිපක්ෂ ධර්මයෙන් නොනස්නාලද හෙයිනි. අර්පණාව තුළදී වනාහි පීතිය පැතිරීමෙන් මුළු කය පුරා සුඛය වැදගත්තේ වේ. සුඛය වැදගන්නාලද කය ඇත්තහුගේ දුඃඛෙන්ද්‍රිය මනාකොට නිරුද්ධවූයේ වේ, ප්‍රතිපක්ෂධර්මය විසින් නස්නාලද හෙයිනි. නානාවර්ජන සහිතවූම ද්විතීයධ්‍යානොපචාරයෙහිදී විතක්ක විචාරයන් හේතුකොට හටගත් කායපීඩා චිත්තපීඩා ඇති කල්හි ප්‍රහීණවූද, දෝමනස්සෙන්ද්‍රිය යම්හෙයකින් උපදනේ නමුදු විතක්කවිචාරයන්ගේ අභාවයෙහිදී නොම උපදනේය, යම් තැනෙක උපදනේ නම් ඒ විතක්කවිචාරයන් ඇති තන්හිය. ද්විතීයධ්‍යානොපචාරයෙහි විතක්කවිචාරයෝ අප්‍රහීණයෝම වෙති, එහිදී එම දෝමනස්සෙන්ද්‍රියයාගේ උපත සිදුවන්නේය, ද්විතීයධ්‍යානයෙහිදී සිදු නොවන්'නේ'මය, ප්‍රහීණවූ ප්‍රත්‍යය ඇති හෙයිනි. එසේ'ම තෘතීයධ්‍යානොපචාරයෙහිදී පීතියෙන් උපන් ප්‍රණීත රූපයෙන් ස්පර්ශ කරනලද කය ඇත්තහුට ප්‍රහීණවූද සුඛෙන්ද්‍රියයාගේ උපත සිදුවන්නේය, තෘතීයධ්‍යානයෙහිදී සිදු නොවන්නේමය, තෘතීයධ්‍යානයෙහිදී වනාහි සුඛයට ප්‍රත්‍යවූ පීතිය සකලාකාරයෙන්ම නිරුද්ධ වේ. එසේම චතුර්ථධ්‍යානොප-චාරයෙහිදී ප්‍රහීණවූද සොමනස්සෙන්ද්‍රිය ආසන්නව සිටි හෙයින්ද, අර්පණාවට නොපැමිණි උපෙක්ෂා ඇති හෙයින්ද, එහෙයින්ම (එම සොමනස්සෙන්ද්‍රිය) මනාකොට නො-ඉක්මවූ හෙයින්ද එම සොමනස්සේන්ද්‍රියයාගේ උපත සිදුවන්නේය, චතුර්ථධ්‍යානය තුළදී එසේ සිදු නොවන්නේමය. එහෙයින්ම (මේ පාඨයෙහි) "උපන්නාවූ දුඃඛෙන්ද්‍රියය මෙහිදී (ප්‍රථමධ්‍යානය තුළදී) නිරවශෙෂයෙන් නිරුද්ධ වෙති"යි ආදි වශයෙන් ඒ ඒ ධ්‍යානයෙහි අපරිශෙෂ ග්‍රහණය කරනලදී. මෙහිලා කියන ලදී: එසේ වෙතොත්, ඒ ඒ ධ්‍යානය

---

(1) සං. නි. ඉන්ද්‍රිය සං - S v 213ff.

පිළිබඳ උපචාරාවස්ථාවෙහිදී ප්‍රහීණවූ දුඃඛාදී මේ වේදනාවෝ මෙහිදී කවරහෙයින් ගෙන දක්වන ලද්දහුද? සුඛාවබෝධය පිණිසයි.

මෙහි **අදුක්ඛමසුඛං** යනුවෙන් දුක් නොවූත් සුව නොවූත් යම් මේ (උපෙක්‍ෂා) වේදනාවක් කියන ලද්දේද, එය සියුම්ය, දුර්බෝධය, පහසුවෙන් දතනොහැකිය, එහෙයින්, යම්සේ වනාහි වණ්ඩවූ, කිසිසේත් ලඟට එලඹ අල්වාගත නොහැකිවූ ගොනකු අල්වා ගැනීම පිණිස ගොපල්ලෙක් සියලු ගවයන් එක් ගාලකට රැස්කොට, ඉක්බිති එක් එක් ගවයා පිට කරමින් ඒ ගොනා ළඟට ආවිට "මේ ඒ ගොනාය, ඌ අල්වා ගනිවු'යයි කියමින් ග්‍රහණය කරවාද, එසේම භාග්‍යවතුන් වහන්සේ සුවසේ අවබොධ කරවීම පිණිස මේ සියල්ල ගෙනහැර දැක්වූහ. මෙසේ එක්කොට ගත්තාලද මේ දුඃඛාදී වේදනාවන් දක්වමින් සුඛද නොවූ දුඃඛද නොවූ සොමනස්සද නොවූ දොමනස්සද නොවූ යම් වෙදනාවක් වේද, දුඃඛද නොවූ සුඛද නොවූ මෙය උපෙක්ඛා වේදනායයි අවබෝධ කරවිය හැකිය. තවද, දුඃඛද නොවූ සුඛද නොවූ උපෙක්ඛාසහගත චෙතොවිමුක්තියට ප්‍රත්‍යයවූ ධර්මයන් දක්වනු පිණිසද මේ සියල්ල කියන ලද'යි දතයුතුය. සුඛදුඃඛාදිය පිළිබඳ ප්‍රහාණය ඒ උපෙක්ඛා චෙතෝවිමුක්තියට ප්‍රත්‍යය වේ. කියනලද මැයි, "ඇවැත්නි, අදුඃඛවූ අසුඛදවූ චෙතොවිමුක්තිසමාපත්තියට හේතු සතරෙකි; ඇවැත්නි, මේ ශාසනයෙහි භික්‍ෂු තෙමේ සුඛය පහ කිරීමෙන්ද-පෙ-චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙරේ, ඇවැත්නි, මේ සතර අදුඃඛවූ අසුඛවූ චෙතොවිමුක්ති සමාපත්තියට හේතුවේ.[1] යම්සේ හෝ අන් මහෙක්හිදී ප්‍රහීණකරන ලද්දවූද සක්කායදිට්ඨි ආදිය තෘතීය මාර්ගයෙහි ගුණකථනය පිණිස එම තෘතීය මාර්ගයෙහිදී ප්‍රහීණ වීයයි කියනලද්දේද, එසේම මේ චතුර්ථධ්‍යානයෙහි ගුණකථනය පිණිස ඒ සියල්ල මෙහි කියනලද'යි දතයුතුය. නොහොත්, ප්‍රත්‍යයන් නැසීමෙන් රාගද්වේෂයන් ඉතා දුරබව දක්වනු පිණිසද, මේ සියල්ල මෙහි කියන ලද'යි දතයුතුය. මේ වේදනාවන් අතුරෙන් වනාහි, සුඛය සොමනස්සයටද, සොමනස්සය රාගයටද, දුඃඛය දෙමනස්සයටද, දෙමනස්සය ද්වේෂයටද හේතුවේ. සුඛාදිය නැසීමෙන් ප්‍රත්‍යය සහිත රාගද්වේෂයෝ නසන ලද්දහුය, ඉතා දුරු වූවාහුය.

**අදුක්ඛමසුඛං** යනුවෙන් - දුඃඛාභාවයෙන් අදුඃඛ වේ, සුඛාභාවයෙන් අසුඛයි. මෙයින් මෙහි දක්වෙනුයේ දුඃඛ, සුඛ යන දෙකට ප්‍රතිපක්‍ෂවූ තුන්වැනි (උපෙක්ඛා) වෙදනාවයි, හුදෙක් දුඃඛ සුඛ යන දෙක්හි අභාවමාත්‍රය නොවේ, තුන්වන වෙදනාව නම් අදුඃඛමසුඛ වෙදනාවයි.

(1) ම. නි. මහාවෙදල්ල සූ -M i 296

උපෙක්ඛායයිද කියනු ලැබේ. ඒ උපෙක්ඛාව වූකලී, ඉෂ්ට අනිෂ්ට යන දෙකෙහිම විපරීතය (රුචි, අරුචි යන දෙකටම විරුද්ධ දෙයක්) අනුභව කිරීම ලක්‍ෂණකොට ඇත්තේය, මධ්‍යස්ථතාව රස හෙවත් කෘත්‍යකොට ඇත්තේය, අප්‍රකටබව වැටහීම්කොට ඇත්තේය, සුඛ දුඃඛ නිරෝධය ආසන්නකාරණ කොට ඇත්තේය'යි දතයුතුය.

**උපෙක්ඛාසතිපාරිසුද්ධිං** යනු, උපෙක්ඛාවෙන් ජනිතවූ සතිපාරිසුද්ධියයි. මේ (චතුර්ථ) ධ්‍යානයෙහි වූ ස්මෘතිය ඉතා පිරිසුදු වේ, එම ස්මෘතිය පිළිබඳවූ යම් පාරිසුද්ධියක් වේනම් එය අන් හේතුවෙකින් නොව උපෙක්ඛා හේතුවෙන්ම සිද්ධවේ. එහෙයින් මෙය උපෙක්ඛාසති පාරිසුද්ධියයි කියනු ලැබේ. විභංගයෙහිදඃ මේ ස්මෘතිය මේ උපේක්‍ෂාවෙන් පැහැදිලි බවට පත්වේ, පිරිසුදු වේ, නිර්මලවේ. එහෙයින් එය උපෙක්ඛාසතිපාරිසුද්ධිය'යි වහරනු ලැබෙති'යි(1) කියනලදි. මෙහි යම් උපෙක්ඛාවක් හේතුකොට සතිපාරිසුද්ධිය වේනම්, එය අර්ථවශයෙන් තත්‍රමජ්ඣත්තතායයි දතයුතුය, මෙහිදී එම තත්‍රමජ්ඣත්තතාව හේතුකොට පිරිසුදු වනුයේ හුදෙක් ස්මෘතියම නොවේ, එමනු නොව සියලුම සම්ප්‍රයුක්ත ධර්මයෝ 'සති' යන ශීර්ෂයෙන් දේශනා කරන ලද්දහුය. මෙම උපෙක්ඛාව වූකලී, කිසියම් ප්‍රමාණයෙකින් පහළ ධ්‍යාන තුනෙහිද විද්‍යමාන වේ. යම්සේ වනාහි දහවල හිරුරැසින් මඩනාලද හෙයින් හෝ සෞම්‍යභාවය හේතුකොටගෙන හෝ උපකාරක වශයෙන් යෙදෙන රාත්‍රිකාලය නොලැබීමෙන් හෝ දිවාකාලයෙහි විද්‍යමානවූද චන්‍ද්‍රලේඛාව පැහැදිලි නොවේද, නිර්මල නොවේද, එසේම මෙම තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නමැති චන්‍ද්‍රලේඛාවද විතක්ක ආදී ප්‍රතිපක්‍ෂ ධර්මයන්ගේ බලයෙන් මඩනාලද බැවින් හෝ, උපකාරකවූ උපෙක්ඛාවේදනා නමැති රාත්‍රිකාලය නොලැබීමෙන් හෝ ප්‍රථමාදී ධ්‍යානයන්හිද විද්‍යමානවන නමුදු නොපැහැදිලි වේ. එම තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව පිරිසුදු නොවන හෙයින් සහජාතවූ ස්මෘති ආදියද දහවල නොපැහැදිලි චන්‍ද්‍රලේඛාවෙහි ප්‍රභාව සෙයින් නොපිරිසුදුම වේ. එහෙයින් එම ධ්‍යානයන් අතුරෙන් එකෙකුදු උපෙක්ඛාසතිපාරිසුද්ධිය'යි නොකියනලදි. මෙම චතුර්ථධ්‍යානයෙහිදී වනාහි විතක්ක ආදී ප්‍රතිපක්‍ෂයන්ගේ බලයෙන් නොමඩනාලද හෙයින්ද, උපෙක්ඛා වේදනා නමැති රාත්‍රිකාලය ලැබීමෙන්ද මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නමැති චන්‍ද්‍රලේඛාවෙහි ප්‍රභාව සෙයින් සහජාතවූ ස්මෘති ආදියද පිරිසුදු වේ, නිර්මලද වේ. එහෙයින් මෙම චතුර්ථධ්‍යානයම උපෙක්ඛා සතිපාරිසුද්ධිය'යි කියනලද්දැ'යි දතයුතුය. 'චතුත්ථං' යනු, ගණන් අනුපිළිවෙළින් සිවුවැන්නයි, සිවුවැනිව සමවදිනු ලැබෙති'යි හෝ 'චතුත්ථ' නමි.

(1) Vbh 261

**එකඞ්ගවිප්පයුත්තං ද්වඞ්ගසමන්නාගතං** (එක් අංගයෙකින් අඩුවූ අංගදෙකෙන් සමන්විතවූ) යනුවෙන් යමක් කියන ලද්දේද, එහි සොමනස්සය පහවීම් වශයෙන් එකංගවිප්පහීණතාව දතයුතුය. එම සොමනස්සය වනාහි එක්ම චිත්තවීථියෙහි පූර්වජවනයන්හිදීම ප්‍රහීණවේ, එහෙයින් එම සොමනස්සය මෙම ධ්‍යානයෙහි ප්‍රහාණාංගයයි කියනු ලැබේ. උපෙක්ඛාවේදනා, චිත්තෙකග්ගතා යන මේ දෙකෙහි උත්පත්ති වශයෙන් ද්වංගසමන්නාගතතාව දතයුතුය. සෙස්ස ප්‍රථමධ්‍යාන විවරණයෙහි කී-නයම වේ. මේ වනාහි චතුෂ්ක ධ්‍යාන ක්‍රමයයි.

පංචකධ්‍යානය (ධ්‍යාන පසක් වශයෙන්) නිපදවන්නහු විසින් ප්‍රගුණවූ ප්‍රථමධ්‍යානයෙන් නැඟී, 'මේ සමාපත්තිය අසල්ව සිටි නීවරණ නමැති සතුරන් ඇත්තේය, විතක්කය ඖළාරික වනහෙයින් අංග වශයෙන් දුබලද වේයයි එහි (ප්‍රථමධ්‍යානයෙහි) දෙස් දැක ද්විතීයධ්‍යානය ශාන්ත වශයෙන් මෙනෙහිකොට ප්‍රථමධ්‍යානයෙහි රුචිය ඉක්මවා ද්විතීය ධ්‍යානාධිගමය පිණිස භාවනානුයොගය කටයුතුය. ඉක්බිති යම් කලෙක ප්‍රථමධ්‍යානයෙන් නැඟී සිහි ඇතිව මනාදැනීම් ඇතිව ධ්‍යානාංගයන් ප්‍රත්‍යවේක්‍ෂා කරන ඒ යොගාවචරයාහට විතක්කය පමණක් ඖළාරික වශයෙන්ද විචාරාදී සෙසු අංගයන් ශාන්ත වශයෙන්ද වැටහේ නම්, එකල ඖළාරික අංගය ප්‍රහීණ කිරීම් වශයෙන්ද, ශාන්ත අංගයන් ලබාගැනීම පිණිසද එම නිමිත්තම "පඨවි පඨවි"යයි නැවත නැවතත් මෙනෙහි කරනවිට යටකී නයින්ම ද්විතීයධ්‍යානය උපදී. එම ධ්‍යානයෙහි ප්‍රහාණාංගය වනුයේ විතක්කය පමණෙකි, විචාරාදී සෙසු සතර සමන්නාගතඅංගයි. සෙස්ස යටකී ප්‍රකාරම වේ. මෙසේ එම ධ්‍යානයට පැමිණි කල්හිද යටකී නයින්ම පස් ආකාරයෙන් විෂණවසීභාවයට පැමිණ ප්‍රගුණවූ ද්විතීයධ්‍යානයෙන් නැඟී, මේ සමාපත්තිය අසල්ව සිටි විතක්ක නමැති සතුරා වේ, විචාරය ඖළාරික වනහෙයින් අංග වශයෙන්ද දුබල වේයයි එහි දෙස් දැක තෘතියධ්‍යානය ශාන්ත වශයෙන් මෙනෙහි කොට ද්විතීය ධ්‍යානය කෙරෙහි රුචිය ඉක්මවා තෘතීයධ්‍යානාධිගමය පිණිස භාවනානුයොගය කටයුතුය. ඉක්බිති යම් කලෙක ද්විතීයධ්‍යානයෙන් නැඟී සිහි ඇතිව මනා දැනීම් ඇතිව ධ්‍යානාංගයන් මෙනෙහිකරන ඒ යොගාවචරයාහට විචාරය පමණක් ඖළාරික වශයෙන්ද, පීති ආදී සෙසු අංගයන් ශාන්ත වශයෙන්ද වැටහේද, එකල ඖළාරිකාංගය ප්‍රහීණකිරීම පිණිසද, ශාන්ත අංගයන් ලැබීම පිණිසද එම නිමිත්තම 'පඨවි පඨවි' යනුවෙන් නැවත නැවතත් මෙනෙහි කරනවිට යටකී නයින්ම තෘතීයධ්‍යානය උපදී. එම ධ්‍යානයෙහි විචාරය පමණක් ප්‍රහාණාංගය වේ, චතුෂ්කනයෙහි ද්විතීයධ්‍යානයෙහි මෙන් පීති ආදී

අංග තුන සමන්නාගත අංගයෝ වෙති. සෙස්ස යටකී ප්‍රකාරම වේ. මෙසේ යම් ධ්‍යානයක් චතුෂ්කනයෙහිදී ද්විතීය ධ්‍යානය වේද, එය පංචකනයෙහිදී දෙකක් වශයෙන් බෙදීමෙන් ද්විතීය ධ්‍යානයද තෘතීය ධ්‍යානයද වේ. එම චතුෂ්ක නයෙහිදී යම් කිසිවක් තෘතීය හා චතුර්ථ වේද, එය පිළිවෙළින් චතුර්ථ හා පංචම වේ. ප්‍රථමධ්‍යානය ප්‍රථමම වේ.

**සාධුජන ප්‍රමෝදය පිණිස කරනලද විශුද්ධිමාර්ගයෙහි**
**සමාධිභාවනාධිකාරයෙහි කසිණනිද්දේස නම්**
**සිවුවන පරිච්ඡේදය මෙතෙකින් සමාප්තයි.**

# 5. සෙසකසිණනිද්දෙසය

පඨවිකසිණයට අනතුරුව දැන් ආපොකසිණයෙහි විස්තරකථාව පැවසේ, පඨවිකසිණය මෙන්ම ආපොකසිණයද වඩනු කැමැත්තහු විසින් සුවසේ හිඳගෙන කෘත හෝ අකෘත (පිළියෙළ කරගත් හෝ ස්වාභාවික) ජලයෙහි නිමිති ගතයුතුයයි සියල්ල විස්තර කළයුතුය. මෙහි යම්සේද මතු සියලු තන්හිද එසේමය. මින් මතු මෙතෙකුදු නොපවසා විශේෂයක් ඇතොත් එය පමණක් පවසමු. මෙහිදීද පෙර කළ පුරුදු ඇති පිනැත්තහුට පොකුණෙක වේවයි, විලෙක වේවයි, ලේවායෙක (කලපුවෙක) වේවයි, මුහුදෙහි වේවයි පවත්නා ස්වාභාවික ජලයෙහි නිමිති උපදී, චූලසීව තෙරුන්හට මෙනි. ඒ ආයුෂ්මතුන් වහන්සේ, ලාභසත්කාර හැර විවේකීව වාසය කරන්නෙමි'යි මහතොටින් නැව් නැඟ දඹදිව් යන අතරමඟ මහසමුදුර දෙස බලනවිට එය හා සමඟ බැදි කසිණනිමිති පහළවිය. පෙර නොකළවිරූ පුරුදු ඇත්තහු විසින් සිවු කසිණදෙස් හැර, නීල, පීත, ලොහිත හෝ අවදත වර්ණ ඇති ජලය නොගෙන, පොළොව මත වැටෙන්නට පෙර අහස්හිදීම පිරිසුදු වස්ත්‍රයක් මහින් ලබාගත් වැසිදිය හෝ එබඳු පැහැදි නොකැළඹි අන් ජලයක් හෝ පාත්‍රයෙක හෝ කුණ්ඩ සැළියෙක හෝ මුවවිට සමකොට පුරවා, විහාරභූමිය කෙළවර යටකී ප්‍රකාර ඇති මුවහවූ තැනෙක තබා සුවසේ හිඳගෙන, හුදෙක් වර්ණය හෝ ලක්‍ෂණය මෙනෙහි නොකොට වර්ණය ආපොධාතුවටම අයත් සේ සලකා සමස්ත වශයෙන් ගෙන, උත්සන්න (වැඩි) වශයෙන් ප්‍රචලිත ප්‍රඥප්ති ධර්මයෙහි සිත පිහිටුවා අම්බු, උදක, වාරි, සලිල යන ආදී ආපො (ජලයේ) නාමයන් අතුරෙන් ප්‍රකටනාම වශයෙන්, "ආපො ආපො" යයි භාවනා කළයුතුය. මෙසේ භාවනා කරන ඒ යෝගියාහට අනුක්‍රමයෙන්, යටකී නයින්ම (උග්ගහ, පටිභාග යන) නිමිති දෙක පහළ වේ. මෙහිදී වනාහි උග්ගහනිමිත්ත සැලෙන ආකාරයෙන් වැටහේ, ඉදින් පෙණ බුබුලු මුසු ජලයක් නම් ඒ ආකාරයෙන්ම වැටහේ, කසිණ දෙෂයක් මෙන් දිස්වේ. පටිභාගනිමිත්ත වූකලී ගැහෙන ආකාරයෙන් අහසෙහි තබනලද මිණිතල්වටක් සෙයින්ද, මිණිමුවා කැටපත් තලයක් සෙයින්ද වැටහේ. එම පටිභාගනිමිත්ත වැටහෙනුවා සමගම උපචාරධ්‍යානයටද යටකී නයින්ම චතුෂ්ක-පංචක ධ්‍යානයනටද පැමිණේ.

**ආපොකසිණයයි.**

## තෙජෝ කසිණය

තෙජෝ කසිණය වඩනු කැමැත්තහු විසින්ද (යටකී නයින්ම) ගින්නෙහි නිමිති ගතයුතුය. එහිදී පෙර කළ පුරුදු ඇති පිනැත්තහුට ස්වාභාවික තෙජෝ ධාතුවෙහි, පහන්සිළුවෙක වේවයි, උදුනෙක වේවයි, පාත්‍රා (සෑදීම පිණිස) ගිනියම් කරන තැනෙක වේවයි, ලැව් ගින්නෙක වේවයි, කිසියම් තැනෙක ගිනිදැල් දෙස බලනවිට නිමිති උපදී, චිත්ත ගුත්ත තෙරුන්හට මෙනි. ඒ ආයුෂ්මතුන් වහන්සේ වනාහි දහම් අසන දවස්හි පොහෝගෙට පිවිසි කල්හි පහන්සිළු බලනුවා සමගම නිමිති උපනි. (පෙරපින් නැති) අන් කෙනකු විසින් වනාහි කසිණය සාදගත යුතුය, එහි සාදගන්නා විධිය මෙසේය: සිනිඳු හර ඇති දර පලවා වියලවා කඩ කඩ කොට කපා යෝග්‍යවූ රුක්මුලකට හෝ මඩුවකට හෝ ගොස් පාත්‍රා රත්කරන විට මෙන් ගොඩක් කොට දල්වා බටපැලැල්ලෙක හෝ, සම්කඩෙක හෝ රෙදිකඩෙක හෝ' එක්වියත් සතරඟුල් පමණ සිදුරක් සාදගතයුතුය. එය ඉදිරියෙන් තබා යටකී නයින්ම හිඳගෙන යටින් ඇති කොළ, රොඩු, දර ආදිය හෝ මත්තෙහි ඇති දුම්සුළි හෝ මෙනෙහි නොකොට මැදින් පෙනෙන අතුරු සිදුරු නැති ගිනිකඳෙහි නිමිති ගතයුතුය. නීල පීත යන ආදී වශයෙන් හුදෙක් වර්ණයම මෙනෙහි නොකටයුතුය, උෂ්ණුසුම්බව ආදී ලක්‍ෂණද මෙනෙහි නොකටයුතුය. වර්ණය තෙජෝ ධාතුවට අයත්සේ සලකා සමස්ත වශයෙන් ගෙන උත්සන්න වශයෙන් (වඩාමත් ප්‍රවලිත) ප්‍රඥප්ති ධර්මයෙහි සිත පිහිටුවා පාවක, කණ්හවත්තනි, ජාතවෙද, හුතාසන යන ආදී අග්නිනාමයන් අතුරෙන් ප්‍රකට නම වශයෙන්ම "තෙජෝ තෙජෝ"යි භාවනා වැඩිය යුතුය. මෙසේ භාවනා කරනවිට ඒ යෝගියාහට යටකී නයින්ම අනුපිළිවෙළින් නිමිති දෙක උපදී. එහි උග්ගහනිමිත්ත ගිනිදැල් සිඳී සිඳී වැටෙන ආකාරයෙන් වැටහේ. ස්වාභාවික ගින්නෙහි නිමිති ගන්නහුට කසිණ දෙස් පෙනේ, පෙනෙලි කැබලි හෝ අඟුරුපිඩු හෝ අලු හෝ දුම් හෝ වැටහේ. පටිභාගනිමිත්ත අහස්හි තුබු රත්පලස් කඩක් සෙයින්ද. රන්මුවා තල්වටක් සෙයින්ද, රන් ටැඹක් සෙයින්ද වැටහේ. එසේ වැටහෙනුවා සමගම ඒ භාවනානුයෝගී තෙමේ යටකී නයින්ම උපචාරධ්‍යානයටද, චතුෂ්ක පංචක ධ්‍යානයන්හටද පැමිණේ.

**තෙජෝ කසිණයයි.**

## වායො කසිණය

වායො කසිණය වඩනු කැමැත්තහු විසින් වායුවෙහි නිමිති ගතයුතුය. එයද (සැලෙන වස්තූන්) දකීම් වශයෙන් හෝ (පහස) දැනීම් වශයෙන් හෝ වේ. කියනලදමැයි අටුවාහි:- "වායොකසිණය උගන්නේ වායුවෙහි නිමිති ගනියි, සැලෙන, සසලවන උක් අගක් හෝ හුණ අගක් හෝ, රුක් අගක් හෝ කෙස් අගක් හෝ නිමිති වශයෙන් දකියි, කයෙහි ගැටෙන සුළඟ හෝ නිමිති වශයෙන් ගනියි.[a]

එහෙයින් මුදුන් සමව සිටි ගනව වැඩුණ පත් ඇති උක්පදුරක් හෝ, හුණපදුරක් හෝ, ගසක් හෝ, සතරඟුල් පමණ ගන කෙස් ඇති පුරුෂයකුගේ හිස හෝ සුළඟින් සැලෙනු දක, මේ වාතයයි, මෙතැන වාතය ගැටෙයි යනුවෙන් සිහිය පිහිටුවා, නැතහොත්, කවුළු අතරින් හෝ බිත්ති සිදුරෙකින් හෝ වාතය පිවිස තමාගේම කයෙහි කිසියම් පෙදෙසක වදියි නම්, එහි හෝ සිහිය පිහිටුවා වාතය මාරුතය, අනිලය යන ආදී වාතනාමයන් අතුරෙන් ප්‍රකට නම වශයෙන් "වායො වායො" යනුවෙන් භාවනා වැඩියයුතුය. මෙහි උග්ගහනිමිත්ත උදුනෙන් බාගත් කෙණෙහි කිරිබතෙක හුමාලවැටි සෙයින් චංචලව වැටහේ, පටිභාගනිමිත්ත වනාහි (නිවුණු කිරිබතින් නැගෙන මඳ හුමාලය මෙන්) සන්සුන්ව නිසලව වැටහේ. සෙස්ස යටකී නයින්ම දතයුතුය.

**වායො කසිණයයි.**

## නීල කසිණය

ඉන් අනතුරුව "නීලකසිණය උගන්නේ නිල් පැහැති මලෙක හෝ, වස්ත්‍රයෙක්හි හෝ වර්ණධාතුවෙක්හි හෝ ඇති නීලවර්ණයෙහි නිමිති ගනී" යන වචනයෙන් පෙර කළ පුරුදු ඇති පිනැත්තහුට එබඳු මල්පඳුරක් හෝ පූජා ස්ථානයෙක්හි ඇති මල් ඇතිරියක් හෝ නීලවර්ණ වස්ත්‍ර, මණි ආදිය අතුරෙන් කිසියම් වස්තුවක් හෝ දුටුමතින්ම නිමිති උපදී, එසේ පෙර කළවිරු පුරුදු නොමැත්තහු විසින් නිල් උපුල් නිල් කටරොළු ආදි මල් ගෙන කෙසුරු හෝ නටු නොපෙනෙන සේ සුමුඟු පියනක් හෝ කරඬු පියන් පතක් හෝ මල් පෙතිවලින්ම පුරවා සමකොට ඇතිරිය යුතුය. නිල්වන් රෙදි කඩෙකින් වණ්ඩුවක් හෝ බැඳ පිරවියයුතුය. නොහොත් මුවවිට බෙර ඇසක් සෙයින් සමව සිටින සේ බැඳිය යුතුය, නැතහොත් ලොහොමල (පල්ලමාණික්කම්) නිලය, කොළනිලය, අඳුන්

(a) මහා අට්ඨකථා

නිලය යන මේවා අතුරෙන් කිසියම් ධාතුරාගයෙකින් (ස්වාභාවික වර්ණයෙකින්) පඨවිකසිණයෙහිදී කී-නයින් ගෙනයාහැකිවනසේ හෝ බිත්තියෙක හෝ කසිණ මණ්ඩලය සද වෙනස් වර්ණයෙන් පිරිසිදිය යුතුය. ඉක්බිති පඨවිකසිණයෙහි කීලෙසින් "නීලං, නීලං" යනුවෙන් මෙනෙහි කළයුතුය. මෙහිද උග්ගහනිමිත්තේදී කසිණ දෙස් පැනේ, කෙසුරු, නටු, පෙති, යන මෙහි අතරතුර ආදිය පැනේ. පටිභාගනිමිත්ත කසිණ මණ්ඩලයෙන් මිදුණුවිට පවා අහස්හි නැගි මිණිතල්වටක් සෙයින් වැටහේ. සෙස්ස යටකී නයින්ම දතයුතුය.

**නිල කසිණයයි.**

## පීත කසිණය

පීත කසිණයෙහිද මේ ක්‍රමයමයි, කියනලදමැයි:- "පීතකසිණය උගන්නේ මල්හි හෝ වස්ත්‍රයෙක්හි හෝ ධාතුරාගයෙහි (ස්වාභාවික වරණාලේපයෙහි) හෝ ඇති පීතවර්ණයෙහි නිමිති ගනී.[1] එහෙයින් මෙහිදීද පෙර කළ පුරුදු ඇති පිනැත්තහුට එවන් පැහැ ඇති මල් පිපුණු ගසක් හෝ, මල් ඇතිරියක් හෝ පීතවර්ණ වස්ත්‍රය, ධාතුරාගය යන මේදැ'තුරින් එකක් හෝ දුටුමතින්ම නිමිති උපදී, චිත්තගුත්ත තෙරුන්හට මෙනි. ඒ ආයුෂ්මතුන් වහන්සේට චනාහි, සිතුල්පව්වෙහි පතහිමලින් කළ ආසනපූජාවක් දක, දුටුවා හා සමගම ආසන පමණවූ නිමිති පහළ විය. පෙර පුරුදු නැත්තහු විසින් කිණිහිරිමල් ආදියෙන් හෝ රන්වන් වස්ත්‍රයෙකින් හෝ හිරියල් ආදී ධාතුරාගයෙකින් හෝ නීලකසිණයෙහි කී-නයින්ම කසිණය සාදගෙන "පීතකං පීතකං" යනුවෙන් මනස්කාරය පැවැත්විය යුතුය. සෙස්ස එලෙසම වේ.

**පීතකසිණයයි.**

## ලොහිත කසිණය

ලොහිත කසිණයෙහිද මේ නයම වේ, කියනලදමැයි: ලොහිතකසිණය උගන්නේ මල්හි හෝ වස්ත්‍රයෙක හෝ (සුවඟුරු, දැහිඟුල් ආදී) ධාතුරාගයෙහි හෝ ඇති රත් පැහැයෙහි නිමිති ගනී.[2] එහෙයින් මෙහිද පෙර පුරුදු ඇති පිනැත්තහුට එවන් මලින් ගැවසීගත් බඳුවද

(1) මහා අට්ඨකථා
(2) මහා අට්ඨකථා

ආදී මල් ගසක් හෝ මල් ඇතිරියක් හෝ රත් පැහැ ඇති වස්ත්‍ර, මණිආදිය අතුරෙන් කිසිවක් හෝ දුටුමතින්ම නිමිති උපදී. අවශේෂ ජනයා විසින් ජයසුමන බඳුවද, රත්කරඩු ආදී මලින් හෝ රත් පැහැති වස්ත්‍රයෙකින් හෝ ධාතුරාගයෙකින් හෝ නීලකසිණයෙහි කී-නයින්ම කසිණය සාදගෙන, "ලොහිතකං ලොහිතකං" යනුවෙන් මනස්කාර පැවැත්විය යුතුය. සෙස්ස එලෙසම වේ.

**ලෝහිත කසිණයයි.**

## ඔදාත කසිණය

ඔදාත කසිණයෙහිද, ඔදාතකසිණය උගන්නේ මල්හි හෝ වස්ත්‍රයෙක්හි හෝ වර්ණධාතුවෙක්හි ඇති සුදු පැහැයෙහි නිමිති ගනී[1]යයි කීහෙයින් පෙරපුරුදු ඇති පිනැත්තහුට එවන් මල් පිපීගිය ගසක් හෝ ඉද්ද සමන් ආදී මල් ඇතිරියක් හෝ කුමුදු, සුදුනෙළුම් ආදී මල් ගොඩක් හෝ සුදුපැහැ පිළියක් හෝ (මකුලු ආදී) ධාතුරාගයක් හෝ යන මේ කිසියම් වස්තුවක් දකිනුවා හා සමගම නිමිති උපදී. ඊයම් මඩුලු, රිදී මඬුලු, සඳමඬුලු යන මේවායෙහිද උපදීමයි. අවශේෂ ජනයා විසින් යටකී ප්‍රකාර ඇති මලින් හෝ සුදු පැහැති පිළියෙන් හෝ ධාතුරාගයෙකින් හෝ නීලකසිණයෙහි කී ලෙසින්ම කසිණය සාදගෙන, "ඔදාතං ඔදාතං" යනුවෙන් මනස්කාරය පැවැත්විය යුතුය. සෙස්ස එලෙසම වේ.

**ඔදාත කසිණයයි.**

## ආලොකකසිණය

ආලොකකසිණයෙහිදී වනාහි, "ආලොක කසිණය උගන්නේ බිතු සිදුරෙක්හි හෝ යතුරු කපොල්ලෙක හෝ කවුළු විවරයෙක හෝ දිස්වන ආලෝකයෙහි නිමිතිගනී[2]යයි කීහෙයින් පෙර කළ පුරුදු ඇති පිනැත්තහුට බිතුසිදුරු ආදිය අතුරින් යම්කිසිවක් මහින් සූර්යාලෝකය හෝ චන්ද්‍රාලෝකය පිවිස බිත්තියෙක හෝ බිම හෝ යම් මණ්ඩලයක් සැදේද, ඝනසරුවට වැඩුණු පත් ඇති රුකෙක අතු අතරින් හෝ ඝනසරුවට වැඩුණු අතු ඇති වදුලක් අතරින් හෝ නික්ම බිම මණ්ඩලයක් සැදේද, එය දකිනුවා හා සමගම නිමිති උපදී. අවශේෂ ජනයා විසින් එකී ප්‍රකාර ඇති ආලෝක මණ්ඩලයක්ම "ඔභාසො ඔභාසො" යනුවෙන්

(1) මහා අට්ඨකථා
(2) මහා අට්ඨකථා

හෝ "ආලොකො ආලොකො" යනුවෙන් හෝ වැඩිය යුතුය. එසේ නොහැකි වෙතොත්, කළයක් තුළ පහනක් දල්වා මුවවිට වසා එහි සිදුරක් කොට බිත්තියක් ඉදිරියෙන් තැබිය යුතුය. එම සිදුරෙන් පහන් එළිය නික්ම බිත්තියෙහි මණ්ඩලයක් සැදේ, එය 'ආලොකො ආලොකො' යනුවෙන් වැඩිය යුතුය. මෙය සෙසු මණ්ඩලවලට වඩා වැඩි වේලාවක් පවත්නේය. මෙහි උග්ගහනිමිත්ත බිත්තියෙහි හෝ බිම හෝ සැදෙන මණ්ඩලය හා සමානම වේ, පටිභාගනිමිත්ත ඝනවූ විශේෂයෙන් ප්‍රසන්නවූ ආලෝක පුංජයක් සදිසිම වේ. සෙස්ස යටකී ප්‍රකාරම වේ.

**ආලෝකකසිණයයි.**

## පරිච්ඡින්නාකාශකසිණය

පරිච්ඡින්නාකාසකසිණයෙහිදීද "ආකාසකසිණය උගන්නේ බිතු සිදුරෙක හෝ යතුරු කපොල්ලෙක හෝ කවුළු විවරයෙක හෝ පෙනෙන ආකාශයෙහි නිමිති ගනී"යි කීහෙයින් පෙර කළ පුරුදු ඇති පිනැත්තහුට බිතුසිදුරු ආදී යම් කිසිවක් දුටු මතින්ම නිමිති උපදී. අවශේෂ ජනයා විසින් මනාකොට සෙවිලි කළ මඩුවෙක හෝ සම්, බටපැලලි ආදී කිසියම් වස්තුවෙක හෝ එක් වියත් සතරඟුල් පමණ සිදුරක් කොට නැතහොත් එම බිත්ති සිදුරු ආදියම ආකාසො ආකාසො යනුවෙන් වැඩිය යුතුය. මෙහි උග්ගහනිමිත්ත බිතුකෙළවර හා සමග ඇති සිදුරු බඳුම වේ. වඩනු ලබනුයේද නොවැඩේ. පටිභාගනිමිත්ත වනාහි ආකාශමණ්ඩලය මෙන්ම වැටහේ. වඩනු ලබනුයේ වැඩේ. සෙස්ස පඨවිකසිණයෙහි කී-නයින්ම දතයුතුය.

**පරිච්ඡින්නාකාශකසිණයයි.**

ඉති කසිණානි දසබලො-දස යානි අවොච සබ්බධම්මදසො
රූපාවචරම්හි චතුක්ක - පඤ්චකජ්ඣානහෙතූනි

එවං තානි ච තෙසඤ්ච - භාවනානයම්මං විදිත්වාන
තෙස්වෙව අයං භීයො - පකිණ්ණකකථාපි විඤ්ඤෙය්‍යා.

මෙසේ දශබලධාරීවූ සියලු ධර්මයන් දක්නාවූ සම්බුද්ධයන් වහන්සේ රූපාවචරභූමියෙහි චතුෂ්ක පංචකධ්‍යානයනට හේතුවූ යම් දසකසිණයක් කීසේක්ද,

ඒ දසකසිණයන්ද, එම කසිණයන් පිළිබඳ මේ භාවනාක්‍රමයද දත, යළිදු එම දසකසිණයන් කෙරෙහිමවූ මේ ප්‍රකීර්ණක කථාවද දතයුතුය.

මේ කසිණයන් අතර පඨවිකසිණ වශයෙන්, එකෙක්වද බොහෝ ආකාර ඇත්තේ වේ යන ආදී ස්වභාවය, අහසෙහි හෝ දියෙහි හෝ පොළොව මවා ඊමත පිය තබා ගමන් කිරීමය, සිටීම් හිඳීම් කිරීමය, පරිත්ත වශයෙන් හෝ අප්පමාණ වශයෙන් අභිභායතනයන් ලැබීමය යන මේ ආදිය සිද්ධ වේ. ආපොකසිණ වශයෙන්, පොළොවෙහි මතුවීමය, කිමිදීමය, ජල වැසි ඉපැදවීමය, ගංගා මුහුදු ආදිය මැවීමය පෘථිවි, පර්වත ප්‍රාසාදදිය කම්පා කරවීමට සමත් බවය යන ආදිය සිද්ධවේ. තෙජොකසිණ වශයෙන් දුම් නිකුත් කිරීමය, ගිනි මෙන් දිලීමය, අඟුරු වැසි ඉපැදවීමය, තමාගේ තේජසින් අනෙකාගේ තේජස මැඩලීමය, යම් දෙයක් දවාලනු කැමැති වෙතොත් එය දවාලීමට සමත් බවය, දිව්‍යසින් රූපයන් බැලීම පිණිස ආලෝක දනවීමය, පිරිනිවන් සමයෙහි තේජෝධාතුවෙන් සිරුර දවා යාමය යන මේ ආදිය සිද්ධ වේ. වායො කසිණ වශයෙන් වාතගමන මෙන් ශීඝ්‍ර ගමන් ඇති බවය, සුළං වැසි ඉපැදවීමය, යන මේ ආදිය සිද්ධ වේ. නීලකසිණ වශයෙන් නිල්වන් රූ මැවීමය, අඳුරු ඇතිකරවීමය, සුවර්ණ දුර්වර්ණ වශයෙන් අභිභායතන ධ්‍යානයන් ලැබීමය, ශුභ විමොක්ෂාධිගමය යන මේ ආදිය සිද්ධ වේ. පීතකසිණ වශයෙන් රන්වන් රූ මැවීමය, රන්බවට පත් වේවා'යි යන අධිෂ්ඨානය, (යට නීලකසිණයෙහි) කී නයින්ම අභිභායතනලාභය, ශුභවිමොක්ෂාධිගමය යන මේ ආදිය සිද්ධ වේ. ලොහිතකසිණ වශයෙන් රත්පැහැ රූ මැවීමය, යටකී නයින්ම අභිභායතනයන් ලැබීමය ශුභවිමොක්ඛාධිගමය යන මේ ආදිය සිද්ධ වේ. ඔදාතකසිණ වශයෙන්, සුදුවන් රූ මැවීමය, ථිනමිද්ධය දුරු කරනු පිණිස අඳුරු වැනසීමය, දිව්‍යසින් රූප දකීම පිණිස ආලොක කරණය, යන මේ ආදිය සිද්ධ වේ. ආලොකකසිණ වශයෙන් දිලිසෙන රූ මැවීමය, ථිනමිද්ධය දුරලීමය, අඳුරු නැසීමය, දිව්‍යසින් රූප දකීම පිණිස ආලොකකරණය, යන මේ ආදිය සිද්ධ වේ. ආකාසකසිණ වශයෙන් මුවහවූ වස්තූන් ගෙනහැර පෑමය, පෘථිවි, පර්වත ආදිය ඇතුළත පවා අහස් මවා ඉරියවු පැවැත්වීමය, බිත්ති ආදිය හරහා නොපැකිල යාහැකිවීමය, යන මේ ආදිය සිද්ධ වේ. සියලුම කසිණයෝ උඩය, යටය, සරසය, දෙකක් නොවන බවය, පමණ නැති බවය යන මේ ප්‍රභේදයන් ලබති. කියන ලදමැයි: "එක් පුද්ගලයෙක් පඨවිකසිණය උඩය, යටය, සරසය, දෙකක් නැත, පමණ නැත යනුවෙන් හඳුනාගනී[1] යන ආදියයි. එහි උඩ (උද්ධං) යනු, ඉහළ ආකාශතලයට අභිමුඛවයි, යට (අධො) යනු, පහළ

(1) ම.නි. මහාසකුලුදායි සූ - M ii 14

පොළෝ තලයට අභිමුඛවයි, සරස (තිරියං) යනු, කෙෂත්‍ර මණ්ඩලයක් ලෙසින් හාත්පස පිරිසිඳීමෙනි. එක් පුද්ගලයෙක් කසිණය උඩු අතටද, එක් පුද්ගලයෙක් යටි අතටද, තවත් පුද්ගලයෙක් හාත්පස වශයෙන්ද වඩයි. ඒ ඒ කාරණයෙන් හෝ මෙසේ පතුරුවයි, දිවැසින් රූ දකිනු කැමැත්තකු ආලෝකය පතුරුවන්නා සේය. එහෙයින් "උද්ධං අධො තිරියං"යයි කියනලදි. 'අද්වයං' යන මෙය එක් එක් කසිණයක් අනෙක් අනෙක් කසිණයක් බවට නොඑළඹෙන බව දක්වනු පිණිස කියන ලදි. යම්සේ ජලයට පිවිසියහුට සියලු දෙසින් ජලයම මිස අනෙකක් නොවන්නේද, එසේම පඨවිකසිණය (අන් කසිණයක් නොව) පඨවිකසිණයම වේ, එය වෙනෙකක් බවට හැරීමක් නැත. සියලු තන්හිම මෙම නයයි. "අප්පමාණං" යන මෙය කසිණය පැතිරීම පමණ නැතිබව හැඟවීම පිණිස කියනලදි. එය වනාහි සිතින් පැතිරෙනුයේ සියලු තන්හි පැතිරේ, මේ මෙහි මුලයි, මේ මැදයි, යන ලෙසින් පමණ නොගනියි. "යම් ඒ සත්ව කෙනෙක් කර්මාවරණයෙන් යුක්තවූවාහුද, ක්ලෙශාවරණයෙන් හෝ යුක්තවූවාහුද, විපාකාවරණයෙන් හෝ යුක්ත වූවාහුද, සැදැහැ නැත්තාහුද, (ප්‍රතිපත්තිධර්මයෙහි) රුචි නැත්තාහුද, යහපත් ප්‍රඥා නැත්තාහුද, කුශලධර්මයන් කෙරෙහි මනාව පිළිපැදීමයයි කියනලද නියාමධර්මයට පැමිණිය නොහැක්කෝය"[1]යි කියන ලද්දාහුද, ඔවුනතුරෙන් එකකුට හෝ එක් කසිණයෙක්හිදු භාවනාව සමෘද්ධ නොවේ. එහි කර්මාවරණයෙන් යුක්තවූවාහු නම් ආනන්තරිය කර්ම ඇත්තාහුය. ක්ලෙශාවරණයෙන් යුක්තවූවාහු නම්, නියත මිථ්‍යාදෘෂ්ටිකයෝද, උභතොබ්‍යඤ්ජනකයෝ හා නපුංසකයෝද යන මොහුය. විපාකාවරණයෙන් යුක්තවූවාහු නම් අහෙතුක ද්විහෙතුක ප්‍රතිසන්ධි ඇත්තාහුය, සැදැහැ නැත්තාහුය යනු, බුද්ධාදීන් කෙරෙහි සැදැහැ නැත්තෝය. අච්ඡන්දික යනු, සන්මාර්ග ප්‍රතිපත්තියෙහි රුචි නැත්තෝය, ප්‍රඥා නැත්තාහුය යනු, ලෞකික ලොකොත්තර සම්‍යග්දෘෂ්ටියෙන් හීන වූවෝය, නියාමධර්මයට බැස ගැනීමට නොහැක්කෝය යනු, කුශලධර්මයන් කෙරෙහි නියාමයයි කියනලද, සම්‍යක්ස්වභාවයයි කියනලද, ආර්යමාර්ගයට අවතීර්ණ වීමට නොසුදුස්සෝය. හුදෙක් කසිණ විෂයෙහි නොව සෙසු කර්මස්ථාන විෂයයෙහිද මොවුනතුරෙන් එකකුට හෝ භාවනාව සමෘද්ධ නොවේ. එහෙයින් විපාකවරණයෙන් මිදුණාවූද කුලපුත්‍රයා විසින් කර්මාවරණයද ක්ලෙශාවරණයද දුරින් දුරු කොට සද්ධර්මශ්‍රවණසත්පුරුෂසේවනාදියෙන් ශ්‍රද්ධා, ඡන්ද, ප්‍රඥා යන මේවා වඩා කර්මස්ථානයෝගයෙහි උත්සාහ කටයුතුය.

**සාධුජන ප්‍රමොදය පිණිස කරනලද විශුද්ධිමාර්ගයෙහි සමාධිභාවනාධිකාරයෙහි සෙසකසිණ නිද්දෙස නම්වූ පස්වන පරිච්ඡේදය මෙතෙකින් සමාප්තයි.**

(1) අභි. විභංග - Vbh 341

# 6. අශුභකම්මට්ඨානනිද්දේසය

කසිණයනට අනතුරුව දක්වන ලද "උද්ධුමාතකය, විනීලකය, විපුබ්බකය, විච්ඡිද්දකය, වික්ඛායිතකය, වික්ඛිත්තකය, හතවික්ඛිත්තකය, ලොහිතකය, පුළවකය, අට්ඨිකය" යන[1] දශවිධ අවිඤ්ඤාණක අශුභයන් අතුරෙන්, ජීවිතක්ෂයයෙහි පටන්, වාතයෙන් පිම්බෙන හස්ත්‍රාවක් (මයිනාසමක්) මෙන්, ක්‍රමයෙන් නැඟී ආ පිම්බුණු ස්වභාවය හේතුකොටගෙන ඉදිමීගිය හෙයින් උද්ධුමාත නම්, උද්ධුමාතයම (ස්වාර්ථ 'ක'-ප්‍රත්‍යය යෙදීමෙන්) උද්ධුමාතක නම්ද වේ, පිළිකුල්බව හේතුකොටගෙන ගර්හිත වූයේ හෝ (කුත්සිතාර්ථ ක-ප්‍රත්‍යය යෙදීමෙන් හෝ) උද්ධුමාතය උද්ධුමාතක නම් වේ, එබඳු ස්වභාවයට පත් මළ සිරුරට මේ අධිවචනයි. විවර්ණවූ මළ සිරුර විනීල නම්, විනීල යනුම (ස්වාර්ථයෙහි) විනීලක නම්වේ, පිළිකුල් බවින් ගර්හිතවූයේ හෝ (කුත්සිතාර්ථයෙහි) විනීලකනම් වේ. මාංශය උස්ව පිහිටි තන්හි රත් පැහැයෙන්ද, පූයා එක්රැස්වූ තන්හි සුදු පැහැයෙන්ද, බොහෝසෙයින්ම නිල් පැහැයෙන්ද යුත් නීලවර්ණ ස්ථානයෙහි නීලවර්ණ වස්ත්‍රයක් පෙරවගත් විලාශයෙන් දිස්වන මළසිරුරට මේ අධිවචනයි. කැඩී බිඳී ගිය තන්හි වැගිරෙන පූයා සහිත මළසිරුර විපුබ්බ නම්, විපුබ්බ යනුම විපුබ්බක නම්ද වේ. පිළිකුල්බවින් කුත්සිතවූ හෙයින් හෝ විපුබ්බක නම් වේ. එබඳු මළසිරුරට මේ අධිවචනයි.

දෙකඩව බිඳීයාමෙන් වෙන්වූයේ විච්ඡිද්ද'යි කියනු ලැබේ, විච්ඡිද්ද යනුම විච්ඡිද්දක වේ. පිළිකුල්බවින් කුත්සිතවූ හෙයින් හෝ විච්ඡිද්දක නම්වේ, මැදින් දෙකඩවී ගිය මළ සිරුරට මේ අධිවචනයි. බලු කැණහිල් ආදීන් විසින් එතැනින් මෙතැනින් නොයෙක් ලෙසින් කාදමන ලද්දේ වික්ඛායිත නම්, වික්ඛායිත යනුම වික්ඛායිතක නම් වේ, පිළිකුල්බවින් කුත්සිතවූ හෙයින් හෝ වික්ඛායිතක නම්වේ, ඒ ආකාර ඇති මළසිරුරට මේ අධිවචනයි. නොයෙක් ලෙසින් විසිරී ගියේ වික්ඛිත්ත නම්, වික්ඛිත්තයම වික්ඛිත්තක නම් වේ, පිළිකුල් බවින් කුත්සිත වූ හෙයින් හෝ වික්ඛිත්තක නම්වේ, අත එක් තැනෙකය, පය අන් තැනෙකය, හිස තවත් තැනෙකය, මෙසේ ඒ ඒ තැන විසිරී කපන කොටන ලදුව එලෙසින්ම විසිරී ගියේ හතවික්ඛිත්තක නම්, කාකපාද සලකුණෙහි ආකාරයට (පහර දෙකකින්) අහපසහ ශස්ත්‍රයෙන් කපා කොටා යටකී ලෙසින්ම විසුරුවනලද මළසිරුරට මේ අධිවචනයි. ලෙහෙ ගලති'යි, විසිරෙති'යි, ඒ ඒ තැන වැගිරෙති'යි හෝ ලොහිතක නම්, වැගිරෙන ලෙයින් වැකුණු මළසිරුරට

(1) අභි. ධම්මසංගනි

මේ අධිවචනයි. පණුවනට 'පුළව'යයි කියනුලැබේ, පණුවන් විසිරෙති'යි පුළවක නම්, පණුවන් ගැවසුණ මළසිරුරට මේ අධිවචනයි. 'අට්ඨි' යනුම 'අට්ඨික' නම්, පිළිකුල්බවින් කුත්සිතවූයේ හෝ අට්ඨික නම්වේ, ඇටසැකිල්ලටද, එක් එක් ඇටයකටද මේ අධිවචනයි. මෙකී උද්ධුමාතකාදිය නිසා උපන් නිමිතිද, එම නිමිති හේතුකොට ලබාගන්නාලද ධ්‍යානයන්ද ඒ ඒ නමින්ම වහරති.

එහි, උද්ධුමාතක ශරීරයෙහි උද්ධුමාතක නිමිති උපදවා උද්ධුමාතකයයිම කියනුලබන ධ්‍යානය වඩනුකැමැති යෝගාවචරයා විසින් යට පඨවිකසිණයෙහි කීනයින්ම, කියනලද ප්‍රකාර ඇති ආචාර්යවරයකු වෙත එළඹ කමටහන් උගතයුතුය, කමටහන් කියන එම ආචාර්යවරයා විසින් අසුභනිමිති සඳහා යන පිළිවෙළ, හාත්පස නිමිති සැලකීම, එකොළොස් ආකාරයෙකින් නිමිති ගැනීම, යන එන මඟ ගැන මෙනෙහි කිරීම, ආදී වශයෙන් අර්පණා විධානය අවසන් කොට ඇති සියල්ල ඒ යෝගාවචරයාහට කියාදියයුතුය. යෝගාවචරයා විසින්ද ඒ සියල්ල මනාසේ උගෙන, යටකී ප්‍රකාර ඇති සේනාසනයකට පැමිණ උද්ධුමාතක නිමිත්තක් සොයමින් එහි වාසය කළයුතුය. මෙසේ වාසය කරන්නහු විසින්ද, අසුවල් ගම්දෙර හෝ වනය අබියස හෝ, මාර්ගය අසල හෝ, පවුපාමුල හෝ, රුක්මුල හෝ, සොහොන්පලෙහි හෝ, උද්ධුමාතක මළසිරුරක් දමා ඇතැ'යි කියන්නන්ගේ එම වචන අසා වුවද, නොතොටින් (එතෙරවීම පිණිස ගඟට) පනින්නකු ලෙසින් එක්වරම නොයායුතුය. කවර හෙයින්දයත්, මෙම අසුභය වූකලී වනසිවුපාවුන් විසින්ද අමනුෂ්‍යයන් විසින්ද අරක්ගන්නා ලද්දක් විය හැකිය, එහිදී ඔහුගේ ජීවිතයට පවා විපත් සිදුවිය හැකිය. මෙහි යන මාර්ගයද ගම්දෙරින් හෝ, නහනතොටින් හෝ, කුඹුරු කෙළවරින් හෝ වියහැකිය, එහිදී අහිතකර රූපයන් මුණගැසිය හැකිය, එම මළ සිරුරම වුවද අහිතකර වියහැකිය. පුරුෂයකුට ස්ත්‍රී ශරීරයද ස්ත්‍රියකට පුරුෂශරීරයද විසභාග (අහිතකර) වේ. මෑදුන් මළ හෙයින් එම සිරුර සුබ වශයෙන් වැටහිය හැකිය, මෙසේ ඔහුගේ බ්‍රහ්මචර්යයටද එය හානිකර වියහැකිය. ඉදින් 'මාවැන්නකුට මෙය බැරෑරුම් නොවෙති'යි තමා ගැන සිතාගත හැකි වෙතොත්, එසේ සිතාගත හැක්කහු විසින් යායුතුය. එසේ යනවිටද සංඝස්ථවිරයන්හට හෝ අන්කිසි ප්‍රමුඛ භික්ෂු කෙනකුට හෝ දන්වා යායුතුය, කවර හෙයින්දයත්? ඉදින් ඒ සොහොන් පලෙහිදී අමනුෂ්‍යයන්ගේ හෝ සිංහව්‍යාඝ්‍රාදීන්ගේ රූප ශබ්ද ආදී අනිටු අරමුණුවලින් මඩනාලදුව ඒ යෝගාවචරයාගේ අඟපසඟ වෙවුලන්නට වුවහොත්, බුදිනලද ආහාර පවා දරා සිටිනු නොහැකි වුවහොත්,

අත්කිසි ආබාධයක් හෝ වුවහොත්, එවිට එම සංඝස්ථවිරයන් වහන්සේ ඔහුගේ පාසිවුරු විහාරයෙහි සුරැකිකොට තබනු ඇත, තරුණ භික්ෂූන් හෝ සාමණේරරභික්ෂූන් හෝ එහි යවා එම යෝගාවචර භික්ෂුව පිළිදගවනු (උවටැන් කරවනු) ඇත. එමතු නොව, සොහොන නම් සැක නොකරන තැනෙකැ'යි හඟිමින් සොරකම් කළ හෝ නොකළ සොරු එහි රැස්වෙති, ඔවුහු මිනිසුන් විසින් ලුහුබඳනා ලද්දහු භික්ෂුව වෙත බඩු දමා පලා යෙති, මිනිස්සු බඩුත් සමග සොරු දුටුමු'යි භික්ෂුව අල්වාගෙන ගහට කරති, එවිට වෙහෙරවැසි තෙරුන්, 'මොහුට ගහට නොකරවු, මොහු මට කියා මෙනම් කාර්යයක් සඳහා ගියේය'යි දන්වා ඔහු මුදවාගනු ඇත. මේ වනාහි දන්වා යාමෙහි ආනිසංසයි. එහෙයින් යටකී ප්‍රකාර ඇති භික්ෂු කෙනකුට දන්වා, අසුභනිමිති දැකීමේ අභිලාෂ ඇති යෝගාවචරවයා විසින්, ක්ෂත්‍රියයකු අභිෂේකස්ථානයට, යාගකරන්නකු යඥශාලාවට, නිර්ධනයකු නිධානස්ථානයකට යන ලෙසින් සතුටු සොම්නස් උපදවාගෙන අටුවායෙහි කියනලද නියායෙන් යායුතුය. කියනලද මැයි: "උද්ධුමාතක නම් අසුභ නිමිත්ත උගන්නේ හුදකලාව, දෙවැන්නකු නැතිව, එළඹ සිටි නුමුළා සිහියෙන් යුක්තව, ඇතුළතට නැඹුරු ඉඳුරන් ඇතිව, පිටතට යොමු නොවූ මනස් ඇතිව, යන එන ගමන්මඟ මෙනෙහි කරමින් යන්නේය, යම් පෙදෙසක උද්ධුමාතක ශරීරයක් දමන ලද්දේද, එම පෙදෙසෙහි ඇති ගලක් හෝ තුඹසක් හෝ රුකක් හෝ ගසක් හෝ වැලක් හෝ ලක්ෂ්‍යකොට නිමිති ගන්නේය, අරමුණු ගන්නේය. එසේ නිමිති ගෙන අරමුණු ගෙන, උද්ධුමාතක අසුභනිමිත්ත සභාගලක්ෂණ වශයෙන් සලකන්නේය. වර්ණ වශයෙන්ද, ලිංග වශයෙන්ද, සටහන් වශයෙන්ද, දිශා වශයෙන්ද, අවකාශ වශයෙන්ද, පරිච්ඡේද වශයෙන්ද, සන්ධි වශයෙන්ද, සිදුරු වශයෙන්ද, නිම්නවශයෙන්ද, ස්ථල වශයෙන්ද, හාත්පස වශයෙන්ද එම යෝගාවචරතෙමේ එම නිමිත්ත මනාකොට ගැනීම කරන්නේය, මනාකොට පිරික්සීම කරන්නේය, මනාකොට නිශ්චය කිරීම කරන්නේය.

"හේ තෙමේ එම නිමිත්ත මනාව ගැනීම කොට, මනාව පිරික්සීම කොට, මනාව තහවුරුකිරීම කොට, හුදකලාව, දෙවැන්නකු නොගෙන, එළඹසිටි සිහි ඇතිව, ඇතුළතට නැඹුරු ඉඳුරන් ඇතිව, පිටතට යොමු නොවූ මනසින් යුතුව, යන එන ගමන්මඟ මෙනෙහි කරමින් යන්නේය, හේ තෙමේ සක්මන් කරනුයේද එම අසුභ නිමිත්තම මෙනෙහි කරමින් සක්මන් කරන්නේය, හිඳිනුයේද එයම මෙනෙහි කරමින් අසුන් පනවන්නේය. හාත්පස නිමිති සැලකීම කුමක් සඳහාද? එහි අනුසස් කවරේද? හාත්පස නිමිති සටහන් කිරීම නුමුළාබව සඳහාය, නුමුළාබව එහි ආනිසංසයි.

එකොළොස් ආකාරයෙකින් නිමිති ගැනීම කුමක් සඳහාද? එහි ආනිසංස කවරේද? එකොළොස් ආකාරයෙකින් නිමිති ගැනීම (අසුබ නිමිත්තෙහි) සිත රඳවා ගැනීම සඳහාය, සිත රඳවා තැබීමම එහි ආනිසංසයි. යන එන ගමන්මග මෙනෙහි කිරීම කුමක් සඳහාද? එහි අනුසස් කවරේද? යන එන ගමන්මඟ සිහිකිරීම කර්මස්ථාන වීථිය සංවිධාන කර ගැනීම සඳහාය. එයම එහි ආනිසංසයි. හේ තෙමේ ආනිසංස දක්නාසුලු වූයේ කමටහන්හි රත්නසංඥ ඇතිව, ගෞරව උපදවා, සොම්නස් සහිතව, 'ඒකාන්තයෙන් මේ පිළිවෙත හේතුකොටගෙන ජරාමරණයෙන් මිදෙන්නෙමි'යි සිතාගෙන එම අරමුණෙහිම සිත රඳවන්නේය. හේ තෙමේ කාමයන්ගෙන් වෙන්ව-පෙ-ප්‍රථම ධ්‍යානයට පැමිණ විහරණය කරන්නේය. මෙසේ ඒ යෝගාවචරයා විසින් රූපාවචර ප්‍රථමධ්‍යානයද, දිව්‍යමය ආර්ය විහරණයද, භාවනාමය පුණ්‍යක්‍රියාවස්තුන්ද ලබනාගන්නා ලද්දේ වේ.(1)

එහෙයින් යම් පුද්ගලයෙක් විසිතුරු දකිනු අටියෙන් (විනෝදවනු පිණිස) අමුසොහොන දක්නට යන්නේනම්, හේ තෙමේ ගෙඩිය ගසා සංඝයා රැස්කොට (ප්‍රසිද්ධ කොට) යේවා, කමටහන් අරමුණුකොට යන්නේ නම්, හුදකලාව දෙවැන්නකු නැතිව (බුද්ධානුස්සති ආදී) මුල් කමටහන් අත්නොහැර මෙනෙහි කරමින්ම, සොහොනෙහිදී බලු ආදීන්ගෙන් වියහැකි උවදුරු වලක්වනු පිණිස සැරයටියක් හෝ කෙවිටක් හෝ ගෙන, මනාව අවධානය එළවා ගැනීමෙන් නුමුළා-සිහි ඇතිව, මනින්ද්‍රියය සවැනි කොට ඇති ඉන්ද්‍රියයන් ඇතුළතට යොමුකොට තබාගැනීමෙන් පිටතට යොමු නොවූ සිත් ඇතිව යායුතුය. විහාරයෙන් නික්මෙමින්ම 'අසුවල් දිශාවෙහි අසුවල් දෙරින් නික්මුණෙමි'යි දෙරටුව මතක තබාගත යුතුය, ඉක්බිති යම් මඟෙකින් යන්නේ නම්, ඒ මඟ නියමකොට ගතයුතුය:- මේ මඟ නැගෙනහිර දිශාවට අභිමුඛව යෙයි, බටහිර-පෙ-උතුරු-පෙ-දකුණු දිශාවට හෝ අනුදිශාවකට හෝ අභිමුඛව යෙයි, මෙතැනින් වම් අතට, මෙතැනින් දකුණු අතට යෙයි, මෙතැන ගලෙකි, මෙතැන තුඹසෙකි, මෙතැන රුකෙකි, මෙතැන ගසෙකි, මෙතැන වළකි'යි මෙසේ ගමන්මග නියම දකිමින් නිමිති තිබෙන තැනට යායුතුය. තවද උඩුසුළඟට නොයායුතුය, උඩුසුළං-දෙසට යනවිට කුණපගන්ධය නාසයෙහි පැහැර හිස්මොල හෝ කළඹන්නේය, ආහාර හෝ වමාරවන්නේය, 'මෙවන් මිනීකුණු ඇති තැනකට ආයේ වෙමි'යි විපිළිසර හෝ දනවන්නේය. එහෙයින් උඩුසුළං අතට නොයා යටිසුළං අතට යායුතුය. ඉදින් යටිසුළං

(1) මහා අට්ඨකථා

අතට යා නොහැකිනම්, අතරමඟ පර්වතයක් හෝ ප්‍රපාතයක් හෝ ගලක් හෝ වැටක් හෝ කටු-ලැහැබක් හෝ වතුරක් හෝ වගුරක් හෝ ඇත්නම්, සිවුරු කොණින් නහය වසාගෙන යායුතුය. මේ ඔහුගේ ගමන් වතයි.

මෙසේ ගොස් එක් වරම අසුභ නිමිත්ත නොබැලිය යුතුය, දිශාව නියමකොට ගතයුතුය, එක් පසෙකින් සිටිනවිට අරමුණ පැහැදිලිව නොපෙනේ නම්, සිතද භාවනා පිණිස කර්මණ්‍ය නොවේනම්, එය හැර යම් පසෙකින් සිටිනවිට අරමුණ පැහැදිලිව වැටහේ නම්, සිතද කර්මණ්‍ය වේනම්, එපසින් සිටිය යුතුය. උඩුසුළඟ යටිසුළඟ යන දෙකම හළ යුතුය, සුළඟට මුහුණලා සිටිනවිට කුණපගන්ධයෙන් අපහසුකම් ඇතිවී සිත ඒ අත මේ අත දුවන්නට වන්නේය, සුළඟට පිටුපා සිටින විට, එයට අරක් ගත් අමනුෂ්‍යයන් ඇතොත්, ඔවුහු කිපී ගහට සිදු කරන්නාහුය, එහෙයින් මඳක් ඉවත්ව කෙළින්ම යටිසුළඟින් නොවනසේ සිටියයුතුය. මෙසේ සිටින්නහු විසින්ද ඉතා දුරින් හෝ ඉතා ළඟින් හෝ පාමුලින් හෝ ඉස්දෙරින් හෝ නොසිටිය යුතුය. ඉතා දුරින් සිටියහුට අරමුණ පැහැදිලිව නොපෙනේ, ඉතා ළඟින් සිටිනවිට බිය උපදී, පාමුලින් හෝ ඉස්දෙරින් සිටිනවිට සම්පූර්ණ අසුභය පැහැදිලිව නොපෙනේ. එහෙයින් ඉතා දුරින් හෝ ඉතා ළඟින් හෝ නොසිට, බැලීමට පහසුවන ලෙසින් (සිරුරෙහි) මැද කොටසට ඉදිරියෙන් සිටිය යුතුය. මෙසේ සිට, ඒ පෙදෙසෙහි ගලක් හෝ-පෙ-වැලක් හෝ නිමිතිකොට ගන්නේය'යි මෙසේ යට දක්වනලද පරිදි අවටින් ඇති නිමිති වටහාගත යුතුය.

එහිලා නිමිති හඳුනාගන්නා ක්‍රමය මෙසේය: ඉදින් ඒ උද්ධුමාතක නිමිත්ත අවට ඇසට ලක්වන මානයෙහි ගලක් ඇත්නම්, මේ ගල උස්යයි හෝ, මිටියයි හෝ කුඩායයි හෝ මහත්යයි හෝ තඹ පැහැයයි හෝ කළුපැහැයයි හෝ සුදුපැහැයයි හෝ දිගටියයි හෝ වටකුරුයයි හෝ හඳුනාගත යුතුය. ඉක්බිති මෙතැන මේ ගලය, මේ අසුබ නිමිත්තය, මේ අසුබ නිමිත්තය, මේ ගලයයි සිතින් සලකුණු කොටගත යුතුය. ඉදින් තුඹසක් වේනම් එයද උස්යයි හෝ මිටියයි හෝ, කුඩායයි හෝ මහත්යයි හෝ තඹවන්යයි හෝ කළුපැහැයයි හෝ සුදුපැහැයයි හෝ දිගටියයි හෝ වටකුරුයයි හෝ හඳුනාගත යුතුය. ඉක්බිති, මෙතැන තුඹසය, මෙතැන මේ අසුබ නිමිත්තයයි (සිතින්) සලකුණු කොටගත යුතුය. ඉදින් රුකක් ඇතොත්, එයද ඇසතුයයි හෝ නුගයයි හෝ ගිවිලුයයි හෝ දිඹුල්යයි හෝ උස්යයි හෝ මිටියයි හෝ කුඩායයි හෝ මහත්යයි හෝ තඹවන්යයි හෝ කළුපැහැයයි හෝ සුදුපැහැයයි හෝ

හඳුනාගතයුතුය. ඉක්බිති, මෙතැන මේ රුකය, මේ අසුබ නිමිත්තයයි සලකුණු කොටගත යුතුය. ඉදින් (කුඩා) ගසක් වෙතොත්, එයද හිඳියයි හෝ කරඹයයි හෝ කණේරුයයි හෝ කටුකරඬුයයි හෝ උස්යයි හෝ මිටියයි හෝ, කුඩායයි හෝ මහත්යයි හෝ හඳුනාගත යුතුය. ඉක්බිති, මෙතැන මේ ගසය, මේ අසුබ නිමිත්තයයි සලකුණු කොට ගතයුතුය. ඉදින් වැලක් වෙතොත්, එයද ලබුයයි හෝ, පුසුල්යයි හෝ ඉරමුසුයයි හෝ කළුවැල්යයි හෝ රසකිඳියයි හෝ හඳුනාගත යුතුය. ඉක්බිති, මෙතැන මේ වැලය, මේ අසුබ නිමිත්තයයිද, මේ අසුබනිමිත්තය මේ වැලයයිද සලකුණු කොටගතයුතුය.

**සනිමිත්තං කරොති සාරම්මණං කරොති** (නිමිති සහිත කෙරේ, අරමුණු සහිත කෙරේ)යයි යමක් කියන ලද්දේද, එය මෙහිම ඇතුළත් වේ. නැවත නැවතත් ව්‍යවස්ථාපනය කිරීම (පිඩුකොට ගැනීම) නිමිති සහිත කිරීමයයි කියනු ලැබේ: මේ ගලය, මේ අසුබ නිමිත්තයයිද, මේ අසුබ නිමිත්තය, මේ ගලයයිද මෙසේ යුගලයක් යුගලයක් වශයෙන් පිඩුකොට ගැනීම අරමුණු සහිත කිරීම නම්වේ. මෙසේ නිමිති සහිතව, අරමුණු සහිතව ගැලපෙන පරිදි සලකුණුකොට ගනිති'යි කී හෙයින්, ඒ (උද්ධුමාතක නම්) අසුබ නිමිත්ත එයටම ගැලපෙන, අන් (විනීලකාදී) අසුබයනට පොදු නොවූ, යම් ඉදිමුණු ස්වභාවයක් ඇත්නම්, ඒ අනුසාරයෙන්ම මෙනෙහි කළයුතුය. පිම්බුණේය, ඉදිමුණේයයි මෙසේ ස්වභාව වශයෙන් හා කෘත්‍යවශයෙන් සලකුණු කොටගතයුතුය යන අර්ථයි. මෙසේ සලකුණු කොටගෙන, වර්ණ වශයෙන්ද, ලිංග වශයෙන්ද, සටහන් වශයෙන්ද, දිශාවශයෙන්ද, අවකාශ වශයෙන්ද, පරිච්ජේද වශයෙන්ද'යි යන මේ සවැදෑරුම් ආකාරයෙන් නිමිති ගතයුතුය. කෙසේදයත්, ඒ යෝගාවචරයා විසින් මේ සිරුර කළු හෝ එළලු හෝ මඟුරුවන් පැහැ ඇත්තකුගේයයි වර්ණ වශයෙන් නියම කටයුතුය, ලිංග වශයෙන් වනාහි ස්ත්‍රීලිංගය පුරුෂලිංගයයි යනුවෙන් නොව, ළදරුවියෙහි, මැදිවියෙහි හෝ මහලු වියෙහි සිටියකුගේයයි නියම කටයුතුය. සටහන් වශයෙන් වනාහි උද්ධුමාතක සටහන් වශයෙන්ම මේ මොහුගේ හිස සටහනය, මේ ගෙලසටහනය, මේ අත් සටහනය, මේ උදරසටහනය, මේ නැබ සටහනය, මේ උකුලු සටහනය, මේ කෙණ්ඩා සටහනය, මේ පාසටහනයයි නියම කටයුතුය. දිශා වශයෙන් වනාහි, මේ සිරුරෙහි නාභියෙන් පහළ කොටසය, යටි දිසාවය, මේ ඉහළ කොටසය, උඩු දිසාවයයි නියම කටයුතුය, නොහොත් මම මේ පැත්තෙහි වෙමි, අසුබ නිමිත්ත ඒ පැත්තෙහි වේයයි නියම කටයුතුය. අවකාශ වශයෙන් වනාහි මෙනම් අවකාශයෙහි අත්ය, මෙහි පාය, මෙහි හිසය, මෙහි මැදිකයයයි නිශ්වය

කටයුතුය. නොහොත්, මම මේ අවකාශයෙහි සිටියේ වෙමි, අසුබ නිමිති ඒ අවකාශයෙහි සිටියේයයි නිශ්චය කටයුතුය. පරිච්ඡේද වශයෙන්, මේ සිරුර යටින් දෙපතුලෙන්ද, උඩින් කෙස'ගින්ද, සරසින් සමෙන්ද පිරිසිදියේයයි, මෙසේ පිරිසිදි තන්හි දෙතිස් කුණපයෙන් පිරී සිටියේමයයි නිශ්චය කටයුතුය, නොහොත් මේ අසුබ නිමිත්තෙහි මෙතෙක් අත් සීමාවයි, මෙතෙක් පා සීමාවයි, මෙතෙක් හිස් සීමාවයි, මෙතෙක් මැදිකය සීමාවයයි නිශ්චය කටයුතුය. යම් පමණ තැන් ගන්නේ නම්, එපමණම තැන් මේ උද්ධුමාතකය මෙබඳුයයි පිරිසිදිය යුතුය. පිරිමියකුට ගැහැණු සිරුරක් හෝ ගැහැණියකට පිරිමි සිරුරක් හෝ යෝග්‍ය නොවේ. නොසම (ලිංගික) සිරුරෙහි අරමුණු නොවැටහේ, කෙලෙස් පණ ගැන්වීමටම හේතුවේ. "ඉදිමී ගියාවූද ගැහැණු සිරුර පිරිමියකුගේ සිත පැහැරගෙන සිටින්නේ'යයි මැදුම් සඟි අටුවාවෙහි[1] කියනලදි. එහෙයින්, සභාගවූ (සමවූ) ශරීරයෙහිම මෙසේ ස-ආකාරයෙකින් නිමිති ගතයුතුය.

යමෙක් තෙමේ පෙර බුදුවරයන් සමීපයෙහි වඩනාලද කමටහන් ඇත්තේ නම්, පුරුදුකළ ධුතංග ඇත්තේ නම්, මඩනාලද මහාභූත ඇත්තේ නම්, හඳුනා ගන්නාලද සංස්කාර ලක්ෂණ ඇත්තේ නම්, නිශ්චයකොට දැනගත් නාම-රූප ස්වභාව ඇත්තේනම්, උගුළුවා හරිනලද සත්වසංඥ ඇත්තේ නම්, පුරණලද මහණදම් ඇත්තේ නම්, පුරුදුකළ කුසලවාසනා ඇත්තේ නම්, වඩනාලද භාවනා ඇත්තේ නම්, කුසලබීජ ඇත්තේ නම්, මුහුකළ නුවණ ඇත්තේ නම්, මඳවගිය කෙලෙසුන් ඇත්තේ නම්, එබඳු කුලපුත්‍රයාහට බැලූ බැලූ අතින් පටිභාගනිමිති පහළවේ, එසේ නොවැටහේ නම් මේ ආකාරයෙන් සවැදරුම් නිමිති ගන්නාවිට වැටහේ, යමකුට වනාහි එසේත් නොවැටහේ නම්, ඒ යෝගාවචරයා විසින් සන්ධි වශයෙන්ද, විවර වශයෙන්ද, වළ වශයෙන්ද, ගොඩ වශයෙන්ද, සමස්ත වශයෙන්දැයි යන පස් ආකාරයෙන් නැවතත් නිමිති ගතයුතුය. එහි සන්ධි වශයෙන්ය යනු, එක්සිය අසූවක්වූ සන්ධි වශයෙනි. ඉදිමුණු මළසිරුරෙහි වනාහි, කෙසේ නම් එක්සිය අසූවක් සන්ධීන් හඳුනාගතහැකිද? එහෙයින් යෝගාවචරයා විසින් දකුණු අතෙහි සන්ධීන් තුනෙකැ'යිද, වම් අතෙහි සන්ධීන් තුනෙකැ'යිද, දකුණු පයෙහි සන්ධීන් තුනෙකැයි ද, වම් පයෙහි සන්ධීන් තුනෙකැ'යිද, ගෙලෙහි එක් සන්ධියෙකැ'යිද, උකුලෙහි එක් සන්ධියෙකැයිද, මෙසේ මේ තුදුස් මහා සන්ධීන් වශයෙන් නියම දතයුතුය. විවර වශයෙන්ය යනු, අත් සම්බන්ධවන විවරය, පා සම්බන්ධවන විවරය, උදරය, පෙකනිය, කන් සිදුරුයයි මෙසේ විවරවශයෙන් නියම කටයුතුය.

(1) හෙළටුවා

ඇස් වැසුණුබව හෝ ඇරුණුබවද, මුව වැසුණුබව හෝ ඇරුණුබවද නියම කටයුතුය. **වළ** වශයෙන්ය යනු, ඇස්වල හෝ, ඇතුළු මුව හෝ, ගලවට හෝ මෙසේ සිරුරෙහි වළතැන් ඇත්නම්, එය නියම කටයුතුය, නොහොත්, මම වළතන්හි සිටියේ වෙමි, සිරුර උස්තන්හි සිටියේයයි නියම කටයුතුය. **ගොඩ** වශයෙන්ය යනු, සිරුරෙහි දණහිස් හෝ ළය හෝ, නලළ හෝ මෙසේ සිරුරෙහි උස් තැන් ඇත්නම් එය නියම කටයුතුය, නොහොත්, මම ගොඩ තන්හි සිටියෙමි, සිරුර වළ තන්හි සිටියේයයි නියම කටයුතුය **සමන්ත** වශයෙන්ය යනු, මුළු සිරුර හාත්පස සමස්ත වශයෙන් නියම කටයුතුය, මුළු සිරුරෙහි නුවණ හසුරුවා යම් තැනක් ප්‍රකටව වැටහේ නම්, එතන්හි, 'උද්ධුමාතකං උද්ධුමාතකං'යයි සිත පිහිටුවිය යුතුය. ඉදින් මෙසේත් නොවැටහේනම්, උදරය කෙළවර අධික වශයෙන් ඉදිමුණු තැනක් ඇත්නම්, එතන්හි 'උද්ධුමාතකං උද්ධුමාතකං'යයි සිත පිහිටුවිය යුතුය.

දැන් **සො තං නිමිත්තං සුග්ගහිතං කරොති** (හේ තෙමේ ඒ නිමිත්ත මනාකොට ගැනීම කරයි) යන ආදියෙහි විනිශ්චය කථාව මෙසේයි: ඒ යෝගාවචරයා විසින් එම සිරුරෙහි යටකී ආකාරයෙන් නිමිතිගැනීම් වශයෙන් මනාකොට නිමිති ගතයුතුය, සිහි එළවාගෙන මනාකොට ආවර්ජනය කළයුතුය, මෙසේ නැවත නැවතත් කරමින් මනාකොට ධාරණය කටයුතුය, ව්‍යවස්ථාපනයද කටයුතුය. සිරුරෙන් ඉතා දුර නොවන, ඉතා ළඟද නොවන තැනෙක සිට හෝ හිඳ හෝ ඇස් ඇර බලා නිමිති ගතයුතුය. 'උද්ධුමාතකපටික්කූලං, උද්ධුමාතකපටික්කූලං' යනුවෙන් සියවර දහස්වර පවා ඇස් යොමා බැලිය යුතුය, ඇස් පියා ආවර්ජනය කළයුතුය. මෙසේ යලි යලිත් කරනවිට උග්ගහනිමිත්ත මනාකොට ප්‍රගුණ කරනලද්දේ වේ. කවර අවස්ථාවෙක්හිදී මනාකොට ගන්නාලද්දක් වේද? යම් අවස්ථාවෙක්හිදී ඇස් ඇර බලනවිටද, ඇස් පියා ආවර්ජනය කරනවිටද එකසේ දිස්වේ නම්, ඇස්හමුබවට ඒනම් එවිට මනාකොට ප්‍රගුණකොට ගන්නාලද්දේ වේ. මෙසේ ඒ යෝගී තෙමේ මනාකොට නිමිති ගෙන මනාකොට ධාරණය කොටගෙන, මනාකොට ව්‍යවස්ථාපනය කොටගෙන, ඉදින් එතන්හිදීම භාවනා කෙළවරට පැමිණීමට නොසමත් වේනම්, ඉක්බිති පෙරළා එන කල්හිද, පෙර කීලෙසින්ම හුදකලාව, දෙවැන්නකු නොමැතිව, එම කමටහනම මෙනෙහි කෙරෙමින් මනාකොට සිහි එළවාගෙන, ඇතුළතට යොමුවූ ඉඳුරන් ඇතිව, පිටතට යොමු නොවූ සිත් ඇතිව, තමාගේ සෙනස්නටම ආයුතුය. සොහොනෙන් නික්මෙන විටද ආයුතු මඟ නියම කටයුතුය. යම් මඟෙකින් නික්මුණෙම්ද, මේ මඟ පෙරදිගට විහිදෙයි, පැදුම් දිගට

උතුරු දිගට, දකුණු දිගට හෝ විහිදෙයි, අනුදිගකට හෝ විහිදෙයි, මෙතැනදී වමට හැරෙයි, මෙතනදී දකුණට හැරෙයි, මෙතැන ගලෙකි, මෙතැන තුඹසෙකි, මෙතැන රුකෙකි, මෙතැන (කුඩා) ගසෙකි, මෙතැන වැලෙකි'යි මෙසේ ආයුතු මහතියම දන පෙරළා පැමිණ සක්මන් කරන්නහු විසින්ද එපසින්මවූ සක්මණෙක් ඇසුරු කළයුතුය, අසුබනිමිත්ත තිබෙන දෙසට අභිමුඛවූ බිම් පෙදෙසක සක්මන් කළයුතුය යන අර්ථයි. හිඳින විටද එදෙසට මුහුණලා අසුන් පැනවිය යුතුය. ඉදින් එදෙසින් වළෙක් හෝ, බෑවුමෙක් හෝ, රුකෙක් හෝ වැටෙක් හෝ වගුරෙක් හෝ වේනම්, ඒ බිම් පෙදෙසෙහි සක්මන් කළ නොහැකි නම්, ඉඩ නොමැති හෙයින් අස්නක් හෝ පැනවිය නොහැකි නම්, ඒ දිශාව නොදකිමින් වුවද ඉඩ ඇති තැනෙක්හි සක්මන් කළයුතු වේ, හිඳියයුතුද වේ, සිත වනාහි එදෙසටම (නිමිත්ත තිබෙන දිශාවටම) යොමුකොට තබා ගතයුතුය.

ඉක්බිති **සමන්තා නිමිත්තුපලක්ඛණා කිමත්ථියා** 'හාත්පස නිමිති සැලකීම කුමක් පිණිසද?' ආදී ප්‍රශ්නවලට (අසම්මොහත්ථං) 'නුමුළාබව පිණිසය' යන ආදී විසඳුම්වල අභිප්‍රාය මෙයි: යමකුට වනාහි අවේලාවෙහි උද්ධුමාතක අසුබ නිමිති ඇති තැනට ගොස්, හාත්පස නිමිති සලකා, අසුබ නිමිති ගැනීම පිණිස ඇස් දල්වා බලන විටම, එම මළ සිරුර නැගිට සිටින විලාශයෙන් හෝ, බාධක මැඩගෙන ඉදිරියට එන විලාශයෙන් හෝ, පසුපසලුහුබැඳ එන විලාශයෙන් හෝ වැටහේ නම්, ඒ යෝගී තෙමේ එම බියකරු, භයානක අරමුණ දක, විසුරුණ සිත් ඇතිව උමතු වුවකු සෙයින් බියට, තැතිගැන්මට, ලොමුදැහැගැන්මට පත්වේ. පෙළෙහි විභාගකොට දක්වා ඇති අටතිස් අරමුණු අතුරෙන් මෙවන් බියකරුවූ භයානකවූ අන් අරමුණෙක් නම් නැත්මය. මේ කර්මස්ථානයෙහි වනාහි 'ඣානවිබ්භන්තක' (විසිරීගිය ධ්‍යාන ඇත්තෙක්) නම් වේ, කවර හෙයින්ද? මේ කර්මස්ථානය ඉතා බිය දනවන හෙයිනි. එහෙයින් එම යෝගියා විසින් සිත දැඩිකොට ගෙන, මනාකොට සිහි එළවාගෙන, 'නැගිට ලුහුබඳින මළසිරුරක් නම් නොවූවිරූය, ඉදින් එම මළසිරුර සමීපයෙහි ඇති ගල හෝ-පෙ-වැල හෝ එන්නේ නම් මළසිරුරද එන්නේය, යම්සේ වනාහි එම ගල හෝ-පෙ-වැල නොඑන්නේද, එසේම මළසිරුරද නොඑන්නේය, තොපට වැටහෙන මේ ආකාරය හුදෙක් හැඟීමෙන් උපන්, හැඟීමෙන් හටගත් එකෙකි, අද තොපට කමටහන වැටහීගියේ වන, මහණ, නොබා සිටුව'යි තැතිගැන්ම දුරුකොට සොම්නස් උපදවාගෙන එම නිමිත්තෙහි සිත හැසිරවිය යුතුය. මෙසේ විශේෂාධිගමයට පැමිණේ. "හාත්පස නිමිති සැලකීම නොමුළාබව පිණිසය"යි යන මෙය මේ සඳහා කියනලදි.

එකොළොස් ආකාරයෙන් නිමිති ගැනීම කරනුයේ කමටහනට යොමුව සිටී, ඔහුට වනාහි ඇස් හැර බැලීමෙන් උග්ගහනිමිත්ත උපදී, එම උග්ගහනිමිත්ත වෙත මනස හසුරුවනවිට පටිභාගනිමිත්ත උපදී, එම පටිභාගනිමිත්ත වෙත මනස හසුරුවනවිට අර්පණාවට පැමිණේ. අර්පණාවෙහි සිට විදර්ශනා වඩමින් රහත්බව අවබෝධ කරයි. එහෙයින් එකොළොස් ආකාරයෙන් නිමිති ගැනීම කමටහන වෙත බැඳී සිටීම පිණිසය'යි කියනලදි.

**ගතාගතමග්ගපච්චවෙක්ඛණා වීථිසම්පටිපාදනත්ථා** (ආගියමඟ මෙනෙහි කිරීම කමටහන් පිළිවෙළ මනාව ප්‍රතිපාදනය කිරීම පිණිසය)යි යන මෙහි වනාහි ගියමඟ හා ආමඟ පිළිබඳ යම් මෙනෙහි කිරීමක් කියන ලද්දේද, එය කමටහන් වීථිය මනාසේ ප්‍රතිපාදනය කරනු පිණිසය යන අර්ථයයි. ඉදින් මේ භික්ෂුව කමටහන් ගෙන පෙරළා එන අතරමඟ කිසිවකු, 'ස්වාමීනි, අද කිනම් දවසෙක්ද'යි විචාළහොත්, ප්‍රශ්නයක් හෝ ඇසුවහොත්, පිළිසඳර හෝ කළහොත්, "මම කමටහන් ඇත්තෙක්මි'යි මුවෙන් නොබැන යනු නොවටී. දවස කුමක්දැයි කිව යුතුය. ප්‍රශ්නය විසඳිය යුතුය, ඉදින් නොදනී නම් 'නොදනිමි'යි කිව යුතුය, දැහැමි පිළිසඳර කළයුතුය. මෙසේ කරනවිට ඔහුගේ උග්ගහනිමිත්ත නැසේනම්, එසේවත් මුත් දවස කුමක්දැයි අසන්නහුට කිවයුතුම වේ. ප්‍රශ්න නොදනිතොත්, නොදනිමි'යි කිවයුතුය, දනිතොත් කෙටියෙන් හෝ කියනු වටී. පිළිසඳරද කළ යුතුය. ආගන්තුක භික්ෂුවක් හමුවුවහොත් ආගන්තුක පිළිසඳරද කළයුතුම වේ. සෑමලු වත්, බෝමලු වත්, පොහොගේ වත්, බොජුන්හල් වත්, ගිනිහල් වත්, ආචාර්ය වත්, උපාධ්‍යාය වත්, ආගන්තුක වත්, ගමික වත් ආදී සෙසු සියලු 'ඛන්ධක' වත්ද පිරියයුතුම වේ. මෙකී වත් පුරන්නහුට එම තරුණ නිමිත්ත නැසී යාහැකිය, 'නැවත ගොස් නිමිති ගනිමි'යි යනු කැමැත්තහුට පවා අමනුෂ්‍යයන් හෝ ව්‍යාල මෘගයන් ගැවසී හෙයින් නැවත සොහොනට යා නොහැකි වනු ඇත, උද්ධුමාතකයද, එක් දිනක් හෝ දෙදිනක් තිබී විනීලකාදී ස්වභාවයට පත්වන හෙයින් එම (පළමු) නිමිත්ත පවා අතුරුදන්ව තිබෙනු ඇත, සියලු කමටහන් අතුරෙන් මේ උද්ධුමාතකය තරම් දුලබ අන් කමටහනෙක් නම් නැත, එසේ හෙයින්, නිමිත්ත නැසී ගියහොත් ඒ භික්ෂුව විසින් රාත්‍රිස්ථානයෙහි දිවාස්ථානයෙහි හිඳ, "මම මේ දෙරටුවෙන් විහාරයෙන් නික්ම අසුවල් දිශාවට යන මඟට බැස අසුවල් තැනදී වමට හැරුණෙමි. අසුවල් තැනදී දකුණට හැරුණෙමි, එහි අසුවල් තැන පහණෙකි. අසුවල් තැන තුඹසෙකි, අසුවල් තැන රුකෙක් හෝ (කුඩා) ගසෙක් හෝ වැලක් ඇත, එමඟින් ගොස් මම අසුවල් තැනදී අසුබනිමිත්ත දිටිමි, එහිදී අසුවල්

දෙසට හැරී සිටිමින් හාත්පස මේ මේ නිමිති සලකුණු කොටගෙන මෙසේ අසුබනිමිති උගෙන, අසුවල් දෙසින් සොහොනෙන් නික්ම මෙවන් මඟෙකින් මේ මේ දෙය කරමින් පෙරළා අවුත් මෙහි හුන්නේ වෙමි"යි මෙසේ පලක් බැඳ හුන් තැන් දක්වා ආ ගිය මඟ මෙනෙහි කළයුතුය. මේ ආකාරයෙන් මෙනෙහි කරනවිට ඔහුට එම අසුබනිමිත්ත පහළ වේ. තමා ඉදිරියෙහි තබන ලද්දක් මෙන් වැටහේ. කමටහන පෙර ලෙසින්ම චිත්තවීථියට බැසගනී. එහෙයින් ආගිය මඟ මෙනෙහි කිරීම වීථිය පිළිබඳ මනාවු ප්‍රතිපාදනය පිණිසය'යි කියනලදි.

ඉක්බිති **ආනිසංසදස්සාවී රතනසඤ්ඤී හුත්වා චිත්තීකාරං උපට්ඨපෙත්වා සම්පියායමානො තස්මිං ආරම්මණෙ චිත්තං උපනිබන්ධති** (ආනිසංස දකිමින් රත්න සංඥ ඇතිව තුටුසිත් උපදවාගෙන ප්‍රිය කෙරෙමින් එම අරමුණෙහි සිත රඳවයි)" යන මෙහි, උද්ධුමාතක අසුභයෙහි සිත හසුරුවා ධ්‍යාන උපදවාගෙන ධ්‍යානය පාදක කොටගෙන විදර්ශනා වඩා, ඒකාන්තයෙන් මේ ප්‍රතිපදව හේතුකොටගෙන ජරාමරණ දෙකින් මිදෙන්නෙමි'යි මෙසේ ආනිසංස දක්නකු වියයුතුය. යම්සේ වනාහි දිළිඳු පුරුෂයෙක් තෙමේ මහඟු මිණිරුවනක් ලැබ, 'මවිසින් ඒකාන්තයෙන් දුලබ වස්තුවක් ලබනලද්'යි එහි රත්නසංඥා ඇතිව ගරුසරු උපදවා බලවත් ආදරයෙන් ප්‍රිය කෙරෙමින් එය රක්නේ වේද, එසේම දිළින්දකුට මහඟුමිණිරුවනක් වන් මේ දුලබ කමටහන මවිසින් ලබාගන්නා ලදී, චතුධාතුකර්මස්ථානය වඩනුයේ වනාහි තමා වෙතම වූ සතර මහා භූතයන් ගනියි, ආනාපානසති කර්මස්ථානය වඩනුයේ තමාගේ නහයෙහි හැපෙන වාතයෙහි අරමුණු ගනියි, කසිණ කර්මස්ථානය වඩනුයේ කසිණය සපයාගෙන පහසුවෙන් වඩයි, එසේම සෙසු කර්මස්ථානයෝද සුලබ වෙති. මෙම කර්මස්ථානය වූකලී එක් දිනක්ම නොහොත් දෙදිනක් පමණක් පවතී, ඉන්පසු විනීලකාදී අන්‍යස්වභාවයට පත් වේයයිද, මෙයට වැඩි තරම් දුලබ අන් කමටහනෙක් නැතැයිද, එය කෙරෙහි රත්න සංඥ උපදවා තුටුසිත් දනවාගෙන ආදර වඩමින් එම නිමිත්ත රැකිය යුතුය. රාත්‍රිස්ථානයෙහිද දිවාස්ථානයෙහිද 'උද්ධුමාතක පටික්කූලං උද්ධුමාතක පටික්කූලං (ඉදිමීගිය සිරුර පිළිකුල් සහිතය) යනුවෙන් නැවත නැවතත් එය කෙරෙහි සිත රැඳවිය යුතුය, නැවත නැවතත් එම නිමිත්ත ආවර්ජනය කළයුතුය, මෙනෙහි කළ යුතුය, තර්කයට විතර්කයට ගොදුරු කළයුතුය. එසේ කරනවිට ඔහුට පටිභාගනිමිත්ත පහළවේ. එහිලා නිමිති දෙකෙහි වෙනස මෙසේය:- උග්ගහනිමිත්ත විරූපව, පිළිකුල්ව, බියකරුව වැටහෙයි, පටිභාගනිමිත්ත වනාහි, ඇතිතාක් අනුභවකොට වැදහොත් පුෂ්ටිමත් අඟපසඟ ඇති පුරුෂයකු ලෙසින්

වැටහෙයි. පටිභාගනිමිත්ත ලැබෙනුවා හා සමගම බාහිර කාමයන් මෙනෙහි නොකිරීමෙන් ඔහුගේ කාමච්ඡන්ද නීවරණය වික්ඛම්භන වශයෙන් පහවෙයි, අනුනයප්‍රහාණය (ඇල්ම පහවීම) හා සමගම ලෙය පහවීමෙන් පූයාවද පහවන සෙයින් ඔහුගේ ව්‍යාපාදනීවරණයද පහවේ, එසේම වඩනාලද වීර්ය ඇති හෙයින් ථීනමිද්ධනීවරණයද, විපිළිසර දුරුකරන ශාන්ත ධර්මයන් හා යෙදීම හේතුකොටගෙන උද්ධච්ච-කුක්කුච්ච නීවරණයද, අධිගම විශේෂයන් ප්‍රත්‍යක්ෂවීම හේතුකොටගෙන එම ප්‍රතිපත්තිය දේශනාකළ ශාස්තෲවරයා කෙරෙහිද, ප්‍රතිපත්තිය කෙරෙහිද, ප්‍රතිපත්තිඵලය කෙරෙහිද සැක දුරුවීමෙන් විචිකිච්ඡා නීවරණයදැයි මෙසේ පංචනීවරණයෝ පහවෙති. එසේම එම පටිභාගනිමිත්තය කෙරෙහිම සිත නැංවීම ලක්ෂණකොට ඇති විතක්කයද, එම පටිභාගනිමිත්තය ඇසුරෙහිම සිත හැසිරවීමේ කාර්යය සිද්ධ කරන විචාරයද, ලබාගන්නාලද විශේෂ අධිගමය හේතුකොට උපන් පීතියද, පීතිසහිත සිත් ඇත්තහුට පස්සද්ධිය ඉපැදීමෙන් එම පස්සද්ධිය නිමිතිකොට පවතින සුඛයද, සුඛිත වූවහුට චිත්තසමාධිය හටගැනීමෙන් එම සුඛය නිමිතිකොට ඇති ඒකග්ගතාවද'යි යන මේ ධ්‍යානාංගයෝ පහළ වෙති. මෙසේ ඒ යෝගියාහට ප්‍රථමධ්‍යානය පිළිබිඹු කරවන උපචාරධ්‍යානයද එකෙණෙහිම උපදියි. මෙතැන් සිට යම්තාක් ප්‍රථමධ්‍යානය අර්පණා බවට හා වශීතාවට පත්වීම වේද ඒතාක් සියල්ල පඨවිකසිණයෙහි කීනයින්ම දතයුතුය.

මෙයින් අන්‍යවූ විනීලකාදී අසුභයන් කෙරෙහිද, "උද්ධුමාතක අසුබ නිමිත්ත උගන්නේ හුදකලාව, දෙවැන්නකු නැතිව, එළඹසිටි සිහි ඇතිව යන්නේය" යන ආදී වශයෙන් යාම් ආදී කොට ඇති යම් ලක්ෂණයක් කියන ලද්දේද, ඒ සියල්ල, 'විනීලක අසුබනිමිත්ත උගන්නේ, විපුබ්බක අසුබ නිමිත්ත උගන්නේ" යන ආදී නයින් ඒ ඒ පරිද්දෙන් එහි "උද්ධුමාතක" යන පදය පමණක් වෙනස්කොට එහි කියනලද නයින්ම විනිශ්චය හා අභිප්‍රාය සහිතව දතයුතුය. මේ වනාහි එහි වෙනසයි. විනීලක අසුභයෙහිදී 'විනීලකපටික්කූලං විනීලකපටික්කූලං' (නිල්වූ මළ සිරුර පිළිකුල්) යයි මනස්කාරය පැවැත්විය යුතුය, මෙහි උග්ගහනිමිත්ත මිශ්‍රවර්ණයෙන් දිස්වේ. පටිභාගනිමිත්ත වනාහි බහුලයේ පෙනෙන වර්ණයෙන් දිස්වේ.

විපුබ්බකඅසුභයෙහි, "විපුබ්බකපටික්කූලං විපුබ්බකපටික්කූලං" (පූයා වැගිරෙන මළසිරුර පිළිකුල්ය) යනුවෙන් මනස්කාරය පැවැත්විය යුතුය, මෙහි උග්ගහනිමිත්ත වැගිරෙන ආකාරයෙන් වැටහේ, පටිභාගනිමිත්ත නිසලව තැන්පත්ව තිබෙන ආකාරයෙන් වැටහේ.

විච්ඡිද්දක අසුභය, යුදබිමෙක හෝ, සොරුන් සිටින අඩවියෙක හෝ, රජදරුවන් විසින් සොරුන්ගේ අත්පා සිඳුවන සොහොන් බිමෙක හෝ සිංහව්‍යාඝ්‍රාදීන් විසින් මිනිසකු කඩ කඩ කොට ඉරා දමනලද වනබිමෙක හෝ දක්නට ලැබේ, එහෙයින් එවැනි තැනකට ගොස් නොයෙක් තැන විසිරී ඇතත්, එක්වර ඇස් හමුවට එතොත් යෙහෙකි, එසේ නොවෙතොත්, තමා අතින් නොඇල්විය යුතුය, අතින් අල්වා ගතහොත්, හුරුපුරුදු බවට පැමිණේ, (පිළිකුල් හැඟීම පහව් යාහැකිය) එහෙයින් අරම්වැසියකු ලවා හෝ හෙරණකු ලවා හෝ අන් කිසිවකු ලවා හෝ (කැබලි) එක්තැන් කරවාගත යුතුය, එවන් කිසිවකු නොලැබෙතොත්, සැරයටියෙන් හෝ දඬුවෙකින් හෝ එක් අඟුල් පමණ අතර සිටිනසේ (තමාම) එක්තැන් කරගත යුතුය. එසේ කොට "විච්ඡිද්දකපටික්කුලං විච්ඡිද්දක පටික්කුලං" (විසිරීගිය මළසිරුර පිළිකුල්ය) යනුවෙන් මනස්කාරය පැවැත්විය යුතුය, එහි උග්ගහනිමිත්ත මැදින් කපන ලද්දක් සෙයින් දිස්වේ, පටිභාගනිමිත්ත වනාහි පිරිපුන් ලෙසින් දිස්වේ. වික්ඛායිතක අසුභයෙහිදී "වික්ඛායිතකපටික්කුලං වික්ඛායිතකපටික්කුලං" (කාදමනලද මළසිරුර පිළිකුල්ය) යනුවෙන් මනස්කාර පැවැත්වියයුතුය. මෙහි උග්ගහනිමිත්ත ඒ ඒ තැනින් කාදමනලද ආකාරයෙන්ම වැටහේ, පටිභාගනිමිත්ත වනාහි පිරිපුන් ලෙසින් වැටහේ. වික්ඛිත්තකඅසුභයද විච්ඡිද්දක විෂයෙහි කීනයින්ම අඟලක් අඟලක් අතර තබා එක්තැන් කරවාගෙන හෝ තමාම එක්තැන් කොටගෙන හෝ "වික්ඛිත්තක පටික්කුලං වික්ඛිත්තකපටික්කුලං" යනුවෙන් මනස්කාරය පැවැත්විය යුතුය, මෙහි උග්ගහනිමිත්ත පැහැදිලිව දිස්වන අතරක් ඇතිව වැටහේ, පටිභාගනිමිත්ත වනාහි පිරිපුන් ලෙසින් වැටහේ.

හතවික්ඛිත්තක අසුභයද විච්ඡිද්දකයෙහි කියනලද තැන්වලම දක්නට ලැබේ, එහෙයින් එවැනි තැනකට ගොස් කී-නයින්ම අඟලක් අඟලක් පමණ අතර ඇතිවනසේ එක්රැස් කරවාගෙන හෝ තමාම රැස්කොට ගෙන හෝ, "හතවික්ඛිත්තකපටික්කුලං හතවික්ඛිත්තක පටික්කුලං" (කපා කොටා විසිරීගිය මළසිරුර පිළිකුල්ය) යනුවෙන් මනස්කාරය පැවැත්විය යුතුය. මෙහි උග්ගහනිමිත්ත වනාහි පෙනෙන තුවාල ලෙසින් වැටහේ. පටිභාගනිමිත්ත පිරිපුන්වම වැටහේ. ලෝහිතක අසුභය යුදබිම් ආදී තන්හි පහර ලද්දවුන්ගේ සුන්ව ගිය අත්පා ආදියෙහි හෝ, ගෙඩි පිළිකා ආදිය ගැසී මුඛයෙන් වැගිරෙනවිට හෝ දක්නට ලැබේ, එහෙයින් එවැන්නක් දක, "ලොහිතකපටික්කුලං ලොහිතක පටික්කුලං" (ලේ සහිත මළසිරුර පිළිකුල්) යයි මනස්කාරය පැවැත්විය යුතුය. මෙහි උග්ගහනිමිත්ත සුළඟ වැදී සෙලවෙන රතු කොඩියක් ලෙසින් වැටහේ,

පටිභාගනිමිත්ත වනාහි නිශ්චලව තිබෙන ලෙසින් වැටහේ. පුළවක අසුභය දෙතුන් දිනක් ඉකුත්වූ මළසිරුරෙක්හි නව දෙරින් පණුකැල වැගිරෙන්නටවූ කල්හි විද්‍යමානවේ, තවද එය බලු කැණහිල්, මිනිස්, ගව, මහිෂ, ඇත්, අස්, පිඹුරු ආදීන්ගේ ඒ ඒ ශරීරප්‍රමාණයෙන්ම හැල්බත් ගොඩක් ලෙසින් දිස්වේ. එකී මළ සිරුරු අතුරෙන් යම් කිසිවක් කෙරෙහි "පුළවකපටික්කුලං පුළවකපටික්කුලං" (පිළවුන් සහිත මළසිරුර පිළිකුල්ය)යයි මනස්කාරය පැවැත්විය යුතුය. චූළපිණ්ඩපාතිකතිස්ස තෙරුන්හට කාළදීඝවාපියෙහිදී ඇත්කුණක් කෙරෙහි නිමිති වැටහිණි. මෙහි උග්ගහනිමිත්ත චංචල ආකාරයෙන් වැටහේ, පටිභාගනිමිත්ත හැල්බත් පිඩක් මෙන් නිශ්චලව වැටහේ.

අට්ඨිකඅසුභය, "හේ තෙමේ අමු සොහොහොනෙහි දමනලද මස් ලේ සහිත නහරින් බැඳුණු මළසිරුරක් දක්නේය"(1) යන ආදී නයින් නොයෙක් ආකාරයෙන් කියනලදි. එහෙයින් යම් තැනෙක එවැන්නක් දමන ලද්දේද, පෙර කී-නයින්ම එහි ගොස් හාත්පස පාෂාණ ආදිය නිමිති සහිතව අරමුණු සහිතව ගෙන මේ මේ අට්ඨිකඅසුභයයි ස්වභාව වශයෙන් සලකා වර්ණාදී වශයෙන් එකොළොස් ආකාරයෙන් නිමිති ගතයුතුය. එය වනාහි වර්ණ වශයෙන් සුදුයයි ගෙන බලන්නහුට කමටහන නොවැටහේ, ඔදතකසිණය හා සමග පැටලීම සිදුවේ, එහෙයින් 'අට්ඨිකං' යනුවෙන් පිළිකුල් (පටික්කුල) වශයෙන්ම බැලිය යුතුය.

මෙහි **ලිංග** යනු අත් ආදියට නමෙකි, එහෙයින් අත්, පා, හිස, බඩ, බාහු, උකුල, කලවා, කෙන්ඩ ආදී වශයෙන් ලිංග අනුව නිශ්චය කටයුතුය; දිගය, කොටය, වටකුරුය, සතරැස්ය, කුඩාය, මහත්යයි සටහන් වශයෙන් නිශ්චය කටයුතුය. දිශා අවකාශ යන දෙක පෙරකී ආකාරම වේ. ඒ ඒ ඇටයෙහි කෙළවර පරිච්ඡේද වශයෙන් නිශ්චයකොට, යමක් මෙහි ප්‍රකටව වැටහේ නම්, එය ගෙන අර්පණාවට පැමිණිය යුතුය. ඒ ඒ ඇටයෙහි වළ තැන් ගොඩ තැන් වළ හෝ ගොඩ තැන් වශයෙන් නිශ්චය කටයුතුය. ප්‍රදේශ වශයෙන්ද, "මම් වළතන්හි වෙමි, අට්ඨිකය ගොඩ තැන්හිය," නැතහොත් "මම් ගොඩ තන්හි වෙමි, අට්ඨිකය වළ තන්හිය'යි ව්‍යවස්ථාපනය කටයුතුය. ඇට දෙකක් ගැටෙන ගැටෙන තැන් සන්ධි වශයෙන් ව්‍යවස්ථාපනය කටයුතුය. ඇටවලම අතරින්පතර විවරවූ තැන් විවර වශයෙන් ව්‍යවස්ථාපනය කටයුතුය. සියලු තන්හිම නුවණ හසුරුවා, මේ මේ තන්හි මේ මේ ඇටයයි සමස්ත වශයෙන් ගෙන ව්‍යවස්ථාපනය කටයුතුය. මෙසේත් නිමිති නොවැටහේ නම්,

(1) දී. නි. මහාසතිපට්ඨාන සූ. - D ii 296

නලල් ඇටය කෙරෙහි සිත රඳවාගත යුතුය. යම්සේ මෙහි එකොළොස් ආකාරයෙන් නිමිති ගැනීම කළයුතු වේද, එසේම පෙර කී පුළවකාදී අසුභයන් විෂයෙහිද යෙදිය යුතුයයි සැලකිය යුතුය. මේ (අට්ඨිකඅසුභ) කර්මස්ථානය සම්පූර්ණ ඇට සැකිල්ලෙහි මෙන්ම එක් ඇටයක් කෙරෙහිද සිද්ධ වේ. එහෙයින් ඒ දෙක අතුරෙන් එකක් කෙරෙහි එකොළොස් ආකාරයෙන් නිමිති ගැනීම උගෙන "අට්ඨිකපටික්කුලං අට්ඨිකපටික්කුලං (ඇට සහිත බවට පත් මළසිරුර පිළිකුල්ය) යයි මනස්කාරය පැවැත්විය යුතුය. මෙහි උග්ගහනිමිත්තද පටිභාගනිමිත්තද එක හා සමානයයි කියනලදි, එය එක් ඇටයක් පිළිබඳව යෝග්‍ය වේ. ඇට සැකිල්ලක් පිළිබඳ වූවිට උග්ගහනිමිත්තෙහිදී විද්‍යමාන විවර ඇතිබවද, පටිභාගනිමිත්තෙහිදී පිරිපුන් බවද යෝග්‍ය වේ, එක් ඇටයක් පිළිබඳ වුවද උග්ගහනිමිත්ත පිළිකුල්ද බියකරුද වන්නේය, පටිභාගනිමිත්ත උපචාරධ්‍යානය ගෙනඑන හෙයින් සතුට, සොම්නස දනවන්නේය. මේ කරුණ පිළිබඳව අටුවාවන්හි යමක් කියන ලද්දේ නම්, එය (මතු දැක්වෙන කරුණුවලට) ඉඩ තබාම කියන ලද්දේය. ඒ එසේමැයි. එහි සිවුබඹවිහරණ හා දස අසුභ විෂයෙහි පටිභාගනිමිත්ත දක්වා නැත. බඹවිහරණ විෂයෙහි වනාහි සීමාසම්භෙදයම නිමිති වෙතැයිද දසඅසුභ විෂයෙහි පිළිකුල්බව දුටු කල්හිම ඒකාන්ත වශයෙන් එයම නිමිති වෙතැයිද පවසා, අනතුරුවම "මෙහි නිමිත්ත උග්ගහ, පටිභාග වශයෙන් ද්විවිධ වේ, උග්ගහනිමිත්ත විරූපවද පිළිකුල්වද, බියකරුවද වැටහේ"යයි නැවත කියන ලදි. එහෙයින් විචාරණය කොට මෙහිලා යමක් පැවසුමුද, එය යුතුවේ. තවද මහාතිස්ස තෙරුන්හට දත්ඇට පමණක් දැකීමෙන් මුළු ස්ත්‍රීශරීරය ඇට ගොඩක් මෙන් වැටහී යාම ආදියද මෙහිලා නිදසුන් වේ. (ඉන්ද්‍රියසංවරසීල විස්තරය බලන්න).

ඉති අසුභානි සුභගුණො දසසතලොචනෙන ථුතකිත්ති
යානි අවොච දසබලො එකෙකජ්ඣානහෙතූනි,

එවං තානි ච තෙසඤ්ච භාවනානයමිමං විදිත්වාන
තෙසේවව අයං භීයො පකිණ්ණකකථාපි විඤ්ඤෙය්‍යා.

මෙසේ, සහසැස්හු විසින් පසස්නා ලද කීර්ති ඇති, පිරිසුදු ගුණ ඇති, දශබලධාරී භාග්‍යවතුන් වහන්සේ එක් එක් ධ්‍යානයට හේතුවූ යම් දසඅසුභයක් කියෙක්ද,

ඒ අසුභයන්ද, ඔවුන් පිළිබඳ මේ භාවනා ක්‍රමයද මෙසේ දැන, යළිදු එම අසුභයන් පිළිබඳවූ මේ ප්‍රකීර්ණක කථාද දතයුතුය.

මේ දසඅසුභයන් අතුරෙන් කවර හෝ අසුභයක් ඇසුරෙන් ලබනලද ධ්‍යාන ඇත්තේ වේද, හේ තෙමේ මනාකොට වියලවනලද රාග ඇති හෙයින් වීතරාගියකු මෙන් ලොල්බවින් තොර පැවතුම් ඇත්තෙක් වේ. එසේ වතුදු යම් යම් අසුභ ප්‍රභේදයක් කියන ලද්දේද, එය ශරීරය පිළිබඳ වෙනස් වෙනස් ස්වභාවයට පැමිණීම් වශයෙන්ද, රාගචරිතයාගේ වෙනස් වෙනස් ප්‍රභේද වශයෙන්ද එසේ කියනලදැයි දතයුතුය. මළසිරුර වනාහි පිළිකුල් බවට පැමිණෙනුයේ උද්ධුමාතක ස්වභාවයට යාම හෝ වන්නේය, විනීලකාදීන් අතුරෙන් කිසියම් ස්වභාවයකට යාම හෝ වන්නේය. මෙසේ යම් යම් ස්වභාවයක් ලදහැකි වන්නේද, ඒ ඒ ස්වභාවයෙහිදී 'උද්ධුමාතක පටික්කුලං විනීලකපටික්කුලං" යන ආදී වශයෙන් නිමිති ගතයුතු වන්නේයයි ශරීරස්වභාවයට පත්වීම් වශයෙන් දශවිධ අසුභප්‍රභේදයන් කියනලද'යි දතයුතුය.

මෙහිලා විශේෂයෙන් උද්ධුමාතකය ශරීරයෙහි හැඩහුරුව විනාශවීම ප්‍රකාශ කරන හෙයින් සණ්ඨානරාගියා (හැඩහුරුව පිළිබඳ රාග ඇත්තා) හට යෝග්‍ය වේ, විනීලකය ශරීරවර්ණයෙහි විනාශය ප්‍රකාශ කරන හෙයින් වර්ණරාගියාහට යෝග්‍ය වේ, විපුබ්බකය කායවර්ණය හා සමඟ බැඳුණු දුගඳබව ප්‍රකාශ කරන හෙයින් මාලාගන්ධාදී වශයෙන් උපදවනලද ශරීරගන්ධය කෙරෙහි රාග ඇත්තාහට යෝග්‍ය වේ, විච්ඡිද්දකය ඇතුළත සිදුරු ඇතිබව ප්‍රකාශ කරන හෙයින් අඟපසඟ ආදිය පිළිබඳ තිරබවෙහි රාග ඇත්තාහට යෝග්‍ය වේ, වික්ඛායිතකය මාංශක ලක්ෂණ සම්පත්තියෙහි විනාශය ප්‍රකාශකරන හෙයින් පියොවුරු ආදී සිරුරු කොටස්වල මාංශබහුලතාවෙහි රාග ඇත්තාහට යෝග්‍ය වේ, වික්ඛිත්තකය අංගප්‍රත්‍යංග විනාශය ප්‍රකාශ කරන හෙයින් අංගප්‍රත්‍යංගලීලාවෙහි රාග ඇත්තාහට යෝග්‍ය වේ, හතවික්ඛිත්තකය ශරීරයෙහි කැටිබව විනාශවීම ප්‍රකාශ කරන හෙයින් ශරීරසංඝාත සම්පත්තිය කෙරෙහි රාග ඇත්තාහට යෝග්‍ය වේ, ලොහිතකය ලෙයින් වැකීමෙහි පිළිකුල්බව ප්‍රකාශ කරන හෙයින් ආභරණයෙන් ජනිතවූ ශෝභාව කෙරෙහි රාග ඇත්තාහට යෝග්‍ය වේ, පුළවකය ශරීරය නොයෙක් පණුකුලවලට සාධාරණබව ප්‍රකාශ කරන බැවින් කාය පිළිබඳ මමත්‍වයෙහි රාග ඇත්තාහට යෝග්‍ය වේ, අට්ඨිකය සිරුරු ඇටවල පිළිකුල්බව ප්‍රකාශ කරන හෙයින් දන්තකල්‍යාණසම්පත්තිය කෙරෙහි රාග ඇත්තාහට යෝග්‍ය වේ. මෙසේ රාගචරිතයාගේ ප්‍රභේද වශයෙන්ද දශවිධ අසුභප්‍රභේදය කියනලද'යි දතයුතුය.

යම්හෙයකින් මේ දසඅසුභයෙහිදී, යම්සේ ගලාබස්නා ජලය සහිත ශඝ්‍රප්‍රවාහ සහිත ගඟෙක හබලෙහි බලයෙන්ම නැවක් සිටුවිය හැකිවේද,

හබලක් නැතිව සිටුවිය නොහැකි වේද, එසේම අරමුණ දුබලවන හෙයින් විතක්ක බලයෙන්ම සිත එකඟව සිටුවිය හැකිවේ, විතක්කයෙන් තොරව සිටුවිය නොහැකිවේ, එහෙයින් මෙහි ප්‍රථමධ්‍යානයම වන්නේය, ද්විතීයධ්‍යානාදිය නොවන්නේය. පිළිකුල්වූද මේ අරමුණෙහි, "ඒකාන්තයෙන් මේ ප්‍රතිපදව හේතුකොටගෙන ජරාමරණ දෙකින් මිදෙන්නෙමි'යි මෙසේ මෙහි ආනිසංස දක්නා බැවින්ද, නීවරණ සන්තාපය පහවීමෙන්ද පීති සොමනස්සය උපදී, "දුන් බොහෝ වැටුප් ලබන්නෙමි"යි කසල රැසෙක්හි අනුසස් දක්නා කසල ශෝධකයාට මෙනි, උත්සන්නවූ රෝදුක් ඇත්තහුට වමනවිරේචනාදිය පැවැත්වීමෙහිදී මෙනි. මේ අසුභ කර්මස්ථානය දශවිධ වනනමුදු අසුභලක්ෂණ වශයෙන් එකක්ම වේ, දශවිධවූ නමුදු මේ අසුභය අපවිත්‍රබවම, දුගඳබවම, නොමනහර බවම, පිළිකුල්බවම ලක්ෂණකොට ඇත්තේය. එහෙයින් මෙකී ලක්ෂණ හේතුකොටගෙන හුදෙක් මළසිරුරෙහිම නොව ජීවමාන සිරුරෙහි පවා මේ ආකාරය වැටහේ, දත්ඇට දක්නා සෑගිරි වැසි මහාතිස්ස තෙරුන්හට මෙනි. ඇත්කඳ මත හුන් රජු දෙස බලනවිට සංඝරක්ඛිත තෙරුන්ගේ උපස්ථායක සාමණේරයන්හට මෙනි. මළසිරුර මෙන්ම ජීවමාන සිරුරද අසුබම වේ, මෙහි වනාහි අසුභලක්ෂණය ආගන්තුක අලංකරණයෙන් වැසී පවත්නා හෙයින් ප්‍රකටව නොපෙනේ. මේ ශරීරය වූකලී ප්‍රකෘති වශයෙන්ම තුන්සියයකට අධිකවූ ඇටවලින් නැගී (කෙලින්) සිටිනේය, එක්සිය අසූවක් සන්ධිවලින් කැටිව පවත්නේය, නවසියයක් නහරවලින් බැඳී පවත්නේය, නවසියයක් මස්පිඩුවලින් ගැවසී පවත්නේය, තොවියලි මිනිස් සමින් වෙළී පවත්නේය, සිවියෙන් වැසී පවත්නේය, කුදු මහත් සිදුරෙන් සිදුරු සහිත වන්නේය, මේදතෙල්පිරි බඳුනක් මෙන් උඩින් යටින් නිතොරව වැගිරෙමින් සිටිනේය, පණුකැලට නිවෙස් වන්නේය, රෝගයනට ආකර වන්නේය, සියලු දුකට බඳුන් වන්නේය, කල්ගිය ගඩුවක් ගැසුණු කල මෙන් නව දොරෙකින් නිරතුරුව වැහෙමින් පවත්නේය, මේ ශරීරයෙහි දෙ-ඇසින් කබ වැගිරෙන්නේය, දෙකන් සිදුරින් කන්මළ (කළාඳුරු) වැගිරෙන්නේය, දෙනහස්පුටයෙන් සොටු වැගිරෙන්නේය, මුඛයෙන් අහරද, පිත්-සෙම්ද, ලෙහෙද වැගිරෙන්නේය, අධොද්වාරයෙන් මලමුත්‍ර වැගිරෙන්නේය, නවානුදහසක් රෝමකූපයෙන් අපිරිසුදු දහදිය වැගිරෙන්නේය, නිලමැසි ආදීහු අවටින් පිරිවරා සිටිනාහුය. මෙම ශරීරය දත්මැදීම්, මුවදෙවීම්, හිසතෙල් ගැල්වීම්, නෑම්, හැඳීම්, පෙරවීම් ආදියෙන් පිළිදගුම් නොකොට උපන්වනම රළුව විසුරුණ කෙස් සහිතව ගමින්ගම හැසිරෙතොත් රජකු වුවද, කසලශෝධක චණ්ඩාලාදීන් අතුරෙන් එකකු වුවද පිළිකුලින් සමාන සිරුරු ඇති බැවින් විශේෂයෙක් නොවේ. මෙසේ අපිරිසුදු බවින්, දුගඳ සහිත බවින්, කලකිරුවන බවින්, පිළිකුල් දනවන

බවින් රජකුගේ වේවා, සැඩොලකුගේ වේවා, සිරුරෙහි වෙනසෙක් නම් නැත. දත්මැදීම් මුවදෙවීම් ආදියෙන් මේ සිරුරෙහි දත්මැලියම් ආදිය ඉවත්කොට, නොයෙක් වස්ත්‍ර ජාතියෙන් මුවහ කොට, නන්වන් සුවඳවිලවුන් අලෙවිකොට, මල් අබරණ ආදියෙන් සැරසී 'මම'ය 'මාගේ'යයි ගතයුතු බවට පත්කර ගනිති. එහෙයින් මේ ආගන්තුකවූ අලංකාරයෙන් මුවහවූ හෙයින් මේ සිරුරෙහි ස්වභාව වශයෙන් ඇති අසුබ ලකුණු නොදක්නා පුරුෂයෝ ස්ත්‍රීන් කෙරෙහිද, ස්ත්‍රීහු පුරුෂයන් කෙරෙහිද ඇලුම් කෙරෙති. පරමාර්ථථ වශයෙන් වනාහි මෙහි ස්වල්පවූ හෝ ඇලුම් කටයුතු කිසිවක් නැත. ඒ එසේමැයි:- කෙස්, ලොම්, නිය, දත්, කෙළ, සොටු, මල, මූ ආදිය අතුරෙන් එක් කොටසක් නමුදු, සිරුරෙන් ඉවතට හැලුණු සැණින් අත තැබීමට පවා කිසිවෙක් කැමැති නොවෙති, හැකිලෙති, මිරිකෙති, පිළිකුල් කෙරෙති, මේ සිරුරෙහි යම් යම් කොටසක් ඉතිරි වේද, ඒ ඒ කොටස් පවා පිළිකුල්වන නමුදු අවිද්‍යාන්ධකාරයෙන් වැසී ගියාහු ආත්ම ස්නේහරාගයෙන් ඇලුණාහු, ඉෂ්ටය, කාන්තය, නිත්‍යය, සුඛය, ආත්මයයි ගනිති. මෙසේ ගන්නා ඔවුහු කැල ගසක් දැක, ගසින් නොවැටුණු මලක් 'මේ මස් පිඩෙකි, මේ මස් පිඩෙකි'යි වෙහෙසට පත්වන ජරසිවලකු හා සමානබවට පත් වන්නාහුය, එහෙයින්,

යථාහි පුප්ඵිතං දිස්වා සිගාලො කිංසුකං වනෙ
මංසරුක්ඛො මයා ලද්ධො ඉති ගන්ත්වාන වෙගසා

පතිතං පතිතං පුප්ඵං ඩසිත්වා අතිලොලුපො:
නයිදං මංසං අදුං මංසං යං රුක්ඛස්මින්ති ගණ්හති

කොට්ඨාසං පතිතං යෙව අසුභන්ති තථා බුධො
අගහෙත්වාන ගණ්හෙය්‍ය සරීරට්ඨම්පි තං තථා

ඉමං හි සුභතො කායං ගහෙත්වා තත්ථ මුච්ඡිතා
බාලා කරොන්තා පාපානි දුක්ඛා න පරිමුච්චරෙ

තස්මා පස්සෙය්‍ය මෙධාවී ජීවිනො වා මතස්ස වා
සභාවං පූතිකායස්ස සුභභාවෙන වජ්ජිතං.

යම්සේ සිවලෙක් වනයෙහි මල් පිපුණු කැල ගසක් දැක 'මාහට මස් පිරුණු ගසක් ලැබිණැ'යි වේගයෙන් ගොස්,

වැටුණු වැටුණු මල ගිජුකමින් ඩැහැගෙන 'මේ මස් නොවේ, අර ගසෙහි එල්බෙනුයේ මස්ය'යි ගනීද,

එසේම වැටුණු කොටස් පමණක් අසුබ වශයෙන් (ගන්නා බාලයකුමෙන්) නොම ගෙන නුවණැත්තේ සිරුරෙහි ඉතිරි කොටස්ද අසුබ ලෙසින්ම ගන්නේය.

මේ කය සුබ වශයෙන් ගෙන එහි මුළාවට පත් අඥනයෝ පව්කම් කරන්නාහු දුකින් නොමිදෙති.

එහෙයින් නුවණැත්තේ ජීවමානවූ හෝ මළාවූ පිළිකුල් කයෙහි සුබබවින් තොරවූ ස්වභාවය දක්නේය. කියන ලදමැයි:

දුග්ගන්ධො අසුචි කායො කුණපො උක්කරූපමො
නින්දිතො චක්ඛුභූතෙහි කායො බාලාභිනන්දිතො

අල්ලචම්මපටිච්ඡන්නො නවද්වාරො මහාවණො
සමන්තතො පග්ඝරති අසුචි පූතිගන්ධියො

සචෙ ඉමස්ස කායස්ස අන්තො බාහිරතො සියා
දණ්ඩං නූන ගහෙත්වාන කාකෙ සොණෙ ච වාරයෙ.

දුගඳ වූ අපිරිසුදුවූ කය කුණපයෙකි, කසල ගොඩක් හා සමානය, නුවණැත්තවුන් විසින් නිඳු කරන ලද්දේය, අඥනයන් විසින් ඇල්මෙන් ගන්නා ලද්දේය.

නොවියලි සමින් වැසී ඇති නව දෙරක් සහිත මහවණයක්වූ කය සියලු පසින්ම වැගිරේ, අපිරිසුදු වේ. දුගඳ වහනය කෙරේ.

ඉදින් මේ කය ඇතුළත පිටතට පත්වූවහොත් නියැකයෙන්ම දණ්ඩක් ගෙන කපුටන් හා බල්ලන් වැළැක්වියයුතු වන්නේය.

එහෙයින් භව්‍යවූ භික්ෂුව විසින් ජීවමාන ශරීරයෙක්හි වේවයි, මෘත ශරීරයෙක්හි වේවයි, යම් යම් තැනෙක්හි අසුභ ආකාරය ඔහුට පෙනේද, ඒ ඒ තන්හිම නිමිති ගෙන කමටහන අර්පණා බවට පැමිණවිය යුතුය.

**සාධුජන ප්‍රමෝදය පිණිස කළ විශුද්ධිමාර්ගයෙහි**
**සමාධිභාවනාධිකාරයෙහි වූ අසුභකම්මට්ඨානනිද්දෙස නම්**
**සවන පරිච්ඡේදය මෙතෙකින් සමාප්තයි.**

# 7. ජ-අනුස්සතිනිද්දේසය

දස අසුභයනට අනතුරුව දක්වනලද දස අනුස්සතීන් අතර– නැවත නැවත උපදනා හෙයින් එහි සති තොමෝම අනුස්සති නම්වේ, පැවැත්වියයුතු තන්හිම පැවැත්වෙන හෙයින් හෝ සැදැහැයෙන් පැවිදිවූ කුලපුත්‍රයාහට යෝග්‍යවූ හෙයින් හෝ අනුස්සති නම්වේ–බුදුන් උදෙසා උපන් අනුස්සතිය **බුද්ධානුස්සති** නම් වේ, බුදුගුණ අරමුණුකොට උපන් සිහියට මේ අධිවචනයෙකි. ධර්මය අරබයා උපන් අනුස්සතිය **ධම්මානුස්සති** නම් වේ, ස්වාක්ඛාතතාදී දහම්ගුණ අරමුණුකොට ඇති සිහියට මේ අධිවචනයෙකි. සංඝයා අරබයා උපන් අනුස්සතිය **සංඝානුස්සති** නම් වේ, සුපටිපන්නතාදී සඟුන් ගුණ අරමුණුකොට ඇති සිහියට මේ අධිවචනයෙකි. සීලය අරබයා උපන් අනුස්සතිය **සීලානුස්සති** නම් වේ, අඛණ්ඩතාදී සිල්ගුණ අරමුණුකොට ඇති සිහියට මේ අධිවචනයෙකි. චාගය අරබයා උපන් අනුස්සතිය **චාගානුස්සති** නම් වේ, මුදහළ ආශා ඇතිබව ආදී ත්‍යාගගුණ අරමුණුකොට ඇති සිහියට මේ අධිවචනයෙකි. දේවතාවන් අරබයා උපන් අනුස්සතිය **දෙවතානුස්සති** නම්වේ, දෙවියන් සාක්ෂ්‍යස්ථානයෙහි තබා තමාගේ ශ්‍රද්ධාදී ගුණ අරමුණුකොට ඇති සිහියට මේ අධිවචනයෙකි. මරණය අරබයා උපන් සිහිය **මරණසති** නම් වේ, ජීවිතෙන්ද්‍රිය ක්‍ෂයවීම අරමුණුකොට ඇති සිහියට මේ අධිවචනයෙකි. කෙශාදී ප්‍රභෙද ඇති රූපකාය වෙත යොමුවූවා නොහොත් කය වෙත නැඹුරුවූවා **කායගතා** නම්, 'කායගතා'ද වූවා 'සති'ද වූවා 'කායගතසති' (සමාස කොට) කිවයුතු තැන හ්‍රස්ව නොකොට කායගතාසතියයි කියන ලදී, කෙශාදීවූ කයෙහි කොටස් නිමිතිකොට, අරමුණුකොට ඇති සිහියට මේ අධිවචනයෙකි. ආශ්වාස ප්‍රශ්වාසයන් අරබයා උපන් සතිය **ආනාපානසති** නම් වේ, ආශ්වාස ප්‍රශ්වාසයන් නිමිතිකොට අරමුණුකොට ඇති සිහියට මේ අධිවචනයෙකි. උපසමය අරබයා උපන් අනුස්සතිය **උපසමානුස්සති** නම් වේ. සියලු දුක් ශමනය කිරීම අරමුණුකොට ඇති සිහියට මේ අධිවචනයෙකි.

මෙසේ මේ දස අනුස්සතීන් අතුරින් පළමුකොට බුද්ධානුස්සති භාවනාව වඩනු කැමැති, බුදුගුණ තත්වාකාරයෙන් දැනීම හේතුකොට උපන් ප්‍රසාද ඇති යෝගාවචරයා විසින් යෝග්‍යවූ සෙනස්නෙක්හි, හුදෙකලාව විවේකසුවයෙන් යුක්තව, "මේ කරුණෙනුදු ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් නම් වනසේක, සම්මාසම්බුද්ධ නම් වනසේක, අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් සමන්විත වනසේක, සුගත නම් වන සේක. ලොකවිදූ නම් වනසේක, අනුත්තර පුරිසදම්මසාරථි නම් වනසේක.

දෙව්මිනිසුන්හට අනුශාසනා කරන හෙයින් ශාස්තෘ නම් වනසේක, භගවත් නම්ද වනසේකැ”යි මෙසේ භාග්‍යවත් බුදුන් වහන්සේගේ ගුණ සිහිකළ යුතුය. ඒ අනුස්මරණ ක්‍රමය මෙසේයි:- “ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද අර්හත් වනසේක, මෙසේද සම්මාසම්බුද්ධ වනසේක,-පෙ-මෙසේද භගවත් වනසේකැ’යි සිහිකරන්නේය. මේ මේ කරුණින්යයි කී නියායි. එහි කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින්, කෙලෙස් සතුරන්ද, සංසාරචක්‍රයෙහි අරයන්ද නැසූ හෙයින්, ප්‍රත්‍යයාදිය ලැබීමට සුදුසුවන හෙයින්, රහසින්වත් පව් නොකරන හෙයින්, යන මේ ආදී කරුණෙන් ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් වනසේකැ’යි සිහිකරන්නේය. ඒ භාග්‍යවතුන්වහන්සේ සියලු කෙලෙසුන්ගෙන් දුරුවූ සේක, දුරින්ම දුරුව සිටිසේක, ආර්යමාර්ගයෙන් වාසනාගුණ සහිත ක්ලේශයන් නැසූ හෙයින්, කෙලෙසුන්ගෙන් දුරුවූ හෙයින් අර්හත් වනසේක.

සො තතො ආරකා නාම යස්ස යෙනාසමඞ්ගිතා
අසමඞ්ගී ච දොසෙහි නාථො තෙනාරහං මතො.

යම් කෙනෙකුන්ගේ කිසිම වස්තුවක් හා සමග නොබැඳුණු බවෙක් වේද, ඒ නාථයන් වහන්සේ එම හේතුවෙන් “ආරකා” (දුරින් සිටියේ) නම් වනසේක, දෝෂයන්ගෙන්ද, විනිර්මුක්තවූ (ලෝක)-නාථයන් වහන්සේ එහෙයින් ‘අරහත්’ යයි දත්නාලද සේක.

කෙලෙස් නමැති සතුරෝද මොවුන් විසින් මාර්ගඥානයෙන් නසන ලද්දාහු’යි, සතුරන් නැසූ හෙයින් අරහත් නම් වනසේක.

යස්මා රාගාදිසංඛාතා සබ්බෙපි අරයො හතා
පඤ්ඤාසත්ථෙන නාථෙන තස්මාපි අරහං මතො.

යම් හෙයකින් රාගාදිසංඛ්‍යාතවූ සියලුම කෙලෙස් සතුරෝ ඒ නාථයන් වහන්සේ විසින් ප්‍රඥ නමැති ශස්ත්‍රයෙන් නසන ලද්දාහුද, එහෙයින්ද අර්හත්’යයි දත්නාලදසේක.

අවිද්‍යා, භවතෘෂ්ණා යන මෙයින් නිර්මිතවූ නාභියක් ඇති, පුණ්‍යාදී අභිසංස්කාර නමැති අර සහිත, ජරාමරණ නමැති නිම්වලලු ඇති, ආසවසමුදයෙන් සෑදි අක්ෂයෙන් විද ත්‍රිභව නමැති රථයෙහි යොදනලද, අනාදිමත් කාලයක් පවත්නා යම් මේ සංසාර නමැති චක්‍රයක් වේද, ඒ චක්‍රයෙහි සියලු අරයෝ මොවුන් විසින් බෝධිමූලයෙහිදී, ශීල නමැති පොළොවෙහි වීර්ය නමැති පයින් සිට, ශ්‍රද්ධා නමැති අතින්

කර්මක්‍ෂයකරඥාන නමැති පොරොව ගෙන සිඳින ලදහ'යි අරයන් සිඳලූ හෙයින්ද අර්හත් වනසේක. නොහොත්, අගක් මුලක් නැති සංසාරවට්ටය සංසාර චක්‍රයයි කියනු ලැබේ, එහි වනාහි අවිද්‍යාව නාභිය වේ. එය මුල්වන හෙයින්, ජරාමරණ යන දෙක නිම්වලලු වේ, එය කෙළවරවන හෙයිනි, (පටිච්චසමුප්පාදයෙහි දක්වෙන සංඛාරාදී) සෙසු දශධර්ම අරයෝ වෙති, අවිද්‍යාව මුල්වන හෙයින් හා ජරාමරණයන් කෙළවරවන හෙයිනි, එහි දුඃඛාදී සත්‍යයන් විෂයෙහි නොදන්නාබව අවිද්‍යාවයි. කාමභව විෂයෙහි අවිද්‍යාව කාමභවය පිළිබඳ සංඛාරයනට හේතුවේ. රූප-පෙ-අරූපභව විෂයෙහි අවිද්‍යාව අරූපභවය පිළිබඳ සංඛාරයනට හේතුවේ. කාමභව විෂයෙහිවූ සංඛාරයෝ කාමභවය පිළිබඳ පටිසන්ධිවිඤ්ඤාණයට හේතුවේ. සෙසු තන්හිද මෙම නයයි. කාමභව විෂයෙහි වූ පටිසන්ධිවිඤ්ඤාණය කාමභවය. පිළිබඳ නාමරූපයනට හේතුවේ. එසේම රූපභව විෂයෙහිද මෙම නයයි, අරූපභව විෂයෙහිවූ පටිසන්ධිවිඤ්ඤාණය අරූපභවය පිළිබඳ නාමයටම හේතුවේ. කාමභව විෂයෙහිවූ නාමරූපය කාමභවය පිළිබඳ සළායතනයට හේතුවේ, රූපභව විෂයෙහිවූ නාමරූපය රූපභවය පිළිබඳ ආයතන තුනට හේතුවේ. අරූපභව විෂයෙහි වූ නාමය අරූපභවය පිළිබඳ එක්ම ආයතනයට හේතුවේ. කාමභව විෂයෙහිවූ සළායතනය කාමභවය පිළිබඳ ස-වැදෑරුම් ඵස්සයට හේතුවේ. රූපභව විෂයෙහිවූ ආයතන තුන රූපභවය පිළිබඳ තෙ-වැදෑරුම් ඵස්සයට හේතුවේ, අරූපභව විෂයෙහිවූ එක්ම මනායතනය අරූපභවය පිළිබඳ එක්ම ඵස්සයට හේතුවේ. කාමභව විෂයෙහිවූ ස-වැදෑරුම් ඵස්සය කාමභවය පිළිබඳ ස-වැදෑරුම් වේදනාවට හේතුවේ, රූපභව විෂයෙහිවූ තෙ-වැදෑරුම් ඵස්සය රූපභවය පිළිබඳ තෙ-වැදෑරුම් වේදනාවට හේතුවේ, අරූපභව විෂයෙහිවූ එක්ම ඵස්සය එය පිළිබඳවවූ එක්ම වේදනාවට හේතුවේ. කාමභව විෂයෙහිවූ ස-වැදෑරුම් වේදනාව කාමභවය පිළිබඳ ස-වැදෑරුම් තණ්හා කායයනට හේතුවේ, රූපභව විෂයෙහිවූ තුන් වැදෑරුම් වේදනාව එයම පිළිබඳ තුන්-වැදෑරුම් තණ්හාකායයනට හේතුවේ, අරූපභව විෂයෙහිවූ එක්ම වේදනාව එයම පිළිබඳ වූ එක්ම තණ්හාකායයට හේතුවේ. ඒ ඒ භව විෂයෙහි වූ තණ්හාව ඒ ඒ භවය පිළිබඳ උපාදානයටද, උපාදානාදිය භව ආදියටද හේතුවේ. කෙසේද යත්, මේ ලෝකයෙහි කිසියම් පුද්ගලයෙක් කම්සැපත් වළඳම්'යි කාමුපාදානය හේතුකොට කයින් දුශ්චරිතයෙහි හැසිරේ, වචනයෙන් දුශ්චරිතයෙහි හැසිරේ, මනසින් දුශ්චරිතයෙහි හැසිරේ, දුසිරිත් පිරීමෙන් අපායෙහි උපදී, එහිලා ඔහුගේ ඒ උපතට හේතුවූ කර්මය කර්මභවය වේ, කර්මයෙන් උපන් ස්කන්ධයෝ උප්පත්තිභව නම්වේ. ස්කන්ධයන්ගේ හටගැනීම ජාති නම්වේ, මුහුකුරා යාම ජරා නම්වේ, බිඳීයාම මරණ නම්වේ. අනෙකෙක් සගසැප වළඳිමියි

එසේම දුච්චරිතයෙහි හැසිරෙයි, දුච්චරිත පරිපූරණය හේතුකොට ස්වර්ගයෙහි උපදියි, එහිලා ඔහුගේ උපතට හේතුවූ කර්මය කර්මභව නම් වෙති'යි එම නයම වේ. අනෙකෙක් බඹලෝ සැප අනුභව කෙරෙමි'යි කාමඋපාදන හේතුවෙන්ම මෛත්‍රීය වඩයි-පෙ-කරුණාව-පෙ-මුදිතාව-පෙ-උපෙක්ඛාව වඩයි, එම භාවනා පරිපූරණය හේතුකොට බඹලොව උපදියි, එහි ඔහුගේ එම උපතට හේතුවූ කර්මය කර්මභව නමැයි එම නයම වේ. තවද පුද්ගලයෙක් අරූපභවයෙහි සැපත් විඳිමි'යි එසේම ආකාසානඤ්චායතනාදී සමාපත්තීන් වඩයි. භාවනාපරිපූරණය හේතුකොට ඒ ඒ බඹලොවෙහි උපදියි, එහිලා ඔහුගේ එම උපතට හේතුවූ කර්මය කර්මභව නම්වේ. කර්මයෙන් උපන් ස්කන්ධයෝ උප්පත්තිභව නම්වේ, ස්කන්ධයන්ගේ ඉපැදීම ජාතියයි, මුහුකුරා යාම ජරාවයි, බිඳීයාම මරණයයි. සෙසු උපාදනයන් මුල්කොට කරනු ලබන යෝජනාවන්හිදීද මෙම නය වේ. මෙසේ මේ අවිද්‍යාව හේතුවයි, සංස්කාරයෝ එම හේතුවෙන් උපන්නාහුයයි, මේ අවිද්‍යා සංස්කාර යන දෙකම හේතුවෙන් උපන්හ'යි හේතු පිරිසිඳ ගැනීමේ ප්‍රඥාව ධම්මට්ඨිතිඤාණ නම්වේ. අතීත කාලයෙහිද, අනාගත කාලයෙහිද සංස්කාරයෝ හේතුවෙන්ම හටගන්නාහු වෙති, මේ අවිද්‍යා සංස්කාර යන දෙකම හේතුවෙන් උපන්හ"යි හේතු පිරිසිඳගැනීමේ ප්‍රඥාව ධම්මට්ඨිතිඤාණය'යි[(1)] මෙසේ මෙම ක්‍රමයෙන් සියලු පදයන් විස්තර කළ යුතුය. එහි අවිජ්ජා, සංඛාර යන දෙක එක් සංක්ෂෙපයෙකි, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන පස එක් සංක්‍ෂෙපයෙකි, තණ්හා උපාදන භව යන තුන එක් සංක්‍ෂෙපයෙකි, ජාති, ජරා, මරණ යන තුන එක් සංක්‍ෂේපයෙකි. මෙහි ප්‍රථම සංක්‍ෂේපය අතීත කාලයයි, මධ්‍යයෙහිවූ දෙක වර්තමාන කාලයයි, (අවසන්හිවූ) ජාති, ජරා, මරණ යන තුන අනාගත කාලයයි. අවිජ්ජා සංඛාර යන දෙක ගැනීමෙන් තණ්හා. උපාදන, භව යන තුන ගන්නා ලද්දේමයයි; මේ පස අතීත කම්මවට්ටයයි, විඤ්ඤාණාදී පස වර්තමානයෙහිවූ විපාකවට්ටයයි, තණ්හා, උපාදන, භව යන තුන ගැනීමෙන් අවිජ්ජා, සංඛාර, යන දෙක ගන්නා ලද්දේමයයි; මේ පස වර්තමාන කම්මවට්ටයයි. ජාති, ජරා, මරණ යන තුන පැවසීමෙන් විඤ්ඤාණාදියද දක්වනලද හෙයින් මේ (විඤ්ඤාණාදී) පස අනාගත විපාකවට්ටයයි. ඒ අවිද්‍යා ආදිය ආකාර වශයෙන් විසි වැදෑරුම් වේ. මෙහි සංඛාර, විඤ්ඤාණ යන දෙක අතර (හේතුඵල වශයෙන්) එක් සන්ධියෙකි, වේදනා, තණ්හා යන දෙක අතර එක් සන්ධියෙකි, භව, ජාති යන දෙක අතර එක් සන්ධියෙකි'යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ සංක්‍ෂෙප සතරක් ඇති, කාලත්‍රයයෙන්

(1) පටිසම්භිදාමග්ග - Ps i 50

යුත්, විසි ආකාරවූ, සන්ධි තුනක් ඇති පටිච්චසමුප්පාද ධර්මය සියලු ආකාරයෙන් දන්නාසේක, දක්නාසේක, ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දන්නාසේක, විනිවිද දක්නාසේක. (යථාස්වභාවයෙන්) දත් හෙයින් ඤාණ නම්, ප්‍රතිවෙධ වශයෙන් දත් හෙයින් පඤ්ඤා නම්, එහෙයින්, "හේතූන් පිරිසිඳ දැනීමේ නුවණ ධම්මට්ඨිතිඤානය'[1]යි කියනු ලැබේ. මෙම ධම්මට්ඨිතිඤාණයෙන් භාග්‍යවතුන් වහන්සේ ඒ ධර්මයන් තත්වූ පරිද්දෙන් දැන එම ධර්මයන් කෙරෙහි කලකිරෙන සේක්, දුරලන සේක්, යටකී ප්‍රකාර ඇති මේ සංසාරවට්ටයෙහි අරයන් බිඳලූ සේක, නැසූ සේක, විදහූ සේක, මෙසේද අරයන් නැසූ හෙයින් අර්හත් නම් වන සේක.

අරා සංසාරචක්කස්ස හතා ඤාණාසිනා යතො
ලොකනාථෙන තෙනෙස අරහන්ති පවුච්චති

යම් හෙයකින් ලෝකනාථයන් වහන්සේ විසින් ඥාන නමැති කඩුවෙන් සංසාර නමැති චක්‍රයෙහි අරයෝ සිඳින ලද්දාහුද, එහෙයින් උන්වහන්සේ අර්හත්යයි වහරනු ලැබෙති.

අග්‍රදක්ෂිණාර්හ වනහෙයින් චීවරාදී සිවුපසයද, පූජා විශේෂයන්ද ලැබීමට සුදුසු වෙති. එහෙයින්ම තථාගතයන් උපන් කල යම්කිසි මහේශාඛ්‍ය දේවමනුෂ්‍ය කෙනෙක් වෙත්ද, ඔවුහු අන්‍යතීර්ථකයන් වෙත පූජාවන් නො-කෙරෙති. ඒ ඒසේමැයි, සහම්පති නම් බ්‍රහ්ම තෙමේ මේරු (පර්වත) ප්‍රමාණවූ රුවන් දමෙකින් තථාගතයන් වහන්සේ පිදීය, අන් දෙවියෝද, බිම්බිසාර රජු, කොසොල් රජු ආදී මනුෂ්‍යයෝද ශක්ති ප්‍රමාණයෙන් පිදූහ. අශෝක මහරජ තෙමේ පිරිනිවියාවූද භාග්‍යවතුන් වහන්සේ උදෙසා සයානු කෙළක් ධනය වැයකොට මුළු දඹදිව්තෙලෙහි අසූසාරදහසක් විහාරයන් පිහිටුවීය. අන්‍යවූ පූජා විශේෂයන් ගැන කවර වාදයෙක්දැ'යි ප්‍රත්‍යයයනට සුදුසුවන හෙයින් අර්හත් නම් වනසේක.

පූජාවිසෙසං සහ පච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථො
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං.

යම් හෙයකින් මේ ලෝකනාථයන් වහන්සේ ප්‍රත්‍යයයන් සහිතවූ පූජාවිශේෂයනට සුදුසු වෙත්ද, එහෙයින් ඒ ජිනෙන්ද්‍රයන්

(1) එම - Ps i 52

වහන්සේ මේ ලෝකයෙහි අන්වර්ථවූ ‘අරහං’ යන මේ නාමයට සුදුසු වෙති.

තවද යම්සේ මේ ලෝකයෙහි පණ්ඩිතමානීවූ කිසියම් අඥානජනකෙනෙක් අපකීර්තියට බියෙන් රහසිගතව පව් කෙරෙත්ද, එනමුත් මේ භාග්‍යවතුන් වහන්සේ කවර කලෙකවත් එසේ නොකෙරෙති’යි, පව් කිරීමෙහි රහස් නැති හෙයින්ද අර්හත් නම් වෙති.

යස්මා නත්ථි රහො නාම පාපකම්මෙසු තාදිනො
රහාභාවෙන තෙනෙස අරහං ඉති විස්සුතො

එවන් (තාදීගුණ ඇති) භාග්‍යවතුන් වහන්සේට යම් හෙයකින්, පව්කම්හි රහස් නැත්තේ වේද, එසේ රහස් නැති බැවින්ද, මොවුන් වහන්සේ අර්හත්යයි ප්‍රකටවූ සේක.

මෙසේ සියලු ආකාරයෙන්ම

ආරකත්තා හතත්තා ච කිලෙසාරීන සො මුනි
හතසංසාරචක්කාරො පච්චයාදීන චාරහො
න රහො කරොති පාපානි අරහං තෙන වුච්චති

ඒ මුනිවරයන් වහන්සේ කෙලෙස් සතුරන්ගෙන් දුරුවූ හෙයින්ද, එම කෙලෙස් සතුරන් නැසූ හෙයින්ද, සංසාරචක්‍රයෙහි අරයන් සිඳදමා ප්‍රත්‍යයාදීනට සුදුසුවද, රහසින්වත් පව් නොකරති, එහෙයින් අර්හත්යයි කියනු ලැබෙති.

සියලු ධර්මයන් තමන්ම මනාකොට අවබෝධ කළහෙයින් **සම්මාසම්බුද්ධ** වනසේක. ඒ එසේමැයි, මොවුන් වහන්සේ සියලු ධර්මයන් අවබෝධ කළසේක් සම්මා සම්බුද්ධයහ, මැනවින් දතයුතු ධර්මයන් තමන් වහන්සේම මැනවින් අවබෝධ කළහ, පිරිසිඳ දතයුතු ධර්මයන් පිරිසිඳ දතයුතුයයි දත්හ, පහකළයුතු ධර්මයන් පහකළයුතුයයි දත්හ, සාක්ෂාත් කටයුතු ධර්මයන් සාක්ෂාත් කටයුතුයයි දත්හ. එහෙයින්ම කීහු.

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බඤ්ච භාවිතං
පහාතබ්බං පහීනමෙම තස්මා බුද්ධො’ස්මි බ්‍රාහ්මණ[1]

(1) සු. නි. සෙලසු. - Sn 558 (=ම. නි.)

බ්‍රාහ්මණය, මවිසින් මනාව දතයුතු දෙය මනාව දන්නා ලද්දේය, වැඩියයුතු දෙය වඩනා ලද්දේය, පහ කළයුතු දෙය පහකරන ලද්දේය, එහෙයින් බුද්ධ නම් වෙමි.

තවද, චක්ෂුරායතනය දුකැ'යි යන දුඃඛ සත්‍යයද, එම චක්ෂුරායතනයට මුල්වූ හේතු වශයෙන් උත්පාදක පූර්ව තෘෂ්ණා වන සමුදය සත්‍යයද, ඒ දෙකෙහිම නොපැවැත්ම වන නිරෝධ සත්‍යයද, එම නිරොධය ප්‍රතිවෙධ කිරීමේ ප්‍රතිපත්ති මාර්ගය වන මාර්ගසත්‍යයදැයි මෙසේ එක් එක් පදයෙන් නිර්ධාරණය වන (වෙන්කොට දක්වෙන) සියලු ධර්මයන් මනාකොට තමන්ම අවබෝධ කළහ. සොත-ඝාන-ජිව්හා-කාය-මනො යන මොවුන් කෙරෙහිද මෙම නය වේ. මෙනයින්ම රූපාදීවූ ෂඩායතනයන්ද, චක්ඛු විඤ්ඤාණාදී ෂඩ්විඥනකායයන්ද, චක්ඛු සම්ඵස්සාදී ෂට්ස්පර්ශයන්ද. චක්ඛුසම්ඵස්සාදියෙන් හටගත් ෂඩ්වෙදනාවන්ද, රූපතෘෂ්ණාදී ෂට්තෘෂ්ණාකායයන්ද, රූපවිතක්කාදී ෂඩ්විතර්කයන්ද, රූපවිචාරාදී ෂඩ්විචාරයන්ද, රූපස්කන්ධාදී පංච ස්කන්ධයන්ද, දසකකසිණයන්ද, දස අනුස්සතීන්ද, උද්ධුමාතකසඤ්ඤාදී වශයෙන් දසසඤ්ඤාවන්ද, කේශාදීවූ ද්වත්තිංසාකාරයන්ද, ද්වාදශායතන යන්ද, අටළොස් ධාතුන්ද, කාමභවාදී නව භවයන්ද, ප්‍රථමධ්‍යානාදීවූ චතුර්ධ්‍යානයන්ද, මෛත්‍රී භාවනාදීවූ අප්පමඤ්ඤා සතරද, අරූපසමාපත්ති සතරද, ප්‍රතිලෝම වශයෙන් ජරාමරණාදිය හා අනුලෝම වශයෙන් අවිද්‍යාදියදැ'යි යන පටිච්චසමුප්පාද ඞගයන්ද යෙදිය යුතුය. එහි එක් පදයෙක යෝජනා ක්‍රමය මෙසේය:- ජරාමරණ දෙක දුඃඛ සත්‍යයයි, ඉපදීම සමුදයසත්‍යයයි. මේ දෙකෙහිම නැවැත්ම නිරොධ සත්‍යයයි, නිරොධය දනගැනීමට හේතුවන ප්‍රතිපදව මාර්ගසත්‍යයයි යනුවෙන් මෙසේ එක් එක් පදය ගෙන බැලීමෙන් සියලු ධර්මයන් තමන්ම මනාකොට අවබෝධ කළහ, තත්වාකාරයෙන් දත්හ, විනිවිද දත්හ, එහෙයින් "මනාකොට (සම්මා) තමන්ම (සාමඤ්ච) සියලු ධර්මයන් අවබෝධ කළහෙයින් **සම්මාසම්බුද්ධ** වෙති'යි කියනලදී.

විද්‍යාවන්ගෙන්ද චරණධර්මයන්ගෙන්ද සමන්විතවූ හෙයින් විජ්ජාචරණසම්පන්න නම් වනසේක. එහි විජ්ජා නම් ත්‍රිවිද්‍යා හා අෂ්ටවිද්‍යාය. ත්‍රිවිද්‍යාවත් භයභෙරවසූත්‍රයෙහිද අෂ්ටවිද්‍යාවන් අම්බට්ඨසූත්‍රයෙහිද කීනයින් දතයුතුය. එහි වනාහි විදර්ශනාඥනය හා මනෝමය ඍද්ධිය ෂඩභිඥවන් හා සමඟ ගෙන අෂ්ටවිද්‍යායයි කියනලදි. චරණ නම්, ශීලසංවරය, ඉන්ද්‍රිය විෂයෙහි වසනලද දොර ඇතිබවය, භෝජනයෙහි පමණ දන්නා බවය, ජාගරියානුයෝගය හෙවත් නිතර පිබිදීමෙන් යුතුව සිටීම (ශ්‍රද්ධා,

හිරි, ඔත්තප්ප, බහුශ්‍රැතතා, වීර්ය, ස්මෘති ප්‍රඥ යන) සප්ත ධර්මය, සතර රූපාවචරධ්‍යානයයි යන මේ පසළොස් චරණ ධර්මයයි දතයුතුය. මේ පසළොස් චරණධර්මයෝම–යම් හෙයකින් මේ ධර්මයන් කරණකොට ආර්යශ්‍රාවක තෙමේ හැසිරේද, නිවන් දෙසට යේද, එහෙයින් චරණයයි කියන ලද්දහ. කියනලදමැයි 'මහානාමය, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙමේ සිල්වත් වේද'යි[1] යන මේ සියල්ල මජ්ඣිමපණ්ණාසකයෙහි කීනයින්ම දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ මෙකී විද්‍යාවන්ගෙන් හා චරණධර්මයන්ගෙන් සමන්විත වූසේක. එහෙයින් **විජ්ජාචරණසම්පන්නයහ**'යි කියනු ලැබේ. එහි විජ්ජාසම්පත්තිය භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥතාවද, චරණසම්පත්තිය මහාකාරුණිකතාවද පුරා පැතිර සිටියි. උන්වහන්සේ සර්වඥතාවෙන් සියලු සත්වයන්ගේ වැඩ අවැඩ දෙක දැන, මහාකාරුණිකතාවෙන් අවැඩ වලකා වැඩෙහි යොදවන සේක. යම්සේ විජ්ජාචරණසම්පන්න වනසේක්ද, එසේම ඔවුන්ගේ ශ්‍රාවකයෝද සුප්‍රතිපන්න වෙති, දුෂ්ප්‍රතිපන්න නොවෙති. විජ්ජාචරණවිපන්නයන්ගේ ශ්‍රාවකයෝ වනාහි අත්තන්තපාදීන් බඳු වෙති.

යහපත් ගමන් ඇති හෙයින්ද, සොඳුරු තැනට ගිය හෙයින්ද, මනාසේ ගිය හෙයින්ද, මනා තෙපුල් ඇති හෙයින්ද, **සුගත** නම් වනසේක. ගමනද 'ගත'යයි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේගේ ඒ ගමනද යහපත් වේ, පිරිසුදු වේ, නිරවද්‍ය වේ. ඒ කවර ගමනෙක්ද යත්, ආර්යමාර්ගය පිළිබඳවූ ගමනයි, එම ආර්යමාර්ගයෙන් මුන්වහන්සේ නිවන් දෙසට නොපැකිල ගියසේකැ'යි ශෝභන ගමන් ඇති හෙයින් සුගත නම් වනසේක. උන්වහන්සේ සුන්දරස්ථානයයි කියනලද අමෘත මහා නිර්වාණයට ගියහ'යි සුන්දරස්ථානයට ගිය හෙයින්ද සුගත නම් වනසේක. ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණ කරනලද ක්ලෙශයනට පෙරළා නො-එතැ'යි සුගත නම් වනසේක. කියනලද මැයි: "සොතාපත්ති මාර්ගයෙන් යම් ක්ලෙශයෙක් ප්‍රහීණ කරන ලද්දේද, එම ක්ලෙශයට යළි නො-එති, පෙරළා නො-එති'යි සුගත නම් වන සේක - පෙ-අර්හත් මාර්ගයෙන් යම් ක්ලෙශයෙක් ප්‍රහීණ කරන ලද්දේද, එම ක්ලෙශයට යළි නො-එති'යි, පෙරළා නො-එති'යි සුගත නම් වනසේක." නොහොත්, දීපංකර පාදමූලයෙහි පටන් බෝමැඩ තෙක් සමතිස් පැරුම් පුරමින් සම්‍යක් ප්‍රතිපත්තියෙන් සියලු ලෝකයාහට හිත සුව සලස්වමින් ශාශ්වතය, උච්ඡේදය, කාමසුඛය, අත්තකිලමථය යන මේ අන්තයනට නොයෙමින් ගියහ'යි මනාසේ ගිය හෙයින්ද සුගත නම් වනසේක. මනාකොට

---

(1) ම. නි. සෙඛසු - M i 355

බෙණෙති'යි සුදුසු තන්හි සුදුසුමවූ වදන් බෙණෙති'යි මනාකොට බෙණෙන හෙයින්ද මොවුන් වහන්සේ සුගත නම් වනසේක. එහිලා මේ සාධකවූ සූත්‍රයෙකිඃ 'තථාගතයන් වහන්සේ යම් වචනයක් අසත්‍යයයි, අතථ්‍යයයි, අනර්ථෝදයකයයි දනිත්ද, එයද පරහට අප්‍රිය වන්නේද, නොමිහිරි වන්නේද, තථාගතයන් වහන්සේ එම වචනය නොබෙණති, යම් වචනයක් සත්‍යයයි, තථ්‍යයයි, අනර්ථකරයයි දනිත්ද, එය පරහට අප්‍රිය වන්නේද, නොමිහිරි වන්නේද එයද තථාගතයන් වහන්සේ නොබෙණෙති, යම් වචනයක් වනාහි සත්‍යයයි, තථ්‍යයයි, වැඩ සලසති'යි දනිත්ද, එය පරහට අප්‍රිය වන්නේද. නොමිහිරි වන්නේද, එහිදී තථාගතයන් වහන්සේ එම වචනය ප්‍රකාශ කිරීම කල් දන කෙරෙති, යම් වචනයක් අසත්‍යයයි, අතථ්‍යයයි, අවැඩ සලසති'යි දනිත්ද, එය පරහට ප්‍රිය වන්නේද, මිහිරි වන්නේද, තථාගතයන් වහන්සේ, එම වචනයද නොබෙණෙති. යම් වචනයක් සත්‍යයයි, තථ්‍යයයි, වැඩ සලසති'යි දනිත්ද, එය පරහට ප්‍රිය වන්නේද, මිහිරි වන්නේද එම වචනය පැවසීම කල් දන කෙරෙති.'[(1)] මෙසේ මනාකොට බෙණෙන හෙයින්ද, **සුගත** නම් වන සේකැ'යි දතයුතුය.

සර්වප්‍රකාරයෙන්ම ලෝතතු දත් හෙයින් **ලොකවිදූ** නම් වෙති, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි ස්වභාව වශයෙන්ද, (හටගැනීමේ) හේතු වශයෙන්ද, නිරෝධ වශයෙන්ද, නිරෝධ උපාය වශයෙන්දැයි යන මේ සියලු ආකාරයෙන්ම ලෝකය දත් සේක, අවබෝධකළ සේක, විනිවිද දුටුසේක. යම්සේ කියන ලද්දේදඃ 'ඇවැත්නි, යම් තැනෙක වනාහි ඉපැදීමක් නැත්ද, ජරාවට පැමිණීමක් නැත්ද, මරණයක් නැත්ද, චුත වීමක් නැද්ද, යළි ඉපැදීමක් නැත්ද, එබඳුවූ ලොකාවසානය පාගමනින් ගොස් දත හැකියයි, දක්ක හැකියයි, පැමිණිය හැකියයි මම නොපවසමි, ඇවැත්නි, ලෝකාවසානයට නොපැමිණම දුක් කෙළවර කිරීමක්ද මම නොපවසමි; ඇවැත්නි, එසේ වුවද, බඹයක් පමණවූ, හැඟීම් සහිතවූ මනසින් යුතුවූ මේ සිරුර තුළ ලෝකයද, ලෝකය පිළිබඳ හේතුවද, ලෝකය පිළිබඳ නිරෝධයද, ලෝකනිරෝධයට පමුණුවන ප්‍රතිපදවද පෙන්වමි.

ගමනෙන න පත්තබ්බො ලොකස්ස'න්තො කුදචනං
න ච අප්පත්වා ලොකන්තං දුක්ඛා අත්ථි පමොචනං

තස්මා හවෙ ලොකවිදූ සුමෙධො
ලොකන්තගු වුසිතබ්‍රහමචරියො

(1) ම. නි. අභයරාජකුමාර සූ - M i 395

ලොකස්ස අන්තං සමිතාවි ඤත්වා
නාසිංසති ලොකමිමං පරඤ්චා'ති.[1]

පාගමනින් ගොස් ලෝකයෙහි කෙළවරට කිසිකලෙකත් නොපැමිණිය හැකිය, ලෝකයෙහි කෙළවරට නොපැමිණ දුකින් මිදීමෙක්ද නැත.

එහෙයින් ලෝකය දන්නාවූ, යහපත් ප්‍රඥ ඇති, ලෝකයෙහි කෙළවරට ගියාවූ මාර්ගබ්‍රහ්මචර්යාව වැස නිම කළාවූ, කෙලෙස් සංසිද දමූ ලෝකයෙහි කෙළවර ඒකාන්ත වශයෙන් දන මේ ලෝකය හෝ පර ලෝකය හෝ නොපතයි.

තවද, සංස්කාර ලෝකය, සත්ව ලෝකය අවකාශ ලෝකයයි ලෝක තුනෙකි. එහි "එකො ලොකො, සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා"[2] යනුවෙන් ආතන්හි සංස්කාර ලෝකයයි දතයුතුය. "සස්සතො ලොකො'ති වා අසස්සතො ලොකො'තිවා"[3] යනුවෙන් ආ තන්හි සත්වලෝකයයි දතයුතුය.

"යාවතා චන්දිමසූරියා පරිහරන්ති දිසා භන්ති විරොචනා
තාව සහස්සධා ලොකො එත්ථ තෙ වත්තතී වසො"[4]

යම් පමණ තන්හි දීප්තිමත් චන්ද්‍රසූර්යයෝ දිශාවන් බබලවමින් හැසිරෙත්ද, ලෝකය එපමණ තැන් මෙන් දහස් ගුණයකි, මෙහි ඔබගේ අණසක පවත්නේය. යනුවෙන් ආතන්හි අවකාශලෝකයයි.

එම අවකාශ ලෝකයද භාග්‍යවතුන් වහන්සේ සර්වාකාරයෙන් දත්සේක. එසේම උන්වහන්සේ විසින් 'සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා යනුවෙන් එක් ලෝකයක්ද, 'නාමඤ්ච රූපඤ්ච' යනුවෙන් ලෝක දෙකක්ද, 'තිස්සො වෙදනා' යනුවෙන් ලෝක තුනක්ද, 'චත්තාරො ආහාරා' යනුවෙන් ලෝක සතරක්ද, 'පඤ්චුපාදානක්ඛන්ධා' යනුවෙන් ලෝක පසක්ද, 'ඡ අජ්ඣත්තිකානි ආයතනානි' යනුවෙන් ලෝක සයක්ද 'සත්ත විඤ්ඤාණට්ඨිතියො' යනුවෙන් ලෝක සතක්ද, 'අට්ඨ ලොකධම්මා' යනුවෙන් ලෝක අටක්ද, 'නව සත්තාවාසා' යනුවෙන් ලෝක නවයක්ද,

(1) සං. නි. දෙවපුත්ත සං - S i 62
(2) පටිසම්භිදාමග්ග - Ps i 122
(3) ම. නි. චූළමාලුඞ්ක්‍ය සු. - M i 426
(4) ම. නි. බ්‍රහ්මනිමන්තනික සු - M i 328

'දසායතනානි' යනුවෙන් ලෝක දසයක්ද, 'ද්වාදසායතනානි' යනුවෙන් ලෝක දෙළොසක්ද, අටධාරස ලොකා අටධාරස ධාතුයෝ යනුවෙන් ලෝක අටළොසක්ද ධාතතුහු අටළොසක්දැයි[1] යන මේ සංස්කාර ලෝකයද සකලාකාරයෙන් දන්නා ලද්දේය. යම් හෙයකින් වනාහි මොවුන් වහන්සේ සියලු සත්වයන්ගේ ආශය (ගති ලක්‍ෂණ) දනිත්ද, අනුසය (නැඹුරුවීම්) දනිත්ද, චරිතය දනිත්ද, අදහස් දනිත්ද, මඳ කෙලෙස් ඇත්තවුන්ද, මහ කෙලෙස් ඇත්තවුන්ද, තීක්ෂ්ණඉන්ද්‍රිය ඇත්තවුන්ද, මෘදුඉන්ද්‍රිය ඇත්තවුන්ද, යහපත් ආකාර ඇත්තවුන්ද, අයහපත් ආකාර ඇත්තවුන්ද, පහසුවෙන් අවබෝධ කරවිය හැක්කවුන්ද, පහසුවෙන් අවබෝධ කරවිය නොහැක්කවුන්ද, භව්‍යයන් හා අභව්‍යයන්ද මැනවින් දනිත්ද, එහෙයින් මොවුන් වහන්සේ විසින් සත්වලෝකයද සර්වප්‍රකාරයෙන් දන්නා ලද්දේය. සත්වලෝකය මෙන්ම අවකාශලෝකයද දන්නා ලද්දේය. එසේමැයි: මේ අවකාශ ලෝකය වූකලී, එක් සක්වළක් දිගින් පළලින් යොදුන් දෙළොස් ලක්ෂ තුන් දහස් හාරසිය පණසකි. වටප්‍රමාණයෙන්,

> සබ්බං සතසහස්සානි ඡත්තිංස පරිමණ්ඩලං
> දස චෙව සහස්සානි අඩ්ඪුඩ්ඪානි සතානි ච.

මුළු වටප්‍රමාණය තිස්හය ලක්‍ෂයක්ද, දසදහසක්ද, තුන්සිය පණසක්ද (තිස්හය ලක්‍ෂ දසදහස් තුන්සිය පණසක්) යොදුන් වන්නේය, එහි,

> දුවෙ සතසහස්සානි චත්තාරි නහුතානි ච
> එත්තකා බහලත්තෙන සංඛාතා'යං වසුන්ධරා

මේ මහපොළොව ගනකමින් දෙලක්‍ෂයක්ද, සතළිස් දහසක්දැ'යි මෙපමණ (යොදුන්) වන්නේයයි කියනලදි. ඒ මහපොළොව දරා සිටින,

> චත්තාරි සතසහස්සානි අට්ඨේව නහුතානි ච
> එත්තකං බහලත්තෙන ජලං වාතෙ පතිට්ඨිතං

සාර ලක්‍ෂයක්ද, අසූදහසක්දැ'යි මෙපමණ ගැඹුරුබව ඇති ජලය වාතය මත පිහිටියේය.

ඒ ජලයද දරා සිටින,

---

(1) පටිසම්භිදාමග්ග - Ps 122

නව සතසහස්සානි මාලුතො නභමුග්ගතො
සට්ඨි චෙව සහස්සානි එසා ලොකස්ස සණ්ඨිති.

ආකාශයෙන් පැන නැඟුණ, නව ලක්‍ෂයක්ද, සැටදහසක්දයි මෙතෙක් ගනකඩ ඇති වාතය වන්නේය. මේ අවකාශ ලෝකයෙහි ව්‍යුහයයි.

මෙසේ සැදුම් ලත් මේ ලෝකධාතුවෙහි,

චතුරාසීති සහස්සානි අජ්ඣොගාළ්හො මහණ්ණවෙ
අච්චුග්ගතො තාවදෙව සිනෙරුපබ්බතුත්තමො

අසූසාර දහසක් යොදුන් මහාසාගරයෙහි ගිලී, එපමණම (මහාසාගරයෙන්) මතුවී පවතින මේරු පර්වතරාජයාද වන්නේය.

තතො උපඩ්ඪුපඩ්ඪෙන පමාණෙන යථාක්කමං
අජ්ඣොගාළ්හුග්ගතා දිබ්බා නානාරතනචිත්තිතා
යුගන්ධරො ඊසධරො කරවීකො සුදස්සනො
නෙමින්ධරො විනතකො අස්සකණ්ණො ගිරි බ්‍රහා
එතෙ සත්ත මහාසෙලා සිනෙරුස්ස සමන්තතො
මහාරාජානමාවාසා දෙවයක්ඛනිසෙවිතා.
යොජනානං සතානුච්චො හිමවා පඤ්ච පබ්බතො
යොජනානං සහස්සානි තීණි ආයතවිත්ථතො
චතුරාසීති සහස්සානි කූටෙහි පතිමණ්ඩිතො.
තිපඤ්ච යොජනක්ඛන්ධ-පරික්ඛෙපා නගව්හයා
පඤ්ඤාස යොජනක්ඛන්ධ-සාඛායාමා සමන්තතො
සතයොජනවිත්ථිණ්ණා තාවදෙව ච උග්ගතා
ජම්බු යස්සානුභාවෙන ජම්බුදීපො පකාසිතො.

ඒ මේරු පර්වතයෙහි පටන් පිළිවෙළින් එකිනෙකට අඩක් අඩක් පමණ ජලයෙහි ගිලී හා ජලයෙන් නැඟී සිටින යුගන්ධරය, ඊසධරය, කරවීකය, සුදස්සනය, නේමින්ධරය, විනතකය, අස්සකණ්ණය යන මේ දිව්‍යමය නොයෙක් රුවනින් විසිතුරුවූ මහා පර්වතයෝ වෙති.

මේ සප්ත මහා පර්වතයෝ මේරු පර්වතය වටකොට සිටියාහුය, සතරවරම් දෙව්මහරජුන්ගේ වාසස්ථානයෝය, දෙවියන් යකුන් විසින් සෙවුනා ලද්දාහුය.

හිමාලය පර්වතය යොදුන් පන්සියයක් උසය, දිගින් පළලින් යොදුන් තුන්දහසෙකි, අසූසාර දහසක් කුළින් හෙබියේය.

වටප්‍රමාණයෙන් පසළොස් යොදුන් පමණ කඳක් ඇති, පණස් යොදුන් දිග කඳ සිසාරා පණස් යොදුන් දිග ශාඛා ඇති, සියයක් යොදුන් පමණ පැතිරී සිටි, එපමණම උස ඇති, "න-ග" නාමධාරී (යම් වෘක්‍ෂයක්හුගේ) ආනුභාවයෙන් ජම්බුද්වීපය යන නම ප්‍රකාශයට පත්වීද, එම ජම්බු වෘක්‍ෂයද පිහිටියේය.

මේ ජම්බු වෘක්‍ෂය යම් තරම් වේද, අසුරයන්ගේ චිත්‍ර පාටලී වෘක්‍ෂයද, ගරුඩයන්'ගෙ' සිම්බලී වෘක්‍ෂයද, අපරගෝයානයෙහි කදම්බ වෘක්‍ෂයද, උතුරුකුරු දිවයිනෙහි කල්ප වෘක්‍ෂයද පූර්වවිදේහයෙහි සිරීස වෘක්‍ෂයද, තාවතිංසයෙහි පාරිච්ඡත්තක වෘක්‍ෂයද එතරම්ම වේ.

එහෙයින් කීහු පුරාණාචාර්යයෝ

පාටලී, සිම්බලී, ජම්බු, දෙවානං පාරිච්ඡත්තකො<br>
කදම්බො කප්පරුක්ඛො ච සිරීසෙන භවති සත්තමං.

දෙව අසීති සහස්සානි අජ්ඣොගාළ්හො මහණ්ණවෙ<br>
අච්චුග්ගතො තාවදෙව චක්කවාළසිලුච්චයො<br>
පරික්ඛිපිත්වා තං සබ්බං ලොකධාතුමයං ඨිතො.

පළොල් රුකද, ඉඹුල් රුකද, දඹ රුකද, දෙවියන්ගේ පරසතු රුකද, කොළොම් රුකද, කප්රුක හා සත්වැනි මහරි රුකද වේ.

සක්වළගල යොදුන් දෙ-අසූ දහසක් මහසමුදුරෙහි ගිලී එපමණම ජලයෙන් නැඟී පවතී. මේ සක්වළගල ඒ සියලු ලෝකධාතුව වටකොට සිටියේය.

එහි සඳමඩල එකුන්පණස් යොදුනෙකි, හිරුමඩල පණස් යොදුනෙකි, තව්තිසා බවන දසදහස් යොදුනෙකි, අසුර භවනයද, අවීචි මහානරකයද, දඹදිවද එතරම්ය. අපරගෝයානය සත්දහස් යොදුනෙකි, පූර්වවිදේහයද එතරම්ය, උතුරුකුරු දිවයින අටදහස් යොදුනෙකි. මෙහි එක් එක් මහදිවයිනක් පන්සියයක් පන්සියයක් කොදෙව් පිරිවරකොට ඇත්තේය. ඒ සියල්ල එක් සක්වළෙකි, එක් ලෝක ධාතුවෙකි. ඒ අතරතුර

ලෝකාන්තරික නරකයෝ වෙති. භාග්‍යවතුන් වහන්සේ අනන්තවූ බුද්ධඥානයෙන් මෙසේ අනන්තවූ චක්‍රවාටයන්, අනන්තවූ ලෝකධාතූන් දත්සේක, අත්දුටු සේක, විනිවිද දුටුසේක. මෙසේ මොවුන්වහන්සේ විසින් අවකාශ ලෝකයද සියලු ආකාරයෙන් දන්නා ලද්දේය. මෙසේ සර්වප්‍රකාරයෙන් ලෝකය දත් හෙයින්ද **ලොකවිදූ** නම් වනසේක.

ගුණයෙන් තමනට වඩා විශිෂ්ටවූ කිසිවකු නොමැති හෙයින් මොවුන්හට වැඩි උතුම් අන් කෙනකු නැතැ'යි **අනුත්තර** වෙති. ඒ එසේමැයි, මොවුන් වහන්සේ සීලගුණයෙන්ද සකල ලෝකයා අබිබවා සිටිනසේක. සමාධි-පඤ්ඤා-විමුත්ති, විමුත්තිඤාණදස්සන ගුණයෙන්ද එසේ වනසේක. සීලගුණයෙන්ද-පෙ-විමුත්තිඤාණදස්සන ගුණයෙන්ද අසම, අසමසම, අතුල්‍ය, අසමාන හා අප්පටිපුග්ගලද වනසේක. යම්සේ කියනලද්දේද, 'මහණෙනි, දෙවියන් සහිත මරුන් සහිත-පෙ-දෙව්මිනිසුන් සහිත ලෝකයෙහි තමනට වැඩි සීලසම්පන්නයකු මම් නොදක්මි"[(1)]යි මෙසේ අග්ගප්පසාද සූත්‍රාදියද[(2)] 'මට ආචාර්යවරයෙක් නැතැ'යි (න මෙ ආචරියො අත්ථි)[(3)] යන ආදී ගාථාද විස්තර කළ යුතුය.

දමනය කිරීමට සුදුසු පුරුෂයන් දමනය කෙරෙති'යි **පුරිසදම්මසාරථී** නම් වනසේක, හීලෑ කරතියි, හික්මවති'යි යන අර්ථයි. එහි 'පුරිසදම්ම' යනු හීලෑ නොවූ හීලෑ කරනු යෝග්‍ය තිරිසන්වූ හෝ මනුෂ්‍යවූ හෝ අමනුෂ්‍යවූ පුරුෂයෝය. ඒ එසේ මැයි, භාග්‍යවතුන් වහන්සේ විසින් අපලාලය, චූළොදරය, මහොදරය, අග්ගිසිඛය, ධූමසිඛය, ආරවාළය යන නාරජවරුද, ධනපාල නම් හස්තියාදූයි යන මේ ආදී තිරිසන්ගිය පුද්ගලයෝ දමනය කරන ලද්දාහු, විෂරහිත කරන ලද්දාහු සරණශීලයෙහිද පිහිටුවන ලද්දාහුය. සච්චක, නිගණ්ඨපුත්ත, අම්බට්ඨමානවක, පොක්ඛරසාති, සොණදණ්ඩ, කූටදන්ත ආදී මනුෂ්‍යපුරුෂයෝද දමනය කරන ලද්දාහුය. ආළවක, සූචිලොම, ඛරරෝමයක්ෂ සක්දෙව්රජදූයි යන ආදී අමනුෂ්‍යපුරුෂයෝද විසිතුරු විනයන උපාය මගින් හික්මවන ලද්දාහුය. 'කේසිය, මම් වනාහි දැමියයුතු පුරුෂයන් මොළොක්වූ උපාය මගින්ද රළුවූ උපාය මගින්ද හික්මවමි[(4)]යි යන මේ ආදී සූත්‍රද මෙහිලා විස්තර කළ යුතුවේ. තවද: භාග්‍යවතුන් වහන්සේ පිරිසුදු සිල්ඇත්තවුනට ප්‍රථමධ්‍යාන ආදියද, සොතාපන්න ආදීන්හට උත්තරමාර්ග ප්‍රතිපදවත්ද

(1) සං. නි. බ්‍රහ්මසංයුත්ත - S i 139
(2) අං. නි. චතුක්ක නිපාත - A ii 34
(3) ම. නි. අරියපරියෙසන සු - M i 171
(4) අං. නි. චතුක්ක නිපාත - A ii 112

කියා දෙමින් දමනය කරන ලද්දවුන්ද දමනය කෙරෙත්මය. නොහොත් **අනුත්තරෝ පුරිසදම්මසාරථී** යනුවෙන් මෙය එක්ම අර්ථයක් ඇති පදයෙකි, භාග්‍යවතුන් වහන්සේ වනාහි යම්සේ එක්ම පර්යංකයෙන් හුන්නාහු අට දික්හි නොපැකිල දිවියහැකි වෙත්ද, එසේ පුරුෂදම්‍යයන් දමනය කෙරෙති, එහෙයින් අනුත්තරවූ පුරිසදම්මසාරථීයයි කියනු ලබති. "මහණෙනි, ඇතුන් දමනය කරන්නකු විසින් දමනය කරනු ලබන ඇතෙක් එක්ම දිශාවකට දිවෙයි"(1) යනුවෙන්ද මේ සූත්‍රය මෙහිලා විස්තර කළයුතුය.

ඉහලෝකාර්ථ පරලෝකාර්ථ වශයෙන්ද, පරමාර්ථ (නිවණ) වශයෙන්ද සුදුසු පරිදි අනුශාසනය කරති'යි **සත්ථා** නම් වනසේක. තවද 'සත්ථා' යනු සාර්ථ කෙණෙකි, සාර්ථවාහ කෙනෙකි, යම්සේ සාර්ථවාහකයෙක් සාර්ථයන් (වෙළඳ බඩු සහිත තවලම්) කාන්තාරතරණය කරවන්නේ සොරුන් ගැවසි කාන්තාර තරණයකර වන්නේද, චණ්ඩ මෘගයන් ඇති කාන්තාර තරණය කරවන්නේද, දුර්භික්‍ෂ කාන්තාර තරණය කරවන්නේද, නිරුදක කාන්තාර තරණය කරවන්නේද, එතෙරට පමුණුවන්නේද, එතෙරට හැරලන්නේද, ක්‍ෂෙමභූමියට පමුණුවන්නේද, එසේම භාග්‍යවතුන් වහන්සේ සාර්ථකෙනකු, සාර්ථවාහක කෙනකු වශයෙන් සත්වයන් කාන්තාර තරණය කරවනසේක, ජාතිකාන්තාරය තරණය කරවන සේකැයි(2) යන මේ නිද්දේස නයින්ද මෙහි අර්ථය දතයුතුය. **දෙවමනුස්සානං** යනු දෙවියනට හා මිනිසුනටය, උත්කෘෂ්ට පුද්ගලයන්, භව්‍ය පුද්ගලයන් පිරිසිඳ දක්වනු පිණිස මෙය කියනලද්දේ නමුදු භාග්‍යවතුන්වහන්සේ වනාහි තිරිසන් සතුනට පවා අනුශාසනා දීමෙන් 'සත්ථා' නම් වනසේක්මය. ඒ සත්වයෝද භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය ඇසීමෙන් උපනිශ්‍රය සම්පත්තියට පැමිණ එම උපනිශ්‍රය සම්පත්තියම හේතුකොටගෙන දෙවන හෝ තුන්වන හෝ අත්බව්හිදී මාර්ගඵල ලබන්නාහු වෙති. මෙහිලා මණ්ඩූක දිව්‍යපුත්‍රාදීහු නිදසුන් වෙති. භාග්‍යවතුන් වහන්සේ වනාහි ගග්ගරා පොකුණුතෙරදී චම්පානුවර වැසියනට දහම් දෙසනවිට එක්තරා මැඩියෙක් භාග්‍යවතුන් වහන්සේගේ ස්වරයෙහි නිමිති ගත්තේය. එක්තරා ගොපල්ලෙක් දඬුවෙහි එල්බ සිටිනුයේ ඒ මැඩියාගේ හිස මත දඬුව ඔබාගෙන සිටියේය. ඒ මැඩියා එකෙණෙහිම කාලක්‍රියාකොට තව්තිසා බවනෙහි දෙළොස් යොදුන් පමණ රන් විමනෙක්හි නිදා සිට පිබිදියක්හු සෙයින් උපන්නේය. එහි තමන් දෙවඟනන් පිරිවරා සිටිනු දක, "කොල, මම්ද මෙහි උපන්මි,

(1) ම. නි. සළායතනවිභංග සූ - M iii 222

(2) Nd 1 446

කිනම් කුසලකර්මයක් කළෙම්දැ'යි ආවර්ජන කරනුයේ භාග්‍යවතුන් වහන්සේගේ ස්වරයෙහි නිමිතිගැනීම හැර අන්කිසි කර්මයක් නොදිටියේය. හේ තෙමේ එකෙණෙහිම විමානයත් සමගම අවුත් භාග්‍යවතුන් වහන්සේගේ පා හිස තබා වැන්දේය. භාග්‍යවතුන් වහන්සේ එපවත් දනිමින්ම විචාළ සේක:

කො මෙ වන්‍දති පාදනි ඉද්ධියා යසසා ජලං
අභික්කන්තෙන වණ්ණෙන සබ්බා ඔභාසයං දිසා.

මණ්ඩුකො'හං පුරෙ ආසිං උදකෙ වාරිගොචරො
තව ධම්මං සුණන්තස්ස අවධී වච්ඡපාලකො[1]

ඍද්ධියෙන්ද යසසින්ද දිලිසෙමින් ඉතා කාන්තවූ වර්ණයෙන් සියලු දිසාවන් බබුළුවමින් මාගේ පා වඳිනුයේ කවරෙක්ද?

පෙර අත්බව්හි මම් දියෙහි, දියම ගොදුරුබිම්කොට වූසූ මැඩියෙක් වීමි, ඔබවහන්සේගේ ධර්මය අසමින් සිටියදීම ගොපලු දරුවෙක් මා නැසීය.

භාග්‍යවතුන්වහන්සේ ඒ දෙව්පුත්හට දහම් දෙසූසේක. අසූසාරදහසක් ප්‍රාණීන්හට ධර්මාභිසමය විය. දෙව්පුත් තෙමේද සෝවාන් පෙලෙහි පිහිටා සිනා පහළකොට පෙරළා ගියේය.

දතයුතු යම්කිසිවක් ඇත්නම්, ඒ සියල්ල අවබෝධ කළහෙයින් විමෝක්ෂය කෙළවරකොට පැතිර සිටි ඥාන වශයෙන් බුද්ධ නම් වෙති. නොහොත්, යම් හෙයකින් චතුස්සත්‍යයන් තමන්ද අවබෝධකොට සෙසු සත්වයනටද අවබෝධ කරවූසේක්ද, එහෙයින් මේ ආදී කරුණු හේතුකොට බුද්ධ නම් වනසේක. මේ අර්ථය හඟවනු පිණිස: 'සත්‍යයන් අවබෝධ කළහ'යි බුද්ධ නම් වෙති, සත්වයන්හට එය අවබෝධ කරවති'යි බුද්ධ නම් වෙති"[2] යනුවෙන් මෙසේ පැවති සියලු නිද්දේස ක්‍රමය නොහොත් පටිසම්භිද ක්‍රමය විස්තර කළයුතුය.

භගවා යන මෙය වනාහි ගුණයෙන් විශිෂ්ටවූ සත්වයන් අතර ශ්‍රේෂ්ඨවූ උන්වහන්සේ වෙත ආරෝපිත ගෞරවාභිධානයෙකි. එහෙයි කීහු පූර්වාචාර්යයෝ:

---

(1) විමානවත්ථු-මණ්ඩුක වි - Vv 49

(2) මහානිද්දෙස - Nd1 457

භගවාති වචනං සෙට්ඨං භගවාති වචනුත්තමං
ගරුගාරවයුත්තො සො භගවා තෙන වුච්චති.

භගවා යන වචනය ශ්‍රේෂ්ඨය, භගවා යන වචනය උතුම්ය, එහෙයින් අතිශය ගෞරවයට යෝග්‍යවූ උන්වහන්සේ 'භගවා'යි වහරනු ලබනසේක.

නොහොත්, නාමය ආවස්ථිකය, ලෛංගිකය, නෛමිත්තිකය, අධීත්‍යසමුත්පන්නයයි චතුර්විධ වේ. අධීත්‍යසමුත්පන්න නම් (හෙතුවර්ථය නොසලකා) ලෞකික ව්‍යවහාරයෙන් කැමති–කැමතිසේ තබනු ලද්දෙකැ'යි කියනලදි. එහි වච්ඡය, දම්මය, බලිවද්දය, යන ආදිය (ඒ ඒ අවස්ථාවන් සලකා කියනු ලබන හෙයින්) ආවස්ථික වේ, දණ්ඩී, හත්ථී, සිඛී, කරී යන ආදිය (සංකේතාත්මක වශයෙන් කියනු ලබන හෙයින්) ලෛංගික වේ, තෙවිජ්ජය, ඡළභිඤ්ඤය යන ආදිය (ඒ ඒ ගුණය නිමිතිකොට කියනු ලබන හෙයින් නෛමිත්තික වේ. සිරිවඩ්ඪකය, ධනවඩ්ඪකය යන ආදිය වචනාර්ථය නොසලකා පනවනු ලබන හෙයින් අධීත්‍යසමුත්පන්න වේ. මේ 'භගවා' යන නාමය වනාහි නෛමිත්තික වේ. මහාමායා දේවීන් විසින් හෝ සුදොවුන් මහරජුන් විසින් හෝ, අසූදහසක් ඥතීන් විසින් හෝ, ශක්‍ර සන්තුෂිතාදී දේව වර්ගයා විසින් හෝ මේ නම තබන ලද්දේ නොවේ. ධම්මසේනාපති සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ විසින් මෙසේ කියනලදී. 'භගවා' යන මේ නාමය මව විසින් තබන ලද්දේ නොවේ, -පෙ-මේ 'භගවා' යන ප්‍රඥප්තිය භාග්‍යවත් බුදුවරයන් විසින් විමොක්ෂය නිමිතිකොට බොධිමූලයෙහිදී සර්වඥතාඥනය ලැබීමත් සමගම එය සාක්ෂිකොට පනවන ලද්දෙකි"[1]. යම්හෙයකින් ගුණයන් නිමිතිකොට මෙම නාමය වේද, එහෙයින් එම ගුණයන් ප්‍රකාශ කරනු පිණිස මේ ගාථාව කියති.

භගී භජී භාගී විභත්තවා ඉති
අකාසි භග්ගනති ගරූති භාග්‍යවා
බහූහි ඤායෙහි සුභාවිතත්තනො
භවන්තගො සො භගවාති වුච්චති

(දෙතිස් ලකුණු ඈ දී) භග ලක්ෂණයෙන් යුක්ත වූහ'යිද, (අර්ථ, ධර්ම, විමුක්ති ආදිය) භජනය කළහ'යිද, (ආර්යධර්මයන්) අවබෝධ කළහ'යිද (ලෞකික ලෝකෝත්තර ධර්මයන්) විග්‍රහකොට දේශනා

(1) මහානිද්දෙස - Nd1 143

කළහ'යිද, (රාගාදී ක්ලේශයන්) සිඳලූහයිද, භාග්‍යයෙන් අනූන වූහ'යිද, (භාවනාදී අනේකවිධ) න්‍යායයෙන් මනාකොට වඩනාලද අත්බැව් ඇත්තාහ'යිද, භවයෙහි කෙළවරට ගියහ'යිද, තුන්ලොවට ගුරුවූ උන්වහන්සේ 'භගවා' යයි කියනු ලබන සේක.

නිද්දේසයෙහි කියන ලද නයින්ම[1] මෙහි ඒ ඒ පදයන්ගේ අරුත් දත යුතුය. මේ වනාහි තවත් ක්‍රමයෙකි:

භාග්‍යවා භග්‍ගවා යුත්තො භගෙහි ච විභත්තවා
භත්තවා වන්තගමනො භවෙසු භගවා තතො

(පාරමී භාවයට පත්) භාග්‍යයෙන් යුක්ත වූහ'යිද, (රාගාදී කෙලෙසුන්) බිඳ හළහ'යිද, භග ලක්ෂණයෙන් යුක්ත වූහ'යිද, (මාර්ගඵලාදී ආර්ය ධර්මයන්) විභාගකොට අවබෝධ කළහ'යිද, (අර්ථථ රසාදිය) වළඳන්නාහ'යිද, භවත්‍රය විෂයෙහි තෘෂ්ණා සංඛ්‍යාත ගමනය වමාරා හරිනලදහ'යිද 'භගවා' නම් වනසේක.

එහි, යම් හෙයකින් ලෞකික ලෝකෝත්තර සැප සාදන දානශීලාදියෙන් උච්ච අවස්ථාවට පත් භාග්‍යය මොවුන්හට ඇත්තේද, එහෙයින් 'භාග්‍යවා'යි කිව යුතු තැන, ශබ්ද ශාස්ත්‍රනයින් වර්ණාගම, වර්ණවිපර්යය ආදී නිරුක්ති ලක්ෂණ ගෙන නැතහොත්, පෘෂෝදර (පෘෂත් + උදර) ආදියෙහි මෙන් ප්‍රක්ෂෙප ලක්ෂණ ගෙන 'භගවා'යි කියනු ලැබෙති'යි දතයුතුය. යම්හෙයකින් වනාහි ලෝභය, ද්වේෂය, මෝහය යන මෙයින් ඇතිවන විපරීත මනසිකාර (සිත්පෙරළි)ය, අහිරික හා අනොත්තප්ප (පව් කිරීමෙහිලා විළිබිය නැති බවය.) ක්‍රොධ හා උපනාහ හෙවත් වෛරය, මක්ඛ හා පලාස (අනුන් ගුණ මැකීම හා අවඥ කිරීම)ය, ඊර්ෂ්‍යා හා මාත්සර්යය, කුහකබව හා කපටිබවය, දරදඬුකම හා එකටෙක කරනසුලුබවය, මාන හා අතිමානය, මදය හා ප්‍රමාදය, තෘෂ්ණා හා අවිද්‍යාවය, ලොභාදී ත්‍රිවිධ අකුශලමූලය, කායාදී දුශ්චරිතය, තෘෂ්ණාදී සංකිලෙසය, රාගාදී මලය, රාගාදී විෂමය, කාමාදී සංඥය, කාමාදී විතර්කය, තෘෂ්ණාදී ප්‍රපංචය, චතුර්විධවූ විපර්යාසය, කාමාදී ආසවය, අභිධ්‍යාදී ග්‍රන්ථය, කාමාදී ඔඝය, කාමාදී යොගය, ඡන්දාදී අගතිය, චීවරහේතු ආදී තණ්හුප්පාදය, කාමාදී උපාදානය, පංචවිධවූ චෙතෝඛිලය, විනිබන්ධය, නීවරණය, අභිනන්දනය, ෂඩ්විධවූ විවාදමූලය, තණ්හාකාය, සප්ත අනුශයධර්ම, අෂ්ට මිථ්‍යාභාවය, නවවිධ

(1) මහානිද්දෙස - Nd1 142

තණ්හාමූලකය, දශ අකුශල කර්මපථය, ද්වාෂෂ්ටි දෘෂ්ටිය, අෂ්ටශත තෘෂ්ණාවිචරිතප්‍රභෙදය යන මේ ලක්‍ෂ සංඛ්‍යාතවූ සියලු දරථපරිළාහ කිලෙසයන්, නොහොත්, සංක්‍ෂෙප වශයෙන් ක්ලෙශ, ස්කන්ධ, අභිසංස්කාර, දේවපුත්‍ර, මෘත්‍යු මාරයන් බිඳලූහ. එහෙයින් මේ උවදුරු බිඳලූ හෙයින් 'භග්ගවා'යි කිවයුතු තැන 'භගවා'යි කියනු ලබනසේක. තවද මෙහිලා කියන ලදී:

> භග්ගරාගො භග්ගදෙසො භග්ගමොහො අනාසවො
> භග්ගා'ස්ස පාපකා ධම්මා භගවා තෙන වුච්චති.
>
> බිඳහළ රාග ඇත්තාහ, බිඳහළ ද්වේෂ ඇත්තාහ, බිඳහළ මොහ ඇත්තාහ, ආශ්‍රව රහිතයහ, මොවුන් විසින් පාපස්වභාවයෝ බිඳුනාලදහ, එහෙයින් 'භගවා' යි කියනු ලබනසේක.

ශත පුණ්‍යලක්‍ෂණයන් දරන්නාවූ මොවුන්ගේ භාග්‍යවත් භාවය යනුවෙන් රූපකාය සම්පත්තිය දක්වනලද්දේ වේ. භග්නදෝෂතා යනුවෙන් ධර්මකාය සම්පත්තිය දක්වනලද්දේ වේ. එසේම (භාග්‍යවත් භාවය හා භග්නදෙෂතාව යන මේ ද්විවිධ ගුණයන්ගෙන් පිළිවෙළින්) සාමාන්‍ය ලෝකයාගේ හා පරීක්‍ෂකයන්ගේ බහුමානයට පාත්‍රවූබව දක්වනලද්දේ වේ, ගෘහස්ථයන් විසින්ද ප්‍රව්‍රජිතයන් විසින්ද එළඹිය යුතුබව දක්වන ලද්දේ වේ, එළඹ සිටියාවූ ගෘහස්ථයන්ගේද ප්‍රව්‍රජිතයන්ගේද කායදුඃඛය හා චිත්තදුඃඛය දුරුකිරීමෙහි පොහොසත්බව දක්වනලද්දේ වේ, ආමිෂදාන හා ධර්මදානයන්ගෙන් උපකාරීවූබව දක්වනලද්දේ වේ, ලෞකික ලොකෝත්තර සුඛයන් හා සමග යෙදවීමෙහි සමත්බව දක්වනලද්දේ වේ. යම්හෙයකින් ලෝකයෙහි ඓශ්වර්යය. ධර්මය, යශස්‍ය, ශ්‍රීය, කාමය, ප්‍රයත්නය යන මේ සවැදෑරුම් ස්වභාවයන් කෙරෙහි 'භග' ශබ්දය පවත්නේද, එසේම මොවුන්හට ස්වකීය චිත්තය පිළිබඳ පරමවූ ස්වාධිපත්‍යය ඇත්තේ වේද, නැතහොත් අණිමා (පරමාණු තරම් කුඩා බවට පත්වීම) ලඝිමා (අහසෙහි පාවෙන තරම් සැහැල්ලු බවට පත්වීම) ආදී ලෞකික සම්මත සියලු ආකාර ඇති ඓශ්වර්ය ගුණ ඇත්තේ වේද, එසේම ලෝකෝත්තර ධර්ම විද්‍යමාන වේද, තුන්ලොව එක පැහැර පැතිර සිටි සත්‍යවූ ගුණයන් හේතුකොට පැන නැඟුණු අතිශය නිර්මල යශස් ඇත්තේද, රූපකාය දර්ශනයෙහි තියැලි ජනයාගේ නෙත් සිත් පිනවනු සමත් සර්වාකාරයෙන් පරිපූර්ණවූ සියලු අඟපසඟ වැළඳගත් රූපශ්‍රීය ඇත්තේද, මොවුන් විසින් ආත්මහිත වශයෙන් වේවයි, පරහිත වශයෙන් වේවයි, සිතූ පැතූ යමක් යමක් ඇත්නම් ඒ ඒ දෙය එලෙසින්ම නිපැයෙන හෙයින් ඉච්ඡිතනිෂ්පත්ති සංඛ්‍යාත කාමය ඇත්තේද, සකල

ලෝකයාගේ ගුරුබවට පත්වීමට හේතුවූ සම්‍යග්ව්‍යායාම සංඛ්‍යාත ප්‍රයත්න ඇත්තේද, එහෙයින් මෙකී භග ලක්‍ෂණයන්ගෙන් යුක්තවූහයි, මෙකී භග ලක්‍ෂණයන් මොවුන් කෙරෙහි විද්‍යමාන වෙති'යි යන මේ අර්ථයෙන් හෝ 'භගවා'යයි වහරනු ලබනසේක. යම් හෙයකින් කුශලාදී ප්‍රභේද ඇති සියලු ධර්මයන්ද, නොහොත්, ස්කන්ධ, ආයතන, ධාතු, සත්‍ය, ඉන්ද්‍රිය, පටිච්චසමුප්පාද ආදී භේද සහිත කුශලාදී ධර්මයන්ද, පීඩන, සංඛත, සන්තාප, විපරිණාම යන මේ අර්ථ වශයෙන් දුඃඛ ආර්ය සත්‍යයද, ආයූහන, නිදාන, සංයෝග, පළිබෝධ යන මේ අර්ථ වශයෙන් සමුදය සත්‍යයද, නිස්සරණ, විවේක, අසංඛත, අමෘත යන මේ අර්ථ වශයෙන් නිරෝධ සත්‍යයද, නිර්යාණ, හේතු, දර්ශන, ආධිපතෙය්‍ය යන මේ අර්ථ වශයෙන් මාර්ගසත්‍යයද විග්‍රහ කළහ'යි බෙද විවරණකොට දේශනා කළහ'යි කියන ලද්දේද, එහෙයින් 'විභත්තවා'යි කිවයුතු තැන 'භගවා'යි කියනු ලැබෙති. තවද යම් හෙයකින් මොවුන්වහන්සේ (කසිණ සමවත් ආදී) දිව්‍යවිහාරය, මෙත්තා කරුණා ආදී බ්‍රහ්මවිහාරය, සෝවාන් ආදී ආර්යවිහාරයයි යන ත්‍රිවිධ විහාරයන්ද, කායවිවේක, චිත්තවිවේක, උපධිවිවේකයි යන ත්‍රිවිධ විවේකයන්ද, ශූන්‍යතා විමෝක්‍ෂය, අප්‍රණිහිත විමෝක්‍ෂය, අනිමිත්ත විමෝක්‍ෂයයි යන ත්‍රිවිධ විමෝක්‍ෂයන්ද, සෙසු ලෞකික ලෝකෝත්තර අභිඥාදී උත්තරීය මනුෂ්‍ය ධර්මයන්ද භජනය කළාහුද, සේවනය කළාහුද, හුරු පුරුදු කළාහුද, එහෙයින් 'භත්තවා'යි කිවයුතු තැන 'භගවා'යි කියනු ලැබෙති. තවද යම් හෙයකින් වනාහි භවත්‍රය විෂයෙහි තෘෂ්ණා සංඛ්‍යාත ගමන මොවුන් විසින් වමාරා හරින ලද්දේද, එහෙයින් භවේසු වන්තගමනො'යි කිවයුතු තැන භව-ශබ්දයෙන් භ-කාරයද ගමන-ශබ්දයෙන් ග-කාරයද, වන්ත-ශබ්දයෙන් ව-කාරය (දීර්ඝකොට)ද ගෙන 'භගවා'යි කියනු ලබනසේක. යම්සේ ලෝකයෙහි "මෙහනස්ස ඛස්ස මාලා"යි කිවයුතු තැන 'මෙඛලා'යි කියනු ලැබේද, එසේය.

මෙසේ මේ මේ කාරණයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් නම් වනසේක, -පෙ-මේ මේ කාරණයෙන් භගවත් නම් වනසේකැ'යි බුදුගුණ සිහිකරන ඒ යෝගාවචරයාගේ සිත එසමයෙහි රාගයෙන් මඩනාලද්දේ නොවේ, ද්වේෂයෙන් මඩනා ලද්දේ නොවේ, මොහයෙන් මඩනාලද්දේ නොවේ. ඔහුගේ සිත "එසමයෙහි තථාගතයන් අරබයා ඍජුව පවත්නා බවට ගියේම වේ."(1) මෙසේ රාගාදීන්ගේ නොපැළඹීමෙන් වියලී ගිය නීවරණ ඇති, කර්මස්ථානයට අභිමුඛවූ හෙයින් ඍජුව

(1) අං. නි. ඡක්ක නිපාත - A iii 285

පවත්නා සිත් ඇති ඒ යෝගියාහට බුදුගුණයනට නැඹුරුවූ විතක්ක විචාරයෝ පවත්නාහුය. බුදුගුණයනට අනුව විතක්කනය විචාරණය කරන ඕහට පීතිය උපදනේය, පීතියෙන් යුත් සිත් ඇත්තහුට එම පීතිය ආසන්න කාරණකොට ඇති 'පස්සද්ධිය' හේතුකොටගෙන කායචිත්ත පීඩාවෝ සන්සිඳෙති, සන්සුන් පීඩා ඇත්තහුට කායික චෛතසික සුඛය උපදනේය, සුඛ ඇත්තහුගේ සිත බුදුගුණයන් වෙතට නැඹුරුවී සමාධිගත වන්නේයයි, මෙසේ අනුක්‍රමයෙන් එක් කෙණෙහිම ධ්‍යානාංගයෝ උපදනාහුය, බුදුගුණයෙහි ගැඹුරුබව හේතුකොටගෙන, නොයෙක් ප්‍රකාර ඇති ගුණයන් සිහිකිරීමට නැඹුරුවීම හේතුකොටගෙන හෝ, අර්පණාවට නොපැමිණි හුදෙක් උපචාරයටම පැමිණි ධ්‍යාන වේ. ඒ මේ ධ්‍යානය බුදුගුණ සිහිකිරීම් වශයෙන් උපන් හෙයින් බුද්ධානුස්මෘති ධ්‍යානයයි ව්‍යවහාරයට යෙයි. මෙකී බුද්ධානුස්මෘති භාවනාවෙහි යෙදුණු භික්ෂු තෙමේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගරුසරු ඇත්තේ වේ, ශ්‍රද්ධා මහත්වයටද, ස්මෘති මහත්වයටද, ප්‍රඥාමහත්වයටද, පුණ්‍යමහත්වයටද පත්වේ, ප්‍රීතිප්‍රමෝද බහුලකොට ඇත්තේ වේ, කුදුමහත් බිය දරා සිටිනු සමත්වූයේ, දුක් ඉවසා සිටිනු සමත්වූයේ 'ශාස්තෘන් වහන්සේ හා සමඟ වෙසෙමි'යි යන හැඟීම ලබයි, බුදුගුණ සිහිකරමින්ම වාසය කරන මේ යෝගියාගේ සිරුර පවා චෛත්‍යසරයක් සෙයින් පූජාර්හ බවට පත්වේ, බුද්ධභූමිය වෙත සිත නැඹුරුවේ. ඉක්මවියයුතු වස්තූන්ගේ සමාගමයෙහිදී ඇස් ඉදිරියේ වැඩ සිටින ශාස්තෘන් වහන්සේ දක්නහුට සෙයින් මොහුට හිරිඔතප් දෙක එළඹ සිටියි, උපරිම මාර්ගඵලයන් ප්‍රතිවෙධ නොකළහොත් සුගතියට යන්නේම වේ.

තස්මා හවෙ අප්පමාදං කයිරාථ සුමෙධසො
එවං මහානුභාවාය බුද්ධානුස්සතියා සද.

එහෙයින් මෙවන් මහානුභාව ඇති බුද්ධානුස්මෘති භාවනා විෂයෙහි, ඒකාන්තයෙන් නුවණැත්තෝ සැම කල්හිම අප්‍රමාද බව පුරුදු කරන්නාහුය.

**මෙතෙක් මේ බුද්ධානුස්මෘති භාවනා විෂය පිළිබඳ විස්තරකථා ක්‍රමයයි.**

## ධම්මානුස්සති භාවනාව

ධම්මානුස්සති භාවනාව වඩනු කැමැත්තහු විසින්ද හුදකලාව කායචිත්ත විවේකයෙන් යුක්තව, "භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට

(1) අං. නි. ඡක්ක නිපාත - A iii 285

දේශනා කරනලද මේ පර්යාප්ති ධර්මයද නවවිධ ලොකෝත්තර ධර්මයද තමා විසින්ම නොහොත් මේ ආත්මභාවයෙහිදීම දක්ක යුතුය, කල් නොයවා පල දෙවනු සමත්ය, එවබලව'යි දක්වීමට සුදුසුය. තමා විසින් තම සිත්හි එළවීමට සුදුසුය, පණ්ඩිතයන් විසින් තම තමන් විසින්ම ප්‍රත්‍යක්‍ෂ කරනු ලැබීමට සුදුසුය'යි(1) මෙසේ පර්යාප්තිධර්මයෙහිද, නවලෝකෝත්තර ධර්මයෙහිද ගුණ සිහිකළ යුතුය. **ස්වාක්ඛාතො** යන මේ පදයෙහි පර්යාප්තිධර්මයද ඇතුළත් වේ. 'සන්දිට්ඨිකො' යන ආදී සෙසු පදවල ලෝකෝත්තරධර්මයම ඇතුළත් වේ. එහි පළමුකොට පර්යාප්තිධර්මය මුල, මැද, අග යන තුන්තන්හිම යහපත්වන හෙයින්ද, අර්ථයෙන් හා ව්‍යංජනයෙන් සර්වප්‍රකාරයෙන් පරිපූර්ණවන හෙයින් හා සුපරිසුද්ධ බ්‍රහ්මචර්යාව ප්‍රකාශකරන හෙයින්ද 'ස්වාක්ඛාත' නම් වේ. භාග්‍යවතුන් වහන්සේ වනාහි යම් එක් ගාථාවක් හෝ දේශනා කෙරෙත්ද, එය සැම අතින්ම යහපත්වන හෙයින් (එම ගාථාවෙහි) පළමු පාදයෙන් ආදිකල්‍යාණද, දෙවන තෙවන පාදයන්ගෙන් මධ්‍යකල්‍යාණද අවසන් පාදයෙන් පර්යවසානකල්‍යාණද වන්නේය. ඒකානුසන්ධික (බොහෝ විභාග නැති සංක්‍ෂිප්ත) සූත්‍රයක් නම්, එය නිදානයෙන් ආදිකල්‍යාණද, නිගමනයෙන් පර්යවසානකල්‍යාණද, සෙසු කොටස්වලින් මධ්‍යකල්‍යාණද වන්නේය. නානානුසන්ධික (විස්තර විභාග සහිත) සූත්‍රයක් නම්, පළමුවන අනුසන්ධියෙන් ආදිකල්‍යාණද, අවසන් අනුසන්ධියෙන් පර්යවසානකල්‍යාණද, සෙසු අනුසන්ධීන්ගෙන් මධ්‍යකල්‍යාණද වන්නේය. තවද: නිදානසහිත බැවින් හා අර්ථෝත්පත්ති සහිත බැවින් ආදිකල්‍යාණ වන්නේය, වෛනේයජනයනට යෝග්‍යවූ හෙයින්ද, අර්ථය නොවෙනස්වන හෙයින්ද, හේතු-උදාහරණයන්ගෙන් යුක්තවූ හෙයින්ද මධ්‍යකල්‍යාණ වන්නේය, අසන්නවුනට ශ්‍රද්ධාප්‍රතිලාභය දනවන නිගමන ඇති හෙයින් පර්යවසානකල්‍යාණ වන්නේය. සකල ශාස්තෘශාසනය ප්‍රකාශකරන පර්යාප්තිධර්මය ස්වකීය අර්ථයවූ ශීලයෙන් ආදිකල්‍යාණද, සමථ විපස්සනා මාර්ගඵලයන්ගෙන් මධ්‍යකල්‍යාණද, නිර්වාණයෙන් පර්යවසානකල්‍යාණද වන්නේය. නොහොත්, ශීල සමාධි යන දෙකින් ආදිකල්‍යාණද විපස්සනා, මග්ග යන දෙකින් මධ්‍යකල්‍යාණද, ඵල, නිර්වාණ යන දෙකින් පර්යවසානකල්‍යාණද වන්නේය. නොහොත්, බුදුන් විසින් මනාලෙස අවබෝධකළ හෙයින් ආදිකල්‍යාණද, ධර්මයම මනා ස්වභාවයෙන් යුක්තවූ හෙයින් මධ්‍යකල්‍යාණද, සංඝයා සුපිළිවෙත් සහිත වනහෙයින් පර්යවසාන කල්‍යාණද වන්නේය. එම ධර්මය අසා දැන ඒ අනුව පිළිපන්නහු විසින් අවබෝධ කටයුතු සම්‍යක් සම්බෝධියෙන් ආදිකල්‍යාණද, ප්‍රත්‍යෙක බෝධියෙන් මධ්‍යකල්‍යාණද, ශ්‍රාවක බෝධියෙන්

(1) අං. නි. ඡක්ක නිපාත - A iii 285

පර්යවසානකල්‍යාණද වන්නේය. මේ ධර්මය අසනු ලබනවිටම නීවරණයන් දුරුකරන හෙයින් ඇසීමෙන් පවා යහපත ගෙනදෙති'යි ආදිකල්‍යාණ වන්නේය, පිළිපදිනු ලබනවිට සමථවිපස්සනා සුඛය ගෙනදෙන හෙයින් පිළිපැදීමෙන්ද යහපත ගෙනදෙති'යි මධ්‍යකල්‍යාණ වන්නේය, පිළිපදනාලද මෙම ධර්මය ප්‍රතිපත්තිඵලය තිමවූ කල්හි අපේක්ෂිත අර්ථය එළවන හෙයින් ප්‍රතිපත්ති ඵලයෙන්ද යහපත ගෙනදෙති'යි පර්යවසානකල්‍යාණ වන්නේය. මෙසේ මුල මැද අග යන තුන් තන්හිම කල්‍යාණ වනහෙයින් මනාසේ පවසන ලද්දේ (ස්වාක්ඛාත) වේ. සංකාසන (සැකෙවින් හැඟවීම), පකාසන (විසිතුරු කොට පැවසීම) විවරණ (නොපළට තැන් පළට කිරීම), විභජන (විග්‍රහ කිරීම) උත්තානීකරන (පැහැදිලි කිරීම), පඤ්ඤත්ති (ධාරණය කිරීම) යන මේ සවැදෑරුම් අර්ථපදයන්ගේ සමායෝජනයෙන් හෙවත් එක්ව යෙදීමෙන් 'සාර්ථ' නම් වේ. අක්ඛර, පද, ව්‍යංජන, ආකාර, නිරුත්ති, නිද්දේස යන මේ සවැදෑරුම් සම්පත්තියෙන් 'සව්‍යංජන' නම්වේ. අර්ථගම්භීරතාවෙන් යුක්තවූ හෙයින් සාර්ථ නම්වේ, ධර්ම ගම්භීරතාවෙන් හා දේශනාගම්භීරතාවෙන් යුක්තවූ හෙයින් සව්‍යංජන නම් වේ. අත්ථපටිසම්භිද පටිභානපටිසම්භිද යන දෙකට විෂයවූ හෙයින් සාර්ථ නම්වේ, ධම්මපටිසම්භිද නිරුත්තිපටිසම්භිද යන දෙකට විෂයවූ හෙයින් 'සව්‍යංජන' නම් වේ. නුවණැත්තන් විසින් දතහැකිවන හෙයින් පරීක්ෂක ජනයාට ප්‍රසාදය ජනිතකරවති'යි 'සාර්ථ' නම්වේ, ඇදහිය හැකිවන හෙයින් ලෞකික ජනයාහට ප්‍රසාදය ගෙනදෙති'යි සව්‍යංජන නම්වේ. ගම්භීර අභිප්‍රාය ඇති හෙයින් සාර්ථ නම්වේ, සුබෝධවූ පද ඇති හෙයින් සව්‍යංජන නම්වේ. එක්කළයුතු කිසිවක් නොමැති හෙයින් සියල්ලෙන් පරිපූර්ණවූ බැවින් කේවලපරිපූර්ණ නම්වේ, ඉවත් කළයුතු කිසිවක් නැති හෙයින් නිදෙස් වන බැවින් පරිසුද්ධ නම්වේ. තවද: ප්‍රතිපත්තියෙන් අධිගමය ව්‍යක්තවන හෙයින් සාර්ථ නම්වේ. පර්යාප්තිධර්මයෙන් ආගම ව්‍යක්තවන හෙයින් සව්‍යංජන නම්වේ. ශීලාදී පංචධර්මස්කන්ධයෙන් යුක්තවන හෙයින් කේවලපරිපූර්ණ නම්වේ. දිට්ඨි, මාන ආදී උපක්ලේශයන්ගෙන් තොරවූ හෙයින්, සසරවටින් ගොඩ යනු පිණිස පවත්නා හෙයින්, හා ලෝකාමිෂයෙහි අපෙක්ෂා නැති හෙයින් පිරිසුදුවූහ'යි මෙසේ සාර්ථ, සව්‍යංජන, කෙවලපරිපූර්ණ, පරිසුද්ධ, බ්‍රහ්මචර්යය ප්‍රකාශ කරන හෙයින් 'ස්වාක්ඛාත' නම් වේ. නොහොත්, අර්ථවිපර්යාසයක් නොවන හෙයින් මනාසේ කියනලදහ'යි ස්වාක්ඛාත නම්වේ. යම්සේ අන්‍යතීර්ථකයන්ගේ ධර්මයෙහි අර්ථය විපර්යාසයට පැමිණේද, අන්තරායිකයයි කියනලද ධර්මයන් අන්තරායික නොවියහැකි හෙයින්ද, නෛර්යානිකයයි කියනලද ධර්මයන් නෛර්යානික නොවියහැකි හෙයින්ද ඒ තීර්ථකජනයා මනාසේ නොකියනලද (දුරක්ඛාත) ධර්ම ඇත්තාහුම වෙති, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මයෙහි අර්ථය ඒ

ආකාරයෙන් විපර්යාසයට නොපැමිණේ, මේ ධර්මයෝ අන්තරායිකයහ'යිද, මේ ධර්මයෝ නෛර්යානිකයහ'යිද කියන ලද්දහු නම්, එම ධර්මයන් කියනලද ස්වභාවය නොඉක්මවන හෙයිනි. මෙසේ පළමු කොට පර්යාප්ති ධර්මය ස්වාක්ඛාත නම්වේ, ලෝකෝත්තර ධර්මය වනාහි නිර්වාණයට අනුරූපවූ ප්‍රතිපත්තියද, ප්‍රතිපදාවට අනුරූපවූ නිර්වාණයද කියනලද බැවින් **ස්වාක්ඛාත** නම්වේ. යම්සේ කියනලදදː

"ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයනට නිර්වාණගාමිනී ප්‍රතිපදාව මනාසේ පනවන ලද්දේම වේ, නිර්වාණයද ප්‍රතිපදාවද එකිනෙක සැසඳේ, යම්සේ වනාහි ගංගා නදී ජලය යමුනා නදී ජලය හා සමග සැසඳේද, සමවේද, එසේම ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයනට නිර්වාණගාමිනී ප්‍රතිපදාව මනාසේ පනවන ලද්දේම වේ, නිර්වාණයද ප්‍රතිපදාවද එකිනෙක සැසඳේ"(1)

මෙහි ආර්යමාර්ගයද අන්ත දෙකට නොපැමිණ මධ්‍යම ප්‍රතිපද වූයේම මධ්‍යමප්‍රතිපදායයි කියනලද හෙයින් ස්වාක්ඛාත නම්වේ. ශ්‍රාමණ්‍යඵලයෝද සන්සුන් කෙලෙස් ඇති හෙයින්ම සන්සුන් කෙලෙස් ඇත්තාහ'යි කියනලද හෙයින් ස්වාක්ඛාත නම් වෙති. නිර්වාණයද සස්සත (සදාකාලික), අමත (අමෘත), තාණ (රක්ෂාස්ථාන) ලෙණ (ආවරණ) යන ආදී ස්වභාව ඇත්තේම සස්සතාදී ස්වභාව වශයෙන් කියනලද හෙයින් ස්වාක්ඛාත නම් වේ. මෙසේ ලොකෝත්තර ධර්මයද ස්වාක්ඛාත නම්වේ.

**සන්දිට්ඨිකො** යන මෙහි වනාහි, ආර්යමාර්ගය තමාගේ සන්තානය තුළ රාගාදී කෙලෙසුන් වඳ කිරීමෙන් තමා විසින්ම දතයුතු වෙති'යි 'සන්දිට්ඨික' නම් වේ. යම්සේ කියන ලදදː 'බ්‍රාහ්මණය, රාගී පුද්ගල තෙමේ රාගයෙන් මඩනා ලද්දේ, රාගයෙන් වෙළාගන්නාලද සිත් ඇත්තේ, තමා පෙළනු පිණිසද ප්‍රයෝග කරයි, අනුන් පෙළීම පිණිසද ප්‍රයෝග කරයි, දෙපක්ෂයම පෙළනු පිණිසද ප්‍රයෝග කරයි, චෛතසිකවූ දුක් දොම්නස්ද විඳියි, රාගය පහ කරනලද කල්හි තමා පෙළනු පිණිසද, අනුන් පෙළනු පිණිසද, දෙපක්ෂයම පෙළනු පිණිසද ප්‍රයත්න නොකරයි, චෛතසිකවූ දුක් දොම්නස්ද නොවිඳියි, බ්‍රාහ්මණය මෙසේද ධර්මය සන්දිට්ඨික වන්නේය.(2)

තවද නවවිධවූ ලෝකෝත්තර ධර්මය, යම් යම් පුද්ගලයකු විසින් අවබෝධ කරනලද්දේ වේද, ඒ ඒ පුද්ගලයා විසින් අනුන් කෙරෙහි

---

(1) දී. නි. මහාගොවින්ද සූ. - D ii 223

(2) අං. නි. තික නිපාත - A i 156

ඇදහීමෙන් යායුතුබව හැර ප්‍රත්‍යක්‍ෂඥනයෙන් තමා විසින්ම දතයුතු වෙති'යි 'සන්දිට්ඨික' නම් වේ. නොහොත් ප්‍රශස්තවූ දෘෂ්ටිය සන්දිට්ඨි නම්, එම සන්දිට්ඨිය හේතුකොටගෙන ජය ගනී යන අර්ථයෙන් සන්දිට්ඨික නම් වේ. ඒ එසේම වේ, මෙහි ආර්යමාර්ගය තමා සමග යෙදුණාවූ සන්දෘෂ්ටිය හේතුකොටගෙනද, ආර්යඵලය තමාට කාරණවූ සන්දෘෂ්ටිය හේතුකොටගෙනද, නිර්වාණය තමාට විෂයවූ සන්දෘෂ්ටිය හේතුකොටගෙනද ක්ලේශයන් ජයගනී. එහෙයින්, යම්සේ රථය හේතුකොටගෙන ජයගනී යන අරුතින් රථික නම් වේද, එසේ නවවිධවූ ලෝකෝත්තර ධර්මය සන්දෘෂ්ටිය හේතුකොටගෙන ජයගනී යන අරුතින් සන්දිට්ඨික නම් වේ. නොහොත්: 'දිට්ඨං' යනු දර්ශනයයි කියනු ලැබේ, 'දිට්ඨං' යනුම 'සන්දිට්ඨං' නම් වේ, සන්දර්ශන (යහපත් දර්ශන)ය යන අර්ථයි, සන්දර්ශනයට සුදුසු වෙති'යි සන්දිට්ඨික නම් වේ. ලෝකෝත්තර ධර්මය වූකලී භාවනාප්‍රතිවේධ වශයෙන්ද ප්‍රත්‍යක්‍ෂප්‍රතිවේධ වශයෙන්ද දක්නා ලබනුයේම සසරබිය වළක්වයි. එහෙයින් යම්සේ වස්ත්‍රයට සුදුසුය යන අරුතින් 'වත්ථික' නම් වේද එසේම සන්දිට්ඨියට සුදුසුය යන අරුතින් සන්දිට්ඨික නම් වේ.

තමාගේ ඵලදනය සඳහා නියමිත කලක් නැතැ'යි යන අරුතින් 'අකාල' නම්, 'අකාල' යනුම **අකාලික** වේ, පස් දිනෙක, සත් දිනෙක යන ආදී භේද සහිත කාලයක් ගෙවා පල දෙනුයේ නොවේ, තමාගේ පැවැත්ම හා සමඟම, අතරක් නැතිවම, පල දෙති'යි කී නියායි, නොහොත්, තමාගේ ඵලදනයෙහිදී බොහෝ කලක් ගතවීයයි යන අරුතින් 'කාලික' නම්, ඒ කිමෙක්ද? ලෞකික කුශල ධර්මයයි, මේ ලෝකෝත්තර ධර්මය වනාහි අතරක් නැතිවම පල දෙන හෙයින් 'කාලික' නොවෙති'යි අකාලික නම් වේ. මෙය මාර්ග චිත්තය සඳහාම කියනලදි.

'එව, මේ ධර්මය බලව' යනුවෙන් මෙසේ පවත්නා 'එහි, පස්ස' යන විධානයට යෝග්‍ය වෙති'යි **එහිපස්සික** නම් වේ. කවර හෙයින් මේ ධර්මය එම විධානයට සුදුසු වන්නේද? විද්‍යමානවන හෙයිනි, එසේම පිරිසුදුවන හෙයිනි. හිස්වූ මුෂ්ටියෙහි (මිටෙහි) වනාහි 'මෙහි අමුරන් හෝ රත්රන් හෝ ඇතැ'යි කීවත්, 'එව බලව'යි කිව නොහැකිය. කවර හෙයින්ද? අවිද්‍යමාන හෙයිනි. විද්‍යමානවූද මල හෝ මූත්‍ර හෝ මනෝඥභාවය ප්‍රකාශ කිරීමෙන් සිත් සතුට දනවනු පිණිස 'එව බලව'යි කිව නොහැකිය. තවද එය තෘණයෙන් හෝ පර්ණයෙන් වැසියයුතුද වේ. කවර හෙයින්ද? අපිරිසුදුවූ හෙයිනි. මේ නවලෝකෝත්තර ධර්මය ස්වභාව වශයෙන්ම විද්‍යමානවූයේ වළාකුල් පහව ගිය ආකාශයෙහි පූර්ණ

චන්‍ද්‍රමණ්ඩලය සෙයින්ද පඬුවත් කම්බිලියෙක්හි බහා තබනලද දැරහමිණක් සෙයින්ද පිරිසුදු වේ. මෙසේ විද්‍යමාන හෙයින්ද, පිරිසුදුවූ හෙයින්ද, 'එහි, පස්ස' යන විධානයට සුදුසු වෙති'යි 'එහිපස්සික' නම් වේ.

එළවියයුතුය යන අරුතින් **ඔපනයික** නමි. මෙහි විනිශ්චය මෙසේය: එළවීම උපනය නමි. ගිනි ඇවිලගත් ඉනකඩ හෝ හිස ගැන පවා නොතකා භාවනා වශයෙන් තමාගේ සිත තුළ ඉපැදවිය යුතුය යන අරුතින් 'ඔපනයික' නම් වේ. මෙය (සතර මඟ සතර පල) යන සංඛත ලෝකෝත්තර ධර්මය කෙරෙහි යෙදේ. අසංඛත ලෝකෝත්තර ධර්ම (නිර්වාණ)ය වනාහි තමාගේ සිතින්ම එළඹීම සුදුසුය යන අරුතින් ඔපනයික නම් වේ. සාක්‍ෂාත් කිරීම් වශයෙන් අත්නොහැර ඇලීසිටීම යෝග්‍ය වෙතියි යන අර්ථයි. නොහොත්, නිර්වාණය කරා මෙහෙයවති'යි ආර්යමාර්ගය උපනෙය්‍ය නම්, සාක්‍ෂාත් කළයුතු බවට පමුණුවතියි ඵල නිර්වාණධර්මය උපනෙය්‍ය නම්, උපනෙය්‍ය යනුම 'ඔපනයික' වේ.

**පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි**: උග්ඝටිතඤ්ඤූ ආදී වූ සියලුම විඥ (නුවණැති) යන් විසින් තම තමන් කෙරෙහිම, 'මවිසින් ආර්යමාර්ගය වඩනා ලද්දේය, ඵලය අවබෝධ කරන ලද්දේය, නිවණ ප්‍රත්‍යක්‍ෂ කරන ලද්දේය'යි දතයුතුය. උපාධ්‍යායයන් විසින් ආර්යමාර්ග වඩනාලද කල්හි සද්ධිවිහාරිකයන්ගේ කෙලෙස්හු පහනොවෙති, සද්ධිවිහාරිකයා උපාධ්‍යායන්ගේ ඵලසමාපත්තියෙන් ඵාසුවිහරණය නොලබයි. ඔවුන් විසින් ප්‍රත්‍යක්‍ෂ කර ගත්නාලද නිර්වාණය ප්‍රත්‍යක්‍ෂ නොකරයි. එහෙයින් මේ නවලෝකෝත්තර ධර්මය අනුන් හිසෙහි පළඳනාවක් විලසින් නොදක්ක යුතුය. තමන් සිත තුළම දක්ක යුතුය. නුවණැත්තවුන් විසින් අත්දැකීමෙන්ම ප්‍රත්‍යක්‍ෂ කටයුතුයයි කී-නියායි. මේ ධර්මය වනාහි ආඥනයන්හට විෂය නොවේ. තවද, මේ ධර්මය 'ස්වාක්ඛාත' නම්වේ, කවර හෙයින්ද? සන්දිට්ඨිකවූ හෙයිනි, සන්දිට්ඨික වනුයේ අකාලිකවූ හෙයිනි, අකාලික වනුයේ එහිපස්සිකවූ හෙයිනි, යම් ධර්මයක් එහිපස්සික වේනම්, එය ඔපනයික වේයයි මෙසේ ස්වාක්ඛාතාදීවූ දහම්ගුණ සිහි කරන ඒ යෝගාවචරයාගේ සිත එසමයෙහි රාගයෙන් මඩනා ලද්දේ නොවේ. ද්වේෂයෙන් මඩනා ලද්දේ නොවේ, මෝහයෙන් මඩනා ලද්දේ නොවේ. එසමයෙහි ඔහුගේ සිත ධර්මය ඇරබ සෘජු බවට පත් වන්නේය. පෙර කී-නයින්ම නීවරණ සොල්වාහළ ඔහුට එක් වරම ධ්‍යානාංගයෝ උපදිති. දහම්ගුණයෙහි ගැඹුරුබව හේතුකොට හෝ නොයෙක් ආකාරයෙන් අනුස්මරණය කිරීමෙහි අභිලාෂ ඇති හෙයින් හෝ අර්පණාවට

නොපැමිණි උපචාරයට පත් ධ්‍යානයම වේ. ඒ මේ ධර්මගුණ අනුස්මරණ වශයෙන් උපන් හෙයින් ධම්මානුස්සතිය යන ව්‍යවහාරයට පත්වේ. මේ ධම්මානුස්සති භාවනාවෙහි නිරතවූ භික්ෂු තෙමේ මෙසේ ඉහතකී ඕපනයික ගුණයෙන් යුතු ධර්මය දේශනා කරන්නාවූ, මේ අංගයෙනුදු සමන්විතවූ ශාස්තෘවරයකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීතයෙහි හෝ වර්තමානයෙහි හෝ නොදක්නෙමි'යි මෙසේ ධර්මයෙහි ගුණ දැකීමෙන්ම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව සහිත වන්නේය, යහපත් පැවතුම් ඇත්තෙක් වන්නේය, ධර්මය කෙරෙහි ගරුසරු සහිත සිත් ඇත්තේ ශ්‍රද්ධාදී ගුණයෙන් මහත්බවට පැමිණෙන්නේය, ප්‍රීති ප්‍රමෝද බහුලවූයේ, බිය හා බියජනක උවදුරු ඉවසනු සමත්වූයේ, දුක් ඉවසනු සමත්වූයේ ධර්මය හා සමහම වෙසෙමි'යි යන හැඟීම ලබන්නේය. ධර්මගුණානුස්මරණ ඇතිව වාසය කරන ඔහුගේ ශරීරය පවා චෛත්‍යගෘහයක් මෙන් පූජාර්හ බවට පත් වන්නේය. අනුත්තරධර්ම (නිර්වාණ)ය අවබෝධ කරනු පිණිස සිත යොමු වන්නේය. ඉක්මවිය හැකි ශික්ෂාපද එළඹසිටි කල්හි පවා ධර්මය පිළිබඳ යහපත් ස්වභාවය සිහිකරන ඔහුට හිරි, ඔතප් දෙක එළඹ සිටී, උතුම්වූ නිර්වාණය අවබෝධ කළ නොහැකි වූවහොත් ස්වර්ගපරායන වන්නේය.

තස්මා හවෙ අප්පමාදං කයිරාථ සුමෙධසො
එවං මහානුභාවාය ධම්මානුස්සතියා සදා.

එහෙයින් මෙවන් මහානුභාව සම්පන්නවූ ධම්මානුස්සති භාවනාව කෙරෙහි යහපත් ප්‍රඥ ඇත්තේ ඒකාන්තයෙන් සැම කල්හිම උත්සාහ ඇත්තෙක් වන්නේය.

**මේ ධම්මානුස්සති භාවනාව පිළිබඳ විස්තර කථාවයි.**

## සංඝානුස්සති භාවනාව

සංඝානුස්සති භාවනාව වඩනු කැමැත්තහු විසින්ද හුදෙකලාව විවේකීව, "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝයා වහන්සේ මනා පිළිවෙතට පිළිපන්නාහුය, ඍජුවූ පිළිවෙතට පිළිපන්නාහුය, නිර්වාණගාමීමාර්ගයට පිළිපන්නාහුය, සුදුසුතම පිළිවෙතට පිළිපන්නාහුය. යම් මේ පුරුෂ යුගල සතරෙක් ඇත්ද, ඔහු (සතර මග සතර ඵල වශයෙන්) ආර්යපුද්ගලයෝ අට දෙනෙකි, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවකසංඝයා වහන්සේ දුර සිට ගෙනවුත් පිළිගන්වනු ලබන සිවුපසය

ලැබීමට සුදුස්සෝය, නොයෙක් දිශාවෙන් ගෙනවුත් පිළිගන්වනු ලබන සිවුපසය ලැබීමට සුදුස්සෝය, පරලොව අදහා දෙනු ලබන දක්ෂිණාව පිළිගැනීමට සුදුස්සෝය, දෙහොත් මුදුන් දී වදිනු ලැබීමට සුදුස්සෝය, සියලු ලෝකයාහට අනුත්තරවූ පුණ්‍යක්ෂේත්‍රද වන්නාහුය"[1]යි. මෙසේ ආර්යපුද්ගල සංඝයාගේ ගුණ සිහිපත් කළයුතුය.

එහි **සුපටිපන්නො** යනු මනාසේ පිළිපන්නාහුය, මනා පිළිවෙතට ප්‍රතිපක්ෂ ධර්මයන් නැවත නොපවත්නා පිළිවෙතට, නිර්වාණගාමීවූ අනුලෝම පිළිවෙතට, නිර්වාණයට අනනුරූප නොවන පිළිවෙතට, ධර්මයට අනුරූපවූ පිළිවෙතට පිළිපන්නාහුයි කී-තියායි. භාග්‍යවතුන් වහන්සේගේ අවවාදනුශාසනා මනාකොට අසති'යි සාවක නම් වෙති, සාවකයන්ගේ සමූහය **සාවකසංඝ** නම් වෙති, ශීලයෙන් හා දෘෂ්ටියෙන් සමාන වනබැවින් එකමුතුබවට පැමිණි ශ්‍රාවකසමූහයා යන අර්ථයි. යම් හෙයකින් වනාහි ඒ මනා පිළිවෙත ඍජුවූයේ, අවංකවූයේ, අකුටිලවූයේ, අව්‍යාජවූයේ වේද, (එහෙයින්ම) ආර්යයයි, න්‍යායයයි වහරනු ලැබේද, යෝග්‍යවූ හෙයින් සාමීචියයි වහරට ගියේද, එහෙයින් එම පිළිවෙතට පිළිපන් ආර්ය සංඝයා **උජුපටිපන්නයයිද, ඤායපටිපන්නයයිද, සාමීචිපටිපන්නයයිද** කියන ලද්දාහුය. මෙහිද යම් කෙනෙක් ආර්යමාර්ගයෙහි සිටියාහුද, ඔවුන් මනා පිළිවෙතින් යුතුවූ හෙයින් සුපටිපන්නයයිද, යම් කෙනෙක් ඵලයෙහි සිටියාහුද ඔවුන් මනා පිළිවෙතින් ලැබියයුතු දෙය ලබා ඇති හෙයින් ඉකුත් පිළිවෙත ගැන සලකා සුපටිපන්නයයිද දතයුතුය. තවද මැනවින් දෙසනලද ධර්මවිනයෙහි අනුශාසිතවූ ලෙසින් පිළිපන් හෙයින්ද, නිවැරදි පිළිවෙතට පිළිපන් හෙයින්ද **සුපටිපන්න** වෙති. අන්ත දෙකට නොගොස් මැදුම් පිළිවෙතට පිළිපන් හෙයින්ද, කාය, වාක්, මනස් යන මෙහි වංක බව, කුටිල බව ව්‍යාජ බව යන දෝෂයන්ගේ ප්‍රහාණය පිණිස පිළිපන් හෙයින්ද **උජුපටිපන්න** වෙති. ඤාය යනු නිර්වාණයයි කියනු ලැබේ, එම නිර්වාණය සඳහා පිළිපන් බැවින් **ඤායපටිපන්න** වෙති. යම් ආකාරයකට පිළිපන්නාහු අනුන් විසින් කරනු ලබන සාමීචිකර්මයට සුදුස්සෝ වෙත්ද, එම ආකාරයට පිළිපන් හෙයින් **සාමීචිපටිපන්න** වෙති. **යදිදං** යනු, යම් මේ, **චත්තාරි පුරිසයුගානි** යනු, ප්‍රථම ප්‍රථම ආර්යමාර්ගයෙහි සිටියේද ඵලයෙහි සිටියේද'යි මේ ආකාරයෙන් යුගල වශයෙන් ගෙන පුරිසයුගල සතරෙක් වෙති. **අට්ඨපුරිසපුග්ගලා** යනු පුරිසපුග්ගලයන් වශයෙන් ප්‍රථම මාර්ගයෙහි සිටියේ එක් පුද්ගලයෙකි, ඵලයෙහි සිටියේ තවත් පුද්ගලයෙකි'යි යන මේ නයින් පුරුෂ පුද්ගලයෝ අට දෙනෙක් වෙති, මෙහි පුරිසො යනු හා

---

(1) අං. නි. ඡක්ක නිපාත - A iii 286

පුග්ගලෝ යනු මේ පදයෝ සමානවූ අර්ථය ඇත්තාහුය, වෛනේයජනයා සඳහා පුරිසපුග්ගලා යන මේ වචනය කියන ලද්දේය. **එස භගවතො සාවකසංඝො** යනු, භාග්‍යවතුන් වහන්සේගේ යුගල වශයෙන් යම් මේ පුරුෂ යුගල සතරක්වූද වෙන් වෙන් වශයෙන් පුරුෂ පුද්ගලයන් අට දෙනෙක්වූද ශ්‍රාවක සංඝයායි. **ආහුනෙය්‍යො** යන ආදියෙහි ගෙනඅවුත් පිදිය යුතු වෙති'යි ආහුන නම්, දුරයිට වුවද ගෙනඅවුත් සිල්වතුන්හට පිදියයුතුය යන අර්ථයි, මේ 'ආහුන' යන්න සිවුපසය හැඳින්වීමට වහරනු ලබන නාමයෙකි, එම ආහුනය පිළිගැනීමට සුදුසුවෙති'යි හෝ එය මහත්ඵල ඇතිකෙරෙතියි හෝ ආහුනෙය්‍ය නම් වෙති, නොහොත් දුර සිට වුවද ගෙනවුත් මුළු ධනයම මෙහි පිදීමට යෝග්‍යවෙති'යි ආහවනීය නම් වෙති, ශක්‍රාදීන් විසින් පවා පුදනු ලැබීමට යෝග්‍ය වෙති'යි ආහවනීය නම් වෙති, බ්‍රාහ්මණයන්ගේ යම් මේ ආහවනීය නම් ගිනි විශේෂයක් වේද, එම ආහවනීය නම් ගින්නෙහි පුදනලද්ද, මහත්ඵල වෙති'යි ඔවුන්ගේ විශ්වාසයෙක් වේද, ඉදින් පුදනලද්ද මහත්ඵල වනහෙයින් ආහවනීය නම් වෙතොත්, මේ සංඝයාම ආහවනීය වෙති, සංඝයා කෙරෙහි දෙනලද්ද මහත්ඵල වේ. කියන ලද මැයි:

යො ච වස්සසතං ජන්තු අග්ගිං පරිචරෙ වනෙ
එකඤ්ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ
සා යෙව පූජනා සෙය්‍යො යඤ්චෙ වස්සසතං හුතං."(1)

යම් පුද්ගලයෙක් තෙමේ හවුරුදු සියයක් මුළුල්ලේ වනයෙහි ගිනි පුදන්නේ, එක් මොහොතක් හෝ වඩනාලද සිත්ඇති සංඝයා පුදන්නේද, හවුරුදු සියයක් කළ අග්නිපූජාවට වඩා එම පූජාවම උතුම් වේ.

නිකායාන්තරයෙක්හි 'ආහවනීය'යි දක්වනලද මේ පදය මෙහි 'ආහුනෙය්‍ය' යන පදය හා අර්ථයෙන් සමානය, ව්‍යංජන (ශබ්ද) වශයෙන් වනාහි මෙහි කිසියම් සුලු වෙනසක් ඇත, මෙසේ ආහුනෙය්‍ය නම් වෙති.

**පාහුනෙය්‍යො** යන මෙහි වනාහි, දිසා අනුදිසාවන්ගෙන් ආ ප්‍රියමනාපවූ ඥතිමිත්‍රයන් සඳහා සත්කාර වශයෙන් සපයනලද ආගන්තුකදනය 'පාහුන'යයි කියනු ලැබේ, එම පාහුනයද එබඳුවූ ඥතිමිත්‍රයන් පසෙක සිටියදී සංඝයාහට දීමට යෝග්‍ය වේ, සංඝයාද එය පිළිගැනීමට සුදුසු වෙති. පාහුනය ලැබීමට සංඝයා හා සමාන සුදුසු

(1) ධම්මපද - Dh 107

කම් ඇති අන් කෙනෙක් නැත. ඒ එසේමැයි, මේ සංඝයා වනාහි එක් බුද්ධාන්තරයෙක්හිදීම සංකර නොවී දිස්වෙති, ප්‍රියමනාපබව උපදවන ධර්මයන්ගෙන් සමන්විතද වෙති. මෙසේ පාහුනය මොවුන්හට දියයුතුය, පාහුනය පිළිගැනීමට සුදුසුද වෙති'යි පාහුනෙය්‍ය නම් වෙති. යම් කෙනෙකුන්හට පාහවනීය යන පාය්‍ය (රුචි) වේද, ඔවුන්හට යම් හෙයකින් සංඝයා ප්‍රථම සත්කාරයට සුදුසු වෙත්ද, එහෙයින් සියල්ලනට පළමුව ගෙනවුත් මේ සංඝයා වෙත පිදිය යුතුයයි පාහවනීය නම් වෙති, සියලු ආකාරයෙන් ගෙනවුත් පිදීමට සුදුසු වෙති'යි හෝ පාහවනීය නම් වෙති. මෙහිදී සංඝයා එම අර්ථයෙන්ම පාහුනෙය්‍යයයි කියනු ලබති. දක්ඛිණා යනු පරලොව අදහාගෙන දියයුතු දනයයි කියනු ලැබේ, එම දක්ෂිණාවට සුදුසු වෙති'යි, නොහොත් දක්ෂිණාවට හිතකර වෙති'යි, යම් හෙයකින් එම දක්ෂිණාව මහත්ඵල ඇත්තක් කිරීමෙන් විශුද්ධ භාවයට පත් කෙරෙති'යි දක්ඛිණෙය්‍ය නම් වෙති. දෙඅත් සිරස තබා සියලු ලෝකයා විසින් කරනු ලබන අංජලි කර්මයට සුදුසු වෙති'යි **අංජලිකරණීය** නම් වෙති.

**අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස** යනු සියලු ලෝකයාහට අසදෘශවූ කුසල් වැඩෙන කෙත්බිමක් වැනි වේ. යම්සේ රජකුගේ හෝ ඇමතියකුගේ හෝ හැල් හෝ යව හෝ වැඩෙන ස්ථානය රජුගේ හැල්කෙතය, යවකෙතයයි කියනු ලැබේද, එසේම සංඝයා සියලු ලෝකයාහට කුසල් වැඩෙන ස්ථානයක් වේ, සංඝයා නිසා ලෝකයාහට නොයෙක් ආකාර හිතසුව පිණිස පවත්නා කුසල් වැඩේ.

එහෙයින් සංඝයා ලෝකයාහට අනුත්තරවූ පුණ්‍යක්ෂේත්‍රයක් වෙති'යි මේ ආකාරයෙන් සුපටිපන්නතාදීවූ සංඝගුණයන් සිහිකරන යෝගාවචරයාගේ සිත එසමයෙහි රාගයෙන් මඩනාලද්දේ නොවේ, ද්වේෂයෙන් මඩනාලද්දේ නොවේ, මෝහයෙන් මඩනාලද්දේ නොවේ. ඔහුගේ සිත සංඝයා අරබයා එසමයෙහිදී ඍජුභාවයට පත්වූයේම වේ. පෙර කී-නයෙන්ම යටපත්වූ නීවරණ ඇති ඔහුට එක් වරම ධ්‍යානාංගයෝ උපදිති. සංඝගුණයන්ගේ ගැඹුරුබව හේතුකොටගෙන, නැතහොත් නොයෙක් ආකාර ඇති සංඝගුණයන් සිහි කිරීම හේතුකොටගෙන අර්පණාවට නොපැමිණි උපචාරයටම පැමිණි ධ්‍යානය වේ. එම ධ්‍යානය සංඝගුණ අනුස්මරණයෙන් උපන් හෙයින් සංඝානුස්සති ධ්‍යානයයි ව්‍යවහාරයට යෙයි. මේ සංඝානුස්සති භාවනාවෙහි යෙදුණු භික්ෂු තෙමේ සංඝයා කෙරෙහි ගෞරව ඇත්තේ, හරසර ඇත්තේ ශ්‍රද්ධාවෙන් විපුලභාවයට පැමිණේ, ප්‍රීතිප්‍රමෝද බහුලවූයේ භයසන්ත්‍රාසයන් දරාගැනීමට හැකිවූයේ, දුක් විඳදරාගනු සමත්වූයේ, සංඝයා හා සමග සහවාසය පිළිබඳ හැඟීම

ලබයි. සංඝගුණානුස්මෘතියෙන් යුක්තව වාසය කරන ඔහුගේ ශරීරය සංඝයා එක්රැස්වූ උපොසථාගාරයක් සෙයින් පූජාර්හ බවට පත්වේ. සංඝගුණාධිගමය පිණිස සිත නැඹුරු වේ. ඉක්මවිය යුතු වස්තූන් එළඹි විටෙක (ශික්ෂාපදයක් ඉක්මවීමට පෙළඹවීමක් ඇති විටෙක) අභිමුඛවූ සංඝයා දක්නහුට මෙන් හිරිඔතප් උපදී, උසස් වූ මාර්ගඵලාධිගමයක් නොලබන්නේ නම් සුගතියට යන්නේ වේ.

තස්මා හවෙ අප්පමාදං කයිරාථ සුමෙධසො
එවං මහානුභාවාය සංඝානුස්සතියා සදා.

එහෙයින් නුවණැත්තේ මෙවන් මහානුභාව ඇති සංඝානුස්සති භාවනාවෙහි හැම කල්හිම ඒකාන්තයෙන් අප්‍රමාදීව කටයුතු කරන්නේය.

**මේ සංඝානුස්සතියෙහි විස්තර කථායි.**

## සීලානුස්සති භාවනාව

සීලානුස්සති භාවනාව වඩනු කැමැත්තහු විසින් වනාහි හුදෙකලාව විවේකසුවයෙන් යුක්තව, 'අහෝ මාගේ ශීලය අඛණ්ඩය, සිදුරු රහිතය, කැලැල් රහිතය, පැල්ලම් රහිතය, ස්වාධීනය, නුවණැත්තන් විසින් පසස්නා ලදය, තෘෂ්ණාදී ක්ලේශයන් ගැවී නැත, සමාධිය පිණිස පවත්නේය'යි මෙසේ අඛණ්ඩතාදී ගුණ වශයෙන් තමාගේ ශීලය සිහිපත් කළ යුතුය. එම ශීලයද, ගෘහස්ථයා විසින් ගෘහස්ථශීලයද ප්‍රව්‍රජිතයා විසින් ප්‍රව්‍රජිතශීලයද සිහිකළ යුතුය. ගෘහස්ථශීලය වේවා, ප්‍රව්‍රජිතශීලය හෝ වේවා, මුල හෝ අග එක් ශික්ෂාපදයකුදු නොකැඩුණේ නම්, එය කෙළවරින් ඉරීගිය සළුවක් මෙන් කඩ නොවූයේයි අඛණ්ඩ නම් වේ, මැද එක් සික පදයකුදු නොබිඳුණේ නම් එම සීලය මැදින් ඉරී ගිය සළුවක් මෙන් සිදුරු නොවූයේ'යි අච්ඡිද්ද නම් වේ, පිළිවෙළින් සිකපද දෙකක් හෝ තුනක් නොකැඩුණේ නම් එම ශීලය පිටෙහි හෝ කුසෙහි නැඟුණු දිග, වටකුරු ආදී හැඩ ඇති විෂම වර්ණයෙන් යුත්, කළු, රතු ආදී එක්තරා ශරීරවර්ණයක් ඇති ගවදෙනකගේ මෙන් ශබල නොවූයේය'යි අශබල නම් වේ, යම් ශීලයක් අතරින් පතර කඩවී නැත්නම් එම ශීලය විෂම වර්ණ ඇති පුල්ලි සහිත දෙනක මෙන් කල්මාෂ නොවූයේ අකම්මාස නම් වේ. අවිශේෂයෙන් සියලු ශික්ෂාපදයෝ (යට ශීලනිර්දේශයෙහි කී) සත් වැදෑරුම් මෛථුන සංයෝගයෙන්ද, ක්‍රෝධ, වෛර ආදී පාප ධර්මයන්ගෙන්ද නොමඩනාලද හෙයින් අඛණ්ඩ වූවාහුද, අච්ඡිද්ද වූවාහුද,

අශබල වූවාහුද, අකල්මාෂ වූවාහුද, එම ශික්ෂාපදයෝම තෘෂ්ණාදසත්වයෙන් මුදවා නිදහස් බවට පත් කරනු ලැබීමෙන් 'භුජිස්ස' නම් වූවාහුය. බුද්ධාදී විඥයන් විසින් පසස්නාලද හෙයින් 'විඤ්ඤුප්පසත්ථ' නම් වූවාහුය. තෘෂ්ණා දෘෂ්ටීන් නොතැවරුණු හෙයින් හෝ කිසිවකු විසින් මේ ඔබගේ ශීලයෙහි දෝෂයෙකි'යි මෙසේ අල්ලා දෙන්නට නොහැකි බැවින් 'අපරාමට්ඨ' නම් වෙති. උපචාරසමාධිය හෝ අර්පණාසමාධිය හෝ, නැතහොත් මාර්ගසමාධිය හෝ ඵලසමාධිය හෝ පිණිස පවත්නාහ'යි 'සමාධිසංවත්තනික' නම් වෙති. මෙසේ අඛණ්ඩාදී ගුණ වශයෙන් තමාගේ ශීලය මෙනෙහි කරන්නහුගේ සිත එසමයෙහි රාගයෙන් මඩනා-ලද්දේ නොවේ, ද්වේෂයෙන් මඩනා-ලද්දේ නොවේ, මෝහයෙන් මඩනා-ලද්දේ හෝ නොවේ. ඔහුගේ සිත එසමයෙහි ශීලය අරබයා ඍජුබවට ගියේම වේ, පෙර කියනලද නයින්ම ප්‍රහීණවූ නීවරණ ඇති ඔහුට එක් ක්ෂණයෙක්හිදී ධ්‍යානාංගයෝ උපදනාහුය. ශීලගුණයන්ගේ ගැඹුරුබව හේතුකොටගෙන, නැතහොත්, නානා ආකාර ඇති ගුණයන් සිහි කිරීමෙහි යෙදෙන හෙයින් අර්පණාවට නොපැමිණි, උපචාරයටම පැමිණි ධ්‍යානය වේ. එම ධ්‍යානය ශීලගුණ අනුස්මරණයෙන් උපන් හෙයින් 'සීලානුස්සතිජ්ඣාන' යනුවෙන්ම ව්‍යවහාරයට යෙයි. මෙම සීලානුස්සති භාවනාවෙහි යෙදුණ භික්ෂු තෙමේ ශික්ෂාපද කෙරෙහි ගෞරව ඇත්තේ, ශීලසම්පන්නයන් හා සමාන පැවතුම් ඇත්තේ, අප්‍රමාදවූයේ, අත්තානුවාදදී භයෙන් තොරවූයේ, ස්වල්පමාත්‍රවූද වරදෙහි බිය දක්නාසුලු වූයේ ශ්‍රද්ධාදී ගුණයෙන් මහත් බවට පැමිණේ, ප්‍රීතිප්‍රමෝද බහුලවූයේද වේ. උසස්වූ මාර්ගඵලාදියක් නොලදහොත් සුගතිපරායන වන්නේය.

> තස්මා හවෙ අප්පමාදං කයිරාථ සුමෙධසො
> එවං මහානුභාවාය සීලානුස්සතියා සදා.

එහෙයින්, යහපත් නුවණ ඇත්තේ මෙවන් මහානුභාව ඇති ශීලානුස්සති භාවනාවෙහි හැම කල්හිම, ඒකාන්තයෙන්ම අප්‍රමාදී භාවය ඇති කර ගන්නේය.

**මේ සීලානුස්සති භාවනාවෙහි විස්තර කථායි.**

## චාගානුස්සති භාවනාව

චාගානුස්සති භාවනාව වඩනු කැමැත්තහු විසින් වනාහි ප්‍රකෘතියෙන්ම පරිත්‍යාගශීලයකු වියයුතුය, නිරතුරුව පවත්වනු ලබන දනයෙන්ද, බෙදගෙන පරිභෝග කිරීමෙන්ද යුක්තවූවකු වියයුතුය. නොහොත් භාවනාව අරඹන්නහු විසින්, "අද පටන් මෙතැන් සිට

ප්‍රතිග්‍රාහකයකු ලැබෙතොත් යටත් පිරිසෙයින් අහර පිඩක් තරම්වූ හෝ දනයක් නොදී නොවළඳන්නෙමි'යි සමාදන්වී, එදවස්හි ගුණයෙන් විශිෂ්ටවූ ප්‍රතිග්‍රාහකයන් වෙත ශක්තිප්‍රමාණයෙන්, හැකි පමණින් දන් දී, එහි නිමිති ගෙන හුදෙකලාව විවේකීව, 'ඒකාන්තයෙන් මට වූයේ ලාභයෙකි, මවිසින් මනාකොට ලබන ලද්දෙකි, මසුරුමලයෙන් මඩනාලද සත්‍වයා අතර මම මසුරුමලයෙන් තොර සිත් ඇතිව, නිරපේක්ෂ පරිත්‍යාගයෙහි යෙදුනෙමි (දන්දෙනු පිණිස) නිතර දිගුකරනලද අත් ඇතිව ත්‍යාගයෙහි තියැලියකුව, යදිනු ලැබීමට සුදුස්සකුව, දනයෙහිද බෙදගෙන පරිභෝග කිරීමෙහිද ඇලුණකුව වාසය කරමි'යි[1] මෙසේ මසුරුමල දුරුකිරීම් ආදී ගුණ වශයෙන් තමාගේ ත්‍යාගගුණය ගැන මෙනෙහි කළයුතුය. එහි, **ලාභා වත මෙ** යනු ඒකාන්තයෙන් මට ලාභයෙකි. මට යහපතැයි "ආයුෂ දී දිව්‍යවූ හෝ මානුෂවූ හෝ ආයුෂයට හිමිවෙයි'[2] යනුවෙන්ද, "දෙන තැනැත්තේ (ජනයාට) ප්‍රිය වන්නේය"[3] යනුවෙන්ද, 'බොහෝ දෙනා ඔහු ඇසුරු කෙරෙති" යනුවෙන්ද, "දෙන තැනැත්තේ ප්‍රිය පුද්ගලයෙක් වන්නේය" යනුවෙන්ද, "සත්පුරුෂ ධර්මයට ක්‍රමයෙන් පැමිණීමෙකි"[4] යනුවෙන්ද මේ ආදී නයින් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙන්නහුට වන ලාභයෝ වර්ණනා කරන ලද්දහුය, ඒ ලාභයෝ මට අවශ්‍යයෙන්ම සිදු වන්නාහුය යනු අභිප්‍රායයි. **සුලද්ධං වත මෙ** යනු, මවිසින් යම් ශාසනයක් නොහොත් මිනිසත් බවක් ලබන ලද්දේද, එය මනා ලෙසින්ම ලබන ලද්දේය, කවර හෙයින්දයත්, මසුරු මලයෙන් මඩනාලද ජනයා අතර -පෙ- දනයෙහි හා බෙදගෙන වැළඳීමෙහි ඇලුණේවෙමි. එහි **මච්ඡෙරමලපරියුට්ඨිතාය** යනු, මසුරු මලින් මඩනාලද, **පජාය** යනු, ඉපැදීම් වශයෙන් සත්‍වයෝ 'පජා' යයි කියනු ලබත්. එහෙයින් තමන්ගේ සම්පත් අනුන්හටද පොදුබව නො-ඉවසීම ලක්ෂණකොට ඇති, සිතෙහි පිරිසුදුබව කිලුටු කරන පාපධර්මයන් අතුරෙන් එකක් වන මසුරු මලින් මඩනාලද සත්‍වයන් අතරැයි යනු මෙහි අර්ත්‍ථයි. **විගතමල මච්ඡෙරෙන** යනු, රාග ද්වේෂාදී අන්‍යවූ පාපධර්මයන්ගෙන් හා මසුරු බවින්ද දුරුවූ හෙයිනියි යන අර්ත්‍ථයි. **විගතමලමච්ඡෙරෙන චෙතසා විහරාමි** යනු, මෙසේ කියන ලද ප්‍රකාර සිත් ඇතිව වාසය කරමි'යි යන අර්ත්‍ථයි. සූත්‍රදේශනාවන්හි වනාහි, සෝවාන් පලයට පත්ව නිස්සයවිහාර (වැඩියයුතු කමටහන්) විචාළ මහානාම නම් ශාක්‍යයාහට නිස්සයවිහාර වශයෙන් දේශනා කරනලද හෙයින් එහි **අගාරං අජ්ඣාවසාමි**'යි (ගිහිගෙහි

(1) අං. නි. ඡක්ක නිපාත - A iii 287
(2) අං. නි. පඤ්චක නිපාත - A iii 42
(3) අං. නි. එම - A iii 40
(4) අං. නි. පඤ්චක නිපාත - A iii 41

වාසය කරමි'යි) කියනලදී. එහි 'රාගාදී කෙලෙසුන් මැඩ වාසය කරමි'යි යන අර්ථයි.

**මුත්තචාගො** යනු අපේක්ෂාරහිත ත්‍යාගී බවයි. **පයතපාණි** යනු, පිරිසුදු අත් ඇතිව දියයුතු වස්තූන් මනාකොට සියතින් දෙනු පිණිස සැමවිටම දිගුකළ අත් ඇතිව'යි කී නියායි. **වොස්සග්ගරතො** යනු, වොස්සග්ග නම් දීමයි, පරිත්‍යාගයයි යන අර්ථයි, එම වොස්සග්ගයෙහි නිරන්තරයෙන් යෙදීම් වශයෙන් නියැලුණහ'යි වොස්සග්ගරත නම්. **යාචයොගො** යනු, අන්‍යයෝ යම් යම් දෙයක් ඉල්වත්ද, ඒ ඒ දෙය දෙන හෙයින් යදිනු ලැබීමට සුදුසුය යන අර්ථයි, 'යාජයෝග' යන පාඨයද වේ, යජනයයි කියනුලබන දනයෙන් යුක්ත වූයේයි යනු එහි අර්ථයි. **දානසංවිභාගරතො** යනු, දනයෙහිද බෙදගෙන පරිභෝග කිරීමෙහිද නියැලුණේ "මම වනාහි දන් දෙමි, මවිසින් පරිභෝග කළයුතු දෙයින්ද කොටසක් දෙමි, මේ දෙකෙහිම නියැලුණෙමි"යි මෙසේ මෙනෙහි කෙරෙයි යන අර්ථයි.

මේ ආකාරයෙන් විගතමලමච්ඡෙරාදී වශයෙන් තමාගේ ත්‍යාගී ගුණය මෙනෙහි කරන ඔහුගේ සිත එසමයෙහි රාගයෙන් මඩනාලද්දේ නොවේ, ද්වේෂයෙන්-පෙ-මොහයෙන් මඩනාලද්දේ නොවේ, ඔහුගේ සිත එසමයෙහි චාග ගුණය අරබයා ඍජුව පිහිටියේ වේ.[1] පෙර කී නයින්ම නීවරණ පහව ගියවිට එක් වරම ධ්‍යානාංගයෝ උපදිත්. ත්‍යාග ගුණයන්ගේ ගැඹුරු බවින් හෝ නොයෙක් ආකාර ඇති ත්‍යාග ගුණයන් සිහි කිරීමෙහි නියුක්තවූ හෙයින් හෝ අර්පණාවට නොපැමිණි උපචාරයටම පැමිණි ධ්‍යානය වේ. මෙසේ මේ භාවනාව ත්‍යාගගුණ සිහිකිරීම් වශයෙන් 'චාගානුස්සති'යයි ව්‍යවහාරයට යෙයි. මේ චාගානුස්සති භාවනාවෙහි යෙදුණු භික්ෂු තෙමේ බොහෝසෙයින් ත්‍යාගයට නැඹුරුවූ හෙයින් අලෝභ අධ්‍යාසය ඇත්තේ, මෛත්‍රියට අනුරූපවූ කාර්ය සහිතවූයේ, විශාරදවූයේ, ප්‍රීති ප්‍රමොද බහුලවූයේ වෙයි. උසස් මාර්ග ඵලාදියක් නොලදහොත් සුගතිය කරා යන්නේය.

තස්මා හවෙ අප්පමාදං කයිරාථ සුමෙධසො
එවං මහානුභාවාය චාගානුස්සතියා සද.

එහෙයින් නුවණැත්තේ සැම කල්හිම මෙවන් මහ අනුසස් ඇති චාගානුස්සති භාවනාව කෙරෙහි ඒකාන්තයෙන් අප්‍රමාදබව ඇති කරගන්නේය.

**මේ චාගානුස්සතියෙහි විස්තර කථායි.**

---

(1) අං. නි. ඡක්ක නිපාත - A iii 287

# දේවතානුස්සති භාවනාව

දේවතානුස්සති භාවනාව වඩනු කැමැත්තහු විසින් ආර්යමාර්ග වශයෙන් පුරුදු කරනලද ශ්‍රද්ධාදී ගුණයන්ගෙන් සමන්විතයකු විය යුතුය. ඉක්බිති හුදකලාව විවේකීව මෙසේ සිහිකළ යුතුය. 'චාතුර්මහාරාජික දෙවියෝ වෙති, තාවතිංස දෙවියෝද යාම දෙවියෝද තුසිත දෙවියෝද, නිර්මාණරති දෙවියෝද, පරනිර්මිතවසවර්ති දෙවියෝද වෙති, බ්‍රහ්මකායික දෙවියෝද වෙති, ඔවුනට වඩා උසස් (පරිත්තාභ ආදී), දෙවියෝද වෙති, යම් බඳුවූ ශ්‍රද්ධාවෙකින් සමන්විතවූ ඔවුහු මේ මිනිස් ලොවින් චුතව එහි උපන්නාහු නම්, මටද එබඳුවූම ශ්‍රද්ධාවක් ඇත, යම්බඳුවූ ශීලයකින් යම්බඳුවූ ශ්‍රුතයෙකින් යම්බඳුවූ ත්‍යාගගුණයෙකින්, යම්බඳුවූ ප්‍රඥවෙකින් සමන්විතවූ ඒ දෙවියෝ මේ මිනිස් ලොවින් චුතව එහි උපන්නාහු නම්, මටද එබඳුවූම-පෙ-ප්‍රඥවක් ඇත."[1] මෙසේ දෙවියන් සාක්ෂි කොට තමාගේ ශ්‍රද්ධාදී ගුණයන් සිහිපත් කළයුතුය. (මහානාම) සූත්‍රයෙහි වනාහි, 'මහානාමය, යම් කලෙක්හි ආර්යශ්‍රාවක තෙමේ තමාගේ හා එම දෙවියන්ගේ ශ්‍රද්ධාවද, ශීලයද, ශ්‍රුතගුණයද පරිත්‍යාගයද, ප්‍රඥවද සිහිපත් කරන්නේද, එසමයෙහි ඔහුගේ සිත රාගයෙන් මඩනාලද්දේ නොවේ,"යයි[2] කියනලදි. කුමක් කියනලද්දේ වීනමුදු, ශාක්ෂිස්ථානයෙහි තැබියයුතු දෙවියන්ගේ ශ්‍රද්ධාදී ගුණයන් තමා සතු එම ගුණයන් දීපනය කිරීම පිණිස කියන ලදයි දතයුතුය. අටුවාවෙහි[3] වනාහි, "දෙවියන් ශාක්ෂිස්ථානයෙහි තබා තමාගේ ගුණ මෙනෙහි කරයි" යනුවෙන් ස්ථිරවම කියන ලද්දේය. එහෙයින් පළමුකොට දෙවියන්ගේ ගුණ සිහිකොට පසුව තමා කෙරෙහි විද්‍යමානවූ ශ්‍රද්ධාදී ගුණයන් මෙනෙහි කරන ඔහුගේ සිත එසමයෙහි රාගයෙන් මඩනාලද්දේ නොවේ, ද්වේෂයෙන්-පෙ-මෝහයෙන් මඩනාලද්දේ නොවේ, එසමයෙහි ඔහුගේ සිත දෙවියන් අරබයා ඍජුබවට පැමිණියේම වේ. පෙරකී නයින්ම නීවරණයන් යටපත්ව ගිය කල්හි එක් වරම ධ්‍යානාංගයෝ උපදනාහුය. ශ්‍රද්ධාදී ගුණයන්ගේ ගැඹුරුබවින් නැතහොත් නොයෙක් ආකාර ගුණයන් සිහි කිරීමෙහි යෙදුණුබැවින් අර්පණාවට නොපැමිණි උපචාරයටම පැමිණි ධ්‍යානය වේ. දේවතාවන්ගේ ගුණයන් හා සමානවූ තමාගේ ශ්‍රද්ධාදී ගුණයන් සිහි කිරීම් වශයෙන් මේ භාවනාව දෙවතානුස්සති යනුවෙන්ම ව්‍යාවහාරයට යෙයි. මෙම දෙවතානුස්සති භාවනාව වැඩීමෙහි නිරත භික්ෂු තෙමේ

---

(1) අං. නි. ඡක්ක නිපාත - A iii 287

(2) අං. නි. ඡක්ක නිපාත - A iii 287

(3) හෙලටුවා

දෙවියනට ප්‍රිය මනාප වේ, බොහෝ සෙයින් ශ්‍රද්ධාදියෙන් විපුලත්වයට පැමිණේ, ප්‍රීතිප්‍රමෝද්‍ය බහුලව විහරණය කෙරේ. උසස් මාර්ග ඵලාදියක් නොලබනුයේ නම් සුගතිය කරා යන්නේ වේ.

තස්මා හවෙ අප්පමාදං කයිරාථ සුමෙධසො
එවං මහානුභාවාය දෙවානුස්සතියා සද.

එහෙයින් නුවණැත්තේ සැම කල්හිම මෙවන් මහ අනුසස් ඇති දේවතානුස්සති භාවනාව කෙරෙහි ඒකාන්තයෙන් අප්‍රමාද බව වඩන්නේය.

**මේ දේවතානුස්සතියෙහි විස්තර කථායි.**

මෙම ජඅනුස්සති භාවනාව පිළිබඳ විස්තර ඇතුළත් (මහානාම සූත්‍ර) දේශනාවෙහි,(1) "ඒ යෝගාවචරයාගේ සිත එසමයෙහි තථාගතයන් අරබයා ඍජු බවට ගියේම වෙයි," යන ආදිය කියා, "මහානාමය, ඍජුභාවයට ගිය සිත් ඇති ආර්යශ්‍රාවක තෙමේ අර්ථය නිසා උපන් තුෂ්ටියද ලබයි, ධර්මය නිසා උපන් තුෂ්ටියද ලබයි, ධර්මය හා සමග යෙදුණු ප්‍රමෝදයද ලබයි, ප්‍රමුදිතවූ ඔහුට ප්‍රීතිය උපදී'(1) යනුවෙන් කියනලදී. එහි 'ඉතිපි සො භගවා' යන ආදියෙහි අර්ථය නිසා උපන් තුෂ්ටිය සඳහා **ලභති අත්ථවෙදං** යයිද, එහි පෙළ නිසා උපන් තුෂ්ටිය සඳහා **ලභති ධම්මවෙදං** යයිද, එම අර්ථ, ධර්ම යන දෙකෙහිම ස්වභාව වශයෙන් **ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං** යයිද කියනලදැයි දතයුතුය.

දේවතානුස්සතියෙහි **දෙවතා ආරබ්භ** යනුවෙන් යමක් කියන ලද්දේද, එය පළමුකොට දෙවියන් අරබයා පවත්වනලද සිත් වශයෙන් හෝ දේවතා ගුණයන් හා සමානවූ තමාගේ ගුණයන් අරබයා, නොහොත්, දේවතාභාවය දනවනසුලු තමාගේ ගුණයන් අරබයා පවත්වනලද සිත් වශයෙන් හෝ කියනලදැයි දතයුතුය. මෙම අනුස්සති භාවනා සය ආර්ය ශ්‍රාවකයන්හටම සමෘද්ධ වේ. ඔවුන්හට වනාහි බුදුගුණ, දහම්ගුණ, සඟගුණ ප්‍රකට වේ, එම ආර්යශ්‍රාවකයෝද අඛණ්ඩතාදී ගුණ ඇති ශීලයෙන්ද, මසුරුමල පහවූ ත්‍යාගයෙන්ද, මහානුභාවසම්පන්න දෙවියන්ගේ ගුණයන් හා සමානවූ ශ්‍රද්ධාදී ගුණයෙන් සමන්විත වූවාහුය. මහානම සූත්‍රයෙහිද, සෝවාන් වූවහුට නිස්සයවිහාර (කමටහන් විහරණ) යන් විචාළ කල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් සෝවාන් වූවහුට කමටහන් විහරණ දක්වනු පිණිසම මේ අනුස්සති භාවනා සය විස්තර වශයෙන්

(1) අං. නි. ඡක්ක නිපාත - A iii 287.

දේශනා කරන ලද්දේය.[1] ගේධ සූත්‍රයෙහිද, "මහණෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙමේ, 'ඉතිපි සො භගවා' යන ආදී වශයෙන් තථාගතයන් සිහි කරයි-පෙ-ඔහුගේ සිත එසමයෙහි ඍජුභාවයට ගියේම වේ.[2] ගෙධ (පංචකාම ගුණ)යෙන් වෙන්වූයේ, මිදීගියේ, නැගී සිටියේ වේ. මහණෙනි, ගෙධ යන මෙය පංචකාමගුණයට අධිවචනයෙකි. මහණෙනි, මේ බුද්ධානුස්සතිය අරමුණු කොටගෙන මෙසේ මේ ශාසනයෙහි ඇතැම් සත්ව කෙනෙක් විශුද්ධියට පැමිණෙති"[3]යි මෙසේ ආර්යශ්‍රාවකයා විසින් අනුස්සති භාවනා වශයෙන් සිත පිරිසුදුකොට උත්තරවූ පරමාර්ථ විශුද්ධිය අවබෝධ කිරීම දක්වනු පිණිස කියනලද්දේය.

ආයුෂ්මත් මහාකච්චායන තෙරුන් විසින් දේශනා කරනලද සම්බාධොකාස සූත්‍රයෙහිද, "ඇවැත්නි, දන්නා, දක්නා, භාග්‍යවත්, අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් සම්බාධ (හෙවත් තෘෂ්ණා ක්ලෙශාදී ගැහැට) සහිත ගිහිගෙහි සිටියදීම සත්වයන්ගේ විශුද්ධිය පිණිස -පෙ- නිර්වාණාවබෝධය පිණිස, යම් මේ අනුස්සති භාවනා සයක් ඔකාසාධිගම වශයෙන් දන්නා ලද්දේද, එය ආශ්වර්යයෙකි, අද්භූතයෙකි, කිනම් භාවනා සයෙක්ද? ඇවැත්නි මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙමේ තථාගතයන් අනුස්මරණය කරයි -පෙ-මෙසේ මේ ශාසනයෙහි ඇතැම් සත්ව කෙනෙක් විශුද්ධිස්වභාව ඇත්තෝ වන්නාහුය."[4] මෙසේ ආර්යශ්‍රාවකයාගේම පරමාර්ථ විශුද්ධි ස්වභාවය පිණිස ඔකාස අධිගම වශයෙන් කියන ලද්දහුය. උපොසථ සූත්‍රයෙහිද, 'විශාඛාවෙනි, ආර්යවූ උපොසථය කෙසේ සිදු වන්නේද? විශාඛාවෙනි, කිලුටුබවට ගිය සිත උපක්‍රම මගින් පිරිසුදු වන්නේය, විශාඛාවෙනි, කෙසේ නම් කිලුටුබවට ගිය සිත උපක්‍රම මගින් පිරිසුදු වන්නේද? විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙමේ තථාගතයන් අනුස්මරණය කරන්නේය'යි[5] මෙසේ පෙහෙවස් වසන ආර්යශ්‍රාවකයාගේම සිත පිරිසුදු කරන කමටහනක් වශයෙන් පෙහෙවස් විසීමෙහි මහත්ඵලභාවය දක්වනු පිණිස කියනලදී. එකාදස නිපාතයෙහිද, "මහානාමය, ශ්‍රද්ධා ඇත්තේ (තථාගතයන්) සිත් ගන්නේය, ශ්‍රද්ධා නැත්තේ නොඑසේ වන්නේය, අරඹනලද වීර්ය ඇත්තේ එළඹසිටි සිහි ඇත්තේ-සන්සුන් සිත් ඇත්තේ ප්‍රඥා ඇත්තේ (තථාගතයන්) සිත් ගන්නේය, ප්‍රඥා නැත්තේ නොඑසේ වන්නේය, මහානාමය, මේ ශ්‍රද්ධාදී

(1) අං. නි. ඡක්ක නිපාත - A iii 285
(2) එම - A iii 312
(3) එම
(4) අං. නි. ඡක්ක නිපාත - A iii 314f.
(5) අං. නි. තික නිපාත - A i 206 ff.

පංචධර්මයෙහි පිහිටා එයින් මතු (බුද්ධානුස්සති ආදී) ෂඩ්ධර්මයන් වඩන්නෙහිය, මහානාමය මෙහිදී ඉතිපි සො භගවා යන ආදී වශයෙන් තථාගතයන් සිහි කරන්නෙහිය"යි[1] මෙසේ, "ස්වාමීනී, නොයෙක් විහරණයෙන් දවසරින අප විසින් කවර විහරණයෙකින් විසිය යුතු වන්නේද?යි[2] විචාරන ආර්යශ්‍රාවකයකුටම සුදුසු විහරණ දක්වනු පිණිස කියන ලද්දේය. එසේ වුවද, පිරිසුදු ශීලාදී ගුණයෙන් සමන්විතවූ පෘථග්ජන පුද්ගලයකු විසින්ද මෙසේ මෙනෙහි කළයුතුය. අනුස්සව වශයෙන් වුවද බුද්ධාදීන්ගේ ගුණ මෙනෙහි කරන්නහුගේ සිත පහන් වන්නේමය. එසේ මෙනෙහි කිරීමේ අනුහසින් නීවරණයන් යටපත්කොට උදරවූ ප්‍රමෝද ඇතිව විදර්ශනා අරඹා රහත්බව සාක්‍ෂාත් කරන්නේය, කටකන්‍දරවාසී[3] ඵුස්සදෙව තෙරුන් මෙනි. ඒ ආයුෂ්මතුන් වහන්සේ වනාහි, මාරයා විසින් මවාගත් බුදුවෙස් දැක, රාග, ද්වේෂ, මොහ සහිත මාරයා ගත් බුදුවෙස් මෙතරම් හොබනේ නම්, සියලු අතින්ම රාගද්වේෂ මොහාදියෙන් දුරුවූ භාග්‍යවතුන් වහන්සේ කෙතරම් හොබනාහුදැයි බුදුන් අරමුණු කොටගත් ප්‍රීතිය ලැබ විදර්ශනා වඩා රහත් බවට පැමිණියාහුය.

**සාධුජන ප්‍රමොදය පිණිස කරනලද විශුද්ධිමාර්ගයෙහි සමාධිභාවනාධිකාරයෙහි ජ-අනුස්සතිනිද්දේස නම් සත්වන පරිච්ඡේදය මෙතෙකින් නිමියේය.**

(1) අං. නි. එකාදස නිපාත - A v 329 ff.

(2) එම - A v 328

(3) ඇතැම් : කටකන්ධකාර

# 8. අනුස්සති කම්මට්ඨාන නිද්දේසය

## මරණානුස්සති භාවනාව

ඉක්බිති මේ දෙවතානුස්සතියට අනතුරුව මරණානුස්සතිය පිළිබඳ භාවනා නිර්දේශය එළඹියේය. එහි **මරණ** යනු එක් භවයකින් පිරිසුන් ජීවිතෙන්‍ද්‍රියයාගේ බිඳී යාමයි. රහතුන්ගේ සසරදුක් සහමුලින් සිඳලන සමුච්ඡේදමරණයයි කියනලද යම් මේ මරණයක් වේනම් එම සමුච්ඡේදමරණයද, මොහොතක් පාසා බිඳෙන, එහෙයින් ක්‍ෂණභංගයයි කියනලද, සංස්කාරයන්ගේ ක්‍ෂණිකමරණයද, 'ගස මළේය', 'ලෝහය මළේය' යන ආදී තන්හි සම්මුතිමරණයද මෙහිලා අභිප්‍රේත නොවේ. යම් මරණයක් මෙහිලා අභිප්‍රේත වේද, එය කාලමරණය, අකාලමරණයයි දෙවැදෑරුම් වේ. එහි කාලමරණය පුඤ්ඤක්ඛය (කම්මක්ඛය) හෝ ආයුක්ඛය හෝ උභයක්ඛය වශයෙන් වේ. අකාලමරණය උපච්ඡේදකකම්ම වශයෙන් වේ. එහි ආයුෂ පවත්වා ගැනීමට හේතුවන ආහාරාදී ප්‍රත්‍යය විද්‍යමාන කල්හිදු හුදෙක් ප්‍රතිසන්ධිජනක කර්මය විපාක දී අවසන් වීමෙන් යම් මරණයක් වේනම් එය පුඤ්ඤක්ඛය නම් වේ. ගති, කාල, ආහාරාදී සම්පත් නොමැතිවීමෙන් වර්තමාන කාලයෙහි මිනිසුන්ගේ සියවසක් පමණවූ ආයුෂය ක්‍ෂයවීමෙන් යම් මරණයක් වේනම් මේ ආයුක්ඛය මරණයයි. දූසිමාර, කලාබු ආදී රජුන්ගේ මෙන් ජීවිතයෙන් තොරකරවන්නට සමත් කර්මයක් හේතුකොටගෙන සිඳීගිය ජීවිතප්‍රවෘත්ති ඇත්තවුන්ගේද, පූර්වකර්ම වශයෙන් ආයුධප්‍රහාර ආදී උපක්‍රම මගින් සිදුනාලද ජීවිතප්‍රවෘත්ති ඇත්තවුන්ගේද යම් මරණයක් වේනම් මෙය අකාලමරණ නම් වේ. මේ සියල්ලම යට කියනලද ජීවිතේන්‍ද්‍රිය උපච්ඡේද යන්නෙහි ඇතුළත් වේ. මෙසේ ජීවිතේන්‍ද්‍රිය සිඳී යාමයයි කියනලද මරණය ගැන සිහි කිරීම **මරණසති** නම් වේ.

එම මරණානුස්සති භාවනාව වඩනු කැමති යෝගාවචරයා විසින් හුදකලාව විවේකීව, "මරණය සිදු වන්නේය, ජීවිතේන්‍ද්‍රියය සිඳීයන්නේය' යනුවෙන් හෝ, 'මරණං මරණං' යනුවෙන් හෝ නුවණින් මෙනෙහි කිරීම පැවැත්විය යුතුය. නුනුවණින් පවත්වන්නාහට වනාහි හිතවත් ජනයාගේ මරණය සිහි කිරීමෙන්, පිය පුතුගේ මරණය සිහි කරන වැදූ මවකට මෙන් ශෝකය උපදියි, අහිතවත් ජනයාගේ මරණය සිහි කිරීමෙන් සතුරකුගේ මරණය සිහි කරන සතුරකුට මෙන් ප්‍රමෝදය උපදියි, මධ්‍යස්ථ ජනයාගේ මරණය සිහි කරනවිට මළ සිරුරු දක්නාවිට සොහොන් පල්ලකුට මෙන් සංවේගය නො-උපදියි, තමාගේ මරණය

සිහි කරන්නහුට කඩුව ඔසවාගත් වධකයකු දකීමෙන් බියපුලු පුද්ගලයකුට මෙන් සන්ත්‍රාසය උපදියි. එහෙයින් මේ සියල්ලම සති, සංවෙග, ඥාණ යන මෙයින් තොරවූ හෙයින් අයොනිසො මනසිකාර හෙවත් නුනුවණින් මෙනෙහිකිරීම වේ. එහෙයින් ඒ ඒ තන්හි මරණ ලද්දවූද, මළාවූද සත්වයන් බලා දුටුවිරූ සැපත් ඇති ජනයාගේ මරණය ආවර්ජනය කොට සති, සංවෙග, ඥාණ යන මෙයින් යුතුව "මරණය වන්නේය," ආදී නයින් මෙනෙහි කිරීම පැවැත්විය යුතුය, මෙසේ මෙනෙහි කිරීම පවත්වනුයේම නුවණින් පවත්වයි, උපාය සහිතව පවත්වයි යන අර්ථයි. මෙසේ මනසිකාරය පවත්වන්නහුටම නීවරණයෝ විනාශයට පත්වෙති, මරණය අරමුණු කොටඇති සිහිය මනාව පිහිටයි, උපචාරයටම පැමිණි කර්මස්ථාන වේ.

යමකුට මෙපමණෙකින් (නුවණින් මෙනෙහි කිරීමෙන්) එසේ නොවෙතොත්, ඔහු විසින් වධකයකු ලෙසින් තමා වෙත එළඹ සිටින නියායෙන් (වධක පච්චුපට්ඨානතො)ද, සම්පත් විපත් බවට හැරීමේ නියායෙන් (සම්පත්තිවිපත්තිතො)ද, අනුන්ගේ මරණය සිදුවීම අනුව තමාටද මරණය වන නියායෙන් (උපසංහරණතො)ද, ශරීරය බොහෝ දෙනකුට පොදුවීමේ නියායෙන් (කායබහුසාධාරණතො)ද, ආයු දුබල වීමේ නියායෙන් (ආයුදුබ්බලතො)ද, මරණයට නිමිත්තක් නොමැතිවීම් වශයෙන් (අනිමිත්තතො)ද, පරමායුෂ කාලපරිච්ඡේද වශයෙන් (අද්ධානපරිච්ඡේදතො)ද, චිත්තක්ෂණයන්ගේ කෙටිබැව් වශයෙන් (ඛණපරිත්තතො)ද යන මේ අට ආකාරයෙන් මරණය ගැන මෙනෙහි කළ යුතුය. එහි **වධකපච්චුපට්ඨානතො** යනු, වධකයකු එළඹ සිටින නියායෙන් මෙනෙහි කිරීමයි. යම්සේ වනාහි 'මොහුගේ හිස සිඳිමි'යි කඩුවක් ගෙන ගෙල වටා සිසාරවමින් වධකයෙක් එළඹ සිටින්නේද, එසේම මරණයද එළඹ සිටින්නේමයයි සිහි කටයුතුය. කවර හෙයින්දයත්, උපත හා සමගම මරණයද ආ හෙයිනි, එසේ ජීවිතය තොර කරන හෙයිනි. යම්සේ හතුකැකුලක් මුදුනෙන් ගත් පස් ඇතිව මතුවේද, එසේම, සත්වයෝ ජරා, මරණ දෙක රැගෙනම උපදිති. ඒ එසේමැයි, ඒ සත්වයන්ගේ ප්‍රතිසන්ධිචිත්තය. ඉපැදෙනු අනතුරුවම, දිරාපත්ව පර්වත ශිඛරයෙකින් වැටුණු ගලක් මෙන් එම චිත්තය හා සමඟ බැඳුණු ස්කන්ධයන් හා සමඟම බිඳීයයි. මෙසේ ක්ෂණිකවූ මරණය වනාහි උපත හා සමගම ආයේය, උපන්නහුට මරණය අවශ්‍යයෙන්ම සිදුවන හෙයින් මෙහි අභිප්‍රේත මරණය උපත හා සමගම ආයේය. එහෙයින් යම්සේ උදාවූ සූර්යයා අස්තය කරා යන්නේම වේද, යන යන තැනින් මදක් හෝ නොනවතීද, එසේම යම්සේ පර්වතයෙකින් ගලා එන නදියක් වේගවත් ප්‍රවාහයෙන්

තණපත් ආදිය ගෙන ගලාබසීද, මදකට හෝ නො-නවතීද, එසේම මේ සත්වයා උපතෙහි පටන් මදකට හෝ නොනැවතී මරණය කරාම යෙයි. එහෙයින් කියන ලදි.

යමෙකරත්තිං පඨමං ගබ්භෙ වසති මානවො
අබ්භුට්ඨිතොව සො යාති ස ගච්ඡං න නිවත්තති.[1]

යම්හෙයකින් සත්වයෙක් පළමුකොට මව්කුස තුළ එක් රාත්‍රියක් හෝ වෙසේද, හේ තෙමේ අහසට නැඟුණු වළාකුළක් සෙයින් නොනැවතීම (මරණය කරා) යෙයි.

මෙසේ යන ඔහුට ග්‍රීෂ්මයෙන් රත්වී කුඩා ඇල දෙළ වියළී යන සෙයින්ද, උදෑසන තෙත් බවින් ලිහිල්වූ නටු සහිත පලතුරු ගස්වලින් ගිලිහෙන සෙයින්ද, මුගුරින් පහරනලද මැටි බඳුන් බිඳී යන සෙයින්ද, හිරුරැස් වැදී පිණිබිඳු වැනසී යන සෙයින්ද මරණය ලංවේ. එහෙයින් කියන ලදි.

අච්චයන්ති අහොරත්තා ජීවිතං උපරුජ්ඣති
ආයු ඛීයති මච්චානං කුන්නදීනං ව ඔදකං[2]

ඵලානමිව පක්කානං පාතො පපතතො භයං
එවං ජාතාන මච්චානං නිච්චං මරණතො භයං.

යථාපි කුම්භකාරස්ස කතං මත්තිකභාජනං
සබ්බං භෙදනපරියන්තං එවං මච්චාන ජීවිතං.[3]

උස්සාවො ව තිණග්ගම්හි සූරියස්සුග්ගමනං පති
එවමායු මනුස්සානං, මා මං අම්ම නිවාරය.[4]

දිවා රාත්‍රි ගෙවී යයි, ජීවිතයද නිරුද්ධ වීයයි, කුඩා නදීන්ගේ ජලය මෙන් මනුෂ්‍යයන්ගේ ආයුෂයද ගෙවීයයි.

විලිකුත් ඵලයන්හට උදසන වැටී වැනසී යෑමේ බිය මෙන් උපන්නාවූ මනුෂ්‍යයන්හට නිතොර මරණයෙන් බිය ඇතිවේ.

---

(1) ජාතකපාළි - J iv 494
(2) ස. නි. සගාථවග්ග - S i 109
(3) සු. නි. - Sn 576 f
(4) ජාතකපාළි - J iv 122

කුම්භකාරයකු විසින් නිපදවනලද මැටි බඳුනක් මෙන් සියල්ල බිඳීමෙන් අවසන් වේ, මනුෂ්‍යයන්ගේ ජීවිතයද එසේය.

මනුෂ්‍යයන්ගේ ආයුෂ හිරු නැග එනවිට තණ අග තිබෙන පිණි බිඳක් සෙයින් වැනසී යයි, මැණියනි, මා නොවලකනු මැනවි.

මෙසේ උපත හා සමහම ආ මේ මරණය වනාහි කඩුව ඔසවාගත් වධකයකු වැනි වේ, ගෙල වටා කඩුව සිසාරවන ඒ වධකයා ජීවිතය පැහැර ගන්නේමය, පැහැර නොගෙන නොනවතී. එහෙයින් උපත හා සමග ආ හෙයින්ද, ජීවිතය පැහැරගන්නා හෙයින්ද, කඩුව ඔසවාගත් වධකයකු මෙන් මරණයද ළංව එළඹියේම වේ'යයි මෙසේ වධකපච්චුපට්ඨාන (එළඹසිටි වධකයකු) වශයෙන් මරණය ගැන සිහිකළ යුතුය.

**සම්පත්තිවිපත්තිතො** යනු මෙහි සම්පත්ති නම් ලෝකයෙහි යම්තාක් විපත් මගින් නොමඩනා ලද්දේද, ඒතාක් පමණක් හොබනේය. විපත් ඉක්මවා සිටින සම්පතෙක් නම් නැත්තේමය. ඒ එසේමැයි:

සකලං මෙදිනිං භුත්වා දත්වා කොටිසතං සුඛී
අඩ්ඪාමලකමත්තස්ස අන්තෙ ඉස්සරතං ගතො.

තෙනෙව දෙහබන්ධෙන පුඤ්ඤම්හි ඛයමාගතෙ
මරණාභිමුඛො සො පි අසොකො සොකමාගතො.

මුළුමහත් පෘථිවිය නතු කොටගෙන සැප ඇත්තෙක්ව කෙළසියයක් ධනය පරිත්‍යාග කොට එම ජීවිතයෙහිම අවසාන කාලයෙහිදී පින් පිරිහීමෙන් නෙල්ලි ගෙඩියකින් අඩකට පමණක් හිමිකරුවකු බවට පත් ඒ අසෝක රජ තෙමේද මරණාසන්න වූයේ ශෝකයට පත් වූයේය.

තවද සියලු නීරෝග බව ව්‍යාධියෙන් කෙළවර වේ, සියලු යෞවනය ජරාවෙන් අවසන් වේ. සියලු ජීවිතය මරණයෙන් අවසන් වේ. මුළුමහත් ලෝක සන්නිවාසයම ඉපැදීම අනුව ආයේය, ජරාවෙන් බඳනා ලද්දේය, ව්‍යාධියෙන් මඩනා ලද්දේය. එහෙයින් කීහ:

යථාපි සෙලා විපුලා නභං ආහච්ච පබ්බතා
සමන්තා අනුපරියෙයျුං නිප්පොථෙන්තා චතුද්දිසා

එවං ජරා ච මච්චූ ච අධිවත්තන්ති පාණිනො.
ඛත්තියෙ බ්‍රාහ්මණෙ වෙස්සෙ සුද්දෙ චණ්ඩාලපුක්කුසෙ
න කිඤ්චි පරිවජ්ජෙති සබ්බමෙවාභිමද්දති
න තත්ථ හත්ථීනං භූමි න රථානං න පත්තියා
න චාපි මන්තයුද්ධෙන සක්කා ජෙතුං ධනෙන වා.[1]

යම්සේ ශෛලමයවූ මහා පර්වතයෝ අහස ගැටෙමින් සිවුදිසාවන් හාත්පසින් මැඩගෙන පැතිරෙනු සමත් වන්නාහුද,

එසේම ජරාමරණයෝ සත්වයන් මඩිති, ක්‍ෂත්‍රියයන් බ්‍රාහ්මණයන්, වෛශ්‍යයන්, ශුද්‍රයන්, චණ්ඩාලයන්, පුප්සඩුවන් (කසල ශෝධකයන්) යන මේ කිසිවකු නොහැර සියල්ලන්ම මඩිති.

එහිලා ඇතුන්හට තැනෙක් නැත, රථසේනාවට හෝ පාබල සේනාවට තැනෙක් නැත, මන්ත්‍ර යුද්ධයෙන් හෝ ධන පරිත්‍යාගයෙන් ජයගත නොහැකිය.

මෙසේ ජීවිත සම්පත්තිය මරණ විපත්තිය කෙළවරකොට ඇතිබව නිගමනය කරමින් සම්පත්ති විපත්ති වශයෙන් මරණය සිහිකළ යුතුය.

**උපසංහරණතො** යනු, සෙසු ජනයා හා සමගම තමාටද මරණය පොදුබව සැසඳීම් වශයෙනි; එහිලා සත් ආකාරයෙකින් තමා කෙරෙහි ආරෝපණය කරමින් මරණය සිහිකළ යුතුය. යශෝමහත්ව වශයෙන්ද, පුණ්‍යමහත්ව වශයෙන්ද, බලමහත්ව වශයෙන්ද, ඍද්ධිමහත්ව වශයෙන්ද, ප්‍රඥමහත්ව වශයෙන්ද, ප්‍රත්‍යෙකබුද්ධ වශයෙන්ද, සම්‍යක්සම්බුද්ධ වශයෙන්ද'යි යන සත් ආකාරයෙනි. කෙසේද යත්: මේ මරණය වනාහි මහා යශස් ඇති, මහ පිරිවර ඇති ධනවාහනයෙන් සමෘද්ධවූ මහාසම්මත, මන්ධාතු, මහාසුදස්සන, දළ්හනෙමි, නිමි ආදීන් මතද නිසැකයෙන්ම වැටුණේය, මා පිට කිමෙකැ'යි නොවැටෙන්නේද?

මහායසා රාජවරා මහාසම්මත-ආදයො
තෙපි මච්චුවසං පත්තා මාදිසෙසු කථා'ව කා.

මහා යශස් ඇති මහාසම්මතාදී නරවරයෝ පවා මරුවසභයට පැමිණියාහුය, මා වැන්නවුන් ගැන කියනුම කවරේද?

---

(1) සං. නි. සගාථවග්ග - S i 102

මේ ආකාරයෙන් යශෝමහත්වය අනුව සිහිකළ යුතුය.

පුණ්‍යමහත්වය අනුව කෙසේ සිහිකළයුතු තුද යත්:

ජොතියො ජටිලො උග්ගො මෙණ්ඩකො අථ පුණ්ණකො
එතෙ ච'ඤ්ඤෙ ච යෙ ලොකෙ මහාපුඤ්ඤා'ති විස්සුතා
සබ්බෙ මරණමාපන්නා මාදිසෙසු කථා'ව කා.

ජෝතිය, ජටිල, උග්ග, මෙණ්ඩක හා පුණ්ණක යන මොහුද, මහා පිනැත්තෝයයි ලෝකයෙහි ප්‍රකටවූ අන් යමෙක් වූවාහුනම් ඒ සියල්ලෝමද මරණයට පත්වූහ, මා වැන්නවුන් ගැන කියනුම කවරේද?

මේ ආකාරයෙන් පුණ්‍යමහත්ව වශයෙන් සිහි කළ යුතුය.

බලමහත්වය අනුව කෙසේ සිහිකළ යුතුද යත්:

වාසුදෙවො බලදෙවො භීමසෙනො යුධිට්ඨිලො
චානුරො පියදමල්ලො අන්තකස්ස වසංගතා

එවං ථාමබලූපෙතා ඉති ලොකම්හි විස්සුතා
එතෙ පි මරණං යාතා මාදිසෙසු කථාව කා.

වාසුදෙවය, බලදෙවය, භීමසෙනය, යුධිෂ්ඨිරය, අනුරය, පියදමල්ලය යන මොහුද මරු වසහයට ගියාහුය.

මෙසේ වීර්ය බලයෙන් යුත් වූහ'යි ලෝකයෙහි ප්‍රකටවූ මොවුහුද මරණයට පැමිණියාහුය. මා වැන්නවුන් ගැන කියනුම කවරේද?

මෙසේ වීර්යබලමහත්ව වශයෙන් මරණය ගැන සිහිකළ යුතුය.

ඍද්ධිමහත්ව වශයෙන් කෙසේද යත්,

පාදඞ්ගුට්ඨකමත්තෙන වෙජයන්තං අකම්පයි
යො නාමිද්ධිමතං සෙට්ඨො දුතියො අග්ගසාවකො
සොපි මච්චුමුඛං ඝොරං මිගො සීහමුඛං විය
පවිට්ඨො සහ ඉද්ධීහි මාදිසෙසු කථා'ව කා.

යමෙක් තුමූ පා ඇඟිලි මතින් වෛජයන්ත ප්‍රාසාදය සොල්වා ලූහුද ඍද්ධිමතුන් අතුරෙන් ශ්‍රේෂ්ඨවූ ඒ දෙවන අගසව්වන් වහන්සේද

එම සෘද්ධිබලය ඇතිව පවා සිංහ මුඛයට පිවිසි මුවකු මෙන් ඝෝරවූ මාරමුඛයට පිවිසියහ, මා වැන්නවුන් ගැන කියනුම කවරේද?

මේ ආකාරයෙන් සෘද්ධිමහත්ත්වය අනුව සිහි කළයුතුය.

ප්‍රඥා මහත්වය අනුව කෙසේද යත්,

ලොකනාථං ඨපෙත්වාන යෙ අඤ්ඤෙ අත්ථි පාණිනො
පඤ්ඤාය සාරිපුත්තස්ස කලං නාග්ඝන්ති සොළසිං

එවං නාම මහාපඤ්ඤො පඨමො අග්ගසාවකො
මරණස්ස වසං පත්තො මාදිසෙසු කථාව කා.

ලෝකනාථයන්වහන්සේ හැර අනෙක් යම් සත්ත්ව කෙනෙක් ඇත්ද, ඒ සියල්ලෝම ප්‍රඥාව අතින් සැරියුත් තෙරුන්ගේ ප්‍රඥාවෙන් සොළොසින් පංගුවක් හෝ නො-අගනේය.

මෙවන් මහ පැනැති පළමුවන අගසව්වන් වහන්සේ පවා මරුවසහයට පැමිණියාහුය. මා වැන්නන් ගැන කියනුම කවරේද?

මේ ආකාරයෙන් ප්‍රඥා මහත්ත්වය අනුව සිහිකළ යුතුය.

පසේබුදුවරයන් අනුව කෙසේද යත්:

යම් කෙනෙක් තමන්ගේ ඥාන වීර්ය බලයෙන් සියලු කෙලෙස් සතුරන් නසා පසේබුදු බවට පැමිණියාහුද, කඟවෙහෙණුන් හා සමාන හුදෙකලා පැවතුම් ඇති ස්වයම්භූඥානයෙන් චතුස්සත්‍යය අවබෝධ කළාවූ ඔවුහුද මරණයෙන් නොමිදුණාහ, මම් කෙසේ මිදෙම්ද?

තං තං නිමිත්තමාගම්ම වීමංසන්තා මහෙසයො
සයම්භුඤාණතෙජෙන යෙ පත්තා ආසවක්ඛයං
එකචරියනිවාසෙන ඛග්ගසිඞ්ගසමූපමා
තෙ පි නාතිගතා මච්චුං මාදිසෙසු කථාව කා.

යම් මහර්ෂී කෙණෙක් තුමූ ඒ ඒ නිමිත්තට පැමිණ ස්වයම්භූඥාන තේජසින් ආශ්‍රවක්ෂය සංඛ්‍යාතවූ නිවණට පැමිණියාහුද ඒකචාරීවාසය හේතුකොටගෙන කඟවෙහෙණුන් හා සමානවූ ඒ පසේබුදුවරයෝද මරණය නො-ඉක්මවූහ, මා වැන්නවුන් ගැන කියනුම කවරේද?

මේ ආකාරයෙන් පසේබුදුවරයන් අනුව සිහිකළ යුතුය.

සම්‍යක් සම්බුද්ධයන් අනුව කෙසේදයත්: යම් ඒ භාග්‍යවත් කෙනෙක් තුමූ අනුව්‍යඤ්ජන (සිරුරෙහි මහුල් ලකුණු) අසූවෙකින් යුක්තවූ දෙතිස් මහාපුරුෂලක්ෂණයෙකින් විචිත්‍රවූ රූපකාය සම්පත්තියක් සහිතවූ සර්වාකාරයෙන් පිරිසුදුවූ ශීලස්කන්ධාදී ගුණරත්නයෙන් සමෘද්ධ ධර්මකාය සම්පත්තියක් ඇති, යශෝමහත්වය, පුණ්‍යමහත්වය, ථාමමහත්වය, ඍද්ධිමහත්වය, ප්‍රඥමහත්වය යන මෙයින් පාරප්‍රාප්තවූ, අසමවූ, අසමසමවූ, අප්‍රතිපුද්ගලවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූහුද, ඔහු තුමූද සිහිල්දිය වැසි වැටීමෙන් මහ ගිනිකඳක් නිවී යන සෙයින් මරණ නමැති මහවැසි වැටීමෙන් ස්ථානානුරූපව නිවී ගියාහුය.

එවං මහානුභාවස්ස යං නාමෙතං මහෙසිනො
න භයෙන න ලජ්ජාය මරණං වසමාගතං

නිල්ලජ්ජං වීතසාරජ්ජං සබ්බසත්තාභිමද්දනං
තයිදං මාදිසං සත්තං කථං නාභිභවිස්සති

මෙවන් මහානුභාව ඇති මහාමුනිවරයන් වහන්සේහට පවා ලජ්ජාවක් භයක් නැතිව මේ මරණය තමා වසහයට ගෙන ආයේය.

ලජ්ජාවක් නැති බියක් සැකක් නැති සියලු සත්වයන් මැඩලන ඒ මරණය තෙමේ මා වැනි සත්වයකු කෙසේ නම් නොමඩින්නේද?

මේ ආකාරයෙන් සම්‍යක් සම්බුද්ධයන් අනුව සිහිකළ යුතුය. මෙසේ යශෝමහත්වාදියෙන් යුක්තවූ අන්‍යයන් හා සමඟ තමාටද මරණය පොදු ධර්මතාවක් බව නිගමනය කොට, ඒ සුවිශේෂ සත්වයන්හට මෙන්ම තමාහටද මරණය වන්නේයයි මෙනෙහි කරන්නහුට උපචාරයට පත් කමටහන් වේ. මේ ආකාරයෙන් උපසංහරණ වශයෙන් මරණය ගැන සිහිකළ යුතුය.

**කායබහුසාධාරණතො** යනු, මේ කය බොහෝ දෙනාට පොදු වේ, පළමු කොටම අසූ කුලයෙක පණුවන්හට පොදුය, එහි සිවිය ඇසුරු කොට වසන පණුවෝ සිවිය කති, සම ඇසුරු කොට වසන පණුවෝ සම කති, මස් ඇසුරු කොට වෙසෙන පණුවෝ මස් කති, නහර ඇසුරු කොට වසන්නාහු නහර කති, ඇට ඇසුරු කොට වසන්නාහු ඇට කති, ඇටමිදුලු ඇසුරු කොට වසන්නාහු ඇටමිදුලු කති, එම

ශරීරය තුළම උපදිති, එහිම ජරාවට පත් වෙති, එහිම නැසෙති, මල මූ පහ කෙරෙති, මේ ශරීරයම ඔවුනට තිඹිරිගෙයද, ගිලන්හලද සොහොන්බිමද වැසිකිළියද, කෙසිකිළියද වන්නේය, මේ ශරීරය ඒ පණුවන් කිපීමෙන්ද මරණයට පත් වන්නේමය, අසූකුල පණුවන්හට මෙන්ම මේ ශරීරය නොයෙක් සිය ගණන් අභ්‍යන්තර රෝගයටද, මරණයට හේතුවන බාහිරවූ සප්ගෝනුසු ආදීනටද පොදු වේ. යම්සේ වනාහි සිවුමංසලෙක්හි පිහිටුවනලද ලක්‍ෂ්‍යයක් මත සියලු දෙසින් ආ ඊතල කඩු හෙල්ල ගල් ආදිය වැටේද, එසේම ශරීරය මත සියලු උවදුරු වැටෙයි, එම උවදුරුවලට ගොදුරුවීමෙන්ද මේ ශරීරය මරණයට පත් වන්නේමය. එහෙයින් වදළහ භාග්‍යවතුන් වහන්සේ: "මහණෙනි, මේ ශාසනයෙහි භික්‍ෂු තෙමේ දහවල ඉකුත්වූ කල්හි රාත්‍රිය එළඹි කල්හි, මෙසේ සිහි කරයි: මාගේ මරණයට හේතු බොහෝය, සර්පයකු හෝ මා දෂ්ට කළ හැකිය, ගෝනුස්සකු හෝ මා දෂ්ට කළ හැකිය, පත්තෑයකු හෝ මා දෂ්ට කළ හැකිය. ඒ හේතුවෙන් මාගේ මරණය වන්නේය, එය මට අන්තරාය පිණිස වන්නේය, පය පැකිල හෝ වැටෙනු හැකිය, මවිසින් අනුභව කරනලද අහර හෝ නපුරට සිටිය හැකිය. මාගේ පිත හෝ කිපිය හැකිය. සෙම හෝ කිපිය හැකිය, මාගේ ශස්ත්‍රක වාතයන් හෝ කිපිය හැකිය, ඒ හේතුවෙන් මාගේ මරණය වන්නේය, එය මට අන්තරාය පිණිස වන්නේය.'(1) මෙසේ 'කායබහුසාධාරණ' වශයෙන් මරණය ගැන සිහිකළ යුතුය.

**ආයුදුබ්බලතො** යනු, මේ ආයුෂ වනාහි අබලය, දුබලය, ඒ එසේමැයි: සත්වයන්ගේ ජීවිතය ආශ්වාස ප්‍රශ්වාසයන් හා සමඟ බැඳී පවත්නේය. ඊර්යාපථයන් හා සමඟ බැඳී පවත්නේය, ශීත උෂ්ණ යන දෙක හා සමග බැඳී පවත්නේය, මහාභූතයන් හා සමඟ බැඳී පවත්නේය, ආහාරය හා සමඟ බැඳී පවත්නේය, එහෙයින් මේ ජීවිතය ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ සමපැවතුම් ලබමින්ම පවත්නේය, පිටතට නික්මුණ නාසිකාවාතය ඇතුළට නොපිවිසෙනවිට හෝ ඇතුළට පිවිසුණ වාතය පිටතට නොනික්මෙනවිට හෝ මළේ නම් වේ. මේ ජීවිතය සතර ඉරියවු සමව පවත්නාබව ලබමින්ම පවත්නේය, එක් එක් ඉරියව්වෙක පැවැත්ම වැඩිවීමෙන් ආයුසංස්කාරය සිඳී යන්නේය, මේ ජීවිතය ශීත උෂ්ණයන්ගේ සමපැවතුම් ලබමින්ම පවත්නේය, අධික උෂ්ණයෙන් හෝ අධික ශීතයෙන් හෝ මඩනාලද්දහුගේ ජීවිතය විපතට පත්වේ. මහාභූතයන්ගේද සම පැවතුම් ලබමින්ම ජීවිතය පවත්නේය. පඨවිධාතුව හෝ ආපො ධාතු

---

(1) අං. නි. ඡක්ක නිපාත - A iii 306

ආදිය හෝ එකක් එකක් කිපීමෙන් බලසම්පන්න පුද්ගලයකු පවා හාත්පසින් දරදඬුව ගිය සිරුරු ඇත්තෙක්ව හෝ අතීසාරාදී රෝග වැළඳීමෙන් කිලිටිව කුණුවී ගිය සිරුරු ඇත්තෙක්ව හෝ අධික දහයෙන් පෙළෙන්නෙක්ව හෝ සිඳිනු ලබන සන්දිපත් ඇත්තෙක්ව හෝ ජීවිතක්‍ෂයට පත් වන්නේය. කබලිංකාරාහාරයද සුදුසු කල්හි ලබන්නහුගේම ජීවිතය පවත්නේය, නොලබන්නහුගේ ජීවිතය ක්‍ෂයවී යන්නේයයි මෙසේ ආයුදුබ්බලතා වශයෙන් මරණය ගැන සිහිකළ යුතුය.

**අනිමිත්තතො** යනු. නියමයක් කළ නොහැකි හේතුවෙනි, පිරිසිඳීමක් නැති හේතුවෙතියි යන අර්ථයි.

සත්ත්වයන්ගේ වනාහි,

> ජීවිතං ව්‍යාධි කාලො ච දෙහනික්ඛෙපනං ගති
> පඤ්චෙතෙ ජීවලොකස්මිං අනිමිත්තා න ඤායරෙ.

> ජීවිතයද, ව්‍යාධියද, ආයුකාලයද, දේහය බහවන ස්ථානයද, මරණින් මතු උපදින ස්ථානයද යන මේ කරුණු පස සත්ත්වලෝකයෙහි නිමිති රහිතව සිදුවන හෙයින් දත නොහැකි වේ.

එහි, ජීවිතය: මෙතෙක් කල්ම ජීවත්විය යුතුය, මෙයින් මතු ජීවත්විය නොහැකිය'යි මෙසේ නියමයක් කළ නොහැකි හෙයින් අනිමිත්ත නම් වේ, සත්ත්වයෝ කලල අවස්ථාවෙහිද නැසෙති, අබ්බුද-ඝන-පේශී අවස්ථාවලදීද, එක් මස්, දෙමස් තෙමස්, සිවුමස්, පස්මස්, දසමස් කාලයෙහිදී ද, මව්කුසින් බිහිවූ කල්හිද, එතැන් පටන් සියක් වසක් ඇතුළතදී හෝ ඉකුත්වූ කල්හිද නැසෙත්මය. ව්‍යාධියද, සත්ත්වයෝ මෙනම් ව්‍යාධියෙන්ම නැසෙති, අනෙකෙකින් නොනැසෙති'යි මෙසේ නියමයක් කළ නොහැකි හෙයින්ද අනිමිත්ත නම් වේ, සත්ත්වයෝ ඇස් රෝගයෙන්ද කර්ණ රෝගාදිය අතුරෙන් කිසියම් රෝගයෙකින්ද නසිති. කාලයද: මෙනම් කාලයෙහිම නැසිය යුතුය. අන් කාලයෙක නොනැසිය යුතුය'යි නියමයක් කළ නොහැකි හෙයින් අනිමිත්ත නම් වේ, සත්ත්වයෝ පෙරවරුවෙහිද, මද්දහන ආදී අන් කිසියම් කාලයෙක්හිද නසිති. දේහනික්ෂේපනයද, මැරෙනවුන්ගේ දේහයන් මෙහිම බැහැවිය යුතුය, අන් තැනෙක නොබැහැවිය යුතුයයි නියමයක් කළ නොහැකි හෙයින්ද අනිමිත්ත නම් වේ. ගමතුළ උපන්නවුන්ගේ ආත්මභාවය ගමෙන් පිටතද, ගමෙන් පිටත උපන්නවුන්ගේ ආත්මභාවය ගම ඇතුළතද වැටෙයි.

එසේම ගොඩ උපන්නවුන්ගේ දේහය ජලයෙහිද, ජලයෙහි උපන්නවුන්ගේ දේහය ගොඩද වැටෙතැ'යි මෙසේ නොයෙක් ලෙසින් විස්තර කළ හැකිය.

ගතියද: මෙතැනින් චුතවී මෙතැන ඉපැදිය යුතුයයි නියමයක් නොකළහැකි හෙයින්ද අනිමිත්ත නම් වේ. දෙව්ලොවින් ඉකුත්වූවාහු මිනිස් ලොවද, මිනිස්ලොවින් ඉකුත් වූවාහු දෙව්ලොව ආදී කිසියම් තැනෙකද උපදිති'යි මෙසේ යන්ත්‍රයෙක යොදන ලද ගොනකු සෙයින් (නරකාදී) ගති පසක් ඇති ලෝකයෙහි කැරකෙති'යි මෙසේ අනිමිත්ත වශයෙන් මරණය ගැන සිහිකළ යුතුය.

**අද්ධානපරිච්ඡෙදතො** යනු, මනුෂ්‍යයන්ගේ ජීවිතයට වර්තමානයෙහි කාලපරිච්ඡේදය සීමිතය. යමකු දීර්ඝ කාලයක් ජීවත් වෙතොත් හෝ සියක් වසක් හෝ මඳක් අඩුවෙන් හෝ වැඩියෙන් ජීවත් වෙයි. එහෙයින් වදාළහ: "මහණෙනි, මනුෂ්‍යයන්ගේ ආයුෂ අල්ප වේ, පරලෝ ගමන යායුතු වේ. එහෙයින් කුසල් රැස්කළ යුතුය. බඹසර රැකිය යුතුය, උපන්නහුට නොමැරීමෙක් නැත, මහණෙනි, යමෙක් බොහෝ කල් ජීවත් වන්නේ නම් හේ සියක් වසක් හෝ මඳක් අඩු හෝ වැඩි කලෙක් ජීවත්වේ."

අප්පමායු මනුස්සානං හීළෙය්‍ය නං සුපොරිසො
චරෙය්‍යාදිත්තසීසොව නත්‍ථි මච්චුස්ස නාගමො.(1)

මනුෂ්‍යයන්ගේ ආයුෂය මඳ වේ, සත්පුරුෂ තෙමේ ඒ ආයුෂය නොතකන්නේය. හිස ගිනිගත්තකු මෙන් හැසිරෙන්නේය, මරණයට නොපැමිණ සිටීමෙක් නැත.

"මහණෙනි, යටගිය දවස අරක නම් ශාස්තෘවරයෙක් වීය"යි(2) අනෙකුදු සූත්‍රයක් වදාළහ. උපමා සතෙකින් අලංකෘතවූ සියලු අරක සූත්‍රය මෙහිලා විස්තර කටයුතුය. අනෙකුදු සූත්‍රයක් වදාළහ, "මහණෙනි, යම් මේ මහණෙක් තෙමේ 'මම් තවත් එක් දිවා රාත්‍රියක් ජීවත්වන්නෙම් නම් යෙහෙකි, එම දිවාරාත්‍රිය තුළ භාග්‍යවතුන් වහන්සේගේ අවවාදය මෙනෙහි කරන්නට ලැබේ නම් මවිසින් බොහෝ මහණදම් කරන ලද්දේ වන්නේය'යි මෙසේ මරණසතිය වඩනුයේද, තවද මහණෙනි, යම් මේ මහණෙක් තෙමේ, 'මම් තවත් එක් දහවලක් ජීවත් වන්නෙම් නම් යෙහෙකි, එම දහවල තුළ භාග්‍යවතුන් වහන්සේගේ අවවාදය මෙනෙහි

(1) සං. නි. මාර සංයුත්ත - S i 108
(2) අං. නි. සත්තක නිපාත - A iv 136ff.

කරන්නට ලැබේ නම් මවිසින් බොහෝ මහණදම් කරන ලද්දේ වන්නේය'යි මෙසේ මරණසතිය වඩනුයේද, තවද මහණෙනි, යම් මේ මහණෙක් තෙමේ 'මම් තවත් එක් පිණ්ඩපාතයක් වළඳන තෙක් ජීවත් වන්නෙම් නම් යෙහෙකි, එම කාලය තුළ භාග්‍යවතුන් වහන්සේගේ අවවාදය මෙතෙහි කරන්නට ලැබේ නම් මවිසින් මහණදම් පුරන ලද්දේ වන්නේය'යි මෙසේ මරණසතිය වඩනුයේද, තවද මහණෙනි, යම් මේ මහණෙක් තෙමේ 'මම් තවත් අහර පිඩු සතරක් පහක් සපා ගිලින තුරු ජීවත් වන්නෙම් නම් යෙහෙකි, එම කාලය තුළ භාග්‍යවතුන් වහන්සේගේ අවවාදය මෙතෙහි කරන්නට ලැබේ නම් මවිසින් බොහෝ මහණදම් කරන ලද්දේ වන්නේය'යි මෙසේ මරණසතිය වඩනුයේද, මහණෙනි, මෙකී මහණහු ප්‍රමාදව වෙසෙති'යි, ආශ්‍රවයන් ක්‍ෂය කරනු පිණිස මරණසතිය ලිහිල්ව වඩති'යි කියනු ලබති. මහණෙනි, යම් මේ මහණෙක් තෙමේ, 'මම් තවත් එක් අහර පිඩක් සපා ගිලින තුරු ජීවත් වන්නෙම් නම් යෙහෙකි, එම කාලයතුළ භාග්‍යවතුන් වහන්සේගේ අවවාදය සිහි කරන්නෙම් නම් මවිසින් බොහෝ මහණදම් කරන ලද්දේ වන්නේය'යි මෙසේ මරණසතිය වඩනුයේද, තවද මහණෙනි, යම් මේ මහණෙක් තෙමේ, 'මම් තවත් එක් වරක් ආශ්වාස කොට ප්‍රශ්වාස කරන තෙක්, නැතහොත් ප්‍රශ්වාස කොට ආශ්වාස කරන තෙක් ජීවත් වන්නෙම් නම් මැනවි, එම කාලය තුළ භාග්‍යවතුන් වහන්සේගේ අවවාදය මෙනෙහි කරන්නට ලැබේ නම් මවිසින් බොහෝ මහණදම් කරන ලද්දේ වන්නේය'යි මෙසේ මරණසතිය වඩනුයේද, මහණෙනි මෙකී මහණහු අප්‍රමාදව වෙසෙතියි, ආශ්‍රවයන් ක්‍ෂය කිරීම පිණිස මරණසතිය දැඩිව වඩති'යි කියනු ලැබෙති.[1] මෙසේ අහර පිඩු හතරක් පහක් වළඳන තෙක් පමණ හෝ විශ්වාස කළ නොහැකි තරම් ජීවිත කාලය කෙටිවේය'යි අද්ධානපරිච්ඡේද වශයෙන් මරණය සිහිකළ යුතුය.

**ඛණපරිත්තතො** යනු- පරමාර්ත්‍ථ වශයෙන් ගතහොත් සත්‍වයන්ගේ ජීවිතක්‍ෂණය ඉතා කෙටිවේ, එක් චිත්තක්‍ෂණයක් පවත්නා කාලය වේ. යම්සේ වනාහි රථචක්‍රය කැරකෙනවිට නිම්වලල්ලෙහි එක්ම පෙදෙසකින් කැරකෙන්නේද, නිශ්චලව සිටිනවිටද එක්ම නිම් පෙදෙසකින් සිටින්නේද, එසේම සත්‍වයන්ගේ ජීවිතය එක් චිත්තක්‍ෂණමාත්‍රයෙකි. එම චිත්තක්‍ෂණය ඉකුත්වූ පමණින් සත්‍වයා මළේයයි ඉකුත් වූයේය'යි කියනු ලැබේ. යම්සේ කියන ලද්දේද:- "චිත්තක්‍ෂණය ඉකුත්වූවිට ජීවත්වූයේ වේ, (දැන්) ජීවත් වන්නේ හෝ (මතු) ජීවත් වන්නේ නොවේ. චිත්තක්‍ෂණය නොඑනතෙක් ජීවත්වූයේ හෝ (දැන්) ජීවත්වන්නේ නොවේ, (මතු)

---
(1) අං. නි. ඡක්ක නිපාත - A iii 305f.

ජීවත්වන්නේ වේ. චිත්තක්ෂණය පවත්නාවිට ජීවත්වූයේ නොවේ, (දැන්) ජීවත්වන්නේ වේ, (මතු) ජීවත්වන්නේද නොවේ.

ජීවිතං අත්තභාවො ච සුඛදුක්ඛා ච කෙවලා
එකචිත්තසමායුත්තා ලහුසො වත්තතෙ ඛණො.

යෙ නිරුද්ධා මරන්තස්ස තිට්ඨමානස්ස වා ඉධ
සබ්බෙපි සදිසා ඛන්ධා ගතා අප්පටිසන්ධියා.

අනිබ්බත්තෙන න ජාතො-පච්චුප්පන්නෙන ජීවති.
චිත්තභඞ්ගා මතො ලොකො-පඤ්ඤත්ති පරමත්ථියා[1]

ජීවිතේන්ද්‍රියයද, ආත්මභාවයද, සියලු සුඛදුඃඛ වෙදනාද එකක් එකක් එක් එක් චිත්තක්ෂණයෙකින් යුක්ත වේ, එම චිත්තක්ෂණයද කෙටි කාලයක් පවත්නේ වේ.

මිය යන්නහුගේ හෝ වේවා, ජීවත්වන්නහුගේ හෝ වේවා, නිරුද්ධවූ සියලු ස්කන්ධයෝ මෙහිලා එක සමාන වෙති, ප්‍රතිසන්ධානයක් (ගැලපීමක්) නැතිවම ඉකුත්ව ගියාහු වෙති.

(පරමාර්ත්ථ වශයෙන් ගතහොත්) නො-උපන් සිතින් නො-උපන්නේ නම් වේ, පවත්නා සිතින් ජීවත් වන්නේ නම් වේ, සිත බිඳී ඉකුත්වී යාමෙන් ලෝකය (සත්වයා) මළේ නම් වේ, මේ පරමාර්ත්ථ ප්‍රඥප්තියයි.

මෙසේ ඛණපරිත්ත වශයෙන් මරණය ගැන මෙනෙහිකළ යුතුය.

මෙසේ මේ අට ආකාරයන් අතුරෙන් එක් එක් ආකාරයක් සිහි කරන්නහුට නැවත නැවත මෙනෙහි කිරීම් වශයෙන් සිත ආසේවනය (හෙවත් එකමුතුබව) ලබයි, මරණය අරමුණුකොට ඇති සිහිය මොනවට පිහිටයි, නීවරණයෝ යටපත් වෙති, ධ්‍යානාංගයෝ පහළ වෙති. ස්වභාවධර්ම හෙයින්ද සංවේග දනවන හෙයින්ද අරමුණ අර්පණාවට නොපැමිණ උපචාරයටම පැමිණි ධ්‍යානය වේ. ලෝකෝත්තර ධ්‍යානයද, දෙවන සිවුවන අරූපධ්‍යාන දෙකද ස්වභාවධර්ම වූයේ නමුදු භාවනා විශේෂයෙන් අර්පණාවට පැමිණේ. ලෝකෝත්තර ධ්‍යානය විශුද්ධි භාවනා පිළිබඳ අනුක්‍රම වශයෙන් අර්පණාවට පැමිණේ. අරූපධ්‍යානය ආරම්මණ-අතික්‍රම (අරමුණු ඉක්මවීම්) භාවනා වශයෙන් අර්පණාවට පැමිණේ.

(1) මහානිද්දෙස - Nd1 42

එහිදී අර්පණාවට නොපැමිණි ප්‍රථම හෝ තෘතීය ධ්‍යානයෙහිම අරමුණු ඉක්මවීම පමණක් සිදුවේ. මෙහිදී වනාහි ඒ දෙකම සිදු නොවේ. එහෙයින් උපචාරයටම පැමිණි ධ්‍යානය වේ. ඒ මේ ධ්‍යානය ස්මෘති බලයෙන් උපන් හෙයින් මරණසති යනුවෙන්ම ව්‍යවහාරයට යෙයි. මේ මරණානුස්මෘතියෙහි යෙදුණු භික්ෂු තෙමේ නිරතුරුව අප්‍රමාද වූයේ වේ, සියලු භවවිෂයෙහි අනභිරත සංඥව (නො-ඇලීම පිළිබඳ හැඟීම) ලබයි, ජීවිතාශාව හරියි, පාපයට නිග්‍රහ කරනුයේ, බොහෝ රැස් කිරීම් රහිත වූයේ, පිරිකර විෂයෙහි පහවූ මසුරුමල ඇත්තේ වේ. ඔහුට අනිත්‍ය සංඥවද පුරුදුබවට යෙයි, ඒ අනුසාරයෙන්ම දුඃඛ සංඥවද අනාත්ම සංඥවද වැටහේ. යම්සේ මරණානුස්මෘතිය නොවැඩූ සත්වයෝ මරණාසන්න වූවිට ව්‍යාලමෘග, යක්ෂ, සර්ප, චෝර, වධක ආදීන් විසින් මඩනා ලද්දවුන් මෙන් දැඩිලෙස තැතිගැනීමට, සිහිමුළාවට පත් වෙත්ද, එසේ (තැතිගැනීමට සිහිමුළාවට) නොපැමිණ, නොබියව, නොමුළාව, කලුරිය කරයි, ඉදින් මේ ජන්මයෙහිම නිවන් අවබොධ නොකළහොත් මරණින් මතු සුගතියෙහි උපත ලබයි.

තස්මා හවෙ අප්පමාදං කයිරාථ සුමෙධසො
එවං මහානුභාවාය මරණානුස්සතියා සද.

එහෙයින් යහපත් ප්‍රඥ ඇත්තේ මෙවන් මහ අනුසස් ඇති මරණානුස්සති භාවනාවෙහි සැම කල්හි අප්‍රමාද බව ඒකාන්තයෙන් ඇති කරගන්නේය.

**මේ මරණානුස්සති භාවනාවෙහි විස්තර කථායි.**

## කායගතාසති භාවනාව

ඉක්බිති බුද්ධෝත්පාද කාලයකදී හැර නොපැවතිවිරූ, සියලු තීර්ථකයනට අවිෂයවූ, ඒ ඒ සූත්‍රාන්තයන්හි, "මහණෙනි, එක් ධර්මයක් වඩනාලද්දේ, බොහෝසෙයින් පුරුදු කරනලද්දේ මහත්වූ සංවේගය පිණිස පවතී, මහත්වූ යහපත පිණිස පවතී, මහත්වූ ක්ෂේමය පිණිස පවතී, මහත්වූ සිහි නුවණ පිණිස පවතී, විදර්ශනාඥනදර්ශන ප්‍රතිලාභය පිණිස පවතී, ඉහාත්මභාවයෙහි සුඛවිහරණ පිණිස පවතී, ත්‍රිවිද්‍යා විමුක්ති ඵලයන් සාක්ෂාත් කිරීම පිණිස පවතී, කවර නම් ධර්මයක්ද? කායගතාසතිභාවනාවයි"[1] 'මහණෙනි, යම් කෙනෙක් තුමූ කායගතාසතිධ්‍යානය (සමවැදීම් වශයෙන්) වළඳත්ද ඔහු අමෘතය වළඳත්,

(1) අං. නි. එකක නිපාත- A i 43

යම් කෙනෙක් තුමූ කායගතාසති ධ්‍යානය නොවළඳත්ද, ඔහු අමෘතය නොවළඳත්, මහණෙනි, යම් කෙනකු විසින් කායගතාසති ධ්‍යානය වළඳනා ලද්දේද, ඔවුන් විසින් අමෘතය වළඳනා ලද්දේය, යම් කෙනකු විසින් කායගතාසතිධ්‍යානය නොවළඳනා ලද්දේද, ඔවුන් විසින් අමෘතය නොවළඳනා ලද්දේය, යම් කෙනකු විසින් කායගතාසතිය පිරිහෙලන ලද්දේ නම්, ඔවුන් විසින් අමෘතය පිරිහෙලන ලද්දේය. යම් කෙනකු විසින් නොපිරිහෙලන ලද්දේද, ඔවුන් විසින් අමෘතය නොපිරිහෙලන ලද්දේය, යම් කෙනකු විසින් කායගතාසතිය වරදනා ලද්දේද, ඔවුන් විසින් අමෘතය වරදනා ලද්දේය, යම් කෙනකු විසින් කායගතාසතිය නිපදවන ලද්දේද, ඔවුන් විසින් අමෘතය නිපදවන ලද්දේය'යි[1] මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ප්‍රශංසා කොට, තවද "මහණෙනි, කායගතාසති භාවනාව කෙසේ වඩනා ලද්දේ, කෙසේ බහුල ලෙස ප්‍රගුණ කරන ලද්දේ මහත්ඵලවේද? මහත් අනුසස් ඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ අරණ්‍යයට ගියේ හෝ වේද"යි[2] යන ආදී නයින් ආනාපාන කාණ්ඩය, ඉරියාපථ කාණ්ඩය, චතුසම්පජඤ්ඤ කාණ්ඩය, පටික්කූලමනසිකාර කාණ්ඩය, ධාතුමනසිකාර කාණ්ඩය, නවසීවථික කාණ්ඩයන්ද'යි යන මේ තුදුස් කාණ්ඩයන් වශයෙන් යම් ඒ කායගතාසති කර්මස්ථානයක් දක්වන ලද්දේද, ඒ කායගතාසති කර්මස්ථානය පිළිබඳ නිර්දේශය අනුපිළිවෙළින් එළඹියේය.

එහි, යම් හෙයකින් ඉරියාපථපබ්බය, චතුසම්පජඤ්ඤපබ්බය ධාතුමනසිකාරපබ්බය, යන මේ තුන විදර්ශනා වශයෙන් කියනලදි. සීවථිකපබ්බ නවය විදර්ශනා ඥානයෙහිදීම ආදීනව දැකීම් වශයෙන් කියනලදි. මෙහි උද්ධුමාතකඅසුභ ආදියෙහිදී යම් සමාධි භාවනාවක් සිද්ධ වේනම්, එය අසුභ නිද්දේසයෙහි ප්‍රකාශකරන ලද්දේමය. ආනාපානපබ්බය හා පටික්කූලමනසිකාරපබ්බයද යන මේ දෙක මෙහිම සමාධි වශයෙන් කියනලදි. ඒ දෙකින් ආනාපානපබ්බය ආනාපාන සති වශයෙන් වෙනම කර්මස්ථානයක්ද වේ.

යම් මේ කර්මස්ථානයක් වනාහි, "මහණෙනි, යලිදු භික්ෂු තෙමේ පාදතලයෙන් ඉහළ කෙස් මුදුනෙන් පහළ සමින් සීමාවූ නොයෙක් ආකාර ඇති අශුචියෙන් පිරුණු මේ ශරීරයම පිළිබඳව, අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා -පෙ-මුත්තං"[3] යනුවෙන් මෙසේ හිස්මොල ඇටමිදුලු

---

(1) එම - A i 45
(2) ම. නි. ආනාපානසති සූ - M iii 89
(3) ම. නි. ආනාපානසති සූ - M iii 90

හා සමග එක්කොට ගෙන පිළිකුල මෙනෙහිකිරීම් වශයෙන් දේශනා කරනලද ද්වත්තිංසාකාර කර්මස්ථානය මෙහි **කායගතාසති** යනුවෙන් අභිප්‍රේතයි.

මේ එම කර්මස්ථානය පිළිබඳ පාළි වර්ණනාව පෙරටුකොට ඇති භාවනා නිර්දේශයයි: **ඉමමෙව කායං** (මේ සිරුරම) යනු, සතර මහාභූතයන්ගෙන් නිමවූ කුණු කයයි, **උද්ධං පාදතලා** යනු, පාද තලයෙන් ඉහළ, **අධො කෙසමත්ථකා** යනු, කෙස් අගින් පහළ, **තචපරියන්තං** යනු, සමින් සීමාවූ, **පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති** යනු නානාප්‍රකාර අශුචි කොටස්වලින් හරිතවූ මේ ශරීරය දකියි. කෙසේද? "අත්ථි ඉමස්මිං කායෙ -පෙ-මුත්තං" යන ආදී වශයෙනි. එහි අත්ථි යනු විද්‍යමාන වේ. **ඉමස්මිං** යනු, පාදතලයෙන් ඉහළ කෙශාන්තයෙන් පහළ සම සීමාකොට ඇති අශුචියෙන් පිරි යම් මේ කයක් වේද, ඒ කයෙහිය, සිරුරෙහිය. සිරුර වනාහි අශුචි රාශියක් වන හෙයින්ද, පිළිකුල් දනවන කෙස් ආදියටද, චක්ඛුරෝගාදී සියගණන් රෝගවලටද නිධානවූ හෙයින් **කාය** යයි කියනු ලැබේ. **කෙසා, ලොමා** යනු, මේ කෙස් ආදී දෙතිස් කොටස්ය. එහි අත්ථි ඉමස්මිං කායෙ කෙසා, මේ කය තුළ කෙස් ඇත, ලොම් ඇතැයි මෙසේ සම්බන්ධය දතයුතුයි. පාද තලයෙහි පටන් උඩින්ද, කෙසග පටන් යටින්ද, සමෙහි පටන් ඇතුළතද, බඹයක් පමණවූ මේ සිරුරෙහි සියලු අයුරින් සොයත්මුත් කිසිවෙක් මුතු හෝ මැණික් හෝ වෙරළුමිණි ආදී කිසිවක් හෝ, අගිල්, කොකුම්, කපුරු චන්දුණු ආදීවූ ස්වල්පමාත්‍ර පවිත්‍රතාවක් හෝ නොදකී. වැලිදු අතිශය දුර්ගන්ධවූ පිළිකුල් දනවනසුලු නිශ්‍රීක දර්ශන ඇති, කෙස් ලොම් ආදී ප්‍රභේද ඇති නානාප්‍රකාර කුණප කොටසක්ම දකියි. එහෙයින් "අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා.-පෙ-මුත්තං" යනුවෙන් මේ පද සම්බන්ධ වශයෙන් මෙහි වර්ණනායි.

මේ කර්මස්ථානය වඩා, රහත්බවට පැමිණෙනු කැමැති ආධුනික කුලපුත්‍රයා විසින් යට කියනලද ප්‍රකාර ඇති කල්‍යාණමිත්‍රයකු වෙත එළඹ මේ කමටහන් ලබාගත යුතුය. ඒ කල්‍යාණමිත්‍රයා විසින්ද ඔහුට කමටහන් කියනවිට උග්ගහකොසල්ලය (ඉගෙනීමේ පහසු ක්‍රමය) සත් ආකාරයෙකින්ද, මනසිකාරකොසල්ලය (මෙනෙහි කිරීමේ පහසු ක්‍රමය) දශ ආකාරයෙකින්ද කිවයුතුය. එහි වචන වශයෙන්ද (වචසා), මනස් වශයෙන්ද (මනසා), වර්ණ වශයෙන්ද (වණ්ණතො) සංස්ථාන වශයෙන්ද (සණ්ඨානතො) දිශාවශයෙන්ද (දිසතො), අවකාශ වශයෙන්ද (ඔකාසතො), පරිච්ඡේද වශයෙන්දයි (පරිච්ඡෙදතො) මෙසේ උග්ගහකොසලලය කිවයුතුය.

මේ පිළිකුල් මෙනෙහි කිරීමේ කමටහන් විෂයෙහි යමෙක් ත්‍රිපිටකධර වේද, ඔහු විසින් වුවද මෙනෙහි කිරීම් කාලයේදී පළමුකොට වචනයෙන් සජ්ඣායන කටයුතුය. ඇතැමකුට සජ්ඣායන කරද්දීම කමටහන් වැටහේ. මලයරට වැසි මහාදේව තෙරුන් සමීපයෙහි කමටහන් උගත් තෙරුන් දෙදෙනා වහන්සේට මෙති. ඒ මහාදේව තෙරණුවෝ වනාහි එම තෙරුන් දෙදෙනා විසින් කමටහන් අයදිනලද කල්හි සාරමසක් මෙය සජ්ඣායන කරහුයයි ද්වත්තිංසාකාරයෙහි පෙළ දුන්හ. එතෙකුදු වුවත් ඒ දෙදෙනා වහන්සේ විසින් දෙතුන් නිකායක් ප්‍රගුණ කරන ලද්දේය. ගෞරවාදර පෙරටුකොට ගන්නාලද හෙයින් වනාහි සාරමසක් ද්වත්තිංසාකාරය සජ්ඣායන කරමින් සිටියදීම සෝවාන් වූහ. එහෙයින් කමටහන් කියන ආචාර්යවරයා විසින් අන්තෙවාසිකයාහට 'පළමු කොට වචනයෙන් සජ්ඣායන කරන්නැ'යි කිවයුතුය. සජ්ඣායන කරන්නහු විසින්ද තචපඤ්චකාදී වශයෙන් පිරිසිඳ අනුලොම ප්‍රතිලොම වශයෙන් සජ්ඣායන කළයුතුය. 'කෙසා ලොමා නඛා දන්තා තචො'යි කියා නැවත ප්‍රතිලොම වශයෙන් 'තචො දන්තා නඛා ලොමා කෙසා'යි කිව යුතුය. ඉතික්බිති වක්කපංචකයෙහි 'මංසං නහරු අට්ඨි අට්ඨිමිඤ්ජං වක්කං' යයි කියා ප්‍රතිලොම වශයෙන් 'වක්කං අට්ඨිමිඤ්ජං අට්ඨි නහාරු මංසං, තචො දන්තා නඛා ලොමා කෙසා' යනුවෙන් කිවයුතුය. ඉක්බිති පප්ඵාස පංචකයෙහි, 'හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං'යයි කියා නැවත ප්‍රතිලොම වශයෙන් පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජං අට්ඨි නහාරු මංසං තචො දන්තා නඛා ලොමා කෙසා'යි කිව යුතුය. ඉක්බිති මත්ථලුඞ්ග පඤ්චකයෙහි, අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං'යයි කියා, නැවත ප්‍රතිලොම වශයෙන් 'මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජං අට්ඨි නහාරු මංසං තචො දන්තා නඛා ලොමා කෙසා'යි කිව යුතුය. ඉක්බිති මෙද ඡට්කයෙහි, 'පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදෙ මෙදෙ'යි කියා නැවත ප්‍රතිලොම වශයෙන් මෙදෙ සෙදෙ ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජං අට්ඨි නහාරු මංසං තචො දන්තා නඛා ලොමා කෙසා'යි කිව යුතුයි. ඉක්බිති මුත්ත ඡට්කයෙහි, 'අස්සු වසා ඛෙළො සිඞ්ඝානිකා ලසිකා මුත්තං'යයි කියා නැවතද ප්‍රතිලොම වශයෙන් 'මුත්තං ලසිකා සිඞ්ඝානිකා ඛෙළො වසා අස්සු මෙදෙ සෙදෙ ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජං

අට්ඨී නහාරූ මංසං තචො දන්තා නඛා ලොමා කෙසා'යි මෙසේ සියවර, දහස්වර, සුවහස්වර වචනයෙන් සජ්ඣායන කළ යුතුය. වචනයෙන් මෙසේ සජ්ඣායන කිරීමෙන් කමටහන් පෙළ ප්‍රගුණ වේ, සිත ඒ මේ අත නොදුවයි. දෙතිස් කොටස් ප්‍රකට වේ. එක්කොට තබනලද අත් දෙකෙහි ඇඟිලි පෙළ මෙන්ද, වැටෙක බැඳි රිටි පෙළක් මෙන්ද මොනවට වැටහේ. වචනයෙන් මෙන්ම සිතින්ද සජ්ඣායන කළ යුතුය. වාචසික සජ්ඣායනය මානසික සජ්ඣායනයට ප්‍රත්‍යය වේ, මානසික සජ්ඣායනය (අසුභ) ලක්ඛණ ප්‍රතිවෙධයට ප්‍රත්‍යය වේ.

**වණ්ණතො** යනු, කේශාදියෙහි වර්ණය නිශ්චය කළ යුතුය. **සණ්ඨානතො** යනු, ඒ කෙස් ආදියෙහිම සංස්ථානය (හැඩය) නිශ්චය කළ යුතුය. **දිසතො** යනු, මේ ශරීරයෙහි නාභියෙන් ඉහළ උපරිම දිශාවයි, පහළ හෙට්ඨිම දිසාවයි. එහෙයින් මේ මේ කොට්ඨාසය මේ මේ දිශාවට අයත්ය'යි දිශාව නිශ්චය කළ යුතුය. **ඔකාසතො** යනු, මේ මේ කොට්ඨාසය මේ මේ තන්හි පිහිටියේයයි මෙසේ ඒ ඒ කොට්ඨාසයෙහි අවකාශය (පිහිටි ස්ථානය) නිශ්චය කළ යුතුය. **පරිච්ඡේදතො** යනු, සභාගපරිච්ජේද විසභාගපරිච්ජේදයයි පරිච්ජේද දෙකෙකි. එහි මේ මේ කොටස උඩින්ද, යටින්ද, සරසින්ද, මෙතෙකින් පිරිසිඳියේයයි මෙසේ සභාගපරිච්ජේදය දතයුතුය. මේ කෙස්ය, ලොම් නොවේ, මේ ලොම්ය, කෙස් නොවේයයි මෙසේ එකිනෙක වෙන්කොට හඳුනාගැනීම් වශයෙන් විසභාගපරිච්ඡේදය දතයුතුය.

මෙසේ සත් ආකාරයෙකින් උග්ගහකොසල්ලය කියන්නහු විසින් මේ කර්මස්ථානය අසුවල් සූත්‍රයෙහි පිළිකුල් භාවනා වශයෙන්ද, අසුවල් සූත්‍රයෙහි ධාතු වශයෙන්ද කියනලදැයි දන කිවයුතුය. මේ කායගතාසති කර්මස්ථානය මහාසතිපට්ඨාන සූත්‍රයෙහි පිළිකුල් වශයෙන්ම කියනලදි. මහාහත්ථිපදෝපම සූත්‍රයෙහිද රාහුලොවාද සූත්‍රයෙහිද ධාතුවිභඞ්ගයෙහිද ධාතුවශයෙන් කියනලදි. කායගතාසති සූත්‍රයෙහි වනාහි යම් පුද්ගලයකුට කේශාදිය වර්ණවශයෙන් වැටහේනම්, ඒ පුද්ගලයා සඳහා සතර ධ්‍යානය බෙද දක්වනලදී, එහි ධාතු වශයෙන් කියනලද්දේ විදර්ශනා කර්මස්ථානයයි, පිළිකුල් වශයෙන් කියනලද්දේ සමථකර්මස්ථානයයි, මෙහි දක්වෙන සමථකර්මස්ථානයද එයම වේ.

මේ සත් ආකාරයෙන් උග්ගහකෝසල්ලය කියාදී, පිළිවෙළ වශයෙන් (අනුපුබ්බතො)ද, ඉතා යුහු නොවීම් වශයෙන් (නාතිසීඝතො)ද, ඉතා ලැයි නොවීම් වශයෙන් (නාතිසනිකතො)ද, සිත් විඩාව දුරු කිරීම් වශයෙන් (වික්ඛෙපපටිබාහනතො) ද, ලොකව්‍යවහාරය ඉක්මවීම් වශයෙන්

(පණ්ණත්තිසමතික්කමනතො)ද, පිළිවෙළ හැරදැමීම් වශයෙන් (අනුපුබ්බමුඤ්චනතො)ද, අර්පණා වශයෙන් (අප්පනාතො)ද, සූත්‍රාන්ත තුන වශයෙන් (තයො ච සුත්තන්තා) දැයි මෙසේ දශ ආකාරයෙකින් මනසිකාරකොසල්ලය කියාදිය යුතුය.

එහි, **අනුපුබ්බතො** යනු මේ කර්මස්ථානය සජ්ඣායනයෙහි පටන් අනුපිළිවෙළින් මෙනෙහි කළ යුතුය, එකක් හැර එකක් සිහි කරමින් නොකළ යුතුය. යම්සේ වනාහි අදක්‍ෂ පුරුෂයෙක් තෙමේ පෙති දෙතිසක් ඇති ඉණිමහෙක එකක් හැර එකක් පෙති නඟිනුයේ වෙහෙසට පත්ව ඇද වැටෙනුයේද, නැඟීම කළ නොහැකි වේද, එසේම භාවනා සමෘද්ධවීම් වශයෙන් ලැබියයුතු ආස්වාදය නොලැබීමෙන් විඩාවට පත් සිත් ඇතිව භාවනාවෙන් ගිලිහෙයි, භාවනාව සමෘද්ධ නොවේ. අනුපිළිවෙළින් මෙනෙහි කරන්නහු විසින්ද ඉතා යුහුව (**නාතිසීඝතො**) නොකළ යුතුය. යම්සේ තුන් යොදුන් මඟකට බැස යායුතු නොයායුතු දිශාව නොවිමසා යුහු යුහුව සියවරක් හෝ ඔබ මොබ ගමන් කරන පුරුෂයකුහට කෙසේ හෝ ගමන අවසන් විය හැකි නමුදු, මඟ තොරතුරු අසා දැනගෙනම යායුතුය. එලෙසින්ම ඉතා යුහුව මෙනෙහි කරන්නහුට හුදෙක් කර්මස්ථානය අවසනට ආ හැකිය, එහෙත් වැටහීමෙක් සිදු නොවේ, එහෙයින් ඉතා යුහුව මෙනෙහි නොකළ යුතුය. ඉතා යුහුව මෙනෙහි නොකළ යුතුවා සේම ඉතා ලැසිව (**නාතිසනිකතො**)ද මෙනෙහි නොකළ යුතුය. යම්සේ වනාහි එක්දින තුන්යොදුන් ගමනක් යනු කැමැති පුරුෂයකුහට අතරමඟ ගස් ගල් පර්වත තඩාගාදී තන්හි ලස් වුවහොත් මඟ ගෙවාලීය නොහැකි වේද, දෙදිනකින් හෝ තුන් දිනෙකින් මිස අවසන්කළ නොහැකි වේද, එසේම ඉතා ලැසිව මෙනෙහි කරන්නහුට කර්මස්ථානය අවසනට නොයෙයි, විශෙෂාධිගමයකට හේතු නොවෙයි.

**වික්ඛෙපපටිබාහනතො** යනු, කර්මස්ථානය හැරදමා බැහැර අරමුණු වෙත සිත ඇදී යාම වැලැක්විය යුතුය, වලක්වා නොගැනීමෙන් යම්සේ එක් කෙනකුට පමණක් යාහැකි ප්‍රපාතමාර්ගයෙක්හි පිළිපන් පුරුෂයකු පය තැබිය යුතු තැන් නොසලකා ඔබ මොබ බලමින් ගියහොත් ඔහුගේ පියවර වරදියි, ඒ හේතුකොටගෙන මිනිසුන් (බඹ) සියයක් උසතරම් ප්‍රපාතයෙක්හි වැටිය හැකිය. එසේම සිත බැහැරට යනවිට කමටහන් පිරිහෙයි, විනාශ වෙයි, එහෙයින් වික්‍ෂෙපය දුරු කිරීම් වශයෙන් මෙනෙහි කළ යුතුය.

**පණ්ණත්ති සමතික්කමනතො** යනු, මේ කෙස්ය, මේ ලොම්ය, යන ආදී වශයෙන් යම් ලෝක ව්‍යවහාරයක් වේනම්, එය ඉක්මවා

පිළිකුල් සිතම පිහිටුවාගත යුතුය. යම්සේ ජලය හිඟ නියං කාලයෙක්හි මනුෂ්‍යයෝ වනයෙහි ලිඳක් දැක එහි තල්පත් ආදී කිසියම් සලකුණක් තබා එම සලකුණෙන් පැමිණ ස්නානය කෙරෙද්ද, පානය කෙරෙද්ද, ඔවුන්ගේ නිරන්තර සංචාරය හේතුකොට යම් දවසෙක යන එන මඟ ප්‍රකටවූවිට සලකුණෙන් පලක් නැතිව කැමැති කැමැති විටෙක ගොස් ස්නානය කෙරෙත්ද, පානය කෙරෙත්ද, එසේම මුල් අවස්ථාවේදී 'කෙසා ලොමා' යනුවෙන් ප්‍රඥප්තිවශයෙන් මෙනෙහි කරන්නහුට පිළිකුල් බව ප්‍රකට වේද, එවිට 'කෙසා ලොමා' යන ප්‍රඥප්තිය (ව්‍යවහාරය) ඉක්මවා පිළිකුල් බවෙහිම සිත පිහිටුවිය යුතුය.

**අනුපුබ්බමුඤ්චනතො** යනු යම් යම් කොටසක් නොවැටහේ නම්, ඒ ඒ කොටස අත්හැර අනු පිළිවෙළ හැර දැමීමෙන් මෙනෙහි කළ යුතුය, ආධුනිකයාට වනාහි 'කෙසා' යයි මෙනෙහි කරන විට මනස්කාරය ගොස් 'මුත්තං' යන අවසාන කොටස ගෙනසිටියි, 'මුත්තං' යයි අවසාන කොටස මෙනෙහි කරනවිට මනස්කාරය ගොස් 'කෙසා' යන ආදිතම කොට්ඨාසය අල්වාගෙන සිටියි. නැවත නැවත මෙසේ මෙනෙහි කරන ඔහුට ඇතැම් කොටස් සිහියට එළඹ සිටියි. සෙසු ඇතැම් කොටස් සිහියට නො-එයි. ඔහු විසින්, යම් යම් කොටසක් සිහියට එළඹේ නම්, ඒ ඒ කොටස කෙරෙහි භාවනා කර්මය කළයුතුයි. කොටස් දෙකක් එළඹිවිට යම්තාක් ඒ දෙකෙනුදු එක් කොටසක් වඩා පැහැදිලිව වැටහේ නම් ඒතාක් භාවනා කර්මය කළයුතුය. මෙසේ සිහියට එළඹි එම කොටස් නැවත නැවත මෙනෙහි කරමින් අර්පණා ඉපැදවිය යුතුය.

එහිලා මේ උපමායි. යම්සේ තල්ගස් දෙතිසක් ඇති තල් අරමෙක වසන වඳුරකු අල්වාගනු කැමැති වැද්දෙක් මුලදී සිටි තල්ගසෙහි කොළ හීයෙන් විද හඬ නඟාද, එවිට ඒ වඳුරා පිළිවෙළින් ඒ ඒ තල්ගසට පනිමින් ගොස් කෙළවර ඇති තල්ගසට පැමිණේද, වැද්ද ගොස් එහිද එසේම කළ විට නැවත එම නයින්ම පළමු තල්ගසට පැමිණේද, මෙසේ ඒ වඳුරා යලි යලිදු පන්වනු ලබනුයේ හඬ නැගූ නැඟූ තන්හි පැන පැන අනුපිළිවෙළින් ගොස් එක් තල් ගසෙක්හි මැද නොවිහිදි ගොබ් අත්තක් දැඩිව අල්වාගෙන විදිනු ලබද්දී පවා පැන නොගොස් සිටීද, මේ කරුණද එසේයයි දතයුතුය. එහි උපමා සංසන්දනය මෙසේය:- යම්සේ තල් අරමෙහි තල්ගස් දෙතිසක් ඇද්ද, එසේම මේ කයෙහිද දෙතිස් කොටසෙක් ඇත, සිත වඳුරා වැනිය, යෝගාවචරයා වැද්ද වැනිය, දෙතිස් කොටස් ඇති කයෙහි අරමුණු ගැනීම් වශයෙන් යෝගාවචරයාගේ සිත සැරිසැරීම තල්ගස් දෙතිසක් ඇති රුප්පාවෙහි වඳුරාගේ වාසය වැනිය. 'කෙසා'

යයි මෙනෙහි කිරීම අරඹනලද කල්හි සිත පිළිවෙළින් ගොස් අවසන් කොටසෙහි සිටීම වැද්ද විසින් මුලදී සිටි තල්ගසෙහි කොළ හීයෙන් විද හඬ නැගුවිට වඳුරා ඒ ඒ තල්ගසට පනිමින් ගොස් කෙළවර තල්ගසට පැමිණීම වැනිය. නැවත පෙරළා පැමිණීමේදීද මෙම නය වේ. නැවත නැවත මෙනෙහි කරන්නහු විසින් යම් යම් කොටසක් වැටහුණු කල්හි නොවැටහෙන කොටස් හැරදමා වැටහීගිය කොටස් කෙරෙහි භාවනා කර්මය කිරීම නැවත නැවත පන්වනු ලබන වඳුරා වැද්ද විසින් හඬ නැඟූ නැඟූ තැනින් පැන යාම වැනිය. අවසන්හි කොටස් දෙකක් සිහියට එළඹි කල්හි යමක් වඩා පැහැදිලිව වැටහේනම් එයම නැවත නැවතත් මෙනෙහි කරමින් අර්පණා ඉපැදවීම වඳුරා අනුපිළිවෙළින් පැන ගොස් අවසන්හි එක් තල් ගසකට පැන එහි මැද නොවිදිහි ගොබ් අත්තක් දැඩිව අල්වාගෙන විදිනු ලබද්දී පවා එහිම සිටීම වැනිය.

තවද උපමාවෙකි:- යම්සේ වනාහි පිණ්ඩපාතික මහණෙක් තෙමේ ගෙවල් දෙතිසක් ඇති ගමක් ඇසුරුකොට වාසය කරනුයේ පළමු ගෙහිදීම භික්‍ෂා දෙකක් ලැබ පසුවට ඇති එක් භික්‍ෂාවක් හරියි, දෙවන දිනයෙහි භික්‍ෂා තුනක් ලැබ අගින් ඇති භික්‍ෂා දෙකක් හරියි, තෙවැනි දිනයෙහි පළමු ගෙහිදීම පාත්‍රය පුරා ලැබ ආසනශාලාවට ගොස් වළඳනුයේද, එසේම මේ කාරණය දතයුතුය. දෙතිස් ආකාර ඇති කොටස් පවුල් දෙතිසක් ඇති ගම වැනිය, යෝගාවචර තෙමේ පිණ්ඩපාතික භික්‍ෂුව වැනිය. යෝගාවචරයා විසින් දෙතිස් ආකාර කොටස් විෂයෙහි භාවනා කිරීම එම ගම ඇසුරුකොට වාසය කිරීම වැනිය. නැවත නැවත මෙනෙහි කරන යෝගාවචරයා විසින් නොවැටහෙන කොටස් අත් හරිමින් වැටහෙන වැටහෙන කොටස් මෙනෙහි කරමින් කොටස් දෙකක් දක්වා භාවනා කිරීම (පිණ්ඩපාතික භික්‍ෂුව විසින්) පළමු ගෙහිදීම භික්‍ෂා කොටස් දෙකක් ලැබ පසුව එන එක් භික්‍ෂා කොටසක් අත්හැරීම හා දෙවැනි දිනයෙහි භික්‍ෂා කොටස් තුනක් ලැබ අගින් එන දෙකක් අත් හැරීම වැනිය, කොටස් දෙකින් යමක් පහසුවෙන් වැටහේනම් එයම නැවත නැවත මෙනෙහිකොට අර්පණා ඉපැදවීම තුන්වන දිනයෙහි, ආරම්භයෙහිදීම පාත්‍රය පුරා භික්‍ෂාව ලැබ ආසනශාලාවෙහි හිඳ වැළඳීම වැනිය.

**අප්පනාතො** යනු, අර්පණාවන කොට්ඨාස වශයෙනි. කෙසාදීවූ එක් එක් කොටසෙක්හිම අර්පණා වෙතැ'යි දතයුතුය යනු මෙහි අදහසයි. **තයො ච සුත්තන්තා** යනු, අධිචිත්ත, සීතීභාව, බොජ්ඣංගකොසල්ල යන මේ සූත්‍රාන්තයන් වීර්ය, සමාධි යන දෙක සමසේ යොදගනු සඳහා

දතයුතුය යනු මෙහි අදහසයි. එහි, “මහණෙනි අධිචිත්තභාවනාවෙහි යෙදුණ භික්ෂුව විසින් නිමිති තුනක් මෙනෙහිකළ යුතුය, කලින් කල සමාධි නිමිත්ත මෙනෙහිකළ යුතුය, කලින් කල පග්ගහ (වීර්ය) නිමිත්ත මෙනෙහිකළ යුතුය, කලින් කල උපෙක්ඛා නිමිත්ත මෙනෙහි කළ යුතුය, මහණෙනි, ඉදින් අධිචිත්ත භාවනාවෙහි නියැලි භික්ෂුව සමාධි නිමිත්තම මෙනෙහි කරතොත් එම භාවනා චිත්තය කුසීතබව පිණිස පවත්නේය. මහණෙනි අධිචිත්ත භාවනාවෙහි නියැලි භික්ෂුව ඉදින් පග්ගහ නිමිත්තම මෙනෙහි කරතොත් එම භාවනාචිත්තය නොසන්සුන්බව පිණිස පවත්නේය, මහණෙනි, අධිචිත්ත භාවනාවෙහි නියැලි භික්ෂුව ඉදින් උපෙක්ඛා නිමිත්තම මෙනෙහි කරතොත්, එම භාවනා චිත්තය ආශ්‍රවයන් ක්ෂය කරනු පිණිස මනාකොට සමහත් නොවන්නේය. මහණෙනි, යම් හෙයකින් වනාහි අධිචිත්ත භාවනාවෙහි නියැලි භික්ෂුතෙමේ කලින් කල සමාධිනිමිත්තද, පග්ගහනිමිත්තද, උපෙක්ඛානිමිත්තද මෙනෙහි කරන්නේද, එම භාවනා චිත්තය මෘදුද වන්නේය, කර්මණ්‍යද වන්නේය, පිවිතුරුද වන්නේය, බිඳෙනසුලු නොවන්නේය, ආශ්‍රවයන් ක්ෂය කරනු පිණිස සමහත් වන්නේය.

මහණෙනි, යම්සේ රන්කරුවෙක් හෝ රන්කරු අතවැස්සෙක් හෝ උදුනක් (කෝවක්) බඳින්නේද, උදුනක් බැඳ උදුන්දෙර ගිනි දල්වන්නේද, උදුන්දෙර ගිනි දල්වා අඩුවෙන් රන් ගෙන උදුන්දොර බහා විටින්විට ගිනි පිඹින්නේද, විටින්විට ජලයෙන් තෙමන්නේද, විටින් විට නවත්වා බලා සිටින්නේද, මහණෙනි, ඉදින්, රන්කරුවකු හෝ රන්කරු අතවැස්සකු හෝ එකැතින්ම (ඒකන්තං) රන්වලට ගිනි පිඹිතොත් එම රන් දැවී යන්නේය, මහණෙනි, ඉදින් රන්කරු හෝ රන්කරු අතවැස්සා හෝ එම රන් එකැතින්ම දියෙන් තෙමතොත් එම රන් නිවී යන්නේය. මහණෙනි, ඉදින් රන්කරු හෝ රන්කරු අතවැස්සා හෝ එකැතින්ම නවත්වා බලා සිටියහොත් එම රන් මනාසේ පදම් නොවන්නේය, මහණෙනි, යම් හෙයකින් වනාහි රන්කරුවා හෝ රන්කරු අතවැස්සා හෝ එම රන් විටින්විට ගිනි පිඹින්නේද, විටින්විට දියෙන් තෙමන්නේද, විටින්විට නවත්වා බලා සිටින්නේද එම රන් මෘදුද වන්නේය, කර්මණ්‍යද වන්නේය, පිවිතුරුද වන්නේය, නොබිඳෙනසුලුද වන්නේය, මනාකොට වැඩට යෝග්‍යද වන්නේය, යම් යම් ආභරණ විශේෂයකට, නළල්පටකට හෝ වේවා, කොඩොලකට හෝ වේවා, ගෙල පළඳනාවකට හෝ වේවා, රන්දමකට හෝ වේවා, කැමැති වේනම්, එම අභිමතාර්ථය සාද දෙන්නේය. මහණෙනි, එසේම අධිචිත්ත භාවනාවෙහි නියැලි භික්ෂුව විසින්-පෙ-ආශ්‍රවයන් ක්ෂය කරනු පිණිස මනාසේ සමහත් වන්නේය, අභිඥාවෙන් සාක්ෂාත් කළයුතු යම් යම් ධර්මයකට නැඹුරු වේනම්, ඒ ඒ ධර්මයන්

අභිඥාවෙන් සාක්ෂාත් කරනු පිණිස ඒ ඒ ආයතනයන් ඇති කල්හි ප්‍රත්‍යක්ෂ භාවයට පමුණු වන්නේය"(1) යන මේ අධිචිත්තසූත්‍රයයි දත යුතුය.

"මහණෙනි, සවැදෑරුම් ධර්මයෙකින් සමන්විතවූ භික්ෂු තෙමේ අනුත්තරවූ නිර්වාණය සාක්ෂාත් කිරීමට පොහොසත් වේ, කවර නම් සවැදෑරුම් ධර්මයෙක්ද? මහණෙනි මේ ශාසනයෙහි භික්ෂු තෙමේ යම් විටෙක සිත ඔබා තැබියයුතු වේනම්, එවිට සිත ඔබා තබයි, යම් විටෙක සිත ඔසවා තැබියයුතු වේනම්, එවිට සිත ඔසවා තබයි, යම් විටෙක සිත පිනවියයුතු වේනම්, එවිට සිත පිනවයි, යම්විටෙක සිත මැදහත් කළයුතු වේනම්, එවිට සිත මැදහත් කරයි, උතුම්වූ මාර්ගඵලයන් වෙතට නැඹුරු වූයේද වෙයි, නිවණ කෙරෙහි ඇලීම් ඇත්තේද වෙයි, මහණෙනි, මෙම සවැදෑරුම් ධර්මයෙන් සමන්විතවූ භික්ෂු තෙමේ අනුත්තරවූ නිර්වාණය සාක්ෂාත් කිරීමට පොහොසත් වේ."(2) යන මේ සීතිභාව සූත්‍රයයි දත යුතුය.

බොජ්ඣඞ්ගකොසල්ලය වනාහි, "මහණෙනි, එසේම යම් විටෙක හැකිලුණු සිත් ඇත්තේ වේනම්, එවිට පස්සද්ධිසම්බොජ්ඣංගය වැඩීමට කල් නොවේ"(3) යන ආදී වශයෙන් (යට පඨවිකසිණ විස්තරයෙහි) අප්පනාකොසල්ල කථාවෙහි දක්වන ලද්දේමය. මෙසේ මේ සත් වැදෑරුම් උග්ගහකොසල්ල විධිය මනාකොට උගෙන, එසේම මේ දස වැදෑරුම් මනසිකාරකොසල්ල විධිය මනාසේ පිහිටුවාගෙන ඒ යෝගියා විසින් උභයකොසල්ල වශයෙන් කර්මස්ථානය මනාසේ උගතයුතුය. ඉදින් ඒ යෝගාවචරයාහට ආචාර්යවරයා හා සමඟ එක් විහාරයෙක විසීම පහසු වන්නේ නම්, මෙසේ එක්වරම විස්තර වශයෙන් කියවා (අසා) නොගෙන කමටහන්හි නියැලෙමින් මතු විශේෂයක් ලැබූ විටෙක වරින්වර කමටහන් කියවාගත යුතුය. විහාරයෙන් පිටත අන් තැනෙක වසනු කැමැත්තහු විසින් යටකී නයින් විස්තර වශයෙන් කමටහන් කියවාගෙන නැවත නැවත පිරිවහා සියලු ගැටලු තැන් විසඳගෙන පඨවිකසිණනිද්දෙසයෙහි කී-නයින්ම නොසුදුසු සෙනසුන් හැර සුදුසු සෙනසුනෙක වෙසෙමින් සුලු පලිබෝධයන් නසා පිළිකුල් මෙනෙහි කිරීමෙහි පිරියම් කටයුතුය. එසේ කරන්නහු විසින් පළමුකොට කෙස්හි නිමිති ගතයුතුය. කෙසේද? කෙස් ගසක් හෝ දෙකක් කපා අත්ලෙහි

(1) අං. නි. තික නිපාත - A i 256 ff
(2) අං. නි. ඡක්ක නිපාත - A iii 435
(3) සං. නි. බොජ්ඣංග සං - S v 113

තබා පළමුකොට වර්ණ වශයෙන් පරීක්ෂා කටයුතුය. කෙස් කැපුණ තැනද බැලිය යුතුය. දිය බඳුනෙක හෝ කැඳ බඳුනෙක තුබූ කෙස්ද බැලීම වටී. කළු නම් කළු යයි මෙනෙහි කළයුතුය. සුදු නම් සුදුයයිද, කළු සුදු මුසු නම් බහුලවූ වර්ණය මෙනෙහි කළයුතුය. කෙස් කෙරෙහි මෙන්ම සියලු තචපංචකයෙහිම දක බලාම නිමිති ගතයුතුය. මෙසේ නිමිති ගෙන සියලු කොටස්වල වර්ණ, සණ්ඨාන, දිසා, ඔකාස, පරිච්ඡේද වශයෙන් නිශ්චය කොට, වර්ණ, සණ්ඨාන, ගන්ධ, ආසය, ඔකාස යන පස් ආකාරයෙන්ද පිළිකුල් බව නිශ්චය කටයුතුය.

එහිලා සියලු කොටස් පිළිබඳ අනුපිළිවෙළ කථාව මෙසේය:- පළමුකොට කෙස් ගතහොත්, එය පියවි පැහැයෙන් අමු පෙනෙල ඇට මෙන් කළුය, සටහන් වශයෙන් දික්වට තුලා දඬු වැනි සටහන් ඇත්තේය, දිශා වශයෙන් උඩු දිශාවෙහි උපන්නේය, ආකාශ වශයෙන් දෙපස කන්සිළුවට ඉදිරි පසින් නළල කෙළවරින්ද, පසුපස ගෙල වටින්ද පිරිසිඳි හිස්කබල වසා සිටිනතෙක් සම කෙස්වල අවකාශයයි. පරිච්ඡේද වශයෙන් යටින් හිසවසාගෙන සිටි සම තුළට වියගක් පමණ පිවිස සිටි කෙස් මුල් වලින්ද, උඩින් අහසින්ද සරසින් එකිනෙකින්ද පිරිසිඳීයේයි. කෙස් ගස් දෙකක් එකට පිහිටා නැතැ'යි යන මේ කාරණය සභාග වශයෙන් පිරිසිඳීමයි. කෙස්, ලොම් නොව, කෙස්ම වේ, ලොම් කෙස් නොව ලොම්ම වේයයි මෙසේ සෙසු එක්තිස් කොටස් වලින් වෙන්කොට, කෙස් නම් වෙනම කොට්ඨාසයෙකැ'යි යන මෙය විසභාග වශයෙන් පිරිසිඳීමයි. මේ කෙස් ආදිය වර්ණාදී වශයෙන් නිශ්චය කිරීමයි. ඒ කෙස් ආදිය වර්ණ ආදී වශයෙන් පස් ආකාරයෙකින් පිළිකුල් බව නිශ්චය කිරීම මෙසේය:- මේ කෙස්ය, කෙස් වනාහි, පැහැයෙන්ද පිළිකුල්ය, හැඩයෙන්ද, ගඳින්ද, ආශ්‍රය වශයෙන්ද, අවකාශ වශයෙන්ද පිළිකුල්ය, ප්‍රියවූද බත් බඳුනෙක හෝ කැඳ බඳුනෙක කෙසක් වැනි කිසිවක් දක, 'මෙය කෙස් මුසුය, මෙය ඉවතලවු' යයි පිළිකුල් කරති. මෙසේ වර්ණයෙන්ද පිළිකුල්වේ, රාත්‍රියෙහි අනුභව කරන්නකුහට කෙස් හැඩය ඇති වරා කෙන්දක් හෝ නියද කෙන්දක් විකුණුවිට එසේම පිළිකුල් කරති. මෙසේ සටහන් වශයෙන් පිළිකුල් වේ.

තෙල් ගැල්වීම්, මල් ගැවසීම්, දුම් ඇල්ලීම් ආදී සැරසීම් නැතිවිට කෙස්වල ගඳ ඉතා පිළිකුල් වේ, ගින්නෙහි ලූවිට (කෙස්වල ගඳ) එයටත් වඩා පිළිකුල් වේ. කෙස් වනාහි වර්ණ සණ්ඨාන වශයෙන් පිළිකුල් නොවත්මුත් ගඳින් පිළිකුල් වන්නේමය. යම්සේ ළදරුවකුගේ වසුරු පැහැයෙන් කසාවන් වන්නේද, හැඩයෙන්ද, කසාපිඩක් හා සමාන

වන්නේද, තවද කසල ගොඩෙක දමූ කළු බල්ලකුගේ ඉදිමී ගිය සිරුර පැහැයෙන් පැසුණු තල් ගෙඩියක් හා සමාන වන්නේද, සටහන් වශයෙන් වටකොට ලියා තිම කළ මිහිඟු බෙරයක් හා සමාන වන්නේද (උගේ) දළද සමන් කැකුළු හා සමාන වන්නේද, (ළදරුවාගේ වසුරුය, ඉදිමුණ බලු කුණය යන) මේ දෙකම වර්ණ වශයෙන් හෝ සටහන් වශයෙන් පිළිකුල් නොවන්නේය, ගඳින් වනාහි පිළිකුල් වන්නේමය, එසේම කෙස්ද වර්ණ වශයෙන් හෝ සටහන් වශයෙන්ද පිළිකුල් නොවත්මුත් ගඳින් වනාහි පිළිකුල් වන්නේමය. යම්සේ වනාහි ගම්දෙර ගලා යන මලමූත්‍රාදිය සහිත අපවිත්‍ර ස්ථානයෙක්හි හටගත් පිස බිදිය හැකි පලා කොළ පවා නාගරික ජනයාට පිළිකුල් වන්නේද, නොබිදියයුතු වන්නේද, එසේම කෙස්ද ලෙහෙ, සැරව, මලමූත්‍ර, පිත්, සෙම් ආදිය වැගිරීමෙන් උපන් හෙයින් පිළිකුල් වන්නේමය. මේ කෙස් පිළිබඳ ආශ්‍රයස්ථාන වශයෙන් ඇති පිළිකුල් බවයි.

මේ කෙස් වනාහි වසුරු ගොඩෙක නැගුණ පුස් මෙන් එක් තිසක් සෙසු කුණප කොට්ඨාසයන් මත උපන්නේය, ඒ කෙස් සොහොන්පල, කසලගොඩ ආදී තන්හි හටගත් පලාකොළ සෙයින්ද දිය අගල් ආදියෙහි හටගත් පියුම් මහනෙල් ආදී පුෂ්පයන් සෙයින්ද, අපවිත්‍ර ස්ථානයන්හි උපන් හෙයින් ඉතා පිළිකුල් වන්නේය. මේ අවකාශ වශයෙන් කෙස් පිළිබඳ පිළිකුල් බවයි. කෙස් පිළිබඳව යම්සේද, සියලු කුණප කොට්ඨාසයන් පිළිබඳවද එසේම වර්ණ-සංස්ථාන (හැඩය) - ගන්ධ ආශ්‍රයස්ථාන–අවකාශස්ථාන ආදී නයින් පස් ආකාරයෙකින් පිළිකුල්බව දතයුතුය. වර්ණ-සංස්ථාන-දිශා-අවකාශ-පරිච්ඡේද වශයෙන්ද සියලු කොට්ඨාසයන් වෙන් වෙන් වශයෙන් නිශ්චය කටයුතුය.

එහි **ලොමා** (ලොම්) වනාහි ප්‍රකෘති වර්ණ වශයෙන්, කෙස් මෙන් තනිකර කළු පැහැ ඇත්තේ නොවේ. දුඹුරුපැහැ මුසු කළු පැහැ ඇත්තේය. සංස්ථාන (හැඩය) වශයෙන් අගින් නැමුණු තල්මුල්වල හැඩය ඇත්තේය. දිශා වශයෙන් උඩ යට දෙදිශාවෙහිම උපන්නේ වේ. අවකාශ වශයෙන් කෙස් ඇති තැන්ද අතුල් පතුල්ද හැර බොහෝ සෙයින් සෙසු සිරුර වසා සිටි සම මත හටගත්තේය. පරිච්ඡේද වශයෙන් සිරුර වසාසිටි සම මත යටින් ලෙහෙඩියකු පමණ තැන් පිවිස පිහිටි මුලින්ද, උඩින් අහසින්ද සරසින් එකිනෙකින්ද පිරිසිදියේය. ලොම් ගස් දෙකක් එක්ව නොපිහිටියේය. මේ ලොම් පිළිබඳ සභාග පරිච්ඡේදයි, විසභාග පරිච්ඡේදය වනාහි කෙස් පිළිබඳ පරිච්ඡේදය මෙන්ම වේ.

**නහා** යනු, නියපොතු විස්සට නමෙකි, සියලු නිය වර්ණ වශයෙන් සුදු පැහැවේ, හැඩයෙන් මසුන්ගේ කොරපොතු වැනි වේ, දිශා වශයෙන් පා නිය යටි දිශාවෙහිද, අත් නිය උඩු දිශාවෙහිද වේ, අවකාශ වශයෙන් ඇඟිලි අග පිටුපස පිහිටියේය, පරිච්ජේද වශයෙන් තුන් පැත්තෙකින් ඇඟිලි අග මසින්ද, ඇතුළතින් ඇඟිලි අග පිටුපස මසින්ද, පිටතින් හා අගින් ආකාශයෙන්ද සරසින් එකිනෙකින්ද පිරිසිදියේය, නිය දෙකක් එක්ව නොපිහිටියේය, මේ නිය පිළිබඳ සභාග පරිච්ජේදයයි. විසභාග පරිච්ජේදය කෙස් පිළිබඳව කී නියායෙන්ම වේ.

**දන්තා** යනු, පිරිපුන් දත් ඇත්තකුගේ දෙතිස් දත් ඇටයි, ඒ දත්ද පැහැයෙන් සුදුය, හැඩයෙන් නොයෙක් ආකාර ඇත්තේය, එම දත් අතුරෙන් යටි ඇන්දෙහි දත් පෙළ මැද පිහිටි සතරක් මැටි පිඩක පිළිවෙළින් සිටවූ ලබු ඇට හා සමාන වේ, ඒ දත් සතර දෙපසින් එක් මුලක් හා එක් අගක් ඇති සමන් කැකුළු හැඩය සහිත එක් එක් දතක් වේ, එම දත් දෙකට පසුව මුල් දෙකකින්ද අග් දෙකකින්ද යුත් ගැල් විය බඳු එක් එක් දතක් වේ, එම දත් දෙකට පසුව මුල් තුනක් හා අග් තුනක් ඇති දත් දෙකක් බැගින් වේ, එම දත්වලට පසුව මුල් සතරක් හා අග් සතරක් ඇති දත් දෙකක් බැගින් වේ, උඩු ඇන්දෙහිද මෙම නයයි. දිශා වශයෙන් උඩු දිශාවෙහි හටගත්තේ වේ, අවකාශ වශයෙන් හනු ඇට දෙකෙහි පිහිටියේය, පරිච්ඡෙද වශයෙන් යටින් හනු ඇටයෙහි පිහිටි දත් මුලින්ද, උඩින් ආකාශයෙන්ද, සරසින් එකිනෙකින්ද පිරිසිදියේය, දත් දෙකක් එක්ව පිහිටියේ නොවේ, මේ දත් පිළිබඳ සභාග පරිච්ඡෙදයයි. විසභාග පරිච්ඡෙදය කෙස් පිළිබඳව කීනියායෙන්ම වේ.

**තචො** යනු මුළු සිරුර වෙලා සිටි සමයි, ඒ සම මත කළුවන්, සම්වන්, රන්වන් ආදී පැහැ ඇති සිවිය මුළු සිරුරෙන්ම දුරා ගතහොත් ඩෙබර ඇටයක් තරම් වේ. සම වනාහි වර්ණයෙන් සුදු පාටම වේ. සම සුදු පැහැ බව ගිනිදැල් වැදීම් ආයුධ පැහැරීම් ආදියෙන් සිවිය විනාශවී ගිය කල ප්‍රකට වේ. හැඩයෙන් සිරුරු හැඩයම වේ, මේ මෙහි සංක්ෂේපයයි, විස්තර වශයෙන් වනාහි පා-ඇඟිලි පටපණු කොෂයකට සමාන හැඩය ඇත්තේය. පිටි පතුලෙහි සිටි සම පුටබද්ධඋපාහනයකට (පතුල වැසෙන සේ තැනූ පාවහනකට) බඳු හැඩය ඇත්තේය, කෙණ්ඩාවල සම බත්මුලක් බැඳි තල්පතක් බඳු හැඩය ඇත්තේය, කලවාවල සම සහල් පිරවූ දික් පසුම්බියකට බඳු හැඩය ඇත්තේය, ආනිසදයෙහි (තට්ටම්වල) සම දිය පිරි පට පෙරහන් කඩකට සමාන හැඩය ඇත්තේය. පිටිකරෙහි සම පුවරුවක සවිකළ සමකට සමාන හැඩය ඇත්තේය, උදරයෙහි සම

වීණා දෙනෙක්හි බැදි සමකට සමාන හැඩය ඇත්තේය, පපුවෙහි සම බොහෝ සෙයින් සිවුරැස් හැඩය ඇත්තේය, දෙ-අතෙහි සම හියවුරෙක යෙදූ සමකට බඳු හැඩය ඇත්තේය, පිටි අත්ලෙහි සම දැලිපිහි කොපුවකට බඳු හැඩය ඇත්තේය- නැතහොත් පනා කොපුවකට සමාන හැඩය ඇත්තේය, අත් ඇඟිලි සම යතුරු පසුඹියකට සමාන හැඩය ඇත්තේය, ගෙල සම කරපටියකට සමාන හැඩය ඇත්තේය, මුහුණෙහි සම කුදු මහත් සිදුරු සහිත දෙබරයකට සමාන හැඩය ඇත්තේය, හිස සම පාත්‍ර පසුඹියකට බඳු හැඩය ඇත්තේයයි මෙසේ සම නිමිති කොටගෙන භාවනා කරන යෝගාවචරයා විසින් උඩු තොල පටන් මුඛයෙහි ඉහළට ඥනය මෙහෙයවා පළමුකොට මුඛය වසා සිටින සම නිශ්චය කටයුතුය. ඉක්බිති පසුඹියෙහි බහාලූ පාත්‍රයටත් පසුඹියටත් අතරින් අත යවන ලෙසින් හිස් කබලටත් හිස සමටත් අතරින් ඥනය මෙහෙයවා හිස් කබල හා සමග එකට බැඳී පවත්නා සම වෙන්කොට නිශ්චය කටයුතුය. ඉක්බිති කඳෙහි සමද, ඉන් ඉක්බිති මුල සිට අගට හා අග සිට මුලට දකුණත් සමද, එසේම වමත් සමද, ඉන් අනතුරුව පිටෙහි සමද නිශ්චය කොට මුල සිට අගට හා අග සිට මුලට දකුණු පා සමද එසේම වම් පා සමද, ඉන් ඉක්බිතිව පිළිවෙළින් වස්ති, උදර, හෘදය, ග්‍රීවා, යන මෙතැන්හි සම නිශ්චය කටයුතුය. ගෙල සමට අනතුරුව යටි හනුවෙහි සම නිශ්චය කොට යටිතොල අවසනට පමුණුවා නිමා කළයුතුය. මෙසේ ඔළාරික ඔළාරිකවූ සම් කොටස් නිමිතිකොට ගන්නාවිට සියුම් කොටස්ද ප්‍රකට වේ. දිශා වශයෙන් උඩු යටි දෙදිසාවෙහිම හටගත්තේය. අවකාශ වශයෙන් මුළු සිරුර වසාගෙන සිටියේය. පරිච්ඡෙද වශයෙන් යටින් පිහිටා සිටින ස්ථරයෙන්ද උඩින් අහසින්ද පිරිසිඳියේ වේ. මේ මෙහි සභාග පරිච්ඡෙදයි, විසභාග පරිච්ඡෙදය යට කෙස් පිළිබඳව කී නියායම වේ.

**මංසං** යනු, නවසියයක් මස් පිඩුයි. සියල්ලම වර්ණ වශයෙන් කැලමල් සෙයින් රතුය. සටහන් වශයෙන් කෙණ්ඩා පිඩු මස තල් පතෙහි බැදි බත්මුලක් බඳු හැඩය ඇත්තේය, කලවා මස ඇඹරුම් ගලෙහි ගල් පෝයක් බඳු හැඩය ඇත්තේය, ආනිසද (තට්ටම්) මස (මැටියෙන් කළ) උදුන් කෙළවරක් බඳු හැඩය ඇත්තේය. පිටිකර මස තල්සකුරු පටලයකට බඳු හැඩය ඇත්තේය. ඉල ඇට දෙපෙළෙහි මස පඹයකු කුසෙහි තුනීකොට අලවනලද මැටිපිඩක් බඳු හැඩය ඇත්තේය, තනෙහි මස වටකුරුකොට ගෙන හෙලූ මැටි පිඩක් බඳු හැඩය ඇත්තේය, බාහු දෙකෙහි මස දෙගුණකොට තබනලද සමගැසූ මහමීයකු (වල්මීයකු) බඳු හැඩය ඇත්තේය. මෙසේ මහත් මහත් අවයව නිමිතිකොට ගන්නා

යෝගාවචරයාහට සියුම් අවයවද ප්‍රකට වේ. දිශාවශයෙන් උඩ යට දෙදිසාවෙහි හටගත්තේ වේ, අවකාශ වශයෙන් තුන්සියයකට අධික ඇට වසා බැඳී සිටියේ වේ. පරිච්ඡේද වශයෙන් යටින් ඇටසැකිල්ලෙහි පිහිටි ස්ථරයෙන්ද උඩින් සමින්ද, සරසින් එකිනෙකින්ද පිරිසිඳියේය. මේ මෙහි සභාග පරිච්ඡේදයයි, විසභාග පරිච්ඡේදය කෙස් පිළිබඳව කී නියායමවේ.

**නහාරු** යනු, නවසියයක් නහරයි. වර්ණ වශයෙන් සියලුම නහර සුදුය, හැඩයෙන් නොයෙක් ආකාර වේ. මේ නහර අතුරෙන් ගෙල මත්තෙහි පටන් සිරුර වැළඳගෙන මහනහර පසක් ඉදිරි පසින්ද, පසක් පසු පසින්ද, පසක් දකුණු පසින්ද, තවත් පසක් වම් පසින්ද පහළට විහිදී ඇත. දකුණු අත වැළඳගත් මහනහර පසක් ඉදිරි පසින්ද, තවත් පසක් පසු පසින්ද, වම් අත වැළඳගත් පසක් ඉදිරි පසින්ද, තවත් පසක් පසු පසින්ද, එසේම දකුණු පය වැළඳගත් මහනහර පසක් ඉදිරි පසින්ද, තවත් පසක් පසු පසින්ද, එසේම වම් පය වැළඳගත් මහනහර පසක් ඉදිරි පසින්ද, තවත් පසක් පසු පසින්දයි මෙසේ ශරීරධාරක නම්වූ මහනහර සැටක් කය වැළඳගෙන පහළට විහිදී ඇත. 'කණ්ඩරා' යයිද කියනු ලබන මේ නහර සියල්ලම කඳල මල් කැකුළු බඳු හැඩය ඇත්තේය. සෙසු නහර ඒ ඒ පෙදෙස පැතිර සිටියේය. මහනහරවලට වඩා සියුම් ඒ සෙසු නහර හුයෙන් කළ රැහැන් බඳු හැඩය ඇත්තේය. එයට වඩා සියුම් වෙනත් නහර රසකිඳ කෙඳි හා සමාන හැඩය ඇත්තේය. එයටත් වඩා සියුම් තවත් නහර මහාවීණාතත් බඳු හැඩය ඇත්තේය. අනෙක් සියුම් නහර දළ හු බඳු හැඩය ඇත්තේය. අතුල් පතුල් පිටු පස නහර කුරුලු පා බඳු හැඩය ඇත්තේය. හිස නහර කුඩා දරුවන්ගේ හිස දැල් පළඳනාවකට සමාන හැඩය ඇත්තේය. පිටිකර නහර අව්වෙහි වැනූ තෙත් දැලක් බඳු හැඩය ඇත්තේය. සිරුරෙහි ඒ ඒ අවයව අනුව ගිය සෙසු නහර සිරුර මත බහාලූ දැල් සැට්ටයක් බඳු හැඩය ඇත්තේය. දිශා වශයෙන් උඩු යටි දෙදිගෙහි හටගත්තේ වේ. අවකාශ වශයෙන් සිරුර පුරා ඇති ඇට හා බැඳී සිටියේය. පරිච්ඡේද වශයෙන් යටින් තුන් සියයක් ඇට මත පිහිටි තලයෙන්ද උඩින් මස් සම් හා බැඳී සිටි පෙදෙසින්ද, සරසින් එකිනෙකින්ද පිරිසිඳියේය, මේ නහර පිළිබඳ සභාග පරිච්ඡේදයයි, විසභාග පරිච්ඡේදය වනාහි කෙස් පිළිබදව කීපරිදිම වේ.

**අට්ඨී** යනු, දෙතිස් දත් ඇට හැර, අත් ඇට සූසැටක්ද, පා ඇට සූසැටක්ද, මස් ඇසුරුකොට ඇති මොළොක් ඇට සූසැටක්ද, විලුඹු

ඇට දෙකක්ද, එක් එක් පයෙහි ගොප් ඇට දෙකක් බැගින්ද, කෙණ්ඩා ඇට දෙකක් බැගින්ද, එක් දණ ඇටයක් බැගින්ද, කලවා ඇට එකක් බැගින්ද, උකුල් ඇට දෙකක්ද, කොඳු ඇට දසටක්ද, ඉල ඇට සුවිස්සක්ද පපු ඇට තුදුසක්ද, ළය ඇට එකක්ද, අකු ඇට දෙකක්ද, උරපතු ඇට දෙකක්ද. බාහු ඇට දෙකක්ද, අග්‍රබාහු ඇට දෙකක්ද, ගෙල ඇට සතක්ද, හනු ඇට දෙකක්ද, නාස් ඇට එකක්ද, නළල් ඇට එකක්ද, හිස්මුදුන් ඇට එකක්ද, හිස්කබොලු ඇට නවයක්දයි මෙසේ ඇට තුන්සියයක් පමණ වේ. ඒ සියල්ලම වර්ණවශයෙන් සුදුපැහැ වේ. හැඩහුරුකම වශයෙන් නොයෙක් ආකාර ඇත්තේ වේ. එහි පාඅග ඇඟිලි ඇට ඉඟිනි ඇට බඳු හැඩය ඇත්තේය. ඉන් අනතුරුව ඇති මැද පුරුක් ඇට කොස් ඇට බඳු හැඩය ඇත්තේය, මුල් පුරුක් ඇට පණාබෙර වැනි හැඩය ඇත්තේය, පිටිපතුල් ඇට කොටනලද කඳල අල රැසක් වැනි හැඩය ඇත්තේය, විලුඹු ඇටය එක් ඇටයක් ඇති තල්ගෙඩියක පැලමදය බඳු හැඩය ඇත්තේය, ගොප් ඇට බඳනාලද කෙළිපන්දක් බඳු හැඩය ඇත්තේය. ගොප් ඇටවල කෙණ්ඩා ඇට පිහිටි තැන පොතු නොහළ හිඳිගොබයක් බඳු හැඩය ඇත්තේය, කුඩා කෙණ්ඩා ඇටය දුනුදඬුවක් බඳු හැඩය ඇත්තේය, මහ කෙණ්ඩා ඇටය වැහැරුණු සර්පයකුගේ පිටක් බඳු හැඩය ඇත්තේය, දණ ඇට එක් පසෙකින් හැකුලුණ පෙණ පිඩක් බඳු හැඩය ඇත්තේය. එහි කෙණ්ඩා ඇටය පිහිටි තැන ඉතා තියුණු අග් සහිත ගව අහක් බඳු හැඩය ඇත්තේය. කලවා ඇට මනාකොට නොසැසි වෑ පොරෝ මිටක් බඳු හැඩය ඇත්තේය. එය උකුල් ඇටයෙහි පිහිටි තැන කෙළිපන්දක් බඳු හැඩය ඇත්තේය. එම කලවා ඇටය හා උකුල් ඇටය සම්බන්ධවන තැන මුදුන සිඳලූ මහ දෙඹ ගෙඩියකට සමාන හැඩය ඇත්තේය. උකුලු ඇට දෙක ඒකාබද්ධව කුඹල් උදුනකට සමාන හැඩය ඇත්තේය. වෙන වෙනම ගත් කල කඹුරන්ගේ කුළුගෙඩියෙහි බැඳි යකඩ වළලු වැනි හැඩය ඇත්තේය, උකුලු කෙළවර පිහිටි ආනිසද ඇටය යටිකුරුකොට ගන්නා ලද සර්පයකුගේ පෙණයට සමාන හැඩය ඇත්තේය, සත් තැනෙක කුදුමහත් සිදුරු ඇත්තේය. පිටකටුවෙහි ඇට ඇතුළතින් එකක් මත එකක් තබන ලද ඊයම් තහඩු පෙළක් බඳු හැඩය ඇත්තේය, ඇතුළතින් නවගුණවැලක් (වට්ටනාවලී?) බඳු හැඩය ඇත්තේය. ඒ කොඳු ඇට අතරතුර කියත්දත් බඳු කටු දෙක තුනක් ඇත්තේය. සුවිසි ඉළ ඇට අතුරෙන් නොපිරිපුන් ඇට නොපිරිපුන් දෑකැති බඳු හැඩය ඇත්තේය. පිරිපුන් ඇට පිරිපුන් දෑකැති බඳු හැඩය ඇත්තේය. මෙකී සියලු ඉළ ඇට සුදු කුකුළකුගේ විදහාගත් පියාපත් වැනි හැඩය ඇත්තේය, ළයමත

පිහිටි තුදුස් ඇට ගමන්ගත් දිරාපත් රිය කුඩුවක් බඳු හැඩය ඇත්තේය, පපු ඇට හැදි තලයක් බඳු හැඩය ඇත්තේය, අකුඇට කුඩා ලොහො වෑමිටකට සමාන හැඩය ඇත්තේය. උරපතු ඇට එක් පසෙකින් ගෙවීගිය සිංහල උදැල්ලකට සමාන හැඩය ඇත්තේය.

ඇ බාහුවෙහි ඇට කැඩපත් මිටක් බඳු හැඩය ඇත්තේය. බාහු අග ඇට දෙබිඩි තල්අල මුලකට සමාන හැඩය ඇත්තේය. මැණික් කටුවෙහි ඇටය එක්කොට අලවා තුබූ ඊයම් තහඩු පෙළකට සමාන හැඩය ඇත්තේය, පිටි අත්ලෙහි ඇට කොටනලද කඳල අල රැසකට සමාන හැඩය ඇත්තේය. අතැඟිලිවල මුල් පුරුකෙහි ඇති ඇට පණාබෙර බඳු හැඩය ඇත්තේය, මැද පුරුකෙහි ඇට නොපිරිපුන් කොස් ඇට වැනි හැඩය ඇත්තේය. අග පුරුකෙහි ඇට ඉඟිනි ඇට බඳු හැඩය ඇත්තේය. උගුරු දඬුවෙහි ඇට සත දඬුවෙහි විද පිළිවෙළින් අවුණා තුබූ හුණ කිලිල් මද බඳු හැඩය ඇත්තේය. යටිහනු ඇට කඹුරන්ගේ කුළුගෙඩියෙහි බැඳි යකඩ වළලු බඳු හැඩය ඇත්තේය. උඩු හනුඇට ගිරාතල බඳු හැඩය ඇත්තේය. ඇස් සිදුරු, නහස් සිදුරු ඇට ලොඳ ඉවත්කළ ලා තල් ඇට බඳු හැඩය ඇත්තේය, කන්සිළු ඇට කරනවැමියකුගේ දැළිපිහි කොපුවකට සමාන හැඩය ඇත්තේය. නළල හා කන්සිළුවලට ඉහළින් තළල්පට බඳනා අවකාශයෙහි ඇති ඇට සිඳ ගන්නාලද ගිතෙලින් පිරි කඩපටක් බඳු හැඩය ඇත්තේය. හිස්මුදුනෙහි ඇටය මුහුනත කැපූ වක්වූ පොල්ගෙඩියක් බඳු හැඩය ඇත්තේය. හිසෙහි ඇට එකට අමුණා තැබූ දැදුරු ලබු කබලක් බඳු හැඩය ඇත්තේය.

දිශා වශයෙන් ඇට උඩ යට දෙදිසාවෙහි හටගත්තේය. අවකාශ වශයෙන්, අවිශේෂයෙන් සියලු සිරුරෙහි පිහිටියේය. විශේෂයෙන් මේ ඇට අතුරෙන් හිස ඇට ගෙල ඇට මත පිහිටියේය, ගෙල ඇට කොඳු ඇට මත පිහිටියේය, කොඳු ඇට උකුල් ඇට මත පිහිටියේය, උකුල් ඇට කලවා ඇට මත පිහිටියේය, කලවා ඇට දණිස් ඇට මත පිහිටියේය, දණිස් ඇට කෙණ්ඩා ඇට මත පිහිටියේය, කෙණ්ඩා ඇට ගොප් ඇට මත පිහිටියේය, ගොප් ඇට පා ඇට මත පිහිටියේය. පරිච්ඡෙද වශයෙන් ඇතුළත ඇටමිදුලෙන්ද, පිටත මසින්ද අග හා මුල එකිනෙකින්ද පිරිසිඳියේය. මේ ඇට පිළිබඳ සභාග පරිච්ඡෙදයයි. විසභාග පරිච්ඡෙදය වනාහි කෙස් පිළිබඳ කීතියාම වේ.

**අට්ඨිමිඤ්ජා** යනු, ඒ ඒ ඇට ඇතුළත තිබෙන මිදුළුය. එය පැහැයෙන් සුදුය. හැඩයෙන් මහත් ඇට ඇතුළත හුණ නලයෙක බහාලූ තවනලද මහත් වේබඩ අගිස්සක් බඳු හැඩය ඇත්තේය, කුඩා කුඩා

ඇට ඇතුළත හුණ පුරුකෙක බහාලූ තවනලද සිහින් වේබඩ අගිස්සක් බඳු හැඩය ඇත්තේය, දිශා වශයෙන් උඩ යට දෙදිසාවෙහි හටගත්තේය. අවකාශ වශයෙන් ඇට ඇතුළත පිහිටියේය. පරිච්ඡෙද වශයෙන් ඇටවල ඇතුල් තලයෙන් පිරිසිඳියේය. මේ මෙහි සභාග පරිච්ඡේදයයි, විසභාග පරිච්ඡෙදය වනාහි කෙස් පිළිබඳව කීනයම වේ.

**වක්කං** යනු, එකට බැඳුණු මස්පිඩු දෙකෙකි. එය වර්ණ වශයෙන් මද රතු පැහැ වේ, එරබදු ඇටයෙක පැහැ ඇත්තේය. හැඩයෙන් දරුවන්ගේ කෙළිපන්දු යුවලක් බඳුය, නැතහොත් එක් නටුවෙකින් බැඳුණු අඹපල යුවලක් වැනිය. දිශාවශයෙන් උඩ දිශාවෙහි පිහිටියේය. අවකාශ වශයෙන් ගලවළුයෙන් නිකුත් එක් මුලක් ඇති, මදක් ගොස් දෙකට බෙදුණ මහ නහරයෙකින් බැඳී (වකුගඩු) හෘදයමාංශය සිසාරා සිටියේය. පරිච්ඡෙද වශයෙන් වකුගඩු එහි කෙළවරින් පිරිසිඳියේය, මේ මෙහි සභාග පරිච්ඡෙද වශයෙනි, විසභාග පරිච්ඡෙදය කෙස් පිළිබඳව කීනයම වේ.

**හදයං** යනු, හෘදය මාංශයයි. එයද පැහැයෙන් රත් පියුම් පතෙක පිටත බඳු පැහැ ඇත්තේය, හැඩයෙන් පිටතපෙති ගලවා පහතට හරවා තැබූ පියුම් කැකුළක් බඳුය, පිටතින් මට සිලුටුය. ඇතුළත වැටකොළු පලයෙක ඇතුල් පැත්ත බඳුය. නැණවතුන්ගේ හෘදය මදක් විකසිතවී සිටියි. මද නුවණ ඇත්තන්ගේ හෘදය හැකිලී සිටියි. එහි ඇතුළ දෙඹ ඇටයක් පිහිටන තරම් ආවාටයක් වේ, එහි අඩ පතක් පමණ ලෙහෙ පිරී ඇත්තේය. එය ඇසුරුකොට මනොධාතුවද, මනොවිඤ්ඤාණධාතුවද පවත්නේය. රාගචරිත ඇත්තහුගේ ලෙය රත් පැහැ වේ, ද්වේෂ චරිතයාගේ කළු පැහැ වේ, මොහචරිතයාගේ ලෙය මස් සේදූ ජලය බඳුවේ, තර්කචරිතයාගේ ලෙය කොල්ලු යුස බඳු පැහැ ඇත්තේය, ශ්‍රද්ධාචරිතයාගේ ලෙය කිණිහිරි මල් පැහැ ඇත්තේය, ප්‍රඥාචරිතයාගේ ලෙය පිවිතුරුය, පැහැදිලිය, නොකැලැත්ය, පඬුවන්ය, පිරිසුදුය, ඔප දමූ දරහමිණක් මෙන් ප්‍රභාවත්ව දිස්වේ. දිශා වශයෙන් උඩු දිසාවෙහි හටගත්තේය, අවකාශ වශයෙන් සිරුර ඇතුළත දෙතන මැදින් පිහිටියේය. පරිච්ඡෙද වශයෙන් හෘදය හෘදයභාගයෙන් පිරිසිඳියේය, මේ මෙහි සභාග පරිච්ඡෙදයයි, විසභාග පරිච්ඡෙදය කෙස් පිළිබඳව කී නයම වේ.

**යකනං** යනු (අක්මා නම්) මාංස පටල යුවලයි. එය පැහැයෙන් රතුය, පඬු පැහැයට හුරු වේ, ඉතා රතු නොවූ කුමුදු මල් පෙත්තෙක පිටත වැනි පැහැ ඇත්තේය. හැඩයෙන් මුලින් එක්ව අගින් යුවලක්ව සිටි කොබෝලීල පතකට සමාන හැඩය ඇත්තේය, එයද මඳ නුවණැත්තන්ගේ එකක්ම වේ, මහත් වේ. නුවණැත්තන්ගේ දෙකක් හෝ

තුනක්ව කුඩාවට පිහිටියේය, දිශාවශයෙන් උඩු දිශාවෙහි හටගත්තේය. අවකාශ වශයෙන් දෙතන අතර දකුණුපස ඇසුරුකොට සිටියේය. පරිච්ඡෙද වශයෙන් අක්මාව අක්මා කෙළවරින් පිරිසිඳියේය, මේ මෙහි සභාග පරිච්ඡෙදයයි. විසභාග පරිච්ඡෙදය කෙස් පිළිබඳව කී අයුරුම වේ.

**කිලොමකං** යනු, වැසුණු නොවැසුණු ලෙසින් දෙවැදෑරුම්ව වසාතෙල වැළඳ සිටින දලබුමසයි. ඒ දෙවැදෑරුම්වූම දලබුව වර්ණයෙන් දුහුල් කඩක් සෙයින් සුදුය, හැඩයෙන් එයට අයත් අවකාශයට සමාන වේ. දිශා වශයෙන්, වැසුණු දලබුව උඩු දිසාවෙහිද, අනෙක උඩුයටි දෙදිසාවෙහිද හටගත්තේය, අවකාශ වශයෙන් සැභවුණු දලබුව හෘදය හා වකුගඩුව වසාගෙන සිටියේය, නොසැභවුණු දලබුව මුළු සිරුර පුරා සමට යටින් මස් හා සමග බැඳී සිටියේය. පරිච්ඡෙද වශයෙන් යට මසින්ද, උඩ සමින්ද, සරස කිලොමකභාගයෙන්ද පිරිසිඳියේය. මේ මෙහි සභාග පරිච්ඡෙදයයි, විසභාග පරිච්ඡෙදය කෙස් පිළිබඳව කී අයුරුම වේ.

**පිහකං** යනු බඩදිව්මසයි, එය පැහැයෙන් නිකමල් කළඹක් මෙන් නිල්ය, දිගින් සතඟුලක් පමණ වේ. බන්ධනයක් නොමැත, කළු වස්සකුගේ දිවට සමාන හැඩය ඇත්තේය, දිසා වශයෙන් උඩු දිසාවෙහි හටගත්තේය, අවකාශ වශයෙන් හෘදයට වම් පසින් උදර පටලයට උඩු පැත්තෙන් පිහිටියේය. එය අවිපහරෙකින් පිටතට නිකුත් වුවහොත් ප්‍රාණීන්ගේ මරණය වන්නේය, පරිච්ඡෙද වශයෙන් බඩදිව් කෙළවරින් පිරිසිඳියේය, මේ මෙහි සභාග පරිච්ඡෙදයි, විසභාග පරිච්ඡෙදය කෙස් පිළිබඳව කී නයම වේ.

**පපඵාසං** යනු, මස් වැදලි දෙක තුනකට බෙදුණු පපුමසයි. එය වර්ණයෙන් රතුය, ඉතා නොපැසුණු දිඹුල් පලයෙක පැහැ ඇත්තේය, හැඩයෙන් නොසමකොට කපනලද මහ පූකඩක් බඳු හැඩය ඇත්තේය, ඇතුළත කෑ, පූ, අහරක් නැතිවිට නැඟෙන කර්මජ තේජොධාතුවෙන් (බඩ ගිනි වේගයෙන්) පහරනු ලැබීමෙන් හපා දමනලද පිදුරු පිඩක් සෙයින් වියලෙයි, මැලවී යයි; දිසා වශයෙන් උඩු දිසාවෙහි හටගත්තේ වේ. අවකාශ වශයෙන් සිරුර ඇතුළත දෙතන අතර හෘදය හා අක්මාව මතුපිට වසාගෙන එල්බෙමින් සිටියේය, පරිච්ඡෙද වශයෙන් පපු කෙළවරින් පිරිසිඳියේය, මේ මෙහි සභාග පරිච්ඡෙදයයි, විසභාග පරිච්ඡෙදය කෙස් පිළිබඳව කීනියාම වේ.

**අන්තං** යනු, පුරුෂයකුගේ දෙතිස්රියන් හා ස්ත්‍රියකගේ අටවිසිරියන් තරම් වූ එක්විසි තැනෙකින් නැමුණු අතුණුවැටියයි. එය වර්ණ වශයෙන්

සුදුය, දළ වැලි මුසු හුණු බදමයට සමාන පැහැ ඇත්තේය, හැඩයෙන් ලෙහෙ ඔරුවෙක නම නමා තැබූ හිස සුන් සර්පයකු බඳු හැඩය ඇත්තේය, දිසා වශයෙන් උඩු යටි දෙදිසාවෙහි හටගත්තේය, අවකාශ වශයෙන් උඩින් ගලවළෙන්ද, යටින් ගුද මාර්ගයෙන්ද බැඳී ඇති හෙයින් ගලවළුව හා ගුදය කෙළවරකොට සිරුරු ඇතුළත පිහිටියේය, පරිච්ඡෙද වශයෙන් අතුණු කෙළවරින් පිරිසිඳියේය, මේ මෙහි සභාග පරිච්ඡෙදයයි, විසභාග පරිච්ඡෙදය වනාහි කෙස් පිළිබඳව කීනයම වේ.

**අන්තගුණං** යනු, (අතුණු බහනි) නැමුණු තැන්වල ඇති බැමිය. එය වර්ණ වශයෙන් සුදුය, හෙල්මැලි මුලකට සමාන පැහැ ඇත්තේය, දිසා වශයෙන් උඩු යටි දෙදිසාවෙහි හටගත්තේය. අවකාශ වශයෙන් යන්ත්‍රයක් අදින විට යන්ත්‍ර පුවරු බැඳගෙන සිටින යන්ත්‍ර සූත්‍ර සෙයින්ද, පාබිස්සෙක දරණු මඩුල්ල එක්කොට ගොතා ඇති බහන් සෙයින්ද, උදලු පොරෝ ආදියෙන් කර්මාන්ත කරන්නවුන්ගේ අතුණු ගිලිහී යා නොදී එක්කොට බැඳගෙන අතුණු නැමි වියිඑක අතරතුර පිහිටියේය. පරිච්ඡෙද වශයෙන් අතුණු බහන් කෙළවරින් පිරිසිඳියේය, මේ මෙහි සභාග පරිච්ඡේදයයි, විසභාග පරිච්ඡෙදය කෙස් පිළිබඳව කීනියාම වේ.

**උදරියං** යනු, අනුභව කළ බත් ආදියද, පානය කළ දියර අහරද, කනලද කැවිලි ආදියද, ලොවිනලද මීපැණි ආදියද, ඇතුළු උදරයෙහි වූ දෑය. එය වර්ණ වශයෙන් වැළඳූ ආහාරයෙහි වර්ණ ඇත්තේය. හැඩයෙන් පෙරහන්කඩක් තුළ ලිහිල්කොට බහනලද සහලට සමාන හැඩය ඇත්තේය. දිසා වශයෙන් උඩු දිසාවෙහි හට ගත්තේය, අවකාශ වශයෙන් උදරය තුළ සිටියේය. උදරය නම් දෙකොණින් මිරිකනලද තෙත් සළුවෙක සුළං හිරවීමෙන් හටගත් ගෝලාකාරවූ ආන්ත්‍රපටලයයි. එය පිටතින් මට සිලුටුය. ඇතුළත මස්, කසල වැසීමෙන් කිලිටිවී ගිය පොරෝනා කඩෙක හටගත් පුස් රැසක් බදුය, කුණුවී ගිය කොස් කටුවෙක ඇතුළත බඳුයයි කියනුද වටී. එහි තක්කෝටකය, ගණ්ඩුප්පාදකය, තාලහීරකය, සූචිමුඛකය, පටතන්තුකය, සුත්තකය යන මේ ආදී දෙතිස් කුලයෙක කෘමි ජාතීහු ආකුල ව්‍යාකුලව, මුළු මුළුව, හැසිරෙමින් වෙසෙති. ඒ කෘමීහු පාන භෝජන ආදිය නැති කල්හි පිටතට අවුත් හඬ දෙමින් හෘදයමාංශය සපා කති, පාන භෝජනාදිය වළඳනවිට උඩට නැගී පළමුවෙන් වැළඳූ දෙතුන් පිඩක් යුහු යුහුව පැහැර ගනිති. එම උදරයම ඒ පණුවන්හට තිඹිරිගෙයද, වැසිකිළියද, ගිලන්හලද, සොහොන්බිමද වේ, යම්සේ වනාහි සැඩොල් ගම්දෙර ගවරවළකට නියං කලෙක දළපොද සහිත වැසි වස්නාවිට ජලයට ගසා ආ මල මූත්‍ර ආදියද, සම් ඇට නහර කැබලිද,

කෙළ, සොටු ලෙහෙ ආදී නොයෙක් කුණප කොටස්ද වැටී මඩ ගොහොරු දියෙන් කැළඹී දෙතුන් දිනක් ඉකුත්ව ගිය කල, පණුවන් හටගෙන ඉර අවු වේගයෙන් රත්වී මතුපිට පෙණ බුබුලු නංවමින්, ඉතා නිල්වන්ව, ඉතා දුගඳව, පිළිකුල්ව, ළඟට එළඹීමට හෝ, දැකීමට හෝ නුසුදුසු බවට පත්ව සිටීද, ආඝ්‍රාණය පිණිස හෝ ආස්වාද පිණිස කැලම නොසුදුසුව සිටීද, එසේම නොයෙක් ප්‍රකාරවූ පාන භෝජනාදිය දත් නමැති මොහොලින් සුණු විසුණුව, දිව නමැති අතින් පෙරළන ලදුව, (දිව අග) තුනී කෙළවලින් හා (දිව මුල ලාලා නම්) බොල් කෙළවලින්ද, මුසුව එකෙණෙහිම වර්ණ ගන්ධ රස ආදී සම්පතින් පිරිහී පෙහෙරුන්ගේ ගල්ඔරුවෙක්හි දමනලද බලු වමනය හා සමාන බවට පත්ව පිත් සෙම් වාත යන මෙයින් මුසුව බඩගිනි වේගයෙන් රත්වී පණු කුලයන්ගෙන් ආකුලව, මතු මත්තෙහි පෙණ බුබුලු නංවමින් ඉතා දුගඳ පිළිකුල් බවට පත්ව සිටියි. එය ගැන ඇසූ පමණින් පැන් බොජුන් ආදිය අප්‍රිය බවට පත්වේ, පැනැසින් බැලූවිට කැලම අප්‍රියබවට පත්වේ. තවද එම උදරයෙහි වැටුණු පැන් බොජුන් ආදිය පස් ආකාරයකට බෙදීයෙයි, එක් කොටසක් පණුවෝ කති, එක් කොටසක් බඩගින්නෙන් දැවී යයි. එක් කොටසක් මූත්‍රා බවටද, එක් කොටසක් මල බවටද පත්වේ. එක් කොටසක් පමණක් රස බවට පත්ව ලෙහෙ මස් ආදිය වඩයි. පරිච්ඡෙද වශයෙන් උදර පටලයෙන්ද උදරිය කෙළවරින්ද පිරිසිඳියේය. මේ මෙහි සභාග පරිච්ඡෙද වශයෙනි, විසභාග පරිච්ඡෙදය වනාහි කෙස් පිළිබඳව කී නියාම වේ.

**කරීසං** යනු මලයි, එය වර්ණයෙන් බොහෝ සෙයින් වැළඳූ ආහාරයෙහි වර්ණයම වේ, හැඩයෙන් අවකාශයට අනුරූපවූ හැඩය ඇත්තේය, දිසා වශයෙන් යටි දිසාවෙහි හටගත්තේය, අවකාශ වශයෙන් පක්වාශයෙහි සිටියේය. නාභියෙහි පහළ කොටස හා කොඳු ඇට පෙළ මුල අතර ආන්ත්‍රයෙහි කෙළවර පටන් උසින් අටඟුලක් පමණවූ හුණ නලයක් බඳු වූයේ පක්වාශයයි. එහි වනාහි, යම්සේ ඉහළ බිම් පෙදෙසක වට වැසිදිය ගලා අවුත් පහළ බිම් පෙදෙස් පුරා සිටීද, එසේම ආමාශයෙහි වැටුණු කිසි පානභෝජන ආදියක් බඩ ගින්නෙන් පෙණ නැහෙමින් පැසී ඇඹරුම් ගලෙහි අඹරන ලද්දක් සෙයින් සිලුටු බවට පැමිණ අතුණු සිදුරෙන් පහළට බැස මැඩගෙන හුණ පුරුකක් තුළ බහා ලනලද පඩුවන් මැටි මෙන් රැස්ව සිටියේය. පරිච්ඡේද වශයෙන් එය පක්වාශය පටලයෙන්ද, කරීස කෙළවරින්ද පිරිසිඳියේය, මේ මෙහි සභාග පරිච්ඡේදයයි. විසභාග පරිච්ඡේදය කෙස් පිළිබඳව කීනියාමය.

**මත්ථලුඞ්ගං** යනු, හිස් කබල ඇතුළත පිහිටි මිදුලු රැසයි, එය වර්ණයෙන් සුදුය, හතු රැසකට සමාන පැහැ ඇත්තේය, දී බවට නොපැමිණ පිළුණුවූ කිරකට බඳු පැහැ ඇත්තේයයි හෝ කියනු වටී, හැඩයෙන් එහි අවකාශයට අනුරූපවූ හැඩය ඇත්තේය, දිසා වශයෙන් උඩු දිසාවෙහි හටගත්තේ වේ, අවකාශ වශයෙන් හිස් කබල ඇතුළත ගෙත්තම් මාර්ග සතරක් තුළ එක්කොට තබනලද පිටිගුලි සතරක් සෙයින් එක්ව බැදී සිටියේය, පරිච්ඡේද වශයෙන් හිස් කබල ඇතුළත තලයෙන්ද හිස්මුළ කෙළවරින්ද පිරිසිඳියේය. මේ මෙහි සභාග පරිච්ඡේදයයි, විසභාග පරිච්ඡේදය කෙස් පිළිබඳව කීනයම වේ.

**පිත්තං** යනු, බැඳුණු පිතය, නොබැඳුණු පිතයයි පිත දෙවැදෑරුම් වේ, එහි බැඳුණු පිත වර්ණ වශයෙන් ගන මීතෙල් බඳු පැහැ ඇත්තේය. නොබැඳුණු පිත මැලවුණු රණවරා මල් බඳු පැහැ ඇත්තේය, හැඩයෙන් බැඳුණු නොබැඳුණු දෙ-පිතම අවකාශයට අනුරූපවූ හැඩය ඇත්තේය, දිසා වශයෙන් නොබැඳුණු පිත කෙස් ලොම් නිය දත් ආදී මසින් තොර පෙදෙස් හා තද වියලි සමද හැර, දිය මත තෙලිත්තක් මෙන් සෙසු සිරුර පුරා විසිර සිටියේය, එය කිපි කල්හි ඇස් කසාවන් වේ, සිරුර බමන්නට ගනියි, සැලෙයි, කසයි. බැඳුණු පිත හෘදය පපුමස යන දෙකට අතරින් අක්මාව ඇසුරුකොට පිහිටි මහ වැටකොළු වහල්ලක් සෙයින් පිත්තාශයෙහි පිහිටියේය. එය කිපි කල්හි සත්වයෝ උමතුවෙති, පෙරළුණ සිත් ඇතිව, හිරිඔතප් නැතිව නොකටයුතු කෙරෙති, නොතෙපලියයුතු බස් තෙපලති, නොසිතිය යුතු සිතුම් සිතති. පරිච්ඡේද වශයෙන් පිත් කෙළවරින් පිරිසිඳියේය. මේ මෙහි සභාග පරිච්ඡේදයයි, විසභාග පරිච්ඡේදය කෙස් පිළිබඳව කී නයම වේ.

**සෙම්හං** යනු, සිරුර ඇතුළත පාත්‍රයක් පිරෙන තරම්වූ සෙමයි. එය වර්ණයෙන් සුදුය. කැලිය පත් යුස බඳු පැහැ ඇත්තේය, හැඩයෙන් අවකාශයට අනුරූපවූ හැඩය ඇත්තේය, දිසා වශයෙන් උඩු දිසාවෙහි හටගත්තේය, අවකාශ වශයෙන් උදර පටලයෙහි සිටියේය, යම්සේ ජලය මතුපිට ඇති සෙවෙල් පටලය දඬුවක් හෝ කැට කැබිලිත්තක් හෝ වැටෙනවිට කැඩී දෙකට බෙදී ගොස් යලි එක්ව පැතිර සිටීද, එසේම පැන් බොජුන් ආදිය වැටෙනවිට එය දෙබෑව ගොස් යලි එක්ව පැතිර සිටී. තවද එය මඳවූ කල පැසුණු ගඩක් සෙයින්ද, කුණුවූ කුකුළු බිජුවක් සෙයින්ද උදරය ඉතා පිළිකුල් දනවන කුණු ගඳ ඇත්තේ වේ. එයින් නැඟුණ දුගඳින් යුත් උද්රේකය (රාමතෙල් නැඟ ඒම) නිසා මුඛයද පිළිකුල් කුණපයක් බඳු වේ. එම පුරුෂයාද "ඉවත් වෙව, දුගඳ

වහන්නෙහිය'යි කිවයුතු බවට පත් වන්නේය. එය වැඩී ගනබවට පත්වූ කල වැසිකිළි පියන් පතක් මෙන් උදර පටලය ඇතුළතම කුණුගඳ ඔබාගෙන සිටියි. පරිච්ඡේද වශයෙන් සෙම් කොටසින්ම පිරිසිඳියේය. මේ මෙහි සභාග පරිච්ඡේදයි-පෙ-

**පුබ්බො** යනු, (කුණුව ගිය ලෙහෙ වශයෙන් පැවති එය) ඉදුණු කොළ වැනි පැහැඇති පූයාව (සැරව)යි. මෘත ශරීරයෙහි වනාහි එය කුණුවී ගනබවට පත් කැඳක් බඳු පැහැ ඇත්තේය, හැඩයෙන් අවකාශයට සමාන හැඩය ඇත්තේය, දිසා වශයෙන් උඩුයටි දෙදිසාවෙහි සිටියේය, අවකාශ වශයෙන් වනාහි පූයාවට නියමිත අවකාශයෙක් නැත, යම් තැනෙක එය රැස්ව සිටීද, යම් යම් තැනෙක කණු කටු අවි ගිනිදැල් ආදියෙන් පැරුණු සිරුරු කොටස්හි ලේ රැස්ව පැසවයිද, ගඩ පොළ ආදිය හෝ උපදීද, ඒ ඒ තැන්හි සිටියි. පරිච්ඡේද වශයෙන් පූයා කොටස් වශයෙන්ම පිරිසිඳියේය. මේ මෙහි සභාග-පෙ-

**ලොහිතං** යනු, රැස්ව සිටි ලෙහෙය, සැරිසරන ලෙහෙයයි දෙවැදෑරුම්වූ රුධිරයයි. එහි රැස්ව සිටි ලෙය කකාරවනලද ගන ලහ (ලාකෂා) බඳු පැහැ ඇත්තේය, සැරිසරන ලෙය පැහැදි ලාකඩ දියර බඳු පැහැ ඇත්තේය. හැඩයෙන් මේ දෙකම අවකාශයට අනුරූපවූ හැඩය ඇත්තේ වේ. දිසා වශයෙන් රැස්ව සිටි ලෙය උඩු දිසාවෙහිද අනෙක උඩු යටි දෙදිසාවෙහිද සිටියේය. අවකාශ වශයෙන් සැරිසරන ලෙය කෙස් ලොම්, දත්, යන මෙහි මසින් තොර තැන් හා තද වියලි සම්ද හැර, ධමනීජාලයට අනුව සියලු ජීවමාන සිරුර තුළ පැතිර සිටියේය. රැස්වූ ලෙය අක්මාවෙහි යටි පෙදෙස පුරා සිටියේය, එක් පාත්‍රයක් පිරෙන තරම්වූ එය හෘදය, වකුගඩු, පපුමස යන අවයව මත්තෙහි මඳ මඳව වැගිරෙමින් වකුගඩු, හෘදය, අක්මා, පපුමස යන මේවා තෙමමින් සිටියේය. එම වකුගඩු හෘදය ආදිය නොතෙමෙන විට සත්වයෝ පිපාස ඇත්තෝ වෙති. පරිච්ඡේද වශයෙන් ලෝහිත කොටසින්ම පිරිසිඳියේය. මේ මෙහි සභාග-පෙ-

**සෙදො** යනු, රෝම කූපාදියෙන් වැගිරෙන ආපොධාතුවයි. එය වර්ණයෙන් පැහැදි තලතෙල් පැහැ ඇත්තේය, හැඩයෙන් අවකාශයට සමාන හැඩය ඇත්තේය, දිසා වශයෙන් උඩු යටි දෙදිසාවෙහි සිටියේය, අවකාශ වශයෙන් දහදියට ලෙයට මෙන් නිබඳව පවත්නා නිශ්චිත තැනෙක් නැත, යම් කලෙක වනාහි ගින්නෙන් තැවීම, ඉර අව්වෙන් තැවීම, සෘතුවිපර්යාස ආදිය හේතුකොටගෙන සිරුර උණුසුම් වේද, එකල දියෙන් ගොඩ නැගූ පමණින් නොමටකොට සිඳිනලද නෙළුම්දළි

කුමුදුදඬු කළඹක් සෙයින්ම සියලු කෙශකූප රොමකූප සිදුරු තුළින් වැගිරෙයි. එහෙයින් එහි හැඩයද කෙශකූප රොමකූප විවර අනුවම වෙතැ'යි දතයුතුය. සෙදය (හෙවත් දහදිය) නිමිති වශයෙන් ගන්නා යෝගාවචරයා විසින්ද කෙශ රොමකූප විවරයන් පිරී සිටින ලෙසින්ම සෙද කොට්ඨාසය මෙනෙහි කළයුතුය. පරිච්ඡෙද වශයෙන් සෙද කොට්ඨාස වශයෙන්ම පිරිසිඳියේය, මේ මෙහි සභාග-පෙ-

**මෙදෙ** යනු, ඝන බවට පත් (මිදුණු) තෙලයි. එය වර්ණයෙන් පලනලද කහ අත්තකට සමාන පැහැ ඇත්තේය. හැඩයෙන් තර සිරුරු ඇත්තහුගේ සම් හා මස් අතර තබනලද කහ පැහැති දුහුල් රෙදි කඩක් බඳු හැඩය ඇත්තේය, කෙසඟ සිරුරු ඇත්තහුගේ කෙණ්ඩා මසය, කලවා මසය, කොඳු ඇටය ඇසුරුකොට ඇති පිට මසය, බඩවත මසය, යන මේවා ඇසුරු කොට දෙපට තුන්පට කොට තබනලද කසාවත් රෙදි කඩක් බඳු හැඩය ඇත්තේය, දිසා වශයෙන් උඩු යටි දෙදිසාවෙහි පිහිටියේය, අවකාශ වශයෙන් තර සිරුරු ඇත්තහුගේ මුළු සිරුර පුරා පැතිර සිටියේය. කෙසඟ සිරුරු ඇත්තහුගේ කෙණ්ඩා මස් ආදිය ඇසුරුකොට සිටියේය. තෙල්යයි කියනු ලබන නමුදු ඉතා පිළිකුල් වන හෙයින් හිස ගැල්වීම පිණිස හෝ නස්‍ය පිණිස හෝ නොගනිත්. පරිච්ඡෙද වශයෙන් යට මසින්ද උඩ සමින්ද සරස මේදයෙන්මද පිරිසිඳියේය, මේ මෙහි-පෙ-

**අස්සු** යනු, ඇස්වලින් වැගිරෙන ආපො ධාතුවයි. එය වර්ණයෙන් පැහැදි තලතෙල් බඳු පැහැ ඇත්තේය, හැඩයෙන් අවකාශයට අනුරූපවූ හැඩය ඇත්තේය. දිසා වශයෙන් උඩු දිසාවෙහි පිහිටියේය. අවකාශ වශයෙන් අක්ෂිකූප තුළ සිටියේය. පිත්ත කොෂයෙහි පිත මෙන් මෙය අක්ෂිකූපයෙහි සිටියේ නොවේ. යම් කලෙක වනාහි සත්වයෝ සොම්නස්ව මහ සිනා සෙත්ද, දෙම්නස්ව හඬත්ද, වැලපෙත්ද, එසේම විෂම ආහාර බුදිත්ද, යම් කලෙක ඔවුන්ගේ ඇස් දුම්, දූවිලි, පස් ආදිය වැදී පෙළේද, එකල මේ සොම්නස්, දෙම්නස්, විෂමාහාර, ඍතු ආදිය හේතුකොට නැගී අක්ෂිකූපයන් පුරා සිටියි, නැතහොත් වැගිරෙයි. අස්සු කොට්ඨාසය නිමිතිකොට ගන්නා යෝගාවචරයා විසින් වනාහි අක්ෂිකූපයන් පුරා සිටි ආකාරයෙන්ම ගතයුතුය. පරිච්ඡෙද වශයෙන් අස්සු කොට්ඨාසයෙන්ම පිරිසිඳියේය. මේ මෙහි සභාග-පෙ-

**වසා** යනු විරුණු තෙලයි. එය වර්ණයෙන් පොල්තෙල් පැහැ ඇත්තේය. හුළු කැඳෙහි ඉසිනලද තෙලෙහි පැහැ ඇත්තේයයිද කියනු ලැබේ. හැඩයෙන් නහනකල පැදිදිය මතුපිට බමන තෙල් බිංදු විසිර

සිටියා වැනි හැඩය ඇත්තේය. දිසා වශයෙන් උඩු යටි දෙදිසාවෙහි පිහිටියේය, අවකාශ වශයෙන් අතුල් පිටිඅතුල්, පතුල්, පිටිපතුල්, නහස්පුඩු, නළල්, දසරු යන තන්හි බොහෝ සෙයින් සිටියේය. මෙය මෙකී තන්හි සැම විටම විරී (හුණුවී) සිටිනේ නොවේ, යම් කලෙක ගින්නෙන් හෝ හිරුරැසින් තැවීම, ඍතුවිපර්යාස ධාතුවිපර්යාස ආදියෙන් එම පෙදෙස් උණුසුම් වේද, එකල එතන්හි නහන කල පැහැදි දියපිට තෙල් බිඳු විසිරී සිටියාසේ ඔබ මොබ හැසිරේ, පරිච්ඡේද වශයෙන් වසා-කොටසින්ම පිරිසිඳියේය. මේ මෙහි සභාග-පෙ-

**ඛෙළො** යනු, මුඛය තුළ සිටි පෙණ මුසු ආපො ධාතුවයි, එය වර්ණයෙන් සුදුපෙණ බඳු පැහැ ඇත්තේය, හැඩයෙන් අවකාශයට අනුරුපවූ හැඩය ඇත්තේය. පෙණ බඳු හැඩය ඇත්තේයයිද කියනු වටී, දිසා වශයෙන් උඩු දිසාවෙහි හටගත්තේ වේ. අවකාශ වශයෙන් දෙකොපුල් පසින් (කම්මුල් දෙපැත්තෙන්) බැස දිවෙහි සිටියේය, මෙය මෙතන්හි සැම විටම එක් රැස්ව සිටියේ නොවේ, යම් කලෙක වනාහි සත්වයෝ උණුසුම් හෝ තිත්ත හෝ කටුක හෝ ලවණ හෝ අම්ල හෝ කිසියම් අහරක් දිව මත තබත්ද, නැතහොත් එවැනි අහරක් දකිත්ද, සිහි කරත්ද, නැතහොත් ඔවුන්ගේ හෘදය ක්ලාන්ත වේද, නැතහොත් කිසියම් දෙයක් කෙරෙහි පිළිකුල උපදීද, එකල කෙළ හටගෙන දෙකොපුල් පසින් (කම්මුල් දෙපසින්) බැස දිවෙහි සිටියි. දිව'ගෙහි සිටියහොත් තුනීවේ, දිවමුල සිටියහොත් ගනවේ, මුවතුළ තැබූ අත්සුණු හෝ සහල් හෝ අන්කිසි කැවිලි වෙසෙසක් හෝ ගංතලා වැල්ලෙහි සාරනලද ලිදෙක ජලය මෙන් සිඳී නොගොසින්ම තෙමනු සමත්වේ. පරිච්ඡේද වශයෙන් ඛෙළ කොට්ඨාසයෙන්ම පිරිසිඳියේය. මේ මෙහි සභාග-පෙ-

**සිඞ්ඝාණිකා** යනු, හිස් මුලින් වැගිරෙන මල (හෙවත් සොටු)ය. එය වර්ණයෙන් ලා තල් ලොදකට බඳු පැහැ ඇත්තේය, හැඩයෙන් අවකාශයට අනුරුපවූ හැඩය ඇත්තේය, දිසා වශයෙන් උඩු දිසාවෙහි සිටියේය, අවකාශ වශයෙන් නාසාපුට පුරා සිටියේය, එය සැම විටම මෙහි රැස්ව සිටිනේ නොවේ, යම්සේ පුරුෂයෙක් තෙමේ පියුම් පතෙක දී අසුරා යට කටුවෙකින් විදියිද, එවිට ඒ සිදුරෙන් දී කැළඹී දිය පිටතට වැගිරෙන්නේද, එසේම සත්වයන් වැලපෙනවිට හෝ ආහාර ඍතු ආදිය විෂමවීමෙන් ධාතූන් කැළඹුණවිට හෝ කුණු සෙම් බවට පත් හිස්මුල වැගිරී උඩු තල්ලෙහි ඇති විවරයෙන් බැස නාසාපුට පුරා සිටියි, නැතහොත් වැගිරෙයි. සොටු නම්වූ මේ කුණප කොට්ඨාසය නිමිති වශයෙන් ගන්නා යෝගාවචරයා විසින් නාසාපුට පුරා සිටින අයුරින්ම

ගතයුතුය. පරිච්ඡේද වශයෙන් සිඞ්ඝාණිකා කොට්ඨාසයෙන්ම පිරිසිඳියේය. මේ මෙහි සභාග-පෙ-

**ලසිකා** යනු, සිරුරු සන්ධීන් ඇතුළත ඇති සඳමිදුලු නම් ලිස්සන සවරූප ඇති කුණප කොට්ඨාසයයි. එය වර්ණයෙන් කිණිහිරි ලාටු බඳු පැහැ ඇත්තේය, හැඩයෙන් අවකාශයට අනුරූපවූ හැඩය ඇත්තේය, දිසා වශයෙන් දෙදිසාවෙහිම පිහිටියේය, අවකාශ වශයෙන් ඇට සන්ධීන් ලිහිසි කරමින් එක්සිය අසූවක් ඇට සන්ධීන් ඇතුළත සිටියේය. යමකුහට මේ සඳමිදුලු මඳවේද, ඔවුන් නැගී සිටිනවිටද, හිඳිනවිටද, ඉදිරියට යනවිටද, ආපසු එනවිටද, හකුලනවිටද, දිගහරිනවිටද ඇට 'කට කට' යනුවෙන් හඬ නංවයි. අසුරුසන් කරමින් මෙන් ඇවිදියි. ඔහු එක් යොදුන් දෙ-යොදුන් පමණවූද ගමනක් ගියවිට වායො ධාතුව කිපේ, ගාත් රිදුම් දේ. යමකුට එය බහුල වේනම්, ඔහුට නැගිටීම් හිඳීම් ආදියෙහිදී ඇට 'කට කට' හඬ නොනංවයි. දිග ගමනක් ගියද වායොධාතුව නොකිපෙයි, ගාත් රිදුම් නොදෙයි. පරිච්ඡේද වශයෙන් ලසිකා කොට්ඨාසයෙන්ම පිරිසිඳියේය. මේ මෙහි සභාග-පෙ-

**මුත්තං** යනු උඳු තැම්බූ දියට සමාන වර්ණ ඇති මූත්‍රයි. හැඩයෙන් මුවවිට යටිකුරු කොට තැබූ කළයක් ඇතුළත තිබෙන දියට සමාන හැඩය ඇත්තේය, දිසා වශයෙන් යටිදිසාවෙහි හටගත්තේ වේ, අවකාශ වශයෙන් වස්තිය ඇතුළත සිටියේය. වස්ති යනු වස්තිපුටයයි කියනු ලැබේ. යම්සේ ගවරවළෙක ඔබනලද මුඛයක් නැති යවනසටයක් තුළට එම ගවරවළෙහි දිය වදීද, එයට දිය ඇතුළුවන මඟක් නොපෙනේද, එසේම සිරුරෙන් එම වස්තිපුටය තුළට මූත්‍රය වදියි, එය වදනා මඟක් නොපෙනේ. නික්මෙන මඟ පමණක් ප්‍රකට වේ. එම වස්තිපුටය මූත්‍රයෙන් පිරීගිය විට 'මූත්‍ර කරම්හයි' සත්වයනට හැඟීමක් පහළ වේ. පරිච්ඡේද වශයෙන් වස්ති අභ්‍යන්තරයෙන් හා මූත්‍ර කොට්ඨාසයෙන් පිරිසිඳියේ වේ. මේ මෙහි සභාග පරිච්ඡේදයයි-පෙ-

මෙසේ කෙසාදී දෙතිස් කුණප කොට්ඨාසයන් කෙරෙහි වර්ණ, සණ්ඨාන, දිසා, ඔකාස, පරිච්ඡේද යන මේ පස් ආකාරයෙන් ව්‍යවස්ථාපනය කොට අනුපුබ්බතො (පිළිවෙළින්) නාතිසීඝතො (ඉතා යුහුනොව) ආදී නයින් වර්ණ, සංස්ථාන (හැඩය), ගන්ධ, ආශය, අවකාශ වශයෙන්ද පස් ආකාරයෙකින් 'පටික්කූලා පටික්කූලා' (පිළිකුල, පිළිකුලැයි) මෙනෙහි කරනවිට ප්‍රඥප්ති ඉක්මවීම අවසන්හි, යම්සේ ඇස් ඇති පුරුෂයකුහට දෙතිසක් පැහැ ඇති මලින් එක් හුයෙක්හි

ගොතනලද මල්දමක් බලනවිට සියලු මල් පෙර පසු නොව එකවිට (සමස්තයක් වශයෙන්) ප්‍රකට වේද, එසේම 'අත්ථි ඉමස්මිං කායෙ කෙසා' යන ආදී නයින් මේ කය දෙස බලනවිට කෙශාදීවූ ඒ සියල්ල පෙර පසු නොව එකවිට (සමස්තයක් ලෙසින්) ප්‍රකට වේ. එහෙයින් මනසිකාර කොසල්ලයෙහිදී යට කීපරිදි ආධුනිකයා 'කෙසා'යි මෙනෙහි කරනවිට එම මනස්කාරය දිවගොස් 'මුත්තං' යන අවසාන කුණප කොට්ඨාසය පැහැර සිටින්නේයයි කියනලදි. ඉදින් බාහිර කයක් කෙරෙහි මනස්කාරය එළවා නම්, එවිට ඔහුට සියලු කුණප කොට්ඨාසයන් ප්‍රකටවූ කල්හි ඇවිදින මිනිස් තිරිසන් ආදීහු සත්වස්වභාවය හැර කුණප කොටස් රැසක් ලෙසින්ම වැටහෙති. එම මිනිස් තිරිසන් ආදීන් විසින් වළඳනු ලබන පැන් බොජුන් ආදියද කුණප කොට්ඨාසයන් තුළ බහා ලන්නාසේ වැටහේ. ඉක්බිති ඒ යෝගාවචරයාහට යටකී ආකාරයෙන් අනුපුබ්බමුඤ්චනාදී (පිළිවෙළින් එකක් එකක් හැරීම්) වශයෙන් පිළිකුල පිළිකුලැයි නැවත නැවත මෙනෙහි කරත්ම ක්‍රමයෙන් අර්පණා උපදී. එහිදී කෙශාදිය පිළිබඳ වණ්ණ-සණ්ඨාන-දිසා-ඔකාස-පරිච්ඡෙද වශයෙන් වැටහීම උග්ගහනිමිත්තයි. සකලාකාරයෙන්ම පිළිකුල් වශයෙන් වැටහීම පටිභාගනිමිත්තයි. එම පටිභාගනිමිත්ත සේවනය කරනවිට, වඩන විට, අසුභ කර්මස්ථානයෙහි යට කියනලද නයින්ම ප්‍රථමධ්‍යාන වශයෙන්ම අර්පණා උපදී. යම් කෙනකුහට එක්ම කුණප කොට්ඨාසයක් ප්‍රකට වේනම්, නැතහොත් එක් කුණප කොට්ඨාසයෙක්හි අර්පණාවට පැමිණ නැවත අන් කොට්ඨාසයෙක්හි භාවනායෝග නොකෙරේනම්, ඒ යෝගාවචරයාහට එක්ම අර්පණාවක් උපදී, යම් යෝගාවචරයකුට නොයෙක් කුණප කොටස් ප්‍රකට වේනම්, නැතහොත්, එක් කොට්ඨාසයෙක්හි අර්පණාවට පැමිණ පසු නැවත සෙසු කොට්ඨාසයන් කෙරෙහි යෝග කෙරේනම් ඔහුට මල්ලක තෙරුන්හට මෙන් එම කොටසක් කොටසක් පාසා ප්‍රථමධ්‍යානය නැවත නැවත උපදී. එම ආයුෂ්මත්හු වනාහි දීඝභාණක අභය තෙරුන්ගේ අත අල්වාගෙන, ආයුෂ්මතුනි මේ පැනය උගනුයැයි කියා මෙපවත් පැවසූහ. මල්ලක තෙරණුවෝ දෙතිස් කුණප කොට්ඨාසයන්හි ප්‍රථම ධ්‍යාන දෙතිසක් ලද්දාහු වෙති. ඉදින් රැයෙහි එක් ධ්‍යානයක්ද, දහවල්හි එක් ධ්‍යානයක්ද, සමවදිතොත් නැවත එම ධ්‍යානයට පැමිණෙන්නේ අඩමසකට අධික කාලයෙකිනි, ඉදින් එක් දිනකට එක් ධ්‍යානයකට සමවදිතොත්, පටන්ගත් ධ්‍යානයට නැවත පැමිණෙනුයේ මසකට (දෙදිනක්) අධික කාලයෙකිනි. මෙසේ ප්‍රථම ධ්‍යාන වශයෙන් සමෘද්ධවන මෙම කර්මස්ථානය වර්ණ-සංස්ථාන ආදිය පිළිබඳ ස්මෘති බලයෙන් සිද්ධවන හෙයින් කායගතාසතියයි කියනු ලැබේ. මෙම කායගතාසති භාවනාවෙහි නියැලුණ භික්ෂු තෙමේ (කුසල්

විෂයෙහි) අනභිරතිය හා (පංචකාම විෂයෙහි) අභිරතිය මැඩලයි, එම අනභිරතිය හෝ අභිරතිය ඔහු අභිභවනය කරන්නේ නොවේ, උපන්නාවූද අනභිරතිය හෝ අභිරතිය මැඩලමින් විහරණය කරයි. බිය හා තැතිගැනීම් මැඩ පවත්වා ගනියි, බිය හෝ තැතිගැනීම ඔහු නොමැඩලයි, උපන්නාවූද බිය හා තැතිගැනීම් මැඩලමින් විහරණය කෙරේ. ශීත හා උෂ්ණය ඉවසනු සමත් වේ -පෙ-මරණීය උපද්‍රවයන් පවා ඉවසනු සමත්වේ. කේශාදිය පිළිබඳ වර්ණභේදය නිමිතිකොට චතුර්-ධ්‍යානයන් ලබන්නෙක් වේ, ෂඩ්අභිඥාවන් අවබොධ කරයි.

තස්මා හවෙ අප්පමත්තො අනුයුඤ්ජෙථ පණ්ඩිතො
එවං අනෙකානිසංසං ඉමං කායගතාසතිං.

එහෙයින් නුවණැත්තේ ඒකාන්තයෙන් අප්‍රමාදව මෙවන් නොයෙක් ආනිසංස ඇති කායගතාසති කර්මස්ථානයෙහි නියැලෙන්නේය.

**මේ කායගතාසති භාවනාව පිළිබඳ විස්තරකථායි.**

## ආනාපානසති කර්මස්ථානය

ඉක්බිත්තෙන්, භාග්‍යවතුන් වහන්සේ විසින්, "මහණෙනි, මේ ආනාපානසති සමාධිය වූකලී වඩනාලද්දේ, පුරුදු කරනලද්දේ, ශාන්තද ප්‍රණීතද වන්නේය, නොවිසුරුණේද සුඛවිහරණ ඇත්තේද වන්නේය, උපන් උපන් පාපක අකුශල ධර්මයන් ලත්තැනම අතුරුදහන් කරවන්නේය, ශමනය කරවන්නේය"යි[1] මෙසේ ප්‍රශංසා කොට, මහණෙනි, ආනාපානසති සමාධිය කෙසේ වඩනාලද්දේ, කෙසේ පුරුදු කරනලද්දේ ශාන්තද ප්‍රණීතද, වන්නේද? නොවිසුරුණේද සුඛවිහරණ ඇත්තේද වන්නේද? උපන් උපන් පාපක අකුශල ධර්මයන් ලත් තැනම අතුරුදහන් කරවන්නේද? ශමනය කරවන්නේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ අරණට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ පාලු ගෙයකට ගියේ හෝ පලඟ බැඳ, උඩුකය ඍජුව පිහිටුවාගෙන සිහි පෙරටුකොට පිහිටුවාගෙන හිඳියි, හේ තෙමේ සිහි ඇතිවම ආශ්වාස කරයි, සිහි ඇතිවම ප්‍රශ්වාස කරයි, දිගුව ආශ්වාස කරන්නේ දිගුව ආශ්වාස කෙරෙමියි දනියි, දිගුව ප්‍රශ්වාස කරන්නේ හෝ දිගුව ප්‍රශ්වාස කෙරෙමියි දනියි, කෙටිව හෝ ආශ්වාස කරන්නේ කෙටිව-පෙ-ප්‍රශ්වාස කරන්නේ කෙටිව ප්‍රශ්වාස කෙරෙමියි දනියි, මුළුකයම විදිමින් ආශ්වාස කෙරෙමියි හික්මෙයි. කායසංස්කාරය ශමනය කරමින් ආශ්වාස කෙරෙමියි හික්මෙයි,

(1) සං. නි. ආනාපානසති සං. - S v 321ff.

කායසංස්කාරය ශමනය කරමින් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි, පීතිය විඳිමින්-පෙ-සුඛය විඳිමින් චිත්තසංස්කාරය විඳිමින්-පෙ-චිත්ත සංස්කාරය ශමනය කෙරෙමින්-පෙ-චිත්තය විඳිමින්-පෙ-චිත්තය ප්‍රමොද කෙරෙමින් -පෙ-චිත්තය සමාධිගත කෙරෙමින් චිත්තය මුදවමින්-පෙ-අනිත්‍යය අනුව බලමින් විරාගය අනුව බලමින් නිරොධය අනුව බලමින්, (කෙලෙස්) බැහැර කිරීම අනුව බලමින් ආශ්වාස කරමියි හික්මෙයි, (කෙලෙස්) බැහැර කිරීම අනුව බලමින් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි"(1) යනුවෙන් මෙසේ සොළොස් ආකාරවූ යම් මේ ආනාපානසති කර්මස්ථානයක් දක්වන ලද්දේද, එම කර්මස්ථානය පිළිබඳ භාවනා නිර්දේශය අනුක්‍රමයෙන් පැමිණියේ වේ. එම භාවනා නිර්දේශය වනාහි, යම්හෙයකින් පාළි වර්ණනා අනුසාරයෙන්ම කියනු ලබන්නේ සියලු අයුරින් පරිපූර්ණ වන්නේද, එහෙයින් මෙහි පාළි වර්ණනාක්‍රමය පෙරදැරිකොට මේ නිර්දේශය කියනු ලැබේ:- 'කථං භාවිතො ච භික්ඛවෙ ආනාපානසති සමාධි' (මහණෙනි, ආනාපානසතිසමාධිය කෙසේ වඩනා ලද්දේ) යන මෙහි පළමුකොට **කථං** යනු, ආනාපානසති සමාධිභාවනාව නන් අයුරින් විස්තර කරනු කැමැතිව කැරෙන ප්‍රශ්න කිරීමයි. භාවිතො ච භික්ඛවෙ ආනාපානසති සමාධි යනු, නන් අයුරින් විස්තර කරනු කැමැතිව ප්‍රශ්න කැරුණු ධර්මය ගෙනහැර දක්වීමයි. 'කථං බහුලීකතො-පෙ-වූපසමෙති' (කෙසේ පුරුදු කරන ලදුයේ-පෙ-ශමනය කරයි) යන මෙහිද මෙම නයයි. එහි **භාවිතො** යනු, උපදවනලද හෝ වඩනාලද සමාධියයි. **ආනාපානසතිසමාධි** යනු ආශ්වාස ප්‍රශ්වාස කිරීම පිළිබඳ සිහියෙන් යුක්තවූ සමාධියයි, නැතහොත් ආනාපානසතියෙහි වූ සමාධිය එනම් වේ. **බහුලීකතො** යනු, නැවත නැවතත් පුරුදු කරනලද භාවනාවයි. **සන්තො චෙව පණීතො ච** යනු ශාන්තවූද ප්‍රණීතවූද භාවනාවයි. දෙතන්හිම "එව" ශබ්දයෙන් නිශ්චය කිරීම දතයුතුයි. කුමක් කියන ලද්දේද යත්, අශුභ කර්මස්ථානය වූකලී හුදෙක් ප්‍රතිවෙධ වශයෙන්ම ශාන්තද ප්‍රණීතද වේ, ඔළාරිකවූ අරමුණු ඇති හෙයින්ද, පිළිකුල් අරමුණු සහිතවූ හෙයින්ද, අරමුණු වශයෙන් ශාන්තද නොවේ. ප්‍රණීතද නොවේ, මේ ආනාපාන සතිසමාධිය වූකලී එසේ කිසිම ආකාරයෙකින් අශාන්ත හෝ අප්‍රණීත හෝ නොවේමය. වැලිදු, අරමුණු වශයෙන් ශාන්තවූ හෙයින්ද ශාන්ත වේ, සන්සිඳියේ වේ, නිවුණේ වේ, ප්‍රතිවෙධ සංඛ්‍යාත අංගවශයෙන් ශාන්තවූ හෙයින්ද, අරමුණු වශයෙන් ප්‍රණීතවූ හෙයින්ද, ප්‍රණීත වේ, අතෘප්තිකර වේ. අංග වශයෙන් ප්‍රණීතවූ හෙයින් ප්‍රීතියද වේ, එහෙයින් ශාන්තයයිද ප්‍රණීතයයිද කියනලදී.

---

(1) සං. නි. ආනාපානසති සං. - S v 321ff.

**අසෙචනකො ච සුඛො ච විහාරො** යන මෙහි වනාහි, මෙයට විසිරීමෙක් නැතැයි අසෙචනක නම් වේ. විසිරීම් රහිතවූයේ, අසම්මිශ්‍රවූයේ, වෙන්වූයේ, ආවෙණිකද වූයේය. මේ ආනාපානසති සමාධි විෂයෙහි පරිකර්ම වශයෙන් හෝ උපචාර වශයෙන් හෝ ශාන්ත වීමෙක් නැත්තේය, පළමුවෙන් ආරම්භකළ තැන් පටන්ම, ස්වකීය ස්වභාව වශයෙන්ම ශාන්තද ප්‍රණීතද වේ යන අර්ථයි. කිසිවෙක් වනාහි අසෙචනකො යනු නොවිසුරුණේ, ඔදවත් වූයේ, ස්වභාවයෙන්ම මිහිරි වූයේයයි කියති. මෙසේ මේ ආනාපානසති සමාධිය නොවිසුරුණේ සමවත් සමවත් කෙණෙහි කායිකවූද චෛතසිකවූද සුවය ලැබීම පිණිස පවත්නා හෙයින් සුඛවිහරණ සහිත වූයේයයිද දතයුතුය. **උප්පන්නුප්පන්නෙ** යනු, උපන් උපන් නොමඩනාලද, **පාපකෙ** යනු ලාමකවූ **අකුසලෙ ධම්මෙ** යනු අකුසල ධර්මයන් **ඨානසො අන්තරධාපෙති** යනු සැණෙකින් අතුරුදන් කරවයි, **වූපසමෙති** යනු මනාකොට සන්සිඳුවයි. නිබ්බෙධභාගී වන හෙයින් හෝ අනුක්‍රමයෙන් ආර්යමාර්ගවිෂයෙහි වෘද්ධියට පත්වූයේ මුලින් උපුටාලයි, සහමුලින් සොල්වා ලතියි කීතියායි.

මේ වනාහි මෙහි සංක්ෂේපාර්ථයයි: මහණෙනි, කවර ප්‍රකාරයෙකින්, කවර ආකාරයෙකින්, කිනම් ක්‍රියා මාර්ගයෙකින් මඩනාලද, කවරාකාරයෙකින් පුරුදු පුහුණු කරනලද ආනාපානසති සමාධිය ශාන්ත වේද? -පෙ-ශමනය කෙරේද? දැන් එම (සංක්ෂෙප) අර්ථය විස්තර කෙරෙමින්, 'ඉධ භික්ඛවෙ' යන ආදිය කීහු. එහි **ඉධ භික්ඛවෙ භික්ඛු** යනු, 'මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ,' මෙහි මේ 'ඉධ' ශබ්දය සියලු ආකාර ඇති ආනාපානසති සමාධිය උපදවන පුද්ගලයාහට සන්නිශ්‍රයවූ ශාසනය දක්වන්නේ වේ, අන්‍ය තීර්ථකයන්ගේ ශාසනයන්හි එසේ වීම ප්‍රතිෂේධ කරන්නේද වේ. කියන ලදමැයි: "මහණෙනි, සියලු ආකාරයෙන් පරිපූර්ණ ආනාපානසතිය පුරුදු කරන ශ්‍රමණ තෙමේ මේ ශාසනයෙහිම වේ-පෙ-අන්‍ය වාදයෝ ශ්‍රමණයන්ගෙන් හිස් වූවාහුය."[1] එහෙයින් මේ ශාසනයෙහි භික්ෂු තෙමේයි කියන ලදි. **අරඤ්ඤගතො වා සුඤ්ඤාගාරගතො වා** යන මෙය ආනාපානසතිසමාධිභාවනාවට සුදුසුවූ සේනාසනයක් තෝරාගැනීම දක්වීමයි. (ආනාපානසති කර්මස්ථානය වඩන) මේ භික්ෂූන්ගේ රූපාදිවූ අරමුණු කෙරෙහි දිගු කලක් විසිරීගිය සිත එම ආනාපානසතිසමාධි අරමුණට නැඟීම පිළිකෙව් කරයි. කුළු ගොණුන් යෙදූ රථයක් මෙන් නොමඟටම දිවේ. එහෙයින්, යම්සේ ගොපල්ලෙක් තෙමේ කුළු දෙනකගේ සියලු කිරි බී වැඩුණු කුළු වස්සකු හීලෑකරගනු කැමතිව දෙනගෙන් වෙන්කොට එකත්පසෙක මහ ටැඹක්

(1) අං. නි. චතුක්ක නිපාත- A ii 238

සිටුවා යොතෙකින් එයට බැඳ තබන්නේද, එවිට ඒ කුළු වස්සා ඒ අත මේ අත පැන පලා යනු නොහැකිව ඒ ටැඹ සමීපයෙහිම හිඳිනේද, නැතහොත් හෝනේද, එසේම මේ භික්ෂුව විසින් බොහෝ කාලයක් රූපාදීවූ අරමුණු නමැති කිරි බී වැඩුණු නොදැමුණු සිත දමනු කැමැතිව රූපාදී අරමුණුවලින් ඉවත්කොට අරණ්‍යයක් හෝ -පෙ-පාලුගෙයක් හෝ වෙත පිවිස එහි ආශ්වාස ප්‍රශ්වාස නැමැති ටැඹෙහි සිහි නමැති යොතින් බැඳ තැබිය යුතුය. මෙසේ ඔහුගේ සිත ඒ අත මේ අත පැන පෙර පුරුදු අරමුණු නොලැබ සිහි නමැති යොත කඩාගෙන පලායනු නොහැකිව උපචාර හෝ අර්පණා වශයෙන් එම අරමුණෙහිම හිඳිනේද හෝනේද වේ. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:

> යථා ථම්භෙ නිබන්ධෙය්‍ය වච්ඡං දම්මං නරො ඉධ
> බන්ධෙය්‍යෙවං සකං චිත්තං සතියාරම්මණෙ දළ්හන්ති.

> යම්සේ මෙහිලා පුරුෂයෙක් හීලෑ කළයුතු වස්සකු ටැඹෙක්හි බඳනේද, එසේම ස්වකීය චිත්තය සිහියෙන් දැඩිලෙස අරමුණෙහි බඳනේය.

මෙසේ මේ භික්ෂුවහට මේ සේනාසනය භාවනාවට යෝග්‍යවේ, එහෙයින්, මෙය ඒ භික්ෂූහු විසින් ආනාපානසති සමාධිභාවනාවට අනුරූපවූ සේනාසනයක් තෝරාගැනීම දක්වතියි කියනලදි. නොහොත් යම් හෙයකින් කර්මස්ථාන ප්‍රභේදයෙහි ප්‍රමුඛවූ සියලු බුදු පසේබුදු බුදු සව්වන්ගේ විශේෂාධිගමයට හා දෘෂ්ටධර්ම සුඛවිහරණයට හේතුවූ මේ ආනාපානසති කර්මස්ථානය ස්ත්‍රී පුරුෂ හස්ති අශ්වාදීන්ගේ ශබ්දයෙන් ආකුලවූ ග්‍රාමාන්තය අත් නොහැර වඩනු දුෂ්කර නොවේ, ශබ්දය ධ්‍යානයට පලිබෝධ වනහෙයිනි. ග්‍රාමාන්ත නොවූ අරණ්‍යයෙහිම දුකර වේ. යෝගාවචරයා විසින් මේ කර්මස්ථානය ලබාගෙන ආනාපානසති චතුර්ථධ්‍යානය උපදවා එයම පාදක කොටගෙන සංස්කාරයන් ආවර්ජනය කොට අග්‍රඵලයවූ අර්හත්ත්වයට පත්වන්නට ග්‍රාමාන්තයෙන් බැහැර අරණ්‍යයෙහිම සුකරවේ. එහෙයින් මේ ආනාපානසති කර්මස්ථානයට යෝග්‍යවූ සේනාසනය දක්වන භාග්‍යවතුන් වහන්සේ 'අරඤ්ඤගතො වා' යන ආදිය වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ වනාහි වාස්තුවිද්‍යා ආචාර්යවරයකු වැනියහ, යම්සේ වාස්තුවිද්‍යාචාර්යවරයෙක් තෙමේ නගරයකට යෝග්‍යවූ බිම්කඩක් දැක, මොනවට පිරික්සා බලා මෙහි නගරය ගොඩනඟවුයයි උපදේශ කරයිද, නගරය යහතින් නිමි කල්හි රාජකුලයෙන් මහත් සත්කාර ලබයිද, එසේම යෝගාවචරයාහට අනුරූපවූ සේනාසනය පිරික්සා මෙහි

කර්මස්ථානයෙහි යෙදෙනුයැයි උපදෙස් දෙන්නාහ. ඉක්බිති එම සේනාසනයෙහි කර්මස්ථානයෙහි යෙදෙන යෝගාවචරයා අනුක්‍රමයෙන් රහත්බවට පැමිණි කල, ඒ භාග්‍යවතුන්වහන්සේ ඒකාන්තයෙන්ම සම්‍යක් සම්බුද්ධ වනසේකැයි මහත් සත්කාර ලබන්නාහුය. තවද මේ භික්‍ෂු තෙමේ දිවියකු වැනියයි කියනු ලැබේ. යම්සේ මහ දිවි රජෙක් වනයෙහි තෘණභූමියක් හෝ වනලැහැබක් හෝ පර්වතගහණයක් හෝ ඇසුරුකොට සැඟවී සිට වල්මිවු, ගෝණ, හූරු ආදීන් අල්වාගනීද, එසේම අරණ්‍ය ආදී තන්හි කමටහනෙහි යෙදෙන භික්‍ෂු තෙමේද අනුපිළිවෙළින් සෝතාපත්ති, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන ආර්යමාර්ගයන්ද ආර්යඵලයන්ද ලබා ගන්නේයයි දතයුතුය:

එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:

> යථාපි දීපිකො නාම නිලීයිත්වා ගණ්හති මිගෙ
> තථෙවායං බුද්ධපුත්තො යුත්තයොගො විපස්සකො
> අරඤ්ඤං පවිසිත්වාන ගණ්හාති ඵලමුත්තම'න්ති.

යම්සේ වනාහි දිවියෙක් සැඟවී සිට මෘගයන් අල්වාගනීද, එසේම භාවනායෝගයෙහි නියැලුණු විදර්ශනා වඩන බුද්ධපුත්‍ර තෙමේ වනසෙනස්නට පිවිස උතුම්වූ ශ්‍රාමණ්‍යඵලය ලබා ගන්නේය.

එහෙයින් මේ භික්‍ෂුහුගේ භාවනාපරාක්‍රම ජවයට යෝග්‍යවූ වනසෙනස්න දක්වන භාග්‍යවතුන් වහන්සේ 'අරඤ්ඤගතො වා' යන ආදිය වදළහ.

එහි **අරඤ්ඤගතො වා** යනු, අරණ්‍යය නම් ඉන්ද්‍රඛීලයෙන් බැහැරව නික්මුණු කල මේ සියල්ල අරණ්‍යයයිද, ආරණ්‍යක සේනාසනය නම් යටත්පිරිසෙයින් දුනු පන්සියයකට පසුවයයිද මෙසේ කියනලද ලක්‍ෂණ ඇති වනසෙනසුන් අතුරෙන් යෝග්‍යවූ විවේකසුව සහිත කිසියම් සෙනස්නකට ගියේ, **රුක්ඛමූලගතො වා** යනු රුක්මුලක් වෙතට ගියේ, **සුඤ්ඤාගාරගතො වා** යනු, ජනශූන්‍යවූ විවේකස්ථානයකට ගියේ, මෙහි අරණ්‍යයද, වෘක්‍ෂමූලයද හැර සෙසු සත් වැදෑරුම් සෙනස්නට ගියේද 'සුඤ්ඤාගාරගතො'යි කියනු වටී. මෙසේ ඔහුට ත්‍රිවිධ ඍතුවට යෝග්‍යවූද, ශ්ලෙෂ්මාදී ත්‍රිවිධ ධාතූන්ගේ චර්යාවට අනුකූලවූද ආනාපානසති භාවනාවට අනුරූපවූද, සෙනස්නක් උපදේශකොට (වැදහෙවීම වැනි) ලීන පක්‍ෂයට හෝ (සිටීම, සක්මන් කිරීම වැනි) උද්ධච්ච පක්‍ෂයට නොවැටෙන සන්හුන් ඉරියව්වක් නිර්දේශ කරමින් 'නිසීදති' (හිඳියි) යන ආදිය වදළහ. ඉක්බිති ඒ යෝගීහුගේ හිඳීම් ඉරියව්වෙහි තිරබවට ආශ්වාස ප්‍රශ්වාසයන් පැවැත්වීමේ

පහසුවද, අරමුණු ගැනීමේ උපායද දක්වමින් 'පලලඩකං ආභුජිත්වා' යන ආදිය වදළහ. එහි **පලලඩකං** යනු, හාත්පසින් ඌරුබද්ධ (එරමිණියා ගොතා සිටින) ආසනයයි. **ආභුජිත්වා** යනු බැඳ, **උජුං කායං පණිධාය** යනු උඩුකය එකලස්ව පිහිටුවාගෙන, කොඳුඇට අටළොස කෙළවරින් කෙළවර තබා, මෙසේ හුන්විට සම් මස් නහර නොනැමෙයි. ඒ සම් මස් නහර නැමුණුවිට ඒ හේතුවෙන් කෙණෙහි කෙණෙහි යම් වේදනාවක් උපදීනම් ඔහුට ඒ වේදනා නොඋපදියි. එම වේදනා නොඋපදනා කල සිත එකඟවේ. කමටහන නොගිලිහෙයි, වෘද්ධියට මහත්බවට යෙයි.

**පරිමුඛං සතිං උපට්ඨපෙත්වා** යනු, කමටහනට අභිමුඛව සිහිය පිහිටුවාගෙන, නොහොත්, 'පරි' යනු හාත්පසින් ගැනීම යන අරුත් ඇත්තේය, 'මුඛං' යනු, 'නික්මයාම' යන අරුත් ඇත්තේය, 'සති' යනු, 'එළඹ සිටීම'යයි යන අරුත් ඇත්තේය, එහෙයින් 'පරිමුඛං සතිං' යයි කියනලදි. මෙසේ පටිසම්භිදවෙහි කීනයින්ද මෙහි අරුත් දතයුතුය. එහි (පටිසම්භිදවෙහි) හාත්පසින් ගන්නාලද (ක්ලේශයන් කෙරෙන්) නිකුත්වීමේ සිහිය එළවා'යි[1] යන මේ සංක්ෂේපාර්ථය වේ.

**සො සතො'ව අස්සසති සතො පස්සසති** යනු, ඒ භික්ෂු තෙමේ මෙසේ හිඳ මෙසේ සිහි එළවාගෙන එම සිහිය නොහරිමින් සිහි ඇතිවම ආශ්වාස කරයි, සිහි ඇතිවම ප්‍රශ්වාසද කරයි, සිහි ඇතිවම කටයුතු කරතියි කී තියායි. ඉක්බිති යම් ආකාරයෙකින් සිහි ඇතිව කටයුතු කරන්නේද, ඒ ආකාරය දක්වනු පිණිස 'දීඝං වා අස්සසන්තො' යන ආදිය කීහු. පටිසම්භිදවෙහි මෙසේ කියන ලද්දේය: "ඒ යෝගී තෙමේ සිහි ඇතිවම ආශ්වාස කරයි, සිහි ඇතිවම ප්‍රශ්වාසද කරයි"[2] යනුවෙනි. මෙය විභාග කිරීමෙහිදී "දෙතිස් ආකාරයෙකින් සිහි ඇතිව කටයුතු කරන්නේ වේ. දිගුව ආශ්වාස කිරීම් වශයෙන් සිතෙහි එකාග්‍රතාව අවික්ෂේප වූබව දන්නහුගේ සිහිය (අරමුණට) එළඹ සිටියේ වේ. එම සිහිය හා එම ඥානය හේතුකොටගෙන සිහි ඇතිව කටයුතු කරන්නේ වේ, දිගුව ප්‍රශ්වාස කිරීම් වශයෙන්-පෙ-පටිනිස්සග්ගය (නොඇලීම) අනුව බලමින් ආශ්වාස කිරීම් වශයෙන්-පෙ-පටිනිස්සග්ගය අනුව බලමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් සිතෙහි එකාග්‍රතාව අවික්ෂේපවූබව දන්නහුගේ සිහිය අරමුණ වෙත එළඹසිටියේ වේ. එම සිහිය හා එම ඥානය හේතුකොටගෙන සිහිඇතිව කටයුතු කරන්නේ වේ"[3] යනුවෙන් කියනලදී.

(1) Ps i 176
(2) එම
(3) Ps i 176

එහි **දීඝං වා අස්සසන්තො** යනු, දිගුව හෝ ආශ්වාසය පවත්වනුයේයි, ආශ්වාස නම් පිටතට නික්මෙන වාතයයි, ප්‍රශ්වාස නම් ඇතුළට පිවිසෙන වාතයයි යනුවෙන් විනයට්ඨකථාවෙහි කියනලදි. සුත්තන්ත අට්ඨකථාවන්හි වනාහි මෙය උපිළිවෙළින් (අග මුල මාරුකොට) ආයේය. එහි මව්කුස හෝනා සියලු සත්ත්වයන් මව්කුසින් නික්මෙනවිට පළමුකොට ඇතුළත වාතය පිටතට නික්මෙයි, පසුව පිටත වාතය සියුම් දූවිලිද ගෙන ඇතුළට පිවිසෙමින් තල්ලෙහි හැපී නවතියි, මෙසේ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ පැවැත්ම දතයුතුය. ඒ ආශ්වාසප්‍රශ්වාසයන් පිළිබඳවූ යම් දිගුබවක් හෝ කෙටිබවක් වේද, එය කාලපරිමාණ හෝ අවකාශ පරිමාණ වශයෙන් දතයුතුය. යම්සේ අවකාශයක් පුරා සිටි ජලය හෝ වැල්ල 'දික් ජලය'යි හෝ 'දික් වැල්ල'යි 'කෙටි ජලය'යි හෝ 'කෙටි වැල්ල'යි කියනු ලැබේද, එසේම කැඩීබිඳී ගියාවූද ආශ්වාස ප්‍රශ්වාසයෝ හස්ති ශරීරයෙහි හෝ සර්ප ශරීරයෙහි දීර්ඝවූ අවකාශයන් වන එම ශරීරයන් සෙමින් පුරවා සෙමින්ම නික්මෙති, එහෙයින් දීර්ඝයයි කියනු ලැබෙති, ශුනක ශශ ආදීන්ගේ කෙටිවූ අවකාශ සහිත ශරීරයන් වහා පුරවා වහා නික්මෙති, එහෙයින් හ්‍රස්වයයි කියනු ලැබෙති. මිනිසුන් අතර වනාහි කිසිවෙක් හස්ති සර්ප ආදීන්ගේ මෙන් කාල පරිමාණ වශයෙන් දිගුලෙස ආශ්වාස ප්‍රශ්වාස කෙරෙති, කිසිවෙක් ශුනක ශශ ආදීන් මෙන් කෙටිව ආශ්වාස ප්‍රශ්වාස කෙරෙති, එහෙයින් ඔවුන්ගේ කාල වශයෙන් දීර්ඝ කාලයක් නික්මෙන්නාවූද පිවිසෙන්නාවූද ආශ්වාස ප්‍රශ්වාසයන් දීර්ඝයයිද කෙටි කාලයක් නික්මෙන්නාවූද පිවිසෙන්නාවූද ආශ්වාසප්‍රශ්වාසයන් හ්‍රස්වයයිද දතයුතුය. එහි (එම ආශ්වාස ප්‍රශ්වාස විෂයෙහි) මේ භික්ෂු තෙමේ නව ආකාරයෙකින් දීර්ඝලෙස ආශ්වාස ප්‍රශ්වාස කරනුයේ දීර්ඝ ලෙස ආශ්වාස කරමි, ප්‍රශ්වාස කරමියි දනියි. මෙසේ දන්නාවූ ඔහුට එක් ආකාරයෙකින් කායානුපස්සනා සතිපට්ඨානභාවනාව සිද්ධ වෙතැයි දතයුතුය.

කියනලද මැයි පටිසම්භිදවෙහි: "කෙසේ දිගුලෙස ආශ්වාස කරන්නේ දිගුලෙස ආශ්වාස කරමියි දනීද? දිගුලෙස ප්‍රශ්වාස කරන්නේ දිගුලෙස ප්‍රශ්වාස කරමියි දනීද? දීර්ඝවූ ආශ්වාසය දිගු කලක් ආශ්වාස කරයි, දීර්ඝවූ ප්‍රශ්වාසය දිගු කලක් ප්‍රශ්වාස කරයි, දීර්ඝවූ ආශ්වාස ප්‍රශ්වාසය දිගු කලක් ආශ්වාසද ප්‍රශ්වාසද කරයි, දීර්ඝවූ ආශ්වාසප්‍රශ්වාසය දිගු කලක් ආශ්වාස හා ප්‍රශ්වාස කරන්නහුට (කුශල) ඡන්දය උපදියි, ඡන්ද වශයෙන් වඩාත් සියුම් ලෙස දීර්ඝවූ ආශ්වාසය දිගු කලක් ආශ්වාස කරයි, ඡන්දවශයෙන් වඩාත් සියුම් ලෙස දීර්ඝවූ ප්‍රශ්වාසය-පෙ-දීර්ඝවූ ආශ්වාස ප්‍රශ්වාසය දිගු කලක් ආශ්වාසද ප්‍රශ්වාසද කරයි, ඡන්ද වශයෙන්

වඩාත් සියුම් ලෙස දීර්ඝවූ ආශ්වාසප්‍රශ්වාසය දිගුකලක් ආශ්වාසද ප්‍රශ්වාසද කරන්නහුට ප්‍රමෝදය උපදියි, ප්‍රමෝද වශයෙන් එයට වඩා සියුම් ලෙස දීර්ඝවූ ආශ්වාසය දිගුකලක් ආශ්වාස කරයි, ප්‍රමෝද වශයෙන් එයට වඩා සියුම් ලෙස දීර්ඝවූ ප්‍රශ්වාසය-පෙ- දීර්ඝවූ ආශ්වාසප්‍රශ්වාසය දිගුකලක් ආශ්වාසද ප්‍රශ්වාසද කරයි, ප්‍රමෝද වශයෙන් එයට වඩා සියුම් ලෙස දීර්ඝවූ ආශ්වාස ප්‍රශ්වාසය දිගු කලක් ආශ්වාසද ප්‍රශ්වාසද කරන්නහුට දිගු කල් පවත්නා ආශ්වාස ප්‍රශ්වාසයන් කෙරෙන් සිත වෙන්වේ, උපේක්‍ෂාව පිහිටයි. මේ නව ආකාරයෙන් දීර්ඝ පරිමාණ ආශ්වාස ප්‍රශ්වාසයෝ (සමූහාර්ථයෙන්) කාය නම් වෙති. සිහිය (අරමුණ වෙත එළඹ සිටින හෙයින්) උපට්ඨාන නම් වේ, (නිමිත්ත අනුව) බැලීම ඥනයයි, කය (අරමුණු වශයෙන්) එළඹ සිටිනේ උපට්ඨාන නම් වේ, එය කායසතිය නොවේ. 'සති' යනු 'සිහිය' යන අර්ථයෙහිද, එළඹ සිටීම් අර්ථයෙහිද වේ. ඒ සතියෙන්ද ඒ ඥනයෙන්ද, ඒ කය අනුව බලයි යනුයි. එහෙයින් කායානුපස්සනා සතිපට්ඨානභාවනායයි කියනු ලැබේ.[1]

'රස්ස' යන පදය යෙදීමේදීද, මෙම නයයි. මේ වනාහි විශේෂයයි: යම්සේ මෙහි "දීඝං අස්සාසං අද්ධානසඞ්ඛාතෙ"යි කියන ලදද, එසේම මෙහි "රස්සං අස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසති" යනුවෙන් පෙළ ආයේය. එහෙයින් එය අනුව "තෙන වුච්චති කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා"[2] යන්න දක්වා යෙදිය යුතුය.

මෙසේ දීර්ඝ (කාල)පරිමාණ වශයෙන්ද, ස්වල්ප පරිමාණ වශයෙන්ද මේ ආකාරයෙන් ආශ්වාස ප්‍රශ්වාසයන් දන්නේ දීර්ඝ ලෙස ආශ්වාස කරනුයේ දීර්ඝ ලෙස ආශ්වාස කෙරෙමියි දනියි-පෙ-ස්වල්ප ලෙස ප්‍රශ්වාස කරනුයේ ස්වල්ප ලෙස ප්‍රශ්වාස කෙරෙමි'යි දනියි" යනුවෙන් දතයුතුය.

> දීඝො රස්සො ච අස්සාසො පස්සාසො පි ච තාදිසො
> චත්තාරො වණ්ණා වත්තන්ති නාසිකග්ගෙ'ව භික්ඛුනො

ඒ භික්ෂුහුගේ නාසිකාග්‍රයෙහි (උඩු තොලෙහි හෝ) දීර්ඝවූද ස්වල්පවූද ආශ්වාසය හා එසේම වූ ප්‍රශ්වාසයද යන සතර ආකාරය පවත්නේය.

---

(1) Ps i 177

(2) Ps i 182f

**සබ්බකායපටිසංවේදී අස්සසිස්සාමීති** -පෙ- **පස්සසිස්සාමීති සික්ඛති** යනු, සියලු ආශ්වාසකාය (සමූහය) පිළිබඳ මුල මැද අග (යන තුන) දැනුවත් කරමින්, ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සියලු ප්‍රශ්වාසකාය පිළිබඳ මුල මැද අග දැනුවත් කරමින්, ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. මෙසේ දැනුවත් කරමින්, ප්‍රකට කරමින් ඥානසම්ප්‍රයුක්තවූ සිතින් ආශ්වාස කරයි. ප්‍රශ්වාසද කරයි, එහෙයින් ආශ්වාස කරන්නෙමියි, ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේයයි කියනු ලැබේ. කිසියම් භික්ෂු කෙනකුට වනාහි කැඩී බිඳී පැතුරුණු ආශ්වාස සමූහයෙහි හෝ ප්‍රශ්වාස සමූහයෙහි මුල ප්‍රකට වේ, මැද ප්‍රකට නොවේ, හේ තෙමේ මුල පමණක් අල්වාගනු සමත් වේ, මැද අග දෙතන්හි වෙහෙසට පත්වේ. අන් කෙනකුහට මැද ප්‍රකට වේ, මුල අග ප්‍රකට නොවේ, තවද කෙනකුහට අග පමණක් ප්‍රකට වේ, මුල මැද ප්‍රකට නොවේ, හේ තෙමේ අග පමණක් අල්වාගනු සමත් වේ, මුල මැද යන දෙතන්හි වෙහෙසට පත්වේ. තවද කෙනකුහට මුල මැද අග යන සියලු අවස්ථා ප්‍රකට වේ, හේ තෙමේ සියල්ලම අල්වා ගැනීමට සමත් වේ, කිසිම තැනෙක වෙහෙසට පත් නොවේ, එවැන්නකු විය යුතුයයි දක්වන්නාහු "සබ්බකායපටිසංවේදී-පෙ-පස්සසිස්සාමීති සික්ඛති" යි කීහු. එහි **සික්ඛති** යනු, මේ ආකාරයෙන් උත්සාහ කරයි, ප්‍රයත්න කරයි, එබන්දහුගේ යම් සංවරයෙක් වේද, එය මෙහි අධිශීලශික්ෂායි, එබන්දහුගේ යම් සමාධියෙක් වේද, එය අධිචිත්තශික්ෂායි, එබන්දහුගේ යම් ප්‍රඥාවක් වේද, එය අධිප්‍රඥාශික්ෂායි. මේ ත්‍රිවිධ ශික්ෂාව එම අරමුණෙහි, ඒ සිහිය හේතුකොටගෙන, ඒ මෙනෙහි කිරීම හේතුකොටගෙන, පුහුණුවෙයි, සේවනය කරයි, වඩයි, පුරුදුකරයි යනුවෙන් මෙහි අර්ථය දතයුතුය. එහි යම්සේ පළමුනයෙහි හුදෙක් ආශ්වාස කටයුතුබව, ප්‍රශ්වාස කටයුතුබව වේද, එහෙයින් අන් කිසිවක් නොකළ යුතුය. මෙතන් පටන් වනාහි ඥානොත්පාදනාදියෙහි යෝග කටයුතුය. එහෙයින් එහිදී 'පස්සසාමීති පජානාති පස්සසාමීති පජානාති' යනුවෙන් වර්තමානකාල වශයෙන් පෙළ කියා මෙතැන් පටන් කළයුතු ඥානොත්පාදනාදිය පිළිබඳ ආකාරය දක්වනු පිණිස 'සබ්බකායපටිසංවේදී අස්සසිස්සාමීති' ආදී නයින් අනාගත කාලික වචන වශයෙන් පෙළ යොදනලදැයි දතයුතුය.

**පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමි-පෙ-පස්සසිස්සාමීති සික්ඛති** යනු, ඖදාරිකවූ කායසංඛාරය සංසිඳුවමින්, වෙසෙසින් සංසිඳුවමින්, පහ කරමින්, ශමනය කරමින් ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාසද කරන්නෙමියි හික්මෙයි. එහිලා ඖදාරිකබව හා සියුම්බවද, සංසිඳුවීමද මෙසේ දතයුතුය. මේ භික්ෂුහුගේ වනාහි පෙර (ආනාපානසති භාවනාව) නොඇරඹි කල්හි

කයද, සිතද පරිදහසහිත වේ, ඖළාරිකද වේ. කයසිත යන දෙක්හි ඖළාරිකබව නොසන්සිඳි කල්හි ආශ්වාස ප්‍රශ්වාසයෝද ඖළාරික වෙති, බලවත්ව පවතිති, නාසය නොසෑහේ, මුඛයෙන්ද ආශ්වාස ප්‍රශ්වාස කෙරෙමින් සිටියි. යම් කලෙක ඔහුගේ කයද සිතද (භාවනාව විසින්) ගන්නාලද්දේ වේද, එකල ඒ කයසිත දෙක සන්සිඳියේ වේ, ශමනය කරනලද්දේද වේ. කයසිත දෙක ශමනය කරනලද කල්හි ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම්ව පවතිත්, 'ඇත්දෝ නැත්දෝ'යි විමසියයුතුබවට පත්වෙති. යම්සේ දුවගොස් හෝ පර්වතයෙකින් බැස හෝ හිසින් ගත් මහ බරක් බහා තබා හෝ සිටි පුරුෂයකුගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ ඖළාරික වෙත්ද, නහය නොපොහොනේ මුඛයෙන් ආශ්වාසද ප්‍රශ්වාසද කෙරෙමින් සිටීද, නැවත හේ තෙමේ එම විඩාව දුරුකොට නහා පැන් බී තෙත් රෙදිකඩක් ළෙහි රදවාගෙන සිහිල් සෙවණෙක හොත්තේ වේද, එකල එම ආශ්වාස ප්‍රශ්වාසයෝ සියුම් වෙත්ද, 'ඇත්දෝ නැත්දෝ හෝ'යි' විමසියයුතුබවට යෙත්ද, එසේම මේ භික්‍ෂුහුගේ කය සිත දෙක පෙර (භාවනාව විසින්) නොගන්නාලද කල්හි-පෙ-විමසියයුතුබවට පත්වෙති. කවර හෙයින්ද යත්, එසේ මැයි. පෙර (භාවනාව විසින්) නොගන්නාලද කල්හි ඔහුට ඖළාරික ඖළාරිකවූ කාය සංඛාරයන් සන්සිඳුවෙමි'යි යන ආවර්ජනයක්, කල්පනයක්, මනස්කාරයක්, ප්‍රත්‍යවෙක්‍ෂණයක් නැත, (භාවනාව විසින්) ගන්නාලද කල්හි ඇත. එහෙයින් (භාවනාව විසින්) නොගන්නාලද කලට වඩා ගන්නාලද කල්හි ඔහුගේ කායසංඛාරය සියුම් වේ.

එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:

> සාරද්ධෙ කායෙ චිත්තෙ ච අධිමත්තං පවත්තති,
> අසාරද්ධම්හි කායම්හි සුඛුමං සම්පවත්තතීති.

කයද සිතද පරිදහ සහිත වූ කල්හි අධිමාත්‍රව (ඖළාරිකව) පවතී, පරිදහ රහිතවූ කල්හි (කායසංඛාරය) සියුම්ව පවතී.

පරිගෘහීත (භාවනාව විසින් ගන්නාලද)කල්හිදු ඖළාරිකව පවත්නේය. ප්‍රථමධ්‍යාන උපචාරයෙහිදී සියුම් වේ, එහිද ඖළාරිකව පවත්නේ ප්‍රථමධ්‍යානයෙහිදී සියුම් වේ, ප්‍රථම ධ්‍යානයෙහිද ද්විතීයධ්‍යාන උපචාරයෙහිද ඖළාරිකව පවත්නේ ද්විතීයධ්‍යානයෙහිදී සියුම් වේ, ද්විතීයධ්‍යානයෙහිද තෘතීයධ්‍යාන උපචාරයෙහිද ඖළාරිකව පවත්නේ තෘතියධ්‍යානයෙහිදී සියුම් වේ, තෘතීය ධ්‍යානයෙහිද චතුර්ථධ්‍යාන උපචාරයෙහිද ඖළාරිකව පවත්නේ චතුර්ථධ්‍යානයෙහිදී ඉතා සියුම්ව

නොපවත්නාබවට පැමිණේ. මේ වනාහි දීඝභාණක සංයුත්තභාණකයන්ගේ මතයයි. මජ්ඣිමභාණකයෝ වනාහි ප්‍රථමධ්‍යානයෙහි ඖළාරිකවූයේ ද්විතීයධ්‍යාන උපචාරයෙහිදී සියුම් වේ යනුවෙන් මෙසේ අවම අවමවූ ධ්‍යානයෙහිදී පවත්නා තරමට වඩා උපරිම උපරිම ධ්‍යාන උපචාරයෙහිදීද සියුම්බව කැමැති වෙති. සියල්ලන්ගේම මතයට අනුව අපරිගෘහීත (භාවනාව විසින් නොගන්නාලද) කාලයෙහි පවත්නා කායසංඛාරය පරිගෘහිත කාලයෙහි සන්සිඳෙයි, පරිගෘහිත කාලයෙහි පැවති කාය සංඛාරය ප්‍රථමධ්‍යන උපචාරයෙහිදී-පෙ-චතුර්ත්‍ථධ්‍යාන උපචාරයෙහි පැවති කායසංඛාරය චතුර්ත්‍ථධ්‍යානයෙහිදී සන්සිඳෙයි. මේ වනාහි සමථභාවනා නයයි. විදර්ශනාවෙහි වනාහි: පරිග්‍රහ නොකළ කල්හි පැවති කායසංඛාරය ඖළාරික වේ, මහාභූතයන් පරිග්‍රහකළ කල්හි සියුම් වේ, එයද ඖළාරිකවූයේ උපාදරූප පරිග්‍රහකළ කල්හි සියුම් වේ, එයද ඖළාරිකවූයේ සකලරූප පරිග්‍රහකළ කල්හි සියුම් වේ, එයද ඖළාරික වූයේ අරූප පරිග්‍රහකළ කල්හි සියුම් වේ, එයද ඖළාරිකවූයේ රූපාරූප පරිග්‍රහකළ කල්හි සියුම් වේ, එයද ඖළාරිකවූයේ ප්‍රත්‍යයයන් පරිග්‍රහකළ කල්හි සියුම්වේ, එයද ඖළාරික වූයේ ප්‍රත්‍යය සහිත නාමරූපයන් පරිග්‍රහකළ කල්හි සියුම් වේ, එයද ඖළාරිකවූයේ ත්‍රිලක්ෂණයන් අරමුණුකොට ඇති විදර්ශනාවෙහිදී සියුම් වේ, එයද දුර්වල විදර්ශනාවෙහි ඖළාරික වූයේ බලවත් විදර්ශනාවෙහිදී සියුම් වේ. එහි පෙර කී නයින්ම පළමු පළමු කී දෙය පසු පසුව කී දෙයින් ශමනය වෙතැ'යි දතයුතුය. මෙහි ඖළාරිකබව හා සියුම්බවද, ශමනයද මෙසේ දතයුතුය.

පටිසම්භිදවෙහි වනාහි චෝදනා පරිහාර සහිතව මේ කාරණය කියන ලද්දේය. කෙසේදයත්, කායසංඛාරය, සන්සිඳුවමින් ආශ්වාස කෙරෙමි'යි-පෙ-ප්‍රශ්වාස කෙරෙමි'යි හික්මෙයි. කායසංස්කාරයෝ නම් කවරහුද? දීර්ඝවූ ආශ්වාස ප්‍රශ්වාසයෝය, කායිකවූ කය හා බැඳී සිටියාවූ මේ ධර්මයෝ කායසංඛාර නම් වෙති, ඒ කායසංඛාරයන් සන්සිඳුවමින්, පහ කෙරෙමින් ශමනය කෙරෙමින් හික්මෙයි. යම්බඳු කායසංඛාරයන් හේතුකොටගෙන කය ඉදිරි පසට නැමීම, දෙපසට නැමීම, සියලු පසට නැමීම, පසු පසට නැමීම, කැළඹීමට පත්වීම, පණ ගැසීම, චංචල වීම, කම්පාවීම වේද, එබඳු ඖළාරිකවූ කාය සංඛාරයන් සන්සිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි, ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. යම්බඳු කායසංඛාරයන් හේතුකොටගෙන කය ඉදිරියට නොනැමීම, දෙපසට නොනැමීම, සියලු අතට නොනැමීම, පසුපසට නොනැමීම, නොකැළඹීම, නොගැසීම, චංචලනොවීම, කම්පා නොවීම සිදුවේද, එබඳු ශාන්තවූ සියුම්වූ කායසංඛාරයන්ද සන්සිඳුවමින්

ආශ්වාස කරන්නෙමියි හික්මෙයි, ප්‍රශ්වාසද කරන්නෙමියි හික්මෙයි. ඉදින් කායසංඛාරයන් සන්සිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ නම්, එසේ කායසංඛාරයන් සන්සිඳවූ කල්හි, ආශ්වාස ආදී වාතයන්ගේ පැවැත්මක් නොවේ, ආශ්වාස ප්‍රශ්වාසන්ගේ පැවැත්මක් සිදුනොවී, ආනාපානසතියෙහි පැවැත්මක් නොවී, ආනාපානසති සමාධියෙහි පැවත්මක් නොවේ. පණ්ඩිත ජනයා සමවදින නැඟී සිටින එම සමාපත්තියද නොවේ. ඉදින් ඔළාරිකවූ කායසංඛාරය සන්සිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි හික්මේ නම්, එසේවූ කල්හි (ඔළාරිකවූ කායසංඛාරය සන්සිඳවූ කල්හි) ආශ්වාසාදී වාතයන්ගේ පැවැත්මද වේ, ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ පැවැත්මද වේ. ආනාපානසතියෙහි පැවැත්මද වේ, ආනාපානසති සමාධියෙහි පැවැත්මද වේ, පණ්ඩිත ජනයා සමවදින නැඟී සිටින එම සමාපත්තියද වේ. කුමක් මෙන්ද යත්, යම්සේ ලොහො තලියකට ගැසූ කල පළමුවෙන් ඔළාරික ශබ්දයෝ නිකුත් වෙති, එම ඔළාරික ශබ්දයන් පිළිබඳ නිමිති මනාකොට ගන්නාලද හෙයින්, මනාකොට සිත තුළ පිහිටි හෙයින් මනාකොට දරා ගන්නාලද හෙයින් එම ඔළාරික ශබ්දය ඉකුත්ව ගිය කල්හිද, ඉන් පසු සියුම් ශබ්දයෝ පවතිත්ද, සියුම් ශබ්දයන්ගේද නිමිති මනාකොට ගන්නාලද හෙයින්, මනාකොට සිත තුළ පිහිටි හෙයින්, මනාකොට දරාගන්නාලද හෙයින් එම සියුම් ශබ්දයන් ඉකුත්ව ගිය කල්හිදු, ඉන් පසු එම සියුම් ශබ්දයන් පිළිබඳ නිමිත්තෙහි අරමුණුගත් සිත පවත්නේය, එසේම පළමුකොට ඔළාරිකවූ ආශ්වාස ප්‍රශ්වාසයෝ පවතිත්ද, එම ඔළාරික ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබඳ නිමිත්ත මනාකොට ගන්නාලද හෙයින්, මනාකොට සිතතුළ පිහිටුවා ගන්නාලද හෙයින් ඔළාරික ආශ්වාස ප්‍රශ්වාසයන් ඉකුත්ව ගිය කල්හිදු, ඉක්බිති සියුම් ආශ්වාස ප්‍රශ්වාසයෝ පවතිත්ද, එම සියුම් ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබඳ නිමිති මනාකොට ගන්නාලද හෙයින් මනාකොට සිතතුළ පිහිටුවා ගන්නාලද හෙයින්, මනාකොට සිත්හි දරාගන්නාලද හෙයින් එම සියුම් ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබඳ නිමිත්ත අරමුණු කොටගත් සිත වික්ෂෙපයට නොයෙයි. එසේවූ කල්හි ආශ්වාසාදී වාතයන්ගේ පැවැත්මද වේ, ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ පැවැත්මද වේ, ආනාපානසතියෙහි පැවැත්මද වේ. ආනාපානසති සමාධියෙහි පැවැත්මද වේ, පණ්ඩිත ජනයා සමවදින නැඟී සිටින එම සමාපත්තියද වේ. 'පස්සම්භයං කායසංඛාරං' යන මෙහි ආශ්වාස ප්‍රශ්වාසයෝ කාය නම් වෙති, එළඹවීම සති නම්, අනුව බැලීම ඤාණ නම්, කය යනු උපට්ඨාන හෙවත් එළඹසිටීමයි. එහෙත් එය සතිය නොවේ, සති යනු එළඹසිටීම මෙන්ම සිහියද වේ. ඒ සිහිය හේතුකොටගෙන

ඒ ඥානය හේතුකොටගෙන එම කය අනුව බලයි. එහෙයින් කය පිළිබඳවූ කායානුපස්සනා සතිපට්ඨානභාවනායයි කියනලදි. මේ වනාහි මෙහි කායානුපස්සනා වශයෙන් කියනලද ප්‍රථම චතුෂ්කය පිළිබඳව පිළිවෙළින් කරනලද පදවර්ණනාවයි.

යම් හෙයකින් වනාහි මෙහි මේ චතුෂ්කයම ආධුනික යෝගාවචරයාහට කර්මස්ථාන වශයෙන් කියනලද්දේ වේද, ඉතිරි චතුෂ්ක තුන මේ ප්‍රථම චතුෂ්කයෙහිදී ධ්‍යානයට පත්වූවාහු උදෙසා වේදනා-චිත්ත-ධම්මානුපස්සනා වශයෙන් කියනලද්දාහු වෙත්ද, එහෙයින් මේ කර්මස්ථානය වඩා ආනාපාන චතුර්ථධ්‍යානය පාදක කොටගත් විදර්ශනාවෙන් පිළිසිඹියා සහිත රහත්බවට පැමිණෙනු කැමැති ආධුනික කුලපුත්‍රයා විසින් පෙර කී නයින්ම, සිල් පිරිසුදු කිරීම් ආදී සියලු කාර්යයන් කොට පෙර කියනලද ප්‍රකාර ඇති ආචාර්යවරයකු සමීපයෙහි සන්ධි පසක් ඇති කර්මස්ථානය උගතයුතුය. එහි සන්ධි පස නම්: උග්ගහය, පරිපුච්ඡාය, උපට්ඨානය, අප්පනාය, ලක්ඛණය යන මොහුය. එහි, **උග්ගහ** නම් කර්මස්ථානය ඉගෙනීමයි. **පරිපුච්ඡා** නම් කර්මස්ථානය පිළිබඳවූ කරුණු විමසීම නොහොත්, සැක තැන් විමසීමයි. **උපට්ඨාන** නම් කර්මස්ථානය වටහා ගැනීමයි, **අප්පනා** යනු කර්මස්ථානය පිළිබඳ අර්පණායි. **ලක්ඛණ** නම් කමටහන් පිළිබඳ ලක්ෂණයි. මේ ආකාර ලක්ෂණ සහිත කර්මස්ථානයයි. කර්මස්ථානය පිළිබඳ ස්වභාවය උපධාරණය (සැලකිල්ලට ගැනීම)යයි කී නියාය. මෙසේ සන්ධි පසක් සහිත කර්මස්ථානය උගන්නාවිට තමන්ද වෙහෙසට පත්නොවේ, ආචාර්ය වරයාද වෙහෙසට පත් නොකරවයි. එහෙයින් මඳක් කියවාගෙන බොහෝ කලක් හදරා, මේ ආකාරයෙන් සන්ධි පසක් ඇති මේ කමටහන උගෙන ආචාර්යවරයා සමීපයෙහි හෝ පෙර කී ප්‍රකාර ඇති අන් සෙනස්නෙක හෝ වෙසෙමින් සුලු පලිබෝධයන් සිඳලා, බත්කිස නිමවීමෙන් පසු, බත්මත දුරලා සුවසේ හිඳගෙන රත්නත්‍රය ගුණ සිහිකිරීමෙන් සිත් පහන් කොටගෙන ආචාර්යවරයාගෙන් උගත් එක් පදයක් හෝ අමතක නොකොට මේ ආනාපානසති කර්මස්ථානය මෙනෙහි කළයුතුය. එහි මෙනෙහි කිරීමේ පිළිවෙළ මෙසේයි:

ගණනා අනුබන්ධනා ඵුසනා ඨපනා සලක්ඛණා
විවට්ටනා පාරිසුද්ධි තෙසඤ්ච පටිපස්සනා.

ගණනය, අනුබන්ධනය, ඵුසනාය, ඨපනාය, සල්ලක්ඛණය, විවට්ටනාය, පාරිසුද්ධිය, පටිපස්සනාය යන මේය.

එහි **ගණනා** යනු ගණනයමයි, **අනුබන්ධනා** යනු, ආශ්වාස ප්‍රශ්වාසයන් අනුව සිත පැවැත්වීමයි. **ඵුසනා** යනු ආශ්වාස ප්‍රශ්වාසයන් ස්පර්ශ කරන ස්ථානය වන නාසිකාග්‍රයෙහි ස්පර්ශ කිරීමයි, **ඨපනා** යනු අර්පණායි, හෙවත් සිත මනාකොට අරමුණෙහි පිහිටුවීමයි, **සල්ලක්ඛණා** යනු, අනිත්‍යාදිය මනාකොට සලකන හෙයින් විදර්ශනාවයි, **විවට්ටනා** යනු, ක්ලේශයන් (සර්වප්‍රකාරයෙන් සන්සිඳුවන හෙයින්) මාර්ගයමැයි, **පාරිසුද්ධි** යනු, ඵලයමැයි. **තෙසඤ්ච පටිපස්සනා** යනු ප්‍රත්‍යවෙක්‍ෂණයයි. එහිලා මේ ආධුනික කුලපුත්‍රයා විසින් පළමුකොට ගණනය කෙරෙමින් මේ කමටහන මෙනෙහිකළයුතුය. ගණනය කරනවිට පහට අඩුවෙන් නොනැවැත්විය යුතුය. දහයට වඩා වැඩියෙන් ගණනය නොකළයුතුය. අතරතුර කඩවීමක් නොපෙන්විය යුතුය. පහට අඩුවෙන් නවත්වනවිට බාධා සහිත ගවගාලෙක හිර කරනලද ගව සමූහයක් මෙන් බාධා සහිත අවකාශයෙහි චිත්තොත්පාදය චංචල වේ. දහයට වඩා ගණනය ගෙනයන විට, ගණනයම ඇසුරුකළ චිත්තොත්පාදය වේ. අතරතුර කඩවීමක් දක්වනවිට, 'මාගේ කර්මස්ථානය මුදුන්පත් වූයේ දේ නොවූයේ දේ හෝ'යි සිත ඒ මේ අත පැද්දෙයි. එහෙයින් මෙකී දෝෂයන් වලක්වා ගණනය කළයුතුය. ගණනය කරනවිටද පළමුකොට සෙමින් වී මනින්නකුගේ ගණන විලාශයෙන් ගණන් කළයුතුය. වී මනින්නෙක් නැළිය පුරවා, එකයි කියමින් මුනින් නමයි, නැවත පුරවමින් කිසියම් කසලක් දැක එය ඉවත් කරමින්ද 'එකයි, එකයි' කියයි. 'දෙකයි, දෙකයි' ආදියෙහිද මෙම නයයි. ඒ ආකාරයෙන්ම මොහු (යෝගාවචරයා) විසින්ද ආශ්වාස ප්‍රශ්වාසයන් අතුරෙන් යමක් වැටහේද එය ගණන් ගෙන 'එකයි, එකයි' කී තැන් පටන් 'දහයයි, දහයයි' කියනු තෙක් පවත්නා පවත්නා ආශ්වාසය හෝ ප්‍රශ්වාසය ගැන සැලකීමෙන්ම ගිණිය යුතුය. මෙසේ ගණනය කරන ඔහුට නික්මෙන්නාවූද පිවිසෙන්නාවූද ආශ්වාස ප්‍රශ්වාසයෝ ප්‍රකට වෙති. ඉක්බිති ඔහු විසින් වී මනින්නකුගේ වැනි එම ලැසිව ගණන් කිරීම හැර, ගොපල්ලකුගේ ගවයන් ගණන් කිරීම වැනි යුහුව ගණන් කිරීම කළයුතුය. දක්‍ෂවූ ගොපල්ලෙක් හිණපටින් (ඔඩොක්කුවෙන්) අකුරු (බොරළු) ආදිය ගෙන රැහැන් හා කෙවිටි අතැතිව උදසනින්ම ගවහල වෙත ගොස් ගවයන් පිටට ගසා හිදි කණුව (කඩුල්ල) මත හිඳ දොරකඩ වෙත පැමිණි දෙනුන් 'එකයි, දෙකයි' යනුවෙන් බොරළු කැට දමමින් ගණනය කරයි. තුන්යම් රැය මුළුල්ලෙහි තදබදවූ අවකාශයෙහි හිරවී දුකසේ සිටි ගවරැළ එකිනෙකාගේ සිරුරු ගටමින් කීප දෙනකු බැගින් වේගයෙන් නික්මෙති, හේ තෙමේ 'තුනයි, හතරයි, පහයි' යනුවෙන් යුහුව ගණනය කෙරේමැයි. එසේම

පළමු කී ආකාරයෙන් ගණින්නහු (යෝගාවචරයා)ගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ ප්‍රකටව යුහුයුහුව නැවත නැවත හැසිරෙත්.

ඉක්බිති ඔහු විසින් නැවත නැවතත් හැසිරෙතියි දැන ඇතුළත හෝ පිටත නොගෙන නහය දෙරකඩට ආ ආශ්වාස ප්‍රශ්වාසයන් 'එකයි, දෙකයි, තුනයි, හතරයි, පහයි', 'එකයි, දෙකයි, තුනයි, හතරයි, පහයි', 'එකයි, දෙකයි, තුනයි, හතරයි, පහයි, හයයි,' 'එකයි, දෙකයි, තුනයි, හතරයි, පහයි, හයයි, හතයි;-පෙ-අටයි, නවයයි, දහයයි' යනුවෙන් යුහුයුහුව ගිණියයුතුය. කමටහන ගිණීම හා සමඟ බැඳී ඇති කල්හි, ගිණීමේ බලයෙන්ම සිත එකඟ වේ, අවලෙහි පිහිටෙන් සැඩ පහරෙහි නැව සිටින්නාසේය. මේ ආකාරයෙන් යුහුයුහුව ගණින ඔහුට කමටහන නිරතුරුව පවත්නාසේ වැටහේ, ඉක්බිති නිරතුරුව පවත්නේයයි දැන ඇතුළත හෝ පිටත හෝ වාතය නොගෙන පළමු නයින්ම යුහුයුහුව ගිණියයුතුය. ඇතුළට පිවිසෙන වාතය හා සමග සිත මෙහෙයවන්නහුට ඇතුළත වාතයෙන් පහරනලද්දක් මෙන්ද මේදයෙන් පිරුණක් මෙන්ද වේ, පිටතට නික්මෙන වාතය හා සමග සිත නාසාග්‍රයෙන් පිටතට යවන්නහුගේ සිත පිටත ඇති නොයෙක් අරමුණු කෙරෙහි දිවයයි. වාතය වදින වදින තන්හි සිහිය පිහිටුවා වඩන්නහුටම භාවනාව සමෘද්ධ වේ. එහෙයින් ඇතුළතද පිටතද වාතය නොගෙන පළමු නයින්ම යුහුයුහුව ගිණියයුතුයයි කියනලදි.

කොපමණ කලක් මෙසේ ගිණීම කළයුතුද? යම්තාක් ගිණීමෙන් තොරව ආශ්වාස ප්‍රශ්වාස අරමුණෙහි සිහිය පිහිටාද, ඒතාක් කල් කළයුතුය. පිටත විසුරුණ විතර්කය නැතිකොට ආශ්වාස-ප්‍රශ්වාසාරම්මණයෙහි සිහිය පිහිටුවීම පිණිසම ගිණීම කළයුතුය. මෙසේ ගිණීම් වශයෙන් මෙනෙහිකොට අනුබන්ධනා අනුව සිහිය පැවැත්වීම් වශයෙන් මෙනෙහි කළයුතුය. අනුබන්ධනා නම්, ගිණීම නවතා සිහියෙන්, නිරතුරුව ආශ්වාස ප්‍රශ්වාසයන් අනුව යාමයි, එම අනුගමනයද මුල මැද අග අනුව යෑම් වශයෙන් නොකළයුතුය. පිටතට නික්මෙන වාතයෙහි මුල නාභියයි. මැද හෘදයයි, අග නාසිකාග්‍රයයි. ඇතුළට පිවිසෙන වාතයෙහි මුල නාසිකාග්‍රයයි, මැද හෘදයයි, අග නාභියයි. එය අනුගමනය කරන ඔහුගේ සිත වික්ෂේපයට ගොස් විඩාව පිණිසද, කම්පනය පිණිසද හේතුවේ. කියනලද මැයි:

අස්සාසාදිමජ්ඣපරියොසානං
සතියා අනුගච්ඡතො අජ්ඣත්තං
වික්ඛෙපගතෙන චිත්තෙන කායො පි
චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච.

පඤ්චාසාදිමජ්ඣපරියොසානං
සතියා අනුගච්ඡතො බහිද්ධා
විකෙඛපගතෙන චිත්තෙන කායොපි
චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා චා'ති [1]

ආශ්වාසය පිළිබඳ මුල, මැද, අග සිහියෙන් අනුගමනය කරන්නහුගේ ඇතුළත වික්ෂේපයට ගිය සිත හේතුකොටගෙන කයද සිතද විඩාසහිත වේ, චංචලවේ, කම්පිතද වේ.

ප්‍රශ්වාසය පිළිබඳ මුල, මැද, අග සිහියෙන් අනුගමනය කරන්නහුගේ පිටත වික්ෂේපයට ගිය සිත හේතුකොටගෙන කයද සිතද විඩාසහිත වේ, චංචල වේ, කම්පිතද වේ.

එහෙයින් අනුවයාමෙන් මෙනෙහි කරන්නහු විසින් මුල, මැද, අග වශයෙන් මෙනෙහි නොකළයුතුය, එතෙකුදු වුවත්, ඵුසනා (ස්පර්ශ කිරීම්) වශයෙන්ද. ඨපනා (අරමුණෙහි සිත පිහිටුවීම්) වශයෙන්ද මෙනෙහි කළයුතුය. ගණනා-අනුබන්ධනා වශයෙන් මෙන් ඵුසනා-ඨපනා වශයෙන් වෙන වෙනම මෙනෙහි කිරීමෙක් නැත, ස්පර්ශ කළ කළ තන්හිම ගණනය කිරීමෙන් ගණනා වශයෙන්ද, ඵුසනා වශයෙන්ද මෙනෙහි කරයි, එහිම ගණනය නවතා සිහියෙන් ඒ ආශ්වාසප්‍රශ්වාසයන් අනුව යමින්ද, අර්පණා වශයෙන් සිත පිහිටුවමින්ද අනුබන්ධනා වශයෙන්ද, ඵුසනා වශයෙන්ද, ඨපනා වශයෙන්ද මෙනෙහි කෙරෙතියි කියනු ලැබේ. ඒ මේ අර්ථය අටුවාහි කියනලද පඞ්ගුලොපමා, දොවාරිකොපමාවන්ගෙන්ද, පටිසම්භිදාවෙහි කියනලද කකචූපමාවෙන්ද දතයුතුය[2].

එහි පඞ්ගුලොපමාව මෙසේය: යම්සේ කොරෙක් තෙමේ ඊලෙක්හි (උන්සිල්ලාවෙක්හි) ක්‍රීඩාකරන මව්පුතු දෙදෙනකුගේ ඊල එහි ඊල්ටැඹ මුල හිඳ පැද්දූවිට ක්‍රමයෙන් එන්නාවූද යන්නාවූද ඊල්පුවරුවෙහි දෙකෙළවර හා මධ්‍යය දක්නේද, එහෙත් දෙකෙළවර හා මධ්‍යය දකිනු පිණිස උත්සුක නොවේද, එසේම භික්ෂු තෙමේ සිහි වශයෙන් කමටහන් නිමිති නමැති ටැම්මුල ආශ්වාස ප්‍රශ්වාස නමැති ඊල යවා නිමිත්තෙහි සිහිය පිහිටුවා හුන්නේ ක්‍රමයෙන් එන්නාවූද යන්නාවූද ආශ්වාස ප්‍රශ්වාසයන් වැදුණු තැන මුල මැද අග සිහියෙන් අනුගමනය කරනුයේ එහිම සිත පිහිටුවා බලන්නේය, එහෙත් ඒ මුල මැද අග දකිනු පිණිස උත්සුක නොවන්නේය. මේ පඞ්ගුලොපමායි.

---

(1) පටිසම්භි - Ps i 165

(2) Ps i 170

දොවාරිකොපමාව මෙසේය: යම්සේ දෙරටුපාලයෙක් තෙමේ නගරය ඇතුළතද පිටතද සිටින පුරුෂයන් දැක 'තෝ කවරෙක්ද? කොයින් ආයේද? කොයි යන්නෙහිද? අත්හි කුමක් ඇත්ද?'යි නොවිමසන්නේද, එම පුරුෂයන් ගැන විමසීම ඔහුගේ කාර්යයක් නොවන්නේද, දෙරටුව වෙත එළඹියවුන්ම විමසන්නේද, එසේම ඇතුළට පිවිසි වාතයන්ද පිටතට නික්මුණු වාතයක්ද ගැන විමසීම මේ භික්ෂුවගේ කාර්යය නොවන්නේය, (නාසිකාග්‍ර නමැති) දෙරටුව වෙත පැමිණි ආශ්වාස ප්‍රශ්වාසයම නිමිති වන්නේය මේ දොවාරිකොපමායි.

කකචූපමාව මුල පටන් මෙසේ දතයුතුය. කියනලද මැයි:

නිමිත්තං අස්සාස පස්සාසා අනාරම්මණමෙකචිත්තස්ස
අජානතො ච තයො ධම්මෙ භාවනා නූපලබ්භති,

නිමිත්තං අස්සාසපස්සාසා අනාරම්මණමෙකචිත්තස්ස
ජානතො ච තයො ධම්මෙ භාවනා උපලබ්භතී'ති

උපනිබන්ධනනිමිත්තය, ආශ්වාසය, ප්‍රශ්වාසය යන මේ තුන එක් සිතකට අරමුණු නොවේ, මේ තුන් කරුණු නොදන්නාහට ආනාපානසතිභාවනාව සමෘද්ධ නොවේ.

උපිනිබන්ධනනිමිත්තය, ආශ්වාසය, ප්‍රශ්වාසය යන මේ තුන එක් සිතකට අරමුණු නොවේ, මේ තුන් කරුණු දන්නාහට ආනාපානසතිභාවනාව සමෘද්ධ වේ.

මේ තුන් කරුණු එක් සිතකට අරමුණු නොවනුයේ කෙසේද? එහෙත් මේ තුන් කරුණු නොදන්නාලද නොවනුයේ කෙසේද? සිතද වික්ෂෙපයට නොයන්නේ කෙසේද? පධානවීර්යයද විද්‍යමාන වනුයේ කෙසේද? භාවනානුයෝගයද සිද්ධවනුයේ කෙසේද? (ලෞකික ලෝකෝත්තර) විශෙෂාධිගමය වනුයේ කෙසේද? යම්සේ සමතලා බිම් පෙදෙසෙක රුක්කඳක් තබනලද්දේද, පුරුෂයෙක් තෙමේ එම රුක්කඳ කියතෙකින් කපන්නේද, දවකඳට වැදෙන කියත්දත් අනුසාරයෙන් ඒ පුරුෂයාගේ සිහිය එළඹියේ වේද? ඒ පුරුෂ තෙමේ තමා වෙතට එන්නාවූද ආපසු යන්නාවූද කියත්දත් මෙනෙහි නොකෙරේද, එහෙත් ආවාවූද ගියාවූද කියත්දත් නොදන්නාලද්දේ නොවේද, වීර්යයද විද්‍යමාන වේද, කාර්යයද සිද්ධවේද, අපෙක්ෂිත ඵලවිශෙෂයටද පැමිණේද, එහි සමතල බිම් පෙදෙසෙහි තබනලද දවකඳ උපනිබන්ධන නිමිත්ත වැනිය, කියත්දත් ආශ්වාස ප්‍රශ්වාසයන් වැනිය, යම්සේ දවකඳට වදින කියත්දත්

අනුසාරයෙන් පුරුෂයාගේ සිහිය එළඹියේ වේද, යම්සේ ආවාවූද ගියාවූද කියත්දත් මෙතෙහි නොකෙරේද, එහෙත් ආවාවූද ගියාවූද කියත්දත් නොදන්නාලද්දේ නොවේද, ප්‍රයත්නය විද්‍යමාන වේද, ප්‍රයෝජනය සිද්ධ වේද, අපෙක්ෂිත ඵලයට පැමිණේද, එසේම භික්‍ෂු තෙමේ නැහැ අගෙහි හෝ උඩුතොලෙහි සිහිය එළවා හුන්නේ වේ, ආවාවූද ගියාවූද ආශ්වාසප්‍රශ්වාසයන් මෙනෙහි නොකෙරේ, එහෙත් ආවාවූද ගියාවූද ආශ්වාස ප්‍රශ්වාසයෝ නොදන්නා ලද්දහු නොවෙත්, ප්‍රයත්නයද විද්‍යමාන වේ, භාවනානුයෝගයද සමෘද්ධ වේ, අපෙක්ෂිත ඵලවිශෙෂයටද පැමිණේ.

'පධානං' යනු, පධාන නම් කිමෙක්ද? ඇරඹිවීර්ය ඇත්තහුගේ කයද සිතද කර්මණ්‍ය වේ, මේ 'පධාන'යි. 'පයොග' යනු කිමෙක්ද? ඇරඹිවීර්ය ඇතියහුගේ උපක්ලෙශ හෙවත් නීවරණයෝ ප්‍රහීන වෙති, කාමවිතර්කාදීහු ශමනය වෙති, මේ පයොගයි. 'විසෙස' යනු කිමෙක්ද? ඇරඹිවීර්ය ඇත්තහුගේ සංයොජනයෝ ප්‍රහීන වෙති, අනුසයයෝ භංග වෙති, මේ විසෙසයි; මෙසේ මේ කරුණු තුන එක් සිතකට අරමුණු නොවේ, එහෙත් මේ කරුණු තුන නොදන්නාලද්දේ නොවේ, සිත වික්ෂෙපයටද නොයේ. ප්‍රයත්නය විද්‍යමාන වේ, ප්‍රයොගයද සිද්ධ වේ, විසෙසයටද පැමිණේ.

ආනාපානසති යස්ස පරිපුණ්ණා සුභාවිතා
අනුපුබ්බං පරිචිතා යථා බුද්ධෙන දෙසිතා
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා'ති.

යමකු විසින් ආනාපානසති භාවනාව බුදුන් විසින් වදහළ පරිදි පිරිපුන් කොට වඩනා ලද්දේද, ක්‍රමයෙන් පුරුදු කරන ලද්දේද, හේ තෙමේ වළා ගබින් මිදුණු චන්ද්‍රයා මෙන් මේ ලෝකය බබලවන්නේය.

මේ කකචූපමායි. මේ කකචූපමාවෙහි වනාහි කියත්දත් හා ආශ්වාස ප්‍රශ්වාසයන් ආගතාගත වශයෙන් (ආ ආ පරිදි) මෙනෙහි නොකිරීමම ප්‍රයොජනයයි දතයුතුය. මේ කමටහන මෙනෙහි කරන කිසිවකුහට නොබෝ කලෙකින්ම (පටිභාග) නිමිත්ත උපදියි. අවශේෂ ධ්‍යානාංගයන්ගෙන් හොබනා අර්පණායයි කියනලද ඨපනා හෙවත් පිහිටුවීමද සිද්ධ වේ. කිසිවකුහට වනාහි ගිණීමෙන් මෙනෙහි කරන කාලයෙහි පටන්ම ක්‍රමයෙන් ඖළාරිකවූ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ නැවැත්මෙන් කායවිඩාව සන්සුන් කල්හි කයද සිතද සැහැල්ලු වේ, සිරුර අහසෙහි පාවෙන ආකාරයට පත්වූ සේ දනේ. යම්සේ විඩා සහිත

කය ඇත්තකු ඇඳෙක හෝ පුටුවෙක හිඳගන්නාවිට ඇඳ පුටු නැමේද, හඬ නැගේද, ඇතිරිලි හැකිලේද, එහෙත් විඩානැත්තකු හිඳිනවිට ඇඳ පුටු එසේ නොනැමේ, හඬ නොනැගේ, ඇතිරිලි නොම හැකිලේ ඇඳපුටු ඉඹුල්පුලුන් පිරුණාසේ වේ. කවර හෙයින්ද? යම් හෙයකින් විඩා නොමැති කය සැහැල්ලු වේ, එහෙයින් එසේම ගිණීම් වශයෙන් මෙනෙහි කරන කාලයෙහි පටන් අනුක්‍රමයෙන් ඖළාරිකවූ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ සන්සිඳීම් වශයෙන් කායවිඩාව සන්හුන් කල්හි කයද සිතද සැහැල්ලු වේ. සිරුර ආකාශයෙහි පාවෙන තත්වයකට පත්වූසේ දනේ. ඔහුට ඖළාරික ආශ්වාස ප්‍රශ්වාසයන් නිරුද්ධවූ කල්හි සියුම්වූ ආශ්වාසප්‍රශ්වාස නිමිත්ත අරමුණුකොටගත් සිත පවතී. එයද නිරුද්ධ වූකල්හි තව තවත් වඩ වඩා සියුම්වූ නිමිති අරමුණු පවත්නේමය. කෙසේදයත්, යම්සේ පුරුෂයෙක් තෙමේ මහත්වූ යකඩ කුරෙකින් ලොහොතලියකට ගසාද, එක් පහරින් මහත් ශබ්දයක් නැගේ, ඔහුගේ සිත ඖළාරික ශබ්දය අරමුණුකොට පවතී, ඖළාරික ශබ්දය ඉකුත්ව ගිය පසු සූක්ෂ්ම ශබ්දනිමිත්ත අරමුණු වේ. එයද ඉක්මගිය පසු වඩවඩාත් සියුම් ශබ්ද අරමුණු වේ. එසේයයි දතයුතුය. කියන ලදමැයි, 'යම්සේ ලොහොතලියකට ගැසූ කල්හි' යනුවෙන් විස්තර කළ යුතුය. යම්සේ වනාහි සෙසු කර්මස්ථානයෝ මතු මත්තෙහි වඩනා කල්හි මහත් වෙත්ද, මේ කර්මස්ථානය එසේ නොවේ, මෙය නැවත නැවත වඩන්නහුට සියුම්බවට යෙයි, වැටහීමටද නො-එළඹේ, මෙසේ ඒ ආශ්වාස ප්‍රශ්වාස නිමිත්ත නොවැටහීමට එළඹි කල්හි ඒ භික්ෂුව විසින් හුනස්නෙන් නැගිට පත්කඩ ගසාදමා නොයායුතුය. කුමක් කළ යුතුද? ආචාර්යයන් විමසම්'යි හෝ, මාගේ කමටහන නටුයේ වනැ'යි හෝ නොනැගිටිය යුතුය. ඉරියවු වෙනස්කොට යන්නහුට කමටහන නැවත නැවත අලුත් වේ. එහෙයින් හුන්වනම හිඳ (පළමු තමා විසින් ඵුසනා වශයෙන් සලකනලද) තන්හි නැවත සිහි එළවිය යුතුය. එහි, සිහි එළවන උපාය මෙසේයි:- කමටහන නොවැටහෙන බව දනෙනවිට ඒ භික්ෂුව විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතුය. 'මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ නම් කොහි ඇත්ද? කොහි නැත්ද? කවරකුහට හෝ ඇත්ද? කවරකුහට නැත්දැ'යි යනුවෙනි. මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරන්නහු විසින්, මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ මව්කුස ඇතුළත නැත, දියෙහි ගිලුණවුනට නැත, එසේම විසඥවූවනටද මළවුනටද චතුර්ථධ්‍යානයට සමවන්නවුනටද, රූප අරූප භවයන්හි උපන්නවුනටද නිරෝධයට සමවන්නවුනටද නැතැ'යි දන මේ ආකාරයෙන් තමා විසින් තමාටම මෙහෙයවීම කටයුතුය. 'නුවණැත්ත, මව්කුසට නොගියේ නොවෙහිද? දියෙහි නොගිලුණේ නොවෙහිද? සිහිසුන් බවට නොගියේ

නොවෙහිද? නොමළේ නොවෙයිද? චතුර්ථධ්‍යානයට නොසමවන්නේ නොවෙහිද? රූපාරූප භවයන්හි නො-උපන්නේ නොවෙහිද? නිරෝධයට නොසමවන්නේ නොවෙහිද? ආශ්වාස ප්‍රශ්වාසයෝ ඇත්තාහුම වෙති, නුවණ මඳ හෙයින් අල්වාගනු නොහැකි වෙහි'යි යනුවෙනි. ඉක්බිත්තෙන් මොහු විසින් පියෙවි වශයෙන් ගැටෙන තන්හි සිත පිහිටුවා මෙනෙහි කිරීම පවත්වාගත යුතුය. මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ දිගු නැහැ ඇත්තහුගේ නැහැපුඩුද, කෙටිනැහැ ඇත්තහුගේ උඩුතොලද ගැටෙමින් පවත්නාහුය. එහෙයින් මොහු විසින් මෙනම් තන්හි ගැටෙති'යි නිමිති පිහිටුවා ගතයුතුය. මෙම අර්ථය ගැන සලකාගෙනම භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදි. 'මහණෙනි, මුළාසිහි ඇත්තහුට, නුවණ මඳවූවහුට මම ආනාපානසතිභාවනාව නොකියමි'(1) යනුයි.

කෙසේ වතුදු, කිසියම් කර්මස්ථානයක් සිහි ඇත්තහුටම, නුවණ ඇත්තහුටම සමෘද්ධ වේ. මේ ආනාපානසති කර්මස්ථානය හැර සෙසු කර්මස්ථානයක් මෙනෙහි කරත් කරත් වඩ වඩා ප්‍රකට වේ, මේ ආනාපානසති කර්මස්ථානය වූකලී ගරුකවූ, වැඩීමට අපහසුවූ භාවනාවෙකි, බුදු පසේබුදු බුදුසවු ආදී මහාපුරුෂයන්ගේම මනස්කාරයට විෂය වූවෙකි, එසේ මෙසේ වූවක් නොවේ, එසේ මෙසේ නොවූ සත්‍වයන් විසින් සෙවුණා ලද්දේය. යම් යම් පමණෙකින් මෙනෙහි කරනු ලැබේද, ඒ ඒ පමණට ශාන්තද සූක්ෂ්මද වේ. එහෙයින් බලවත්වූ ස්මෘතියද ප්‍රඥාවද අවශ්‍ය වන්නේය.

යම්සේ වනාහි පටසළුවක් හිදියම් කරනකල හිදිකටුවද සියුම් වියයුතුවේද, හිදිකටුවෙහි මලය වඩාමත් සියුම් වියයුතු වේද, එසේම පටසළුවක් වැනිවූ මේ කමටහන වඩනකල හිදිකටුවක් මෙන් සියුම්වූ සිහියද, එම සිහියෙන් යුක්තවූ හිදිකටුමල වැනි සියුම්වූ බලවත් ප්‍රඥාවද අවශ්‍ය වන්නේය. එවන් ස්මෘතිප්‍රඥාවෙන් සමන්විතවූ භික්ෂුව විසින් ඒ ආශ්වාස ප්‍රශ්වාසයන් ස්වාභාවික වශයෙන් ගැටෙන තැන් හැර අන් තැනෙක නොසෙවිය යුතුය.

යම්සේ වනාහි ගොවියෙක් සී සාමින් සිට ගොනුන් මුද තණබිමට යවා සෙවණෙක හිඳ ගිමන් හරින විට ඒ ගොන්නු මහවනයට වදනාහුද, එවිට ඔහු දක්ෂ ගොවියෙක් නම් ඒ ගොනුන් නැවත අල්වාගෙන යොදනු කැමැත්තේ නම් ඔවුන් පසුපස ගොස් වනයෙහි නොඇවිදිනේය, වැලිදු රැහැනක්ද කෙවිටක්ද ගෙන ඉඳුරාම ගොනුන් පැන් බොන

(1) සං. නි. ආනාපානසති සං. - S v 337

තොටට ගොස් හිඳින්නේය, නැතහොත් හෝන්නේය. ඉක්බිති දවල් කාලයෙහි ගොදුරු පිණිස හැසිර පැන්තොටට බැස නහා පැන් බී යලි ගොඩ අවුත් සිටින ගොනුන් රැහැනෙන් බැඳ කෙවිටෙන් අනිමින් ගෙනවුත්, හීයෙහි යොද නැවත කර්මාන්ත කරන්නේය, එසේම ඒ භික්ෂුව විසින් එම ආශ්වාස ප්‍රශ්වාසයන් පියවි වශයෙන් ගැටෙන තැන්හි හැර අන් තැනෙක නොසෙවියයුතුය. සිහි නමැති රැහැනද නුවණ නමැති කෙවිටද ගෙන පියවි වශයෙන් ගැටෙන තැන සිත පිහිටුවා මෙනෙහිකිරීම පැවැත්වියයුතුය. මෙසේ මෙනෙහිකරන ඒ යෝගියාහට නොබෝ කලෙකින්ම ඒ ආශ්වාස ප්‍රශ්වාසයෝ පැන් තොටෙහි ගොනුන් සෙයින් නැවත වැටහෙති. ඉක්බිති ඔහු විසින් සිහි නමැති රැහැනින් බැඳ එතන්හිම යොද ප්‍රඥ නමැති කෙවිටෙන් අනිමින් නැවත නැවතත් කමටහන්හි තියැලිය යුතුය.

මෙසේ කමටහන්හි යෙදෙන ඒ යෝගාවචරයාහට නොබෝ කලෙකින්ම (උග්ගහපටිභාග) නිමිති වැටහේ. එය වනාහි සියල්ලන්ටම එක සමාන නොවේ, වැලිදු කිසිවකුට එය සුවපහස් දනවමින් ඉඹුල් පුළුන් මෙන්ද, කපු පුළුන් මෙන්ද, සුළං රැල්ලක් මෙන්ද වැටහෙතැ'යි කෙනෙක් කීහ. අට්ඨකථාවන්හි එන විනිශ්චය මෙසේයි: මේ නිමිත්ත වනාහි කිසිවකුට තාරකාරූපයක් මෙන්ද, මිණිවටක් (දමක්) මෙන්ද, මුතුපටක් මෙන්ද කිසිවකුට ගොරහැඩිපහස ඇති කපු ඇටයක් මෙන්ද, දැවඅරටු හිදක් සෙයින්ද, කිසිවකුට දික්වූ පාසළම් හුයක් මෙන්ද මල්දමක් මෙන්ද, දුම් සිළුවක් මෙන්ද, කිසිවකුට පැතිරුණ මකුළුහුයක් මෙන්ද, වලා පටලයක් මෙන්ද, නෙළුම් මලක් මෙන්ද, රියසකක් මෙන්ද, සඳමඬලක් මෙන්ද, හිරුමඬලක් මෙන්ද වැටහේ.

ඒ මේ (පටිභාග නිමිත්ත) වනාහි, යම්සේ බොහෝ භික්ෂූන් සූත්‍රාන්තය සජ්ඣායනකොට හුන් කල්හි, එක් භික්ෂුවක් විසින් ඔබ වහන්සේට මේ සූත්‍රය කුමක් සදිසිව වැටහේදැයි ඇසූ විට, එක් භික්ෂු කෙනෙක් 'මට පර්වතයෙකින් වැහෙන මහනදියක් මෙන් වැටහේ'යයි කීහ, අන් කෙනෙක් 'මට එකම වනරොදක් මෙන් වැටහේ'යයි ද, තවද කෙනෙක් මට සිහිල් සෙවණ සහිත අතුපතර ඇති, පල බරින් බරවූ එකම රුකක් මෙන් වැටහේ'යයිද කීහ. ඒ භික්ෂූන්හට එකම සූත්‍රය ප්‍රඥනානත්වය හේතුකොටගෙන නොයෙක් ආකාරයෙන් වැටහේ, එපරිද්දෙන්ම එකම කමටහන සංඥනානත්වය හේතුකොටගෙන නොයෙක් අයුරින් වැටහේ. මේ නිමිත්ත වනාහි සංඥවෙන් හටගන්නේය, සංඥව නිදනකොට ඇත්තේය. සංඥව ප්‍රභවකොට ඇත්තේය, එහෙයින් සංඥනානත්වය හේතුකොටගෙන නන්අයුරින් වැටහෙතැ'යි දතයුතුය.

තවද මෙහි ආශ්වාසය අරමුණුකොට ඇති සිත එකෙකි, ප්‍රශ්වාසය අරමුණුකොට ඇති සිත අනෙකෙකි, නිමිත්ත අරමුණුකොට ඇති සිත තවද එකෙකි. යම් කෙනකුට මේ තුන් කරුණු නැත්ද, ඔහුගේ කමටහන අර්පණාවට හෝ උපචාරයට හෝ නොපැමිණේ. යමකුට මේ තුන් ධර්මයෝ ඇත්ද ඔහුට මේ කමටහන (උපචාරයටද අර්පණාවටද) පැමිණේ. කියනලදමැයි:

නිමිත්තං අස්සාසපස්සාසා අනාරම්මණමෙකචිත්තස්ස
අජානතො තයො ධම්මෙ භාවනා නුපලබ්භති

නිමිත්තං අස්සාසපස්සාසා අනාරම්මණමෙකචිත්තස්ස
ජානතො ච තයො ධම්මෙ භාවනා උපලබ්භතීති.(1)

අනුබන්ධන නිමිත්තද -පෙ-එක් සිතකට අරමුණු නොවේ -පෙ- මෙකී තුන් කරුණු නොදන්නාහට ආනාපාන සතිභාවනාව සිද්ධ නොවේ.

අනුබන්ධන නිමිත්තද -පෙ- එක් සිතකට අරමුණු නොවේ. මේ තුන් කරුණු දන්නාහට ආනාපානසති භාවනාව සිද්ධ වේ.

මෙසේ පටිභාගනිමිත්ත වැටහුණවිට ඒ භික්ෂුව විසින් ආචාර්යවරයා වෙත ගොස්, 'ස්වාමීනි, මට මෙවන් දෙයක් වැටහේ'යයි දන්වියයුතුය. ආචාර්යවරයා විසින් වනාහි, 'මේ නිමිත්තැ'යි හෝ 'නිමිති නොවේ'යි හෝ නොකිවයුතුය. 'ඇවැත්නි භාවනාවෙහි යෙදෙනවිට එසේ වන්නේය'යි කියා නැවත නැවතත් මෙනෙහි කරන්නැ'යි කිවයුතුය. නිමිත්තැ'යි කිවහොත් භාවනාවෙහි නිමාව වෙත යන්නේය, නිමිති නොවෙති'යි කිවහොත් භාවනාවෙහි ආශා හැර පසුබස්නේය, එහෙයින් ඒ දෙකම නොකියා මෙනෙහි කිරීමෙහි යෙදවියයුතුයයි යන මේ දීඝභාණක මතයයි. මජ්ඣිමභාණකයෝ වනාහි, 'ඇවැත්නි මේ නිමිත්තැ'යි කියා 'සත්පුරුෂය, නැවත නැවත කමටහන මෙනෙහි කරන්නැ'යි කිවයුතුය'යි පවසති. ඉක්බිති ඒ භික්ෂුව විසින් නිමිත්තෙහිම සිත පිහිටුවියයුතුය, මෙසේ මෙතැන් පටන් ඒ යෝගාවචරයාහට 'ඨපනා' වශයෙන් භාවනාව සිද්ධවේ. කියන ලදමැයි පුරාණාචාර්යයන් විසින්

නිමිත්තෙ ඨපයං චිත්තං නානාකාරං විභාවයං
ධීරො අස්සාසපස්සාසෙ සකං චිත්තං නිබන්ධතී'ති.

---

(1) පටිසම්භිද - Ps i 170f

(පටිභාග) නිමිත්තෙහි සිත පිහිටුවමින් නුවණැත්තේ (ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබද) නොයෙක් ආකාරයන් ප්‍රකට කෙරෙමින් තමාගේ සිත එම ආශ්වාසප්‍රශ්වාසයන් කෙරෙහි රඳවයි.

මෙසේ ඒ යෝගාවචරයාහට පටිභාගනිමිත්ත වැටහීමෙහි පටන් නීවරණයෝ නටුවාහුම වෙති, ක්ලේශයෝ සන්හිඳියාහුම වෙති. සිහිය එළඹ සිටියේම වේ. සිත උපචාර සමාධියෙන් සමාහිත වූයේම වේ, ඉක්බිත්තෙන් ඒ යෝගාවචරයා විසින් එම පටිභාගනිමිත්ත (පුළුන්පිඩු, තාරකාරූප ආදී) වර්ණ වශයෙන් මෙනෙහි නොකළයුතුවේ, (ගොරහැඩි බව ආදී හෝ අනිත්‍යබව ආදී හෝ) ලක්‍ෂණ වශයෙන් ප්‍රත්‍යවෙක්‍ෂණයද නොකළයුතුය. එතෙකුදු වුවත්, රජ මෙහෙසියක විසින් සක්විති ගැබක් සෙයින්ද, ගොවියකු විසින් හැල්යව ගබක් සෙයින්ද ආවාසාදී සප්ත අසත්ප්‍රායයන් දුරුකොට සත්ප්‍රායවූ එම ආවාස ආදිය සෙවුමින් මනාකොට රැකියයුතුය. ඉක්බිති එම පටිභාගනිමිත්ත මේ ආකාරයෙන් රැක යලි යලිදු මෙනෙහි කිරීම් වශයෙන් වෘද්ධියට මහත්බවට පමුණුවා දශවිධ අර්පණා කුශලතාව ඉපැදවිය යුතුය. වීර්යසමතාව යෙදවිය යුතුය.

මෙසේ ප්‍රයත්න කරන ඒ යෝගාවචරයාහට යට පඨවිකසිණයෙහි කී පිළිවෙළින්ම ඒ පටිභාගනිමිත්තෙහි චතුෂ්ක පංචක ධ්‍යානයෝ උපදනාහුය. මෙසේ උපන් චතුෂ්ක පංචකධ්‍යාන ඇති භික්‍ෂු තෙමේ මෙම භාවනාවෙහිදී සල්ලක්ඛණ විවට්ටනා වශයෙන් කමටහන් වඩා පාරිශුද්ධියට පැමිණෙනු කැමැත්තේ එම ධ්‍යානයම පස් ආකාරයෙන් වසීභාවයට පමුණුවා ප්‍රගුණකොට නාමරූපයන් ව්‍යවස්ථාපනය (නිශ්චය) කොට විදර්ශනා පටන්ගනියි. කෙසේදයත්, හේතෙමේ සමාපත්තියෙන් නැගී ආශ්වාස ප්‍රශ්වාසයනට ප්‍රභවවූ කරජකායද චිත්තයද බලයි. යම්සේ චනාහි කඹුරු උදුනට ගිනි පිඹිනවිට හස්ත්‍රාව (මයිනාහම)ද ඒ අනුව පැවැති පුරුෂයාගේ ව්‍යායාමයද නිසා වාතය ඔබමොබ හමයිද, එසේම කයද සිතද නිසා ආශ්වාස ප්‍රශ්වාසයෝ පවත්නාහුය. ඉක්බිති ආශ්වාස ප්‍රශ්වාසයන් හා කරජකාය රූපයයිද, චිත්තයද එය හා බැඳුණු ධර්මයන් අරූපයයිද ව්‍යවස්ථාපන (නිශ්චය) කරයි. මේ මෙහි සංක්ෂෙපයයි. නාමරූපව්‍යවස්ථාපනය විස්තර වශයෙන් මතු දක්වනු ලබන්නේය.

මෙසේ නාමරූප දෙක ව්‍යවස්ථාපනය කොට ඒ නාමරූපයනට හේතුවූ කරුණු සොයයි, එසේ සොයනුයේ එම හේතු දැක තුන් කල්හි එම නාමරූපයන්ගේ පැවැත්ම අරභයා සැක දුර හරියි. සැක දුර හැර

රූපකලාප සම්මර්ශන වශයෙන් තිලකුණට නංවා උදයව්‍යය අනුව දකීමේ පූර්වාවස්ථාව උපන් කල්හි 'ඔභාස' ආදීවූ දශවිධ විදර්ශනා උපක්ලෙශයන් හැර උපක්ලෙශයන් කෙරෙන් මිදුණු ප්‍රතිපදඥනය මාර්ගය'යි ව්‍යවස්ථාපනය කොට උදයානුපස්සනාව හැර භංගානුපස්සනාවට පැමිණ, නිරතුරුවම භංගානුපස්සනා හෙයින් භය වශයෙන් එළඹි සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරෙනුයේ, නො-ඇලෙනුයේ, මිදෙනුයේ අනුපිළිවෙළින් සතර ආර්යමාර්ගයට පැමිණ රහත් පෙලෙහි පිහිටා එකුන්විසිවැදෑරුම් ප්‍රත්‍යවෙක්‍ෂාඥනයෙහි කෙළවරට පැමිණියේ දෙවියන් සහිත ලෝකයාහට අග්‍ර දක්‍ෂිණෙය්‍යභාවයට පත්වන්නේය. මෙතෙකින් මෙහි ගිණීමෙන් පටන්ගෙන පටිපස්සනාවෙන් අවසන්වන ආනාපානසති සමාධිභාවනාව සමාප්ත වේයයි මේ සියලු ආකාරයෙන් කරනලද ප්‍රථමචතුෂ්ක වර්ණනායි.

සෙසු චතුෂ්ක තුනෙහි වනාහි, යම්හෙයකින් වෙන් වෙන් වශයෙන් කර්මස්ථාන භාවනා නයෙක් නැත්ද, එහෙයින් පද පිළිවෙළින්ම එම චතුෂ්ක තුනෙහි අර්ත්‍ථය මෙසේ දතයුතුය: **පීති පටිසංවෙදී** යනු, පීතිය මනාකොට දනිමින්, ප්‍රකට කරමින්, ආශ්වාස කරන්නෙමි'යි ප්‍රශ්වාස කරන්නෙමි'යි හික්මෙයි. එහි දෙආකාරයෙකින් පීතිය මොනවට දන්නා ලද්දක් වෙයි, අරමුණු වශයෙන් හා අසම්මොහ වශයෙනි. කෙසේනම් පීතිය අරමුණුවශයෙන් මොනවට දන්නාලද්දේ වේද? පීති සහිතවූ (ප්‍රථම, ද්විතීය) ධ්‍යාන දෙකම සමවදියි. සමවන් කෙණෙහිම ධ්‍යානප්‍රතිලාභය හේතුකොටගෙන පීතිය අරමුණු වශයෙන් මොනවට දන්නාලද්දේ වේ, අරමුණ මොනවට දන්නාලද හෙයිනි. අසම්මොහ වශයෙන් කෙසේ මොනවට දන්නාලද්දේ වේද? පීති සහිතවූ (ප්‍රථම, ද්විතීය) ධ්‍යාන දෙකම සමවැද, එයින් නැඟී ධ්‍යානය හා සමග යෙදුණ පීතිය ක්‍ෂය වශයෙන්ද ව්‍යයවශයෙන්ද සලකා බලයි. විදර්ශනා ක්‍ෂණයෙහි ඒ යෝගියා විසින් ලක්‍ෂණ ප්‍රතිවෙධයෙන් පීතිය අසම්මොහවශයෙන් මොනවට දන්නාලද්දේ වේ.

පටිසම්භිදවෙහි මෙය කියන ලදමැයි: දීර්ඝවූ ආශ්වාස වශයෙන් වික්ෂේප නොවූ චිත්තෛකාග්‍රතාව දන්නහුට සිහිය එළඹ සිටියේ වේ. එම සිහියෙන් එම ඥනයෙන් ඒ පීතිය මොනවට දන්නාලද්දේ වේ. දීර්ඝවූ ප්‍රශ්වාස වශයෙන්.... කෙටිවූ ආශ්වාස වශයෙන්...කෙටිවූ ප්‍රශ්වාස -පෙ-සියලු කය මොනවට දනිමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන්..... කායසංස්කාරය සන්සිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම් වශයෙන් වික්ෂෙප නොවූ චිත්තෛකාග්‍රතාව දන්නාහට සිහි එළඹ සිටියේ වේ. ඒ සිහියෙන්,

ඒ ඥානයෙන් පීතිය මනාකොට දන්නාලද්දේ වේ. ආවර්ජන වශයෙන් ඒ පීතිය මොනවට දන්නාලද්දේ වේ. දන්නහු විසින්, දක්නහු විසින්, ප්‍රත්‍යවෙක්ෂා කරන්නහු විසින්, (විදර්ශනා) චිත්තය පිහිටුවන්නහු විසින්, ශ්‍රද්ධාවෙන් අදහන්නහු විසින්, වීර්යය දැඩිව ගන්නහු විසින්, සිහිය එළවන්නහු විසින් සිත එකඟ කරන්නහු විසින්, සම්‍යක් ප්‍රඥවෙන් දන්නහු විසින්, මනාකොට දතයුතු දෙය මනාකොට දන්නහු විසින්, තිලකුණු වශයෙන් දතයුතු දෙය තිලකුණු වශයෙන් දන්නහු විසින්, අත්හළයුතු දෙය අත්හරින්නහු විසින්, වැඩියයුතු දෙය වඩන්නහු විසින්, සාක්ෂාත් කළයුතු දෙය සාක්ෂාත් කරන්නහු විසින්... ඒ පීතිය මොනවට දන්නාලද්දේ වේ'(1) යනුයි. මෙම නයින් සෙසු පදයන්ද, අර්ථථ වශයෙන් දතයුතුය. මෙහිලා විශේෂ වනුයේ මේය, (ප්‍රථම, ද්විතීය තෘතීය යන) තුන් ධ්‍යානයන්ගේ වශයෙන්, සුඛපටිසංවෙදිතාවද, සතර ධ්‍යානයන්ගේ වශයෙන් චිත්තසංඛාර පටිසංවෙදිතාවද දතයුතුය. චිත්තසංඛාර නම්, වේදනා සඤ්ඤ යන ස්කන්ධ දෙකයි. මෙහිලා 'සුඛපටිසංවෙදී' යන මේ පදයෙහි විදර්ශනා භූමිය දක්වනු පිණිස, 'සුඛන්ති, ද්වෙ සුඛානි, කායිකං සුඛං චෙතසිකඤ්ච'(2) (සුඛය නම් කායික චෛතසික වශයෙන් දෙකෙකි) යනුවෙන් පටිසම්භිදවෙහි කියන ලදි. **පස්සම්භයං චිත්තසංඛාරං** යනු, ඖළාරිකවූ චිත්තසංඛාරය සන්සිඳුවමින්, පහකෙරෙමින් යන අර්ථථයි. එම චිත්තසංඛාරය කායසංඛාරයෙහි කී නයින් සවිස්තරව දතයුතුය. වැලිදු, මෙහිලා 'පීති' යන පදයෙහි පීති යනුවෙන් වේදනා ස්කන්ධය කියන ලද්දේය. 'සුඛ' යන පදයෙහි ස්වරූපයෙන්ම වේදනාව කියන ලද්දේය. 'චිත්ත-සංඛාරං' යන දෙපෙදෙහි, සංඥවද වේදනාවද චෛතසිකයෝය, මේ ස්වභාවයෝ සිත පිළිබඳ වූවාහුය, චිත්තසංඛාර යන වචනයෙන් සංඥ සම්ප්‍රයුක්ත වේදනා ස්කන්ධය කියනලදැයි මෙසේ වේදනානුපස්සනා නයින් මේ චතුෂ්කය කියනලදැයි දතයුතුය.

තෙවන චතුෂ්කයෙහිද සතර ධ්‍යානයන්ගේ වශයෙන් චිත්ත පටිසංවෙදිතාව දතයුතුය. **අභිප්පමොදයං චිත්තං** යනු, චිත්තය සතුටු කරමින්, ප්‍රමොද කරමින්, පිනවමින්, ප්‍රහසන කරමින් ආශ්වාස කරන්නෙමි'යි ප්‍රශ්වාස කරන්නෙමි'යි හික්මෙයි. එහි දෙ-ආකාරයෙකින් අභිප්‍රමොදනය වන්නේය. සමාධි වශයෙන් හා විදර්ශනා වශයෙනි. සමාධි වශයෙන් කෙසේද? පීති සහිතවූ (ප්‍රථම, ද්විතීය) ධ්‍යාන දෙකට සමවදියි, ඒ යෝගී තෙමේ සමවන් කෙණෙහිම සම්ප්‍රයුක්ත ප්‍රීතියෙන්

(1) Ps i 187
(2) Ps i 188

සිත තුටු කරවයි, ප්‍රමොද කරවයි. විදර්ශනා වශයෙන් කෙසේද? පීති සහිත (ප්‍රථම, ද්විතීය) ධ්‍යාන දෙකට සමවැද ඉන් නැඟී සිට ධ්‍යාන සම්ප්‍රයුක්ත පීතිය ක්‍ෂය වශයෙන්ද ව්‍යය වශයෙන්ද සලකා බලයි. මෙසේ විදර්ශනා ලත් කෙණෙහිම ධ්‍යාන සම්ප්‍රයුක්ත පීතිය අරමුණුකොට සිත තුටු කරවයි, ප්‍රමොද කරවයි. මෙසේ පිළිපන්නේ සිත වෙසෙසින් ප්‍රමොද කරවමින් ආශ්වාස කරන්නෙමි'යි ප්‍රශ්වාස කරන්නෙමි'යි හික්මේ'යයි කියනු ලැබේ.

**සමාදහං චිත්තං** යනු, ප්‍රථමධ්‍යාන ආදී වශයෙන් අරමුණෙහි සිත සමව යොදවමින්, සමව තබමින් ඒ ධ්‍යානයනට සමවැද ඉන් නැඟී ධ්‍යානසම්ප්‍රයුක්ත සිත ක්‍ෂය වශයෙන්, ව්‍යය වශයෙන් සලකා බලමින්, විදර්ශනාක්‍ෂණයෙහි ලක්‍ෂණප්‍රතිවෙධයෙන් ක්‍ෂණික එකාග්‍රතාව උපදී. මෙසේ උපන් ක්‍ෂණික චිත්තෛකාග්‍රතා වශයෙන්ද, අරමුණෙහි සිත සමව යොදවමින් සමව තබමින් ආශ්වාස කරන්නෙමි'යි ප්‍රශ්වාස කරන්නෙමි'යි හික්මෙයයි කියනු ලැබේ.

**විමොචයං චිත්තං** යනු, ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගෙන් සිත මුදවමින්, විශේෂයෙන් මුදවමින් තවද ද්විතීය ධ්‍යානයෙන් විතර්ක විචාරයන්ගෙන්ද, තෘතීය ධ්‍යානයෙන් පීතියෙන්ද, චතුර්ථධ්‍යානයෙන් සුඛදුඃඛයන් කෙරෙන්ද සිත මුදවමින්, වෙසෙසින් මුදවමින් එම ධ්‍යානයනට සමවැද එයින් නැඟී ධ්‍යාන සම්ප්‍රයුක්ත සිත ක්‍ෂය වශයෙන්, ව්‍යය වශයෙන් සලකා බලයි. ඒ යෝගී තෙමේ විදර්ශනාක්‍ෂණයෙහි අනිච්චානුපස්සනාවෙන් නිත්‍ය සංඥව කෙරෙන් සිත මුදවමින්, වෙසෙසින් මුදවමින් තවද දුඃඛානුපස්සනාවෙන් සුඛසංඥව කෙරෙන්ද, අනත්තානුපස්සනාවෙන් ආත්මසංඥව කෙරෙන්ද, නිබ්බිදනුපස්සනාවෙන් නන්දියෙන් (හෙවත් සොම්නස් සහිත තෘෂ්ණාවෙන්) ද, විරාගානුපස්සනාවෙන් රාගය කෙරෙන්ද, නිරෝධානුපස්සනාවෙන් පුනර්භවයෙන්ද, පටිනිස්සග්ගානුපස්සනාවෙන් ආදානය කෙරෙන්ද සිත මුදවමින් ආශ්වාස කරයි, ප්‍රශ්වාසද කරයි. එහෙයින් විමොචයං චිත්තං අස්සසිස්සාමි පස්සසිස්සාමීති සික්ඛති (සිත මුදවා ලමින් ආශ්වාස කරන්නෙමි, ප්‍රශ්වාසද කරන්නෙමි'යි හික්මේ'යයි කියනු ලැබේ. මෙසේ චිත්තානුපස්සනා වශයෙන් මේ චතුෂ්කය කියනලදැයි දතයුතුය.

සිවුවන චතුෂ්කයෙහි වනාහි **අනිච්චානුපස්සී** යන මෙහි පළමුව අනිත්‍යය දතයුතුය, අනිත්‍යතාව දතයුතුය, අනිච්චානුපස්සනාව දතයුතුය, අනිත්‍යය අනුව බලන්නා දතයුතුය. එහි **අනිච්ච** යනු, පංචස්කන්ධයයි. කවරහෙයින්දයත්, ඉපිද නැසෙමින් අන්‍ය ස්වභාවයට පත්වන හෙයිනි.

**අනිච්චතා** යනු, ඒ පංචස්කන්ධයන්ගේම ඉපිද නැසෙමින් වෙනස්වෙමින් අභාවයට යාමයි, උපන්නවුන් එම ආකාරයෙන් නොසිට ක්‍ෂණයක් පාසා බිඳෙමින් විනාශ වීමයි යන අර්ථයි. **අනිච්චානුපස්සනා** යනු, එම අනිච්චතාවගේ වශයෙන් රූපාදිය කෙරෙහි අනිත්‍යය යන දැකීමයි. **අනිච්චානුපස්සී** යනු, එම අනුපස්සනාවෙන් සමන්විතවූ යෝගාවචරයාය. එහෙයින් මෙසේ අනිත්‍යය අනුව බලන්නෙක් වී ආශ්වාස ප්‍රශ්වාස කරනුයේ මේ ශාසනයෙහි අනිච්චානුපස්සී අස්සසිස්සාමි පස්සසිස්සාමී'ති සික්ඛතී'ති (අනිත්‍යය අනුව බලමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි'යි හික්මේයයි) දතයුතුය.

**විරාගානුපස්සී** යනු, මෙහි විරාගයෝ දෙදෙනෙකි, ඛයවිරාගය, අත්‍යන්තවිරාගය යනුවෙනි. එහි ඛයවිරාග නම් සංස්කාරයන්ගේ ක්‍ෂණයක් පාසා සිදුවන බිඳීමයි. 'අච්චන්තවිරාග' යනු නිර්වාණයයි. **විරාගානුපස්සනා** යනු (ඛයවිරාගය, අත්‍යන්තවිරාගයයි යන) එම උභය විරාගයන් අනුව පැවැති විදර්ශනාවද මාර්ගයද යන දෙකයි. ඒ දෙවැදෑරුම් විරාගානුපස්සනාවෙන් සමන්විතව ආශ්වාස ප්‍රශ්වාස කරමින් විරාගානුපස්සීව ආශ්වාසද ප්‍රශ්වාසද කරන්නෙමි'යි හික්මේයයි දතයුතුය. **නිරෝධානුපස්සී** යන පෙදෙහිද මෙම නයයි.

**පටිනිස්සග්ගානුපස්සී** යන මෙහිද, පටිනිස්සග්ගයෝ පරිච්චාගපටිනිස්සග්ගය, පක්ඛන්දනපටිනිස්සග්ගයයි දෙදෙනෙකි. පටිනිස්සග්ගයම අනුපස්සනාද වේනැ'යි පටිනිස්සග්ගානුපස්සනා නම්. විදර්ශනා-මාර්ග යන දෙකට මේ අධිවචනයි. විදර්ශනාව තදඞ්ග වශයෙන් ස්කන්ධඅභිසංස්කාරයන් හා සමග ක්ලෙශයන් දුර හරියි. සංඛත වස්තූන් (සංස්කාරයන්) කෙරෙහි දෙස් දැකීම හේතුකොටගෙන එයට විපරීතවූ නිර්වාණය කෙරෙහි නැඹුරුබවට හේතුවේනැ'යි පරිච්චාගපටිනිස්සග්ගයයිද පක්ඛන්දනපටිනිස්සග්ගයයිද කියනු ලැබේ. මාර්ගය සමුච්ඡේද වශයෙන් ස්කන්ධාභිසංස්කාරයන් හා සමග ක්ලෙශයන් දුර හරියි. අරමුණු කිරීමෙන්ද නිර්වාණය වෙත නැඹුරු වේනැ'යි පරිච්චාගපටිනිස්සග්ගයයිද, පක්ඛන්දනපටිනිස්සග්ගයයිද කියනු ලැබේ, (විදර්ශනා-මාර්ග යන) දෙකම පළමු පළමු ඥානයන් අනුව බලන හෙයින් අනුපස්සනායයි කියනු ලැබේ. ඒ දෙවැදෑරුම්වූ පටිනිස්සග්ගානුපස්සනාවෙන් සමන්විතව ආශ්වාස ප්‍රශ්වාස කෙරෙමින් පටිනිස්සග්ගය අනුව බලමින් ආශ්වාසද ප්‍රශ්වාසද කරන්නෙමි'යි හික්මේයයි දතයුතුය.

මේ සිවුවන චතුෂ්කය හුදෙක් විදර්ශනා වශයෙන්ම කියනලදී. පළමු චතුෂ්ක තුන සමථ වශයෙන් මෙන්ම විදර්ශනා වශයෙන්ද කියනලදී.

මෙසේ චතුෂ්ක සතරක් වශයෙන් සොළොස් ආකාරවූ ආනාපානසතිභාවනාව දතයුතුය. සොළොස් ආකාර වශයෙන් මෙම ආනාපානසතිභාවනාව මහත්ඵල මහානිශංස ඇත්තේ වේ. එහි, "අයම්පි ඛො භික්ඛවෙ ආනාපානසතිසමාධි භාවිතො බහුලීකතො සන්තො චෙව පණීතො ච"[1] "මහණෙනි, මෙම ආනාපානසතිසමාධිය වඩනාලද්දේ, පුරුදු කරනලද්දේ ශාන්ත වේ, ප්‍රණීතද වේ" යන ආදී වචනයෙන් ශාන්තභාව ආදී වශයෙන්ද, කාමවිතර්කය නැසීමට සමත්වන හෙයින්ද මහානිශංස ඇතිබව දතයුතුය. මෙම ආනාපානසතිභාවනාව වූකලී ශාන්තවූ, ප්‍රණීතවූ, අසෙවනකවූ (නොවිසුරුණු) සුඛවිහාර ඇති හෙයින් සමාධියට අන්තරායකර (කාමාදී) විතර්කයන්ගේ වශයෙන් සිත ඔබ මොබ දිවීම වලකා ආශ්වාස ප්‍රශ්වාසයනට අභිමුඛවම සිත පිහිටුවයි. එහෙයින් "ආනාපානසති භාවෙතබ්බා විතක්කුපච්ඡෙදය"[2] (විතර්කයන් නැසීම පිණිස ආනාපානසති භාවනාව වැඩියයුතුය)යි කියනලදි. තවද මෙම ආනාපානසතිභාවනාව විජ්ජාවිමුත්ති හෙවත් මාර්ගඵලයන් සම්පූර්ණවීම පිණිස මුල්වන හෙයින්ද මහානිශංසබව දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ විසින් වදරනලදමැයි: "මහණෙනි, ආනාපානසති භාවනාව වඩනාලද්දේ, පුරුදු කරනලද්දේ සතර සතිපට්ඨානයන් පරිපූර්ණ කරයි, සතර සතිපට්ඨානයෝ වඩනාලද්දාහු, පුරුදු කරන ලද්දාහු සප්ත බොජ්ඣංගයන් පරිපූර්ණ කරති. සප්ත බොජ්ඣංගයෝ වඩනාලද්දාහු, පුරුදු කරනලද්දාහු, විජ්ජාවිමුත්තිය හෙවත් මාර්ගඵලයන් පරිපූර්ණ කරති."[3] තවද චරිමක හෙවත් අන්තිම ආශ්වාසප්‍රශ්වාසයන් දැනුවත් කරන හෙයින්ද මෙම ආනාපානසතිභාවනාව මහානිශංස වනබව දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ විසින් වදරනලදමැයි: "රාහුලය, ආනාපානසතිය මෙසේ වඩනාලද කල්හි මෙසේ පුරුදු කරනලද කල්හි, යම් ඒ චරිමක හෙවත් අන්තිම ආශ්වාස ප්‍රශ්වාස කෙනෙක් වෙත්ද, ඔහු පවා දැනුවත්වම ඉකුත් වෙති, නොදැනුවත්ව ඉකුත් නොවෙති."[4] එහි, නිරුද්ධවීම් වශයෙන් භවචරිමකය, ධ්‍යානචරිමකය, චුතිචරිමකයයි චරිමකයෝ තිදෙනෙකි. භවයන් අතුරෙන් කාමභවයෙහි ආශ්වාස ප්‍රශ්වාසයෝ පවත්නාහුය, රූප අරූප භවයන්හි නොපවත්නාහුය, එහෙයින් ඔහු භවචරිමක නම් වෙති. ධ්‍යානයන් අතුරෙන් පළමු ධ්‍යාන තුනෙහි (ආශ්වාස ප්‍රශ්වාසයෝ) පවත්නාහුය. එහෙයින් ඔහු ධ්‍යාන චරිමක

(1) සං. නි. ආනාපාන සං. - S v 321
(2) අං. නි. මෙඝිය සු. - A iv 353
(3) ම. නි. ආනාපානසති සු. - M iii 82
(4) ම. නි. රාහුලොවාද සු. - M i 425 f.

නම් වෙති. යම් ආශ්වාස ප්‍රශ්වාසයෙක් චුතිචිත්තයට පෙරාතුව සොළොස්වන චිත්තය හා සමග ඉපිද චුතිචිත්තය හා සමග නිරුද්ධ වේද, එය චුතිචරිමක නම් වේ. මෙකී චුතිචරිමක ආශ්වාස ප්‍රශ්වාසයෝ මෙහි චරිමක යනුවෙන් අභිප්‍රේත වෙති.

මෙම චුතිචරිමක ආශ්වාස ප්‍රශ්වාසයෝ මේ ආනාපානසති භාවනාවෙහි යෙදුණු භික්ෂුවහට, එම ආනාපාන ආරම්මණය මනාකොට ගන්නාලද හෙයින් චුතිචිත්තයට පෙරාතුව සොළොස්වන චිත්තය උපන් කෙණෙහි උපත ආවර්ජනය කරනවිට ඔවුන්ගේ උපත ප්‍රකට වේ, පැවැත්ම ආවර්ජනය කරනවිට පැවැත්මද ප්‍රකට වේ, බිඳීම ආවර්ජනය කරනවිට බිඳීමද ප්‍රකට වේ. මේ ආනාපානසති කර්මස්ථානය හැර අන් කර්මස්ථානයක් වඩා රහත් පලයට පැමිණි භික්ෂු කෙනෙකුහට ඉතිරි ආයුෂ කාලය පිරිසිඳියේ හෝ නොපිරිසිඳියේ හෝ වේ, මේ සොළොස් ආකාර ආනාපානසතිය වඩා රහත්පලයට පැමිණි භික්ෂු කෙනෙකුහට ඉතිරි ආයුෂ කාලය ප්‍රකට වන්නේම වේ. එම භික්ෂු තෙමේ "මාගේ ආයුසංස්කාරය මෙපමණ කලක්ම පවත්නේය, ඉන් ඔබ්බට නොපවත්නේය'යි දැන තමාගේ ස්වභාවය අනුව සිරුරු පිළිදැගුම්, හැඳීම් පෙරවීම් ආදී සියලු කෘත්‍යයන් කොට ඇස් පියා ගනියි. කෝටපබ්බතවිහාරවාසී තිස්ස තෙරුන්ද, මහාකරඤ්ජයවිහාරවාසී මහාතිස්ස තෙරුන්ද දේවපුත්‍ර දේශයෙහි පිණ්ඩපාතික තෙරුන්ද, සිතුල්පවු වෙහෙර වැසි දෙ බෑ තෙරුන්ද මෙති.

එහිලා එක් කතා පුවතක් මෙසේයි: දෙ බෑ තෙරුන් අතුරෙන් එක් කෙනෙක් වනාහි පුන් පොහෝ දිනයෙක ප්‍රාතිමොක්ෂය දේශනාකොට භික්ෂුසංඝයා විසින් පිරිවරනලදුව තමන්ගේ වාසස්ථානය වෙත ගොස් සක්මන් මළුවෙහි සිට චන්‍ද්‍රාලොකය බලා තමාගේ ආයුසංස්කාරයන් සලකා බලා භික්ෂුසංඝයා අමතා, ඔබ වහන්සේ විසින් කවර ආකාරයෙන් පිරිනිවන් පාන භික්ෂූන් දුටුවිරුද'යි කීහ. ඒ භික්ෂූන් අතුරෙන් ඇතැමෙක් "අප විසින් අස්නෙහි හුන්වනම පිරිනිවන් පානවුන් දුටුවිරුය"යි කීහ. ඇතැමෙක් "අප විසින් අහසෙහි පලක් බැඳ හුන්වනම පිරිනිවන් පානවුන් දුටුවිරුය"යි කීහ. තෙරුන්වහන්සේ, "දැන් මම සක්මන් කරමින්ම පිරිනිවන් පාන සැටි පෙන්වමි"යි සක්මන් මළුවෙහි සරසට ඉරක් ඇද, "මම මේ සක්මන් කෙළවර සිට ඈත කෙළවරට ගොස් පෙරළා එමින් මේ රේඛාව වෙත පැමිණි කෙණෙහිම පිරිනිවන් පානෙමි"යි කියා සක්මනට බැස ඈත කෙළවරට සක්මන් කොට පෙරළා එමින් එක් පයෙකින් රේඛාව පැගූ කෙණෙහිම පිරිනිවන් පෑහ.

තස්මා හවෙ අප්පමත්තො අනුයුඤ්ජෙථ පණ්ඩිතො
එවං අනෙකානිසංසං ආනාපානසතිං සදා.

එහෙයින් නුවණැත්තේ ඒකාන්තයෙන් අප්‍රමාදීව මෙවන් නොයෙක් අනුසස් ඇති ආනාපානසති භාවනාවෙහි සැම කල්හිම නියැලෙන්නේය.

**මේ ආනාපානසති භාවනාව පිළිබඳ විස්තර කථාමුඛයයි.**

## උපසමානුස්සති භාවනාව

ආනාපානසති භාවනාවට අනතුරුව දක්වනලද මේ උපසමානුස්සති භාවනාව වඩනු කැමැති යෝගාවචරයා විසින්, රහසිගතව, විවේකීව, "යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා, විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛායති, යදිදං මදනිම්මදනො පිපාසවිනයො ආලයසමුග්ඝාතො වට්ටුපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං"(1) (මහණෙනි, යම්තාක් සංඛතවූ හෝ අසංඛතවූ ධර්මයෝ ඇත්තාහුද, විරාගය (නිර්වාණය) ඒ සියලු ධර්මයනට අග්‍රය'යි කියනු ලැබේ, ඒ මේ විරාගය තෙමේ රාගාදී මදයන් නිර්මද කරන්නේය, රාගාදී පිපාසයන් දුරලන්නේය, පංචකාමගුණ සංඛ්‍යාත ආලය (ඇලීම) නසන්නේය, සසරවට සිඳලන්නේය, තෘෂ්ණාව ක්‍ෂය කරන්නේය, රාගයෙන් තොර වන්නේය, සසරදුක් අවුරන්නේය, වාණ'යයි කියනු ලබන තෘෂ්ණාව නැති කරන්නේය) යනුවෙන් මෙසේ සියලු දුක් ශමනය කෙරෙති'යි කියනලද නිර්වාණය පිළිබඳ ගුණ සිහි කළයුතුය. එහි **යාවතා** යනු, යම්තාක්, යම් පමණ, **ධම්මා** යනු ස්වභාවයෝ, **සඞ්ඛතා වා අසඞ්ඛතා වා** යනු, එකතුව, එක් රැස්ව, හේතූන් විසින් ඇති කරනලද හෝ එසේ නොකරනලද ධර්මයෝය. **විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛායති** යනු, ඒ සංඛත අසංඛත ධර්මයන් අතුරෙන් විරාගය අග්‍රයයිද, ශ්‍රේෂ්ඨයයිද, උත්තමයයිද කියනු ලැබේ. එහි **විරාගො** යනු, රාගය පිළිබඳ අභාවමාත්‍රය හෙවත් නොවීම පමණක් නොවේ. වැලිදු, **යදිදං මද නිම්මදනො- පෙ - නිබ්බානං** යනු, යම් ඒ අසංඛත ස්වභාවයක් මදනිම්මදන මත්වූ ස්වභාවය ඉවත් කිරීම ආදී නාමයන් ලබන්නේද ඒ ස්වභාවය විරාගයයි දතයුතුය. යම් හෙයකින් එයට පැමිණ සියලු මානමද පුරිසමදදීවූ සියලු මදයෝ (මත්වීම්) නිර්මද බවට යෙත්ද, මදරහිත වෙත්ද, නැසෙත්ද, එහෙයින් එම විරාගය මදනිම්මදනයයි කියනු ලැබේ. යම්හෙයකින් එයට පැමිණ

---

(1) අං. නි. චතුක්ක නි. අග්ගප්පසාද සූ. - A ii 34

සියලු කාමපිපාසයෝ විනාශයට, අභාවයට යෙත්ද, එහෙයින් එම විරාගය පිපාසවිනයයි කියනු ලැබේ. යම් හෙයකින් එයට පැමිණ පංචකාම ගුණ නමැති ආලයයෝ විනාශයට යෙත්ද, එහෙයින් ආලය සමුග්ඝාතයයි කියනු ලැබේ, යම් හෙයකින් එයට පැමිණ තුන්බුමු සසරවට සිඳිනු ලැබේද, එහෙයින් වට්ටුපච්ඡේදයයි කියනු ලැබේ, යම් හෙයකින් වනාහි එයට පැමිණ සියලු ආකාරයෙන් තෘෂ්ණාව ක්‍ෂයභාවයට යේද, ඇලුම් රහිතබවට යේද, නිරුද්ධභාවයට යේද, එහෙයින් 'තණ්හක්ඛය'යයිද, 'විරාග'යයිද, 'නිරොධ'යයිද කියනු ලැබේ, යම් හෙයකින් වනාහි මේ විරාගය තෙමේ යෝනි සතරය, ගති පසය, විඤ්ඤාණට්ඨිති සතය, සත්තාවාස නවයය, යන මොවුන් අතික් අතික් ස්වභාවයට හරවමින් බැඳ තබන හෙයින් පටලවන හෙයින් 'වාන' යයි ව්‍යවහාරයට පත් තෘෂ්ණාව කෙරෙන් නිකුත් වූයේද, ඉකුත් වූයේද, වෙන් වූයේද, එහෙයින් නිබ්බාණ'යයි කියනු ලැබේ. මෙසේ මේ මදනිම්මදනතාදී ගුණයන්ගේ අනුසාරයෙන් නිර්වාණයයි කියනු ලබන උපසමය සිහිකළ යුතුය. භාග්‍යවතුන් වහන්සේ විසින් "මහණෙනි, තොපට අසංඛත ධර්මයක් දේශනා කරන්නෙමි, සත්‍යවූද, (සසර පිළිබඳ) කෙළවරවූද, ඉතා දුකසේ දකියයුතු වූද, ජරාවට ප්‍රතිපක්‍ෂ වූද, නිත්‍ය වූද, (තෘෂ්ණාදී) ප්‍රපංචරහිත වූද, මරණයට ප්‍රතිපක්‍ෂ වූද, සුන්දර වූද, නිරුපද්‍රැත වූද, අද්භූත වූද, ලෝකස්වභාවයට ප්‍රතිපක්‍ෂ වූද, ව්‍යාපාද රහිත වූද, අතිපරිශුද්ධ වූද, රැකවරණ සහිත වූද, ආරක්‍ෂාස්ථානයක් වූද, (රැකවරණ ඇති) ලෙණක් වූද ධර්මයක් තොපට දේශනා කරන්නෙමි" යනුවෙන් සූත්‍රයන්හි යම් ඒ අන්‍ය වූද (සච්චං, පාරං, සුදුද්දසං, අජරං, ධුවං, නිප්පපඤ්චං, අමතං, සිවං, ඛෙමං, අබ්භුතං, අනීතිකං, අබ්‍යාපජ්ජං, විසුද්ධිං, දීපං, තාණං, ලෙණං ආදී වශයෙන්) උපසම ගුණයෝ වදරන ලද්දාහුද,[1] ඒ ගුණයන්ගේ අනුසාරයෙන්ද සිහිකළ යුතුමය. මෙසේ මදනිම්මදනතා ආදී ගුණවශයෙන් උපසමය මෙනෙහි කරන යෝගාවචරයාගේ සිත එකල්හි රාගයෙන් මඩනාලද්දේ නොවේ, ද්වේෂයෙන්-පෙ-මොහයෙන් මඩනාලද්දේ නොවේ, ඔහුගේ සිත එසමයෙහි ඍජුභාවයට පත්වූයේම වේ.

**උපසමං ආරබ්භ** යනු, බුද්ධානුස්සති ආදියෙහි කියනලද නයින්ම යටපත්කරනලද නීවරණ ඇත්තහුට එක්වරම ධ්‍යානාංගයෝ උපදනාහුය. උපසම ගුණයන්ගේ ගැඹුරුබව හේතුකොටගෙන, නොයෙක් ආකාර ඇති ගුණයන් සිහිකිරීමේ ප්‍රවණතාව හේතුකොටගෙන හෝ, අර්පණාවට නොපැමිණි උපචාරයටම පැමිණි ධ්‍යාන වන්නේය, ඒ මේ ධ්‍යානය

---

(1) සං. නි. අසංඛත සං. - S iv 360ff.

තෙමේ උපසම ගුණානුස්මරණ වශයෙන් 'උපසමානුස්සති' යන ව්‍යවහාරයට යෙයි. පළමු අනුස්සතිභාවනා සය මෙන් මෙයද ආර්යශ්‍රාවකයාහටම සිද්ධ වේ. එසේ වුවද උපසමය කෙරෙහි ගෞරව ඇති පෘථග්ජනයා විසින්ද මෙනෙහි කළයුතුය. ශ්‍රැත වශයෙන්ද උපශම විෂයෙහි සිත පහදීමය. මේ උපසමානුස්සති භාවනාවෙහි නියැලි භික්‍ෂු තෙමේ සුවසේ නිදයි, සුවසේ පිබිදෙයි, සන්හුන් ඉඳුරන් ඇත්තේ වෙයි, සන්හුන් සිත් ඇත්තේ වෙයි, හිරිඔතප් දෙකින් යුක්ත වූයේ, ප්‍රසාද දනවනුයේ උතුම් ස්වභාව ඇත්තේ සබ්‍රම්සරුන් අතර ගරු කටයුත්තේ සම්භාවනා කටයුත්තේද වෙයි. උසස් මාර්ගඵලාදියක් අවබොධකළ නොහැකි වුවහොත් සුගතිපරායණ වෙයි.

තස්මා හවෙ අප්පමත්තො භාවයෙථ විචක්ඛණො
එවං අනෙකානිසංසං අරියෙ උපසමෙ සතින්ති.

එහෙයින් නුවණැත්තේ ඒකාන්තයෙන් අප්‍රමාදීව මෙවන් නොයෙක් අනුසස් ඇති ආර්යවූ උපසමානුස්සති භාවනාව වඩන්නේය.

**මේ උපසමානුස්සති භාවනාව පිළිබඳ විස්තර කථාමුඛයයි.**
**සාධුජන ප්‍රමොදය පිණිස කරනලද විශුද්ධිමාර්ගයෙහි**
**සමාධිභාවනාධිකාරයෙහි අනුස්සති කම්මට්ඨාන නිද්දෙස නම්**
**අටවන පරිච්ඡේදය මෙතෙකින් නිමියේය.**

# 9. බ්‍රහ්මවිහාර නිද්දේසය

අනුස්සති කර්මස්ථානයනට අනතුරුව දක්වනලද මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන මේ සතර බ්‍රහ්මවිහාරයන් අතුරෙන් මෙත්තාවිහාරය, වඩනු කැමැති ආධුනික යෝගාවචරයා විසින් පලිබෝධයන් සිඳහැර කමටහන් ගෙන බත්කිස නිමවීමෙන් පසු බත්මත දුරහැර විවේක සහිත තැනෙක්හි මනාකොට පනවනලද අස්නෙක සුවසේ හිඳ, පළමුකොට ද්වේෂයෙහි ආදීනවද ඉවසීමෙහි ආනිසංසද මෙනෙහි කළයුතුය. කවර හෙයින්ද යත්, මේ භාවනාවෙන් වනාහි ද්වේෂය පහකළ යුතුය, ඉවසීම පුරුදුකළ යුතුය. ආදීනව නොදුටු කිසිවක් පහකිරීම හෝ ආනිසංස නොදත් කිසිවක් ලබාගැනීම හෝ නොකළහැකි වේ. එහෙයින්, "දුට්ඨො ඛො ආවුසො දෙසෙන අභිභූතො පරියාදින්නචිත්තො පාණම්පි හන්ති"[1] (ඇවැත්නි, ද්වේෂයෙන් මඩනාලද, හාත්පසින් අල්වාගන්නාලද, ද්වේෂයෙන් දූෂිත සිත් ඇති පුද්ගලයා පරපණද නසයි) යන මේ ආදී පාඨයන්ගේ වශයෙන් ද්වේෂයෙහි ආදීනව දැකිය යුතුය. "ඛන්තී පරමං තපො තිතික්ඛා නිබ්බාණං පරමං වදන්ති බුද්ධා"[2] (ඉවසීම ලක්ෂණකොට ඇති ක්ෂාන්තිය උතුම්ම තපසැයිද, නිර්වාණය උතුම්යයිද බුදුවරයෝ පවසති), 'ඛන්තී බලං බලානීකං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං'[3] (ඉවසීම් බලය ඇතිකරගත් ඉවසීම් බලයෙන් යුත් ඔහු බ්‍රාහ්මණයෙකි'යි කියමි), "ඛන්ත්‍යා භීය්‍යො න විජ්ජති"[4] (ඉවසීමට වඩා බලයක් විද්‍යමාන නොවේ) යන ආදී පාඨයන්ගේ වශයෙන් ඉවසීමෙහි අනුසස් දත යුතුය.

ඉක්බිති මෙසේ දක්නාලද ආදීනව ඇති ද්වේෂයෙන් සිත වෙන්කරනු පිණිසද, මෙසේ දන්නාලද අනුසස් ඇති ඉවසීම හා සමග සිත සංයෝග කරනු පිණිසද මෛත්‍රී භාවනාව ඇරඹිය යුතුය. එසේ අරඹන්නහු විසින් පළමුකොටම පුද්ගලභේදය දතයුතුය. මෙවන් පුද්ගලයන් කෙරෙහි පළමුකොට මෛත්‍රී වැඩියයුතුය, මෙවන් පුද්ගලයන් කෙරෙහි (පළමුකොට) නොවැඩියයුතුය යනුවෙනි. මේ මෛත්‍රී භාවනාව වනාහි අප්‍රිය පුද්ගලයා කෙරෙහිද, ඉතා ප්‍රිය සහායකයා කෙරෙහිද, මධ්‍යස්ථ පුද්ගලයා කෙරෙහිද, වෛරී පුද්ගලයා කෙරෙහිද යන මේ සතර දෙනා කෙරෙහි පළමුකොට නොවැඩියයුතුය. විසදෘශ ලිංගිකයන් කෙරෙහිද මළවුන් කෙරෙහිද

---

(1) අං. නි. - A i 216

(2) ධම්මපද බුද්ධ වග්ග - Dh 184

(3) එම බ්‍රාහ්මණ වග්ග - Dh 399

(4) සං. නි. - S i 122

විශේෂයෙන් පළමුකොට නොවැඩියයුතුය. කවරහෙයින්ද යත් අප්‍රියයා ප්‍රියයකු ලෙස සලකනුයේ වෙහෙසට පත්වෙයි. ඉතා ප්‍රිය මිත්‍රයා මධ්‍යස්ථයකු ලෙස සලකනුයේද වෙහෙසට පත්වෙයි. ඔහුට ස්වල්පමාත්‍ර වූද දුකක් පැමිණිවිට හඬන වැලපෙන තත්වයට පත්වූවෙක් වේ. මධ්‍යස්ථයා ගරුතන්හිද ප්‍රියතන්හිද ලා සලකනුයේද වෙහෙසට පත්වේ. වෛරී පුද්ගලයා ගැන සිහි කරන්නහුට ද්වේෂය උපදියි. එහෙයින් මෙකී අප්‍රිය ආදීන් කෙරෙහි පළමුකොට නොවැඩියයුතුය. විසදෘශ ලිංගිකයන් කෙරෙහි, විශේෂකොට එක් පුද්ගලයකු කෙරෙහි, මෙත් වඩන්නහුට රාගය උපදියි. එක්තරා අමාත්‍යපුත්‍රයෙක් තම නිවසට නිතර එළඹෙන තෙරණුකෙනකුගෙන් "කවුරුන් කෙරෙහි මෛත්‍රිය වැඩිය යුත්තේද ස්වාමීනි"යි විමසීය. තෙරණුවෝ "ප්‍රිය පුද්ගලයා කෙරෙහිය"යි කීහ. ඔහුට වනාහි සිය බිරිය ඉතා ප්‍රිය වන්නීය. හේ තෙමේ ඇය කෙරෙහි මෙත් වඩනුයේ මුළු රාත්‍රිය පුරා භිත්ති යුද්ධය (බිත්තිය සමඟ පොර බැදීම) කළේය. එහෙයින් විසදෘශ ලිංගිකයා කෙරෙහි විශේෂයෙන් මෙත් නොවැඩිය යුතුය. මළ තැනැත්තකු කෙරෙහි මෙත් වඩනුයේ අර්පණාවට හෝ උපචාරයට හෝ පැමිණිය නොහේ. එක්තරා තරුණ යතිවරයෙක් ස්වකීය ආචාර්යවරයා ඇරබ මෙත් වැඩීම ඇරඹීය. ඔහුගේ මෛත්‍රිය නොපවතියි. හේ තෙමේ මහතෙර කෙනකු වෙත ගොස්, "ස්වාමීනි, මෛත්‍රී ධ්‍යාන සමාපත්ති මවිසින් පුරුදුකරන ලද්දේය, එසේ වුවද එම සමාපත්තියට සමවදිනු නොහැක්කෙමි, කවර හෙයින්ද"යි විමසීය. තෙරණුවෝ, "ඇවැත්නි, නිමිත්ත ගැන සොයා බලන්නැ"යි කීහ. ඒ තරුණ භික්ෂු තෙමේ සොයා බලනුයේ ආචාර්යවරයා අපවත්ව ඇති බැව් දැන අන් කෙනකු ඇරබ මෙත් වඩා සමාපත්තියට පැමිණියේය. එහෙයින් මියගිය කෙනකු වෙත මෙත් නොවැඩිය යුතුමය.

සියල්ලට පළමු, "මම සුවපත් වෙම්වා, නිදුක් වෙම්වා"යි හෝ "වෛර නැත්තේ වෙමි, ව්‍යාපාද රහිත වූයේ වෙමි, උවදුරු රහිත වූයේ, සුවපත්වූයේ ආත්මභාවය පවත්වමි"යි හෝ මෙසේ නැවත නැවතත් තමා කෙරෙහිම මෙත් වැඩිය යුතුය. මෙසේ වෙතොත් 'කථඤ්ච භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති?' (කෙසේ නම් භික්ෂු තෙමේ එක් දිශාවෙක්හි මෛත්‍රිය පතුරුවා විහරණය කරන්නේද?) යනුවෙන් විභංගයෙහිද,[1] 'කතමෙහි පඤ්චහාකාරෙහි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති භාවෙතබ්බා? සබ්බෙ සත්තා අවෙරා හොන්තු අව්‍යාපජ්ඣා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු, සබ්බෙ පාණා-පෙ-

(1) Vbh 272

සබ්බෙ භූතා-පෙ-සබ්බෙ පුග්ගලා-පෙ-සබ්බෙ අත්තභාවපරියාපන්නා අවෙරා අව්‍යාපජ්ඣා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු"[1] (අවිශේෂයෙන් හෙවත් පුද්ගලයකුට සීමා නොකොට පතුරුවන මෛත්‍රී චෙතොවිමුත්තිය කවර නම් පස් ආකාරයෙන් වැඩිය යුත්තේද? 'සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා, ව්‍යාපාද නැත්තෝ වෙත්වා, උපද්‍රව නැත්තෝ වෙත්වා, සුවපත්ව ජීවිතය පවත්වත්වා, සියලු ප්‍රාණීහු-පෙ-සියලු ජීවීහු-පෙ-සියලු පුද්ගලයෝ-පෙ-සියලු ආත්මභාවයට පැමිණියාහු වෛර නැත්තෝ-ව්‍යාපාද නැත්තෝ-උපද්‍රව නැත්තෝ-සුවපත්ව ජීවිතය පවත්වත්වා) යනුවෙන් පටිසම්භිදවෙහිද,[1] "සුඛිනො වා ඛෙමිනො හොන්තු සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා" (සියලු සත්වයෝ සුව ඇත්තෝ වෙත්වා, බිය නැත්තෝ වෙත්වා, සුඛිත ආත්මභාව ඇත්තෝ වෙත්වා) යනුවෙන් මෙත්ත සූත්‍රයෙහිද[2] පවසනලද දෙයට විරුද්ධවේද? ඒ විභංග ආදියෙහි තමා කෙරෙහි භාවනා වැඩීම නොකියනලද්දේ වුවද, එය විරෝධද නොවන්නේය.

කවර හෙයින්ද යත්: විභංග ආදියෙහි කියනලද එය වනාහි අර්පණා වශයෙන් කියන ලද්දේය, (මම් සුවපත් වෙම්වා යන ආදී) මෙය සාක්ෂිභාව වශයෙන් කියන ලද්දේය. ඉදින් අවුරුදු සියයක් හෝ අවුරුදු දහසක් නමුදු "මම් සුවපත් වෙම්වා" යන ආදී නයින් තමා කෙරෙහි මෙත් වඩත් මුත් ඔහුට අර්පණා නො-උපදියි. 'මම් සුවපත් වෙම්වා'යි මෙත් වඩන්නහුට වනාහි "යම්සේ මම් සුව කැමැත්තේ දුක පිළිකුල් කරන්නේ වෙම්ද, එසේම අන්‍ය සත්වයෝද එසේ වෙති'යි තමා සාක්ෂි කොට අන්‍යසත්වයන් කෙරෙහි හිතසුව කැමැතිබව උපදියි. භාග්‍යවතුන් වහන්සේ විසිනුදු:

> "සබ්බා දිසා අනුපරිගම්ම චෙතසා නෙවජ්ඣගා පියතරමත්තනා ක්වචි,
> එවං පියො පුථු අත්තා පරෙසං තස්මා න හිංසෙ පරමත්තකාමො'[3]ති
>
> සියලු දිශාවන් සිතින් සොයා ගියද කිසි තැනෙකත් තමාට වඩා පියතර වූවකු කිසිසේත් හමු නොවීය, මෙසේම අන්‍යයනටද තම තමන්ගේ ආත්මභාවය ප්‍රිය වන්නේය, එහෙයින් තමාට හිතසුව කැමැතිවන්නේ අනුන් නොපෙළන්නේය"යි

වදරමින් මේ නයම දක්වන ලද්දේය. එහෙයින් තමා සාක්ෂි වශයෙන් ගෙන තමා කෙරෙහි මෙත් පතුරුවා, ඉක්බිති (එම මෙත්

(1) Ps ii 130
(2) සු. නි. - Sn 145
(3) සං. නි. සගාථවග්ග - S i 75

සිතම) පහසුවෙන් පවත්වා ගැනීම පිණිස, ඒ යෝගාවචරයාහට ප්‍රියවූ මනාපවූ, ගරුබුහුමනට පාත්‍රවූ ආචාර්යවරයා හෝ ආචාර්යවරයා හා සමානවූ උපාධ්‍යායවරයා හෝ උපාධ්‍යායවරයා හා සමානවූ යම් කෙනකු වෙතොත්, ඔවුන්ගේ දන ප්‍රියවචනාදී ප්‍රියමනාප වීමට හේතුවූ කරුණුද, ශීල ශ්‍රැත ආදී ගෞරව සම්භාවනාවට හේතුවූ කරුණුද සිහිකොට, 'මේ සත්පුරුෂ තෙමේ සුවපත් වේවා, නිදුක් වේවා, යන ආදී වශයෙන් මෙත් වැඩිය යුතුය. මෙබඳුවූ පුද්ගලයකු කෙරෙහි (මෙත් වඩන්නහුට) ඒකාන්තයෙන් අර්පණා සිද්ධවන්නේය. මේ (යෝගාවචර) භික්ෂුව විසින් එතෙකින් තෘප්තියට නොපැමිණ, සීමාසම්භේදය (එම පුද්ගලයාහට සීමා නොකොට) කරනු කැමැතිව, ඉක්බිති ඉතා ප්‍රියමිත්‍රයා කෙරෙහිද, ඉතා ප්‍රියමිත්‍රයාගෙන් මධ්‍යස්ථයා කෙරෙහිද, මධ්‍යස්ථයාගෙන් වෛරී පුද්ගලයා වෙතද මෙත්සිත වැඩියයුතුය. මෙසේ මෙත්සිත් වඩමින් එක් එක් කොට්ඨාසය කෙරෙහි මුදුබවට, හුරුබුහුටිබවට පත්කොට අනෙක් අනෙක් කොට්ඨාස වෙත පැතිරවියයුතුය. යමකුට වනාහි වෛරී පුද්ගලයෙක් නැත්තේ වේනම්, එසේ නැතහොත් උදරචරිත ඇත්තකු වීම නිසා අනර්ථයක් කරනවිට පවා අනුන් කෙරෙහි සතුරෙකැ'යි යන හැඟීම නො-උපදී නම්, ඔහු විසින් "මධ්‍යස්ථයා කෙරෙහි මාගේ මෙත් සිත කර්මණ්‍ය බවට පත්වී ඇත. දැන් එය සතුරු ජනයා වෙත යොමු කරමි"යි වෑයම් නොකළ යුතුය. යමකුට සතුරෙක් ඇත්තේ නම් ඔහු සඳහා මධ්‍යස්ථයාගෙන් අනතුරුව වෛරී ජනයා කෙරෙහි මෙත්සිත වැඩිය යුතුයයි කියනලදි. ඉදින් වෛරී ජනයා කෙරෙහි මෙත්සිත් පතුරුවන යෝගියාහට ඔවුන් විසින් කරනලද අපරාධ සිහිවීමෙන් ද්වේෂයක් උපදී නම්, එවිට ඔහු විසින් පළමු සිහිකළ පුද්ගලයන් අතුරෙන් කිසිවකු කෙරෙහි නැවත නැවතත් මෛත්‍රියට සමවැද එයින් නැඟී නැවත නැවතත් සතුරු ජනයා වෙතට මෙත්සිත යොමු කරමින් ද්වේෂය දුරු කළයුතුය. ඉදින් එසේ වෑයම් කරද්දීත් ද්වේෂය නොසන්සිදේනම්, එවිට

"කකචූපමඔවාද-ආදීනං අනුසාරතො
පටිඝස්ස පහාණාය ඝටිතබ්බං පුනප්පුනං"

කකචූපම (සූත්‍රයෙහි දැක්වෙන) අවවාද ආදීන්ගේ අනුසාරයෙන් ද්වේෂය පහකරනු පිණිස නැවත නැවතත් ප්‍රයත්න කළ යුතුය.

එයද මේ ආකාරයෙන් තමාහට අවවාද කරගනිමින්ම කළයුතුය: "කොල, කිපෙනසුලු පුරුෂය, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ දේශනා කරනලද්දේ නොවේද? 'මහණෙනි, දෙකොණෙහි දව මිටි සහිත කියතෙන්

පවිටු සොරුන් (තමාගේ) අඟපසඟ කපද්දී පවා යම් (යෝගාවචරයෙක්) සිත දූෂ්‍ය කරගන්නේ නම්, එය හේතුකොටගෙන හේ තෙමේ මාගේ අවවාද පිළිපදින්නෙක් නොවේ"[1]යයිද,

"තස්සෙව තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති
කුද්ධං අප්පටිකුජ්ඣන්තො සඞ්ගාමං ජෙති දුජ්ජයං

උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච
පරං සඞ්කුපිතං ඤත්වා යො සතො උපසම්මතී[2]

කිපුණාහුට යමෙක් පෙරළා කිපෙන්නේ නම්, ඒ හේතුවෙන් හේ තෙමේ ඔහුට වඩා පවිටකු බවට පත් වන්නේය, කිපුණහුට පෙරළා නොකිපෙන්නේ ජයගත නොහැකි සංග්‍රාමය ජය ගන්නේය.

අනෙකා කිපුණබව දැන යමෙක් සිහි උපදවාගෙන සන්සිඳේනම් හේ තෙමේ තමාගේද අනෙකාගේද යන දෙදෙනාගේම හිත වැඩ පිණිස හැසිරෙන්නේයයිද,

"මහණෙනි, සතුරකු විසින් කැමැතිවන මේ සතුරු ක්‍රියා සත ක්‍රෝධ කරන ස්ත්‍රිය හෝ පුරුෂයා කරා එයි, කවර සතක්ද? මහණෙනි, මේ ලෝකයෙහි සතුරෙක් තමාගේ සතුරාහට, 'මොහු දුර්වර්ණ වෙතොත් යෙහෙකියි මෙසේ කැමැති වෙයි, එයට හේතු කවරේද? මහණෙනි, සතුරෙක් සිය සතුරාගේ වර්ණවත් බවට සතුටු නොවේ, මහණෙනි, ක්‍රෝධ කරනසුලු මේ පුරුෂ පුද්ගලයා ක්‍රෝධයෙන් මඩනා ලද්දේය, ක්‍රෝධයෙහි වසභයට ගියේ වෙයි, හේ තෙමේ මනාකොට නහා පිරිසුදුවූයේ නමුදු, මනාකොට විලවුන් ගත්තේ නමුදු, කපනලද කෙස් රැවුල් ඇත්තේ නමුදු සුදුවත් හැඳගත්තේ නමුදු, ක්‍රෝධයෙන් මඩනා ලද්දේ දුර්වර්ණ වූයේම වෙයි. මහණෙනි සතුරකු විසින් කැමැතිවන මේ පළමු සතුරු ක්‍රියාව ක්‍රෝධ කරන ස්ත්‍රිය කරා හෝ පුරුෂයා කරා හෝ එයි. තවද මහණෙනි, සතුරකු තමාගේ සතුරාහට, 'මොහු දුකසේ නිදන්නේ නම් යෙහෙකි'යි-පෙ-'මොහු බොහෝ ධනය ඇත්තෙක් නොවන්නේ නම් යෙහෙකි'යි-පෙ-'මොහු භෝග සම්පත් ඇත්තෙක් නොවන්නේ නම් යෙහෙකි'යි මොහු යසස් ඇත්තෙක් නොවන්නේ නම් යෙහෙකි'යි-පෙ-'මොහු මිතුරන් ඇත්තෙක් නොවන්නේනම් යෙහෙකි'යි-පෙ-'මොහු කය බිඳීමෙන් මරණින් මතු සුගතියෙහි, ස්වර්ගලොකයෙහි නො-උපදින්නේ

---

(1) ම. නි. කකචූපම සූ. - M i 129
(2) අං. නි. සත්තක නි. - A iv 94ff.

නම් යෙහෙකි'යි මෙසේ කැමැති වෙයි. එයට හේතු කවරේද? මහණෙනි, සතුරෙක් තමාගේ සතුරාගේ සුගතිගමනට සතුටු නොවේ. මහණෙනි, ක්‍රෝධ කරනසුලු මේ පුද්ගලයා ක්‍රෝධයෙන් මඩනාලද්දේ, ක්‍රෝධයෙහි වසඟයට ගියේ කයින් දුශ්චරිතයෙහි යෙදෙයි, වචනයෙන් දුශ්චරිතයෙහි යෙදෙයි, මනසින් දුශ්චරිතයෙහි යෙදෙයි, වචනයෙන් දුශ්චරිතයෙහි වසඟයට ගියේ කයින් දුශ්චරිතයෙහි යෙදෙයි, හේ තෙමේ කයින් දුශ්චරිතයෙහි හැසිර, වචනයෙන්, මනසින් දුශ්චරිතයෙහි හැසිර කය බිඳීමෙන් මරණින් මතු අපායෙහි, දුගතියෙහි, විනිපාතයෙහි, නිරයෙහි උපදී"[1]යයිද, "මහණෙනි, යම්සේ සොහොන් පෙනෙල්ල දෙපසින් ඇවිලුණේ මැද අපිරිසුදු වූයේ ගමෙහි දරකිස නොකෙරේද, වනයෙහිද දරකිස නොකෙරේද, මහණෙනි, මේ පුරුෂ පුද්ගලයාද එබඳුයයි මම කියමි"යයිද[2] පවසනලද්දේ නොවේද? දැන් මෙසේ ක්‍රෝධ කරමින් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය නොකරන්නෙහිය, තවද පෙරළා ක්‍රෝධ කරමින් පළමු ක්‍රෝධ කළ පුරුෂයාටද වැඩි පවිටෙක් වී, දුකසේ ජයගතයුතු සංග්‍රාමය ජය නොගන්නෙහිය, සතුරා විසින් කළයුතු අනර්ථයන් තමාම තමාහට කර ගන්නෙහිය, සොහොන් පෙනෙල්ලට සමාන වන්නෙහිය".

මෙසේ යත්න දරන වෑයම් කරන ඔහුගේ ක්‍රෝධය සන්සිදේ නම් මැනවි, ඉදින් නොසන්සිදේ නම්, එවිට ඒ (වෛරී) පුද්ගලයාගේ කායසමාචාරාදී යම් යම් ස්වභාවයක් උපශාන්ත වූයේද, පිරිසුදු වූයේද, සිහිකරනු ලබනවිට ප්‍රසාදය ගෙන ඒද, ඒ ඒ ස්වභාවය සිහිකොට වෛරය දුරුකොටගත යුතුය.

ඇතැමකුගේ වනාහි කායසමාචාරයම උපශාන්ත වේ, එම උපශාන්තභාවය බොහෝසේ වත්පිළිවෙත් කරනවිට බොහෝ දෙනාට වැටහේ. වාක්සමාචාරය හා මනඃසමාචාරය උපශාන්ත නොවේ, ඔහුගේ වාක්- මනඃසමාචාරයන් ගැන නොසිතා කායසමාචාරය උපශාන්තවූ බවම සිහිකළයුතුය. ඇතැමකුගේ වාක්සමාචාරයම උපශාන්ත වේ, එය උපශාන්ත වූබව බොහෝ දෙනාට දැනේ, හේ තෙමේ ප්‍රකෘතියෙන්ම පිළිසඳර බිණීමෙහි දක්ෂයෙකි, මෘදු ස්වභාව ඇත්තෙකි. ප්‍රිය වචන බෙණෙමින්, සොම්නස් දනවමින්, පිනාගිය මුහුණු ඇතිව පළමුවෙන් කථා කරයි, මිහිරි හඬින් දහම් දෙසයි, සම්පූර්ණ පද ව්‍යංජන ඇතිව

---

(1) අං. නි. - ii 95

(2) අං. නි. පඤ්චක නි. - A iii 186ff.

දහම් කතා කියයි. ඔහුගේ කායසමාචාරය හා මනඃ සමාචාරය උපශාන්ත නොවේ, ඔහුගේ එම කායමනඃ සමාචාරයන් ගැන නොසිතා වාක්සමාචාරයෙහි උපශාන්තබවම සිහිකළ යුතුය. ඇතැමකුගේ මනඃසමාචාරයම උපශාන්ත වේ, ඔහුගේ එය උපශාන්ත වූබව චෛත්‍ය වන්‍දනාදියෙහිදී සියලු දෙනාටම පැහැදිලි වේ. යමෙක් නොසන්හුන් සිත් ඇත්තේ නම්, හේ තෙමේ චෛත්‍යය හෝ බෝධිය හෝ තෙරුන් හෝ වදිනවිට සකසා නොවදියි, දහම් අසන මඩුවෙහිදී එකඟ නොවූ සිත් ඇතිව හෝ නිදිකිරමින් හෝ හිඳියි. සන්හුන් සිත් ඇත්තේ වනාහි සාවධානව සකසා වඳියි, සවන් යොමා, අසනු රිසි ඇතිව, කයින් වචනයෙන් සිත් පහන්බව පළකෙරෙමින් දහම් අසයි. මෙසේ ඇතැමකුගේ මනඃසමාචාරයම උපශාන්ත වේ, කායවාක් සමාචාරය උපශාන්ත නොවේ. ඔහුගේ කායවාක් සමාචාරයන් ගැන නොසිතා මනඃසමාචාරයම සිහිපත් කළයුතුය. ඇතැමකුට වනාහි මේ තුනෙන් එකක් හෝ උපශාන්ත නොවේ. එබඳු පුද්ගලයා කෙරෙහි, "මොහු දැන් මේ මිනිස් ලොව හැසිරෙතත් කිහිප දවසක් ඇවෑමෙන් අට මහනිරය හෝ සොළොස් ඔසුපත්නිරය ආදිය පුරවන්නෙක් වන්නේය"යි කරුණාව එළවියයුතුය. කරුණාව නිසා වෛරය සන්සිඳේ.

ඇතැමකුගේ මේ තුනම උපශාන්ත වේ, ඔහුගේ යම් යම් සමාචාරයක් රිසිවේද එය සිහිපත් කළයුතුය. එබඳු පුද්ගලයකු කෙරෙහි මෛත්‍රිය වැඩීම දුෂ්කර නොවේ. මෙම අර්ත්‍ථයම ප්‍රකට කරනු පිණිස, "ඇවැත්නි, වෛරය දුරුකරන කරුණු පසෙක් වේ, මේ මගින් භික්‍ෂුවක්හට උපන් ආඝාතය සර්වප්‍රකාරයෙන් දුරුකර ගතයුතුය"(1) යන මේ පංචක නිපාතයෙහි එන ආඝාතපටිවිනය සූත්‍රය විස්තර වශයෙන් සිහිපත් කළ යුතුය. ඉදින් මේ ආකාරයෙන් වෑයම් කරද්දීත් වෛරය උපදනේම වේනම් එවිට ඔහු විසින් මේ ආකාරයෙන් තමාහට අවවාද කරගත යුතුයඃ-

"අත්තනො විසයෙ දුක්ඛං කතං තෙ යදි වෙරිනා
කිං තස්සාවිසයෙ දුක්ඛං සචිත්තෙ කත්තුමිච්ඡසි.

බහූපකාරං හිත්වාන ඤාතිවග්ගං රුදම්මුඛං
මහානත්‍ථකරං කොධං සපත්තං න ජහාසි කිං.

යානි රක්ඛසි සීලානි, තෙසං මූලනිකන්තනං
කොධං නාමූපලාලෙසි කො තයා සදිසො ජළො.

(1) අ. නි. පඤ්චක නි - A iii 186 ff.

කතං අනරියං කම්මං පරේන ඉති කුජ්ඣසි.
කින්නු ත්වං තාදිසං යෙව සො සයං කත්තුමිච්ඡසි.

රොසෙතුකාමො යදි තං අමනාපං පරො කරි,
දොසුප්පාදෙන තස්සෙව කිං පූරෙසි මනොරථං.

දුක්ඛං තස්ස ච නාම ත්වං කුද්ධො කාහසි වා න වා,
අත්තානං පනි'දනෙ'ව කො'ධ දුක්ඛෙන බාධසි.

කොධන්ධා අහිතං මග්ගං ආරූළ්හා යදි වෙරිනො,
කස්මා තුවම්පි කුජ්ඣන්තො තෙසං යෙවානුසික්ඛසි.

යං දොසං තව නිස්සාය සත්තුනා අප්පියං කතං,
තමෙව දොසං ජින්දස්සු කිමට්ඨානෙ විහඤ්ඤසි.

ඛණිකත්තා ච ධම්මානං යෙහි ඛන්ධෙහි තෙ කතං,
අමනාපා නිරුද්ධා තෙ, කස්ස දානීධ කුජ්ඣසි.

දුක්ඛං කරොති යො යස්ස, තං විනා කස්ස සො කරෙ,
සයම්පි දුක්ඛහෙතුත්තමිති කිං තස්ස කුජ්ඣසී"ති.

ඉදින් සතුරා විසින් තමාට විෂයවූ භෞතික ශරීරයක් තුළ දුකක් ඇති කරන ලද්දේනම් කිම, ඔහුට විෂය නොවූ තමාගේ සිත තුළත් දුකක් ඇති කර ගැනීමට කැමැත්තෙහිද?

බෙහෝ උපකාරීවූ ඥාතිවර්ගයා හඬද්දී ඔවුන් හැර දමා (සඳුන් වැද දුන්) මහත් අනර්ථයන් ඇති කරන ක්‍රෝධ නමැති සතුරා කිම අත් නොහරින්නෙහිද?

යම් ශීලයක් රක්නෙහිද, එම ශීලයෙහි මුල් කපා හරින ක්‍රෝධය නලවන්නෙහි නම්, තා හා සමානවූ අඥානයෙක් තවත් ඇත්ද?

අනෙකා විසින් නොමනා ක්‍රියාවක් කරන ලදැයි කිපෙන්නෙහි නම් කවර හෙයින් එබඳුම ක්‍රියාවක් තමාම කරනු කැමැත්තෙහිද?

තරහ ගන්වනු කැමැතිව අනෙකෙක් ඔබට නොමනා ක්‍රියාවක් කළේ නම්, ඔහු කෙරෙහි ද්වේෂය ඉපැදවීමෙන් ඔහුගේම කැමැත්ත සම්පූර්ණ කරන්නේ නොවෙහිද?

(සතුරා කෙරෙහි) කිපී ඔහුටද දුකක් ඇති කරතත් නැතත් දැන් පටන්ම තමා ක්‍රෝධ නමැති දුකින් පෙළන්නෙහිය.

ඉදින් ක්‍රෝධයෙන් අන්ධවූ වෛරී ජනයා අවැඩ ගෙනදෙන මඟට (නොමඟට) පිවිසියාහු නම්, කවර හෙයින් ඔවුන් කෙරෙහි ක්‍රෝධ කරමින් ඔවුන් අනුවම යන්නෙහිද?

තා කෙරෙහි ඇති ද්වේෂය හේතුකොට සතුරා විසින් කිසියම් අමිහිරි දෙයක් කරනලද්දේ නම්, එම ද්වේෂයම නසව, කවර හෙයින් නොතන්හි වෙහෙස වන්නෙහිද?

සංස්කාර ධර්මයන් ක්ෂණික පැවැත්ම ඇති හෙයින්, යම් ස්කන්ධයන් විසින් අමිහිරි දෙයක් කරනලද්දේ නම්, දැන් ඒ අමනාපවූ ස්කන්ධයෝ නිරුද්ධවූවෝ වෙති. මේ කාරණයෙහිදී දැන් කවරකුට කිපෙන්නෙහිද?

යමෙක් යමකුට දුකක් ඇති කෙරේ නම්, හේ තෙමේ එම දුකට භාජනවූවහු හැර අන් කවරකුට එය කරන්නේද? එම දුක ඇති කිරීමට තමාද හේතුවූ බැවින් කවර හෙයින් ඔහුට කිපෙන්නෙහිද?

මෙසේ තමාහට අවවාද කරගන්නාවූද ඔහුගේ ද්වේෂය නොසන්සිඳේ නම්, එවිට ඔහු විසින් තමාගේද අනෙකාගේද කර්මස්වකතාව මෙනෙහි කළයුතුය. එහිලා පළමුකොට තමාගේ කර්මස්වකතාව මෙසේ මෙනෙහි කළයුතුය: "පින්වත, ඔහුට ක්‍රෝධ කිරීමෙන් කුමක් කෙරෙහිද? ද්වේෂ මූලිකවූ මේ කර්මය තමාටම අනර්ථප පිණිස පවත්තේ නොවේද? කර්මයම උරුමකොට, කර්මයම දයාදකොට, කර්මයම පිහිටකොට, කර්මයම පිළිසරණකොට ඇත්තෙහි යම් කර්මයක් කරන්නෙහිද, එයටම දයාද වන්නෙහිය, මේ කර්මය සම්‍යක් සම්බොධිය හෝ ප්‍රත්‍යෙකසම්බොධිය හෝ ශ්‍රාවකභූමිය හෝ පිණිස හේතු නොවේ, බ්‍රහ්මභාවය හෝ ශක්‍රභාවය හෝ චක්‍රවර්ති භාවය හෝ ප්‍රදේශරාජ්‍යාදී සම්පත්තීන් අතුරෙන් එක්තරා සම්පත්තියක් හෝ සාද දීමට සමත් නොවේ, වැලිදු මේ කර්මය ශාසනයෙන් ඉවත් කරනලදුව, ඉවත ලනලද අහර බුදින්නකු බවටද, අපායගතවීම් ආදී දුක් වෙසෙස්වලටද හේතු වන්නේය. මෙසේ කරනුයේ ගිනිසිලු ඉවත්වූ අඟුරු හෝ අසුචි හෝ දෙඅතින් ගෙන අනුනට පහර දෙනු කැමැති පුරුෂයකු සෙයින් පළමුකොට තමාම දවා ගන්නෙහිය, දුගඳ කර ගන්නෙහිය."

මෙසේ තමාගේ කර්මස්වකතාව මෙනෙහිකොට අනෙකා ගැනද මෙසේ මෙනෙහිකළයුතුය. " මේ තෙමේද ක්‍රෝධ කිරීමෙන් කුමක්

කරන්නේද? මෙය ඔහුට අනර්ථය පිණිස පවත්නේ නොවේද? මේ ආයුෂ්මත් තෙමේද කර්මය උරුමකොට කර්මයම දයාද කොට-පෙ-යම් කර්මයක් කරන්නේද එයටම දයාද වන්නේය, ඔහුගේ මේ කර්මය සම්‍යක් සම්බොධිය හෝ ප්‍රත්‍යෙකසම්බොධිය හෝ ශ්‍රාවකභූමිය හෝ බ්‍රහ්මභාවය හෝ ශක්‍රභාවය හෝ චක්‍රවර්තිභාවය හෝ ප්‍රදේශ රාජ්‍යාදියෙන් එක්තරා සම්පත්තියෙක් හෝ සාද දෙන්නට සමත් නොවේ, වැලිදු මේ කර්මය ශාසනයෙන් ඉවත් කරන ලදුව, ඉවත ලනලද අහර බුදින්නකු බවටද, අපාගතවීම් ආදී දුක් වෙසෙස්වලටද හේතු වන්නේය. මෙසේ කරන හේ තෙමේ උඩු සුළඟෙහි සිටි අනුන් වෙත දූවිලි ඉසිනු කැමැති පුරුෂයකු සෙයින් තමා වෙතම ඉස ගන්නේය." කියන ලද මැයි භාග්‍යවතුන් වහන්සේ විසින්:

යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස,
තමෙව බාලං පච්චෙති පාපං
සුඛුමො රජො පටිවාතං ව ඛිත්තො[1] ති.

යමෙක් තෙමේ අනුන්හට ද්වේෂ නොකරන නිර්දෝෂීවූ නික්ලේශීවූ පුරුෂයකුට ද්වේෂ කෙරේ නම්, එම පාපය උඩුසුළඟට දැමූ සියුම් දූවිලි මෙන් එම අඥනයා වෙතම පෙරළා එන්නේය.

ඉදින් මේ ආකාරයෙන් කර්මස්වකතාව මෙනෙහි කරන්නහුගේද ද්වේෂය නොසන්සිඳේ නම්, එවිට ඔහු විසින් ශාස්තෘන් වහන්සේගේ පූර්ව-චරිත ගුණයන් මෙනෙහි කළයුතුය. එහිලා මෙනෙහි කිරීමේ ක්‍රමය මෙසේය: පින්වත් මහණ, ඔබගේ ශාස්තෘන් වහන්සේ සම්බොධියට පළමු බුද්ධත්වයට නොපැමිණිසේක්ම බොධිසත්වවූ සේක්ම සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් පැරුම් පුරණසේක් ඒ ඒ අවස්ථාවෙහිදී තමන්හට වද දෙන සතුරන් කෙරෙහි පවා සිත දූෂ්‍ය නොකළසේක් නොවේද? කෙසේදයත් පළමුකොටම, සීලවජාතකයෙහි තමාගේ දේවිය කෙරෙහි අපරාධ කළ පවිටු ඇමතියා විසින් කැඳවනලද සතුරු රජු තුන්සියක් යොදුන් රාජ්‍යය පැහැර ගන්නාවිට එය වලකනු පිණිස නැඟීසිටි ඇමතිවරුන්හට ආයුධ අතට ගැනීමට පවා ඉඩ නොදුන්හ, තවද දහසක් ඇමතියන් හා සමග අමුසොහොනෙහි ගලවටක් පොළොව සාරා සිටුවා පස්යට කරද්දී පවා සිත් නොසතුටු බවක් පමණකුදු පළනොකොට, මළ සිරුරු කනු පිණිස ආ කැනහිලුන් පස් සෑරීම නිසා පුරුෂවීර්ය කොට දිවි ගලවාගෙන,

---

(1) ධම්මපද - Dh 125

යක්ෂයන්ගේ ආනුභාවයෙන් තමාගේ සිරියහන් ගබට බැස තමාගේ සිරියහනෙහි හොත් සතුරා දැක, කෝප නොඋපදවා එකිනෙකා සපථකොට සතුරා මිතුරුතන්හි තබා මෙසේ කීහ:

ආසිංසෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො
පස්සාමි වො'හං අත්තානං යථා ඉච්ඡිං තථා අහුන්ති"(1)

පුරුෂ තෙමේ අභිමතාර්ථයන් ප්‍රාර්ථනා කරන්නේ මැයි, පණ්ඩිත තෙමේ එයින් නො-කලකිරෙන්නේය. යම් ප්‍රකාරයක් මම් අපේක්ෂා කළෙම්ද, ඔබද තමාද ඒ ප්‍රකාරම වූහ'යි දකිමි.

ක්ෂාන්තිවාදී ජාතකයෙහි අඥනවූ කසී රජු විසින්, 'ශ්‍රමණය, තෝ කිනම් වාදියෙක් වෙහිද"යි ඇසූ විට "මම් ක්ෂාන්තිවාදී වෙමි"යි කීකල්හි, කටු සැමිටියෙන් තළා අත් පා සිදිද්දී පවා කිපීම් පමණකුදු නොකළහ. වැඩිවියෙහි පැවිදිබවට පත්වූවකු මෙසේ කරතොත්, එය ආශ්චර්යයෙක් නොවේ, චුල්ලධම්මපාල ජාතකයෙහි උඩුකුරුව හෝනා ළදරුවෙක්වූ සේක්ම,

චන්දනරසානුලිත්තා බාහා ඡිජ්ජන්ති ධම්මපාලස්ස
දායාදස්ස පථව්‍යා පාණා මෙ දෙව රුජ්ඣන්ති"(2)ති

පෘථිවීරාජ්‍යයට හිමිකරුවූ ධම්මපාලයාගේ සඳුන්රස අලෙව්දුන් අත්පා සිඳිනු ලබයි, දේවයිනි, මාගේ ප්‍රාණයෝ නැසෙති'යි

මෙසේ මැණියන් හඬා වැලපෙද්දී මහාප්‍රතාප නම් පියරජු විසින් හුණ කිලිල් මෙන් අත් පා කප්වනලද කල්හි, එතෙකිනුදු තෘප්තියට නොපැමිණ, 'මොහුගේ හිස සිඳුව'යි අණ කළ කල්හි," දැන් මේ තොපගේ සිත දමනය කරගතයුතු කාලයයි, එම්බා ධර්මපාලය, හිස සිඳලීමට අණකළ පියාද, හිස සිඳුනා පුරුෂයාද, හඬා වැළපෙන මවද, තමාද'යි යන මේ සතර දෙනා කෙරෙහිම සමසිත් ඇත්තේ වෙව"යි දැඩිලෙස ඉටාගෙන කිපෙන ආකාරයක් පමණකුදු පළ නොකළසේක. මනුෂ්‍යයකුව කළ මෙයද ආශ්චර්යයෙක් නොවේමය, තිරිසන්ගතව පවා, ඡද්දන්ත නම් ඇත්ව විස පොවනලද හීයෙන් නාභියෙහි විදිනා ලද්දේද, එවන් අනර්ථයක් කළ වැද්ද කෙරෙහි සිත දූෂ්‍ය කොට නොගත්සේක. කියන ලදමැයි:

(1) ජාතකපාළි, සීලවජා. - Ja i 267
(2) එම, චුල්ලධම්මපාල ජා. - Ja iii 181

"සමප්පිතො පුථුසල්ලෙන නාගො
අදුට්ඨචිත්තො ලුද්දකං අජ්ඣභාසි:
කිමත්ථියං කිස්ස වා සම්ම හෙතු
මමං වධී කස්ස වායං පයොගො"[(1)]ති

දැඩිව හීයෙන් පහරනලද ඇත් තෙමේ සිත් කෝප නොගෙන, වැද්දට මෙසේ කීය, 'යහලුව කිනම් අර්ථයක් සඳහා, නැතහොත් කවර හේතුවක් නිසා, එසේත් නැතහොත් කවරකුගේ මෙහෙයවීමෙන් මාහට විද්දෙහිදැ"යි

මෙසේ කියා, "පින්වත, කසීරජුගේ මෙහෙසිය විසින් ඔබගේ දළ පිණිස එවන ලද්දෙමි"යි කී කල්හි, ඔහුගේ මනදෙළ පුරවමින් සවණක් රැස් විහිදෙමින් දිලිසෙන මනහර ශෝභා ඇති තමාගේ දළ කපා දුන්සේක. මහාවානරයෙක්ව තමා විසින්ම පර්වත ප්‍රපාතයෙකින් ගොඩලනලද පුරුෂයකු විසින්,

"භක්ඛො අයං මනුස්සානං යථෙවඤ්ඤෙ වනෙ මිගා,
යන්නූනිමං වධිත්වාන ඡාතො ඛාදෙය්‍ය වානරං
අසිතොව ගමිස්සාමි මංසමාදය සම්බලං
කන්තාරං නිත්ථරිස්සාමි පාථෙය්‍යං මෙ භවිස්සති"[(2)]ති

වනයෙහි වෙසෙන අනෙක් මෘගයන් සෙයින්ම මොහුද මනුෂ්‍යයන් විසින් කෑමට යෝග්‍ය වන්නේය, සයින් පෙළුණෙම් මේ වඳුරා මරා කන්නෙම් නම් යෙහෙකි,

බඩකට පුරා අනුභවකොට මහට ආහාර පිණිස ඉතිරි මස් ගෙනයන්නෙම් කාන්තාරය තරණය කරන්නෙමි, එය මාහට ගමන් ආහාර වන්නේය.

මෙසේ සිතා ගලක් ඔසවා හිස් මුදුන පැළු කල්හි, කඳුලුපිරි දෙනෙතින් ඒ පුරුෂයා දෙස බලමින්,

"මායොය්‍යාසි මේ භදන්තෙ ත්වං තුවං නාමෙදිසං කරි,
ත්වං බො සි නාම දීඝායු අඤ්ඤං වාරෙතුමරහසී"[(3)] ති

(1) ජාතකපාළි, ඡද්දන්ත ජා. - Ja v 51
(2) එම, මහාකපි ජා. - Ja v 71
(3) ජාතකපාළි, මහාකපි ජා. - Ja v 71

පින්වත, ඔබ මට වඩා උසස් කෙනෙකි, ඔබ මට මෙවැනි දෙයක් නොකළ මැනවි, ඔබ දිගා ඇත්තකු වනු මැනවි, මෙවන් දෙයක් කරන අනෙකකු වුව වැලැක්වීම සුදුසුය'යි

මෙසේ කියා ඒ පුරුෂයා කෙරෙහි සිත දූෂ්‍යකොට නොගෙන තමාගේ දුක ගැනද නොසිතා ඒ පුරුෂයා උපද්‍රව රහිත භූමියට පමුණුවාලූසේක. භූරිදත්ත නම් නාරජුව උපෝසථාංගයන් ඉටාගෙන තුඹසක් මත වැතිර කල්පාන්ත වග්නිය වැනි ඖෂධයෙන් මුළු සිරුර තෙමනු ලබන කල්හිද, පැසෙක බහා මුළු දඹදිවිහි නටවනු ලබන කල්හිද ඒ බ්‍රාහ්මණයා කෙරෙහි සිත කෝප ගැනීම්මතෙකුදු නොකළේය. කියන ලද මැයි:

"පෙළාය පක්ඛිපන්තෙපි මද්දන්තෙ පි ච පාණිනා
ආලම්බනෙ න කුප්පාමි සීලඛණ්ඩභයා මමා"[1]ති

"පැසෙහි බහා ලනවිටද, අතින් මඩිනු ලබනවිටද මාගේ ශීලය බිඳේති'යි යන බියෙන් අහිගුණ්ඨික ආලම්බනයා, කෙරෙහි නොකිපෙමි."

චම්පෙය්‍ය නම් නාරජුව අහිගුණ්ඨිකයා විසින් ගැහැට කරනු ලබනවිට සිතෙහි කෝප මාත්‍රයකුදු නොඉපිදවූහ. කියන ලදමැයි:

'තදපි මං ධම්මචාරිං උපවුත්ථං උපොසථං
අහිතුණ්ඩිකො ගහෙත්වාන රාජද්වාරම්හි කීළති.

යං සො වණ්ණං චින්තයති නීලං පීතඤ්ච ලොහිතං
තස්ස චිත්තානුවත්තෙන්තො හොමි චින්තිතසන්නිභො

ථලං කරෙය්‍ය උදකං උදකම්පි ථලං කරෙ
යදිහං තස්ස පකුප්පෙය්‍යං ඛණෙන ඡාරිකං කරෙ.

යදි චිත්තවසී හෙස්සං පරිහායිස්සාමි සීලතො
සීලෙන පරිහීනස්ස උත්තමත්ථො න සිජ්ඣති"[2]ති

එකල්හිදු ධර්මචාරීවූ පෙහෙවස් වුසූ මා අල්වාගෙන අහිගුණ්ඨිකයා රජගෙදර දෙරටුව අසල ක්‍රීඩා කරවයි.

---

(1) චරියාපිටක - Cp 85

(2) ජාතකපාළි, සංඛපාල ජා. - Ja v 172 cf. Cp 85 f.

එම අභිගුණ්ඨිකයා නිල්, කහ, රතු යන යම් වර්ණයක් ගැන සිතාද, ඔහුගේ සිතට අනුව පවත්නෙමි, ඔහු සිතූ වර්ණයට සමාන වෙමි.

ගොඩ දිය බවට හරවමි, දිය ගොඩ බවට හරවමි, ඉදින් මම් ඕහට කිපියෙම් නම් සැණෙකින් හලු බවට පත් කරන්නෙමි.

ඉදින් සිතට වසහවීම් නම් ශීලයෙන් පිරිහෙන්නෙමි, ශීලයෙන් පිරිහුණු කල පරමාර්ථය සිද්ධ නොවේ.

සංඛපාල නම් නාරජුව තියුණු සැතින් අට තැනෙක විද, විදි තන්හි කටුසහිත වැල් ඔබා නාසයෙහි සවි ඇති රැහැනක් බහා ගැමි දරුවන් සොළොස් දෙනෙකුන් විසින් කද බැඳගෙන යද්දී පොළොවෙහි ගැටෙන සිරුරු ඇතිව මහත් දුක් විඳිමින් පවා කිපී බැලූ පමණෙකින් සියලු ගැමි දරුවන් හලු කරනු සමත්වද ඇසිපිය නගා කිපි ආකාරයක් පවා පහළ නොකළහ. කියන ලදමැයිඃ-

"චාතුද්දසිං පඤ්චදසිඤ්ච'ළාර
උපොසථං නිච්චමුපාවසාමි
අථාගමුං සොළස භොජපුත්තා
රජ්ජුං ගහෙත්වාන දළ්හඤ්ච පාසං
ඡෙත්වාන නාසං අතිකස්ස රජ්ජුං
නයිංසු මං සම්පරිගය්හ ලුද්දා
එතාදිසං දුක්ඛමහං තිතික්ඛං
උපොසථං අප්පටිකොපයන්තො"(1) ති.

"අළාරය, තුදුස්වක පසළොස්වක නොකඩවා පෙහෙවස් වෙසෙමි, එකල්හි ගැමිදරුවෝ සොළොස් දෙනෙක් රැහැනක්ද සවිඇති මලයක්ද ගෙන ආවාහුය, නාසය විද රැහැන එහි රුවා මා අල්වාගෙන ගියාහුය, පෙහෙවස් කඩ නොකොට මම් මේසා දුකක් වින්දෙමි."

"එමතුද නොවේ, සෙසු මාතුපොසක ජාතක ආදියෙහිද නොයෙක් අසිරිය කළසේක. එබඳුවූ උන්වහන්සේ විසින් සර්වඥතාව අවබෝධ කරගන්නා ලද්දේය, දෙවියන් සහිත ලෝකයෙහි කිසිවකු හා සම නොවන ක්ෂාන්තිගුණ ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ ගුරුකොට අනුගමනය

(1) එම - Ja v 172 f.

කෙරෙමි'යි පවසන ඔබ විසින් ද්වේෂ චිත්තයක් ඉපැදවීම නම් ඉතා නුසුදුසුය, අයෝග්‍යය."

ඉදින් මේ ආකාරයෙන් ශාස්තෘන් වහන්සේගේ පෙර සිරිත් ගුණ මෙනෙහි කරනවිට වුවද, දීර්ඝ කාලාන්තරයක් ක්ලේශයන්ගේ වසඟයට ගිය පුද්ගලයකුගේ ද්වේෂය නොසන්සිඳෙන්නේය. එවිට ඔහු විසින් අනමතග්ග (ඉමක් කොණක් නැති) ධර්මයන් මෙනෙහි කළයුතුය. කියනලදමැයි අනමතග්ග සූත්‍රයෙහි: "මහණෙනි, (පෙර අත්බව්හිදී) මව් නොවූවිරූ පුද්ගලයෙක් සුලබ නොවේ, පිය නොවූවිරූ, සොහොවුරු නොවූවිරූ, සොහොයුරි නොවූවිරූ, පුත් නොවූවිරූ, දූ නොවූවිරූ පුද්ගලයෙක්ද සුලබ නොවේ"(1) යනුවෙනි. එහෙයින් එම පුද්ගලයා කෙරෙහි මෙවන් සිතක් ඉපැදවිය යුතුය. "මෝ තොමෝ අතීතයෙහි මාහට මව් වී දසමසක් කුස දරා මල මූත්‍ර කෙළ සොටු ආදිය රත්සඳුන් සේ පිළිකුල් නැතිව ගෙන ඉවත්කොට තමාගේ ළය මත නටවමින්, ඇකයෙන් වඩාගෙන පෝෂණය කළාය. මේ තෙමේ මාහට පිය වී එළුවන් යන මාර්ගය, කටු කොහොල් සහිත මාර්ගය ආදියෙහි යෙමින් වෙළඳහම්හි යෙදෙමින් මා වෙනුවෙන් ජීවිතය පවා පරදුවට තබා, දෙපසින් නැඟී ආ යුද මැදට පිවිසෙමින්, නැවෙන් මහ සමුදුර එතෙර යමින්, තවත් සිය ගණන් දුෂ්කර කාර්යයන් කෙරෙමින්, 'පුතු පෝෂණය කෙරෙමි'යි ඒ ඒ උපායෙන් ධනය උපයමින් මා පෝෂණය කළේය. සොහොවුරුව, සොහොයුරිව, පුත්ව, දුවව මේ මේ උපකාර කළේය. මේ පුද්ගලයා කෙරෙහි සිත දූෂ්‍ය කර ගැනීම මට නොසුදුසුය.' ඉදින් මෙසේද සිත නිවා ගැනීමට නොපොහොසත් වෙතොත්, එවිට ඔහු විසින් මෛත්‍රානිසංසයන් මෙනෙහි කළයුතුය. 'පින්වත් පැවිද්ද, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදරන ලද්දේ නොවේද? 'මහණෙනි, ආදරයෙන් සෙවුනාලද, වඩනාලද, බොහෝසෙයින් පුහුණු කරනලද, යානයක් මෙන් භාවිත කරනලද, වස්තුවක් මෙන් රක්නාලද, නිසිලෙස පිහිටුවනලද, පුරුදු කරනලද, මනාකොාට අරඹනලද මෛත්‍රීසහගත චිත්තසමාධියෙහි ආනිසංසයන් එකොළොසක් අපේක්ෂා කළ හැකිවේ. කවර නම් එකොළොසක්ද? සුවසේ නිදයි, සුවසේ පිබිදෙයි, නපුරු සිහින නොදකියි, මිනිසුන්හට ප්‍රිය වෙයි, නොමිනිසුන්හට ප්‍රිය වේ. දෙවියෝ ආරක්ෂා කෙරෙති, ගිනි හෝ විස හෝ අවිආයුධ හෝ නොපෙළයි, සිත වහා සමාධිගත වෙයි, මුඛවර්ණය ප්‍රසන්න වේ, මූළාවෙන් තොරව කලුරිය කරයි, (සමාපත්තීනට) වඩා උසස් (මාර්ග ඵලාදිය) අවබෝධ

(1) සං. නි. - S ii 189f.

නොකළහොත් බඹලොව උපදියි' යනුවෙන්, ඉදින් ඔබ මේ සිත නිවා නොගතහොත් මේ ආනිසංසයන් කෙරෙන් දුරු වන්නාහුය."[1]

මේ ආකාරයෙනුදු සමනය කරගත නොහැකි වුවහොත් ධාතුව්‍යවච්ඡේදය කළයුතුය, කෙසේදයත්, "පින්වත් පැවිද්ද, ඔබ මොහු කෙරෙහි කිපෙමින් කවරකට කිපෙන්නේද? කෙස් කෙරෙහි කිපෙන්නේද? නැතහොත්, ලොම් කෙරෙහි, නිය කෙරෙහි,-පෙ-මූත්‍ර කෙරෙහි කිපෙන්නේද? නොඑසේනම්, කෙස් ආදියෙහි වූ පඨවිධාතුව කෙරෙහි කිපෙන්නේද? ආපොධාතුව කෙරෙහි, තෙජොධාතුව කෙරෙහි, වායොධාතුව කෙරෙහි කිපෙන්නේද? නොහොත්, යම් මේ ස්කන්ධ පසක්, ආයතන දොළොසක්, ධාතූන් අටළොසක් නිසා මේ ආයුෂ්මත් තෙමේ මෙනම් වේය'යි කියනු ලැබේනම්, ඔවුන් අතුරෙන්, කිම? රූපස්කන්ධයට කිපෙන්නේද? නැතහොත්, වේදනා-පෙ-සඤ්ඤා-සංඛාර-විඤ්ඤාණ ස්කන්ධයට කිපෙන්නේද? කිම? චක්ෂුරායතනයට කිපෙන්නෙහිද? කිම? රූපායතනයට කිපෙන්නේද? -පෙ-මනායතනයට කිපෙන්නේද? කිම? ධම්මායතනයට කිපෙන්නේද? කිම? චක්ඛුධාතුවට කිපෙන්නේද? කිම? රූපධාතුවට-පෙ-චක්ඛු විඤ්ඤාණධාතුවට-පෙ-කිම? මනොධාතුවට-ධම්මධාතුවට-මනොවිඤ්ඤාණධාතුවට කිපෙන්නේද"යි මෙසේ ධාතු විනිබ්භොගය (විග්‍රහය) කරනවිට, හිදිකටු අග අබැටකට සෙයින්, අහසෙහි සිතුවමකට සෙයින් ක්‍රෝධයට පිහිටවන තැනෙක් නොවේ.

ධාතුවිනිබ්භොගය කරනු නොහැකි වෙතොත්, දානසංවිභාගය කළයුතු වේ. තමා සතු දෑය සතුරාහට දියයුතුය, සතුරා සතු දෑය තමා විසින් පිළිගත යුතුය, ඉදින් සතුරා නසාගත් ආජීව ඇත්තෙක් නම්, පරිභොගයට සුදුසු නොවන පිරිකර ඇත්තෙක් නම්, තමා සතු දෑය දීම පමණක් කළයුතුය, මෙසේ කරනවිට එම පුද්ගලයා කෙරෙහිවූ ආඝාතය ඒකාන්තයෙන්ම සන්සිඳේ, අනෙකාගේද පෙර අත්බැව්හි පටන් බැඳගෙන ආ වෛරය වුවද එකෙණෙහි සන්සිඳේමය. සිතුල්පවු වෙහෙරෙහි තුන්වරක් සෙනසුනෙන් නෙරපනලද පිණ්ඩපාතික තෙරුන් විසින්, "ස්වාමීනී, කහවනු අටක් අගනා මේ පාත්‍රය මාගේ. මව් උපාසිකාව විසින් දෙනලද ධාර්මිකවූ ලාභයකි, මහෝපාසිකාවට පින් ලබා දෙනු මැනවැයි" කියා දෙනලද පාත්‍රය පිළිගත් මහතෙරුන්ගේ (ක්‍රෝධය) මෙනි. මෙසේ මේ දානය නම් මහානුභාව ඇත්තෙකි. කියන ලද මැයි:

"අදන්තදමනං දානං දානං සබ්බත්ථ සාධකං
දානෙන පියවාචාය උන්නමන්ති නමන්ති චා"ති

(1) අං. නි. මෙත්තසුත්ත - A v 342

දනය තෙමේ නොදමුණුවුන් දමනය කරන්නේය, දනය තෙමේ සියලු වැඩ සාදන්නේය, දනයෙන්ද ප්‍රියවචනයෙන්ද උඩු අතටද යටි අතටද නැඹුරු වන්නේය (මෘදුවූ සිත් ඇත්තෙක් වන්නේය.)

වෛරී පුද්ගලයා කෙරෙහි ද්වේෂය සන්සිඳුණු ඒ යෝගාවචරයාගේ සිත ප්‍රියසහාය, අතිප්‍රිය සහාය, මධ්‍යස්ථ යන මොවුන් කෙරෙහි මෙන්ම ඒ වෛරී පුද්ගලයා කෙරෙහිද මෛත්‍රී වැඩීම් වශයෙන් එකසේ පවතියි. ඉක්බිති නැවත නැවතත් මෛත්‍රී පතුරුවන ඔහු විසින් තමාද, ප්‍රිය පුද්ගලයාද, මධ්‍යස්ථයාද, වෛරී පුද්ගලයාද යන මේ සතරදෙනා කෙරෙහි සමසිත්බව වඩමින් සීමාසම්භෙදය කටයුතුය. මේ එහි ලක්ෂණයයි: ඉදින් මේ පුද්ගලයා, ප්‍රිය, මධ්‍යස්ථ, වෛරී යන තිදෙනා සමඟ තමා සිවුවැනියා කොට එක් තැනෙක හුන් විටෙක සොරු අවුත්, “ස්වාමීනි, අපට එක් භික්ෂුවක් දෙනු මැනවැ”යි කියා “කවර කරුණක් සඳහා ද”යි කී කල්හි, “මරා ගලලෙහෙ ගෙන බිලි පූජා කරනු පිණිසය“යි කියන්නාහු නම්, එහිදී මේ භික්ෂුතෙමේ “අසුවලා හෝ අසුවලා හෝ ගනිත්වා“යි සිතන්නේ නම්, සීමාසම්භෙදය නොකරන ලද්දේමය. ඉදින් “මා අල්වා ගනිත්වා, මේ තිදෙනා නොගනිත්වා”යි සිතනුයේ සීමාසම්භෙදය නොකරන ලද්දේමය. කවර හෙයින්ද? යම් යම් අයකු අල්වා ගැනීමට කැමැති වේනම් ඒ ඒ පුද්ගලයාට අහිත කැමැත්තේ නම් වේ. සෙසු අයටම හිත කැමැත්තේ වේ. යම් කලෙක්හි වනාහි සිවු දෙනා අතුරෙන් එක් කෙනකුවත් සොරුන්හට දියයුතුයේ නොදකී නම් තමා කෙරෙහිද එවිට සීමාසම්භෙදය කරනලද්දේ නම් වේ.

එහෙයින් කීහු පුරාණාචාර්යයෝ

“අත්තනි හිතමජ්ඣත්තෙ අහිතෙ ච චතුබ්බිධෙ
යදා පස්සති නානත්තං හිතචිත්තො’ව පාණිනං
න නිකාමලාභී මෙත්තාය කුසලීති පවුච්චති.

යදා චතස්සො සීමායො සම්භින්නා හොන්ති භික්ඛුනො
සමං ඵරති මෙත්තාය සබ්බං ලොකං සදෙවකං
මහාවිසෙසො පුරිමෙන යස්ස සීමා න ඤායති.”

තමාය, හිතවතාය, මධ්‍යස්ථයාය, අහිතවතාය යන සිවු දෙනා කෙරෙහි යම්තාක් නානත්වය දකීද, ඒතාක් ප්‍රාණීන් කෙරෙහි හුදෙක් හිතසිත් ඇත්තේ නම් වේද හේ තෙමේ ඒකාන්ත මෛත්‍රීලාභී කුසල් ඇත්තෙකැ’යි නොකියනු ලැබේ.

යම් කලෙක ඒ භික්ෂුව විසින් මෙකී සීමා සතර බිඳින ලද්දේ වේද, ඒ භික්ෂු තෙමේ දෙවියන් සහිත සකල ලෝකයා කෙරෙහි සමසිත් ඇති මෛත්‍රිය පතුරුවයිද, සීමා නොදක්නේද, එකල පළමු තත්වයට වඩා මහත් විශේෂයෙක් වේ. එහි සීමාවක් නොදනේ.

මෙසේ සීමාසම්භෙදය හා සමකාලයෙහිම මේ භික්ෂුව විසින් නිමිත්තද උපචාරයද ලබනලද්දේ වේ. සීමාසම්භෙදය කළ කල්හි එයම නිමිතිකොට සේවනය කෙරෙමින්, වඩමින්, පුරුදු කෙරෙමින් මඳ ආයාසයෙකින්ම, පඨවිකසිණයෙහි කියනලද නයින්ම, අර්පණාධ්‍යානයට පැමිණේ. මෙතෙකින් මොහු විසින් අංග පසෙකින් හීනවූ, අංගපසෙකින් යුක්තවූ ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තවූ, දශලක්ෂණයෙන් සමන්විතවූ මෛත්‍රීසහගත ප්‍රථමධ්‍යානය ලබනලද්දේවේ. එය ලදවිට එයම නිමිතිකොට සේවනය කෙරෙමින්, වඩමින්, පුරුදු කෙරෙමින් අනුපිළිවෙළින් චතුෂ්කනයෙහිදී ද්විතීය, තෘතීය ධ්‍යානයනටද, පඤ්චකනයෙහිදී ද්විතීය, තෘතීය, චතුර්ථ ධ්‍යානයනටද පැමිණේ. හේ තෙමේ ප්‍රථමධ්‍යානාදී එක්තරා ධ්‍යානයක් මෛත්‍රීසහගත සිතින් එක් දිශාවක් පතුරුවමින් විහරණ කරයි, එසේම දෙවන, තුන්වන, සතරවන දිසාවන්ද මෛත්‍රී සහගත සිතින් පතුරුවමින් විහරණය කරයි. මෙසේ උඩුඅතට, යටිඅතට, සරසට සියලු තන්හි සමසේ සියලු සත්වයා සහිත ලෝකය විපුලවූ, මහද්ගතවූ, අපමණවූ, අවෛරීවූ, අව්‍යාපාදවූ, මෛත්‍රීසහගතවූ සිතින් පතුරුවමින් විහරණය කරයි. ප්‍රථම ධ්‍යානාදී වශයෙන් අර්පණාවට පැමිණි සිත් ඇත්තහුටම මෙම විකුබ්බනය (එනම් ඔධිසො අනොධිසො ඵරණය හෙවත් අවධි සහිත හා රහිත මෛත්‍රී පැතිරවීම) සිද්ධ වේ.

මෙහි **මෙත්තාසහගතෙන** යනු, මෛත්‍රීයෙන් යුක්තවූ, **චෙතසා** යනු සිතින්, **එකං දිසං** යනු, එක් දිශාවක් තුළ පළමුවෙන් ගන්නාලද සත්වයාගේ පටන් එක් දිශාවක් තුළ සිටි සත්වයන් කෙරෙහි පැතිරවීම් වශයෙන් කියනලදි. **ඵරිත්වා** යනු, (සිතින්) ස්පර්ශ කෙරෙමින්, අරමුණු කෙරෙමින්, **විහරති** යනු, බ්‍රහ්ම විහාරයෙන් අධිෂ්ඨිතවූ ඉරියාපථවිහරණය පවත්වයි. **තථා දුතියං** යනු, යම්සේ පූර්ව ආදී දිශාවන් අතුරෙන් එක් දිශාවක් තුළ මෛත්‍රිය පතුරුවමින් විහරණය කෙරේද, එසේම සෙසු දෙවන තෙවන සිවුවන දිශාවන්හිය යන අර්ථයි.

**ඉති උද්ධං** යනු, මේ ආකාරයෙන්ම උඩු දිශාවයි කියනලද්දේ වේ, **අධො තිරියං** යනු, යටි දිශාවද සරස් දිශාවද, මෙසේ **අධො** යනු යටි දිශාවයි, **තිරියං** යනු අනුදිශායි. මෙසේ සියලු දිශාවන්හි අස්මඩලෙහි

අසකුමෙන් මෛත්‍රීසහගත සිත හසුරුවයි, නැවත නැවත හසුරුවයි, මෙතෙකින් එක් එක් දිශාවක් ගෙන සීමා වශයෙන් මෛත්‍රිය පැතිරවීම දක්වනලදි.

**සබ්බධි** යන ආදිය අනවධි වශයෙන් (සීමා රහිතව) මෛත්‍රිය පැතිරවීම දක්වනු පිණිස කියනලදි. **සබ්බධි** යනු, සියලු තන්හි, **සබ්බත්තතාය** යනු, සියලුම හීන, මධ්‍යම, උත්කෘෂ්ට, මිතුරු, සතුරු, මැදහත් ආදි ප්‍රභේද ඇති සත්වයන් කෙරෙහි තමා කෙරෙහි මෙන්ම, 'මේ අන් සත්වයෙකැ'යි වෙනසක් නොකොට තමා මෙන්මැ'යි කියන ලද්දේ වේ. නැතහොත්, **සබ්බත්තතාය** යනු, මුළු සිතින්ම, මඳකුදු කමටහනින් තොරව වික්ෂේපයට නොපමුණුවමිනි'යි කී තියායි. **සබ්බාවන්තං** යනු, සියලු සත්වයන් සහිතව, සියලු සත්වයන්ගෙන් යුක්තය යන අර්ථයි. **ලොකං** යනු සත්වලෝකයයි.

**විපුලෙන** යනු, මේ ආදීවූ පර්යාය දර්ශනයෙන්, මෙහි නැවත **මෙත්තාසහගතෙනයයි** කියනලදී. නොහොත් මෙහි සීමා වශයෙන් සිත පැතිරවීමෙහිදී මෙන් 'තථා' ශබ්දය හෝ 'ඉති' ශබ්දය නොකියනලදි. එහෙයින් නැවත **මෙත්තාසහගතෙන චෙතසා** (මෛත්‍රී සහගත සිතින්) යයි කියනු ලැබේ. **විපුලෙන** යනු, මෙහි පැතිරවීම් වශයෙන් විපුලත්වය දතයුතුය. භූමි වශයෙන් මෙය (රූපාවචර වශයෙන්) 'මහද්ගත' නම්වේ. පුරුණකිරීම් වශයෙන්ද, අප්‍රමාණ සත්වයන් පිළිබඳ අරමුණු වශයෙන්ද **අප්පමාණ** වේ. ව්‍යාපාද නමැති සතුරා පිටුදැකීම් වශයෙන් **අවෙර** නම්, දෙම්නස පහකිරීම් වශයෙන් **අබ්‍යාපජ්ඣ** නම්, නිදුක්යයි කීතියායි. මේ 'මෙත්තාසහගතෙන චෙතසා' ආදි නයින් කියනලද විකුබ්බන (ආකාරපරිවර්තන)යෙහි අර්ථයි. යම්සේ මේ විකුබ්බනය අර්පණාවට පැමිණි සිත් ඇත්තහුටම සමෘද්ධවේද, එසේම පටිසම්භිදවෙහි අනවධි වශයෙන් පතුරුවනු ලබන මෛත්‍රී ධ්‍යානය පස් ආකාරයෙකින්ද, අවධි වශයෙන් පතුරුවනු ලබන මෛත්‍රී ධ්‍යානය සත් ආකාරයෙකින්ද, දිශාවන්හි පතුරුවනු ලබන මෛත්‍රී ධ්‍යානය දශ ආකාරයෙකින්ද සිද්ධ වේ[1]යයි කියනලදි. එයද අර්පණාවට පත්වූ සිත් ඇත්තහුටම සමෘද්ධ වේයයි දතයුතුය.

එහිද සියලු සත්වයෝ වෛර නැත්තෝ, ව්‍යාපාද නැත්තෝ ගැහැට නැත්තෝ සුවපත් වෙත්වා'යි සියලු ප්‍රාණීහු-පෙ-සියලු භූතයෝ (උපතලත් සත්වයෝ) සියලු පුද්ගලයෝ, සියලු ආත්මභාවපර්යාපන්නයෝ අවෛරී

---

(1) පටිසම්භිද Ps ii 130

-පෙ-සුවපත් වෙත්වා'යි මේ පස් ආකාරයෙන් අනවධි වශයෙන් පතුරුවනු ලබන මෛත්‍රී ධ්‍යානය දතයුතුය. 'සියලු ස්ත්‍රීහු අවෛරී-පෙ-සුවපත් වෙත්වා, සියලු පුරුෂයෝ, සියලු ආර්යයෝ, සියලු අනාර්යයෝ, සියලු දෙවියෝ, සියලු මනුෂ්‍යයෝ, සියලු විනිපාතිකයෝ (දුගතියෙහි උපන්නාහු) අවෛරී -පෙ-සුවපත් වෙත්වායි යන මේ සත් ආකාරයෙන් අවධි වශයෙන් පතුරුවනු ලබන මෛත්‍රී ධ්‍යානය දතයුතුය. පෙරදිග වැසි සියලු සත්වයෝ අවෛරී-පෙ-සුවපත් වෙත්වා, බටහිරදිග වැසි සියලු සත්වයෝ, උතුරුදිග වැසි සියලු සත්වයෝ, දකුණු දිග වැසි සියලු සත්වයෝ, නැගෙනහිර අනුදිශා වැසි සියලු සත්වයෝ, බටහිර අනුදිශා වැසි සියලු සත්වයෝ, උතුරු අනුදිශා වැසි, දකුණු අනුදිශා වැසි, යටි දිසාවෙහි, උඩු දිසාවෙහි වැසි සියලු සත්වයෝ අවෛරී-පෙ-සුවපත් වෙත්වා, නැගෙනහිර අනුදිශා වැසි ප්‍රාණීහු-භූතයෝ-පුද්ගලයෝ-ආත්මභාවපර්යාපන්නයෝ අවෛරී-පෙ-සුවපත් වෙත්වා'යි, පෙරදිග වැසි සියලු ස්ත්‍රීහු, සියලු පුරුෂයෝ, ආර්යයෝ, අනාර්යයෝ, දෙවියෝ, මනුෂ්‍යයෝ, විනිපාතිකයෝ අවෛරී -පෙ-සුවපත් වෙත්වා, බටහිර වැසි, උතුරුදිග වැසි, දකුණුදිග වැසි, නැගෙනහිර අනුදිශා, බටහිර අනුදිශා, උතුරුඅනුදිශා, දකුණු අනුදිශා, යටි දිසාවෙහි, උඩුදිසාවෙහි වැසි සියලු ස්ත්‍රීහු -පෙ- විනිපාතිකයෝ අවෛරී, ව්‍යාපාද රහිත, නිදුක් (ගැහැට නැත්තෝ), සුවපත් වෙත්වා'[1]යි යන මේ දශ ආකාරයෙන් දිශාවන්හි පැතිරවීමේ මෛත්‍රී ධ්‍යානය දතයුතුය.

එහි, **සබ්බෙ** යන මෙය, ඉතිරි නොකොට සත්වවිෂය ග්‍රහණය කිරීමයි, **සත්තා** යනු, රූපාදී ස්කන්ධයන් කෙරෙහි ඡන්දරාගයෙන් ඇලුණාහු, විශේෂයෙන් ඇලුණාහු සත්ත නම් වෙති. වදරන ලදමැ'යි භාග්‍යවතුන් වහන්සේ විසින් "රාධය, රූප විෂයෙහි යම් කැමැත්තක්, යම් රාගයක්, යම් පිනායාමක් යම් තෘෂ්ණාවක් ඇත්තේද, එහි ඇලුණේ, විශේෂයෙන් ඇලුණේ ඒ හේතුවෙන් 'සත්ත'යයි කියනුලැබේ. වෙදනා විෂයෙහි-සඤ්ඤා විෂයෙහි - සංඛාර විෂයෙහි - විඤ්ඤාණ විෂයෙහි යම් කැමැත්තක්, යම් රාගයක්, යම් නන්දිරාගයක් (පිනායාමක්) යම් තෘෂ්ණාවක් ඇත්තේද, එහි ඇලුණේ, වෙසෙසින් ඇලුණේ ඒ හේතුවෙන් 'සත්ත'යයි කියනු ලැබේ."[2]

රූඪිශබ්ද වශයෙන් වනාහි වීතරාගීන් කෙරෙහිද මේ 'සත්ව' යන ව්‍යවහාරය පවත්නේමය. හුණපතුරෙන් කළ, වීජනි විශේෂයටද තාලවණ්ට

(1) එම - Ps ii 131

(2) සං. නි. රාධ සු - S iii 90

(තල්වට) යන ව්‍යවහාරය මෙනි. වියරණ ඇදුරෝ (අක්‍ෂරයන් පිළිබඳව සිතන්නෝ) වනාහි අර්ථය නොවිචාරා මෙය නාමමාත්‍රයෙකැ'යි (කීමට) කැමැතිවෙති. යමෙක් අර්ථය විචාරත්ද, ඔහු සත්ත (ඇලීම) යන යෝගයෙන් සත්ව නම් වෙති'යි අරුත් දීමට කැමැතිවෙති. ආශ්වාස ප්‍රශ්වාස කරන හෙයින් ප්‍රාණී නම් වෙති, ආශ්වාස ප්‍රශ්වාසයට අයත් පැවතුම් ඇති හෙයිනි'යි යන අර්ථයි. හටගත් හෙයින් 'භූත' නම් වෙති, පහළවූ හෙයින්, උපන් හෙයිනි'යි යන අර්ථයි. 'පුං' යනු නිරයයි කියනු ලැබේ, එම නිරයතුළ ගැලෙති'යි 'පුග්ගල' නම් වෙති, නිරයට යෙති'යි යන අර්ථයි. ශරීරය නැතහොත් ස්කන්ධපංචකයම ආත්මභාවයයි කියනුලැබේ. ඒ ස්කන්ධපංචකය ඇසුරුකොට ප්‍රඥප්ති මාත්‍රයෙන් විද්‍යමානවනහෙයිනි. එම ආත්මභාවයෙහි අන්තර්ගත වූවාහු'යි අත්තභාවපරියාපන්න නම් වෙති. **පරියාපන්නා** යනු පිරිසිඳියාහු'යි, ඇතුළත් වූවාහු'යි යන අර්ථයි.

**සත්තා** යන වචනය යම්සේද, එසේම 'පාණා' ආදී සෙසු වචනද රූඪී වශයෙන් ආරෝපණයකොට මේ සියලු වචන සියලු සත්වයන් සඳහාවූ පර්යායවචනැ'යි දතයුතුය. 'සබ්බෙ සත්තා, සබ්බෙ ජීවා' ආදී වශයෙන් සර්ව සත්ව පර්යායයෝ ඇත්තාහුමය, ප්‍රකටපර්යාය වශයෙන් 'සත්තා' ආදී මේ පංචකයම ගෙන පස් ආකාරයෙකින් ගෙන අනොධිසො ඵරණා (අනවධි වශයෙන් පතුරුවනු ලබන) මෛත්‍රී චෙතොවිමුක්ති (ධ්‍යානය)යි කියනලදි. යම් කෙනෙක් වනාහි 'සත්තා, පාණා' යන ආදී පදයන් හුදෙක් වචනමාත්‍රයෙන් නොව අර්ථයෙන්ද නානත්වය කැමති වෙත්ද, ඔවුනට අනවධිවශයෙන් (මෙත්සිත) පැතිරවීම විරුද්ධ වේ. එහෙයින් එසේ නානත්වයෙන් අර්ථය නොගෙන මේ පස් ආකාරයෙන් එක්තරා ආකාරයෙකින් අනොධිසො ඵරණය (අනවධි වශයෙන් මෙත්සිත පැතිරවීම) කළයුතුය. මෙහි 'සබ්බෙ සත්තා අවෙරා හොන්තු' යනු එක් අර්පණාවෙකි, "අබ්‍යාපජ්ඣා හොන්තු" යනු එක් අර්පණාවෙකි. අබ්‍යාපජ්ඣා යනු දෙම්නස් නැත්තාහුයි. "අනීඝා හොන්තු" යන මේ එක් අර්පණාවෙකි. 'අනීඝා' යනු නිදුක් වූවාහුයි. "සුඛී අත්තානං පරිහරන්තු" යන මේ එක් අර්පණාවෙකි, එහෙයින් මේ පදයන් අතුරෙන්ද යම් යම් පදයක් ප්‍රකටව වැටහේනම් ඒ ඒ පදය වශයෙන් මෛත්‍රී පැතිරවියයුතුය. මෙසේ පස් ආකාරයන් අතුරෙන් එකකට අර්පණා සතරක් බැගින් අනොධිසො ඵරණයෙහිදී අර්පණා විස්සෙක් වේ. ඔධිසො ඵරණයෙහිදී (අවධි වශයෙන් පැතිරවීමෙහිදී) වනාහි සත් ආකාරයන් අතුරෙන් එකකට සතරක් බැගින් අර්පණා විසිඅටෙකි. මෙහි 'ඉත්ථියො, පුරිසා' යනු, ලිංග වශයෙන් කියනලදි. 'අරියා, අනරියා' යනු, ආර්ය පුද්ගලයන් පෘථග්ජන

පුද්ගලයන් වශයෙන්ද ‘දෙවා, මනුස්සා, විනිපාතිකා’ යනු, උත්පත්ති වශයෙන්ද කියනලදි. දිශාවන් අනුව මෛත්‍රී පැතිරවීමේදී “සබ්බෙ පුරත්ථිමාය දිසාය සත්තා” (පූර්ව දිශාවෙහි සියලු සත්වයෝ) ආදී නයින් එක් එක් දිශාවෙක්හි විස්සක් විස්සක් වශයෙන් අර්පණා දෙසියයක් වේ. ‘සබ්බා පුරත්ථිමාය දිසාය ඉත්ථියො’ (පූර්ව දිශාවෙහි සියලු ස්ත්‍රීහු) යන ආදී නයින් එක් එක් දිශාවෙක්හි විසි අටක් විසිඅටක් බැගින් ගෙන දෙසිය අසූවක් වේ, මෙසේ පටිසම්භිදවෙහි කියනලද සියලු අර්පණාවෝ පන්සියවිසිඅටෙකි. මෙසේ මේ අර්පණාවන් අතුරෙන් යම්කිසි අර්පණාවකට අනුව මෛත්‍රීසහගතචෙතොවිමුක්තිය වඩන මේ යෝගාවචර තෙමේ “සුඛං සුපති” ආදී නයින් කියනලද එකොළොස් ආනිශංසයන් ලබයි.

එහි ‘සුඛං සුපති’ යනු, යම්සේ සෙසු ජනයා ඒ මේ අත පෙරළෙමින්, ගොර ගොර හඬ නංවමින් දුකසේ නිදත්ද, එසේ නොව සුවසේ නිදයි. නින්දට යන්නේද සමවතට සමවන්නකු මෙන් වේ. ‘සුඛං පටිබුජ්ඣති’ යනු, යම්සේ සෙසු ජනයා තතනමින් ඈනුම් හරිමින් පෙරළෙමින් දුකසේ පිබිදෙත්ද, එසේ නොව පියුමක් පුබුදින ලෙසින් විකාර රහිතව සුවසේ පුබුදියි. ‘න පාපකං සුපිනං පස්සති’ සිහින දක්නේද සුබ සිහිනම දකියි, චෛත්‍යයක් වදින්නකු මෙන්ද, පූජා පවත්වන්නකු මෙන්ද, දහම් අසන්නකු මෙන්ද වේ. යම්සේ වනාහි සෙසු ජනයා තමා සොරුන් විසින් වටලන ලද්දකු මෙන්ද, වල් සතුන් විසින් උවදුරු පමුණුවන ලද්දකු මෙන්ද, ප්‍රපාතයෙක්හි වැටෙන්නකු මෙන්ද දකිත්ද, එසේ නපුරු සිහින නොදකී. ‘මනුස්සානං පියො හොති’ යනු, උරතල මත බහනලද මුතුහරක් සෙයින්, සිරසෙහි පැලදි මලක් සෙයින් මනුෂ්‍යයන්හට ප්‍රිය මනාප වේ. ‘අමනුස්සානං පියො’ යනු මනුෂ්‍යයනට මෙන්ම අමනුෂ්‍යයනටද ප්‍රිය වේ, විසාඛ තෙරුන් මෙනි. ඒ තෙරණුවෝ වනාහි පාටලීපුත්‍ර නගරයෙහි වැසි කෙළඹියෙක් වූහ. කෙළඹි තෙමේ එහි වෙසෙනුයේ, “තම්බපණ්ණි ද්වීපය වනාහි චෛත්‍ය පඞ්ක්තියෙන් අලංකෘතය, කාසාව වස්ත්‍රයෙන් බබලන්නේය, එහි කැමැති කැමැති තැනෙක හිඳිනට හෝ වැතිරෙන්නට හෝ හැකිය, ඍතුගුණ පහසුකම්ද, සෙනසුන් පහසුකම්ද, පුද්ගලයන් ඇසුරු කිරීමේ පහසුකම්ද, දහම් ඇසීමේ පහසුකම්ද යන මේ සියල්ල සුලබය”යි ඇසීය. හේ තෙමේ තමා සතු භවභෝගරාශිය අඹුදරුවන්හට පවරාදී ඇදුම් වාටියෙහි තබා මසනලද එක්ම කහවණුවක් අතැතිව ගෙයින් නික්ම නැවක් පැමිණීම බලාපොරොත්තුවෙන් මුහුදුතෙර එක් මාසයක් වාසය කළේය. හේ තෙමේ ව්‍යවහාරයෙහි (වෙළඳමෙහි) දක්ෂවූ හෙයින් එක් ගෙදෙරෙකින් බඩු මිළදී ගෙන තවත් ගෙදෙරකට විකුණමින්

දහැමි වෙළඳමෙන් එම මාසය ඇතුළත කහවණු දහසක් ඉපයීය. ක්‍රමයෙන් මහාවිහාරයට අවුත් පැවිදිබව ඉල්වීය. හේ තෙමේ පැවිදි කරවනු පිණිස සීමාවට පමුණුවනුලද්දේ ඒ දහස් අගනා පියල්ල හිනෙන් ගෙන බිම හෙළීය. 'මේ කිමෙක්ද'යි විමසන ලද්දේ 'ස්වාමීනි, කහවණු දහසෙකැ'යි කියා, "උපාසකය, පැවිදිවූ තැන් පටන් එය පරිහරණය නොහැකිය, දන්ම කළයුත්තක් කරව"යි කියනලද්දේ, "විසාඛයා පැවිදිවන තැනට ආවාහු හිස් අතින් නොයෙත්වා"යි සීමාමාලකයෙහි බෙද විසුරුවා හැර පැවිදිව උපසම්පන්න විය. ඉකුත් පස් වස් ඇතිව උභයමාතිකා ප්‍රගුණකොට පවාරණ කොට තමාහට සප්පායවූ කමටහනක් ගෙන එක් එක් විහාරයෙක්හි සාරමසක් බැගින් සමවත්තවාසය වෙසෙමින් හැසුරුණාහ. මෙසේ හැසිරෙමින්ද,

> වනන්තරෙ ඨිතො ථෙරො විසාඛො ගජ්ජමානකො
> අත්තනො ගුණමෙසනෙතා ඉමමත්ථං අභාසථ:
>
> "යාවතා උපසම්පනෙනා යාවතා ඉධමාගතො
> එත්ථන්තරෙ ඛලිතං නත්ථි අහො ලාභා තෙ මාරිසා"ති.

වනයෙහි සිට විසාඛ තෙරණුවෝ තමාගේ ගුණ සොයමින් (උදන මුඛයෙන්) සිංහ ගර්ජනා කරමින් මේ කාරණය පැවසූහ.

උපසපන්වූ තැන් පටන් මෙතැනට එන තෙක්, මෙදැතුරෙහි මා අතින් සිදුවූ වරදෙක් නැත, නිදුකාණෙනි, තොපට මහත් ලාභයෙකි.

තෙරණුවෝ සිතුල්පවු විහාරයට යන්නාහු තුන්මංසලකට පැමිණ "මේ මග දෝ නැතහොත් ඒ මගදෝ"යි සිතමින් සිටියහ. එවිට පර්වතයෙහි වැසි දේවතාවෙක් අත දිගුකොට තෙරුන්හට "මේ මගය"යි දක්වීය. තෙරණුවෝ සිතුල්පවු වෙහෙරට ගොස් එහි සාර මසක් වැස "අළුයම් වේලාවෙහිදී යන්නෙමි"යි සිතා වැද හොත්තාහ. සක්මන් කෙළවර මණිල රුකෙහි වැසි රුක්දෙවියා පියගැට පෙළ මුදුනෙහි හිඳ හඬන්නට විය. තෙරණුවෝ "මේ කවරෙක්ද"යි කීහ. "ස්වාමීනි මම මණිල රුක්වැසි දෙවියා වෙමි"යි කීය. "කවර කරුණක් නිසා වැලපෙහිද"යි ඇසූහ. "ඔබවහන්සේගේ ගමන නිසාය"යි කීය. "මා මෙහි වසනකල ඔබට වන යහපත කුමක්ද"යි ඇසූහ. "ස්වාමීනි, ඔබවහන්සේ මෙහි වසන කල අමනුෂ්‍යයෝ එකිනෙකාට මෛත්‍රී කර ගනිති, ඔබවහන්සේ ගිය කල්හි කලහ කරගන්නාහුය, නපුරුබස් තෙපලන්නාහුය"යි කීය. තෙරණුවෝ "ඉදින් මා මෙහි වසනකල ඔබට පහසුවිහරණ වන්නේනම් යහපතැ"යි

කියා තවත් සාරමසක් වැස නැවත වෙන'තෙක යන අදහස ඉපැදවූහ. දේවතාවාද පෙර සේම නැවතත් වැලපිණි. මේ උපායෙන්ම තෙරණුවන් රඳවාගතුලැබ එහිම වාසයකොට එහිම පිරිනිවන් පෑහ. මෛත්‍රීවිහරණ ඇති භික්ෂුතෙමේ මෙසේ අමනුෂ්‍යයනට ප්‍රිය වන්නේය.

**දෙවතා රක්ඛන්ති** යනු, මාපියන් දරුවන් රක්නා ලෙසින් දෙවියෝ එවන් යෝගාවචරයන් ආරක්ෂා කෙරෙති. **නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති** යනු, මෛත්‍රීවිහරණ ඇත්තහුගේ කයට, උත්තරා නම් උවැසියට මෙන් ගින්න හෝ, සංයුත්තභාණක චූලසීව නම් තෙරුන්හට මෙන් විස හෝ, සංකිච්ච නම් සාමණේරයන්හට මෙන් ආයුධ හෝ නොවදියි, නොපිවිසෙයි, ඔහුගේ කයට හානි නොපමුණුවන්නේයයි කී-තියායි. මෙහිලා ධේනුවගේ කතාපුවතද කියත්: එක්තරා දෙනක් වසුපැටියාට කිරි දෙමින් සිටියාය, එක්තරා වැද්දෙක් 'ඇයට විදිමි'යි අතින් හරවා දික් දඬු ඇති සැතෙකින් දමා ගැසීය, ඒ සැත දෙනගේ සිරුරෙහි වැදී තල්පතක් මෙන් හැකිළී ගියේය. උපචාර බලයෙකින් නොවේ, අර්පණා බලයෙකින් හෝ නොවේ, හුදෙක් වසු කෙරෙහිවූ බලවත් ඉතසිත්බව හේතුකොටගෙනය. මෙසේ මෛත්‍රී භාවනාව මහානුභාව ඇත්තේය. **තුවටං චිත්තං සමාධියති** යනු, මෛත්‍රී විහරණ ඇත්තහුගේ සිත වහා එකඟ වන්නේය, සිත එකඟවීමෙහි පමා බවෙක් නැත්තේය. **මුඛවණ්ණො විප්පසීදති** යනු, නටුවෙන් ගිලිහුණු තල්ගෙඩියක් සෙයින් මෛත්‍රීවඩන්නහුගේ මුහුණ ප්‍රසන්න වර්ණ ඇත්තේ වෙයි. **අසම්මූළ්හො කාලං කරොති** යනු, මෛත්‍රීවිහරණ ඇත්තහුට සිහිමුළාවෙන් යුත් මරණයක් නම් නැත්තේය, නොමුළාවම නින්දට වදින්නකු සෙයින් කලුරිය කරන්නේය. **උත්තරිං අප්පටිවිජ්ඣන්තො** යනු, මෙත් සමවතින් මතු රහත්බව ප්‍රතිවෙධකරනු නොහැකි වුවහොත් මෙතැනින් චුතව නිඳ පිබිදියකු මෙන් බඹලොව උපදනේය.

**මේ මෛත්‍රී භාවනාවෙහි විස්තර කථායි.**

## කරුණා භාවනාව

කරුණාව වඩනු කැමැත්තහු විසින් කරුණා රහිතබවෙහි ආදීනවද කරුණාවෙහි ආනිසංසද මෙනෙහිකොට කරුණාභාවනාව ඇරඹියයුතුය. එය අරඹන්නහු විසින් පළමුකොට ප්‍රියපුද්ගලාදීන් කෙරෙහි නො-ඇරඹියයුතුය. ප්‍රියපුද්ගලයා ප්‍රිය තන්හිම සිටියි, අතිප්‍රිය සහායකයා අතිප්‍රිය තන්හිම සිටියි. මධ්‍යස්ථයා මධ්‍යස්ථ තන්හිම සිටියි, අප්‍රිය පුද්ගලයා අප්‍රිය තන්හිමද, වෛරීපුද්ගලයා වෛරී ස්ථානයෙහිමද සිටියි. නොසම ලිංග ඇත්තාහුද මළාහුද අක්ෂෙත්‍ර වන්නාහුමය.

"කෙසේනම් භික්ෂු තෙමේ කරුණාසහගත සිතින් එක් දිශාවක් පතුරුවා විහරණය කරන්නේද යම්සේ වනාහි දිළිඳුවූ දුකට පත්වූ කිසියම් පුද්ගලයකු දැක කරුණා උපදවන්නේද, එසේම සියලු සත්වයන් වෙත කරුණාව පතුරුවන්නේය"[1]යි විභංගයෙහි කියනලද හෙයින් සියල්ලට පළමු කරුණා කළයුතුවූ ඉතා දුකට පත්වූ, දිළිඳුවූ, දුර්භගවූ, අත්පා කැඩුණු බිඳුණු, කබල ඉදිරියෙන් තබා අනාථ මඩමෙහි හොත්, අත්පාවලින් වැගිරෙන පණුකැලින් යුත්, දුක්මුසු හඬින් හඬන කිසියම් බැගෑපත් පුරුෂයකු දැක මේ සත්ව තෙමේ ඒකාන්තයෙන් දුෂ්කරත්වයට පත් වූවෙකි. මොහු මේ දුකින් මිදෙන්නේ නම් යෙහෙකැ'යි කරුණාව පැවැත්විය යුතුය. එබන්දකු නොලැබෙතොත් සුවපත්වූ නමුදු පව් කරන පුද්ගලයකු වධයට ගොදුරු වූවකු සේ සලකා කරුණාව පැතිරවිය යුතුය.

කෙසේද? යම්සේ බඩුත් සමග අල්වා ගන්නාලද සොරකු 'මොහුට වධ කරවූ'යයි රජු විසින් අණ කරනලද රාජපුරුෂයෝ සතර මං සන්ධියක් පාසා පහර සියගණන් දෙවමින් වධස්ථානයට ගෙනයත්ද, එවිට මිනිස්සු ඔහුට කෑයුතු බිදියයුතු දෙයද, මල් ගඳවිලවුන්ද බුලත්ද දෙන්නාහුද, ඒ පුරුෂයාද ඒවා කමින් බුදිමින් භෝගයෙන් අනූන සුවපත් පුද්ගලයකු සෙයින් යන්නේ නමුදු, "මොහු මහාභෝගඇති සුවපත් වූවෙකි"යි කිසිවෙක් නොහඟියි, "ඒකාන්තයෙන් අභාග්‍යසම්පන්නවූ මේ තෙමේ දැන් මරණයට පත් වන්නේය, මේ තෙමේ යම් පියවරක් තබන්නේ නම් ඒ පියවරින් මරණය කරාම ළං වන්නේය"යි ජනයා ඔහු කෙරෙහි අනුකම්පා කෙරෙත්ද, එසේම කරුණා කර්මස්ථානයෙහි යෙදුණු භික්ෂුව විසින් සුඛිතවූද ඒ (පාපකාරී) පුද්ගලයා කෙරෙහි මේ ආකාරයෙන් කරුණාව පැතිරවිය යුතුය: "මේ අසරණයා දැන් මෙසේ සුවපත්ව, මනාකොට සැරසී භෝගයන් වළඳන්නේ නමුදු, තුන් දෙරින් එක් දෙරෙකින් හෝ කළ සත් ක්‍රියාවක් නැති හෙයින් දැන් දැන් අපායෙහි දැඩි දුක් දෙම්නස් විඳින්නේය"යි මෙසේ ඒ (පාපකාරී) පුද්ගලයා කෙරෙහි කරුණාව පතුරුවා, ඉක්බිති එම නියායෙන්ම ප්‍රිය පුද්ගලයා කෙරෙහිද, ඉක්බිති මධ්‍යස්ථයා කෙරෙහිද ඉන් ඉක්බිති වෛරී පුද්ගලයා කෙරෙහිද අනුක්‍රමයෙන් කරුණාව පැවැත්විය යුතුය. ඉදින් ඉහත (මෙත්තා භාවනාවෙහි) කී-ලෙසින් වෛරී පුද්ගලයා කෙරෙහි ද්වේෂය උපදී නම්, එය එම මෙත්තා භාවනාවෙහි කී ලෙසින්ම සන්සිඳුවිය යුතුය. මෙහි කරනලද කුසල් ඇත්තකු නම්, ඥාතිව්‍යසන, රෝගව්‍යසන, භොගව්‍යසන ආදිය අතුරෙන් කිසියම්

(1) Vbh 273

ව්‍යසනයෙකින් ඔහු විපතට පත්වූ විටෙක, දැක හෝ අසා හෝ, එබඳු ව්‍යසනයක් දකින්නට අසන්නට නැතිවිට, සංසාර දුක් නොඉක්මවූ හෙයින්, "මේ තෙමේ දුක්පත් වූයේම"යයි මෙසේ සියලු ආකාරයෙන් කරුණා පතුරුවා, ඉහත කී-නයින්ම තමා කෙරෙහිද, ප්‍රිය පුද්ගලයා කෙරෙහිද, මධ්‍යස්ථයා කෙරෙහිද, වෛරී පුද්ගලයා කෙරෙහිදැ'යි මේ සිවු දෙනා කෙරෙහි සීමාසම්භෙද කොට (සමසිත් ඇත්තෙක්ව) එම සමථනිමිත්තය සෙවුමින්, වඩමින්, පුරුදු කෙරෙමින් මෛත්‍රී භාවනාවෙහි කී-නයින්ම ත්‍රික චතුෂ්ක ධ්‍යාන වශයෙන් අර්පණා වැඩියයුතුය.

අඞ්ගුත්තර අටුවාවෙහි වනාහි 'පළමුකොට වෛරී පුද්ගලයා කෙරෙහි කරුණා පැවැත්විය යුතුය, ඔහු කෙරෙහි සිත මොලොක් කොට, ඉන් අනතුරුව දුර්ගත පුරුෂයා කෙරෙහිද, ඉන් ඉක්බිති ප්‍රිය පුද්ගලයා කෙරෙහිද, ඉන් ඉක්බිති තමා කෙරෙහිදැ'යි යන මේ ක්‍රමය කියනලදි. එම ක්‍රමය "දුග්ගතං දුරුපෙතං" යන පෙළ හා සමග නොසැසඳෙයි. එහෙයින් මෙහි කියනලද නයින්ම භාවනාව අරඹා සීමාසම්භෙදකොට අර්පණා වැඩියයුතුය. ඉක්බිති පස් ආකාරයෙන් අනවධි වශයෙන් පැතිරවීමද, සත් ආකාරයෙන් අවධිවශයෙන් පැතිරවීමද, දශ ආකාරයෙන් දිශා අනුව පැතිරවීමදැයි යන මේ විකුබ්බනාව (ඔධිසො අනොධිසො ඵරණය හෙවත් අවධි වශයෙන් හා අනවධි වශයෙන් පැතිරවීම) ද, "සුඛං සුපති" යන ආදී ආනිසංසද මෛත්‍රී භාවනා විෂයෙහි කී-නයින්ම දත යුතුය.

**මේ කරුණා භාවනාව පිළිබඳ විස්තර කථායි.**

## මුදිතා භාවනාව

මුදිතා භාවනාව අරඹන්නහු විසින්ද පළමුකොට ප්‍රියපුද්ගලාදීන් වෙත නොඇරඹිය යුතුය. ප්‍රියපුද්ගලයා ප්‍රියවූ පමණෙකින්ම මුදිතාවට ආසන්න කාරණ නොවේ, මධ්‍යස්ථ හා වෛරී පුද්ගලයෝ කැලම නොවෙති, අසමලිංගිකයෝද මළගියාහුද අවිෂය වූවෝමය. ඉතාප්‍රිය සහායකයා වනාහි මුදිතාවට පදට්ඨාන හෙවත් ආසන්න කාරණ වන්නේය. යම් සහායකයෙක් 'සොණ්ඩසහාය' යනුවෙන් අටුවායෙහි කියනලද්දේද, හේ තෙමේ වනාහි අතිශයින්ම මුදිත වූවෙකි. පළමුකොට සිනාසී පසුව කතාකරයි, එහෙයින් පළමුකොට එවන් සහායකයකු වෙත මුදිතාව පැතිරවිය යුතුය. නැතහොත් සුඛිතවූ, ප්‍රමුදිතවූ, ප්‍රීතිමත්වූ ප්‍රියපුද්ගලයකු දැක හෝ අසා හෝ, "මේ සත්ව තෙමේ ඒකාන්තයෙන් මුදිතවූයේ වේ, අහෝ මැනවි, අහෝ යෙහෙකි"යි මුදිතාචිත්තය ඉපැදවිය

යුතුය. මෙම අර්ථයම සලකා විභඞ්ගයෙහි, “භික්ෂු තෙමේ මුදිතාසහගත සිතින් එක් දිශාවක් පතුරුවා විහරණය කරනුයේ කෙසේද? යම්සේ වනාහි ප්‍රියමනාපවූ එක්තරා පුද්ගලයකු දැක මුදිත වන්නේද, එසේම සියලු සත්වයන් කෙරෙහි මුදිතාචිත්තය පතුරුවන්නේය”යි[(1)] කියන ලදි.

ඉදින් ඒ සොණ්ඩසහායකයා නැතහොත් ප්‍රියපුද්ගලයා අතීතයෙහි සුඛිතවූයේද, එහෙත් දැනට දිළිඳුවූයේ, දුශ්චරිතයෙන් යුක්තවූයේ වේද, එවිට ඔහුගේ අතීතවූ සුඛිතභාවයම සිහිකොට, “මේ තෙමේ අතීතයෙහි මෙවත් මහාභෝග ඇත්තේ, මහපිරිවර ඇත්තේ නිරන්තරයෙන් ප්‍රමුදිතවූයේය”යි ඔහුගේ ඒ අතීත මුදිතාකාරයම ගෙන මුදිතාචිත්තය ඉපැදවියයුතුය. “අනාගතයෙහි හෝ නැවත එවන් සම්පත් ලැබ ඇතු පිටින්, අසු පිටින්, රන් දෝලාවෙන් හැසිරෙන්නේය”යි ඔහුගේ අනාගතය මුදිතාකාරයෙන් ගෙන මුදිතාචිත්තය ඉපැදවියයුතුය. මෙසේ ප්‍රියපුද්ගලයා කෙරෙහි මුදිතාව උපදවා ඉක්බිති මධ්‍යස්ථයා කෙරෙහිද, ඉන් පසු වෛරී පුද්ගලයා කෙරෙහිද අනුපිළිවෙළින් මුදිතාචිත්තය පැවැත්විය යුතුය, අර්පණා වැඩියයුතුය.

ඉදින් යටකියනලද නයින් වෛරී පුද්ගලයා කෙරෙහි ද්වේෂය උපදී නම්, යට මෛත්‍රීභාවනා විෂයෙහි කී-නයින්ම සන්සිඳුවා, මෙකී (ප්‍රිය, මධ්‍යස්ථ, වෛරී යන) තිදෙනා කෙරෙහිද තමා කෙරෙහිදැ'යි යන සිවු දෙනා කෙරෙහිම සමසිත් ඇති සීමාසම්භෙදය කොට, එම සමථනිමිත්ත සෙවුමින්, වඩමින්. පුරුදු පුහුණු කරමින් මෛත්‍රී භාවනා විෂයෙහි කියනලද නයින් ත්‍රිකධ්‍යාන චතුෂ්කධ්‍යාන වශයෙන් අර්පණා වැඩිය යුතුය. ඉන් අනතුරුව පස් ආකාරයෙන් අනවධි වශයෙන් පැතිරවීමද, සත් ආකාරයෙන් අවධිවශයෙන් පැතිරවීමද, දශ ආකාරයෙන් දිශා අනුව පැතිරවීමදැ'යි යන මේ විකුබ්බනය සමෘද්ධ වේ. **සුඛං සුපති** යන ආදී ආනිසංසද මෛත්‍රී විෂයෙහි කී-නයින්ම සිද්ධවෙතැ'යි දතයුතුය.

**මේ මුදිතාභාවනාව පිළිබඳ විස්තර කථායි.**

## උපෙක්ෂා භාවනාව

උපෙක්ෂාභාවනාව අරඹනු කැමැති යෝගාවචරයා විසින් වනාහි මෛත්‍රී විහරණ ආදියෙහිදී ලබාගන්නාලද ත්‍රික චතුෂ්ක ධ්‍යානයනට අනුව ප්‍රගුණ කරනලද තෘතීයධ්‍යානයෙන් නැඟී, ‘සුඛිතා හොන්තු’ යන ආදී වශයෙන් සත්වයන් කෙරෙහි ඇලීම් වශයෙන් පවත්වනලද මනස්කාර

(1) Vbh 274

ඇති හෙයින්ද, දොම්නස හා ඇල්ම යන දෙකට (කරුණාව දෙම්නසටද මෛත්‍රී මුදිතා යන දෙක සොම්නසටද) සමීපව පවත්නා හෙයින්ද, සොම්නස හා සමග යෙදීමෙන් ඖළාරික වනහෙයින්ද පළමු (මෛත්‍රී, කරුණා, මුදිතා යන) විහරණ තුනෙහි ආදීනවද, ශාන්තභාව වශයෙන් උපෙක්‍ෂාවිහරණයෙහි ආනිසංසද දැක, යම් පුද්ගලයෙක් ප්‍රකෘතියෙන් මධ්‍යස්ථ ස්වභාව ඇත්තේද, එවන් පුද්ගලයකු කෙරෙහි නිරතුරුව අවධානය යොමු කරමින් උපෙක්‍ෂාචිත්තය ඉපැදවියයුතුය. ඉක්බිති ප්‍රිය පුද්ගලාදීන් කෙරෙහි (උපෙක්‍ෂාචිත්තය) යොමු කළයුතුය. කියනලද මැයි: "භික්‍ෂු තෙමේ උපේක්‍ෂා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා විහරණය කරනුයේ කෙසේද? යම්සේ වනාහි මනාපද නොවූ අමනාපද නොවූ එක්තරා පුද්ගලකු දැක උපෙක්‍ෂා සහිත (මධ්‍යස්ථ) වන්නේද, එසේම සියලු සත්‍වයන් කෙරෙහි උපෙක්‍ෂාව පතුරුවයි."[1] එහෙයින් කියනලද නයින් මධ්‍යස්ථ පුද්ගලයකු කෙරෙහි උපෙක්‍ෂාව උපදවා, ඉක්බිති ප්‍රිය පුද්ගලයා කෙරෙහිද, ඉන් අනතුරුව සොණ්ඩ සහායකයා කෙරෙහිද, ඉන් අනතුරුව වෛරී පුද්ගලයා කෙරෙහිද'යි මෙසේ මෙකී තිදෙනා කෙරෙහිද, තමා කෙරෙහිද, යන සෑම දෙනා කෙරෙහි මධ්‍යස්ථ වශයෙන් සීමාසම්භෙදය කොට, එම සමථනිමිත්ත සේවනය කළයුතුය, වැඩියයුතුය. පුරුදු පුහුණු කළයුතුය. මෙසේ විහරණය කරනවිට පඨවිකසිණයෙහිදී කියනලද නයින්ම චතුර්ත්‍ථධ්‍යානය උපදී. මෙම චතුර්ත්‍ථධ්‍යානය පඨවිකසිණ ආදියෙහි උපන් තෘතීයධ්‍යාන ඇත්තහුට උපදීද? නො-උපදියි. කවර හෙයින්ද යත්: අරමුණු විසදෘශ වනහෙයිනි. මෛත්‍රී ආදී බඹවිහරණ විෂයෙහි උපන් තෘතීයධ්‍යාන ඇත්තහුටම මෙකී (උපෙක්‍ෂාවිහරණයෙන් උපදින) චතුර්ත්‍ථධ්‍යානය උපදියි; අරමුණු සමානවන හෙයිනි. ඉක්බිති (පංචාකාර, සප්තාකාර, දශාකාර) විකුබ්බනාදී ආනිසංස ප්‍රතිලාභයන්ද මෛත්‍රී භාවනාවෙහිදී කී-නයින්ම දතයුතුය.

**මේ උපෙක්‍ෂාභාවනාව පිළිබඳ විස්තර කථායි.**

බ්‍රහ්මුත්තමෙන කථිතෙ බ්‍රහමවිහාරෙ ඉමෙ ඉති විදිත්වා
භියෙ‍යා එතෙසු අයං පකිණ්ණකකථා පි විඤ්ඤෙයා‍යා.

බ්‍රහ්මෝත්තමවූ තථාගතයන් වහන්සේ විසින් කියනලද මේ බ්‍රහ්මවිහාරයන් මෙසේ දැන, යළිදු මේ බ්‍රහ්මවිහාරයන් පිළිබඳ මේ ප්‍රකීර්ණකකථාද දතයුතුය.

(1) විභංග - Vbh 275

මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන බ්‍රහ්මවිහාරයන් අතුරෙන්, අරුත් වශයෙන්, ස්නේහ කෙරෙති'යි යන අරුතින් මෙත්තා නම්, සත්‍වයන් කෙරෙහි හිත පතුරුවති'යි යන අර්ථයි. 'මිත්‍රයා කෙරෙහි වූයේ', නැත හොත් 'මේ මිත්‍රයාගේ ස්වභායයි' යන අරුතින් හෝ **මෙත්තා** නම්. අනුන්ගේ දුකෙහිදී සද්ජනයන්ගේ හෘදය කම්පනය කෙරෙති'යි **කරුණා** නම්, අනුන්ගේ දුක් නසති'යි, පහ කෙරෙති'යි හෝ කරුණා නම්, නොහොත් දුකට පත්වූවන් කෙරෙහි පැතිරවීම් වශයෙන් පවත්වනු ලැබෙති'යි කරුණා නම්. එය (මුදිතාගුණය) හේතුකොටගෙන එම ගුණයෙන් සමන්විත පුද්ගලයෝ සතුටුවෙති'යි හෝ, තමාම සතුටුවෙති'යි හෝ, හුදෙක් මෝදනයට පත්වීම හෝ **මුදිතා** නම්. 'වෛර නැත්තෝ වෙත්වා' යන ආදී ව්‍යාපාරයන් පහවීමෙන්ද, මධ්‍යස්ථභාවයට පැමිණීමෙන්ද උපෙක්‍ෂා කෙරෙති'යි **උපෙක්ඛා** නම්. ලක්‍ෂණාදී වශයෙන් වනාහි මෙහි මෙත්තාගුණය හිතවත් ආකාරයෙන් පැවැතීම ලක්‍ෂණකොට ඇත්තේය, (සත්‍වයන් වෙත) හිතවත්බව පැවැත්වීම කෘත්‍යකොට ඇත්තේය, ආඝාතය හෙවත් වෛරය දුරුකිරීම වැටහීම්කොට ඇත්තේය, සත්‍වයන්ගේ මනාපබව දැකීම ආසන්නකාරණකොට ඇත්තේය. ව්‍යාපාදය ශමනයවීම මෙහි සම්පත්තියයි, තෘෂ්ණා ස්නේහයේ උපත මෙහි විපත්තියයි. කරුණාව දුක් ඉවත්කිරීම් ආකාරයෙන් පැවැතීම ලක්‍ෂණකොට ඇත්තේය, අනුන්ගේ දුක් නො-ඉවසීම කෘත්‍යයකොට ඇත්තේය, අවිහිංසාව වැටහීම්කොට ඇත්තේය, දුකින් පීඩිත වූවන්ගේ අසරණබව දැක්ම ආසන්නකාරණ කොට ඇත්තේය, හිංසාව දුරුවීම එහි සම්පත්තියයි, ශෝකය ඉපදීම එහි විපත්තියයි. මුදිතාගුණය ප්‍රමෝදයට පත්වීම ලක්‍ෂණකොට ඇත්තේය, ඊර්ෂ්‍යා නොකිරීම කෘත්‍යයකොට ඇත්තේය, අරතිය නැසීම වැටහීම්කොට ඇත්තේය, සත්‍වයන්ගේ සම්පත් දැකීම ආසන්නකාරණකොට ඇත්තේය, අරතිය (කුසල්හි නොඇලීම) සන්සිඳුවීම එහි සම්පත්තියයි, ප්‍රහාසය (ගේහසිතප්‍රීතිය) හටගැනීම විපත්තියයි. උපෙක්ඛාගුණය සත්‍වයන් වෙත මධ්‍යස්ථාකාරයෙන් පැවැත්ම ලක්‍ෂණකොට ඇත්තේය, සත්‍වයන් කෙරෙහි සමබැව් දැක්ම කෘත්‍යයකොට ඇත්තේය, ද්වේෂය හා ඇල්ම සන්සිඳුවීම වැටහීම්කොට ඇත්තේය. 'සත්‍වයෝ කර්මය උරුමයකොට ඇත්තාහුය, ඔවුහු අන් කවරකුගේ රුචියට අනුව සුඛිත වන්නාහුද? දුකින් මිදෙන්නාහුද? ලද සැපතින් නොපිරිහෙන්නාහුද'යි මෙසේ පවත්නා කර්මස්වකතාව දැකීම ආසන්නකාරණකොට ඇත්තේය, ද්වේෂය හා ඇල්ම දුරුවීම එහි සම්පත්තියයි, ගේහසිතවූ අඥාන උපෙක්‍ෂාවෙහි උපත එහි විපත්තියයි.

මෙම බ්‍රහ්මවිහාර සතරටම විදර්ශනාසුඛයද භවසම්පත්තියද පොදු ප්‍රයෝජන වේ. ව්‍යාපාදදිය නැසීම ආවේණික ප්‍රයෝජන වේ. මෙහි

මෙත්තාගුණය ව්‍යාපාදය නැසීම ප්‍රයෝජනකොට ඇත්තේය, කරුණාදී සෙසු විහාර තුන පිළිවෙළින් හිංසාව, අරතිය හා රාගය නැසීම ප්‍රයෝජනකොට ඇත්තේය. කියන ලදමැයි: "ඇවැත්නි, යම් මේ මෙත්තා චෙතොවිමුත්තියක් වේද, එය ව්‍යාපාදයට ප්‍රහාණ වන්නේය, යම් මේ කරුණා චෙතොවිමුත්තියක් වේද, එය විහිංසාවට ප්‍රහාණ වන්නේය, යම් මේ මුදිතා චෙතොවිමුත්තියක් වේද, එය අරතියට ප්‍රහාණ වන්නේය, ඇවැත්නි, යම් මේ උපෙක්ඛා චෙතොවිමුත්තියක් වේද, එය රාගයට ප්‍රහාණ වන්නේය"(1) යනුයි.

මෙහි එක් එක් බඹ විහරණයට ආසන්න දූර වශයෙන් ප්‍රතිපක්ෂ ධර්මයෝ දෙදෙනෙක් බැගින් වෙති, මෙත්තා බඹවිහරණයට, ගුණලක්ෂණයෙන් සමානවන හෙයින් රාගය, පුරුෂයකුගේ සමීපයෙහි හැසිරෙන සතුරකු මෙන්, ආසන්න ප්‍රතිපක්ෂ වේ. එ රාගය තෙමේ වහා අවකාශ ලබයි, එහෙයින් ඒ රාග නමැති ප්‍රතිපක්ෂයාගෙන් මෛත්‍රිය රැක ගතයුතුය. ස්වභාවයෙන්ම විපරීත ස්වරූප ඇති හෙයින් ව්‍යාපාදය තෙමේ, පර්වතාදී දුර්ගයන් ඇසුරු කළ සතුරකු සෙයින් දූරප්‍රතිපක්ෂ වේ. එහෙයින් (එම සතුරා පහසුවෙන් හඳුනාගතහැකි හෙයින්) නිර්භයව මෛත්‍රී වැඩියයුතුය. මෛත්‍රී වඩන්නේය, කෝපද කරන්නේය යන මෙය විය නොහැකිය. කරුණා බඹවිහරණයට "චක්ෂුර් විඥනයෙන් දතයුතුවූ, ප්‍රියවූ, කමනීයවූ, මනාපවූ, මනරම්වූ තෘෂ්ණාසන්නිශ්‍රිතවූ රූපයන් නොලැබීම නොලැබීම් වශයෙන් අනුස්මරණය කරන්නහුට හෝ පෙර ලදවිරූ (දැනට) ඉකුත්වූ, නිරුද්ධවූ, වෙනස් ස්වභාවයට පත්වූ රූපයන් සිහිකරන්නහුට හෝ දෙම්නස උපදී. මේ ආකාරවූ යම් දෙම්නසෙක් වේද, එය ගේහසිත දෙම්නසයයි කියනු ලැබේ"(2) යන මේ ආදී වශයෙන් ආ ගේහසිත දෙම්නස විපත්තිලක්ෂණ වශයෙන් සමානවන හෙයින් (කරුණා විහරණයට) ආසන්නප්‍රතිපක්ෂ වේ. ස්වභාව වශයෙන්ම විසදෘශවන හෙයින් විහිංසාව දූරප්‍රතිපක්ෂ වේ. එහෙයින් නොබියව ඒ විහිංසාව කෙරෙන් දුරුව කරුණාව වැඩියයුතුය. කරුණා වඩන්නේය, හස්තාදී අවයවයෙන් වෙහෙස කරන්නේය යන මෙය සිදුනොවිය හැකිය.

මුදිතා බඹවිහරණයට, "ඇසින් දතයුතුවූ ප්‍රියවූ, කමනීයවූ, මනාපවූ, මනරම්වූ ලෝකාමිසසංයුක්ත (තෘෂ්ණා සන්නිශ්‍රිත)වූ රූපයන් ලැබීම ප්‍රතිලාභ වශයෙන් සිහි කරන්නහුට හෝ, පෙර ලදවිරූ (දැනට) අතීතවූ, නිරුද්ධවූ, වෙනස්බවට පත්වූ රූපයන් සිහි කරන්නහුට හෝ යම්

(1) දී. නි. සංගීති සු. - D iii 248 f
(2) ම. නි. සළායතනවිභංග සු. - M iii 218

සොම්නසෙක් උපදීද, එය ගේහසිත සොම්නසයයි කියනු ලැබේ"[1] යන මේ ආදී වශයෙන් ආ ගේහසිත සොම්නස සම්පත්ති දර්ශන සමතාව හේතුකොටගෙන ආසන්නප්‍රතිපක්ෂවේ. ස්වභාව වශයෙන් නොසමතාව හේතුකොටගෙන අරතිය දූරප්‍රතිපක්ෂ වේ. එහෙයින් ඒ අරතියෙන් බිය නැතිව මුදිතාව වැඩියයුතුය. ප්‍රමුදිත වන්නේය, පන්ත (ප්‍රාන්ත) සේනාසන කෙරෙහිද, අධිකුශලයන්හිද උකටලීද වන්නේය යන මෙය සිදුවිය නොහැකිය.

උපෙක්ඛා බඹවිහරණයට වනාහි, "ඇසින් රූපයක් දැක අඥනවූ මුළාවූ පෘථග්ජනවූ, ක්ලේශාවධීන් ජයනොගත්, විපාකසන්තතිය ජයනොගත්, ආදීනව නොදක්නාසුලු, අශ්‍රුතවත් පෘථග්ජනයාහට මෙබඳුවූ යම් උපෙක්ෂාවක් වේද, ඒ උපෙක්ෂාව රූපය නොඉක්මවයි, එහෙයින් එම උපෙක්ෂාව ගේහසිත උපෙක්ෂායයි කියනු ලැබේ"[2] යනාදී නයින් ආ ගේහසිතවූ අඥනොපෙක්ෂාව දෙස-ගුණ-අවිචාර වශයෙන් උපෙක්ෂාව හා සමානවන හෙයින් ආසන්න පච්චත්ථික වේ. ස්වභාව වශයෙන් අසමානවන හෙයින් රාග ද්වේෂයෝ දූරපච්චත්ථික වෙති. එහෙයින් එම දූරප්‍රතිපක්ෂයන්ගෙන් බියක් නැතිව උපෙක්ෂා වැඩියයුතුය. උපෙක්ෂා වඩන්නේය, ආලයද, ද්වේෂද කරන්නේය යන මෙය සිදුවිය නොහැකිය. මේ සියලු බ්‍රහ්මවිහාරයනට කත්තුකම්‍යතා (කරනු කැමතිබැව් ඇති) ඡන්දය ආරම්භයයි, නීවරණාදිය යටපත් කිරීම මධ්‍යයයි, අර්පණාව අවසානයයි. ප්‍රඥප්තිධර්ම වශයෙන් එක් සත්වයෙක් හෝ බොහෝ සත්වයෝ හෝ අරමුණු වෙති. උපචාරක්ෂණයෙහි හෝ අර්පණාවට පැමිණිවිට හෝ අරමුණ වැඩීම සිදුවේ.

එහි වඩනා ක්‍රමය මෙසේය: යම්සේ දක්ෂවූ ගොවියෙක් සීසෑයුතු තැන් පිරිසිඳ සීසායිද, එසේම පළමුකොට එක් ආවාසයක් පිරිසිඳගෙන එහි නිවැසි සත්වයන් වෙත 'මේ ආවාසයෙහි සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා' යන ආදී නයින් මෛත්‍රී වැඩියයුතුය. එම අරමුණෙහි සිත මෘදු කොට කර්මණ්‍යකොට ආවාස දෙකක් පිරිසිඳ ගතයුතුය; ඉක්බිති අනුක්‍රමයෙන් ආවාස තුනක්, සතරක්, පසක්, සයක්, සතක්, අටක්, නවයක්, දහයක්, එක් වීථියක්, ගම් අඩක් මුළු ගමක්, දනව්වක්, රාජ්‍යයක්, එක් දිශාවක්දයි මෙසේ එක් සක්වළක් දක්වා, නැතහොත් එයටත් වඩා වැඩි තන්හි සත්වයන් කෙරෙහි මෛත්‍රී වැඩියයුතුය. කරුණාදී සෙසු විහාරයෝද එසේමය. මේ මෙහි අරමුණු වඩනා ක්‍රමයයි.

---

(1) එම - M iii 217

(2) එම - M iii 219

යම්සේ වනාහි කසිණයන්ගේ අග්‍රඵලය අරූපධ්‍යානයෝ වෙත්ද සමාධීන්ගේ අග්‍රඵලය නෙවසඤ්ඤානාසඤ්ඤායතනය වේද, විදර්ශනාවෙහි අග්‍රඵලය ඵලසමාපත්ති වේද, සමථවිපස්සනා දෙක්හි අග්‍රඵලය නිරොධ සමාපත්තිය වේද, එසේම ප්‍රථම බ්‍රහ්මවිහාර තුනෙහි අග්‍රඵලය මෙහි උපෙක්ඛා බ්‍රහ්මවිහාරය වේ. යම්සේ වනාහි ටැම් නොසිටුවා යටලී මුලු පරාල නොනඟා කැණිමඬල හා ගොනැයි (පරාල) අහසෙහි පිහිටුවිය නොහැකි වේද, එසේම පළමු බ්‍රහ්මවිහාරයන්හි තෘතීය ධ්‍යානය නැතිව චතුර්ථධ්‍යානය වැඩිය නොහැකිය. මෙහිලා මෙවන් විතර්කයක් ඇතිවිය හැකිය: කවර හෙයින් මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන මොහු බ්‍රහ්මවිහාරයයි කියනු ලබත්ද? කවර හෙයින් සතරක්ම වේද? මොවුන්ගේ ක්‍රමය කවරේද? අභිධර්මයෙහි කවර හෙයින් 'අප්පමඤ්ඤ'යයි කියන ලද්දහුද? (පරිහාර) කියනු ලැබේ: ශ්‍රේෂ්ඨය යන අර්ථයෙන්ද, නිර්දෝෂ බැවින්ද මෙහි බ්‍රහ්මවිහාර වනබව දතයුතුය. සත්වයන් කෙරෙහි මනාවූ පරහිත ප්‍රතිපත්ති වනහෙයින් මෙම විහාරයෝ ශ්‍රේෂ්ඨ වන්නාහ. යම්සේ බ්‍රහ්මයෝ නිදොස් සිත් ඇතිව වාසය කෙරෙත්ද, එසේම මෙම විහාරයන්ගෙන් යුක්තවූ යෝගීහු බ්‍රහ්මයන් හා සමානව වෙසෙති'යි ශ්‍රේෂ්ඨාර්ථයෙන්ද, නිදොස් බැවින්ද බ්‍රහ්මවිහාරයයි කියනු ලැබෙත්, කවර හෙයින් සතරෙක්ම වේද යන ආදී ප්‍රශ්නයට පිළිතුරු මෙසේය:

විසුද්ධිමග්ගාදිවසා චතසෙසා
හිතාදි-ආකාරවසා පනාසං
කමො පවත්තන්ති ච අප්පමාණෙ
තා ගොචරෙ යෙන තදප්පමඤ්ඤා.

විශුද්ධිමාර්ග ආදී වශයෙන් (මෙත්තා කරුණා ආදිය ව්‍යාපාද විහිංසා ආදියට විශුද්ධිමාර්ග වනහෙයින්) බ්‍රහ්මවිහාර සතරෙක් වෙති, හිතසිත් ආදිය පැතිරවීම් වශයෙන් මොවුන්ගේ ක්‍රමය වේ, ඒ බ්‍රහ්මවිහාරයෝ යම් හෙයකින් අප්‍රමාණ විෂයෙක්හි පැතිර පවතිත්ද, එහෙයින් 'අප්පමඤ්ඤ' නම් වෙති.

මේ බ්‍රහ්මවිහාරයන් අතුරෙන් මෙත්තාවිහාරය යම්හෙයකින් ව්‍යාපාදබහුලයාහටද කරුණාව විහිංසාබහුලයාහටද මුදිතාව අරතිබහුලයාහටද, උපෙක්ඛාව රාගබහුලයාහටද විශුද්ධිමාර්ග වේද, එසේම හිත පැතිරවීම, අහිත දුරුකිරීම, සැපතෙහි සතුටුවීම, පක්ෂපාතබව නොවැළඳගැනීම ආදී වශයෙන් සත්වයන් කෙරෙහිවූ මනස්කාරය චතුර්විධ වේ. යම්හෙයකින්, යම්සේ මවක් තොමෝ ළදරු පුතුය, ගිලන් පුතුය,

යොවුන් පුතුය, සිය කටයුතුවල යෙදුණු පුතුය යන පුතුන් සිවු දෙනා අතුරෙන් ළදරු පුතුගේ අභිවෘද්ධිය කැමැති වන්නීද, ගිලන් වූවහුගේ ගිලන්බව පහවීම කැමැති වන්නීද, යොවුන්බවට පත්වූවහුගේ යොවුන්බව බොහෝකල් පැවතීම කැමැති වන්නීද, තම කාර්යයන්හි නිරතවූවහු කෙරෙහි මෙකී කවර ලෙසකින් හෝ ව්‍යාවෘත නොවන්නීද, එසේම අප්පමඤ්ඤබ්‍රහ්මවිහාර ඇත්තහු විසින් සියලු සත්වයා කෙරෙහි මෙත්තාවිහාර ආදී වශයෙන් පැවැතියයුතුය. එහෙයින් මේ විශුද්ධිමාර්ග ආදී වශයෙන් අප්‍රමෙයවූ බ්‍රහ්මවිහාර සතරෙක්ම වේ. යම් හෙයකින් වනාහි මේ සතරම වඩනු කැමැත්තහු විසින් පළමුකොට හිතවත් ආකාරය පැවැත්වීම් වශයෙන් සත්වයන් කෙරෙහි පිළිපැදිය යුතුවේද, එහෙයින් මෛත්‍රිය හිතවත් ආකාරයෙන් පැවැතීම ලක්ෂණකොට ඇත්තේය. ඉක්බිති මෙසේ සුව පතනලද සත්වයන් දුකින් පීඩිතවීම දැක හෝ අසා හෝ කල්පනාකොට හෝ දුක් පහවීම කැමැතිවීම් ආකාර ඇති පැවතුම වශයෙන් කරුණාව දුක් පහවීම කැමැතිවන ආකාර ඇති පැවතිම ලක්ෂණකොට ඇත්තේය. ඉක්බිති, මෙසේ සුව පතනලද, දුක් පහවීමද පතනලද, සත්වයන් සැපතට පත්වනු දැක එම සැපතෙහි සතුටුවීම් වශයෙන් මුදිතාව ප්‍රමෝදවීම ලක්ෂණකොට ඇත්තේය. ඉන් ඉක්බිති කළයුතු දෙයක් නොමැති හෙයින් අජ්ඣුපෙක්ඛනයයි කියනුලබන මධ්‍යස්ථාකාරයෙන් පිළිපැදියයුතු උපෙක්ෂාව මධ්‍යස්ථාකාර පැවැත්ම ලක්ෂණකොට ඇත්තේය. එහෙයින් හිතාදී ආකාරවශයෙන් පළමුකොට මේ මෙත්තාවිහරණය කියනලදී. ඉක්බිති කරුණා, මුදිතා, උපෙක්ඛා යන මේ ක්‍රමය දතයුතුය.

යම් හෙයකින් මේ සියලු බ්‍රහ්මවිහාරයෝ ප්‍රමාණරහිත විෂයයෙක්හි පවතිත්ද, මේ බ්‍රහ්මවිහාරයනට ගෝචරවූ සත්වයෝ පමණකළ නොහැක්කාහුද, එක් සත්වයකු කෙරෙහි වුවද මෙපමණ පෙදෙසෙක්හි මෙත්තා ආදී විහරණයන් වැඩියයුතුයයි මෙසේ ප්‍රමාණයක් නොගෙන සියල්ලන් වෙත පැතිරවීම් වශයෙන් පැවැත්තාහුද, එහෙයින් කියන ලදිඃ-

විසුද්ධිමග්ගාදිවසා චතස්සො
හිතාදි-ආකාරවසා පනාසං
කමො පවත්තන්ති ච අප්පමාණෙ
තා ගොචරෙ යෙන තදප්පමඤ්ඤා'ති.

විශුද්ධිමාර්ග ආදී වශයෙන් (මෙත්තා කරුණා ආදිය ව්‍යාපාද විහිංසා ආදියට විශුද්ධිමාර්ග වනහෙයින්) බ්‍රහ්මවිහාර සතරෙක්

වෙති, හිතසිත් ආදිය පැතිරවීම් වශයෙන් මොවුන්ගේ ක්‍රමය වේ, ඒ බ්‍රහ්මවිහාරයෝ යම් හෙයකින් අප්‍රමාණ විෂයෙක්හි පැතිර පවතිත්ද, එහෙයින් 'අප්පමඤ්ඤ' නම් වෙති.

මෙසේ අප්‍රමාණ ගෝචර ඇතිහෙයින් සමාන ලක්‍ෂණ ඇති මේ බ්‍රහ්මවිහාරයන් අතුරෙන් මෙත්තා, කරුණා, මුදිතා යන පළමු තුන ත්‍රික-චතුෂ්ක-ධ්‍යානික (චතුෂ්ක - පංචක ධ්‍යාන ක්‍රම වශයෙන් පිළිවෙළින් තුන්වන - සතරවන ධ්‍යානයනට අයත්) වේ. කවර හෙයින්දයත්: සොම්නසින් තොර නොවූහෙයිනි. කවර හෙයින් මේ සොම්නසින් තොර නොවීම වේදයත්: දෙම්නසින් පැනනැඟි ව්‍යාපාදදිය පහවන හෙයිනි. පශ්චිම බ්‍රහ්මවිහාරය වන උපෙක්‍ෂාව ඉතිරිවූ එකම (චතුර්ත්‍ථ හෝ පංචම) ධ්‍යානයට අයත් වේ. කවර හෙයින්දයත්: උපෙක්‍ෂා වෙදනාව හා සමඟ යෙදුණ හෙයිනි. සත්ත්‍වයන් වෙත මධ්‍යස්ථාකාර පැවතුම් සහිත බ්‍රහ්මවිහාර උපෙක්‍ෂාව, උපෙක්‍ෂා වේදනායෙන් තොරව නොපවතියි. යමෙක් වනාහි, "යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ විසින් අට්ඨක නිපාතයෙහි අප්පමඤ්ඤ සතරෙහිම, 'මහණ ඉක්බිති විතර්ක සහිත විචාරද සහිත මේ සමාධිය වඩන්නෙහිය, විතර්ක රහිත විචාරමාත්‍ර සහිත සමාධිය වඩන්නෙහිය, විතර්ක රහිත විචාරද රහිත මේ සමාධියද වඩන්නෙහිය, පීති සහිත සමාධියද වඩන්නෙහිය, පීති රහිත සමාධියද වඩන්නෙහිය, සුඛසහිත සමාධියද වඩන්නෙහිය, උපෙක්ඛාසහගත සමාධියද වඩන්නෙහිය"යි[(1)] මෙසේ අවිශේෂයෙන් කියන ලද්දේද, එහෙයින් අප්පමඤ්ඤ සතරම චතුෂ්ක පංචකධ්‍යානිකයහ'යි කියා නම්, ඔහුට 'එසේ නොකියව'යි කිවයුතුය. එසේ වෙතොත් කායානුපස්සනා ආදියද චතුෂ්ක - පංචක - ධ්‍යානික වන්නේය. වෙදනානුපස්සනා ආදියෙහි පවා ප්‍රථමධ්‍යාන පමණකුදු නැත, ද්විතීයධ්‍යාන ආදිය කැලම නැත. එහෙයින් "ව්‍යංජනච්ඡායාමාත්‍රය ගෙන භාග්‍යවතුන් වහන්සේට නිගා නොකරව, බුද්ධවචනය ගැඹුරුය, එය ආචාර්යයන් ඇසුරු කරමින් අභිප්‍රාය වශයෙන් තේරුම් ගතයුතුය."[(1)]

මේ එහි අභිප්‍රායයි: "ස්වාමීනි, යම්සේ මම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා හුදකලාව, ගණයා කෙරෙන් වෙන්ව, අප්‍රමාදීව තපස් කරමින් නිවණට නැඹුරු කය සිත ඇතිව, වෙසෙම් නම්, එසේ වන ලෙසින් මාහට භාග්‍යවතුන් වහන්සේ සංක්‍ෂේපයෙන් ධර්මය දේශනාකරන සේක්වා"[(2)]යි මෙසේ ආයාචනාකළ ඒ භික්‍ෂුව, යම් හෙයකින් ප්‍රථමයෙන්ද

(1) අං. නි. - A iv 300
(2) එම - A iv 299

ධර්මය අසා එතැනම වෙසේද, ශ්‍රමණධර්මය පිළිපැදීමට නොයාද, එහෙයින් එම භික්ෂුවහට භාග්‍යවතුන් වහන්සේ, "එසේම මේ ශාසනයෙහි ඇතැම් මෝඝ පුරුෂයෝ මටම ආරාධනය කෙරෙති, දහම් දෙසූ කල්හි මා පසුපසම යායුතුයයි හඟිති"[1]යි දෙස් නහා යළිදු එම භික්ෂුව රහත්බවට උපනිශ්‍රය ඇත්තකු හෙයින් ඔහුට අවවාද කරනසේක්, "එහෙයින්, ශ්‍රමණය, ඔබ විසින් මෙසේ හික්මිය යුතුය, 'මාගේ අභ්‍යන්තර චිත්තය (යම්සේ) සිටියේ, මනාකොට සිටියේ වන්නේය, උපන් පාපක අකුසල ධර්මයෝ සිත පැහැර නොසිටින්නාහ'යි මෙසේ, ශ්‍රමණය, මේ ආකාරයෙන් හික්මිය යුතුය"[2]යි යන මේ අවවාදයෙන් නියකජ්ඣත්ත වශයෙන් චිත්තෛකාග්‍රතාමාත්‍රවූ මූලසමාධිය කියනලදි. ඉක්බිති මෙපමණෙකින් තෘප්තියට නොපැමිණ මෙසේ එම සමාධිය වැඩියයුතුයයි දක්වනු පිණිස, "යම් හෙයකින්, ශ්‍රමණය, ඔබගේ අභ්‍යන්තර චිත්තය සිටියේ, මනාකොට පිහිටියේ වේද, උපන් ලාමක අකුසල ධර්මයෝ සිත පැහැරගෙන නොසිටිත්ද, එවිට, ශ්‍රමණය, ඔබ විසින් මෙසේ හික්මිය යුතුය, 'මා විසින් මෙත්තා චෙතොවිමුත්තිය වඩනාලද්දේ, පුරුදු කරනලද්දේ, පුහුණුකරනලද්දේ, වස්තුගත කරන ලද්දේ, පිහිටුවන ලද්දේ, සුපුරුදු කරනලද්දේ, මනාකොට අරඹනලද්දේය'යි මෙසේ, ශ්‍රමණය ඔබ විසින් හික්මිය යුතුය"යි මේ ආකාරයෙන් මෙත්තාභාවනා වශයෙන් කියාදී යළිදු, "යම් හෙයකින්, ශ්‍රමණය, මේ සමාධිය මේ ආකාරයෙන් වඩනා ලද්දේ, පුරුදු කරනලද්දේ වේද, එහෙයින්, ශ්‍රමණය, ඉක්බිති විතක්ක-විචාරසහිත මේ මූලසමාධිය වඩන්නෙහිය-පෙ-උපෙක්ඛාසහගත සමාධියද වඩන්නෙහිය"[3]යි කියනලදී. එහි අර්ථය වනුයේ: 'ශ්‍රමණය, යම් කලෙක මෙත්තාභාවනා වශයෙන් මේ මූලසමාධිය වඩනාලද්දේ වේද, එකල එපමණෙකින් තෘප්තියට නොපැමිණ මෙම මූලසමාධිය සෙසු අරමුණු විෂයෙහිද චතුෂ්ක- පංචකධ්‍යානයන් කරා පමුණුවමින් සවිතක්ක-සවිචාර වශයෙන් ආදී නයින් වඩන්නෙහිය' යනුයි. මෙසේද පවසා යළිදු කරුණා ආදී සෙසු බ්‍රහ්මවිහාරයන් පූර්වාංගමකොට ඇති අනෙක් අරමුණු විෂයෙහිද චතුෂ්ක-පංචකධ්‍යාන වශයෙන් භාවනා කරන්නෙහිය'යි දක්වමින්, "යම් හෙයකින්, ශ්‍රමණය, ඔබ විසින් මෙම සමාධිය මෙසේ වඩනාලද්දේ, පුරුදු කරනලද්දේ වේද, එහෙයින්, ශ්‍රමණය, ඉක්බිති ඔබ විසින් මෙසේ හික්මියයුතුය: මවිසින් කරුණාචෙතොවිමුත්තිය..."[4] යන ආදිය කියනලදි.

---

(1) එම - A iv 299

(2) එම

(3) අං. නි. - A iv 300

(4) එම

මෙසේ මෙත්තා ආදිය පූර්වාංගමකොට ඇති චතුෂ්ක-පංචක ධ්‍යාන වශයෙන් භාවනාව දක්වා නැවත කායානුපස්සනා වශයෙන් දක්වනු පිණිස, "යම් හෙයකින්, ශ්‍රමණය, ඔබ විසින් මෙම සමාධිය මෙසේ වඩනාලද්දේ, පුරුදු කරනලද්දේ වේද, එහෙයින් ශ්‍රමණය, ඔබ විසින් ඉක්බිති, 'කය කෙරෙහි කය අනුව බලමින් හැසිරෙන්නෙමි'යි මෙසේ හික්මිය යුතුය"යි කියා, "යම් හෙයකින්, ශ්‍රමණය, ඔබ විසින් මේ සමාධිය මෙසේ වඩනාලද්දේ, මනාකොට වඩනාලද්දේ වන්නේද, එහෙයින්, ශ්‍රමණය, යම් යම් තැනෙක යන්නෙහිද, පහසුවෙන්ම යන්නෙහිය, යම් යම් තැනෙක සිටින්නෙහිද, පහසුවෙන්ම සිටින්නෙහිය, යම් යම් තැනෙක හිඳින්නෙහිද, පහසුවෙන්ම හිඳින්නෙහිය, යම් යම් තැනෙක හොවින්නෙහිද, පහසුවෙන්ම හොවින්නෙහිය"[1]යි රහත්බව කෙළවරකොට දේශනය සමාප්ත කළසේක. එහෙයින් මෙත්තා ආදී පළමු තුන ත්‍රික-චතුෂ්කධ්‍යානික වෙතැ'යිද, උපෙක්ඛාවිහරණය අවශෙෂ එකධ්‍යානිකම වෙතැ'යිද දතයුතුය. අභිධර්මයෙහිද එසේම බෙද දක්වනලදැ'යි දතයුතුය.

මෙසේ ත්‍රික-චතුෂ්කධ්‍යාන වශයෙන්ද, අවශෙෂ එකධ්‍යාන (චතුර්ථ හෝ පංචම) වශයෙන්ද දෙවැදෑරුම්ව සිටි මේ බ්‍රහ්මවිහාරයන් පිළිබඳ එකිනෙකට වෙනස්වූ සුභපරමාදී ආනුභාවවිශේෂය දතයුතුය. හලිද්දිවසන සූත්‍රයෙහි මේ මෙත්තා ආදීහු සුභපරම ආදී වශයෙන් විශේෂකොට කියනලද්දහ. "මහණෙනි, මෙත්තා චෙතොවිමුත්තිය, මම් සුභපරමයයි කියමි, මහණෙනි, කරුණා චෙතොවිමුත්තිය, ආකාසනඤ්චායතනපරමයයි කියමි, මහණෙනි, මුදිතා චෙතොවිමුක්තිය, මම් විඤ්ඤාණඤ්චායතන පරමයයි කියමි, මහණෙනි, උපෙක්ඛා චෙතොවිමුත්තිය මම් ආකිඤ්චඤ්ඤායතනපරමයයි කියමි"[2] යනුවෙනි.

කවර හෙයින් මේ මෙත්තා ආදීහු මෙසේ කියනලද්දහුද? ශුභවිමොක්ෂාදී ඒ ඒ විමොක්ෂයනට උපනිශ්‍රය වනහෙයිනි. මෙත්තාවිහරණ ඇත්තාහට සත්වයෝ ප්‍රතිකූල නොවෙත්, ප්‍රතිකූල නොවනබව පුරුදුවීමෙන් ඔහුට ප්‍රතිකූල නොවූ නීලාදී පිරිසුදු වර්ණයන් වෙත සිත යොමු කරනවිට වැඩි ආයාසයක් නැතිවම එයට සිත වැදගනියි. මෙසේ මෙත්තාවිහරණය ශුභවිමෝක්ෂයට උපනිශ්‍රය වේ, ඉන් මතු කිසිවකට උපනිශ්‍රය නොවේ. එහෙයින් එය සුභපරමයයි කියනලදි.

මුගුරු පහර ආදී රූපනිමිතිවලට පැමිණි සත්වයන්ගේ දුක් අනුව බලන කරුණාවිහරණ ඇත්තහුට කරුණාව පැවැත්වීමේ හේතුවෙන්

(1) එම - A iv 301
(2) සං. නි. - S v 119ff.

රූපයෙහි ආදීනව මනාව වැටහේ. ඉක්බිති, රූපයෙහි ආදීනව දත් හෙයින් පඨවිකසිණාදිය අතුරෙන් කිසියම් කසිණයක් උගුළුවා රූප රහිතවූ ආකාශයෙහි සිත මෙහෙයවනවිට අල්ප ආයාසයෙන්ම එහි සිත වැදගනියි. මෙසේ කරුණාව ආකාසානඤ්චායතනයට උපනිශ්‍රය වේ, ඉන්මතු කිසිවකට නොවෙයි, එහෙයින් එය ආකාසානඤ්චායතන පරමයයි කියනලදී.

මුදිතාවිහරණ ඇත්තහුට වනාහි ඒ ඒ ප්‍රමොදජනක කරුණු හේතුකොටගෙන හටගත් ප්‍රමොද ඇති සත්ත්වයන්ගේ විඤ්ඤාණය අනුව බලනවිට මුදිතාව පැවැත්වීම හේතුකොටගෙන විඤ්ඤාණග්ගහණයෙහි පුරුදු කරනලද සිත් ඇතිවේ. ඉක්බිති ඔහුට අනුක්‍රමයෙන් අධිගතවූ ආකාසානඤ්චායතනය ඉක්මවා ආකාශය නිමිත්තගෝචර කොටඇති විඤ්ඤාණය වෙත සිත මෙහෙයවනවිට අල්ප ආයාසයෙන්ම එහි සිත වැදගනියි. මෙසේ මුදිතාව විඤ්ඤාණඤ්චායතනයට උපනිශ්‍රය වෙයි, ඉන් මතු කිසිවකට උපනිශ්‍රය නොවෙයි, එහෙයින් එය විඤ්ඤාණඤ්චායතන පරමයයි කියනලදී.

උපෙක්ඛාවිහරණ ඇත්තහුට වනාහි, 'සත්ත්වයෝ සුවපත් වෙත්වා'යි හෝ, 'දුකින් මිදෙත්වා'යි හෝ 'ලැබූ සැපතින් නොමිදෙත්වා'යි හෝ ප්‍රාර්ථනා විශේෂයක් නැති හෙයින් සුඛදුඃඛාදී පරමාර්ථග්‍රහණයට විමුඛ වනහෙයින් අවිද්‍යමානප්‍රඥප්ති ගැනීමෙහි දක්‍ෂවූ සිත් වේ. ඉක්බිති පරමාර්ථග්‍රහණ වශයෙන් විමුඛභාවයට පුරුදු කරනලද සිත් ඇති, පරමාර්ථ වශයෙන් අවිද්‍යමානප්‍රඥප්ති ගැනීමෙහි දක්‍ෂවූ සිත් ඇති ඔහුට අනුක්‍රමයෙන් අධිගතවූ විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා, ස්වභාව වශයෙන් අවිද්‍යමානවූ පරමාර්ථබවට පත් විඤ්ඤාණයාගේ අභාවයෙහි සිත මෙහෙයවනවිට අල්පආයාසයෙන්ම එයට සිත වැදගනියි. මෙසේ උපෙක්ඛාවිහරණය ආකිඤ්චඤ්ඤායතනයට උපනිශ්‍රය වේ, ඉන් මතු කිසිවකට උපනිශ්‍රය නොවේ, එහෙයින් එය ආකිඤ්චඤ්ඤායතනපරමයයි කියනලදී.

මෙසේ සුභපරමාදි වශයෙන් මේ විහරණයන්ගේ ආනුභාවය දැන, යලිදු මේ සියලුම විහරණයෝ දානාදීවූ සියලු කල්‍යාණධර්මයන් පරිපූරණය කරන්නාහ'යිද දතයුතුය. සත්ත්වයන් වෙත හිතාධ්‍යාශය ඇති බැවින්ද, සත්ත්වයන්ගේ දුක් නොඉවසන බැවින්ද, සත්ත්වයන්ගේ සම්පත්ති විශේෂයන් බොහෝකල් පවතිනු කැමැති බැවින්ද, සියලු සත්ත්වයන් කෙරෙහි අපක්‍ෂපාතවූ බැවින්ද සමව පවත්වන සිත් ඇති මහා සත්ත්වයෝ 'මොහුට දියයුතුය,

මොහුට නොදියයුතුය’යි වෙනසක් නොකොට සියලු සත්ත්වයනට සුඛනිදනවූ දන් දෙති, එම සත්ත්වයනට හිංසා කිරීමෙන් වැලකෙමින් ශීලය පරිපූර්ණ කෙරෙති, ශීලය පරිපූර්ණ කරනු පිණිස නෛෂ්ක්‍රම්‍යය භජනය කෙරෙති, සත්ත්වයන්ගේ හිත අහිත දෙකෙහි මූළා නොවනු පිණිස ප්‍රඥව පිරිසුදු කෙරෙති, සත්ත්වයන්ගේ හිතසුව පිණිස නිරතුරුව වීර්යය අරඹති, උත්තමවීර්ය වශයෙන් වීරභාවයට පත්ව පවා සත්ත්වයන්ගේ නානාප්‍රකාර අපරාධයන් ක්‍ෂමා කෙරෙති; තොපට මෙය දෙන්නෙමි, කරන්නෙමි’යි කරනලද ප්‍රතිඥවක් කඩනොකෙරෙති, ඔවුන්ගේ හිතසුව පිණිස නොසැලෙනසුලු අදිටන් ඇත්තාහු වෙති, ඔවුන් කෙරෙහි නොසැලෙන මෛත්‍රීය හේතුකොටගෙන පළමුවෙන් උපකාර කෙරෙති, උපෙක්‍ෂාව හේතුකොටගෙන ප්‍රත්‍යුපකාරයක් අපෙක්‍ෂා නොකෙරෙති’යි මෙසේ පාරමී දම් පුරා, යම්තාක් දශබල-චතුර්වෛශාරද්‍ය-ෂඩ්අසාධාරණඥන - අෂ්ටාදශ බුද්ධධර්ම ප්‍රභේද සහිත සියලු කල්‍යාණධර්මයන් පරිපූරණය කෙරෙති.

**මෙතෙකින් සාධුජන ප්‍රමොදය පිණිස කරනලද විශුද්ධිමාර්ගයෙහි සමාධිභාවනාධිකාරයෙහි බ්‍රහ්මවිහාර නිද්දේස නම්වූ නවවැනි පරිච්ඡේදය නිමියේයි.**

# 10. ආරුප්ප නිර්දේශය

බ්‍රහ්මවිහාරයනට අනතුරුව දක්වනලද චතුරාරුප්පයන් අතුරෙන් පළමුකොට ආකාසානඤ්චායතනය වඩනු කැමැති යෝගාවචර තෙමේ, "රූපය හේතුකොටගෙන වනාහි දඬුමුගුරු ගැනීම, අවිආයුධ ගැනීම, කලහ, විග්‍රහ, විවාද යන මොහු දක්නා ලැබෙති, අරූපභවයෙහි වනාහි මොහු සර්වප්‍රකාරයෙන්ම අවිද්‍යමානයහ'යි හේ තෙමේ මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කොට රූපයන්ගේ නිර්වෙදය පිණිස, විරාගයය පිණිස, නිරොධය පිණිස පිළිපන්නේ වේ"[1] යයි කී හෙයින් මේ දණ්ඩාදනාදීන්ගේද, චක්ඛු-සොත රෝගාදීන්ගේද, දහස් ගණන් ආබාධයන්ගේද වශයෙන් කරජරූපයෙහි ආදීනව දැක, එය ඉක්මවනු පිණිස, පරිච්ඡින්නාකාස කසිණය හැර පඨවිකසිණ ආදී පළමු නව කසිණයන් අතුරෙන් කිසියම් කසිණයෙක්හි චතුර්ත්‍ථධ්‍යානය උපදවයි, ඔහු විසින් රූපාවචර චතුර්ත්‍ථධ්‍යාන වශයෙන් කරජරූපය ඉක්මවනලද්දේ නමුදු, ඉක්බිති කසිණරූපයද එම කරජරූපය හා සමානවන හෙයින් එයද ඉක්මවනු කැමැත්තේ වේ. කෙසේදයත්, යම්සේ සර්පයනට බිය ඇති පුද්ගලයෙක් වනයෙහිදී සර්පයකු විසින් ලුහුබඳනා ලද්දේ වේගයෙන් පලාගොස් පලාගිය තන්හිදී රේඛාචිත්‍රයක් හෝ තල් කොළයක් හෝ වැලක් හෝ රැහැනක් හෝ ඉරිතලාගිය පොළොවෙහි පැල්මක් හෝ දැක බියපත් වේමය, තැතිගනීමය, දකින්නට පවා නොකැමැති වේමය. තවද අනර්ත්‍ථකාරී වෛරී පුරුෂයකු හා සමග එක් ගමෙක වාසය කරන පුරුෂයෙක් ඔහු (වෛරී පුරුෂයා) විසින් වධබන්‍ධන, -පෙ-, ගිනිලෑම් ආදියෙන් උපද්‍රව කරනලදුව අන් ගමෙක විසීමට ගොස් එහිදී එම වෛරියාට සමාන රූපශබ්දප්‍රවෘත්ති ඇති පුරුෂයකු දුටුවිට බියපත් වේමය, තැති ගනීමය, දකින්නට පවා නොකැමැති වේමය. එහි උපමා සංසන්‍දනය මෙසේය: සර්පයා විසින් හෝ වෛරී පුද්ගලයා විසින් උපද්‍රව කරන කාලය එම භික්‍ෂුවගේ කරජරූපය හා සමග බැඳී සිටින කාලය වැනිය, ඔහුගේ වේගයෙන් පලායාම, නැත්හොත්, අන්ගමකට පලායාම මෙහි භික්‍ෂුවගේ රූපාවචරචතුර්ත්‍ථධ්‍යාන වශයෙන් කරජරූපය ඉක්මවන කාලය වැනිය, ඔවුන් පලාගිය ස්ථානයෙහිදී නොහොත්, අන් ගමෙකදී රේඛාචිත්‍ර තාලපත්‍ර ආදිය නොහොත් වෛරී පුරුෂයාට සමාන පුරුෂයකු දැක ඇතිවන භය, සන්ත්‍රාසය හෝ නොදක්නාකැමැතිබව භික්‍ෂුවගේ කසිණරූපය කරජරූපය හා සමානයයි සලකා එයද ඉක්මවනු කැමැතිවීම වැනිය. මෙහිලා හූරකුගෙන් පහර කෑ බල්ලාය, පිශාචයන් ගැන බියෙන් පෙළෙන්නාය යන මෙ උපමාවන්ද දතයුතුය.

---

(1) ම. නි. අපණ්ණක සු. - M i 410

එහෙයින් එසේ හේ තෙමේ චතුර්ථධ්‍යානයට අරමුණුවූ කසිණරූපයෙහි කලකිරී එයින් ඉවත යනු කැමැතිව, පස් ආකාරයෙන් වඩනාලද චිණ්ණවසීභාව ඇතිව ප්‍රගුණකරනලද රූපාවචරචතුර්ථ ධ්‍යානයෙන් නැගී, එම ධ්‍යානයෙහි, "මා කලකිරුණ මේ රූපය අරමුණු කෙරෙති'යිද, ආසන්නව සිටි සොමනස්ස නමැති ප්‍රතිපක්ෂයකු ඇතැ'යි ද, ශාන්ත විමොක්ෂයට (අරූපාවචරධ්‍යානයට) වඩා ඖළාරික'යයිද යන මේ ආදීනව දකී. මෙහි ධ්‍යානාංග වශයෙන් ඖළාරිකබවක් නැත. යම්සේ මේ රූපාවචර චතුර්ථධ්‍යානය ද්වංගික වේද, එසේම සතර අරූපධ්‍යානයෝද ද්වංගික වෙති. ඒ යෝගී තෙමේ එම චතුර්ථධ්‍යාන විෂයෙහි ආදීනව දක, එයට ඇති රුචිබව ඉක්මවා, ආකාසානඤ්චායතනය ශාන්ත වශයෙන්, අනන්ත වශයෙන් මෙනෙහිකොට, සක්වළ කෙළවරට හෝ යම්තාක් කැමැත්තේ නම් ඒතාක් දුරට කසිණය පතුරුවා එයින් පැතුරුණ ආකාශය "ආකාසො ආකාසො" යනුවෙන්, නැතහොත්, "අනන්තො ආකාසො" යනුවෙන් මෙනෙහි කරමින් කසිණය උගුළුවන්නේ වේ. කසිණයද උගුළුවනු ලබනුයේ පැදුරක් මෙන් හැකිලෙන්නේ නොවේ, කබලින් පූවක් මෙන් ගැලවෙන්නේ නොවේ. හුදෙක් එම කසිණය ආවර්ජනය නොකෙරේ, මෙනෙහි නොකෙරේ, ප්‍රත්‍යවෙක්ෂා නොකෙරේ. ආවර්ජන නොකරනවිට, මෙනෙහි නොකරනවිට, ප්‍රත්‍යවෙක්ෂා නොකරනවිට ඒකාන්තයෙන්ම එම කසිණයෙන් පැතිරුණ ආකාශය "ආකාසො ආකාසො" යනුවෙන් මෙනෙහි කරනුයේ කසිණය උගුළුවන්නේ නම් වේ. කසිණයද උගුළුවනු ලබන්නේ නොපැතිරේ, නොහැකිලේ, හුදෙක් මේ කසිණය මෙනෙහි නොකිරීමද, "ආකාසො ආකාසො"යි ආකාශය මෙනෙහිකිරීමද හේතුකොටගෙන උගුළුවනු ලදුයේ නම් වේ. කසිණ ඉගුළුවූ ආකාශය පමණක් දිස්වේ. කසිණය ඉගුළුවූ ආකාශය යනු හෝ, කසිණය පැතුරුණ ආකාශය යනු හෝ, කසිණයෙන් තොරවූ ආකාශය යනු හෝ මේ සියල්ලෙන්ම පැවසෙනුයේ එකක්මය. ඒ යෝගාවචර තෙමේ කසිණය ඉගුළුවූ ආකාසනිමිත්ත "ආකාසො ආකාසො"යි නැවත නැවතත් මෙනෙහිකරයි, තර්කයට විතර්කයට බඳුන් කරයි. මෙසේ නැවත නැවතත් ආවර්ජනය කරනවිට, තර්කයට විතර්කයට බඳුන් කරනවිට ඒ යෝගාවචරයාගේ නීවරණයෝ යටපත් වෙති, සිහිය මනාව පිහිටයි, උපචාර ධ්‍යානයෙන් සිත සමාධිගත වේ. ඒ යෝගාවචර තෙමේ එම ආකාස නිමිත්ත යලි යලිත් සේවනය කරයි, වඩයි, පුරුදු කරයි.

මෙසේ යලි යලිත් ආවර්ජනය කරනවිට, මෙනෙහි කරනවිට, පඨවිකසිණාදියෙහි රූපාවචරචිත්තය මෙන් ආකාශ විෂයෙහි

ආකාසානඤ්චායතන චිත්තය අර්පණාගත වෙයි. මෙහිදීද ප්‍රථමභාගයෙහි තුන්-සතර ජවනයෙක් කාමාවචර වේ, උපෙක්ෂාවෙදනාවෙන් යුක්තවූයේම වේ, සතරවැන්න හෝ පස්වැන්න අරූපාවචර වේ. සෙස්ස පඨවිකසිණයෙහි කී නයමැයි. මේ වනාහි විශේෂයයි: මෙසේ අරූපාවචර සිත් උපන් කල ඒ භික්ෂු තෙමේ, යම්සේ වනාහි යානමුඛය (යානයෙක ඉදිරි පස) පතොලිමුඛය (වීදි දෙරකඩ) කුම්භිමුඛය (සැලිකට) යන ආදිය අතුරෙන් කිසිවක් නිල් කඩෙකින් හෝ පීත, ලොහිත, අවදත ආදී වර්ණ ඇති කඩෙකින් හෝ බැඳ අවට නරඹන පුරුෂයෙක් වාතවේගයෙන් හෝ අන් කිසියම් වේගයෙකින් හෝ එම රෙදිකඩ ඉවත්වූවිට ආකාශයම දකිමින් සිටින්නේද, එසේම පළමුව කසිණමණ්ඩලය ධ්‍යානචක්ෂුසින් බලමින් සිට, "ආකාසො ආකාසො" යන මේ පරිකර්ම මනස්කාරයෙන් එම නිමිත්ත වෙගයෙන් ඉවත්වූවිට ආකාශයම දකිමින් විහරණය කරයි. මෙපමණෙකින්ම මේ යෝගාවචර තෙමේ "සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා, පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා, නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති"(1) (සැම අතින්ම රූපසංඥාවන් ඉක්මවීමෙන්, පටිඝසංඥාවන් පහවීමෙන්, නානත්තසංඥාවන් මෙනෙහි නොකිරීමෙන් 'ආකාශය අනන්තය'යි ගෙන ආකාසානඤ්චායතනයට පැමිණ විහරණය කෙරේය"යි කියනලදි.

එහි **සබ්බසො** යනු, සියලු ආකාරයෙන්, නොහොත් 'ඉතිරි නොකොට සියලු රූපසංඥාවන්ගේ'යි යන අර්ථයි. **රූපසඤ්ඤානං** යනු, සඤ්ඤා ශීර්ෂයෙන් කියනලද රූපාවචර ධ්‍යානයන්ගේද එයට අරමුණුවූ කසිණාදී නිමිත්තයන්ගේද—රූපාවචරධ්‍යානයද 'රූපී රූපානි පස්සති'(2) යන ආදි තන්හි රූපයයි කියනුලැබේ. "බහිද්ධා රූපානි පස්සති සුවණ්ණදුබ්බණ්ණානි'(3) යන ආදී තන්හි එම අරමුණුද රූපයයි කියනුලැබේ. එහෙයින් මෙහි රූපයෙහි වූ සංඥාව 'රූපසඤ්ඤා' යයි මෙසේ සඤ්ඤා ශීර්ෂයෙන් කියනලද රූපාවචරධ්‍යානයට මේ අධිවචනයෙකි. රූපය යන සංඥාව මෙයට ඇත්තේයයි 'රූපසඤ්ඤා'යයි කියනු ලැබේ. 'රූප' යනු මෙයට නමැ'යි කී නියායි. මෙසේ පඨවිකසිණ ආදී ප්‍රභේද ඇති එම රූපාවචරධ්‍යාන හා ආරම්මණයනටද මේ අධිවචනැ'යි දතයුතුය. **සමතික්කමා** යනු, අනභිරතියෙනි, පහකිරීමෙනි. කුමක් කී නියාදයත්, කුසලවිපාකකිරිය වශයෙන් මෙම ධ්‍යාන සංඛ්‍යාතවූ පසළොස් රූපසංඥාවන්ගේද පඨවිකසිණාදී වශයෙන් ආරම්මණ සංඛ්‍යාත වූ

(1) දී. නි. මහානිදාන සු. - D ii 71

(2) එම - D ii 70

(3) දී. නි. මහාපරිනිබ්බාණ සු. - D ii 110

අනවශේෂ නවරූපසංඥවන්ගේද, නොහොත් සියලු ආකාරයෙන් අනවශේෂවූ රූපසංඥවන්ගේද අනභිරතියෙන් වැලැක්වීමෙන්, විරාගයට හේතුවූ නිරෝධයට හේතුවූ ආකාසානඤ්චායතනයට පැමිණ විහරණය කරයි. සියලුම ආකාරයෙන් නොඉක්මවූ රූපසංඥ ඇත්තහුට මෙම ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ විහරණයකළ නොහැකිය. එහිලා, යම් හෙයකින් අරමුණෙහි නොඇලුණාහුට සංඥවන්ගේ ඉක්මවීම නොවන්නේද, සංඥවන් ඉක්මවනලද කල්හිම අරමුණ ඉක්මවනලද්දේ වේද, එහෙයින් ආරම්මණසමතික්‍රමණය නොකියා, එහි 'රූපසඤ්ඤ' යනු කවරේද යත්, රූපාවචරසමාපත්තියට පැමිණියහුගේ හෝ එම විපාකයට පැමිණියහුගේ හෝ දිට්ඨධම්මසුඛයෙන් වසන්නහුගේ හෝ සංඥව, හැඳිනීම, හඳුනනබව රූපසංඥය'යි කියනු ලැබේ. මේ රූපසංඥවන් ඉක්මවූවාහුය, ව්‍යතික්‍රමණය කළාහුය, මනාකොට ඉක්මවූවාහුය, එහෙයින් රූපසංඥවන් ඉක්මවීමෙනියි කියනු ලැබේ."(1) මෙසේද විභඞ්ගයෙහි සංඥවන්ගේම සමතික්‍රමණය කියනලදි. යම්සේ වනාහි ආරම්මණ සමතික්‍රමණයෙන් මෙම සමාපත්තියට පැමිණියයුතු වන්නේද, ප්‍රථමධ්‍යානාදිය මෙන් එක්ම අරමුණෙක්හි සිට පැමිණියයුතු නොවන්නේද, එහෙයින් මෙම ආරම්මණසමතික්‍රමණ වශයෙන්ද අර්ථවර්ණනාව කරනලද්'යි දතයුතුය. **පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා** යනු, චක්ෂුරාදී වස්තූන්ගේද, රූපාදී ආරම්මණයන්ගේද ගැටීමෙන් උපන් සංඥවෝ පටිඝසඤ්ඤ නම් වෙති, මේ රූපසඤ්ඤ ආදියට අධිවචනයි. කියනලද මැයි: එහි 'පටිඝසඤ්ඤ' යනු කවරේද යත්: රූපසඤ්ඤ, සද්දසඤ්ඤ, ගන්ධසඤ්ඤ, රසසඤ්ඤ, පොට්ඨබ්බසඤ්ඤ යන මොහු 'පටිඝසඤ්ඤ'යයි කියනු ලැබෙති.(2) කුසලවිපාක පසෙක්ද, අකුසලවිපාක පසෙක්දැයි දශයක්වූ සියලු ආකාර ඇති පටිඝසංඥවන්ගේ ඉවත්වයාමෙන්, පහවීමෙන්, නොඉපැදවීමෙන් නොපැවතීම සිදු කොටැ'යි කී තියායි. මෙම පටිඝසංඥවෝ ඒකාන්තයෙන්ම ප්‍රථමධ්‍යානාදියට සමවන්නහුටද නොවන්නාහුය. එම රූපධ්‍යානයනට සමවන් කල්හි සිත පඤ්චද්වාර වශයෙන් නොපවතී. එසේ වත්මුත්, යම්සේ සෙසු ධ්‍යානයන්හිදී ප්‍රහීණ කළ සුඛදුඃඛාදිය චතුර්ථධ්‍යානයෙහිද කියනු ලබනුයේ වේද, (ප්‍රථම මාර්ගයෙන් ප්‍රහීණකළ) සක්කායදිට්ඨි ආදිය තුන්වන මාර්ගයෙහිද කියනු ලැබෙනුයේ වේද, එසේම මෙම ධ්‍යානය කෙරෙහි උත්සාහ දනවනු පිණිසද, මේ ධ්‍යානයට ප්‍රශංසා වශයෙන්ද මෙම පටිඝසංඥවන් ගැන මෙහි සඳහන් කරනලද්'යි දතයුතුය, නොහොත්, එම පටිඝසංඥවන්

(1) අභි. විභංගපාළි - Vbh 261

(2) එම - Vbh 261

රූපාවචර ධ්‍යානයනට සමවන්නහුටද ඇත්තේ නැත. එතෙකුදු වුවත්, ප්‍රහීණවූ හෙයින්ම නැත්තේ නොවේ, රූපාවචරභාවනාව රූපවිරාගය පිණිස පවත්නේ නොවේ. මෙකී භාවනාවන්ගේ පැවැත්මද රූපයනට අයත්වේ. මෙම (අරූපාවචර) භාවනාව රූපවිරාගය පිණිස පවත්නේය. එහෙයින් ඒ පටිඝසංඥවෝ මෙම අරූපභාවනා විෂයෙහිදී ප්‍රහීණයහ'යි කියනු වටනේය. හුදෙක් කියනුමතු නොවේ, ඒකාන්තයෙන් එසේය'යි සිතට ගනුද වටනේය.

මෙම අරූපධ්‍යානයනට පෙර අප්‍රහීණවූ හෙයින්ම, ප්‍රථමධ්‍යානයට සමවන්නහුට ශබ්දය කටුඅකුලෙකැ'යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරනලදි. මෙම අරූපධ්‍යානයෙහිදී ප්‍රහීණවූ හෙයින්ම අරූපසමාපත්තීන් අකම්ප්‍යවනබවද, 'සන්තවිමොක්ඛ' නම් වනබවද කියනුලැබේ. ආළාර කාලාම තෙමේද, අරූපසමාපත්තියට සමවන්නේ පන්සියයක් පමණවූ ගැල් ගෙනයන්නවුන් නොදුටුවේය, ශබ්දය හෝ නොම ඇසීය.

**නානත්තසඤ්ඤානං අමනසිකාරා** යනු, නානාස්වභාව ඇති අරමුණෙහි පැවැති සංඥවන්ගේ නොහොත් නානාස්වභාව ඇති සංඥවන්ගේ—යම්හෙයකින් වනාහි මේ සංඥවෝ, "එහි නානත්තසඤ්ඤා නම් කවරහුද යත්, මනොධාතුසමන්විතවූ හෝ මනොවිඤ්ඤාණධාතු සමන්විතවූ හෝ ධ්‍යානයනට නොසමවන්නහුගේ සංඥවන්, හැඳින ගැනීම, හඳුනාගත්බව 'නානත්තසඤ්ඤා'යයි කියනු ලබ"[1]යි මෙසේ විභංගයෙහි විග්‍රහකොට කියනලද සංඥවෝ මෙහිලා අභිප්‍රේතයහ. ධ්‍යානයනට සමනොවන්නහුගේ මනොධාතුත් හා මනොවිඤ්ඤාණධාතුන්ගෙන් සංගෘහීතවූ සංඥවෝ රූප ශබ්දදී ප්‍රභේද ඇති, නානාප්‍රකාර ඇති, නානාස්වභාව ඇති, අරමුණෙහි පවත්නාහු වෙත්ද, තවද යම් හෙයකින් මේ සංඥවෝ කාමාවචරකුසලසංඥ අටෙක්ද, අකුසලසංඥ දෙළොසෙක්ද, කාමාවචරකුසලවිපාකසංඥ එකොළොසෙක්ද, අකුසලවිපාකසංඥ දෙකෙක්ද, කාමාවචරකිරියසංඥ එකොළොසෙක්දැ'යි මෙසේ සූසාළිස් සංඥවෝම නානාආකාර ඇත්තාහු, නානාස්වභාව ඇත්තාහු, එකිනෙකට විසදෘශ වූවාහු වෙත්ද, එහෙයින් 'නානත්තසඤ්ඤාය'යි කියනුලබති. සියලු ආකාර නානත්වයෙන් යුත් එම සංඥවන් මෙනෙහි නොකිරීමෙනි, ආවර්ජන නොකිරීමෙනි, වැළඳ නොගැනීමෙනි, ප්‍රත්‍යවෙක්‍ෂා නොකිරීමෙනි. යම් හෙයකින් එම සංඥවන් ආවර්ජන නොකෙරේද, මෙනෙහි නොකෙරේද, ප්‍රත්‍යවෙක්‍ෂා නොකෙරේද, එහෙයිනි'යි කී-තියායි.

---

(a) Vbh 261

තවද යම්හෙයකින් මෙහි පළමු කී රූපසඤ්ඤාවෝද පටිඝසඤ්ඤාවෝද මේ ධ්‍යානය හේතුකොට උපන් භවයෙක්හිදු විද්‍යමාන නොවෙත්ද, එම භවයෙහිදී මෙම ධ්‍යානයට පැමිණ විහරණකරන කල්හි කැලම විද්‍යමාන නොවෙත්ද, එහෙයින් එම සංඥවන් ඉක්මවීමෙන්ද, පහවීමෙන්දැයි යන දෙආකාරයෙන්ම ඔවුන්ගේ අභාවයම කියනලද්දේය. නානත්වසංඥවන් අතුරෙන් වනාහි, යම් හෙයකින් කාමාවචරකුසලසංඥ අටද, කිරියසංඥ නවයෙක්ද, අකුසලසංඥ දශයෙක්දැ'යි යන මේ සත්විසි සංඥවෝ මෙම ධ්‍යානය හේතුකොට උපන් භවයෙක්හිදු විද්‍යමාන වෙත්ද, එහෙයින් එම සංඥවන් මෙනෙහි නොකිරීමෙනි'යි කියනලදැ'යි දතයුතුය. එම අරූපභවයෙහිදී පවා මෙම අරූපධ්‍යානයට පැමිණ විහරණ කරනුයේ එම නානත්වසංඥවන් මෙනෙහි නොකරන හෙයින්ම ධ්‍යානයට පැමිණ විහරණ කරන්නේ වේ, එම සංඥවන් මෙනෙහි කරනුයේ නොසමවන්නේ වේ.

සංක්ෂේපයෙන් මෙහි, **රූපසඤ්ඤානං සමතික්කමා** යන මෙයින් සියලු රූපාවචරධර්මයන්ගේ ප්‍රහාණය කියනලදී, **පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා, නානත්තසඤ්ඤානං අමනසිකාරා** යන මෙයින් සියලු කාමාවචර චිත්තචෛතසිකයන්ගේ ප්‍රහාණයද අමනසිකාරයද කියනලදැ'යි දතයුතුය. **අනන්තො ආකාසො** යන මෙහි, මේ ආකාශයෙහි ඉපදීම පිළිබඳ කෙළවර හෝ විනාශය පිළිබඳ කෙළවර හෝ නොපෙනෙති'යි අනන්ත නම්, 'ආකාස' යනුවෙන් කසිණය ඉගිලවූ අහසයි කියනු ලැබේ. මෙනෙහිකිරීම් වශයෙනිදු මෙහිලා අනන්තබව දතයුතුය. එහෙයින්ම විභංගයෙහි: 'ඒ ආකාශයෙහි සිත පිහිටුවයි, මනාකොට පිහිටුවයි, අනන්ත ලෙසින් පතුරුවයි, එහෙයින් "අනන්තො ආකාසො" ආකාශය අනන්තයයි කියනු ලබති'[1]යි කියනලදී. **ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති** යන මෙහි වනාහි, මෙයට කෙළවරක් නැතැ'යි අනන්ත නම් වේ, ආකාස අනන්තය'යි 'ආකාසානන්ත' නම්, ආකාසානන්තයම (ස්වාර්ථ ය-ප්‍රත්‍ය යෙදීමෙන්) ආකාසානන්ත්‍ය = 'ආකාසානඤ්ච' නම්, එම ආකාසානඤ්චය පිහිටවෙතැ'යි යන අර්ථයෙන්, (ස්පර්ශාදී) සම්ප්‍රයුක්ත ධර්මයන් සහිතවූ මෙම ධ්‍යානයට ආයතන වූයේය'යි - දෙවියනට දෙවායතන යන්න මෙන් - 'ආකාසානඤ්චායතන' නම්. 'ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති' යනු, එම ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ, එය නිපදවා, එයට අනුරූපවූ ඊර්යාපථ විහරණයෙන්, වෙසෙති'යි යන අර්ථයි.

**මේ ආකාසානඤ්චායතන කර්මස්ථානය පිළිබඳ විස්තර කථායි.**

---

(a) Vbh 262

## විඤ්ඤාණඤ්චායතන කර්මස්ථානය

විඤ්ඤාණඤ්චායතනය වඩනු කැමැත්තහු විසින් වනාහි (ආවජ්ජනසමාපජ්ජනාදී) පස් ආකාර පැවැත්මෙන් ආකාසානඤ්චායතන සමාපත්ති විෂයෙහි පුරුදු පුහුණු කරණලද වසීභාවය හේතුකොටගෙන, 'මේ සමාපත්තිය අසල්ව සිටි රූපාවචරධ්‍යාන නමැති ප්‍රතිපක්ෂයන් ඇත්තේය, විඤ්ඤාණඤ්චායතනය තරම් ශාන්තද නොවන්නේය"යි ආකාසානඤ්චායතනයෙහි ආදීනව දැක, එහි අනභිරුචිය දනවා, විඤ්ඤාණඤ්චායතනය ශාන්ත වශයෙන් ගෙන මෙනෙහිකොට එම ආකාශය හිම්කොට පැතිරසිටි විඤ්ඤාණය 'විඤ්ඤාණං විඤ්ඤාණං' යනුවෙන් නැවත නැවතත් ආවර්ජන කළයුතුය, මෙනෙහිකළයුතුය, ප්‍රත්‍යවෙක්ෂා කළයුතුය, තර්කයට විතර්කයට භාජන කළයුතුය, "අනන්තං අනන්තං" යනුවෙන් මෙනෙහි නොකළයුතුය. මෙසේ එම නිමිත්තෙහි යලි යලිදු සිත හසුරුවනවිට ඒ යෝගාවචරයාගේ නීවරණයෝ මඩිනු ලබති, සිහිය මනාව පිහිටයි, උපචාරධ්‍යානයෙන් සිත සමාධිගත වෙයි. හේ තෙමේ එම නිමිත්ත යලි යලිදු සේවනය කරයි, වඩයි, පුරුදු කරයි. මෙසේ පුරුදු පුහුණු කරනවිට ඔහුට ආකාස විෂයෙහි ආකාසානඤ්චායතනචිත්තය මෙන්ම, එම ආකාශයෙහි පැතිරපවත්නා විඤ්ඤාණවිෂයෙහි විඤ්ඤාණඤ්චායතනචිත්තය අර්පණාගත වෙයි. මෙහි අර්පණානය වනාහි පළමු කියනලද නයින්ම දතයුතුය. මෙපමණෙකින්ම මේ තෙමේ, "සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඤ්ඤාණය අනන්තය'යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ විහරණය කෙරෙති'[(1)]යි කියනු ලැබේ.

එහි **සබ්බසො** (සියලු ආකාරයෙන්) යනු, මේ කියනලද නයමැයි. **ආකාසානඤ්චායතනං සමතික්කම්ම** යන මෙහි පෙර කී-නයින් ධ්‍යානයද ආකාසානඤ්චායතන අරමුණද යන දෙකම වේ, අරමුණද පළමු නයින්ම 'ආකසානඤ්ච'ද, ප්‍රථම අරූපධ්‍යානයට අරමුණුවන හෙයින්, දෙවියනට 'දෙවායතන' යනු මෙන් ප්‍රතිෂ්ඨාවන අර්ත්ථයෙන් 'ආයතන'ද වෙති'යි 'ආකාසානඤ්චායතන' නම් වේ. එසේම 'ආකාසානඤ්ච' වූයේද, එම ධ්‍යානයෙහි උපතට හේතුවන හෙයින්, 'කාම්බෝජ්දේශය අශ්වයනට ආයතන වේ' යනුවෙන් උපදනා දේශය යන අර්ත්ථයෙන් 'ආයතන' වූයේද ඒ මැයි 'ආකාසානඤ්චායතන' නම් වේ. මෙසේ මෙම ධ්‍යානයද අරමුණද යන දෙකම නොපැවැත්වීමෙන්ද මෙනෙහි නොකිරීමෙන්ද මැනවින් ඉක්මවාම මෙම විඤ්ඤාණඤ්චායතනයට පැමිණ විහරණය

(1) අභි. විභංගපාළි - Vbh 245

කටයුතු වේ, එහෙයින් (ධ්‍යානයද අරමුණද යන) දෙකම එක්කොට 'ආකාසානඤ්චායතනය ඉක්මවයි' යන මේ අර්ථය කියනලද්දැ'යි දතයුතුය.

**අනන්තං විඤ්ඤාණං** යනු, එම ආකාසානඤ්චායතනයම 'අනන්තො ආකාසො' යනුවෙන් මෙසේ පවත්වා පතුරුවනලද විඤ්ඤාණය 'අනන්තං විඤ්ඤාණං' යනුවෙන් මෙසේ මෙනෙහි කෙරෙමිනි'යි කී-නියායි, නොහාත් මෙනෙහිකිරීම් වශයෙන් අනන්ත වේ, ඒ යෝගාවචර තෙමේ එම ආකාශය අරමුණුකොටඇති විඤ්ඤාණය නිරවශේෂයෙන් මෙනෙහි කරනුයේ 'අනන්තය'යි මෙනෙහි කෙරේ. යමක් විභංගයෙහි අනන්තවූ විඤ්ඤාණය'යි කියන ලද්දේද, විඤ්ඤාණයෙන් පතුරුවනලද එම ආකාශයම මෙනෙහි කරයි, අතරක් නොමැතිසේ පතුරුවයි, එහෙයින් 'අනන්තං විඤ්ඤාණං' (අනන්තවූ විඤ්ඤාණය)යි කියනලදි.(1) එහි 'විඤ්ඤාණෙන' (විඤ්ඤාණයෙන්) යනු, කර්මාර්ථයෙහි කරණවචනැ'යි දතයුතුය. මේ ආකාරයෙන් අට්ඨකථාචාර්යයෝ එහි අර්ථය වර්ණනා කෙරෙති. 'අනන්තං ඵරති' (අනන්තලෙස පතුරුවයි) යනු ආකාශය පුරා පැතිර සිටි එම විඤ්ඤාණය මෙනෙහි කරති'යි කී-නියායි. **විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති** යනු, මෙහි කෙළවරක් නැතැ'යි යන අරුතින් 'අනන්ත'වේ, අනන්තයම (ස්වාර්ථ තද්ධිත වශයෙන්) ආනන්ත්‍ය = 'ආනඤ්ච' වේ, විඤ්ඤාණං ආනඤ්චං (ආනන්ත්‍යවූ විඤ්ඤාණය) යනු 'විඤ්ඤාණානඤ්චං'යයි නොකියා 'විඤ්ඤාණඤ්ච'යයි කියනලදි. මේ මෙහි රූඪී වචනයි. එම විඤ්ඤාණඤ්චය මෙම ධ්‍යානයට ප්‍රතිෂ්ඨාවන අර්ථයෙන්, දෙවියනට 'දෙවායතන' යනුවෙන් 'විඤ්ඤාණඤ්චායතන' නම් වේ. සෙස්ස පළමු කීලෙසම වේ.

**මේ විඤ්ඤාණඤ්චායතන කර්මස්ථානය පිළිබඳ විස්තර කථායි.**

## ආකිඤ්චඤ්ඤායතන කර්මස්ථානය

ආකිඤ්චඤ්ඤායතන කර්මස්ථානය වඩනු කැමැති යෝගාවචරයා විසින් (ආවජ්ජන සමාපජ්ජනාදී) පස් ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙහි බෝකල් හුරුපුරුදුවූ බැවින්, 'මේ සමාපත්තිය ළංව සිටි ආකාසානඤ්චායතන නමැති ප්‍රතිපක්ෂ සහිත වේ, ආකිඤ්චඤ්ඤායතනය තරම් ශාන්තද නොවේ' යනුවෙන් විඤ්ඤාණඤ්චායතනයෙහි ආදීනව දැක එහි අනභිරතිය උපදවා ආකිඤ්චඤ්ඤායතනය ශාන්ත වශයෙන් ගෙන මෙනෙහි කරමින් එම විඤ්ඤාණඤ්චායතනයටම ආරම්මණවූ ආකාසානඤ්චායතනවිඤ්ඤාණයෙහි අභාවය, ශූන්‍යතාව, විව්‍යුක්තාකාරය

(a) අභි. විභංගපාළි - Vbh 262

මෙනෙහි කළයුතුය. කෙසේද යත්:- එම විඤ්ඤාණය මෙනෙහි නොකොට 'නත්ථි නත්ථි' (නැත, නැත) යනුවෙන් හෝ 'සුඤ්ඤං සුඤ්ඤං' (ශූන්‍යය, ශූන්‍යය) යනුවෙන් හෝ 'විවිත්තං විවිත්තං' (පාලුය පාලුය) යනුවෙන් හෝ නැවත නැවතත් ආවර්ජන කළයුතුය. මෙනෙහි කළයුතුය, ප්‍රත්‍යවේක්‍ෂා කටයුතුය, තර්කයට විතර්කයට ලක්කළයුතුය. මේ ආකාරයෙන් එම නිමිත්තෙහි සිත හසුරුවන ඒ යෝගාවචරයාගේ නීවරණයෝ යටපත් වෙති, සිහිය මනාසේ පිහිටයි, උපචාර ධ්‍යානයෙන් සිත සමාධිගත වෙයි. හේ තෙමේ එම නිමිත්ත යළි යළිදු සේවනය කරයි, වඩයි, පුරුදු පුහුණු කරයි, මෙසේ පුරුදු කරනවිට ආකාශවිෂයෙහි පතළ මහද්ගතවිඤ්ඤාණයෙහි විඤ්ඤාණඤ්චායතනය මෙන් ආකාශය පුරා පැවැති එම මහද්ගත විඤ්ඤාණය පිළිබඳ හිස් බවෙහි, පාලු බවෙහි, නැති බවෙහි ආකිඤ්චඤ්ඤායතනචිත්තය අර්පණා බවට පත්වේ. මෙහිද අර්පණානය පළමු නයින්ම දතයුතුය. මේ විශේෂයයි: එම අර්පණා චිත්තය උපන් කල්හි ඒ භික්‍ෂු තෙමේ, යම්සේ පුරුෂයෙක් මණ්ඩලමාල (රැස්වීම්ශාලා, ධර්මශාලා) ආදී තැනෙක්හි කිසියම් කටයුත්තක් සඳහා රැස්වූ භික්‍ෂු සංඝයා දැක ඉවත්ව ගොස්, රැස්වූ කාර්යය නිමකොට භික්‍ෂූන් නැඟී ගිය පසු නැවත අවුත් දෙරකඩ සිට එම ස්ථානය බලනුයේ හිස්වගිය, පාලුවගිය ශාලාවම දක්නේද, එවිට ඔහුට 'මෙපමණ භික්‍ෂූහු කලුරිය කළාහුය නැතහොත් පිට පළාත්වලට ගියාහුය'යි මෙවැනි අදහසෙක් නොවන්නේද, මේ ස්ථානය හිස්වී ඇත, පාලුවී ඇතැ'යි හුදෙක් හිස්බවම දක්නේද, එසේම පළමු ආකාශ විෂයෙහි පවත්වනලද විඤ්ඤාණය විඤ්ඤාණඤ්චායතන චක්‍ෂුසයෙන් බලමින් විහරණයකොට 'නැත නැත' යන ආදී වශයෙන් පිරියම් මෙනෙහි කිරීමෙන් එම ආකාසානඤ්චායතනවිඤ්ඤාණය අතුරුදන්වූ කල්හි එහි පහවීම හෙවත් අභාවයම දකිමින් විහරණය කෙරේ.

මෙපමණෙකින්ම මේ භික්‍ෂු තෙමේ "සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා 'කිසිවක් නැතැ'යි යන ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ විහරණය කෙරේය'[(1)]යි කියනුලැබේ. මෙහිද **සබ්බසො** (සියලු ආකාරයෙන්) යනු, පළමු කීනයමැයි. **විඤ්ඤාණඤ්චායතනං** යන මෙහිද පෙරකී නයින්ම ධ්‍යානයද, විඤ්ඤාණඤ්චායතන අරමුණද යන දෙකම වේ. අරමුණද පෙරකී නයින්ම 'විඤ්ඤාණ' වූයේද එම, දෙවන අරූපධ්‍යානයට අරමුණුවූ හෙයින් දෙවියනට 'දෙවායතන' යනු මෙන් ප්‍රතිෂ්ඨාවෙතැ'යි යන අරුතින් 'ආයතන' වූයේද එමැයි විඤ්ඤාණඤ්චායතන

---

(a) අභි. විභංගපාළි - Vbh 245

නම් වේද, එසේම 'විඤ්ඤාණ' වූයේද එම, ධ්‍යානයට උත්පත්තිස්ථාන වනහෙයින් 'කම්බෝජ දේශය අශ්වයනට ආයතන වේ' යන ආදිය මෙන්, උපන් දේශයයි යන අරුතින් 'ආයතන' වූයේද එමැ'යි විඤ්ඤාණඤ්චායතන නම් වේද, ඒ ආකාරයෙන්ම ධ්‍යානයද අරමුණද යන දෙකම නොපැවැත්වීමෙන්ද, මෙනෙහි නොකිරීමෙන්ද මනාකොට ඉක්මවාම, යම්හෙයකින් මේ ආකිඤ්චඤ්ඤායතනය උපදවා විහරණය කළයුතු වේද, එහෙයින් මේ (ධ්‍යානයද අරමුණද යන) දෙකම එක්කොට විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා'යි යන මෙය කියන ලද්'යි දතයුතුය.

**නත්ථි කිඤ්චි** යනු, කිසිවක් නැත, හිස්ය, පාලුය'යි මෙසේ මෙනෙහි කරමිනි'යි කී-තියායි. විභඞ්ගයෙහි "නත්ථි කිඤ්චි" යනු එකී විඤ්ඤාණයම පිළිබඳව වැඩීම නොකරයි, පහවූ ස්වභාවයට පත්කරයි, අතුරුදන් කරයි, කිසිවක් නැතැ'යි දකියි, එහෙයින් 'නත්ථි කිඤ්චි'යි කියනු ලැබේයයි(1) යමක් පවසනලද්දේද, එය හුදෙක් ක්‍ෂය වශයෙන් (සංස්කාරයන්) බැලීම මෙන් කියනලදි. එහෙත් එහි අර්ථය එසේමයයි දතයුතුය. එම විඤ්ඤාණය ආවර්ජන නොකෙරෙමින්, මෙනෙහි නොකෙරෙමින්, ප්‍රත්‍යවෙක්‍ෂා නොකෙරෙමින්, හුදෙක් නැතිබවම, හිස්බවම, පාලුබවම මෙනෙහි කරමින් එහි නොවැඩීම, පහකිරීම, අතුරුදන් කිරීම කරති'යි කියනුලැබේ. අන් ලෙසකින් නොවේ.

**ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති** යන මෙහි කිසිවක් නැතැ'යි 'අකිඤ්චන' නම්, යටත්පිරිසෙයින් මෙහි භංගමාත්‍රයක් හෝ ඉතිරිව නැතැ'යි කී-තියායි. 'අකිඤ්චන'යෙහි ස්වභාවය (භාවතද්ධිත වශයෙන්) ආකිඤ්චඤ්ඤ නම්. ආකාසානඤ්චායතන-විඤ්ඤාණයෙහි අභාවයට මේ අධිවචනයි. එම ආකිඤ්චඤ්ඤය මෙම ධ්‍යානයට ප්‍රතිෂ්ඨා ස්ථානය'යි යන අරුතින් 'ආයතන වෙතැ'යි, 'දෙවියනට දෙවායතන' යනුවෙන් ආකිඤ්චඤ්ඤායතන නම් වේ. සෙස්ස පෙරකී නයින්ම වේ.

**මේ ආකිඤ්චඤ්ඤායතන කර්මස්ථානය පිළිබඳ විස්තර කථායි.**

## නෙවසඤ්ඤානාසඤ්ඤායතනය

නෙවසඤ්ඤානාසඤ්ඤායතන කර්මස්ථානය වඩනු කැමැති යෝගාවචරයා විසින් (ආවජ්ජන සමාපජ්ජනාදී පෙරකී) පස් ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙහි බෝකල් හුරු පුරුදුවූ හෙයින්, 'මේ සමාපත්තිය සමීපව සිටි විඤ්ඤාණඤ්චායතනය ප්‍රතිපක්‍ෂකොට ඇත්තේය,

(a) අභි. විභංගපාළි - Vbh 262

නෙවසඤ්ඤානාසඤ්ඤායතනය තරම් ශාන්තද නොවේය'යි හෝ, 'සංඥව රෝගයක් වැනිය, සංඥව ගඩක් වැනිය, සංඥව හුලක් වැනිය, යම් මේ නෙවසඤ්ඤානාසඤ්ඤවක් වේද, එය ශාන්තය, එය ප්‍රණීතය'යි හෝ මෙසේ ආකිඤ්චඤ්ඤායතනයෙහි ආදීනවද, මතු (සිවුවැනි ආරූප්‍ය) ධ්‍යානයෙහි ආනිසංසද සලකා ආකිඤ්චඤ්ඤායතයෙහි අභිරුචිය හැර නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ශාන්ත වශයෙන් මෙනෙහිකොට, (ආකාසානඤ්චායතන-විඤ්ඤාණයෙහි) අභාවය අරමුණුකොට පවත්වනලද එම ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියම 'ශාන්තය, ශාන්තය'යි නැවත නැවතත් ආවර්ජන කළයුතුය. මෙනෙහි කළයුතුය, ප්‍රත්‍යවෙක්‍ෂා කටයුතුය, තර්කයට විතර්කයට භාජන කළයුතුය. මෙසේ එම ආකිඤ්චඤ්ඤායතන නිමිත්තෙහි නැවත නැවත සිත හසුරුවන ඔහුගේ නීවරණයෝ යටපත් වෙති, සිහි මනාසේ පිහිටයි, උපචාර සමාධියෙන් සිත සමාධිගත වෙයි. හේ තෙමේ එම නිමිත්ත නැවත නැවතත් සේවනය කරයි, වඩයි, පුරුදු පුහුණු කරයි. මෙසේ පුරුදු කරනවිට විඤ්ඤාණාපගමයෙහි ආකිඤ්චඤ්ඤායතනය සෙයින්ම, ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති සංඛ්‍යාතවූ (නාම) ස්කන්ධ සතරෙහි නෙවසඤ්ඤ නාසඤ්ඤායතනචිත්තය අර්පණාගත වෙයි, මෙහි අර්පණානය යටකී ලෙසින්ම දතයුතුය. මෙපමණෙකින්ම මේ භික්‍ෂු තෙමේ, 'සියලු ආකාරයෙන්ම ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤ-නාසඤ්ඤායතනයට පැමිණ විහරණය කෙරේ"[(1)]යයි කියනු ලැබේ.

මෙහිද **සබ්බසො** (සියලු ආකාරයෙන්) යනු යටකී නයමැයි. **ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම** (ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා) යන මෙහිද පෙරකී නයින්ම ධ්‍යානයද අරමුණද යන දෙකම ආකිඤ්චඤ්ඤායතන යනුයි. අරමුණද පෙරකී නයින්ම ආකිඤ්චඤ්ඤවූයේද එම, තුන්වැනි අරූපධ්‍යානයට අරමුණුවූ හෙයින්, දෙවියනට 'දෙවායතන' යනු මෙන් ප්‍රතිෂ්ඨානාර්ථයෙන්, ආයතන වූයේද එමැ'යි ආකිඤ්චඤ්ඤායතන නම් වේ. එසේම ආකිඤ්චඤ්ඤ වූයේද එම, එම ධ්‍යානයට උත්පත්තිස්ථානවූ හෙයින්, 'කාම්බෝජ දේශය අශ්වයනට ආයතන වේ' යන ආදිය සෙයින් නිපබිමැ'යි යන අරුතින්, ආයතන වූයේද එමැ'යි ආකිඤ්චඤ්ඤායතන නම් වේ. මෙසේ, යම්හෙයකින් මේ ධ්‍යානයද අරමුණද යන දෙකම නොපැවැත්ම ඇති කිරීමෙන්, මෙනෙහි නොකිරීමෙන්, මනාකොට ඉක්මවාම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය උපදවා විහරණය කළයුතුවේද, එහෙයින් මේ දෙකම එක්කොට 'ආකිඤ්චඤ්ඤායතනය මනාකොට ඉක්මවා'යි යන මෙය කියනලද'යි දතයුතුය.

(a) අභි. විභංගපාළි - Vbh 245

**නෙවසඤ්ඤානාසඤ්ඤායතනං** යන මෙහි, යම් සංඥවක් ඇතිවීමෙන් එය නෙවසඤ්ඤ-නාසඤ්ඤායතනයයි කියනුලැබේද, තිසිසේ පිළිපන්නහුට එම සංඥව වේද, එම සංඥව ගෙනහැර දක්වනු පිණිස 'නෙව සඤ්ඤී නාසඤ්ඤී' යනුවෙන් මතුකොට දක්වමින්, 'තඤ්ඤෙව ආකිඤ්චඤ්ඤායතනං සන්තතො මනසිකරොති සංඛාරාවසෙසසමාපත්තිං භාවෙති තෙන වුච්චති නෙවසඤ්ඤීනාසඤ්ඤී"(1) (එම ආකිඤ්චඤ්ඤායතනයම ශාන්ත වශයෙන් ගෙන මෙනෙහි කරයි, සංඛාරාවශේෂසමාපත්තිය වඩයි, එහෙයින් නේවසඤ්ඤීනාසඤ්ඤීයයි කියනු ලැබේ) යනුවෙන් පවසනලදි.

එහි, **සන්තතො මනසිකරොති** යනු, යම් සමාපත්තියක් තුළ වනාහි (විඤ්ඤාණය පිළිබඳ) නැතිබව අරමුණුකොට සිටීද, මේ සමාපත්තිය ඒකාන්තයෙන් ශාන්ත වේයයි මෙසේ ශාන්ත අරමුණු ඇති හෙයින් එය ශාන්තයයි මෙනෙහි කරයි. ඉදින් ශාන්ත වශයෙන් මෙනෙහිකෙරේ නම්, සමතික්‍රමණය කෙසේ සිදුවේද? නොසමවදිනු කැමැතිවීමෙනි. ඒ යෝගාවචර තෙමේ එම ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ශාන්ත වශයෙන් මෙනෙහිකරනුමුත්, ඔහුට 'මම මේ සමාපත්තිය ආවර්ජනය කෙරෙමි, සමවදිමි, ඉටා ගනිමි, එයින් නැඟෙමි, ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙමි'යි යන මේ (පස් ආකාර) චින්‍තනය, යොමුවීම, මනස්කාරය ඇතිනොවේ. කවර හෙයින්ද යත්, ආකිඤ්චඤ්ඤායතනයට වඩා නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ශාන්තද ප්‍රණීතද වනහෙයිනි.

යම්සේ රජෙක් තෙමේ මහත්වූ රාජානුභාවයෙන් මහුලැතු පිට නැඟී නුවර වීථි සංචාරය කරනුයේ ඇත්දත් කැටයම්කරුවන් ආදී ශිල්පීන් එක් වස්ත්‍රයක් තදකොට හැඳ අනෙක් වස්ත්‍රයෙකින් හිස වෙළාගෙන දළසුණු ආදියෙන් වැකුණු සිරුරු ඇතිව ඇත්දළ ආදියෙන් නොයෙක් ආකාර ඇති කැටයම් කරනු දැක "කොල, මේ ආචාර්යයෝ ඉතා දක්‍ෂයහ, මේ මේ ආකාර කර්මාන්ත කෙරෙති"යි මෙසේ ශිල්පීන්ගේ දස්කම් දැක සතුටු වේ, එහෙත් "මටද රාජ්‍යය හැරදමා මෙවන් ශිල්පියකු වන්නට ඇත්නම්" යන මෙවන් අදහසෙක් නම් පහළ නොවේ. කවර හෙයින්ද යත්, රාජ්‍යශ්‍රීය මහත් අනුසස් ඇති හෙයිනි, ඔහු ශිල්පීන් ඉක්මවා යන හෙයිනි. එසේම මෙම යෝගාවචර තෙමේ එම සමාපත්තිය ශාන්ත වශයෙන් ගෙන මෙනෙහි කරනුයේ නමුදු, ඔහුට "මම මේ සමාපත්තිය ආවර්ජන කෙරෙමි, සමවදිමි, ඉටා ගනිමි, එයින් නැඟී සිටිමි, ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙමි"යි යන මේ චින්‍තනය, මේ යොමුවීම, මේ මනස්කාරය ඇති නොවේ, හේ තෙමේ එය ශාන්ත වශයෙන් ගෙන

(a) අභි. විභංගපාළි - Vbh 263

මෙනෙහි කරනුයේ පෙරකී නයින් එය අතිශයින් සියුම්වූ අර්පණාවට පත් (චතුර්ත්‍ථ ආරූප්‍යධ්‍යාන) සංඥවට පැමිණේ, එම සංඥව හේතුකොටගෙන හේ තෙමේ නෙවසඤ්ඤානාසඤ්ඤී නම් වේ, සංඛාරාවශේෂ සමාපත්තිය වඩති'යි කියනු ලැබේ. **සංඛාරාවසෙසසමාපත්ති** යනු ඉතා සියුම් බවට පත් සංඛාර ඇති සිවුවැනි අරූපාවචර සමාපත්තියයි.

දැන් මෙසේ අධිගතවූ සංඥ වශයෙන් යම් ඒ සමාපත්තියක් නෙවසඤ්ඤානාසඤ්ඤ'යයි කියනු ලැබේද, එය අර්ත්‍ථ වශයෙන් දක්වනු පිණිස, "නෙවසඤ්ඤානාසඤ්ඤායතනං" යනු, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන්නහුගේ හෝ පැමිණියහුගේ හෝ එම දෘෂ්ටධර්මසුඛවිහරණ ඇත්තහුගේ හෝ චිත්තචෛතසික ධර්මයෝය'යි[1] කියනලදි. එම (ත්‍රිවිධ) චිත්තචෛතසික ධර්මයන් අතුරෙන්, මෙම සමාපත්තියට සමවන්නහුගේ චිත්තචෛතසික ධර්මයෝ මෙහිලා අභිප්‍රේතයහ. මෙහි වචනාර්ත්‍ථ නම්: ඖළාරිකවූ සංඥ නැති හෙයින්ද, සූක්ෂ්ම සංඥ ඇති හෙයින්ද, සම්ප්‍රයුක්ත ධර්මයන් සහිතවූ මෙම ධ්‍යානයට සංඥවක් නැතැ'යි, (සංඥවක්) නැත්තේද නැතැ'යි නෙවසඤ්ඤානාසඤ්ඤ නම් වේ. නෙවසඤ්ඤානාසඤ්ඤ වූයේද එම, මනායතන ධම්මායතනයනට ඇතුළත්වූ හෙයින් ආයතන වූයේද එමැ'යි නෙවසඤ්ඤානාසඤ්ඤායතන නම් වේ. නොහොත්, මෙහි යම් සංඥවෙක් ඇත්නම්, එය ප්‍රකටලෙස සංඥකෘත්‍යය කරනු නොසමත්වන හෙයින් නෙවසඤ්ඤ නම්ද, සංඛාර වශයෙන් ශේෂව සියුම් ලෙසින් පවත්නා හෙයින් නාසඤ්ඤනම්ද වෙති'යි නෙවසඤ්ඤානාසඤ්ඤ නම් වේ. 'නෙවසඤ්ඤානාසඤ්ඤ' වූයේද එම ශේෂවූ ධර්මයනට ප්‍රතිෂ්ඨාවූ අර්ත්‍ථයෙන්, 'ආයතන' වූයේද එමැ'යි නෙවසඤ්ඤානාසඤ්ඤායතන නම් වේ. මෙම ධ්‍යානයෙහි හුදෙක් සංඥව පමණක් මෙසේ වූයේ නොවේ. වේදනාවද, නෙවවේදනා-නාවේදනා' යනුවෙන් වේ. චිත්තයද, 'නෙවචිත්තං නාචිත්තං' යනුවෙන් වේ, ඵස්සයද, 'නෙව ඵස්සො නාඵස්සො' යනුවෙන් වේ, සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහිද මෙම නයයි. මේ දේශනාව වනාහි 'සඤ්ඤ' යන ශීර්ෂයෙන් කරනලද්දැ'යි දතයුතුය.

පත්තමක්ඛනතෙල (පාත්‍රයෙහි ගැල්වූතෙල්) ආදී උපමා මගින් මෙම අර්ත්‍ථය පැහැදිලි කළයුතුය: සාමණේර කෙනෙක් පාත්‍රයෙහි තෙල් ගල්වා තැබූහ, තෙරුණුවෝ කැඳ බොන අවස්ථාවෙහි, 'පාත්‍රය ගෙනෙව'යි කීහ. සාමණේරයෝ "ස්වාමීනි, පාත්‍රයෙහි තෙල් ඇතැ'යි කීහ, ඉක්බිති, "සාමණේරය, තෙල් ගෙනෙව, නාළිකාව පුරවා තබන්නෙමු'යි කී කල්හි,

---

(a) අභි. විභංගපාළි - Vbh 263

'ස්වාමීනි, තෙල් නැතැ'යි කීහ. එහිදී, යම්සේ ඇතුළත වැකීතුබුණ හෙයින් කැඳ හා සමග නොයෙදේ යන අදහසින් තෙල් ඇතැ'යි කීමද, නාළිකාව පුරවන තරම් නැති හෙයින් 'නැතැ'යි කීමද වේ. මෙසේම, එම සංඥවද ප්‍රකටලෙස සංඥකෘත්‍යය කරනු නොසමත්වන අරුතින් 'නෙවසඤ්ඤ' නම්. සංඛාර වශයෙන් ශේෂව සියුම් බවින් යුතුව විද්‍යමාන වනහෙයින් 'නාසඤ්ඤ' නම්.

මෙහි 'සංඥකෘත්‍ය' යනු කිමෙක්ද යත්: අරමුණ හඳුනා ගැනීමද, විදර්ශනාවට විෂයබවට පැමිණ නිර්වෙදය ඉපැදවීමද යන මේය. ඇල්මැරූ දියෙහි දහනකෘත්‍යය මෙන් තෙජොධාතුව හඳුනාගැනීමේ කෘත්‍යය පවා ප්‍රකටකිරීමට මෙම සංඥව නොසමත් වේ. සෙසු සමාපත්තීන් කෙරෙහිවූ සංඥව මෙන් විදර්ශනාවට විෂයබවට පැමිණ නිර්වේදජනනය කිරීමට පවා මෙය නොසමත්වේ.

අනෙක් ස්කන්ධයන් කෙරෙහි නොකරනලද විදර්ශනා අරමුණු ඇති භික්ෂු තෙමේ නෙවසඤ්ඤනාසඤ්ඤයතන ස්කන්ධයන් සම්මර්ශනය කොට නිර්වෙදයට පැමිණීමට සමත් නොවේමය. වැලිදු, ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ ප්‍රකෘතියෙන්ම විදර්ශනාවට නැඹුරු වූවාහුය, මහාප්‍රඥ ඇත්තාහුය, ශාරීපුත්‍රස්ථවිරයන් හා සමානවූ කෙනෙක්ම (නෙවසඤ්ඤයතනස්කන්ධයන් සම්මර්ශනයකොට නිර්වේදයට පැමිණීමට) සමත් වන්නාහුය. උන්වහන්සේ පවා, 'මෙසේ මේ ධර්මයෝ පවත්නාබවට නොපැමිණ හටගන්නාහුය, හටගෙන විනාශ වන්නාහුය'යි[(1)] කලාප සම්මර්ශන වශයෙන් මිස අනුපද (වෙන් වෙන්ව ගෙන) සම්මර්ශන වශයෙන් නොසමත් වන්නාහුය. මෙම සමාපත්තිය මෙතරම්ම සියුම්බවට ගියේවේ.

'පත්තමක්ඛණතෙල' උපමාවෙන් මෙන්ම 'මග්ගුදක' උපමාවෙන්ද මෙම අර්ථය පැහැදිලි කළයුතුය. මඟට පිළිපන් තෙරුණු කෙනෙකුන්ගේ ඉදිරියෙන් යන සාමණේර කෙනෙක් මඟ දියත්තක් දක, 'ස්වාමීනි, දිය ඇත, වහන් ගැලවුම මැනවැ'යි කීහ. එවිට තෙරුන් විසින්, "ඉදින් දිය ඇත්නම් නහනකඩ ගෙනෙව, නහන්නෙමි"යි කී කල්හි, 'ස්වාමීනි, නැතැ'යි කීහ. එහි වහන් තෙමෙන තරම්ය යන අරුතින් දිය ඇතැ'යිද, නහන තරම්ය යන අරුතින් නැතැ'යි යනුද වේ. එසේම මෙම සමාපත්තිය ප්‍රකටලෙස සංඥකෘත්‍යයන් කරනු නොසමත්වන හෙයින් 'නෙවසඤ්ඤ' නම්වේ. සංඛාර වශයෙන් ශේෂව සියුම්ලෙස විද්‍යමානවූ සංඥ ඇති

(1) ම. නි. අනුපද සූ - M iii 28

හෙයින් 'නාසඤ්ඤා' නම් වේ. හුදෙක් මේ උපමා මගින් පමණක් නොව, අන්‍යවූද සුදුසු උපමා මගින් මෙම අර්ථය පැහැදිලි කළයුතුවේ. **උපසම්පජ්ජ විහරති** යන මෙය පළමුකී නයම වේ.

**මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය පිළිබඳ විස්තර කථායි.**

අසදිසරූපො නාථො ආරුප්පං යං චතුබ්බිධං ආහ
තං ඉති ඤත්වා තස්මිං පකිණ්ණකකථාපි විඤ්ඤෙය්‍යා.

අසදෘශවූ රූපකාය සම්පත්තියක් ඇති ලෝකනාථයන් වහන්සේ චතුර්විධවූ යම් අරූපාවචර සමාපත්තියක් දේශනා කළසේක්ද, එය මෙසේ දැන ඉක්බිති එය පිළිබඳවූ ප්‍රකීර්ණක කථාද දතයුතුය. අරූපාවචර සමාපත්තීහු වනාහි:

ආරම්මණාතික්කමතො චතස්සොපි භවන්ති'මා,
අඞ්ගාතික්කමමෙතාසං න ඉච්ඡන්ති විභාවිනො.

**අරමුණු ඉක්මවීමෙන් මේ අරූපාවචර සමාපත්තීහු සතරෙක් වෙති, මොවුන් පිළිබඳව ධ්‍යානාංග ඉක්මවීමක් නුවණැත්තෝ නොරුස්වති.**

මෙම අරූපාවචර සමාපත්තීන් අතුරෙන් පළමුවැන්න (කසිණරූප සංඛ්‍යාත) නිමිත්ත ඉක්මවීමෙන් සිද්ධවේ. දෙවැන්න ආකාශය පිළිබඳ නිමිත්ත ඉක්මවීමෙන්ද, තුන්වැන්න ආකාශවිෂයෙහි පවත්වනලද විඤ්ඤාණය ඉක්මවීමෙන්ද, සිවුවැන්න ආකාශ විෂයෙහි පවත්වනලද විඤ්ඤාණාපගමය ඉක්මවීමෙන්ද සිද්ධවේ. මෙසේ සියලු ආකාරයෙන් අරමුණු ඉක්මවීමෙන් මේ අරූපාවචර සමාපත්ති සතරම සිද්ධවෙති'යි දතයුතුය. මෙම අරූපාවචර සමාපත්තීන් පිළිබඳව ධ්‍යානාංග ඉක්මවීමක් පණ්ඩිතයෝ නොරුස්වති. රූපාවචර සමාපත්ති විෂයෙහි මෙන් මෙම අරූපාවචර සමාපත්ති විෂයෙහි ධ්‍යානාංග ඉක්මවීමෙක් නැත. මේ සියලු අරූපාවචර සමාපත්ති විෂයෙහි උපෙක්ෂා, චිත්තෛකාග්‍රතා යන ධ්‍යානාංග දෙක පවතී. මෙසේ වතුදු:

සුප්පණීතතරා හොන්ති පච්ඡිමා පච්ඡිමා ඉධ
උපමා තත්‍ථ විඤ්ඤෙය්‍යා පාසාදතලසාටිකා.

මෙහි පසු පසුව එන සමාපත්තිය (පළමු පළමු සමාපත්තියට වඩා) ඉතා ප්‍රණීතකර වේ. එහිලා ප්‍රාසාදතල හා සාටිකාවන් පිළිබඳ උපමා දතයුතුය.

යම්සේ වනාහි සිවුමහල් පහයෙක යටිතලයෙහි දිව්‍යවූ නෘත්‍ය-ගීත-වාදිත-සුගන්ධ-මාලා-භොජන-ශයන-වස්ත්‍රාදී වශයෙන් ප්‍රණීතවූ පංචකාමගුණයෝ එළවනලද්දහු වෙත්ද, දෙවැනි තලයෙහි එයට වඩා ප්‍රණීතතරවූ, තෙවැනි තලයෙහි එයටද වඩා ප්‍රණීතතරවූ, සිව්වැනි තලයෙහි එයටද වඩා ප්‍රණීතතරවූ පංචකාමගුණයෝ වෙත්ද, එසේ වතුදු ඒ සතරම එකම පහයෙහි තලයෝම වෙත්ද, ප්‍රාසාදතල වශයෙන් ඔවුන්ගේ විශේෂයෙක් නැත්ද, පංචකාම ගුණයන්ගේ සමෘද්ධවීම් වශයෙන්ම යටි යටි තලයට වඩා මතු මතු තලය ප්‍රණීතතර වේද, තවද එක්ම ස්ත්‍රියක විසින් කටිනලද දළවූද, සිනිඳුවූද, සිනිඳුතරවූද, සිනිඳුතමවූද හුයෙන් කළ සිවුපට, තුන්පට, දෙපට, තනිපට සළු සතරෙක් වේද, දිගින් පළලින් සමප්‍රමාණ වේද, එම සළු සතරම දිගින් පළලින් සමප්‍රමාණ වූයේ ප්‍රමාණ වශයෙන් විශේෂයක් නැති නමුදු, සුවපහස, සියුම්බව, මහඟුබව යන මෙයින් පළමු පළමු සළුවට වඩා පසු පසු සළුව ප්‍රණීතතර වේද, එසේම මේ සතරෙහිම උපෙක්‍ෂා, චිත්තෛකාග්‍රතා යන මේ අංග දෙකම විද්‍යමානවන නමුදු, භාවනාවිශේෂ වශයෙන් ඒ ඒ අංගයන් ප්‍රණීතතර වනහෙයින් මෙහි පසු පසුව එන සමාපත්තිය වඩ වඩා ප්‍රණීත වෙතැ'යි දතයුතුය.

මෙසේ අනුපිළිවෙළින් වැඩි වන මේ ප්‍රණීතතාව:

අසුචිම්හි මණ්ඩපෙ ලග්ගො එකො, තන්නිස්සිතො පරො,<br>
අඤ්ඤො බහි අනිස්සාය තං තං නිස්සාය චාපරො

ඨිතො, චතුහි එතෙහි පුරිසෙහි යථාක්කමං,<br>
සමානතාය ඤතබ්බා චතස්සොපි විභාවිනා.

අපිරිසුදු තැනෙක තනන ලද මණ්ඩපයෙක්හි එල්බ සිටි එක් පුරුෂයෙකි, ඔහු ඇසුරින් සිටි අනෙකෙකි, ඔහුට නොළංව පිටතින් සිටි වෙනෙකෙකි, ඔහු (තුන්වැන්නා) වෙත සිටි තවෙකෙකි.

මේ පුරුෂයන් සිවුදෙනා හා සමානත්වයෙන් මේ සමාපත්ති සතර නුවණැත්තහු විසින් පිළිවෙළින් දතයුතුවේ.

එහි අර්ථපෞ යෝජනාව මෙසේය: අපවිත්‍ර තැනෙක්හි ඉදිකළ එක්තරා මණ්ඩපයෙක් වේ. ඉක්බිති එක්තරා පුරුෂයෙක් එහි අවුත් එම අසුචි පිළිකුල් කරමින් අත්වලින් මණ්ඩපයෙහි එල්බගෙන එහි ඇලීගිය ආකාරයෙන් සිටියේය. ඉක්බිති අනෙකෙක් අවුත් මණ්ඩපයෙහි ලැගි ඒ පුරුෂයා ළඟින් සිටියේය; ඉන් ඉක්බිති වෙනත් පුරුෂයෙක් අවුත් මෙසේ සිතීය. "මේ මණ්ඩපයෙහි එල්බ සිටි පුරුෂයාද ඔහු වෙත ලැගී සිටි අනෙකාද යන මේ දෙදෙනාම නොමනාව සිටියාහු වෙති, මණ්ඩපය බිඳී වැටුණහොත් දෙදෙනාාම එහි වැටෙනු නියතය, එහෙයින් මම් පිටතින් සිටිමි"යි මණ්ඩපයෙහි එල්බ සිටියහු වෙත සිටි (දෙවැනි) පුරුෂයාගෙන් ඈත්ව පිටත රැඳී සිටියේය. අනතුරුව තවත් (සිවුවැනි) පුරුෂයෙක් පැමිණ මණ්ඩපයෙහි එල්බ සිටියහුද ඔහු වෙත සිටි අනෙකාද යන දෙදෙනාගේම අවදනම්බව සලකා පිටතින් සිටියහු (තෙවැන්නා) මනාව සිටියහ'යි හැඟ ඔහු වෙත සිටියේය.

එහි, කසිණය ඉගිලවූ ආකාශය අසුචියෙහි සිටි මණ්ඩපය වැනියයි දතයුතුය, රූපාවචර අරමුණු කෙරෙහි පිළිකුලින් ආකාශය අරමුණුකොට සිටි ආකාසානඤ්චායතනය අසුචිය කෙරෙහි පිළිකුලින් මණ්ඩපයෙහි එල්බ සිටි පුරුෂයා වැනියයි දතයුතුය, ආකාසානඤ්චායතනය නිසා පැවති විඤ්ඤාණඤ්චායතනය මණ්ඩපයෙහි එල්බ සිටි පුරුෂයා ඇසුරුකොට සිටියහු (දෙවැන්නා) වැනියයි දතයුතුය, ආකාසානඤ්චායතනය, අරමුණු කොටනොගෙන එහි අභාවය අරමුණුකොට ඇති ආකිඤ්චඤ්ඤායතනය, ඔවුන් (පළමුවැනි දෙවැනි) දෙදෙනාගේම අරක්ෂිතතාව සලකා මණ්ඩපයෙහි සිටියවුන්ගෙන් ඈත්ව පිටත රැඳීසිටියහු (තෙවැන්නා) වැනියයි දතයුතුය, විඤ්ඤාණාභාව සංඛ්‍යාතවූ බැහැර පෙදෙස්හි සිටි ආකිඤ්චඤ්ඤායතනය නිසා පැවැති නෙවසඤ්ඤානාසඤ්ඤායතනය මණ්ඩපයෙහි එල්බ සිටියහුගේද ඔහු වෙත ලැගී සිටියහුගේද අරක්ෂිතතාව සලකා, පිටත සිටියහු මනාව සිටියහ'යිද හැඟ, ඔහු ඇසුරුකොට සිටියහු වැනියයි දතයුතුය.

මේ ආකාරයෙන් පවත්වනු ලබන්නාවූද

> ආරම්මණං කරොතෙව අඤ්ඤාභාවෙන තං ඉදං,
> දිට්ඨදෙසම්පි රාජානං වුත්තිහෙතු ජනො යථා.

මේ (නෙවසඤ්ඤානාසඤ්ඤායතනය) අන් අරමුණක් නැති බැවින් එම (ආකිඤ්චඤ්ඤායතනය) අරමුණු කෙරේමැයි, ජනයා ජීවනවෘත්තිය හේතුකොටගෙන, දක්නාලද දෙස් ඇත්තාවූද රජකු ඇසුරු කරනු සේය.

මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය වනාහි, 'මේ සමාපත්තිය වූකලී ළංව සිටි විඤ්ඤාණඤ්චායතන නමැති ප්‍රත්‍යනීකය (ප්‍රතිවිරුද්ධභාවය) ඇත්තේය'යි මෙසේ දක්නාලද දෙස් සහිතවූද ආකිඤ්චඤ්ඤායතනය, අන් අරමුණක් නැති බැවින් අරමුණු කෙරේමැයි. කුමක් මෙන්ද යත්, ජනයා ජීවන වෘත්තිය හේතුකොටගෙන දක්නාලද, දෙස් ඇත්තාවූද රජකු ඇසුරු කරනු මෙනි. යම්සේ, නොදමුණු, සැඩපරුෂවූ කායවාක් මනොසමාචාර සහිතවූද සියලු දිශාවනට අධිපතිවූ කිසියම් රජකු, 'මොහු රළු පැවතුම් ඇත්තෙකැ'යි මෙසේ දක්නාලද දෙස් ඇත්තකු වුවද, අන් තැනෙක වෘත්තියක් නොලබන ජනයා වෘත්තිහේතුවෙන් ඇසුරු කෙරෙත්ද, එසේම මෙම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, දක්නාලද දෙස් ඇත්තාවූද ආකිඤ්චඤ්ඤායතනය, අන් අරමුණක් නොලබන හෙයින් අරමුණු කෙරේමය.

මෙසේ (අරමුණු) කරන්නාවූද (නෙවසඤ්ඤානාසඤ්ඤායතනය)

ආරුළ්හෝ දීඝනිස්සෙණිං යථා නිස්සෙණිබාහුකං,
පබ්බතග්ගඤ්ච ආරුළ්හෝ යථා පබ්බතමත්ථකං.

යථා වා ගිරිමාරුළ්හෝ අත්තනො යෙව ජණ්ණුකං,
ඔලුබ්භති තථාවෙතං ඣානමොලුබ්භ වත්තති.

යම්සේ දික් හිණිමගකට නැංගේ තමාට ඉහළින් ඇති හිණ ඇන්ද (අතින්) ගන්නේද, යම්සේ කන්දකට නැංගේ කඳුමුදුනෙහි එල්බේද,

තවද ගිරිකුළකට නැංගේ තමාගේම දණෙහි හෝ එල්බේද, එසේම, මේ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයෙහි එල්බ පවත්නේය.

**මෙතෙකින්, සාධුජන ප්‍රමොදය පිණිස කළ විශුද්ධිමාර්ගයෙහි සමාධිභාවනාධිකාරයෙහි ආරුප්පනිද්දේස නම්වූ දසවන පරිච්ඡේදය නිමියේය.**

# 11. සමාධි නිර්දේශය

## ආහාරෙ පටික්කූලසඤ්ඤා භාවනාව

ආරුප්ප සමාපත්තීනට අනතුරුව 'එකා සඤ්ඤා' යනුවෙන් මෙසේ දක්වනලද ආහාර විෂයෙහි ප්‍රතිකූල සංඥාව පිළිබඳ භාවනා නිර්දෙශය අනුපිළිවෙළින් පැමිණියේය. එහි ආහරති (එළවයි යන අරුතින්) 'ආහාර' නම්. එම ආහාරය කබලිංකාර ආහාරය, ස්පර්ශ ආහාරය, මනොසඤ්චෙතන ආහාරය, විඤ්ඤාණ ආහාරයයි සිවු වැදෑරුම් වේ. මෙහි, කවරෙක් කවරක් එළවාද යත්, කබලිංකාර ආහාරය ඔජො ගුණය අටවැනිකොට ඇති රූපය එළවයි, ස්පර්ශ ආහාරය වෙදනාත්‍රයය එළවයි, මනොසංචෙතන ආහාරය තුන් භවයෙහි ප්‍රතිසන්ධිය එළවයි, විඤ්ඤාණ ආහාරය පිළිසිඳි කෙණෙහි නාමරූප යන දෙක එළවයි. එම ආහාරයන් අතුරෙන් කබලිංකාර ආහාර විෂයෙහි ආශාව හෙවත් තෘෂ්ණාව නමැති බිය ඇත, ස්පර්ශාහාර විෂයෙහි උපගමන (හෙවත් අරමුණු හා සමඟ එක්වීම) නමැති බිය ඇත, මනොසඤ්චෙතනාහාර විෂයෙහි උප්පත්ති (හෙවත් දුකට හේතුවීමේ) බිය පවතී, විඤ්ඤාණාහාර විෂයෙහි පටිසන්ධි (හෙවත් පිළිසිඳීමේ) බිය පවතී. මෙසේ බිය සහිතවූ මේ ආහාරයන් අතුරෙන් කබලිංකාර ආහාරය පුත්‍රමාංසූපමාවෙන් පැහැදිලි කළයුතුය. ස්පර්ශාහාරය සමගසනලද ගවයකු පිළිබඳ උපමාවෙන්ද. මනොසංචෙතනාහාරය අඟුරුවළක් පිළිබද උපමාවෙන්ද, විඤ්ඤාණාහාරය සත්තිසූල (හෙවත් කැති හුල්) උපමාවෙන්ද පැහැදිලි කළයුතුවේ.

මේ සිවු වැදෑරුම් ආහාරයන් අතුරෙන් බිදීමය, බීමය, කෑමය, ලෙවීමය යන සිවු ආකාර ඇති කබලිංකාර ආහාරය මෙහිලා අභිප්‍රෙත වේ. එම ආහාරයෙහි පිළිකුල්බව ගැනීම් වශයෙන් උපන් සංඥාව ආහාරෙ පටික්කූලසඤ්ඤා නම් වේ. එම ආහාරෙ පටික්කූලසඤ්ඤා භාවනාව වඩනු රිසියහු විසින් කමටහන උගෙන, උගත් දෙයින් එක් පදයක් හෝ නොවරදවා හුදකලාව විවෙකසුවයෙන් යුතුව, බිදීමය, බීමය, කෑමය, ලෙවීමය යන ප්‍රභේද සහිත කබලිංකාර ආහාරයෙහි පිළිකුල්බව දශ ආකාරයෙකින් ප්‍රත්‍යවෙක්ෂා කටයුතුය. කෙසේදයත් ගමන් වශයෙන්, සෙවීම් වශයෙන්, වැළඳීම් වශයෙන්, ආශ්‍රයස්ථාන වශයෙන්, නිධානස්ථාන වශයෙන්, නොපැසවුණු ආහාර වශයෙන්, පැසවුණු ආහාර වශයෙන්, ඵල වශයෙන්, වැගිරීම් වශයෙන් හා වැකීම් වශයෙනි.

එහි **ගමනතො** (ගමන් වශයෙන්) යනු, මෙවන් මහ අනුසස් ඇති සස්නෙහි පැවිදිවූවහු විසින් මුළු රාත්‍රියම බුද්ධවචනය සජ්ඣායන

කිරීම හෝ ශ්‍රමණධර්මය පිළිපැදීම කොට වේලාසනින්ම නැගිට සැමලු බෝමලුවත් නිමකොට පියයුතු පරිභෝග කළයුතු පැන් එළවා පිරිවෙන් හැමද සිරුරු පිළිදගුම් කොට අස්නට නැඟ විසිතිස් වරක් කමටහන මෙනෙහිකොට නැගිට පාසිවුරු ගෙන ජනාකීර්ණ නොවූ, විවේකසුව ඇති, සෙවණින් හා ජලයෙන් අනූනවූ, පිරිසුදුවූ, සිහිල්වූ, රමණීය බිම් පෙදෙස් ඇති, තපෝවනය හැර උතුම්වූ විවේකරතිය අපේක්‍ෂා නොකොට, සොහොනක් බලා යන සිවලකු ලෙසින් අහර පිණිස ගම බලා යායුතුය. මෙසේ යන්නහු විසින්ද, ඇඳෙන් හෝ පුටුවෙන් බට තැන් පටන් පාදූවිලි සුණු-වසුරු ආදියෙන් වැකුණු බුමුතුරුණු මත පා තැබිය යුතුවේ, ඉක්බිති ඇතැම් දිනෙක මී-වසුරු වවුල්-වසුරු ආදියෙන් වැකුණු හෙයින් ඇතුල්ගෙටත් වඩා පිළිකුල්වූ ආලින්දය දක්ක යුතුවේ. ඉක්බිති බකමුහුණු පරෙවි ආදීන්ගේ වසුරින් වැකුණුහෙයින් උඩුමහලටත් වඩා පිළිකුල් දනවන යටිමහල දක්ක යුතුවේ. ඉක්බිති ඇතැම් දිනෙක සුළඟින් කැළඹී ගිය තණ පරණලාවලින්ද, ගිලන් සාමණේරයන්ගේ මල-මූ කෙළ-සොටු හා වැසි කාලයෙහි දිය, කලල්, වගුරු ආදියෙන්ද වෙසෙසින් අපවිත්‍රවූ හෙයින් යටිමහලටද වඩා පිළිකුල් දනවන පිරිවෙන දක්ක යුතුවේ. පිරිවෙණටද වඩා පිළිකුල් දනවන වෙහෙරට වදනා මඟ දක්ක යුතුවේ. පිළිවෙළින් චෛත්‍යයද බෝධියද වැඳ විතක්කමාලකයෙහි සිට, මුතුගොඩක් බඳු චෛත්‍යයද මොනරපිල් කළඹක් බඳු බෝධිවෘක්‍ෂයද දෙව්විමනක් සෙයින් සශ්‍රීකවූ සෙනස්නද බලා, 'මෙවන් රමණීය පෙදෙසකට පිටුපා අහර සොයා යායුතු වන්නේය'යි සිතමින් ගමට පිවිසෙන මහට බට විට කටු කොහොල් සහිතවූද, සෝදපාලුවෙන් කැඩී බිඳී විෂමවී ගියාවූද මඟ දක්ක යුතුවේ.

ඉක්බිති ගඩක් (තුවාලයක්) වසන්නකු මෙන් අඳනය හැඳ, වණයක් ඔතන රෙදිපටියක් වැනි පටිය බැඳ. ඇටගොඩක් වසන්නකු සෙයින් සිවුර පොරවා, බෙහෙත් කබලක් ගන්නකු සෙයින් පාත්‍රය ගෙන, ගම්දෙර සමීපයට පැමිණිවිට, ඇත්කුණප, අස්කුණප, ගවකුණප, මිනිස්කුණප, සර්පකුණප, බලුකුණප ආදියද දක්ක යුතුවේ. හුදෙක් දක්ක යුතුවා පමණක් නොව, නහය පාරවන දුර්ගන්ධයද ඉවසිය යුතුවේ. ඉක්බිති ගම්දෙර සිට චණ්ඩ හස්ති අශ්ව ආදීවූ උවදුරු වලක්වනු පිණිස ගමට වදනා මංපෙත් බැලිය යුතුවේ. මෙසේ මේ බුමුතුරුණෙහි පටන් නොයෙක් කුණපජාතීන් කෙළවරකොට ඇති පිළිකුල් උපදවන ද පැගිය යුතුද, දක්ක යුතුද, ඉවසිය යුතුද වන්නේය. "අහෝ! මේ ආහාරය පිළිකුල් වන්නේය"යි මෙසේ ගමන් වශයෙන් පිළිකුල්බව මෙනෙහි කළයුතුය.

**පරියෙසනතො** (සෙවීම් වශයෙන්) කෙසේද යත්: මෙසේ ගමන් වශයෙන් පිළිකුල්බව ඉවසාගෙන ගමට පිවිස සඟලසිවුර පොරවාගෙන, කබලක් අතින් ගත් දිළිඳු මිනිසකු මෙන් ගම් වීදිවල ගෙපිළිවෙළින් හැසිරිය යුතුවේ. එම වීථි වැසි කල්හි, පා තැබූ තැබූ තන්හි ගොප්මස දක්වා දිය මුසු වගුරෙහි එරෙයි. එක් අතෙකින් පාත්‍රය ගතයුතුවේ. අනෙක් අතින් සිවුර එසවිය යුතුවේ. ගිම්කල්හි සුළං පහරින් නැගෙන පස් කොළරොඩු සහිත දූවිල්ලෙන් වැකුණු සිරුරු ඇතිව හැසිරිය යුතුවේ, ඒ ඒ ගෙදෙරට පැමිණ මාලු සේදූ මස් සේදූ සහල් සේදූ දියද, කෙළ සොටු බලු-වසුරු හූරු-වසුරු ආදියද මුසුවූ පණුකැලන් තිලමැස්සන් ගැවැසීගත් අගල්ද, ගවරවළවල්ද දක්ක යුතුද පෑගිය යුතුද වේ, එම අගල්වලින් ගවරවළවලින් නැඟි මැස්සෝ සහල සිවුරෙහිද, පාත්‍රයෙහිද, හිසෙහිද වසාගෙන සිටිති. ගෙයකට පිවිසි කල්හිද කිසිවෙක් දෙති, කිසිවෙක් නොදෙති. දෙනවිටද ඇතැමෙක් පෙර දින පිසූ බත්ද, කල් ඉක්ම ගිය කැවිලිද, පිළුණුවූ පිට්ටු කැවුම් ආදියද දෙති. නොදෙන්නාහුද කිසිවෙක්, 'වහන්ස, අන් තැනෙකට වැඩිය මැනවැ'යි කියති. කිසිවෙක් නොදුටුවන්ව මුවෙන් නොබැණ සිටිති. කිසිවෙක් අනෙකකුගේ මුහුණ බලති. කිසිවෙක්, 'කොල මුඩුමහණ, වෙනතෙක යව'යි යන මේ ආදී රළු බස් බෙණෙති. මෙසේ දිළිඳු මිනිසකු මෙන් ගම්හි පිඬු සිඟා නික්මිය යුතුය. මෙසේ ගමට පිවිසි තැන් පටන් එයින් නික්මෙන තුරු දියවගුරු ආදී පිළිකුල්සහගත දෑ ආහාරය නිසා ඇක්මියයුතුද, දක්කයුතුද, ඉවසියයුතුද වේ. 'අහෝ මේ ආහාරය ඒකාන්තයෙන්ම පිළිකුල් සහගතය'යි මෙසේ සෙවීම් වශයෙන් පිළිකුල් බව මෙනෙහි කළයුතුය.

**පරිභොගතො** පරිභොග වශයෙන් කෙසේද යත්: මෙසේ ආහාරය සොයාගත් පසු ගමෙන් පිටත පහසු තැනෙක්හි සුවසේ හිඳ, යම්තාක් එහි අත නොබහාද ඒතාක් ගරුතන්හි සිටි භික්ෂු කෙනෙකුන් හෝ ලජ්ජී ගුණ ඇති මිනිසකු හෝ දක 'වළඳනු මැනැව'යි ඇරයුම් කළ හැකිය. වළඳනු කැමැතිව එය තුළට අත බහාලීම් පමණින් 'අහර වළඳනු මැනවැ'යි කියන්නට පවා ලජ්ජා වියයුතුවේ. අත බහා මඩිනකල පස් ඇඟිලි ඔස්සේ දහදිය වැහෙමින් වියලී දැඩිවූ බත් පවා තෙමමින් මොලොක් බවට පමුණුවයි. ඉක්බිති හැනීමෙන් නිෂ්ප්‍රභවී ගිය (ඉදුල්වූ) එම ආහාරය පිඩුකොට මුවෙහි තැබූවිට යටි ඇන්දෙහි දත් වණ කිස (වංගෙඩියෙන් කැරෙන කාර්යය)ද උඩු ඇන්දෙහි දත් මොහොල් කිසද, දිව අත් කිසද සම්පූර්ණ කරයි. එම ආහාරය බල්ලනට අහර දෙන ඔරුවක් තුළ බලු අහර පිඩක් සෙයින් දත් මොහොලින් කෙටී දිවෙන් ඒ මේ අත පෙරළෙමින් දිවගින් වැහෙන තුනී කෙළවලින් වැකේ. දිව මැද පටන් බොල් කෙළවලින්

වැකේ. දැහැට් නොවදනා තන්හි දත් මැලියමින් වැකේ. මෙසේ එම ආහාරය ඇඹරෙමින් හැනෙමින් එකෙණෙහි අතුරුදන්වූ වර්ණ-ගන්ධ සංස්කාර විශේෂ ඇතිව බල්ලනට ආහාර දෙන ඔරුවෙක තිබෙන බලු වමනයක් මෙන් අතිශයින් පිළිකුල් බවට පත්වන්නේය. මෙබඳු වූයේ නමුදු ඇස්හමුව ඉකුත්වූ හෙයින් ගිලියයුතුබවට පැමිණෙතැ'යි මෙසේ පරිභෝග වශයෙන් පිළිකුල්බව මෙනෙහි කළයුතුය.

**ආසයතො** (ආශය වශයෙන්) කෙසේදයත්: මෙසේ පරිභොගයට පැමිණියාවූද මෙම ආහාරය (සිරුර) ඇතුළතට පිවිසෙනුයේ යම් හෙයකින් බුදු පසේබුදුවරයනට වුවද, සක්විති රජකුහට වුවද, පිත්, සෙම්, පූයා, ලෙහෙ යන සතරින් එකක් ආශය වන්නේද, මඳ පිනැත්තවුනට වනාහි මේ සතරම ආශය වන්නේද, එහෙයින් යමකුහට පිත්තාශය අධික වේ නම්, ඔහුට ගත මී තෙලින් වැකුණක් මෙන් අතිශයින් පිළිකුල් වේ. යමකුහට ශ්ලේෂ්මාශය අධික වේනම්. නාගබලා (කැලිය) කොළයුෂයෙන් වැකුණාක් මෙන්ද, යමකුහට පූයා අංශය අධික වේනම්, ඔහුට පිළුණු මෝරුවලින් වැකුණාක් මෙන්ද, යමකුට ලෙහෙ ආශය අධික වේනම්, ඔහුට සායම් වැකුණාක් මෙන්ද අතිශයින් පිළිකුල් වෙය'යි මෙසේ ආශය වශයෙන් පිළිකුල්බව මෙනෙහි කළයුතුය.

**නිධානතො** (නිධාන වශයෙන්) කෙසේද යත්: එම ආහාරය මේ සතර ආශයන් අතුරෙන් එක් ආශයෙකින් වැකී කුසතුළට පිවිස රන් බඳුනෙක හෝ මිණිරුවන් ආදියෙන් කළ බඳුනෙක හෝ නොපිහිටයි, ඉදින් එය දසහැවිරිදි වූවකු විසින් පරිභෝග කරනලදුයේ නම් දසහවුරුද්දක් නොසේදූ වැසිකිළියක් බඳු තැනෙක පිහිටයි, ඉදින් විසි-තිස්-සතළිස්-පණස්-සැට-සැත්තෑ-අසූ-අනූ හැවිරිදි වූවකු විසින්, -පෙ- ඉදින් සියක් හැවිරිදි වූවකු විසින් පරිභෝග කරනලදුයේ නම් සියක් හවුරුද්දක් නොසේදූ වැසිකිළියක් වැනි තැනෙක පිහිටයි. මෙසේ නිධාන වශයෙන් පිළිකුල්බව මෙනෙහි කළයුතුය.

**අපරිපක්කතො** (නොපැසුණු අහර වශයෙන්) කෙසේදයත්: එම ආහාරය මෙබඳුවූ අවකාශයෙහි නිදන්බවට ගියේ යම්තාක් නොපැසුණේද ඒතාක් යථෝක්ත ප්‍රකාර ඇති ඉතා අඳුරු, නොයෙක් කුණුගඳ වැහෙන වාතය විසිරෙන ඉතා දුගඳ පිළිකුල් ආමාශ ප්‍රදේශයෙහි, යම්සේ නියඟෙක්හි වට අකල් වැස්සෙකින් සැඩොල් ගම්දෙර වළෙක වැටුණු කොළරොඩු, පැදුරුමාලු කැබැලි හා සර්ප, බලු, මිනිස් ආදීන්ගේ මළ සිරුරු ආදිය හිරු රැසින් කැකැරෙමින් පෙණ බුබුලු නංවමින් තිබේද, එසේම එදවස, පෙරදවස, ඉතුදු පෙර දවස බුදිනලද අහර සියල්ල එකට එක්වී සෙම්

පටලින් වෙළී සිරුරු රස්නෙන් කැකැරී, කැකැරීමෙන් හටගත් පෙණ බුබුලුවලින් ගැවසීගෙන ඉතා පිළිකුල්බවට පත්ව සිටිනේය'යි මෙසේ නොපැසවුණු අහර වශයෙන් පිළිකුල්බව මෙනෙහි කළයුතුය.

**පරිපක්කතො** (පැසවුණු අහර වශයෙන්) කෙසේද යත්: එම ආහාරය ජඨරාග්නියෙන් පැසවෙමින්, අමුරන් අමුරිදී ආදිය (රත්වූ කල) මෙන් රන් රිදී ආදිය බවට පත්නොවේ, පෙණ බුබුලු නංවමින්, සිහින්-දහව අඹරා නළයෙක්හි බහනලද පඬුවන් මැටි මෙන් මලබවට පැමිණ පක්වාශයද, මූත්‍රබවට පැමිණ මූත්‍රාශයද පුරවා සිටිනේය'යි මෙසේ පැසුවුණු අහර වශයෙන් පිළිකුල්බව මෙනෙහි කළයුතුය.

**ඵලතො** (ඵල වශයෙන්) කෙසේද යත්: මෙම ආහාරය මැනවින් පැසවෙනුයේ කෙස්, ලොම්, නිය, දත් ආදී නන් වැදෑරුම් කුණපයන් නිපදවයි, නොමනාව පැසවෙනුයේ දද, කණ්ඩු, සොරි, කුෂ්ඨ, පාණ්ඩු, ක්‍ෂය, කාස, අතිසාර ආදී සිය ගණන් රෝග උපදවයි. මේ මෙම ආහාරයෙහි ඵලය වන්නේය'යි මෙසේ ඵල වශයෙන් පිළිකුල්බව මෙනෙහි කළයුතුය.

**නිස්සන්දතො** (වැගිරීම් වශයෙන්) කෙසේද යත්: මෙම ආහාරය බුදිනු ලබනුයේ එක් දොරෙකින් පිවිස, වැගිරෙනුයේ ඇස්වලින් කබද, කන්වලින් කලාඳුරුද්ද'යි ආදී වශයෙන් නොයෙක් දොරවලින් වැගිරෙයි, අනුභව කරනවිට මෙම ආහාරය මහපිරිවර සමග අනුභව කරනු ලැබේ. (මලමූත්‍ර ආදිය බවට හැරී) වැගිරෙනවිට හුදෙකලාවම පහ කරනු ලැබේ. පළමු දවසෙහි අහර බුදිනවිට තුටුපහටුද වෙයි, ඔදවැඩි සිත් ඇත්තේද වෙයි, ප්‍රීතියෙන් සොම්නස් වූයේද වෙයි, දෙවන දිනයෙහි වගුරුවනුයේ හැකුලුණු නහය ඇතිව, විරූපවූ මුහුණු ඇතිව, පිළිකුල් කරමින් සැහැවී සිට පහකරයි, පළමු දවස්හි ඇලුම් ඇතිව, ගිජුව, ආශාවෙන් බැඳී, (රසතෘෂ්ණාවෙන්) මුසපත්ව අනුභවකොට එක් රැයක් ඇවෑමෙන් දෙවැනි දවස්හි ඇලුම් නැතිව, හැකිලෙමින්, ලජ්ජාවෙන්, පිළිකුල් කරමින් පහ කරයි. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:

"අන්නං පානං ඛාදනීයං භොජනඤ්ච මහාරහං,
එකද්වාරෙන පවිසිත්වා නවද්වාරෙහි සන්දති.

අන්නං පානං ඛාදනීයං භොජනඤ්ච මහාරහං,
භුඤ්ජති සපරිවාරො නික්ඛාමෙන්තො නිලීයති.

අන්නං පානං ඛාදනීයං භොජනඤ්ච මහාරහං,
භුඤ්ජති අභිනන්දන්තො නික්ඛාමෙන්තො ජිගුච්ඡති.

අන්නං පානං ඛාදනීයං භොජනඤ්ච මහාරහං
එකරත්තිපරිවාසා සබ්බං භවති පූතිකං"ති.

ආහාරපානද, කැයුතු දෑද, මාහැඟි භෝජනද එක් දෙරෙකින් පිවිස නව දෙරෙකින් වැගිරෙයි.

ආහාරපානද, කැයුතු දෑද, මාහැඟි බොජුන්ද පිරිවර හා සමඟ වළඳයි, පහකරනවිට සැඟවෙයි.

ආහාරපානද, කැයුතු දෑද, මාහැඟි බොජුන්ද තුටු පහටු වෙමින් වළඳයි, පහකරනවිට පිළිකුල් කරයි.

ආහාරපානද, කැයුතු දෑද, මාහැඟි බොජුන්ද එක් රැයක් ගතකිරීමෙන් පසු සියල්ල පිළිකුල් වෙයි.

මෙසේ වැගිරීම් වශයෙන් පිළිකුල්බව මෙනෙහි කළයුතුය.

**සම්මක්ඛනතො** (වැකීම් වශයෙන්) කෙසේදයත්: මෙම ආහාරය පරිභෝග කරනවිටද අත්, තොල්, දිව, තල්ල යන මෙහි වැකෙයි, එම අවයව ආහාරයෙන් වැකුණුවිට පිළිකුල් උපදවයි, සේදූ කල්හි පවා ගඳ ඇරීම පිණිස යලි යලිදු සේදිය යුතුවේ. පරිභෝගකළ පසුද, බත පැසෙන කල වීපොතු, සුන්සාල්, කුඩු ආදිය උතුරා ගොස් සැළි-මුවවිට මූඩිපියන් ආදියෙහි වැකෙයිද, එසේම මුළු සිරුර පුරා පැතිරී පවත්නා සිරුරු රස්නෙන් පෙන නඟිමින් උතුරා යනුයේ දත්වල මැලියම් ලෙසින්ද, දිව් තලු ආදියෙහි කෙළ, සෙම ආදිය ලෙසින්ද, ඇස්, කන්, නහ, අධොමාර්ගාදියෙහි කබ, කළාදුරු, සොටු, මලමූත්‍රාදිය ලෙසින්ද, වැකෙයි. අහරින් වැකුණු මේ ද්වාරයෝ දිනපතා දෙවිනු ලබන්නාහුද පිරිසුදු නොවෙති. මනරම්ද නොවෙති. මෙකී ද්වාරයන් අතුරෙන් සමහරක් දෙවිනු ලබනුයේ ගොමමැටි, ගඳසුණු යොදමින් දෙතුන්වර සේදූ කල පවා පිළිකුල්බව ඉවත් නොවේ'යයි මෙසේ වැකීම් වශයෙන් පිළිකුල්බව මෙනෙහි කළයුතුය. මෙසේ දශ ආකාරයෙකින් පිළිකුල්බව මෙනෙහි කරනවිට, තර්කයට විතර්කයට ගොදුරු කරනවිට, යෝගාවචරයාහට පිළිකුල් ආකාරයෙන් කබලිංකාරාහාරය ප්‍රකටවේ. හේ තෙමේ එම නිමිත්ත නැවත නැවතත් සේවනය කරයි, වඩයි, පුරුදු කරයි; මෙසේ පුරුදු කරන ඔහුගේ නීවරණයෝ යටපත් වෙති, කබලිංකාර

ආහාරය පිළිබඳ ස්වභාවධර්මය ගැඹුරු බැවින් අර්පණා බවට නොපැමිණි උපචාර සමාධියෙන් සිත සමාධිගත වෙයි. ප්‍රතිකූල-ආකාරය ගැනීම් වශයෙන් මෙහි සංඥව ප්‍රකටවේ. එහෙයින් මෙම කර්මස්ථානය 'ආහාරෙ-පටික්කූලසඤ්ඤ' යනුවෙන් ව්‍යවහාරයට ගියේය. මෙම 'ආහාරෙ-පටික්කූලසඤ්ඤ' කර්මස්ථානයෙහි නියැලි මහණහට රසතෘෂ්ණා විෂයෙහි සිත නොපෙළඹේ, නොඇදෙයි, වැලකෙයි. ඒ භික්ෂු තෙමේ කාන්තාරතරණය පිණිස පුත්‍රමාංශය සෙයින් මදයෙන් තොරව, යම්තාක් දුකින් එතෙරවීම පිණිස අවශ්‍ය වේද, ඒතාක් අහර වළඳයි. ඉක්බිති අල්පායාසයෙන්ම, කබලිංකාරාහාරය පිරිසිඳ දැනීමේ මාර්ගයෙන් පංචකාමගුණිකරාගය පිරිසිඳ හඳුනා ගනියි, පංචකාමගුණයන් හඳුනාගැනීමේ මාර්ගයෙන් රූපස්කන්ධය පිරිසිඳ හඳුනා ගනියි, නොපැසවුණු ආහාරාදිය විෂයෙහි පිළිකුල් බැව් වශයෙන් ඔහුට කායගතාසතිභාවනාවද පිරිපුන්බවට යයි, අශුභසංඥවට අනුලෝමවූ පිළිවෙතට පිළිපන්නේ වේ, මෙම පිළිවෙත නිසා මේ ආත්මභාවයෙහිදීම නිවන් කෙළවරට නොයතොත් සුගතියෙහි උපත ලබන්නේය.

**මේ ආහාරෙ පටික්කූලසඤ්ඤ භාවනාව පිළිබඳ විස්තර කථායි.**

## චතුධාතුවවත්ථාන භාවනාව

ආහාරෙ පටික්කූලසඤ්ඤ භාවනාවට අනතුරුව 'එකං වවත්ථානං' යනුවෙන් මෙසේ දක්වනලද චතුධාතුවවත්ථානය පිළිබඳවූ භාවනා නිර්දෙශය පිළිවෙළින් පැමිණියේය. එහි 'වවත්ථානං' යනු, ස්වභාව උපලක්ෂණ වශයෙන් සනිටුහන් කිරීමයි, සිවු ධාතුන්ගේ වවත්ථානය 'චතුධාතුවවත්ථාන' නම්. 'ධාතුමනසිකාර', 'ධාතුකම්මට්ඨාන', 'චතුධාතුවවත්ථාන' යන තුනම අර්ථ වශයෙන් එකෙකි. ඒ මේ චතුධාතුවවත්ථානය සංක්ෂෙප වශයෙන්ද විස්තර වශයෙන්ද'යි දෙ-පරිද්දෙකින් ආයේය. මහාසතිපට්ඨාන සූත්‍රයෙහි සංක්ෂෙප වශයෙන්ද, මහාහත්ථිපදෙපම, රාහුලොවාද සූත්‍රයන්හි හා ධාතුවිභංගයෙහි විස්තර වශයෙන්ද ආයේය. එය වනාහි, "මහණෙනි යම්සේ දක්ෂවූ ගවඝාතකයෙක් හෝ ගවඝාතකන්තෙවාසිකයෙක් හෝ ගවදෙනක මරා සිවුමංසලෙක කොටස් වශයෙන් වෙන්කොට හුන්නේ වේද, එසේම මහණෙනි, භික්ෂු තෙමේ මෙම කය සිටි සැටියෙන්ම පිහිටි සැටියෙන්ම ගෙන ධාතුවශයෙන් මෙනෙහි කෙරේ. මේ කයෙහි පෘථිවිධාතුව ඇත. ආපොධාතුව ඇත, තෙජොධාතුව ඇත, වායොධාතුවද ඇතැ"[(1)]යි මෙසේ තීක්ෂණ ප්‍රඥ ඇති

(1) දී. නි. මහාසතිපට්ඨාන සූ. - D ii 294

ධාතුකර්මස්ථානිකයාගේ වශයෙන් මහාසතිපට්ඨාන සූත්‍රයෙහි සංක්ෂෙප වශයෙන් ආයේය. එහි අර්ත්‍ථය මෙසේයි: යම්සේ දක්‍ෂවූ ගවඝාතකයෙක් හෝ ඔහුගේම බත් වැටුප් ලබන අතවැස්සෙක් හෝ දෙනක මරා කඩ කඩ කොට කපා, සිව්‍ දිගට විහිදුණු මහ මඟෙහි මධ්‍යස්ථානයයි කියනු ලබන සිවුමංසලෙහි තබා කොටස් කොට හුන්නේ වේද, එසේම භික්‍ෂු තෙමේ සිවු ඉරියවු අතුරෙන් කිසියම් ඉරියව්වෙකින් සිටි හෙයින් 'යථාඨිත'වූ, 'යථාඨිත'වූ හෙයින්ම 'යථාපණිහිත'වූ කය, 'මේ කය තුළ පඨවිධාතුව - පෙ-වායොධාතුවද ඇතැ'යි මෙසේ ධාතු වශයෙන් මෙනෙහි කරයි. කුමක් කී-තියාද යත්: යම්සේ ගවඝාතකයා දෙන පෝෂණය කරනවිට හෝ, ඝාතනස්ථානයට ගෙනඑනවිට හෝ, ගෙනවුත් එහි බැඳ සිටිනවිට හෝ, ඝාතනය කරනවිට හෝ, ඝාතනය කොට මළ දෙන දෙස බලනවිට හෝ, එම ගවදෙන කපා කොටස් කොට බෙදනතුරු එම ගවඝාතකයාහට ගවදෙනකැ'යි යන හැඟීම නොමැකේ. කොටස් කොට බෙද හුන්විට වනාහි දෙනකැ'යි යන හැඟීම මැකී ගොස් මස්'ය යන හැඟීම පහළවේ. කඩ කඩ කොට බෙදීමෙන් පසු ඔහුට "මම දෙන විකුණම්, මොවුහු දෙන ගෙනයති"යි යන හැඟීම ඇති නොවේ, එවිට "මම මස් විකුණම්, මොවුහු මස් ගෙනයති"යි යන හැඟීමම ඇතිවේ. එසේම මේ මහණහටද, පෙර අඥනවූ පෘථග්ජන අවධියෙහිදී ගිහියකු වශයෙන් වේවා, පැවිද්දකු වශයෙන් වේවා, යම්තාක් සමූහ වශයෙන් ඝනව (එක්රැස්ව) සිටි මේ කය සිටි ලෙසින්ම, පිහිටි ලෙසින්ම ගෙන මෙනෙහි කෙරේද, ධාතු වශයෙන් විග්‍රහකොට මෙනෙහි නොකෙරේද, ඒතාක් 'සතෙකි'යි හෝ 'පුරුෂයෙකි'යි හෝ 'පුද්ගලයෙකි'යි යන හැඟීම නොමැකේ. ධාතු වශයෙන් මෙනෙහි කරනවිට වනාහි 'සතෙකි'යි යන හැඟීම නැතිවේ, ධාතුවශයෙන්ම සිත පිහිටයි. එහෙයින් වදළහ භාග්‍යවතුන් වහන්සේ: මහණෙනි, යම්සේ දක්‍ෂවූ ගවඝාතකයෙක් හෝ-පෙ-හුන්නේ වේද, එසේම මහණෙනි, භික්‍ෂු තෙමේ-පෙ-වායොධාතුයයි ගනී." මහාහත්ථිපදෙපම සූත්‍රයෙහි වනාහි, "ඇවැත්නි, අජ්ඣත්තික පඨවිධාතු නම් කවරේද? යම් ධාතුකොටසක් තමා තුළම වූයේද, තමා කෙරෙහිම වූයේද, රළු වූයේද, පරුෂ වූයේද, තමාගේ යයි ගන්නා ලද්දේද, කවර නම් ධාතු කොටසක්ද යත්: කෙස්ය, ලොම්ය, නියය, දත්ය-පෙ-නොපැසුණු අහරය, පැසුණු අහරය, යන ආදිය හෝ අන් කිසියම් හෝ ධාතු කොටසක් තමා තුළ වේද, තමා කෙරෙහිම වේද, රළුවේද, දැඩිවේද, තමාගේ'යයි ගන්නාලද්දේද, ඇවැත්නි, මෙය අජ්ඣත්තික පඨවිධාතුයයි කියනුලැබේ. අජ්ඣත්තික ආපොධාතු නම් කවරේද? තමාතුළ වූ තමා කෙරෙහිම වූ යම් ධාතු කොටසක් දියර වූයේද, දියරබවට ගියේද,

තමාගේයයි ගන්නා ලද්දේද, කවර නම් ධාතු කොටසක්ද යත්, පිත්ය -පෙ-මූත්‍රය යන ආදිය හෝ අන් කිසි හෝ යම් ධාතු කොටසක් තමා වෙත වේද, තමාගේයයි ගන්නා ලද්දේද, ඇවැත්නි, මෙය අජ්ඣත්තික ආපොධාතුයයි කියනුලැබේ. ඇවැත්නි අජ්ඣත්තික තේජෝධාතු නම් කවරේද? යම් ධාතු කොටසක් තමා වෙතම වූයේද, තමා උදෙසාම වූයේද, තාප'යයි, තාප ගුණ'යයි ගන්නා ලද්දේද, කවර නම් ධාතු කොටසක්ද යත්, යමක් හේතුකොටගෙන තවනු ලැබේද, දිරාපත් වේද, යමක් හේතුකොටගෙන පරිදහ ඇතිවේද, යමක් හේතුකොටගෙනම බුදිනලද බොනලද කනලද, උරනලද ආහාර මනාකොට පරිපාකයට යේද, අන්කිසි හෝ යම් ධාතු කොටසක් තමා කෙරෙහි වූයේද, තමා උදෙසා වූයේද, තාපය'යි තාපගුණය'යි ගන්නා ලද්දේද, ඇවැත්නි, මෙය අජ්ඣත්තික තෙජොධාතුයයි කියනු ලැබේ, ඇවැත්නි, අජ්ඣත්තික වායොධාතු නම් කවරේද? යම්ධාතු කොටසක් තමා වෙත වූයේද, තමා උදෙසා වූයේද, වායුයයි වායුගුණයයි ගන්නා ලද්දේද, කවර නම් වායුවක්ද යත්, උඩු අතට යන වාතය, යටි අතට යන වාතය, කුස තුළ පවත්නා වාතය, අතුණුවල පවත්නා වාතය, අඟපසඟ පුරා සැරිසරන වාතය, ආශ්වාස වාතය, ප්‍රශ්වාස වාතය යන මේ ධාතු කොටස් හෝ, අන් කිසි හෝ යම් ධාතු කොටසක් තමා වෙත වූයේද, තමා උදෙසා වූයේද, තමාගේයයි ගන්නා ලද්දේද, ඇවැත්නි, මෙය අජ්ඣත්තික වායොධාතුය'යි කියනු ලැබේ."(1)

මෙසේ ඉතා තියුණු නොවූ ප්‍රඥ ඇති ධාතු කර්මස්ථානිකයාගේ වශයෙන් සවිස්තරව ආයේය. මෙහි යම්සේද, රාහුලොවාද සූත්‍ර, ධාතුවිභංග යන දෙක්හිද එසේමය. එහි අප්‍රකට පද වර්ණනාව, මෙසේයි: **අජ්ඣත්තං පච්චත්තං** යනු මේ පද දෙකම 'නියක' හෙවත් තමා පිළිබඳවූ දෙයට අධිවචනයි. **නියකං** යනු, "තමා කෙරෙහි හටගත්තේය, ස්වසන්තානයෙහි අන්තර්ගත වූයේයි" යන අර්ථයි. ඒ මේ 'නියකය', යම්සේ ලෝකයෙහි ස්ත්‍රීන් පිළිබඳ කථා 'අධිත්ථි'යයි කියනු ලැබේද, එසේම තමා කෙරෙහි පැවැති හෙයින් 'අජ්ඣත්ත' නම්. තමා උදෙසා පැවති හෙයින් 'පච්චත්ත'යයි කියනු ලැබේ. **කක්ඛලං** යනු කැකුලුය හෙවත් දෘඩිය. **ඛරිගතං** යනු, රළුය, එහි පළමුවැන්න ලක්ෂණය හඟවන වචනයි, දෙවැන්න ආකාරය හඟවන වචනයි. පඨවිධාතුව දෘඪ ස්වභාව ඇත්තේය. රළුවූ ආකාර ඇත්තේය, එහෙයින් එය 'ඛරිගත'යයි කියනු ලැබේ. **උපාදින්නං** යනු, තදින් අල්වා ගන්නා ලද්දේය, 'මමය, මාගේ'යයි

---

(1) ම. නි. මහාහත්ථිපදොපම සූ. - M i 185 ff.

මෙසෙ දැඩිව ගන්නා ලද්දේය, අල්වා ගන්නා ලද්දේය යන අර්ථයි. **සෙය්‍යථීදං** යනු, නිපාතයි, 'ඒ කවරේද?' යනු එහි අර්ථයි. ඉක්බිති එය ගෙනහැර දක්වමින් කෙසා, ලොමා යන ආදිය කීහ. මෙහි 'මත්ථලුඞ්ග' (හිස්මොළ) යනු අට්ඨිමිඤ්ජා (ඇටමිදුලු) යන්නෙහිම සංග්‍රහකොට විසි ආකාරයෙකින් පඨවිධාතුව දක්වනලද්දැයි දතයුතුය.

**යං වා පන අඤ්ඤං කිඤ්චි** (ඉන් බැහැර වූ යමක් ඇත්නම් එය) යනු සෙසු ආපො ආදී කොටස් තුනෙහි ඇති පඨවිධාතුව සංග්‍රහ කරනලදි. වැහෙන ස්වභාවයෙන් ඒ ඒ තැන පැතිරෙති'යි, පැමිණෙති'යි **ආපො** නම්වේ. කම්මසමුට්ඨාන (ක්‍රියාවෙන් හටගත්) ආදී වශයෙන් නන් වැදෑරුම් ආපයෙහි අන්තර්ගතයයි යන අර්ථයෙන් 'ආපොගත' නම්. ඒ කිමෙක්ද? ආපොධාතුවෙහි ඇති බැඳීම් ස්වභාවයයි.

තාප වශයෙන් **තෙජො** නම් වේ. කියනලද නයින්ම, තෙජො ධාතුවෙහි අන්තර්ගතයයි, **තෙජොගත** නම්. ඒ කිමෙක්ද? **උෂ්ණත්ව ලක්ෂණයයි. යෙන ච** යනු, කිපුණාවූ යම් තෙජොධාතුවක් හේතුකොටගෙන මේ කය තාපයට පත්වේද, ඒකාහික ජ්වර (එක්දු උණ) ආදී ස්වභාවයෙන් උණුසුම්බවට පත්වේද, යම් තෙජොධාතුවක් හේතුකොටගෙන දිරාපත්වීම වේද, මේ කය ජරාවට පත්වීම වේද, ඉන්ද්‍රිය විකලත්වයට, බෙලහීනතාවට, ඇඟ රැළිවැටීම්, හිසකේ පැසීම් ආදී ස්වභාවයට පත්වේද, **යෙන ච පරිඩය්හති** යනු, කිපුණාවූ යම් ධාතුවක් හේතුකොට මේ කය දහයට පත්වේද, එසේ දහයට පත් පුද්ගලයා 'දැවෙමි, දැවෙමි'යි හඬ නඟමින් සියක්වර දෙවීමද ගිතෙල් සුදුසඳුන් ආලේප කිරීමද, විජිනි පවන්ද පතන්නේද වේ. **යෙන ච අසිතපීතඛායිතසායිතං සම්මා පරිණාමං ගච්ඡති** යනු, යම් ධාතුවක් හේතුකොටගෙන, බුදිනලද බත් ආදිය හෝ බොනලද පාන ආදිය හෝ කනලද පිටිකැවිලි ආදිය හෝ ලොවිනලද විලිකුන් අඹරස මී පැණි ආදිය හෝ මනාකොට පැසවීමට යේද, රස ලේ ආදී වශයෙන් පදම් වන්නේදැයි යන අර්ථයි. මෙහිලා පළමුව සඳහන් තාපන, ජීරණ දහන යන තෙජො ධාතු තුන (කර්ම, චිත්ත, ඍතු, ආහාර යන) සතරින්ම හටගනී. අවසන්හි සඳහන් පක්වාග්නිය කර්මයෙන්ම හටගනී.

වායන (හැමීම්) වශයෙන් **වායු** නම්. කියනලද නයින්ම වායු බවට ගියේය'යි **වායොගත** නම්. ඒ කුමක්ද යත්, පිම්බෙන ස්වභාවයයි. **උද්ධඞ්ගමා වාතා** යනු, ඔක්කාර, හික්කා ආදී වශයෙන් පවත්නා උඩට නඟින වාතයෝය. **අධොගමාවාතා** යනු, මල මූත්‍රාදිය නික්මවන යටට බස්නා වාතයෝය, **කුච්ඡිසයා වාතා** යනු, අතුණුවලින් පිටත සිටි

වාතයෝය, **කොට්ඨසයා වාතා** යනු, අතුනු ඇතුළත සිටි වාතයෝය, **අඞ්ගමඞ්ගානුසාරිනො වාතා** යනු, ධමනීජාලානුසාරයෙන් මුළු සිරුර පුරා අඟපසඟ තුළ පැතිර සිටි හැකිලීම්, දික් කිරීම් පවත්වන වාතයෝය. **අස්සාසො** යනු, ඇතුළට පිවිසෙන නාසිකාවාතයයි, **පස්සාසො** යනු, පිටතට නික්මෙන නාසිකාවාතයයි. මෙහි මුලින් සඳහන් පස (කර්ම, චිත්ත, ඍතු, ආහාර) යන සතරින්ම හටගනී. ආශ්වාස ප්‍රශ්වාසයෝ සිතින් හටගනිත් මැයි. සියලු තන්හි, **යං වා පන'ඤ්ඤම්පි කිඤ්චි** යන මේ පදයෙන් සෙසු ධාතු කොටස්හි ආපො ආදී ධාතු සංග්‍රහ කරනලදි. මෙසේ පඨවිධාතුව විසි ආකාරයෙකින්ද, ආපොධාතුව දෙළොස් ආකාරයෙකින්ද, තෙජොධාතුව සතර ආකාරයෙකින්ද, වායොධාතුව ස-ආකාරයෙකින්දයි දෙසාළිස් ආකාරයෙකින් ධාතු සතර විස්තර කරන ලද'යි යන මේ මෙහි පෙළ වර්ණනාවයි.

මෙම භාවනා ක්‍රමයෙහි වනාහි, තියුණු නුවණැති භික්ෂු කෙනකුට 'කෙස් පඨවිධාතුය, ලොම් පඨවිධාතුය'යි මෙසේ විස්තර වශයෙන් ධාතූන් ගැනීම ප්‍රපඤ්චයක් (කල්මැරීමක්) වශයෙන් වැටහේ. 'යමක් **දැඩිවූ ස්වභාව ඇත්තේද, එය පඨවිධාතුය, යමක් බැඳීම් ස්වභාව ඇත්තේද, එය ආපොධාතුය, යමක් පැසවීම් ස්වභාව ඇත්තේද එය තෙජොධාතුය, යමක් පැතිරීම් ස්වභාව ඇත්තේද, එය වායොධාතුය**'යි මෙසේ මෙනෙහි කරනවිට කමටහන ප්‍රකටව වැටහෙයි. ඉතා තියුණු නොවූ නුවණ ඇත්තහුට වනාහි මෙසේ මෙනෙහි කරනවිට අඳුරක් මෙන් අප්‍රකටවේ. පළමු නයින් සවිස්තරව මෙනෙහි කරනවිට ප්‍රකටවේ. කුමක් මෙන්ද යත්, යම්සේ බොහෝ පෙය්‍යාල සහිත පෙළ පිරිවහන භික්ෂූන් දෙනමක් අතුරින් තීක්ෂණප්‍රඥ ඇති භික්ෂු තෙමේ එක් වරක් හෝ දෙවරක් හෝ පෙය්‍යාලමුඛය විස්තරකොට ඉන් මතු ආදි අන්ත යන දෙකෙළවර පමණක් පිරිවහමින් යේද, එවිට තියුණු නොවූ ප්‍රඥ ඇති භික්ෂු තෙමේ, 'කවර නම් සජ්ඣායනයෙක්ද? මේ තෙමේ තොල ගැටෙන තරම්වත් ඉඩක් නොදේ, මෙසේ සජ්ඣායන කළහොත් කවරදක පෙළ ප්‍රගුණ වේද'යි කියන්නේය. හේ තෙමේ පැමිණි පැමිණි පෙය්‍යාලය විස්තර වශයෙන් කියමින්ම සජ්ඣායන කරන්නේය. අනෙක් භික්ෂු තෙමේ, කවර නම් සජ්ඣායනයෙක්ද? මේ තෙමේ මෙය අවසන් කරන්නට නොදේ මෙසේ සජ්ඣායන කළහොත් කවරදක පෙළ අවසනට යන්නේද'යි කියයි. මෙසේම තියුණු නුවණ ඇත්තහුට කේසාදී වශයෙන් විස්තර සහිතව ධාතු පරිග්‍රහය ප්‍රපංචයක් ලෙසින් වැටහේ. "යමක් දැඩිවූ ස්වභාව ඇත්තේද, එය පඨවී ධාතුය" යන ආදී වශයෙන් සංක්ෂේප වශයෙන් මෙනෙහි කරනවිට කමටහන ප්‍රකට වේ. අනෙකාහට එසේ මෙනෙහි

කරනවිට අඳුරක් ලෙසින් අප්‍රකටවේ. කේසාදී වශයෙන් විස්තර සහිතව මෙනෙහි කරනවිට ප්‍රකටවේ.

එහෙයින් මෙම කර්මස්ථානය වඩනු කැමැති තියුණු නුවණ ඇත්තාහු විසින් හුදෙකලාව, විවේකීව, තමාගේ මුළු රූපකාය (භෞතික ශරීරය) ආවර්ජන කොට, 'මේ කයෙහි යම් දැඩිබවක්, රළුබවක් ඇත්නම්, මේ පඨවිධාතුය, යම් බැඳෙනබවක්, දියරබවක් ඇත්නම් මේ අපොධාතුය, යම් පැසෙනබවක්, උණුසුම්බවක් ඇත්නම්, මේ තෙජොධාතුය, යම් පැතිරෙනබවක් සැලෙනබවක් ඇත්නම්, මේ වායොධාතුය'යි මෙසේ සංක්ෂෙප වශයෙන් ධාතු පරිග්‍රහණය කොට නැවත නැවතත් 'පඨවි ධාතුය, 'ආපොධාතුය'යි ධාතුමාත්‍ර වශයෙන්, 'සත්වයකු නොවේ' 'ජීවියකු නොවේ'යයි ගෙන ආවර්ජන කළයුතුය, ප්‍රත්‍යවෙක්ෂා කළයුතුය, මෙනෙහි කළයුතුය. මෙසේ වීර්ය වඩන ඔහුට නොබෝ කලෙකින්ම ධාතූන් පිළිබඳ විශේෂ ලක්ෂණ ප්‍රකට කරන ඥානය සහිතවූ, ස්වභාවධර්මය අරමුණුකොට ඇති හෙයින් අර්පණාවට නොපැමිණියාවූ උපචාරමාත්‍ර සමාධිය උපදී. නැතහොත් චතුර්මහාභූතයන් පිළිබඳ නිස්සත්ත භාවය (සත්වයන් නොවනබව) දක්වනු පිණිස දම්සෙනෙවි සැරියුත් තෙරුන් විසින්, "ඇට නිසාද, නහර නිසාද, මස් නිසාද, සම නිසාද අවට පිරිවරා සිටි ආකාශය රූපයමයි යන ව්‍යවහාරයට යෙයි"(1) යනුවෙන් යම් මේ සතර කොටසෙක් කියනලද්දේද, ඒ කොටස් අතුරෙන්, ඒ ඒ කොටස් අතරතුර පවත්නා ඥාන නමැති අතින් ඒ ඒ කොටස වෙන් වෙන් වශයෙන් ගෙන, "මේ ධාතූන් අතර යම් දැඩිබවෙක් හෝ රළුබවෙක් වේනම්, මේ පඨවිධාතුය'යි පෙරකී නයින්ම ධාතූන් වෙන්කොටගෙන නැවත නැවතත් 'පඨවිධාතුය', 'ආපොධාතුය'යි ධාතුමාත්‍ර වශයෙන්, නිස්සත්ව වශයෙන්, නිජ්ජීව වශයෙන්, ආවර්ජන කළයුතුය, මෙනෙහි කළයුතුය, ප්‍රත්‍යවෙක්ෂා කළයුතුය.

මෙසේ වීර්ය කරන ඔහට නොබෝ කලෙකින්ම ධාතූන් පිළිබඳ ප්‍රභේදය ප්‍රකට කරන ඥානය සහිතවූ, ස්වභාව ධර්මය අරමුණුකොට පවත්නා හෙයින් අර්පණාවට නොපැමිණියාවූ, උපචාරමාත්‍රවූ, සමාධිය උපදී. මේ සංක්ෂෙප වශයෙන් ආ චතුධාතුවවත්ථානය පිළිබඳ භාවනා නයයි.

විස්තර වශයෙන් ආ චතුධාතුවවත්ථානයෙහි භාවනා ක්‍රමය මෙසේ දතයුතුය. මෙම කර්මස්ථානය වඩනු කැමැති, ඉතා තියුණු නොවූ ප්‍රඥ ඇති යෝගාවචරයා විසින් ආචාර්යයන් සමීපයෙහි දෙසාළිස්

---

(1) ම. නි. මහාහත්ථිපදොපම සූ. - M i 190

ආකාරයෙකින් විස්තර වශයෙන් ධාතූන් උගෙන යටකී ආකාර ඇති සෙනසුනෙක්හි වාසය කෙරෙමින්, සියලු කටයුතු නිමකොට, හුදෙකලාව, විවේක සුවයෙන් යුක්තව, සසම්භාරසංඛෙප වශයෙන්ද, සසම්භාරවිභක්ති වශයෙන්ද, සලක්ඛණසංඛෙප වශයෙන්ද, සලක්ඛණවිභක්ති වශයෙන්දයි මෙසේ සිවු ආකාරයෙකින් කර්මස්ථානය වැඩියයුතුය. එහි **සසම්භාරසංඛෙප** වශයෙන් වඩනුයේ කෙසේද යත්, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ කේශාදී විසි කොටස් කෙරෙහිවූ දැඩි ස්වභාවය පඨවිධාතුයයි ව්‍යවස්ථාපනය කරයි, පිත්තාදී දෙළොස් කොටසෙහි දියරබවට ගිය උදකය යන ව්‍යවහාරයට පත් බැඳීම් ස්වභාවය ආපොධාතුයයි ව්‍යවස්ථාපනය කරයි, පැසවීම් ආදී සිවු කොටසෙහි පැසවීම ඇති කරන තාපගුණය තෙජොධාතුයයි ව්‍යවස්ථාපනය කරයි, උද්ධංගමාදී සකොටසෙහි පැතිරීම් ස්වභාවය වායොධාතුයයි ව්‍යවස්ථාපනය කරයි. මෙසේ ව්‍යවස්ථාපන කරනවිට, ඕහට ධාතූහු ප්‍රකට වෙති. එම ධාතූන් නැවත නැවතත් ආවර්ජනය කරනවිට, යටකී නයින්ම උපචාර සමාධිය උපදී.

යමකුහට මෙසේ වඩනවිට කමටහන සඵල නොවේනම්, ඔහු විසින් සසම්භාරවිභක්ති වශයෙන් වැඩියයුතුය. කෙසේදයත්, ඒ භික්ෂුව විසින්, කායගතාසතිකම්මට්ඨානනිද්දෙසයෙහි යමක් සත් ආකාර උග්ගහකොසල්ල යනුවෙන්ද, දශ ආකාර මනසිකාරකොසල්ල යනුවෙන්ද කියනලද්දේද, ඒ සියල්ල දෙතිස් ආකාර කොටස් කෙරෙහි නොපිරිහෙලා, තචපංචක ආදියෙහි අනුලොම ප්‍රතිලොම වශයෙන් සජ්ඣායනාදිය කරමින් එහි කියනලද සියලු විධානය කළයුතුය. මෙයම එහි විශේෂයයි: එම කායගතාසති භාවනාවෙහිදී, වණ්ණසණ්ඨාන-දිසා-ඔකාස-පරිච්ඡෙද වශයෙන් කෙස් ආදිය මෙනෙහිකොට පිළිකුල් වශයෙන් සිත පිහිටුවිය යුතුවේ. මෙහිදී වනාහි ධාතු වශයෙන් සිත පිහිටුවිය යුතුවේ.

එහෙයින් වර්ණ ආදි වශයෙන් පස් පස් ආකාරයෙන් කෙස් ආදිය මෙනෙහිකොට අවසන්හි මෙසේ මනස්කාරය පැවැත්විය යුතුය: මේ **කෙසා** (කෙශයෝ) නම් හිස් කබල වසා සිටි සමෙහි හටගත්තාහු වෙති, එහි යම්සේ තුඹස් මුදුනෙක ඉලුක් තණ හටගත් කල, එම තුඹස්මුදුන 'මා වෙත ඉලුක් තණ හටගත්තේය"යි නොදනීද, එම ඉලුක් තණද 'අපි තුඹස් මුදුනෙහි උපන්නෝ වෙමු'යි නොදනීද, එසේම හිස් කබල වසාසිටි සම 'මා කෙරෙහි කෙශයෝ හටගත්තාහුය'යි නොදනී, කෙස්ද 'අපි හිස්කබල වසා සිටි සමෙහි උපන්නෝ වෙමු'යි නොදනී. සමය, කෙස්ය යන මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්

තොර වූවාහුය. මෙසේ කෙස් නම් මේ ශරීරය තුළ විශේෂවූ කොටසෙකි, එය චෙතනාරහිතය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවීධාතුය.

**ලොමා** (රෝමයෝ) සිරුර වසා සිටි සමෙහි හටගත්තාහුය. එහි, යම්සේ පාලු ගම් පියසෙක්හි හීතණ හටගත් කළ, 'මාතුළ හීතණ හටගත්තේය'යි එම පාලුගම්පියස නොදනී, 'අපි පාලුගම් පියසෙක්හි උපන්නෝ වෙමු'යි හීතණද නොදනී. එසේම සිරුර වසා සිටි සම 'මා කෙරෙහි ලොම් හටගත්තේය'යි නොදනියි, 'අපි සිරුර වසා සිටි සම මත උපන්නෝ වෙමු'යි ලොම්ද නොදනී. මෙසේ ලොම්ද සමද යන මේවා එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්‍ෂණ රහිත ධර්මයෝය. මෙසේ ලොම් නම් මේ කයෙහි වූ එක්තරා විශේෂ කොටසෙකි. එය අචෙතනිකය, විවරණකළ නොහැකිය, ශූන්‍යය, නිඃසත්වය, තදගුණයෙන් යුක්තය, එහෙයින් පඨවීධාතුය.

**නඛා** (නිය) ඇඟිලි අග හටගත්තේය, යම්සේ බාල දරුවන් මී ඇට දඬුවලින් විද ක්‍රීඩා කරනවිට 'අප වෙත මී ඇට තබන ලද'යි දඬු නොදනීද, 'අපි දඬු මත තබන ලද්දමෝය'යි මී ඇට නොදනීද, එසේම 'අපගේ අග්හි නිය හටගත්තේය'යි ඇඟිලි නොදනී, 'අපි ඇඟිලි අග හටගත්තෙමු'යි නියද නොදනිය,. මේ ධර්මයෝ එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්‍ෂණ රහිතයෝය. මෙසේ නිය නම් මේ කයෙහි එක් විශේෂවූ කොටසෙකි, එය අචෙතනය, විවරණ කළනොහැකිය, ශූන්‍යය, නිඃසත්වය තදගුණයෙන් යුක්තය, එහෙයින් පඨවීධාතුය.

**දන්තා** (දත්) හනු ඇටෙහි හටගත්තේය. යම්සේ වඩුවන් විසින් ගල්වණෙහි කිසියම් ලහටු වෙසෙසෙකින් බැඳ ටැම් සිටුවූ කල්හි, 'අප කෙරෙහි ටැම් සිටවියහ'යි ගල්වණ නොදනීද, 'අපි ගල්වණෙහි සිටිමු'යි ටැම් නොදනීද, එසේම 'අප කෙරෙහි දත් හටගත්හ'යි හනුඇට නොදනියි, 'අපි හනු ඇටෙහි උපන්නෙමු'යි දත්ද නොදනියි. මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්‍ෂණ රහිතයෝය. මෙසේ දත් නම් මේ කය තුළ ඇති එක් විශේෂවූ කොටසෙකි. එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවීධාතුය.

**තචො** (සම) මුළු සිරුර වසා සිටියේය. යම්සේ අමු ගෙරිසමෙකින් මහාවීණාවක් වෙලනලද කල්හි, 'මම අමු ගෙරිසමෙකින් වෙළන ලදිමි'යි මහාවීණාව නොදනීද, 'මම මහාවීණාව වෙළා සිටිමි'යි ගෙරිසම නොදනීද, එසේම 'මම සමින් වසන ලදිමි'යි සිරුර නොදනියි, 'මා විසින් සිරුර

වසන ලද්’යි සමද නොදනියි. මේ වසතුහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ සම නම් මේ සිරුරෙහිවූ එක්තරා විශේෂවූ කොටසෙකි. එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**මංසං** (මස්) ඇට සැකිල්ල (බදමක් මෙන්) අනුලේපනය කොට සිටියේය. යම්සේ මහ මැටි බිත්තියෙක අනුලේපනය කළ කල්හි, ‘මම මහමැටියෙන් ආලේපනය කරන ලදිමි’යි බිත්තිය නොදනීද, ‘මා විසින් බිත්තිය අනුලේපනය කරනලද්’යි මහමැටි නොදනීද, එසේම ‘මම නව සියයක් ප්‍රභේද ඇති මසින් අනුලේපනය කරන ලදිමි’යි ඇටසැකිල්ල නොදනී. ‘මවිසින් ඇට සැකිල්ල අනුලේපනය කරන ලද්’යි මස්ද නොදනී. මේ වස්තුහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ මස් නම් මේ සිරුර තුළ එක්තරා විශේෂවූ කොටසෙකි. එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**නහාරු** (නහර) සිරුර තුළ ඇට සම්බන්ධ කෙරෙමින් සිටියේය. යම්සේ බිත්තියට සිටුවනලද වඩිති ලී වැලින් බදනාලද කල්හි, ‘අප වැලින් වෙළන ලදහ’යි වඩිති ලී නොදනීද, ‘අප විසින් වඩිති ලී බදනා ලදහ’යි වැල් නොදනීද, එසේම ‘අපි නහරින් බදනා ලබමු’යි ඇට නොදනී, “අප විසින් ඇට වෙළන ලදහ’යි නහරද නොදනියි. මේ වස්තුහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවේක්ෂණ රහිතයෝය. මෙසේ නහර නම් මේ සිරුර තුළ ඇති එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචේතනය, අව්‍යාකෘතය ශූන්‍යය, නිඃසත්වය, තදගුණයෙන් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**අට්ඨිසු** (ඇට අතුරෙන්) විළුම් ඇටය ගොප් ඇටය ඔසවාගෙන සිටියේය, ගොප් ඇටය කෙණ්ඩා ඇටය ඔසවාගෙන සිටියේය. කෙණ්ඩා ඇටය කලවා ඇටය ඔසවාගෙන සිටියේය, කලවා ඇටය උකුල් ඇටය ඔසවාගෙන සිටියේය, උකුල් ඇටය පිටකටුව (කොඳු ඇටය) ඔසවාගෙන සිටියේය, පිටකටුව ගෙල ඇටය ඔසවාගෙන සිටියේය, ගෙල ඇටය හිස්කබල ඔසවාගෙන සිටියේය, හස්කබල් ඇට ගෙල ඇටයෙහි පිහිටියේය, ගෙල ඇටය පිටකටුවෙහි පිහිටියේය. පිටකටුව උකුල් ඇටයෙහි පිහිටියේය, උකුල් ඇටය කලවා ඇටයෙහි පිහිටියේය. කලවා ඇටය කෙණ්ඩා ඇටයෙහි පිහිටියේය. කෙණ්ඩා ඇටය ගොප් ඇටයෙහි පිහිටියේය, ගොප් ඇටය විළුම් ඇටයෙහි පිහිටියේය.

එහි, යම්සේ උළු (පිලිස්සීමට ගන්නා) දර, ගොමරිටි ආදී ද්‍රව්‍ය සමහාරයෙහි යටින් යටින් සිටි ද්‍රව්‍යයෝ 'අපි මතුමත්තෙහි ද්‍රව්‍යයන් ඔසවාගෙන සිටියෙමු'යි නොදනිත්ද, මතුමත්තෙහි ද්‍රව්‍යයෝ අපි යටින් යටින් සිටි ද්‍රව්‍යයන් මත සිටියෙමු'යි නොදනිත්ද, එසේම විළුම් ඇටය, 'මම ගොප් ඇටය ඔසවාගෙන සිටියෙමි'යි නොදනියි, ගොප් ඇටය 'මම කෙණ්ඩා ඇටය ඔසවාගෙන සිටියෙමි'යි නොදනියි, කෙණ්ඩා ඇටය 'මම කලවා ඇටය ඔසවාගෙන සිටියෙමි'යි නොදනියි, කලවා ඇටය 'මම උකුල් ඇටය ඔසවාගෙන සිටියෙමි'යි නොදනියි, උකුල් ඇටය 'මම පිටකටුව ඔසවාගෙන සිටියෙමි'යි නොදනියි. කෙණ්ඩාඇටය මම කලවා ඇටය ඔසවා ගෙන සිටියෙමි'යි නොදනියි, කලවා ඇටය, 'මම උකුල් ඇටය ඔසවාගෙන සිටියෙමි'යි නොදනි'යි, උකුල් ඇටය මම පිටකටුව ඔසවාගෙන සිටියෙමි'යි නොදනියි, ගෙල ඇටය 'මම හිස් ඇටය ඔසවාගෙන සිටියෙමි'යි නොදනියි, හිස් ඇටය 'මම ගෙල ඇටයෙහි පිහිටියෙමි'යි නොදනියි, ගෙල ඇටය 'මම පිටකටුවෙහි පිහිටියෙමි'යි නොදනියි, පිටකටුව 'මම උකුල් ඇටයෙහි පිහිටියෙමි'යි නොදනියි, උකුල් ඇටය 'මම කලවා ඇටයෙහි පිහිටියෙමි'යි නොදනියි, කලවා ඇටය 'මම කෙණ්ඩා ඇටයෙහි පිහිටියෙමි'යි නොදනියි. කෙණ්ඩා ඇටය 'මම ගොප් ඇටයෙහි පිහිටියෙමි'යි නොදනියි, ගොප් ඇටය 'මම විළුම් ඇටයෙහි පිහිටියෙමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ ඇට නම් මේ සිරුර තුළ සිටි එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්ත්වය, තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවීධාතුය.

**අට්ඨිමිඤ්ජං** (ඇට මිදුළු) ඒ ඒ ඇට ඇතුළත සිටියේය. යම්සේ හුණ පුරුක් ආදිය තුළ තැම්බූ වේබඩ ආදිය බහාලූකල, හුණ පුරුක් ආදිය 'අප තුළ වේබඩ ආදිය බහාලන ලදහ'යි නොදනියිද, වේබඩ ආදියද 'අපි හුණපුරුක් ආදිය තුළ සිටියෙමු'යි නොදනීද, එසේම ඇට 'අපතුළ මිදුළු සිටියහ'යි නොදනියි, මිදුළුද 'අපි ඇට තුළ සිටියෙමු'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ ඇටමිදුළු නම් මේ සිරුර තුළ පිහිටි එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්ත්වය, තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවීධාතුය.

**වක්කං** (වකුගඩුව) ගලවළුවෙහි සිට නිකුත් එක් මුලෙකින් මද තැන් ගොස් දෙකක්ව බෙදුණු මහ නහරයෙකින් බැඳී හෘදයමාංශය වටකොට සිටියේය. එහි, යම්සේ අඹපල දෙකක් එක් නටුවෙකින් බැඳී

සිටි කල්හි, 'මවිසින් අඹපල දෙක එක්ව බැඳුණහ'යි නටුව නොදනියිද, 'අපි නටුවෙන් බැඳුණෙමු'යි අඹපල දෙක නොදනීද, එසේම, 'මවිසින් වකුගඩු දෙක එක්කොට බඳනා ලදහ'යි මහනහරය නොදනී, 'අපි මහනහරයෙන් බැඳුණෙමු'යි වකුගඩුද නොදනියි. මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්ෂණයෙන් තොරවූවෝය. මෙසේ වකුගඩු නම් මේ සිරුර තුළ සිටි එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**හදය** (හෘදයවස්තුව) සිරුර ඇතුළත පපුඇට මැදිරිය මැද ඇසුරුකොට සිටියේය. එහි, යම්සේ දිරාපත් රිය කුඩුවක් තුළ මස් පිඩුවක් එල්වා තැබූ කල්හි, රිය කුඩුව 'මා නිසා මස් පිඩුව සිටියහ'යි නොදනීද, මස් පිඩුවද 'මම දිරාපත් රිය නිසා එල්බ සිටියෙමි'යි නොදනීද, එසේම පපුඇට මැදිරිය 'මා නිසා හෘදයවස්තුව එල්බ සිටියහ'යි නොදනියි, හෘදයවස්තුවද 'මම පපුඇට මැදිරිය නිසා එල්බ සිටියෙමි'යි නොදනියි, මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ හෘදයවස්තුව නම් මේ සිරුරෙහි සිටි එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**යකනං** (අක්මාව) සිරුර තුළ දෙතන අතර දකුණු පසට නැඹුරුව සිටියේය. එහි, යම්සේ සැළිකබලෙක දෙපසින් මස් පිඩු යුවලක් එල්බ සිටි කල, එම සැළි කබල 'මා වෙත මස්පිඩු යුවලක් එල්බ සිටියහ'යි නොදනීද, මස්පිඩු යුවලද 'අපි සැළිකබලෙහි එල්බ සිටියෙමු'යි නොදනීද, එසේම දෙතන අතර දකුණුපස 'මා නිසා අක්මාව සිටියහ'යි නොදනියි, අක්මාවද 'මම දෙතන අතර දකුණුපස ඇසුරුකොට සිටියෙමි'යි නොදනියි, මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ අක්මාව නම් මේ සිරුර තුළ එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිස්සත්වය, තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**කිලොමක** (දලබු) අතුරෙන් සැඟවුණු දලබුව හෘදයද වකුගඩුද පිරිවරා සිටියේය, නොසැඟවුණු දලබුව මුළු සිරුරෙහි සමට යටින් මස වසා සිටියේය. එහි, යම්සේ මසක් රෙදි කඩෙකින් වෙළූ කල්හි එම මස 'මම රෙදි කඩෙකින් වෙළන ලදිමි'යි නොදනීද, රෙදි කඩද මවිසින් මස වෙළන ලදහ'යි නොදනීද, එසේම වකුගඩු හා හදවතද මුළු සිරුර පුරා ඇති මසද, 'අප දලබුවෙන් වසන ලදිමු'යි නොදනී, දලබුවද 'මවිසින්

වකුගඩු හා හෘදයද, මුළු සිරුරෙහි මස්ද වසන ලදහ'යි නොදනී. මේ ධර්මයෝ එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්‍ෂණ රහිතයෝය, මෙසේ දලබුව නම් මේ සිරුරෙහි එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**පිහක** (බඩදිව) හෘදයට වම්පසින් උදර පටලයෙහි උඩුපස ඇසුරුකොට සිටියේය. එහි, යම්සේ වීගුලෙක මුදුනෙහි ගොමපිඩක් එල්බනලද කල, එම වීගුල් මුදුන 'මා නිසා ගොම පිඩ එල්බ සිටියහ'යි නොදනීද, ගොම පිඩද 'මම වීගුල් මුදුන එල්බ සිටියෙමි'යි නොදනීද, එසේම උදරපටල මුදුනත 'මා නිසා බඩදිව එල්බ සිටියහ'යි නොදනී, බඩදිවද 'මම උදරපටල මුදුනත නිසා එල්බ සිටියෙමි'යි නොදනී. මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්‍ෂණ රහිතයෝය. මෙසේ බඩදිව නම් මේ සිරුර තුළ එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**පප්ඵාස** (පපුමස) සිරුර ඇතුළත දෙතන අතර හෘදයද අක්මාවද වසාගෙන එල්බෙමින් සිටියේය. එහි, යම්සේ දිරාපත් වීගුලක් තුළ ලිහිණි කැදැල්ලක් එල්බෙමින් සිටියේ නම්, එම දිරාපත් වීගුල 'මාවෙත ලිහිණි කැදැල්ලක් එල්බෙමින් සිටියහ'යි නොදතියිද, එම ලිහිණි කැදැල්ලද 'මම දිරාපත් වීගුල ඇතුළත එල්බ සිටියෙමි'යි නොදනීද, එසේම සිරුර ඇතුළත 'මාවෙත පපුමස එල්බ සිටියහ'යි නොදතියි, පපුමසද 'මම මෙවන් සිරුර ඇතුළත එල්බෙමින් සිටියෙමි'යි නොදතියි. මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්‍ෂණ රහිතයෝය. මෙසේ මේ පපුමස නම් මේ සිරුරෙහි එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචෙතනිකය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තද ගුණයෙන් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**අන්ත** (අතුණු) ගෙලවළුව පටන් මල මාර්ගය කෙළවරකොට සිරුර ඇතුළත සිටියේය. එහි, යම්සේ ලේ ඔරුවක් තුළ හිස්සුන් ගැරඩි කුණක් දරණ ගසා තබනලද කල්හි, එම ලේ ඔරුව 'මා වෙත හිස් සුන් ගැරඩි කුණක් සිටියහ'යි නොදනීද, එම ගැරඩි කුණද 'මම ලේ ඔරුවක් තුළ සිටියෙමි'යි නොදනීද, එසේම සිරුරු ඇතුළ 'මා වෙත අතුණු සිටියහ'යි නොදතියි, අතුණුද 'මම සිරුර ඇතුළත සිටියෙමි'යි නොදනී. මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්‍ෂණ රහිතයෝය. මෙසේ අතුණු නම් මේ සිරුර තුළවූ එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචෙතනය,

අව්‍යාකෘතය ශූන්‍යය, නිඃසත්වය, තද ගුණයෙන් යුක්තය එහෙයින් පඨවිධාතුය.

**අන්තගුණ** (අතුණුබහන්) අතුණු අතරතුර දරණු විසිඑකකින් යුත් එම අතුණ බැඳගෙන සිටියේය, එහි යම්සේ පාපිස්නා බිස්සක් වියාගෙන රැහැන් සිටි කල්හි, එම පාපිස්නාා බිස්ස 'රැහැන් මා බැඳගෙන සිටියහ'යි නොදනීද, රැහැන්ද 'අපි පාබිස්ස බැඳගෙන සිටියෙමු'යි නොදනීද, එසේම අතුණ 'අතුණු බහන් මා බැඳගෙන සිටියහ'යි නොදනී, අතුණුබහන්ද 'අපි අතුණ බැඳගෙන සිටියෙමු'යි නොදනී. මේ වස්තුහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්‍ෂණ රහිතයෝය. මෙසේ අතුණුබහන් නම් මේ සිරුර තුළවූ එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තදගුණයෙන් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**උදරිය** නම් උදරය තුළ සිටි බුදිනලද, බොනලද, කනලද ලොවිනලද නොපැසුණු ආහාරයි. එහි යම්සේ බලු පැන් ඔරුවෙක්හි, බලු වමනයක් තිබෙන කල්හි එම බලු ඔරුව 'මා තුළ බලු වමනයක් සිටියහ'යි නොදනීද, බලු වමනයද 'මම බලු ඔරුවෙක්හි සිටියෙමි'යි නොදනීද, එසේම උදරය 'මා තුළ නොපැසුණු අහර සිටියහ'යි නොදනියි, නොපැසුණු අහරද 'මම උදරය තුළ සිටියෙමි'යි නොදනී, මේ වස්තුහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්‍ෂණ රහිතයෝය. මෙසේ උදරිය නම් මේ සිරුර තුළ ඇති එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තද බවින් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**කරීස** (මල) පක්වාශයයි කියනලද අටඟුලක් පමණවූ හුණ පුරුකක් වැනි අතුණු කෙළවරයි. එහි, යම්සේ හුණ පුරුකක් තුළ සිතිදූ පඬුවන් මැටි අඹරා බහාලූ කල, එම උණ පුරුක 'මා තුළ පඬුවන් මැටි සිටියහ'යි නොදනීද, පඬුවන් මැටිද "මම උණ පුරුකක් තුළ සිටියෙමි'යි නොදනීද, එසේම පක්වාශය 'මාතුළ මල සිටියහ'යි නොදනීයි, මලද "මම පක්වාශය තුළ සිටියෙමි'යි නොදනියි. මේ වස්තුහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවෙක්‍ෂණ රහිතයෝය. මෙසේ මල නම් මේ සිරුර තුළ ඇති එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තද බවින් යුක්තය, එහෙයින් පඨවිධාතුය.

**මත්ථලුඞ්ග** (හිස්මොළ) හිස් කබල තුළ සිටියේය. එහි, යම්සේ පරණ ලබු කබලෙක පිටි පිඩක් බහාලූ කල්හි, එම ලබු කබල 'මා තුළ පිටි පිඩක් සිටියහ'යි නොදනීද, පිටි පිඩද 'මම ලබු කබලෙක්හි සිටියෙමි'යි නොදනියිද, එසේම හිස් කබල 'මාතුළ හිස්මොළ සිටියහ'යි නොදනියි,

හිස්මොළද 'මම හිස්කබල තුළ සිටියෙමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවේක්ෂණ රහිතයෝය. මෙසේ හිස්මොළ නම් මේ සිරුර තුළ ඇති එක්තරා විශේෂවූ කොටසෙකි. එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, තද බවින් යුක්තය, එහෙයින් පඨවීධාතුය.

**පිත්ත** (පිත්) අතුරෙන් නොබැඳුණු පිත ජීවිතේන්ද්‍රිය හා බැඳී මුළු සිරුර පුරා පැතිර සිටියේය, බැඳුණු පිත පිත්තාශයයෙහි රැඳී සිටියේය. එහි යම්සේ කැවුමක් තුළ පැතිර තෙල් සිටි කල්හි, කැවුම 'මාතුළ පැතිරී තෙල් සිටියහ'යි නොදනීද, තෙල්ද 'මම කැවුම තුළ පැතිර සිටියෙමි'යි නොදනීද, එසේම ශරීරය 'මාතුළ නොබැඳුණු පිත පැතිර සිටියහ'යි නොදනියි, නොබැඳුණු පිතද 'මම සිරුර පුරා පැතිර සිටියෙමි'යි නොදනී. යම්සේ වැටකොලු කොෂය වැසිදියෙන් පිරී සිටි කල්හි, එම වැටකොලු කොෂය 'මා තුළ වැසිදිය සිටියහ'යි නොදනීද, වැසිදියද 'මම වැටකොලු කොෂය තුළ සිටියෙමි'යි නොදනීද, එසේම පිත්තාශය 'මා තුළ බැඳුණු පිත සිටියහ'යි නොදනියි, බැඳුණු පිතද 'මම පිත්තාශය තුළ සිටියෙමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආවර්ජන ප්‍රත්‍යවේක්ෂණ රහිතයෝය. මෙසේ පිත නම් මේ සිරුර තුළ ඇති එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, දියාරුය, බැඳෙනසුලුය, එහෙයින් ආපොධාතුය.

**සෙම්හ** (සෙම) එක් පාත්‍රයක් පිරෙන තරම් වූයේ උදර පටලයෙහි සිටියේය. එහි, යම්සේ ගවරවළෙක්හි මතුපිට පෙණ පටලයක් හටගත්විට, ගවරවළ 'මා තුළ පෙණපටලයක් සිටියහ'යි නොදනීද, පෙණ පටලයද 'මම ගවරවළෙහි සිටියෙමි'යි නොදනීද, එසේම උදරපටලය 'මාතුළ සෙම සිටියහ'යි නොදනියි, සෙමද 'මම උදරපටලය තුළ සිටියෙමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආභොග (සංලක්ෂණ) ප්‍රත්‍යවේක්ෂණ රහිතයෝය. මෙසේ සෙම නම් මේ සිරුර තුළ සිටි එක්තරා විශේෂවූ කොටසෙකි. එය අචේතනය, අව්‍යාකෘතය ශූන්‍යය, නිඃසත්වය, දියාරුය, බැඳෙනසුලුය, එහෙයින් ආපොධාතුය.

**පුබ්බ** (පූයාව) තිබඳව සිටි තැනෙක් නැත. යම් යම් සිරුරු පෙදෙසක කණු, කටු, අවි, ගිනිදැල් ආදියෙන් පහරනලදුව ලේ එකතුවී පැසවාද, ගඩු පිළිකාදිය හෝ උපදීද, ඒ ඒ තැන සිටියේය. එහි, යම්සේ පොරෝපහර ආදී හේතුවෙන් ගසෙකින් යුස වැහෙන කල, එම කැඩුණු බිඳුණු රුක් පෙදෙස් 'අප කෙරෙහි යුස සිටියහ'යි නොදනීද, යුසද 'මම කැඩීබිඳී ගිය රුක්පෙදෙස්හි සිටියෙමි'යි නොදනීද, එසේම සිරුරෙහි කණු කටු ආදියෙන් පැරුණු පෙදෙස් 'අප වෙත පූයාව සිටියහ'යි

නොදනියි, පූයාවද 'මම ඒ ඒ සිරුරු පෙදෙස්හි සිටියෙමි'යි නොදනීයි. මේ වස්තූහු එකිනෙක ආභොග (සංලක්ෂණ) ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ පූයාව නම් මේ සිරුරෙහි ඇති එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචෙතනය, අව්‍යාකෘතය, ශුන්‍යය, නිඃසත්වය, දියාරුය, බැදෙනසුලුය, එහෙයින් ආපොධාතුය.

**ලොහිත** (ලෙහෙ) අතුරෙන් සැරිසරන ලෙය පිත මෙන්ම මුළු සිරුර පුරා ව්‍යාප්තව සිටියේය, තැන්පත් ලෙය අක්මාව පිහිටි තැන පහළ කොටස පුරා, වකුගඩු, හදවත, අක්මාව පපුමස ආදිය තෙමමින් එක් පාත්‍රයක් පිරෙන තරම් සිටියේය. එහි, සැරිසරන ලෙය පිළිබඳ විනිශ්චය නොබැඳුණු පිත බඳුම වේ. තැන්පත් ලෙය, එහි, යම්සේ දුදුරුවී ගිය කබලෙක්හි වැසි දිය වට කල යට කැබැලිති කැට ආදිය තෙමෙන කල එම කැබැලිති කැට 'අපි ජලයෙන් තෙමෙමු'යි නොදනීද, ජලයද 'මම කැබැලිති කැට ආදිය තෙමමි'යි නොදනීද, එසේම අක්මාවෙහි පහළ කොටස හෝ වකුගඩු ආදිය හෝ 'මා වෙත ලෙය සිටියහ'යි නැතහොත් 'අප තෙමමින් සිටියහ'යි නොදනියි, ලෙයද 'මම අක්මාව පහළ කොටස පුරවා වකුගඩු ආදිය තෙමමින් සිටිමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආභොග (සංලක්ෂණ) ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ ලෙය නම් මේ සිරුර තුළ සිටි එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචෙතනය, අව්‍යාකෘතය, ශුන්‍යය, නිඃසත්වය, දියාරුය, බැදෙනසුලුය, එහෙයින් ආපොධාතුය.

**සෙද** (ඩහදිය) ගිනි හිරුරැස් ආදියෙන් තැවෙන කල්හි කෙස් ලොම් සිදුරු විවර පුරවා සිටියි. වැගිරෙයි. එහි, යම්සේ නෙළුම්බල, නෙළුම්දළි, කුමුදු නල කලබ් ආදිය ජලයෙන් පිටට ගත් කල, එම නෙළුම්බල කලබ් ආදියෙහි සිදුරු 'අප කෙරෙන් ජලය වැගිරෙති'යි නොදනීද, එම නෙළුම්බල කලබ් ආදියෙහි සිදුරුවලින් වැහෙන ජලයද, 'මම නෙළුම්බල කලබ් ආදියෙහි සිදුරුවලින් වැගිරෙති'යි නොදනීද, එසේම කෙස් ලොම් සිදුරු 'අප කෙරෙන් ඩහදිය වැගිරෙති'යි නොදනියි, ඩහදියද 'මම කෙස් ලොම් සිදුරුවලින් වැගිරෙමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආභොග (සංලක්ෂණ) ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ ඩහදිය නම් මේ සිරුරෙහි ඇති එක්තරා විශේෂවූ කොටසෙකි. එය අචෙතනය, අව්‍යාකෘතය, ශුන්‍යය, නිඃසත්වය, ද්‍රව වූයේය, බැදෙනසුලුය. එහෙයින් ආපොධාතුය.

**මෙද** (මේදය) ස්ථූල වූවහුගේ මුළු සිරුර පුරාද, කෘශ වූවහුගේ කෙණ්ඩා මස්ගොබ ආදියෙහිද සිටි ඝනවූ තෙලයි. එහි යම්සේ මස් පිඩක් කසාවත් රෙදි කඩෙකින් වසනලද කල්හි, එම මස්පිඩ 'මා

ඇසුරුකොට කසාවත් රෙදිකඩ සිටියහ'යි නොදනීද, කසාවත් රෙදි කඩද 'මම මස්පිඩ ඇසුරුකොට සිටිමි'යි නොදනීද, එසේම මුළු සිරුර පුරා නැතහොත් කෙණ්ඩා ආදියෙහිවූ මස් 'මා ඇසුරු කොට මේදය සිටියහ'යි නොදනියි, මේදයද 'මම මුළු සිරුර පුරා, නැතහොත් කෙණ්ඩා ආදියෙහිවූ මස් ඇසුරු කොට සිටිමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආභොග (සංලක්ෂණ) ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ මේදය නම් මේ සිරුරෙහි ඇති එක්තරා විශේෂවූ කොටසෙකි. එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය., නිඃසත්වය, බැඳෙනසුලු උකු දියරයෙකි. එහෙයින් ආපොධාතුය.

**අස්සු** (කඳුළු)යම් කලෙක හටගනීද, එකල ඇස් කෙළවර කඳුළුවළ පුරවා සිටියි, නැතහොත් වැගිරෙයි. එහි, යම්සේ තල්ගොබොලු සිදුරු තුළ ජලය පිරුණු කල එම තල්ගොබොලු 'අප තුළ ජලය සිටියහ'යි නොදනීද, ජලයද 'මම තල්ගොබොලු විවර තුළ සිටිමි'යි නොදනීද, එසේම ඇස් කෙළවර කඳුළුවළ 'මාතුළ කඳුළු සිටියහ'යි නොදනී, කඳුළුද 'මම ඇස් කෙළවර කඳුළුවළ තුළ සිටිමි'යි නොදනී. මේ ධර්මයෝ අන්‍යොන්‍ය ආභොග (සංලක්ෂණ) ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ කඳුළු නම් මේ සිරුරෙහි ඇති විශේෂවූ කොටසෙකි. එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, දියාරුය, බැඳෙනසුලුය, එහෙයින් ආපොධාතුය.

**වසා** (වුරුණුතෙල්) ගිනි රැසින් අව්රැසින් තැවෙන කල අතුල්, පිටිඅතුල්, පතුල්, පිටිපතුල්, නහස්පුඩු, නළල්තල, දසරු ආදියෙහි සිටි තුනී තෙලයි. එහි, යම්සේ හුළුකැදෙහි තෙල් බහාලූ කල එම හුළුකැද 'මා මත වැතිරගෙන තෙල් සිටියහ'යි නොදනීද, තෙල්ද 'මම හුළුකැද තුළ වැතිරගෙන සිටිමි'යි නොදනීද, එසේම අතුල් ආදී පෙදෙස් 'මා තුළ වැතිර වුරුණුතෙල සිටියහ'යි නොදනියි, වුරුණුතෙලද "මම අතුල් ආදියෙහි වැතිරගෙන සිටියෙමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආභොග (සංලක්ෂණ) ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ වුරුණු නම් මේ සිරුරෙහි ඇති විශේෂවූ කොටසෙකි, එය අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, ද්‍රවාකාරය, බැඳෙනසුලුය, එහෙයින් ආපොධාතුය.

**ඛෙල** (කෙළ) ඉනීමට සුදුසු හේතුවක් ඇති කල දෙකොපුල් පසින් බැස දිව මත සිටියි. එහි, යම්සේ ගංතෙරෙක කණිනලද නොනැවත දිය උනන ළිදෙක්හි ළිංතලය 'මා වෙත දිය සිටිති'යි නොදනීද, දියද, 'මම ළිංතලෙහි සිටිමි'යි නොදනීද, එසේම දිව්තලය 'දෙකොපුල් පෙදෙසින් බැස මා වෙත කෙළ සිටියහ'යි නොදනියි, කෙළද මම දෙකොපුල්

පෙදෙසින් බැස දිවිතෙලෙහි සිටියෙමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආභොග (සංලක්ෂණ) ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ කෙළ නම් මේ සිරුරෙහි එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, දියාරුය, බැඳෙනසුලුය, එහෙයින් ආපොධාතුය.

**සිංඝාණිකා** (සොටු) යම් විටෙක උපදීද, එවිට නහස්පුඩු පුරා සිටියි, නැතහොත් වැගිරෙයි. එහි, යම්සේ බෙලි කටුවෙක්හි පිළුණු දී පිරවූ කල්හි, එම බෙලිකටුව 'මා තුළ පිළුණු දී සිටියහ'යි නොදනීද, පිළුණු දීද 'මම බෙලිකටුව තුළ සිටියෙමි'යි නොදනීද, එසේම නහස්පුඩු 'අපතුළ සොටු පිරී සිටියහ'යි නොදනියි. සොටුද 'මම නහස්පුඩුවල සිටියෙමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආභොග (සංලක්ෂණ) ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ සොටු නම් මේ සිරුරෙහි එක්තරා විශේෂවූ කොටසෙකි. එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, වැගිරෙනසුලුය, බැඳෙනසුලුය, එහෙයින් ආපොධාතුය.

**ලසිකා** (සඳමිදුලු) ඇට සන්ධීන් අභ්‍යංජනය කෙරෙමින්, (ලිහිසි කෙරෙමින්) එක්සිය අසූවක් සන්ධීන්හි සිටියේය. එහි, යම්සේ අක්ෂයෙක්හි ලිහිසිතෙල් ගැල්වූවිට එම අක්ෂය 'මා ගල්වමින් තෙල් සිටියහ'යි නොදනීද, තෙල්ද 'මම අක්ෂය ගල්වමින් සිටියෙමි'යි නොදනීද, එසේම එක්සිය අසූවක් සන්ධීහු සඳමිදුලු අප ගල්වමින් සිටියහ'යි නොදනිති, සඳමිදුලුද 'මම එක්සිය අසූවක් සන්ධීන් ගල්වාගෙන සිටියෙමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආභොග (සංලක්ෂණ) ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ සඳමිදුලු නම් මේ සිරුර තුළ සිටි එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, ද්‍රවාකාරය, බැඳෙන සුලුය, එහෙයින් ආපොධාතුය.

**මුත්ත** (මූත්‍රය) වස්තිකෝෂය තුළ (මූත්‍රාශය තුළ) සිටියේය. එහි, යම්සේ ගවරවළෙක්හි යවනඝටයක් (බොරදිය පෙරාගැනීම පිණිස යොදගන්නා මැටි බඳුනක්) යටිකුරුකොට බහා තැබූ කල්හි, එම යවනඝටය 'මා තුළ ගවරවළ දිය සිටියහ'යි නොදනීද, ගවරවළ දියද 'මම යවනඝටය තුළ සිටියෙමි'යි නොදනීද, එසේම මූත්‍රාශය 'මා තුළ මූත්‍ර සිටියහ'යි නොදනියි, මූත්‍රයද 'මම මූත්‍රාශය තුළ සිටියෙමි'යි නොදනියි. මේ වස්තූහු එකිනෙක ආභොග (සංලක්ෂණ) ප්‍රත්‍යවෙක්ෂණ රහිතයෝය. මෙසේ මූත්‍රය නම් මේ සිරුර තුළ ඇති එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, ද්‍රවාකාරය, බැඳෙනසුලුය, එහෙයින් ආපොධාතුය.

මෙසේ කේශාදියෙහි මනස්කාරය පවත්වා ඉක්බිති යමක් හේතුකොටගෙන තාපය ඇතිවේද, මෙය මේ සිරුරතුළ ඇති එක්තරා විශේෂයෙකි. එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, මුහුකුරුවන ආකාර ඇත්තේය, එහෙයින් තෙජොධාතුය. යමක් හේතුකොටගෙන දිරාපත්වේද, යමක් හේතුකොටගෙන දහය නැඟේද, යමක් හේතුකොටගෙන බුදිනලද, බොනලද, කනලද, ලොවිනලද අහර මනාසේ පරිණාමයට යේද, මෙය මේ සිරුරෙහි ඇති එක්තරා විශේෂයෙකි. එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, මුහුකුරුවන ස්වභාව ඇත්තේය, එහෙයින් තෙජොධාතුයයි මෙසේ තෙජොධාතු කොටස් කෙරෙහි මනස්කාරය පැවැත්විය යුතුය.

ඉක්බිති උද්ධංගම වාතයන් උඩට නැඟීම් වශයෙන් ගෙන, අධොගම වාතයන් යටට බැසීම් වශයෙන්ද, කුච්ඡිසය වාතයන් කුස තුළ පැවතීම් වශයෙන්ද, කොට්ඨසය වාතයන් අතුණු තුළ සිටීම් වශයෙන්ද. අංගමංගානුසාරී වාතයන් අඟපසඟ අනුව සැරිසැරීම් වශයෙන්ද, ආශ්වාස ප්‍රශ්වාස වාතයන් ඇතුළට පිවිසීම් පිටතට නික්මීම් වශයෙන්ද ගෙන, උද්ධංගම වාතයෝ නම් මේ සිරුර තුළවූ එක්තරා විශේෂවූ කොටසෙකි. එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, පිම්බීම් ආකාර ඇත්තේය, එහෙයින් වායොධාතුය. අධොගම වාතයෝ නම්, කුච්ඡිසය වාතයෝ නම්, කොට්ඨසය වාතයෝ නම්, අංගමංගානුසාරී වාතයෝ නම්, ආශ්වාස ප්‍රශ්වාස වාතයෝ නම්, මේ සිරුර තුළ සිටි එක්තරා විශේෂවූ කොටසෙකි, එය අචෙතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, නිඃසත්වය, පිම්බීම් ආකාර ඇත්තේය, එහෙයින් වායොධාතුයයි මෙසේ වායොධාතු කොටස් කෙරෙහි මනස්කාරය පැවැත්විය යුතුය.

මේ ආකාරයෙන් මනස්කාරය පවත්වන යෝගාවචරයාහට ධාතුහු ප්‍රකට වෙති. එම ධාතුන් නැවත නැවතත් ආවර්ජනය කරනවිට, යටකී නයින්ම උපචාර සමාධිය උපදී. යම් කෙනකුට මේ ආකාරයෙන් වඩනවිටද කමටහන සඵල නොවේනම්, ඔහු විසින් ස්වලක්‍ෂණ සංක්‍ෂෙප වශයෙන් වැඩියයුතුය. කෙසේදයත්: විසි වැදෑරුම් පඨවි කොටස් කෙරෙහි තද ස්වභාවය පඨවිධාතුයයි ව්‍යවස්ථාපනය කළයුතුය, එහිමවූ බැඳෙනසුලු ගුණය ආපොධාතුයයිද, පැසවීම් ස්වභාවය තෙජොධාතුයයිද, පිම්බීම් ස්වභාවය වායොධාතුයයිද ව්‍යවස්ථාපනය කළයුතුය. දෙළොස් වැදෑරුම් ආපො කොටස් කෙරෙහිවූ බැඳීමේ ස්වභාවය ආපොධාතුයයි නිගමනය කළයුතුය, එහිම පැසවීම් ස්වභාවය තෙජොධාතුයයිද, පිම්බීමේ ස්වභාවය වායොධාතුයයිද, තද ස්වභාවය පඨවිධාතුයයිද නිගමනය කළයුතුය.

සිවු වැදෑරුම් තෙජොධාතු කොටස් කෙරෙහි ඇති පැසවීමේ ලක්‍ෂණය තෙජොධාතුයයි ව්‍යවස්ථාපනය කළයුතුය. එම තෙජොධාතු කොටස් කෙරෙන් වෙන්කළ නොහැකි පිම්බීම් ස්වභාවය වායොධාතුයයිද, තද ස්වභාවය පඨවීධාතුයයිද, බැඳීම් ස්වභාවය ආපොධාතුයයිද, ව්‍යවස්ථාපනය කළයුතුය. සවැදෑරුම් වායොධාතු කොටස් කෙරෙහිවූ පිම්බීමේ ස්වභාවය වායොධාතුයයිද, තද ස්වභාවය පඨවීධාතුයයිද, බැඳීම් ස්වභාවය ආපොධාතුයයිද පැසවීම් ස්වභාවය තෙජොධාතුයයිද ව්‍යවස්ථාපනය කළ යුතුය. මෙසේ ව්‍යවස්ථාපන කරනවිට ඔහුට ධාතුහු ප්‍රකට වෙති. එම ධාතුන් නැවත නැවතත් ආවර්ජන කරනවිට, මෙනෙහි කරනවිට, යටකී නයින්ම උපචාර සමාධිය උපදී.

මේ ආකාරයෙන් වඩන විදසුන් ඇති යම් කෙනෙකුහට කමටහන සිද්ධ නොවේනම්, ඔහු විසින් ස්වලක්‍ෂණ සංක්‍ෂෙපවශයෙන් වැඩියයුතුය. කෙසේදයත්, යටකී නයින්ම කෙස් ආදිය ගෙන කෙස්හි ඇති තද ස්වභාවය පඨවීධාතුයයිද, එහිම ඇති බැඳීම් ස්වභාවය ආපොධාතුයයිද, පැසවීම් ස්වභාවය තෙජොධාතුයයිද, පිම්බීම් ස්වභාවය වායොධාතුයයිද යන මේ ආකරයෙන් සියලු කොටස් අතුරෙන් එක් එක් කොටස ගෙන එහි ඇති සිවුවැදෑරුම් ධාතුන් ව්‍යවස්ථාපනය කළයුතුය. එසේ ව්‍යවස්ථාපනය කරනවිට ඔහුට ධාතුහු ප්‍රකට වෙති. එම ධාතුන් නැවත නැවතත් ආවර්ජන කරනවිට මෙනෙහි කරනවිට පළමුකී නයින්ම උපචාරසමාධිය උපදී. තවද, වචනාර්ත්‍ථ වශයෙන්ද, කලාප වශයෙන්ද, චූර්ණ වශයෙන්ද, ලක්‍ෂණාදිය වශයෙන්ද, සමුට්ඨාන වශයෙන්ද, නානත්ත්‍ව එකත්ත්‍ව වශයෙන්ද. විනිර්භොග අවිනිර්භොග වශයෙන්ද, සභාග විසභාග වශයෙන්ද, අභ්‍යන්තර බාහිර විශේෂ වශයෙන්ද, සංග්‍රහ වශයෙන්ද, ප්‍රත්‍යය වශයෙන්ද, අසමන්නාහාර වශයෙන්ද, ප්‍රත්‍යයවිභාග වශයෙන්දයි යන මේ ආකාර වශයෙන් ධාතුන් මෙනෙහි කළයුතුය. එහි **වචනත්‍ථතො** (වචනාර්ත්‍ථ වශයෙන්) මෙනෙහි කරන්නහු විසින් පතළ හෙයින් පඨවි නම්, ගලාබසී, බොනු ලැබෙයි, වැඩෙයි හෝ ආපො නම්, තවති'යි තෙජො නම්. හමති'යි වායො නම්. අවිශේෂයෙන් වනාහි ස්වලක්‍ෂණයන් දරති'යි, දුක් ගෙනදෙති'යි දුක් දරති'යි හෝ ධාතු නම්'යි මෙසේ විශේෂ වශයෙන්ද, සාමාන්‍ය වශයෙන්ද වචනාර්ත්‍ථ වශයෙන් මෙනෙහි කළ යුතුය. **කලාපතො** (කලාප වශයෙන්) යනු, යම් මේ පඨවිධාතුව කෙස්, ලොම් ආදී නයින් විසි ආකාරයෙකින්ද, ආපොධාතුව පිත් සෙම් ආදි වශයෙන් දෙළොස් ආකාරයෙකින්ද දක්වන ලද්දේද එහි යම් හෙයකින්,

වණ්ණො ගන්ධො රසො ඔජා චතස්සො චාපි ධාතුයො
අට්ඨධම්මසමොධානා හොති කෙසාති සම්මුති
තෙසං යෙව විනිබ්භොගා නත්ථි කෙසාති සම්මුති.

වර්ණය, ගන්ධය, රසය, ඔජාය, ධාතු සතරය යන මේ අෂ්ට ධර්මයන්ගේ සමොධානය (එක්ව ගැලපීම) හේතුකොට 'කෙස්'ය යන සම්මුතිය වේ. එම අෂ්ට ධර්මයන් විශ්ලේෂ (වෙන්) කොට ගැනීමෙන් 'කෙස්'ය යන සම්මුතිය නොවේ.

එහෙයින් කෙස්ද මේ අෂ්ටධර්මයන්ගේ එක්වීමෙක් පමණි, ලොම් ආදියද එසේය. මෙහිලා ක්‍රියාවෙන් හටගත් කොටසක් වේද, එය ජීවිතෙන්ද්‍රියය, භාවය යන මේ දෙක හා සමග ගෙන 'දශධර්ම කලාප' නම්ද වේ. අධිකතා වශයෙන් වනාහි 'පඨවිධාතුය', 'ආපොධාතුය' යන ව්‍යවහාරයට ගියේය. මෙසේ කලාප වශයෙන් ගෙන මෙනෙහි කළයුතුය. **චුණ්ණතො** (චූර්ණ වශයෙන්) යනු, මේ (මිනිස්) සිරුරෙහි වනාහි, මධ්‍යම ප්‍රමාණයෙන් ගතහොත්, පරමාණු පමණට බිඳීමෙන් සුණුවූ සියුම් දූවිලිබවට පත් පඨවිධාතුව ද්‍රොණයක් (කුරුණියක්) පමණ වන්නේය. එම පඨවිධාතු කොටසින් අඩක් පමණවූ ආපොධාතුවෙන් පිඩුබවට පත්ව, තෙජොධාතුවෙන් ආරක්‍ෂා කරනලදුව, වායොධාතුවෙන් පුඹුවනලදුව නොවිසිරී, විනාශයට පත්නොවී පවතියි. නොවිසිරෙමින්, විනාශයට පත්නොවෙමින් නානා ආකාර ස්ත්‍රී-පුරුෂ-ලිංග-භාව විශේෂයනට පැමිණේ. කුදු-මහත්-දික්-කොට-තිර-තද ආදී භාවයන්ද ප්‍රකාශ කරයි. මේ සිරුර තුළ ද්‍රවභාවයට ගිය බැඳීම් ආකාර ඇති, ආපොධාතුව පඨවිධාතුවෙහි පිහිටා, තෙජොධාතුවෙන් රක්නාලදුව, වායොධාතුවෙන් පුඹුවනලදුව නොවැගිරෙයි, නොවැහෙයි. නොවැගිරෙමින්, නොවැහෙමින් පින පිනා සිටිනබවක් දක්වයි. මේ සිරුර තුළ ආහාරපානාදිය පැසවන, ඌෂ්මාකාර ඇති, උෂ්ණත්ව ලක්‍ෂණ ඇති තෙජොධාතුව පඨවිධාතුවෙහි පිහිටා, ආපොධාතුවෙන් පිඩු කරනලදුව, වායොධාතුවෙන් පුඹුවන ලදුව මේ කය මුහුකුරුවයි, එහි වර්ණ සම්පත්තියද එළවයි. එම තෙජොධාතුවෙන් පරිපාකයට පමුණුවනලද මේ කය පිළිකුල්බව නොදක්වයි. මේ කයෙහි අභපසභ තුළ පැතිර පවත්නා, සැලීම් පැතිරවීම් ස්වභාවයෙන් යුත් වායෝධාතුව පඨවිධාතුව මත පිහිටා අපොධාතුවෙන් පිඩුකරන ලදුව, තෙජොධාතුවෙන් රක්නාලදුව මේ කය පුඹුවා ලයි. එම (විත්ථම්භන ලක්‍ෂණ ඇති) වායොධාතුවෙන් පුඹුවනලද මේ කය නොවැටී පවතියි, ඍජුව සිටියි. අනෙක් (සමුදීරණ ලක්‍ෂණ ඇති) වායොධාතුවෙන් මෙහෙයවනලද මේ කය යාම, සිටීම,

හිඳීම, හෙවීම යන ඉරියව්වු කෙරෙහි විඥප්තිය (හැඟවීම) දක්වයි, හැකිලීම්, දිගහැරීම්, අත් පා සෙලවීම් කරවයි. මෙසේ මේ ස්ත්‍රී පුරුෂාදීභාවයෙන් අඥාන ජනයා රවටන මායාරූපයක් බඳු ධාතුයන්ත්‍රය පවතීයයි මෙසේ චූර්ණ (පරමාණු) වශයෙන් මෙනෙහි කළයුතුය.

**ලක්ඛණාදිතො** (ලක්ෂණාදී වශයෙන්) යනු, පඨවිධාතුව කුමක් ලක්ෂණකොට ඇත්තේද? කුමක් රස (කෘත්‍ය) කොට ඇත්තේද? කුමක් වැටහීම්කොට ඇත්තේදැයි මෙසේ ධාතූන් සතරම ආවර්ජනය කොට, පඨවිධාතුව දැඩිබව ලක්ෂණකොට ඇත්තේය, ප්‍රතිෂ්ඨානය (දරා සිටීම) රස (කෘත්‍ය) කොට ඇත්තේය, (සෙසු ධාතූන්) පිළිගැනීම වැටහීම්කොට ඇත්තේය. ආපොධාතුව වැගිරීම ලක්ෂණකොට ඇත්තේය, වැඩීම කෘත්‍ය කොට ඇත්තේය, පිඩුකිරීම වැටහීම්කොට ඇත්තේය, තෙජොධාතුව උෂ්ණත්වය ලක්ෂණකොට ඇත්තේය, පැසවීම කෘත්‍යකොට ඇත්තේය, මුදුබව ගෙනදීම වැටහීම්කොට ඇත්තේය. වායොධාතුව පැතිරීම ලක්ෂණකොට ඇත්තේය. සැලීම කෘත්‍යකොට ඇත්තේය, ඒ මේ අත ගෙනයාම වැටහීම්කොට ඇත්තේය. මෙසේ ලක්ෂණාදී වශයෙන් මෙනෙහි කළයුතුය.

**සමුට්ඨානතො** (සමුට්ඨාන වශයෙන්) යනු, පඨවිධාතු ආදිය විස්තර වශයෙන් දැක්වීම් වශයෙන් කෙස් ආදී වූ යම් මේ දෙසාළිස් කොටසක් දක්වන ලද්දේද, එම කොටස් අතුරින් උදරිය (නොපැසවුණු අහර) කරීස (පැසවුණු අහර)ය, පූයාවය, මූත්‍රය යන මේ කොටස් සතර සෘතු හේතුවෙන්ම හටගත්තේය. කඳුලුය, ඩහදියය, කෙළය, සොටුය යන මේ සතර සෘතු චිත්ත යන දෙකින්ම හටගත්තේය, ආහාරාදිය පැසවන තෙජොධාතුව කර්මයෙන්ම හටගත්තේය. ආශ්වාස ප්‍රශ්වාසයෝ චිත්තයෙන්ම හටගත්තාහුය, සෙසු සියලු කොටස් (කර්ම, චිත්ත, සෘතු ඕජා යන) සමුට්ඨාන සතරින්ම හටගත්තේයයි මෙසේ සමුට්ඨාන වශයෙන් මෙනෙහි කළයුතුය.

**නානත්තෙකත්තතො** (නානත්ව ඒකත්ව වශයෙන්) යනු, සියලු ධාතූන් පිළිබඳ ස්වලක්ෂණාදී වශයෙන් ඇති නානත්වය එකෙකි, පඨවිධාතුව පිළිබඳ ලක්ඛණ, රස, පච්චුපට්ඨානාදිය එකෙකි, ආපොධාතුව පිළිබඳ ලක්ෂණාදිය අනෙකෙකි, මෙසේ ලක්ෂණාදී වශයෙන්ද කම්මසමුට්ඨානාදී වශයෙන්ද නානා ආකාර ඇත්තාවූද මේ ධාතූන්ගේ රූප, මහාභූත, ධාතු, ධම්ම, අනිච්චතා යන මේ ආදී වශයෙන් ඒකත්වය (ඒකාකාරබව) වේ.

සියලු ධාතූහු රුප්පන (විනාශවීම්) ලක්‍ෂණය නොඉක්මවූ හෙයින් රූප නම් වෙති, **මහන්තපාතුභාවාදී** හේතුවෙන් මහාභූත නම් වෙති. මහන්තපාතුභාවාදියෙන් යනු, මේ ධාතූහු මහත්සේ පහළවීම් වශයෙන්ද, මහාභූතයන් හා සමග සැසඳෙන හෙයින්ද, මහත් පරිහාර ඇති හෙයින්ද, මහත් විකාර ඇති හෙයින්ද, මහත්බවින් හා විද්‍යමානබවින්දැයි යන මේ කරුණු අතින් මහාභූතයයි කියනු ලබති. එහි **මහන්තපාතුභාවතො** යනු, මේ මහාභූතයෝ අනුපාදින්න සන්තානයෙහිද, උපාදින්න සන්තානයෙහිද මහත්වූ ප්‍රාදූර්භාව ඇත්තාහුය, ඔවුනතුරෙන් අනුපාදින්න සන්තාන විෂයෙහි (ග්‍රහණය නොකළ පැවැත්මෙහි):

> ද්වෙ සතසහස්සානි චත්තාරි නහුතානි ච
> එත්තකං බහලත්තෙන සඞ්ඛාතා'යං වසුන්ධරා.

> මේ මහ පොළොව ගනකමින් (යොදුන්) සුවහස් දෙකකුත් නහුත සතරෙකැයි (දෙලක්‍ෂසතළිස් දහසෙකැයි) යන මෙතෙකින් ගණනය කරන ලද්දේයයි

යන ආදී නයින් මහත්වූ ප්‍රාදූර්භාව ඇත්තේයයි යට බුද්ධානුස්මෘති නිර්දේශයෙහි කියන ලද්දේමය. උපාදින්නසන්තාන විෂයෙහිද (ග්‍රහණය කළ පැවැත්මෙහිද) මත්ස්‍ය, කැසුබ්, දෙව, අසුර ආදී ශරීර වශයෙන් මහත් ලෙසින්ම පහළවීම් ඇත්තේය. කියන ලදමැයි: "මහණෙනි, මහාසමුද්‍රයෙහි යොදුන් සියයක් තරම්වූද ආත්මභාවයෝ (ප්‍රාණීහු) ඇත්තාහ"(1) යන ආදියයි.

**මහාභූතසාමඤ්ඤතො** (මහාභූතයන්ගේ සමානත්ව වශයෙන්) යනු, මේ භූතයෝ වනාහි, යම්සේ ඉන්ද්‍රජාලිකයෙක් මැණික් නොවූ ජලය මැණික් කොට දක්වාද, රන් නොවූ කැටකැබිලිති රන් කොට දක්වාද, තවද යම්සේ යක්‍ෂයකු නොවූ, යක්ෂිණියක නොවූ තමා යක්‍ෂයකු ලෙසින්, යක්ෂිණියක ලෙසින් දක්වාද, එසේම (මහාභූතයෝ) තුමූ නීලවර්ණ නොවූවාහුම නීලවර්ණ උපාදරූප දක්වති, පීතවර්ණ නොවූවාහුම, ලොහිතවර්ණ නොවූවාහුම, අවදාතවර්ණ නොවූවාහුම-පෙ-අවදාත වර්ණ උපාදරූප දක්වති'යි ඉන්ද්‍රජාලියකයන්ගේ හා මහාභූතයන්ගේ සමානත්ව වශයෙන් මහාභූත නම් වෙති. තවද යම්සේ යක්‍ෂාදී මහාභූත කෙනෙක් යම් පුද්ගලයකු ග්‍රහණය කෙරෙත්ද, එවිට ඒ මහාභූතයන් සිටි තැනක් එම පුද්ගලයාගේ ඇතුළතද පිටතද'යි දැනගත නොහැකි වේද, ඔහු

(1) අං. නි. අට්ඨක නි. - A iv 207

ඇසුරුකොට නොසිටියාහුද නොවෙත්ද, එසේම මේ සතර මහාභූතයෝද ඔවුනොවුන්ගේ ඇතුළත හෝ පිටත සිටිත්ද'යි දැනගත නොහැකි වේ, ඔවුනොවුන් ඇසුරුකොට නොසිටින්නාහුද නොවෙති'යි මෙසේ සිටින තැන සිතාගත නොහැකිවන හෙයින් යක්‍ෂාදී මහාභූතයන් හා සමානවන හෙයින්ද මහාභූත නම් වෙති. තවද යම්සේ යක්‍ෂිණී'යයි හැඳින්වෙන මහාභූත කෙනෙක් මනවඩන පැහැපත් බවින්ද, කඩවසමින්ද, අඟපසඟ සැලීමෙන්ද තමන්ගේ බියකරුබව වසන්කොට සත්ත්වයන් රවටත්ද, එසේම මෙම සතර මහාභූතයෝද ස්ත්‍රී පුරුෂ ශරීරාදියෙහි මනවඩන පැහැපත් බවින්ද, මනවඩන අඟපසඟ කඩවසමින්ද මනවඩන අත්-පා-ඇඟිලි-බැම හැසිරවීමෙන්ද තමන්ගේ රළු බව ආදී විශේෂ ඇති ස්වාභාවික ලක්‍ෂණ වසන්කොට අඥනජනයා රවටති'යි, තමන්ගේ සැබෑ ආකාරය දැක ගන්නට නොදෙති'යි යන වංචක ස්වභාවය හේතුකොටගෙන යක්‍ෂිණීයයි හඳුන්වනු ලබන මහාභූතයන් හා සමානවන හෙයින්ද, මහාභූත නම් වෙති.

**මහාපරිහාරතො** (මහාපරිහාර) ඇති හෙයින් යනු, බොහෝ ප්‍රත්‍යයයන් පරිහරණය කළයුතු හෙයින් මහාභූතයෝ වනාහි දවස දවස එළවිය යුතු බැවින් බොහෝවූ අහර පිළී ආදියෙන් පවත්වන (නඩත්තු කරන) ලද්දහු'යි මහාභූත නම් වෙති. භූතයෝ මහත් පරිහාර ඇත්තාහු'යි හෝ මහාභූත නම් වෙති. **මහාවිකාරතො** (මහත් විකාර ඇති හෙයින්) යනු, මේ සතර මහාභූතයෝ උපාදින්න (ග්‍රහණය කළා)වූද, අනුපාදින්න (ග්‍රහණය නොකළා)වූද, මහත් විකාර ඇත්තාහු වෙති. එහි, අනුපාදින්න භූතයන්ගේ විකාර මහත්වය කල්ප විනාශයෙහිදී ප්‍රකට වේ.

උපාදින්නයන්ගේ විකාර මහත්වය ධාතුන් කැළඹී කල්හි ප්‍රකට වේ. ඒ එසේමැයි:

භූමිතො වුට්ඨිතො යාව බ්‍රහ්මලොකා විධාවති.
අච්චි අච්චිමතො ලොකෙ ඩය්හමානම්හි තෙජසා,

කොටිසතසහස්සෙකං චක්කවාළං විලීයති.
කුපිතෙන යද ලොකො සලිලෙන විනස්සති,

කොටිසතසහස්සෙකං චක්කවාළං විලීයති.
වායො ධාතුප්පකොපෙන යද ලොකො විනස්සති,

පත්ථද්ධො භවතී කායො දට්ඨො කට්ඨමුඛෙන වා.
පඨවිධාතුප්පකොපෙන හොති කට්ඨමුඛෙව සො,

පූතිකො භවතී කායො දට්ඨො පූතිමුඛෙන වා.
ආපො ධාතුප්පකොපෙන හොති පූතිමුඛෙව සො,

සන්තත්තො භවතී කායො දට්ඨො අග්ගිමුඛෙන වා.
තෙජොධාතුප්පකොපෙන හොති අග්ගිමුඛෙව සො,

සඤ්ඡින්නො භවති කායො දට්ඨො සත්ථමුඛෙන වා.
වායොධාතුප්පකොපෙන හොති සත්ථමුඛෙව සො,

ලෝකය ගින්නෙන් දැවී යන කල පොළොවෙන් නැගී එම ගින්නෙහි සිළු බ්‍රහ්මලෝකය දක්වා දිව යයි.

යම් කලෙක ලෝකය කිපියාවූ ජලයෙන් නස්නේද, එකල කෙළ ලක්ෂයක් සක්වළ ක්‍ෂයවී යයි.

යම් කලෙක ලෝකය වායොධාතුව කිපීමෙන් නස්නේද, එකල කෙළ ලක්ෂයක් සක්වළ ක්‍ෂයවී යයි.

කට්ඨමුඛ නම් සර්පයා විසින් ඩහනලද කල්හි ශරීරය දරදඬුවීයයි, පඨවිධාතුව කිපීමෙන්ද එම කය කට්ඨමුඛයා විසින් ඩහන ලද්දක් මෙන් වේ.

පූතිමුඛ නම් සර්පයා විසින් ඩහනලද කල්හි ශරීරය කුණුවීයයි, ආපොධාතුව කිපීමෙන්ද එම කය පූතිමුඛයා විසින් ඩහන ලද්දක් මෙන් වේ.

අග්ගිමුඛ නම් සර්පයා විසින් ඩහනලද කල්හි ශරීරය තැවීයයි. තෙජොධාතුව කිපීමෙන්ද එම කය අග්ගිමුඛයා විසින් ඩහන ලද්දක් මෙන් වෙයි.

සත්ථමුඛ නම් සර්පයා විසින් ඩහනලද කල්හි ශරීරය සුණුවිසුණු වීයයි, වායොධාතුව කිපීමෙන්ද එම කය සත්ථමුඛයා විසින් ඩහන ලද්දක් මෙන් වෙයි.

මෙසේ භූතයෝ මහත් විකාර ඇත්තාහු'යි මහාභූත නම් වෙති. **මහන්තා භූතත්තා** (මහත් බැවින්ද විද්‍යමාන බැවින්ද) මහත් වැයමින් අවබෝධ කළයුතු හෙයින් මොවුහු 'මහත්' නම් වෙති, විද්‍යමානවන හෙයින් 'භූත' නම් වෙති, මහත් බැවින්ද විද්‍යමාන බැවින්ද මහාභූත නම් වෙති. මෙසේ මේ සියලු ධාතුහු මහත් ප්‍රාදූර්භාව ආදී කරුණු

අනුව මහාභූත නම් වෙති. ස්වලක්‍ෂණයන් දරන හෙයින්ද, දුක් ගෙනදෙන හෙයින්ද, දුක් දරා සිටින හෙයින්ද, ධාතු ලක්‍ෂණයන් නොඉක්මවූ හෙයින්ද සියලුම භූතයෝ **ධාතු** නම් වෙති. ස්වලක්‍ෂණයන් දැරීමෙන්ද, තමන්ගේ ක්‍ෂණයට අනුරූපව දැරීමෙන්ද **ධම්ම** නම් වෙති, විනාශවීම් අර්ත්‍ථයෙන් **අනිච්චා** (අනිත්‍ය) නම් වෙති, භය ගෙනදීමේ අර්ත්‍ථයෙන් **දුක්ඛ** (දුඃඛ) නම් වෙති, අසාරය යන අර්ත්‍ථයෙන් **අනත්ත** (අනාත්ම) නම් වෙති. මෙසේ රූප, මහාභූත, ධාතු, ධම්ම, අනිත්‍ය ආදී වශයෙන් සියලුම ධාතුන්ගේ ඒකත්වය වෙති'යි යන මේ ආකාරයෙන් නානත්ව ඒකත්ව වශයෙන් මෙනෙහි කළයුතුය.

**විනිබ්භොග** (වෙන් කළ හැකිබව,) **අවිනිබ්භොග** (වෙන් කළ නොහැකි බව) වශයෙන් විනිබ්භොගාවිනිබ්භොගතො යනු, සහජාතව හටගත් මේ ධාතූහු, සියල්ලන්ම අන්තිමවූ (ඉතා කුඩා) එක් එක් ශුද්ධාෂ්ටක කලාපයෙක්හි ප්‍රදේශ වශයෙන් වෙන් නොකරන ලද්දාහුය. (වෙන්කළ නොහැකිය). ලක්‍ෂණ වශයෙන් වනාහි වෙන් කරන ලද්දාහුය. (වෙන් කළ හැකිය). මෙසේ විනිබ්භොග අවිනිබ්භොග වශයෙන් මෙනෙහි කළ යුතුය. **සභාගවිසභාගතො** (සභාග විසභාග වශයෙන්) යනු, මෙසේ වෙන් නොකළ හැක්කාවූද මේ ධාතුන් අතුරෙන් පළමු (පඨවී, ආපො යන) දෙක ගුරු බැවින්ද, එසේම පසු (තෙජො, වායො යන) දෙක ලුහු බැවින්ද එකිනෙකට සමාන වේ. පළමු දෙක පසු දෙකටද, පසු දෙක පළමු දෙකටද අසමාන වේය'යි මෙසේ සභාග විසභාග වශයෙන් මෙනෙහි කළයුතුය. **අජ්ඣත්තිකබාහිරවිසෙසතො** (අභ්‍යන්තර බාහිර විශේෂ වශයෙන්) යනු, අජ්ඣත්තික (අභ්‍යන්තර) ධාතූහු චක්ඛු විඤ්ඤාණාදී පසටද, විඤ්ඤත්ති දෙකටද, ඉන්ද්‍රියයනටද නිශ්‍රය වෙති, ඔවුහු ඉරියවු සහිත වූවාහු, චතුසමුට්ඨානිකද වෙති. බාහිර ධාතූහු මෙම ප්‍රකාරයට වෙනස් ප්‍රකාර ඇත්තාහුයයි මෙසේ අභ්‍යන්තර බාහිර විශේෂ වශයෙන් මෙනෙහි කළයුතුය. **සංගහතො** (සංග්‍රහ වශයෙන්) යනු, කම්මසමුට්ඨානවූ පඨවීධාතුව කම්මසමුට්ඨානවූ අන්‍ය ධාතුන් හා සමජාතික බැවින් එකට සංග්‍රහ වේ, සමුට්ඨාන වශයෙන් නොවෙනස් වන හෙයිනි. එසේම චිත්තසමුට්ඨානිකාදී ධාතූහු චිත්තසමුට්ඨානිකාදී ධාතුන් හා එකට සංග්‍රහ වෙති. මෙසේ සංග්‍රහ වශයෙන් මෙනෙහි කළයුතුය. **පච්චයතො** (ප්‍රත්‍යය වශයෙන්) යනු, පඨවීධාතුව ආපොධාතුව විසින් කැටිකොට ගන්නාලදුව, තෙජොධාතුව විසින් රක්නාලදුව, වායොධාතුව විසින් පුඹුවනලදුව සෙසු මහාභූත තුනට ප්‍රතිෂ්ඨා බවට පත්වීමෙන් ප්‍රත්‍යය වේ. ආපොධාතුව පඨවීධාතුව තුළ පිහිටා, තෙජොධාතුව විසින් රක්නාලදුව, වායොධාතුව විසින් පුඹුවනලදුව,

සෙසු මහාභූත තුන එක්කොට බැඳවීමෙන් ප්‍රත්‍යය වේ. තෙජොධාතුව පඨවිධාතුවෙහි පිහිටා ආපොධාතුව විසින් කැටිකොට ගන්නාලදුව වායොධාතුව විසින් පුඹුවන ලදුව සෙසු මහාභූත තුනට පරිපාකය ගෙනදෙමින් ප්‍රත්‍යය වේ. වායොධාතුව පඨවිධාතුවෙහි පිහිටා, ආපොධාතුව විසින් කැටිකොට ගන්නාලදුව තෙජොධාතුව විසින් පරිපාකයට පමුණුවන ලදුව, සෙසු මහාභූත තුනට පිම්බීම ගෙනදෙමින් ප්‍රත්‍යය වේය'යි මෙසේ ප්‍රත්‍යය වශයෙන් මෙනෙහි කළයුතුය. **අසමන්නාහාරතො** (අසමන්නාහාර) වශයෙන් යනු, මෙහි පඨවිධාතුව 'මම් පඨවිධාතු වෙමි'යි හෝ 'සෙසු ධාතු තුනට ප්‍රතිෂ්ඨා වශයෙන් ප්‍රත්‍යය වෙමි'යි නොදනියි, සෙසු ධාතු තුනද අපට 'පඨවිධාතුව ප්‍රතිෂ්ඨා වශයෙන් ප්‍රත්‍යය වෙති'යි නොදනියි. සියලු තන්හි මෙම නයයි, මෙසේ අසමන්නාහාර වශයෙන් මෙනෙහි කළයුතුය.

**පච්චයවිභාගතො** (ප්‍රත්‍යය විභාග වශයෙන්) යනු, ධාතුන්හට වනාහි කර්ම, චිත්ත, ආහාර, ඍතු යන මොහු ප්‍රත්‍යය වෙති. එහි කර්මයෙන් හටගත් ධාතුන්හට කර්මයම ප්‍රත්‍යය වේ, චිත්තාදිය ප්‍රත්‍යය නොවේ. චිත්ත ආදියෙන් හටගත් ධාතුන්හට චිත්ත ආදියම ප්‍රත්‍යය වේ. සෙසු කර්ම ආදිය ප්‍රත්‍යය නොවේ. කර්මයෙන් හටගත් ධාතුන්හට කර්මය ජනක ප්‍රත්‍යය වේ, සෙසු ධාතුන්හට පරියාය වශයෙන් උපනිශ්‍රය ප්‍රත්‍යය වේ. චිත්ත සමුට්ඨානිකයනට චිත්තය ජනකප්‍රත්‍යය වේ, සෙසු ධාතුන්හට පච්ඡාජාත (පසුව උපන්) ප්‍රත්‍යයද, අස්තිප්‍රත්‍යයද, අවිගතප්‍රත්‍යයද වේ. ආහාරසමුට්ඨානික ධාතුන්හට ආහාරය ජනක ප්‍රත්‍යය වේ, සෙසු ධාතුන්හට ආහාරප්‍රත්‍යයද, අස්තිප්‍රත්‍යයද, අවිගත ප්‍රත්‍යයද වේ. ඍතුසමුට්ඨානික ධාතුන්හට ඍතුවම ජනකප්‍රත්‍යය වේ, සෙසු ධාතුන්හට අස්තිප්‍රත්‍යයද, අවිගතප්‍රත්‍යයද වේ. කම්මසමුට්ඨානික මහාභූතය කම්මසමුට්ඨානික මහාභූතයනට ප්‍රත්‍යය වේ. චිත්තාදි සමුට්ඨානික මහාභූතයනටද චිත්තය ප්‍රත්‍යය වේ, එසේම චිත්තසමුට්ඨානික -පෙ- ආහාරසමුට්ඨානික-පෙ-උතුසමුට්ඨානික මහාභූතය උතුසමුට්ඨානික මහාභූතයනටද, කම්මාදි සමුට්ඨානික මහාභූතයනටද ප්‍රත්‍යය වේ. එහි කම්මසමුට්ඨානික පඨවිධාතුව කම්මසමුට්ඨානිකවූ සෙසු ධාතුන්හටද සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත වශයෙන් හා ප්‍රතිෂ්ඨා වශයෙන්ද ප්‍රත්‍යය වේ, ජනක වශයෙන් ප්‍රත්‍යය නොවේ. (චිත්ත-ආහාර-උතු යන) තුන සමුට්ඨානකොට ඇති මහාභූතයනට නිස්සය, අත්ථි, අවිගත වශයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රතිෂ්ඨා වශයෙන්ද, ජනක වශයෙන්ද ප්‍රත්‍යය නොවේ. මෙහි, ආපොධාතුවද සෙසු ධාතුත්‍රයයට සහජාතාදී වශයෙන්ද ආබන්ධන වශයෙන්ද ප්‍රත්‍යය වේ, ජනක වශයෙන් ප්‍රත්‍යය

නොවේ. (චිත්ත ආදී තුන) සමුට්ඨානකොට ඇති සෙසු ධාතූන්හට නිස්සය, අත්ථි, අවිගත වශයෙන් ප්‍රත්‍යය වේ, ආබන්ධන වශයෙන්ද, ජනක වශයෙන්ද ප්‍රත්‍යය නොවේ. මෙහි තෙජෝධාතුවද සෙසු ධාතුත්‍රයට සහජාතාදී වශයෙන්ද, පරිපාචන වශයෙන්ද ප්‍රත්‍යය වේ. ජනක වශයෙන් ප්‍රත්‍යය නොවේ. (උතු-චිත්ත-ආහාර යන) තුන සමුට්ඨානකොට ඇති සෙසු මහාභූතයනට නිස්සය, අත්ථි, අවිගත වශයෙන් ප්‍රත්‍යය වේ, පරිපාචන වශයෙන්ද, ජනක වශයෙන්ද ප්‍රත්‍යය නොවේ. මෙහි වායො ධාතුවද සෙසු ධාතුත්‍රයට සහජාතාදී වශයෙන්ද, විත්ථම්භන වශයෙන්ද ප්‍රත්‍යය වේ, ජනක වශයෙන් ප්‍රත්‍යය නොවේ. (උතු චිත්ත-ආහාර යන) තුන සමුට්ඨානකොට ඇති සෙසු මහාභූතයනට නිස්සය, අත්ථි, අවිගත වශයෙන් ප්‍රත්‍යය වේ, විත්ථම්භන වශයෙන්ද, ජනක වශයෙන්ද ප්‍රත්‍යය නොවේ. චිත්ත-ආහාර-උතු යන තුන සමුට්ඨානකොට ඇති පඨවිධාතු ආදියෙහිද මෙම නයයි. මෙසේ සහජාතාදී ප්‍රත්‍යය වශයෙන් පවත්නාවූ මේ ධාතූන් අතර,

> එකං පටිච්ච තිස්සො චතුධා තිස්සො පටිච්ච එකො ච,
> ද්වෙ ධාතුයො පටිච්ච ද්වෙ ඡධා සම්පවත්තන්ති.

> එක් ධාතුවක් නිසා සෙසු තුන් ධාතූහු සිව් ආකාරයෙකින් පවතිත්,
> ධාතු තුනක් නිසා එක් ධාතුවක්ද සිව් ආකාරයෙකින් පවතී,
> ධාතු දෙකක් නිසා අනෙක් දෙක සය ආකාරයෙකින් පවතී.

පඨවි ආදී ධාතූන් අතර එක් එක් ධාතුවක් නිසා සෙසු ධාතූන් තුනක් තුනක්යයි මෙසේ එක් ධාතුවක් නිසා සෙසු ධාතු තුන සතර ආකාරයෙකින් පවතියි, එසේම පඨවිධාතු ආදිය අතුරෙන් එක් එක් ධාතුවක් සෙසු ධාතූන් තුනක් තුනක් නිසා වෙතැ'යි මෙසේ ධාතූන් තුනක් නිසා ඉතිරි එක් ධාතුවක්දැ'යි සිව් ආකාරයෙකින් පවතියි. පළමු දෙක නිසා පසු දෙකද, පසු දෙක නිසා පළමු දෙකද, පළමුවන තුන්වන දෙක නිසා දෙවන සිවුවන ධාතු දෙකද දෙවන සිවුවන ධාතු නිසා පළමුවන තුන්වන ධාතු දෙකද, පළමුවන සිවුවන ධාතු නිසා දෙවන තුන්වන ධාතුද, දෙවන තුන්වන ධාතු නිසා පළමුවන සිවුවන ධාතූන්දැ'යි මෙසේ ධාතු දෙකක් නිසා ධාතු දෙකක්දැ'යි සය ආකාරයෙකින් පවතියි. එම ධාතූන් අතර පඨවිධාතුව යාම් ඊම් ආදිය කරනවිට පීඩනයට (තල්ලුවට) ප්‍රත්‍යය (උපකාරී) වෙයි, එම පඨවිධාතුවම ආපොධාතුවට අනුගතවූ විට පා තැබීමට ප්‍රත්‍යය වේ, පඨවිධාතුවට අනුගතවූ ආපොධාතුව පා යටට හෙළීමට ප්‍රත්‍යය වේ. වායො ධාතුවට අනුගතවූ

තෙජොධාතුව පා උඩට නැඟීමට ප්‍රත්‍යය වේ, තෙජොධාතුවට අනුගතවූ වායොධාතුව පා ඉදිරියට හා සරසට යැවීමට ප්‍රත්‍යය වේය'යි මෙසේ ප්‍රත්‍යය විභාග වශයෙන් මෙනෙහි කළයුතුය. මේ ආකාරයෙන්, වචනාර්ත්‍ථ ආදී වශයෙන් මෙනෙහි කරනවිට, එක් එක් මාතෘකා මාර්ගයෙන් ධාතූහු ප්‍රකට වෙති, එම ධාතූන් නැවත නැවතත් ආවර්ජනය කරනවිට, මෙනෙහි කරනවිට, පෙරකී නයින්ම උපචාර සමාධිය උපදී, එම සමාධිය සිව් ධාතූන් ව්‍යවස්ථාපනය කරන ඥානයෙහි අනුභාවයෙන් උපදින හෙයින් 'චතුධාතුවවත්‍ථාන' යනුවෙන්ම ව්‍යවහාරයට පත්වෙයි. මෙම චතුධාතුවවත්‍ථාන භාවනාවෙහි නියුතුවූ භික්‍ෂු තෙමේ ශූන්‍යතාව අවබෝධ කරයි, සත්‍වයෙකැ'යි යන හැඟීම නසාලයි, සත්‍වසංඥාව නසනලද හෙයින් ඒ යෝගාවචර තෙමේ ව්‍යාලමෘග යක්‍ෂ රාක්‍ෂසාදී උපද්‍රවයකට නොපැමිණෙනුයේ, බිය හා බියකරු හැඟීම් ඉවසනු සමත්වේ. (කුශලවිෂයෙහි) අරතියද, (පංචකාමවිෂයෙහි) රතියද මැඩලන්නේ වේ, ඉටු අනිටු අරමුණෙහි උදම්වීමට හෝ පසුබැසීමට නොපැමිණේ, මහාප්‍රඥ ඇත්තේද වේ, අවසන්හි නිවන් දක්නේ හෝ සුගතිපරායණ හෝ වන්නේය.

එවං මහානුභාවං යොගීවරසහස්සකීළිතං එතං,<br>
චතුධාතුවවත්‍ථානං නිච්චං සෙවෙථ මෙධාවී.

මෙසේ මහානුභාව ඇති දහස් ගණන් ශ්‍රේෂ්ඨ යෝගීන් විසින් පුරුදු කරනලද මේ චතුධාතුවවත්‍ථාන භාවනාව නුවණැත්තේ නිරතුරුව සේවනය කරන්නේය.

**මේ චතුධාතුවවත්‍ථානය පිළිබඳ භාවනා නිර්දේශයයි.**

සමාධිය පිළිබඳ විස්තරය හා භාවනා ක්‍රමය දක්වනු පිණිස සමාධි නම් කිමෙක්ද? කවර අරුතෙකින් සමාධි නම් වේද? ආදි නයින් යම් ප්‍රශ්නකර්මයක් කරන ලද්දේ නම්, එහි 'කෙසේ වැඩිය යුතුද?'යි යන මේ පදයට කළ අර්ත්‍ථවර්ණනාව මෙතෙකින් සර්වප්‍රකාරයෙන් සමාප්ත වූයේය. මෙහි අභිප්‍රේතවූ එම සමාධිය උපචාරය, අර්පණායයි දෙවැදෑරුම් වේ. එහි (බුද්ධානුස්සති ආදී) දස කමටහන්හිද, අර්පණාවට පෙරාතුව පහළවන චිත්තොත්පාදයන්හිද ඇතිවන එකාග්‍රතාව උපචාර සමාධියයි. සෙසු කමටහන්හිදී ඇතිවන චිත්තෛකාග්‍රතාව අර්පණා සමාධියයි. ඒ කර්මස්ථානයන් වඩනාලද හේතුවෙන් ද්විප්‍රකාරවූම එම සමාධිය වඩනාලද්දේ වේ. එහෙයින් 'කෙසේ වැඩිය යුතුද?'යි යන මේ පදයෙහි අර්ත්‍ථවර්ණනාව සර්වප්‍රකාරයෙන් සමාප්තය'යි කියනලදී. 'සමාධිභාවනාවෙහි ආනිසංස කවරේද?'යි යමක් කියන ලද්දේද, එහි

වත්මන් අත්බැව්හිදීම සුඛවිහරණ ආදී වශයෙන් සමාධිභාවනාවෙහි පස්වැදෑරුම් ආනිසංස වේ. ඒ එසේමැයි:- ආශ්‍රවයන් ක්ෂයකළ යම් රහත් කෙනෙක් සමවැදීමෙන් එකඟකළ සිත්ඇතිව දිවාකාලය සුවසේ විහරණය කරම්හ'යි සමාධි වඩත්ද, ඒ රහතුන්ගේ අර්පණාසමාධි භාවනාව වත්මන් අත්බැව්හිදීම සුඛවිහරණ ආනිසංසකොට ඇත්තේ වේ. එහෙයින් වදළහ භාග්‍යවතුන් වහන්සේ: "චුන්දය, ආර්යයන්ගේ විනයෙහි (හික්මීම් විෂයෙහි) මේ (සමාධීහු) 'සල්ලෙඛ' (කෙලෙසුන් සිඳින) යයි වහරනු නොලබති, මේ (සමාධීහු) ආර්යයන්ගේ විනයෙහි 'දිට්ඨධම්මසුඛවිහාර'යයි වහරනු ලබති"(1)

'සමවතින් නැගී සමාධිගතවූ සිතින් විදර්ශනා වඩම්හ'යි සමාධිභාවනා වඩන ශෛක්ෂ්‍යයන්ගේ හා පෘථග්ජනයන්ගේ අර්පණා සමාධිභාවනාවද, සම්බාධ සහිත සසර ගමනෙහිදී 'අවකාශයක් ලැබියහැකිවීමේ නයින් උපචාර සමාධිභාවනාවද් විදර්ශනා ආනිසංස කොට ඇතේතේ වේ. එහෙයින් වදළහ භාග්‍යවතුන් වහන්සේ: "මහණෙනි, සමාධි වඩවූ, මහණෙනි, සමාධිගතවූ භික්ෂු තෙමේ යථාස්වභාවය මැනවින් දනියි"(2) යනුවෙනි. යම් කෙනෙක් වනාහි අෂ්ටසමාපත්තීන් උපදවා අභිඥපාදක ධ්‍යානයට සමවැද, එම සමවතින් නැගී, 'එක් පුද්ගලයකු වුවද බොහෝ පුද්ගලයන් සේ දිස්වෙති'යි කී නයින් අභිඥවන් පතමින් (සමාපත්තීන්) උපදවත්ද, ඔවුන්ගේ අර්පණා සමාධිභාවනාව පූර්වභවයෙහි සිද්ධවූ ආයතනයක් (හේතුවක්) ඇති ඇති විටෙක එය අභිඥවට පදට්ඨානවන හෙයින් අභිඥ ආනිසංසකොට ඇත්තේ වේ. එහෙයින් වදළහ භාග්‍යවතුන් වහන්සේ: "ඒ භික්ෂු තෙමේ අභිඥවෙන් සාක්ෂාත් කටයුතු යම් යම් ධර්මයක් අභිඥවෙන් සාක්ෂාත් කරනු පිණිස සිත නැඹුරු කරන්නේද, ඒ ඒ ධර්මය විෂයෙහි පූර්වභවයෙහි සිද්ධවූ හේතුවක් ඇති ඇති විටෙක සාක්ෂාත් කරනු හැකිබවට පැමිණෙන්නේය"(3) යනුවෙනි.

යම් පෘථග්ජන කෙනෙක් තුමූ ධ්‍යානයෙන් නොපිරිහී බ්‍රහ්මලෝකයෙහි උපදින්නෙමු'යි බ්‍රහ්මලෝකෝත්පත්තිය ප්‍රාර්ථනා කෙරෙමින් හෝ, එසේ ප්‍රාර්ථනා නොකෙරෙමින් හෝ, සමාධියෙන් නොපිරිහෙත්ද, ඔවුන්ගේ අර්පණා සමාධි භාවනාව භව විශේෂයන් ගෙනදෙන හෙයින් එසේ භව විශේෂ ආනිසංසකොට ඇත්තේ වේ. එහෙයින් වදළහ භාග්‍යවතුන් වහන්සේ "ප්‍රථමධ්‍යානය ස්වල්ප වශයෙන්

(1) ම. නි. සල්ලෙඛ සු - M i 40ff

(2) සං. නි. ඛන්ධ සං. - S iii 13

(3) ම. නි. කායගතාසති සු - M iii 96

වැඩීමෙන් කොහි උපදින්නාහුද? බ්‍රහ්මපාරිසජ්ජ දෙවියන් හා සමබව්හි (එනම් බ්‍රහ්මලෝකයෙහි) උපදින්නාහුය"[1] යන ආදී වශයෙනි. උපචාරසමාධි භාවනාව කාමාවචර සුගති භවවිශේෂයන් එළවන්නේමය. යම් ආර්ය (රහත්) කෙනෙක් තුමූ "අෂ්ට සමාපත්තීන් උපදවා, නිරෝධ සමාපත්තියට සමවැද සත් දිනක් අචිත්තකව (සතර නාමස්කන්ධයෙන් තොරව) සිටිමින් ඉහාත්මභාවයෙහිම නිරොධසංඛ්‍යාත නිර්වාණයට පැමිණ සුවසේ විහරණය කරම්හ"යි සමාධි වඩත්ද, ඔවුන්ගේ අර්පණාසමාධි භාවනාව නිරොධ ආනිසංසකොට ඇත්තේවේ. එහෙයින් වදළහ භාග්‍යවතුන් වහන්සේ "සොළොස් (අනිච්චානුපස්සනා ආදී) ඥානචර්යා වශයෙන්ද, නව (ප්‍රථමධ්‍යාන ආදී) සමාධිචර්යා වශයෙන්ද වශීභාවය හේතුකොට උපන් ප්‍රඥාව නිරෝධසමාපත්තිය පිළිබඳ ඥානය වේ"[2] යනුවෙනි. මෙසේ මේ සමාධිභාවනාව පිළිබඳ ආනිසංස දිට්ඨධම්මසුඛවිහාර (ඉහාත්මයෙහිම වන්නාවූ සුඛවිහරණ) ආදී වශයෙන් පංචවිධ වේ.

තස්මා නෙකානිසංසම්හි කිලෙසමලසොධනෙ
සමාධිභාවනායොගෙ නප්පමජ්ජෙය්‍ය පණ්ඩිතො.

එහෙයින් නුවණැත්තේ අනේක ආනිසංස ඇති, කෙලෙස්මල සෝදලන, සමාධිභාවනායෝගයෙහි ප්‍රමාද නොවන්නේය.

**"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො"** යන ආදීවූ මේ ගාථාවෙහි, සීල-සමාධි-පඤ්ඤා යන මාතෘකා වශයෙන් දේශනා කරනලද විශුද්ධිමාර්ගයෙහි සමාධියද මෙතෙකින් විස්තර කරනලද්දේ වේ.

**සාධුජන ප්‍රමොදය පිණිස කරනලද විසුද්ධිමග්ග නම් ග්‍රන්ථයෙහි සමාධිභාවනාධිකාරයෙහි සමාධිනිද්දේස නම් එකොළොස්වන පරිච්ඡේදය මෙතෙකින් සමාප්තයි.**

---

(1) අභි. විභංග - 424

(2) පටිසම්භිදමග්ග - Ps i 2